විගණකාධිපතිවරයාගේ ත්‍රෛවාර්ෂික වාර්තාව

2021-2023

දෙපාර්තමේන්තු

පටුන

විධායක සාරාංශය.. 4

01. ශීර්ෂය - 001 ජනාධිපති කාර්යාලය.. 5

02. ශීර්ෂය - 002 අග්‍රාමාත්‍ය කාර්යාලය.. 12

03. ශීර්ෂය - 004 උපරිමාධිකරණ විනිශ්චයකාරවරු 15

04. ශීර්ෂය - 016 පාර්ලිමේන්තුව 17

05. ශීර්ෂය - 201 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව 19

06. ශීර්ෂය - 202 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 21

07. ශීර්ෂය - 203 ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව 23

08. ශීර්ෂය - 204 හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව 25

09. ශීර්ෂය - 205 මහා භාරකාර දෙපාර්තමේන්තුව.. 26

10. ශීර්ෂය - 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.. 30

11. ශීර්ෂය - 207 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.. 32

12. ශීර්ෂය - 208 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.. 36

13. ශීර්ෂය - 209 ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.. 39

14. ශීර්ෂය - 210 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 42

15. ශීර්ෂය - 211 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.. 45

16. ශීර්ෂය - 212 විභාග දෙපාර්තමේන්තුව 51

17. ශීර්ෂය - 213 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 55

18. ශීර්ෂය - 215 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව 57

19. ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව 59

20. ශීර්ෂය - 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව.. 63

21. ශීර්ෂය - 219 ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව 67

22. ශීර්ෂය - 220 ආයුර්වේද දෙපාර්තමේන්තුව 70

23. ශීර්ෂය - 221 කම්කරු දෙපාර්තමේන්තුව 96

24. ශීර්ෂය - 222 ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 111

25. ශීර්ෂය - 223 ශ්‍රී ලංකා නාවික හමුදාව.. 129

26. ශීර්ෂය - 224 ශ්‍රී ලංකා ගුවන් හමුදාව 147

27. ශීර්ෂය - 225 ශ්‍රී ලංකා පොලීසිය 166

28. ශීර්ෂය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව 179

29. ශීර්ෂය - 227 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව.. 190

30. ශීර්ෂය - 228 අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව 200

31. ශීර්ෂය - 229 නීතිපති දෙපාර්තමේන්තුව.. 208

32. ශීර්ෂය - 230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව.. 217

33. ශීර්ෂය - 231 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.. 219

34. ශීර්ෂය - 232 බන්ධනාගාර දෙපාර්තමේන්තුව.. 223

35. ශීර්ෂය - 233 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව 257
36. ශීර්ෂය - 234 ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව 263
37. ශීර්ෂය - 235 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව 267
38. ශීර්ෂය - 236 රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව 270
39. ශීර්ෂය - 237 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව 272
40. ශීර්ෂය - 238 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව 274
41. ශීර්ෂය - 239 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව 289
42. ශීර්ෂය - 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුව 296
43. ශීර්ෂය - 241 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 299
44. ශීර්ෂය - 242 කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 309
45. ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව 314
46. ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව 316
47. ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව 319
48. ශීර්ෂය - 246 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 320
49. ශීර්ෂය - 247 ශ්‍රී ලංකා රේගුව 348
50. ශීර්ෂය - 248 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව 364
51. ශීර්ෂය - 249 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 394
52. ශීර්ෂය - 250 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව 402
53. ශීර්ෂය - 251 තක්සේරු දෙපාර්තමේන්තුව 408
54. ශීර්ෂය - 252 ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව 410
55. ශීර්ෂය - 253 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව 416
56. ශීර්ෂය - 254 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව 421
57. ශීර්ෂය - 280 ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව 446
58. ශීර්ෂය - 281 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව 452
59. ශීර්ෂය - 282 වාරිමාර්ග දෙපාර්තමේන්තුව 457
60. ශීර්ෂය - 283 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව 504
61. ශීර්ෂය - 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 513
62. ශීර්ෂය - 285 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 519
63. ශීර්ෂය- 286 ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව 522
64. ශීර්ෂය- 287 ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව 530
65. ශීර්ෂය - 288 මිනින්දෝරු දෙපාර්තමේන්තුව 537
66. ශීර්ෂය - 289 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 550
67. ශීර්ෂය - 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව 558
68. ශීර්ෂය - 291 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 564
69. ශීර්ෂය - 292 සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 568
70. ශීර්ෂය - 293 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 572

71. ශීර්ෂය - 294 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තුමේන්තුව 576
72. ශීර්ෂය - 295 වානිජ දෙපාර්තමේන්තුව 580
73. ශීර්ෂය - 296 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව 581
74. ශීර්ෂය - 297 සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව 589
75. ශීර්ෂය - 298 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව 591
76. ශීර්ෂය - 299 ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලය 592
77. ශීර්ෂය - 300 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව 594
78. ශීර්ෂය - 301 සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව 599
79. ශීර්ෂය - 302 සමූපකාර සේවක කොමිෂන් සභාව 601
80. ශීර්ෂය - 303 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව 603
81. ශීර්ෂය - 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 605
82. ශීර්ෂය - 306 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 608
83. ශීර්ෂය - 307 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 628
84. ශීර්ෂය - 308 තැපැල් දෙපාර්තමේන්තුව 669
85. ශීර්ෂය - 309 ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 671
86. ශීර්ෂය - 310 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව 676
87. ශීර්ෂය - 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව 684
88. ශීර්ෂය - 320 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව 689
89. ශීර්ෂය - 322 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව 722
90. ශීර්ෂය - 323 නීති කටයුතු දෙපාර්තමේන්තුව 725
91. ශීර්ෂය - 324 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව 727
92. ශීර්ෂය - 325 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව 728
93. ශීර්ෂය - 326 ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව 734
94. ශීර්ෂය - 327 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව 739
95. ශීර්ෂය - 328 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 741
96. ශීර්ෂය - 329 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව 748
97. ශීර්ෂය - 331 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව 749
98. ශීර්ෂය - 332 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව 753
99. ශීර්ෂය - 333 කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය 771
100. ශීර්ෂය - 334 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව 775
101. ශීර්ෂය - 335 ජාතික අධ්‍යාපන කොමිසම 779
102. ශීර්ෂය - 336 වෙළඳ නාවික ලේකම් කාර්යාලය 780
103. රජයේ මූල්‍යා ප්‍රකාශන 785

විධායක සාරාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව වර්ෂ 2021 සිට 2023 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව මෙම ත්‍රෛවාර්ෂික විගණකාධිපති තත්ත්ව වාර්තාව නිකුත් කෙරේ. උක්ත කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක රජයේ දෙපාර්තමේන්තු වෙත නිකුත් කරන ලද හා පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද විගණන නිරීක්ෂණවල සාරාංශයක් මෙම වාර්තාවේ දැක්වේ. එහි දී ශ්‍රී ලංකා ජනරජ ගිණුම ද ඇතුළුව රජයේ දෙපාර්තමේන්තු 103 ක් සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ සම්බන්ධයෙන් විගණකාධිපති නිර්දේශ, එක් එක් විගණිත දෙපාර්තමේන්තුව විසින් නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති අඩුපාඩු වැළැක්වීමට ගත් ක්‍රියාමාර්ග හා එම නිරීක්ෂණ සඳහා ගත් ක්‍රියාමාර්ගවල වර්තමාන තත්ත්වය ද සාරාංශ ගත කර මෙම වාර්තාවට ඇතුළත් කර ඇත.

මෙහි දී ප්‍රධාන විගණන නිරීක්ෂණ ලෙස වත්කම් පාලනයේ දුර්වලතා, නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම්, අකාර්යක්ෂම මූල්‍ය පාලන දුර්වලතා, අකාර්යක්ෂම සම්පත් උපයෝජනය, අනාර්ථික ගනුදෙනු, හානි හා පාඩු, දුර්වල සැලසුම්කරණය, දුර්වල කාර්යසාධනය හා සේවක මණ්ඩල පරිපාලන දුර්වලතා යනාදිය අදාළ වර්ෂ 03 තුළ දී අනාවරණය කර තිබුණි. මෙහි දී මෙම ත්‍රෛවාර්ෂික වාර්තාව මඟින් වාර්තා කර ඇත්තේ උක්ත අඩුපාඩු සඳහා නිවැරදි කිරීමේ හා වළක්වා ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කර ඇතත් ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට හා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වුවත් එසේ කිරීමට අදාළ ගණන්දීමේ නිලධාරීන්/ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොමැති අවස්ථා වේ.

තවද, ඒ සමග එම එක් එක් දෙපාර්තමේන්තුවෙ 2021, 2022 සහ 2023 වර්ෂ අවසානයේදී වත්කම්, වගකීම් සහ ස්කන්ධය ද වගුවක ආකාරයෙන් ඉදිරිපත් කර ඇති අතර, ඒ තුළින් වසර 03 තුළ එම අගයන්ගේ වෙනස්වීම පරීක්ෂා කිරීම පහසු කර ඇත. මීට අමතරව ගිණුම් සම්බන්ධව විගණන මතය ද එහි දක්වා තිබීමෙන් දෙපාර්තමේන්තුවේ එක් එක් වර්ෂයේ ගිණුම් සම්බන්ධව විගණන මතය පිලිබඳව පරිශීලකයන් දැනුවත් කර ඇත.

01. ශීර්ෂය - 001 ජනාධිපති කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	39,752,990	39,752,990	39,752,990	තත්ත්වාගණනය නොකළ
2022	38,790,771	38,790,771	38,790,771	තත්ත්වාගණනය නොකළ
2023	38,595,789	38,595,789	38,595,789	තත්ත්වාගණනය නොකළ

අනු අංකය		විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	නීති, රීති හා රෙගුලාසි වලට යොමුව	අනුකූල නොවීම				
	මු.රෙ. 315, 880 හා 881	2023 වර්ෂයේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ඇප තැබිය යුතු කිසිදු නිලධාරියකු විසින් ඇප තැන්පත් කිරීම සිදු කර නොතිබූ අතර ඇප ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි පරිදි කටයුතු කළ යුතු වීම.	රාජ්‍ය නිලධාරින්ගේ ඇප තැබීම සම්බන්ධ කටයුතු රජයේ ඇපකාරක සංගමය හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මඟින් සිදු කිරීමට අපේක්ෂිත අතර, රාජ්‍ය නිලධාරින් ඇප තැබීම සම්බන්ධයෙන් පවතින මාර්ගෝපදේශ අනුව නිලධාරින්ගේ තනතුරු අනුව තැබිය යුතු ඇප වටිනාකම් පිළිබඳව නිශ්චිත සඳහනක් නොමැති වීම නිසා නිලධාරින්ගේ වගකීම්, අවදානම් ආදි කරුණු සැලකිල්ලට ගෙන ඇප තීරණය කළ යුතුව ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	මේ දක්වා කිසිදු නිලධාරියෙකු විසින් ඇප තබා නොතිබූ අතර ලේඛනයක් සකස් කර නොතිබුණි.

02.	V වන විධායක ජනාධිපති සඳහා මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් වැය විෂයය අංක 001-3-5-2001 ට රු.1,000,000 ක් ප්‍රතිපාදනයෙන් කිසිදු වියදමක් නොකර සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිකර මූල්‍ය ප්‍රකාශනවල ACA2(II) හි ඉතිරිවීම් සඳහා හේතු වශයෙන් අපේක්ෂිත පරිදි වියදම් පැන නොනැගි බව දක්වා තිබුණි. එසේ වුවද සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැයවිෂයයෙන් හිටපු V වන විධායක ජනාධිපතිගේ නිල නිවාසය අළුත්වැඩියා කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවට රු.18,336,135 ක ප්‍රතිපාදන ද එම නිල නිවාසයේ එක්ස්කැලේටරයක් සවි කිරීමට රු.15,093,876 ක් හා ජෙනරේටරයක් මිලට ගැනීමට රු.4,885,844 ක් බිල්පත් මඟින් ද ගෙවීම් කර තිබුණි.	2023	වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය කිරීමේදී අපේක්ෂිත අරමුණු ළඟාකර ගත හැකි පරිදි කටයුතු කළ යුතු වීම.	වැය ශීර්ෂ 001-1-03-5-2001 යටතේ මූලධන වත්කම් පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම සඳහ ප්‍රතිපාදන සලසා ඇති බව කාරුණිකව දන්වමි. නමුත්, V වන විධායක (විශ්‍රාමික) ජනාධිපතිතුමා වෙත පහසුකම් සැපයීම සම්බන්ධයෙන් අවශ්‍යතාවය මත පැන නැගුණු අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු කිහිපයක් සිදු කර ගැනීමට වැය ශීර්ෂ 001-1-03-5-2001 යටතේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය වැය විෂය යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ප්‍රතිපාදන ලබා දීම සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එක්ස්කැලේටරය හා ජෙනරේටරය මිලදී ගැනීම සඳහා වැය කළ රු.19,979,720 ක මුදල නව මූලධන වත්කම් අත්පත් කර ගැනීමකි. එම අවස්ථාවේ 001-01-01-0-2103 වැය විෂයෙහි ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබූ බැවින් සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ වැය විෂය යටතේ වැය කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	සංවර්ධන මූලාරම්භ සම්බන්ධීකරණ සහ අධීක්ෂණ කටයුතු සඳහා සලසා තිබූ ප්‍රතිපාදන වලින් V වන විධායක ජනාධිපති නිල නිවස අලුත්වැඩියා කිරීම් සිදු කිරීමට රු.38,315,855 ක් දරා තිබුණි.

03.	වෙන්දේසි කිරීම සඳහා නිර්දේශ කර ඇති වාහන 07 ක් වෙන්දේසි කිරීම සඳහා කටයුතු කරන ලෙස 2023 මැයි 10 දින ප්‍රසම්පාදන අංශය වෙත දන්වා තිබූ නමුත් විගණිත දිනය වූ 2024 ජනාවාරි 31 දින වන විටත් එම කටයුතු කර අවසන් කර නොතිබුණි.	2023	වත්කම් අපහරණය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුවීම.	වාහන තක්සේරු කිරීම සඳහා තක්සේරු කමිටුවක් පත් කර ඇති අතර, අදාළ තක්සේරු කමිටුව වෙතින් මේ වන විට තක්සේරු වටිනාකම ඇතුළත් රහස්‍ය වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කර ඇති බව ද, ඒ අනුව, ඉදිරියේදී මෙම වාහන 07 වෙන්දේසි කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.	මේ වන විටත් වෙන්දේසිය සිදු කර නොතිබුණි.
04.	වාහන 02 කට සිදු වූ අනතුරු සම්බන්ධයෙන් රක්ෂණයෙන් අයකර ගත නොහැකි වූ වටිනාකම එකතුව රු.341,878 ක් ජනාධිපති කාර්යාලය විසින් දරා ඇති අතර එම අනතුර සිදු වී වසරකට වැඩි කාලයක් ගත වී ඇතත් අලාභයට වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	වගකිව යුතු පාර්ශව හඳුනාගෙන අලාභ අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම.	එක් රථයක් 505 මෝටර්ස් ආයතනය වෙත සේවා කටයුත්තකට යොමු කර තිබියදී සේවා කටයුතු අවසන් කිරීමෙන් පසුව එම ආයතනය තුළ ගාල්කර තිබියදි, 2022.08.19 දින වාහනයේ ඇතුළත ගිනි ගැනීම හේතුවෙන් අනතුරට පත්ව ඇති බව කාරුණිකව දන්වා සිටිමි. ඒ අනුව, අදාළ රථය අනතුරට පත්වීම සම්බන්ධයෙන් සිදු වූ හානිය සඳහා රක්ෂණාවරණය ලබා ගැනීම සම්බන්ධයෙන්, රක්ෂණ ආයතනය සහ අලුත්වැඩියා කටයුතු සිදු කළ ආයතනය සමඟ නීති කටයුතු සිදු වෙමින් පවතින අතර, අදාළ නීති කටයුතු අවසන් වන තෙක්	මේ දක්වා අලාභ අයකරගෙන නොතිබුණි.

				රථයට සිදු වූ හානි අලුත්වැඩියා කිරීමට ඇස්තමේන්තුවක් ලබා ගැනීමට හෝ අලුත්වැඩියා කිරීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. අනෙක් රථය 2022.07.09 දින කැරලි කෝලාහල හේතුවෙන් අනතුරට ලක්වී එම අනතුරට අදාළ මු.රෙ. 104(4) පරීක්ෂණ අවසන් කර එම වාර්තාවල නිර්දේශ අනුව අධිකරණය තීරණය කරන්නා වූ වගකිවයුත්තන්ගෙන් අලාභ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බවත්, කාරුණිකව දන්වා සිටිමි.	
05.	2023.05.25 දින ඩිපෙන්ඩර් රථයක් අනතුරකට ලක් වීමෙන් වූ අලාභය රු.2,110,400 ක් ලෙස යාන්ත්‍රික ඉංජිනේරු ඇස්තමේන්තු කර තිබුණි. මු.රෙ. 104(1)(අ) අනුව ප්‍රාරම්භක පරීක්ෂණ වහාම ආරම්භ කල යුතු වුවත් පරීක්ෂණ කර තිබුනේ 2023 සැප්තැම්බර් 15 දින එනම් මාස 04 කට පසුවය. තවද 2023 සැප්තැම්බර් 21 දිනැති ලිපිය අනුව මු.රෙ. 104 (4) අනුව වගකිවයුත්තන් නිශ්වය කිරීමේ පරීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂණ වාර්තාව සතියක් ඇතුලත ලබා දිය යුතු බව දක්වා තිබුණද විගණිත දිනය වන 2024 මාර්තු මස වන විටත් අවසන් වාර්තාව ලබා දීම හා එම වාහනය අළුත්වැඩියා කිරීම සහ රක්ෂණ වන්දි ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	2023	වාහන අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි පරිදි කටයුතු සිදු කළ යුතු වීමත	මෙම රථයේ අලුත්වැඩියා කටයුතු මේ වන විටත් සිදු කෙරෙමින් පවතින අතර එම කටයුතු කඩිනමින් අවසන් කර දෙන ලෙස අලුත්වැඩියාව සිදු කරන ආයතනය වෙත සිහිකැඳවීම් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. අලුත්වැඩියා කටයුතු සිදු කර අවසන් වන තෙක් මු.රෙ.104(4) පරීක්ෂණ කටයුතු අවසන් කිරීමට හැකියාවක් නොමැති අතර, අදාළ අලුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කිරීමට කටයුතු කරනු ලබන අතර,	මේ වන විටත් කටයුතු අවසන් කර නොතිබුණි.

				අලුත්වැඩියාව කටයුතු අවසන් වූ වහාම මු.රෙ.104(4) පරීක්ෂණ කටයුතු අවසන් කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.	
06.	වෙනත් රාජ්‍ය ආයතන හා විහාරස්ථාන වෙත මුදාහැර ඇති වාහන 116 ක ලියාපදිංචි අයිතිය නිරාකරණය කර ගැනීම සඳහා ලිපි ලේඛන වර්ෂයකට පෙර භාර දී ඇති නමුත් 2023 අප්‍රේල් මාසය දක්වා ලියාපදිංචි අයිතිය පවරා දී නොතිබුණි.	2022	වාහනවල භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.	අංක: BDN-4409, BDN-4412, DAD-1180, KB-9985 හා PH-2913 දරන රථ වල පැවරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති බවත්, අංක RW-6953 දරන රථයේ පැවරීම් කටයුතු සඳහා අදාළ ලිපි ලේඛන මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත් අනෙකුත් වාහන වල ලියාපදිංචි අයිතිය විධිමත්ව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස නිරන්තරයෙන් අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බවද දන්වා තිබුණි.	මේ වන විටත් ලියාපදිංචිය පවරාදීමේ කටයුතු අවසන් කර නොතිබුණි.
07.	භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට නොහැකි ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් වාහන 51 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පැවැත්ම තහවුරු කර ගැනීමට අසමත් වී තිබුණි. මෙම වාහනවල වටිනාකමක් හෝ සොයා ගැනීමට නොහැකි වී තිබුණි.	2022	අපහරණ කළ යුතු වාහන අපහරණය කිරීම කඩිනම්ව කළ යුතු වීම.	මෙම වාහන වල භෞතික පැවැත්ම අනාවරණය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අතර වාහන 51 අතරින් වාහන 28ක භෞතික පැවැත්ම සනාථ කර ගැනීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු, රක්ෂණ ආයතන, කොම්ප්ට්‍රොලර්	මේ වන විට වාහන 24 ක භෞතික පැවැත්ම තවදුරටත් තහවුරු කරගෙන නොතිබුණි.

				ජනරාල් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධීකරණයෙන් කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	
08.	2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ මු.රෙ.109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනයට අනුව 2014 සිට 2022 කාල පරිච්ඡේදයට අදාළව රු.25,000ට අඩු වාහන අනතුරු සිද්ධි 51ක් සහ රු.25,000ට වැඩි වාහන අනතුරු සිද්ධි 279ක් සම්බන්ධයෙන් කටයුතු අවසන්වී නොතිබීමේ හේතුවෙන් තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනයමින් පැවතුණි. උක්ත වාහන 279 අතරින් වාහන 235 ක තක්සේරුගත අලාභ වටිනාකම එකතුව රු.54,442,331 ක් වූ අතර වාහන 44 ක අලාභය මේ දක්වා ගණනය කර නොතිබුණි.	2022	මුදල් රෙගුලාසි පරිදි කටයුතු සිදු කර අලාභ හානි අයකර ගැනීම හා පොත්පත් වලින් ඉවත් කිරීමට කටයුතු සිදු කළ යුතු වීම.	හදිසි අනතුරුවලට අදාළව මු.රෙ.104 අනුව අලාභයන් ගණනය කිරීම, විමර්ශන කටයුතු හා පරීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.	වාහන අනතුරු 34 ක කටයුතු අවසන් කර ඇති අතර 245 ක අනතුරු පිළිබඳ කටයුතු මේ වන විටත් අවසන් කර නොතිබුණි.
09.	විශ්‍රාම ගිය නිලධාරියකුගෙන් හා උද්‍යාන කම්කරු නිලධාරියකුගෙන් එකතුව රු.259,423 ක දේපල ණය ශේෂය වර්ෂ 5 කට වැඩි කාලයක් මුළුල්ලේ පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	2021	එම	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇති පරිදි විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.7 වගන්තිය යටතේ තනතුර අහෝසි වීම මත විශ්‍රාම ගැන්වීම අනුව ණයකරුට හිමිවන විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.	විශ්‍රාමික රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරියකුගෙන් අයවිය යුතු රු.144,768 ක් මේ වන විටත් අයවී නොතිබුණි.
10.	සේවය අතහැර ගිය නිලධාරීන් හත් දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දින වන විට එකතුව රු.901,198ක ණය ශේෂ අයවිය යුතුව තිබුණි. එම ණය ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය	2021	අප්‍රමාදව හිඟ අත්තිකාරම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	සේවය අතහැර ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.212,639 ක් හිඟහිටි ණය ශේෂ අදාළ ඇපකරුවන්ගෙන්	නිලධාරීන් තිදෙනෙකුගෙන් රු.564,618 ක් මේ වන විටත් අයකර නොතිබුණි.

අවසන් වන විටත් එම ණය ශේෂ අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි.	අයකර අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි නිලධාරීන් තිදෙනාගෙන් අයවිය යුතු එකතුව රු.680,558 ක ණය ශේෂ ඇත.

02. ශීර්ෂය - 002 අග්‍රාමාත්‍ය කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	20,043,516,880	20,043,516,880	20,037,827,606	තත්ත්වාගණනය නොකළ
2022	20,135,804,582	20,135,804,582	20,107,729,177	තත්ත්වාගණනය නොකළ
2023	19,953,480,471	19,953,480,471	19,943,369,205	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	2023 ඔක්තෝබර් 23 දින පැවති ජාතික සමූපකාර ව්‍යාපාරය හා සම්බන්ධ රේඛීය ආයතන ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාල සාකච්ඡාව වෙනුවෙන් අනු කමිටුවක් පත්කොට එමගින් ඉදිරිපත් කරනු ලබන ක්‍රමවේද හා නිර්දේශ ඇතුළත් වාර්තාවට සමගාමීව ඉදිරි වර්ෂ 03 ඇතුළත ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම කටයුත්ත අවසන් කර නොතිබුණි.	2023	රැස්වීම් සාකච්ඡාවල තීරණය කළ කටයුතු කඩිනමින් නිම කළ යුතු වීම.	පසුකාලීනව ඉදිරිපත් වූ තොරතුරු හා විෂයට අදාලව පත්කළ අමාත්‍ය මණ්ඩල අනු කමිටුව ඉන් පසු රැස් වී කළ සාකච්ඡාවල කරුණු මත එම අනු කමිටුව අතුරු වාර්තාවක් කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් සිටී.	මේ දක්වා අනු කමිටු අතුරු වාර්තාව කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
02.	වෙනත් රාජ්‍ය ආයතන සතු වාහන 19 ක් විධිමත් පවරා ගැනීමකින් තොරව වර්ෂ 1 ත් වර්ෂ 8 ත් දක්වා කාල සීමාවක් තුල අග්‍රාමාත්‍ය කාර්යාල කටයුතු සඳහා භාවිතා කර තිබූ අතර එම වාහන කාර්යාලයට පවරා ගැනීමේ කටයුතු 2023 වර්ෂය අවසානය දක්වා නිමකර නොතිබුණි.	2023	වත්කම් වල අයිතිය විධිමත්ව පැවරිය යුතුවීම.	වාහන 05 ක් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ණය පදනම මත ලබාගෙන ඇති බැවින් පවරාදිය නොහැකි අතර දැනට වාහන 04 ක් පවරාගෙන ඇති අතර ඉතිරි වාහන විධිමත්ව පවරා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. එක් රථයක හිමිකාර ආයතනය ඈවර කිරීම හේතුවෙන් අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත පවරා දීම සඳහා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත භාරදී ඇත.	වාහන 13 ක් තවදුරටත් පවරා ගැනීමකින් තොරව භාවිතා කරනු ලැබේ.
03.	කාර්යාලය සතු වාහන 07	2023	එම	අග්‍රාමාත්‍ය කාර්යාලය වෙතින්	මේ දක්වා

	ක් නැවත භාරදීමේ දින වකවානු නිශ්චිතව සඳහන් නොකර වෙනත් ආයතන වෙත තාවකාලිකව පවරා දී තිබුණි.			වෙනත් කාර්යාල වෙත තාවකාලික පදනම මත ලබාදී ඇති වාහන ආපසු භාරදීමට නිශ්චිත දින වකවානු ඒ ඒ ආයතන වෙත මේ වන විට දන්වා යවා ඇත.	වාහන 03 ක් ආපසු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.
04.	Major repair වශයෙන් දක්වා තිබූ වාහන 06 ඇතුළුව කාර්යාලය සතු වාහන 07 කට අදාල හානි වටිනාකම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2023	වාහන අනතුරු තක්සේරු කිරීම් කඩිනමින් සිදුකළ යුතු වීම.	වාහන තක්සේරු කිරීමේ කමිටුව විසින් අදාළ වාහන අලුත්වැඩියා කටයුතු නිම කර ධාවන තත්වයට පත් වීමෙන් පසු වාහන තක්සේරු කර අදාළ වාහන සම්බන්ධයෙන් නව තක්සේරු අගයන් ලබා දීමට කටයුතු කරනු ලැබේ.	මේ දක්වා වටිනාකම තක්සේරු කර නොතිබුණි.
05.	අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු සඳහා භාවිතා කළ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට අයත් රජයේ බංගලා 03 ක් 2022 සැප්තැම්බර් 22 දින සිට අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු සඳහා භාවිතයට නොගෙන පවතී. 2023 වර්ෂය අවසානය දක්වා අදාල අමාත්‍යාංශයට නැවත භාරදී නොතිබුණි.	2023	රජයේ දේපල හැකි උපරිමයෙන් උපයෝජනය කරගත යුතුවීම.	මෙම රජයේ නිවාස තුන 2022.07.22 දින සිට අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් පරිභෝජනය නොකලත් ඒවායේ ආරක්ෂක අංශ සාමාජිකයන් රැඳී සිටි බැවින් ඌණ උපයෝජනය නොවී ඇත. හිඟ කුලී, ජල හා විදුලි බිල්පත් පැවතීම හේතුවෙන් භාරකාරීත්වය පැවරීම ගැටළුකාරී වූ අතර 2024.03.27 දින පැවති සාකච්ඡාවට අනුව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/NSLE/103/13/2022 සහ 2024.04.08 දිනැති ලිපිය අනුව ආරක්ෂක හමුදාවන් වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන මගින් හිඟ බිල්පත් ගෙවීමට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාළ ආරක්ෂක ප්‍රධානීන් වෙත දන්වා ඇත. හිඟ බිල්පත් ගෙවූ පසු නිවාස ද්විත්වයෙහි භාරකාරීත්වය පැවරීමේ කටයුතු සිදු කෙරෙනු ඇත.	එම නිවාසවල හිඟ බිල්පත් මේ දක්වා නිරවුල්කර නොතිබූ අතර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට ආපසු භාරදීමක් සිදුකර නොතිබුණි.
06.	මු.රෙ.104(1) ප්‍රකාරව අලාභය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් අලාභහානි වටිනාකම එකතුව රු.203,181,631 ක් වූ	2022	අලාභ හා හානි පිළිබඳ මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කිරීම කඩිනම් කළ යුතු වීම.	2022 වර්ෂයේදී සිදු වූ දේශපාලන වෙනස්වීම මත ඇතිවූ පරිපාලන ව්‍යුහය වෙනස්වීම හේතුවෙන් මු.රෙ. 104 පරීක්ෂණ සඳහා පත්කළ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු වී ඇති අතර, නැවත එම	මේ දක්වා වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

	2022 වර්ෂයේ සිදුවී ඇති වාහන අනතුරු 08 ක් සම්බන්ධයෙන් 2023 අප්‍රේල් 17 විගණිත දිනය වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.			කමිටු සඳහා නිලධාරීන් පත් කිරීමට කටයුතු යොදා ඇති බවත් දන්වා තිබුණි.	
07.	2020 අගෝස්තු 28 දිනැති අංක. 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පොදු 47 ආකෘතිය යටතේ, භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට ප්‍රථම සුදුසු පරිදි කටයුතු කර, නිම කළ යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂයට අදාළව භාවිතයට ගත නොහැකි භාණ්ඩ අයිතම 905 ක් සම්බන්ධව කටයුතු 2022 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි.	2021	භාවිතයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධව විධිමත් පරිදි නොපමාව කටයුතු කළ යුතු වීම.	රට තුළ පැවති උග්‍ර ඉන්ධන හිඟය නිසා නියමිත කාල වකවානු තුළ අපහරණ කටයුතු සිදු කිරීමට අපහසු තත්ත්වයන් ඇති විය.	භාණ්ඩ අයිතම 88 ක් සම්බන්ධව මේ දක්වා අදාල කටයුතු නිම කර නොතිබුණි.

03. ශීර්ෂය - 004 උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	611,913,114	-	611,913,114	තත්ත්වාගණනය කළ
2022	611,558,512	-	611,558,512	තත්ත්වාගණනය කළ
2023	613,660,859	-	613,660,859	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මුදල් රෙගුලාසි අංක 103 (1) (ආ) සහ 104(3)(4) ප්‍රකාරව හදිසි අනතුරු සම්බන්ධයෙන් පොලිසියට වාර්තාකර ඒ සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ පවත්වා නොතිබුණි.	2023 2021	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය .	ඉදිරියේදී අනතුරු පොලීසිය වෙත දැනුම් දෙන ලෙස සහ මු.රෙ.103(1)(ආ) ප්‍රකාරව පරීක්ෂණයන් සිදුකළ අධිකරණ රෙජිස්ට්‍රාර්වරිය ස්ථාන මාරුවීම නිසා පරීක්ෂණ කටයුතු අඩාල වුව ද, මේ වන විට සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.	මේ වන විට අනතුරු සම්බන්ධයෙන් පොලීසිය දැනුවත් කර වාර්තාවක් ලබා ගැනීම සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව පරීක්ෂණයන් මේ වන විට අවසන් කර ඇත.
02	2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (i) ඡේදය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවෙන් හා අධිකරණ අමාත්‍යාංශයෙන් ලබාදී ඇති වාහන 07 ක් වාර්තාවේ දින වන විටත්, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	දැනටමත් වෙනත් ආයතන විසින් ලබාදී ඇති වාහන විධිමත්ව ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව දන්වා තිබුණි.	ඒ සඳහා ඉල්ලීම් කර ඇතත්, අධිකරණ අමාත්‍යාංශය මගින් තවමත් අනුමැතිය ලැබී නොමැත.
03	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවේ පාලක මණ්ඩලය විසින්	2021 2022 2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව කටයුතු කළ	මෙම වැය ශීර්ෂයට අදාළ කාර්ය මණ්ඩලය උපරිමාධිකරණ විනිශ්චයකාරවරුන් 37 දෙනෙකු වන අතර, සාමාන්‍ය පරිපාලන වියදම් පමණක් ඇතුළත්ව	2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක

පත් කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු නමුත්, උපරිමාධිකරණ විනිශ්චයකාරවරුහි අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුළත් කර නොතිබුණි. තව ද, 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙහි 03 ඡේදය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ/ ගණන්දීමේ නිලධාරියාගේ සෘජු අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I පන්තිය නිලධාරියෙකුගේ ප්‍රධානත්වය දරන අභ්‍යන්තර විගණන අංශයක් සියලුම විශේෂ වියදම් ඒකක සඳහා ස්ථාපිත කළ යුතු නමුත්, උපරිමාධිකරණ විනිශ්චයකාරවරුහි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.	යුතු ය.	ඇත. මේ සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු අභ්‍යන්තර විගණන නිලධාරියෙකු ලෙස අධික පිරිවැයක් දරා පත් කරගැනීම ප්‍රායෝගික නොවන බව රජයේ විගණන අංශය සමඟ ද, කළමනාකරණ විගණන කමිටු රැස්වීමේදී ද සාකච්ඡාවට භාජනය විය. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීමක් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	කළමනාකරණ විගණන වාර්තාවේ නිර්දේශ පරිදි ශීර්ෂ 4 සඳහා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඡේද අංක 40(1) ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා එම දෙපාර්තමේන්තුවේ පාලක මන්ඩලය විසින් පත් කරනු ලබන තම දෙපාර්තමේන්තුවටම අයත් අභ්‍යන්තර විගණකවරයකු සිටිය යුතු බව නිර්දේශ කර තිබුණද, ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ අනුමත සේවා ගණයක් ලෙස මෙම තනතුර මෙතෙක් කල් නොපැවති බව සඳහන් කරමි. ඒ හේතුවෙන් මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, යථා කාලයේදී එම තනතුරු පිහිටුවීම සිදු කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

04. ශීර්ෂය - 016 පාර්ලිමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	17,487,530,058	14,011,729	17,473,518,329	තත්ත්වාගණනය නොකළ
2022	17,498,973,563	6,922,108	17,492,051,455	තත්ත්වාගණනය නොකළ
2023	21,962,618,223	4,860,606	21,957,757,618	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාගේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව යාවත්කාලීනව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කර වාර්තාව ඉදිරි වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මෙම වාර්තාවේ දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තාව වර්ෂ 2 ක කාලපමාවකින් පසු 2023 අප්‍රේල් 12 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	2023	චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා නියමිත දිනට ඉදිරිපත් කළ යුතුය.	2022 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණය පවත්වා වාර්තාවල තීරණ ක්‍රියාත්මක කර අවසන් වූ පසු විගණකාධිපති වෙත පිටපත් ලබාදීමට සහ 2023 වසර සඳහා භාණ්ඩ සමීක්ෂණ සති අන්ත දිනයක පවත්වා දින දෙකක් ඇතුළත නිම කිරීමට උපදෙස් ලබා දී ඇත.	වාර්තාවේ දින දක්වාම භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නැත.
02	2017 මැයි 04 දිනැති අංක 02/2017 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සහ 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/පුස/1(2016-සංශෝධිත) දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 වගන්තිය අනුව, පාඨකයන්ගේ පරිහරණය සඳහා පුස්තකාලවලට අත්පත්	2023	චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතුය.	9 වැනි පාර්ලිමේන්තුව අවසන් වනවිට ලැබෙන කාලපරාසය තුළ පුස්තකාලයේ පොත් සඳහා වාර්ෂික සමීක්ෂණයක් පැවැත්වීමට සැලසුම්කර ඇත.	වාර්තාවේ දින දක්වාම භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නැත.

	කර ගන්නා ලිඛිත, මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය හා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ඇතුළත් පුස්තකාල ද්‍රව්‍ය, සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ අනිවාර්යයෙන් පැවැත්විය යුතු වුවත්, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ පුස්තකාලය සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ පවත්වා නොතිබුණි.				
03	2020, 2021 සහ 2022 වර්ෂයන්හි විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාවල 3.4 සහ 3.5 ඡේදවල දැක්වෙන 2018 පෙබරවාරි 15 දිනැති අංක 01/2018 දරන, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 1.2 ඡේදය හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් පාර්ලිමේන්තු මහලේකම් වෙත නිකුත් කර තිබූ, අංක TIP/SS/01/84 හා 2019 අප්‍රේල් 25 දිනැති ලිපියට අනුව පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය වෙත සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන සහ උපදෙස්වලට පටහැනිව, ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර නොතිබුණු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකුට (බලපත්‍රය හිමි තනතුරට අදාල සක්‍රීය සේවා කාලය මාස 02 ත් වර්ෂ 01 ත් අතර) සහනදායී මෝටර් වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විගණනය විසින් 2019 වසරේදී ඉදිරිපත් කරන ලද නිරීක්ෂණයන් සමඟ පාර්ලිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් දීර්ඝ කාලයක සිට භුක්ති විඳිමින් පැවති මෙම වරප්‍රසාදය තාවකාලිකව අත්හිටුවා ඇත. මේ වනවිට පාර්ලිමේන්තුවේ කාර්යය මණ්ඩලය 6/2006 චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුව ස්ථානගත කිරීම පිණිස උපදේශකවරයෙකුගේ සහාය ඇතිව යෝජනාවලියක් සකසා ඒ සඳහා අදාළ අනුමැතියට යොමු කිරීමට සැලසුම් කරඇත.	අදාළ අනුමැතියට යොමු කිරීමට සැලසුම්කොට ඇත.

05. ශීර්ෂය - 201 බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	250,513,093	65,000	250,448,093	තත්ත්වාගණනය කළ
2022	284,776,164	1,384,111	283,392,053	තත්ත්වාගණනය නොකළ
2023	312,767,569	2,263,498	310,504,071	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1647 (ආ) සහ 128(ඊ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන හා ඊට අදාළ උපකරණ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	මේ සඳහා 2024 වර්ෂයේ දී වාහන සමීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති බව.	වර්තමානය වන විටත් වාහන සමීක්ෂණය සිදු කර නොතිබුණි.
02	1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 4(1) වගන්තිය යටතේ පාලනය වන සිද්ධස්ථාන 254 න් සිද්ධස්ථාන 211 ක අනුමාන අයවැය වාර්තා ද, සිද්ධස්ථාන 244 ක අර්ධ වාර්ෂික ආදායම් වියදම් වාර්තා ද, ගෙන්වා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.	2023	පනතේ විධිවිධාන ප්‍රකාරව අනුමාන අයවැය වාර්තා සහ අර්ධ වාර්ෂික ආදායම් වියදම් වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ.	අයවැය වාර්තා ගෙන්වා ගැනීමට සිහිකැඳවීම් ලිපි යොමු කර ඇති බවත් 2024 වසරේ සිට මේ සම්බන්ධ අඩුපාඩු මග හරවා ගනිමින් සිද්ධස්ථාන වෙතින් අයවැය වාර්තා ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා මෙන් අදාළ අංශ ප්‍රධානියා දැනුවත් කර ඇති බවත් දන්වා තිබුණි.	සිද්ධස්ථාන 254න් 2024 වර්ෂයේ අනුමාන අයවැය වාර්තා 218ක්ද අර්ධ වාර්ෂික අයවැය වාර්තා 181 ක් ද ලබා ගෙන ඇති අතර මෙතෙක් අයවැය වාර්තා ලබා දී නොමැති සිද්ධස්ථාන සඳහා සිහි කැඳවීම් ලිපි යොමු කර ඇත.
03	කැලණිය ඊරියවැටියේ දස සිල් මාතා මූලස්ථානය ඉදි කරන ලද ඉඩම, 2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම	2021 2022 2023	ගොඩනැඟිල්ල ඉදි කර ඇති අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ.	ඉඩම් අත්පත් කර ගැනීම සම්බන්ධව පිළියෙල කරන ලද හත්වන වගන්තිය යටතේ දැන්වීම දෙමළ හා ඉංග්‍රීසි	වර්තමානය වන විට ද පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

නායක ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත දැනුම් දී වර්ෂ 11 කට වැඩි කාලයක් ගත වුව ද මෙතෙක් ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කර ගෙන නොතිබුණි.	භාෂාවන්ට පරිවර්තනය කර මේ වන විට රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා රජයේ මුද්‍රණාලය වෙත බාර දී ඇති බව කැලණිය ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම් දී ඇති බව දන්වා තිබුණි.

06. ශීර්ෂය - 202 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	363,840,943	18,462,916	345,378,027	තත්ත්වාගණනය නොකළ
2022	365,997,757	18,696,341	347,301,416	තත්ත්වාගණනය කළ
2023	367,334,927	172,000	367,162,927	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 128 (1) (ඉ) හා 1647 (ආ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් සත්‍යෙක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් සත්‍යෙක්ෂණයක් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.	දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් 2024 සැප්තැම්බර් 30 දින වන විට ද සත්‍යෙක්ෂණයක් සිදු කර නොතිබුණි.
02	දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මඟින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 876 (3) ප්‍රකාරව අරමුදල පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය සලකා බලා නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	හජ් අරමුදල නිත්‍යානුකූල පනතක් මගින් පිහිටුවාලිමට වන ක්‍රියාමාර්ග මේ වන විට අමාත්‍යංශය හා එක්ව සිදු කරනු ලබයි.	හජ් අරමුදල නීතිගත කිරීමට අදාළ පනත් කෙටුම්පත සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.
03	දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන වකුෆ් අරමුදලට අදාළ 1982 අංක 33 දරන වකුෆ් පනතේ 45 වගන්තිය ප්‍රකාරව මුස්ලිම් ජාතිකයින්ගේ හා ඉස්ලාම් ආගමෙහි අභිවෘද්ධිය සඳහා ඉටු කළ යුතු කාර්යයන් 5න් එක් කාර්යයකට අදාළ එක් වැඩසටහනක් පමණක්	2022 2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	වකුෆ් පනත පරිදි මුස්ලිම් ජාතිකයන්ගේ හා ඉස්ලාම් ආගමේ අභිවෘධිය සඳහා ඉටුකල හැකි කාර්යන් 5, ඉටුකිරීම සඳහා වකුෆ් සභාවේ	ඉස්ලාම් ආගමේ අභිවෘද්ධිය සඳහා පහත සඳහන් ව්‍යාපෘති යෝජනාවන් සකස්කර වකුෆ් සභාවේ අනුමැතිය සඳහා 2024 අගෝස්තු 01 දින ඉදිරිපත්

ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේදී රු.161,500ක මුදලක් පමණක් වැය කර තිබුණු අතර අරමුදලේ වැටුප් හා දීමනා සඳහා වැය කළ මුදල රු.2,518,027ක් හෙවත් මුළු වියදමෙන් සියයට 93 ක් විය. අරමුදලේ අරමුණු නිසි අයුරින් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදල සතු මුදල් ප්‍රමාණය රු.79,538,421 ක් විය.	අවධානය යොමුකර අධ්‍යාපන වැනි ක්ෂේත්‍රවල අභිවෘධිය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට හා ඉදිරියේදී ඉතිරි අංශ සම්බන්ධයෙන්ද අවධානය යොමු කරන බව.	තිබුණි. 1.මුස්ලිම් පල්ලිවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. වකුෆ් පනතේ 45 (A) අනුව දිස්ත්‍රික් 25 ක පිහිටි පල්ලි 25 ක් තෝරාගෙන එක් පල්ලියක් වෙනුවෙන් රු.500 000 බැගින් ලබා දීම. 2. මෘත ශරීර දෝවනය කිරීමේ (Bath Tub) මෙවලමක් ලබාදීම වකුෆ් පනතේ 45 (b) සහ (e) අනුව මොනරාගල, බදුල්ල, හම්බන්තොට, අනුරාධපුර වන දිස්ත්‍රික්කවල පිහිටි දුෂ්කර පල්ලි 10ක් සඳහා රුපියල් 200 000 ක් ලබා දීම 3.අරාබි විදුහල් සංවර්ධනය කිරීම වකුෆ් පනතේ 45(c) අනුව දිවයිනේ පිහිටි අරාබි විදුහල්වල අධ්‍යාපනය වැඩිදියුණු කිරීම හා යටිතල පහසුකම් සැපයීම

07. ශීර්ෂය - 203 ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	34,772,613	4,600	34,768,013	තත්ත්වාගණනය නොකළ
2022	35.884,054	5,025	35,879,029	තත්ත්වාගණනය නොකළ
2023	34,781.406	4,000	34,777,406	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	ගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මරදමඩු දේවස්ථානයේ වන්දනා ගෘහය 2017 වර්ෂයේ ඉදිකර නිම කිරීමට අපේක්ෂා කර තිබුණ ද, 2017 වර්ෂයේදී රු.මිලියන 2.5 ක් වැය කර ගොඩනැඟිල්ලේ පාදම සහ කණු පමණක් ඉදි කර වර්ෂ 06 ක් ගත වී තිබුණද ඉදිකිරීම් කටයුතු නිම කර නොතිබුණි.	2021 2022 2023	සැලසුම් කළ පරිදි ව්‍යාපෘති අවසන් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.	2024 අයවැය මගින් ලද රු. මිලියන 5 ක ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර ඊට අදාලව මේ වන විට මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.	2024.02.21 දින මන්නාරම දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කර ඇති අතර මේ වන විට මෙම සංවර්ධන කටයුත්තෙහි 90% ක පමණ වැඩ අවසන් වී ඇත. ඉතිරි ඉදිරි කටයුතු සඳහා මන්නාරම දිස්ත්‍රික් ලේකම් වෙතින් 2025 වසරට අදාලව ඇස්තමේන්තු කැඳවා ඇත.
02	කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2006 වර්ෂයේදී ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවට පවරා තිබුණු තලවිල චාරිකා නිවාසය පිහිටි ඉඩමේ අයිතිය පවරා ගැනීමට 2023 වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.	2022 2023	අදාළ ඉඩමේ අයිතිය පවරා ගැනීමට නොපමාව කටයුතු කළ යුතු වේ.	අදාළ ඉඩම දෙපාර්තමේන්තුව වෙත පැවරිම කල්පිටිය ප්‍රාදේශිය ලේකම් විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත නිර්දේශ කර ඇති අතර පැවරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව.	ඉඩම පැවරීම සඳහා ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කිරීම සිදු කර තිබුණි.
03	දහම් පාසැල් ගුරුවරුන්ට දීමනා, නිල ඇඳුම් වැනි අනුග්‍රහයන් ලබාදීමේදී ලියාපදිංචිය සම්බන්ධයෙන් සලකා බැලුව ද, පවත්නා	2023	පනත අනුමත කර ගැනීමේ කටයුතු කඩිනම් කළ	ක්‍රිස්තියානි දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමට ක්‍රමවේදයක් නොමැති අතර	කතෝලික දේවස්ථාන ලියාපදිංචිය බොහෝ දුරට අවසන් කර ඇති අතර, නව ලියාපදිංචි කිරීම් පැවති

කතෝලික හා ක්‍රිස්තියානි දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොමැති අතර ඒ සම්බන්ධයෙන් අදාළ දේවස්ථාන හා ආගමික මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම සඳහා කෙටුම්පත් කර ඇති පනත අනුමත කර ගැනීමටද කටයුතු කර නොතිබුණි.	යුතු වේ.	කෙටුම්පත් කර ඇති පනත අනුමත කිරීමට ඇති ගැටලුකාරී තත්ත්වයන් නිසා අමාත්‍යාංශය විසින් විද්වත් කමිටුවක් මගින් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදයක් සකසමින් පවතී. ඒ සඳහා අවශ්‍ය අයදුම්පත් සහ කොන්දේසි සකස් කර අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලද වහාම ලියාපදිංචි කිරීම් ආරම්භ කිරීමට නියමිතයි.	ක්‍රමවේදයටම සිදු කරමින් පවතී.ක්‍රිස්තියානි දේවස්ථාන ලියාපදිංචි කිරීම සඳහා මේ වන විට අමාත්‍යාංශ අනුමැතිය ලැබී ඇති බැවින් 2024 ඔක්තෝබර් මස 01 දින සිට ලියාපදිංචි කිරීමේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

08. ශීර්ෂය - 204 හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	176,523,683	1,041,122	175,482,561	තත්ත්වාගණනය නොකළ
2022	175,613,432	2,081,436	173,531,996	තත්ත්වාගණනය කළ
2023	175,141,189	446,811	174,694,378	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.5, 4.4, 4.5, 4.6 සහ 6.3 උප වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් වසරක කාලයක සිට අය විය යුතුව පවතින රු.220,300ක ආපදා ණය ශේෂය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් වසර 29 කට අධික කාලයක සිට අය විය යුතුව පවතින රු.46,462 ක ණය ශේෂ අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021 2022 2023	හිඟහිටි ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ.	සේවයෙන් විශ්‍රාම ලැබූ නිලධාරියෙකුගෙන් අය විය යුතු ආපදා ණය ශේෂය වූ රු.220,300 ක් වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇති බවත් රු.46,462 ක ණය ශේෂය කපා හැරීමට ඉල්ලීම් කර ඇති බව.	වර්තමානය වන විටත් ණය ශේෂ අය කර ගෙන නොතිබුණි.
02	2022 (2023) වර්ෂය සඳහා වූ ජාතික නිර්මාණ තරගාවලියේ දහම් පාසැල් මට්ටම, ප්‍රාදේශීය මට්ටම දිස්ත්‍රික්ක මට්ටම සහ ජාතික මට්ටමට අදාළ තරඟ රු. 4,310,630 ක වියදමකින් 2023 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ පවත්වා, ප්‍රතිඵල නිකුත් කර තිබුණ ද, ඊට අදාළ සහතික සහ ත්‍යාග ප්‍රදානයන් 2024 සැප්තැම්බර් 30 වන දින වන විටත් සිදු කර නොතිබුණි.	2023	තරගාවලියට අදාළ සහතික සහ ත්‍යාග ප්‍රදානයන් කඩිනමින් සිදු කළ යුතු වේ.	සහතික සහ ත්‍යාග ප්‍රදානයන් 2024 අගෝස්තු මස පවත්වනු ලබන බව.	2024 සැප්තැම්බර් 30දින වන විටත් සහතික සහ ත්‍යාග ප්‍රධානයන් සිදු කර නොතිබුණි.

09. ශීර්ෂය - 205 **මහා භාරකාර දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	45,114,216	-	45,114,216	තත්ත්වාගණනය නොකළ
2022	46,625,411	-	46,625,411	තත්ත්වාගණනය කළ
2023	65,636,246	-	65,636,246	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස්වල භාරකාරිත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් වුවද එම කාර්යය දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු නොලබන අතර කාර්යසාධන දර්ශකයක් ලෙස හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.	2021 2023	කාර්යභාරය අනුව කාර්යසාධන දර්ශක හඳුනාගත යුතුය.	ඉදිරියේදී කාර්යසාධන දර්ශකයන්ට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද කාර්යසාධන දර්ශකයන්ට ඇතුළත් කර නොතිබුණි.
02	මියගිය පුද්ගලයන් 144 ක් වෙනුවෙන් යැපෙන්නන්/නීත්‍යානුකූල උරුමකරුවන් වෙත 2023 දෙසැම්බර් 31 දිනට ගෙවීමට ඇති විදේශ වන්දි මුදල රු.122,303,680 ක් වුවද වන්දිලාභීන් හඳුනා ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි.	2023	අදාළ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන් වෙත අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතුය.	හඳුනාගැනීමට නොහැකිව පවතින විදේශ වන්දිලාභීන්ගේ ලැයිස්තු පුවත්පත් දැන්වීම් පළකර හඳුනාගැනීමට උත්සහ දරා ඇති අතර එහි දී එක් අයෙක් හඳුනාගත් අතර එකී වන්දි මුදල් මුදාහැරීම පිළිබඳව ඉදිරි කටයුතු සිදුකර ඇති බව සහ අනෙකුත් වන්දි මුදල් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් මාර්ගයෙන් තොරතුරු ලබාගැනීම සඳහා කටයුතු සිදුකරමින්	2024 සැප්තැම්බර් 30 දින වන විට ද වන්දිලාභීන් හඳුනාගෙන නොතිබුණි.

				පවතින බව.	
03	වයස අවුරුදු 18 සම්පූර්ණ වන තෙක් ස්ථාවර තැන්පතුවල තැන්පත් කර ඇති බාලවයස්කාර යැපෙන්නන් 507කට අදාළව 2022 දෙසැම්බර් 31 වන විට පැවති රු.271,744,562 ක් වූ ස්ථාවර තැන්පතුවලින් 404 දෙනෙකුගේ උපන් දිනය හඳුනා ගැනීමටත්, උපන් දිනය හඳුනාගත හැකි අවුරුදු 18ට වැඩි බාලවයස්කරුවන් 21 දෙනෙකු වෙනුවෙන් එකතුව රු. 687,012 ක් වූ විදේශ වන්දි මුදල් ගෙවීමටත් කටයුතු කර නොතිබුණි.	2023	අදාළ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන් වෙත අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතුය.	බාලවයස්කරුවන්ගේ තැන්පතු පිළිබඳව පරීක්ෂාකර බලා වයස අවු.18 සම්පූර්ණ වූ අය හඳුනාගෙන ඒ අය ලිඛිතව දැනුවත් කර ස්ථාවර තැන්පතු නිදහස් කර නොමැති අය ගේ ස්ථාවර තැන්පතු නිදහස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද අදාල වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණි.
04	1998 සිට 2004 දක්වා නොගෙවූ විදේශ වන්දි ලෙස හඳුනාගෙන තිබූ රු.2,196,364 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කර තිබූ අතර 2004 වර්ෂයේදී එකතුව රු.539,090 ක් වූ වන්දි මුදල් නීත්‍යානුකූල උරුමකරුවන්ගේ විස්තර ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ගෙවීමට නොහැකි වී තිබුණ ද ඒවාට අදාළ තොරතුරු ගෙන්වා ගැනීමටත්, ඊට අදාළ ලිපිගොනු සහ තොරතුරු යාවත්කාලීනව විධිමත් පරිදි පවත්වා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.	2023	ලිපිගොනු සහ තොරතුරු යාවත්කාලීනව විධිමත් පරිදි පවත්වාගෙන යාමට සහ විදේශ වන්දි, නීත්‍යානුකූල උරුමකරුවන් වෙත අප්‍රමාදව ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.	විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශයෙන් මේ පිළිබඳව ලිඛිතව විමසා ඉදිරි කටයුතු සිදු කරන බව හා ලිපිගොනු යාවත්කාලීන කිරීමට උපදෙස් ලබා දී ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද ලිපිගොනු යාවත්කාලීන කර වන්දි මුදල් ගෙවීම සිදු කර නොතිබුණි.
05	1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම් (විශේෂ විධි විධාන) පනත මගින් ලේක්හවුස් ආයතනය රජයට පවරා ගැනීමේදී රජය වෙනුවෙන් කොටස් දැරීම සඳහා මහා	2023	භාණ්ඩාගාරයේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.	භාර/බුදල් ගිණුම්වල හෙළිදරව් කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද අදාළ හිමිකාරිත්වය සහ උපයන ලාභාංශ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ භාර/බුදල් ගිණුම්වලට

	භාරකාරවරයා නම් කර තිබුණු අතර රජය වෙනුවෙන් මහා භාරකාරතැන විසින් එම සමාගමේ සාමාන්‍ය කොටස් 3,050.379ක් එනම් සියයට 87.5ක හිමිකාරිත්වයක් ලබාගෙන තිබුණි. එසේ වුවද, ඒ සම්බන්ධව හා ඒ මත උපයන ලාභාංශ සම්බන්ධව දෙපාර්තමේන්තුවේ භාර/බූදල් ගිණුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.				ඇතුලත් කර නොතිබුණි.
06	මහාභාරකාර දෙපාර්තමේන්තුව යටතේ පවතින පෞරාණික වටිනාකමකින් යුත් කළුතර පළාතොට පිහිටි රිච්මන්ඩ් කාසල් ගොඩනැඟිල්ල, නිසි කාලය තුළ විධිමත් පරිදි නඩත්තු කටයුතු සහ අළුත්වැඩියාවන් සිදු නොකිරීම හේතුවෙන් වහලයෙන් ජලය කාන්දුවී බිත්තිවලට හානි සිදුවී තිබුණු අතර ඇතැම් ස්ථාන පෞරාණිකත්වයට නොගැළපෙන ආකාරයට අළුත්වැඩියාවන් සිදු කර ඇති බවට නිරීක්ෂණය විය. ඒ අනුව නැවත අළුත්වැඩියාවක් සිදු කිරීම සඳහා 2023 අගෝස්තු මාසයේදී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානයෙන් තත්ත්ව වාර්තාවක් ලබා ගෙන තිබුණ ද අරමුදල් සපයා ගැනීමේ නොහැකියාව මත අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකිව තවදුරටත් මන්දිරයට හානි සිදුවෙමින් පැවතුණි.	2022 2023	මන්දිරයේ පෞරාණිකත්වය ආරක්ෂා වන අයුරින් කඩිනමින් අළුත්වැඩියාව සිදු කළ යුතුය.	අරමුදල් සම්පාදනය කර ගැනීමේ නොහැකියාව මත අදාළ ඇස්තමේන්තුව ලබා ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත් අදාළ අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් මේ වන විට අවධානය යොමු කර ඇති අතර ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ශ්‍රම දායකත්වය යොදා ගනිමින් පුරා විද්‍යා බලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඉදිරි වර්ෂ කිහිපය තුළ මූලික නවීකරණ කටයුතු පෞරාණිකත්වයට හානියක් නොවන ආකාරයට සිදු කිරීමට බලාපොරොත්තු වන බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

07	හැරී හපුගොඩ බුදලයට අයත් සුදුවැලිපොත වත්තෙහි අන්කුදුව නමැති බිම කොටසෙහි අක්කර 13.5 ක පමණ රබර් වගාකළ ඉඩමෙහි නැවත පැළ වගාවන් සිදු කළ යුතුව පවතින බව නිරීක්ෂණය විය. මෙම වත්තෙහි පවතින අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ද දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, ඉහත සඳහන් වත්තෙහි පිහිටි වතු බංගලාව කඩිනමින් පිළිසකර කිරීමක් අවශ්‍ය බවද නිරීක්ෂණය විය.	2022	නැවත වගා කිරීම සඳහා රජයේ සහනාධාර ලබා ගැනීමේ හැකියාව සලකා බැලීම හා අනවසර ඉදිකිරීම් පවතින වතුවල මැනුම් කටයුතු සිදුකර අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නෛතික පියවර ගැනීමට කටයුතු කළ යුතු වීම.	හැරී හපුගොඩ බුදලයට අයත් අන්කුදුව නමැති අක්කර 13.5 ක ඉඩමේ පැරණි රබර් වගාව වර්ෂයේ මිල ගණන් කැඳවා අලෙවි කිරීම සිදු කර ඇත. මුදල් තත්ත්වය අයහපත් මට්ටමක පවතින බැවින් නැවත වගා කටයුතු සඳහා අරමුදල් සපයාගැනීමේ ගැටලුවක් මතුවී ඇති බව සහ ඉදිරියේදී මෙම ඉඩම සංවර්ධනය කිරීම හෝ බදු පදනම මත ලබා දීමට කටයුතු කරනු ලැබ ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන නොතිබුණි.
08	ඩී. ජේ. ඩී. ජේ. අබේසේකර බුදලයට අයත් ගාල්ල ඇල්පිටිය ප්‍රදේශයෙහි පිහිටි කඩකාමරයක් හා ඉඩමක් වසර 20කට වැඩි කාලයක සිට ගිවිසුම්වලින් තොරව බදු දී තිබූ අතර රු. 1,100,000 ක් ලෙස තක්සේරු කරන ලද මෙම කඩ කාමරය වෙනුවෙන් 2018 මැයි දක්වා රු. 227,380 ක් ද, ඉඩම සඳහා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 143,400 ක් ද වශයෙන් බදු කුලී අයවිය යුතු බව ගණනය කර තිබුණද බදු කුලී අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	2022	බාහිර පාර්ශවයන්ට බුදල් දේපල බදු පදනමින් ලබා දීමේදී දේපලවල ආරක්ෂාවත්, ඉන් සාධාරණ ආදායමක් ලැබීමත් තහවුරු කිරීම සඳහා විධිමත් බදු ගිවිසුම්වලට එළඹිය යුතු බව හා බදු පැහැර හැර ඇති දේපල නැවත ලබා ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු කළ යුතු වීම.	මෙම බුදලයට අයත් තක්සේරු වටිනාකම රු.2,300,000 ක් වූ ඉඩම මේ වන විට විකුණා ඇති බව සහ රු.1,100,000 ක වටිනාකමකින් යුතු කඩකාමරයෙහි බදු කුලී නොගෙවා රැඳී සිටීම වෙනුවෙන් එන්තරවාසි යවා ඇති බව. එයට පිළිතුරු ලෙස අවු. 1 ½ ක් ඇතුළත මිලදී ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති බව සහ ඒ සම්බන්ධයෙන් නීති උපදෙස් ගැනීමට කටයුතු ආරම්භ කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින වන විට ද බදු කුලී අය කර ගැනීමට හෝ දේපල නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

10. ශීර්ෂය - 206 සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,399,485,573	14,785,786	1,384,699,787	තත්ත්වාගණනය කළ
2022	1,455,982,029	14,230,074	1,441,751,955	තත්ත්වාගණනය කළ
2023	1,457,232,320	16,620,759	1,440,611,561	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2, 4.5, 4.6 හා 6.3 වගන්ති ප්‍රකාරව මියගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 54 ක ගෙන් අයවිය යුතු වසර 05 ක් ඉක්මවා ඇති රු. 846,073 ක් වූ හිඟ හිටි ණය ශේෂ අය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021 2022 2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	හිඟහිටි ණය ශේෂ ආවරණය කර ගැනීම සම්බන්ධයෙන් 2023 වර්ෂය තුළදී මෙන්ම මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි.	වර්තමානය වන විටද විගණකාධිපති නිර්දේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
02	ජාතික විගණන පනතේ 40(1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයකු පත් කර අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට සමාලෝචිත වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තුව සඳහා වන අනුමත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුර හා ගණකාධිකාරි තනතුරෙහි පවතින පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට අවස්ථා ගණනාවකදී ඉල්ලීම් කර ඇති බව	ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මේ දක්වා කටයුතු කර නොතිබුණි.
03	ජෝන් ද සිල්වා සමරු රඟහල නවීකරණය කර සංවර්ධනය කිරීමේ අදියර I ට අදාළව කොන්ත්‍රාත්කරු විසින් වසර 03 ක කාල ප්‍රමාදයක් සහිතව එනම් 2018 නොවැම්බර් 24 දින ඉදිකිරීම් කටයුතු අවසන් කර ගොඩනැගිල්ල භාර දී තිබුණ ද, ප්‍රමාද ගාස්තු ලෙස අයකරන ලද රු.38,658,734 ක	2022 2023	කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුවට කරුණු යොමු කර ඇති අතර ඉදිරියේදී ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානය වෙතද දෙපාර්ශවය කැඳවීමට නියමිත බව	විගණකාධිපති නිර්දේශ ප්‍රකාරව මුදල් අයකර ගෙන නොතිබුණි.

මුදල නිසි අනුමැතියකින් හා සාධාරණ කරුණු තහවුරු කර ගැනීමකින් තොරව නැවත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර එම මුදල නැවත ගෙවන ලෙස 2021 මැයි 10 දින කොන්ත්‍රාත්කරුට දැනුම් දී තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම එම මුදල අය කර ගෙන නොතිබුණි.

11. ශීර්ෂය - 207 පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,218,913,630	72,698,078	1,146,215,552	තත්ත්වාගණනය කළ
2022	1,239,275,064	73,043,253	1,166,231,811	තත්ත්වාගණනය කළ
2023	1,246,197,676	55,620,907	1,190,576,769	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් රු. 911,500,000 ක් වූ ඉඩම් සහ රු.138,320,748 ක් වූ ගොඩනැගිලි, 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දේපළෙහි අයිතිය පවරා ගැනීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි.	2023	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කිරීම් කර නොමැති බව හඳුනාගත් අතර එම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි ඉදිරි කටයුතු සිදු කිරීම.	දේපළ පවරා ගැනීමේ කටයුතු අවසන් කර තිබුණි. වත්කම් තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා තිබුණි.
02	ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා වූ පුරාවිද්‍යා නිර්දේශය පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 ජූනි 01 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය ප්‍රකාරව 2018 ජූනි 01 දින සිට වාර්ෂිකව ලබාදුන් නමුත්, 2020 මාර්තු 05 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දිගුකාලීනව නිර්දේශ ලබාදීම හේතුවෙන් පුරා සාධක	2023	ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා පුරාවිද්‍යා නිර්දේශ ලබාදීමේදී පසුවිපරම් කිරීම අත්‍යාවශ්‍ය වීම හා අදාළ අභ්‍යන්තර චක්‍රලේඛ කාලීනව සංශෝධනය කර අවශ්‍ය කොන්දේසි	ඛනිජ හා පාෂාණ නිස්සාරණය සඳහා බලපත්‍රදිගු කාලීනව ලබා දීම කැබිනට් තීරණයක් මත සිදු කෙරුණි.වාර්ෂිකව නිර්දේශ ලබා දීම සඳහා ආදායමට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම හේතුවෙන් වාර්ෂිකව බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදයක් සැකසීම පිළිබඳ අවධානය යොමු නොකරන ලදි.	දිගුකාලීනව නිර්දේශ ලබාදීම හේතුවෙන් පුරා සාධක පිළිබඳ තොරතුරු අනාවරණය නොවීම මත හානිය වැළැක්වීම අරමුණු කරගෙන අමාත්‍ය මණ්ඩල සංදේශය සංශෝධනය කිරීම සඳහා නව අමාත්‍ය මණ්ඩලය වෙත කෙටුම්පත ඉදිරිපත් කිරීමට නියමිත බව

	පිළිබඳ තොරතුරු අනාවරණය නොවීම මඟින් පුරාවස්තුවලට හානි සිදුවිය හැකි වීමත්, කාර්ය මණ්ඩලය හා ප්‍රවාහන පහසුකම් වල ඌනතාවයන් නිසා නැවත පරීක්ෂා කිරීම් සිදු නොවීමත් කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.		ඇතුළත් කළ යුතුය.		දන්වා තිබුණි.
03	නාගතාම්බ්‍රාන්, වවුනිකුලම්, සිවපුරම් ශ්‍රීමලේ කෝවිල යන හඳුනාගන්නා ලද පුරාවිද්‍යා නටබුන් පැවති ස්ථානයන්හි දැනටමත් ස්ථූප ගොඩැලි සම්පූර්ණයෙන්ම පොළොවට සමතලා කොට එම භූමිය තුළ සහ නෙඩුන්කේනි ශිව නගර්, කුලාමුරිප්පු, කොඩ්ඩියාමලෙ යන පුරාවිද්‍යා ස්ථානයන්හි ඇති ස්ථූප ගොඩැලි මත වෙනත් ආගමික ස්ථාන ඉදිකර තිබුණි.	2023	1998 අංක 24 දරන පුරාවස්තු සංශෝධිත පනතින් සංශෝධනය කරන ලද 1940 අංක 09 දරන පුරාවස්තු ආඥා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව පුරාවස්තු රැක ගැනීම සිදු කළ යුතු අතර, අවශ්‍ය තැන්හිදී ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක ARCH/ACC/NA/09/12/2023 හා 2024 මැයි 17 දිනැති ලිපිය මඟින් උතුරු, නැගෙනහිර පළාත්වල පුරාවිද්‍යා ස්ථාන ආශ්‍රිතව ගවේෂණ, කැණීම්, සංරක්ෂණ, නඩත්තු රාජකාරී කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.	ආරක්ෂක ලේකම්ගේ අංක - MOD/MLO/Tmp/04 (103) හා 2024 ජූනි 05 දිනැති ලිපිය මඟින් ආරක්ෂක අමාත්‍යාංශයේ සහයෝගය බලාපොරොත්තු වන ක්ෂේත්‍ර / කාර්යයන් ආදිය පිළිබඳ විස්තර ඉල්ලා ඇත. ඒ අනුව අවශ්‍ය සහයෝගය පිළිබඳ විස්තර ඇතුළත් ලිපිය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කිරීමට නියමිතව ඇති බව දන්වා තිබුණි.
04	උතුරු පළාතේ පිහිටි වෙඩික්කිනාරිමලෙ පුරාවිද්‍යා ස්ථානය, නෙළුක්කුලම, කිඹුලාගල නන්දිමිත්‍රගම පුරාවිද්‍යා පරිශ්‍රයේ ඇති ස්මාරක, නෙඩුන්කේනි ශිවනගර් පුරාවිද්‍යා ස්ථානය, සමලන්කුලම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් සමලන්කුලම පුරාවිද්‍යා ස්ථානය, මාතොට වරාය නගරය සහ 2008 ජූනි 06 දිනැති අංක 1553 දරන	2023	මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීම් සිදුකර ඉදිරි පුරාවිද්‍යාත්මක කාර්යයන් කාල ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුය.	අදහස් දක්වා නොතිබුණි.	වෙඩික්කිනාරිමලෙ සහ සමලන්කුලම යන ස්ථාන මේවනවිට රක්ෂිත ස්ථාන ලෙස නම් කිරීමේ ක්‍රියාවලියට ඇතුළත්ව ඇත. කිඹුලාගල ගවේෂණය මේවනවිට සිදු වෙමින් පවතී. එක් ප්‍රාදේශීය කාර්යාලයකින් මාසයකට ස්ථාන 20 ක් බැගින් සහ රක්ෂිත 02 ක් බැගින් තොරතුරු ගෙන්වා

	ගැසට් පත්‍රය මඟින් ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති තෝනිගල පුරාවිද්‍යාත්මක ස්ථානයද මේ දක්වාම අදාළ මායිම් හඳුනා ගෙන පුරාවිද්‍යා රක්ෂිතයක් හෝ ස්මාරකයක් ලෙසට ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර නොතිබුණි.				ගෙන කඩිනමින් ගැසට් කිරීමට ක්‍රමවේද සකසා ඇති බව දන්වා තිබුණ
05	කුරුදුමලේ (කුරින්දි) පුරාවිද්‍යා ස්ථානයේ නටඹුන් බහුලව විසිරී පැවති අක්කර 229 ක භූමිය මැන මාණක සැලසුම් පිළියෙල කර දෙන ලෙසට 2020 නොවැම්බර් සිට අදාළ රාජ්‍ය ආයතන වෙතින් ඉල්ලීම් කර තිබුණ ද, මෙම කාර්යයන් 2024 සැප්තැම්බර් 30 දක්වා ඉටුවී නොතිබුණි.	2023	අදාළ රාජ්‍ය ආයතන හා සම්බන්ධ වී මැනුම් කටයුතු සිදු කරගෙන පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කල යුතු බව.	අදහස් දක්වා නොතිබුණි.	අවස්ථා කිහිපයකදීම මුලතිව් දිස්ත්‍රික්කයේ මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් වෙතින් මැනුම් නියෝග ඉල්ලීම් කර තිබුණ ද මේවනතෙක් ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් නොලැබීම හේතුවෙන් ඉදිරි කටයුතු සිදු කිරීම අඩාල වී ඇත. නැවත වරක් සිහිකැඳවීම් යැවීම හා සම්බන්ධීකරණය තුළින් කාර්යය කඩිනමින් ඉටුකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.
06	2018 ඔක්තෝබර් 09 දින මධ්‍යම ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයට අයත් ඩබල් කැබ් රථයේ සිදු වූ අනතුර සම්බන්ධයෙන් විත්තිකරු වූ එම රථයෙහි රියදුරුට රු.46,500 ක දඩ මුදලක් නියම කර තිබුණ ද, රථයට සිදු වූ අලාභය වූ රු.5,882,769 ක් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අයකර ගැනීමටත් වසර 05 කට	2021 2022 2023	අලාභයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	මධ්‍යම කාර්යාලය ට අනුයුක්ත කර තිබූ PG 4006 ඩබල් කැබ් රථයේ අනතුර සම්බන්ධයෙන් එහි රියදුරු විත්තිකරු වූ අතර ඔහු මේ වනවිට සේවයෙන් පහකර ඇත. එහි මු.රෙ.104(4) පරීක්ෂණය සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර එහි නිර්දේශ ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.මෙම රථයේ අලුත්වැඩියාව සඳහා මිල ගණන් කැඳවා ඇති අතර ඒ සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් ඇත.	මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති මෙම නඩුව අවසන් වී ඇති අතර රජයට සිදු වී ඇති අලාභය හේතුවෙන් නඩු පැවරීමට උපදෙස් ලබා දෙන ලදි. 2018 වසරේ මෙම අනතුර සිදු වී ඇති අතර ඒ සඳහා එවකට ඇස්තමේන්තුගත වියදම වන රුපියල් ලක්ෂ 58 ක මුදල වර්තමාන වෙළඳපළ

	අධික කාලයක් තිස්සේ කැබ් රථය අළුත්වැඩියා කිරීමටත් කටයුතු කර නොතිබුණි.				සමඟ සැසඳීමේදී ගැටළුකාරී තත්ත්වයන් මතුවන හෙයින් මෙම රථයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමේ වාසිසහගතභාවය පිළිබඳ කරුණු සළකා බලමින් සිටින බව දන්වා තිබුණි.
07	යාන්ඔය වාරිමාර්ග ජලාශ ව්‍යාපෘතියේ, පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා 2017 පෙබරවාරි 14 දින පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර පැවති මුදලින් රු.2,105,152 ක මුදලක් තවදුරටත් පොදු තැන්පත් ගිණුම තුළ රඳවාගෙන පැවතුණි.	2021 2023	පුරාවිද්‍යා හානි ඇගයීම් සමීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා ව්‍යාපෘති යෝජකයන් විසින් දෙපාර්තමේන්තුව වෙත තැන්පත් කරන මුදල් සම්බන්ධව පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතු බව	අදහස් දක්වා නොතිබුණි.	ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන වලට සරිලන අයුරින් කෞතුකාගාරයක් ඉදිකිරීමට හෝ දීඝවාපී කෞතුකාගාරය ඉදිකිරීමට මෙම මුදල් යොදාගැනීමට යෝජනා වී ඇති බව දන්වා තිබුණි

12. ශීර්ෂය - 208 ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	10,946,243,284	16,897,654	10,929,345,630	තත්ත්වාගණනය කළ
2022	11,407,731,006	13,375,063	11,394,355,943	තත්ත්වාගණනය කළ
2023	1,457,232,320	43,846,708	15,193,426,200	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රු.10,800,000,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් තක්සේරු කිරීම සඳහා වන 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	ගිණුම් පිළියෙල කිරීමේදී චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු වන බව.	තක්සේරු දෙපාර්තමේන්තුවෙන් 2023 සැප්තැම්බර් 07 දිනැති ලිපිය මඟින් නව තක්සේරු වාර්තාවක් ඉල්ලුම් කර ඇත. එම වාර්තාව ලද පසුව සංශෝධිත වටිනාකම අනුව ගිණුම්ගත කිරීම සිදු කරනු ලැබේ.	අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.
02	2014 ජනවාරි සිට 2022 අගෝස්තු මස දක්වා ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ ප්‍රවේශ පත්‍ර ආදායම් බැංකුගත කිරීමේදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ 2023 මැයි 31 දින ඉදිරිපත් කර ඇති මූලික විමර්ශන වාර්තා අනුව දෙපාර්තමේන්තුව වෙත අහිමි කර ඇති සමස්ථ ආදායම රු.1,652,605 ක් විය. අලෙවි කළ ප්‍රවේශ පත්‍ර ආදායම් පිළිබඳ දෛනික ලේඛන තුලනය කිරීමත්, මුදල් බැංකුගත කිරීමත් අක්‍රමිකතාවයට වගකිව යුතු ස්ථානභාර නිලධාරියා විසින් සිදුකර තිබුණු අතර, මුදල් රෙගුලාසි 177 (1) ප්‍රකාරව මුදල් දෛනිකව බැංකුගත	2023	වැරදි හා වංචා ඇති නොවන ආකාරයට අභ්‍යන්තර පාලනය සකස් කර යාවත්කාලීන කළ යුතු වන බව හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව.	ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ ප්‍රවේශපත්‍ර ආදායම බැංකුගත කිරීමේදී සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතාවයේ අලාභය වූ රු.1,652,605 ක මුදල අයකර ගැනීම සඳහා ගාල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් දමා නඩු පැවරීමට සහ විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු සිදුකරමින් පවතී.	2024 ජුනි 27 දින අක්‍රමිකතාවයට වගකිව යුතු ස්ථානභාර නිලධාරියා රක්ෂිත බන්ධනාගාරගත කරන ලද අතර, 2024 අගෝස්තු 22 දින ඔහුට ඇප ලබාදී ඇති අතර, ඊළඟ නඩු දිනය 2025 මැයි 22 දිනට යෙදී ඇත.

	කර නොතිබුණි. එසේ වුවද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාර පරීක්ෂණයෙන් පසු අලාභය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමටත් කටයුතු කර නොතිබුණි.				
03	කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය වෙනුවෙන් ගිණි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු.98,550,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ආරම්භ කර තිබූ ව්‍යාපෘතියේ වැඩ 2022 මාර්තු 31 දින අවසන් කළ යුතු වුවද, 2024 අප්‍රේල් මස වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය වියදම රු.43,153,409 ක් විය.	2021 2022 2023	ගිණි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම කඩිනමින් අවසන් කළ යුතු වන බව.	කොළඹ ජාතික කෞතුකාගාරයේ පුස්තකාලය ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව පිරි නැමූ කොන්ත්‍රාත් ආයතනයේ දුර්වල කාර්ය සාධනය මත කොන්ත්‍රාත්තුව අවලංගු කර බැඳුම්කර අය කර ගන්නා ලදී. ඉතිරි කාර්යයන් සඳහා නව මිල ගණන් කැඳවා Thudawe Engineering Service නමැති ආයතනය වෙත 2023 දෙසැම්බර් 18 දින කොන්ත්‍රාත්තුව පවරා ඇත. එම කාර්යය 2024 ජුනි 15 දින වන විට අවසන් වීමට නියමිතය.	කොන්ත්‍රාත්තුව නිම කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය රැගෙන ඒමේදී රතු මුහුද ආශ්‍රිතව හටගෙන ඇති අනාරක්ෂිත තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය 2024 ඔක්තෝම්බර් 31 දින දක්වා දීර්ඝ කර ගැනීමට ඉල්ලීම් කර පැවති අතර, ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබා ගැනීමට උපදේශන ආයතනය වෙතින් විමසීම් කර තිබුණි.
04	කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.4,440,140 ක් වූ කෞතුක භාණ්ඩ 221 ක් සොරකම් කිරීම සිදුවී 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 11 ක කාලයක් ගතවී පැවති නමුත්, අවසන් තීරණය ලබාදීමට අවශ්‍ය නෛතික කාර්යයන් සහ එහි සමස්ථ පාඩුව හඳුනාගෙන ඊට අදාළව මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කිරීම කර නොතිබුණි.	2023	අදාළ නෛතික කටයුතු අවසන් කිරීම කඩිනම් කර ගැනීමට කටයුතු කළ යුතුය.	නඩු කටයුතු අවසන් වන තෙක් එම භාණ්ඩවල මුද්‍රා ඉවත්කොට, ඒවා නිරාවරණය කර ගැනීමට නොහැකි බැවින් ඒ පිළිබඳව මුදල් රෙගුලාසි අනුව නෛතික කාර්යයන් ඉටු කළ නොහැකි බව අදාළ කමිටුව විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත වාර්තා කර තිබුණි.	කෞතුක භාණ්ඩ සොරකමින් සිදු වූ පාඩුව හඳුනාගෙන මුදල් රෙගුලාසි 104(3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම් විසින් 2022 සැප්තැම්බර් 02 දින පංච පුද්ගල කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව තීරණය කරන ලද්දේ දැනට මේ සම්බන්ධව නඩු කටයුත්තක් පවතින බැවින් අපරාධ

					පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මුද්‍රා තබා ඇති භාණ්ඩවල මුද්‍රා ඉවත් නොකළ යුතු බවයි.
05	දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා අංශයේ මැණික් ගල් 272 ක් ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ 1964 සැප්තැම්බර් 18 දින සිට තැන්පත් කර පැවති අතර, 1993 වර්ෂයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී එයින් එක් මැණික් ගලක් කෘතිම ගලක් ලෙසට අනාවරණය වීමෙන් පසුව එම ගල භූ විද්‍යා අංශයේ තැන්පත් කර පැවතුණි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්න විද්‍යාඥයෙකුගේ සහාය ලබාගෙන මෙම ඉතිරි මැණික් ගල් 271 හි වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	වර්තමාන මූල්‍ය වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වන බව.	මැණික් ගල් පරීක්ෂාව හා තක්සේරුව අදාළ බැංකු පරිශ්‍රයේ සිදු කළ නොහැකි බවත්, ඒවා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රසායනාගාර වෙත යොමු කළ යුතු බවත් දන්වා ඇත. එසේම, මේ පිළිබඳව දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ අතර, භාණ්ඩාගාර නියෝජිත මෙම ද්‍රව්‍ය තක්සේරුව සඳහා බාහිර ආයතනයකට භාර දීම නුසුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කෙරේ.	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ජංගම රථය ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් පරිශ්‍රය වෙත ගෙන්වා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ඡායාරූප ශිල්පී විසින් එම මැණික් ගල් වල ඡායාරූප ලබාගෙන, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ තක්සේරු නිලධාරියෙකුගේ සහාය ලබාගෙන ඒවා තක්සේරු කර බර හා මිනුම් ලබාගෙන ඡායාරූප සහිත නාමාවලියක් සකස් කිරීමට යෝජනා වී පැවති නමුත්, කාර්යය ඉටු වී නොතිබුණි.

13. ශීර්ෂය - 209 ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	264,935,514	25,380,472	239,555,042	තත්ත්වාගණනය කළ
2022	264,451,021	29,901,472	234,549,549	තත්ත්වාගණනය කළ
2023	270,416,277	33,341,218	237,075,059	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2021 දෙසැම්බර් 09 දිනැති අංක 05/2021 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂ 05 කට වරක් මූල්‍ය නොවන වත්කම් තක්සේරු කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහනවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු නොකර රු.17,484,320 ක් ලෙස අවසන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි.	2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	ඉදිරි වසර තුළදී (2024) වාහනවල තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට කටයුතු කරමි.	ඉදිරි වසර තුළදී (2024) වාහනවල තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.
02	දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ ලේඛන ආරක්ෂිතව තැන්පත් කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු.50,000,000 කින් 2023 වසරේදී ඉදිකර අවසන් කිරීමට සැලසුම් කළ ජංගම රාක්ක පද්ධතියේ 2023 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 05 ක් පමණක් වූ අතර, මූල්‍ය ප්‍රගතියක් නොවුණි.	2023	සැලසුම් ප්‍රකාරව ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කල යුතුය.	මේ වන විට සුදුසු සැපයුම්කරුවකු වෙත ලංසු ලබා ගැනීම සඳහා ලංසු විවෘත කර ඉදිරි කටයුතු සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ.	අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව නැවත ලංසු කැඳවීම සිදුකර ඇත. එම ලංසු 2024 ඔක්තෝම්බර් 03 දින විවෘත කිරීමට සැලසුම් කර ඇති බව දන්වා තිබුණි.

03	ටෙරාබයිට් 500 ක ඩිජිටල් කෝෂ්ඨාගාරයක් පිහිටුවීමට 2021 අප්‍රේල් 05 දින ලබාදී තිබූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව වසර 05 ක් තුළ රු.120,208,320 ක පිරිවැයක් යටතේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2023 දෙසැම්බර් 31 දිනට අදාළව රු.78,300,000 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු නමුත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	2022 2023	ඩිජිටල් කෝෂ්ඨාගාරය පිහිටුවීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනමින් ඉටුකළ යුතු වන බව.	රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ MBRCA/03/PRO/02/SOFTWARE අංක දරන හා 2024 මාර්තු 14 දිනැති ලිපිය මඟින් උපදේශකවරුන් තෝරාගැනීම සඳහා වන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කර ඇති අතර, ඒ අනුව ඉදිරි කටයුතු සඳහා සාකච්ඡා සිදු කරමින් පවතී.	2024 අගෝස්තු 28 දිනැති දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව ඩිජිටල් කෝෂ්ඨාගාරයක් ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු කළ මුදල වෙනස්වන බැවින් නැවත ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත්, Atom හා Archivematica ස්ථාපිත කිරීම හා නඩත්තුව සඳහා විදේශීය වෘත්තීය සමාගමක් වන Artifactual Systerms Inc ආයතනය වෙත සෘජුව ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත්, අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් පසු විධිමත් ලංසු ලේඛන සකස්කර විධිමත් පරිදි මිල ගණන් කැඳවීමටත් සර්වර් පරිගණක හා ධාරිතාවය ලබා ගැනීමට ජාතික තරඟකාරී ලංසු කැඳවීම යටතේ ප්‍රසම්පාදන කටයුතු කිරීමට අනුමැතිය ලබා දී ඇති බව දන්වා තිබුණි.
04	2019 ජනවාරි සිට 2021 මැයි දක්වා කාලය තුළ රු. 992,230,065 ක ඇස්තමේන්තුගත මුදලකින් නිම කිරීමට සැලසුම් කර තිබුණු	2021 2022 2023	ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල කඩිනමින් ඉදිකර අවසන් කළ යුතු වන	සංශෝධිත ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත. අමාත්‍ය මණ්ඩල තීරණය ලැබීමෙන් පසු 2024 ජුනි මස	2024 ජුනි මස සිට ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර පවතී.

ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2023 දෙසැම්බර් 31 දිනට වසර 02 ක කාලයක් ඉක්මවා තිබුණු නමුත්, ඉදිකිරීම් කටයුතු අවසන් නොකර අත්හැර දමා තිබුණු අතර, එදිනට රු.470,780,777 ක් ගෙවා තිබුණු එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය සියයට 47 ක් ද, භෞතික ප්‍රගතිය සියයට 53 ක් ද විය.	බව.	සිට ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

14. ශීර්ෂය - 210 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,857,701,856	8,162,818	1,849,539,038	තත්ත්වාගණනය කළ
2022	1,872,306,707	7,428,911	1,864,877,796	තත්ත්වාගණනය කළ
2023	1,979,767,600	268,112	1,979,499,488	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01.	ප්‍රවාහන අංශයේ රාජකාරී කළ කාලසීමාව තුළ වාහන අලුත්වැඩියාවේදී සහ වාහන ලිපිගොනු පවත්වාගෙන යාමේදී සිදුකර ඇතැයි පැවසෙන අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට යටත්ව ප්‍රවාහන අංශයේ නිලධාරිනියක් 2021 නොවැම්බර් 23 දිනැති රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියෙන් තාවකාලිකව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත මුදාහැර තිබුණද 2022 මාර්තු 03 දක්වා එවැනි විමර්ශනයක් සිදුකර නොතිබුණි. එසේම වාහන අලුත්වැඩියාව හා සේවා කිරීම් අනුමත කරන අධ්‍යක්ෂ (පාලන) 2021 ඔක්තෝබර් 26 දින වෙනත් දෙපාර්තමේන්තුවක් වෙත මාරු කර තිබුණි.	2021	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.	මෙම නිලධාරිනිය පිළිබඳ මූලික විමර්ශනයක් සිදු කිරීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් එම කටයුතු ආරම්භ කර නොමැත. .
02.	ගෙවීම නිශ්චිතව තහවුරු කර නොගෙන ඉදිකිරීම් කාර්යයන් සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 2,251,226 ක් වටිනා චෙක්පත් 02 ක් 2020 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමට තැන්පත් කරමින් ඒවා	2023	ගෙවීම් නිශ්චිතව තහවුරු කරගෙන චෙක්පත් ලිවීමට කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	දැනට මෙම නවීකරණ කටයුත්තෙහි පවතින අඩුපාඩු හේතුවෙන් ඒවා සඳහා ප්‍රශස්ථ විසඳුම් ලබා දෙන තෙක් රජයේ

	රික්විසිෂන් පත්‍ර මගින් 2023 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුමෙන් ඉවත් කර චෙක්පත් ලියා අත රඳවා ගෙන තිබුණි.				කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මෙම අතුරු ගෙවීම් දෙකක්ද තාවකාලිකව රඳවා තබා ගෙන ඇත.
03.	2021 ජූලි 28 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2021 හි 2.3 (අ)1 ඡේදය ප්‍රකාරව නව ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවා තිබියදී රු. 3,799,932 කට වැසිකිළි පද්ධතියක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. එහිදී උපදේශක ආයතනය හා කොන්ත්‍රාත් ආයතනය තෝරා ගැනීම සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලින් අනුගමනය කර නොතිබුණි. උපදේශක ආයතනයේ ඉදිකිරීම් පිළිබඳ සැලසුම්, පිරිවිතර, ප්‍රමාණ පත්‍ර හා ගෙවීම් වාර්තා සකස් කිරීමේ අඩුපාඩු පැවතීම හේතුවෙන් එම උපදේශක ආයතනයේ සේවාව ලබාගැනීම අත්හිටුවා ඉතිරි කොටස් සඳහා වෙනත් ආයතනයකින් රු. 2,084,081 කට මුදලකට ඉදිකිරීම් කටයුතු සිදු කර ගැනීමට තීරණය කර තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ආයතනයේ අඩුපාඩුද නිරීක්ෂණය වී තිබුණු අතර 2024 අප්‍රේල් 30 දින වනවිට රු.1.649,401 ක් ගෙවා තිබුණද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.	2023	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඉතිරි වැඩ කොටස්වල උපදේශන කටයුතු සිදු කර ගැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීමට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරී, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ තාක්ෂණික ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරී සම්බන්ධ කරගනිමින් අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවතී.	මෙම ඉදිකිරීම සම්බන්යෙන් අදාළ තාක්ෂණික නිර්දේශ ලද පසු මෙහි කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කර (TERMINATE) මෙම ගොඩනැගිල්ලේ සිදු කළ යුතු ඉතිරි වැඩ කොටස් සඳහා නව මිල ගණන් කැඳවීමට අවශ්‍ය ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කරන බව දන්වා ඇත.
04.	ගුණාත්මක තත්ත්වයෙන් යුතු චිත්‍රපට නිපදවීමේ අරමුණින් 1999 දෙසැම්බර් 10 දින Debri ආයතනය හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමඟ එළඹි ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ණය ආධාර යටතේ	2023	වත්කම් නිෂ්කාර්යව නොතබා ප්‍රයෝජනයට ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය.	කැලණිය විශ්ව විද්‍යාලයෙන් මෙම උපකරණය ලබා ගැනීම සම්බන්ධයෙන් වාචිකව දැනුම් දී	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම වත්කම් නිෂ්කාර්යව පැවතුණි.

ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601) කට සමාන රු. මිලියන 102.2 කට 2003 වර්ෂයේ දී ස්ථාපනය කර තිබූ රසායනාගාර යන්ත්‍රෝපකරණ කට්ටලය ගෙන්වීමේදී නිසි පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම හේතුවෙන් 2024 අප්‍රේල් 30 දින දක්වාම නිෂ්කාර්යව පැවතුණි. මෙම යන්ත්‍රෝපකරණ කට්ටලය ස්ථාපිත කර තැබීම සඳහා දෙපාර්තමේන්තුවේ විශාල භූමි ප්‍රමාණයක ගොඩනැගිල්ලක් භාවිතයට ගැනීමෙන් එම ගොඩනැගිල්ලද ඌන උපයෝජිත වත්කමක් බවට පත් වී ඇත. තවද මෙම රසායනාගාර ගොඩනැගිල්ල තුල දීර්ඝකාලීනව භාවිතයට නොගන්නා වත්කම් අයිතම 85 ක් නිෂ්කාර්යව පැවතුණි.

ඇති අතර අදාළ පරීක්ෂා කිරීම සඳහා දෙපාර්තමේන්තු පරිශ්‍රයට පැමිණ එම යන්ත්‍රය පරීක්ෂා කිරීම සිදුකර ඇත. එම උපකරණ විශ්ව විද්‍යාලයට ලබාගැනීම සම්බන්ධව ලිඛිතව දැනුම් දීමෙන් පසු කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කරන බව දක්වා ඇත.

15. ශීර්ෂය - 211 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,552,579,207	301,619,268	1,250,959,939	තත්ත්වාගණනය කළ
2022	1,597,786,532	104,799,939	1,492,986,593	තත්ත්වාගණනය කළ
2023	3,862,376,557	88,913,442	3,773,463,115	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රාජ්‍ය මුදල් අධ්‍යක්ෂකගේ 2021 සැප්තැම්බර් 21 දිනැති අංකPED/RED/WO/2021/30 දරන ලිපිය ප්‍රකාරව 2009 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල රු.81,019,843ක හිඟ ආදායම් ශේෂ පසු විපරම් කර අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවද කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි.	2021 2022 2023	මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට වැඩ පිළිවෙලක් සකස්කර ගත යුතුය.	අත්තිකාරම් මුදලක් ලබාගෙන මුද්‍රණ ඇණවුම් භාර ගැනිම.	නිරීක්ෂණයේ දක්වා ඇති මුදල අයකර ගෙන නොමැත.
02	1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනිමේ පනතේ 460 පරිච්ඡේදයේ 44 වගන්තිය යටතේ කතරගම ප්‍රාදේශීය ලේකම් මුද්‍රණ දෙපාර්තමේන්තුවට 2003 ජනවාරි 31 දින පවරා තිබූ හෙක්ටයාර් 0.105 ක් වූ ඉඩම රජයේ මුද්‍රණාලිය සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය වෙත බදු කාලය අවසන් වීමෙන් පසු ද පරිහරණය සඳහා ලබා දී තිබුණි.	2021 2022 2023	රජය සතු වත්කම් පුද්ගලික පාර්ශවයන්ට පරිහරණය සඳහා ලබා නොදිය යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
03	1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 පරිදි 1998 වර්ෂයේ සිට වානිජ මුද්‍රණ දිමනාව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ට ගෙවනු ලබන අතර එක් මාසයක වානිජ මුද්‍රණ ඇනවුමෙහි වටිනාකම ස්ථාවරව පවතින ලෙස	2021 2022 2023	වර්තමානය තෙක් රටේ පැවති උද්ධමනය, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම යන සාධක සැලකිල්ලට ගෙන එම රු. මිලියන 40 වැඩි කිරිමට කටයුතු	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	පාදක මුදල වන රු. මිලියන 40ට අනුපාත කර වානිජ මුද්‍රණ දීමනාව ගෙවනු ලැබේ. 1998 වර්ෂයේ සිට වර්තමානය දක්වා රටේ පවතින උද්ධමනය, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම යන සාධක සැලකිල්ලට ගෙන එම රු. මිලියන 40 පාදක මුදල වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි.		කළ යුතුය.		
04	1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 හි සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වානිජ මුද්‍රණ දීමනාව ගෙවීම සඳහා පිරිවැය ගිණුම්කරණ පද්ධතියක් හඳුන්වා දීම, මුද්‍රණ කටයුතු වල නිෂ්පාදන ඵලදායිත්වය වැඩිදියුණු කිරීම සහ හඳුනාගත් ප්‍රතිපාදනයන් සහිත ව්‍යාපෘතියක් ඇති කිරීම හෝ එයට විකල්පයක් ලෙස අත්තිකාරම් ගිණුමක් ඇති කිරීම යන කොන්දේසි තුන 1998 වර්ෂයේ සිට සපුරා නොතිබුණි. තවද 2023 වර්ෂයට අදාලව රු.17,429,244ක වාණිජ මුද්‍රණ දීමනා ලෙස ගෙවා තිබුණි.	2021 2022 2023	වානිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදී සපුරා ලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබූ කොන්දේසි කඩිනමින් සපුරාලිය යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
05	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ESJ / T / ALLOW / 03 /012 දරන ලිපිය මඟින් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන කාර්යය මණ්ඩල දීමනා 2018 වර්ෂය දක්වා පමණක් ගෙවීමට අනුමැතිය දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ කාර්යය මණ්ඩලයට ගෙවන ලද එකතුව රු.557,421,503 ක් වූ කැලි පදනම මත දීමනා සඳහා කිසිදු අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	2021	අදාළ දීමනා ගෙවීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනාරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
06	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය අනුව දැනට සේවකයෙකු ලබන වැටුපෙන් සියයට 65ක් වන දීමනාවක් 2018	2021 2022 2023	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අදාළ ලිපියේ සඳහන් කොන්දේසි අනුව කටයුතු කළ යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	වර්ෂය දක්වා ගෙවීමට අනුමත කර තිබුණි. එසේ වුවද සේවකයන්ගේ මාසික වැටුපෙන් සියයට 65 ඉක්මවා සියයට 500 කට ආසන්න ප්‍රමාණයකින් විවිධ වර්ගයේ දීමනා ගෙවන බවට නිරීක්ෂණය විය.				
07	1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව දෙපාර්තමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් කඩිනමින් කිරීමට අතිකාල දීමනා වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයකට අනුමැතිය ලැබී තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණයට වර්ෂ 40 ක් ගතවී තිබුණ ද කැලී පදනම මත දීමනා ගෙවිය යුතු වැඩ කොටස් සහ දීමනා සඳහා ගෙවිය යුතු රේටයන් නිවැරදිව හඳුනා නොගෙන එකම කාර්යයක් වෙනුවෙන් අතිකාල හා කැලී පදනම මත දීමනා යන දෙවර්ගයම ගෙවා තිබුණි.	2021	අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අතිකාල දීමනා වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම කඩිනමින් සිදුකළ යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
08	**1989** මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89 හි 06 ඡේදය ප්‍රකාරව අතිකාල දීමනා ලබා ගැනිමේදි වවුචර පිළියෙල කළ යුතු වුවද නිලධාරීන් අතිකාල වවුචර්යක් පිළියෙල නොකරන අතර දෙපාර්තමේන්තුවේ කාල ගණක අංශය විසින් ලබාදෙනු ලබන පැය ගණනය අනුව අතිකාල ගෙවනු ලබයි.	2022 2023	අදාල චක්‍රලේඛය පරිදි ක්‍රියා කිරිමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර කඩිනමින් චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
09	දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට අනුමැතියක් නොමැති කැලිගණනට දිමනා ගෙවීම සඳහා, දෙපාර්තමේන්තුවේ 211-1-2-0-1205 විවිධ සැපයුම් වැය විෂයයෙන් රු.298,375,331 ක් නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.	2023	වැය විෂයන්ගේ සිමාවන් තුළ තම වියදම් කළමණාකරණය කර ගතයුතුය. එම වැය විෂයයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේනම් ඒ සඳහා ඇති නෛතික රාමුව තුළ සිට නිසි අනුමැතියක් යටතේ	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

			ප්‍රතිපාදන සලසා ගත යුතුය. මෙම මුදල සඳහා අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබාගත යුතුය.		
10	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 ජනවාරි 27 දින නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි (02)(ඇ)iii පරිදි අතිකාල හා නිවාඩු දින වැටුප් සහ වෙනත් දීමනා සඳහා ප්‍රතිපාදන ද අවම වශයෙන් සියයට 6 කින් අඩු කල යුතු බවට අවධාරනය කර තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් අයවැය මගින් ලබා දී ඇති ප්‍රතිපාදන වලට අමතරව මු.රෙ 66 යටතේ අනුමැතිය ලබා ගත් රු.95,000,000 ක් ද, නිසි අනුමැතියන් නොමැතිව රු.298,375,331 ක මුදලක් හා 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ලේඛනයේ ඇතුළත් නොකර දෙසැම්බර් මාසයට අදාළ ව 2024 ජනවාරි සහ පෙබරවාරි මාස දෙක තුළ ගෙවූ දීමනා වූ රු.92,353,696 සමග එකතුව රු.1,509,819,572 ක මුදලක් අතිකාල හා වෙනත් දිමනා ලෙස වියදම් කර තිබුණි. නමුත් 2023 වර්ෂයේ අතිකාල හා වෙනත් දිමනා ලෙස අයවැයෙන් රු.992,000,000ක ප්‍රතිපාදනයක් අනුමත කර තිබුණි. එම නිසා දෙපාර්තමේන්තුව අයවැය චක්‍රලේඛ අංක 01/2023 විධිවිධාන උල්ලංඝනය කරමින් සමස්ථ අතිකාල දීමනා සහ වෙනත් දීමනා ගෙවීම්, අනුමත ප්‍රතිපාදන ඉක්මවා සියයට 52.2 ක් වැඩියෙන් වියදම් කර තිබුණි.	2023	අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කල යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
11	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂක විසින් දෙපාර්තමේන්තුවේ කැලිගණනට දීමනා අනුමත කර ඇත්තේ 2018 වර්ෂය සඳහා පමණක් වන අතර ඊට පසුව ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතියක් ලබානොගෙන දෙපාර්තමේන්තුව කැලිගණනට	2023	2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ආයතන අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතියකින් තොරව දිමනා ලබාගෙන ඇත. අදාල දිමනා සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය. තවද	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	දීමනා ලබාගෙන ඇති බවත් සමාලෝචිත වර්ෂයේදි කිසිදු අනුමැතියකින් තොරව රු.814,476,871 ක මුදලක් කැලිගණනට දීමනා ලෙස ලබා ගෙන තිබුණි.		ඉදිරියෙදි ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් තොරව දිමනා නොගෙවිමට වග බලාගත යුතුය.		
12	දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා මුදල් පදනම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. නමුත් ගනුදෙනුකරුවන්ට ඉන්වොයිසි ලබාදෙන අවස්ථාවේ බදු අනුපාත හා ඉන්වොයිස් වලට මුදල් ලැබෙන අවස්ථාවේ පවතින බදු අනුපාත වෙනස් වීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත නොහැකි එකතු වටිනාකම වූ රු.7,735,242 ක මුදල අයවියයුතු නමුත් අයකර ගැනීමට නොහැකි වූ ව්‍යාජ ආදායමක් ලෙස නිරූපණය වී තිබුණි.	2023	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කඩිනමින් මෙම ගැටළුව විසදාගත යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තාකර නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
13	සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණු සඳහා අනුමත 211-1-1-0-2401 හා 211-1-1-0-2401 යන වැය විෂයන් තුළින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 27 හා 28 දිනයන් හි රු.2,504,000 ක මුදලක් සේවක පුහුණු පාඨමාලා සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට ගෙවා තිබුණි. නමුත් මෙම ගෙවීම සඳහා 2023 මූල්‍ය වර්ෂය තුළදී මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කිසිදු සේවකයින්ට පුහුණු පාඨමාලා පවත්වා නොතිබුණු බවත් හුදෙක්ම වර්ෂය අවසාන වන විට ප්‍රතිපාදනය අවසන් කිරීමේ අරමුණින් මෙම ගෙවීම සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය.	2023	නිශ්චිත කාර්යයන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන එම කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතුය. තවද ඉදිරියේදි මෙවැනි තත්වයන් ඇති නොවිමට අවශ්‍ය පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කල යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග වාර්තාකර නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
14	කැලිගණනට දීමනා ගණනය කිරිම සඳහා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අංශ තුළ එකිනෙකට වෙනස් මාර්ගෝපදේශ භාවිතා කරන අතර එම මාර්ගෝපදේශ තුළ ඇති කොන්දේසි අනුගමනය නොකර දිමනා ගණනය කර ඇති බවට දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ පලමු මාස 07 තුළ බයින්ඩින් A අංශයේ දිමනා	2023	පොදු අනුමත දිමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කල යුතුය. තවද අදාළ කොන්දේසි කඩකරමින් ලබා ගෙන ඇති දීමනා නැවත අයකර ගැනීමට කටයුතු කළ	වැලැක්වීමේ ක්‍රියාමාර්ග නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	ගණනය කිරිමේදි කොන්දේසියක් ලෙස "කැලි ගණනට දීමනාව ලබාගැනිම සඳහා සෑම සේවකයෙකුම අදාල මාසයේ දින 18 ක් හා එම දිනයන්හි අමතර පැයක් සේවයේ යෙදී සිටිය යුතුය" සඳහන් කර තිබුණද එම කොන්දේසිය නොසලකා 2023 වර්ෂයේ පලමු මාස 07 තුළදි රු.10,193,463 ක කැලි ගණනට දිමනා ගෙවා තිබුණි.		යුතුය.		
15	භාණ්ඩාගාර ලේකම්ගේ 2023 පෙබරවාරි 02 දිනැති අයවැය චක්‍රලේඛ අංක 02/2023 හි කොන්දෙසි වලට අනුකූල නොවන පරිදි 2023 වර්ෂයේ මුද්‍රණ කාර්යයන් ඉටුකිරිම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවලින් අයවිය යුතු ආදායම රු.210,048,234ක් විය.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

16. ශීර්ෂය - 212 **විභාග දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,682,151,293	62,717,256	3,619,434,037	තත්ත්වාගණනය කළ
2022	3,689,449,880	18,625,851	3,670,824,029	තත්ත්වාගණනය කළ
2023	3,779,664,005	302,817,886	3,476,846,119	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2017 වර්ෂයේදී ආරම්භ කර 2019 පෙබරවාරි 02 දින අවසන් කිරීමට නියමිත සයමහල් බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.564,320,835 ක කොන්ත්‍රාත් මුදලකට ඉංජිනේරු සංස්ථාව වෙත භාර දී තිබුණි. අවුරුදු 05 කට ආසන්න කාලයක් ප්‍රමාද වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිකිරීම් ප්‍රගතිය සියයට 92 ක් පමණක් වූ අතර මෙම ඉදිකිරීම වෙනුවෙන් එදිනට ඉංජිනේරුමය කාර්යයන් සඳහා මධ්‍යම උපදේශක කාර්යංශයට රු.81,729,560 ක් ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට රු.369,555,925 ක් ද වශයෙන් රු.451,285,486 ක මුදලක් ගෙවීම් කර තිබුණි.	2021 2022 2023	සැලසුම්ගත පරිදි නියමිත කාලයේදී ඉදි කිරීම් කටයුතු අවසන් කල යුතු වීම.	2019 අප්‍රේල් මස සිදු වූ පාස්කු ප්‍රහාරය, පැවති අයහපත් කාලගුණ තත්ත්වය, කොවිඩ් 19 වසංගත තත්ත්වය, රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වී තිබුණු බව.	ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන් අවසන් කර නැත.
02	2018 වර්ෂයේදී රු.546,264,452ක් වටිනා වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණද එම යන්ත්‍රයේ උපරිම ධාරිතාව උපයෝජනය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. 2022 සහ 2023 යන වර්ෂයන්හි මුද්‍රිත සමස්ත ප්‍රශ්නපත්‍ර ප්‍රමාණයෙන් පිළිවෙලින් සියයට 10 ක් සහ සියයට 17 ක් පමණක් අදාල	2021 2022 2023	අවශ්‍යතාවය හඳුනා ගෙන වත්කම් මිළදී ගත යුතු අතර අපේක්ෂිත ධාරිතාවයෙන් භාවිතා කල යුතු වීම.	යම් යම් තාක්ෂණික ගැටළු හේතුවෙන් යන්ත්‍රයේ උපරිම ධාරිතාවයෙන් මුද්‍රණ කටයුතු සිදු කිරීමට නොහැකි වූ අතර 2023.08. 28 දින වන විට ගැටළු විසඳා අ.පො.ස. උ.පෙළ 2023(2024) විභාගයේ ප්‍රශ්න පත්‍ර සංඛ්‍යාවෙන්	තාක්ෂණික ගැටළු නිරාකරණය කර ගැනීමට උත්සාහ කරමින් ඇත.

	යන්ත්‍රය භාවිතයෙන් මුද්‍රණය කර ගත හැකි වී තිබුණි.			සියයට 26.59ක් මුද්‍රණය කර ඇත.	
03	ප්‍රශ්න පත්‍ර වල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා 2018 වර්ෂයේදී රු.8,428,637 ක් වටිනා වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයේ Wrapping Solution කොටස මිලදීගෙන තිබුණ ද දැනට භාවිතා කරන රහස්‍ය ලේඛන ඇසුරුම් ක්‍රියාවලිය සමඟ එම කොටස නොගැලපීම හේතුවෙන් මේ දක්වා එම යන්ත්‍ර කොටස නිශ්කාර්යව පැවතුණි.	2021 2022 2023	යන්ත්‍ර කොටස මිලදී ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ සිට මිලදී ගැනීම දක්වා වූ ක්‍රියාවලියට සම්බන්ධ වී ඒ සඳහා බලය, අනුමැතිය, නිර්දේශය, ගෙවීම යන කටයුතු වලට සම්බන්ධ වූ සියළුම පාර්ශවයන් මේ සඳහා වගකිව යුතුය. මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතුකල යුතු ය.	එම කොටස රහස්‍ය පාසල් විභාග ශාඛාවේ අවශ්‍යතාවය හා නොගැලපෙන බැවින් භාවිතයට ගැනීමක් සිදු නොවිණි. වෙනත් කිසිඳු ශාඛාවකට එහි අවශ්‍යතාවයක් නොමැති බව දන්වා ඇති බැවින් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අදාල නියෝජිත ආයතනය සමඟ සාකච්ඡා කරමින් පවතින බව.	මේ වන විටත් යන්ත්‍ර කොටස භාවිතයෙන් ඉවත් කොට ඇත.
04	මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළ ඇතුලත් රු.630,000,000 ක වටිනාකමැති දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති බත්තරමුල්ල පිහිටි හෙක්ටයාර 1.356 ක ඉඩමෙහි නිත්‍යානුකූල අයිතිය මෙතෙක් පවරාගෙන නොතිබුණි.	2021 2022 2023	ඉඩම පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	විගණන කළමනාකරණ රැස්වීමේ තීරණය අනුව ගාස්තු ගෙවීමකින් තොරව ඉඩම පවරාගැනීම සඳහා 2024 මාර්තු 06 දිනැතිව අධ්‍යාපන ලේකම් වෙත නව කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටද ඉඩම පවරා ගෙන නොමැත.
05	2018 වර්ෂයේදී රු.28,500,000 ක් වැයකර දෙපාර්තමේන්තුව විසින් කිලෝවොට් 250 ක සූර්ය බලශක්ති පද්ධතියක් සවිකර තිබුණි. පද්ධතිය ස්ථාපනය කළ දින සිට වසර හතක කාලයක් අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු සැපයිය යුතු බවත්, රඳවාගත් මුදල් සියයට 10 නිදහස් කිරීමට පෙර සැපයුම්කරු විසින් නඩත්තු	2022 2023	සේවා සැපයුම් සඳහා ගිවිසුම් අත්සන් කළ යුතු වීම හා නඩත්තු ආයතන සමග සාකච්ඡා කර සේවා කටයුතු ඉතා ඉක්මනින් සිදුකර ධාරිතාවය උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත	නව සේවා ගිවිසුමක් ඉදිරිපත් කරන ලෙස **Ginso** ආයතනය වෙත දන්වා ඇති අතර එය ලද පසු ගිවිසුම් ගත වීමට කටයුතු කරනු ලබන බව.	2024 අගෝස්තු 31 දින වන විට ද සේවා ගිවිසුමකට එළඹ නොතිබුණි.

	සේවා සැපයීම සම්බන්ධයෙන් ගිවිසුමක් අත්සන් කළ යුතු බවත්, ලංසු ලියවිලිවල දක්වා තිබුණි. එහෙත් 2018 ජූලි 12 දින වන විට මෙම ව්‍යාපෘතියට අදාළ සියලුම මුදල් ගෙවා අවසන් කර තිබුණ ද මේ වන තෙක් සේවා සපයන ආයතනය සමඟ නඩත්තු ගිවිසුමකට එළඹී නොතිබුණි. මේ හේතුවෙන් සූර්ය බලශක්ති පද්ධතියේ නඩත්තු කටයුතු නිසි පරිදි සිදුවී නොතිබුණි.		යුතු වීම.		
06	2005 වර්ෂයේදී මිලදී ගනු ලැබූ Stitch Master Gathering and wire Stitching machine යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී කොළ ඉවතට හැලීම හේතුවෙන් මිලදීගත් මුල් අවස්ථාවේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයෙන් ඉවත් කර ඇති අතර අදාල යන්ත්‍රයේ වටිනාකම ඇතුලත් ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2022 2023	යන්ත්‍රය මිලදී ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ සිට මිලදී ගැනීම දක්වා වූ ක්‍රියාවලියට සම්බන්ධ වී ඒ සඳහා බලය, අනුමැතිය, නිර්දේශය, ගෙවීම යන කටයුතු වලට සම්බන්ධ වූ සියළුම පාර්ශවයන් මේ සඳහා වගකිව යුතුය. මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතු වේ.	අදාල සැපයුම්කාර සමාගම විමසා යන්ත්‍රය අවශ්‍යතාවය අනුව සක්‍රීය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	2024 අගෝස්තු 31 දින වන විටත් යන්ත්‍රය භාවිතයට ගත හැකි වන පරිදි සකස් කර නොතිබුණි.
07	2018 වර්ෂයේ ආරම්භ කරන ලද, 1990 වර්ෂයට පෙර වර්ෂවල වූ විභාග ප්‍රතිඵල ලේඛන මහජනතාව වෙත අවශ්‍ය අවස්ථාවන්හී දී නිකුත් කිරීමට පහසු වන ආකාරයට එම ප්‍රතිඵල ලේඛන පරිලෝකනය (scan) කර තබාගත හැකි ආකාරයේ මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 දින වන	2022 2023	පැරණි හා නව ලේඛන සංරක්ෂණයට අදාල ක්‍රමවේදයන් ප්‍රමාදයකින් තොරව විධිමත්ව ස්ථාපිත කල යුතුය.	2018 වර්ෂයේ දී පෞද්ගලික ආයතනයක් වෙත ආරම්භක අදියරක් වශයෙන් භාරදෙනු ලැබූ ලේඛන 5000 ක නියැදිය අපේක්ෂිත තාක්ෂණික පිරිවිතර සාක්ෂාත් වන අයුරින් ඉටු නොකිරීම හේතුවෙන් එම සමාගමේ ඇනවුම්	2024 අගෝස්තු 30 දින වන විටත් ප්‍රසම්පාදන කටයුතු අවසන් කර නොතිබුණි.

	විටත් අවසන් කර නොතිබුණි.			ලිපිය අවලංගු කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා නැවත ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව.	
08	දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන්ට අදාල සේවා ගිවිසුම 2021 නොවැම්බර් 30 වන දින අවසන් වී තිබුණ ද වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට නොහැකි වීම නිසා වෙබ් අඩවිය හා විද්‍යුත් සේවාවන් අනාරක්ෂිත වී තිබුණි.	2023	වෙබ් අඩවිය හා විද්‍යුත් සේවාවන් ආරක්ෂිතව පවත්වා ගැනීමට කටයුතු කල යුතු වීම.	නඩත්තු හා සේවාවන් වෙනුවෙන් නව ආයතනයක් තෝරා ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව.	2024 අගෝස්තු 31 වන තෙක් සේවා ගිවිසුම යාවත්කාලීන කර හෝ වෙනත් ආයතනයක් තෝරා ගැනීම සිදු කර නොමැත.

17. ශීර්ෂය - 213 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	6,994,446,131	2,366,280	6,992,079,851	තත්ත්වාගණනය කළ
2022	6,895,821,531	1,761,553	6,894,059,978	තත්ත්වාගණනය කළ
2023	6,699,726,395	36,852,583	6,662,873,812	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයෙහි ඇතුලත් රු.මිලියන 92.14 ක් වටිනා හෝමාගම පිටිපන පිහිටි පෙළපොත් ගබඩා සංකීර්ණය ඉදිකර තිබෙන ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය තහවුරු කරගෙන නොතිබුණි.	2023	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට කටයුතු කල යුතුය.	ඉඩමට අදාලව හෝමාගම දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බැවින් එහි තීන්දුව ලද පසු පැවරීම් කටයුතු සිදු කල හැකි බව හෝමාගම ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇති බව.	ඉඩමේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරා ගෙන නොතිබුණි.
02	2009 වර්ෂයේ සිට නැෂනල් පේපර් කොම්පැනි ලිමිටඞ් වෙතින් අයවිය යුතු රු.7,431,012 ක මුදල සමාලෝචිත වර්ෂය තුළ දී අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	2022 2023	අයවිය යුතු මුදල් නොපමාව අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතු අතර කාලීනව අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකල නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය.	අදාල ණය කපා හැරීම සම්බන්ධයෙන් කර්මාන්ත අමාත්‍යාංශය සමඟ කටයුතු කරමින් පවතින බව.	අය කරගෙන නොතිබුණි.
03	2008 වර්ෂයේ ලද අමාත්‍ය මණ්ඩල තීරණ දෙකකට අනුව අපහරණය කරන ලද රු.312,831,071 ක වටිනාකමක් සහිත පොත් 2017 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත් කර තිබුණු අතර නැවතත් 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රයෝජනයට ගත නොහැකි පොත් ලෙස	2022	වාර්ෂික පෙළපොත් අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මුද්‍රණය කළ යුතු පොත් ප්‍රමාණය තීරණය කළ යුතුය.	ගබඩා ශේෂය හා නැවත භාවිත ප්‍රතිශතය ගණනය කර 2024 වර්ෂය සඳහා පෙළපොත් අවශ්‍යතාවය ගණනය කර ඇති බව.	පෙළපොත් නැවත භාවිතය දිරිමත් කර රජයේ වියදම් අවම කරමින්, ළමුන්ගේ ආකල්පමය වෙනසක් ඇති කිරීමට ප්‍රමාණවත් වැඩපිළිවෙලක්

	රු.93,420,366ක් දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණි.				හඳුන්වා දී නොතිබුණි.
04	2022 වර්ෂයේ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියේ අරමුදල් රු.7,678,441 ක් භාවිතා කරමින් ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ සම්පත් පොත (16+) පිටපත් 15,000 ක් මුද්‍රණය කර තිබුණි. ඉන් 2024 අප්‍රේල් 30 දිනට බෙදාහැරිමකින් තොරව පොත් 1765 ක් ගබඩාවේ ඉතිරි වී තිබුණි.	2023	සැලසුම් ගත පරිදි මුද්‍රණය කල පොත් බෙදාහැරීම් සිදුකල යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	2024 සැප්තැම්බර් 27 දිනට පොත් 1,765 ක් ගබඩාවේ ඉතිරි වී ඇත.

18. ශීර්ෂය - 215 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	8,602,688,105	108,713,953	8,493,974,152	තත්ත්වාගණනය කළ
2022	8,619,559,967	105,696,993	8,513,862,974	තත්ත්වාගණනය නොකළ
2023	9,287,085,081	56,373,813	9,230,711,268	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01.	"ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීමේ ගිණුම" 2023 දෙසැම්බර් 31 දිනට පැවති රු.48,036,824 ක ශේෂයෙන් රු.27,177,140 ක් අදාල කාලය තුලදී භාණ්ඩාගාරයට හා අනෙකුත් ආයතනවලට ප්‍රේෂණය කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.	2021 2023	ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීමේ ගිණුම තුල රඳවාගෙන පවතින ඉතිරි මුදල් ශේෂ අදාල කාලය තුලදී භාණ්ඩාගාරයට හා අනෙකුත් ආයතනවලට ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතුය.	සිසුන්ගෙන් අයකර ගන්නා ලද මුදල් ශිෂ්‍ය සුබසාධනය සඳහා යොදා ගැනීමටත් ඉතිරි මුදල් සිසුන්ගේ අධ්‍යයන අවශ්‍යතා සඳහා පුහුණු උපකරණ මිලට ගැනීමටත් රඳවාගෙන ඇති බව.	රු.5,175,547.18 ක ශේෂයක් නිරවුල් කිරීමට තවදුරටත් ඇත.
02.	මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කර ඇති රු.2,104,197 ක් වටිනා අලාභ හානි ශේෂ 06 කින් ශේෂ 03ක් එම අලාභ හානි සිදු වී වසර 05 ඉක්මවා ඇති අතර වසර 10 ඉක්මවූ ශේෂ 03ක් පැවති අතර ඒ සඳහා මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	අලාභ හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අප්‍රමාදව කටයුතු කළ යුතුය.	අලාභයන් අයකර ගැනීමට වගකිය යුතු නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර සමහර අලාභ සම්බන්ධව අධිකරණයේ නඩු පවරා රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අලාභ හානි සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.
03.	දෙපාර්තමේන්තුවේ සිට වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා ආයතන සඳහා ස්ථාන මාරු වී ගිය , මිය ගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල, සේවය අවසන් කල හා සේවය අතහැර ගිය,	2021 2022 2023	අයවිය යුතු ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2023 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට ඉතිරි වූ නිලධාරීන් 63 දෙනාගේ ණය මුදල් අයකර ගැනීම සඳහා නිසි	නිලධාරීන්ගෙන් අයවිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කර

	නිලධාරීන් 63 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.5,119,650ක් වූ අතර ඒ තුළ වර්ෂ 03කට වඩා වැඩි කාලයක සිට පැවත එන නිලධාරින් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.2,378,403ක ශේෂයක් පැවතුණි.			ක්‍රියාමාර්ග ගන්නා බව.	නොතිබුණි.
04.	දෙපාර්තමේන්තුව යටතේ ඇති තාක්ෂණ / කාර්මික විද්‍යාල 39 න් විද්‍යාල 15 ක පිහිටි ඉඩම් වල අයිතිය අදාල විද්‍යාල වෙත හෝ දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.	2021 2023	ඉඩම් වල අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	විවිධ හේතූන් මත මේ දක්වා පවරා දීම සිදුකර නොමැති බවත් ප්‍රාදේශීය ලේකම්වරු මේ සම්බන්ධයෙන් සෘදනීය කාර්යයභාරයක් ඉටු නොකරන බැවින් ප්‍රතිපත්තිමය තීරණයක් ගතයුතු ගැටළුවක් බව.	ඉඩම් වල අයිතිය අදාල විද්‍යාල වෙත හෝ දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

19. ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	544,414,417	544,414,417	-	තත්ත්වාගණනය කළ
2022	665,096,809	665,096,809	-	තත්ත්වාගණනය කළ
2023	1,165,363,019	1,165,363,019	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදයෙන් අනුමත නිලධාරීන් හට මසකට රු.1000 ක උපරිමයකට යටත්ව දූරකතන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට උපදෙස් ලබාදී තිබුණ ද, ඊට පටහැනිව අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල අනුයුක්තව සේවය කරන දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන්ට හා සංවර්ධන නිලධාරීන්ට මාසිකව දූරකතන දීමනාවක් ලෙස රු.1000ක මුදලක් 2020 සැප්තැම්බර් සිට ගෙවා තිබුණි. ඒ අනුව සමාජ සේවා නිලධාරීන් 872 දෙනෙකු සඳහා 2020 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුල එකතුව රු.8,086,403 ක් වූ දූරකතන දීමනා ගෙවීම	2021 2022	විධිමත් අධිකාරි බලය ලබා ගැනීමට කටයුතු කල යුතුය.	දුරකථන දීමනාවක් ගෙවීමට අනුමැතියක් ලබා ගැනීම සඳහා කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය ලේකම් අනුමැතිය ලැබී ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ රෝහල් වලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරින් සඳහා පමණක් අදාළ දීමනාව ලබා දීමට සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් අනුමත කර ඇත. සමාජ සේවා දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය, වෘත්තීය පුහුණු ආයතන, ළමා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන, මත්ලෝලි පුනරුත්ථාපන ආයතන වල සේවය කරන සමාජ සේවා නිලධාරින්, සංවර්ධන නිලධාරින් වෙතද දීමනාව ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල අතර ඒ සඳහා 2021 මාර්තු 16 දිනැතිව අදාල	මේ වන විට සමාජ සේවා නිලධාරින්ට පමණක් දූරකතන දිමනා ගෙවනු ලබයි. පෙර ගෙවන ලද දූරකතන දීමනා ප්‍රතිපූර්ණය කර නොමැත.

	සඳහා විධිමත් අධිකාර බලයක් ලැබී නොතිබුණි.			දීමනාව ලබා දීමටත් එය වැටුපට ගෙවීමටත් අනුමැතියත් ලබා දී ඇත. සමාජ සේවා නිලධාරීන්ගේ සංගමයේ ඉල්ලීම අනුව දුරකථන දීමනාවක් ගෙවීමට අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලැබී ඇත. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ රෝහල් වලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරින් සඳහා අදාළ දීමනාව ලබා දීම අනුමත කර ඇත. තවද දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ රෝහල් වලට අනුයුක්තව සේවය කරන සංවර්ධන නිලධාරින් සඳහා රු.1,000 ක දුරකථන දීමනාවක් ගෙවන බව දන්වා අනෙක් නිලධාරින් වෙතද දීමනාව ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් විසින් අනුමත කර එය වැටුපට ගෙවීම සඳහා අනුමැතියත් ලබා දී ඇත.	
02	වෘත්තීය පුහුණු ආයතන 07 ක් ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නිත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබීම හා වටිනාකම තක්සේරු කර නොතිබූ අතර ඉකුත් වර්ෂ 11 කට වැඩි කාලයක් තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් යටතේ ගොඩනැගිලි හා ඉදිකිරීම්	2021 2022 2023	අභ්‍යන්තර පාලන පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සමාලෝචනයන් හා වෙනස්කම් සිදු කර එහි වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.	පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කලට සමාලෝචනය සිදු කරනු ලබන බවත්, පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් ද සිදු කරනු ලබන අතර ඉදිරියේ දි මෙම සිදුකරනු ලබන වෙනස්කම් පිළිබඳව දැනුවත් කිරීමට පියවර	මෙතෙක් අදාළ කටයුතු සිදු කර වාර්තා ඉදිරිපත් කර නොමැත.

	ලෙස ගිණුම්ගත කර නොතිබුණි.			ගන්නා බව.	
03	රජයේ වාහනයක් ඉගෙනුම් ආධාරයක් වශයෙන් පරිහරණය කරන්නේ නම් නිසි ක්‍රමවේදයක් අනුව වාහනය අපහරණය කොට ලියාපදිංචිය මෝටර් රථ ආඥා පනත ප්‍රකාරව අවලංගු කිරීමෙන් පසු යොදාගත යුතු වුවත් වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ ඇති වාහන 5 ක වැසි අංක ද සහිතව ඉගෙනුම් ආධාරක වශයෙන් යොදා ගෙන තිබුණි. තවද වත්තේගම වෘත්තීය පුහුණු ආයතනයේ තිබෙන යතුරු පැදි 19 ක් කැටවල වෘත්තීය පුහුණු ආයතනය වෙත රැගෙන ගොස් තිබූ නමුත් යතුරු පැදිවල අංක තහඩු සහිතව එම ආයතනයේ රඳවා ගෙන තිබුණි.	2022 2023	වාහනය ලියාපදිංචිය අවලංගු කර අපහරණ කටයුතු සිදු කළ යුතුය.	ලියාපදිංචිය අවලංගු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරදෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දන්වා ඇති බව.	වාහන 5ක් හා යතුරු පැදි 19 ක් සම්බන්ධව කටයුතු මේ දක්වා අවසන් කර නොමැත.
04	ශ්‍රී ලංකාවේ සමාලෝචිත වර්ෂය වන විට ආන්තීකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රජාවගේ ස්වභාවය, ප්‍රමාණය හා ඔවුන් භූගෝලීය වශයෙන් විසිරීම පිළිබඳ සංඛ්‍යා ලේඛන, වාර්ෂිකව ඊට අලුතින් එකතුවන ප්‍රමාණයන් පිළිබඳ ඇස්තමේන්තුගත දත්ත, දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන විසින් වාර්ෂිකව සවිබලගන්වනු ලබන ප්‍රජාව පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන, දත්ත හා තොරතුරු ඇතුලත් දත්ත	2022 2023	සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන, දත්ත හා තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් පවත්වා ගෙන යාමට කඩිනමින් කටයුතු කර යුතුය.	ආබාධ සහිත පුද්ගලයින්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා Child Fund ආයතනය සමඟ එක්ව මූලික කටයුතු සිදුකරන බව.	තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ඇතුලත් කරමින් යාවත්කාලීන සිදු කරමින් පවතී.

	පද්ධතියක් පවත්වා ගෙන යාමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.				
05	වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු අක්කර 29ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 06 ක් පරිත්‍යාග කර වර්ෂ 11 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද, එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2021 2022 2023	ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කලයුතුය.	පවරා නොගත් ඉඩම් හා ගොඩනැගිලි වල තක්සේරු වාර්තාව පවරා ගැනීම අවසන් වූ පසු ලබා ගැනීමට කටයුතු කරන බව.	පෙන්වා දී ඇති ඉඩම් 6ක් තවදුරටත් තක්සේරු කටයුතු සිදුකර පවරා ගැනිමට හා ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි.

20. ශීර්ෂය- 217 **පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	117,069,018	282,714	116,786,304	තත්ත්වාගණනය නොකළ
2022	115,968,879	81,300	115,897,579	තත්ත්වාගණනය කළ
2023	111,242,562	36,657	111,205,905	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටළුවලට යොමු ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියළු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකර දීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර විය. දෙපාර්තමේන්තුව ආරම්භ වූ 1956 වර්ෂයේ සිට මේ වන විට වර්ෂ 65 ක් ගත වී තිබුණත්, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාළ නීති සම්පාදනය කිරීම මේ දක්වාම ඉටු කර නොතිබුණි. විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් සඳහා 2019 මාර්තු 06 වන දින කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණ ද, එම ප්‍රතිපත්තිය	2021	මෙහෙවරට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතු බව.	විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පලාත් ක්‍රියාකාරී සැලසුම් 08 ක් සකස් කරන ලදි. දිස්ත්‍රික්කවල සියළුම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා පරිවාස නිලධාරීන් එක්ව සබරගමු පළාත් ක්‍රියාකාරී සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සිදුකරන ලද අතර ඉදිරියේදී සෙසු පළාත්වල ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට යෝජිත අතර පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල සංචරණ සීමා තුල වැඩසටහන් පැවැත්වීම සඳහා සීමාකිරීම් පැවතිමද මේ සඳහා කල්ගත වීමට හේතුවක් විය.	විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් මේ වන විටත් සකස් කර නොමැත.

	2022 මාර්තු 25 විගණිත දින වන විටත් ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි.				
02	උපදේශන ගාස්තුද ඇතුලත්ව රු.2,350,000 ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී කාලීන හා නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතිය මූලා නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.මෙම දත්ත පද්ධතිය ක්‍රියාත්මක නොකොට නිෂ්කාර්යව පැවතුණි.	2022	තාක්ෂණික මෘදුකාංග පද්ධති වත්කම් ලෙස හඳුනාගත යුතු අතර එකී දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීමට වගබලා ගතයුතු වීම.	වත්කමක් ලෙස මෙම පද්ධතිය හඳුනා ගත යුතු නම් එලෙස හඳුනාගෙන අමාත්‍යාංශයේ වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇතිදැයි සොයා බලා එසේ ඇතුළත් කර නොමැති නම් අපගේ වත්කම් ලේඛනයට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කර වාර්තා කරන බව.	ප්‍රායෝගික හා තාක්ෂණික ගැටළු අධ්‍යයනය කර දත්ත පද්ධතිය සම්බන්ධයෙන් නිර්දේශ හා විසඳුම් ලබා ගැනීමට මේ වන විට කමිටුවක් පත් කර ඇත.
03	දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුර 2014 අගෝස්තු මාසයේ සිට ද, පරිවාස නිලධාරී තනතුර 2017 වර්ෂයේ සිට ද පුරප්පාඩුව පැවතුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තු වේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අත්‍යවශ්‍ය වන තනතුරු පුරප්පාඩු කඩිනමින් පිරවීමට කටයුතු කළ යුතුය.	නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද නමුත් සුදුසුකම් සපුරන අයදුම්කරුවන් නොසිටි බැවින්,බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය.මේ වන විටත් මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව බඳවා ගැනීම කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.	මෙම තනතුර සඳහා බඳවා ගැනීමට බඳවාගැනීම් ගැසට් නිවේදනය , අයදුම්පත්‍රය හා ලකුණු පටිපාටිය කෙටුම්පත් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2024.07.03 දින යොමු කර ඇත.

04	2019 සිට 2023 දක්වා කාල පරිච්ඡේදය තුල ශ්‍රී ලාංකික දරුවන් විදේශ රටවලට දරුකමට හදාවඩා ගැනීම සඳහා 32 දෙනෙකු ලබා දී තිබුණද විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතතෙහි 10C වගන්තිය අනුව හදාවඩා ගැනීම සඳහා ලබාදුන් දරුවන් පිළිබඳව අවුරුදු 10 ක් යනතෙක් අඛණ්ඩව පසුවිපරම් වාර්තා ලබා ගෙන නොතිබුණි.	2023	විදේශ හදාවඩා ගැනීම් ආඥා පනතට අනුකූලව කටයුතු කළ යුතු අතර භාර දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය නොමැති හා ශ්‍රී ලංකාවේ පදිංචි නොමැති ඉල්ලුම්කරුවන් විසින් දරුකමට හදාවඩා ගන්නා දරුවන් වෙනුවෙන් පමණක් 10C වගන්තියට අනුව ප්‍රගති වාර්තා ලබා ගැනීමේ හැකියාව පවතී. කෙසේ වුවද ප්‍රගති වාර්තා නිසි පරිදි ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් මේ වන විට ස්ථාපිත කර ඇත.	විදේශීය හදාවඩා ගැනීම් යටතේ ලබා දුන් දරුවන් 14 දෙනෙකු දේශීය හදාවඩා ගැනීම් ලෙස සලකා ප්‍රගති වාර්ථා තබාගෙන නොමැති බව සඳහන් කර ඇත.
05	1939 අංක 38 දරන ළමයින් හා යෞවනයන් පිළිබඳ ආඥා පනත වසර කීපයක සිට සංශෝධනය කරමින් පැවතියද සමාලෝචිත වර්ෂ අවසානයටත් එම ආඥා පනත සංශෝධනය අවසන් කර නොතිබුණි. තවද, 1941 අංක 24 දරන දරුවන් හදාවඩා ගැනීමේ ආඥා පනත කාලීන අවශ්‍යතාවයට ගැළපෙන ලෙස සංශෝධනය කර නොතිබුණි.	2023	ආඥා පනත් ඇතුළු නීති අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය.	පනත සංශෝධනය කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය විසින් කමිටු 2ක් පත් කර ඇති අතර එම කමිටුවලට සක්‍රියව දායක වී අදාළ සංශෝධනයන් කිරීමට කටයුතු කරමින් පවතින බව.	දරුවන් හදාවඩා ගැනීමේ ආඥාපනත කාලීනව අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමට අධිකරණ අමාත්‍යාංශය මගින් කමිටුවක් පත් කර ඇත.
06	අපයෝජනයට ලක්වන දරුවන්ට පුහුණුව ලබාදීම තුලින් සමාජගත කිරීම සඳහා වන පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය සහ ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථාන 2ක 2023 ජූනි 06 දින නැවත පවරාගෙන තිබුණි. එහෙත් භෞතික සම්පත් හා අවට පරිසරය යථා	2021 2022 2023	ළමා පුහුණු හා උපදේශන සේවා මධ්‍යස්ථානය යථා තත්ත්වයට ගැනීම සඳහා කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකර ගැනීමට පියවරගත යුතුය.	මධ්‍යස්ථානය යථා තත්ත්වයට පත්කිරීම උදෙසා ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන, **ADB** සහ **UNICEF** වෙතින් සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	අවශ්‍ය ප්‍රතිපාදන, ADB සහ UNICEF වෙතින් සපයා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

	තත්වයට පත්කර පුහුණු හා උපදේශන සේවා සැපයීම සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
07	දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානයේ නිලධාරීන් 60 දෙනෙකුට පමණ පුහුණු වීම් සිදුකළ හැකි වායු සමීකරණය කළ සියළුම පහසුකම් සහිත දේශන ශාලා දෙකක් නිශ්කාර්යව පැවතුණි.	2023	කඩිනමින් අලුත්වැඩියා කටයුතු සිදුකර මධ්‍යස්ථානය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	දැනට සැලසුම් කර ඇති අලුත්වැඩියා කටයුතු සිදු කර නැවත එකී මධ්‍යස්ථානයේ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව.	අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී.
08	ජාතික ප්‍රතිපත්තීන් හා ජාතික ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින්ද, නීතිමය ගැටළු වලට මුහුණදුන් ළමයින්ද සුවිශේෂී කර ගනිමින් සියළු ළමයින්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදාකර දීම පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, බරපතල අවදානමට ලක්වන වීදි දරුවන් හඳුනාගෙන එම දරුවන් සම්බන්ධ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට හා එම දරුවන්ගේ අයිතීන් තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් නිසි යාන්ත්‍රණයක් මේ දක්වා සකස් කර ක්‍රියාවට නංවා නොතිබුණි.	2023	ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ප්‍රකාරව වීදි දරුවන්ගේ අයිතීන් තහවුරු කර ගැනීම සඳහා නිසි යාන්ත්‍රණයක් සකස් කල යුතුය.	වීදි ළමුන් පිළිබඳව දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ හැකියාවක් මෙම දෙපාර්තමේන්තුව සතුව නැත. දෙපාර්තමේන්තු වාර්ෂික වැඩ සැලැස්ම තුළ ක්‍රියාත්මක කරන ආන්තික ප්‍රජාවගේ දරුවන්ගේ අයිතිවාසිකම් කඩ වීම වැලැක්වීම සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබෙන ප්‍රතිපාදන සීමාව තුළ මැදිහත් වීම් සිදු කරනු ලබයි. එසේම දෙපාර්තමේන්තු ප්‍රතිපාදනයන්ට අමතරව මෙම දෙපාර්තමේන්තුව මඟින් ප්‍රා.ලේ කාර්යාල වලට අනුයුක්ත කර සිටින ක්ෂේත්‍ර නිලධාරීන් විසින් බාහිර ආයතන සම්බන්ධ කර ගනිමින් වීදි දරුවන් වෙනුවෙන් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.	වීදි දරුවන් සම්බන්ධව නිසි යාන්ත්‍රණයක් සකස් වී නොමැත.

21. ශීර්ෂය- 219 **ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,826,921,994	198,372,237	3,628,549,757	තත්ත්වාගණනය කළ
2022	3,985,836,741	143,637,644	3,842,199,097	තත්ත්වාගණනය කළ
2023	4,006,151,141	104,467,138	3,901,684,003	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දෙපාර්තමේන්තුව සතු ටොරින්ටන් සහ පොළොන්නරුව දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ ඇතුළුව දෙපාර්තමේන්තුව වෙත මෙතෙක් අයිතිය පවරා ගෙන නොමැති පළාත් සභා සහ පළාත් පාලන ආයතන 07 කට අයත් ඉඩම් වල මේ දක්වා සිදු කරන ලද ඉදිකිරීම්වල රු. මිලියන 4,496.50ක තක්සේරු වටිනාකම් සහ ඊට අදාළ ඉඩම්වල රු. මිලියන 27,713.82 ක තක්සේරු වටිනාකම් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. ඊට අමතරව, ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා නොගෙන ඉදිකරන ලද අම්පාර, පුත්තලම, මන්නාරම, ගාල්ල යන දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ 04 කට සහ සබරගමු පළාත් ක්‍රීඩා සංකීර්ණයට අදාල වටිනාකම්ද තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.	2021 2022 2023	අදාල ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමේ කටයුතු කඩිනමින් කළයුතු වේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. (ඉඩම් සහ දිස්ත්‍රික් ක්‍රීඩා සංකීර්ණ වලට අදාල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.)
02	2013 සිට 2020 දක්වා වූ වර්ෂවල ආරම්භ කරන ලද ඇස්තමේන්තු වටිනාකම් එකතුව රු. මිලියන 1,604 ක් වූ ව්‍යාපෘති 08 ක් නිම නොකොට අත්හැර දමා තිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වැය කළ මුදල රු. මිලියන 586 ක් වී තිබුණි.	2021 2022 2023	ආරම්භ කරන ලද ව්‍යාපෘති සැලසුම් කරන ලද ආකාරයට ඉදිකර සාර්ථකව නිම කිරීමට කටයුතු කළයුතු වේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.
03	මාතලේ බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාපිටියේ ඉතිරි වැඩ නිම කිරීම වෙනුවෙන් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු රු. මිලියන 47.5 කින් රු. මිලියන 1.14 ක් ඉටු නොකළ වෙනත් කාර්යයන් සඳහා ඉංජිනේරුමය	2023	දෙපාර්තමේන්තුප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් බැවින්, ඉදිරිපත්කර ඇති නිරීක්ෂණයන්ට අවධානය යොමුකොට සිදු වී ඇති අලාභයන්ට	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. (අලාභයන්ට වගකිව යුත්තන් හඳුනාගෙන එකී අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.)

	කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙත ගෙවා තිබුණි. මීට අමතරව, ධාවන මංතීරු ඉදිකරන ප්‍රදේශයේ හා ක්‍රීඩාපිටියේ ඇතුළත කපා ඉවත් කරන ලද ඝන මීටර් 506.12 ක පස් කොටස් කපා ඉවත් කිරීම වෙනුවෙන් රු. මිලියන 1.31ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණත්, ඉවත් කල යුතු ප්‍රමාණය ඝන මීටර් 273.58 ක් පමණක් වී තිබුණි. එබැවින් පස් ඝන මීටර් 232.54 ක් වැඩිපුර ඉවත් කර රු.602,279 ක් ඒ සඳහා කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. එසේම වැඩිපුර ඉවත් කරන ලද පස් නැවත පිරවීම සඳහාද රු.639,485 ක් කොන්ත්‍රාත්කරු වෙත වැඩිපුර ගෙවා තිබුණි.		වගකිව යුත්තන් හඳුනාගෙන එකී අලාභ අයකර ගැනීමට කටයුතු කලයුතු වේ.	
04	2023 වර්ෂය තුලදී දකුණු අප්‍රිකාවේ පැවැත්වූ ලෝක ශූරතා නෙට්බෝල් තරඟාවලිය වෙනුවෙන් සහභාගී වන්නන් සඳහා අනුමැතීන් ලබාදීම වෙනුවෙන් නිසි කාලරාමු සහිත ක්‍රමවේදයක් හඳුන්වා දීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. තවද මෙම තරඟාවලිය සඳහා සහභාගිවන්නන් වෙනුවෙන් ගුවන් ටිකට්පත් මිළදී ගැනීම සඳහා රු.මිලියන 8.78 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණද ගැනුම්කාර සමාගම විසින් අවස්ථා ගනණකදී පළමු මිල කැඳවීමේදී ඉහල මිල ගණන්ද, දෙවන මිල කැඳවීමේදී අවම මිල ගණන්ද ඉදිරිපත් කර ඇණවුම් ලබාගෙන තිබුණු බැවින් මෙම ටිකට්පත් මිළදී ගැනීමේ ක්‍රියාවලිය විනිවිධභාවයකින් තොර වූ බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරමින් හා විනිවිදභාවයකින් යුතුව ගුවන් ටිකට්පත් ප්‍රසම්පාදන කටයුතු සිදු කළයුතු වේ.	නිර්දේශය ක්‍රියාත්මක කරමින් පවතී. (දෙපාර්තමේන්තුව සැපයුම්කරුගෙන් පිළිගත හැකි හේතු ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.)
05	2023 වර්ෂයේ පවත්වන ලද පොදු රාජ්‍ය මණ්ඩලීය යොවුන් ක්‍රීඩා උළෙල පැවැත්වීම සම්බන්ධයෙන් නිසි පරිදි සැලසුම් නොකිරීම, ඇස්තමේන්තු සකස් නොකිරීම සහ ටිකට්පත් ප්‍රසම්පාදනය විනිවිද භාවයකින් සිදු නොකිරීම මත ගුවන් ටිකට්පත් හා වීසා නිසි කලට වේලාවට ආර්ථික වශයෙන් ඵලදායි ලෙස මිලදී ගැනීමට නොහැකි වී තිබීමෙන් දෙපාර්තමේන්තුවට	2023	දක්වා ඇති පාඩුව වෙනුවෙන් වගකිව යුත්තන් සහ ඊට හේතු සොයාබලා ඒවා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. (දක්වා ඇති පාඩුව මෙතෙක් අය කරගෙන නොතිබුණි.)

රු. මිලියන 13.81ක පාඩුවක් සිදු වී තිබුණු අතර, ඉහත හේතුවෙන් ජාතික ඔලිම්පික් කමිටුව මඟින් ටිකට්පත් ගාස්තුව ලෙස අයකරගත යුතුව තිබූ රු.මිලියන 7.03 ක මුදලද දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. තවද මෙම ක්‍රීඩා උළෙල සඳහා නිසි කලට ක්‍රීඩකයන් හා නිලධාරීන් හට ස්ථානගත වීමට නොහැකි වීම තුළින් ශ්‍රී ලංකාවට අපේක්ෂිත ජයග්‍රහණ අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

22. ශීර්ෂය - 220 ආයුර්වේද දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,768,600,000	2,257,301,318	511,298,682	තත්ත්වාගණනය කළ
2022	1,959,645,500	1,867,242,147	92,403,353	තත්ත්වාගණනය කළ
2023	2,040,000,000	1,993,624,591	46,375,409	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුව වෙත අයිතිය පවරාගෙන නොතිබුණු ඉඩම් 12ක වටිනාකම වූ රු.2,318,020,000 ක් මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණු අතර නිත්‍යානුකූලව දෙපාර්තමේන්තුවට අයිතිය පවරා ගෙන තිබුණු ඉඩම් 07ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	2023	ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කඩිනම් පියවර ගෙන ගිණුම්වල අදාළ ගැලපීම් සිදු කළ යුතු අතර පවරාගත් ඉඩම් ගිණුම් වල දැක්වීමට කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තුව සතු ඉඩම් නිරවුල් කර ගැනීමෙන් පසු ඒ ඒ ඉඩම්වල වටිනාකම් හා නිවැරදි දත්ත ගිණුමෙන් ඉදිරිපත් කරන බව, සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි මේ වන විට සියළුම අංශ වෙත තම ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු දෙපාර්තමේන්තුව හරහා තක්සේරු කර වාර්තා කිරිමට දන්වා යවා ඇති බව හා අම්පාර සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණ රෝහල පිහිටි ඉඩම සහ එහි ගොඩනැගිලි රු මිලියන 137.1 කට තක්සේරු කර 2024 අප්‍රේල් මස ගිණුම් සාරාංශයෙන් ගිණුම ගත කිරිමට කටයුතු කළ බව.	2024 අප්‍රේල් මස සිදුකළ සංශෝධනය හැර ගිණුම් තැබීම් නිවැරදි කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.
02	දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා භාවිතා කරන ඉඩම් 27 ක් පැවැති නමුත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය	2023	අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය.	මෙම ඉඩම් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දැනට භුක්ති විදින පදනමින් අදාල හිමිකම ඇති ආයතන වෙතින් පවරා ගැනීමට එම ආයතන සමඟ කළමනාකරණ කටයුතු සිදු කරන අතර	අයිතිය ඇති හා ගිණුම් ගත කළ ඉඩම් 06 ක්, අයිතිය නොමැති නමුත් ගිණුම් ගත කළ ඉඩම් 07ක්, අයිතිය ඇති නමුත් ගිණුම් ගත කර නොමැති

	ප්‍රාදේශීය කාර්යාල හා සංචාරක බංගලා පිහිටි ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටද දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.			අවසන් කළ වහාම වාර්තා කිරීමට සටහන් කර ගත් බව.	ඉඩම් 04 ක්, අයිතිය නොමැති හා ගිණුම් ගත කර නොමැති ඉඩම් 03 ක් සහ භාහිර පාර්ශවයන්ට භාරදිය යුතු ඉඩම් 07 ක් වශයෙන් අදාළ ඉඩම් හඳුනාගෙන ඇති නමුත් ඒවා නිරවුල් කිරීමට කඩිනම් පියවර ගෙන නොතිබුණි.
03	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් කොම්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර තිබුණු ගොඩනැගිලිවල වටිනාකම රු.635,961,733ක්වූ අතර ගිණුම්ගත කළ වටිනාකම 1,161,120,186ක් වූයෙන් රු.525,158,453ක ශුද්ධ වෙනසක් විය.	2023	දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් කොම්ට්‍රෝලර් ජනරාල් වෙත වාර්තාකර නිවැරැදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	කොම්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කර ඇති 06/2023 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි මේ වන විට හඳුන්වාදී ඇති මාර්ග ගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය යටතේ දෙපාර්තමේන්තුව සතු සියළු වත්කම් වාර්තා කිරීමට නියමිත බව.	2024 වර්ෂයේ ගිණුම්වලින් නිවැරැදි කිරීමට එකඟවී ඇත.
04	වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත නොකර 2018 වර්ෂයේ සිට ඉදිකිරීම් සඳහා දැරූ සම්පූර්ණ වියදම කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය රු.1,035,539,978 ක් දක්වා වර්ධනය වී තිබුණි.	2023 2022 2021	වැඩ අවසන් ගොඩනැගිලි හා ව්‍යුහවල පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය.	සිගාස් පරිගණක පද්ධතියේ නිවැරදි කිරීම් සිදු කරන බව.	2024 වර්ෂයේ ගිණුම්වලින් නිවැරැදි කිරීමට එකඟවී ඇත.
05	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් වන ගැටළුකාරී තත්වය විසදා ගැනීමට කටයුතු කරමින් පවතින අතර එම කරුණු සම්පූර්ණ කල වහාම ඇප තැන්පත් කිරීමේ ලේඛන	යාවත්කාලීන කර නොතිබුණි..

				යාවත්කාලීන කිරිමට කටයුතු කරන බව.	
06	දෙපාර්තමේන්තුව සතුව රු.93,944,999 ක් වටිනා වාහන පවතින බව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කර තිබුණු නමුත් සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර නොතිබුණු බැවින් දෙපාර්තමේන්තුව සතු සියලු වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල නිරූපනයවන බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.	2023	සිගාස් පරිගණක පද්ධතියේ එක් එක් වාහනය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සඳහන් කර ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.	සිගාස් පද්ධතියට ඇතුලත් කර ඇති වාහන සම්බන්ධ තොරතුරු ප්‍රමාණවත් නොවන බැවින් මෙම නිවැරදි කිරීම් තවදුරටත් ප්‍රමාදවී වී ඇති අතර ප්‍රවාහන හා ගිණුම් අංශ සම්බන්ධිකරණය වෙමින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව දත්ත පද්ධතිය නිවැරදි කර ඉදිරියේදී වාර්තා කිරිමට සටහන් කර ගත් බව.	2024 වර්ෂයේ ගිණුම්වලින් නිවැරදි කිරීමට එකඟවී ඇත.
07	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට	2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තුවේ අභන්තර විගණන අංශය මගින් සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය පරික්ෂාවන් සිදු කර අදාල නිලධාරීන් දැනුවත් කර අඩුපාඩු නිවැරදි කිරිමට දැනුම් දී ඇති අතර ඒ පිළිබඳ පසු විපරමද සිදු කර ඇති බව දන්වමි. වාර්ෂික සමාලෝචනයක් 2024 වර්ෂයේ සිට රජයේ විගණන අංශය වෙත ලබා දීමට කටයුතු කරන අතර විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වනු ලබන බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද විටද අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳ සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ඉදිරිපත් කර නොතිබුණි.

08	2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව චක්‍රලේඛයේ 2 (iv) ඡේදය ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර නොගෙන පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු. 53,325,525 ක් ගෙවා තිබුණි.	2023 2022 2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රෝගී සත්කාරක සේවා බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත නොකිරීම හේතුවෙන් පැමිණීමේ ලේඛන පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට කටයුතු කර ඇති බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමේ පාලන ක්‍රම ස්ථාපිත කර ගැනීමට නොහැකිව තිබුණි.
09	මුලික වියදම් ඇස්තමේන්තුවේ මුලධන හා පුනරාවර්තන වැය විෂයයන් 16ක ප්‍රතිපාදනය සියයට 19 සිට සියයට 2,000 අතර පරාසයකින් වැඩි කරමින් සහ තවත් වැය විෂයයන් 05ක ප්‍රතිපාදනය සියයට 54 සිට සියයට 83ක් අතර පරාසයකින් අඩුකරමින් සංශෝධනය කිරීම යනාදී කරුණු හේතුවෙන් මුලික වියදම් ඇස්තමේන්තුව නිසි අධ්‍යනයකින්, අවබෝධයකින් තොරව හා අතාර්තිකව පිළියෙල කර තිබුණු බව නිරීක්ෂණය විය.	2023	ප්‍රතිපාදන සැලසුම් පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	මුලික වියදම් ඇස්තමේන්තුව 2022 වර්ෂයේ අගෝස්තු මසදී සැලසුම් කළද ඉන් පසු රට තුළ ඇති වූ උද්ධමනකාරී තත්වය හේතුවෙන් සියළුම භාණ්ඩ හා සේවා වල මිල ගණන් අනපේක්ෂිත පරිදි ඉහල යාම හේතුවෙන් අත්‍යාවශ්‍යම වියදම් පමණක් දරමින් (එනම් ජලය , විදුලි , දුරකථන, ආහාර හා ඖෂධ) රෝගී සත්කාරක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට සිදුකර ඇති බව.	ඉදිරි ඇස්තමේන්තු නිසි අධ්‍යනයකින්, අවබෝධයකින් හා තාර්තිකව පිළියෙල කරන බවත් ප්‍රතිපාදන සැලසුම් පරිදි උපයෝජනය කිරීමට කටයුතු කරන බවත් ආයුර්වේද කොමසාරිස් ප්‍රකාශ කර ඇත.
10	ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 02කින් අවශ්‍යතා 05ක් සඳහා ලැබුදුන් රු.53,083,332ක ප්‍රතිපාදන වලින් සමාලෝචිත වර්ෂය අවසානයේ රු.15,630,895ක	2023	වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන හැකිතාක් දුරට ඵලදායීව උපයෝජනය කළ යුතුය.	2023 වර්ෂයේ කැබිනට් අනුමැතිය මත බඳවා ගත් බහු කාර්ය සංවර්ධන සහයකයින්ගේ වැටුප් බහු කාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවෙන් වෙන් වුවද එය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන තුලින්	20224 වර්ෂයේ ප්‍රතිපාදන සැලසුම් කළ පරිදි උපයෝජනය කිරීමට කටයුතු කරන බව ආයුර්වේද කොමසාරිස් ප්‍රකාශ කර ඇත.

	ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එකී ප්‍රතිපාදන ඉතිරිවීම් මුළු ප්‍රතිපාදන වලින් සියයට 08 සිට සියයට 31 දක්වා පරාසයක් ගෙන තිබුණි.			කළමනාකරණය කිරීමට හැකි වූ බැවින් 334-1-1-0-1003-11 වැය විෂය ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වන අතර අනෙකුත් වැය විෂයන් යටතේ සැලසුම් කළ සියළුම වැඩ සටහන් ඇස්තමේන්තු ගත වියදමට වඩා අඩුවෙන් ඉටු කර ගැනීමට හැකි වූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වූ බව.	
11	ඉකුත් වර්ෂවලදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබුණු ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,265,768 ක් ගෙවිය යුතුව පවතින බව එම සංස්ථාවේ ගිණුම් අනුව තහවුරු වූ නමුත් එම බැරකම දෙපාර්තමේන්තුවේ බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.	2023, 2022	සියළු බැරකම් නිවැරදිව හඳුනා ගෙන බැරකම් හා බැඳීම් පිළිබඳ ප්‍රකාශයේ දැක්විය යුතුය.	2022 වර්ෂයට පෙර ඖෂධ සංස්ථාවෙන් ලබා ගෙන තිබූ ඖෂධ වෙනුවෙන් 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සංස්ථාවට ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් වී නොමැති අතර මේ සම්බන්ධ සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන මෙන් ආයුර්වේද සංස්ථාව වෙත ලිපියක් යොමු කර ඇත. එම තොරතුරු ලද පසු අවශ්‍ය කටයුතු සිදු කර වාර්තා කරන බව.	ආයුර්වේද ඖෂධ සංස්ථාවේ අලෙවි අංශය වෙත ගොස් හිඟ බිල්පත් සම්බන්දධව පැවති ගැටළු නිරාකරණය කර ගැනිමටඅවශ්‍ය තො රතුරු ලබා ගෙන ඊට අදාල ලිඛිත ලේඛන ලබා ගැනිමට, අදාල ආයතන වෙත ලිපි යොමු කර ඇති බවත් එම ආයතනය වෙතින් පිළිතුරු ලද පසු ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇති බවත් විගණන හා කළමනාකරණ කමිටුවට වාර්තා කර තිබුණි.
12	ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, වැඩ තහනමට ලක්වී වර්ෂ 3ත් වර්ෂ 10ත් අතර කාලයක් ගතවී තිබුණු	2023, 2022	පසු විපරම් කිරීම හා ප්‍රමාණවත් අධීක්ෂණය මගින් ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය. ආයතන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමේ වගකීම	වැඩ තහනමට ලක්වී වර්ෂ 3ත් වර්ෂ 10ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 177,985 ක් වූ ණය නිරවුල් කිරීමට අදාලව ඇපකරුවන්ගෙන් අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව, නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක ණය නිරවුල්	ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

	නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 177,985 ක් ද, වර්ෂ 20 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 05 දෙනෙකුගෙන් රු. 127,060 ක් ද, අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි.		ඉටුනොකල නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කිරීමට අදාලව වසර 20 කට අධික කාලයක් ගත වී ඇති බැවින් තොරතුරු අනාවරණය කර ගැනීම තරමක දුෂ්කර කටයුත්තක් බවට පත්ව ඇති බව, කෙසේ නමුත් ණය අයකර ගැනීමේ කටයුතු අඛණ්ඩව සිදු කරන බව .	
13	ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල් වලින් හෝ අයකර ගත යුතුය. නමුත් 2023 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම ගොස් වසර 02ක් ඉක්ම වූ නිලධාරීන් 11 දෙනෙකුගෙන් අයවිය යුතු රු.619,110 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.	2023, 2022,	නිලධාරියකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක වෙත ඉදිරිපත් නොකළ හා නොසැලකිලිමත් ව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගත යුතුය.	විගණන නිරීක්ෂණ පිළිගන්නා බව හා මුදල් අයකර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. විශ්‍රාම ගිය නිලධාරීන් අතුරින් විශ්‍රාම ගොස් දැනට අවුරුදු 20 කට අධික කාලයක් ගත වී ඇති නිලධාරීන් තිදෙනා සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කර ගැනීම තරමක දුෂ්කර කටයුත්තක් බවට පත් ව ඇති බව. කෙසේ වෙතත් ඉදිරියේ දී තවදුරටත් මෙම ණය ශේෂයන් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගෙන නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව.	ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.
14	2023 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය වර්ෂ 01ක් වර්ෂ 03ක් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 09 දෙනෙකුගෙන් රු. 701,686ක්ද, වර්ෂ 05ක් වර්ෂ 10ත් අතර කාලයක් ගත වී තිබුණු නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු. 306,950 ක්ද වර්ෂ 20ක් ඉක්මවා තිබුණු නිලධාරීන් 21 දෙනෙකුගෙන්	2023, 2022	ණය මුදල් අයකර ගැනීම සඳහා වහාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	අය වීමට ඇති ණය මුදල ගෙවන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව. 2024.06.30 දින වන විට ගෙවීම පැහැර හැරිය හොත් ඇප කරුවන් වෙතින් අයකර වාර්තා කිරීමට සටහන් කර ගත් බව. තවද එක් නිලධාරියකු වාරික වශයෙන් ගෙවීම් ආරම්භ කර ඇති බව.	ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

	රු. 883,610 ක්ද, අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.				
15	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5,4.6 හා 6.3 වගන්තිය හා 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයෙහි 03 (ආ) ඡේදය, 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයෙහි 04 ඡේදය ප්‍රකාරව මියගිය නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, මියගොස් 2023 දෙසැම්බර් 31 දිනට මාස 06 කට වැඩි කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 08 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු. 642,644 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.	2023, 2022	ආයතන සංග්‍රහය හා අදාල මුදල් චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතුය.	රු.49,300.00 ක ණය ශේෂක් සහිත නිලධාරියා අවුරුදු 20 කට පෙර මියගොස් ඇති බව. එකතුව රු. 121,250 ක් වූ නිලධාරීන් 02 දෙනෙකුට අදළ මරණ පාරිතෝෂික මුදල් ගෙවනු ලබන අවස්ථාවේ දී අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව හා රු.119,550ක ණය ශේෂය මරණ පාරිතෝෂිකය සහ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් ගෙවීමට ඉදිරිපත් වූ වහාම නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. රු.178,910.00 ක ණය ශේෂයක් සහිත මෙම නිලධාරියා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වන ඇල්පිටිය ප්‍ර.ලේ.කා. වත්කම් පිළිබඳ තහවුරුවක් ලැබී ඇති අතර වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප ගෙවන බවට තහවුරු කර ඇති බව. ඒ අනුව මරණ පාරිතෝෂිකය ගෙවීම් කිරීමේදී ණය මුදල නිරවුල් වී ඇත්ද යන්න විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් තොරතුරු අනාවරණය කර ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කර වාර්තා කරන බව. එකතුව රු. 173,634 ක් වූ නිලධාරීන් 03 දෙනෙකුට අදළ මරණ පාරිතෝෂිකයන් මෙතෙක් ගෙවා නොමැති බැවින් ගෙවන අවස්ථාවේ දී අයකර ගැනීමට කටයුතු කරන බව.	ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.

16	සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ඊට අනුගතව කටයුතු කර නොතිබුණු අතර අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන අයුරින් අවශ්‍ය කාලීන සංශෝධන සහිතව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව දැනට ප්‍රධාන කාර්ය සාධන දර්ශක තුනක් හඳුනාගෙන ඇති බව. ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කරගත් බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් කාර්ය සාධන දර්ශක පිහිටුවා ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.
17	ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන 2001 වර්ෂයේ සිට නියමු ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර 2005 වර්ෂයේ සිට අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය දක්වාම එය අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර ව්‍යාපෘතිය සඳහා 2005 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.මිලියන 877.2 ක් වැය කර තිබුණි. 2022 වර්ෂයේ සිට ව්‍යාපෘතිය සඳහා වෙනම ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර සංවර්ධන වැඩසටහනේ රෝගී ප්‍රතිකාර සේවා ව්‍යාපෘතිය යටතේ පුනරාවර්තන වියදම් සඳහා පමණක් ප්‍රතිපාදන සලසා ගෙන නිලධාරීන් 218 දෙනෙකුට වැටුප් හා දීමනා වශයෙන් රු.මිලියන 287.4 ක්ද අනෙකුත් වියදම් සඳහා රු.මිලියන 5.5 ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන 292.9 ක්	2023 2022 2021	ව්‍යාපෘති කාලසීමාව අවසන්ව ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවේනම් එය සතුව පැවැති භෞතික හා මානව සම්පත් දෙපාර්තමේන්තු වේ අරමුණු ඉටුකර ගැනීමට හෝ උතුරු මැද පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවාවට සඳහා යොදා ගැනීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතීන් ලබාගෙන ඒ අනුව ව්‍යාපෘති කාර්යාල නඩත්තුව හා කාර්ය මණ්ඩල සඳහා දරන වියදම් සීමා කර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ව්‍යාපෘතිය අවසන් කර ව්‍යාපෘතිය යටතේ ඇති මානව හා භෞතික සම්පත් විධිමත්ව උතුරු මැද පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක වන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවාවට භාරදීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් අමාත්‍යාංශ මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව අනෙකුත් දිස්ත්‍රික්ක සඳහා සේවා ව්‍යාප්ත කිරීමට කටයුතු කර නොතිබුණි.

	වැයකර තිබුණි. කෙසේ වුවද අනෙකුත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීමට තරම් සාර්ථකව ක්‍රියාත්මක නොවූ මෙම ව්‍යාපෘතියට අදාළ පරිපාලන වියදම් දෙපාර්තමේන්තුවේ රෝගී ප්‍රතිකාර සේවා වැය විෂයයන් මගින් ආවරණය කරමින් තව දුරටත් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි.				
18	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28 ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2024 අප්‍රේල් 10 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම	2023 2022 2021	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායකවූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය.	මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව මේ වන විට අදාල යන්ත්‍ර හා උපකරණ ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත මාරු කිරීමට කටයුතු කර ඇති බව.	2024 ජුලි 23 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙන් හා ගණන්දීමේ නිලධාරීගෙන් වාර්තාවක් කැඳවා ඇත.

	ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු. 28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය.				
19	ආයුර්වේද දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියම ඇතුළත්වන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) සැකසීම සඳහා 2021 වර්ෂයේ මෙන්ම 2022 වර්ෂයේදීද රු. මිලියන 25 බැගින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණු නමුත් එම කාර්යය ඉටුකර නොතිබුණි.	2023 2022 2021	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.	2023 වර්ෂයේදී මේ සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් විධිමත් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර නොතිබුණි .
20	දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඔසු උයන් ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය ඇගයීම සඳහා කාර්යසාධන දර්ශක පිහිටුවා නොතිබුණු අතර ක්‍රියාකාරකම්වල ප්‍රගතියද සමාලෝචනය කර නොතිබුණි.	2023 2022 2021	කාර්යසාධන දර්ශක පිහිටුවා ක්‍රියාකාරකම්වල ප්‍රගතිය සමාලෝචනය කඩිනම් කළ යුතුය.	මේ සම්බන්ධව දැනට ප්‍රධාන කාර්ය සාධන දර්ශක 03ක් හඳුනාගෙන ඇති බව. ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කරගත් බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටත් කාර්ය සාධන දර්ශක පිහිටුවා ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.
21	රුපියල් මිලියන 1,164.13ක් වැය කර ඉදිකරන ලද බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව ගොඩනැගිල්ලේ වැඩ නිමකර වසර 03කට අධික කාලයක් ගතවී තිබුණද ගොඩනැගිල්ල පූර්ණ ධාරිතාවයෙන් උපයෝජනය කිරීමට	2023 2022	ගොඩනැගිල්ල පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට සැලසුමක් සකස් කර ඒ අනුව කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීම කළ යුතුය.	මෙම වාට්ටු සංකීර්ණයෙහි පෙන්වා දී අඩු පාඩු සම්පූර්ණ කිරීම සඳහා ඔබගේ විමසුමෙහි දක්වා ඇති ප්‍රතිපාදන අවශ්‍ය වේ. ඒ අනුව 2024 අයවැය ප්‍රතිපාදන අනුව රුපියල් මිලියන 450 ක මුදලක් වෙන් කර ඇති අතර එමගින් අදාල ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා	දීප ව්‍යාප්ත ලංසු කැඳවීම 2024 ඔක්තෝබර් 15 දින විටත් සිදුකර නොතිබුණි.

	අවශ්‍ය ප්‍රධාන ජල ටැංකියක්, පල්දෝරු පද්ධතියක් හා ප්‍රධාන විදුලි සම්බන්ධතාවය ආදී කාර්යයන් අවසන් කර නොතිබුණි. ඒ සඳහා 2023 පෙබරවාරි 10 දින රු.715,267,800 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණු නමුත් එය ඉටු කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.			සහතිකය ලබා ගැනීමට අදාල කොටස් සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇති අතර එයට අදාල දීප ව්‍යාප්ත ලංසු කැඳවීම 2024 අප්‍රේල් මාසය තුල අවසන් කිරීමට සැලසුම් කර ඇති බවත්, දැනට මහල් 03 ක රෝගීන් ඇතුලත් කර තිබුනද විධිමත් රෝගී සත්කාරක සේවාව සඳහා අවශ්‍ය මූලික අවශ්‍යතා සම්පූර්ණ කර නොමැති බව.	
22	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ මහල් 08 කින් යුතු නව ගොඩනැගිල්ලේ බිම් මහල ඇතුළුව මහල් 04 ක ඇඳන් 183කින් යුත් සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කර තිබුණු නමුත් 1947 අංක 16 දරන මහ නගර සභා ආඥා පනතේ 127 වගන්තිය ප්‍රකාරව අනුකූලතා සහතිකයක් ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	නව ගොඩනැගිල්ලේ මහල් 04 ක සමාන්‍ය වාට්ටු 05ක රෝගී සත්කාර සේවා ක්‍රියාත්මක කරන බැවින් හැකි ඉක්මණින් අනුකූලතා සහතිකය ලබා ගත යුතුය.	අදාල අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ඇස්තමේන්තු සකසා 2020 වර්ෂයේදී ප්‍රතිපාදන ද වෙන් කර ගන්නා ලද නමුත් කොවිඩ් 19 රෝගීන් එයට යාබද ගොඩනැගිල්ලට ඇතුලත් කර ගත් බැවින් එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි වූ බව. මෙම තත්තවයට හේතුව දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂමතාවය නොව ප්‍රතිපාදන සලසා ගැනීමට ඇති දුෂ්කරතාවය බව.	අනුකූලතා සහතිකයක් නොමැතිව අදාළ ගොඩනැගිල්ල අධීවශයෙන් භාවිතා කරයි.
23	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශය ප්‍රකාරව පිළිගත් ආයතනයක් වෙත යොමු කර ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ හතරවන කාර්තුවේ තලතෙල් බෝතල් 1,980ක්, මීතෙල් බෝතල් 22ක්, මී පැණි	2023	ඖෂධ නිපදවීමට මිලදී ගනු ලබන අමු ද්‍රව්‍ය සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.3 මාර්ගෝපදේශීය ප්‍රකාරව පිළිගත් ආයතනයක් වෙත යොමු කර ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා	තත්ත්ව සහතික බැලීමේ ක්‍රමයක්/ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමක් සාමාන්‍යයෙන් රෝහල තුළ ක්‍රියාත්මක නොවන අතර, යම් ඖෂධයක් සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් අවශ්‍ය බවට ඖෂධ කමිටුව විසින් හඳුනාගන්නා ලද අවස්ථාවක එවැනි ඖෂධ කොළඹ විශ්වවිද්‍යාලයට	තත්ත්ව සහතික බැලීමේ ක්‍රමයක් හෝ ප්‍රමිතිය සම්බන්ධයෙන් වූ රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා ගැනීමේ ක්‍රමයක් ආයුර්වේද රෝහල් තුළ ක්‍රියාත්මක නොවන බව සඳහන් කර ඇත.

	බෝතල් 400ක් හා අබතෙල් බෝතල් 200ක් මිළ දී ගෙන තිබුණි.		ලබා ගැනීමට කටයුතු කල යුතුය.	හෝ නාවින්න බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය වෙත යොමු කර වාර්තා ලබා ගැනීමේ ක්‍රමවේදයක් පවතින බව.	
24	බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ නව අටමහල් ගොඩනැගිල්ලේ සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 288කින් 120ක් හෙවත් සියයට 42ක්ද රෝහලේ පැරණි සාමාන්‍ය වාට්ටුවල ඇඳන් 274කින් 76ක් හෙවත් සියයට 28ක්ද ඌණ උපයෝජිතව පැවැති බවද නව ගොඩනැගිල්ලේ නවීන කාමර පහසුකම් වලින් සමන්විත ඇඳන් 88ක ධාරිතාවයෙන් යුක්ත ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු 32කින් 08ක් ඌණ උපයෝජිතව පැවති බවද නිරීක්ෂණය විය.	2023	අවශ්‍ය කාර්ය මණ්ඩල හැකි ඉක්මණින් බඳවාගෙන ඌණ උපයෝජිතව පවතින සාමාන්‍ය වාට්ටු, නවීන කාමර පහසුකම් වලින් සමන්විත නව ගෙවන වාට්ටු සියල්ලම සහ පැරණි ගෙවන වාට්ටු රෝගී සත්කාරක සේවා වෙනුවෙන් උපයෝජනය කළ යුතුය.	හෙද කාර්ය මණ්ඩලය හිඟකම නිසා මෙම වාට්ටු පවත්වාගෙන යාමට නොහැකි වී ඇති බව දන්වන අතර කාර්ය මණ්ඩල බඳවාගත් වහාම මෙම වාට්ටු පවත්වාගෙන යා හැකි බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද ප්‍රගතියක් වාර්තා වී නොතිබුණි.
25	කොළඹ මහ නගර සභාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු විසින් බොරැල්ල, ශ්‍රී ලංකා ජාතික ආයුර්වේද රෝහල් ගබඩාවේ පැවති කොත්තමල්ලි තොගයක් පරීක්ෂාවට භාජනය කර එය පරිභෝජනයට නුසුදුසු බව දන්වා ඖෂධ නිෂ්පාදනාගාරයේ කාමරයක දමා මුද්‍රා තබා වසරකට වැඩි කාලයක් ගත වී තිබුණු නමුත් නිසි පරිදි ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් පිරිවැය රු.327,700 ක් වූ කොත්තමල්ලි කිලෝග්‍රෑම් 1130ක් විනාශ වී තිබුණි.	2023	මුදල් රෙගුලාසි 104 (1) පරිදි ඊට වගකිව යුතු පාර්ශවයන් නිශ්වය කර එම තොගයේ අලාභය ඔවුන් වෙතින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	අදාල අලාභය කොළඹ මහ නගර සභාවෙන් අයකර ගැනීමට කටයුතු කරන අතර ප්‍රගතිය වාර්තා කිරීමට සටහන් කර ගත් බව.	මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.

	එසේ වුවද මුදල් රෙගුලාසි 104 (1) පරිදි ඊට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර එම තොගයේ අලාභය ඔවුන් වෙතින් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.				
26	මංචංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී දෙපාර්තමේන්තුව විසින් වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු නොකර සියයට 25ක අධිභාරයක්ද ද සමඟ 2024 අප්‍රේල් 05 දින වන විට රු.519,600 ක් පමණක් අයකර ගෙන තිබුණි. මෙම සිද්ධියට වසර 10කට අධික කාලයක් ගතවී තිබුණු නමුත් ඉතිරි මුදල් අයකර ගැනීම සහ අදාළ වගකිවයුතු නිලධාරින්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) “ආ”පරිදි වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	තවදුරටත් අයවිය යුතුමුදල් අයකර ගැනීමටත් මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමටත් කටයුතු කළ යුතුය.	අදාළ වෛද්‍යවරයාගෙන් අයවිය යුතු රු. 185,870 ක මුදල අයකර ගැනීම සඳහා දන්වා ඇති අතර 2024.04.03 දින රු.20,000ගෙවා ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීම සම්බන්ධව නිතීමය පියවර ගැනීමට විමර්ශන අංශය දැනුවත් කර ඇති බව.	මේ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.
27	දෙපාර්තමේන්තුව සතුව ඔසු උයන් 08ක් පවතින අතර සමාලෝචිත වර්ෂයේ ඔසු උයන් 05කින් පමණක්	2023	ඔසු උයන්වලින් ලැබෙන ඵලදාව ආයුර්වේද රෝහල් වල	නාවින්න ඔසු උයන පර්යේෂණ හා ව්‍යාප්ති සේවා සඳහා පමණක් යොදා ගනු ලබන අතර	ඔසු උයන් විධිමත්ව කළමනාකරණය කර ගනිමින් ඒවායේ අස්වැන්න

	ඖෂධීය අමුද්‍රව්‍ය වර්ග 35කින් කිලෝග්‍රෑම් 629.17ක් ලබා ගෙන ආයුර්වේද ජාතික රෝහලට කිලෝග්‍රෑම් 552ක්ද, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය වෙත කිලෝග්‍රෑම් 18ක්ද, ආයුර්වේද ඖෂධ සංස්ථාව වෙත කිලෝග්‍රෑම් 59.5ක් සපයා තිබුණි. නාවින්න, කන්නෙලිය හා මිහින්තලේ යන ඔසු උයන් වලින් ඉකුත් වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේදීත් කිසිදු ඖෂධ වර්ගයක් සපයා ගෙන නොතිබුණි.		ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීමට හා ඒ පිළිබඳ ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමට විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතුය.	එය පර්යේෂණ ආයතනයෙහි උද්‍යානය ලෙස සැලකෙන බව. මිහින්තලය මේ දක්වා ඔසු උයනක් ලෙස ක්‍රියාත්මක වී නොමැති අතර පර්යේෂණ රෝහල පිහිටා ඇති ඉඩම ලෙස සැලකෙන බව. කන්නෙළිය ඔසු උයන තුළද මහා පරිමාණ ඖෂධ වගාව සිදු නොකරන අතර එය පර්යේෂණ හා ව්‍යාප්ති සේවා සඳහා පමණක් යොදා ගනු ලබන බව හා මේ වන විට ඔසු උයන්වල කාර්යභාරය හා අරමුණු සංශෝධිත පනත මගින් වෙනස් කරමින් මහා පරිමාණයෙන් ඖෂධ නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති බව.	රෝහල්වල ඖෂධ අවශ්‍යතා සඳහා යොදාගැනීම මගින් වියදම අඩුකර ගැනීමට හැකි වන නමුත් එවැනි අරමුණක් ස්ථාපිත කිරීම සඳහා සුදුසු පියවර ගෙන නොතිබුණි.
28	දෙපාර්තමේන්තුව සතුව වාහන 57 ක් පැවැති අතර මෙම වාහනවලට අදාළ ලොග් පොත් හා ධාවන සටහන් විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම, කාලීනව ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම, වාහන අවභාවිතා කල නිලධාරීන් හා රියදුරන් සම්බන්ධයෙන් විනය පියවර නොගැනීම,වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, ඇතැම් නිලධාරීන් නිසි අනුමැතියකින් තොරව වාහන භාවිතා කර තිබීම හා වාහන අවභාවිතා කළ නිලධාරීන් හා රියදුරන්	2023	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය.	ලොග් පොත් යාවත්කාලීන කරමින් පවතින බව. ප්‍රවාහන අංශයේ සියලුම රාජකාරි කටයුතු සඳහා සිටින්නේ ප්‍රවාහන නිලධාරි පමණක් බැවින් දෛනික ධාවන සටහන් පත්‍ර නිතිපතා පරික්ෂා කිරීමට හැකියාවක් නොමැති බව. ඔබ විසින් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව අදාල නිලධාරින් දැනුවත් කර සෑම අවස්ථාවකම ධාවන අවසර පත්‍රයෙහි මාණ්ඩලික නිලධාරියාගේ නිර්දේශය හා අනුමැතිය අනුව රාජකාරි සඳහා වාහන යොදවනු ලබන අතර ඇතැම් අවස්ථාවන්හිදි මාණ්ඩලික නිලධාරීන් කාර්යාලයේ රැදි නොමැති අවස්ථාවන්හිදි රාජකාරියේ ස්වභාවය අනුව මාණ්ඩලික නිලධාරියාගේ	වාහන අවභාවිතා කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි

	සම්බන්ධයෙන් විනය පියවර නොගැනීම, වාහන ධාවන අවසර පත්‍ර පරික්ෂාවන් නිසි පරිදි සිදු නොවීම සහ රියදුරන්ගේ අක්‍රමිකතාවයන් වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා වාහනවල ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය.			වාර්ෂික අනුමැතිය පරිදි අදාළ රාජකාරි සඳහා වාහන යොදවා ඇති බව. කෙසේ වුවද මෙම තත්වය පාලනය සඳහා පියවර ගෙන ඇති බව.	
29	බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ සේවය කරන නිලධාරීන් 44 දෙනෙකු විසින් නිසි අනුමැතියකින් තොරව ලබාගෙන තිබුණු නිවාඩු සහ අනුමත සීමාව ඉක්මවා ලබාගෙන තිබුණු නිවාඩු දිනයන් වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු නොකිරීම හේතුවෙන් රු.453,475 ක වැටුප් වැඩියෙන් ගෙවා තිබුණි.	2023	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය.	රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරි අනුමත කාර්යමණ්ඩලය 12ක් වන අතර එවකට සේවයේ යෙදී සිට ඇත්තේ නිලධාරීන් 04ක් පමණක් බවින් මෙම නිලධාරී හිඟය හේතුවෙන් සීමිත නිලධාරී කොටසකගෙන් ඉටුකරවා ගැනීමට සිදුවීම මත නිසි අනුමැතියකින් හා දැනුවත් කිරීමකින් තොරව සේවකයින් විසින් ලබාගන්නා ලද නිවාඩු පිළිබඳ නියමිත කාලය තුළ දැනුවත් කිරීමට නොහැකි වූ බව කාරුණිකව පෙන්වා දෙන බව. මෙම තත්වය ඉදිරියේදී නිවැරදි කරගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව.	අදාළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ආරම්භ කර නොතිබුණි
30	කොළඹ විශ්ව විද්‍යාලය යටතේ පාලනය වන දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය 2017 ජුනි 02 සිට බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලේ 05 වන මහලේ	2023, 2022	දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු අතර	දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය බොරැල්ල ආයුර්වේද රෝහලේ 5 වෙනි මහලේ ස්ථාපිත කිරීමට අදාලව විධිමත් ලෙස අත්සන් කරන ලද අවබෝධතා	අවුරුදු 20 කට පෙර විටත් රු.මිලියන 8 කට අධික විදුලි වියදම හෝ අයකර ගැනීමට නොහැකිව තිබුණි.

	ස්ථාපිත කර තිබුණද ඒ සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණු අතර මාසික කුලියක්ද අයකර ගෙන නොතිබුණි. තවද අදාළ ආයතනය විසින් 2018 සිට 2023 නොවැම්බර් දක්වා භාවිතා කර තිබුණු විදුලිය වෙනුවෙන් දෙපාර්තමේන්තුව ගණනය කර තිබුණු රු.7,571,445ක හිඟ විදුලි පරිභෝජන ගාස්තුව හෝ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නොහැකිව තිබුණි.		තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තාවක් ලබාගෙන ගාස්තු අයකිරීමට විධිමත් ගිවිසුමකට එළඹ මාසික කුලියක් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.	ගිවිසුමකට එළඹී බවට කිසිදු ලියකිවිල්ලක් අප සතුව නොමැති අතර ඒ පිළිබඳ සාකච්ඡා කර ඉදිරි කටයුතු කිරීමට එකඟ වෙන බව. විධිමත් ආකාරයට තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තාවක් ලබාගෙන ගාස්තු අයකිරීමට සාකච්ඡා මට්ටමින් පවතින බව. අදාල කටයුතු අවසන් කර විගණනයට වාර්තා කිරීමට සටහන් කර ගෙන ඇති බව. හිඟ ජල පරිභෝජන ගාස්තුව හා හිඟ විදුලි ගාස්තු අයකර ගැනිම සම්බන්ධයෙන් අදාල ආයතනය දැනුවත් කර තිබු අතර ඒ අතරින් 2023 දෙසැම්බර් මස දක්වා අදාල ජල පරිභෝජන ගාස්තු ලෙස රු. 22,200 ක මුදලක් ගෙවා අවසන් කර ඇති බව.	
31	බොරැල්ල ජාතික ආයුර්වේද රෝහලේ පවත්වා ගෙන යන වෙළඳකුටි පරීක්ෂා කර තක්සේරු කිරීම සඳහා පත්කළ කමිටුවක් විසින් 2020 මාර්තු 14 දින ඉදිරිපත් කළ නිරීක්ෂණ අනුව රෝහලේ ආපනශාලාව සුභසාධක සංගමය විසින් රු. 41,600ක මාසික කුළියකට භාහිර පුද්ගලයකුට පවරා අදාල කුලිය සංගමය විසින් ලබාගෙන ඇති බව අනාවරණය වී තිබුණි. 2020 ජුනි 24 දිනැති අංක 02/03 තක්සේරු/2020 දරන ආයුර්වේද	2023, 2022	අදාල මුදල් සුභසාධක සංගමයෙන් අයකර රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.	ආයුර්වේද ජාතික රෝහලේ සේවක සුභසාධක සංගමයේ ලේකම් වෙත යොමු කර ඇති මාගේ අංක 03/01/05-2-ii හා 2021.03.26 දිනැති ලිපියෙහි දක්වා ඇති පරිදි මාසික බදු කුලි පැහැර හැරිම ලෙස ගණනය කර ඇති රුපියල් 400,000 ක මුදල එවකට සුභසාධක සංගමයේ කාරක සභා නියෝජිතයන්ගේ වැටුපෙන් අයකර ගැනීමට සැලසුම් කර ඇති බව. අදාල අයකිරීම් 2024 අප්‍රේල් මස සිට වැටුපෙන් අයකර එහි ප්‍රගතිය ඔබ වෙත වාර්තා කිරීමට	2024 ඔක්තෝබර් 15 දින වන විටද කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණු අතර අදාළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතුද කර නොතිබුණි.

	කොමසාරිස්ගේ ලිපිය මගින් 2020 ජූනි මස දක්වා අයකරගත් කුලී මුදල් රජයේ ආදායමට බැරකරන ලෙස සුභසාධක සංගමයට දන්වා තිබුණද එම මුදල් රජයේ අදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.			සටහන් කර ගත් බව.	
32	රාජ්‍ය නිලධාරීන්ගේ ඇප අඥා පනතේ 612 වැනි අධිකාරය, මුදල් රෙගුලාසි 880 හා 881 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 09 ඡේදය ප්‍රකාරව 2024 මාර්තු 31 දින වන විටත් ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අයත් ආයතන වල ඇප තැබිය යුතු නිලධාරීන් 18 දෙනෙකු එකී විධිවිධාන ප්‍රකාරව ඇප තැබිමට කටයුතු කර නොතිබුණි.	2023, 2022	මුදල් රෙගුලාසි 880 හා 881 සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛනයේ 09 ඡේදය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් ඇප තැබිමට කටයුතු කළ යුතුය.	ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් වන ගැටළුකාරි තත්වය විසඳා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	2024 වර්ෂයෙන් ආරම්භ කර මුදල් රෙගුලාසි 892 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින්ගේ සංශෝධිත වාර්තාවක් වසර තුනකට වරක් එවීමට කටයුතු කරන බව සඳහන් කර තිබුණි.
33	2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9,11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුව තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන්	2023, 2022, 2021	තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය.	තිරසර සංවර්ධන අරමුණු සකස් කිරිම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර 2024.06.30 දින අදාල කටයුතු ඉටු කිරිමට සැලසුම් කර ඇති බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

	හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.				
34	බණ්ඩාරනායක අනුස්මරණ පර්යේෂණ ආයතනය සඳහා පර්යේෂණ නිලධාරි තනතුරු 18 ක් හා පර්යේෂණ සහායක තනතුරු 12 ක් අනුමත කරගෙන තිබුණද, ඉන් කිසිවෙකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර වමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහලට පර්යේෂණ කාර්යය මණ්ඩලයක් අනුමත කරගෙන නොතිබුණි.	2023, 2022	ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීම සඳහා එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව පර්යේෂණ නිලධාරි සහ පර්යේෂණ සහායක තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කළ යුතුය.	නාවින්න, බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය වෙත අනුමත පර්යේෂණ නිලධාරි සහ පර්යේෂණ සහකාර තනතුරු සඳහා බඳවාගැනීම් සම්බන්ධයෙන් ඉදිරියේදී සලකා බැලීමට නියමිත බව.	ආයුර්වේද පර්යේෂණ රෝහල් පිහිටුවීමෙන් අපේක්ෂිත කාර්යසාධනය ළඟා කර ගැනීමට හැකි වන පරිදි සංවිධාන හා ක්‍රම ස්ථාපිත කර නොතිබුණි.
35	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය, ආයුර්වේද රෝහල් හා අංශ 09 ක් වෙනුවෙන් ස්ථිර නිලධාරීන් පත් කිරීමට කටයුතු නොකර ආයුර්වේද කොමසාරිස් ජනරාල් තනතුර සඳහා පූර්ණකාලීන වැඩ බැලීමටත්, නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස් තනතුර හා දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ අධ්‍යක්ෂක තනතුර සඳහා පූර්ණකාලීන රාජකාරි ඉටුකිරීමටත්, සහකාර කොමසාරිස් - ශිල්පීය, සහකාර අධ්‍යක්ෂක (අධ්‍යාපන කාර්මික), රෝහල් අධ්‍යක්ෂක තනතුරු 08ක් හා නියෝජ්‍ය අධ්‍යක්ෂක	2023	සුදුසුකම් සහිත නිලධාරීන්ගෙන් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය.	නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස් තනතුර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ශ්‍රේණියේ නිලධාරීන් නොමැති බැවින් III ශ්‍රේණියේ නිලධාරියකු පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා පත්කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇති බව. දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනයෙහි අධ්‍යක්ෂ තනතුරට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නොමැති බැවින් II ශ්‍රේණියේ නිලධාරියකු පූර්ණකාලීනව රාජකාරී ඉටුකිරීම සඳහා පත්කර ඇති බව. ආයුර්වේද රෝහල් අධ්‍යක්ෂ, බොරැල්ල, ගම්පහ,	2024 ඔක්තෝබර් 15 දින වන විටද වෙනසක් සිදු වී නොතිබුණි.

	තනතුරු 02 ක් සඳහා රාජකාරි ආවරණ කිරීමටත් පත්කිරීම් සිදු කර තිබුණි.			මංචන්තෝඩුවායි, කෝනේෂ්පුරි, අම්පාර, මැදවච්චිය සහ හම්බන්තොට යන තනතුරු ශ්‍රීලංකා ආයුර්වේද වෛද්‍ය පරිපාලන I ශ්‍රේණියේ තනතුරු වන අතර II ශ්‍රේණියේ තනතුරු වන සහකාර කොමසාරිස් (ශිල්පීය), දේශීය වෛද්‍යක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහකාර අධ්‍යක්ෂ (අධ්‍යාපන කාර්මික) සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ, නාවින්න රෝහල යන තනතුරුවල රාජකාරි ආවරණය සඳහා වෛද්‍ය නිලධාරීන් පත්කර ඇති බව.	
36	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.5 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ආයතන විසින් නව ගාස්තුවක් හඳුන්වා දීමට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වුවද ආයුර්වේද පනත හෝ වෙනත් එවැනි ලිඛිත නීතියක් මඟින් ප්‍රතිපාදන සලසා නොගෙන සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුවේ සේවා ලාභීන්ගෙන් එකතුකළ රු.21,564,057 ක් වූ විවිධ ගාස්තු භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරන විකුණුම් සහ ගාස්තු 20.03.99.00 යන ආදායම් සංකේතය යටතේ රාජ්‍ය ආදායමට බැර කර තිබුණි.	2022	රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සියළුම ආදායම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමත ආදායම් සංකේතාංකයක් යටතේ රාජ්‍ය ආදායමට බැර කිරීමටත්, ආදායම් ගණන්දීමේ නිලධාරියා ලෙස ආයුර්වේද කොමසාරිස්වරයාට කටයුතු කිරීමටත් හැකිවන පරිදි නීතිමය පසුබිම විධිමත් පරිදි සකස් කර ගැනිමටත් 2023 වර්ෂයේදී කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ තීරණයන් අනුව ඉදිරියේදී කටයුතු කිරීමට සැලසුම් කර ඇතිබව හා ඒ අනුව ගාස්තු සංශෝධනයටත් අළුතින් ගාස්තු හඳුන්වා දිමටත් ඉදිරියේදී කටයුතු කරන බව.	ආදායම් ගණන්දිමේ නිලධාරියා ලෙස ආයුර්වේද කොමසාරිස්වරයාට කටයුතු කිරිමට හැකිවන පරිදි නිතීමය පසුබිම සකස් කර ගැනිමට 2023 වර්ෂයේදී කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ තීරණයන් අනුව පිළියෙල කල යෝජනා සඳහා භාණ්ඩාගාර එකඟතාව ලබාගෙන නීතිපතිට යොමු කළ බව ආයුර්වේද කොමසාරිස්වරයා ප්‍රකාශ කර ඇත.

37	ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 350ක් වූ පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර 2020 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 04 ක් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2019 අප්‍රේල් 03 දින අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබාගෙන තිබුණි. එසේවුවද, 2020 වර්ෂයේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2023 වර්ෂයේ රු.1,500,000 ක ප්‍රතිපාදන සලසා ගෙන කාර්යයන් 04 ක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණද පාරම්පරික වෛද්‍යවරුන් ඇගැයීම යන එක් කාර්යයක් පමණක් ඉටුකර ඒ සඳහා රු.697,408 ක් වැයකර තිබුණි.	2023 2022	රටේ පවතින ආර්ථික තත්ත්වය සමග ව්‍යාපෘතියේ අරමුණු හා ක්‍රියාත්මක කිරීමේදී පැනනැගුණු ගැටළු නැවත සමාලෝචනය කර වර්තමාන ආර්ථික තත්ත්වයට ගැලපෙන පරිදි ව්‍යාපෘතිය ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතීන් ලබාගැනීමට කටයුතු කළ යුතුය.	එකල රටතුළ පැවති ආර්ථික ස්ථායිතාවය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ප්‍රතිපාදන යම් ප්‍රමාණයක් වෙන් කර තිබුණු නමුත් සැලසුම් කල පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමත සැලැස්ම අනුව ප්‍රතිපාදන ලැබිය යුතු බව හා ඒ අනුව වෙන් කෙරෙන ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් සැලසුම් කළ එක් එක් ක්‍රියාකාරකම ඉටුකරන බව.	2024 වර්ෂය තුළ ඉතිරි කාර්යයන් නිම කිරීම සඳහා රු. මිලියනයක ප්‍රතිපාදන අනුමත කර ඇති බවත් ඒ සඳහා ක්‍රියාකාරකම් සැලැස්මක් සකස් කර ඇති බවත් ආයුර්වේද කොමසාරිස්වරයා ප්‍රකාශ කර ඇත.
38	සමාලෝචිත වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් දක්වා ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධිත ආයතන 18ක ආරක්ෂක සේවා සැපයීම සඳහා වූ රු. 74,759,059 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 1.2.1 (ඉ), 2.12, 4.2.2, 4.2.3 සහ 4.3 යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව දිනපතා පැය 24 ම ආවරණය වන පරිදි සියළුම සේවා ලක්ෂ්‍යාවල	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කර ගිවිසුම් කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කිරීමටත් සුදුසු පාලන ක්‍රම අනුගමනය කළ යුතුය. ප්‍රසම්පාදන	ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මට අනුව විධිමත් පරිදි යාවත්කාලීනව ප්‍රසම්පාදන කටයුතු පවත්වාගෙන යන බව.	ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව විධිමත් පරිදි කටයුතු කරන බවට එකඟ වී ඇත.

	නිලධාරීන් යොදවන බව තහවුරු කර ගැනීම පිණිස විධිමත්ව අධීක්ෂණ නිලධාරියකු පත්කර දිනපතා නම් ලැයිස්තු ලබා ගැනීම, ලොග් සටහන් පරීක්ෂා කිරීම, වරින්වර සේවා ලක්ෂ්‍ය පරීක්ෂා කර බැලීම යනාදී අභ්‍යන්තර පරීක්ෂාවන් සිදුකළ බවට තොරතුරු අනාවරණය නොවුණි.		මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය.		
39	සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් පරිශ්‍රයන්හි පිරිසිදු කිරිමේ සේවාව සැපයීම සඳහා වූ රු.1,947,258 ක කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.3, 2.5.1 (ආ), 2.6.1(ආ)(i) සහ 4.2.2, යන මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටුවල සාමාජිකයින් අදාළ කමිටු සඳහා ප්‍රමුඛත්වය ලබාදී නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහන සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබා දී නොතිබුණු බැවින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.එමෙන්ම අදාළ කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් සේවකයින්ගේ නම	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතු අතර කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අනුව කටයුතු කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් කිරීමටත් ගිවිසුම් කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කිරීමටත් සුදුසු පාලන ක්‍රම අනුගමනය කළ යුතුය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගත යුතුය.	කොවිඩ් වසංගතය හා අරගලකාරි තත්ත්වය නිසා ඇදිරිනීතිය ක්‍රියාත්මක විම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු රැස්කිරීම ප්‍රමාද වූ බව. කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව සේවකයින්ගේ නම්, අත්සන හා ලිපිනයන් ඇතුලත් වාර්තාවක් ගෙන්වා ගෙන ඇති බව. සේවකයින්ට නිල ඇඳුම් හා හැඳුනුම් පතක් ලබා දෙන ලෙස කොන්ත්‍රාත් ආයතනය දැනුවත් කර ඇති බව. සේවයට වාර්තා කිරිම හා පිටවීම සම්බන්ධ වාර්තාවක් ආයතන අංශය විසින් පවත්වාගෙන යනු ලබන බව.මේ වර්ෂයේදී ලංසු කොන්දේසි ප්‍රකාරව පවිත්‍රතා සේවා සපයන ආයතන තම සේවකයින්ට නිසි පරිදි වැටුප් හා දිමනා ගෙවන බවටත්, සේවක අර්ථ සාධක අරමුදල හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට දායක මුදල් ප්‍රේෂණය කරන බවටත් තහවුරු කරන ලෙස සේවා සපයන ආයතනයට දන්වා ඇති බව හා 2023 වර්ෂයේදී ගෙවීම් කිරිමට ප්‍රථම අදාළ කරුණු තහවුරු කරගෙන	- එම -

	අත්සන ලිපිනයන් ඇතුළත් වාර්තාවක්ද, පිරිසිදු කිරීමේ රසායන ද්‍රව්‍යවල සංඝටකයන් හා භාවිතයට සුදුසු බවට විධිමත් තත්ත්ව සහතිකයක්ද, දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණු අතර සේවකයන්ට නිල ඇඳුම් හා පැළඳීම සඳහා හැඳුනුම්පත් සැපයීමටද කටයුතු කර නොතිබුණි. තවද සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සම්බන්ධ තොරතුරු හා සේවකයින්ට ගෙවන ලද මාසික වැටුප, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට කරන ලද ප්‍රේෂණ, යනාදී තොරතුරුද සපයා නොතිබුණි.			ගිවිසුම ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව.	
40	2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ යාවත්කාලීන හා නිවැරදි තොරතුරු කොම්ප්ටෝලර් ජනරාල් වෙත වාර්තා කර නොතිබුණි.	2022	චක්‍රලේඛ ප්‍රකාරව නියමිත කාල සීමාවන් තුළ අදාළ වාර්තා සැපයීමට කටයුතු කළ යුතුය.	ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධ වාර්තාව නියමිත දිනට වාර්තා කර ඇති අතර අනෙකුත් වත්කම් සම්බන්ධයෙන් වාර්තා සකස්කර යැවීමට කටයුතු කරමින් පවතින බව හා ප්‍රගතිය ඉදිරියේදි වාර්තා කිරිමට සටහන් කර ගත් බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද නිවැරදි හා යාවත්කාලීන වාර්තා සැපයීමට කටයුතු කර නොතිබුණි.
41	බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඖෂධ නිෂ්පාදන අංශය මගින් තෛල වර්ග 23 කින් බෝතල් 13,500 ක් හා ගුලි වර්ග 08 කින් කිලෝ ග්‍රෑම් 790 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණු නමුත් කාර්ය මණ්ඩල ඌනතාවය හා ඔසු අමුද්‍රව්‍ය ප්‍රමාණවත්	2021	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම පරිදි කටයුතු කර සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි සැලසුම් පිළියෙල කළ යුතුය.	ඉදිරි නිෂ්පාදන කටයුතු සැලසුම් කිරීමේදී දෙපාර්තමේන්තුව සතු භෞතික හා මානව සම්පත්හි ධාරිතාවයන් සැළකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සැකසීමට අදාළ අංශ ප්‍රධානීන් දැනුවත් කළ බව.	2024 ඔක්තෝබර් 15 දින වන විටද සැලකියයුතු ප්‍රගතියක් වාර්තා වී නොමැත. කාර්ය මණ්ඩල ඌනතාවය හා ඔසු අමුද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි සපයා ගෙන නොතිබීම හේතුවෙන් බොරැල්ල

	පරිදි සපයා ගෙන නොතිබීම හේතුවෙන් තෛල වර්ග 09 කින් බෝතල් 2,977 ක් හා ගුගුල් වර්ග 07 කින් කිලෝ ග්‍රෑම් 268 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.				ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඖෂධ නිෂ්පාදන අංශය මගින් ප්‍රමාණවත් ඖෂධ නිෂ්පාදනයක් සිදු නොකරයි.
42	සමාලෝචිත වර්ෂය තුළදී මුළු පිරිවැය රු.20,799,715 ක් වූ අයිතම 23 කට අයත් කාර්යාලීය ගෘහ භාණ්ඩ ඒකක 1,239 ක් හා මුළු පිරිවැය රු.6,987,850 ක් වූ රෝහල් ගෘහ භාණ්ඩ ඒකක 312 ක් මාතලේ සැපයුම්කරුවකුගෙන් මිලදීගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රසම්පාදනය සැලසුම් කර තිබීම, කාර්යාලීය ලී බඩු උපකරණ සම්බන්ධයෙන් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂයය විශේෂඥයකු පත්කර නොතිබීම, පිරිවිතර සැකසීම හා එම පිරිවිතරවලට අනුකූලව උපකරණ ලබාගැනීම සම්බන්ධව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොමැතිවීම, සියළුම උපකරණ පිරිවිතරවලට අනුකූලව ලැබී ඇති බවට විධිමත්ව තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබීම, ඇණවුම්කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් සපයා තිබුණු උපකරණ සඳහා ගෙවීම් කිරීම, ඇණවුම් කළ උපකරණවලට වඩා වෙනස් උපකරණවලට ගෙවීම් කිරීම, ප්‍රමාද ගාස්තු	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගනිමින් ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතුය.	එක් එක් අංශ වලින් ලැබී ඇති ලිඛිත ඉල්ලීම් පාදක කරගෙන අවශ්‍යතා ලේඛන පිළියෙල කළ බව, රෝහල් ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේදී විෂය විශේෂඥයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කර ඇති බව, සියළුම උපකරණ පිරිවිතරවලට අනුකූල බවට භෞතිකව පරීක්ෂා කර ගෙවීම් සිදුකර ඇති බව, එවකට රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හා අමුද්‍රව්‍ය හිඟතාවය සලකා භාණ්ඩ සැපයීම ප්‍රමාදවීම වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර නොමැති බව හා මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදු නොකරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කළ බව.	2024 ජූලි 23 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙන් හා ගණන්දීමේ නිලධාරීගෙන් වාර්තාවක් කැඳවා ඇත.

	අයකර නොතිබීම සහ ප්‍රතිපාදන සලසා නොගත් වැය විෂයයක් යටතේ රු.11,809,305 ක් ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය.				
43	දේශීය ඖෂධ මගින් කොවිඩ් 19 වසංගතය පාලනය කිරීමට ඒකක් රු.1,000 ක් පිරිවැය වූ සුවධරණී ඖෂධ මංජුසා ලක්ෂ 60 ක් බෙදා දීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ආරම්භයේදී බස්නාහිර පළාතට ඖෂධ මංජුසා 250,000 ක් සැපයීමට පරිපූරක ප්‍රතිපාදන රු.250,000,000 ක් වෙන්කර ගෙන ඉන් රු.142,562,809 ක් වැය කර තිබුණි. ඖෂධ මංජුසා සැකසීමේ සියළුම කාර්යයන් එක් සැපයුම්කරුවෙකු වෙත ලබා දීමට හැකිවන පරිදි මිලගණන් කැඳවීමෙන් ගතවන කාලය, නිෂ්පාදනවල තත්ත්වය අපතය හා පිරිවැය අවම කරගැනීම යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු නොකොට ඖෂධ හා කැඳ නිෂ්පාදනයට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද, ඇසුරුම් මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, කාඩ්බෝඩ් පෙට්ටි හා අත්පත්‍රිකා මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, ඖෂධ හා කැඳ ඇසුරුම් කිරීමට සැපයුම්කරුවන් 07	2021	රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කරමින් අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කරමින් විනිවිදභාවය තහවුරු කරමින් ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවිය යුතුය.	ලංසු ඇගයීමේදී පැවති අඩුපාඩු ගෙවීම් කිරීමට පෙර නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බව, ගබඩා කිරීම බෙදාහැරීම සහ මුද්‍රිත කල් ඉකුත්වීමේ දිනය වැනි ගැටළුකාරී තත්වයන් මතු වූ අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් පියවර ගත් බව, අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදු කළ බව, කොවිඩ් රෝග තත්වය මත ගම්පහ දිස්ත්‍රික්කයට ප්‍රමුඛතාව දුන් අතර අනෙකුත් දිස්ත්‍රික්කද බොහෝ දුරට ආවරණය කළ බව හා ව්‍යාපෘතියේ අරමුණු සියයට සියයක් ඉටුකර ගැනීමට නොහැකි වූ බව.	2024 ජූලි 23 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේදී මේ පිළිබඳව අවධානය යොමුකළ අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගෙන් හා ගණන්දීමේ නිලධාරීගෙන් වාර්තාවක් කැඳවා ඇත.

දෙනෙක්ද වශයෙන් සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි. තවද, ලංසු ඇගයීමේදී පැවති විවිධ අඩුපාඩු පසුව සම්පූර්ණ කිරීමට යටත්ව සැපයුම්කරුවන් තෝරා ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොසලකා කටයුතු කිරීම, සියලුම ප්‍රසම්පාදනයන් නියමිත දිනට අවසන් නොකිරීම, ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය රහිතව කාලය දීර්ඝ කිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම, මිල කමිටුවේ මිල ගණන් ඉක්මවා ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය. ඖෂධ මංජුසා සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා නොකිරීම, අක්‍රමවත් බෙදාහැරීම, ඖෂධ පිරවීමටත් පෙර ඇසුරුම්වල කල් ඉකුත් වීමේ දිනය මුද්‍රණය කර තිබීම හේතුවෙන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වූ සේ සලකා ඉවත් කිරීම, කල් ඉකුත්වීමට පෙර ඖෂධ භාවිතා කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රතිලාභීන්ට ලැබී නොතිබීම, ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ඖෂධ ලැබීම සහ භාවිතය පිළිබඳ අධීක්ෂණය සහ පසුවිපරම් නොකිරීම, බස්නාහිර පළාතට බෙදා හැරීමට සැලසුම් කළ මංජුසා 250,000 කින් 183,776 ක්ම ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් බෙදා හැර තිබීම, දින 60 ක් තුළ දිවයින පුරා මංජුසා ලක්ෂ 60 ක් බෙදාහැරීම සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රම

අනුගමණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට දින 122 ක් ගතව තිබුණද ව්‍යාපෘතියෙන් සියයට 05 ක්වත් අවසන්කර නොතිබීම, යනාදී අඩුපාඩු මෙම ප්‍රසම්පාදනය තුළ පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

23. ශීර්ෂය - 221 කම්කරු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	17,798,856,135	767,737,985	17,201,018,694	තත්ත්වාගණනය කළ
2022	17,968,756,679	710,278,354	17,088,577,781	තත්ත්වාගණනය කළ
2023	18,098,111,763	962,656,533	17,135,455,231	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මු.රෙ. 208 ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් ආරම්භ කිරීමට පෙර මුළු මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට කටයුතු කිරීම හේතුවෙන් රු.397,410,290 ක් වියදම් නොවූ මුදලක් වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2021	කළමණාකරණය විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ප්‍රසම්පාදන තීරණ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉල්ලීම හා ඉංජිනේරු (සිවිල්)ගේ නිර්දේශය මත ඉදිකිරීම් වැඩිදියුණු කටයුතු සඳහා මුදල් නිදහස් කිරීම සිදුකර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් රු.127,687,802 ක් වටිනා ඉදිකිරීම් අවසන් බවට වාර්තා වී නොමැත. වෙනත් ව්‍යාපෘති සඳහා මුදල් මාරුකර ඉතිරි මුදල් පවරා ගැනීමට සාකච්ඡා කර ඇත.
02	කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 2000 මැයි 08 දිනැති අංක 11/2000 දරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3(iii) හා 2(iii) ප්‍රකාරව විවෘත වරෙන්තු නඩු සම්බන්ධ යාවත්කාලීන කරන ලද ලේඛණයක් පවත්වාගෙන යාම, ත්‍රෛමාසික වාර්තා නීති	2021	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ අක්‍රිය නඩු සංඛ්‍යාව 4,393ක් සහ එහි මූල්‍ය වටිනාකම රු.2,162,338,383 ක් වන අතර 2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ විවෘත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,325ක් වන අතර එහි මූල්‍ය	2023 දෙසැම්බර් 31 දිනට අක්‍රිය නඩු 5923 සහ සහ මූල්‍යමය වටිනාකම රු.2,417,792,675 විවෘත

	ක්‍රියා අංශයට ඉදිරිපත් කිරීම, විවෘත වරෙන්තු ක්‍රියාත්මක කිරීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම යනාදිය සිදුකර නොතිබුණි.			වටිනාකම රු.914,663,606 ක් විය යුතුය.	වරෙන්තු නඩු සංඛ්‍යාව 2655 මූල්‍යමය වටිනාකම රු.163,218,921 කි.
03	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අංක 4.3.1 (අ) ප්‍රකාරව මූළ පිරිවැය ඇස්තමේන්තුව අස්ථිත්වය විසින් පිළියෙල කලයුතු වුවද අදාල ඇස්තමේන්තු කොන්ත්‍රාත්කරු වන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින්ම පිළියෙල කර තිබුණි.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න්ට අනුකූල විය යුතු වීම	ඉදිකිරීම් කාර්යයන්ට අදාලව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඇස්තමේන්තුව සකස් කර ගැනීම උපදේශන කාර්යයක් වශයෙන් පමණක් සිදුකරගන්නා අතර, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලංසු කැඳවා කොන්ත්‍රත්කරුවන් තෝරාගනු ලබයි.	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත් භාරදීම 2023 වර්ෂයේ සිට නවතා ඇත.
04	1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් පවත්වාගෙන යනු ලබන ආයතන සංඛ්‍යාව 2021 දෙසැම්බර් 31 දිනට 117 ක් විය. එදිනට ආයතන 30 ක අරමුදල්වල මුළු ශේෂ එකතුව රු.106,794,071,789 විය . එම අරමුදල් විධිමත් පරිදි නියාමනය කිරීමට අපොහොසත් වීමෙන් ලියාපදිංචි ආයතන සංඛ්‍යාව නිවැරදිව හඳුනා නොගැනීම, දායක මුදල් නොගෙවීමේ අවස්ථා හෙළිදරව් වීම හා අධිභාර ක්‍රියාත්මක නොවීම, එම ආයතනවල නිලධාරීන් විසින් වංචනික ලෙස මුදල් ලබාගැනීම, සේවායෝජක ආයතනවල ව්‍යවස්ථා ඉදිරිපත් නොවීම, පැමිණිලි විභාග කිරීමට ක්‍රියාත්මක නොවීම හා අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සක්‍රීයව ක්‍රියාත්මක නොවන ආයතන/ අරමුදල්, 2021 දෙසැම්බර් 31 දිනට	2021	පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල පිළිබඳ පනතේ වගන්ති සංශෝධනය කළ යුතු අතර එහි කටයුතු පිළිබඳ විධිමත් ක්‍රමවේදයන් ඇති කර නියාමනය කිරීම හා අධීක්ෂණය කිරීම සිදු කල යුතු වීම	කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදලට අයත් ආයතන සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු අපේක්ෂිත පරිදි ඉටුකිරීමට නොහැකි විය. එහෙත් මෙම අංශයේ රාජකාරී ඉටුකරනු ලබන සීමිත කාර්යය මණ්ඩලය යටතේ අදාල පරීක්ෂණ කටයුතු සිදුකිරීම හා වාර්තා යාවත්කාලීන කිරීම සිදුකරමින් පවතින අතර අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බාහිර ආයතන වෙතින් ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම ද මෙම කටයුතු නිසි පරිදි ඉටුකිරීමට බාධාවක්ව ඇත.	පනතේ වගන්ති යාවත්කාලීන කර නොමැත.

	අරමුදල්වල ශේෂය හා හිඟ දායක මුදල් හඳුනා නොගැනීම, ආයතන පරීක්ෂා කිරීම පිළිබඳ විධිමත් තොරතුරු ඉදිරිපත් නොවීම, පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ප්‍රමාණවත් නිලධාරීන් මණ්ඩලයක් නොමැතිවීම හා පනතේ වගන්ති යාවත්කාලීන නොවීම හේතුවෙන් විවිධ අර්බුධ මතුවී මෙම අංශයේ කටයුතු අකර්මන්‍ය වී තිබුණි.				
05	‘මෙහෙවර පියස’ ගොඩනැගිල්ල ඉදිකරන ලද පෞද්ගලික ඉදිකිරීම් සමාගම සමඟ 2013 ඔක්තෝම්බර් 03 එළඹ තිබූ ගිවිසුමට අනුව මාස 36 කින් ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීමට එකඟ වී තිබූ නමුත් 2019 මාර්තු 27 දිනැති අංක අමප/19/0761/101/046 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් 2019 අප්‍රේල් 30 තෙක් ප්‍රමාද ගාස්තු ගෙවීමට යටත්ව කාලය දීර්ඝ කර ගැනීමට කටයුතු කර තිබුණි. එසේ වුවද 2021 දෙසැම්බර් 31 දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. 2020 විගණන වාර්තාවේ දක්වා ඇති පරිදි අන්තර් ගෙවීම් සහතික (IPC) 13 ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.21,772,797 ක් අදාල පෞද්ගලික ඉදිකිරීම් සමාගමට 2020 වර්ෂයේදී ගෙවා තිබුණද කොන්ත්‍රාත්තුව ප්‍රමාදවීම සම්බන්ධයෙන් එම ආයතනයෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021	අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු කල යුතුය.	2018 ජූනි 12 දිනැති අනුක්‍රමික අංක 15/2018 දරණ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව ව්‍යාපෘතියේ ගිවිසුම් කොන්දේසි වලට අනුව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුගෙන් ප්‍රමාද ගාස්තු අයකර නොගැනීමට කටයුතු කර ඇත. අන්තර් ගෙවීම් සහතික 13ක් වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා ඇති රු.21,772,797ක මුදල, අන්තර් ගෙවීම් සහතික වලට අදාලව මුදල් නිදහස් කිරීමේ ප්‍රමාදය මත ගෙවීම් සිදුකර ඇත. ප්‍රමාද ගාස්තු ගෙවීම ඉංජිනේරු සිවිල්ගේ CBM/Adm1/14/2017/8 හා 2021 ජූලි 07 දිනැති ලිපියට අනුව කොන්ත්‍රාත් ගිවිසුමේ Cl.57 ඡේදය අනුව ගෙවීම් කර ඇත.	ප්‍රමාද ගාස්තු අයකර නොමැත. අවසන් ගෙවීම (final payment) සිදුකර නොමැත.
06	සේවක අර්ථසාධක අරමුදලේ හිමිකරුවන්ට ප්‍රතිලාභ නියමිත පරිදි ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන	2021 2022 2023	නිරවුල් නොවී පවතින දායක මුදල් නිරවුල් කිරීමට කඩිනම්	2021 වර්ෂයේ කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් දිස්ත්‍රික් කාර්යාල වෙතින් අදාල තොරතුරු ගෙන්වා	කඩිනමින්, විධිමත් වැඩපිළිවෙල ක් සකසා

	කාර්යයන් වලින් එකක් වුවද එයට බාධාවක් වනසේ සේවකයන්ගේ දායක ගිණුම්වලට බැර විය යුතු අර්ථසාධක අරමුදල්වලින් කොටසක් දීර්ඝ කාලයක් තිස්සේ විවිධ හේතූන් මත එම ගිණුම්වලට බැර නොවී කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන කම්කරු කොමසාරිස් ගිණුමට බැර කර තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ කම්කරු කොමසාරිස් ගිණුමේ ශේෂය රු.9,933,449,163 ක් වූ අතර 2021 සැප්තැම්බර් වන විට කම්කරු කොමසාරිස් දායක ගිණුමට බැරවී නිරවුල් නොවූ වසර 5 – 25 අතර පැරණි ශේෂය රු.4,583,817,783 ක් විය.		ක්‍රියාමාර්ග ගැනීම.	ගැනීමේ ප්‍රමාදයන් සිදු වූ අතර කම්කරු කොමසාරිස් ගිණුම නිරවුල් කිරීමේ කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව හා සේවායෝජක පාර්ශවය යන ත්‍රෛපාර්ෂවික සහයෝගීතාවය මත සිදුවන කටයුත්තක් වන නමුත් සේවායෝජක පාර්ශවයෙන් ඒ සඳහා ප්‍රමාණවත් සහයෝගයක් නොලැබීම එම නිරවුල් කිරීමේ කටයුතු ප්‍රමාද වීම කෙරෙහි බලපාන බව සඳහන් කරමි. එසේම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමුකළ ‘‘සී’’ වාර්තා ද මේ වන තෙක් නිරවුල් නොකර පැවතීම ද ‘‘කම්කරු කොමසාරිස්’’ ගිණුමේ ඇති ශේෂය විශාල වීමට හේතුවකි.	නොමැති අතර, 2023 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොවූ ශේෂය රු.355,633,777 කි.
07	පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ හිමිකම් ප්‍රතිලාභ නොලැබීම වෙනුවෙන් පවරන ලද නඩුවලින් 2021 දෙසැම්බර් 31 දින වන විට මූල්‍ය වටිනාකම රු.3,108,693,249 ක් වූ අක්‍රීය නඩු 5,151 ක් ද, මූල්‍ය වටිනාකම රු.879,249,210 ක් වූ විවෘත වරෙන්තු නඩු 2,822 ක් ද, විය. මෙම නඩු වර්ෂ 1 සිට 30 අතර කාලපරාසයක් තුල අක්‍රීයව පැවතුණි.	2021	හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීමට ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කර සේවා නියුක්තිකයන්ගේ හිමිකම් ලබාදීමට කටයුතු කල යුතුය.	2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ අක්‍රීය නඩු සංඛ්‍යාව 4,393 ක් සහ එහි මූල්‍ය වටිනාකම රු.2,162,338,383 ක් වන අතර 2021 දෙසැම්බර් 31 දිනට සංශෝධිත සමස්ථ විවෘත වරෙන්තු නඩු සංඛ්‍යාව 2,325 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.914,663,606 ක් විය යුතුය. එමෙන්ම සංශෝධිත දත්ත අනුව 2022 මාර්තු 31 දිනට සමස්ථ අක්‍රීය නඩු සංඛ්‍යාව 4,596 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.1,738,630,576 ක් වන අතර සමස්ථ විවෘත වරෙන්තු 2,958 ක් වන අතර එහි මූල්‍ය වටිනාකම රු.642,956,437 ක් විය.	2023 දෙසැම්බර් 31 දිනට අක්‍රීය නඩු සංඛ්‍යාව 5923 ක් හා විවෘත වරෙන්තු නඩු 2655 ක් පැවතුණි.
08	රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය නායයාම් තර්ජන පවතින බැවින් කුලී	2021	අවධානම් ස්ථානවල ගොඩනැගිලි	අළුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින්	කුලී ගොඩනැගිල් ලෙන් ඉවත්

	ගොඩනැගිල්ලක ස්ථාපිත කර රු.11,177,000 ක ඇස්තමේන්තු ගත මුදලකට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මගින් අලුත්වැඩියා කර එහි ස්ථාපිත කිරීම සඳහා කටයුතු කර තිබුණි. අලුත්වැඩියා කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් ලබාගත් අවධානම් තත්ත්වයක් නොමැති බව තහවුරු කරන ලද සහතිකය හා කෙටිකාලීන නිර්දේශ ක්‍රියාත්මක කර තිබීම පිළිබඳ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.		ඉදිකිරීමේදී/ අලුත්වැඩියා කිරීමේදී අදාල නීතිරීතීන්ට යටත්ව හා තත්ත්ව වාර්තා ලබාගෙන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සිදුකල යුතුය	අවධානම් තත්ත්වයක් නොමැති බව තහවුරු කරන ලද සහතිකයක් ලබාගෙන නොමැති අතර සමීක්ෂණ වාර්තාවේ කෙටි කාලීන නිර්දේශ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම නොමැති බවත්, ඒ සඳහා විශේෂඥ දැනුම ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මඟින් ලබාගන්නා ලෙසත් දැනුම් දී ඇත.	වී කම්කරු කාර්යාලය පැරණි ස්ථානයටම ගෙන ගොස් ඇත. ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කෙටිකාලීන නිර්දේශ ක්‍රියාත්මක කිරීමෙන් තොරව අලුත්වැඩියාව න් සිදුකර ඇත.
09	අභ්‍යන්තර විගණන පරීක්ෂණවලදී දෙපාර්තමේන්තුවේ කම්කරු කාර්යාලවල පවත්වාගෙන යනු ලබන පොදු සාක්ෂි ලේඛණය නිසි පරිදි අධීක්ෂණය නොකිරීම නිසා නිවේදන යැවීම, නඩු පැවරීම, පෙත්සම් සම්බන්ධ ක්‍රියාමාර්ග ගැනීම සඳහා විශාල කාල ප්‍රමාදයන් සිදුවී තිබුණි.	2021	අභ්‍යන්තර විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිබඳ අවධානය යොමු කර විධිමත් ක්‍රියා මාර්ග ගැනීම කළමණාකාරීත්ව ය විසින් සිදුකල යුතුය	අදාල කාල සීමාව තුලදී (2020 – 2021) රට තුල පැවති කෝවිඩ් - 19 තත්ත්වය හේතුවෙන් සියලුම කාර්ය මණ්ඩලය එකවර කැඳවීමත් සිදු නොකරන ලදී. එසේම අදාල කාලය තුලදී දිගටම පැවති සංචරණ සීමා හේතුවෙන් රාජකාරී කිරීමට දෙපාර්තමේන්තු සේවකයින්ට මෙන්ම පැමිණිලි මෙහෙයවීමට අවශ්‍ය සේවක, සේව්‍ය දෙපාර්ශවය ද එකවර කැඳවීම ප්‍රායෝගිකව අපහසු විය. තවද නඩු පැවරීම සඳහා ද තැපැල් කටයුතු ද ඉහත කරුණු හේතුවෙන් අවහිර විය.	පොදු සාක්ෂි ලේඛන වර්තමානයේ ද යාවත්කාලීන කර නොමැත.
10	1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත 34 (6) වගන්තිය ප්‍රකාරව වාෂ්ප බොයිලේරුවක් යටත් පිරිසෙයින් සෑම මාස 14 කට වරක් පරීක්ෂා කල යුතු අතර, බරපතල අළුත්වැඩියාවකින් පසුව බලයලත් නිලධාරියෙකු පරීක්ෂා කර අත්හදා බැලිය යුතුය. මෙම අවශ්‍යතාවය මත සෑම බොයිලේරුවක් සම්බන්ධවම නියමිත පරිදි	2022	පනත ප්‍රකාරව බොයිලේරු පරීක්ෂාවන් නිසි පරිදි සිදුකල යුතුය	බලයලත් නිලධාරීන් මඟින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලබන වාර්තාවල පිටපත් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත කර්මාන්තශාලා හිමියන් සහ බලයලත් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අතර ඒ අනුව දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන දැනටමත් පවත්වාගෙන යනු ලබයි.	සුදුසු විධිමත් වැඩපිළිවෙල ක් නොමැත.

	සිදුවන බවට සෑහීමට පත්වීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය විසින් සකස් කර නොතිබුණි.				
11	1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත 92 වගන්තිය ප්‍රකාරව කර්මාන්තශාලාවේ සිදුවන හදිසි අනතුරු සහ කාර්මික රෝග සම්බන්ධ විස්තර සාමාන්‍ය ලේඛණයේ සඳහන් කර එහි පිටපත් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය වෙත එවිය යුතු වුවද එවැනි තොරතුරු දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයක් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයේ නොතිබුණි.	2022	කර්මාන්තශාලාවල හදිසි අනතුරු හා කාර්මික රෝග පිළිබඳ විධිමත් වාර්තා පවත්වා ගැනීමට කටයුතු කල යුතුය.	දෙපාර්තමේන්තුවේ යෝජිත ඩිජිටල්කරණ සැලසුම අනුව මෙම කටයුතු තවත් විධිමත් කර ගැනීමට පියවර ගැනීමට අපේක්ෂිතව ඇත.	විධිමත් වැඩපිළිවෙලක් ස්ථාපිත කර නොමැත.
12	2019 සැප්තැම්බර් 27 අංක 2142/90 ගැසට්පත්‍රය ප්‍රකාරව ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව හුමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාජන ලියාපදිංචි කිරීමේ විධිවිධාන සැලැස්විය යුතු වුවත්, කර්මාන්තශාලා පරීක්ෂාවේදී වෙනත් පීඩන භාජන, පරීක්ෂා කිරීමේ විධිවිධාන ඇතුලත් කර නොතිබුණි.	2022	ගැසට් නිවේදනයේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුය.	අනෙකුත් පීඩන භාජන ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන මෙම රෙගුලාසි මඟින් පනවා නොමැත.	ගැසට් නිවේදන ප්‍රකාරව කටයුතු කර නොමැත.
13	2019 සැප්තැම්බර් 27 අංක 2142/90 ගැසට්පත්‍රය ප්‍රකාරව සේවකයන් අධික ශබ්දයෙන් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයන් ඇති බවටත්, කර්මාන්තශාලාවේ ප්‍රමාණවත් ආලෝක සැපයුමක් ඇති බවටත් තහවුරු කල යුතු වුවද, කර්මාන්තශාලා පරීක්ෂාවේදී භාවිත කරනු ලබන නිරීක්ෂණ ලැයිස්තු එම පරීක්ෂා කිරීම් සටහන් කිරීමට අවශ්‍ය පරිදි නව ගැසට් පත්‍රයේ	2022	ගැසට් නිවේදනයේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුය.	පාරිසරික දත්තයන් වන ආලෝකය හා ශබ්දය පිළිබඳ මිනුම් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ වෘත්තීය ස්වස්ථතා අංශයේ පරීක්ෂණ නිලධාරීන් මඟින් සිදුකරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ මිනුම් කටයුතු සඳහා ඇති උපකරණ හා මානව සම්පත් වල ප්‍රමාණය අනුව එම පරීක්ෂා කිරීම් අදාල නිර්දේශ අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය	ගැසට් නිවේදන ප්‍රකාරව කටයුතු කර නොමැත.

	නියෝගවලට අනුකූල වන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.			ස්වස්ථතා අංශයෙන් ලබාගනු ලබයි.	
14	කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටුකරවා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදයේ පරිදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කිරීමකින් තොරව රු.11,177,000ක් වූ ප්‍රසම්පාදනය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මෙම කොන්ත්‍රාත්තුව රු.9,590,303ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට උපකොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඇස්තමේන්තු වටිනාකම තුල වූ කළමණාකරණ ගාස්තුව රු.449,960ක් වූ නමුත් ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු නිසි පරිදි අධීක්ෂණය වී නොමැති අතර, වරින් වර පෙන්වා දෙන ලද අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සකස් කර දී නොතිබුණි.	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය.	ව්‍යාපෘතියට අදාළ සම්පූර්ණ ඇස්තමේන්තු මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කළ ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු ඉතිරි ප්‍රතිපාදන නැවත කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ දී නිම නොවූ කොටස් තිබේ නම් එම කොටස් අදාළ කොන්ත්‍රාත් ආයතනය මගින්ම සිදු කරවා ගැනීමට හෝ එසේ නොවන්නේ නම් මෙම අළුත්වැඩියාවට අදාළ රැඳවුම් මුදල් භාවිතා කරමින් එම කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කරන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. රැඳවුම් මුදල් ප්‍රමාණවත් නොවන්නේ නම් අදාළ කොන්ත්‍රාත් ආයතනයේ අවසාන බිල්පත ගෙවීමේ දී ඒ පිළිබඳව අවදානය යොමු කර කටයුතු කරන ලෙස ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත.	භෞතික පරීක්ෂාවේදී කාර්යාලයේ වහල අලුත්වැඩියා වේ අඩුපාඩු නිසි පරිදි සිදුකරවා ගෙන නොමැත.
15	කර්මාන්තශාලා අයිතිකරු හෝ පදිංචිකරු වීම සඳහා 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/90 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව ලියාපදිංචි විය යුතු වුවත්, 2022 වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරු කාර්යාලය තුල පවත්වාගෙන ගිය ගොනු සංඛ්‍යාව 32,948 කින් නව නීතිරීති අනුව ලියාපදිංචි වූ	2022	ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුකූලව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමට කටයුතු කල යුතුය.	ඉංජිනේරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් කර්මාන්තශාලා වෙත ගොස් ලියාපදිංචි කටයුතු කිරීම ඉතා අපහසු වී ඇත. එමෙන්ම පසුගිය වසරවල මුහුණපෑමට සිදුවූ කොවිඩ් වසංගතය, ආර්ථික ගැටළු හා ඉන්ධන අර්බුදය වැනි ගැටළුද මේ සඳහා බලපෑම් එල්ලකල බව දන්වා සිටිමි. කෙසේ නමුත් දෙපාර්තමේන්තුව විසින් මෙම	ගැසට් නිවේදනය පරිදි කර්මාන්තශාලා හඳුනාගැනීම හා ලියාපදිංචිය අවසන්ව නොමැත.

	සංඛ්‍යාව 3,153 ක් විය. අවම ලියාපදිංචි ගාස්තුව වූ රු.1,000 සැලකූවිට ලියාපදිංචි නොවූ කර්මාන්තශාලා සඳහා ලබාගත හැකි ලියාපදිංචි ගාස්තුව අවම වශයෙන් රු.29,795,000 ක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි.			කටයුතු වැඩිකර ගැනීම සඳහා පියවරයන් ගෙන ඇත.	
16	පනතේ 27(2)(අ) වගන්තිය ප්‍රකාරව යම් මාසයක දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට ගෙවිය යුතු වුවත් එක් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සේවක අර්ථ සාධක අරමුදල සඳහා විධිමත්ව දායක මුදල් බැර නොකිරීම නිසා 2019 – 2021 කාලයට අදාලව රු.108,218,673ක අධිභාර ගෙවීම පැහැර හැර තිබුණි.	2022	පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය.	එම සමාගම සහ නියමිත දිනට දායක මුදල් ගෙවීම සිදු නොකරන අනෙකුත් ආයතන සම්බන්ධයෙන් සමූහ පරීක්ෂණ සිදු කර ඒ අනුව හිඟ දායක මුදල් හා අධිභාර ගණනය කිරීමටත් එම මුදල් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමත් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි.	අදාල සමාගම වෙත අධිභාර ගණනය කර නිවේදනය යවා ඇත. ගෙවීම් සම්බන්ධව 2024 සැප්තැම්බර් 30 වන විට පරීක්ෂා කර නොමැත.
17	වෘත්තීය සමිති අංශය 1935 අංක 14 වෘත්තීය සමිති ආඥා පනත, 1946 අංක 03 දරන ආඥා පනත, 1948 අංක 15 දරන ආඥා පනත, 1958 අංක 18 දරන ආඥා පනත, 1970 අංක 24 දරන ආඥා පනත යන අණපණත් මගින් වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම, පාලනය සහ ක්‍රියාත්මක වීම, පාලනය සිදුකරගෙන යන අතර, මෙම අණපණත් වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර නොතිබූ බව පරිශීලනයේදී නිරීක්ෂණය විය. මේ පිළිබඳව හඳුනාගත් අංශ කිහිපයක් සංශෝධනය කිරීමට 2019 වර්ෂයේ සිට සාකච්ඡා කර තිබුණද මේ සම්බන්ධව ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය. 2289/43 දරණ 2022 ජූලි මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ කාර්ය හා කර්තව්‍ය ලෙස වෘත්තීය සමිති ලියාපදිංචිය,	2022	ආඥා පනත් ප්‍රකාරව අරමුණුගත කාර්යයන් සිදු කිරීමට කටයුතු කල යුතුය.	ඔබ විසින් නිරීක්ෂණය කල කරුණු කෙරෙහි අවධානය යොමුකල බවත්, 2019 වර්ෂයේ සිට වෘත්තීය සමිති ආඥා පනත සම්බන්ධ සංශෝධනයන් දිගින් දිගටම සාකච්ඡා කර ඊට අදාළ සංශෝධන පිළිබඳව වාර්තා නිසි පරිදි අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති බවත්, මේ වන විට ගරු ඇමතිතුමාගේ ද අවධානයට යොමුකර පනත සංශෝධනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතින බව	පනත සංශෝධන යේ ක්‍රියාවලිව අවසන්ව නොමැත.

	සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීමට සාධනීය පියවර හඳුන්වාදීම ක්‍රියාත්මක කලයුතු වුවද එවැනි පියවර ගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය.				
18	බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටුවා ඇති කාන්තා නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු සඳහා 2018 ජුනි 15 දින සිට වසා තිබූ අතර, එම අළුත්වැඩියා කටයුතු 2023 වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි. නේවාසිකාගාරය නැවත පිළිසකර කිරීම මගින් ආයෝජන කලාපය තුල සේවය කරන පිරිස් වෙත නවාතැන් පහසුකම් සපයාගැනීමේ අවස්ථාව අහිමි වී ඇති අතර, මෙම නේවාසිකාගාරයේ ආරක්ෂාව සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් දක්වා රු.4,245,678ක මුදලක් වැයකර තිබුණි.	2022	වත්කම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමණාකරණය කල යුතුය.	නේවාසිකාගාර නඩත්තුව සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් එහි අළුත්වැඩියා කටයුතු සිදුනොකර කොග්ගල සහ කටුනායක නේවාසිකාගාර අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට තිබෙන ප්‍රතිපාදන රු. 4,000,000 යොදාගැනීමට තීරණය කරන ලදී. දැනට බියගම නේවාසිකාගාරය වසා තිබුණද නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ආරක්ෂාව හා නේවාසිකාවන්ගේ සහ ස්ථානභාර නිලධාරීන්ගේ භාවිතය සඳහා ලබාදී ඇති ප්‍රාග්ධන භාණ්ඩවල ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක නිලධාරීන්ගේ සේවය ලබාදී ඇත.	දැනට නේවාසිකාගාරය අලුත්වැඩියාවකින් තොරව අතහැර දමා ඇත.
19	සේවක අර්ථසාධක අරමුදල් අංශයේ තොරතුරු පද්ධතිය බලගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ මිලදීගත් රු.22,462,587 ක් වූ වත්කම්, 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වත්කම් මිලදීගැනීම් ලෙස වාර්තා කර තිබූ අතර, 2023 වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශනවලද වත්කම් ලෙස වාර්තා කර තිබුණි.	2023	වත්කම් ශේෂයන් නිරවුල් කරගැනීමට කටයුතු කල යුතුය.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙතින් මේ සම්බන්ධව උපදෙස් විමසා ඇති බැවින් හැකි ඉක්මණින් පිළිතුරු සැපයීමට පියවර ගන්නා බව.	මේ පිළිබඳව අවසන් තීරණයකට එළඹ නොමැත.
20	මු.රෙ.770 (4) ප්‍රකාරව රජයේ ආයතනවල අබලන් වූ පාවිච්චි කල නොහැකි වාහන හඳුනාගැනීම සඳහා විශේෂ සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ධාවන තත්ත්වයේ පවතින	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2020 හා රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි විධිවිධාන අනුව කම්කරු දෙපාර්තමේන්තුව තුල පවතින ධාවනයෙන් ඉවත්	ක්‍රියාවලිය අවසන්ව නොමැත.

	නමුත් ආර්ථික වශයෙන් ඵලදායී නොවන හෝ වෙනත් විශේෂ කරුණක් මත අපහරණය කළ යුතු වාහන හඳුනාගත යුතු වුවද එසේ සිදුකර නොතිබුණි.			කර ඇති වාහන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2024.05.30 දිනැතිව පුද්ගලයන් පස් දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, වාහන අපහරණය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරගෙන යනු ලබන බව.	
21	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 ප්‍රකාරව කොන්ත්‍රාත් පැවරීමේදී විධිමත් කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹිය යුතු වුවද, අවස්ථා 09 කදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ පූර්ව ඇස්තමේන්තුගත මුදල වූ රු.480,719,000 වන කොන්ත්‍රාත්තු සඳහා කම්කරු දෙපාර්තමේන්තුව විසින් මුදල් ගෙවා තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව එකී කාර්යයන් රු.272,689,000 ක වටිනාකමට උපකොන්ත්‍රාත්කරුවන් වෙත පවරා තිබුණි. මෙම පිරිවැයෙහි වෙනස සේවා ලබාගැනීමේ කාර්යයන් ලෙස දක්වා තිබූ නමුත් ඒ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ නිසි අධීක්ෂණයක් සිදුවී නොතිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුගමනය කරමින් උපදේශන සේවා ආයතන හා කොන්ත්‍රාත්කරුවන් කම්කරු දෙපාර්තමේන්තුව මඟින් තෝරා ගන්නා බැවින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මුදල් හෝ ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොවේ.	පිරිවැයෙහි වෙනස පිළිබඳ සොයාබැලීම සහ අධීක්ෂණයක් කම්කරු දෙපාර්තමේන්තුවෙන් සිදුවී නොමැත.
22	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ හා ප්‍රාදේශීය කාර්යාලවල අවශ්‍ය ඉදිකිරීම් කටයුතු සිදුකරවා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රම අනුගමනය කිරීමකින් තොරව අවස්ථා 22 කදී රු.346,651,027 ක් වටිනා කොන්ත්‍රාත් 22 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත සෘජුවම පිරිනමා තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය.	2023 වර්ෂයේ සිට කම්කරු දෙපාර්තමේන්තුව මඟින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත මුදල් හෝ ප්‍රතිපාදන ලබා දී පෙර පරිදි ඉදිකිරීම් කාර්යයන් සෘජුවම පිරිනැමීම නවතා ඇති අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් උපදේශන සේවාව පමණක් ලබා ගැනීමටත් ඒ සඳහා වන උපදේශන ගාස්තු එම දෙපාර්තමේන්තුව වෙත ගෙවීමත් කම්කරු දෙපාර්තමේන්තුව මඟින්	2023 වර්ෂයේ සිට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට කොන්ත්‍රාත්තු සෘජුවම පිරිනැමීමට නවතා ඇත.

				කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම ප්‍රසම්පාදන ක්‍රමවේදය හරහා සිදුකිරීමටත් කටයුතු කර ඇති බව	
23	2019 සැප්තැම්බර් 27 දින අංක 2142/90 දරණ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව කර්මාන්තශාලා ලියාපදිංචිය හා හුමාල බොයිලේරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය අවම මට්ටමක පැවතුණි.	2023	බොයිලේරු ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිවය විධිමත්ව සිදුකල යුතුය.	දැනටමත් සෑහීමකට පත්වන මට්ටමින් සිදු කර ඇති අතර ඒ සඳහා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල මට්ටමින් ලියාපදිංචි කිරීමේ ලේඛන පවත්වාගෙන යන අතර ලියාපදිංචිය වැඩිකිරීම සඳහා විද්‍යුත් තැපැල මගින් හා තැපැල් මගින් සිහි කැඳවීම් සිදු කරනු ලබයි. තවද කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියේ එක් මොඩියුලයක් ලෙස දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල බොයිලේරු ලියාපදිංචිය ඇතුළු අනෙකුත් දත්ත ඇතුලත් කිරීමට මූලික අධ්‍යයනය සිදු කරමින් පවතින බව.	කාර්යභාරය අවසන්ව නොමැත.
24	මෙහෙවර පියෙස 04 වන මහලේ ආපනශාලාවේ අභ්‍යන්තර නිර්මිත සැකසීම සඳහා 2021 දෙසැම්බර් 30 දින රු.72,000,000 ක මුදලක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විටත් මෙකී කාර්යය සිදුකර නොතිබූ අතර, මෙම මුදලින් රු.67,957,507 ක් නැවත කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන තිබුණි. ව්‍යාපෘතියේ අපේක්ෂිත කාර්යයන්ද මෙතෙක් ඉටුවී නොතිබුණි.	2023	ව්‍යාපෘති මගින් අපේක්ෂිත කාර්යය ඉටුකර ගත යුතුය.	මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 04 වන මහලේ ආපනශාලාවේ අභ්‍යන්තර නිර්මිතය සැකසීම සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත රු. 72,000,000.00ක මුදලක් ලබා දී ඇති අතර එම මුදලින් රු. 3,968,000.00ක් මෙහෙවර පියෙස ගොඩනැගිලේ ප්‍රධාන මෙහෙයුම් කාමරයේ බෙදුම් ඇදි සැකසීම සඳහා යොදාගෙන ඇත. ඉතිරි මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2023.12.31 දින නැවත ලබා දී ඇත.	ආපනශාලාව සැකසීමේ අපේක්ෂිත කාර්යභාරය ඉටුකර නොමැත.
25	කෑගල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සේවා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා	2023	ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් අවසන් කරගැනීමට	රට තුළ පැවති කොවිඩ් වසංගත තත්වය හා ආර්ථික අර්බුද හේතුවෙන් මෙම	කාර්යභාරය අවසන්ව නොමැත.

	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුව මත රු.31,000,000 ක් 2022 පෙබරවාරි 17 දින ගෙවා තිබුණද, එකී කාර්යය මෙතෙක් අවසන්ව නොපැවතුණි.		කටයුතු කල යුතුය.	කාර්යය අතරමග නවතා දමන ලදි. ඉන්පසු වෙළඳපලේ භාණ්ඩ හා අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හේතුවෙන් සිදුකල යුතු අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ඇස්තමේන්තු සංශෝධනය කර ගොඩනැගිල්ලේ බිම් මහලේ සේවා පහසුකම් වැඩිදියුණු කරන ඇත. ඉතිරි ප්‍රතිපාදන මගින් මහජන රැඳවුම් ස්ථානයක් සකස් කිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතින අතර එම කාර්යය අවසන් වීමෙන් පසු ඉතිරි මුදල් කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව.	
26	2021 වර්ෂයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරන ලද රු.127,687,802 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 06 කින් රු.48,663,802 ක් වූ කාර්යයන් 4 ක් අවසන්ව නොතිබුණි. රු.72,000,000 ක් පිරිවැය ඇස්තමේන්තුවක් මත පිරිනමන ලද මෙහෙවර පියෙස 4 වන මහල අපනශාලා අභ්‍යන්තර නිර්මිත සැකසීමේ කාර්යභාරයද අවසන්ව නොතිබූ අතර, එම ප්‍රතිපාදනවලින් මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ ප්‍රධාන මෙහෙයුම් කාමරයේ බෙදුම් ඇදි සැකසීම සඳහා රු.3,968,000 ක ප්‍රතිපාදන සලසාදී තිබුණි.	2023	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කාර්යයන් ඉටුකරවා ගැනීමට කටයුතු කල යුතුය.	සිදුකරමින් පවතින කාර්යයන් මේ වසර අවසන් වනවිට අවසන් කිරීමට කටයුතු කරන බව.	කාර්යභාරය අවසන්ව නොමැත.
27	දෙපාර්තමේන්තුවේ මුද්‍රණ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා 2007 වර්ෂයේ දෙසැම්බර් මස රු.21,884,083 ක් වැයකර මිලදී ගෙන තිබූ මුද්‍රණ යන්ත්‍රයක් හා ඊට අමතරව මුද්‍රණාලයේ ක්‍රියාකාරීත්වයේ පවතින	2023	දෙපාර්තමේන්තුව සතු සම්පත් උපරිම කාර්යක්ෂමතාව යෙන් භාවිත කිරීමට කටයුතු කල යුතුය.	මෙහි සඳහන් උපකරණ ක්‍රියා කරවීම සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් කම්කරු දෙපාර්තමේන්තුව සතුව නොසිටි බැවින් අලුතින් තනතුරු අනුමත කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත	නව කාර්යය මණ්ඩලය අනුයුක්ත කර නොමැති බැවින් උපරිම කාර්යක්ෂම තාවයෙන් භාවිතා

	පරිගණක යන්ත්‍රයක්, ලැප්ටොප් පරිගණකයක්, බැඳුම් යන්ත්‍රයක් හා කඩදාසි කැපීමේ යන්ත්‍රයක් (Paper Cutter) පැවතුණි. මෙම මුද්‍රණාලයෙහි මුද්‍රණ අංශයේ රාජකාරි ඉටුකිරීමට ස්ථිර කාර්යය මණ්ඩලයක් හා අමුද්‍රව්‍ය නොමැතිවීම නිසා එකී සම්පත් 2018 වර්ෂයේ සිට ඌන උපයෝජිතව පැවතුනි. 2019 – 2022 වර්ෂවල අකෘතිපත්‍ර බාහිර පාර්ශවයන්ගෙන් ප්‍රසම්පාදනය කිරීමට රු.36,236,875 ක පිරිවැයක් දරා තිබුණි. 2023 වර්ෂයේ සිට ආකෘති පත්‍ර ප්‍රතිලාභීන් විසින්ම සපයා ගැනීමට කටයුතු කලයුතු බවට දන්වා තිබුණි.			ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ අතර ඒ සඳහා කාර්ය මණ්ඩල සමාලෝචනයේදී සලකා බලන බවට දන්වන ලද බව හා ඒ සඳහා කිසිදු සාධනීය ප්‍රතිචාරයක් නොලැබුණු බව.	නොවේ.
28	රු.7,855,576 ක මුදලක් වැයකර හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව අළුත්වැඩියා කර තිබුණද, අවශ්‍ය ලී බඩු හා උපකරණ ප්‍රසම්පාදනය නොවීම හේතුවෙන් සංචාරක බංගලාව භාවිතයට ගැනීමෙන් තොරව පැවතුණි.	2023	දෙපාර්තමේන්තුව සතු සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතයට ගත යුතුය.	ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව භාණ්ඩ මිලදී ගැනීම් තාවකාලිකව අත්හිටවූ බැවින් හම්බන්තොට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය හා සංචාරක බංගලාව සඳහා ලී බඩු හා උපකරණ මිලදී ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදුකර නොමැත. එමෙන්ම, මේ වනවිට භාවිතා නොකරන කාර්යාල ගොඩනැගිලි වෙනත් කාර්යාල ස්ථාපිත කිරීම සඳහා ලබා දීමට උපදෙස් ලැබී ඇති බැවින් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව.	සංචාරක බංගලාව භාවිතයේ නොපවතී.
29	ගම්පහ දිස්ත්‍රික් නව කම්කරු කාර්යාලයේ බෙඳුම් ඇඳි සකස් කිරීම හා ජාලකරණ පද්ධතිය සැකසීමට ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.4,000,000 ක් ඇස්තමේන්තු කර, 2023 දෙසැම්බර් 27 දින රු.11,727,646 ක ප්‍රතිපාදන ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙත නිදහස් කර තිබුණද එකී	2023	ප්‍රතිපාදන ලබාදුන් කාර්යභාරය නිමකර ගැනීමට කටයුතු කල යුතුය.	මෙම කාර්යයට අදාල ඉතිරි රු.7,559,023 ක මුදල 2024 වර්ෂයේදී ගම්පහ දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දෙන ලදි. පෙර සදහන් පරිදි මෙම කාර්යය ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාලව විචල්‍යයක් ලෙස (Variation) එම උපදේශන	කාර්යභාරය අවසන්ව නොමැත.

	කාර්යය 2024 මැයි මස දක්වාම ඉටු වී නොතිබුණි.			ආයතනය හා සම්බන්ධව සිදුකරනු ලබයි. 2024.06.25 දින වනවිට මෙහි ප්‍රගතිය සියයට 40ක් පමණ බව.	
30	2023 වර්ෂයේදී කොග්ගල නේවාසිකාගාරයේ වැසිකිලි පද්ධතියේ සිදුකල යුතු අළුත්වැඩියාවන් සඳහා රු.6,000,000 ක් වෙන් කර තිබුණද එකී කාරයයන් ඉටු කිරීමට අපොහොසත්ව පැවතුණි.	2023	ප්‍රතිපාදන වෙන්කරගැනීම් හා භාවිතය නිසි පරිදි සිදුකල යුතුය.	ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 අනුව අත්‍යාවශ්‍යම කාර්යයන් පමණක් සිදුකල යුතු බැවින් කොග්ගල නේවාසිකාගාරයේ සිදුකල යුතු අත්‍යාවශ්‍ය කටයුතු ගොඩනැගිලි නඩත්තු අංශය විසින් රු.90,140 ක් වැය කර සිදුකරන ලදි. කම්කරු දෙපාර්තමේන්තුවට අයත් කාර්යාල වල සිදුකල යුතු අළුත්වැඩියා කටයුතු පිළිබඳව සැලකීමේදී කටුනායක නේවාසිකාගාරයේ පවතින අඩුපාඩු හදිසියේ සිදුකල යුතු අළුත්වැඩියාවන් නොවූ බැවින් 2023 වර්ෂයේදී අළුත්වැඩියා කටයුතු සිදුනොකරන ලදි. නමුත්, එම ගොඩනැගිල්ලේ සිදුකල යුතු අළුත්වැඩියා කටයුතු සියල්ල පිළිබඳ අධ්‍යයනය කර සියලුම කාර්යයන් එක් ව්‍යාපෘතියක් ලෙස සලකා 2024 වර්ෂයේදී සිදුකිරීමට නියමිතය.	මෙතෙක් කාර්යභාරය ඉටුකර නොමැත.
31	මෙහෙවර පියෙස පොදු පහසුකම් හා කසල කළමණාකරණය, නාම පුවරු, අමුත්තන්ගේ හැඳුනුම්පත් ඇතුළු පහසුකම් සපයා ගැනීමේ කාර්යය උදෙසා අනුමත රු.55,000,000 ක ප්‍රතිපාදන පැවතියද ඇස්තමේන්තු සකස් කිරීම, සාකච්ඡා කිරීම මිල කැඳවීම් අදියරවල පවතින බවට අනාවරණය විය.	2023	ප්‍රතිපාදන වෙන්කරගන්නා ලද කාර්යයන් නිසි පරිදි ඉටු කරවා ගැනීමට කටයුතු කල යුතුය.	රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි හවුල්කාරීත්වය යටතේ මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 04 වන මහලේ පිහිටි ආපනශාලාව, 31 වන මහල වැනි පොදු පහසුකම්හි ක්‍රියාකාරීත්වය, වෙනස් වන බැවින් හා කම්කරු මහලේකම් කාර්යාලයේ මහල් වෙනත් ආයතන වෙත ලබා දීමට නියමිත බැවින් එහිදී කාර්ය මණ්ඩල පිරිස වැඩි වන බැවින් කසළ කළමනාකරණය සඳහා යෝජිත සැලැස්ම මේ වනවිට සංශෝධනය කලයුතුව ඇති	කාර්යභාරය අවසන්ව නොමැත.

				බව. නාම පුවරු සකස් කිරීමේ කාර්යය මේ වනවිට සිදුකරමින් පවතින බව. අමුත්තන්ගේ හැඳුනුම්පත් පද්ධතිය සැකසීමේ කාර්යය සඳහා කිහිප වරක් මිල ගණන් කැඳවීම් සිදුකලද කිසිදු ආයතනයක් විසින් මිල ගණන් ඉදිරිපත් කර නොමැති බව.	
32	2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි ඇමුණුම 01 පරිදි සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීමේ කාර්යභාරය අවසන්ව නොතිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය මඟින් සෑම කාර්යාලයකම වාර්ෂිකව සිදු කරන ප්‍රගති මෙහෙයුම් පරීක්ෂණ මඟින්ද සේවක අර්ථසාධක අරමුදල් දත්ත පද්ධතිය මඟින් ලබා ගන්නා මාසික වාර්තා මඟින්ද ලබා දෙන සේවාවන් එම අංශ මඟින් අධීක්ෂණය කරනු ලැබේ. එමෙන්ම මාණ්ඩලික නිලධාරීන් සඳහා සහ ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන් සඳහා කාර්ය සාධන ඇගයීමේ ක්‍රමවේදයක් සහ ප්‍රගතිය අගය කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා මේ වන විට කමිටුවක් පත් කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව.	කාර්යභාරය අවසන්ව නොමැත.

24. ශීර්ෂය - 222 ශ්‍රී ලංකා යුද්ධ හමුදාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	90,838,550,016	226,458,963	90,612,091,053	තත්ත්වාගණනය කළ
2022	110,053,805,444	128,223,632	109,925,581,812	තත්ත්වාගණනය කළ
2023	138,582,947,190	97,353,826	138,485,593,364	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	සංනිවේදන පද්ධති වැඩි දියුණු කිරීම සහ පනාගොඩ යුද හමුදා කඳවුර තුළ තෙමහල් මධ්‍යම අවි ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම හා ආරක්ෂාව සහ ත්‍රස්තවාදය වැළැක්වීම සඳහා වන ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා - ඉන්දියාව) යන ව්‍යාපෘති/ වැඩසටහන් 03 සඳහා එකතුව රු.බිලියන 1.24 ක ප්‍රතිපාදන වෙනකර තිබුණද. මෙම සම්පූර්ණ ප්‍රතිපාදනයම වර්ෂ අවසානයට ඉතිරි කර තිබුණි.	2021	ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කිරීමට කටයුතු කළ යුතු වීම.	කොවිඩ් වසංගත ගෝලීය තත්ත්වය නිසා ඇති වූ ප්‍රායෝගික ගැටලු හේතුවෙන් මෙම ඉතිරිවීම් සිදු වී ඇති බව.	මෙතෙක් ඉටුකර ගැනීමට කටයුතු කර නොමැති වීම.
02	යුද සමයේ අත්පත්කර ගත් වාහන 595 ක නිත්‍යානුකූල අයිතිය විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් පරිහරණය කරමින් හෝ යුද්ධ හමුදා පරිශ්‍ර තුළ ගාල්කර ගෙන හෝ පැවතුණි.	2021	මෙම වාහන සම්බන්ධයෙන් උචිත ක්‍රියාමාර්ග ගත යුතු වීම.	මෙම වාහන පවරා ගැනීමට අවස්ථා කිහිපයකිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇති බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
03	විධිමත් අනුමැතියකින් තොරව යුධ හමුදාවට අයත් KA-5972 (යුහ 16024) දරන ටොයෝටා කෙරොල්ලා කාර් රථය තෙවන පාර්ශවයන් වෙත අවිධිමත්ව මුදා හැර තිබුණි.	2021	රජයේ වත්කම් නිසි අනුමැතියකින් තොරව තෙවන පාර්ශවයන්ට මුදා නොහැරිය යුතු වීම.	කාර් රථය මේජර් ජෙනරල් අනුරුද්ධ රත්වත්තේගේ ලඟම ඥාතියෙකුගේ ප්‍රයෝජනය සඳහා 2005 වර්ෂයේ සිට ලබා දී ඇති බව.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
04	2010 වර්ෂයේ සිට 2021 වර්ෂය	2021	අවශ්‍යතාවය සහ	මෙම විදුලි උපකරණ	ක්‍රියාමාර්ග ගෙන

	දක්වා අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා නොගෙන රු.මිලියන 2.44 ක් වැයකර මිලදී ගත් රෙදි සෝදන යන්ත්‍ර 29 ක, ඩිජිටල් තරාදි 16 ක, රූපවාහිනී යන්ත්‍ර, ස්ටැබිලයිසර් ඇතුළු විදුලි උපකරණ අයිතම 66 ක වර්ෂයක නිදහස් වගකීම් කාලයද අවසන් වී තිබූ අතර, එම භාණ්ඩ පරිහරණයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.		නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම.	කොරෝනා නිරෝධායන මධ්‍යස්ථාන වෙත ලබා ගෙන ඇති අතර, වසංගතය පැතිරීම පිළිබඳ පූර්ව නිගමනයන්ට එළඹීම අපහසු බැවින් ආරක්ෂිතව ගබඩා කර ඇති බව.	නොතිබුණි.
05	නිදහස් වගකීම් කාලය වසරක් පමණක් ඇති රු.මිලියන 3.9 ක් වැයකර මිලදී ගන්නා ලද 50 kg ඩිජිටල් තරාදි 34 ක්, ඝණ අඩි 20 අධිශීතකරණ 08 ක්, ඝණ අඩි 08 ශිතකරණ 03 ක් ඇතුලු විද්‍යුත් හා විදුලි උපකරණ අයිතම 65 ක් මිලදී ගැනීමෙන් පසු මාස 05 සිට මාස 12 ක අතර, කාල පරිච්ඡේදයක් රාගම හා වේයන්ගොඩ යුද්ධ හමුදා ගබඩා තුළ නිශ්කාර්යව ගබඩාකර තිබුණි.	2021	අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම.	තරාදි හා ශීතකරණ අවශ්‍යතාවය අනුව නිකුත් කරනු ලබන බව.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
06	යුද්ධ හමුදාවේ සිදු වී ඇති රු.මිලියන 4.47 ක සලාක අක්‍රමිකතාවයන්ට අදාළව සියයට 25 ක දෙපාර්තමේන්තු ගාස්තු මෙතෙක් අයකර ගෙන නොතිබුණි.	2021	අදාළ දෙපාර්තමේන්තු ගාස්තු අයකර ගත යුතු වීම.	යුද්ධ හමුදාධිපති නිගමනය සංශෝධනය කර දෙපාර්තමේන්තු ගාස්තු ඉදිරියේදී අයකර ගැනීමට අවැසි කටයුතු සිදු කරමින් පවතින බව.	මේ දක්වා අයකිරීමට කටයුතු කර නොතිබුණි.
07	රු.මිලියන 3.4 ක් වැයකර මිලදී ගෙන තිබූ කවර් අවුටර්ස් 200 ක් නිකුත් නොකර වර්ෂ 01 සිට 05 කට ආසන්න කාලයක් තුළ රාගම ගබඩා සංකීර්ණයේ රඳවා තබා ගැනීම නිසා මේවායේ කාර්යක්ෂමතාවයට හානි සිදු වී තිබුණි.	2021	අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම.	මෙම කවර් අවුටර්ස් භාවිතා කරන වාහන ධාවනයෙන් ඉවත් කිරීම නිසා මෙම තත්ත්වය හටගෙන ඇති බව හා ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයන් අනුව නිකුත් කිරීම් සිදු කරනු ලබන බව.	කවර් අවුටර්ස් වලින් 41 මේ වන විටත් ගබඩාවේ පවතී.
08	2018 වර්ෂයේ අතිගරු	2022	ඇස්තමේන්තු	අදාළ වැව් වල	මෙතෙක්

ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අනුරාධපුර දිස්ත්‍රිකයේ වැව් 11 ක් රු.මිලියන 113 ක වියදමින් වැව්බැම්, නාන තොටුපළ, රළපනාව, ප්‍රවේශ මාර්ග, රොන්මඩ ඉවත් කිරීම, වාන් ඇළ ඉදිකිරීම, ප්‍රධාන කෘෂි මාර්ග නවීකරණය, සොරොව් ඉදිකිරීම හා නාම පුවරු සකස් කිරීම වැනි ප්‍රතිසංස්කරණයන් සිදුකිරීම සඳහා ඇතැම් වැඩ කොටස් යුද්ධ හමුදාවට පවරා, රු.මිලියන 100 ක ප්‍රතිපාදනද වෙන්කර දී තිබුණි. දුනුමඩලාව, නැඹඩගස්දිගිලිය, ගලහිටියාව, හැළඹ යන වැව් හතරෙහි නවීකරණ කටයුතුවල නිමකිරීමේ ප්‍රතිශතය සියයට 70 සිට 90 දක්වා වූ අතර, මෙම වැව්වල ඇතැම් අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු ඉටුකර නොතිබුණු නිසා සහ විශාල කළු ගල්, ඇතුලු ඉදිකිරීමේ ද්‍රව්‍ය ඇතැම් වැව් පරිශ්‍රවල ගොඩගසා තිබීමෙන් වැව් පරිහරණය කරන ග්‍රාමීය ජනතාව අපහසුතාවයට ලක්ව තිබුණි. තවද, යුද්ධ හමුදාවේ ඉල්ලීම මත ජනාධිපති කාර්යාලයේ අනුමැතිය යටතේ රු.මිලියන 28.01 ක් වැයකර ට්‍රැක්ටර් 10 ක්, යතුරුපැදි 05 ක්, ඩෙක්ස්ටොප් පරිගණක 05 ක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, LED රූපවාහිනි යන්ත්‍ර 05 ක්, තණකොළ කපන යන්ත්‍ර 03 ක් හා Chainsaw යන්ත්‍ර 03 ක් මිලට ගෙන තිබුණු අතර, මෙම කාර්යාල හා යන්ත්‍ර උපකරණ අදාළ ව්‍යාපෘතියට ඍජුවම දායක කර ගත්තේද යන්න අනාවරණය කරගත නොහැකි විය. අදාළ වැව් ප්‍රතිසංස්කරණයන් සඳහා අවශ්‍ය බව දක්වමින් යුද්ධ හමුදාවේ බර වාහන හා බර යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාවන් සඳහා රු.මිලියන 3.8 ක්ද වැයකර තිබුණු අතර, මෙම ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.මිලියන 1.6	කරන ලද ප්‍රතිසංස්කරණයන් සිදු කළ යුතු වීම හා ජනතාවට සිදුවන දුෂ්කරතා පිළිබඳ අවධානය යොමු කළ යුතු වීම සහ අදාළ ව්‍යාපෘතිය සඳහා ලබා දුන් සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කර ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	ප්‍රතිසංස්කරණ කාර්යයන් ප්‍රතිපාදන අනුමත නොවීම හේතුවෙන් අත්හිටුවීමට සිදුවූ අතර, මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති යන්ත්‍ර/වාහන අලුත්වැඩියා කර ගැනීමටද සිදු විය. තවද, සිමෙන්ති මිටි 393 ක් ව්‍යාපෘතියේ සහයක ඉදිකිරීම් සඳහාද, මිටි 218 ක් ව්‍යාපෘති ප්‍රමාදය නිසා නුසුදුසු තත්ත්වට පත්වීමෙන් විනාශ කිරීමට සිදු විය.	ක්‍රියාත්මක කර නොතිබුණි.

	ක් වටිනා සිමෙන්ති මිටි 1482 ක් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා සෘජුව අදාළ නොවන යුද්ධ හමුදා කඳවුරුවල විවිධ ඉදිකිරීම් සඳහා භාවිතා කර තිබුණි. තවද, වැව් ඉදිකිරීමේ ඇස්තමේන්තුවල සඳහන් නොවුණු සමාරම්භක උත්සව සඳහා රු.මිලියන 1.84 ක් වැයකර තිබුණු අතර, රු.මිලියන 1.54 ක් වැයකර කළුගල් කියුබ් මීටර් 400 ක් නඹඩගස්දිගිලිය වැවේ රළපනාව ඉදිකිරීම සඳහා යුද්ධ හමුදාවෙන් ප්‍රසම්පාදනය කරගෙන තිබුණු අතර, මෙයින් කියුබ් මීටර් 50 කට වැඩි ප්‍රමාණයක් එම වැව් පරිශ්‍රයේ ගොඩගසා තිබුණි.				
09	1998 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදීගත් රු.මිලියන 4.33 ක් වටිනා වාහන සහ අනෙකුත් අමතර කොටස් වර්ග 216 ක අයිතම 1,888 ක් හා වටිනාකම් අනාවරණය නොකෙරුණු අමතර කොටස් වර්ග 37 කට අදාළව අයිතම 838 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට නොගෙන කොම්පඤ්ඤවීදිය විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු වැඩපොළ ගබඩාවේ පැවතුණි.	2022	අවශ්‍යතාවය සහ නිකුත් කිරීම් නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම.	මෙම අමතර කොටස් මූලික වැඩපොළ වෙතින් සිදුකරනු ලබන අලුත්වැඩියා කටයුතුවලට නිකුත් කිරීමට කටයුතුකර ඇති බව.	සැලකිය යුතු තොගයක් මේ වන තෙක් උපයෝජනය කර නොමැති වීම.
10	දියතලාව, පනාගොඩ හා අනුරාධපුරය යුද්ධ හමුදා කඳවුරුවල ගබඩා සඳහා මිලදී ගත් රු.මිලියන 5.39 වටිනා කවර් අවුටස් 218 ක්, වාහන බැටරි 80 ක් හා විවිධ කාර්යාල හා විදුලි උපකරණ, වගකීම් කාලය තුළ ප්‍රයෝජනයට නොගැනීම නිසා පාවිච්චියට නුසුදුසු තත්ත්වයට පත්වීමෙන් අපහරණය කිරීමට සිදුව තිබුණි.	2022	අවශ්‍යතාවය නිසි ලෙස හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම.	භාවිතයට ගත හැකි තොග අයිතම නිකුත් කිරීමටත්, අනෙකුත් තොග අයිතම අයෝග්‍ය කිරීමටත් කටයුතු කරන බව.	මෙතෙක් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
11	යුද්ධ හමුදා භට පිරිස්, රජයේ ඉඩම් හා ගොඩනැගිලි ඇතුළු යුද්ධ හමුදා සම්පත් යොදාගෙන දිවයිනේ විවිධ ප්‍රදේශවල යුද්ධ හමුදා ගොවිපළවල් 10 ක් ඇතුළු ආදායම් උපදවන ව්‍යාපෘති තුළින්	2023	යථෝක්ත ආදායම සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කළ යුතු වීම.	මෙම ආදායම් පිළිබඳව නියාමනයන් මහා භාණ්ඩාගාරය මඟින් සිදු කරනු ලබන බව.	මෙතෙක් නිවැරදි කර නොතිබුණි.

	සමාලෝචිත වර්ෂයේ තෙවන කාර්තුව අවසාන වන විට පමණක් එකතුව රු.මිලියන 170.16 ක ශුද්ධ ආදායමක් උපයා තිබුණද, මෙම ආදායම් මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කර නොතිබුණි.				
12	යුද්ධ හමුදාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට දිවයිනේ විවිධ ප්‍රදේශවල පිහිටි යුද්ධ හමුදාවට අයත් බිම් කැබලි 106ක එකතුව අක්කර 4,439 ක් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.	2023	දීර්ඝ කාලයක සිට පරිහරණය කරන යුද්ධ හමුදාවට අයත් ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වීම.	ඉදිරියේදී තක්සේරුකර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව.	මෙතෙක් නිවැරදි කර නොතිබුණි.
13	සමාලෝචිත වර්ෂයේ කෘෂි කාර්මික හා සත්ව පාලන ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධන අයිතමයන් මිලදී ගැනීම හා අශ්වයින් ප්‍රවාහනය කිරීම සඳහා රථයක් නිර්මාණය කිරීම ඇතුළු වාහන අටකට සිදුකළ එකතුව රු.මිලියන 54.73 ක ප්‍රාග්ධන ස්වරූපයේ අලුත්වැඩියා වියදම් ද, යුද්ධ හමුදාවට පරිත්‍යාග/ ආධාර ලෙස ලැබුණු රු.මිලියන 119.51 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ සහ උපකරණ ද, ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කර නොතිබුණි.	2023	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළ යුතු වීම.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මෙතෙක් නිවැරදි කර නොතිබුණි.
14	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) අනුව සමාලෝචිත වර්ෂ අවසානයට සත්‍ය නොනිමි වැඩ ශේෂය රු.බිලියන 9.05 ක් ලෙස දක්වා තිබුණද, පසුගිය වර්ෂ කිහිපය තුළදීම වැඩ නිමකරන ලද රු.බිලියන 7.59 ක ප්‍රාග්ධන වත්කම් ප්‍රාග්ධනිත නොකර මෙම නොනිමිවැඩ වටිනාකම යටතේම දක්වා තිබුණි.	2023	වැඩ නිම කළ වර්ෂයේ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත 07 ප්‍රකාරව ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කළ යුතු වීම.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මෙතෙක් නිවැරදි කර නොතිබුණි.
15	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (ඒසීඒ-6) වත්කම් කාණ්ඩ 05 කට අදාළව වත්කම් වර්ග 28 ක එකතුව රු.බිලියන 42.06 ක් ආරම්භක	2023	අදාළ සංඛ්‍යා පිළිබඳ නිශ්චිත තොරතුරු අනාවරණය කළ යුතු වීම.	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ පරීක්ෂා කර පිළිතුරක් ලබා දීමට කටයුතු කරන බව.	මෙතෙක් නිවැරදි කර නොතිබුණි.

	ශේෂයට කරන ලද එකතු කිරීම් ලෙස දක්වා තිබුණද ඒ සම්බන්ධ නිශ්චිත තොරතුරු අනාවරණයක් සිදු නොවුණි.				
16	අවස්ථා 199 කදී රු.මිලියන 155.56 ක අතුරු අග්‍රිම පුද්ගලික ආයතන වෙත ලබා දී තිබුණි.	2023	2016 අගෝස්තු 03 දිනැති අංක 250/2016 (i) දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඇතැම් දේශීය හා විදේශීය මිලදී ගැනීම් සඳහා අත්තිකාරම් ගෙවීමට සිදු වීම නිසා හටගෙන ඇති තත්ත්වයක් බව.	මෙතෙක් නිවැරදි කර නොතිබුණි.
17	පුනරාවර්ථන වැය විෂයන් 12 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන වලින් එකතුව රු.බිලියන 4.17 ක් කපාහැර නොතිබුණි.	2023	2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	පෙර වර්ෂයේ බැරකම් අධික වීම, සමාලෝචිත වර්ෂයේ, ද්‍රවශීල මුදල් නොලැබීම නිසා ඇති වූ තත්ත්වයක් බව.	ක්‍රියාත්මක කර නොතිබුණි.
18	විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණ වූ පරිදි පුනරාවර්ථන වැය විෂයන් යටතේ වූ රු.බිලියන 1.79 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය කර නොතිබුණි.	2023	මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදවු කළ යුතු වීම.	මෙම බැරකම් ප්‍රමාණය බැදීම් ප්‍රකාශයට ඇතුළත්ව ඇති බව.	ක්‍රියාත්මක කර නොතිබුණි.
19	පසුගිය වර්ෂ 32 ක කාලපරිච්ඡේදය තුළ සේවය හැරගොස් ඇති හමුදා නිලධාරීන් 938 දෙනෙකුගෙන් සහ සිවිල් නිලධාරීන් 436 දෙනෙකුගෙන් එකතුව රු.මිලියන 33.31 ක ආපදා, උත්සව හා විශේෂ අත්තිකාරම් ණය ශේෂ වලින් රු.මිලියන 11.94 ක් වර්ෂ 10 ඉකමවූ ණය ශේෂ වන අතර, විශ්‍රාම ගිය හමුදා නිලධාරීන් 50 දෙනෙකුගේ සහ සිවිල් නිලධාරීන් 84 දෙනෙකුගෙන් වර්ෂය ඉක්මවූ වර්ෂ 20 දක්වා කාල පරාසයක් තුළදී අය නොවූ ණය ශේෂ වල එකතුව රු.මිලියන 6.60 ක් වූ අතර, මෙම ණය ශේෂවලින් රු.මිලියන 5.04 ක් වර්ෂ 5 ඉක්ම වූ ණය ශේෂ වුවත් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ විධිවිධාන පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	මෙම ණය ශේෂ කඩිනමින් අයකරගත යුතු වීම.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	මෙතෙක් අයකර ගැනීමට කටයුතු කර නොමැත.

20	ආයතන සංග්‍රහයේ V හා XLVIII පරිච්ඡේද වල 7.1, 7.4, 37.1 හා 37.2 ඡේද, සහ 214, 215, 216 හා 220 යන කාර්ය පටිපාටික රීති ප්‍රකාරව කටයුතු නොකර සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර තනතුර හැර ගිය සේවකයන් 56 දෙනෙකුට තනතුර හැරයාමේ නිවේදන නිකුත් කිරීමට මාස 02 සිට අවුරුදු 10 යි මාස 06 ක් දක්වා ප්‍රමාද කර තිබුණු අතර, මේ නිසා එම නිලධාරීන්ට අභියාචනා කිරිමේ අවස්ථාවද අහිමි වී තිබුණි. තවද, සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කර 1993 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා සේවය හැර ගිය නිලධාරින් 126 දෙනෙකු සේවය හැරගොස් මාස 03 ක් ඉක්මවීමෙන් පසුව නැවත සේවයේ යෙදීමට අවකාශය ලබා දී තිබුණු අතර, අවස්ථා කිහිපයකදි සේවය හැරගොස් තිබුණු සේවකයින්ද මෙසේ නැවත සේවයේ පිහිටුවා තිබුණි.	2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	කාර්යාල ව්‍යාප්තිය අධික වීම හේතුවෙන් මෙම ප්‍රමාදය හටගෙන ඇති බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
21	සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ වර්ෂ අවසානයට තත්‍ය සේවක සංඛ්‍යාව 8252 ක් වූ අතර, සේවකයන් පිළිබඳ නිසි යාවත්කාලීන දත්ත පද්ධතියක් පවත්වා නොගැනීම නිසා සේවකයන් විශ්‍රාම ගැන්වීම, වැටුප් වර්ධක සැකසීම, නිවාඩු පරිපාලනය ඇතුළු විවිධ පරිපාලන දුර්වලතා හටගෙන තිබුණි.	2023	කඩිනමින් විධිමත් දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතු වීම.	සුදුසු දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට මේ වන විටත් ක්‍රියා කරමින් පවතින බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
22	1989 මාර්තු 23 දිනැති අංක 19/89, 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017, 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 සහ 2009 ජුනි 17 දිනැති අංක 09/2009 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් අනුව කටයුතු	2023	රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයට ඉදිරියේදි පියවර ගන්නා බව.	මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.

	නොකර සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ 8,325 ක් වූ සමස්ත කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොමැති අතර, සමාලෝචිත වර්ෂයේ වැටුප්, දීමනා හා අතිකාල ලෙස මෙම කාර්ය මණ්ඩලයට එකතුව රු.බිලියන 5.47 ක් ගෙවා තිබුණි.				
23	2005 අගෝස්තු 18 දිනැති අංක 14/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු නොකර සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ සේවය කරමින් සිට පසුගිය වර්ෂ 07 තුල විශ්‍රාම ගැන්වූ සේවකයින් 277 දෙෙනකුගේ පෞද්ගලික ලිපිගොනු සම්පූර්ණ කිරීමට මාස 02 සිට වර්ෂ 07 දක්වා කාලයක් ප්‍රමාද කර තිබුණි.	2023	රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදි ප්‍රමාදයන් අවම කර ගැනීමට කටයුතු කරනු ලබන බව	මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.
24	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව නිසි ඉන්ධන පරීක්ෂාවක් සිදු නොකර යුද්ධ හමුදාව විසින් වාහන 4243 ක් පරිහරණය කර තිබුණි.	2024	රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	2024 වර්ෂයේ අදාළ පරීක්ෂණ කඩිනම් කිරීමට පියවර ගන්නා බව.	මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.
25	සමාලෝචිත වර්ෂයේ අවස්ථා 11 කදී එකතුව රු.මිලියන 8.15 ක වාහන අලුත්වැඩියා කිරීම් හා අමතර කොටස් මිලදී ගැනීමේදී 8.9.1(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි.	2023	රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කරනු ලබන බව.	නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.
26	සමාලෝචිත වර්ෂය තුල යුද්ධ හමුදාවට විසින් රු.මිලියන 848.65 ක් වැයකර වාහන 663 ක් අලුත්වැඩියා කිරීමේදී 9.3.1(ආ)	2023	රජයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු	අනුමැතිය ලබාගෙන නොමැති බව.	නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

	මාර්ගෝපදේශය සහ 2021 අප්‍රේල් 21 දින ඊට කරන ලද සංශෝධන ප්‍රකාරව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.		වීම.		
27	2019 මාර්තු 21 දිනැති අංකTO/BE2/UNINCOME/ARMY දරන හා 2020 ඔක්තෝබර් 28 දිනැති අංක TO/BE2/4/ UNINCOME/Army දරන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු උපදෙස් හා මහපෙන්වීම් ප්‍රකාරව කටයුතු නොකර හමුදා හට පිරිස් විදේශ සාම සාධක රාජකාරිවල නියුතු වීම වෙනුවෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙත විදේශ ව්‍යවහාර මුදලින් (ඇමරිකානු ඩොලර්) ලැබෙන ආදායමෙන් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගොස්තු 31 දින දක්වා ඇමරිකානු ඩොලර් 58,626 ත් 2,332,588 ත් අතර මුදලක් නියමිත දිනට මහා භාණ්ඩාගාරයට බැර නොකර රඳවාගෙන තිබුණි.	2023	මහා භාණ්ඩාගාර උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත කාර්යාලය විසින් තහවුරු කර ගැනීමෙන් පසුව ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලබන බව.	නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.
28	අවබෝධතා ගිවිසුමෙන් එකඟ වූ වාහන/උපකරණ හා අමතර කොටස් ප්‍රවාහනය කිරීමට ප්‍රමාද වීම හා උපකරණ හා වාහන ධාවනයට සුදුසු තත්ත්වයේ නොමැති වීම නිසා එක්සත් ජාතීන්ගේ සාම සාධක රාජකාරි වෙනුවෙන් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලබාගත හැකිව තිබූ ඇ.ඩො. මිලියන 3.33 ක ආදායමක් අහිමිවී තිබුණි. යථෝක්ත අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	2023	යථෝක්ත අවබෝධතා ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	නාවික කටයුතු ප්‍රමාදය ඇතුළු පාලන කර ගත නොහැකි තත්ත්වයන් මත ඇති වූ තත්ත්වයන් බව.	මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.
29	වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සැලසුම්	2024 වර්ෂයේ සිට යථා පරිදි ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන	මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.

	සැලැස්මක් සකස්කර නොතිබුණි.		සකස් කළ යුතු වීම.	බව.	
30	නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ පරිදි සීමිත/පාලිත ජාතික තරඟකාරී ක්‍රමය, ජාතික තරඟකාරී ලංසු ක්‍රමය සහ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් සමාලෝචිත වර්ෂයේ සිදුකර තිබුණු රු.මිලියන 1580.17 ක ප්‍රසම්පාදන වලදී ලංසු විවෘත කරන අවස්ථාව දක්වාත්, තාක්ෂණික ඇගයීම් කමිටු පත් නොකිරීම නිසා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි ක්‍රියා කිරීමට බාධා එල්ල වී තිබුණි.	2023	අංක 2.6.1(අ)(I), (II), (III) හා 5.3.1(ඈ) දරන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ට අනුව කටයුතු කළ යුතු වීම.	2024 වර්ෂයේ සිට අදාල ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බව.	මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.
31	3.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් නිර්ණායකයන් පිළිබඳ නොසළකා රු.මිලියන 1,298.81 ක ප්‍රසම්පාදනයන් සඳහා සීමිත/පාලිත ජාතික තරඟකාරී ලංසු ක්‍රමය යොදාගෙන තිබුණු අතර, 4.2.2 (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන කාලසටහනක් නොමැති වීම නිසා ප්‍රසම්පාදන කටයුතු සඳහා විශාල කාලයක් ගත වී තිබුණි. තවද, ප්‍රසම්පාදන අත්පොතෙහි 7.4 සහ 7.5 මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ලංසු විවෘත කළ දින සිට තාක්ෂණික කමිටු වාර්තාව ලබා දීමට දින 96 සිට දින 368 ක කාලයක්ද ගත වී ඇති අතර, ඇණවුම් නිකුත් කළ දින සිට අදාළ භාණ්ඩ තොග ගබඩාවට ලැබීම දක්වා දින 42 සිට දින 884 ක කාලයක්ද ගත වී තිබුණි. තවද, මිල සැඳහුම් ක්‍රමය යටතේ එකතුව රු.මිලියන 41.20 ක මිලදී ගැනීම් සිදු කිරීමේදී, මිල ගණන් ඉල්ලීම් ලැබුණු බවට විධිමත්ව සනාථ කර නොගැනීමත්, තොග නොපවතින සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් ඉල්ලීමත්, නිසා තරඟකාරී මිල	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම සහ ප්‍රමාදයන් අවමකිරීම සඳහා එම කටයුතු මනා ලෙස සැලසුම් කළ යුතු වීම සහ තරඟකාරී මිල ගණන් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී මෙම මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරන බව.	මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.

	ගණන් ලබා ගැනිමට බාධා එල්ල වී තිබුණි.				
32	රු.මිලියන 101.14 ක් වැයකර Oracle- 19c පරිගණක මෘදුකාංග බලපත්‍රය මිලදී ගැනීමේදී, පිරිවිතර ලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති සාධක පාදක කර ගෙන ලංසු ඇගයීම් කර තිබුණු අතර, ලියාපදිංචි සැපයුම්කරුවකු විසින් ඉදිරිපත් කළ රු.මිලියන 26.30 ක අඩු මිල ලංසුව, ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු බව දක්වමින් බැහැර කර තිබුණි. තවද, අදාළ මෘදුකාංගය සම්බන්ධයෙන් මිලදීගත් ආයතනයෙන් ලබාගත යුතු පුහුණුවීම් පිළිබඳව විධිමත්ව එම ආයතනය සමඟ එළැඹි ගිවිසුමෙහි සඳහන් කර නොතිබුණු බැවින්, විධිමත් පුහුණුවීමක් නොමැති වීමෙන් මිලදි ගෙන වර්ෂ දෙකකට අධික කාලයක් ගත වී ඇතත් මෙතෙක් සක්‍රීය කිරීමට නොහැකි වී තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කර රජයට ආර්ථික වාසි සැලසෙන පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු වීම.	පිරිවිතර ලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති නමුත් යුද්ධ හමුදාව තීරණය කළ පිරිවිතර පාදක කරගෙන ලංසු ඇගයීම් කර ඇති බව.	මෙතෙක් ක්‍රියාත්මක කර නොමැත.
33	රු.මිලියන 159.36 ක් වැයකර ගොඩනැගිලි හා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී, කාර්යසාධන සුරක්ෂණයන් ලබාගෙන ගිවිසුම් ගත වී නොතිබුණු අතර, රු.මිලියන 25.21 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම, සැපයුම්කරුවන් පැහැරහැර තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරි ප්‍රසම්පාදනයන් වලදි ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව.	ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම.
34	සමාලෝචිත වර්ෂයේ යුද්ධ හමුදාවේ අවශ්‍යතාවයන් සඳහා රු.මිලියන 202.27 ක් වැයකර ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය මිලදි ගැනීමේදී, පරිභෝජන ස්වභාවයේ ඖෂධ සහ වෛද්‍ය උපකරණ ප්‍රසම්පාදන සංග්‍රහයේ 2.4.11 මාර්ගෝපදේශය හා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) නියමයන්ට අනුව පිරිවිතර සකස්	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) නියමයන් හා සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස් ප්‍රකාරව ඖෂධ හා සැරහුම්	ආනයන කාල පරිච්ඡේදයන් සලකා බලා කඩිනමින් මිලදි ගැනීමට කටයුතු කිරීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබුණු බව සහ ඇතැම් ඖෂධ සමාගම් යුද්ධ හමුදාවට ඖෂධ සැපයීමට අකමැත්ත ප්‍රකාශ කිරීම නිසා හටගත් තත්ත්වයන්	ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම.

	කර නොතිබුණු අතර, එහි 2.3.1, 2.3.2 හා 2.3.3 මාර්ගෝපදේශයන්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදෙස්, 4.1.1(ඇ), 4.2.2 හා 4.2.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු නොකිරීමත් සහ ලංසු ඇගයීම සඳහා විශාල කාලයක් ගත කිරීමත් නිසා, ඖෂධ වර්ග 68 ක්ද, ඖෂධ හා සැරහුම් ද්‍රව්‍ය 95 ක ප්‍රමාණයකගෙන් සියයට 33 සිට සියයට 99 දක්වා ප්‍රමාණයක්ද 2024 මාර්තු මාසය වන තෙක් මිලදී ගැනීමට නොහැකි වී තිබුණු නිසා රෝගීන්ට එම ඖෂධ පිටතින් මිලදී ගැනීමට සිදු වී තිබුණි. තවද, මිලදී ගත් රු.මිලියන 43.49 ක ඖෂධ සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ සහතිකය ලබාගෙන නොතිබුණි.		ද්‍රව්‍ය ප්‍රසම්පාදනය කළ යුතු වීම.	බව.	
35	2020-2021 කාල පරිච්ඡේදයේ ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිය සහ යුද්ධ හමුදාවේ ඉදිරි උපාය මාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය ආධුනික සෙබලුන්ට රු.මිලියන 27.32 ක් වැයකර ජර්සි 35,000 ක් මිලදී ගැනීමේදි, ගිවිසුම් ප්‍රකාරව සැපයිය යුතු තොගයෙන් කොටසක් පමණක් සපයා ඉතිරි කොටස සැපයීමට එකඟ වූ මිලට වඩා රු.මිලියන 1.91 ක වැඩි මිලකට එකඟවී මිලදී ගෙන තිබුණු අතර, 2022 වර්ෂයේ ලැබී තිබූ මෙම තොග සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වන විටත් නිකුත් වී නොතිබුණු නිසා, අවපැහැ ගැන්වීමටත් විවිධ ගබඩා පිරිවැයන් දැරීමටත් සිදු වී තිබුණි. මෙම තත්ත්වය මත සැලකිය යුතු තොගයක් අරමුණෙන් බැහැරව සාමාන්‍ය සෙබලුන්ට ලබා දීමට තීරණය කර තිබුණි.	2023	නිසි පරිදි අවශ්‍යතාවය හඳුනාගෙන රජයට වඩා වාසිදායක කොන්දේසි යටතේ මිලදී ගත යුතු වීම.	රට තුළ පැවති තත්ත්වය හේතුවෙන් බඳවා ගැනීමේ ගැටළු පැන නැගුණු බව හා මේ වන විට අදාළ තොග අනෙකුත් හට පිරිස් වෙත නිකුත් කර ඇති බව.	මෙම තොගය මෙතෙක් පරිහරණයට ගෙන නොමැත.

36	සාම සාධක රාජකාරීන් සඳහා මාලි රාජ්‍ය තුල ස්ථාපිත කිරීමට නියමිත 685 ක භට පිරිසක් සඳහා අවශ්‍ය භාණ්ඩ, සන්නද්ධ හා සන්නද්ධ නොවන රථ හා උපකරණ 2016 හා 2017 වර්ෂ තුලදී මිලදී ගෙන තිබුණු අතර, එම රාජකාරී සඳහා එක් කණ්ඩායමක් මණක් රපෝර්තු කරවීම හේතුවෙන් මෙම මිලදී ගත් ප්‍රවාහන හා අනෙකුත් උපකරණ අතරින් එකතුව ඇමරිකානු ඩොලර් මිලියන 4.57 ක් වටිනා රථ හා උපකරණ තොග නිෂ්කාර්යව දිවයිනේ විවිධ ප්‍රදේශවල ගබඩා කර තිබුණි.	2023	මිලදීගෙන ඇති මෙම රථ හා උපකරණ තොග රජයට උපරිම වාසි සැලසෙන පරිදි උපයෝජනය කළ යුතු වීම.	නුදුරේදී රපෝර්තු කිරීමට නියමිතව ඇති භට කණ්ඩායම් වෙත අදාළ භාණ්ඩ, උපකරණ හා සන්නද්ධ රථ ලබාදීමට කටයුතු කරන බව.	මෙතෙක් උපයෝජනය කර නොමැත.
37	මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හෙක්ටයාර් 14 ක ඉඩමක් කුණ්ඩසාල ප්‍රාදේශීය ලේකම් විසින් 2007 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට පවරා දී තිබුණු අතර, මෙම ඉඩම නිශ්කාර්යව පැවතීම නිසා අනවසර පදිංචිකරුවන් විසින් බලහත්කාරයෙන් පදිංචි වී සිටින බව 2016 වර්ෂයේදී මැනීම් කටයුතු සිදු කිරීමට යාමේදී යුද්ධ හමුදාව විසින් අනාවරණය කරගෙන තිබුණද, මෙම ඉඩම නිරවුල් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග මන්දගාමී ස්වභාවයක පැවතුණි.	2023	යුද්ධ හමුදාවට අයත් වත්කම් නිරවුල් කර ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සම්බන්ධතාවයෙන් නිරවුල් කර ගැනීමේ කටයුතු අවසන් අදියරේ පවතින බව.	මෙතෙක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොමැති වීම.
38	දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් නවාතැන් පහසුකම්, කාර්යාල හා ගබඩා පහසුකම් සලසා ගැනීම සඳහා වාර්ෂිකව රු.මිලියන 132.76 ක් වැය කර ගොඩනැගිලි 25 ක් කුලී පදනම මත යුද්ධ හමුදාවට ලබාගෙන තිබුණු අතර, වර්ෂ 30 කට අධික කාලයක සිට කුලියට ගත් ගොඩනැගිලිද, ඒ අතර විය. මෙම කුලී ගොඩනැගිලි	2023	යුධ හමුදාවේ කුලී වියදම අවම කිරීම හා සැලසුම් කළ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමටත් කටයුතු කළ යුතු වීම.	කුලී පදනම මත පරිහරණය කරනු ලැබූ ගොඩනැගිලි 40 න් 15ක් මේ වන විට නිදහස්කර ඇති බව.	ගොඩනැගිලි 25 ක් තවමත් කුලී පදනම මත ඇති බව.

	වෙනුවට රජයේ ගොඩනැගිලි සපයා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණු අතර, රු. මිලියන 460 ක ඇස්තමේන්තු වියදමකින් 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ඉදිකිරීමට සැලසුම් කළ නිවාස හා ගොඩනැගිලි සැලසුම් කළ පරිදි ඉදිකරනු ලැබුවේ නම් මෙම වියදම අවම කර ගැනීමේ හැකියාව පැවතුණි.				
39	විධිමත්ව පවරා ගැනීමකින් තොරව යුද්ධ හමුදාව විසින් වෙනත් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ වෙනත් ආයතනවලින් ට්‍රැක්ටර් 17 ක්, ඩබල් කැබ් රථ 10 ක්, ජීප් රථ 14 ක්, ධාවන පැදි 9 ක්, ගිලන් රථ 8 ක්, ටේලර් 7 ක්, මිනිපෙල් යන්ත්‍ර 6 ක්, බස් රථ 5 ක්, ට්‍රක් රථ 5 ක්, සිංගල් කැබ් රථ 4ක්, ජල/ඉන්ධන බවුසර් රථ 4 ක් හා වෑන් රථයක්ද, පරිහරණය කරමින් පවතින අතර, මෙම රථ අතුරින් වාහන 24 ක් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අතර කාල පරිච්ඡේදයේදී සුදුසු ධාවන තත්ත්වයේ නොපවතින නිසා යුද්ධ හමුදා පරිශ්‍රයන් වල ගාල් කර තිබුණි.	2023	අදාළ වත්කම් විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතන වෙත මුදා හැරීමට කටයුතු කළ යුතු වීම.	ධාවනයට නුසුදුසු වාහන 24 ක් අදාළ ආයතන වෙත භාරදීමට කටයුතු කරමින් පවතින බව හා අනෙකුත් වාහන යුද්ධ හමුදාධිපති නමින් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	මෙම වාහන මෙතෙක් පවරා දීමට හෝ පවරා ගැනීමට කටයුතු කර නොමැත.
40	2020 හා 2021 වර්ෂවල ජාතිය ගොඩනැගීමේ ව්‍යාපෘතිය සහ යුද්ධ හමුදාවේ ඉදිරි උපායමාර්ග ක්‍රියාවට නැංවීම සඳහා අපේක්ෂා කළ පරිදි ආධුනික සෙබලුන් 11,307 ක් බඳවා නොගැනීම නිසා, එකතුව රු.මිලියන 270.96 ක් වැයකර මිලදී ගන්නා ලද රෙදිපිළි හා ඇඟලුම් වර්ග 47 ක් විගණන දිනය වන විටත් නිකුත් නොවී පැවතුණු අතර, එම රෙදිපිළි හා ඇඟලුම් වලින් 2024 පෙබරවාරි මාසය අවසන් වන විට රු.මිලියන 30.96 ක් වටිනා	2023	පැවති තොග තත්ත්වයන් හා අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගත යුතු වීම.	ඉදිරියේදී රෙදිපිළි හා ඇඟලුම් වගකීම් කාලයක් සහිතව මිලදී ගැනීමට කටයුතු කරන බව.	මේ දක්වාද මෙම තොග ප්‍රයෝජනයට ගෙන නොමැත.

	ඇඟලුම් වර්ග 11 ක වගකීම් කාලය ඉක්මවා මාස 3 ත් 14 ත් අතර කාලයක් ගතවී තිබුණි. තවද, මෙම අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීමට සුදුසු, වටිනාකම හෙලිදරව්වූ නොවූ යුද්ධ හමුදාව විසින් මීට පෙර මිලදී ගත් වර්ග 30 කට අදාළ රෙදිපිළි හා ඇඟලුම් ඒකක 81,253 ක වගකීම් කාලයද මේ වන විට ඉක්මවා තිබුණි.				
41	පනාගොඩ යුද්ධ හමුදා රෝහලෙහි පැවති ගිලන් රථ පහෙන් එක් රථයක් 2022 වර්ෂයේ ගිනිගැනීමට ලක්වී ඇතත්, මෙතෙක් අලුත්වැඩියාව නිමකර නොතිබුණු අතර, තවත් ගිලන්රථ තුනක් දීර්ඝ කාලයක් භාවිතයට ගෙන ඇති නිසා වරින් වර කාර්මික දෝෂයන්ට ලක්වෙමින් පැවතුණි.	2023	වත්කම් නඩත්තු කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතු වීම.	නිතීමය ක්‍රියාදාමයන් හා ටෙන්ඩර් ක්‍රියා පටිපාටි සඳහා සැලකිය යුතු කාලයක් ගත වී ඇති බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැත.
42	2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මිලදී ගෙන තිබුණු විවිධ රෙදි, සපත්තු හා ඇඟලුම් ද්‍රව්‍ය සහ නිල ලාංඡන වලින් රු.මිලියන 88.19 ක වටිනා තොග අයිතම 29 ක තොග ඒකක 366,635 ක් නිකුත් නොවී ගබඩාවේ පැවතුණු අතර, එම තොග තත්ත්වයන් ගැන නොසලකා සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 16.90 ක් වැය කර Bages of Rank Star Gold, Silver, Black වර්ගවල නිල ලාංඡන 16,000 ක් මිලදී ගැනීම නිසා මෙතෙක් එම තොගද, නිකුත් නොවී පැවතුණි. තවද, 2022 වර්ෂයේ මිලදි ගත් රු.මිලියන 16.53 ක් වටිනා ජර්සි 24,614 ක් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මාසය වන විටත් ගබඩාවේ පැවතීම නිසා ඒවායේ පැවතිය යුතු සම්මත ප්‍රමිතින්ට හානි සිදු වී තිබුණු අතර,	2023	අවශ්‍යතාවයන් හඳුනාගෙන මිලදි ගත යුතු වීම.	අදාළ තොග උචිත පරිදි නිකුත් කිරීමට කටයුතු කරන ලබන බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	වටිනාකම රු.මිලියන 963.54 ක් වූ රෙදිපිළි හා ඇඟලුම් වර්ග 35 කට අදාළව ඒකක 653,692 ක් සෙමින් චලනය වන තොග ලෙස පැවතුණි.				
43	යුද්ධ හමුදාවට අයිති 1,343 ක් හා යුද්ධ හමුදාවට වෙනත් ආයතනවලින් ලැබී ඇති වාහන 47 කට අදාළව සමාලෝචිත වර්ෂයේදිද, රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබුණි.	2023	රක්ෂණය කළ යුතු වාහන සඳහා කඩිනමින් රක්ෂණාවරණ ලබාගත යුතු වීම.	ඉදිරියේදී රක්ෂණාවරණ ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව.	මෙතෙක් රක්ෂණාවරණ ලබාගෙන නොමැති වීම.
44	සලාක හා ඉන්ධන අක්‍රමිකතාවයන් ආශ්‍රිත සිද්ධීන්, රිය අනතුරු සිද්ධීන්, ත්‍රස්තවාදී ප්‍රහාර ආශ්‍රිත සිද්ධීන් හා ත්‍රස්තවාදී නොවන හේතූන් මත ඇති වූ අලාභ හානි සිද්ධි වලින් වසර 10 කට වැඩි සිද්ධි 90 කට අදාළව රු.මිලියන 282.48 ක අලාභයක්ද, වසර 05 ට වැඩි වසර 10 ට අඩු සිද්ධි 109 කට අදාළව රු.මිලියන 12,861.24 ක අලාභයක්ද වසර 05 ට අඩු සිද්ධි 204 කට අදාළව එකතුව රු.මිලියන 336.16 ක අලාභයක්ද, පැවති අතර, මේ තුල 1990 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සිදු වූ රිය අනතුරු 159 ක්ද ඇතුළත්ව තිබුණි. මෙම අලාභ හානි අයකර ගැනීමේ හෝ කපා හැරීමේ ක්‍රියාවලිය මන්දගාමී ස්වභාවයක පැවතුණි.	2023	අදාළ අලාභ හානි සුදුසු පරිදි කපාහැරීමේ හෝ අයකර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු බව.	ඇතැම් අලාභහානි සිදුවීම් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහ අනෙකුත් පාඩු හානි නිරවුල් කිරීමට කටයුතු කරන බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම.
45	යුද්ධ හමුදාව විසින් භාවිතා කරන ලද විවිධ වර්ගයේ හිස් පතොරම් 65,564 ක ප්‍රමාණයක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.		ආරක්ෂිතව අපහරණය කර රාජ්‍ය ආදායම ඉහළ නැංවීමට ක්‍රියාකළ යුතු වීම.	ඉදිරියේදී අපහරණයටත්, ප්‍රදර්ශන භාණ්ඩ ලෙස තැබීමටත් කටයුතු කරන බව.	මෙතෙක් ක්‍රියාමාර්ග ගෙන නොමැත.
46	වසර 03 කට අධික කාලයක සිට සිවිල් පරිපාලන අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පවතින අතර, මේ සඳහා ස්ථිර නිලධාරියකු	2023	අදාළ පුරප්පාඩුව කඩිනමින් සම්පූර්ණ කළ යුතු වීම.	පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට ආරක්ෂක අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව.	මේ දක්වා ක්‍රියාමාර්ග ගෙන නොමැති වීම.

	පත්කිරීමට විගණන දිනය දක්වාත් කටයුතු කර නොතිබුණි.				
47	2017 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු තීරණයක් මත 2019 වර්ෂයේ මොරටුව විශ්ව විද්‍යාලය මඟින් යුද්ධ හමුදාවේ වැටුප් හා දීමනා ගෙවීමේ දත්ත පද්ධතියේ සංවර්ධනය කළ යුතු අංශ පිළිබඳව නිගමන හා නිර්දේශ 18 ක් හා 2004 වර්ෂයේ සිට යුද්ධ හමුදාව විසින් එම පද්ධතියේ හඳුනාගෙන ඇති දෝෂ 72 ක් නිවැරදි කිරීමට අපොහොසත් වී තිබීම නිසා වැටුප් හා දීමනා අඩුවෙන් හා වැඩියෙන් ගෙවීම් මෙන්ම, විවිධ අවිධිමත් ගෙවීම්ද සිදු වී තිබුණු අතර, මේ නිසා වාර්ෂිකව රු. බිලියන 140 ඉක්මවා සිදු කරන වැටුප් හා දීමනා ගෙවීම් සම්බන්ධයෙන් දැඩි අවදානමක් පැවතුණි. තවද, වර්ථමානයේ හමුදා සමාජිකයින්ට ලබා දෙන මූල්‍ය හා මූල්‍ය නොවන ප්‍රතිලාභ නියාමනය කිරීමට හැකි වන පරිදි පද්ධතිය සංවර්ධනය කිරීමටද කටයුතු කර නොතිබුණි.	2023	යෝජනා සහ නිර්දේශ, විගණන නිරීක්ෂණ වලින් පෙන්වාදුන් දුර්වලතා හා මෘදුකාංග උපදේශන ආයතන විසින් කර ඇති යෝජනා පිළිබඳව අවධානය යොමුකර වැටුප් හා දීමනා සම්බන්ධ අවදානම අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි මාර්ගගත ක්‍රමවේදයන්ද භාවිතා කරමින් සියලු විගණන නිරීක්ෂණයන් පිළිබඳව ද වැඩි අවධානයක් යොමු කරමින්, නව වැටුප් හා ලේඛණ තොරතුරු කළමණාකරණ පද්ධතියක් (P&RIMS) නිර්මාණය කිරීම ආරම්භ කර ඇති බැවින් අදාළ නිරීක්ෂණ සියල්ල මගහරවා ගැනීමට කටයුතු කරනු ලබන බව.	මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති වීම.
48	වේරහැර යුද්ධ හමුදා රෝහල තුළ පිහිටි ඖෂධ ගබඩා ගොඩනැගිල්ල සෞඛ්‍ය අමාත්‍යාංශ සහ ඖෂධ නියාමන අධිකාරියේ හා අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව සකස්කර නොතිබුණු අතර, ඖෂධ ගබඩා කිරීම සඳහා වර්ග අඩි 14,450 ක ගබඩා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට 2019 වර්ෂයේ සැලසුම් කර තිබුණද, එම අවශ්‍යතාවය මෙතෙක් සම්පූර්ණ කර ගෙන නොතිබුණි.	2023	සැලසුම් කළ පරිදි අදාළ ගොඩනැගිල්ල ඉදිකර, ආරක්ෂිතව ඖෂධ ද්‍රව්‍ය ගබඩා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ගත යුතු වීම.	ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බව හා ප්‍රතිපාදන ලැබෙන පරිදි වැඩ නිම කිරීමට අපේක්ෂා කර ඇති බව.	මෙතෙක් ගොඩනැගිල්ල නිම කිරීමට නොහැකි වීම.
49	අපනයනය ඉලක්ක කරගත් බෝග වගාව, කාබනික පොහොර	2023	තිරසාර සංවර්ධන අරමුණු ඉටුකර	ඇතැම් අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපෘති	අරමුණු ලඟාකර ගැනීමට මෙතෙක්

නිෂ්පාදනය, සෞඛ්‍ය සේවාව පුළුල් සහ ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම, ප්‍රශස්ත වෛද්‍ය සේවාවක් සැපයීම සඳහා ගිලන් රථ අවශ්‍යතාවය සපුරා ගැනීම, රණවිරු පවුල්වල සාමාජිකයන්ට තොරතුරු පුහුණු පාඨමාලා පැවැත්වීම, අගුණකොලපැලැස්ස ගබඩා සංකීර්ණයේ ආරක්ෂක මුර කුටි ඉදි කිරීම, ගජසිංහපුර ගබඩා සංකීර්ණයේ නිලධාරි නේවාසිකාගාරය ඉදිකිරීම හා රථ වාහන අනතුරු පිළිබඳ යුද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීමේ දේශණ පැවැත්වීම යන ඉලක්කයන් වෙත සමාලෝචිත වර්ෂයේදී ලඟාවීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.	ගැනීමට කටයුතු කළ යුතු වීම.	අවසන් අදියරයේ පවතින බවත් ඇතැම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී කාල පමාවක් පවතින බව.	අපොහොසත් වීම.

25. ශීර්ෂය - 223 ශ්‍රී ලංකා නාවික හමුදාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	57,243,920,423	335,839,854	56,908,080,569	තත්ත්වාගණනය කළ
2022	59,522,277,596	312,138,654	59,210,138,942	තත්ත්වාගණනය කළ
2023	62,002,957,695	532,734,936	61,470,222,759	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	කේවල ශේෂ වර්ගීකරණ සාරාංශ එකතුව හා පාලන ගිණුමේ ශේෂය සැසඳීමේදී රු. 21,625,626 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර පරීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත කපාහැරීම සඳහා යෝජනා වුවද ඊට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ඉටුවී නොතිබුණි.	2021	කපාහැරීම සඳහාවූ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු බව.	මේ වන විට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ නිවැරදි වටිනාකම් පොත් හා ලෙජරයන් වල සටහන් කරමින් නියමිත දිනට ගිණුම් පිළියෙල කරනු ලබයි. දීර්ඝ කාලයක් අය නොවන වෙනත් ණය ලෙස දැක්වෙන ශේෂය සම්බන්ධයෙන් පත්කළ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි පියවරෙන් පියවර විෂමතාවන් කපා හැරීමට තීරණය කරනු ලැබූ බැවින් පළමුව රු.18,251,726.34ක අයනොවී පවතින ශේෂයෙන් රු.16,848,699.61කට අදාළ කපාහැරීම් සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇති අතර, එයින් රු.2,509,087.87ක ණය ශේෂයක් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත කපාහැරීම් සිදු කර ඇත. ඉතිරි රු.14,339,611.74ක ණය ශේෂය කපාහැරීම සඳහා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇති බව දන්වා	එම ණය ශේෂය කපා හැරීමෙන් පසු දෙවන අදියරේදී පාලන ගිණුම හා කේවල ණය ශේෂ අතර පවතින වෙනස වන රු.21,625,626ක ශේෂය කපාහැරීම සඳහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බව දන්වා ඇත.

				ඇත.	
02	වයඹ නාවික විධානය සතු අළුත්වැඩියා කිරිම ආර්ථික වශයෙන් ඵලදායී නොවන ලෙස හඳුනාගෙන ඇති වාහන 07 ක් සඳහා සුදුස්සක් කිරීමට නිර්දේශ කර තිබුණද ඊට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021	අළුත්වැඩියා කිරීම් ඵලදායී නොවන වත්කම් සඳහා අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතු බව.	නාවික පොදු දිකාස 071951 පෙබරවාරි 2023 දරණ සංඥාව මගින් නාවික හමුදාව තුල භාවිතයෙන් ඉවත් කර ඇති බව දන්වා ඇත.	සුදුස්සක් කර අදාල වාහන භාවිතයෙන් ඉවත් කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත.
03	වසර 05 කට පෙර වෙඩි බෙහෙත් ගබඩාව තුළ සිදුවූ රු. 8,314,236 ක මූල්‍ය විෂමතාවය සම්බන්ධයෙන් ආරම්භ කරනලද විමර්ශන කටයුතු මේ දක්වාම අවසන් වී නොතිබුණි	2021	විමර්ශන කටයුතු කඩිනම් කර අවසන් කිරිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බව.	DNA/INCI/W1712LD/5862/17(NHQ) දරණ විමර්ශන වාර්තාවේ වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කරුණු විමසීම සඳහා 2024 සැප්තැම්බර් මස 05 වන දිනැති අංක ඩීඑන්ඒ/අයිඑන්සීඅයි/එන්එච්කිව්/පොදු/2024 දරණ නාවික හමුදාධිපතිගේ ලිපිය මගින් විමසීම් කර ඇති බව දන්වා ඇත.	එම විමර්ශන වාර්තාවේ වර්තමාන තත්වය සම්බන්ධයෙන් විමසීමක් සිදු කලද, මේ වන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු වාර්තාවක් ඉදිරිපත් කර නොමැති බව දන්වා ඇත.
04	නියමිත කාලසීමාව තුළදී ලැබී ඇති විදුලි බිල්පත් නිරවුල් නොකිරීම හේතුවෙන් රු.685,792 ක් අධිභාර ලෙස ගෙවීමට සිදුවී තිබුණි.	2021	අධිභාර ගෙවීමට නොහැකි වන අයුරින් ගෙවීමට ඇති නියමිත ගාස්තු නියමිත කාලය තුළ ගෙවීමට කටයුතු කළ යුතු බව.	ඉහත විදුලි ගිණුම් සඳහා පවත්වන ලද පරීක්ෂණ මණ්ඩල වාර්ථාව ඇතුලත් අංක-එන්එච්කිව්/ඒඩීඑම්/බීඕඅයි/එස්සී/2808/යූඑන්-3074/22 දරණ ලිපිගොණුව දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශයෙන් පසු එම ලිපිගොණුවට අදාල ඉදිරි කටයුතු අධ්‍යක්ෂ ජෙනරාල් පරිපාලන වෙත ඉදිරිපත් කර ඇත.	2024 ඔක්තෝම්බර් මස 08 වන දින නිකුත් කරන ලද Master Invoice බිල්පතට අනුව (බිල්පත් අංක 24100884) 2470101573 දරණ ගිණුමේ රු.82,807.20 හිඟ ශේෂයක් සහ 2470101565 දරණ ගිණුමේ රු.16,130.21 හිඟ ශේෂයක් පමණක් ඇත.
05	නාවික හමුදාව සඳහා අවශ්‍ය ඖෂධ	2021	හැකි සෑම අවස්ථාවකම	අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට සිදු කරන ලද අධ්‍යයන	අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට සිදු කරන

	අවශ්‍යතාවය වෛද්‍ය සැපයීම් අංශය මගින් මිලදීගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙහි අනුමැතිය ලබාගෙන තිබියදී ඉහළ මිල ගණන් යටතේ දේශීය සැපයුම්කරුවන්ගෙන් එම ඖෂධ අවශ්‍යතාවය ලබාගැනීමට කටයුතු කිරීම හේතුවෙන් රු.33,400,776 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.		වෛද්‍ය සැපයුම් අංශයෙන් අවශ්‍ය පහසුකම් ලබාගැනීමට කටයුතු කළ යුතු බව.	මණ්ඩල වාර්තාවෙහි නිර්දේශයන් නාවික හමුදාධිපතිමාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත.	ලද පරීක්ෂණ මණ්ඩළ වාර්තාව නැවත සකස් කොට එහි නිර්දේශයන් හට අනුමැතිය ලබා ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කර ඇත.
06	2021 දෙසැම්බර් 21 දිනැති අංක 03/2021 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04(6) වගන්තිය ප්‍රකාරව හා මුදල් රෙගුලාසි 94 (1) වගන්තිය ප්‍රකාරව නියම වශයෙන් මුදල් ගෙවීමට සිදු වන කාලය වන විට අවශ්‍ය අධිකාරි බලය හෙවත් අතිරේක මුදල් ප්‍රතිපාදන ලැබේ යැයි අපේක්ෂාවෙන් වියදම් හෝ බැරකම් හෝ නොදැරිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දී ප්‍රතිපාදන ඉක්මවා පුනරාවර්තන වැය විෂයයක් සඳහා රු.15,358,654 ක සහ ප්‍රාග්ධන වැය විෂයයක් සඳහා රු. 82,126,924 ක බැරකම්වලට එළඹ තිබුණි.	2022	වැය විෂයයකට අදාලව ප්‍රතිපාදන මුදල් ඉක්මවා බැරකම් හා බැදීම් ඇති කර නොගත යුතුය.	මෙම විගණන ඡේදයෙන් දක්වා ඇති වැය විෂයන්හී ඉතිරි ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැදීම් ඇතිකර ගැනීමට අත්‍යාවශ්‍ය වීම හේතුවෙන් මුදල් රෙගුලාසි 94(2) සහ 94(3) මගින් සලසා දී ඇති ප්‍රතිපාදන අනුව ක්‍රියා කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වන අතර, රටතුල පැවති ආර්ථික අර්බුධය හේතුවෙන් ඇති වූ හදිසි තත්වයන් (දේශපාලන අස්ථාවරභාවය, මහජන කැළඹීම්, ඉන්ධන හිඟය) හමුවේ නාවික හමුදා මෙහෙයුම් රාජකාරි ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා අපේක්ෂිත මට්ටමට වඩා වියදම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු වීම මත 1202 සහ 2104 වැය විෂයන්ගේ ප්‍රතිපාදන ඉක්මවා බැදීම් වලට එළඹ තිබුණද, 2022 වර්ෂය තුලදී එලෙස බැරකම් වලට එළඹී වැය විෂයයන් සඳහා ගෙවීමක් සිදුකර නොමැති බව 2022 වර්ෂයේ දෙසැම්බර් මස 31	ඉදිරියේදී නාවික හමුදාව වෙතින් වාර්ෂික අයවැය යෝජනා යටතේ නිවැරදිව පිළියෙල කර ඉදිරිපත් කරන ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන ප්‍රමාණයම වෙන් කිරීමට මහා භාණ්ඩාගාරයට හැකියාවක් පැවතියහොත් අනපේක්ෂිත හදිසි තත්වයකදී හැර මූ.රෙ 66 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම් සිදු නොකිරීමට වග බලාගන්නා බව කාරුණිකව දැන්වේ.

				වන දිනට අදාල භාණ්ඩාගාර මුද්‍රිත පිටපතට අනුව සනාථ වේ.	
07	රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පෙට්‍රල්/ ඩීසල් වාහන භාවිතා කරන, අනුයුක්ත කල නිල වාහන හිමිකම ඇති නිලධරයන්ට මාසිකව ලීටර් 135 ක් අනුමත කර තිබියදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවයේ නියුතු සිවිල් නිලධාරීන් 03 දෙනෙක් වෙනුවෙන් රාජකාරී ගමන් සඳහා මසකට ලීටර් 365 ක් බැගින් හා ඒ අතරින් සිවිල් නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් පෞද්ගලික ගමන් සඳහා මසකට ලීටර් 125 ක් බැගින් අනුමත කර තිබුණි.	2022	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය කරන සිවිල් නිලධාරීන් වෙත නාවික නියෝග 325 අනුව නිල රථයක් ලබා දී ඇත 2023 සැප්තැම්බර් මස 27 වන දිනැති අංක PA/PD/1/65/8 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ ලිපිය ප්‍රකාරව රාජ්‍ය වියදම් කලමනාකරණය යටතේ නිල වාහන හා ඉන්ධන භාවිතය සම්බන්ධ විධිවිධාන සමාලෝචනය කිරීමට පත් කරන ලද කමිටුවේ යෝජනා වල ඉදිරි ක්‍රියාමාර්ග අනුව නාවික හමුදාවට ලැබෙන උපදෙස් ප්‍රකාරව ඉදිරියේදී නාවික හමුදාවේ සේවය කරනු ලබන සිවිල් නිලධාරීන් හට නිල රථ ලබා දීමේදී කටයුතු කිරීමට නියමිතව ඇත.	නාවික හමුදාවට ලැබෙන උපදෙස් ප්‍රකාරව ඉදිරියේදී නාවික හමුදාවේ සේවය කරනු ලබන සිවිල් නිලධාරීන් හට නිල රථ ලබා දීමේදී කටයුතු කිරීමට නියමිතව ඇත.
08	නාවික හමුදාපතිගේ අංක 0325 දරන නාවික නියෝගයේ 47 වගන්තිය මඟින් හා 2020 පෙබරවාරි 13 දිනැති නා.හ. 05 දරන අභ්‍යන්තර චක්‍රලේඛය මඟින් කමාන්ඩර් හා ඊට ඉහළ තනතුරු දරන නිළධාරීන් 583 ක් සඳහා පැවති රාජකාරී ඉන්ධන සීමාව ලීටර් 305 සිට 365 දක්වා ද, කොමදෝරු තනතුර හා ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන් 101 ක් සඳහා රාජකාරී ඉන්ධන ප්‍රමාණයට	2022	මාසික ඉන්ධන ලීටර් ප්‍රමාණය සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	2023 සැප්තැම්බර් මස 27 වන දිනැති අංක PA/PD/1/65/8 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන ගරු අමාත්‍යතුමාගේ ලිපිය ප්‍රකාරව රාජ්‍ය වියදම් කලමනාකරණය යටතේ නිල වාහන හා ඉන්ධන භාවිතය සම්බන්ධ විධිවිධාන සමාලෝචනය කිරීමට පත් කරන ලද කමිටුවේ යෝජනා සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිරීක්ෂණ ඉදිරිපත් කරන ලෙස 2023 ඔක්තොම්බර් 10 වන දිනැති අංක	එම වාර්ථාවේ ඡේද අංක 2.b යටතේ නාවික හමුදාවට විශේෂ වූ දැනට ඉන්ධන ලබාදීමේ පිළිවෙත අනුව කොමදෝරු නිලධාරී සිට ඉහලට රාජකාරි කි.මී.2898 ක් ද පුද්ගලික 966ක් ද, කපිතාන් නිලය සඳහා රාජකාරි කි.මී.2576ක් සඳහා ද කොමාන්ඩර් නිලය සඳහා කි.මී.2415ක් ද වූ

	අමතරව පෞද්ගලික කටයුතු සඳහා ලීටර් 125 ක ඉන්ධන ප්‍රමාණයක් ද අනුමත කර තිබුණ ද, ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.			MOD/DEF/ADM/CP/OBS දරන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය මගින් දන්වා ඇති අතර, ඊට පිළිතුරු වශයෙන් 2023 ඔක්තෝබර් 18 වන දිනැති අංක NHQ/ENG/DAE/VEHI/ADT/23/A/2022 දරන නාවික හමුදාධිපතිගේ ලිපිය මගින් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.	දූර ප්‍රමාණයන් පවත්වාගෙන යාම සුදුසු බව නිර්දේශ කර ඇත.
09	භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 07/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය නාවික හමුදාව සතුව ඇති වාහන 59 ක් සඳහා චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022	චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය.	පසුගිය යුධ සමයේ අත්පත් කරගත් රථ වාහන අබලි ද්‍රව්‍ය ලෙස සුදුස්සක් කිරීමට කටයුතු කල බව යෝජනා කල අතර ඒ සම්බන්ධයෙන් සුදුසු නිර්දේශයන් නිසි කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.	මෙම රථ වාහන අතරින් කොටසක් පවරාගෙන ඇති අතර කොටසක් පවරා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමින් පවතී.
10	පෞද්ගලික ආයතනයක ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා නාවික හමුදා කාර්ය මණ්ඩලය 2019 දෙසැම්බර් මස සිට යොදවා තිබූ අතර ඒ සඳහා ආයතනය සමග ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.	2022	වැඩ ආරම්භ කිරීමට ප්‍රථම ගිවිසුමකට එළඹිය යුතුය.	ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා දෙන අවස්ථාවේදී අදාල ආයතනය පුද්ගලික ආයතනයක් ලෙස දන්වා නොතිබූ හෙයින්ද මෙම ආයතනය සම්බන්ධව පුද්ගලික ආයතනයක් බවට හැඟෙන කිසිදු ලියවිල්ලක් නොමැති වූ හෙයින්ද නාවික හමුදාව මගින් ජාතිය ගොඩනැගීමේ කර්තව්‍යට සමගාමීව සිදුකෙරෙන ආගමික ස්ථාන ඉදිකිරීම්/නවීකරණය කටයුතු, සිදුකරන ආකාරයටම ඉදිකිරීම් කටයුතු ආරම්භ කර සිදුකරගෙන යන ලදී.	නාවික හමුදාව විසින් මේ වන විට සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා එලෙස ගිවිසුම් ගත වීම් සිදු කරනු ලැබේ.
11	නාවිකයින් 25 දෙනෙකු මාස 06 ක කාලයක් පෞද්ගලික ආයතනයක ගොඩනැගිල්ලක්	2022	අතිරේක කාලපරිච්ඡේදය සඳහා ද නාවිකයින්	මේ සම්බන්ධව 2020 ජනවාරි මස 07 වන දිනැති ඩීජීසිර්/ඩීඅයිආර්/ඩබ්ර්එස්ටී/111 දරන නාවික	නව ව්‍යාපෘති යෝජනා සඳහා ද එලෙස ආරක්ෂක අමාත්‍යාංශයේ

	ඉදිකිරීම සඳහා යෙදවීමට ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් අනුමැතිය ලබා දී තිබුණි. නමුත් තවදුරටත් මාස 09 ක කාලයකට එකී ව්‍යාපෘතිය වෙනුවෙන් නාවිකයන් යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව නාවිකයින් 17 දෙනෙකු යොදවා තිබුණි.		යෙදවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය.	හමුදාධිපතිගේ ලිපිය සහ 2020 මැයි මස 02 වන දිනැති ඩීජීසීර්/ජීර්එන්/256 දරණ නාවික හමුදාධිපතිගේ ලිපිය මඟින් ආරක්‍ෂක අමාත්‍යාංශයේ අනුමැතිය ඉල්ලා ඇත.	අනුමැතීන් ලබා ගනු ලැබේ.
12	2019 දෙසැම්බර් ආරම්භකර තිබූ ඉහත ව්‍යාපෘතියේ කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් අනුමත මාස 06 ක කාල සීමාව තුළ පුහුණු නාවික මිනිස් දින 1505 ක් ද, සුපරීක්ෂක නාවික මිනිස් දින 109 ක් ද, යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් දළ වැටුප් වියදම රු.4,842,000 ක් වී තිබුණි. එමෙන්ම ව්‍යාපෘතිය සඳහා අතිරේක මාස 28 ක කාල පරිච්ඡේදය වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව සුපරීක්ෂක නාවික මිනිස් දින 639 ක්, පුහුණු නාවික මිනිස් දින 9201 ක් හා නාවික ඉංජිනේරු කාර්මික මිනිස් දින 61 ක් යොදවා තිබුණු අතර ඒ වෙනුවෙන් ගණනය කල දළ වැටුප් වියදම රු. 23,486,800 ක් වී තිබුණි. ඒ අනුව පෞද්ගලික ආයතන වල ඉදිකිරීම් වෙනුවෙන් මිනිස් දින 11,515 ක් සඳහා දළ වැටුප් වියදම ලෙස රු. 28,328,800 ක්	2022	පෞද්ගලික ආයතනයක ඉදිකිරීම් කටයුතු බැවින් වැටුප් වියදම හෝ කාර්මික කුලියක් ප්‍රතිපූරණය කරගත යුතුය.	වෙනත් ආගමික ස්ථාන වල ඉදිකිරීම් සඳහා ද නාවික හමුදා ශ්‍රම දායකත්වය ලබාදීම සිදුකරන අතර, එහිදී එම ශ්‍රමය වෙනුවෙන් වැටුප් වියදම් නැවත ප්‍රතිපූර්ණය කර ගැනීමක් සිදු නොකරන ලදී.	මෙම ව්‍යාපෘතියද ඉහත සඳහන් පරිදි ආගමික ස්ථානයක් ලෙස සලකා ඉදිකිරීම් සිදුකර ගෙන ගිය බැවින් වැටුප් අයකර ගැනීමක් සිදු නොකරන ලදී.

	දරා තිබුණ ද, එය ප්‍රතිපූරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
13	විගණන පරීක්ෂණ දිනට නාවික හමුදාව සතුව විවිධ මාදිලිවලට අයත් මෝටර් වාහන 3415 කින් යුත් ප්‍රවාහන ඇණියක් පැවති අතර ඉන් නාවික හමුදාවේ කාර්යයන් වෙනුවෙන් වාහන 3231 ක් යොදාගෙන තිබුණි. වාහන 03 ක් ධාවනයෙන් ඉවත් කර තිබුණු අතර වාහන 172 ක් අලුත්වැඩියා සඳහා භාර දී තිබුණි. ඉතිරි වාහන 09 ආරක්ෂක අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වෙනුවෙන් යොදවා තිබුණි.	2022	වාහන කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය.	අළුත්වැඩියාව සඳහා යොමුකර තිබූ වාහන 172 අතුරින් වාහන 47ක් මේවන විට ක්‍රියාකාරී තත්වයට පත්කර ඇත. ධාවනයෙන් ඉවත් කර ඇති වාහන 03 සුදුස්සක් කර විකිණීමට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත. බාහිර පාර්ශවයන් වෙත මුදාහැර ඇති වාහන 09 සම්බන්ධයෙන් 2023 අප්‍රේල් මස 19 වන දිනැති එන්එච්කිව්/ඊඑන්ජී/ඩීජ්ඊ/වී ඊඑච්අයි/ඒඩිටී/23/ඒ/2022 දරන නාවික හමුදාධිපතිගේ ලිපිය මගින් සහ 2023 මැයි 23 වන දිනැති එන්එච්කිව්/ ඊඑන්ජී/ ඩීජ්ඊ/ වීඊඑච්අයි/ඒඩිටී/23/ඒ/2022 දරන නාවික හමුදාධිපතිගේ ලිපිය මගින්ද වැඩිදුරටත් දන්වා ඇත. තවද, 2023 ජුනි මස 23 වන දිනැති අංක MOD/IAD/04/ 01/02/07 / 2023(A) දරන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියේ ඡේද අංක 04.01 හි ප්‍රකාරව නාවික හමුදාවේ හිමිකාරිත්වය ඇති සහ කුලී පදනම මත ලබාගත් වාහන, බාහිර පාර්ශවයන් වෙත මුදා හැරීමේදී සංකල්ප වාර්ථාවක් සකස් කර අනුගමනය කර ලද ප්‍රතිපත්තිය, අනුමැතිය ලබාදීමේ පදනම, රටේ පවතින වාතාවරණය මත සිදු කරන ලද්දක්ද යන්න හා භාවිතා කරන ආකාරය ලබා දීමට හේතු ආදිය ඇතුලත්ව එම වාහන පිලබඳව ලේඛනයක්	නාවික හමුදාවේ වාහන කාර්යක්ෂම හා ඵලදායීව උපයෝජනය කිරීමට පියවර ගෙන ඇත.

				නඩත්තු කිරීමටත්, නාවික හමුදාවට අදාල වන පරිදි මේ සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කිරීමටත් ආරක්‍ෂක අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරන කමිටුව උපදෙස් දෙන ලදි.	
14	අංක 09/2022 දරන 2022 දෙසැම්බර් 27 දිනැති අයවැය චක්‍රලේකයේ 02 වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයට අදාළ විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේද අවධාරණය කර ඇති පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මන පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ, ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේද වගකීම වුවද, සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනය රු. 31,975,880,000 ක් වුවත් ඒවායෙහි මුළු වියදම ඉක්මවා රු. 9,671,616,659 ක වටිනාකමකින්යුත් බැරකම් වලට සමාලෝචිත වර්ෂය තුළදී එළඹ තිබුණි.	2023	බැරකම් වලට එළඹීමේදී ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි කටයුතු කළයුතු වීම.	ප්‍රතිපාදන ඇස්තමේන්තුව හැකිතාක් නිවැරදි ආකාරයෙන් පිළියෙල කර ඉදිරිපත් කොට ඇත. රට තුළ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් නාවික හමුදාව විසින් ඇස්තමේන්තු කොට ඉල්ලුම් කරන ලද සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය නාවික හමුදාව වෙත නොලැබුණි. නාවික හමුදා වෙත පැවරී ඇති රාජකාරී ස්භාවයන් මත මෙහෙයුම් හා පරිපාලන රාජකාරි අඛණ්ඩව හා ක්‍රමවත්ව පවත්වාගෙන යෑම ජාතික ආරක්‍ෂාවට ඉතාමත් අත්‍යවශ්‍ය සාධකයක් වන බැවින් ඒ සඳහා අපේක්ෂිත මට්ටමට වඩා වියදම් දැරීම සිදුවීම මත ඇතැම් විෂයයන්ගේ අනුමත ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැඳීම් වලට එළඹීමට සිදුවී ඇත.	එලෙස ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා බැඳීම් ඇති කර ගැනීමට අත්‍යාවශ්‍ය වූ අවස්ථාවන්හිදී මුදල් රෙගුලාසි 94 (2) සහ 94 (3) මඟින් සලසා දී ඇති ප්‍රතිපාදන අනුව ක්‍රියා කිරීමට කටයුතු කර ඇති බව කාරුණිකව දැන්වේ.
15	නාවික හමුදාවේ පුනරාවර්තන වැය විෂයයන් 05 කින් හා ප්‍රාග්ධන වැය විෂයයන් 13 කින් එකතුව රු.	2023	බැරකම් වලට එළඹීමේදී ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන	2023 නොවැම්බර් මස 28 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නාවික හමුදාවේ ප්‍රතිපාදනවලින් රුපියල්	ඇණවුම්පත් ලබාදී දෙස් විදෙස් සැපයුම්කරුවන් හා ගිවිසුම් වලට එළඹව තිබූ

	5,294,900,000 ක ප්‍රතිපාදන ශ්‍රී ලංකා යුධ හමුදාවට මාරුකර තිබීමෙන් සමාලෝචිත වර්ෂයට අදාළ එම වැය විෂයයන්හි බැරකම රු. 9,264,105,756 කින් වැඩි වී තිබුණි.		පරිදි කටයුතු කළයුතු වීම.	බිලියන 5.29 ක් ප්‍රතිපාදන අනපේක්ෂිතව යුද්ධ හමුදාවට මාරු කිරීමට සිදුවිය.	විෂයයන් නාවික හමුදාව වෙත එම වර්ෂයේ සැපයීම හේතුවෙන් ඊට අදාල බිල්පත් නිරවුල් කිරීමට එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන සීමාව ප්‍රමාණවත් නොවීම බැරකම් වැඩි වීමට හා වියදම් කළමනාකරණය කර ගැනීමට නොහැකි වීමට හේතුවක් විය.
16	ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වත්කම් අත්පත් කර ගැනීමට තිබූ රු. 152,890,000 ක් හා යටිතල පහසුකම් සංවර්ධනයට තිබූ රු.190,027,000 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවට මාරුකිරීම හේතුවෙන් නාවික හමුදාවේ ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය අඩාලවීමෙන් ඉදිරි මෙහෙයුම් කාර්යන් හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය දුර්වලවීමට හේතුවිය හැකිබව නිරීක්ෂණය කරනු ලැබේ.	2023	මූලධන වත්කම් සංවර්ධනය සඳහා ඉදිරියේදී වැඩි අවධානයක් යොමුකළ යුතු වීම.	ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රාග්ධන වැය විෂයන් යටතේ වෙන් කර තිබූ ප්‍රතිපාදන යුද්ධ හමුදාවේ ආහාර පාන හා නිල ඇඳුම් වියදම් සඳහා මාරු කිරීම හේතුවෙන් නාවික හමුදාවේ ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය අඩාල වීමට හේතුවක් විය හැකි බවට දක්වා ඇති කරුණ සම්බන්ධයෙන් එකඟ වේ.	එකඟවන නමුත්, 2023 නොවැම්බර් මස 28 වන දින ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින වියදම් ඒකක මඟින් අපේක්ෂිත ඉතිරිවීම් අවුරා තබන ලදී. ඒ යටතේ නාවික හමුදාව වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන මඟින් රුපියල් බිලියන 5.29 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් අවුරා තැබීමට කටයුතු කරන ලදී.
17	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ වර්ගීකරන සාරාංශය අනුව නාවික පුද්ගලයින් 266 දෙනෙකුගෙන්	2023	හිඟ හිටි අත්තිකාරම් ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතු වීම.	ශ්‍රී ලංකා නාවික හමුදාවේ අත්තිකාරම් බී ගිණුමේ 2001 වර්ෂයේ සිට අයවිය යුතු රු.15,671,072ක ණය ශේෂයෙන් රු.25,000ට වැඩි ශේෂයන් පවතින	ඉතිරි රු.1,916,992ක ශේෂය අයකර ගැනීම සඳහා තවදුරටත් ලිපිගොනු සොයා තහවුරු කර

	2001 වර්ෂයේ සිට අයවිය යුතු රු. 15,671,072 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය වී නොතිබුණි. අයකර ගැනීම් පිලිබඳව ප්‍රමාණවත් ලිපිගොණු පවතින බවට තහවුරු කර ගෙන තිබූ රු. 25,000 ට වැඩි ශේෂයන් පවතින නාවික පුද්ගලයින් 230 කගෙන් අයවිය යුතු රු. 13,754,080 ක් කපා හැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. ඉතිරි නාවික පුද්ගලයින් 36 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,916,992 ක් සම්බන්ධයෙන් අයකර ගැනීම් පිළිබඳව තොරතුරු අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.			පුද්ගලයන් 230කගෙන් අයවිය යුතු රු.13,754,080ක ශේෂයක් කපාහැරීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	ගැනීමට අවශ්‍ය කටයුතු කරගනිමින් පවතින බව කාරුණිකව දැන්වේ.
18	රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු. 523,138,367 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ශේෂය රු. 501,512,741 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු. 21,625,626 ක වෙනසක් පැවතුණි. 2001 වර්ෂයේ සිට පැවත එන මෙම වෙනස සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය මඟින් පත් කර තිබුණු කමිටුවේ වාර්තාව අනුව මෙම වෙනස පරීක්ෂා	2023	වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට ක්‍රියාකළ යුතු වීම.	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ඒම ශේෂයන් අතර පැවති රු.21,625,626 ක වෙනස සහ රු.18,251,726.34 ක දීර්ඝ කාලයක් අය නොවන වෙනත් ණය ලෙස දැක්වෙන ශේෂය සම්බන්ධයෙන් පත්කළ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි ඉහත විෂමතාවයන් කපා හැරීමට තීරණය කරනු ලැබූ බැවින් පළමුව රු. 18,251,726.34 ක අය නොවී පවතින ශේෂයෙන් රු.16,848,699.61 කට අදාල කපාහැරීම් සඳහා අවශ්‍ය කටයුතු ආරම්භ කර	රු.2,509,087.87 ක ණය ශේෂයක් ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත කපාහැරීම් සිදුකර ඇත.

	කිරීමට පොත්පත් සහ ගිණුම් සාරාංශ නාවික හමුදාව සතුව නොමැති බැවින් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා නාවික නීති අංශය මැදිහත් වීමෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බවට නිර්දේශ කර තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණය හා අත්තිකාරම් පාලන ගිණුමේ වෙනස එලෙසම පැවතුණි.			ඇත.	
19	2018 අංක 19 දරන ජාතික විගණන පනත 3 හා 6 වගන්ති ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලු ආදායම්, ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් සහ ගිණුම් පරීක්ෂා කළ යුතු වුවද, නාවික හමුදාවේ මාලිමා සත්කාරක සේවා, මාලිමා එන්ටප්‍රයිසස්, ඉන්ධන පිරවුම්හල, කෘෂි ව්‍යාපෘති, තල් මසුන් නැරඹීමේ ව්‍යාපෘති, නිවාඩු නිකේතන ආදියේ අරමුදල්වලට අදාල ආදායම් වියදම් සම්බන්ධ ගිණුම් වාර්තා හා ලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	සියළු අරමුදල් ව්‍යාපෘති වලට අදාළ ආදායම්, වියදම් හා ගිණුම් වාර්තා විගණනයට ඉදිරිපත් කළයුතු වීම.	සුභසාධක ව්‍යාපෘතීන් රාජ්‍ය නොවන අරමුදල් මගින් ආරම්භක ප්‍රාග්ධනය සපයා ගෙන සංස්ථාපනය කොට නාවික හමුදා සේවයේ නියුතු නාවික පුද්ගලයින්, විශ්‍රාමික නාවික පුද්ගලයින්, යුද්ධයේදී මියගිය ආබාදිත සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ සහ ඔවුන්ගේ ලඟම ඥාතීන්ගේ සුභසාධනය අරමුණු කරගෙන පවත්වාගෙන යනු ලබන අතර, පූර්ණ වශයෙන් ලාභ ඉපයීම පරමාර්ථය නොවූ සුභසාධන ව්‍යාපෘතීන් වේ.	ත්‍රිවිධ හමුදාව, ආරක්‍ෂක අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එහි අවසන් නිගමනයන්ට මේ දක්වා එළඹී නොමැති බැවින් ඉදිරියේදී ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ.
20	2018 අංක 19 දරන ජාතික විගණන පනත 6(3) වගන්තිය මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව සහ	2023	පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළයුතු	2016 වර්ෂයේ පවත්වන ලද රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝග අංක 09 ට ප්‍රතිවාර	ඉදිරි මූල්‍ය වර්ෂ සඳහා විගණකවරුන් පත්

	විගණකාධිපතිවරයා විමසා අස්ථිත්‍යවල ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම්ලත් විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවද, නාවික හමුදාවේ අරමුදල් විගණනය සඳහා පත්කර තිබූ විගණකවරයා එකී විධිවිධාන ප්‍රකාරව පත්කර නොතිබුණි.		වීම.	දැක්වීමක් වශයෙන් නාවික හමුදාව තුළ පවත්නා රාජ්‍ය නොවන වත්කම් විගණනය කිරීම සඳහා පිළිගත් විගණන ආයතනයක් වෙත මේ වන විට ගිණුම් ලබා දෙමින් පවතී.	කිරීමේදී 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(3) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවර යා වෙත දැනුම් දීමට කටයුතු කරන බව කාරුණිකව දැන්වේ.
21	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 101 වගන්තිය	2023			
	2010 ජුලි මස 21 වන දින සිට 2011 අගෝස්තු මස 21 වන දින දක්වා කාලය තුළ ශ්‍රීලංනානෞ “පැරකුම්බා” ආයතනයේ ආහාර ගබඩාව වෙත සැපයුම්කරුවන් විසින් ආහාර සැපයීමේදී සහ ආහාර ගබඩාව වෙතින් මුළුතැන්ගෙයට ආහාර නිකුත් කිරීමේදී සිදු වී තිබූ රු.7,721,406 ක අලාභය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ මණ්ඩල වාර්තා අනුව වරදකරුවන් 11 දෙනෙකු 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ඉන් 04 දෙනෙකුට අදාල අලාභය නාවිකයින්ගේ සුභපැතීමේ ත්‍යාග අරමුදලින් අයකර තිබුණද, ඉතිරි නාවිකයින් 07 දෙනාට අදාල අලාභය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.		මෙම අලාභය අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගතයුතු වීම.	මෙම අලාභයට සම්බන්ධව නාවික පුද්ගලයින් දෙදෙනකු නාවික සේවයෙහි රැඳී සිටින අතර තවත් එක් අයකුගේ සේවය අත්හිටුවා ඇත. තවද මෙම සිදුවීමට අදාල සෙසු නාවික පුද්ගලයින් තිදෙනකු වසර 22 සම්පූර්ණ වීමට ප්‍රථම නාවික හමුදාවෙන් ඉවත්වී ඇති අතර එක් පුද්ගලයකු වසර 22 සේවා කාලය අවසන් වීමෙන් පසු විශ්‍රාම ගොස් ඇත. තවද මොවුන්ගේ සේවා පාරිතෝෂිකය මඟින්ද අයකරගැනීම් කර නොමැති බව පෙනී යයි. විශ්‍රාම වැටුපකට හිමිකම් තිබෙන පුද්ගලයාගේ විශ්‍රාම වැටුප අත්හිටුවීමට හෝ කටයුතු කර නොමැත.	මෙම පුද්ගලයන්ගෙන් අයකරගැනීම් සම්බන්ධව සිවිල් අධිකරණයේ නඩු පැවරීමට නාවික හමුදා නීති අංශය මඟින් පියවර ගනිමින් සිටින අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් මූතූර් අධිකරණයේ නඩුවක් ගොනුකර ඒ සම්බන්ධවද කටයුතු කරමින් සිටී.
22	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 104 වගන්තිය අනුව පාඩුවක් හෝ අලාභ	2023	පරීක්ෂණ කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාකළ යුතු වීම.	2023 නොවැම්බර් මස 23 දින නාවික හමුදා පරීක්ෂණ මණ්ඩලයක් පත් කරන ලදී. එම වාර්තාවේ අලාභය සම්බන්ධ ඉදිරිපත්කර ඇති	පරීක්ෂණ මණ්ඩල වාර්තාව නැවත සකස් කලයුතු බව පෙනී යන බැවින් පරීක්ෂණ මණ්ඩල

	හානියක් ඇති වූ වහාම පරීක්ෂණයක් කළ යුතු වුවත්, විදේශීය මිලදී ගැනීම් අංශයේ මිලදී ගැනීම්වලින් අගය එකතු කිරීමේ බදුවලින් (VAT) නිදහස් කර තිබූ භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත අගය එකතු කිරීමේ බදු ලෙස රු.2,329,345 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.			නිර්දේශ අනුව වගකිව යුතු පුද්ගලයින් කවුරුන්දැයි නම් කර නොමැති බැවින් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සැලකිල්ලට ගෙන ඇත.	වාර්තාව නැවත සකස් කිරීම සඳහා පරීක්‍ෂණ මණ්ඩලය වෙතට නැවත යොමු කොට ඇත.
23	ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 177(1) වගන්තිය අනුව රැස්කරන රජයේ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වුවද, නාවික නිලධාරීන්ගේ හා නාවිකයන්ගේ සුභ සාධක කටයුතු සඳහා යොදවා තිබෙන සුඛෝපභෝගී බස් රථ 04 කින් හා වෑන් රථ 02කින් නාවික හමුදාව 2022 හා 2023 වර්ෂයන් වලදී උපයා තිබූ රු. 19,880,407 ක ආදායම නාවික හමුදාවේ සුභ සාධක අරමුදලට බැරකර තිබුණි. එම කාලපරිච්ඡේදයට අදාලව ඉන්ධන සඳහා රු. 17,113,256 ක් ද අළුත්වැඩියා වියදම් සඳහා රු. 4,486,420 ක් ද වශයෙන් රු. 21,599,676 ක වියදමක් එම වාහන වෙනුවෙන් නාවික හමුදාව විසින් දරා තිබුණි.	2023	ඒකාබද්ධ අරමුදලට හිමි ආදායම් රැස්කිරීමට නොපමාව කටයුතු කළයුතු වීම.	සේවයේ නියුතු, විශ්‍රාමික, යුද්ධයේදී මියගිය හා අබාධිත නාවික පුද්ගලයන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ සුභසාධනය උදෙසා සහනදායී මිල ගනන් යටතේ සුභසාධන කටයුත්තක් ලෙස නාවික හමුදාධිපතිගේ සංදේශයක් මගින් නිසි ක්‍රමවේදයක් අනුව අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව එම බස්රථ සහ වෑන්රථ ලබාදීම සිදුකරයි. එයින් අයකරගනු ලබන මුදල් එම රථවල ධාවනයේදී සිදුවන අළුත්වැඩියාවන් සිදුකිරීම සඳහා යොදවනු ලැබේ.	ත්‍රිවිධ හමුදාව, ආරක්‍ෂක අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය සමග මේ සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කර ඇති අතර, එහි අවසන් නිගමනයන්ට මේ දක්වා එළඹී නොමැති බැවින් ඉදිරියේදී ආරක්ෂක අමාත්‍යාංශය මඟින් ලබා දෙන උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ.

24	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.6 (අ) වගන්තිය අනුව ශ්‍රී ලංකාව තුළ ඇති ශ්‍රමය, අමුද්‍රව්‍ය සහ සංරචක පිරිනමනු ලබන නිෂ්පාදනයේ (Ex work) මිලෙන් සියයට 30 වන විට හා අඩුම තරමින් ලංසු ඉදිරිපත් කළ අවස්ථාවේ සිට එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ / එකලස් කිරීමේ කටයුතුවල නිරත වන විට දේශීය ප්‍රමුඛතාවය මත සියයට 20 ක ආන්තිකයක් ලබාදිය යුතු වුවද, ඊට පටහැනිව කටයුතු කිරීම මත ආරක්ෂිත පාවහන් යුගල් 3000 ක් මිලදී ගැනීමේදී රු. 2,236,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම ඇගයීමට ලක් කල පාවහන් අතරින් මෙම පාවහන් බරෙන් වැඩි බවද ගුණාත්මක භාවය අසතුටුදායක වී තිබූ බවද නිරීක්ෂණය විය.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාර කටයුතු කළයුතු වීම හා බැහැරවීම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්විය යුතු වීම.	අදාල සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ සාමාජිකයකු පත් කර ගැනීමට ගණකාධිකාරි (ආදායම් හා වත්කම් කළමනාකරණ) වෙත 2024 මැයි මස 01 වන දින නාවික හමුදාධිපතිගේ ලිපිය මගින් ඉදිරිපත් කර ඇත.	අදාල පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිත බව වැඩිදුරටත් දැන්වේ.
25	නාවික හමුදාවේ Material digital camaflag , Material olive green, Black drill සහ Material cloth truser inner යන රෙදි වර්ග වල රෙදි මීටර් 57,014 ක් 2019 වර්ෂය අවසාන වන විට ගබඩාවේ තිබියදී සහ වාර්ෂික තොග අවශ්‍යතාවය පිළිබඳව ඇගයීමකින් තොරව 2020 සහ 2021 වර්ෂවලදී රෙදි මීටර් 164,520 ක් මිළදී ගෙන තිබුණි. 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ	2023	රජයේ මුදල් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා පමණක් පිරිමැසුම්දායක ලෙස උපයෝජනය කළයුතු බව.	2024 වර්ෂය සඳහා නාවික පුද්ගලයින් 4,169 පමණ බඳවා ගැනීමට සැලසුම් කර ඇති බව අධ්‍යක්ෂ නාවික පුද්ගල මගින් ඉදිරිපත් කර ඇතත්, 383 ක් පමණක් බඳවා ගෙන ඇත.	මෙම වර්ෂය තුල ඉතිරි ප්‍රමාණය බඳවා නොගතහොත් ඇණවුම් කර ඇති නිල ඇඳුම් ප්‍රමාණය නිකුත් නොවී පැවතිය හැක.

	අවුරුදු 04 ක කාලය තුල එම රෙදි වර්ග වලින් රෙදි මීටර් 96,175 ක් පමණක් නිකුත්කර තිබූ අතර ඒ අනුව 2019 වර්ෂයේ සිට පැවත එන තොග වලින්ද සමන්විත වූ රෙදි මීටර් 125,359 ක පමණ තොගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගබඩාවේ පැවතුණ අතර එම රෙදි වල ගුණාත්මක භාවය අඩු වී තිබුණු බවද නිරීක්ෂණය විය.				
26	Material Woollen Polyester dark blue 6 (A), Material woolen polyester reefer suit සහ Material wooden mess Jacket රෙදි මීටර් 18,145 ක් රු. 24,949,100 ක වටිනාකමකට 2012 වර්ෂයේදී මිලදීගෙන තිබූ අතර 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල එම අයිතමයන්ගෙන් රෙදි මීටර් 12,378 ක් පමණක් නිකුත් වී තිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රෙදි මීටර් 5,767 ක් ගබඩාවේ පැවතුණි. විශාල තොග ප්‍රමාණයක් මිළදී ගැනීමෙන් පසු 2014 වර්ෂයේ සිට එම රෙදි වලින් නිල ඇඳුම් මැසීම නතර කිරීමට තීරණය කිරීම හේතුවෙන් අවුරුදු 11 කට වැඩි කාලයක සිට එම රෙදි තොග ගබඩාවේ ගොඩගැසී ඇති අතර ඒවායේ ගුණාත්මකභාවය ද හීන වී ගොස් තිබුණි.	2023	රජයේ මුදල් අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම සඳහා පමණක් පිරිමැසුම්දායක ලෙස උපායෝජනය කළයුතු බව හා පවත්නා රෙදි තොගය ඵලදායී කටයුතු සඳහා භාවිතා කළයුතු වීම.	රෙදි ගබඩාව තුල මේ වන විට Material Woolen Polyester Dark Blue 6(A) රෙදි මීටර 2,997.30, Material Woolen Polyester Reefer Suit රෙදි මීටර් 1,750.85 හා Material Woolen Mess Jacket රෙදි මීටර 1,019.00 ක ප්‍රමාණයක් තොගයේ පවතී. මෙම රෙදි 2012 වසරේදී මිලදී ගැනීම සිදුකර ඇති අතර, 2014 දෙසැම්බර් 10 දිනැති අංක WAS/01/2014 දරණ අධ්‍යයන වාර්තාව මගින් නිර්දේශ කර ඇති පරිදි, මෙම නිල ඇඳුම් වර්ග 03 අළුතෙන් මැසීම නතර කර ඇත.	මේ සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිර්දේශ ලබාගැනීමට නාවික හමුදා අභ්‍යන්තර අධ්‍යයන මණ්ඩලයක් පත්කිරීමටද කටයුතු කර ඇත.

27	මධ්‍යම නිළ ඇඳුම් ගබඩාවට නව කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කිරීමෙන් පසු 2023 ඔක්තෝබර් 31 දින කර තිබූ ගබඩා තොග සමීක්ෂණ වාර්තාව අනුව තොග අයිතම් 269 ක තොග ඒකක 9401 ක අතිරික්තයක්ද, තොග අයිතම් 227 ක තොග ඒකක 8635 ක ඌණතාවයක්ද තිබූ අතර ඒ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	කඩිනමින් පරීක්ෂණ කටයුතු අවසන් කර සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වීම.	මධ්‍යම නිල ඇඳුම් ගබඩාවේ තොග අයිතමයන්හී අතිරික්තයක් හා ඌණතා පැවතීම සම්බන්ධව විධිමත් පරීක්‍ෂණයක් දැනටමත් සිදු කරමින් පවතී.	පරීක්‍ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ නාවික හමුදාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අතර නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කර ඇත.
28	බාහිර පාර්ශවයන්ට සැපයූ සේවා වෙනුවෙන් ඉපයූ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඉතිරි වී තිබූ රු. මිලියන 337.5 කින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට එකග වී තිබූ සියයට 40ක ප්‍රමාණය වන රු. මිලියන 135 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.	2023	රාජ්‍ය ගිණුම්කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළයුතු වීම.	2016 වර්ෂයේදී නාවික හමුදාවේ අධ්‍යක්‍ෂ ජෙනරාල් පුහුණු ඒකකය යටතේ විදේශීය පුහුණු පාඨමාලාවන් සඳහා සහභාගී වූ නාවික පුද්ගලයින්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි රු මිලියන 147.4 ක මුදලක් ලබා දී ඇති අතර, එම මුදල් මේ දක්වා ප්‍රතිපූර්ණය වී නොමැත.	එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමෙන් පසු ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු රු මිලියන 337.5 මුදලින් 40% ප්‍රමාණය වන රු මිලියන 135 ක මුදල ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
29	නාවික හමුදාව මඟින් පවත්වාගෙන යනු ලබන සියළුම ආදායම් උපයන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට පවතින මූල්‍ය රෙගුලාසිවලට අනුව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන එහි	2023	රාජ්‍ය ගිණුම් කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කළයුතු වීම.	නාවික හමුදා මාලිමා සත්කාරක සේවා, මාලිමා එන්ටප්‍රයිසස්, ඉන්ධන පිරවුම්හල, තල්මසුන් නැරඹීමේ ව්‍යාපෘති, කෘෂි ව්‍යාපෘතිය, නිවාඩු නිකේතන ආදී ආදායම් උපයන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් 2024 මැයි මස 14 වන දින මුදල් අමාත්‍යාංශයේදී පැවති රැස්වීමේ තීරණ අනුව ක්‍රියා	ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදෙන උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරන බව දැන්වේ.

	වාර්තාවක් රාජ්‍ය ගිණුම් කාරක සභාවට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යොමුකර නොතිබුණි.			කරනු ලැබේ.	
30	රජයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් මිළදී ගත් පිරිවැය රු.1,860,619 ක්වූ ඖෂධ වර්ග 49 ක් විවිධ හේතූන්මත තවදුරටත් භාවිතා කිරීම නවතන ලෙස වෛද්‍ය සැපයුම් අංශය මඟින් ලබාදුන් උපදෙස් හේතුවෙන් මධ්‍යම ඖෂධ ගබඩාව තුළ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි.	2023	පිරිවැය අයකර ගැනීමට හෝ එම ඖෂධ සඳහා විකල්ප ඖෂධ ලබා ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් ඇතිකරගත යුතු වීම.	එලෙස උපදෙස් ලබා දුන් එම ඖෂධයන්ගෙන් ඇතැම් ඖෂධ දැනට කල් ඉකුත් වී ඇත.	එම අයිතමයන් වෙනුවට නව ඖෂධ ලබා ගැනීම හෝ එහි වටිනාකම වෙනුවෙන් වෙනත් ඖෂධ ලබා දෙන ලෙසට විටින් විට ලිපි මගින් වෛද්‍ය සැපයුම් අංශය දැනුවත් කිරීම් සිදු කලද නිශ්චිත පිලිතුරක් මේ වන තෙක් ලැබී නොමැත. වෛද්‍ය සැපයුම් අංශය මගින් ලබා දෙන පිලිතුරු ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දැන්වේ.

31	2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ අවුරුදු 05 ක කාලපරිච්ඡේදය තුළ නිලධාරීන් සහ නාවිකයින් පිළිවෙලින් 537 දෙනෙකු හා 9,011 දෙනෙකු බඳවාගන්නා විට විශ්‍රාම ගිය හා සේවය හැර ගිය සංඛ්‍යාව පිළිවෙලින් නිලධාරීන් 580 ක් සහ නාවිකයින් 17,734 ක් වී තිබුණි. ඒ අනුව නාවික හමුදාවෙන් ඉවත්ව යන සංඛ්‍යාවට සාපේක්ෂව බඳවා ගන්නා සංඛ්‍යාව සියයට 52 ක අඩු මට්ටමක පැවතුණි.	2023	සේවය හැර යාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වීම හා බඳවාගැනීම් කඩිනම් කිරීමට කටයුතු කළයුතුවීම.	විශාල ප්‍රමාණයක් කෙටි කාලසීමාවක් තුල සේවයෙන් විශ්‍රාම ගැනීම ඉදිරි සේවා කාලය සඳහා නැවත සේවය ලබාගැනීමට අකැමැත්ත ප්‍රකාශ කර සිටීම, අනුමත සේවා කාලයට ප්‍රථම වෙනත් රැකියාවක නිරතවීමට/ විදේශ ගතවීම වැනි කටයුතු සඳහා සේවයෙන් නිත්‍යානුකූලව ඉවත්වීම හෝ සේවය අතහැරයාම, 2019 සිට 2022 වසර දක්වා රටේ පැවැති කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ නව බඳවා ගැනීම් පහත වැටීම, 2022 වර්ෂයේ රජය විසින් රාජ්‍ය ආයතන වෙත නව බඳවා ගැනීම් අත්හිටුවීමට කටයුතු කිරීම වැනි හේතු බලපා තිබුණි.	බඳවා ගැනීම් ප්‍රවර්ධන කිරීම සඳහා නාවික හමුදා වෙබ් අඩවිය ඔස්සේ මෙන්ම සමාජ ජාලා ඔස්සේ පුද්ගලයින් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පාසල් මගින් නාවික හමුදා සේවයේ ඇති වැදගත් කම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇත.
32	ශාරීරික අභ්‍යාස, නීති,තොරතුරු තාක්ෂණ, වාදක, ඉංජිනේරු, සිවිල් ඉංජිනේරු, නිත්‍ය නාවික, විශේෂ ක්‍රමය යටතේ බඳවාගත් නාවික යන අංශයන්හී 2012 වර්ෂයේ සිට 2024 ජනවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුල ඇති වී තිබූ ඉංජිනේරු වෘත්තියේ නිලධාරීන් 68 ක්, ඉදිකිරීම් හා කාර්මික ක්ෂේත්‍රයට අදාල නාවිකයින් 3,896 ඇතුළුව විශේෂ කුසලතාවයන්ගෙන් යුත් නිලධාරීන් 90 කගේ සහ නාවිකයින් 4,103 කගේ පුරප්පාඩු දීර්ඝ කාලයක සිට පැවතුණි.	2023	කාර්යමණ්ඩල අවශ්‍යතා කාලීනව හා නිවැරදිව හඳුනාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම හෝ අවශ්‍ය නොවන්නේ නම් අනුමත සංඛ්‍යාව සංශෝධනය කරගත යුතු වීම.	සීමිත නාවික පුද්ගලයින් ප්‍රමාණයක් බඳවා ගැනීමට රජය විසින් අනුමැතිය ලබාදී තිබීම එක්වර විශාල පිරිසක් බඳවා ගැනීම තුලින් පුහුණු කටයුතු සිදුකරගෙන යාමේදී පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ ඊට සැලකිය යුතු කාලයක් අවශ්‍ය වීම යන කරුණු පැවතීම මත බඳවා ගැනීම සීමා වී ඇත.	අනුමත ප්‍රමාණයන්ගෙන් ප්‍රතිශතයන් ලෙස එක් එක් අංශයන් වෙත බඳවා ගැනීම තුලින් මෙම තත්වය වළක්වා ගැනීමට කටයුතු කරනු ලබයි.

26. ශීර්ෂය - 224 ශ්‍රී ලංකා ගුවන් හමුදාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	116,727,748,169	95,095,343	116,632,652,826	තත්ත්වාගණනය කළ
2022	117,014,063,684	84,091,084	116,929,972,600	තත්ත්වාගණනය කළ
2023	123,705,252,774	84,413,240	123,620,839,534	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්තරික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය 231 (1) අනුව හැකිතාක් දුරට වෙනත් ලේඛනයක් නොබලා හරි වැරදි බැලීමට හැකිවන පරිදි සියළු විස්තර ගෙවීම් වවුචරය තුල ඇතුලත් විය යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ අවස්ථා 21 කදී ගෙවා තිබුණු එකතුව රු.4,566,882 ක් සංග්‍රහ වියදම් වෙනුවෙන්, වැය ශීර්ෂ 224-1-2-1203 මගින් Officers' Mess වෙත ගෙවා තිබුණි.	2021	මුදල් රෙගුලාසි ප්‍රකාරව ගෙවීම් වවුචර් තුල ඇතුලත් විය යුතු සියළු විස්තර ඇතුලත් විය යුතු වීම.	ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සංග්‍රහ කටයුතු සිදු කිරීමේදී ආරක්ෂාව හා රහස්‍යභාවය වැනි හේතු මත මෙම තත්ත්වය පැවතුණි. 2021 අගෝස්තු සිට මෙම තත්වය නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.	2023 වර්ෂය වන විට ද මෙවැනි තත්වයන් නිරීක්ෂණය විය. නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
02	ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සරය සඳහා අදාල දේශීය/විදේශීය නිලධාරීන්ට හෝටල් නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් රු.5,256,425 ක් SLAF Command Welfare අරමුදලින් ගෙවා පසුව ගුවන් හමුදා වැය ශීර්ෂයෙන් නැවත ප්‍රතිපූර්ණය කර තිබුණි. මේ සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර නොතිබුණි.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නිශ්චිතව දක්වා ඇති විධි විධාන වලට අනුගත වී ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම සිදු කල යුතු වීම.	ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 70 වන සංවත්සරයට විදේශ නියෝජිතයන්ගේ පැමිණීම සනාථ කිරීම දින කිහිපයකට පෙර සිදුවීම, කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වීමට නොහැකි වීම, ණය පහසුකම් සහිත හෝටල් ලබාගැනීමට නොහැකි වීම, නවාතැන් පහසුකම් සැපයීමේදී ඔවුන්ගේ රුචි අරුචිකම්	2023 වර්ෂය වන විට ද මෙවැනි තත්වයන් නිරීක්ෂණය විය. නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

				සැලකිලිමත් වීම ආදි හේතුකොටගෙන ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත විය නොහැකි විය.	
03	කටුනායක ගුවන් හමුදා මූලික කදවුරට අදාලව නිලධාරි නිවාස 37 ක් මාස 02ත් - වර්ෂ 11 ත් අතර කාලයක සිට පදිංචියට නුසුදුසු තත්ත්වයේ අබලන්ව පැවතුණි. නිවාස අළුත්වැඩියා කර පදිංචිය වෙනුවෙන් ලබා නොදීමෙන් රජයට අයකර ගත හැකිව තිබුණු එකතුව රු.5,718,900 ක්වූ ගොඩනැගිලි කුලී ආදායම අහිමි වී පැවතුණි.	2021	ආයතනය විසින් අළුත්වැඩියා හා ප්‍රතිසංස්කරණ කල යුතු වත්කම් කාර්යක්ෂම ක්‍රමවේදයක් හරහා අළුත්වැඩියා කිරීමට කටයුතු කල යුතු වීම.	නිළධාරී නිවාස අලුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇති නමුත්,යෝජනා සඳහා අනුමැතීන් ලැබී නොමැත.	2023 වර්ෂය වන විට ද මෙවැනි තත්වයන් නිරීක්ෂණය විය. නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
04	මුදල් රෙගුලාසි 128 (1) (ආ) ප්‍රකාරව රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා සම්පූර්ණයෙන් අයකර ගැනීමට ගණන්දීමේ නිලධාරි කටයුතු කල යුතුය. එම නියමයන්ගෙන් බැහැරව කටුනායක ගුවන් හමුදා මූලික කදවුරේ සහ කොළඹ ගුවන් හමුදා කදවුරේ රජයේ ගොඩනැගිලි 15 ක් බාහිර පාර්ශවයන්ට ලබාදීමේදී. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පරිපාලන අධ්‍යක්ෂකගේ උපදෙස් ප්‍රකාරව ගිවිසුම් ගත වටිනාකමින් කොටසක් රජයේ ආදායම ලෙසත් ඉතිරි මුදල් රාජ්‍ය නොවන අරමුදල් (Non Public Fund) වෙතත් බැර කිරීමට කටයුතු කර තිබුණි. එබැවින් 2021 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුල එකතුව රු. 11,596,650 වූ ආදායමක් රජයට අහිමි වී තිබුණි.	2021	මුදල් රෙගුලාසි ප්‍රකාර රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට හා සම්පූර්ණයෙන් අයකර ගැනීමට ගණන් දීමේ නිළධාරී කටයුතු කල යුතුය.	ශ්‍රී ලංකා ගුවන් හමුදාව බාහිර පාර්ශවයන් වෙත කුලී පදනම මත ලබා දීමෙන් ලද ආදායම් රජයේ අරමුදලට බැරකර ඇත. තක්සේරු දෙපාර්තමේන්තුව නිකුත් කරන ලද තක්සේරු වාර්තාව අනුව කටයුතු කිරීම අදාල පාර්ශවයන් වෙත දැනුම් දී ඇත.	2023 වර්ෂය වන විට ද මෙවැනි තත්වයන් නිරීක්ෂණය විය. නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
05	2011 නොවැම්බර් 30 දිනැති අංක 852 දරණ ගුවන් හමුදා	2021	ශ්‍රී ලංකා ප්‍රජාතාන්තරික	අදහස් දක්වා නොතිබුණි.	2023 වර්ෂය වන විට ද

	නියෝගයේ අංක 5 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, විවිධ කඳවුරු හා ඒකක වල අභ්‍යන්තර අරමුදල් ආරම්භ කර තිබුණි. මෙම අරමුදල් වල මෙහෙයුම් කටයුතු සඳහා සහ අරමුදල් මගින් මෙහයවනු ලබන ලාභ උපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු භෞතික හා මානව සම්පත් උපයෝගී කරගෙන තිබුණි. මුදල් රෙගුලාසි 154 අනුව මෙම අභ්‍යන්තර අරමුදල්, ව්‍යවස්ථාපිත අරමුදල් වශයෙන් ස්ථාපනය නොකිරීම හේතුවෙන් ඒවායේ කටයුතු මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පාලනයට යටත් නොවී පැවති බවද තවදුරටත් නිරීක්ෂණය විය.		සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි සහ 2016 ජූනි 24 වන දින පැවැත්වූ රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමේ නියෝග ප්‍රකාර ලාභ උපයන ව්‍යාපෘති වල මෙහෙයුම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තු අධීක්ෂණ කටයුතු විධිමත් කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම අවශ්‍ය වේ.		මෙවැනි තත්වයන් නිරීක්ෂණය විය. නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
06	කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ඉන්ධන අංශයේ 2021 දෙසැම්බර් 06 දින ඉන්ධන තොග අයිතම් 04 ක භෞතික ශේෂය එදිනට පරිගණක මෘදුකාංග පද්ධතියේ (EPASS) පැවති ශේෂය සමග වටිනාකම රු.29,451,200 ක්වූ ඉන්ධන ලීටර් 222,944 ක ප්‍රමාණයකින් එනම් සියයට 48 සිට සියයට 1137 කින් පරිගණක පද්ධතියේ තොග ශේෂය අහිතකර ලෙස වැඩියෙන් දක්වා තිබුණි.	2021	පරිගණක පද්ධතියක් මගින් කටයුතු කිරීමේදී සියළුම දත්ත පරිගණකයට ඇතුලත් කර පද්ධතිය යාවත්කාලීන කල යුතුය.	ගුවන් යානා ඉන්ධන හා මෝටර්රථ ඉන්ධන නිකුත් කිරීම පරිගණක මෘදුකාංග පද්ධතිය මගින් දෛනිකව සිදු නොවන බැවින් මෙම වෙනස පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
07	ACA 6 ආකෘතිය ප්‍රකාර මූල්‍ය නොවන වත්කම් - 9152 ප්‍රවාහන උපකරණ හා යන්ත්‍රෝපකරණ වල හර සහ බැර වීම් වලට අදාල අගයන් භාණ්ඩාගාර ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ සමඟ පිළිවෙලින් රු.54,396,990 ක් සහ රු.87,423,189 කින්	2022	දෙපාර්තමේන්තු පොත් වල ගිණුම් ගත වීමට අදාල හර බැර ගිණුම් සාරාංශ මගින් භාණ්ඩාගාරය වෙත වාර්තා කරන බැවින් දෙපාර්තමේන්තු	ACA 6 ආකෘතියෙහි ඇතුළත් වන්නේ සිගාස් මගින් ජනනය කරන ලද මූල්‍ය නොවන වත්කම් වාර්තාව වේ. නමුත් භාණ්ඩාගාර ශේෂ පිරික්සුමේ හර හා බැර ශේෂ වල ඇතුළත්	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.

	නොසැසඳුනි.		හා භාණ්ඩාගාර ශේෂ පිරික්සුම වෙනසක් නොවිය යුතු බව.	වන්නේ වර්ෂයේ මූල්‍යමය ගණුදෙනු සහ ජර්නල් අගයන් පමණි.	
08	මු.රෙ.109 යටතේ ගුවන් යානා 03 ක අලාභහානි කපා හැරීමේදී අනුමත වටිනාකමට වඩා රු.85,255,268 ක් අඩුවෙන් කපා හැර තිබූ අතර තවත් ගුවන් යානාවක අලාභහානි පාඩු යටතේ කපා හැරීමේදී අනුමත වටිනාකමට වඩා රු. 14,772,702ක් වැඩියෙන් කපා හැර තිබුණි.	2022	හානි පාඩු නිවැරදිව හඳුනාගෙන අනුමැතිය ලබා ගැනීම හා කපා හැරීම කල යුතුය.	පරීක්ෂණ අධිකරණ මණ්ඩලයන් මඟින් සිදුවීම් 4ට අදාලව අලාභයන් වෙන් වෙන් වශයෙන් ගණනය කිරීමෙන් අනතුරුව පොත් වලින් කපාහැරීමට අවශ්‍ය අනුමැතිය ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් ලබාගෙන, වගකිව යුතු අංශයන් වෙත යොමු කර ඇත.	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.
09	රත්මලාන ගුවන් හමුදා මූලික කඳවුර තුල පවතින ගුවන් හමුදා කෞතුකාගාරයේ 2022 වර්ෂයේ ඉපයූ රු.21,303,078 ක ආදායමින් රජයට අභිමිවූ ආදායම රු.18,912,131 ක් විය.	2022	රජයේ වත්කම් උපයෝජනයෙන් උපයන ලද ආදායම රජයට මුළුමනින්ම බැර කල යුතු බව.	මුදල් අමාත්‍යාංශයෙන් ලැබෙන උපදෙස් පරිදි අභ්‍යන්තර අරමුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ගුවන් හමුදාව සැලසුම් කර තිබේ.	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.
10	රාජ්‍ය වියදම් පාලනය කිරීම වෙනුවෙන් 2022 අප්‍රේල් 26 දිනැති මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම්ගේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 3/2022 හි 02 ඡේදය ප්‍රකාර රාජ්‍ය වියදම් පාලනය කිරීමට සියළුම රාජ්‍ය ආයතනයන් දැඩිව ක්‍රියාමාර්ග ගත යුතු බව දන්වා ඇතත් විදේශ අධ්‍යයන චාරිකා හා පුහුණු වෙනුවෙන් වැය ශීර්ෂ 224-1-1-1102 යටතේ රු.8,342,043 ක් වූ වැය දරා තිබුණි. එමෙන්ම වැය ශීර්ෂ 224-1-1-2401 යටතේ විදේශ පුහුණු සංචාර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මැයි සිට අගෝස්තු දක්වා	2022	රාජ්‍ය වියදම් දැඩිව පාලනය කිරීමට චක්‍රලේඛය ප්‍රකාරව මෙන්ම රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් වූ කාලීන අවශ්‍යතාවයද සලකා වියදම් පාලනය කල යුතු බව .	අදාළ චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව 2022 මැයි මස සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුළ 224-1-1-0-1102 යටතේ ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් පසුව විදේශ ගමන් සඳහා රු.8,342,042 ක වැයක් දරා තිබුණි.	2023 වර්ෂය වන විටත් චක්‍රලේඛ නියමන්ට අනුකූල නොවීමේ අවස්ථා පැවතුණි.

	රු.31,246,205 ක් වැය කර තිබුණි.				
11	මුදල් රෙගුලාසි 128 (2) (එ) ප්‍රකාරව ්‍ංයේ ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරී විසින් , අවශ්‍යතැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව බදු ගාස්තු අයකිරීම් සමාලෝචනය කොට ඒවා ප්‍රතිශෝධනය කිරීමේ පියවර ගත යුතුය. නමුත් එයින් බැහැරව රත්මලාන මූලික කඳවුර තුල ගොඩනැඟිලි 04ක් බදු දීම වෙනුවෙන් අය වූ මුළු බදු කුලී ආදායම රු.1,511,000 කින් රු.161,200ක් පමණක් රජයට බැර කර තිබූ අතර මුළු එකතුව රු.1,349,200 ක් වූ ගොඩනැඟිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි.	2022	මුදල් රෙගුලාසි ප්‍රකාරව රජයේ ආදායම් පිළිබඳව ගණන්දීමේ නිලධාරී විසින් , අවශ්‍යතැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව බදු ගාස්තු අයකිරීම් සමාලෝචනය කොට ඒවා ප්‍රතිශෝධන කළ යුතු බව,සහ එම ආදායම් රජයේ ආදායමට ගතයුතු බව.	අවශ්‍ය උපදෙස් වගකිවයුතු අංශයන් වෙත ලබා දීමට කටයුතු කෙරේ. ආයතන අරමුදල මගින් කඳවුරු සේවා පුද්ගලයින්ගේ සුභසාධන කටයුතු සඳහා යෙදවීම සිදුකරනු ලබයි.	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.
12	මුදල් රෙගුලාසි 128 (2) (ඊ) අනුව රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් වූ විධිමත් විධිවිධාන යෙදිය යුතු බව ගණන් දීමේ නිළධාරීගේ වගකීම වුවත් එයින් බැහැරව ACA 6 ආකෘතිය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව එකතු වටිනාකම රු53,846,539,763 ක්වූ ගුවන් යානා 110 කින් ගුවන් යානා 66ක් වර්ෂ 1 සිට වර්ෂ 23 ක් දක්වා වූ දීර්ඝ කාලයක සිට මෙහෙයුම් කටයුතු වලින් බැහැරව පවතී.	2022	රජය සතු වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් වූ විධිමත් විධිවිධාන යෙදිය යුතු බව .	වර්ග 27 කට අයත් ගුවන් යානා 66 ක් දීර්ඝ කාලීනව අක්‍රීය වී ඇත.	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.
13	සාම සාධක හමුදාවට යැවීම සඳහා 2022 අප්‍රේල් 01 දින රු.මිලියන 41.9 ක් ගෙවා ලැන්ඩ්රෝවර් ඩිෆෙන්ඩර් ජීප් රථයක් මිලදීගෙන තිබුණි.	2022	අධික වැයක් දරා රජයට ලබාගත් වත්කම් නිෂ්කාර්ය නොකර අදාල අරමුණු වෙනුවෙන්	මෙම රථය මිලදීගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ වී ඇත්තේ 2020 වසරේදී වන අතර වාහනය	2023 වර්ෂය වන විට ගුවන් හමුදා විධායක රථවාහන සංචිතය යටතේ

	නමුත් 2023 මැයි 19 දින වන විටත් එම ජීප් රථය සාම සාධක හමුදාව වෙත යවා නොතිබුණි.		උපයෝජනයට යෙදවිය යුතු බව.රජයේ මුදල් වැය කිරීමේදී ඊට අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනයට අවශ්‍ය නිසි කටයුතු සිදු කල යුතුය.	ඉල්ලුම් කරන විට සාම සාධක මෙහෙයුම් දෙකක් පැවතියද දැනට එක් මෙහෙයුමක් පමණක් පවතී. ඒ අනුව වාහනය සාම සාධක මෙහෙයුම සඳහා නොයවා දැනට ගුවන් හමුදා විධායක රථවාහන සංචිතය යටතේ ඇත .	ඇත.
14	ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතු පුහුණු ගුවන් යානා බලගනය වර්ධනය සඳහා 2018 ඔක්තොබර් 17 දින රු.මිලියන 946.32 ක් ගෙවා චීනයෙන් මිලදී ගන්නා ලද ප්‍රාථමික පුහුණු ගුවන්යානා 06 කින් එකක් 2020 දෙසැම්බර් 15 දින අනතුරට ලක්වී සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.මිලදී ගන්නා ලද ඉතිරි ගුවන් යානා 05 ද එන්ජින් පිරිවැඩියාව ප්‍රමාද වීම හේතුවෙන් වසර 2කට අධික කාලයක් තිස්සේ පුහුණු කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. ඒ අනුව දරණ ලද මුළු වියදම අනාර්ථික වියදමක් වී තිබුණි.	2022	මෙම ගුවන් යානා ඒන්ජින් වල පියාසර පැය ගණන අවසන් වන විට ඒ සඳහා යොදනු ලබන ඒන්ජින් සූදානම් කර තැබිය යුතුයි	PT - 6 ගුවන් යානාවන්වල එන්ජිමේ පියාසර ආයු කාලය පැය 600 කි. නමුත් මේවන විට සියලුම එන්ජින් උපයෝජනයෙන් බැහැරව පවතී. මෙම එන්ජින්වල පිරිවැඩියා (Overhaul) කටයුතු ප්‍රමාද වීම හේතු කොටගෙන මෙම තත්වය හටගෙන ඇත.	2023 වර්ෂයේදීද මෙවැනි අනාර්ථික වියදමක් දරා තිබුණි.
15	සමාලෝචිතවර්ෂයේ "මෙත් සෙවන" සහ "අපි වෙනුවෙන් අපි" නිවාස ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයෙන් රු .36,572,648ක් රජයේ ගිණුම් වලින් බැහැර වූ ගුවන් හමුදාවේ මධ්‍යම සුභසාධන හා පුනරුත්ථාපන අරමුදල (ලංකා බැංකුව ගි.අ.716731) වෙත බැර කරවාගෙන පසුව ඊට අදාල ප්‍රතිලාභීන්	2022	රජයේ මුදල් රජයේ ගිණුම් වලින් බැහැරව වෙනත් රාජ්‍ය නොවන ගිණුම් මගින් ගෙවීම් වෙනුවෙන් යොදවා නොගත යුතු බව සහ එම වැය රජයේ ගිණුම් වලින් බැහැර වීම හේතුවෙන් විගණනයට ලක් නොවීම, රාජ්‍ය	සියලු මුදල් අදාල ප්‍රතිලාභීන්ගේ ගිණුම් වෙත ප්‍රේෂණය කිරීමේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ CW&RF යන සුභසාධක අරමුදල යොදා ගන්නා අතර මෙම අරමුදල සුභසාධන කටයුතු සඳහා භාවිතා කරනු ලබන ගිණුමකි.	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.

	වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.		මුදල් වැය කිරීම මුදල් රෙගුලාසි වලට අදාලව සිදු විය යුතු වීම.		
16	2021 මැයි 21 සිට අගෝස්තු 19 දක්වා කාලය තුල "X Press Pearl" නෞකාවේ අනතුර මැඩපැවැත්වීම සඳහ දායකත්වය ශ්‍රී ලංකා ගුවන් හමුදාව ලබා දීම වෙනුවෙන් ඇ.එ.ජ.ඩො 2,875,136.55 ක වන්දි මුදලක් ප්‍රතිපූර්ණය විය යුතුව පැවති අතර ඒ තුල ඇතුලත් ඇ.එ.ජ.ඩො 1,149,500 ක් වූ අවදානම් දීමනාව ලබා ගැනීමට අවශ්‍ය වැඩිදුර සාක්ෂි ගුවන් හමුදාව විසින් ඉදිරිපත් නොකිරිම හේතුවෙන් අදාල වන්දි ගෙවන පාර්ශව එය ගෙවීම ප්‍රතික්ෂේප කල බැවින් එම මුළු මුදලම රජයට අහිමි වී පැවතුණි.	2022	වන්දි ප්‍රදානයට අදාල අවධානම් දීමනාව ලබා ගැනීම වෙනුවෙන් විධිමත් සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් රජයට විශාල මුදලක් අහිමි වන නිසා විධිමත් සාක්ෂි ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ඉදිරිපත් කල යුතු වීම.	ගුවන් හමුදාව විසින් ඉල්ලා සිටි අවදානම් දීමනාව ගෙවීමට අදාළ නැව් රක්ෂණ සමාගම විසින් සිය අකමැත්ත පළකොට ඇත. නීතිමය පියවර ගැනිමට කරුණු සම්පාදනය කරමින් පවතී.	2023 වර්ෂය වන විට නිවැරදි වී නොමැත.
17	සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් හමුදාවේ අධිකාරීලත් නිලධාරීන් අනුමත සංඛ්‍යාව 2557 ක් වූ අතර ඉන් පුරප්පාඩු 464 ක් පැවතුණි. අධිකාරි නොලත් (සෙසු නිලයන්) නිලධාරීන් අනුමත සංඛ්‍යාව 34,381 ක්වූ අතර ඉන් පුරප්පාඩු 5324 ක් විය. 2022 දෙසැම්බර් 31 දින වන විට සිවිල් කාර්ය මණ්ඩලයේ (ජ්‍යෙෂ්ඨ /තෘතිය/ ද්විතිය /ප්‍රාථමික) අනුමත සේවක සංඛ්‍යාව 3057 කින් පුරප්පාඩු 769 ක් පැවතුණි.	2022	පුරප්පාඩු පිරවීමට හෝ තත්‍ය කාර්ය මණ්ඩලයට ගැලපෙන ලෙස අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කර ගැනීමට කටයුතු කල යුතු වීම.	මෙම පුරප්පාඩු මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමෙන් අනතුරුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.	බඳවා ගැනීම් සීමා කිරීමට රජය විසින් තීරණය කිරීම හේතුවෙන් පුරප්පාඩු පවතී.
18	2022 වර්ෂය තුළදී ඕස්ට්‍රේලියානු රජය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට ලබාදුන් වටිනාකම රු.28,727,120 ක් වූ ගුවන්	2023	ඉකුත් වර්ෂයේ විදේශ ප්‍රධාන යටතේ ලද ඉන්ධන එම වර්ෂයේ වියදමක්	2022 වර්ෂයේ හා 2023 වර්ෂයේදී ඕස්ට්‍රේලියානු රජය මගින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ B - 200	2022 වර්ෂයේ ලද ඉන්ධන 2023 වර්ෂයේදී ගිණුම්ගත

	යානා ඉන්ධන ලීටර් 77,000 වැය විෂය 224-1-1-1202-3 යටතේ ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ප්‍රවර්තන වර්ෂයේ ඉන්ධන වියදම 28,727,120 කින් වැඩියෙන් දක්වා තිබුණි.		සේ ගිණුම්ගත කළ යුතු බව.	ගුවන්යානාව පැදවීම සඳහා ලබාදුන් ඉන්ධන ලීටර් 202,0ක ප්‍රමාණයක් විදේශ ප්‍රදානයක් වශයෙන් 2023 වර්ෂයේදී ගිණුම්ගත කිරීම සිදු කරන ලදී.	කිරීම සිදු කර ඇත.
19	සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ඒ.සී.ඒ.6 - මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය තුළින් ගිලන් රථ 04 ක්, ගිනි නිවීම් රථ 14 ක් , සංඥා රථ (**Radar Vehicle**) 03 ක් , ජීප් රථයක් ,ට්‍රක් රථයක් හා **GPU** රථයක් ගිණුම් ගත කිරීම අත්හැරී තිබුණි.	2023	වර්ෂයට අදාළ නිවැරදි මූල්‍ය නොවන වත්කම් වටිනාකම ගිණුම්ගත කළ යුතු වීම.	මෙම වාහන පරිත්‍යාගයන් වන අතර ඒවායේ තක්සේරු කටයුතු සිදුකරමින් පවතී.	තක්සේරු කටයුතු සිදුකරමින් පවතී.
20	ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 1 සහ 2 ප්‍රකාර රජයේ වැටුප් ලබන නිලධාරියෙකු රාජ්‍ය සේවයේ බැහැර වෙනත් ආයතනයන්හි කටයුතු වෙනුවෙන් යෙදවිය නොහැකි වුවද එම නියමයන්ගෙන් බැහැරව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හටයන් සිව් දෙනෙකු පෞද්ගලික ආයතනයක් වෙත මුදාහැර 2023 මාර්තු 01 දින සිට සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් රු.2,360,680 ක් වූ වැටුප් රජයෙන් ගෙවා තිබුණි. එසේම කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් හටයින් 31 ක් දින 01 සිට මාස 03 දක්වා වූ කාලයක් තම නිත්‍ය රාජකාරියෙන් බැහැරව වෙනත් බාහිර ආයතනයන්හි කටයුතු වලට යොදවා තිබුණි.	2023	නිලධාරීන් සේවයේ යෙදවීමේදී නීත්‍යානුකූලව කටයුතු කළ යුතු වීම.	මේ වන විට මෙම ගුවන් හටයින් සිව්දෙනා ගුවන් හමුදා මූලස්ථානය වෙත වාර්තා කර ඇත.සේවා පුද්ගලයින් ගුවන් හමුදාව වෙත පැවරෙන විශේෂ රාජකාරී සහ සමාජ සත්කාර කටයුතු සඳහා අනුයුක්ත කර ඇති බව දන්වා තිබුණි.	ගුවන් හටයින් සිව්දෙනා ගුවන් හමුදා මූලස්ථානය වෙත වාර්තා කර ඇත.
21	මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව, ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම්	2023	ආදායම් ගණන් දීමේ නිලධාරී විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ	මෙම හිඟ හිට් ආදායම් කපා හැරීමට අනුමැතිය ඉල්ලා කැබිනට් සංදේශ යොමු කිරීමට	මෙම හිඟ හිට් ආදායම් කපා හැරීමට අනුමැතිය ඉල්ලා කැබිනට්

	අප්‍රමාදව එකතු කර ගැනිම සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සමාලෝචිත වර්ෂය අවසන් වන විට රාජ්‍ය ආයතන 10 කින් හා පෞද්ගලික ආයතන 02 කින් ගුවන් යානා කුලී ආදායම් එකතුව රු.12,674,073 ක් වර්ෂ 05 ත් 20 ත් අතර කාල ප්‍රමාදයකින් යුතුව හිඟ හිටව පැවතුණි.		ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු බව.	තීරණය කර ඇත.	සංදේශ යොමු කිරීමට තීරණය කර ඇත.
22	මුදල් රෙගුලාසි 128 (2) (එ) ප්‍රකාරව ,රජයේ ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය තැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව කලින් කල වරිපනම් හා අයකිරීම් හෝ බදු හා ගාස්තු ආදිය අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු වුවත් 2016 වර්ෂයෙන් පසු ගුවන් යානා ගොඩබෑමේ ගාස්තු සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි .ඒ අනුව ගුවන්යානා ගොඩබෑමේ ගාස්තු අයවීම් රු.120.75 ලෙස ඉතා අවම මුදලක් වූ අතර ගුවන් යානා ගොඩබෑමේ වාර 2009 ක් වෙනුවෙන් ලද ආදායම රු.236,221 ක ඉතා පහළ අගයක් විය.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව ,රජයේ ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරි විසින් අවශ්‍ය තැන්හි ආර්ථික ක්‍රමයේ හා වෙනත් තත්ත්වයන්ගේ වෙනස්වීම් ගැන සැලකිලිමත්ව ගාස්තු ආදී අයකිරීම් සමාලෝචනය කර ඒවා ප්‍රතිශෝධනය කිරීමට පියවර ගත යුතු වීම.	i.අදාළ ගාස්තු සංශෝධන ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ. ii.ගාස්තු සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇති බව දන්වා ඇත.	ගාස්තු සංශෝධනය න් සඳහා අනුමැතිය වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.
23	මුදල් රෙගුලාසි 128 (2) (එ) ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා ඒකල ගුවන් හමුදා කඳවුර තුල ගොඩනැගිලි 05 ක් බදු දීම සඳහා රජයේ අදායමට ගැනීමට එක් ගිවිසුමක් හා ව්‍යවස්ථාපිත නොවන අරමුදලකට ආදායම් ලබා ගැනීමට තවත් ගිවිසුමක් ලෙස එකම ගොඩනැගිල්ලට ගිවිසුම් දෙකක් වශයෙන්	2023	රජයේ ගොඩනැගිලි උපයෝජනයෙන් ලබන ඉපයීම් රජයේ ආදායමට බැරවිය යුතු වීම.	රජයේ පාර්ශවය වෙත ලැබෙන කුලී ආදායම රජයේ ගිණුම වෙත බැර කර සේවා ආයතන අරමුදල වෙනුවෙන් ලැබෙන කුලී ආදායම් මඟින් සුබසාධන කටයුතු, ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදුකරයි.	මෙවැනි තත්වයන් දිගින් දිගටම නිරීක්ෂණය වේ . නිර්දේශ ක්‍රියාත්මක නොවේ.

	ගිවිසුම් 10 ක් අත්සන් කර බදු කුලී අය කිරීම හේතුවෙන් එකතුව රු.2,037,400 ක් වූ ගොඩනැගිලි කුලී ආදායම් රජයට අහිමි වී තිබුණි.				
24	මු.රෙ.2.(1) (ඇ) ප්‍රකාර රජය සතු සියළුම ආදායම් හා ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතු වුවත් එයින් බැහැරව මෝටර් රථ හා යතුරු පැදි ධාවන තරඟ සඳහා පුහුණු වීමට කටුකුරුන්ද ගුවන් හමුදා කඳවුරෙහි ගුවන් පථය ලබාදීම වෙනුවෙන් 2022 සහ 2023 වර්ෂයේ රු.1,383,125 ක් ගුවන් හමුදාව විසින් උපයාගෙන ඒකාබද්ධ අරමුදලට බැර නොකර ව්‍යවස්ථාපිත නොවූ අරමුදලක් වන සේවා ආයතන අරමුදල වෙත බැර කර තිබුණි.	2023	රජයේ මානව හා භෞතික සම්පත් උපයෝජනයෙන් ලබන ඉපයීම් රජයේ ආදායමට බැරවිය යුතු වීම.	මෙම ගුවන් පථය නඩත්තු කිරීම සේවා ආයතන අරමුදල හරහා සිදු වේ. මේ සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැකසීම පිළිබඳ සාකච්ඡා සිදුවෙමින් පවතින බව දන්වා ඇත.	නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
25	විදේශ අධ්‍යනය , පුහුණුව, සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා විදේශගතවීමේදී අදාල කර ගත යුතු අංක MF/06/23/50/2023 දරණ සහ 2023 මාර්තු 20 දිනැති මුදල් අමාත්‍යාංශයේ නව චක්‍රලේඛයේ 02(1) ඡේදය අනුව එක් දිනකට ඇ.එ.ජ.ඩොලර් 40 ක්ව පැවති අනියම් දීමනාව ඇ.එ.ජ. ඩොලර් 25 දක්වා අඩුකර උපරිම දින 15 ලෙස සංශෝධනය කර තිබුණු නමුත් එම නියමයෙන් බැහැරව 2023 මාර්තු 20 දිනෙන් පසුවද විදේශ අධ්‍යයන පුහුණු සාකච්ඡා, සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ නිලධාරීන් දස දෙනෙකුට දිනකට ඇ.එ.ජ ඩොලර් 40 බැගින් ගෙවීම් කර තිබුණි.ඒ අනුව විදේශ ගමන් වියදම් වෙනුවෙන් ඇ.එ.ජ.ඩොලර් 6045 ක් එනම් රු.2,006,109 ක් චක්‍රෙල්ඛයට පටහැනිව	2023	චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු කල යුතු වීම.	ගුවන් හමුදා නිළධාරීන්ට එම අනියම් දීමනා ගෙවීම වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත.	චක්‍රලේඛ නියමයන්ට අනුකූලව කටයුතු සිදු නොවේ. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.

වැඩිපුර ගෙවා තිබුණි.

26	සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට නිළ ඇඳුම් මිළදී ගැනීම මෙන්ම වාහන අළුත්වැඩියා දැඩි අවශ්‍යතාවයක් පැවතියදීත් අදාළ වාර්ෂික ප්‍රතිපාදන 2023 නොවැම්බර් 30 දින වන විටත් වැය නොකර ඌන උපයෝජනය වීම හේතුවෙන් රු.3,064,000,000 ක පුනරාවර්තන ප්‍රතිපාදන සහ යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ වැය විෂය මගින් රු.5,491,127,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රතිපාදන අවුරා තබා ශ්‍රී ලංකා යුධ හමුදාවේ පුනරාවර්තන වැය විෂයක් වෙනුවෙන් ලබාදී තිබුණි.	2023	වාර්ෂික ප්‍රතිපාදන ඌන උපයෝජිත නොවිය යුතුය.	වාර්ෂික ටෙන්ඩර් කාලය දීර්ඝ කිරීම් නිර්දේශ නොකිරීම, භාණ්ඩ ආනයනය සීමා කිරීම, භාණ්ඩ වල මිල අධික වීම, පුනරාවර්තන වියදමෙන් සියයට 6 ක මුදලක් අවුරා තැබීම,සේවයේ යෙදී සිටි සක්‍රීය සේවක සංඛ්‍යාව පදනම් කරගෙන 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු පිළියෙල කරන අතර වෙනත් විවිධ හේතුන් මත ප්‍රතිපාදන වැය නොවී පැවතුණි.	විවිධ හේතුන් මත ප්රතිපාදන වැය නොවී පැවතුණි. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
27	මු.රෙ.94 (1) ප්‍රකාරව වැය විෂයක් වෙනුවෙන් වාර්ෂිකව දරණ ලද බැදීම් හා බැරකම් වල එකතුව කිසිදු අවස්ථාවක මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් එම නියමයෙන් බැහැරව 2023 වර්ෂයේදී වැය විෂය අංක 224-1-1-1401 - ප්‍රවාහන යටතේ රු.1,765,607 ක් වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී තිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්ෂිකව දරණ ලද බැදීම් හා බැරකම් වල එකතුව මුදල් වර්ෂය සඳහා වූ ප්‍රතිපාදන නොඉක්ම විය යුතුය.	1401 ප්‍රවාහන යටතේ ශුද්ධ ප්‍රතිපාදන රු.570,000,000 ක් වේ. ACA-2 (iii) ආකෘතියේ සම්පූර්ණ වියදම වශයෙන් 557,850,607 ක් වේ.ඒ අනුව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී නොමැත.	ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා එළඹී ඇත. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
28	සමාලෝචිත වර්ෂය තුළ ගෙවිය යුතු සියළු බැරකම් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම iii - බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට ඇතුලත් කල යුතු වුවත්, අවස්ථා 28 කට අදාල රු.20,121,111 ක් වටිනා බැරකම් සමාලෝචිත වර්ෂයේදී ඊට ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම ඉකුත්	2023	බැරකම් නිසි ලෙස ලේඛණගත කල යුතුය.	පිළිගත හැකි පිළිතුරක් ඉදිරිපත් වී නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක නොවේ.

	වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ බැරකම් ප්‍රකාශයට ඇතුළත් නොවූ අවස්ථා 10 කට අදාළ එකතු වටිනාකම රු.12,619,050 ක් වූ බැරකම් වෙනුවෙන් 2023 වර්ෂයේ දී ගෙවා තිබුණි.				
29	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් පරිදි ණය මුදල් ගෙවා අවසන් කිරීමට පෙර විශ්‍රාම ගිය/මියගිය/සේවය අවසන් වන නිලධාරීන්ගේ අත්තිකාරම් ණය ශේෂ අයකර ගත නොහැකි අවස්ථාවලදී ඇපකරුවන්ගෙන් හෝ උරුමක්කාරයින්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කල යුතු වුවත් එම නියමයන්ගෙන් බැහැර වීම නිසා මියගිය/විශ්‍රාම ගිය/වැඩ තහනම් කරන ලද /සේවය හැරගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට හිඟහිටි ණය ශේෂය රු.10,759,840 ක් විය. වර්ෂ 5 කට වැඩි කාලයක සිට හිඟ හිටි ණය ශේෂය රු.7,734,231 ක් විය.	2023	හිඟහිටි ණය අයකර ගැනීම සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් පරිදි කටයුතු කළ යුතුය.	විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂය 2024.04.30 දින වන විට රු.160,476.52ක් දක්වා අඩු කිරීමට කටයුතු කර ඇත. සේවය හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ හිටි ණය ශේෂයෙන් රු.455,126.69 ක මුදලක් අත්හැර දැමීම සඳහා ලද නිර්දේශ අනුව අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි.	නිර්දේශ අනුව අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතියි.
30	2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කළ යුතු වුවත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2023 අගෝස්තු , සැප්තැම්බර්, ඔක්තෝබර් මාස තුනට අදාලව නිලධාරීන් 100 කගේ නියැදියකින් රු.2,875,270 ක් වූ අය විය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) වෙනුවට රු.482,770 ක්	2023	2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනතට අදාළව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කල යුතු වීම.	දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව නිකුත් කරන ලද SEC/2023/E/01 මාර්ගෝපදේශයේ උපදෙස් මාලාවේ ඡේද අංක 3 හි කරුණු අංක 4 මඟින් දක්වා ඇති ආකාරයේ සියළු සේවා පුද්ගලයින්ට පොදුවේ විශේෂ සැලකිල්ලක් නොදැක්වීමේ	පොදුවේ විශේෂ සැලකිල්ලක් නොදැක්වීමේ පදනම මත ලබා දෙන දීමනා ආදායම් ප්‍රභවයන් 10 යටතේ සැලකිල්ලට නොගෙන අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT)

	පමණක් අයකරගෙන තිබුණි.ඒ අනුව රු.2,392,500 ක අත්තිකාරම් පුද්ගල ආදායම් බදු වටිනාකම රජයට අහිමි වී තිබුණි.			පදනම මත ලබා දෙන දීමනා ආදායම් ප්‍රභවයන් 10 යටතේ සැලකිල්ලට නොගෙන අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ගණනය කර ඇත.	ගණනය කර ඇත. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
31	ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කටුනායක මූලික කඳවුරේ පර්යේෂණ හා සංවර්ධන පක්ෂාංගයේ ව්‍යාපෘතියක් වන මෙට්ට ව්‍යාපෘතිය මගින් නිෂ්පාදනය කරනු ලබන මෙට්ට 1380ක් 2021 සිට 2024 පෙබරවාරි 09 දින දක්වා කාලය තුල රු.6,915,000 කට ප්‍රමිති සහතිකයක් මෙන්ම නිශ්චිත වගකීම් කාලයක්ද රහිතව කෘෂි අරමුදල ව්‍යාපෘතියෙන් (AGRO FUND) ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිලදී ගෙන තිබුණි.	2023	විධිමත් ප්‍රමිති සහතිකයක් සහ වගකීම් කාලයක් සහිතව භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කල යුතු වීම.	මෙහි ගුණාත්මක බව පරීක්ෂා කිරීම සඳහා වෙනම කමිටුවක්ද පත් කර ඇති අතර එම කමිටුව මගින් භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසු තොගයට ගැනීම සිදු කරයි.	කමිටුවක්ද පත් කර එම කමිටුව මගින් භාණ්ඩ පරීක්ෂා කිරීමෙන් පසු තොගයට ගැනීම සිදු කරයි. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
32	ශ්‍රී ලංකා ගුවන් හමුදාව හා පුද්ගලික සමාගමක් සමඟ රු.9,675,750 ක (වැට් රහිත) ගිවිසුම්ගත මුදලකට ඩිෆෙන්ඩර් රථ 03 ක් අළුත්වැඩියාවන් වෙනුවෙන් 2021 පෙබරවාරි 06 දින ගිවිසුම් ගත වී ඇතත් දින 673 ක කාල ප්‍රමාදයකින් අළුත්වැඩියාව සිදු නොකර ආපසු භාර දී තිබුණි. අදාළ ප්‍රසම්පාදනය ගුවන් හමුදාව අවලංගු කරවා තිබුණි. ප්‍රසම්පාදනයට අදාළව තාක්ෂණික ඇගයීම පරීක්ෂාවේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1. (අ) IV ප්‍රකාර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ හා	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ හා පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව තාක්ෂණික ඇගයීම් කමිටුව ක්‍රියා කල යුතුය.	විගණන ඡේදයේ සඳහන් පරිදි වාහන අළුත්වැඩියාවන් සිදුකිරීමේදී බාහිර ආයතන සඳහා තත්ව පරීක්ෂණය (facility audit) සිදුකරනු ලබන අතර මෙහිදී සිදුකරනු ලැබූ තත්ව පරීක්ෂණයෙන් Tech Net Auto World (Pvt) Ltd ආයතනයද තෝරාගෙන ඇත.	නිර්දේශ ක්‍රියාත්මක නොවේ.

	පිළිගත් ප්‍රසම්පාදන මූලධර්ම වලට අනුකූලව ක්‍රියා කරන බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තනි තනිව හා කමිටුව වගකිව යුතු වුවත්, එයින් බැහැරව අභ්‍යන්තර විගණන වාර්තාවක් පදනම් කර ගෙන ප්‍රසම්පාදන ප්‍රදානය සිදු කර තිබුණි. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුව නිසි වගකීමෙන් බැහැරවීම මත අදාළ ප්‍රසම්පාදනය අසාර්ථක වී පැවතුණි.				
33	ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ විංග් කමාන්ඩර් සහ ඉහල නිලධාරීන් රජයේ ආයතන වල වෙනත් තනතුරු වලට මුදා හැරීමේදී ඔවුන්ට වෙන්කල මාණ්ඩලික රථ ද අදාල ආයතන වෙත මුදා හැර තිබුණි.එවැනි නිලධාරීන් 29 ක් වෙනුවෙන් 2022 ජනවාරි 01 සිට 2022 සැප්තැම්බර් 30 දිනට ඉන්ධන ලීටර් 76,175 ක් සපයා තිබුණු අතර එම වාහන වෙනුවෙන් කුලිය රු. 10,800,000ක් ගෙවා තිබුණි. ඒ අනුව ගුවන් හමුදාවේ රාජකාරියෙන් පරිබාහිරව වෙනත් ආයතන වල රාජකාරී කටයුතු වෙනුවෙන් ගුවන් හමුදා වැය ශීර්ෂයෙන් රු.10,800,000 ක වියදම් දරා තිබුණි.	2023	අදාළ වාර්ෂික ප්‍රතිපාදන මගින් ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා වැය දැරීම සිදු කල යුතු අතර වෙනත් ආයතන වෙනුවෙන් වූ මෙහෙයුම් කටයුතු වලට වැය නොකල යුතුය.	අදාළ ආයතන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන ආයතන වේ. එම නිසා එම නිළධාරීන්ට හිමි මාණ්ඩලික රථ ඇතුළු අනෙක් වරප්‍රසාද ලබා දී ඇති බව දන්වා තිබුණි.	අදාළ ආයතන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබන ආයතන බැවින් වරප්‍රසාද ලබා දී ඇති බව දන්වා තිබුණි. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
34	මාසිකව රු.50,000 ක කුලී පදනම මත ලබා ගත් වාහන සඳහා මුදල් ගෙවීමේදී වවුචර් සමග අමුණා තිබුණු ඉන්වොයිසි වල කුලිය ගෙවීමට අදාලව ගෙවීම් සිදුකල වාහනයේ අත්‍යවශ්‍ය සාධකයක් වූ ගුවන් වාහන අංකය හෝ සිවිල් වාහන අංකය යන දෙකම රහිතව වාහන 47 ක් වෙනුවෙන්	2023	ගෙවීම් වවුචරය හා ඊට අදාළ ලියවිලි වල නිවැරදි තොරතුරු ඇතුළත්ව ඇති බවට සනාථ කර ගැනීමෙන් පසු ගෙවීම් කළ යුතු වීම.	මේ පිළිබඳව ගෙවීම් සම්බන්ධ කරුණු ඇතුළත් කර බිල්පත් ඉදිරිපත් කිරීමට සැපයුම්කරුවන් දැනුවත් කර ඇත	විධිමත්ව බිල්පත් ඉදිරිපත් කිරීමට සැපයුම්කරුවන් දැනුවත් කර ඇත

	එකතු වටිනාකම රු.21,150,000 ක් ගෙවා තිබුණි.				
35	කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි යන්ත්‍ර ප්‍රවාහන අළුත්වැඩියා කිරීමේ හා ප්‍රතිසංස්කරණය කිරීමේ පක්ෂාංගය වෙත 2011 ජුනි 23 සිට අළුත්වැඩියාවන් වෙනුවෙන් වාහන 105 ක් ලබා දී තිබූ අතර නිසි සැලසුමකින් යුක්තව අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 01 සිට වර්ෂ 12 ක කාලයක් නිෂ්කාර්යව ඌණ උපයෝජිතව පැවතුණි.	2023	අළුත්වැඩියා කටයුතු කඩිනමින් අවසන් කර වාහන උපයෝජනයට ගත යුතුය.	ඉහත විමසුමෙහි සඳහන් වාහන 105න් 31ක් සඳහා පිරිවැය අධික වීම හේතුවෙන් අපහරණය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඉතිරි වාහන 74 සඳහා වාහන ප්‍රතිස්ථාපනය සඳහා කාර්තු (Recovery plan) ලෙස සැලසුම් සකස් කරමින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි.	අපහරණය සඳහා වාහන 31 ක් යොමු කර ඇත.වාහන 74 ක Recovery plan ලෙස සැලසුම් සකස් කරමින් අලුත්වැඩියා කටයුතු සිදු කරනු ලබයි.
36	කටුනායක ගුවන් හමුදා කඳවුරෙහි සැපයුම් හා නඩත්තු පක්ෂාංගය තුල පවතින ගබඩා සඳහා ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේදී රු.1,346,000 ක් සහ 2023 වර්ෂයේදී රු.3,841,860 ක් ලෙස එකතුව රු.5,187,860 ක් වැය කර උපකරණ මිලදී ගෙන තිබුණු අතර 2024 පෙබරවාරි 09 දින වන විටත් අදාළ ගිනි නිවීමේ පද්ධතියක් ස්ථාපිත නොවීම හේතුවෙන් අවදානමක් පැවති අතර එම භාණ්ඩ ගබඩා තුල නිෂ්කාර්යව පැවතුණි.	2023	භාණ්ඩ නිෂ්කාර්ය වීම නොවිය යුතුය.	අදියරයන් කිහිපයක් ඔස්සේ මේ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සිදු වන බැවින් මිළට ගත් භාණ්ඩ යොදාගෙන ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ඉතිරි ප්‍රතිපාදන ලැබිය යුතුය. 2024 වර්ෂය තුළදී ව්‍යාපෘතිය නිම කිරීම කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.	2024 වර්ෂය තුළදී ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු සම්පාදනය කර ඇත.
37	කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගබඩා අංශ 06 ක් තුල සෙමින් නිකුත් වන රු.5,574,656 ක් වටිනා භාණ්ඩ අයිතම 22,061 ක්, නිකුත් නොවී ගබඩා තුල පවතින රු.2,763,655 ක් වටිනා භාණ්ඩ අයිතම 12,946 ක් සහ අපහරණ මණ්ඩලය වෙත යොමු කරන	2023	ගබඩා පාලනය යටතේ භාණ්ඩ වෙනුවෙන් දරණ ලද වැය ඌණ උපයෝජිත නොවන සේ පවත්වාගෙන යා යුතුය.	සෙමින් නිකුත් වන භාණ්ඩ අයිතම ගුවන් හමුදා මූලස්ථානය මගින් ලබාදෙන අනුමැතීන්ට අදාළව ගබඩාවෙන් නිකුත් කිරීම් සිදුකරයි. (ii)නිකුත් නොවී පවතින භාණ්ඩ අයිතම පිළිබඳ තොරතුරු	අදාළ මණ්ඩල නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ.

	ලද රු.840,570 ක් වටිනා භාණ්ඩ අයිතම 633 ක් 2024 පෙබරවාරි 09 දිනට ගබඩා තුල පැවතුණි.			2023 තොග සත්‍යාපන මණ්ඩල නිර්දේශයන් අනුව ඉදිරි කටයුතු සිදු කෙරේ. (iii)අපහරණ මණ්ඩල වෙත යොමු කර ඇති භාණ්ඩ අයිතම සම්බන්ධව අපහරණ මණ්ඩල නිර්දේශයන් අනුව කටයුතු කරනු ලැබේ.	
38	2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අළුත්වැඩියාවන් සඳහා විදේශයන් වෙත යවන ලද අළුත්වැඩියා වටිනාකම ඇ.ඩො. 191,289.22 ක් වූ ගුවන් යානා අමතර කොටස් 27 ක් හා අගයන් වාර්තා නොවූ එහි සුන්බුන් අගය එකතුව ඇ.ඩො 63,000 ක් වූ ගුවන් යානා අමතර කොටස් 32 ක් විදේශයන් වෙත යවා වර්ෂ 09 -19 කාලයක් ගතවී තිබුණද 2024 පෙබරවාරි 09 දින වන විටත් ගුවන් හමුදාව වෙත ලැබී නොතිබුණි.	2023	පරීක්ෂණ අධිකරණ කටයුතු, ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමේ කටයුතු කඩිනමින් අවසන් කලයුතුය.	2004 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ලද ගුවන් යානා අමතර කොටස් අයිතම ගණන එකකි. මෙම තවදුරටත් ලැබිය යුතු අයිතම 33 ක් අපහරණ මණ්ඩල වෙත ද එක් අයිතමයක් පරීක්ෂණ අධිකරණයක් වෙත ද යොමු කිරීමට අපේක්ෂිතයි. ඉතිරි අයිතම 14 ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	අයිතම 33 ක් අපහරණ මණ්ඩල වෙත ද එක් අයිතමයක් පරීක්ෂණ අධිකරණයක් වෙත ද ඉතිරි අයිතම 14 ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
39	කටුනායක ගුවන් හමුදා මූලික කඳවුරේ ගුවන් යානා අමතර කොටස් පක්ෂාංගයේ 2020 වර්ෂයේ සිට 2024 පෙබරවාරි 09 දිනය දක්වා විදේශයන් වෙතින් නව මිලදි ගැනීම් හා අළුත්වැඩියාවන් අවසන් වීම් ලෙස ගෙන්වා ගෙන තිබූ ගුවන් යානා අමතර කොටස් 63 ක් විවිධ ගැටළු හේතුවෙන් අදාල පක්ශාංගය වෙත නිකුත් නොකර වර්ෂ 1-4 කාල ප්‍රමාදයකින් නිරෝධායනයන් (Quarantined Items) ලෙස රඳවාගෙන තිබුණි. ඒ අනුව එහි නිශ්චිත වටිනාකම සඳහන් අවස්ථා 09 ක් යටතේ මිලදීගෙන තිබූ වටිනාකම	2023	මිලදී ගනු ලබන ගුවන් යානා අමතර කොටස් ගබඩාව තුල නිෂ්කාර්යව රඳවා නොතබා ඉහල කාර්යක්ෂමතාවකින් යුතුව උපයෝජනය කළයුතු වීම.	2020 සිට 2024 කාලය තුළ විදේශයන් වෙතින් නව මිලදී ගැනීම් හා අළුත්වැඩියාවන් අවසන් වී ගෙන්වා තිබූ ගුවන් යානා අමතර කොටස් විවිධ ගැටලු හේතුවෙන් පක්ෂාංගය වෙත නිකුත් නොකර නිරෝධායන ගබඩාව (Quarantined stores) තුළ පවතී.	විවිධ ගැටලු හේතුවෙන් පක්ෂාංගය වෙත නිකුත් නොකර නිරෝධායන ගබඩාව (Quarantined stores) තුළ පවතී.

	යූරෝ 21,218.86 හා ඇ.ඩො.50,141 ක වටිනාකමකින් යුතු ගුවන් යානා අමතර කොටස් හා 2020 සිට 2023 දක්වා කාල සීමාව තුලදී අළුත්වැඩියාව අවසන් කරන ලද අවස්ථා 16 කට අදාලව එකතුව ඇ.ඩො. 527,550 ක් වූ ඉතා අධික වටිනාකමෙන් යුතු ගුවන් යානා අමතර කොටස් නිෂ්කාර්යව ගබඩාව තුල පැවතුණි.				
40	ගුවන් යානා අමතර කොටස් මිලදී ගැනීම යටතේ අවස්ථා 09 ක දී රේගු ගාස්තු ලෙස රු.65,752,943ක් වූ වියදමක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මේ සදහා දරා තිබූ නමුත් එම ගුවන් යානා අමතර කොටස් මුළුමණින්ම හෝ ඇණවුමේ කොටසක් වශයෙන් Quarantined Items ලෙස රඳවා තබා ගැනීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරණ ලද මෙම වියදම වර්ෂ 01ත් 4ත් අතර කාලයක් නිෂ්කාර්ය වී තිබුණි.	2023	මිලදී ගනු ලබන ගුවන් යානා අමතර කොටස් ගබඩාව තුල නිෂ්කාර්යව රඳවා නොගෙන උපරිම කාර්යක්ෂමතාව යෙන් යුතුව උපයෝජනය කළයුතු වීම.	පිළිතුරු ඉදිරිපත් කර නොමැත	නිරෝධායන ගබඩාව (Quarantined stores) තුළ පවතී.
41	ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් බැටරි නැවත ආරෝපණය කිරීම හා බැටරිය විශ්ලේෂණය කිරීම අරමුණින් බැටරි විශ්ලේෂක (Battery analyzer) 17 ක් හා ඊට අදාල adapter 108 ක් ඇ.ඩො. 105,717 වටිනාකමට Cadex Electronics inc ආයතනයෙන් 2022 මාර්තු 25 දින මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.3 ප්‍රකාර පිරිවැය ඇස්තමේන්තු උද්ධමනය වැනි සාධක හමුවේ වෙනස් වීම් වලට අදාලව පිරිවැය සංශෝධිතය අදාළ අධිකාරිත්වය අනුමත කළ	2023	ප්‍රසම්පාදන අගයන්ගේ වෙනස් වීම් වලට අදාළ අධිකාරියේ බලය ලබා ගත යුතු බව.	විදේශීය මිලදී ගැනීමක් වන අතර ඇමරිකානු ඩොලරයේ අගය වැඩි වීම නිසා 2022 අප්‍රේල් 18 වන දින රු. 35,609,286.00 වැය කර ඇත.	මෙවැනි තත්වයන් නිරීක්ෂණය වේ. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.

	යුතු වුවත් එයින් බැහැර වී තිබුණි.ඒ අනුව අධිකාරිත්වය විසින් අනුමත කල මුළු පිරිවැය 2021 නොවැම්බර් 26 දින වන විට රු.24,863,776 ක් වුවත් තත්‍ය වශයෙන්ම රු.35,609,286 ක් වූ වියදමක් ඒ වෙනුවෙන් දරා තිබුණි.				
42	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.3 ප්‍රකාර සීමිත ජාත්‍යන්තර ලංසු කැඳවීමේදී තරඟකරී මිල ගණන් ඉදිරිපත් කරනු ලබන බවට වගබලා ගන්නා විභව සැපයුම්කරුවන්ගේ ලංසු කැඳවිය යුතුය.යථෝක්ත ප්‍රසම්පාදනයට අදාළ ඒකක මිල ගණන් අන්තර්ජාලයෙන් ඒවා මිලදී ගත් ආයතනයේ වෙබ් පිටුවේ ඇ.ඩො.2630 ක් ලෙස මිල ප්‍රදර්ශණය වුවත් ප්‍රසම්පාදනය පැවරුමට අදාල එම ආයතනයෙන් ඒකක මිල ඇ.ඩො.5090 ක් වූ ඉතා අධික මිලක් විය. ඒ අනුව තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් මගින් මෙම ප්‍රසම්පාදනය සිදු නොකිරීම නිසාවෙන් එකතුව රු.14,051,520 ක්වූ ආසන්න මුදලක් රජයට අවාසිදායක වන අයුරින් වැය කර තිබුණි.	2023	වෙළඳපල මිල පිළිබඳව පරීක්ෂා කිරීමෙන් තොරව ප්‍රසම්පාදන කටයුතු සිදු නොවිය යුතුය.	අන්තර්ජාලයේ මිල ගණන් සඳහන් භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍ය තාක්ෂණික පිරිවිතරයන් සහ දත්තයන් ටෙන්ඩර් පටිපාටිය තුළින් ණය පදනම යටතේ මිලදී ගන්නා භාණ්ඩ හා සැසඳීමේ දී වෙනස් විය හැක.	මෙවැනි තත්වයන් නිරීක්ෂණය වේ. නිර්දේශ ක්‍රියාත්මක නොවේ.
43	බැටරි විශ්ලේෂණය හා Adapter සඳහා ඇ.ඩො.105,717 (රු.35,520,912 ක්) වූ අධික වැයක් දරා තිබූ නමුත් ඒවා උපයෝජනයට අදාළ ගුවන් හමුදාව සතු භාවිතා කරනු ලබන වෝර්කි ටෝර්කි ප්‍රමාණය 2594 ක් ද බැටරි ගණන 3282 ක් ද විය. නව බැටරි මිලදී ගත්තද සාමාන්‍ය ඒකක පිරිවැය රු.5000 කට අඩු අගයක්ව පැවතුණි.ඒ අනුව මිලදී ගැනීමේ අවශ්‍යතාවය ප්‍රමුඛගත කිරීමේදී ඉතාම සුළු	2023	වියදම් අනාර්ථික නොවිය යුතුය.	දීර්ඝ කාලීනව බැටරි සංරක්ෂණය කිරීම මෙන්ම බැටරි නව මිලදී ගැනීමකට නොයෑම මේ සඳහා අරමුණු කරගෙන ඇත.	මෙවැනි තත්වයන් නිරීක්ෂණය වේ. නිර්දේශ ක්‍රියාත්මක නොවේ .

	වටිනාකමකින් යුතු බැටරි විශ්ලේෂණය කිරීම සඳහා රු.35,520,912 වැයක් දරා තිබීම විගණනයේදී අනාර්ථික ගණුදෙනුවක් බව නිරීක්ෂණය විය.				
44	ශ්‍රී ලංකා ගුවන් හමුදා කටුකුරුන්ද කඳවුර තුළ 2001 වර්ෂයේ සිට ගිවිසුම් රහිතව ගුවන් මෙහෙයුම් කටයුතු සිදු කළ පුද්ගලික සමාගමක් 2020 අප්‍රේල් සිට 2021 මාර්තු දක්වා රු.420,453 ක් වූ හිඟ මුදල් ගෙවීම් නොකර 2021 මාර්තු 18 වන දින කඳවුරෙන් වත්කම් සියල්ල ඉවත් කර ගෙන තිබුණි.ඒ අනුව ගිවිසුම් රහිත වීම හේතුවෙන් අයවිය යුතු මුදල් අයකල නොහැකි වී තිබුණි.	2023	නීත්‍යානුකූලව ඇතිකර ගත යුතු ගිවිසුම් ප්‍රකාර කටයුතු කළ යුතු වීම.	අදාළ සමාගම ලිඛිත ගිවිසුමක් නොමැතිව පරිශ්‍රයේ රැඳී සිටින බවට නීති අධ්‍යක්ෂක දැනුවත් වූ පසු ඔවුන්ව ඉවත් කිරීමට කටයුතු කරන ලදී. හිඟ මුදලට අදාළව පැවති පරීක්ෂණ අධිකරණය මගින් එම මුදලින් රු.350,000ත් අඩු කර රු. 70,453.60ක් පමණක් අය විය යුතු බවට තීරණය කර ඇත. එම රු.70,453.60 ගෙවන ලෙසට අදාළ සමාගමට එන්තරවාසියක් යවා ඇත.	නිර්දේශ ක්‍රියාත්මක නොවේ.

27. ශීර්ෂය - 225 ශ්‍රී ලංකා පොලීසිය

	මුළු වත්කම් රු.	**මුළු වගකීම්** රු.	**ස්කන්ධය** රු.	**මතය**
2021	53,037,287,006	1,115,038,544	51,922,248,462	තත්ත්වාගණනය කළ
2022	58,965,870,786	276,710,899	58,689,159,887	තත්ත්වාගණනය කළ
2023	141,458,320,138	235,524,798	141,222,795,339	තත්ත්වාගණනය කළ

අනු අංකය	**විගණන නිරීක්ෂණ**	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියා මාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
01	2023නොවැම්බර් 30 දිනැති අංක 2023/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් පොලිස් කොට්ඨාශ වාර්තා ඒකාබද්ධකර ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙලකර පවත්වා ගෙනගොස් නොතිබුණි.	2023	සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම.	කොට්ඨාශ ඒකාබද්ධ කර වත්කම් ලේඛන නඩත්තු කිරීම සඳහා පොලිසියේ දේපළ කළමනාකරණ කොට්ඨාශය වෙත පවරා ඇති අතර, එමඟින් ඉදිරියේදී මෙම කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරන බව.	කොට්ඨාසය විසින් ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කරන බව.
02	2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබාදී තිබුණු පරිත්‍යාග මුදලින් ඉතිරිරු.11,503,192 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන පවතින අතර, ඒ සඳහා ඉදිරි වැඩපිළිවෙලක් ද නොවීය.	2023	අදාළ අරමුණ සඳහා ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු ය.	මෙම මුදල SAARC සමුළුවේදී තීරණයක් ලැබෙන තුරු රඳවා ගැනීමට සිදු වී ඇති බව.	මෙම මුදල් වැය කිරීම සම්බන්ධව ඉන්දියානු රජයේ උපදෙස් පරිදි ඉදිරි කරුණු සිදු කරනු ලබන බව
03	රථවාහන වැරදි සඳහාස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ ක්‍රමවේදයක් (Spot Fine Information System)	2023	රථවාහන වැරදි සඳහා යෝජිත ස්වයංක්‍රීයව දඩ මුදල් ගෙවීමේ	මේ වන විට මෙම කටයුතු සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව	මෙම ක්‍රමවේදය හා රියදුරන් සඳහා හීනවන ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා

	ස්ථාපිත කිරීම සඳහා 2014 වර්ෂයේ සිට සැලසුම් කරමින් පැවතියද මේ දක්වා අදාළ ක්‍රමය ස්ථාපිතව නොතිබුණි.		ක්‍රමවේදය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු ය.	සහ මූලික පිරිවිතර සකස් කිරීමේ කමිටුව වශයෙන් කමිටු 02 ක් නම් කර මෙහි වැඩකටයුතු සිදුකර ගෙන යන බව.	යෝජිත නව දත්ත පද්ධතිය සඳහා කැබිනට් අනුමැතිය යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය මූලිකත්වයෙන් සිදු කරනු ලබන බවසහ දැනට මෙම ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික අංශ සම්බන්ධිත ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව.
04	.“මහජනආරක්ෂාවහාසාමය පවත්වාගෙනයාම” හා “අපරාධ පාලනය හා වැළැක්වීම” ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන කාර්යයන් 02 ක් වන අතර 2021 සිට 2023 වර්ෂය දක්වා පිළිවෙලින් බරපතල තුවාල සිදු කිරීම හා මනුෂ්‍ය ඝාතනය යන බල අපරාධ 1375, 1482 සහ 2030 ක් ලෙස වාර්තා වී තිබුණි. මෙම බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම හා පාලනය කිරීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියා මාර්ග ගත යුතුව පැවතුණි.	2023	බරපතලතුවාලසිදුකිරීම හා මනුෂ්‍ය ඝාතනය යන බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම අවම කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු ය.	බල අපරාධ වාර්තා වර්ධනය වීම සම්බන්ධයෙන් පළාත භාර ජ්‍යෙ.නි. පොලිස්පතිවරු හා කොට්ඨාශ භාර නිලධාරීන් දැනුවත්කර බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස දන්වා ඇති බව.	බල අපරාධ වාර්තා වීම වර්ධනය වීම පාලනය කිරීම සඳහා, බස්නාහිර පළාත තුල හා දකුණු පළාත තුල අපරාධ මැඩලීම සඳහා පොලිස් කණ්ඩායම් යෙදවීම, අපරාධ සිදු කර පලා යන පුද්ගලයින් පසු පස හඹා ගොස් අත්අඩංගුවට ගැනීමේ මෙහෙයුම් සඳහා පොලිස් යතුරු පැදි කණ්ඩායම් 15ක්,ක්‍රියාත්මක කර ඇත, යුක්තිය මෙහෙයුම ක්‍රියාත්මක කිරීම, ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීම, ප්‍රජා පාදක ප්‍රතිකාර හා පුනුරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවීම,පොලිස් ස්ථානය වෙත පැමිණිල්ල ලද මුල් අවස්ථාවේදීම ඒ සඳහා නිසි ක්‍රියා මාර්ග ගන්නා ලෙස පොලිස් ස්ථාන දැනුවත් කර තිබීම, අපරාධ වැඩි ප්‍රවනතාවයකින් වාර්තා වන පළාත් හා

					කොට්ඨාස පිළිබඳව නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම ආදි ක්‍රියා මාර්ග ගෙන ඇති බව.
05	ගෙවල් බිඳීමේ බල අපරාධ වාර්තා වීම 2023 වර්ෂය වන විට 50% කින් වර්ධනය වී තිබුණු අතර විසඳීමේ ප්‍රගතිය සියයට 60 සිට සියයට 50 දක්වා අඩු වී තිබුණි. කොල්ලකෑම් විසඳීමේ ප්‍රගතිය සියයට 75 සිට සියයට 61 දක්වා අඩු වී තිබුණි.	2023	ගෙවල් බිඳීම හා කොල්ලකෑම යන බල අපරාධ විසඳීම කඩිනම් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු ය.	එම අපරාධයන් සම්බන්ධයෙන් සාක්ෂි හෙළිකර ගැනීම සඳහා ගත බල අපරාධ වාර්තා වීම වන කාලය අනුව විසඳීමේ ප්‍රතිශතයන් අඩුවෙන් පෙන්නුම්කර ඇති බව.	මෙම අපරාධ වාර්තා වීම වර්ධනය වීම පාලනය කිරීම සඳහා, යුක්තිය මෙහෙයුම ක්‍රියාත්මක කිරීම, ප්‍රජා පොලිස් සංකල්පය ක්‍රියාත්මක කිරීම, ප්‍රජා පාදක ප්‍රතිකාර හා පුනුරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටවීම, මෙම අපරාධ වැඩිපුර සිදුවන ප්‍රදේශයන් හඳුනා ගෙන එම ප්‍රදේශ වලට වැඩිපුර නිළධාරීන් සංඛ්‍යාවක් යොදවා මෙහෙයුම් සිදු කිරීමආදී ක්‍රියා මාර්ග ගෙන ඇති බව.
06	කණිෂ්ඨ ශ්‍රේණියේ නිලධාරීන්ගේ විවාහක නිල නිවාස ඉදිකිරීම, කොළඹ නාගරික රථ වාහන මූලස්ථානය ඉදිකිරීම, වැලිගම පොලිස් ස්ථානය ඉදිකිරීම සහ කොල්ලුපිටිය, කුරුඳුවත්ත, තිරුක්කෝවිල්, මල්ලාවි හා නාරාහේන්පිට පොලිස් ස්ථානවල වැඩ අවසන් කිරීම යන ව්‍යාපෘති 08 හි වර්තමාන ප්‍රගතිය මන්දගාමීව පැවතුණි.	2023	ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.	ඉහත ව්‍යාපෘති 08හි ප්‍රගතිය සියයට 55,79, 50, 80, 72, 60, 80 සහ 70 ක් බව.	වර්තමානය වන විට මෙම ව්‍යාපෘති 08 ප්‍රගතිය සියයට 50 සිට සියයට 80 දක්වා වන බව
07	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර සභාගත	කාර්යය සාධන වාර්තාව සමග ඉදිරිපත් කළ යුතු 2023 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව 2024.05.

	වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.			කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බව	30 දින මාවෙත ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවද ඇතුලත් කර 2023 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා පොලිසියේ කාර්යය සාධන වාර්තාව නියමිත පරිදි පාර්ලිමේන්තු සභා ගත කර ඇති බව.
08	ප්‍රසම්පාදන				
(අ)	2011 වර්ෂයේදී පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරින් සඳහා හිස්වැසුම් 75,000 ක් රු.93,455,119 කට සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනක්‍රියාවලියේදී සිය සැපයුම අවලංගු කිරීමට එරෙහිව සැපයුම්කරු බේරුම්කරණය වෙත ගොස් තිබුණු අතරසැපයුම්කරුගේ ගබඩා ගාස්තු, නීති ගාස්තු හා විනිමය අනුපාත වැඩිවීමේ අවාසියද ශ්‍රී ලංකා පොලීසිය දැරිය යුතු බවට සැපයුම්කරු ඉල්ලා තිබුණි.බේරුම්කරණයේදී 2017 ජනවාරි 21 දින ලබාදී තිබූ තීන්දුව වූ හිස්වැසුම් 75,000 සඳහා වූ මුදල සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ගෙවීම ද ශ්‍රී ලංකා පොලීසිය විසින් ප්‍රතික්ෂේප කරමින් අඛණ්ඩව අධිකරණ ක්‍රියාමාර්ගයක යෙදී තිබුණු අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවිධිමත්භාවය හා දීර්ඝ කාලයක් ගත වුවද,සමථකරණයකට නොපැමිණ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් දැරීමට වන පිරිවැය සඳහා වගකිවයුත්තන් හෝ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	මෙම ප්‍රසම්පාදන හා බේරුම්කරණ ක්‍රියාවලියේ අඩුපාඩු මත රජයට දැරීමට සිදුවන අමතර වියදම් සම්බන්ධයෙන් වගකිවයුත්තන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	වාණිජ මහාධිකරණ තීන්දුව ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් හිස් වැසුම් 60,000 ක් සඳහා සැපයුම්කාර ආයතනය වෙත ගෙවිය යුතු ඇමරිකානු ඩොලර් 414,000 ක මුදලින් සියයට 10 ක මුදල වන ඇමරිකානු ඩොලර් 41,400 ක මුදලක් 2022 මාර්තු 16 දින විදේශීය නියෝජිත ආයතනය වෙත ගෙවා ඇති අතර, ඉතිරි මුදල ගෙවීම සඳහා ණයවර ලිපි විවෘත කර ඇති බවත්, 2023 ජුනි 06 දින ශ්‍රී ලංකාව වෙත භාණ්ඩ ලැබීමට නියමිත බව.	මේ සඳහා බේරුම් කරනයේදී ලබාදී තිබූ තීන්දුව ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2021.02.09 දින ලබා දෙන ලද වානිජ මහා අධිකරන තීන්දුව ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් හිස් වැසුම් 60,000 ක් සඳහා සැපයුම් කාර ආයතනය වෙත රු.289,138,522.37 ක් ගෙවා ඇති බව.

(ආ)	හබරාදූව“නිල සෙවන” යෝජනා ක්‍රමයෙන් රු. මිලියන 729.6 කට නිවාස 192 ක් මිලදී ගැනීමට 2017 දෙසැම්බර් 29 දින ගිවිසුමකට එළඹ 2019 අප්‍රේල් 02 දින වන විට රු. මිලියන 500 ක අත්තිකාරම් ගෙවා තිබුණ ද 2024 අප්‍රේල් මාසය වන විටත් නිවාස පවරා ගැනීම් අවසන්ව නොතිබුණි.	2023	ගිවිසුම් ප්‍රකාරව නිවාස පවරා ගැනීම සිදුකළ යුතු ය.	2024.005.06 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක /24/0834/640/012 මගින් අනුමැතිය ලබා දී ඇත.ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබන බව.	මෙම ව්‍යාපෘතියෙන් නිවාස 192 ක් ශ්‍රී ලංකා පොලීසිය වෙත මිලදීගැනීම වෙනුවට රුපියල්මිලියන 3.8 බැගින් නිවාස ඒකක 128 ක් රුපියල් මිලියන 486.4 කට මිලදී ගැනීමටත් , ශ්‍රී ලංකා පොලීසිය සඳහා වෙන්කර ඇති ව්‍යාපෘතියේ ඊ නිවාස සංකීර්ණයේ නිවාස ඒකක 64 ක් නැවත එම සමාගම වෙත භාර දීමටත් ,මේ වන විට ගෙවීම් කර ඇති අත්තිකාරම් මුදල වන රුපියල් මිලියන 500 න් වැඩිපුර ගෙවා ඇති මුදල වන රුපියල් මිලියන 13.6 ක මුදල නැවත රජයට අයකර ගැනීමට අදාලව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.ඒ අනුව අදාල නිවාස පවරා ගැනීම සඳහා ගිවිසුම් සකස් කරමින් පවතින බව.
09	වත්කම් කළමනාකරණය				
(අ)	පහත සඳහන් ඉඩම් හා ගොඩනැගිලි ශ්‍රී ලංකා පොලීසියට පවරා ගැනීමේ කටයුතු 2017 වර්ෂයේ සිට ආරම්භකර තිබුණද, 2023 දෙසැම්බර් මාසය වන විටත් අවසන්ව නොතිබුණි.	2023			
(i)	පොලිස් අධ්‍යයන ආයතනයක් පිහිටුවීමට යෝජිත අක්කර 12 රූඩ් 01 පර්චස් 08 ක ප්‍රමාණයකින් යුත් මල්වානේ පිහිටි ඉඩම	2023	ඉඩම පවරා ගැනීම කඩිනමින් අවසන් කළ යුතුය.	මෙම ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් සඳහා යොමුකර ඇති බව.	ගරු අධිකරණයේ නියෝග පරිදි ප්‍රාදේශීය ලේකම් දොම්පෙ විසින් උක්ත ඉඩම රාජසන්තක කිරීමේ නියෝගය පිළිබඳ දත්ත නියමිත පත්‍රිකා වල ඇතුළත් කර ලියා පදිංචි

					කිරීමේ කටයුතු සිදු කල බව 2024.07.15දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති බව.
(ii)	පොලිස්අශ්වාරෝහක කොට්ඨාශය හා පොලිස් රණවිරු සුරැකුම් මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමට යෝජිත අක්කර 75 ක් වූ හොරණ ඇල්ලකන්ද වත්ත ඉඩම	2023	ඉඩම පවරා ගැනීම කඩිනමින් අවසන් කළ යුතුය.	මෙම ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් සඳහා මූලික පිඹුරක් ලබාගැනීමට මිනින්දෝරු අධිකාරිය වෙත දන්වා ඇති බව.	අත්කර ගැනීම සම්බන්ධයෙන්මූලික පිඹුර සකස් කරමින් පවතින බව ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි කළුතර සමග සිදු කරන ලද සාකච්ඡාවේ දී දැනුම් දී ඇති බව.
(ආ)	ඉංගිරියේ උසස් පුහුණුපොලිස් විද්‍යාලය සහ ඉංගිරිය පොලිස් ස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ රු. මිලිය 8.8 ක් වැයකර වැඩ ආරම්භකරඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි.	2023	ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතු ය.	අක්කර 04 රූඩ් 02 පර්චස් 07.2 ක් වූ මෙම ඉඩම ශ්‍රී ලංකා පොලිසිය වෙත ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් විසින් 2024.02.21 දින පවරාදී ඇති බව.	මෙම ඉඩම ශ්‍රී ලංකා පොලිසිය වෙත ප්‍රාදේශීය ලේකම් ඉංගිරිය විසින් 2024.02.21 දින පවරා දී ඇත.
(ඇ)	2016 දෙසැම්බර්රු. මිලියන 333 කට ගාල්ල, වැකුණගොඩ "නිල සෙවන" නිවාස ව්‍යාපෘතියෙන් මිලදී ගත් නිවාස 100 ට අදාළ පැවරුම් ඔප්පු 2024 මාර්තු මාසය වන විටත් ලබාගෙන නොතිබුණි.	2023	මිලදී ගැනීමට අදාළ පැවරුම් ඔප්පු කඩිනමින් ලබාගැනීමට කටයුතු කළ යුතුය.	පැවරුම් ඔප්පු සකස් කිරීම සඳහා සංශෝධනය කරන ලද ගිවිසුම් පත්‍රයක් සකස් කොට ඉදිරිපත් කරන ලෙස 2024.03.25 දින අදාළ ආයතනය දැනුවත්කර ඇත.	මෙම නිල නිවාස 100 සඳහා පැවරුම් ඔප්පු ය සහ සභාධිපත්‍ය සැලසුම් ලබා ගැනීමට අදාළවකටයුතු කරමින් පවතී .
(ඈ)	ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ අත්තිඩියේ පිහිටි පෙරසවි ගොඩනැගිලි 05 ක් සමඟ අක්කර 6 ක පමණ භූමි ප්‍රමාණයක් ශ්‍රී ලංකා යුධ හමුදාවේ භට පිරිස්වලට නවාතැන් ගැනීම සඳහා තාවකාලිකව පවරාදී වසර 05 ක් පමණ ගතවී ඇතත්, නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	භූමිය ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රයෝජනය සඳහා කඩිනමින් පවරා ගත යුතුය.	ජාතික පොලිස් අභ්‍යාස ආයතනයේ ඉදිරි පුහුණු කටයුතු සඳහා මෙම භූමිය යොදා ගැනීමට නියමිත බැවින් කඩිනමින් නැවත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටින බව.	යුධහමුදාව විසින් භුක්ති විඳිනු ලබන පෙරසවි ගොඩනැගිලි 05 ක් සහිත අක්කර 06 ක පමණ භූමිප්‍රමාණය 2024.08.12 සහ 13 දින නැවත ශ්‍රීලංකා පොලිසිය වෙත භාරදී ඇත.

(ඉ)	කටාන ජාතික පොලිස් විද්‍යාලයේ නේවාසික පහසුකම් ලබාදීම සඳහා වූ ගොඩනැගිල්ල ඉදිකිරීම් 2019 වර්ෂයේ ආරම්භ කර2023 අප්‍රේල් 26 දින ඉදිකිරීම් අත්හිටුවා තිබූ අතර, එදිනට ඉටුකර ඇති වැඩවල වටිනාකමරු. 97,290,003 ක් විය. ඒ අනුව රු.42,252,164 ක් නැවත අයවීමට තිබුණ ද, එය අයකර නොතිබුණි. ඊට අමතරව ගොඩනැගිල්ලේ අත්තිවාරමේ හා කොන්ක්‍රීට් තට්ටුවල (Slab) පිටතට නෙරා ඇති යකඩ කම්බි මල බැදී දිරාපත් වෙමින් පැවති අතර, වැඩබිමේ තිබූ රු.1,744,875 ක් පමණ වටිනා කම්බි තොගයක්ද මල බැදී දිරාපත් වෙමින් පැවතුණි.	2023	ව්‍යාපෘති ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	කොන්ත්‍රාත්තුව අවලංගු කිරීම අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් වී ඇති බැවින් වැඩ බිමේ ඇති ඉදිකිරීම් ද්‍රව්‍ය පිළිබඳව කටයුතු කළ නොහැකි තත්ත්වයක් ඇත.	පිරිමි නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් අත්හිටවා ඇති අතර කාර්යය සාධන ඇපකරය සහ අත්තිකාරම් ඇපකරය රාජසන්තක කිරීමට එරෙහිව ඉදිකිරීම් ආයතනය විසින් ගම්පොල දිසා අධිකරණයේ නඩු පවරා ඇත. ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් අවසන් කිරීම සඳහා රුපියල් මිලියන 1,013.98 ක සංශෝධිත ඇස්තමේන්තුව සඳහා අමාත්‍යමණ්ඩල අනුමැතිය ලැබී ඇත. එසේ වුවද පෙර කොන්ත්‍රාත් ආයතනය විසින් නඩු පැවරීම හේතුවෙන් නව ප්‍රසම්පාදනයක් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය නීතිමය අවසරය ලබාගැනීම සඳහා වන ඉල්ලීම නීතිපති වෙත 2024.08.24 දින යොමුකර ඇති බව.
(ඊ)	කටාන ජාතික පොලිස් විද්‍යාලයේ යෝජිත අධ්‍යාපන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමේ සැලසුම් දෝෂයක් හේතුවෙන් පඩිපෙළ සම්පූර්ණයෙන් කඩා ඉවත්කිරීමට සිදුව තිබූ අතර, ඒ සඳහා රු.687,181 ක් වැය වෙතැයි ඇස්තමේන්තුකර	2023	ව්‍යාපෘතිය නියමිත ලෙස සැලසුම්කිරීම මෙන්ම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම කළ යුතු ය.	සැලසුම් දෝෂයක් බැවින් මේ සඳහා දැරීමට සිදු වන අමතර වියදම් මෙහි සැලසුම් කටයුතු සිදු කරන ලද උපදේශක ආයතනයෙන් අය කරගැනීමට උපදේශන	පඩි පෙළ කඩා ඉවත් කර නව පඩි පෙළක් සකස් කර ඇති අතර ගොඩනැගිල්ලේ සියළු ඉදිකිරීම් මේ වන විට අවසන්කර ඇති බව.

	තිබුණි. මෙම තත්ත්වය මත ව්‍යාපෘතියට සිදුවන අමතර වියදම් හා ප්‍රමාදය පිළිබඳ වගකීම භාරගන්නා පාර්ශවය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.			ආයතනය එකඟ වූ අතර,එම ආයතනයෙන් අයකර ගැනීමට කටයුතු සිදුකර ඇති බව.	
(උ)	පොලිස් අභ්‍යාස අයතනයේ නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවනාගාරය සඳහා රු.6,547,992 ක් වැයකර 2021 දෙසැම්බර් 23 දින භාෂා පරිවර්තන පද්ධතියක් මිලට ගෙන ඇති නමුත්, 2023 දෙසැම්බර් මාසය වන විටත් මෙම භාෂා පරිවර්තන පද්ධතිය නිශ්කාර්යව පැවතුණි.	2023	වත්කම් මිලදීගත් අරමුණ වෙනුවෙන් යෙදවිය යුතු අතර, එම වත්කම් නිෂ්කාර්ය නොවීමට වගබලාගත යුතුය.	මෙම අයිතමයන් නව පරිපාලන ගොඩනැගිල්ලෙහි ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව සවි කරන තෙක් එම අයිතමයන් සුරක්ෂිතභාවය සඳහා ගබඩාවේ තැන්පත්කර ඇති බව.	පොලිස් අභ්‍යාස ආයතනයේ නව පරිපාලන ගොඩනැගිලෙහි සියළු ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇති අතරගොඩනැගිල්ල ශ්‍රී ලංකා පොලීසිය වෙත භාර ගැනීමෙන් අනතුරුව එම ගොඩනැගිල්ලේ ශ්‍රවනාගාරය සඳහා මිලදී ගෙන ඇති භාෂා පරිවර්ථන පද්ධතිය ස්ථාපිත කිරිමට කටයතු කරන බව
10	කළමනාකරණ දුර්වලතා				
(අ)	2018 සිට 2023 දක්වා වාර්ෂිකව වාහන වේග සීමා පරීක්ෂා කිරීමේ යන්ත්‍ර500 බැගින් ඉල්ලුම්කර තිබුණද, එයින් කොටසක් හෝ මිලදී ගෙන නොතිබුණි.	2023	අදාළ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන බව දන්වා ඇත.	ස්වයංක්‍රීය වේග මාපක 80ක් මිලදී ගැනීම සඳහා රු.මි. 266 ක ප්‍රසම්පාදනයක් 2024 වර්ෂයේ ආරම්භ කර ඇති බව.
(ආ)	ශ්‍රී ලංකා පොලීසිය මගින් අධිකරණ වෙත යොමු කෙරෙන අපරාධ හෝ වැරදිවලට අදාළව තවදුරටත් පවත්වාගෙන යන අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු, තීන්දු ලබාදුන් නඩු පිළිබඳ විස්තර, බහා තැබීම් හෝ නිශ්ප්‍රභාවීම් වූ නඩු හා සැකකරුවන් වරදකරුවන් වූ හෝ සැකකරුවන් නිදහස් වූ යනාදී වශයෙන් විස්තර ඇතුළත් යාවත්කාලීන	2023	අධිකරණ කටයුතු සම්බන්ධ තොරතුරු ඇතුළත් යාවත්කාලීන තොරතුරු පද්ධතියක් පවත්වාගත යුතුය.	අපරාධ විමර්ශන හා පරිපාලනය සඳහා ප්‍රධාන වශයෙන් පරිගණක වැඩසටහන් 20 ක් පවතින අතර ඒකාබද්ධ පරිගණක තොරතුරු පද්ධතියක් සකස් කිරීමෙන් පසුව යාවත්කාලීන තොරතුරු	අපරාධ බුද්ධි තොරතුරු විශ්ලේෂණ පරිගණක පද්ධතියේ (C.I.A.S.) ගැටළු හඳුනාගෙන ඇති අතර එම ගැටළු නිරාකරනය කරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා බව

	තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය කාර්යසාධනය සමාලෝචනයේදී වැදගත් වන නමුත් එවැනි පද්ධතියක් පවතින බව සනාථ නොවී ය.			පද්ධතියක් පවත්වා ගැනීමට හැකි වනු ඇති බව.	
(ඇ)	ගම්පහ පොලිස් කොට්ඨාශයට අයත් නිලධාරියෙක් චෝදනාවට ලක්වීම මත 2018 අප්‍රේල් 18 දින සිට වැඩ තහනමට ලක්ව තිබූ අතර, එම නිලධාරියාට 2018 සැප්තැම්බර් මස සිට 2022 ජනවාරි දක්වා රු.3,251,000 ක් අඩ වැටුප් ලෙස ගෙවා තිබුණි. 2022 ඔක්තෝබර් මස මෙම නිලධාරියා අදාළ චෝදනාවට අධිකරණයෙන් වරදකරු වීම මත ගෙවන ලද අඩවැටුප් වටිනාකම අයකර ගැනීමට නොහැකිව තිබූ අතර, අඩ වැටුප් ගෙවීමට ගනු ලැබූ තීරණයේ නිවැරදිතාවය පිළිබඳව ද ගැටළු පැවතුණි.	2023	අධිකරණ තීන්දු ලබා දෙන තුරු ගෙවීම් සිදු නොකළ යුතු ය.	මුදල ආපසු ගෙවන ලෙස අධ්‍යක්ෂ නීති කොට්ඨාශයේ අංක L3/B/04/2022/OW /11/94/2023 හා 2023.10.04 දිනැති ලිපිය මගින් අදාළ නිලධාරියා දැනුවත් කර ඇති අතර,එසේ නොගෙවන්නේ නම් නඩු පැවරීමට කටයුතු කරන බව.	වැඩ තහනමට ලක්ව සිටියදී අඩවැටුප් ගෙවීම සම්බන්ධයෙන් උපදෙස් පතා උද්‍ෂත ගොණු ගරු නීතිපති වෙත යොමු කර ඇති බව.
(ඈ)	ප්‍රභූ ආරක්ෂාව සැලසීමට අදාළ පොලිස්පතිගේ 2020 සැප්තැම්බර් 30 දිනැති අංක 2687/2020 දරන චක්‍රලේඛයට පරිබාහිරව ප්‍රභූන් වෙත අනුමත සීමාව ඉක්මවා ප්‍රභූ ආරක්ෂකයින් අනුයුක්ත කර සිටි අතර ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශය යටතේ ඇති පොලිස් කොට්ඨාශ 09 ක් සඳහා 2022 ජනවාරි 01 දිනට 3884 ක් වූ නිලධාරීන්2023 සැප්තැම්බර් 30 දින වන විට 4,859 ක් දක්වා වැඩිකර තිබුණි. 2018 – 2022 කාලපරිච්ඡේදයේ ප්‍රභූ ආරක්ෂක කොට්ඨාශයේ වාර්ෂික සාමාන්‍ය වියදම	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු සිදුකර වියදම් පිරිමැසුම්දායකව න අයුරින් කටයුතු කළ යුතුය.	ප්‍රභූවරුන්ගේ ආරක්ෂාව ඉවත් කිරීම සම්බන්ධවඅවස්ථා නුකූලව විමසීම් කර ඇතත්,ප්‍රභූ ආරක්ෂාව සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමේ කමිටුව මගින් ඒ සඳහා නිසි අනුමැතියක් ලැබී නොතිබීම මත විවිධ තැනැත්තන් සඳහා ප්‍රභූ ආරක්ෂකයන් වසර ගණනාවක් අඛණ්ඩව අනුයුක්තකර තිබීම	2024 දෙසැම්බර් මාසය වන විට ප්‍රභූ ආරක්ෂාව සැලසීමට අදාල විශේෂ ආරක්ෂක දිසාව යටතේ පවතින කොට්ඨාස වලට අනුයුක්ත නිලධාරීන් සංඛ්‍යාව 1939 දක්වා අඩු කිරීමට ක්‍රියා කර ඇති බව.

	රු.මිලියන 4,342 ක් වුවද, 2023 වර්ෂයේදී එම වියදම රු. මිලියන 5,833 දක්වා වැඩිවී තිබුණි.			සිදුව ඇති බව.	
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිලධාරීන් 2,458 ක ගෙන් අයවිය යුතු ශේෂවල එකතුව රු.60,874,303 ක් වූ අතර, එම ණයශේෂ තුළ වර්ෂ 05 ට වැඩි නිලධාරීන් 1,590 කගේ හිඟහිටි ණයශේෂවල එකතුව රු.41,743,898 ක් විය.	2023	හිඟහිටි ණය ශේෂයන් අයකර ගැනිමට කටයුතු කළ යුතු ය.	වර්ෂ 5ට වැඩි හිඟහිටි ණය ශේෂයෙන් රු.623,733 ක් 2024 පළමු කාර්තුව තුළ අය කිරීමට කටයුතු කර ඇති බව.	2024.06.30 දින වන විට මෙම මුදලින් රු.1,507,474ක මුදලක් අය කර ගැනීමට ක්‍රියා කර ඇති අතර තව දුරටත් අය විය යුතු ශේෂය වන රු.40,236,423කි.
(ඊ)	2022 වර්ෂයේදී ප්‍රජා පොලිස් ඒකකය පැවැත්විය යුතු උපදේශක සභා රැස්වීම් 7,224 කින්රැස්වීම් 4,620 ක්ද, 2023 වර්ෂයේදී පැවැත්විය යුතු රැස්වීම් සංඛ්‍යාව 6,020 කින් රැස්වීම් 3,848 ක් පමණක් පවත්වා තිබුණි.	2023	වර්ෂයේදී සැලසුම් කළ පරිදි ප්‍රජා පොලිස් උපදේශක සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය.	පොලිස්පති චක්‍රලේඛ 2758/2023 නමින් නව චක්‍රලේඛයක් නිකුත් කිරීමත්, ප්‍රජා පොලිස් ඒකක සඳහා පත්කර ඇති නිලධාරීන් ඒ සඳහා පූර්ණ කාලීනව යෙදවීමට අවශ්‍ය කටයුතු කිරීමත් මගින් ප්‍රජා පොලිස් කමිටු ශක්තිමත් කිරීමට කටයුතුකර ඇති බව.	ග්‍රාම නිළධාරි වසම් 14022 ක් ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ප්‍රජා පොලිස් කමිටු සදහා පොලිස් නිලධාරීන් පූර්ණකාලීනව යෙදවීමට කටයුතු කර ඇති බව.
(උ)	ප්‍රජා පොලිස් ස්ථානීය මහජන ආරක්ෂක කමිටු 2022 හා 2023 වර්ෂවලදී පිළිවෙලින් 7,224 ක් හා 6,020 ක් පැවැත්විය යුතු වුවත්, 4,523 ක් හා 3,847 ක් පමණක් පවත්වා තිබුණි.	2023	වර්ෂයේදී සැලසුම් කළ පරිදි ප්‍රජා පොලිස් උපදේශක සභා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය.	පොලිස්පති චක්‍රලේඛ 2758/2023 නමින් නව චක්‍රලේඛයක් නිකුත් කිරීමත්, ප්‍රජා පොලිස් ඒකක සඳහා පත්කර ඇති නිලධාරීන් ඒ සඳහා පූර්ණ කාලීනව යෙදවීමට අවශ්‍ය කටයුතු කිරීමත්	ග්‍රාම නිළධාරි වසම් 14022 ක් ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ප්‍රජා පොලිස් කමිටු සදහා පොලිස් නිලධාරීන් පූර්ණකාලීනව යෙදවීමට කටයුතු කර ඇති බව.

				මගින් ප්‍රජා පොලිස් කමිටු ශක්තිමත් කිරීමට කටයුතු කර ඇති බව.	
(ඌ)	1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය කිරීම සඳහා 2014 නොවැම්බර් 19 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලැබී තිබුණ ද, 2024 අප්‍රේල් මාසය වන විටත් පනත සංශෝධනය කර නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 1865 අංක 16 දරන පොලිස් ආඥා පනත සංශෝධනය සිදුකළ යුතු ය.	නීති කෙටුම්පත් සම්පාදකවිසින් පොලිසියේ නිරීක්ෂණ ලබාගැනීමෙන් පසු අවසන් කෙටුම්පත සකස්කර අවසන්ව ඇති බව.	පොලිස් ආඥා පනත සංශෝධනය සම්බන්ධයෙන් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව සමග නැවත සාකච්ඡා කර සංශෝධිත අමාත්‍ය මන්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරණ බව.
(එ)	2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථවාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීමේ ක්‍රමය 2019 ජූනි 20 දින සිට ක්‍රියාත්මක වන නමුත් රථවාහන වැරදි සම්බන්ධයෙන් වරදකරුවන් එකම වරද සිදු කරන වාර ගණන පැහැදිලිව හඳුනාගත හැකි පරිදි තොරතුරු පද්ධතියක් ශ්‍රී ලංකා පොලීසිය ක්‍රියාත්මක නොකිරීම නිසා එකම වරද කිහිප අවස්ථාවක් සිදු කරන වරදකරුවන්ගෙන් නිවැරදි දඩ මුදල අය කරගැනීමට නොහැකි වී තිබුණි.	2023	2019 අංක 10 දරන මෝටර් වාහන (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් මෝටර් රථවාහන වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුය.	ස්වයංක්‍රීය දඩ මුදල් ගෙවීම සහ අවාසි සහගත ලකුණු ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමෙන් පසු මෝටර් රථ වැරදි සිදුවන වාර ගණන අනුව දඩ මුදල් අය කිරීම සිදුකළ හැකි වනු ඇති බව.	මෙම ක්‍රමවේදය හා රියදුරු සඳහා හීනවන ලකුණු ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නව දත්ත පද්ධතිය සඳහා කැබිනට් අනුමැතිය යටතේ ප්‍රවාහන අමාත්‍යංශය මූලිකත්වයෙන් සිදු කරනු ලබන බවසහ දැනට මෙම ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික අංශ සම්බන්ධිත ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව
(ඒ)	පැලියගොඩ ලිපිද්‍රව්‍ය ගබඩාවේ 2023 ජූනි 22 දින සිදුකර තිබූ භෞතික තොග ගණනයේදී භාණ්ඩ අයිතම 72 කට අයත් ඒකක 60082 ක ඌණතාවයක් ද, භාණ්ඩ අයිතම 45 කට අයත් ඒකක 9846 ක අතිරික්තයක් ද හඳුනාගෙන තිබූ නමුත්, මේ	2023	මනා තොග පාලනයක් පවත්වා ගත යුතු අතර, ඌන හෝ අධිතොග සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව හඳුනාගෙන ඉදිරි	2023.03.27 දින දක්වා ගබඩාවෙහි භාරකරු අත්අඩංගුවට පත්වීම සම්බන්ධයෙන් 2023 ජූලි 11 දින මූලික විමර්ශනයක්	පොලිස් මූලස්ථානයේ පරිපාලන නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් මූලික විමර්ශණයක් ආරම්භ කර ඇති බව.

	සම්බන්ධ වගකිව යුතු පාර්ශව හඳුනාගැනීමක් හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමක් සිදුව නොතිබුණි.		කටයුතු සිදුකළ යුතු ය.	ආරම්භකර ඇති බව.	
11	මානව සම්පත් කළමනාකරණය				
(අ)	පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවලට අදාලව අනුමත කාර්ය මණ්ඩල විස්තරයක් පවත්වා නොගැනීම මත එම කොට්ඨාශ හා පොලිස් ස්ථානවල කාර්ය මණ්ඩල අතිරික්තතා සහ ඌනතා හඳුනා ගැනීමට නොහැකි විය.	2023	පොලිස් කොට්ඨාශ හා පොලිස් ස්ථානවල රාජකාරි ස්වභාවය පිළිබඳ අධ්‍යනයකින් පසු නිශ්චිතව හඳුනාගත් අනුමත කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතුය.	පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථානයන්ට අදාල කාර්ය මණ්ඩලය තිරීණය කිරීමට කමිටුවක් පත්කර ඇති අතර,එම කමිටු වාර්තාව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇති බව.	පොලිස් කොට්ඨාස හා පොලිස් ස්ථාන යන්ට අදාල කාර්යය මණ්ඩලය තීරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නියොජ්‍ය පොලිස්පති වරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුවේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු කිරීමට නියමිතව ඇති බව.
(ආ)	වසර 08 සිට 38 දක්වා දීර්ඝ කාලීනව වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් 507 ක් විය.	2023	වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ප්‍රමාද දෝෂයන් වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	දීර්ඝ කාලීනව වැටුප් වර්ධක සකස් නොවූ නිලධාරීන් පිළිබඳ විස්තර ලබාගැනීමට කටයුතුකර ඇති අතර, එම නිලධාරීන් සම්බන්ධව වැටුප් වර්ධක සකස් කිරීමට අවශ්‍ය පියවරයන් ගෙන ඇති බව.	නිලධාරීන්ගේ වැටුප් වර්ධක සහ දීර්ඝ කාලීනව විශ්‍රාම වැටුප් ලැබීම ප්‍රමාදවී ඇති නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් නොපමාව සකස් කරන ලෙස හා එහි ප්‍රගතිය දැනුම් දෙන ලෙස උපදෙස් ලබා දී ඇති බව.
12	තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පැවති අතර, ශ්‍රී ලංකා පොලීසිය තිරසර සංවර්ධනය අරමුණු 04 ක් යටතේ ඉලක්ක 08ක් හඳුන්වාගෙන තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින්	2022	වාර්ෂිකව ලඟාවිය හැකි ඉලක්ක හඳුනාගෙන ඒවා ඇඟයීමට කටයුතු කළ යුතු වීම.	ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව සමඟ සම්බන්ධ වෙමින් අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍යවන සංධිස්ථානයන් හඳුනා ගැනීමට කටයුතු කරමින්	ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරි විෂය පථය මගින් ආවරණය වන තිර සර සංවර්ධන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම මැන බැලීම සඳහා අවශ්‍ය වන සංධිස්ථාන සැලැස්ම 2024.07.16 වන දින සකස් කර ඇති

	දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතිය ද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේ දී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංධිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.			පවතින බව.	බව.
13	නාරාහේන්පිට පොලිස් ප්‍රවාහන කොට්ඨාශයේ ප්‍රධාන ගරාජය ජාලගත කිරීමට අදාලව වාහන කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට 2017 මාර්තු 17 දින රු.12,297,829 ක මුදලකට ගිවිසුම් ගතව තිබුණි. ගිවිසුම්ගත දින සිට වර්ෂ 07 ක් ඉක්ම ගියද, මෙම පද්ධතියෙන් අපේක්ෂිත කාර්යය ඉටුකර ගැනීමට අපොහොසත්ව තිබුණි.	2021	වාහන කළමනාකරණ පද්ධතියෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය.	පසුව පිළිතුරු ඉදිරිපත් කරන බව.	පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීමේ කටයුතු ආරම්භකර ඇති බව.

28. ශීර්ෂය - 226 ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,010,913,060	14,595,840	996,272,030	තත්ත්වාගණනය කළ
2022	1,331,270,071	16,616,499	1,314,653,572	තත්ත්වාගණනය කළ
2023	1,664,287,865	128,126,317	1,644,679,422	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ප්‍රත්‍යාන්ත පාලන පද්ධතිය, වීසා සැකසීම, ගමන් බලපත්‍ර පද්ධතිය හා පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පද්ධතිය යනාදී පද්ධතිවල මිලදී ගැනීම් හා සේවාවන් සැපයීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 7ක් සමඟ දෙපාර්තමේන්තුව විසින් ගිවිසුම් ගතවී තිබුණු අතර 2021 හා 2020 වර්ෂයන්හිදී එම ආයතන වෙත පිළිවෙලින් රු.මිලියන 145.7ක් හා රු.මිලියන 142ක් නඩත්තු හා සේවා සඳහා ගෙවීම් කලද එම පද්ධතිය වරින්වර ක්‍රියා විරහිතවීම හා පද්ධතිය අඩපණවීම සිදුවන අතර ඒ තුලින් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය කාර්යක්ෂමව සිදුකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම වීසා කාලය ඉක්ම වීම හේතුවෙන් නිත්‍යානුකූල නොවන ලෙස රට තුල රැඳිසිටින්නන්ගේ මුළු සංඛ්‍යාව හඳුනා ගැනීමට හා විදේශ ධූත මණ්ඩල අංශයෙන් නිකුත් කරන	2021	පද්ධති වඩාත් ඵලදායීව පවත්වාගෙන යාම.	පද්ධති වඩා ඵලදායීව පවත්වා ගෙන යාම සඳහා අදාළ ආයතනයන් වෙත උපදෙස් හා නියෝග ලබා දී ඇත.	පද්ධති වඩා ඵලදායීව පවත්වා ගෙන යාම සඳහා අදාළ ආයතනයන් වෙත උපදෙස් හා නියෝග ලබා දී ඇති අතර ඒ අනුව කටයුතු සිදුවේ.

	ගමන් බලපත්‍ර වල ආදායම වෙනම හඳුනා ගැනීමට නොහැකි වීමද විගණන නිරීක්ෂණය විය.				
02	2010 ජනවාරි 19 දිනැති අංක අමප/09/2101/307/010 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා 2010 ජනවාරි 04 දිනැති අංක Nscc/2/4/3/2/2/13 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා ලිපිය ප්‍රකාරව දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2014 වර්ෂයෙන් පසුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2022	දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ උපදෙස් මත ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුවේ.	දිරිදීමනා ක්‍රමය සමාලෝචනය කර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමු කිරීම.	දිරිදීමනා ක්‍රමය සමාලෝචනය කර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යොමු කර ඇති අතර, ඒ සඳහා ඉල්ලා ඇති තොරතුරු ද ඉදිරිපත් කර ඇත. මෙතෙක් අනුමැතිය ලබාදී නොමැත.
03	සංශෝධිත දිරිදීමනා ක්‍රමයේ කොන්දේසි ඇතුළත් කරමින් ගෙවීම් ක්‍රමවේදය පිළිබඳ උපදෙස් ඇතුළත්කර දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් චක්‍රලේඛයක් නිකුත් කළ යුතු වුවද, එවැනි උපදෙස් අඩංගු චක්‍රලේඛයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2023	සංශෝධිත දිරිදීමනා ක්‍රමයේ කොන්දේසි සහ උපදෙස් ඇතුළත් කරමින් ගෙවීම් ක්‍රමවේදය පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කළ යුතු වේ.	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය අනුව චක්‍ර ලේඛයක් සකස් කිරීම.	ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලද පසු එම අනුමැතීන් ඇතුලත් කරමින් චක්‍රලේඛයක් ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි.
04	දීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුව ද, ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. දිරිදීමනා ලබාගැනීමට ඉලක්කගත සීමාවන් හඳුන්වාදී තිබුණ ද, දිරිදීමනා ගණනය කිරිමේදී ඒ පිළිබඳ අවධානය යොමු	2023	දිරිදීමනා ක්‍රමය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, දිරිදීමනා ගණනය කිරීමේදී හා ගෙවීම් කිරීමේදී හඳුන්වාදී ඇති ඉලක්කගත සීමාවන් පිළිබඳ අවධානය	ඉලක්කගත සීමාවන් අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ඉලක්කගත සීමාවන් අනුව දිරි දීමනා ගණනය කර ඇත.

	කළ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. එසේ වුව ද 2023 වර්ෂය තුළ දිරිදීමනා වශයෙන් රු.208,792,974ක් ගෙවීම්කර තිබුණි.		යොමුකළ යුතු වේ.		
05	බත්තරමුල්ල, සුහුරුපාය ගොඩනැගිල්ලේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අංශ ඇතුළත බිම ටයිල් වෙනුවට කාපට් අතුරා ඇති අතර, ඒවාද පළුදුවී ගැලවී ගොස් තිබුණද, ගිවිසුම්ගත වී නොමැතිවීම හේතුවෙන් එම අලුත්වැඩියාවන් සිදුකරන්නේ කෙසේද යන්න පැහැදිලි නොවුණි.	2022	නවීකරණ කටයුතු කඩිනමින් සිදුකිරීම සඳහාඅවශ්‍ය ක්‍රියාමාර්ගගතයුතුවේ.	අළුත්වැඩියා කිරීම් සඳහා ශ්‍රී ලංකා යුධ හමුදා ආරක්ෂක ඉංජිනේරු සේවක ශාඛාවේ අධ්‍යක්ෂ දැනුවත් කර ඇත.	මෙම දෙපාර්තමේන්තුවට අයත් 01මහලේ සිට 07 වන මහල දක්වා වූ කොටසේ ටයිල් වෙනුවට කාපට් අතුරා ඇති අතර, එම කාපට් ගැලවී ගොස් ඇති තැන් පිළිසකර කරණ ලෙස අවස්ථා කිහිපයකදීම ශ්‍රී ලංකා යුධ හමුදා ආරක්ෂක ඉංජිනේරු සේවක ශාඛාවේ අධ්‍යක්ෂ දැනුවත් කර ඇත. එම දැනුවත් කිරීම් සිදු කළ පසු එම අංශය විසින් අළුත්වැඩියා කටයුතු සිදුකර ඇත.
06	පුරවැසි අංශය මගින් හඳුනාගත් අඩුපාඩු විද්‍යුත් තැපැල මගින් අයදුම්කරු දැනුවත් කරනු ලැබුව ද, අදාළ විද්‍යුත් පණිවුඩය යැවූ බවට සාක්ෂි ගොනුව තුළ ඇතුළත් කර නොතිබුණු අවස්ථා පැවති අතර, විදුලි පණිවිඩය යැවුවද, ප්‍රතිචාරයක් නොතිබුණු අවස්ථාවන්හි දී ඒ සම්බන්ධයෙන් පසු විපරම් කර දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් ඉහළ නංවා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.	2022 2023	ගමන් බලපත් අඩුපාඩු අයදුම්කරුවන්ට නිවැරදි ආකාරයට සන්නිවේදනය වී තිබේද යන්න පිළිබඳව පසු විපරම් කටයුතු සිදුකළ යුතු වේ.	අයදුම්පත්වල අඩුපාඩු අයදුම්කරුවන්ට ඊ තැපැල මගින් දැනුම්දී එහි පිටපතක් ගොනුගත කරන ලෙසද විද්‍යුත් පණිවිඩය යොමු කිරීමෙන් පසු මාස 03 ක් තුල ප්‍රතිචාර නොමැති අයදුම්කරුවන්ට සිහිකැඳවීම් යොමු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.	අයදුම්පත්වල අඩුපාඩු අයදුම්කරුවන්ට ඊ තැපැල මගින් දැනුම්දී එහි පිටපතක් ගොනුගත කර ඇති අතර, විද්‍යුත් පණිවිඩය යොමු කිරීමෙන් පසු මාස 03 ක් තුල ප්‍රතිචාර නොමැති අයදුම්කරුවන්ට සිහිකැඳවීම් යොමු කරඇත.
07	2021 මැයි 22 දිනැති අංක	2022	2021 මැයි 22 දිනැති	පෞද්ගලික	වැලිසර දැනට පවත්වා

සිආදෙ/08/76/2021 දරන ලිපිය අනුව රැඳවියන් මධ්‍යස්ථානයට ඇතුළු කිරීමේදී ඔවුන්ගේ දේහ පරීක්ෂාව හා ඔවුන් රැගෙන එන බඩු භාණ්ඩ පරීක්ෂා කිරීම, මුදල් හා වටිනා භාණ්ඩ, ජංගම දුරකථන, පරිගණක හෝ වෙනත් සන්නිවේදන උපකරණ, මධ්‍යස්ථානයේ හෝ රැඳවියන්ගේ ආරක්ෂාවට තර්ජනය විය හැකි යම් උපකරණ ඇතිනම් ඒවා රඳවා ගැනීමට සිවිල් ආරක්ෂක නිලධාරීන් එකඟ වුව ද එවැනි භාණ්ඩ රඳවාගැනීමක් සිදුකර නොතිබුණු අතර රැඳවියන් සතුව තිබෙන පෞද්ගලික භාණ්ඩ පිළිබඳව ලැයිස්තුවක් ද මධ්‍යස්ථානය තුළ නඩත්තු කර නොතිබුණි.	අංක සිආදෙ/08/76/2021 දරන ලිපිය අනුව කටයුතු කළ යුතු වේ.	ආරක්ෂක අංශයේ ආයතනයකට මධ්‍යස්ථානයේ ආරක්ෂක කටයුතු භාරදීම	ගෙන යනු ලබන විදේශීය රුදවියන්, රඳවා තබා සිටින මධ්‍යස්ථානයේ ආරක්ෂාව සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යොදවනු ලැබීය. නමුත් ඔවුන්ගෙන් අදාළ ආරක්ෂක කටයුතු ක්‍රමවත්ව සිදු නොවීම හේතුවෙන් විවිධ වූ ගැටළු රාශියකට මුහුණ දීමට සිදු විය. එයට පිළියමක් වශයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින්, පෞද්ගලික ආරක්ෂක අංශයේ ආයතනයකට අදාළ කාර්යය පවරා ආරක්ෂක කටයුතු සිදු කරමින් පවතී. එසේම මෙම රුදවියන් රැඳවීම සඳහා තාවකාලික මධ්‍යස්ථානයේ අන්තර් ජාතික නීතිරීතිවලට යටත්ව පිළියෙල කරනු ලැබූ ගොඩනැගිල්ලක් නොවන අතර, ඉතාම සීමිත වූ පහසුකම් යටතේ පවත්වා ගෙන යනු ලබන්නකි. එසේම මෙම මධ්‍යස්ථානයේ රාජකාරී සඳහා යොදවා ඇති ස්ථිර කාර්ය මණ්ඩලයට ද රාජකාරී කටයුතු කිරීමට අඩි 12*අඩි14 ප්‍රමාණයේ සීමාවූ කාමරයක් තිබෙන අතර එම ප්‍රමාණයේ ද නිලධාරීන් තිදෙනෙකු රාජකාරී කටයුතු කරනු ලැබේ. එවැනි

					පරිසරයක් තුළ තවදුරටත් රැඳවියන්ගේ සියළු ආරක්ෂිත භාණ්ඩ රඳවා තබා ගැනීමට හැකියාවක් නොමැත. කෙසේ වෙතත් රැඳවියන් කඳවුර තුළට ඇතුළු කිරීමේ දී ආරක්ෂක අංශයේ නිලධාරීන් විසින් ඔවුන් පරික්ෂා කිරීමෙන් අනතුරුවඇතුළත් කර ගනු ලබන අතර, අනතුරුවිය හැකි පිහි,කතුරු වැනි භාණ්ඩ අපගේ නිලධාරීන් භාරයට ගනු ලැබේ. එසේම ඔවුන් සතු වටිනා භාණ්ඩ සියල්ලම, ඔවුන් භාරයේ ආරක්ෂිතව තබා ගැනීමට හැකිවන සේ දොරගුළු සහිත කබඩ් ලබා දී තිබේ. රැඳවියන් සතු භාණ්ඩ සම්බන්ධයෙන්ලේඛන යක්ආරක්ෂක අංශය විසින් පවත්වාගෙන යනු ලැබේ.
08	2016 අගෝස්තු 29 වන දින සිට මේ දක්වා බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ පළමු මහලේ සිට හත්වන මහල දක්වා සහ පියස පරිශ්‍රයේ කොටසක ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කුලී පදනම මත ස්ථාපිතකර ඇති අතර, 2016 සිට මේ දක්වා එකතුව රු.2,307,736,815 ක් ආරක්ෂක අමාත්‍යාංශයට කුලී හා	2023	කුලී පදනම මත ගොඩනැගිලි ලබාගැනීම සම්බන්ධව විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වේ.	සුහුරුපාය ගොඩනැගිල්ලේ 01- 07 දක්වා මහල් සඳහා ගිවිසුමක් ආරක්ෂක අමාත්‍යාංශය විසින් සකස් කරමින් පවතින බව දන්වමි.	මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් 2024.09.10 දින ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සූදානම් කර තිබුන ද 2024.09.09 දිනැතිව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් දන්වා ඇත්තේ විදේශ කටයුතු අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක

	නඩත්තු වියදම් ලෙස ගෙවා ඇති නමුත්, මේ දක්වා ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණි.				24/1580/691/024 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ තීරණය අනුව, සුහුරුපාය ගොඩනැගිල්ලේ ස්ථාපිත ආයතන සඳහා වන බදු කුලිය සම්බන්ධව මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර තීරණයකට එළඹිය යුතු බැවින් අදාල ගිවිසුම අත්සන් කිරීම එදිනට සිදු නොකරන බවත්, එය සිදු කරන දිනය ඉදිරියේදී දැනුම් දෙන බවත්ය. එම දැනුම් දීම ලද පසු අදාල ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු සිදු කිරීමට නියමිතය.
09	බත්තරමුල්ල සුහුරුපාය ගොඩනැගිල්ලේ පළමු මහලේ බැංකු 04 ක් සඳහා ගනුදෙනු කිරීමට ඉඩ පහසුකම් වෙන්කරදී තිබුණ ද, එම ආයතනවලින් කුලී හෝ වෙනත් ගාස්තුවක් අයකරගෙන නොතිබුණි.	2023	විධිමත් වූ ක්‍රමවේදයක් යටතේ ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ගගත යුතු වේ.	මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් විමසීම් කර ඇත.	සුහුරුපාය ගොඩනැගිල්ලේ ස්ථාපිත ලංකා බැංකු ශාඛාව හා මිනිබෑන්ක් ශාඛාව මගින් පරිහරණය කරනු ලබන පරිශ්‍රය සඳහා බිම් කුලිය හා විදුලිය අදාල බැංකු මඟින් අය කර නොගැනීම සම්බන්ධව සිදු කර ඇති විගණන විමසුම්වලට අනුව, එලෙස අය කළ යුතු බිම් කුලී හා විදුලිය සඳහා වන මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න තීරණය කර දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙත 2023.11.22 දින

					ලිපියක් යොමු කර ඇත. එම ලිපියට පිළිතුරු ලැබී නොමැති බැවින් 2024.10.18 දින නැවත ඒ පිළිබඳව විමසීමක් ද යොමු කර ඇත.
10	2017 දෙසැම්බර් 22 දින CCTV කැමරා මිලදී ගැනීමට රු.1,330,550 ක් සහ සවි කිරීම වෙනුවෙන් රු.829,903 ක් වශයෙන් එකතුව රු.2,160,453 ක මුදලක් වැයකර කැමරා 62 ක් මිලදී ගෙන තිබුණ ද, එම කැමරා සවි කිරීමට ක්‍රියා නොකර වසර 06 කට වැඩි කාලයක් ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පැවතුණි.	2023	මිලදී ගෙන ගබඩාකර ඇති CCTV කැමරා නිෂ්ක්‍රීයව තබා නොගෙන අදාළ ස්ථානවල සවිකිරීමට ක්‍රියා කළ යුතු වේ.	CCTV කැමරා සවිකිරීමට කටයුතු කිරීම	මේ දිනවල CCTV කැමරා සවි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
11	දෙපාර්තමේන්තුව විසින් හිස් විදේශ ගමන් බලපත්‍ර ලබාගැනීමට 2003 වර්ෂයේ තෝරාගෙන තිබූ පුද්ගලික ආයතනයෙන් අවුරුදු 21 ක පමණ කාලයක්ම ටෙන්ඩර් කැඳවීමකින් තොරව සැපයුම් දිගු ලබාදෙමින් ප්‍රසම්පාදන කාර්යයෙන් බැහැරව හිස් විදේශ ගමන් බලපත්‍ර මිලදී ගෙන තිබුණි. හිස් ගමන්බලපත්‍රවල අවශ්‍යතා සැලකිල්ලට නොගෙන මෙම මිලදී ගැනීම සිදු කිරීම හේතුවෙන් නිකුත් කිරීමට අවශ්‍ය ගමන් බලපත්‍ර සංඛ්‍යාව අවශ්‍යතාවයට ගැළපෙන මට්ටමින් නොවීම ගමන් බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාදයට මූලික හේතුවක් වී තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ටෙන්ඩර් කැඳවීම් කර ආයතනයේ අවශ්‍යතාවයට ගැළපෙන පරිදි හිස් ගමන් බලපත්‍ර මිලදී ගැනීමට කටයුතු කළ යුතු වේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කර හිස් විදේශ ගමන් බලපත්‍ර මිලදී ගැනීමට කටයුතු කිරීම	ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කර නව ආයතනයක් මඟින් හිස් විදේශ ගමන් බලපත්‍ර මිලදී ගැනීමේ කටයුතු වර්තමානයේ දී සිදු කරන බව දන්වමි.
12	දෙපාර්තමේන්තුව විසින් හිස් ගමන් බලපත්‍ර නියමිත කාලවකවානුව තුළ	2023	හිස් ගමන්බලපත්‍ර අවශ්‍යතාවය නිවැරදිව මිලදී ගැනීම් කර	ඉදිරියේදී මෙවැනි ගැටළුකාරී	පාලනය කළ නොහැකි අධික ගමන් බලපත්‍ර ඉල්ලුම

	ගෙන්වා නොගැනීම නිසා ඇති වූ හිස් ගමන්බලපත්‍ර හිඟය නිසාවෙන්,ගමන්බලපත්‍ර ගුවන් මඟින් ගෙන්වීමට ගුවන් භාණ්ඩ ප්‍රවාහනය, ලේඛන සහ අමතර වැඩ ගාස්තු ලෙස USD 33,672 ක මුදලක් පුද්ගලික ආයතනයක් වෙත ද, නැව් වන්දි ගාස්තු ලෙස රු.322,952 ක මුදලක් ලංකා බැංකුව වෙත ද, දේශීය නැව් නියෝජිත ලේඛන ගාස්තු නැවත ගෙවීම ලෙස රු.58,652 ක මුදලක් සැපයුම්කරු වෙත ද ගෙවීමට සිදුවීම නිසා දෙපාර්තමේන්තුවට රු.13,184,416 ක අතිරේක වියදමක් දැරීමට සිදු වී තිබුණි.		හඳුනාගෙන ගබඩාකර අවශ්‍යතාවයට සරිලන පරිදි නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ.	තත්වයන් අවම කර ගැනීම සඳහා කටයුතු කිරීම.	හේතුවෙන් එවකට පැවති තොග දින කිහිපයකට පමණක් ප්‍රමාණවත් වූ බැවින් සැලසුම් කරන ලද ඉතිරි තොග ලැබෙන තුරු අවශ්‍ය වන ගමන් බලපත් ප්‍රමාණය ගුවන් මඟින් ගෙන්වා ගැනීමට සිදු විය.
13	ද්විත්ව පුරවැසිභාවය ලබාගැනීම සඳහා වන අයදුම්පත්, ලියාපදිංචි කිරීමෙන්පසු මාණ්ඩලික නිලධාරියෙකු විසින් පරීක්ෂාකර පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා මාස 10 සිට මාස 14 ක කාලයක් ගත වී තිබුණු අතර, එම අයදුම්පත්වල හඳුනාගත් අඩුපාඩු අයදුම්කරු වෙත විද්‍යුත් පණිවුඩ මඟින් යැවීමට ද කටයුතු කර නොතිබුණි.	2023	ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් ලියාපදිංචිකර අදාළ නිලධාරින් විසින් පරීක්ෂාකර පද්ධතියට දත්ත ඇතුළත් කිරීමට කඩිනමින් ක්‍රියා කළ යුතු අතර, හඳුනාගත් අඩුපාඩු අයදුම්කරුවන් වෙත විද්‍යුත් පණිවිඩ මඟින් යැවීමට ක්‍රියකළ යුතු වේ.	අයදුම්පත්වල අඩුපාඩු අයදුම්කරුවන්ට ඊ තැපැල මඟින් දැනුම්දී එහි පිටපතක් ගොනුගත කරන ලෙසද විද්‍යුත් පණිවිඩය යොමු කිරීමෙන් පසු මාස 03 ක් තුල ප්‍රතිචාර නොමැති අයදුම්කරුවන්ට සිහිකැඳවීම් යොමු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.	උපදෙස් පරිදි කටයුතු කර ඇත.
14	ද්විත්ව පුරවැසිභාවය පිරිනැමීමට අදාළ සහතිකපත් අයදුම්කරු වෙත නිකුත්කර විගණිත දින වන විට මාස 04 සිට මාස 10 ක කාලයක් ගත වී	2023	ද්විත්ව පුරවැසිභාවය පිරිනැමීමට අදාළ ලිපි ලේඛන පරිගණක පද්ධතිය තුළට පරිලෝකනය (Scan) කිරීමට කඩිනමින්	මෙම කටයුතු ප්‍රමාදයකින් තොරව ඉටු කිරීමට උපදේ ලබා දී ඇත.	ද්විත්ව පුරවැසිභාවය ලබා ගැනීම සඳහා වන අයදුම්පත් ලියාපදිංචි කර අදාල විෂයභාර නිලධාරීන් විසින් පරීක්ෂා කර පද්ධතියට

	තිබුණ ද, අදාළ සියලු ලිපි ලේඛන පරිගණක පද්ධතිය තුළට පරිලෝකනය (scan) කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.		ක්‍රියා කළ යුතු ය.		දත්ත ඇතුලත් කිරීම සති දෙකක් පමණ කාලයක් තුල සිදු කරනු ලබන අතර බුද්ධි අංශ වාර්තා කැඳවා මාණ්ඩලික නිලධාරීයා විසින් ගොනු පරීක්ෂා කිරීම මාස 02 ක් තුල සිදු කරනු ලැබේ. ගොනු පරීක්ෂා කිරීමෙන් පසු සතියක් වැනි කාලයක් තුල අඩුපාඩු සහිත අයදුම්පත් සම්බන්ධයෙන් අයදුම්කරුවන් වෙත විද්‍යුත් පණිවිඩ යැවීම සිදු කර ඇත.
15	2023 ඔක්තෝම්බර් 31 දිනට ද්විත්ව පුරවැසිභාවය නිර්දේශ කිරීමේ කමිටුව මඟින් අනුමත කර මුදල් ගෙවීම සඳහා අයදුම්කරුවන් දැනුවත් කළ අයදුම්පත් 6167 ක් පැවති අතර, පළමු අවස්ථාවේදී යවන ලද ඊ මේල් පණිවිඩය හැර වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ සම්බන්ධයෙන් ගෙන නොතිබුණි.	2023	මුදල් ගෙවිය යුතු කාල සීමාවක් තීරණයකර එය අයදුම්කරුවන් දැනුවත්කර, අයදුම්කරුවන්ට අදාළ සහතික නිකුත් කිරීමෙන් පසු අනුමත ආදායම් එකතු කරගැනීමට කටයුතු කළ යුතු වේ.	මුදල් නොගෙවූ අයදුම්කරුවන් වෙත සිහිකැඳවීම් ලිපි සමූහ විද්‍යුත් තැපැල මඟින් 2024.06.05 දින යොමු කර ඇත.	මේ වන විට එම අයදුම්පත්වලට අදාළව මුදල් ගෙවමින් පවතී.
16	නිර්දේශ කිරීමේ කමිටුව වෙත ඉදිරිපත්කර තිබූ ද්විත්ව පුරවැසිභාවය සඳහා වන අයදුම්පත් කමිටුව විසින් අනුමත කිරීම සඳහා මාස 03 සිට 06 ක කාලයක් ගත වූ අවස්ථා පැවතුණි.	2023	නිර්දේශ කිරීමේ කමිටුව වෙත ඉදිරිපත්කර ඇති ද්විත්ව පුරවැසිභාවය සඳහා වන අයදුම්පත් කමිටුව විසින් ප්‍රමාදයකින් තොරව අනුමත කළ යුතු වේ.	පවතින ක්‍රියාවලිය තුල හැකි අවම කාලයකින් කටයුතු අවසන් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.	ද්විත්ව පුරවැසි අයදුම්පත් නිර්දේශ කිරීමේ කමිටුව විසින් 2023.10.03 දින දක්වා ලියාපදිංචි කර ඇති අයදුම්පත් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, මුදල් ගෙවන ලෙස එම අයදුම්කරුවන් දැනුවත් කර ඇත. 2024.04.09 දින දක්වා වන අයදුම්පත් මේ වන විට එම

					කමිටුවේ අනුමැතිය සඳහා යොමු කර ඇත. (මේ වන විට අයදුම්පත් ලියාපදිංචි කර මාස 4-5 අතර කාලයක් තුල කමිටුව වෙත යොමු කිරීම දක්වා ක්‍රියාවලිය වේගවත් කර ඇත.)
17	2023 දෙසැම්බර් 31 දිනට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 1,318 ක් ද, තථ්‍ය කාර්යය මණ්ඩලය 1,106 ක් ද වූ අතර, සේවක මණ්ඩල පුරප්පාඩු 212 ක් පැවතුණි.	2023	පවතින පුරප්පාඩු පිරවීමට පියවරගත යුතුය.	පවතින පුරප්පුපාඩු පිරවීම සඳහා කටයුතු කර ඇත.	2023.12.31 දිනට පැවති සේවක පුරප්පාඩු 212න් 100ක් මෙහෙයුම් සහකාර තනතුරු වන අතර, ඉන් තනතුරු 50ක් සහ ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරී තනතුරු 38ක් බඳවා ගැනීම් සඳහා අනුමැතිය ලැබී ඇත. එමෙන්ම සහකාර ආගමන හා විගමන පාලක තනතුරු 7ක් 2024/03/18 දින පුරවා ඇත. තවදුරටත්, මෙහෙයුම් සහකාර තනතුරු 50ක්, සහකාර ආගමන හා විගමන පාලක තනතුරු 5ක්, ජ්‍යෙෂ්ඨ බලයලත් නිලධාරි තනතුරු 18ක් සහ බලයලත් නිලධාරී තනතුරු 72ක් සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත. නියාමක තනතුර සහ ගමන් බලපත් සහායක තනතුර දැනට සිටින නිලධාරින් විශ්‍රාම ලැබූ පසු හෝ ඔවුන්ගේ සේවය අවසන් වූ පසුව අහෝසි වන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දී ඇති

බැවින්, නැවතත් නිලධාරීන් බඳවා ගැනීමට හැකියාවක් නොමැති බැවින් එම පුරප්පාඩු පිරවීම සිදු නොකරයි.
පුහුණු වන අනියම් කම්කරුවන්ගේ සේවය ස්ථිර කිරීමට රජය විසින් කිසිදු ප්‍රතිපත්තියක් ගෙන නොමැති බැවින්, නැවත පුහුණු වන අනියම් කම්කරුවන් බඳවා ගැනීමට කටයුතු කරනු නොලැබේ.
පාලක හා නියෝජ්‍ය පාලක යන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු දීපව්‍යාප්ත සේවයට අයත් බැවින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් සහ කළමනාකරණ සේවා නිලධාරි සහ කාර්යාල සේවක සේවයේ තනතුරු ඒකාබද්ධ සේවයට අයත් බැවින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් එම පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ.

29. ශීර්ෂය - 227 පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	353,390,447	2,075,502	351,314,945	තත්ත්වාගණනය කළ
2022	564,628,627	4,021,703	560,606,924	තත්ත්වාගණනය කළ
2023	880,553,159	7,932,532	872,620,627	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන්(KPIs) අතුරින් ප්‍රධාන දර්ශකයක් වන “වාර්ෂික සාමාන්‍ය සේවය යටතේ ලද අයදුම්පත්වලින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාවේ” ප්‍රතිශතය සමාලෝචිත වර්ෂයේ සියයට 62ක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.	2021 2022	කාර්ය සාධන දර්ශක උපරිම මට්ටමින් පවත්වාගෙන යාම.	කාර්ය සාධක දර්ශකය වෙත ළඟා වීම සපුරා ගැනීමට අවශ්‍යවන ප්‍රමාණවත් කාඩ්පත් තොග පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.	ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් මිලියන 05ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය ලංසු කැඳවීමෙන් අනතුරුව 2024.05.06 දිනැති අංක අමප 24/0793/601/053-1 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අවලංගු කරන ලද අතර නව ප්‍රසම්පාදනයක් මගින් කාඩ්පත් මිලදී ගන්නා තෙක් ජාතික හැඳුනුම්පත් මුද්‍රණය සඳහා අවශ්‍ය පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් ප්‍රමාණය පමණක් පෙර සැපයුම්කරුගෙන් නැවත ඇණවුමක් ලෙස මිලදී ගන්නා ලෙස ද එම තීරණය මගින් දන්වා තිබූ බැවින් කාඩ්පත් මිලියන 2.3ක් පෙර

					සැපයුම්කරු වන Just In Time Technologies (Pvt) Ltd ආයතනය වෙතින් මිලදී ගැනීමට නැවත ඇණවුම ලබාදී ඇති අතර මේ වන විට කාඩ්පත් ලක්ෂ 02ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. ඉතිරි කාඩ්පත් තොගය ඉදිරියේදී ලැබීමට නියමිතය.
02	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය නවීකරණය කර ආරක්ෂිත විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමේ අවශ්‍යතාවය මත පුරවැසියන් ලියාපදිංචි කිරීම, විද්‍යුත් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම හා විද්‍යුත් ජාතික නාම ලේඛනය ස්ථාපිත කිරීම යන අංග ඇතුළත්ව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය 2006 වර්ෂයේ දී හඳුන්වා දී තිබුණි. 2006 වර්ෂයේ සිට එක් එක් අවස්ථාවන්හිදී ව්‍යාපෘති කාලය දීර්ඝ කරමින් හා ව්‍යාපෘති සැලැස්ම කිහිප අවස්ථාවකදීම සංශෝධනය කරමින් කටයුතු කර තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විට මුළු වියදම රු. මිලියන 2658.33ක් වූවද ‘‘විද්‍යුත් ජාතික හැඳුනුම්පතක්’’ නිකුත් කිරීමේ අදියර දක්වා ප්‍රගතියක් අත් කර ගැනීමට විගණිත දින දක්වාම ව්‍යාපෘතිය අපොහොසත් වී තිබුණි.	2021	ව්‍යාපෘති කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම.	මෙම ව්‍යාපෘතියට අදාළ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ සංරචකය යටතේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වයඹ පළාත් කාර්යාලය කුරුණෑගල දිස්ත්‍රික්කයේ ද, උතුරු පළාත් කාර්යාලය වවුනියා දිස්ත්‍රික්කයේද නැගෙනහිර පළාත් කාර්යාලය මඩකලපුව දිස්ත්‍රික්කයේද දකුණු පළාත් කාර්යාලය ගාල්ල දිස්ත්‍රික්කයේද ස්ථාපනය කිරීමේ කටයුතු ව්‍යාපෘතිය මඟින් සම්පූර්ණ කිරීම පිණිස එම කාර්යාල නවීකරණය කිරීමට අවශ්‍ය කාර්යාලයීය ලි බඩු උපකරණ,	නුවරඑළිය දිස්ත්‍රික්කයේ නව ගොඩනැගිල්ලක් ඉදිකර පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මධ්‍යම පළාත් කාර්යාලයීය 2024 වර්ෂයේ අප්‍රේල් මස 22 දින ආරම්භ කිරීමට අවශ්‍ය පහසුකම් සළසා දී ඇති අතර රාජකාරි කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යනු ලැබේ. තවද, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ වයඹ පළාත් කාර්යාලය මඟින් ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ එක්දින සේවාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කර එම සේවාව මෙම වසරේදී ආරම්භ කිරීමට සැළසුම් කර ඇත. 2024.01.08 දිනැති

පරිගණක හා අවශ්‍ය අනෙකුත් සියළුම විද්‍යුත් උපාංග සැපයීම මෙන්ම නව ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ පරිගණක මෘදුකාංග පද්ධතිය එම කාර්යාලයන්හි ස්ථාපනය කිරීමේ කටයුතු මෙම ව්‍යාපෘතිය විසින් ඉටු කරන ලද අතර මේ වන විට දෙපාර්තමේන්තු වේ පළාත් කාර්යාලීය රාජකාරි කටයුතු සඳහා එම කාර්යාල විධිමත් පරිදි පවත්වාගෙන යනු ලැබේ.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පුද්ගල ජාතික නාම ලේඛණය ගොඩ නැගීමේ කටයුතු 2024 වර්ෂයේ දෙසැම්බර් වන විට ආරම්භ කිරිමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් මෙම ව්‍යාපෘතිය මඟින් මේ වන විට ද සම්පූර්ණයෙන් ම පාහේ අවසන් කර ඇත.නිළධාරින් පුහුණු කිරිම, ඇඟිලි සළකුණු ලබා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර 402ක් මිලදී ගැනීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු මේ වන විට අවසන් කර අදාළ මිලදීගැනීම් සඳහා පියවර ගෙන ඇත.
තවද, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු වේ දකුණු පළාත් කාර්යාලය ගාල්ල දිස්ත්‍රික්කයේ ස්ථාපනය කිරීමෙන් පසු එම කාර්යාලය මඟින් නව ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ එක්දින සේවාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අමතර විද්‍යුත් උපාංග හා කාඩ්පත් මුද්‍රිත යන්ත්‍ර සැපයීම මෙන්ම අදාළ පරිගණක මෘදුකාංග	ඒ අනුව දත්ත එකතු කිරීමේ ක්‍රියාවලිය 2024 දෙසැම්බර් මස ආරම්භ කර ඊට සමගාමීව විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

				පද්ධතිය වැඩිදියුණු කිරීමේ කාර්යය ද මෙම ව්‍යාපෘතිය විසින් ඉටු කරන ලද අතර ඉන් පසු 2019 වර්ෂයේ සැප්තැම්බර් මස 06 වන දින සිට දෙපාර්තමේන්තු වේ එම කාර්යාලය මඟින් ද ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ එක්දින සේවාව ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.	
03	ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට නීති අංශය වෙත ලැබී ඇති මුළු දෝෂ සහිත අයදුම්පත් සංඛ්‍යාව 2067ක් වූ අතර ඒ තුළ පිළිවෙලින් 2018 හා 2019 වර්ෂවල ලැබුණු අයදුම්පත් 185ක් හා 348ක් ද විය.	2021	අයදුම්පත් පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම.	ඉල්ලුම්කරුවන් හට දෙපාර්තමේන්තුව වෙත හෝ එම අයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හැඳුනුම්පත් අංශය වෙත යොමු වෙන ලෙස දැනුම් දීම් සිදු කිරීම.	මේ වන විට නීති අංශයේ රඳවා ඇති ඉල්ලුම්පත් ප්‍රමාණය 69කි. (ඉල්ලුම්කරුවන් නොපැමිණීම හේතුවෙන්)
04	2022 අගෝස්තු 09 දිනැති අංක 2292/13 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2022 අගෝස්තු 15 දින සිට ක්‍රියාත්මක තැපැල් ගාස්තු සංශෝධනයට අනුරූපීව ජාතික හැඳුනුම්පත් ලියාපදිංචි තැපැලට යොමු කිරීම සඳහා වන ගාස්තුව රු.45 සිට රු.110 දක්වා වැඩි කරමින් 2022 අගෝස්තු 18 දිනැති අංක DRP/OP/01/DS/03දරන අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර තිබුණි. චක්‍රලේඛය නිකුත් කරන අවස්ථාව වන විට භාවිතයට නොගත් රු.4,298,895 ක් වටිනා මුද්දර	2022	මුද්දර කවර ප්‍රමාදයකින් තොරව ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට හා ඒවා කාර්යක්ෂම ලෙස භාවිතයට පියවරගතයුතු වේ.	මුද්දර කවර ප්‍රමාදයකින් තොරව ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගැනීමට හා ඒවා කාර්යක්ෂම ලෙස භාවිතයට පියවර ගත යුතු බවට නිලධාරීන් දැනුවත් කිරීම හා ඒ අනුව ක්‍රියාත්මක වීම.	විගණනයෙන් පෙන්වා දී ඇති මුද්දර කවර උපරිමයෙන් භාවිතා කර ඇත. එමෙන්ම, 2024.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සාමාන්‍ය සේවය යටතේ ඉදිරිපත් කරනු ලබන ජාතික හැඳුනුම්පත් ඉල්ලුම්පත් සමඟ මුද්දර කවර වෙනුවට රු.120/= ක මුදලක් අය කිරීම

	ඇල වූ ලිපි කවර 95,531 ක් 2022 සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වාලේඛනාගාරය විසින් ප්‍රධාන කාර්යාලයට එවා ඇති අතර ප්‍රමාදයකින් තොරව නියමිත කාලය තුළලැබුනේ නම් එම මුද්දර කවර භාවිතා කළ හැකිව තිබුණි.				සිදු වන බැවින් ඉදිරියේදී මෙවැනි ගැටළු ඇති නොවීම.
05	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය- 2006, 2.8.1(අ) ඡේදය ප්‍රකාරව කිසියම් සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුව සහ තාක්ෂණික ඇගයීම් කමිටුව යන දෙකේ ම සේවය නොකළ යුතු වුවද, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව නියෝජනය කරනු ලබන විකල්ප සාමාජිකයෙකු උක්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා පත් කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපති ලෙසද කටයුතුකර තිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරියේදී තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් පත් කිරීමේදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින්/ විකල්ප කමිටු සාමාජිකයින් ඇතුලත් නොවන පරිදි පත් කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
06	විගණනය වෙත ලද තොරතුරු අනුව විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතිය ආරම්භයේ සිට වර්තමානය දක්වා ව්‍යාපෘතිය මගින් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලබාදුන් මුළු භාණ්ඩ /වත්කම් වටිනාකම රු.901,868,363 ක් වන අතර මින් වටිනාකම රු.114,964,961 ක භාණ්ඩ /වත්කම් දෙපාර්තමේන්තුව හරහා ප්‍රාදේශීය කාර්යාල වෙත ලබාදුන් භාණ්ඩ /වත්කම් වන අතර, 2023 වර්ෂයේදී රු.50,164,280 ක භාණ්ඩ /වත්කම් පමණක් දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත්කර තිබුණි.	2022 2023	e-NICව්‍යාපෘතිය මඟින් ලද සියලු වත්කම් දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කරගැනීමට කටයුතු කළ යුතුය.	විගනන නිරීක්ෂණ අනුව මෙම වෙනස්වීමට හේතු පුළුල්ව සොයා බලන අතර මේ දක්වා පහත සඳහන් නිරීක්ෂණයන් හඳුනාගෙන ඇත. -දෙපාර්තමේන්තු තොග ලේඛණ සහ e-NIC ව්‍යාපෘතිය මඟින් ලබා දී ඇති භාණ්ඩ සැසඳීම තුළින් ලේඛනගත නොවූ වත්කම් හඳුනාගැනීම. -මිල ගණන්වල ඇති වෙනස්කම් හඳුනාගැනීම. -ප්‍රමාණයන්වල ඇති වෙනස්කම්	මෙම නිරීක්ෂණයන්ට අනුව තොග ලේඛන යාවත්කාලීන කර භෞතික සංගණනයන්ද සිදු කර විධිමත් පරිදි CIGAS පද්ධතියට කඩිනමින් නිවැරදි තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කරමින් ඇත.

				හඳුනාගැනීම. -ද්වීගණන දෝෂ හඳුනාගැනීම. -e-NICව්‍යාපෘතිය මඟින් මිලට ගෙන ප්‍රාදේශීය කාර්යාල වලට සෘජුවම ලබා දුන් අයිතම හඳුනාගැනීම.	
07	ජාතික හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා සාමාන්‍ය සේවය යටතේ 2022 අවසන් කාර්තුවට අදාළව ඉදිරිපත් කරන ලද අයදුම්පත් සහතික කිරීමේ නිලධාරියා විසින් සහතික කළ දින සිට එම ජාතික හැඳුනුම්පත් අයදුම්කරු වෙත තැපැල් කිරීම සඳහා මාස 08 සිට මාස 11 දක්වා කාලයක් ගත වී තිබුණි.	2023	සාමාන්‍ය සේවය යටතේ ලබාගත් හැඳුනුම්පත් කඩිනමින් අයදුම්කරු වෙත තැපැල් කිරීමට කටයුතු කළ යුතුය.	සාමාන්‍ය සේවය මඟින් ඉල්ලුම්කරුවන් වෙත ජාතික හැඳුනුම්පත් ලබා දීම අඛණ්ඩව සිදු කරගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.	පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු අඛණ්ඩව සිදුකර ඇති අතර පෙර සැපයුම්කරු වෙත ලබා දුන් පෙර මුද්‍රිත පොලිකාබනේට් කාඩ්පත් ලක්ෂ මිලියන 2.3 ක නැවත ඇණවුම යටතේ කාඩ්පත් ලක්ෂ 02ක තොගයක් මේ වන විට දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති අතර ඉතිරි කාඩ්පත් තොගය ඉදිරියේදී ලැබීමට නියමිතය.
08	ප්‍රධාන තොග ගබඩාවෙන් මුද්‍රණ අංශයට පෙර මුද්‍රිත කාඩ්පත් නිකුත් කිරීමේ දී ආරක්ෂිත තොගයක් පවත්වා නොගෙන මුළු කාඩ්පත් ප්‍රමාණයම මුද්‍රණ අංශයට නිකුත් කර තිබූ නිරීක්ෂණය විය. තවද 2023 දෙසැම්බර්31 දිනට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අයදුම්පත් 1,299,436 ක් ලැබී තිබුණ ද, ඒ සඳහා වූ හිස් කාඩ්පත් තොගය 461,429 ක් වූඅතර,ලැබී ඇති අයදුම්පත් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රමාණවත්	20212023	තොග පාලනය විධිමත් කරමින් හැඳුනුම්පත් නිකුත් කිරීමට ප්‍රමාණවත් හිස් කාඩ්පත් තොග මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	අවශ්‍ය පරිදි ප්‍රමාණවත් තොග මට්ටමක් පවත්වාගෙන යාමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇත.	නැවත ඇණවුම මගින් මිලදී ගන්නා ලද පෙර මුද්‍රිත කාඩ්පත් ලක්ෂ 02ක තොගයක් මුද්‍රණ අංශයේ ඇති, කාඩ්පත් ආරක්ෂිතව ගබඩා කරන විශේෂ ගබඩාවේ තැන්පත් කර ඇත.

	හිස් කාඩ්පත් තොග මට්ටමක් පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව තිබුණි.				
09	2023 වර්ෂයේ අගෝස්තු හා සැප්තැම්බර් මාසවල තැපැලට යොමු කරන ලද ජාතික හැඳුනුම්පත් පරීක්ෂාවේදී ලිපිකවර මුද්‍රණය වී තිබුණ ද, ඒවා අයදුම්කරු වෙත තැපැල් කිරීම සඳහා වැඩ කරන දින 04 සිට දින 09 දක්වා කාලයක් ගත වී තිබුණි.	2023	කඩිනමින් ජාතික හැඳුනුම්පත් අයදුම්කරු වෙත තැපැල් කිරීමට සඳහා පියවරගතයුතුය.	ලිපි තැපැල් කිරීමේ ප්‍රමාදය වලක්වා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	මේ වන විට ජාතික හැඳුනුම්පත් ලියාපදිංචි තැපැල මඟින් ඉල්ලුම්කරුවන් වෙත යොමු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
10	ජාතික හැඳුනුම්පත් මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය අනුව හිස් පෙර මුද්‍රිත කාඩ්පතෙහි මුද්‍රණයවීමට පෙර එහි නිවැරදිතාවය පරීක්ෂා කිරීමක් ජාතික හැඳුනුම්පත් මුද්‍රණය හා සකස් කිරීමේ අංශය විසින් Print preview අදියරේදී සිදුකළ ද, දෝෂ සහිතව මුද්‍රණය වූ ජාතික හැඳුනුම්පත් සංඛ්‍යාව2023 වර්ෂය තුළ එක්දින සේවය යටතේ 3,064 ක් හා සාමාන්‍ය සේවය යටතේ 8,688 ක් වූ අතර, නිවැරදිතාවය පරීක්ෂා කිරීමේ අදියරක් පැවතියද දෝෂ සහිතව හැඳුනුම්පත් මුද්‍රණය වී තිබීම අනාර්ථික පිරිවැයක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	2023	ජාතික හැඳුනුම්පත් මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය හැකිතාක් දෝෂ රහිතව සිදු කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගගත යුතුය.	මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා පරිශීලකයන් වෙත පුහුණු වැඩසටහන් පැවත්වීමට කටයුතු කිරීම.	පාසැල් ඉල්ලුම්කරුවන් වෙත යොමු කරනු ලබන තොරතුරු තහවුරු කිරීමේ ලිපි, නිකුත් කිරීමට පෙර Print preview අදියරේදී පරීක්ෂා කරන බැවින් ජාතික හැඳුනුම්පත මුද්‍රණය වීමේදී දෝෂ 1% දක්වා මේ වන විට අඩුවී ඇත.
11	2019/2022 වර්ෂවල පැරණි හැඳුනුම්පත් අපහරණය කිරීම සඳහා පත්කළ කමිටු වාර්තාව අනුව හා කොමසාරිස් ජනරාල් විසින් විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ වෙත යොමු කරන ලද 2021 ජුලි 28 දිනැති ලිපිය මඟින් විද්‍යුත් ජාතික හැඳුනුම්පත් ව්‍යාපෘතිය මඟින් සුදුසු කාඩ්පත් කැබලි කිරීමේ යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර දෙපාර්තමේන්තුව වෙත ලබාදීමට කටයුතු කරන ලෙස දන්වා සිටිය ද එය ඉටුවී නොතිබුණි.	2023	පැරණි හැඳුනුම්පත් අපහරණය කිරීම සඳහා කාඩ්පත් කැබලි කිරීමේ යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කර ගැනීමේ කාර්ය කඩිනමින් සිදු කළ යුතුය.	පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ 2021 ජුලි 28 දිනැති ලිපිය අනුව කාඩ්පත් කැබිලි කිරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කලද අදාල ලංසු ලියවිල්ල සඳහා තාක්ෂණික	මේ සම්බන්ධයෙන් පුද්ගලයන් ලියාපාදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් ඉහත යන්ත්‍රය අත්‍යාවශ්‍ය බවට 2023 වර්ෂයේ දැනුවත් කිරීමක් නොකල හෙයින් තවදුරටත් මෙම ප්‍රසාම්පාදය ක්‍රියාත්මක කිරීමට පියවර නොගන්නා ලද බව e-NIC

				ඇගයීම් කමිටු නිර්දේශය ලැබී තිබුණේ 2021.12.03 වැනි දිනය. ඒ අනුව 2021 වර්ෂය තුළ මෙම ප්‍රසම්පාදනය සම්පූර්ණ කිරිමට ප්‍රමාණවත් කාලයක් නොතිබු නිසාත් 2022 වර්ෂය සඳහා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ප්‍රතිපාදන සැලසී තිබුනේ රු.මිලියන 130ක් තරම්අවම ප්‍රමාණයක් නිසාත් මෙම මිලදී ගැනීමසම්පූර්ණ කිරිමට නොහැකි විය.	ව්‍යාපෘතිය මඟින් දන්වා ඇත .
12	නීති නිලධාරී භාෂා පරිවර්තක (සිංහල-දෙමළ), කාර්මික නිලධාරී ඇතුලු තනතුරු 06 ක් සඳහා අනුමත තනතුරු සංඛ්‍යාවම පුරප්පාඩු වී පැවතුණි.	2021 2022	කාර්යමණ්ඩල පරිපාලනය විධිමත් කිරීම.	• ලිපි සහයක තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. • නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත. • භාෂා පරිවර්තක (සිංහල-දෙමළ) තනතුර සම්පූර්ණ කර ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත	• 2024.01.04 දින ලිපි සහයක තනතුරු 05 හි පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. • නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ අනුමැතිය ලබා ගැනීමට 2024.09.08 දිනැතිව රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ ක්‍රියාවලිය සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත. • භාෂා පරිවර්තක (සිංහල-දෙමළ) තනතුර

			ලිපි යොමු කර ඇත. • 2022 වර්ෂයේදී කාර්මික නිලධාරී (සිවිල් හා විදුලි ඉලෙක්ට්‍රානික) තනතුරු 02 සඳහා බඳවා ගැනීමට අතිරේක ප්‍රතිපාදන පිළිබඳව ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත යොමු කල ලිපියට පිළිතුරු ලෙස කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අමතර ප්‍රතිපාදන සලසා දීමේ සීමාවන් සළකා මෙම අවශ්‍යතාව පසුවට සළකා බැලීම සුදුසු බවට 2022.03.04 දිනැතිව අප වෙත යොමු කළ ලිපිය මඟින් යෝජනා කර ඇත. • ජාතික අයවැය චක්‍රලේඛ මඟින් නව බඳවා ගැනීම් සීමා කර ඇත.	සම්පූර්ණ කර ගැනීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපි යොමු කර ඇත. • 2024 වර්ෂයේදී කාර්මික නිලධාරී (සිවිල් හා විදුලි ඉලෙක්ට්‍රානික) තනතුරු 02 සඳහා වැඩබැලීමේ පදනමින් නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත.
13	2023 දෙසැම්බර් 31 දිනට 2023 දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1476 ක් වූ	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙහි	• ලිපි සහයක තනතුරු සඳහා පුරප්පාඩු	• 2024.01.04 දින ලිපි සහයක තනතුරු 05 ක

අතර, කාර්ය තථ්‍ය මණ්ඩලය 1343 ක් වූ බැවින් පුරප්පාඩු 133 ක් නිරීක්ෂණය විය.	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.	සම්පූර්ණ කිරීමට කටයුතු කර ඇත. • මාණ්ඩලික නිලධාරීන්ගේ හා ඒකාබද්ධ සේවාවන්ට අයත් නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත.	පුරප්පාඩු සම්පූර්ණ කර ඇත. • 2024.05.06 දින දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තනතුර සම්පූර්ණ වී ඇත. • 2023.12.31 දිනට පැවති කොමසාරිස් පුරපාඩු 03 සම්පූර්ණ වී ඇත. • 2023.12.31 දිනට පැවති රියදුරු පුරප්පාඩු 01 සම්පූර්ණ වී ඇත.

30. ශීර්ෂය - 228 අධිකරණ පරිපාලන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	15,276,194,966	-	15,276,194,966	තත්ත්වාගණනය කළ
2022	17,206,452,617	-	17,206,452,617	තත්ත්වාගණනය කළ
2023	19,526,959,341	-	19,526,959,341	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය අනුව 2023 දෙසැම්බර් 31 දිනට සිදුවීම් 64 කට අදාළව තවදුරටත් හානි හා පාඩු අයකර ගැනීමට පැවතුණි.	2023 2022 2021	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභහානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම අලාභහානි බොහොමයක් වර්ෂ ගණනාවක් පැරණි ඒවා බැවින්, පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටලු විසඳා ගැනීම හා අවශ්‍ය ක්‍රියාමාර්ග ඒ අනුව ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශයෙහි පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් සිදුවීම් 64 අතුරින් 1 හා 2 සිදුවීම් සම්බන්ධයෙන් වූ අලාභයන් පොත්වලින් කපාහැර ඇත. සිදුවීම් 12, 13 හා 14 අයකර ගැනීම් සිදුකර ඇත. එම සිදුවීම් අතරින් වාහන සම්බන්ධයෙන් වූ අලාභහානි බොහොමයක් රක්ෂණ මඟින් ආවරණය වී ඇත. විගණන විමසුමේ සඳහන් කර ඇති අනෙකුත් අලාභහානි අතුරින් බොහොමයක් වර්ෂ ගණනාවක් පැරණි අලාභ හානි බැවින් ඒවාට අදාළව පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධව පවතින ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි.
02	මහාධිකරණ කලාප 11ක පොදු තැන්පතු ගිණුම් කාලවිශ්ලේෂණයට අනුව වසර 05කට වැඩි කාලයක් සහිතව තැන්පතු ගිණුමේ පවතින මුළු ඇප තැන්පතු ප්‍රමාණය	2023 2022 2021	නිදහස් කළ හැකි තැන්පතු නියමිත පරිදි නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ.	නිදහස් කිරීමට හැකියාව පවතින සියලු රැඳවුම් මුදල් නිදහස් කිරීමටත්, එසේ නොවන්නේ නම් මු.රෙ 571 ප්‍රකාරව රජයේ	දිවයින පුරා පවතින අධිකරණයන්හි පවතින තැන්පතු අතරින් විශාල තැන්පතු ප්‍රමාණයක් නඩු කටයුතුවලට අදාළව පවතී. එම නඩුවලට අදාළව තැන්පතු නිදහස් කරන

	රු.116,077,742ක් ද, ටෙන්ඩර් තැන්පතු ප්‍රමාණය රු.649,173ක් ද, තාවකාලිකව රැඳවුම් තැන්පතු රු.36,282,982ක් සහ කොන්ත්‍රාත් රැඳවුම් රු.1,168,628ක් ද විය.			ආදායමට බැර කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි.	ලෙස තීන්දුව ලබාදෙන තෙක් එම තැන්පත් මුදල් රඳවා ගැනීමට සිදු වේ. තව ද, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම් කිරීමේදී රඳවාගන්නා ලද කොන්ත්‍රාත් රැඳවුම් මුදල් අතරින් ඇතැම් ඉදිකිරීම් මේ දක්වා අවසන්ව නොමැති බැවින්, ඉදිකිරීම් කටයුතු අවසන් වන තෙක් රැඳවුම් මුදල් නිදහස් කළ නොහැකි බැවින් ද, ඇතැම් ඉදිකිරීම් කටයුතු අවසන් වුව ද ස්ථාවර තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලැබෙන තෙක් අවසන් බිල්පත් සඳහා ගෙවීම් කළ නොහැකි බැවින් ද, ඇතැම් ඉදිකිරීම් කටයුතු අවසන් වුව ද, කොන්ත්‍රාත්කරුවන් විසින් අවසන් බිල්පත් ඉදිරිපත් කර නොමැති බැවින් ද, එම රැඳවුම් මුදල් තැන්පත් ගිණුමේ ඉතිරිව පවතී. එසේ වුව ද, නිදහස් කිරීමට හැකියාව පවතින සියළු රැඳවුම් මුදල් නිදහස් කිරීමටත් එසේ නොවන්නේ නම් මු.රෙ. 571 ප්‍රකාරව රජයේ ආදායමට බැර කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස අදාළ නිධාරීන්ට උපදෙස් ලබාදී ඇත.
03	සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහාධිකරණ 03ක නිෂ්කාර්යය කාර්යාල උපකරණ පැවති අතර, ඒවායේ නිෂ්ක්‍රීය කාලය වසර 01 සිට වසර 08 දක්වා විහිදී තිබූ අතර, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 767 පරිදි කටයුතු කර නොතිබුණි.	2023	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මු.රෙ 756 අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල මඟින් නිශ්ක්‍රීය භාණ්ඩ ලෙස නිර්දේශ ලබාදී ඇත්නම් ඒ අනුව ද, පාවිච්චියට ගත හැකි නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් සම්බන්ධයෙන්	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ප්‍රකාරව කටයුතු කරමින් පවතින අතර, අනෙකුත් සියළු වත්කම් අළුත්වැඩියා කර මේ වන විට අධිකරණයේ භාවිතයට ගෙන ඇත.

				මු.රෙ.767(1) හා අදාළ කටයුතු කරන ලෙස අධිකරණ වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි.	
04	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අධිකරණ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් නියමිත පරිදි ඇප තැබිය යුතු වුව ද, මහාධිකරණ කලාප 11ක නිලධාරීන් 65 දෙනෙකු රු.1,450,000ක මුදලක් ඇප වශයෙන් තබා නොතිබුණි.	2023 2022	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව නිලධාරින්ගේ ඇප මුදල් නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	සියලු අධිකරණවල ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශය සතුව නොමැති බැවින්, මේ වන විට අදාළ තොරතුරු කැඳවීම සඳහා සියලු අධිකරණ වෙත දැනුම් දීම සිදුකොට ඇති බව දන්වා තිබුණි.	රාජ්‍ය නිලධාරින්ගේ ඇප තැබීමේ ක්‍රියාවලියේදී සියළු අධිකරණ මගින් එම අධිකරණයේ ඇප තැබිය යුතු යැයි හඳුනාගත් එක් එක් නිලධාරින්ගේ අයදුම්පත්‍ර අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබන අතර, එම අයදුම්පත්‍ර ලියාපදිංචි කිරීම පමණක් අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර, ඇප ලියාපදිංචි කොට අවසානයේ එක් එක් නිලධාරියා වෙනුවෙන් තීරණය කර ඇති ඇප මුදල කොටස් වශයෙන් සෘජුව බැංකුව වෙත ගෙවීම අධිකරණ මගින් සිදු කරනු ලබයි . ඒ අනුව මේ වන විට ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් 482ක් ඇප තබා ඇත.
05	ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තිය ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිත කල්හි ඔවුන්ගෙන් අයවිය යුතු ණය පිළිබඳ විස්තර දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත යොමුකර නිලධාරින්ගේ පරිවර්තික විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදලින් අඩු කළ යුතු බව දක්වා ඇතත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට	2023 2022 2021	ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අය විය යුතු රු.12,735,186ක ණය ශේෂයෙන් රු.563,160ක මුදලක් මේ වන විට නිරවුල් කරගැනීමට හැකි වී ඇත. ඉතිරි ණයශේෂයන් ද නිරවුල්කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, විවිධ හේතූන් මත විශ්‍රාම වැටුප හිමි නොවන	විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අයවිය යුතු රු.12,735,186.82ක ණය ශේෂයක් පැවති අතර, 2024.08.31 දින වන විට එම මුදලින් රු. 2,945,557.00 ක් නිරවුල්කර ගැනීමට හැකිවී ඇත. තව ද, ලිපිගොනුවල අඩුපාඩු පැවතීම, විනය පරීක්ෂණ අවසන් නොවීම වැනි විවිධ හේතූන් මත වර්ෂ 03කට වඩා වැඩි කාලයක සිට අයනොවී පවතින ණය ශේෂ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

	විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණයශේෂය රු.12,135,186ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 03කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ රු. 870,630ක් ද, වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු ණයශේෂ එකතුව රු.243,269ක් ද විය.			නිලධාරින්ගෙන් වාරික වශයෙන් ණය මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. කෙසේ නමුත් විශ්‍රාම ගිය නිලධාරින්ගේ ණයශේෂ ප්‍රතිපාදන නිදහස් කළ වහාම පියවා ගැනීමට කඩිනමින් පියවරගන්නා ලෙස නිලධාරීන් දැනුවත්කර ඇති බව දන්වා තිබුණි.	මඟින් හා ණයකරුවන්, ඇපකරුවන් මඟින් අයකරගැනීමට හැකි බවත්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා බවත් අධිකරණ කලාප මඟින් දන්වා ඇත. ඒ අනුව රු. 478,562.00ක ණය ශේෂයක් වාරික වශයෙන් අයකරගැනීමට හා රු.9,311,067.82ක ණය ශේෂයක් විශ්‍රාම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් අයකරගැනීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවතී.
06	ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 7.2.5 වගන්තිය ප්‍රකාරව වාහන ණය වර්ෂ 05කට වරක් ලබාගත හැකි අතර, එසේ ලබාගැනීමේදී කළින් ලබාගත් වාහන ණය මුදල් සම්පූර්ණයෙන් ගෙවා අවසන්කර තිබිය යුතු වුවත්, එපරිදි කටයුතු නොකර කොළඹ මහාධිකරණ කලාපයේ සේවයකර වැඩ තහනම්කර තිබූ රෙජිස්ට්‍රාර්වරයෙකුට මෝටර්රථ ණය හා බයිසිකල් ණය යන වර්ග දෙකම ලබාදී තිබීම නිසා ඔහුගෙන් රු.107,000ක් වූ මෝටර්රථ ණය හා රු.3,800 බයිසිකල් ණය අයවිය යුතු අතර, එම ශේෂ වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.	2023 2022 2021	ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙය වසර 15කටත් වඩා පැරණි ණයශේෂයක් වන අතර, මහාධිකරණය වෙතින් විමසීමේදී ලිපිගොනු අංක කො/මහාධි/ගි/අත්ති බී/2021 දරන 2021.04.09 හා 2021.10.13 දිනැති ලිපි මඟින් අවධාරණයකර ඇත්තේ මේ නිලධාරියාගේ ණය අයකර ගැනීමට හෝ ඉදිරි කටයුතු කිරීම සඳහා වෙන කිසිදු තොරතුරක් සොයාගත නොහැකි බවත්, මෙවැනි කල්ගත වූ ණයශේෂ සම්බන්ධයෙන් වහාම ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා MOJ/AC/13/39/2024 දරන 2024.04.19 දිනැති ලිපිය මඟින් අවශ්‍ය උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි.	මෙම ණය ශේෂය වසර 15කටත් වඩා පැරණි ණය ශේෂයක් වන අතර, කොළඹ මහාධිකරණය වෙතින් විමසීම් සිදුකළ ද ඊට අදාළ කිසිදු තොරතුරක් සොයාගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව රා.මු.ච. 01/2024 අනුව කපා හැරීමට අනුමැතිය ලබාගැනීම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

07	වැඩ තහනම් කර ඇති නිලධාරින්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලැබිය යුතු ණයශේෂය රු.10,475,575ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 2 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.1,375,612ක් ද, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.2,501,002ක් ද, වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂය රු.1,363,611ක් ද විය.	2023 2022 2021	ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	වැඩ තහනම් නිලධාරීන්ගේ විනය කටයුතු අවසන් වී නොමැති බැවින්, ණයශේෂ අයකර ගැනීමට අපහසු වී ඇති බවත්, බොහෝ අවස්ථාවලදී අදාළ නිළධාරීන් දැනුවත්කර මාසික වාරික වශයෙන් හෝ ණයශේෂය පියවා ගැනීමටත්, ඇපකරුවන්ගේ තොරතුරු පවතින අවස්ථාවලදී ඔවුන්ගෙන් ණය මුදල අයකර ගැනීමටත් කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	වැඩ තහනම් කළ නිලධාරීන්ගේ අයවිය යුතු ණය ශේෂය වශයෙන් රු.10,475,575.01ක් වන අතර, 2024.08.31 දිනට රු.551,306.80ක මුදලක් නිරවුල් කර ගැනීමට හැකි වී ඇත. බොහෝ ණයශේෂයන් ඉතා පැරණි වීම නිසා ණය අයකර ගැනීම සම්බන්ධයෙන් බොහෝ ණය ශේෂවල තොරතුරු එනම් ණයගොනු, පුද්ගලික ලිපි, ජාතික හැඳුනුම්පත් අංක සහ ඇපකරුවන් යනාදී නිසි තොරතුරු අධිකරණ සතුව නොමැති බැවින්, ණයශේෂ අයකරගැනීමට තවදුරටත් පියවරක් ගත නොහැකි වී ඇත. එබැවින් රා.මු.ච. 01/2024 අනුව රු.758,343.90ක ණයශේෂ කපාහැරීම සඳහා කටයුතු කර ඇති අතර, රු.2,292,372.00ක ණයශේෂ කපාහැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තව ද වැඩ තහනම් නිලධාරින්ගේ අයවිය යුතු ඉතිරි රු. 6,873,552.31ක ණයශේෂය ණයකරුගෙන් හා ඇපකරුවන් මඟින් අයකිරීමට පියවර ගනිමින් පවතින බව අධිකරණ කලාප මඟින් දන්වා ඇත.
08	2023 දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් සිටින නිලධාරීන්ගෙන් අයවිය යුතු මුළු ණයශේෂය රු.9,403,611ක් වන අතර, එම ශේෂය තුළ වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට අය විය යුතු	2023 2022	ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය මුදල් වහාම පියවීමට කටයුතු කරන මෙන් අදාළ මහාධිකරණ විසින් සේවය හැරගිය නිලධාරීන් වෙත	සේවය හැර ගිය පුද්ගලයින්ගේ මුළු ණය ශේෂය රු. 9,493,611.38ක් වූ අතර, එයින් රු.466,846.00ක මුදලක් 2024.08.31 දින වන විට නිරවුල්කර ගැනීමට හැකිවී ඇත. බොහෝ ණය ශේෂයන්

	ණයශේෂ එකතුව රු.344,468ක් ද, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂ එකතුව රු.1,471,919ක් ද, වර්ෂ 05කට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු ණයශේෂ එකතුව රු.884,044ක් ද වශයෙන් පැවතුණි.			දන්වා ඇති අතර, ඇපකරුවන් සිටී නම් ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට දන්වා ඇත. ඒ අනුව ඇතැම් නිලධාරීන් වාරික වශයෙන් ණය මුදල් පියවීමට අවස්ථාව ලබාදෙන ලෙස ඉල්ලුම්කර ඇති අතර, ඒ සඳහා මේ වන විට අදාළ අනුමැතීන් ලබාදී ඇති බවත් දන්වා තිබුණි.	ඉතා පැරණි වීම නිසා ණය අයකර ගැනීම සම්බන්ධයෙන් බොහෝ ණය ශේෂවල තොරතුරු එනම් ණයගොනු, පුද්ගලික ලිපි, ජාතික හැඳුනුම්පත් අංක සහ ඇපකරුවන් යනාදී නිසි තොරතුරු අධිකරණ සතුව නොමැති බැවින් ණයශේෂ අයකරගැනීමට තවදුරටත් පියවරක්ගත නොහැකි වී ඇත. එබැවින් රා.මු.ච. 01/2024 අනුව රු. 685,969.75ක ණය ශේෂ කපාහැරීම සඳහා කටයුතු කර ඇති ඇති අතර, රු.1,608,916.00ක ණයශේෂ කපාහැරීම සඳහා අනුමැතිය ලබාගැනීමට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. තව ද වැඩ තහනම් නිලධාරීන්ගේ අයවිය යුතු රු.6,731,879.63ක ඉතිරි ණයශේෂය ණයකරුගෙන් හා ඇපකරුවන් මඟින් අය කිරීමට පියවර ගනිමින් පවතින බව අධිකරණ කලාප මඟින් දන්වා ඇත.
09	2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලසීමාව තුළ ඉදිකිරීම් ව්‍යාපෘති 16කට අදාළව කොන්ත්‍රාත්කරුවන් වෙත ලබාදී තිබූ වැඩ අත්තිකාරම්වලින් රු.301,050,923ක ශේෂයක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් අය වී නොතිබුණු අතර, එහි ඇතුළත් ව්‍යාපෘති 03කට අදාළව ලබාදී තිබූ රු.48,599,924 ක අත්තිකාරම් මුදලින් කිසිදු ශේෂයක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන	2023 2022	බාහිර පාර්ශවයන් වෙත ලබාදී ඇති මුදල් කඩිනමින් අයකර ගත යුතුය.	ව්‍යාපෘතිවලට අදාළව අයවිය යුතු අත්තිකාරම් මුදල් ඒ ඒ ව්‍යාපෘතිවලට අදාළ බිල්පත් ගෙවීම් සිදු කිරීමේදී කර ඇති වැඩ වටිනාකම අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(iii) ප්‍රකාරව පිළිවෙලින් අයකිරීම් සිදු කරනු ලබන බව දන්වා තිබුණි.	අනුරාධපුර අධිකරණ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාදී ඇති අත්තිකාරම් මුදලින් 2023.12.31 දිනට අයවිය යුතුව තිබූ මුදල වන රු.6,503,988.60ක මුදලින් මෙම වර්ෂයේදී රු.1,829,488.58ක මුදලක් අයකර ගෙන ඇති අතර, තවදුරටත් රු.4,674,500.02ක් අයවීමට පවතී. එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් වූ අවසන් බිල්පත කොන්ත්‍රාත්කරු විසින් මේ වන තෙක් ගෙවීමට

	නොතිබුණි.				ඉදිරිපත් කර නොමැති අතර, එම බිල්පත කඩිනමින් ඉදිරිපත් කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. ඒ සඳහා කොන්ත්‍රාත්කරු ප්‍රතිචාර නොදක්වන්නේ නම් රැඳවුම් මුදලින් මෙම අයවිය යුතු අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කරනු ලැබේ. විමසුමෙන් දක්වා ඇති පූගොඩ හා ගාල්ල අධිකරණ සංකීර්ණ ඉදිකිරීමේ ව්‍යාපෘතිවලට අදාළව ගෙවා ඇති අත්තිකාරම් මුදලින් පිළිවෙලින් රු.13,023,234.48ක් හා රු.30,656,378.08 ලෙස අත්තිකාරම් මුදල් තව දුරටත් අය විය යුතුව ඇත. එම ව්‍යාපෘතිවලට හා අනෙකුත් සිදුකර ගෙන යනු ලබන අත්තිකාරම් ලබාදී ඇති සියළු ව්‍යාපෘතිවලට අදාළව අයවිය යුතු අත්තිකාරම් මුදල් ඒ ඒ ව්‍යාපෘතිවලට අදාළ බිල්පත් ගෙවීම් සිදු කිරීමේදී කර ඇති වැඩ වටිනාකම අනුව ප්‍ර.මා.ස. 5.4.4(111) ප්‍රකාරව පිළිවෙලින් අය කිරීම් සිදු කරනු ලැබේ.
10	සමාලෝචිත වර්ෂය අවසානයේදී දෙපාර්තමේන්තුව සඳහා අනුමත මුළු කාර්ය මණ්ඩලය 5256ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 4458ක් වූයෙන් නිලධාරීන් 798ක පුරප්පාඩු පැවතුණි.	2023 2022	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.	මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ 01/2023 ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය	අධිකරණ සඳහා කාර්ය මණ්ඩල අනුයුක්ත කිරීම අධිකරණ සේවා කොමිෂන් සභාව සහ අධිකරණ අමාත්‍යාංශය මඟින් සිදු කරයි. මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛ 01/2023

				යටතේ රාජ්‍ය සේවයට බඳවාගැනීමට නොහැකි වී ඇති අතර, බඳවාගැනීම් සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත්කර අනුමැතිය ලද තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	ප්‍රකාරව රාජ්‍ය වියදම් කළමනාකරණය යටතේ රාජ්‍ය සේවයට බඳවාගැනීමට නොහැකි වී ඇති අතර, බඳවා ගැනීම සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලද තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.
11	ළමුන්ගේ සාක්ෂි විවෘත අධිකරණයෙන් ලබානොගෙන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා මගින් ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ඇමතුම් කට්ටල 26ක් ලබාගැනීමට රු.48,589,772ක් හා පුවත්පත් දැන්වීම් වශයෙන් රු.118,827ක වියදම් දරා තිබුණ ද, විගණිත දින වන විටත් අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.	2022	ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුකල යුතුය.	වීඩියෝ ඇමතුම් තාක්ෂණ කට්ටල 26 මිලදීගෙන මෙම අමාත්‍යාංශය යටතේ වූ අවශ්‍යතාවය සඳහා උපකරණ සවිකිරීම සිදුකරන ලද බවත්, ළමා ආරක්ෂක අධිකාරිය සමඟ සාක්ෂි ලබාගැනීමට සුදුසු ස්ථාන පිළිබඳව අවසන් නිගමනයකට පැමිණීමට නොහැකි වීමෙන් මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇති බව දන්වා තිබුණි.	මෙම කාර්යයට අදාළ ක්‍රියාකාරකම් විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති යටතේ සිදු කිරීමට මේ වන විට අවශ්‍ය කටයුතු කරමින් පවතී. ඒ අනුව, නියමු ව්‍යාපෘතිය ලෙස මහනුවර මහාධිකරණය වෙත යටිතල පහසුකම් සපයාදී ඇති අතර, එහිදී ළමයාට සාක්ෂි ලබාදීම සඳහා එම මහාධිකරණයෙහි ම වෙනත් පරිශ්‍රයක් ස්ථාපිතකර ඇති අතර ඒ සඳහා උපාංග සපයා ඇත. එසේ ම ළමා අපචාර හා වෙනත් නඩු සම්බන්ධයෙන් විශේෂඥ සාක්ෂි ලබාදීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සහ මහනුවර ජාතික රෝහලට ද අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක ඇතුළු අනෙකුත් පහසුකම් ලබාදී ඇත. එම කාර්ය අවසානයේ ළමා අපචාර නඩු බහුල අනෙකුත් අධිකරණ සඳහා ද මෙම ව්‍යාපෘතිය දීර්ඝ කරනු ලැබේ.

31. ශීර්ෂය- 229 නීතිපති දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,604,656,352	60,333,865	2,544,322,487	තත්ත්වාගණනය කළ
2022	2,738,510,477	31,756,272	2,706,754,205	තත්ත්වාගණනය කළ
2023	2,790,240,815	34,268,628	2,755,972,187	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මුදල් රෙගුලාසි 128(2)(ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ ආදායම රු.324,716,556 ක් වූ අතර, එම හිඟ ශේෂය තුළ වර්ෂ 10ට වැඩි රු.105,441,141ක් ද, වර්ෂ 7-9 දක්වා රු.38,786,239ක් ද, වර්ෂ 4-6ත් අතර රු.35,561,472ක් ද සහ වර්ෂ 1-3 දක්වා රු.56,669,736ක් ද ඇතුළත්ව තිබුණි.	2023 2022 2021	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීමට කටයුතු කළ යුතුය.	2023 වර්ෂයේ ගාස්තු ඉහළ නැංවීම හේතුවෙන් පෙර වර්ෂවලට සාපේක්ෂව මුළු හිඟ ආදායම ඉහළ අගයක් ගන්නා බව ද, හිඟ ආදායම් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන අතර, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ණයශේෂ පිළිබඳ සාකච්ඡාවක් 2024 මාර්තු 25 වන දින පැවැත් වූ අතර, මෙම ණයශේෂ ගෙවීම සඳහා අදාළ ආයතන භාර අමාත්‍යාංශ ලේකම්වරු දැනුවත් කරන බව ද, දන්වා තිබුණි.	අධිකරණ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී අදාළ ආයතන දැනුවත් කර හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
02	හිඟ ආදායම් උපලේඛනය අනුව 2005 වර්ෂයේ සිට ලබාදුන් සේවාවන් සඳහා ගාස්තු අයකර ගැනීමකින් තොරව ආයතන 13 ක් සඳහා නැවත නැවත සේවා සැපයීම හේතුවෙන් 2005 වර්ෂයේ සිට 2023	2023	හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීමට කටයුතු කළ යුතු ය.	දීර්ඝ කාලයක සිට හිඟ ණය මුදල් නොගෙවා ඇති ආයතන නැවත නඩු කටයුතු සඳහා යොමු වන තත්වයක් තුළ නඩු ප්‍රතික්ෂේප කළ නොහැකි බැවින්, නැවත නැවතත් සේවා සැපයීමට සිදුව ඇති බව දන්වා තිබුණි.	අධිකරණ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී අදාළ ආයතන දැනුවත් කර හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

	වර්ෂය දක්වාම රු.35,519,200 ක සේවා සැපයුම් ගාස්තු අයවීමට තිබුණි.				
03	මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව හිඟ මුදල් සම්බන්ධයෙන් අප්‍රමාදව නීති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණ ද, ආයතන 60 කින් රු.6,777,170ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට වසර 03 සිට වසර 18 ක පමණ කාලයක් ගත වී තිබුණ ද, ඒ පරිදි කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	2023 2022	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	අදාළ ආයතන 60 සම්බන්ධයෙන් ද ණයශේෂ අයකර ගැනීමට අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග අනුව කටයුතු කිරීමට සහ මෙම වර්ෂය තුළ වසර 10ට වැඩි ණයශේෂ අය කරගැනීම සඳහා ප්‍රමුඛතාවයක්දී කටයුතු කිරීමටත්, අතිරේක ක්‍රියාමාර්ග අනුගමනය කිරීමටත් කටයුතු යොදා ඇති බව දන්වා තිබුණි.	අධිකරණ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වී අදාළ ආයතන දැනුවත් කර හිඟ ආදායම් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
04	2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, රැස්කිරීම, අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයේ 04 ඡේදය පරිදි ආදායම් පරිපාලනය හා ගිණුම්කරණය වැඩිදියුණු කිරීම සඳහාත්, අධීක්ෂණ කටයුතු සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහාත් ක්‍රමවත් පරිදි වාර්තා පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වන අතර, එහි සඳහන් (අ), (ආ) සහ (ඉ) පරිදි කටයුතු කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	2023	යොමුගත චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු ය.	ඉදිරියේදී අදාළ චක්‍රලේඛ පරිදි ක්‍රමවත්ව වාර්තා තබාගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	අදාළ චක්‍රලේඛ පරිදි වාර්තා ක්‍රමවත්ව පවත්වා ගැනීමට කටයුතු කර ඇත.
05	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි	2023	2018 අංක 19 දරන ජාතික විගණන	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර	මූල්‍ය පාලනය සඳහා සඵලදායී

	අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2022	පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	විගණකගේ ලිපියෙන් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට යෝජිත කරුණු ඇතුළත් වාර්තාවක් සකස්කර ගණන්දීමේ නිලධාරී වෙත ඉදිරිපත්කර ඇති අතර, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් සමාලෝචන කටයුතු සිදු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි .	අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වාගෙන යාමට යෝජිත වාර්තාවේ ඇතුළත් කරුණු සම්බන්ධයෙන් සමාලෝචනයන් සිදු වෙමින් පවතී.
06	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වග බලාගත යුතු වුවත්, එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි.	2023 2022	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ප්‍රමාදයන් සිදු වී ඇති බවත්, ඉදිරියේදී අදාළ කාලවකවානු තුළ එම වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	ඉදිරියේදී අදාළ කාලවකවානු තුළ එම වාර්තා ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
07	2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන චක්‍රලේඛය ප්‍රකාරව	2023 2022	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තුවේ පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සකස්කර අනුමැතිය සඳහා 2024 පෙබරවාරි 13 දින	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය සකස්කර ඇත.

	දෙපාර්තමේන්තුවේ මේ දක්වා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීම සිදුකර නොතිබුණි.			අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව දන්වා තිබුණි.	
08	නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. මිලියන 10ක් වෙන්කර තිබුණ ද, කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.	2023	ක්‍රියාකාරී සැලැස්ම අනුව කාර්යයන් සඳහා වෙන්කළ මුදල් උපයෝජනය කළ යුතු ය.	පිළිතුරු ලබාදී නොමැත.	2024 වර්ෂයට අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා පමණක් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කර ඇත.
09	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස්කර මුදල් වර්ෂය අවසාන වී දින 150ක් ගතවීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු වුවත්, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව මාස 05 දින 06 ක කාලප්‍රමාදයක් සහිතව 2023 නොවැම්බර් 06 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	2023 2022	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කළයුතු ය .	ප්‍රමාද දෝෂයකින් 2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර, ඉදිරියේදී නියමිත දිනට වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ඉදිරි වාර්තාවන් නියමිත දිනට ඉදිරිපත් කරනු ඇත.
10	2020 අගෝස්තු 08 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම තුළ	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ	චක්‍රලේඛය අනුව පිළියෙල කළ යුතු ප්‍රසම්පාදන සැලසුමට ලිපිද්‍රව්‍ය මිලදී ගැනීම් ඇතුළත්කර නොමැති බැවින්, ලිපිද්‍රව්‍ය මිලදී	2024 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට පුනරාවර්තන වියදම් සැලසුම ඇතුළත්

	පුනරාවර්තන වියදම් ඇතුළත්කර නොතිබුණු අතර, දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 31 දින දක්වා අවස්ථා 06 කදී රු.3,550,442 ක් වැයකර A4 වර්ගයේ ඡායාපිටපත් කඩදාසි පැකට් 2350 ක් මිලදීගෙන තිබුණි. ඊට අමතරව 2023 පෙබරවාරි සිට ඔක්තෝබර් මාසය දක්වා වාර 13කදී රු.854,550 ක මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර් මිලදීගැනීම් සිදුකර තිබුණි. තව ද, ඊට අදාළ ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.1 ප්‍රකාරව මුද්‍රා තබන ලද කවරයක් යටතේ ඉදිරිපත්කර නොතිබුණු අතර, එම ලංසු ලේඛනයන්හි ලැබීමේ දිනය ද, මුද්‍රා තබා නොතිබුණි.		යුතු ය.	ගැනීම් ඇතුළත් නොකළ අතර, ටෝනර් මිලදී ගැනීම් හදිසි අවශ්‍යතා මත මිලදී ගැනීමට කටයුතු කර ඇති අතර, එක් ඇණවුමක වටිනාකම රු.100,000කට වඩා අඩු මිලදී ගැනීම් වේ. තව ද ගබඩාවේ පවතින ඉඩකඩ සීමිත බැවින් හා එක්වරකට ගබඩාකර තිබිය හැක්කේ මාස දෙකකට (2) අවශ්‍ය ඡායාපිටපත් කඩදාසි පමණක් බව දන්වා තිබුණි.	කර ඇති අතර, ප්‍රසම්පාදනයන් අදාළ චක්‍රලේඛ ප්‍රකාරව හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලබයි.
11	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1(ඇ) වගන්තිය ප්‍රකාරව මුල් ඇණවුම් කිරීමෙන් පසු භාණ්ඩවල මිල ගණන් අඩු වී නොමැති පසුබිමක කෙටි කාලයක් තුළ මුල් සැපයුම්කරු වෙතින් නැවත ඇණවුම් කිරීමට හැකි නමුත්, වෙළෙඳපොළ මිල ගණන් සැසඳීමකින් තොරව අවස්ථා 04කදී රු.1,466,090ක A4 වර්ගයේ ඡායාපිටපත් කඩදාසි පැකට් 950ක් මුල් සැපයුම්කරුගෙන්	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය .	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6.1 වගන්තිය ප්‍රකාරව, මුල් ඇණවුමේ සිට සයමසක කාලයක් තුළ නැවත එකම භාණ්ඩ මුල් සැපයුම්කරුගෙන් ඇණවුම් කළ හැකි බැවින් කෙටි කාලසීමාවක් තුළ මුල් ඇණවුම් සැපයුම්කරු වෙතින් ඇණවුම් කිරීම් සිදුකර ඇති බව දන්වා තිබුණි.	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලබයි.

	ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර තිබුණි.				
12	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 4.2.1 ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.	2023 2022	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය .	වසර 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙළකර නොමැති අතර, ඉදිරියේදී ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමක් පිළියෙල කරන ලෙස විෂයභාර නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලද බව දන්වා තිබුණි.	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලබයි.
13	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ ඡේද අංක 3.4.3 ප්‍රකාරව ආර්ථික වශයෙන් දැන්වීම් පළ කිරීම අවාසි සහගත අයිතමන් ප්‍රසම්පාදනය කිරීම සඳහා අවම වශයෙන් වසරකට වරක් යාවත්කාලීන කරන ලද ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	2023	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය .	ඉදිරියේදී සැපයුම්කරුවන් ලියාපදිංචි කරගැනීමටත්, සැපයුම්කරුවන්ගේ ලේඛනයක් පවත්වාගෙන යාමටත් විෂයභාර නිලධාරීන් වෙත උපදෙස් ලබාදෙන ලද බව දන්වා තිබුණි.	යොමුගත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලබයි.
14	බිම් මහලේ හා පළමු මහලේ වැසිකිළි පද්ධතියෙහි වැසිකිළි උපාංග අස්ථානගත වී තිබුණු අතර, 11 වන මහලේ භෝජනාගාරයේ පවතින වීදුරු දොරක් විනාශ වී ඇති බවත්, එහි බිම අතුරා ඇති ටයිල් පිපිරීමට ලක්ව ඇති අතර, මෙම පාඩු/හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) හා 104(1) ප්‍රකාරව කටයුතුකර නොතිබුණි.	2023	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	නව ගොඩනැගිල්ලේ සිදුව ඇති හානි හා පාඩු සම්බන්ධයෙන් අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට උපදෙස් ලබාදෙන ලද දන්වා තිබුණි.	අදාළ හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.

15	දෙපාර්තමේන්තුව විසින් නියමිත දිනට විදුලි බිල්පත් නොගෙවීම හේතුවෙන් මාසික පරිභෝජන වියදමට අමතරව එකතුව රු.372,759ක් වූ පොළී මුදලක් ගෙවා තිබුණි.	2023 2022 2021	විදුලි බිල්පත් ගෙවීමේදී පොළියක් නොගෙවන ආකාරයට නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු ය.	අදාළ අක්මුදල් නියමිත දිනට නොලැබීමෙන් විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් පොළී මුදලක් එකතු වන අතර, ඉදිරියේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා තිබුණි .	නියමිත දිනට පෙර බිල්පත් ගෙවා නිම කිරීමට කටයුතු යොදා ඇත.
16	සේවය හැර ගිය නිලධාරීන් 04 දෙනෙකුගේ රු.485,842 ක හා වැඩ තහනම් කිරීමට ලක්ව ඇති නිලධාරීන් 03 දෙනෙකුගේ රු.164,560ක හිඟ ණයශේෂයන් වසර 10කට වැඩි කාලයක් අය නොවී පැවතුණි.	2023 2022	ණයශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය .	අදාළ නිලධාරීන්ගේ ණය අයකර ගැනීම සඳහා නඩු පැවරීමට නීති අංශය වෙත ණයගොනු ඉදිරිපත්කර ඇති බව දන්වා තිබුණි.	අයකර ගත හැකි හිඟ ණය අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ණයකරුවන් සොයා ගැනීමට නොමැති හිඟ ණය කපා හැරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.
17	2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන තිබුණ ද, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා වන ඉලක්ක හඳුනාගෙන නොතිබුණු අතර, එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන	2023 2022	යොමුගත ලිපිය ප්‍රකාරව කටයුතු කළ යුතු ය .	තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීම සඳහා නිලධාරීයෙකු පත් කිරීමට කටයුතු කරන ලද අතර, හඳුන්වාදී ඇති අරමුණ ඉටුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශ පිහිටුවා විවිධ ක්‍රියාමාර්ග ගනු ලබන අතර, ඉදිරියේදී තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව ද දන්වා තිබුණි.	අදාළ ලිපිය ප්‍රකාරව කටයුතු කෙරෙමින් පවතී.

	වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි.				
18	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 1295ක් වුව ද, තථ්‍ය කාර්ය මණ්ඩලය 671ක් වූයෙන් නිලධාරීන් 624ක පුරප්පාඩු පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 48ක ප්‍රමාණයක් විය.	2023 2022	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු ය .	නවක රජයේ අධිනීතිඥවරුන් 25 දෙනෙකු බඳවාගැනීමට 2024 වර්ෂය තුළදී සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන්කර ඇති අතර, අනෙකුත් පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදීම දැනුම්දී ඇති බව දන්වා තිබුණි.	පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
19	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 523ක් පැවතිය ද, 2023 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 671ක් වූයෙන් නිලධාරීන් 624ක පුරප්පාඩු පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 48ක ප්‍රමාණයක් විය.	2023 2022 2021	පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය .	නවක රජයේ අධිනීතිඥවරුන් 25 දෙනෙකු බඳවාගැනීමට 2024 වර්ෂය තුළදී සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන්කර ඇති අතර, අනෙකුත් පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදීම දැනුම්දී ඇති බව දන්වා තිබුණි.	පුරප්පාඩු 50 ක් සම්පූර්ණ කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අවසන් කර ඇත.
20	තෘතීයික හා ද්විතීක මට්ටමේ තනතුරු සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 15ක් හා 354ක් වුව ද, 2023 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය පිළිවෙලින් 07ක් හා 157ක් වීම හේතුවෙන් තෘතීයික හා ද්විතීක මට්ටමේ නිලධාරීන්	2023 2022	පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය.	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදීම දැනුම්දී ඇති බව දන්වා තිබුණි.	රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් පරිදි විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

	205ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 56ක අගයක් විය.				
21	ප්‍රාථමික මට්ටමේ අනුමත තනතුරු 403ක් වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය 292ක් වීම හේතුවෙන් නිලධාරීන් 111ක පුරප්පාඩුවක් පැවතුණි. එය අනුමත කාර්ය මණ්ඩලයට සාපේක්ෂව සියයට 28ක අගයක් විය.	2023 2022	පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය.	පුරප්පාඩු සම්පූර්ණ කරගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිසම හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත අවස්ථා කිහිපයකදීම දැනුම්දී ඇති බව දන්වා තිබුණි.	පුරප්පාඩු 50 ක් පමණ පිරවීමට කටයුතු කර ඇත.
22	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස්කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියට ඉදිරිපත්කර ඇති නමුත්, විගණිත වාර්තාවේ දිනය වන තෙක් එය අනුමතකර නොතිබුණු අතර, චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම අවසන්කර නොතිබුණි.	2023 2022 2021	යොමුගත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ වන විට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි.	2024 හා 2025 වර්ෂ සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කෙරෙමින් පවතී.

32. ශීර්ෂය - 230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	116,445,245	7,050	116,438,195	තත්ත්වාගණනය නොකළ
2022	112,407,240	-	112,407,240	තත්ත්වාගණනය කළ
2023	110,198,451	62,310	110,136,141	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර ඇති කාර්යසාධන වාර්තාව අනුව 2023 ජනවාරි 01 දිනට කෙටුම්පත් වශයෙන් භාරදී නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් 297ක් සහ 2023 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 100ක් වූ මුළු ඉල්ලීම් 397න් දීර්ඝකාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු 105ක් විය.	2023 2022	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කළ යුතු ය.	2023 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් 100 ක් සහ නීතිපති හෝ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙතින් නිරීක්ෂණ හා උපදෙස් බලාපොරොත්තුවෙන් ඉතිරිව පවතින ඉල්ලීම් 297 ක් වූ මුළු ඉල්ලීම් 397 න් දීර්ඝකාලීනව උපදෙස් නොමැතිව වසන ලද ගොනු 105 ක් පවතින බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට කටයුතු කරමින් පවතී.
02	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150ක් ගතවීමට ප්‍රථම සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 ඔක්තෝබර් 03 දින	2023 2022	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.	ඉදිරියේදී නියමිත කාලපරිච්ඡේදය තුළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.

	පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණි. 2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.				
03	2023 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 149 ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 86 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 63 ක් විය. එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 42ක ප්‍රතිශතයක් විය.	2023 2022 2021	තනතුරුවල පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි.	පුරප්පාඩු පැවතීම කාර්යසාධනය කෙරෙහි බලපාන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය.	තනතුරුවල පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

33. ශීර්ෂය - 231 ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	13,224,792	-	13,224,792	තත්ත්වාගණනය කළ
2022	13,510,269	-	13,510,269	තත්ත්වාගණනය කළ
2023	14,205,022	-	14,205,022	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2019 අංක 04 දරන ණය සහනදායක (සංශෝධන) පනතෙහි 8(3) වගන්තිය ප්‍රකාරව නීතිඥවරයෙකු ලෙස අවුරුදු 10 කට නොඅඩු වෘත්තීය අත්දැකීම් සහිත හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ හෝ දීපව්‍යාප්ත සේවයක 1 වන ශ්‍රේණියේ ධූරයක තනතුරක් දරන හෝ දරා ඇති තැනැත්තන්ගෙන් මණ්ඩල සාමාජිකයන් සමන්විත විය යුතු වුව ද, එයට පරිබාහිරව ගාල්ල ශාඛා මණ්ඩලයට එක් සාමාජිකයකු 2022 අගෝස්තු 22 දින පත්කර තිබුණු අතර එම සාමාජිකයාගේ පත්වීම 2024 පෙබරවාරි 08 දින දක්වා දීර්ඝකර තිබුණි.	2023	යොමුගත පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මණ්ඩලයේ සියලු පත්කිරීම් සිදුකරනුයේ අධිකරණ අමාත්‍යතුමා බැවින් මේ සම්බන්ධව පිළිතුරු ලබාදිය නොහැකි බව දන්වා තිබුණි.	මණ්ඩලයේ සියලු පත්කිරීම් සිදුකරනුයේ අධිකරණ අමාත්‍යතුමා බැවින් මේ සම්බන්ධව පිළිතුරු ලබාදිය නොහැකි බව දන්වා තිබුණි.

02	2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කාර්යාලයේ 162 ක් ද,කොළඹ ශාඛාවේ 159 ක් ද, ගම්පහ ශාඛාවේ 383 ක් ද, ගාල්ල හා කුරුණෑගල ශාඛාවල පිළිවෙලින් 212 ක් හා 241 ක් ලෙස එකතුව 1157 ක් වූ අයදුම්පත් සංඛ්‍යාවක් විසඳීමට ඉතිරි වී තිබුණි.	2023	නඩු විසඳීමට කඩිනම් පියවරගත යුතුය.	2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සියයට 44 ක් වූ අතර, 2023 වර්ෂයේදී එය සියයට 49 ක් බව දන්වා තිබුණි.	1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අනුව දෙපාර්ශවය සමථයට පත් කිරීම ණය සහන මණ්ඩලයේ කර්තව්‍ය වුවත්, සමථයකින් පසුව ද මුදල් ගෙවා අවසන් වන තුරු අදාළ ලිපිගොනු වසා නොදැමීම නිසා නඩු සංඛ්‍යාව ඉහළ අගයක් ගෙන තිබුණි.
03	2009 වර්ෂය දක්වා භාර ගන්නා ලද 2023 දෙසැම්බර් 31 දින වන විට ද, නොවිසඳුණු නඩුගොනු 12 ක් තිබුණු අතර, මේ තුළ විමසීම සඳහා කාලය ලබාගන්නා ලද නඩුගොනු සංඛ්‍යාව 07 ක් විය. ඒ අනුව වසර 14 කට අධික කාලයක සිට නොවිසඳී පැවත එන නඩුගොනු පවතින බව නිරීක්ෂණය විය.	2023	නඩු විසඳීමට කඩිනම් පියවරගත යුතුය.	මේ සම්බන්ධව ප්‍රධාන මණ්ඩලයෙන් හා ශාඛා මණ්ඩලවල සභාපතිවරුන් ලිඛිතව දැනුවත් කර එම නඩුගොනු ඉක්මනින් විසඳීම සඳහා යෝජනා හා අදහස් විමසා ඇති බව දන්වා තිබුණි.	සභාපතිවරුන්ගෙන් පිළිතුරු විමසා ලිපි යවා ඇත.
04	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද, රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011	2023 2022 2021	යොමුගත මුදල් රෙගුලාසි 880 හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු ය.	නිලධාරීන්ගේ ඇප අයදුම්පත්‍ර ඉදිරි කටයුතු සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි.	නිලධාරීන්ගේ ඇප අයදුම්පත්‍ර ඉදිරි කටයුතු සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇත.

	ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් 12 දෙනෙකු ඇප තබා නොතිබුණි.				
05	2022 වර්ෂයේ අගෝස්තු මාසයේ ප්‍රධාන කාර්යාලයේ ද, 2023 නොවැම්බර් මාසයේ ප්‍රධාන කාර්යාලය ඇතුලු සියලුම ශාඛා කාර්යාලවල ද නඩුගොනු අතින් ගණන්කර තිබුණු අතර, එහිදී ලේඛනගත තොරතුරුවලට වඩා 2022 වර්ෂයේ නඩුගොනු 248 කින් ද, 2023 වර්ෂයේ නඩුගොනු 221 කින් ද, වැඩි වී තිබුණි. ඒ අනුව, 2023 වර්ෂයේ අතින් ගණන් කිරීම නිසා ප්‍රධාන කාර්යාලයේ නඩුගොනු 83 කින් ද, කොළඹ හා ගම්පහ ශාඛාවල පිළිවෙලින් 48 කින් හා 84 කින් ද, වැඩිවීමක් සිදු වී තිබුණි. මෙසේ වරින් වර ගණන් කිරීමේදී ලේඛනගත තොරතුරු හා භෞතික තොරතුරු එකිනෙකට වෙනස් වීම මත ලිපිගොනු නඩත්තුව සඳහා නිසි අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වාදී නොතිබුණු බව නිරීක්ෂණය විය.	2023 2022	නිසි දත්ත පද්ධතියක් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය.	UNDP ආයතනය විසින් නව දත්ත පද්ධතියක ආකෘතියක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	UNDP ආයතනය විසින් නව දත්ත පද්ධතියක ආකෘතියක් ලබාදීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා ඇති අතර, ඒ වන තෙක් ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව, විසඳුම් ලබාදුන් ඉල්ලුම්පත් සංඛ්‍යාව, මුදල් ගෙවා අවසන් කළ ඉල්ලුම්පත් සංඛ්‍යාව සහ ඉතිරිව ඇති ඉල්ලුම්පත් සංඛ්‍යාව වශයෙන් කාණ්ඩවලට වෙන්කොට පවත්වාගෙන යනු ලැබේ.

06	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් සිදු කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් ලෙස වුව ද, ජ්‍යෙෂ්ඨ මට්ටම තුළ ඇතුළත් ගණකාධිකාරී තනතුර 2021 මාර්තු 17 වන දින සිට පුරප්පාඩුව පවතින අතර, අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් මෙම තනතුරෙහි වැඩ බැලීම සිදු කරනු ලබයි.	2023 2022	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම පුරප්පාඩුව සම්පූර්ණ කරගැනීම සඳහා මාගේ සමාංක 3/1/24 හා 2023.09.01 දිනැතිව ලිපියක් යොමු කරමින් ඉල්ලීම්කර ඇතත්, මේ වන විට ස්ථාන මාරු කළ හැකි ගණකාධිකාරී සේවයේ III/I ශ්‍රේණියේ නිලධරයන් නොමැති බව දන්වා ඇත.	ගණකාධිකාරී සේවයේ තනතුරු සඳහා බඳවාගැනීම් කර නොමැති බැවින් මෙම දෙපාර්තමේන්තුව සඳහා ස්ථාන මාරු කළ හැකි නිලධාරීන් නොමැති බව දන්වා ඇත.
07	ද්විතීක මට්ටම තුළ ඇතුළත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 18 ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 19 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 01ක් වී තිබුණු අතර, කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 15 ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06 ක් වූයෙන් පුරප්පාඩු 09 ක් පැවතුණි. තව ද, ලඝුලේඛක තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 06 ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 03 ක් වූයෙන් පුරප්පාඩු 03 ක් පැවතුණි.	2023 2022 2021	සේවක පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමටත් අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වේ අනුමැතිය ලබාගැනීමටත් කටයුතු කළ යුතුය.	සංවර්ධන නිලධාරීන් 03 ක් අධිකරණ අමාත්‍යාංශයෙන් තාවකාලික අනුයුක්තිය මත ලබාදී ඇති බැවින්, සංවර්ධන නිලධාරී තනතුරු 02 ක් පුරප්පාඩුව පවතින අතර, කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා පුරප්පාඩු 09 ක් ද, ලඝුලේඛක තනතුර සඳහා තථ්‍ය සේවක නිලධාරීන් තිදෙනකු තාවකාලික අනුයුක්තීන් මත සේවය කරනු ලබන බැවින්, ලඝුලේඛක තනතුරෙහි පුරප්පාඩු 06 එලෙසම පවතින අතර, මේ වන විට බඳවා ගැනීම සඳහා කටයුතු සිදු කරන බව දන්වා තිබුණි.	සංවර්ධන නිලධාරී තනතුරෙහි පුරප්පාඩු 02 එලෙසම පවතින අතර, කළමනාකරණ සේවයේ පුරප්පාඩු 09 ද, එලෙසම පවතී. පුරප්පාඩුව පවතින ලඝුලේඛක තනතුරු 06 සඳහා ගැසට් පත්‍රයේ දැන්වීම් පළකර අයදුම්පත් කැඳවා විභාගය පැවැත්වීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

34. ශීර්ෂය - 232 බන්ධනාගාර දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	9,989,413,277	155,802,657	9,833,610,620	තත්ත්වාගණනය කළ
2022	10,442,906,075	140,278,748	10,302,627,328	තත්ත්වාගණනය කළ
2023	11,475,916,674	147,863,062	11,328,053,612	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වර්ෂය තුළ ක්‍රියාත්මක වන සත්‍ය ක්‍රියාකාරකම් හඳුනානොගෙන නාමමාත්‍රික (Dummy) ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන තක්සේරු කර තිබුණි. පසුව සත්‍ය ක්‍රියාකාරකම් අනුව වර්ෂය අවසානයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර තිබුණි. මේ අනුව අස්ථිත්වය විසින් සිදු කරනු ලබන සියලුම කාර්යයන් (භාණ්ඩ, සේවා හා ව්‍යාපෘති) පූර්ණය කිරීමට යොදාගන්නා කළමනාකරණ මෙවලමක් වශයෙන් ක්‍රියාකාරී සැලැස්ම උපයෝගී කරගැනීමට නොහැකිව තිබුණු අතර, සකසුරුවමින්, කාර්යක්ෂමව හා ඵලදායී පරිදි කාලානුරූපී ආකාරයට සැලසුම් සම්පාදනය කිරීමේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට ද නොහැකි වී තිබුණි.	2023 2021	රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු ය.	මෙලෙස ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ වැය විෂයය 2001, 2002, 2003 ට වන අතර, එයට අදාළ කාර්යයන් හඳුනාගෙන ඊට අදාළ වැය ඇස්තමේන්තු මත පදනම්ව නොව, ආයතනයට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් ඒ සඳහා අදාළ කරගනු ලබන්නේ අදාළ ක්‍රියාත්මක බලධාරීත්වය විසින් පසුගිය වසරවල පළපුරුද්ද මත පදනම්ව ආයතන වෙත වැය වෙතැයි අපේක්ෂිත මුදලකට සරිලන ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කෙරේ. මන් ද	2022 වසරේ පටන් බන්ධනාගාර ආයතනයන් වෙත ප්‍රතිපාදන වෙන් කිරීම වෙනුවට වර්ෂය මුලම ක්‍රියාකාරකම් හඳුනාගැනීම සිදු කරන අතර, ක්‍රියාකාරී සැලැස්ම අනුමැතියේදී ම එම ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමට පියවරගන්නා ලදී. බන්ධනාගාර ආයතන සියල්ලම පාහේ ඉතා පැරණි හා හදිසි පුනරුත්ථාපන අවශ්‍යතා ඇති වන බැවින් මේ වන විට වර්ෂය මුල හඳුනාගත් ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් ප්‍රමුඛතාව අනුව සංශෝධනය කිරීමට සිදුව ඇති බවත්, ආයතනයන්හි සේවා සැපයීම පහසුකරලීම පිණිස සංශෝධනයන් සිදු කිරීම අත්‍යාවශ්‍ය වී ඇති බවත් ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයේදී ඇති වන අපහසුතාවයන් මධ්‍යයේ වුව ද විගණන නිරීක්ෂණ හා එකඟ වෙමින් අදාළ කටයුතු සිදු

				මෙම වැයවිෂයයන් තුනෙහිම කාර්යයන් පූර්ව නිගමනයක් කළ නොහැකි නිශ්චිත නොවූ අවස්ථානුකූලව පැන නගින ගොඩනැගිලි අළුත්වැඩියා, යන්ත්‍රෝපකරණ හා වාහන අළුත්වැඩියාවීමයි . බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පාලනයෙන් පරිබාහිරව පවතින හේතු මුල්කරගෙන ඇතැම් අවස්ථාවල මුල් පිරිවැය ඇස්තමේන්තු ඉක්මගිය අවස්ථා බහුල වන අතර, එම අවස්ථාවන්හිදී ප්‍රමුඛතාව අනුව එම වැය විෂයයන්ගේ ප්‍රතිපාදන සීමාවට අදාළව අනුමත ක්‍රියාකාරකමට අදාළ ඇස්තමේන්තුගත මුදලේ වටිනාකම සංශෝධනය සිදු කරයි.	කරන බව දන්වා සිටිමි.
02	සමාලෝචිත වර්ෂයේ කාර්මික හා කෘෂිකාර්මික අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති රු.148,861,870 ක ලැබිය යුතු ශේෂයෙන් රු.74,238,302ක ශේෂ තහවුරු කරගැනීමට අවශ්‍ය	2023 2022 2021	සම්පූර්ණ ණයගැති ශේෂ තහවුරුකර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.	හිඟ බිල්පත් කඩිනමින් නිරවුල් කිරීමට ආයතනවලට උපදෙස් ලබාදී ඇත.	ශේෂ තහවුරුකර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකරන ලද රු.74,238,302ක වටිනාකමින් රු.25,954,574ක වටිනාකමින් යුතු බිල්පත්

	සාක්ෂි විගණනයේදී ඉදිරිපත් නොවී ය.				පමණක් තොරතුරු සොයාගත නොහැකිවී ඇති අතර, ඉන් රු.15,138,634ක වටිනාකමින් යුතු බිල්පත් කපාහැරීම සඳහා අමාත්‍යාංශ අනුමැතියට යොමුකර ඇත. තොරතුරු නොමැතිව හිඟ බිල්පත් ශේෂ ලෙස පවතින රු.10,815,940ක ශේෂ අදාළ බිල්පත් තොරතුරු තවදුරටත් බන්ධනාගාර ආයතන වෙතින් තහවුරුකර ගැනීමට කටයුතු කරමින් පවතී.
03	1951 අංක 14 දරන මෝටර් වාහන පනත 25(1) ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ධාවනයේ යොදවා තිබූ වාහන 32ක් සඳහා පනත ප්‍රකාරව වලංගු ආදායම් බලපත්‍ර 2023 වර්ෂය සඳහා ලබාගෙන නොතිබුණි.	2023 2022 2021	මෝටර් වාහන පනතේ ප්‍රතිපාදන අනුව වලංගු ආදායම් බලපත්‍ර ලබාගත යුතු ය.	ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති වාහන සඳහා බලපත්‍ර ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.	2024 ජුනි 30 දින විට වාහන 32න් 27ක් සඳහා වලංගු ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතු සිදුකර ඇත.
04	මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවත්නා වාහන 31ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සිදුකර නොතිබීම හා තවත් වාහන 34 ක් සම්බන්ධයෙන් අපහරණ කටයුතු සඳහා නිර්දේශ ලබාගෙන තිබුණ ද, මෙතෙක් අපහරණ කටයුතු අවසන්කර නොතිබුණි.	2023 2022 2021	මුදල් රෙගුලාසි 770(4) ප්‍රකාරව අපහරණ කටයුතු කළ යුතු ය.	අපහරණය කළ යුතු වාහන සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කිරීම හා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොමැති වාහන පවරාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.	මෙම වාහන 31 අතුරින් වාහන 3ක් රාජසන්තක කරන ලද වාහන වන අතර, එම වාහන පවරා ගැනීමට අදාළව අමාත්‍යාංශ මණ්ඩල සංදේශයක් සකස්කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. LH – 9527 දරන ලොරි රථය ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත. ඉතිරි වාහන සම්බන්ධයෙන් වන අපහරණ කටයුතු සිදු කරමින් පවතී. මෙම වාහන 34න් වාහන 21ක් රාජසන්තක කරන ලද වාහන වන අතර මෙම

					වාහන පවරා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2024 අගෝස්තු 30 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. තවත් 03ක් අපහරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඉතිරි වාහන අදාළ ලියාපදිංචි සහතික නොමැති බැවින් අනුපිටපතක් ලබාගැනීම සඳහා අමාත්‍යාංශ මගින් කමිටුවක් පත්කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
05	දිවයිනේ පාසල් දරුවන්ට අධ්‍යාපනය ලබාදීමට අවශ්‍ය මානව හා භෞතික සම්පත් ඉතාම අවම මට්ටමක පවතින අවස්ථාවකදී ජාතික පාසලක් වශයෙන් පවත්වාගෙන යන වටරැක තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය සඳහා ලබාදී ඇති මානව හා භෞතික සම්පත්වලට සාපේක්ෂව ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැතිවීම හා අධ්‍යාපනය ලබන සිසුන් සඳහා ද වඩාත් සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම නිසා මෙම ව්‍යාපෘතිය මගින් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීමට නොහැකි වී තිබුණි.	2023	අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව ජාතික පාසලක නිර්නායකයන් අනුව විධිමත්ව පවත්වාගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතු ය.	ඉගෙනුම් ක්‍රියාවලිය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව සෘජු මැදිහත් වීමක් සිදු නොකරන අතර, ක්‍රියාකාරකම්, වෘත්තීය පුහුණු වැඩසටහන් හා විවිධ පුනරුත්ථාපන වැඩසටහන් සඳහා තරුණ වරදකරුවන් යෙදවීම පමණක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, අධ්‍යාපන අමාත්‍යාංශය හා එක්ව ඉදිරියේදී වඩාත් සාර්ථක ප්‍රතිඵල අත්කරගත හැකි සුදුසු වැඩපිළිවෙලක් ක්‍රියාත්මක	1939 අංක 28 දරන තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලයීය පනත යටතේ අවුරුදු 03ක පුහුණු කාලසීමාවක් සඳහා ගරු අධිකරණ නියෝග මත පමණක් වයස අවුරුදු 16 – 22 අතර වයස් කාණ්ඩය යටතේ පසුවන රැඳවියන් බන්ධනාගාර 113 පෝරමයට අනුව වටරැක තරුණ වරුදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාලය වෙත ඇතුළත් කරනු ලබයි. මෙය අධිකරණ ක්‍රියාදාමයක් යටතේ පමණක්ම සිදුවන බැවින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව මගින් ඒ සඳහා බලපෑමක් සිදු කිරීමට හැකියාවක් නොපවතී. එසේම මෙම අභ්‍යාස විද්‍යාලයේ ඉගෙනීම් කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත විෂයය නිර්දේශයක් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ

				කිරීමට අදාළ කටයුතු සිදුකර ඇත. බන්ධනාගාරගත වන තරුණ වරදකරුවන් පමණක් මෙම පාසල වෙත යොමු කරන බැවින්, දඩුවම් කාලය සම්පූර්ණ වීම හේතුවෙන් නිදහස්ව යාම වැනි කරුණු මත සමහර අවස්ථාවලදී ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් නොමැති වන අවස්ථා පවතින අතර, අධිකරණ මගින් නියෝග නොකරන රුදවියන් මෙම ආයතනය වෙත ඇතුළත් කළ නොහැකි වේ.	විදුහල්පතිවරයෙක් යටතේ හා පුහුණු ගුරුවරුන් විසින් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. සිසුන් අඩුවීම සහ සුදුසු අධ්‍යාපන ක්‍රමවේදය බන්ධනාගාර දෙපාර්තමේන්තු පරිපාලනයෙන් බැහැරව පවතින කාර්යයක් වේ. මෙම පාසලේ ළමයින් ප්‍රමාණය සංඛ්‍යාත්මකව අඩු වුව ද, අධිකරණ නියෝග මත ඉදිරියේදී වැඩි ළමයින් ප්‍රමාණයක් ඇතුළත් වුවහොත් ඊට සරිලන පරිදි භෞතික පහසුකම් හා මානව සම්පත් තිබිය යුතු බව පෙන්වා දෙමි.
06	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රුපියල් මිලියන 221ක් වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දින වන විට රු.151,915,478ක් දරා තිබුණි. තොරතුරු කළමනාකරණ පද්ධතිය බන්ධනාගාර ආයතනයන් තුළ ක්‍රියාත්මක කිරීමේදී ප්‍රධාන දොරටුව, සිර ලියාපදිංචිය, සිර මාරුවීම්, නිදහස් කිරීම් කටයුතු පමණක් සිදු කරනු ලබයි. විනය, කර්මාන්ත, පුනරුත්ථාපනය, සිර පුද්ගලික දේපළ	2022	ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ප්‍රමාණවත් පරිදි ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම තොරතුරු කළමනාකරණ පද්ධතිය සඳහා නිසි පුහුණුවලත් නිලධාරීන්ගේ පුරප්පාඩු පවතින බැවින්, ඒ සඳහා නිලධාරීන්ට වෙන් වෙන් වශයෙන් ප්‍රායෝගික පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීම සිදු කරමින්	බන්ධනාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය පූර්ණ ලෙස ස්ථාපනය කිරීමට මේ සඳහා දැනුම සහිත නිලධාරීන් ප්‍රමාණවත් නොවන අතර, එසේ නොමැති තත්ත්වයක් තුළ එය පූර්ණ ලෙස ස්ථාපනය කිරීම ගැටලුවක් පවතී. ඉදිරියේදී නවක බන්ධනාගාර නියාමක නිලධාරීන් බඳවාගැනීමට අනුමැතිය ලැබී ඇති අතර, යටිතල පහසුකම් ද ලබාදීමට කටයුතු කරමින් සිටින බැවින්

	කළමනාකරණය, අමුත්තන් පෙන්වීම හා ආහාර වට්ටෝරු අංශය ආදී කාර්යයන් මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය උපයෝගී කරගෙන ඉටු නොකරයි.			පවතී.	ක්‍රමානුකූලව අදාළ අංශ ආවරණය වන පරිදි මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමින් පවතී.
07	බන්ධනාගාරවල පවතින අධික තදබදයට පිළියමක් ලෙස මීගමුව, පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ හදිසි අත්‍යාවශ්‍ය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව රුපියල් මිලියන 135ක ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කර 2020 සැප්තැම්බර් 28 දින වැඩ ආරම්භ කර, 2020 දෙසැම්බර් 31 වන දින වැඩ අවසන් කිරීමට සැලසුම් සකස්කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන වැඩ කොටස් 11ක් නිම කිරීමට තිබූ අතර, එයින් වැඩ කොටස් 07ක් සඳහා ඇස්තමේන්තුගත වියදම රු.10,478,341ක් වූ අතර, ප්‍රතිපාදන ප්‍රමාණය රු.10,125,031ක් විය. තවත් වැඩ කොටස් 04ක් සඳහා මෙතෙක් ඇස්තමේන්තු සකස්කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු ශීර්ෂයේ ගෙවන ලද වැටුප් හා අතිකාල දීමනා වියදම් හැර මේ දක්වා රුපියල් මිලියන 105කට වඩා වැඩි වියදමක් දරා තිබුණ ද, 2024 පෙබරවාරි 06 දින වන විටත් නිම කර නොතිබුණි. මුදල් රෙගුලාසි 136(1)	2023	ව්‍යාපෘති සැලසුම් කරන ලද කාලසීමාවන් තුළ අවසන් කර, අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීම සඳහා විධිමත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය.	ගරු ආරක්ෂක ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් වූ සුරක්ෂිත රටක්, විනයගරුක, ගුණගරුක, නීතිගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය මගින් පවතින COVID 19 වසංගත තත්ත්වය පාලනය සඳහාත් බන්ධනාගාරවල පවතින අධික තදබදයට පිළියමක් ලෙසත්, නව වාට්ටු සංකීර්ණයක් කඩිනමින් ඉදිකිරීමට තීරණය කර ඇත. මෙම කාර්යය කඩිනමින් නිමකළ යුතුවීමත්, COVID 19 වසංගත තත්ත්වය මධ්‍යයේ සිදුකළ යුතුවීමත් හේතුවෙන් ඉතා	මෙම ආහාරපාන සඳහා වැය වූ මුදල් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන සංයුක්ත දීමනා මුදලින් අඩුකර ගෙවීමට කටයුතු කර ඇත. තව ද, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ලබාගත් ආහාර සඳහා පල්ලන්සේන බන්ධනාගාරයේ නිලධාරීන්ගේ ක්‍රීඩා හා සුභසාධක සංගමයේ ආපනශාලාව වෙත ගෙවීම් කිරීමටත්, මාසික පදනමින් අදාළ ගෙවීම් සිදු කිරීමටත්, බන්ධනාගාර සුළු පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර ඇත. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හිමි සංයුක්ත දීමනාව වන රු.1,050ක මුදලින් එක් නිලධාරියෙකුට රු.700ක් වන ලෙස සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ඇස්තමේන්තු අනුව ඉදුරාම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට ලබාදීමටත් බන්ධනාගාර දෙපාර්තමේන්තු සුළු පරිමාණ ප්‍රසම්පාදන

	ප්‍රකාරව අදාළ සේවාව උචිත අධිකාරී බලයට ආවරණයදී ඇති වැය සම්මතයේ හෝ බලය දෙනු ලැබූ මුදල් ප්‍රතිපාදනවලට ඇතුළත් විය යුතු අතර, ඊට අනුගත නොවී භාණ්ඩාගාර අනුමැතියෙන්ද තොරව පල්ලන්සේන තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් ඉටු කළ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලයට 2021 වර්ෂය මුල සිට 2023 වර්ෂය අවසානය දක්වා බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සංයුක්ත දීමනා වශයෙන් රු.22,293,250 ක් ගෙවා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV පරිච්ඡේදයේ 1.3 වගන්තියට අනුගත නොවී මෙම ව්‍යාපෘතියේ නියුක්ත සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය සඳහා 2020 නොවැම්බර් මස සිට 2021 දෙසැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදයට සංයුක්ත දීමනා ලබාදෙමින් සුළු පරිපාලන ප්‍රසම්පාදන මණ්ඩල තීරණය අනුව ඔවුන් ලබාගත් ආහාරපාන වෙනුවෙන් බන්ධනාගාර ආපනශාලාවට ගෙවිය යුතු රු.4,677,625ක මුදලක් මෙම ව්‍යාපෘතිය යටතේ ගෙවා තිබුණි.			දැඩි සෞඛ්‍ය පිළිවෙත් යටතේ ඉටුකිරීමට ජනාධිපති කාර්යසාධන බලකාය තීරණය කර ඇත. ජාතික අයවැය දෙපාර්තමේන්තු වේ අනුමැතිය මත සිදුකර ඇත.	මණ්ඩලය තීරණය කර ඇත. ගොඩනැගිලි ඉදිකිරීම්වලින් සියයට 99ක් අවසන් වී ඇති අතර, මළ හා අපජල පිරිපහදු පද්ධතියේ නළ මාර්ග සම්බන්ධතාවය සිදු කිරීම දැනට පවතින අධික වූ භූ ජලමට්ටම නිසා ඇනහිට ඇත. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව අදාළ ඉදි කිරීම්වලින් මේ වන විට ඉවත්ව ඇත. අදාළ සබඳතාවය ලබාගැනීමට නාවික හමුදාවේ සහාය ඉල්ලා ඇත. දැනට තාවකාලික ජල ටැංකියක් ඉදිකර අවශ්‍ය ජලය ලබාදීමට සැලසුම්කර ජල ටැංකියේ ඉදිකිරීම් සියයට 50ක් පමණ ඉටුකර ඇත.
08	2019 ඔක්තෝබර් 19 වන දින කෑගල්ල බන්ධනාගාර භූමිය තුළ සිදු වූ නායයෑම හේතුවෙන් අස්ථාවර වූ භූමිය ස්ථාවර කිරීම සඳහා පහළින් බැම්මක් ඉදිකිරීම හා නායගිය	2023	ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පූර්ණ උපදෙස් පරිදි කටයුතු	බන්ධනාගාරයේ ආරක්ෂිත බැම්ම අවධානමට ලක් විය හැකි බව උපදේශක ආයතනය මඟින්	නායයාම් තත්ත්වයන් මගින් සිදු වූ අස්ථාවරවීමේ කටයුතුවල මුල් අදියර මේ වන විට නිමකර නායයාම් තත්ත්වය යම්

ස්ථානයේ ඇති තාප්පය අළුත්වැඩියාව සඳහා රු.20,667,766ක වියදමක් දරා තිබුණි. තාප්පය කැඩී ගිය කොටස ආවරණය කිරීම සඳහා ආරක්ෂිත තහඩු ආවරණයක් සහ ආරක්ෂිත කම්බි වැටක් ද ඉදිකර තිබුණ ද, නැවත නායයෑමට හෝ තාප්පය කඩා වැටීමට ද හැකියාව පවතින බැවින්, රෝගීන් හා නිලධාරීන්ගේ ජීවිතවලට අනතුරුදායක තත්ත්වයක් පවතින අතර, ඒ අනුව ආරක්ෂාව සඳහා ආරක්ෂිත තාප්පය ඉදි කිරීම අත්‍යාවශ්‍ය බව නිරීක්ෂණය විය.

කිරීමට පියවරගත යුතුය.

හඳුනාගෙන තිබූ අතර, ඒ සඳහා අවස්ථානුකූලව ගත හැකි ඉංජිනේරුමය පිළියම් ද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ උපදේශකත්වය මත සිදු කරන ලදී. නමුත් දීර්ඝ කාලයක් තුළ සිදු වූ අපජල බැහැර කිරීම ද කෑගල්ල මහ නගර සභාව විසින් සිදු කරන ලද අවිධිමත් පස් ඉවත් කිරීම් ද හේතුවෙන් අතිශය පැරණි ආරක්ෂිත බැම්මේ කොටසක් ඇල වී යාමට ලක් විය. ඒ අනුව ආරක්ෂිත පියවරක් ලෙස බැම්මේ අවදානම් කොටසක් ගලවා ඉවත් කරන ලදී. එයට අදාළව සිදුකළ යුතු ඉදිකිරීම් කටයුතු සඳහා ඉංජිනේරුමය උපදේශක සේවා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් ලබාගැනීමට ප්‍රසම්පාදන මණ්ඩල අනුමැතිය මේ වන විට ලැබී ඇත. එම උපදේශකත්වය

මට්ටමකට අඩුකර ඇත. එහි දෙවන අදියර සිදු කිරීම සඳහා මේ වන විට අදාළ අනුමැතිය ලබාදී ඇත. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී.

				යටතේ මෙම තාප්පයේ ඉතිරි කොටස් හා අනෙකුත් ඉදිකිරීම් ආරක්ෂා කර ගැනීමට අදාළ වන ඉදිකිරීම් සිදු කිරීමට මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. තාප්පය ගලවා ඉවත් කර ඇති කොටස ආරක්ෂිත තහඩු ආවරණයක් හා කම්බි වැටක් අවස්ථානුකූලව ඉදිකර ඇති අතර, අදාළ ඉදිකිරීම නිම වූ පසු එම තාවකාලික ඉදිකිරීම ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	
09	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 ඡේදය හා ප්‍රසම්පාදන අත්පොතේ 2.14.1 හි පෙන්වා ඇති පරිදි ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු විසින් භාණ්ඩ මිලදීගැනීම් සිදු කිරීමේදී වෙළඳපොල සැඳැහුම් ක්‍රමය අනුගමනය කරමින් මුද්‍රා තැබූ මිල ගණන් 05කට නොඅඩු සංඛ්‍යාවක් කැඳවීම් කළ යුතු ය. නමුත් ඊට අනුගත නොවී කළුතර බන්ධනාගාරයේ 2023 වර්ෂයේ මුල් මාස 08 තුළ ආයතන 03කින් පමණක් මිල කැඳවීම් සිදුකර අවස්ථා 12කදී වටිනාකම රු.1,184,320ක් වූ මිලදී	2023	යොමුගත රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ආයතන විසින් තම බන්ධනාගාරයට භාණ්ඩ හා සේවා මිලදීගැනීමේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව තාක්ෂණික කමිටුවේ නිර්දේශ ලබා ගැනීම ඇතුළුව, එම මිල කැඳවීම, දුරකථන නාමාවලියේ ලියාපදිංචි සැපයුම්කරුවන් ගෙන් නැත්නම් ප්‍රාදේශීය ලේකම්	ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි අවම වශයෙන් මිල කැඳවුම් 5ක් සිදුකර ප්‍රසම්පාදන කටයුතු සිදු කරන ලෙස අදාළ ආයතන දැනුවත් කර ඇත.

	ගැනීම් හා මීගමුව බන්ධනාගාරයේ 2023 වර්ෂයේ මුල් මාස 06 තුළ ආයතන 03කින් පමණක් මිල කැඳවීම් සිදුකර අවස්ථා 03කදී වටිනාකම රු.315,375ක් වූ මිලදීගැනීම් සිදුකර තිබුණි. මෙම මිලදීගැනීම් සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන් හෝ ටෙලිකොම් රේන්බෝ පිටුවල ලැයිස්තුගතකර ඇති සැපයුම්කරුවන්ගෙන් පමණක් අදාළ මිල කැඳවීම් සිදුකළ යුතු වුවත්, එසේ කර නොතිබුණි.			කාර්යාල ලියාපදිංචි සැපයුම්කරුවන් ගේ නාම ලේඛනයෙන් හෝ රජයේ සැපයුම්කරුවන් ගෙන් මිල කැඳවීම් කරන ලෙස සියළුම බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත් කොට ඇත.	
10	අක්කර 363.64ක් වූ ඉඩම්වල හිමිකම බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පැවතිය ද වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගත කර නොතිබුණි.	2023 2022	බන්ධනාගාර දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.	හිමිකම පවරාගෙන තිබුණ ද, වටිනාකම තක්සේරු නොකිරීම නිසා ගිණුම්ගත කර නොමැති ඉඩම් සඳහා තක්සේරු වාර්තා කඩිනමින් ලබාදෙන ලෙසට පළාත් තක්සේරු කාර්යාලවලින් හා රජයේ ප්‍රධාන තක්සේරුකරු වෙතින් ඉල්ලීම් කර ඇත. තක්සේරු කළ ඉඩම් ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.	බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හිමිකම පවරා ඇති ඉඩම් අක්කර 363.64 න් 2024 සැප්තැම්බර් 30 දින වන විට අක්කර 229.8664 ක තක්සේරු වාර්තා ලබාගෙන ඇත. අනෙකුත් තක්සේරු වාර්තා කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන ලෙසට බන්ධනාගාර අධිකාරීවරුන් දැනුවත්කර ඇති අතර, රජයේ ප්‍රධාන තක්සේරු වාර්තා කඩිනමින් ලබාදෙන ලෙසටත් ඉල්ලීම් කර ඇත.

11	බන්ධනාගාර, සිරමැදිරි, එළිමහන් සිර කඳවුරු, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා ගොවිපොළවල් වශයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අක්කර 390.98 ක් වූ ඉඩම් ප්‍රමාණයක හිමිකම පවරාගැනීම සිදුකර නොතිබුණි.	2023 2022	මෙම ඉඩම්වල හිමිකම පවරාගැනීමට කටයුතු කළ යුතුය.	පවරා නොගත් ඉඩම් පවරාගැනීමේ කටයුතු කඩිනමින් සිදු කරමින් පවතින අතර, පවරා නොගත් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස සියළුම බන්ධනාගාර අධිකාරිවරුන් දැනුවත්කර ඇත. එමෙන්ම රජයේ ඉඩම්වල හිමිකාරිත්වය ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල, නාගරික සංවර්ධන අධිකාරිය හා මහවැලි සංවර්ධන අධිකාරිය යන ආයතන මගින් ද කඩිනමින් ඉඩම් පවරාදෙන ලෙස ඉල්ලීම් කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විට අක්කර 43.2471ක ඉඩම් ප්‍රමාණයක් (අවිස්සාවේල්ල සිරමැදිරිය පරිවස් 0.2471ක් හා වටරැක බන්ධනාගාරය අක්කර 43ක් ලෙස) බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරාදී ඇත. ඒ අනුව 2024 සැප්තැම්බර් 30 දින වන විට බන්ධනාගාර දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 347.732 කි.
12	අංක PA-7034 දරන කැබ්රථය 2013 වර්ෂයේදී පුනරුත්ථාපන හා බන්ධනාගාර අමාත්‍යාංශය විසින් විධිමත් පවරාදීමකින් තොරව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානය වෙත ලබාදීම නිසා අළුත්වැඩියාවන් සිදුකර ගැනීමට නොහැකිවීම හේතුවෙන් 2013 වර්ෂයේ සිට මේ දක්වාම කැබ්රථය ධාවනයට යොදා ගැනීමට නොහැකි වී පැවතුණි.	2023	විධිමත් පවරාගැනීමක් සිදු කර 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 ප්‍රකාරව අළුත්වැඩියා කටයුතු කළ යුතුය.	අළුත්වැඩියාවන් සඳහා මිල ගණන් කැඳවා ඇති අතර, අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් අවාසිදායක බැවින් විධිමත්ව දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමෙන් අනතුරුව අපහරණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.	අදාළ අනුමැතියෙන් අනතුරුව අපහරණය කිරීමට ආයතනය වෙත දන්වා ඇත.

13	2021 මාර්තු 24 දින සිට වවුනියා බන්ධනාගාරය සතු අංක PH-1916 දරන වෑන්රථය හා 2022 මැයි 14 වන දින සිට බන්ධනාගාර මූලස්ථානය සතු අංක PA-8709 දරන කැබ්රථය අළුත්වැඩියා සිදුකර ගැනීම සඳහා බාහිර ආයතනවලට ලබාදී අවුරුදු 03 කට වඩා වැඩි කාලයක් එම ආයතනවල රඳවා තිබුණි.	2023	2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	PH-1916 වෑන්රථය අපහරණය කිරීමට අනුමැතිය ලබාදී ඇත. PA – 8709 කැබ්රථය අළුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති අතර, ධාවනය සඳහා යොදවා ඇත.	රථයේ අලුත්වැඩියා කඩිනම් කරන ලෙස දන්වා සිටියත් එම ආයතනය එසේ කිරීමට අපොහොසත් වූ බැවින්, රථය මේ වන විට බන්ධනාගාර ආයතනය වෙත රැගෙන විත් ඇති අතර, නැවත මිලගණන් කැඳවීමට කටයුතු කරන ලදී. වෙළඳපොළ තුළ අමතර කොටස් සපයා ගැනීම අසීරුවීම හේතුවෙන් කිසිදු ආයතනයක් මගින් මිලගණන් එවා නොතිබූ අතර, මෙම අමතර කොටස් සොයා ගැනීමට අපහසුවීම සහ මෙම micro වර්ගයේ රථ සඳහා අධික නඩත්තු පිරිවැයක් දැරීමට සිදුවීම හේතුවෙන් අපහරණය සිදු කිරීමට අනුමැතිය ලබාදී ඇත. PA – 8709 අලුත්වැඩියා කටයුතු අවසන් කොට ධාවනයට එක්කර ඇත.
14	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (01) යටතේ ඉදිරිපත් කර තිබූ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා සිද්ධීන් අතරින් වසර 10කට වඩා වැඩි කාලයක සිට පැවත එන වාහන අනතුරු 28ක් ඇතුළු සිද්ධීන් 33කට අදාළ අලාභය රු.36,220,218ක් ද, වසර 05 සිට 10 අතර කාලයක සිට පැවත එන වාහන අනතුරු 79ක් ඇතුළු සිද්ධීන් 80කට අදාළ අලාභය රු.15,651,990ක් ද, 2023	2023 2022 2021	මුදල් රෙගුලාසි 103 හා 104 ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	දීර්ඝ කාලයක සිට පවතින වාහන අනතුරුවලට අදාළ අලාභ හානිවලින් වාහන 07කට අදාළ අලාභයන් පොත්වලින් කපාහැරීම සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමට අදාළ මු.රෙ වාර්තා ඉදිරිපත්	2023 ගිණුම් වර්ෂයට අදාළව වසර 10කට වඩා වැඩි අලාභ හානි 33කින් (රු.36,220,218) රිය අනතුරු අලාභ හානි 10කට අදාළ රු.655,226ක අලාභය ද, වසර 05 සිට 10 අතර පැවති අලාභ හානි 80කින් (රු.15,651,990) රිය අනතුරු 02 කට අදාළ රු.93,505ක් හා දේපළ හානි 02කට අදාළ රු.401,638 ක අලාභය ද, වසර 05කට අඩු අලාභ හානි 78කින්

	වර්ෂයේ වූ වාහන අනතුරු 30 ක් ඇතුළුව වර්ෂ 05 කට වඩා අඩු කාලයක සිට පැවත එන වාහන අනතුරු 77ක් ඇතුළුව සිද්ධීන් 78ක් සම්බන්ධ අලාභය රු.49,955,804ක් බව නිරීක්ෂණය විය. මෙම අලාභ හානිවලින් වාහන 06කට අදාළ අනතුරු සම්බන්ධව රු.2,937,032ක අලාභයක් පොත්වලින් කපාහැරීමට නිර්දේශ කර තිබුණ ද, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මෙතෙක් ලැබී නොතිබුණි.			කරන ලද අතර, ඉතිරි වාහන සඳහා ද අනුමැතිය ලද පසු කපාහැරීම් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.	(රු.49,955,804) රිය අනතුරු 18කට අදාළ (රු.1,750,299) අලාභය ද ලෙස මේ දක්වා මුළු අලාභහානි 32කට අදාළ රු.2,900,668ක අලාභ හානිය කමිටු අනුමැතිය මත කපාහැරීම් සිදුකර ඇත. එමෙන් ම අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා යොමුකළ රියඅනතුරු ගොනු සඳහා MOJ/E/17/T/41 හා 2024 අගෝස්තු 15 දිනැති ලිපිය මගින් ගෙවීම් සිදුකිරීම සම්බන්ධ තොරතුරු, නැවත විමසා ඇති අතර, ඒ සම්බන්ධව අදාළ බන්ධනාගාර ආයතන හා අදාළ අංශයන් මගින් තොරතුරු ඉල්ලුම් කර ඇති අතර, එම තොරතුරු අමාත්‍යාංශය වෙත යොමුකිරීමට කටයුතු සිදු කරමි. තව ද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති අලාභ හානිවල මහර, තංගල්ල, ගාල්ල බන්ධනාගාරවල කැරලි මගින් සිදුවූ දේපළ අලාභ හානිය ද ඇතුළත්ව ඇති අතර, ඒ සම්බන්ධයෙන් අධිකරණවල නඩු කටයුතු පවතින බැවින් කපාහැරීම් සම්බන්ධව කටයුතු සිදුකළ නොහැකිව ඇත.
15	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබූ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු හා සිද්ධීන් අතුරින් 2017 සිට 2021 වර්ෂය අවසානය දක්වා	2023 2022 2021	වාහන අනතුරු ඇතුළු අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 හා 104 හි සඳහන් පරිදි	2023 වර්ෂයේ වාර්තාකරන ලද, 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට	මොණරාගල බන්ධනාගාරයට අයත් අංක GK-5287 හා NC-0615 දරන බස්රථවල අළුත්වැඩියාවන් සිදුකර ඇති බැවින් මේ වන විට

	සිදු වූ අලාභ 05ක අලාභය 2024 පෙබරවාරි 28 දින තෙක්ම තක්සේරු කර නොතිබුණි.		ක්‍රියා කළ යුතු ය.	හෝ අත්හැරීමට ඇති පාඩු හා අලාභ සම්බන්ධ සිද්ධි 05හි අලාභය තක්සේරු කිරීම සඳහා අදාළ ආයතන වෙතට දන්වා ඇත.	කපාහැරීම් සිදුකර ඇත.අනෙකුත් අනතුරුවලට අදාළ වාර්තා නැවත කැඳවා ඇත.
16	මුදල් රෙගුලාසි 104(03) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වඩා ප්‍රමාදයක් සිදු වේ යැයි අපේක්ෂා කරන්නේ නම් නැතිවීම් හා පාඩුවීම් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් වහාම එවිය යුතු ය. නමුත් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 1998 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති අලාභහානි 122ක් සම්බන්ධව ප්‍රාරම්භක වාර්තා හා අලාභහානි 34ක් සම්බන්ධව පූර්ණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	2023 2022	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා සියළුම ආයතන මගින් ගෙන්වා ගැනීමට බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අංක- 08/2023 හා 2023.03.29 වන දිනැති දෙපාර්තමේන්තු චක්‍රලේඛය මගින් දන්වා යවා ඇති අතර, ආයතන මගින් අදාළ වාර්තා ලැබෙන අනුපිළිවෙල අනුව විගණනය සඳහා යොමු කිරීමට කටයුතු කරමි.	ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොමැති අලාභහානි 122 න් අලාභහානි 12ක් (රු.848,881) මේ වන විට අදාළ වාර්තා ලබාගෙන කපාහැරීමට කටයුතු කර ඇත. ඉතිරි අලාභහානිවලින් වසර 10කට වඩා පැරණි හානි 12ක් (රු:1,417,719) පවතී. වසර 10කට වඩා අඩු හානි 98ක් (රු.18,964,773) සඳහා වන හානිපාඩුවලට අදාළ ප්‍රාරම්භක වාර්තා ද අදාළ බන්ධනාගාර ආයතන වෙතින් ගෙන්වාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කෙරෙමින් පවතී. 2023 වර්ෂයට අදාළ හානිපාඩු 32 ක් කමිටු නිර්දේශ හා අනුමැතිය මත පොත්පත්වලින් කපාහැර ඇත. විමසුමෙහි දක්වා ඇති අලාභහානි 34 න් 03 ක්ද ඒ අතර වේ. තවද සියළුම බන්ධනාගාර ආයතන මුදල් රෙගුලාසි පරිදි හානිපාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීමට දැනුවත් කර ඇති අතර, 2/2024 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ පරිදි කඩිනමින් හානි පාඩු සම්බන්ධ ඉදිරි කටයුතු සිදුකරන බවද කාරුණිකව වාර්තා

					කරමි.
17	අංක NC-5426 දරන රථයට සිදු වූ අනතුර සම්බන්ධයෙන් ටොයෝටා ලංකා පුද්ගලික සමාගම විසින් 2022 ජනවාරි 05 වන දින හා 2022 ඔක්තෝබර් 19 වන දින පිළිවෙලින් රු.4,974,724ක් සහ රු.8,656,243ක් වූ ඇස්තමේන්තු දෙකක් ඉදිරිපත් කර තිබුණි. එසේ වුව ද, 2022 ජුනි 18 දිනැති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ලිපිය අනුව, අළුත්වැඩියාව සිදුකර පරීක්ෂාව සඳහා ඉදිරිපත් කිරීම හෝ එසේ කිරීමට නොහැකි නම් ඊට හේතු දක්වන ලෙස වූ දැනුවත් කිරීමට ප්‍රතිචාර දක්වා නොතිබුණි. ඒ අනුව මුදල් රෙගුලාසි 156(1) ප්‍රකාරව රජයට සිදු වූ අලාභය හඳුනාගෙන එය පියවාගැනීමට කටයුතුකර නොතිබුණි. එසේම මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අනතුර සිදු වූ දින සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, විගණන අවස්ථාව වන තෙක් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 103, 104 හා 156(1) ප්‍රකාරව කටයුතු කළ යුතුය.	රථය අලුත්වැඩියාව සඳහා නැවත මිල ගණන් කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.	රථයේ අනතුරට අදාළ රක්ෂණ සංස්ථාව විසින් රු.500,000ක හිමිකමක් ලබාදෙන බව දන්වා ඇත. මෙතෙක් අලුත්වැඩියාව අවසන් නොවීම මත මුරෙ. 104(4) වාර්තාව මෙතෙක් ලබාදීමට නොහැකි වී ඇත. අදාළ අනුමැතිය පරිදි රථයේ අළුත්වැඩියාව සඳහා නැවත මිලගණන් කැඳවා ඇති අතර, මෙම අනතුරෙහි අළුත්වැඩියාව සිදුකිරීමේදී යම්කිසි ප්‍රමාදයක් සිදු වී ඇත් ද යන්න පිළිබඳව විමර්ශනයක් කරන ලෙස බ.කො. (පාලන) වෙත දන්වා ඇත.
18	අගුණකොළපැලැස්ස, මීගමුව, කළුතර බන්ධනාගාර ආයතනවල හා දළුපොත තරුණ වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයේ 2023 වර්ෂය තුළ විදුලි බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීමේදී නියමිත කාලපරිච්ඡේදය තුළ නොගෙවීම නිසා දඩමුදල් (අධිභාර) වශයෙන් රු.1,392,311ක් හා අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ 2023 වර්ෂය	2023 2022	මුදල් රෙගුලාසි 780 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දළමාසික ඇස්තමේන්තුව අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වෙන් අක්මුදල් ලබා දීමෙන් අනතුරුව ප්‍රමාදයකින් තොරව බන්ධනාගාර ආයතන වෙත අක්මුදල් නිකුත්	දළ මාසික ඇස්තමේන්තුව අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අක්මුදල් ලබා දීමෙන් අනතුරුව ප්‍රමාදයකින් තොරව බන්ධනාගාර ආයතන වෙත අක්මුදල් නිකුත් කිරීමට කටයුතු කරන මෙන් දැනුම්දී ඇත.

	තුළ ජල බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීමේදී නියමිත කාලපරිච්ඡේදය තුළ නොගෙවීම නිසා දඩමුදල් (අධිභාර) වශයෙන් රු188,306 ක් ගෙවා තිබුණි.			කිරීමට කටයුතු කිරීම.	
19	නියැදි විගණන පරීක්ෂාවේදී 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයේ දින 31ක තුළ වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් අවස්ථා 233කදී නිලධාරීන්ගේ නිවාස පරිශ්‍රයන් තුළ සේවයේ යොදවා තිබූ අතර, බන්ධනාගාර නියාමක නිලධාරීන්ගේ මිනිස් දින 234ක කාලයක් ද ඒ සඳහා වැයකර තිබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ නිවාස ආශ්‍රිත පරිශ්‍රයන් වෙත සිරකරුවන් රැගෙන යාම සඳහා අවස්ථා 62කදී බන්ධනාගාර මූලස්ථානයේ සංචිත වාහන 09ක් කිලෝමීටර් 372ක් ධාවනය කර තිබුණි. 2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 මගින් අතිකාල වියදම් ද ඇඩි සේ පාලනය කිරීම අත්‍යාවශ්‍ය බව අවධාරණය කර තිබුණ ද, 2023 වර්ෂයේ අතිකාල හා නිවාඩු දීමනා වශයෙන් රුපියල් මිලියන 982ක් වැය කර තිබුණු අතර, එය 2022 වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 106ක වැඩිවීමක් විය.	2023	2023 ජනවාරි 27 දිනැති අයවැය චක්‍රලේඛ අංක 01/2023 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	බන්ධනාගාර ආයතන වෙත අදාළ උපදෙස් ලබාදී ඇත.	සිර සණත්වයට සරිලන පරිදි බන්ධනාගාර නිලධාරී හිඟය හේතුවෙන් බන්ධනාගාර කටයුතු පවත්වාගෙන යෑමට නිලධාරීන් අඛණ්ඩ සේවාවේ යෙදවීමට සිදුව ඇත. මේ හේතුව මත බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අතිකාල හා නිවාඩු දීමනා සඳහා පෙර වර්ෂවලට වඩා වැඩි වැය බරක් දැරීමට සිදුව ඇති බව විගණනය වෙත දන්වා සිටිමි. වැලිකඩ බන්ධනාගාර පරිශ්‍රය අක්කර 44ක පමණ ප්‍රදේශයක් පුරා විහිදී ඇති අතර නිලනිවාස 152ක් ද, ඒ ආශ්‍රිත අංගන හා ප්‍රධාන ක්‍රිඩා පිට්ටනි කිහිපයක් ද, ලෙස්ලි රණගල මාවතේ සිට ටෙලිකොම් ආයතනය දක්වා වූ පාරක් ද බන්ධනාගාර නිලනිවාස පරිශ්‍රය හරහා ස්ථාපනය වී ඇත. මේ සියළු ස්ථාන බැරැක්ක හා නිවාසවලට සම්බන්ධ ඉඩම්, අංගන, වතු හා කාණු ආදිය සුද්ද පවිත්‍ර කිරීමට සිරකරුවන් යෙදවීම බන්ධනාගාර නිත්‍ය නියෝග 234ට අනුව බන්ධනාගාර පාලනයට නරකක් හෝ අපහසුවක් නොවන පරිද්දෙන් සිදුකරනු ලැබේ. මේ සඳහා නිලධාරීන් යොදවනු ලබන්නේ එම නිවාස

					පරිශ්‍රයන් පිහිටි අදාළ බන්ධනාගාරවල සේවය කරන නිලධාරීන් යොදවා ගෙන ය.
20	ඇපමුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ ඇපමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඬුවමින් නිදහස් කළ යුතු ය. නියැදි පරීක්ෂාවක් අනුව මීගමුව බන්ධනාගාරයේ 2023 ජනවාරි මාසය තුළ ඇපමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරදඬුවමින් මුදාහැර නොතිබූ අවස්ථා 121ක් හා 2022 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ අගුණකොලපැලැස්ස හා මොණරාගල බන්ධනාගාර තුළ මෙලෙස මුදාහැර නොතිබූ අවස්ථා 291ක් විය.	2023 2022	ඇපමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද දිනයේම සිරකරුවන් සිර දඬුවමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.	විගණන විමසුම් ලැබුණු අවස්ථාවලදී අදාළ ආයතනවලට උපදෙස් ලබාදී ඇත.	මීගමුව බන්ධනාගාරයට අදාළ මිනුවන්ගොඩ, මාරවිල, හලාවත, පුත්තලම, කල්පිටිය හා ආණමඩුව යන අධිකරණවලින් ඇපනියෝග නිකුත් කළ විට එම ඇපනියෝග මීගමුව බන්ධනාගාරයේ සිරලියාපදිංචි අංශය වෙත පැමිණෙන්නේ අධිකරණ ආරක්ෂණ අවසානයේ වන අතර, එවිට අධිකරණ කාර්යාල කටයුතු අවසන් බැවින් පසුදින එම ඇපකරුවන් අධිකරණ වෙත ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන බව විගණනය වෙත දන්වමි. රුඳවියන්හට අධිකරණවල ඇප තැබූ පසු දුර බැහැර අධිකරණවල ඇපනියෝගය ආයතනයට ලැබෙනුයේ එදින සවස් වරුවේ වන අතර, ඒ වන විට අධිකරණයේ කාර්යාල කටයුතු අවසන් වී ඇති බැවින්, එවැනි අවස්ථාවල ඇප අත්සන් කිරිමට සැකකරුවන් පසුදින අධිකරණයට ඉදිරිපත් කිරිමට කටයුතු කරනු ලබන බවත්, සිකුරාදා දිනයක හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනයකට පෙර දිනයක සවස්වරුවේ ඇප නියෝගය ලැබුනහොත් ඊළඟ අධිකරණය පැවැත්වෙන මුල්

					දිනයේදීම අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බවත් විගණනය වෙත දන්වා ඇත.
21	දඩමුදල් ගෙවීමට නොහැකි වරදකරුවන් සිරගත කරන අතර, එම සිරකරුවන්ගේ දඩමුදල් ගෙවා නිදහස් කිරීමේ නියෝගය ලද වහාම ඔවුන් සිරදඬුවමින් නිදහස් කළ යුතු ය. නියැදි පරීක්ෂාවක් අනුව මීගමුව බන්ධනාගාරයේ 2023 ජනවාරි 01 දින සිට 2023 ජුනි 30 දින දක්වා කාලපරිච්ඡේදය තුළ නිදහස් කිරීමේ නියෝග ලද දිනයේම සිරදඬුවමින් මුදාහැර නොතිබූ අවස්ථා 292ක් හා 2022 ජනවාරි සිට ජුනි දක්වා කාලය තුළ බන්ධනාගාර ආයතන 03ක මෙලෙස මුදාහැර නොතිබූ අවස්ථා 46ක් විය.	2023 2022	නිදහස් කිරීමේ නියෝගය ලද වහාම සිරකරුවන් සිර දඬුවමින් නිදහස් කිරීමට කටයුතු කළ යුතු ය.	විගණන විමසුම් ලැබුණු අවස්ථාවලදී අදාළ ආයතනවලට උපදෙස් ලබාදී ඇත.	මීගමුව බන්ධනාගාරයට අදාළ මිනුවන්ගොඩ, මාරවිල, හලාවත, පුත්තලම, කල්පිටිය හා ආණමඩුව යන අධිකරණවලින් මුදා හැරීමේ නියෝග නිකුත් කළ විට එම මුදා හැරීමේ නියෝග මීගමුව බන්ධනාගාරයේ සිරලියාපදිංචි අංශය වෙත ලැබෙනුයේ අධිකරණ ආරක්ෂණ රාත්‍රී කාලයේදී බන්ධනාගාරය වෙත පැමිණි පසු ය. රාත්‍රී කාලයේදී සිරකරුවන් මුදා හැරීම සඳහා නීතිමය හැකියාවක් නොමැති බැවින්, එම මුදාහැරීමේ නියෝග ලද සිරකරුවන් පසුදින මුදාහැරීමට කටයුතු සිදුකරනු ලබන බවත් බන්ධනාගාරය සවස වැසීමට ප්‍රථමව ලැබෙන මුදා හැරීම් එදිනම සිදුකරන බවත් විගණනය වෙත දන්වා ඇත.
22	නීති විරෝධි ලෙස ජංගම දුරකතන රඳවා තබාගෙන රැඳවියන් විසින් බන්ධනාගාරයේ පිටත බාහිර පාර්ශවයන්ට ලබාගන්නා ඇමතුම් අවහිර කිරීම සඳහා බන්ධනාගාර තුළ ස්ථාපිතකර තිබුණු දුරකතන සංඥා අවහිර කිරීමේ පද්ධති නිසිපරිදි ක්‍රියාත්මක නොවන බව මීගමුව හා අගුණකොළපැලැස්ස	2023 2022	දුරකථන සංඥා අවහිර කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නිසියාකාරව සංඥා අවහිර කිරීමේ පද්ධතිය ක්‍රියාත්මක කළ යුතු ය.	මෙම පද්ධතිය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් හා දුරකථන සේවා සපයන ආයතනවල සහයෝගයෙන් මෙම පද්ධතිය ස්ථාපිත කර ඇත. එම දෝෂ නිවැරදි කිරීමට	මෙම පද්ධතියේ දෝෂ නිවැරදි කිරීමට මේ වන විට කටයුතු කර ඇත. එසේ වුවත්, දැනට ස්ථාපිත කර ඇති දුරකථන අවහිරතා පද්ධතියේ තාක්ෂණික ක්‍රමවේදය වෙනස් කිරීම පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශයේ අවධානය යොමු වී ඇත.

	බන්ධනාගාරවල සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.			ආරක්ෂක අමාත්‍යාංශය දැනුවත් කර ඇත.	
23	ආයතන සංග්‍රහයේ XIX වෙනි පරිච්ඡේදයේ 5.2.1 ඡේදය ප්‍රකාරව උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකම් නැති (පොදු සේවා නිවාස ලබාගත්) විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 12 1/2 ක් නිවාස කුලී ලෙස අයකර ගත යුතු වුවත්, ඊට අනුගත නොවී 2023 වර්ෂයේ බන්ධනාගාර ආයතන 05ක උපලේඛනගත නිවාස ලබාගැනීමට හිමිකම් නැති විවාහක නිලධාරීන් 76 දෙනෙකුගෙන් රු.2,334,509ක් නිවාස කුලි ලෙස අයවිය යුතු වුවත්, නිවාස කුලිය සඳහා වැටුපෙන් සියයට 10 ක් පමණක් එනම් රු.1,864,952ක් අයකරගෙන තිබුණි. මේ අනුව රු.469,557 ක් අඩුවෙන් අයකරගෙන තිබුණි.	2023	ආයතන සංග්‍රහයේ XIX වෙනි පරිච්ඡේදයේ 5.2.1 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	නිලනිවාස කුලී නිසිපරිදි අයකර ගැනීම සම්බන්ධයෙන් හා හිඟ කුලී අදාළ නිලධාරින්ගෙන් අයකර ගැනීමට උපදෙස් ලබාදී ඇත.	ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 ඡේදය ප්‍රකාරව නිලනිවාස කුලී අයකිරීමට සියළුම බන්ධනාගාර ආයතන වෙත උපදෙස් ලබාදී ඇති අතර, විගණනය පෙන්වාදී ඇති කරුණු අනුව මේ වන විට මෙම හිඟ මුදල්වලින් රු. 69,769ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
24	බන්ධනාගාරය විසින් රාජ්‍ය අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු.148,826,252ක ශේෂය තුළ වසර 20කට වඩා පැරණි රු.2,377,921ක් හා වසර 5-20ත් අතර රු.23,643,153ක ශේෂ හා පෞද්ගලික අංශයට සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු රු. 35,618ක ශේෂයන් තුළ වසර 20 කට වඩා පැරණි රු. 19,034ක් හා වසර 10-20ත් අතර රු.16,584ක ශේෂ දීර්ඝ කාලයක සිට පැවතිය ද, ඒවා මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව අප්‍රමාදව අයකර	2023 2022 2021	මුදල් රෙගුලාසි 502(ආ) ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	විකුණුම් වෙනුවෙන් ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.	රාජ්‍ය අංශයේ සිදු කරන ලද විකුණුම්වලින් ලැබිය යුතු බිල්පත් ශේෂය 2023 දෙසැම්බර් 31 දිනට රු.148,826,252 වන අතර, 2024 අගෝස්තු 31 වන විට එම බිල්පත්වලින් රු.88,197,591ක බිල්පත් පියවා ඇත. ඉතිරි වසර 20කට වඩා පැරණි බිල්පත් රු.2,377,921න් රු.1,948,947ක වටිනාකමින් යුතු බිල්පත් රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 පරිදි කපාහැරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයට යොමුකර ඇත. ඉතිරි බිල්පත්

	ගැනීමට කටයුතු කර නොතිබුණි.				අයකර ගැනීම පිළිබඳ කටයුතු ණය කපාහැරීමේ කමිටුවේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු කරමින් පවතී. වසර 05- 20ත් අතර රු.23,643,154ක ණය ශේෂවලින් රු.13,256,187ක ප්‍රමාණයක් කපාහැරීම සඳහා යොමුකර ඇති අතර, ඉතිරි හිඟ බිල්පත් ශේෂ සම්බන්ධයෙන් කමිටු නිර්දේශ පරිදි ක්‍රියාකිරීමට නියමිත ය. පුද්ගලික විකුණුම්වලට අදාළ හිඟ බිල්පත් රු.35,618න් රු.12,650ක මුදලක් 2024 ඔක්තෝබර් 09 දින අයකරගෙන ඇති අතර, ඉතිරි මුදල අයකර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.
25	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන් හා බන්ධනාගාර ආඥා පනතේ විධිවිධානයන්ට අනුකූලව හා අභ්‍යන්තර චක්‍රලේඛයන්ට අනුගතව රැඳවියන්ගේ මානසික හා ශාරීරික යෝග්‍යතාවයන්ට ගැළපෙන ආකාරයට ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබිය යුතු වුවත්, 2023 වර්ෂයේදී සිදු කළ විගණන පරීක්ෂාව අනුව බන්ධනාගාර ආයතන 05ක සිරවාට්ටු 62ක රැඳවිය යුතු රැඳවියන් සංඛ්‍යාවට වඩා වැඩිපුර රැඳවියන් 2,601 දෙනෙකු රඳවා තිබුණු අතර, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ වාට්ටු 12ක රැඳවිය යුතු සංඛ්‍යාවට වඩා අඩුවෙන් රැඳවියන් 127 දෙනෙකු රඳවා තිබුණි.	2023 2022 2021	පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා බන්ධනාගාර ආඥා පනතේ (54 අධිකාරිය) 94 වගන්තිය යටතේ සකස් කරන ලද 179 රීතියට හා අභ්‍යන්තර චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතුය.	සෑමවිටම එක්සත් ජාතීන්ගේ ප්‍රමිතීන්ට අනුව හා බන්ධනාගාර අඥා පනතේ විධි විධාන ප්‍රකාරව සිරකරුවන් හා සැකකරුවන් රැඳවීමේ මූලධර්ම ආරක්ෂා කිරීමටත්, වර්ගීකරණයන් අනුව රැඳවීමටත් අවශ්‍ය කටයුතු සිදු කිරීමට උපරිම උත්සහයක් ගන්නා බව විගණනය වෙත දන්වා සිටින අතර, වෙනත්	කොළඹ හා කොළඹ ආසන්න පරිසරය තුළ ජනගහණය අධික ඝණත්වයකින් යුතුව ඇති අතර, ඊට සාපේක්ෂව අධිකරණ හා පොලිස් ස්ථාන පිහිටුවා ඇත. වර්තමානයේ ජනාකීර්ණත්වය සමග විවිධ වැරදි සඳහා අත්අඩංගුවට ගන්නා ප්‍රමාණය මෙම කොළඹ අවට ප්‍රදේශවලින් වාර්තා වන අතර, වැඩි සැකකරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රදේශවලින් බන්ධනාගාරගත වීම සිදුවේ. ඔවුන් සඳහා විසදීමට නඩු මෙම අධිකරණවල පවතින බැවින් අගුණකොළපැලැස්ස වැනි දුර බැහැර

නඩු කටයුතු ඇති රැඳවියන් අධිකරණ වෙත ඉදිරිපත් කිරීමේ පහසුව තකා එම අධිකරණයන්ට ආසන්න බන්ධනාගාර තුළ රඳවා ඇති බැවින්, ඉඩකඩ සහිත වෙනත් බන්ධනාගාරයන් වෙත මාරු කිරීම සිදු නොකරනුයේ ඒ සඳහා අමතර පිරිවැයක් ද දැරීමට සිදුවන නිසා වේ.	බන්ධනාගාරයන් සඳහා ඔවුන් මාරු කර දින 14න් 14 නැවත නැවත කොළඹ ප්‍රදේශයට රැගෙන ඒමට සිදුවීම හේතුවෙන් අධික ප්‍රවාහන වියදමක් රජයට දැරීමට සිදුවේ. විසඳීමට නඩු ඇති සැකකරුවන් අදාළ අධිකරණ බලප්‍රදේශයේ සිටිය යුතු අතර, ඔවුන් රක්ෂිත බන්ධනාගාරගත කරනු ලැබූ මහේස්ත්‍රාත්වරයාගේ අධීක්ෂණයට පහසුවන පරිදි රැඳවිය යුතු ය. එසේම කොළඹ නඩු පවතින රැඳවියන් දුර බැහැර මාරු කිරීමේදී ඔවුන්ගේ නඩු සඳහා නීති උපදෙස් ලබාගැනීමට අවස්ථාවක් නොමැති බව හා ඔවුන්ගේ ඥාතීන් හමුවීමට අවස්ථාවක් නොවන බවට, චෝදනාවන් එල්ලවන අතර, අභියාචනා නඩු පවතින රැඳවියන්ට ද, මෙම ගැටළුවට මුහුණ පෑමට සිදුවේ. මෙම හේතූන් නිසා කොළඹ බන්ධනාගාරවල වැඩි රැඳවියන් ප්‍රමාණයක් රැඳවීමට සිදුවන අතර, ජනගහනය අඩු ප්‍රතිශතයක් ගන්නා ග්‍රාමීය පරිසරයක් තුළ පවතින අගුණකොළපැලැස්ස වැනි බන්ධනාගාර සඳහා බන්ධනාගාරගත වන ප්‍රමාණයක් අඩුවීම හේතුවෙන් එහි රඳවන ප්‍රමාණයන් අඩු ප්‍රතිශතයක් ගනී. නමුත් මේ වන විට ගරු අභියාචනාධිකරණයේ

					විසඳීමට නඩු පවතින රැඳවියන් අගුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත මාරු කිරීමට කටයුතු කර ඇති අතර, දීර්ඝකාලීන සිරකරුවන් සහ ම.ද.නි. සහ ජීවිතාන්ත ස්ත්‍රී සිර අගුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත මාරු කිරීමට පියවර ගෙන ඇත.
26	අධිකරණය මගින් බන්ධනාගාරගත කර ඇති සැකකරුවන්ට අදාළව පොලීසිය විසින් රස පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ මත්ද්‍රව්‍ය සාම්පල්වලට අදාළ රස පරීක්ෂක වාර්තා මෙතෙක් ඉදිරිපත් නොවීම නිසා 2023 වර්ෂයේදී විගණන නියැදි පරීක්ෂාව අනුව අගුණකොළපැලැස්ස, කළුතර හා මීගමුව යන බන්ධනාගාර ආයතනවල රක්ෂිත බන්ධනාගාරගත කර ඇති සැකකරුවන් සංඛ්‍යාව 1,421 දෙනෙකු විය.	2023 2022 2021	රස පරීක්ෂණ වාර්තා කඩිනමින් ලබාගැනීම මගින් සැකකරුවන්ට අදාළ ක්‍රියාමාර්ග ගැනීම විධිමත් කළ යුතු ය.	රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් මෙම සැකකරුවන්ගේ රස පරීක්ෂණ වාර්තා ලබාදීම ප්‍රමාදවීම මත ඔවුන් දීර්ඝ කාලයක් බන්ධනාගාර ගතව සිටීමේ තත්ත්වය බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පාලනය කළ හැකි තත්ත්වයක් නොවන බව විගණනය වෙත පෙන්වා දෙමි. මෙම ක්‍රියාවලිය අධිකරණය හා රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව සතු කාර්යයක් බව වැඩිදුරටත් විගණනය වෙත පෙන්වා දෙමි.	රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් රක්ෂිත බන්ධනාගාරගතව සිටින සැකකරුවන් ඇපමත මුදාහැරීමට අදාළව 1991 අංක 08 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදවා හැරීමේ පනත යටතේ ඔවුන්ට ඇප ලබාදීමට අදාළව අදාළ ආයතන මගින් එම සැකකරුවන්ගේ තොරතුරු සමග අදාළ අධිකරණයන්ගේ අවධානය සඳහා යොමු කරන අතර. රස පරීක්ෂක වාර්තාවන් කඩිනමින් ලබාදීම බන්ධනාගාර දෙපාර්මේන්තුවේ පාලනයෙන් බැහැරව පවතී. මෙම ක්‍රියාවලිය අධිකරණය, පොලීසිය සහ රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව හරහා සිදුවන ක්‍රියාදාමක් වේ. 2024 ඔක්තෝබර් 15 දින පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව 2024

					අගෝස්තු 31 දින වන විට රස පරීක්ෂක වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් බන්ධනාගාරගත කර ඇති සංඛ්‍යාව 8,447ක් වූ අතර, එක් රැඳවියෙකු සඳහා දිනකට ආහාර හා නඩත්තු වියදම් සඳහ රු.1,084ක වියදමක් දරන අතර, ඒ අනුව දිනකට දරන අතිරේක වියදම රු.9,156,548ක් බව නිරීක්ෂණය විය.
27	නියැදි විගණන පරීක්ෂාවේදී 2023 ඔක්තෝබර් 01 දින වන විට අධිකරණය මගින් පුනරුත්ථාපනය සඳහා නියෝග ලබාදී පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට අපේක්ෂාවෙන් මාස 06කට වැඩි කාලයක් අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ රඳවා සිටි රැඳවියන් සංඛ්‍යාව 45ක් විය.	2023 2022	සිරකරුවන් විධිමත් පරිදි පුනරුත්ථාපනය සඳහා ක්‍රියාමාර්ගගත යුතුය.	පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ පාලනය වන ආයතනවලට රැඳවියන් අධිකරණය මගින් යොමුකළ ද එම ආයතන තුළ පවතින ඉඩපහසුකම් අනුව ඇතුළත් කිරීම් සිදු කරනු ලබන අතර, වෙනත් නඩු නොමැති අයවලුන් පමණක් ඇතුළත් කර ගනු ලබයි. එසේම මෙම ආයතනයේ ද අමදිවි රිද්ම වැඩසටහන යටතේ මත්ද්‍රව්‍ය පුනරුත්ථාපනලාභීන් පුනරුත්ථාපන කටයුතුවල යොදවා තිබුණි.	මේ වන විට එම ගැටළුව නිරාකරණය වී ඇති අතර, අවම කාලයක් තුළ පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. 2024 ඔක්තෝබර් 15 දින පැවති අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටුවේ ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව 2024 සැප්තැම්බර් 01 දින වන විට පුනරුත්ථාපන කාර්යාංශය යටතේ පවතින කඳවුරුවල තවදුරටත් රැඳවියන් 839 දෙනෙකුට පහසුකම් ලබාදිය හැකි බව හෙළිදරව් විය.
28	අගුණකොළපැලැස්ස, වටරැක, මීගමුව, වැලිකඩ, මහර හා බෝගම්බර යන	2023 2022	නැවත නැවත සිරගත වීම අවම කිරීම සඳහා	නැවත නැවත බන්ධනාගාර ගතවී ඇති	නැවත නැවත බන්ධනාගාර ගත වී ඇති සිරකරුවන් අනන්‍යව

	බන්ධනාගාර ආයතනවල 2023 ජනවාරි සිට නොවැම්බර් මාසය අවසානය දක්වා කාලපරිච්ඡේදය තුළ නැවත නැවත බන්ධනාගාර ගත වී ඇති සිරකරුවන් 2,316ක් විය. තව ද බන්ධනාගාරයේ නැවත නැවත සිරගත වන පුද්ගලයන් හඳුනාගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවා බන්ධනාගාරය තුළ නොමැති අතර, දැනට එම සිරකරුවන් හඳුනාගනු ලබන්නේ ඔවුන් විසින්ම ලබාදෙන වාචික තොරතුරු අනුව බව විගණනයේදී නිරීක්ෂණය විය.	2021	ශක්තිමත් හා විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් ඇති කිරීමට කටයුතු කළ යුතු ය.	සිරකරුවන්ගේ අනන්‍යතාවය හඳුනා ගැනීම පිණිස ජීවමිතික පද්ධතියක් බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියට ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගැනීම.	හඳුනාගැනීම පිණිස ජීවමිතික පද්ධතියක් බන්ධනාගාර තොරතුරු කළමනාකරණ පද්ධතියට ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගනිමින් පවතී.
29	බන්ධනාගාර ආඥාපනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදු කළ සංශෝධනයන්හි 223 පරිච්ඡේදයේ විධිවිධානවලට අනුව සෑම සිරකරුවෙක් සඳහාම එහි උපලේඛන IIහි දැක්වෙන විධිවිධානයන්හි පරිමාණයන්ට අනුව රජය විසින් අනුමත කරන ලද සිරඇඳුම් ඇඳීම සහ භාවිතා කිරීම කළ යුතු වුවත්, අගුණකොළපැලැස්ස බන්ධනාගාරයේ 2023 නොවැම්බර් 13 දින වන විට සිරකරුවන් 500 දෙනෙකුට අධික සංඛ්‍යාවක් සිටිය ද ඔවුන් අතරින් සිරකරුවන් 75 දෙනෙකුට පමණ සිරඇඳුම් නොමැතිවීම නිසා තමන් පුද්ගලිකව සපයාගත් ඇඳුම් භාවිතා කරනු ලබයි. අනෙකුත් සිරකරුවන්ට ලබාදී ඇති සිරඇඳුම් ද හොඳ තත්ත්වයේ නොමැති බව නිරීක්ෂණය විය.	2023	බන්ධනාගාර ආඥා පනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදු කළ සංශෝධනයන්හි 223 පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	විගණනයට පසු මාසයේම එම නේවාසිකයන්ට සිර ඇඳුම් නිකුත් කිරීමට කටයුතු කරන ලදී. බන්ධනාගාර ආඥා පනතේ 54 ඡේදයට අදාළව 1956 වර්ෂයේ සිදුකළ සංශෝධනයන්හි 223 පරිච්ඡේදයේ විධිවිධාන අනුව සෑම සිරකරුවෙක් සඳහාම උපලේඛන IIහි දැක්වෙන පරිමාණයන්ට අදාළව අවශ්‍ය කරන සිර ඇඳුම් බන්ධනාගාර මූලස්ථාන ගබඩා අංශයෙන් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කරන ලෙසට සියළුම බන්ධනාගාර	මේ වන විට ඉදිරි අවශ්‍යතාවයන් සඳහා ද සිර ඇඳුම් කට්ටල ගබඩා කොට තබා ඇති අතර, අවශ්‍යතාවය අනුව මූලස්ථාන ගබඩාවට ඇනවුම් සිදුකර ඇත. එමෙන්ම 2023 හා 2024 වර්ෂවලදී කිහිපවතාවකදීම (2023 මැයි 09, 2023 ඔක්තෝබර් 24, 2024 ජනවාරි 08 යනාදී දිනවල) අගුණකොළපැලැස්ස බන්ධනාගාරය වෙත සිර ඇඳුම් නිකුත් කිරීමට කටයුතු කර ඇති බව ද දන්වමි.

				ආයතන වෙත උපදෙස් ලබාදී ඇත.	
30	බන්ධනාගාරවල පවතින අසාමාන්‍ය තදබදයට මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි නිසා බන්ධනාගාරගතවීම් ප්‍රධාන හේතුවක් වන අතර, ඒ සම්බන්ධ රැඳවියන්ගෙන් බොහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් නිසා කවර ආකාරයකින් හෝ අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට ඔවුන් උත්සාහ කරනු ලබන අතර, එවැනි තත්ත්වයන් වැලැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවීම නිසා බන්ධනාගාරයේ ප්‍රධාන අරමුණු කරා ළගාවීමට මෙන්ම බන්ධනාගාර අභ්‍යන්තර ආරක්ෂාව හා ක්‍රියාකාරීත්වයට බාධාවක් වී ඇත. මේ සම්බන්ධව නියැදි පරීක්ෂාවක් අනුව මීගමුව හා කළුතර බන්ධනාගර තුළ සිදුකළ භෞතික පරීක්ෂාවේදී මීගමුව බන්ධනාගාරයේ 2023 අගෝස්තු 27 වන දිනට මුළු රැඳවියන් සංඛ්‍යාව වූ 2,225 න් සියයට 65 ක් එනම් 1,442ක් ද, කළුතර බන්ධනාගාරයේ 2023 සැප්තැම්බර් 19 දිනට රඳවා සිටින මුළු රැඳවියන් සංඛ්‍යාව වූ 1,275න් සියයට 69ක් එනම් 885ක් මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ වන රැඳවියන් විය.	2023	කාලීන අවශ්‍යතාවයට ගැළපෙන පරිදි රැඳවියන් යහපත් පුරවැසින් ලෙස පිටත්වීමට අවශ්‍ය සමාජ පසුබිම සැකසීම දෙපාර්තමේන්තු වේ ප්‍රධාන කාර්යයන් අතුරින් එකක් වන බැවින්, ඊට අදාළ අනිකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණය වෙමින් කටයුතු කළ යුතු ය.	විගණන නිරීක්ෂණ හා එකඟ වන නමුත්, මෙම ක්‍රියාදාමය රජයේ මත්ද්‍රව්‍ය මර්ධන ප්‍රතිපත්තිය මත තීරණය වන ක්‍රියාවලියක් බැවින් බන්ධනාගාර දෙපාර්තමේන්තු වේ පාලනයෙන් පරිබාහිර කටයුත්තකි. මේ සම්බන්ධව පත්කර ඇති කාර්යසාධන බලකා හා අනෙකුත් ප්‍රතිපත්තිමය තීරණ ගන්නා සාකච්ඡාවලදී දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	අධිකරණ මගින් රිමාන්ඩ් භාරයට පත් කරන රැඳවියන් සම්බන්ධයෙන් මැදිහත්වීමට බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හැකියාවක් නොමැති අතර, මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් චෝදනා ලබා රිමාන්ඩ් බන්ධනාගාරගත වන ප්‍රමාණය ඉහළ යාම පිළිබඳව අදාළ අංශ දැනුවත් කිරීමට කටයුතු කර ඇත. එසේම මෙම ගැටළුව සඳහා බන්ධනාගාරයෙන් පරිබාහිර විකල්ප ආයතන ඇති කිරීම සම්බන්ධයෙන් ද අවධානය යොමුකළ යුතු බව අදාළ සාකච්ඡාවලදී දැනුවත් කර ඇත.
31	ගරු අධිකරණය මඟින් බන්ධනාගාරගත වන රැඳවියන් වෙනුවෙන් ඇප නියමවී තිබුණ ද, අදාළ රැඳවියන් හට ඇප කොන්දේසි සපුරාලීමට	2023	ඇප කොන්දේසි කඩිනමින් සපුරාලීම අවශ්‍ය කටයුතු සුදානම් කර දිය යුතු ය.	1991 අංක 08 දරන රිමාන්ඩ් භාරයේ සිටින සැකකරුවන් මුදවා හැරීමේ පනත යටතේ	රක්ෂිත බන්ධනාගාර ගතව සිටින සැකකරුවන් ඇප මත මුදා හැරීමට අදාළව 1991 අංක 08 දරන රිමාන්ඩ් භාරයේ සිටින සිරකරුවන් මුදවා

	නොහැකිවීම තුළ නියැදි පරීක්ෂාවක් අනුව මීගමුව බන්ධනාගාරයේ 2023 අගෝස්තු 15 දින වන විට දීර්ඝ කාලයක් බන්ධනාගාරගත වී සිටින රැඳවියන් 229ක් නිරීක්ෂණය විය.			පවතින නීතිරාමුව තුළ ඒ පිළිබඳව අදාළ අධිකරණ දැනුවත් කර ඔවුන් පුද්ගලික ඇප මත මුදවා හැරීම්, වරද භාරගෙන සිර දඬුවම් ලබා නඩු කටයුතු අවසන් කිරීම් හා ලබාදී ඇති ඇප කොන්දේසි ලිහිල් කර සහන සැලසීම සිදුකරනු ලබන අතර, මහේස්ත්‍රාත්වරුන් මේ පිළිබඳව දැනුවත්කර එම අධිකරණ වෙත ඇප තබාගැනීමට නොහැකි රැඳවියන් පිළිබඳව නාම ලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.	හැරීමේ පනත හා ඇපපනත යටතේ ඔවුන්ට ඇප ලබා දීමට අදාළව අදාළ ආයතන මගින් එම සැකකරුවන්ගේ තොරතුරු සමග අදාළ අධිකරණයන්ගේ අවධානය සඳහා යොමු කරන අතර, ඇප ලබා නොදීම ඇප කොන්දේසි ලිහිල් කිරිම සම්බන්ධයෙන් අධිකරණයට බලපෑමක් කිරිමට බන්ධනාගාර දෙපාර්තමේන්තුවට හැකියාවක් නොපවතී.
32	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වන සුහසාධන ආපනශාලා සහ අලෙවිසැල්වල සේවය කිරීම සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර, ජලය හා විදුලිය වෙනුවෙන් ද වැය වන වියදම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් දරනු ලබයි. නමුත් මෙම සුහසාධන ආපනශාලා සහ අලෙවිසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් ලැබිය යුතු කුලී ආදායම් හඳුනාගෙන එම ආදායම් මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක 05හි ආදායම් සංකේත අංක 20-02-01-01 යටතේ බදු කුලී ආදායම් ලෙස රජයේ	2022 2021	මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	බන්ධනාගාර ආපනශාලාවන් සඳහා මාසික බිම් කුලිය, ජලය හා විදුලිය වෙනුවෙන් රජයට කුලී මුදලක් අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව මගින් නිර්දේශ කරන මුදල, මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක 05 යටතේ බදුකුලී ආදායමක් ලෙස ආදායම් සංකේත	මේ වන විට බන්ධනාගාරවල ආපනශාලා සඳහා මාසික බිම් කුලිය, ජලය හා විදුලිය වෙනුවෙන් රජයට කුලී මුදලක් අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව මගින් මුදලක් නිර්දේශ කර ඇති අතර, එම නිර්දේශ කරන මුදල, මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක 05 යටතේ බදුකුලී ආදායමක් ලෙස ආදායම් සංකේත 20-02-01-01 ට ගිණුම් ගත කිරීමට එක් එක් බන්ධනාගාර ආයතන විසින් කටයුතු කර ඇත.

	ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. නියැදි පදනමක් මත සිදුකළ විගණන පරීක්ෂාවේදී බන්ධනාගාර ආයතන 09ක 2022 වර්ෂයේ මුල් මාස 06 තුළ මේවාට අනුයුක්ත බන්ධනාගාර නිලධාරීන් 27 දෙනෙකු වෙනුවෙන් වැටුප් හා වේතන වශයෙන් රු.7,528,306ක මුදලක් බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගෙවා තිබුණි. මීට අමතරව මිනිස් දින 5,581ක සිරශ්‍රමය යොදාගෙන තිබූ අතර, රුඳවියන් හට ආහාර ද්‍රව්‍ය හා සනීපාරක්ෂක දෑ අලෙවියෙන් පමණක් රු.104,827,723ක ආදායමක් උපයා තිබුණි.			20-02-01-01 ට ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. මේ සම්බන්ධව දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් නිකුත්කර ඇත.	මෙම මුදල් සෑම මසකම 10 වන දිනට පෙර ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස දැනුවත් කර ඇත.
33	වර්ග අඩි 1,800කට වඩා වැඩි ඉඩ ප්‍රමාණයක ගොඩනැගිලි හා අසීමිතව විදුලිය හා ජලය උපයෝගී කර ගනිමින් අනුරාධපුර බන්ධනාගාරයේ සම්පත් යොදාගෙන සුබසාධන සංගමය මගින් පවත්වාගෙන යන අවන්හලක් මුවාවෙන් පුද්ගලික ව්‍යාපාර කටයුත්තක් ලෙස මහා පරිමාණ අවන්හලක් දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යනු ලබයි. මෙම අවන්හලෙන් කර්මාන්ත අංශයේ බේකරි නිෂ්පාදන ද්‍රව්‍ය දෛනිකව අලෙවි කිරීමෙන් ලබන ආදායම රු. 19,000 ක් වුව ද, පාරිභෝගිකයන්හට වෙනත් භාණ්ඩ හා සේවා සැපයීමට අදාළව රු.300,000ක ආසන්න ආදායමක් ඉපයීය හැකි වුවත්, ඒ සඳහා බිල්පත් නිකුත් කිරීමක් සිදු නොකරයි. අවන්හලේ දෛනිකව සිරකරුවන් 6 දෙනෙකුට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවා	2022	ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 1:5 හා 1:11 වගන්තිවලට අනුව කටයුතු කළ යුතු ය.	විගණන විමසුමට අදාළව තොරතුරු බන්ධනාගාර අධිකාරී වෙතින් කැඳවා ඇත. මේ සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. කුලිය, ජලය හා විදුලිය වෙනුවෙන් රජයට කුලී මුදලක් අයකර ගැනීම සඳහා කමිටුවක් පත්කර එම කමිටුව මගින් නිර්දේශ කරන මුදල, මුදල් රෙගුලාසි 83 ප්‍රකාරව රජයේ ආදායම් ශීර්ෂ අංක 05 යටතේ බදුකුලී ආදායමක් ලෙස ආදායම් සංකේත	බන්ධනාගාර ආපනශාලාවෙහි මෙම විගණන විමසුම් කාලය වන විට රාජකාරි සිදු කරන ලද නිලධාරීන් වෙනුවට වෙනත් නිලධාරීන් ආපන ශාලාවේ රාජකාරි සඳහා අනුයුක්ත කර ඇත. මේ සම්බන්ධව පරීක්ෂණ කමිටුවේ වාර්තාව ලැබී ඇති අතර, ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධව නිර්දේශ ලබාදෙන ලෙස දන්වා ඇත. මෙම ආපනශාලාවේ විදුලි සහ ජල මීටර් වෙනම සවිකර ඇත. මාසිකව රු.3150ක මුදලක් රජයේ ආදායමට බැර කරනු ලැබේ. මෙම ආපනශාලාව වඩාත් හොඳ තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා බන්ධනාගාර ආයතනයේ

	තිබුණු අතර, අවන්හලට අනුයුක්තව සේවය කරන බන්ධනාගාර නිලධාරියා වෙනුවෙන් 2022 වර්ෂයේදී වැටුප් හා දීමනා රු.707,241ක් ගෙවා තිබුණි. ඉතා කුඩා ලාභ කොටසක් මාසිකව ඉපයූ ලාභ වශයෙන් සුබසාධක සංගමයට බැර කළ ද, රජයේ ආදායමට කිසිඳු මුදලක් බැර නොකරයි. අවන්හලට අනුයුක්ත කර ඇති නිලධාරියා විසින් අධිශීතකරණ, ශීතකරණ, ගෘහඋපකරණ ආදී ඉතා වටිනාකමින් අධික ඉන්වෙන්ට්‍රි භාණ්ඩ රාශියක් අවන්හලට පුද්ගලිකව සපයා තිබුණි.			20-02-01-01 ට ගිණුම්ගත කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. මේ සම්බන්ධව දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් නිකුත්කර ඇත.	මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ ද සහාය ලබාගනිමින් කටයුතු කරන බව ද දන්වමි. අවශ්‍ය සංග්‍රහ උපකරණ ආදිය ද සංගමය හරහා මිලදී ගැනීමට කටයුතු කරන බව ද දන්වමි.
34	සමාලෝචිත වර්ෂය තුළදී කර්මාන්ත ක්‍රියාත්මක වන බන්ධනාගාර ආයතන 18ක් අතුරින් ආයතන 07ක වැඩ අංශ 11ක නිෂ්පාදනයක් සිදුකර නොතිබුණි. බන්ධනාගාර ආයතන 05ක නිෂ්පාදනය 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියයට 16ත් සියයට 77ත් අතර පරාසයක් තුළ අඩුවීමක් දක්නට ලැබුණු අතර, බන්ධනාගාර ආයතන 03ක විකුණුම් 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ සියයට 42ත් සියයට 48ත් අතර පරාසයක් තුළ අඩුවීමක් දක්නට ලැබුණි.	2022	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශය ප්‍රශස්ථ මට්ටමින් ක්‍රියාත්මක කර ආදායම් වැඩිකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගගත යුතු ය.	නිෂ්පාදනයන් හා විකුණුම් වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.	පල්ලෙකැලේ වීවින් අංශය මේ වන විට ක්‍රියාත්මක වේ. අනුරාධපුර ජේෂකර්ම අංශයේ පුහුණු නිලධාරියෙකු නොමැතිවීමත් හා පුහුණු සිරකරුවන් නොමැතිවීමත් නිසා මෙම අංශය තාවකාලිකව වසා ඇත. ක්‍රියාකාරී සැලැස්ම අනුව තල්දෙන ආයතනයේ රජක අංශයක් නොමැත. මඩකළපුව ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව මැහුම් අංශය හා බ්ලොක් ගල් අංශයක් නොමැත. වීරවිල ආයතනය මත්ද්‍රව්‍ය නිවාරණ හා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වන බැවින් මෙම කම්හල් අංශය හා වැල්ඩින් අංශය ක්‍රියාත්මක නොවන අතර, ක්‍රියාකාරී සැලැස්මට අනුව බේකරි අංශය / ගඩොල් අංශය/ කෘෂි කර්මාන්තය

					පමණක් මෙම ආයතනයේ ක්‍රියාත්මක වේ. දළුපොත - මෙම ආයතනයේ ගඩොල් අංශයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම අනුව නොමැති අතර, පාවහන් අංශය මේ වන විට ක්‍රියාත්මක් නොවේ. වාරියපොල ආයතනයේ මැහුම් හා වඩු අංශයන් ලෙස ක්‍රියාකාරී සැලැස්ම අනුව නොමැත.
35	2023 අප්‍රේල් 30 දින වන විට බන්ධනාගාර 27ක වැසිකිළි 187ක හිඟයක් පැවති අතර, දැනට තිබෙන වැසිකිළිවලින් ද 278 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.	2022	ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් ලබාදිය යුතු ය.	නව වැසිකිළි 106ක් ඉදිකිරීම සඳහා හා වැසිකිළි 166ක් අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත.	එම ප්‍රමාණය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිකුත් කර ඇත. මීට අමතරව සුලු අලුත්වැඩියා සිදුකර අදාළ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර නිම කිරීම සඳහා 1303 වැය ශීර්ෂය යටතේ ඉටුකර ගන්නා ලෙස බන්ධනාගාර අධිකාරී වෙත උපදෙස් ලබාදී ඇත. වැඩකටයුතු සියයට 90කට වඩා ඉටුකර ඇත.
36	අනුරාධපුර, කළුතර හා කෑගල්ල බන්ධනාගාරවල සිදුකළ භෞතික පරීක්ෂාවලදී අළුත්වැඩියා නොකළ අබලන් තත්ත්වයේ පැවතුණු ගොඩනැගිලි නිරීක්ෂණය වූ අතර, මීට අමතරව වැලිකඩ බන්ධනාගාරයේ D හා වැපල් වාට්ටු පරිශ්‍රයන් ද අබලන්ව පැවතුණි. මහර බන්ධනාගාරය වසර ගණනාවකට පෙර ඉදිකරන ලද සිරමැදිරි සහ සිරවාට්ටු කාලීනව අලුත්වැඩියාවන් සිදු නොකිරීම නිසා අබලන් තත්ත්වයේ පැවතුණි. ගරා වැටෙමින් පවතින සිරවාට්ටු පැවතීම, සිරවාට්ටුවල වැසිකිළි පද්ධතිය අබලන්ව පැවතීම, සිරමැදිරි හා වාට්ටු තුළ පවතින අපිරිසිදු පරිසරය	2022 2021	බන්ධනාගාරගත කරන ලද සෑම තරාතිරකම සිරකරුවන්හට බන්ධනාගාර නීතිරීතිවලට අනුකූලව ඔවුන්ගේ ආරක්ෂාව, රැකවරණය හා නඩත්තුව සැලසීම සිදුකළ යුතු ය.	වැපල් අංශයේ D අංශයේ අලුත්වැඩියාවන් සිදු කිරීම ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ උපදෙස් පරිදි සැලසුම් සකස්කර ඇත. පැරණි වාට්ටු වැසිකිලි පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කිරීම. අබලන් ගොඩනැගිලි අලුත්වැඩියාවන් හා වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍ය උපදෙස්	D අංශය සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට යෝජිත ය. පැරණි වාට්ටු 3ක් පූර්ණ අලුත්වැඩියාවන්ට ලක්කර ඇත. ඉතිරි වාට්ටු නිම කිරීම සඳහා අවශ්‍ය සැලසුම් හා ඇස්තමේන්තු සකස් කරන ලෙස උපදෙස් ලබාදී ඇත. කළුතර බන්ධනාගාරයේ ගොඩනැගිලි සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ව්‍යුහාත්මක ඉංජිනේරුවන්ගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන ලදී. එම උපදෙස් පරිදි

	හා මදුරුවන්, මකුණන්,මීයන් වැනි සතුන් බෝවී පැවතීම නිසා රැඳවියන්ට ප්‍රමාණවත් සනීපාරක්ෂක පරිසරයක් නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. මීට අමතරව පල්ලෙකැලේ එළිමහන් සිරකඳවුරේ සිරවාට්ටු නඩත්තු නොකර අබලන් තත්ත්වයේ පැවතුණු අතර, වාට්ටුවල වැසිකිළි පහසුකම් ද ප්‍රමාණවත් පරිදි නොතිබුණි.			ලබාදී ඇත.	අලුත්වැඩියාවන් හෝ ගොඩනැගිලි ඉවත් කිරීම සිදු කිරීමට කටයුතු කරනු ඇත. අනුරාධපුර විශේෂ අංශයේ පූර්ණ අලුත්වැඩියාවන් මේ වන විට සිදුකර ඇත. කෑගල්ල අදාළ අලුත්වැඩියාවන් සිදු කරමින් පවතී.
37	2022 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර උදෑසන විවෘතය අනුව රැඳවියන්ගෙන් සියයට 53ක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වන වැරදි සඳහා දඬුවම් විඳින හා සැකපිට රඳවා ඇති රැඳවියන් වේ. මෙම රැඳවියන්ගෙන් ද සියයට 68ක් සැකපිට රඳවා ඇති රැඳවියන් වේ. මත්ද්‍රව්‍ය වැරදිවලට සම්බන්ධ බන්ධනාගාරගත රැඳවියන්ගෙන් බෙහෝ දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වූවන් නිසා කවර ආකාරයකින් හෝ අවශ්‍ය මත්ද්‍රව්‍ය ප්‍රමාණය ලබාගැනීමට ඔවුන් උත්සහ කරනු ලබන අතර, එවැනි තත්ත්වයන් වැලැක්වීමට බන්ධනාගාර නිලධාරීන්ට වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවන අතර ඒ සඳහා මානව සම්පත් ප්‍රමාණවත් පරිදි නොතිබීම නිසා බන්ධනාගාර අභ්‍යන්තර ආරක්ෂාව හා ක්‍රියාකාරීත්වයට ද එය බාධාවක් වී ඇත.	2022	බන්ධනාගාරයේ මූලික අරමුණක් වන සිරකරුවන්ගේ අරක්ෂාව සැපයීමට බාධාවන වතාවරණයන් අවමකර ගැනීමට සහ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් බඳවාගැනීමටත් කටයුතු කළ යුතුය.	නිලධාරීන් බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	බන්ධනාගාර නියාමක තනතුරු පුරප්පාඩු 347 සම්පූර්ණ කිරීමට විභාග පවත්වා බඳවාගැනීමට අදාළ ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. හදිසි ප්‍රතිචාර හා උපක්‍රමික බලකාය සඳහා යුධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නිලධාරීන් 472ක් බඳවාගැනීමට අයදුම්පත් කැඳවා ඇත.
38	රැඳවියන්ගේ අයිතිවාසිකම් සම්මත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුගතවන සේ ආරක්ෂා කිරීමටත්, රැඳවියන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් විධිමත් අයුරින් රැඳවියන් පුනරුත්ථානය කිරීමටත්	2022	ක්‍රියාත්මක කිරීම අත්හිටුවා ඇති වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ ප්‍රදේශයේ නැවත	මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියකි.	මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියට අදාළව බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින්

	අපේක්ෂාවෙන් රුපියල් බිලියන 30.6ක අපේක්ෂිත පිරිවැය මත බොරැල්ලේ පිහිටි වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියක් සැලසුම්කර තිබුණි. මෙම ව්‍යාපෘතියට අදාළ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව, සැලසුම් හා නිර්මාණ කටයුතු, අභ්‍යන්තර මාර්ග, ජලය හා විදුලිය ඇතුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කටයුතු සියයට 30ක් පමණ නිමකර තිබුණ ද, මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා තිබුණි.		ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය ඉක්මනින් ආරම්භ කර ක්‍රියාත්මක කිරීම.	මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත.	කිසිදු පිරිවැයක් දරා නොමැති බව දන්වමි. මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 03/2022 චක්‍රලේඛය අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවා ඇත. එසේ වුව ද රාජ්‍ය ඉඩම් ආඥාපනතේ 6(1) වගන්තියේ සටහන් අංක 4/2/9799 හා 2022 නොවැම්බර් 16 දිනැති නිදහස් දීමනාපත්‍රය අනුව බන්ධනාගාර මූලස්ථානය පිහිටි හෙක්ටයාර් 16.436ක් වූ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන ඇත.
39	2023 දෙසැම්බර් 31 දිනට අනුමත නිලධාරීන් සංඛ්‍යාව 7,872ක් වූ අතර, තථ්‍ය නිලධාරීන් සංඛ්‍යාව 6,173ක් වූයෙන් තනතුරු 02කට අදාළ අතිරික්ත නිලධාරීන් 18ක් හා තනතුරු 79කට අදාළ පුරප්පාඩු නිලධාරීන් 1,717ක් පැවතුණි. 2021 හා 2022 වාර්තාවල ද එහි සඳහන් පරිදි නිලධාරී පුරප්පාඩු පැවතුණි.	2023 2022 2021	ඵලදායී සේවා මට්ටමක් පවත්වාගැනීම සඳහා සේවක මණ්ඩල සමාලෝචනයක් සිදුකර ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීමට කළමනාකරණය පියවරගත යුතු ය.	2023 අගෝස්තු 31 දිනට පසුව තනතුරු 18කට නිලධාරීන් 169 දෙනෙකු සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තු වේ පැවති පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු කර ඇත.	ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පුරප්පාඩු තනතුරු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් කර ඇත. සහකාර කෘෂිකර්ම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් කර ඇත. සහකාර බන්ධනාගාර අධිකාරී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උපවැඩ පරීක්ෂක තනතුරු සහ වැඩ පරීක්ෂක තනතුරු සම්පූර්ණ කිරීම සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතී. බන්ධනාගාර නියාමක තනතුරු පුරප්පාඩු 347 සම්පූර්ණ කිරීමට විභාග

					පවත්වා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. හදිසි ප්‍රතිචාර හා උපක්‍රමික බලකාය සඳහා යුධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ නිලධාරීන් 472 ක් බඳවාගැනීමට අයදුම්පත් කැඳවා ඇත.
40	2023 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර රෝහල් 14කට අදාළව අතිරික්ත ශ්‍රේණිගත වෛද්‍යවරුන් 22ක් සහ බන්ධනාගාර රෝහල් 05කට අදාළව පුරප්පාඩු ශ්‍රේණිගත වෛද්‍යවරුන් 09ක් වූ අතර, බන්ධනාගාර රෝහල් 04ක අතිරික්ත ලියාපදිංචි වෛද්‍යවරුන් 05ක් සහ බන්ධනාගාර රෝහල් 03ක පුරප්පාඩු ලියාපදිංචි වෛද්‍යවරුන් 05ක් විය. 2023 ජුනි 09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළව වෛද්‍යවරුන් බන්ධනාගාර රෝහල්වලට පැමිණීම හා පිටවීම සම්බන්ධ දොරටු ලේඛනයන්හි ඇතුළත් තොරතුරු බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණ ද, බන්ධනාගාර රෝහල් කිහිපයකට අනුයුක්තව සේවය කරන වෛද්‍යවරුන්ගේ විස්තර පමණක් යොමුකර තිබූ අතර, ඒවා ද ක්‍රමානුකූලව සකස් කරන ලද වාර්තා නොවීය.	2023 2022	බන්ධනාගාර රෝහල්වලට වෛද්‍යවරුන් අනුයුක්ත කිරීමේදී අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන සෞඛ්‍ය අමාත්‍යාංශය සමග ඒකාබද්ධව විධිමත් වැඩ පිළිවෙලක් යෙදිය යුතු වීම සහ 2023 ජුනි 09 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබාදුන් නියෝග ක්‍රියාත්මක කළ යුතු ය.	වෛද්‍යවරුන්ගේ පරිපාලනය හා කාර්ය සාධනය සම්බන්ධව කටයුතු කිරීම බන්ධනාගාර දෙපාර්තමේන්තු වෙන් බැහැර කාරණාවකි. වෛද්‍යවරුන්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට කටයුතු කරයි.	වෛද්‍යවරුන්ගේ පැමිණීම පිටවීම සම්බන්ධයෙන් මේ දක්වා මූලස්ථානය වෙත යොමු කරන බන්ධනාගාරවල සේවයේ නියුතු වෛද්‍යවරුන්ගේ පැමිණීමේ හා පිටවීමේ වාර්තා පමණක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කර ඇති බව දන්වමි.
41	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති අංක 251 ප්‍රකාරව භූගෝලීය වශයෙන් එකම ප්‍රදේශයක	2023 2022	රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටියක රීති	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පවත්නා නිලධාරී හිඟය	2023 වර්ෂයට අදාළව කාලය සම්පූර්ණ සෑම නිලධාරියෙකුම ස්ථාන මාරු ඉල්ලුම් කළ අතර,

	පිහිටි සේවා ස්ථාන අතර, ස්ථාන මාරුවීම් ලබාගනිමින් දිගින් දිගටම එකම ප්‍රදේශයක රැඳී සිටීමට නිලධාරීන් දරන උත්සහයන් වැළැක්වීම සඳහා වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පටිපාටි සැකසීමේදී සැලකිල්ලටගත යුතු වේ. නියැදි විගණන පරීක්ෂාවේදී 2024 මාර්තු 31 දින වන විට බන්ධනාගාර ආයතන 10ක නිලධාරීන් 377 දෙනෙකු බන්ධනාගාරයට අනුයුක්ත කළ දිනයේ සිට වසර 06ත් වසර 25ත් අතර කාලයක සිට එම බන්ධනාගාරයේම අඛණ්ඩව සේවය කරන බව නිරීක්ෂණය විය. මෙයින් නිලධාරීන් 29 දෙනෙකු මීට පෙර ද එම බන්ධනාගාර ආයතවලටම අනුයුක්තව සේවය කර ඇති බව ද වැඩිදුරටත් නිරීක්ෂණය විය.		අනුව වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්ති සකස්කර ක්‍රියාත්මක කළ යුතු ය.	හේතුවෙන් බන්ධනාගාර වෙත ස්ථාන මාරු පැමිණි නිලධාරීන් සංඛ්‍යාවට අදාළව පමණක් මුදාහැරීමේ කටයුතු සිදුකොට ඇත.	නිලධාරීන්ගේ සාධාරණ හේතු මත සමහර නිලධාරීන්ට ස්ථාන මාරු ලබාදීම සිදුකර නොමැත. ඒ අනුව බන්ධනාගාර වෙත ස්ථාන මාරු පැමිණි නිලධාරීන් සංඛ්‍යාවට අදාළව පමණක් මුදාහැරීමේ කටයුතු සිදුකොට ඇත.
42	බන්ධනාගාර දෙපාර්තමේන්තුව මඟින් පාලනය වන දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි වැඩ බිම්, කර්මාන්ත සහ ඉදිකිරීම්වලට සෘජුවම සම්බන්ධ වන තනතුරුවල පවතින පුරප්පාඩු 66ක් හේතුවෙන් ඉදිකිරීම්, කර්මාන්ත, වැඩබිම්වල කාර්යක්ෂමතාවය, ව්‍යාපෘතිවල ඵලදායීත්වය හා ගුණාත්මකභාවය පහළ මට්ටමක පැවතුණි.	2021	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු ය.	නිලධාරීන් බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	සහකාර කෘෂිකර්ම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉල්ලීම් කර ඇත. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ උපවැඩ පරීක්ෂක තනතුරු සහ වැඩ පරීක්ෂක තනතුරු සම්පූර්ණ කිරීම සඳහා මූලික කටයුතු සිදු කරමින් පවතී.
43	බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩල තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය II,III) තනතුරු සඳහා 2013 වර්ෂයේ සිට නිලධාරීන් පත්කර නොතිබුණි.	2021	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු ය.	නව බඳවාගැනීම් සිදු කරන අවස්ථාවලදී මෙම දෙපාර්තමේන්තුව වෙත නිලධාරීන් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් ඉල්ලීම් කර ඇත.	ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II/III ශ්‍රේණියේ නිලධාරියෙකු ලබාගැනීම සඳහා අවස්ථා ගණනාවකදී කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත රේඛීය අමාත්‍යාංශය මගින් ඉල්ලීම් කර ඇත. අවසන් වශයෙන් 2023

					දෙසැම්බර් 15 දිනැතිව ඉල්ලීමක් කර ඇති අතර, කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ලේකම්ගේ ලිපියක් මගින් නවක නිලධාරීන් බඳවාගන්නා විට මෙම දෙපාර්තමේන්තුව වෙත නිලධාරියෙකු ලබාදෙන බව රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ තනතුරු ඉල්ලීම් ලිපිය මගින් දන්වා ඇත.
44	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩල තුළ උපදේශන නිලධාරී තනතුරු 07ක් අනුමත කර තිබූ අතර, මෙම තනතුරු 07 සම්පූර්ණ කිරීම සඳහා බඳවාගැනීමේ පරිපාටියක් සකස්කර ගැනීමට කටයුතු නොකිරීම තුළ දීර්ඝ කාලයක සිට මෙම තනතුරේ පුරප්පාඩු පැවතුණි.	2021	අදාළ තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු ය.	නිලධාරීන් බඳවාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	උපදේශන නිලධාරී බඳවාගැනීම් පරිපාටිය අනුමතකර ගැනීම සඳහා වන ලිපිය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇත.

35. ශීර්ෂය - 233 ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,458,829,205	380,447	2,458,448,759	තත්ත්වාගණනය කළ
2022	2,578,689,247	428,121	2,578,261,127	තත්ත්වාගණනය කළ
2023	2,734,871,696	2,945,744	2,734,871,696	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරීන්ට ඇප තැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන් කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇප මුදල් තැන්පත්කර නොතිබුණි.	2021 2022 2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	අධිකරණ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡා වූ පරිදි රජයේ නිලධාරීන්ගේ ඇප තැබීමේ ආඥා පනත සංශෝධනය කිරීමට නියමිත බවත්, ඒ අනුව ඉදිරියේදී රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම සම්බන්ධයෙන් තීරණය ගන්නා බවත් සඳහන් වූ නිසා එතෙක් ඇප තැබීමේ කටයුතු සිදු නොකරන ලද බව දන්වා තිබුණි.	රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම් ආඥා පනත සංශෝධනය වීමෙන් පසු එහි ඇතුළත් විධිවිධාන අනුව කටයුතු කිරීමට නියමිත ය.
02	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.	2021 2022 2023	විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතු ය.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර 2023 වර්ෂයේදී පුරප්පාඩුව පැවති බැවින්, අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් අධීක්ෂණය කරනු ලබන	මේ වන තෙක් අභ්‍යන්තර විගණන පුරප්පාඩුව ඇත. අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය අදාළ අධීක්ෂණ කටයුතු

				බව දන්වා තිබුණි.	සිදු කරනු ලබයි.
03	2021 - 2024 කාලසීමාව සඳහා කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (KOICA) මඟින් දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධනය කිරීම සඳහා ඇමෙරිකන් ඩොලර් මිලියන 4.5ක ප්‍රදානයක් ලබාදී තිබූ අතර, සමාලෝචිත වර්ෂය සඳහා රු.මි.100ක් ඇස්තමේන්තු කර තිබුණ ද, KOICA ආයතනය විසින් කිසිදු වියදමක් වාර්තා කර නොතිබුණි.	2022 2023	විදේශ ආධාර මත ලැබෙන මෙම මුදල් අපේක්ෂිත කාර්යයන් සඳහා කාර්යක්ෂමව යොදා ගැනීමට කටයුතු කළ යුතු ය.	2023 වර්ෂයට අදාළව ව්‍යාපෘති කාර්යාලය විසින් කිසිදු වියදමක් වාර්තා නොකරන ලද බව දන්වා තිබුණි.	2024 වර්ෂයේදී KOICA ව්‍යාපෘතිය යටතේ විද්‍යාගාර උපකරණ, විද්‍යාගාර ගෘහභාණ්ඩ, රසායනික ද්‍රව්‍ය හා ප්‍රමිතීන් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත. ඒ අනුව 2024 වර්ෂයට අදාළව ලැබුණු ප්‍රතිපාදන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී නොමැත.
04	2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018, 6.1 ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර නොතිබුණි.	2022 2023	කාර්යය මණ්ඩලයේ ඵලදායීතාවය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු ය.	නිකුත්කර ඇති චක්‍රලේඛවල සීමාවන්ට යටත්ව දෙපාර්තමේන්තුව සඳහා වෙන්කළ ප්‍රතිපාදන අනුව සේවා අවශ්‍යතාවය ද සැලකිල්ලට ගෙන අත්‍යාවශ්‍ය පුහුණු සහ නොමිලේ පවත්වන පුහුණු සඳහා පමණක් ඉහත සීමිත අවශ්‍යතාවය පරිදි සහභාගී කළ බව දන්වා තිබුණි.	වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය සීමිත වීම මත පුහුණු අවස්ථාවන්ට යොමු කිරීම සීමා කිරීමට සිදුවිය.
05	2018 දෙසැම්බර් 31 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018, මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 1.3.4 අනුව වාහනයකට සිදු වූ අනතුරකදී රු. ලක්ෂ 05කට වඩා වැඩි අලුත්වැඩියා වියදමක් දරන්නට සිදුවුවහොත් අලුත්වැඩියාවෙන් පසු එහි	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මෙම වාහනය නියෝජිත ආයතනයක් වෙතින් අලුත්වැඩියාකර ලබාදී ඇති අතර, තක්සේරු වාර්තාව ලබාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	තක්සේරු කමිටුවට යොමුකර 2024 ඔක්තෝබර් 31 දිනට පෙර තක්සේරුව ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.

	වටිනාකම තක්සේරු කළ යුතු අතර, එම තක්සේරු වටිනාකම වාහනයේ වටිනාකම ලෙස සැලකිය යුතු වුව ද, වාහනයක් අනතුරින් පසු රු.2,835,853ක් දරා අලුත්වැඩියාව කර තිබුණ ද, අලුත්වැඩියාවෙන් පසු එම වාහනය තක්සේරුකර වටිනාකම ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි.				
06	මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ 2.3, 3.3.1 සහ 4.3 ඡේද ප්‍රකාරව සෑම වර්ෂ 05කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරු කිරීමක් සිදුකළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ස්ථාවර වත්කම් නැවත තක්සේරු කිරීමට අදාළ මාර්ගෝපදේශ අනුව සිදුනොකළ බව පිළිගන්නා බවත්, 2024 වර්ෂයේදී සිදු කිරීමට නියමිත බවත් දන්වා තිබුණි.	ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. කෙසේ වුව ද, දෙවන වටයේ තක්සේරුකිරීම්වලට පෙර පළමු වටයේ තක්සේරු කිරීම් නිමකළ යුතු බැවින්, මෙම තක්සේරු කිරීම කළ නොහැකි බව තක්සේරු දෙපාර්තමේන්තුව දන්වා ඇත. අදාළ ලිපියේ පිටපතක් මේ සමග අමුණා ඇත. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ හා කාර්යාලීය උපකරණ හා ගෘහභාණ්ඩ තක්සේරු කිරීම සඳහා කමිටු පත්කර ඇත.
07	දෙපාර්තමේන්තුවේ 2003 පෙබරවාරි 14 දින සිදුවූ ගිනි අනතුරින් වූ රු.2,229,111ක් වූ හානිය, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් කර තිබුණ ද, එය අයකර ගැනීමට හෝ	2023	හානි හා පාඩු අයකර ගැනීමට හෝ පොත්වලින් කපාහැරීමට කටයුතු කළ	මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව සතුව පවතින ගොනුවේ අලාභයේ ප්‍රමාණය සකස් වූ ආකාරය සඳහන්ව නොමැති අතර, මෙම අලාභය	2024 ඔක්තෝබර් 31 දිනට ප්‍රථම අදාළ අලාභය පොතෙන් කපාහැරීමට කටයුතු කරනු ලැබේ.

	පොත්වලින් ඉවත් කිරීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතුකර නොතිබුණි.		යුතු ය.	අයකර ගැනීමට පාර්ශවයක් පරීක්ෂණවලදී හඳුනාගෙන නොමැති බැවින් පොතෙන් කපාහැරීමේ බලය ලබාගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	
08	සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගේ සහ වැඩ තහනම් කළ නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.448,499ක් වූ ණයශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් කටයුතුකර නොතිබුණි.	2023	අයවිය යුතු ණයශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	එක් නිලධාරිනියක් 2024 මාර්තු මස නැවත සේවයේ පිහිටුවා ඇති නිසා හිඟ ණය හා පොළිය 2024 වර්ෂයේ මාර්තු මස සිට නැවත අය කිරීම ආරම්භකර ඇති අතර, අනෙක් නිලධාරිනියගෙන් අය විය යුතු ණයශේෂය පියවන ලෙස දැනුම් දුන් බව දන්වා තිබුණි. වැඩ තහනම් කර ඇති නිලධාරීන් දෙදෙනාගේ නඩු කටයුත්ත විභාග වෙමින් පවතී.	සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනාගෙන් එක් නිලධාරිනියක් නැවත සේවයේ පිහිටුවා ඇත. ඒ අනුව ණය වාරික නැවත අයකර ගැනීම ආරම්භ කර ඇත. අනෙක් නිලධාරිනියගේ පුද්ගලික ලිපිනයට ණය මුදල නිරවුල් කරන ලෙස දැනුම්දී ඇත. ඉතිරි නිලධාරීන් දෙදෙනාගේ ණයශේෂ කපාහැරීමට කමිටුව නිර්දේශ කර ඇත.
09	දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ නිලධාරීන් සිය සේවා කාලයෙන් පරිබාහිරව ඉටුකරනු ලබන සේවාවන් වෙනුවෙන් වූ ගාස්තු 2016 වර්ෂයෙන් පසු සංශෝධනය කිරීමක් සිදුකර නොතිබුණි. එසේම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2015 දෙසැම්බර් 11 දිනැති අංක PFD/04/08/01/59 දරන ලිපිය අනුව ගාස්තු සංශෝධනය වසර තුනකට වරක් සමාලෝචනය කර නිසිපරිදි සංශෝධනය කළ යුතු වුවත්,	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	2024 වර්ෂයේදී ගාස්තු සංශෝධනය සම්බන්ධයෙන් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට නියමිත බව දන්වා තිබුණි.	මේ වන විට ගාස්තු සංශෝධනයක් වෙනුවෙන් සමාලෝචනය කිරීම සඳහා කමිටුවක් පත්කර එම කමිටු වාර්තාවේ නිර්දේශ ලබාගෙන ඇත. ඒ අනුව ගාස්තු සංශෝධනය සඳහා අනුමැතිය ලබාගැනීමට ඉල්ලීමක් මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීමට නියමිත ය.

	එසේ කර නොතිබුණි.				
10	වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශගත වූ දෙපාර්තමේන්තුවේ නිලධාරිනියන් දෙදෙනෙකු නැවත සේවයට වාර්තාකර නොතිබීම හේතුවෙන් එම නිලධාරිනියන් දෙදෙනාගෙන් අයකරගත යුතුව තිබූ රු.2,260,935ක මුළු දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2023	ගිවිසුම් ප්‍රකාරව එම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	මෙම මුදල් අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ගරු නීතිපතිතුමා වෙත දන්වා ඇති අතර, ඒ අනුව මෙම නිලධාරීන්ට එරෙහිව නඩු පැවරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා තිබුණි.	මෙතෙක් නඩු පවරා නැත. 1. සහකාර රස පරීක්ෂක - නිතිපති උපදෙස් මෙතෙක් ලැබී නොමැති බැවින්, අධිකරණ අමාත්‍යාංශ ලේකම් මඟින් 2024 ජූලි 09 දිනැතිව උපදෙස් විමසා ඇත. 02. පරිගණක දත්ත සටහන්කරු - නීතිපතිතුමා වෙත තොරතුරු වාර්තාවක් ඉදිරිපත් කළ යුතුව ඇත. එම වාර්තාව 2024 ඔක්තෝබර් 31 දිනට ප්‍රථම ගරු නීතිපතිතුමා වෙත යොමු කරනු ලැබේ.
11	විදේශීය වැටුප් සහිත නිවාඩු ලබාගෙන 2021 වර්ෂයේ විදේශගත වූ ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂකවරයෙකු එරටේදී අසනීපවීම හේතුවෙන් 2022 ඔක්තෝබර් මස නැවත ලංකාවට පැමිණ තිබුණු අතර, එම නිලධාරියාට පාඨමාලා ගාස්තු ඇතුලුව අනෙකුත් වියදම් සඳහා රු.6,281,948ක මුදලක් වැයවී තිබුණි. මින් පාඨමාලා ගාස්තුව ලෙස ගෙවන ලද රු.5,224,681ක මුදලින් රු.4,816,556ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් නැවත ගෙවා තිබූ අතර, ඉතිරි මුදල වූ රු.408,125ක් සහ ඊට අමතරව දෙපාර්තමේන්තුව විසින් වැයකළ රු.1,057,267ක මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර	2023	පාඨමාලාව සඳහා රජයට වැය වූ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු ය.	නිලධාරියා හට ප්‍රතිපූරණය කළ යුතුව පවතින වීසා ගාස්තු සහ වෙනත් වියදම් මගින් මෙම මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි.	මේ සම්බන්ධ කටයුතු කිරීමට උපදෙස් ඉල්ලා අධිකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

	නොතිබුණි.				
12	එමෙන්ම මෙම නිලධාරියා මෙරටට 2022 ඔක්තෝබර් 28 දින පැමිණිය ද, විදේශගත වී සිටි කාලපරිච්ඡේදයට අදාළ නිවාඩු විගණන දිනය වූ 2024 මාර්තු 30 වන විටත් අනුමතකර ගෙන නොතිබුණි.	2023	නිලධාරීන් විදේශගතවීම ට පෙර නිවාඩු අනුමතකර ගත යුතු ය.	අදාළ කාලය සඳහා නිවාඩු අනුමැතියට ඉදිරිපත් කරන ලද බව දන්වා තිබුණි.	මෙම නිවාඩු ඉල්ලීම අධිකරණ අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.
13	ආයතනයේ කටයුතු කාර්යක්ෂමව සිදුකිරීමට උපකාරී වන තීරණ ගැනීම සඳහා අවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 35ක් හා තෘතීයික මට්ටමේ නිලධාරීන් 10 දෙනෙකුගෙන් 7 දෙනෙකුගේ තනතුරු පුරප්පාඩු වී තිබීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ කටයුතු මනාලෙස හසුරුවා ගැනීමට එය බාධාවක් වී තිබුණි.	2023	ආයතනයේ අරමුණු, හා ප්‍රධාන කාර්යයන් ඵලදායීව ඉටුකිරීම සඳහා තනතුරුවලට අදාළ කාර්යය මණ්ඩලය බඳවාගැනීමට කටයුතු කළ යුතු ය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 අනුව 2022 වර්ෂයේ සිට බඳවාගැනීම සිදු කිරීමට නොහැකි වී ඇති බවත්, අවශ්‍ය අනුමැතිය සඳහා නිරන්තරයෙන්ම රේඛීය අමාත්‍යාංශය මගින් ඉල්ලීම් සිදු කළ ද, බහුකාර්ය සේවා නිලධාරීන් හැර වෙනත් බඳවාගැනීමක් මෙතෙක් සිදුවී නොමැති බවත්, පුරප්පාඩු විශාල ප්‍රමාණයක් තිබීම නිසා දෙපාර්තමේන්තු කටයුතු මනා ලෙස කළමනාකරණය කරගැනීමට නොහැකි වී ඇති බවත් දන්වා තිබුණි.	2024 අගෝස්තු 15 දින ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් 09 දෙනෙකු පත්කර ඇත. දැනට පවතින සෙසු පුරප්පාඩු සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) මඟින් විභාගයක් පවත්වා බඳවාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර ඇත.

36. ශීර්ෂය - 234 ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	107,305,411	48,355,329	58,950,082	තත්ත්වාගණනය නොකළ
2022	109,683,468	22,226,411	87,457,057	තත්ත්වාගණනය නොකළ
2023	120,403,460	3,606,760	116,796,700	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දෙපාර්තමේන්තුව වාහනයක් සඳහා පෞද්ගලික ආයතනයකින් ලබාගෙන තිබූ කල්බදු ලීසිං පහසුකම් 2023 වර්ෂය තුළදී ගෙවා අවසන් වී තිබුණ ද, එම වාහනය ආයතනය වෙත පවරාගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.	2023	කඩිනමින් අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය.	මෙම වාහනය ආයතනයේ නමට පවරාගැනීමේ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.	මෙම වාහනය පවරා ගැනීමට අදාළ ලියවිලි මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.
02	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව අභියාචනාධිකරණයේ ඇප තැබිය යුතු නිලධාරීන් 09 දෙනෙකු ඇප තබා නොතිබුණි.	2023 2022	ඇප නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මේ වන විට අදාළ නිලධාරීන්ගේ ඇප අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.	මේ වන විට අදාළ නිලධාරීන්ගේ ඇප අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා ඇත.
03	දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2020 ජනවාරි මස සිට මේ දක්වා වසර 4 කට අධික කාලයක් අබලන්ව පවතින අතර, යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය පමණක් මේ වන විට ලබාගෙන තිබුණ ද, අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කළ යුතු ය.	මෙම රථය සඳහා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය කැඳවා තිබුණ ද, මේ දක්වා යාන්ත්‍රික ඉංජිනේරු නිර්දේශය ලැබී නොමැති බව දන්වා තිබුණි.	අලුත්වැඩියාව සිදු කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාගැනීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර, එම මණ්ඩලයේ නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව දන්වා තිබුණි.
04	2023 වර්ෂය තුළදී	2023	නඩු නියමිත	නඩු කටයුතු	ශ්‍රේෂ්ඨාධිකරණය හා

ශ්‍රේෂ්ඨාධිකරණය තුළ නඩු වර්ග 14 කට අයත් විසඳීමට තිබූ මුළු නඩු සංඛ්‍යාව 7268 ක් වූ අතර, වර්ෂය තුළදී විසඳා අවසන් වූ නඩු සංඛ්‍යාව 1535 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 21 වූ අතර වර්ෂය අවසානයේදී විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 5733 කි. ඒ අනුව වර්ෂය තුළදී නඩු විසඳීමේ ප්‍රතිශතය අවම මට්ටමක පැවතුණි.

කාලසීමාව තුළ විසඳා අවසන් කළ යුතු ය.

කඩිනමින් ඉටු කිරීම සඳහා මේ වනවිට ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, ඒ අනුව විශේෂයෙන් වාණිජ මහාධිකරණය, අභියාචනා යන අනෙකුත් නඩු කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා ගරු අගවිනිසුරුතුමාගේ මාර්ගෝපදේශය යටතේ කටයුතු අරඹා ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී නඩු කටයුතු කාර්යක්ෂමව නිම කිරීම සඳහා කටයුතු සලසන බවත් දන්වා තිබුණි.

අභියාචනාධිකරණය ඇත්තේ රටේ උත්තරීතර හා ඉහළම අධිකරණය වන බැවින් හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විෂයය පථය සළකා බැලීමේදී පුද්ගල අයිතිවාසිකම්හි අවසාන යුක්ති තීරකයා වශයෙන්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා පනත් කෙටුම්පත් සම්බන්ධ අධිකරණ බලය සහිත අනන්‍ය අධිකරණය වශයෙන් ද ගරු ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යය හා කර්තව්‍ය වෙනත් අධිකරණ හෝ වෙනත් සාධකයකට සාපේක්ෂව ගණිතමය විග්‍රහ කිරීම සිදුකළ නොහැකි බව ද අවධාරණය විය යුතුව ඇත. එම ඇගයීම එක් එක් නඩුවේ වැදගත්කම, සංකීර්ණතාවය සහ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පවතින සුවිශේෂීතාවය කෙරෙහි මනා බර තැබීමක් සහිතව විෂයය ප්‍රමාණික විශේෂඥ ඇගයීමක් විය යුතු බව ඉදිරි වසරවල විගණන වාර්තා සැකසීමේදී එය සැලකිල්ලට ගත යුතු කරුණක් වශයෙන් ද කාරුණික අවධානයට යොමු කර සිටිමි.

එකී නිරීක්ෂණයට අගති රහිතව වැඩිමනත්ව දන්වා සිටින්නේ ගරු අගවිනිසුරුතුමාගේ මාර්ගෝපදේශ යටතේ ඉදිරියේදී නඩු කටයුතු කාර්යක්ෂමව නිම කිරීමට කටයුතු බවය.

05	සමාලෝචිත වර්ෂය තුළදී අභියාචනාධිකරණය තුළ නඩු වර්ග 23 කට අයත් විසඳීමට ගොනු වූ මුළු නඩු සංඛ්‍යාව 5921 ක් වූ අතර, වර්ෂය තුළදී විසඳා අවසන් වූ නඩු සංඛ්‍යාව 1780 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 30 ක් වූ අතර, වර්ෂය අවසානයේදී විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 4141 කි. ඒ අනුව අභියාචනාධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය තුළ ද නඩු විසඳීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි.	2023 2022	නඩු නියමිත කාලසීමාව තුළ විසඳා අවසන් කළ යුතුය.	නඩු කටයුතු කඩිනමින් ඉටු කිරීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, ඒ අනුව විශේෂයෙන් වාණිජ මහාධිකරණය, අභියාචනා යන අනෙකුත් නඩු කටයුතු කඩිනමින් නිම කිරීම සඳහා ගරු අගවිනිසුරුතුමාගේ මාර්ගෝපදේශය යටතේ කටයුතු අරඹා ඇති බවත්, ඒ අනුව ඉදිරියේදී නඩු කටයුතු කාර්යක්ෂමව නිමකිරීම සඳහා කටයුතු සලසන බවත් දන්වා තිබුණි.	ඉහත පිළිතුරම අදාළ වේ.
06	2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත අනුමත මුළු කාර්ය මණ්ඩලය 558 ක් වූ අතර, එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 430 ක් විය. ඒ අනුව, නිලධාරීන් 127 දෙනෙකු පුරප්පාඩුව පැවතුණි.	2023 2022	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය.	දෙපාර්තමේන්තුවේ පවතින කාර්යය මණ්ඩල අඩුපාඩු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීම්කර ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ පවතින කාර්යය මණ්ඩල අඩුපාඩු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීම්කර ඇත.
07	ගණකාධිකාරී III තනතුර සඳහා වෙනත් දෙපාර්තමේන්තුවක ගණකාධිකාරිවරයකු සතියේ දින 02 ක වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබුණු අතර, එම තනතුර 2022 ජනවාරි 03 දින සිට වර්ෂ 02 කට අධික කාලයක් පුරප්පාඩුව පැවතුණි.	2023 2022	පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු ය.	දෙපාර්තමේන්තුවේ පවතින කාර්යය මණ්ඩල අඩුපාඩු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීම්කර ඇති බව දන්වා තිබුණි.	දෙපාර්තමේන්තුවේ පවතින ගණකාධිකාරී III තනතුරෙහි පුරප්පාඩුව සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීම්කර ඇත.
08	අභියාචනාධිකරණ	2023	පුරප්පාඩු කඩිනමින්	දෙපාර්තමේන්තුවේ	දෙපාර්තමේන්තුවේ

රෙජිස්ට්‍රාර් කාර්යාලය තුළ අධිකරණ ලිපිකරු භාෂා පරිවර්තන, පොත් බැඳුම්කරු යන තනතුරුවල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතුණු අතර, එම ප්‍රමාණයන් පිළිවෙලින් 10,09,08 ක් විය.	2022	සම්පූර්ණකර ගැනීමට කටයුතු කළ යුතු ය.	පවතින කාර්යය මණ්ඩල අඩුපාඩු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීම්කර ඇති බව දන්වා තිබුණි.	පවතින කාර්යය මණ්ඩල අඩුපාඩු සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් වෙත ඉල්ලීම්කර ඇත

37. ශීර්ෂය - 235 නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	27,612,548	-	27,612,548	තත්ත්වාගණනය කළ
2022	29,522,800	-	29,522,800	තත්ත්වාගණනය කළ
2023	27,850,117	-	27,850,117	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදා හැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම් යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන් ද රජයේ ගිණුමට අදාළ වවුචර සහතික කරන, චෙක්පත් අත්සන් කරන අය ද, ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට හා අධිකරණ අමාත්‍යාංශයේ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 දරන චක්‍රලේඛය අනුව ඇප තැබිය යුතු නිලධාරීන් දෙදෙනෙකු ඇප තබා නොතිබුණි.	2023 2022	යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අදාළ නිරීක්ෂණයේ සඳහන් නිලධාරීන් දෙදෙනා සඳහා ඇප තැබීමට අවශ්‍ය ලේඛන විධිමත් පරිදි දැනට වසර කීපයකට පෙර ඉදිරිපත් කරන ලද නමුත්, මේ වන විටත් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඒ සම්බන්ධ උපදෙස් ලැබී නොමැත. මෙම නිලධාරීන් දෙදෙනා සඳහා නැවතත් ඇප තැබීමේ ලේඛන යොමු කිරීමට සිදුවන බව දන්වා තිබුණි.	නැවත ඇප තැබීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් ගෙන ඇත.
02	කොමිෂන් සභා සාමාජිකයන් 18 දෙනාගෙන් සාමාජිකයන් 05 දෙනෙකු 2023 වර්ෂයේ කිසිදු රැස්වීමකට සහභාගී වී නොතිබුණි.	2023	රැස්වීම්වලට සහභාගී වීමට අදාළ සාමාජිකයන් දැනුවත් කිරීමට කටයුතු කළ	නීති කොමිෂන් සභා රැස්වීම්වලට එක් වරක් හෝ සහභාගී නොවී ඇති සාමාජිකයින් පිළිබඳව නීති කොමිෂන් සභාවේ සභාපතිතුමා ද 2023	මේ පිළිබඳ නීතිමය තත්ත්වය පනත පරිදි වන බැවින් නොපැමිණෙන සාමාජිකයන් සම්බන්ධව තීරණ

			යුතුය.	වසරේ පළමු නීති කොමිෂන් සභා රැස්වීමේදී ද සාකච්ඡාවට බඳුන් කරන ලදී. නීති කොමිෂන් සභාව සඳහා සාමාජිකයින් පත් කරනු ලබන්නේ ජනාධිපතිතුමා විසින් අවුරුදු 05 කාලයක් සඳහා ය. සභා පනතේ පවතින විධිවිධාන මත සහභාගී නොවීම හේතුවෙන් සාමාජිකත්වය අහෝසි වීමක් සිදු නොවන බැවින් ඔවුන් වෙනුවට නව සාමාජිකයින් පත් කිරීමට ද හැකියාවක් නොපවතින බව දන්වා තිබුණි.	ගැනීමට සභාපතිට හැකියාවක් නොමැති බව දන්වා තිබුණි.
03	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත්කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ගිණුම් සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කර නොතිබුණි.	2022	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	වාර්තාවේ ඇති කරුණු සමඟ එකඟවන බවත්, ඉදිරියේදී එය සිදු කරන බවත් දන්වා තිබුණි.	2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ගිණුම් සමඟ ඉදිරිපත් කළ ද, 2023 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත දිනට පෙර පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.
04	2019 ජනවාරි 12 දිනැති අංක DMA/01 – 2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙන් අවධාරණය කර ඇති පරිදි මුදල් රෙගුලාසි 134 හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(3) වගන්තිය ප්‍රකාරව ආයතනයේ අභ්‍යන්තර විගණනයක්	2021	අදාළ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වේ.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය අධිකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ලබන අතර, 2021 වසරේ පැවති කොවිඩ් තත්ත්වය, අභ්‍යන්තර විගණනය සිදු නොකිරීමට හේතු	2023 වර්ෂයේ අභ්‍යන්තර විගණනයක් සිදුකර තිබුණ ද, විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

	සිදුකර නොතිබුණි.			වන්නට ඇතැයි අපේක්ෂා කෙරේ. අභ්‍යන්තර විගණනය පැවැත්වීම අප දෙපාර්තමේන්තුවට අදාළ කාර්යයක් නොවන බව ද දන්වමි.	
05	ද්විතීය මට්ටම තුළ අනුමත තනතුරු සංඛ්‍යාව 15 ක් වුව ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 06 ක් වූයෙන් පුරප්පාඩු 09 ක් පැවතුණි. මේ තුළ ගිණුම් සහකාර තනතුර ද, සංවර්ධන නිලධාරි තනතුරු 01 ක් ද, කළමනාකරණ සහකාර තනතුරු 06 ක් ද, ලඝු ලේඛක තනතුර ද, පුරප්පාඩු වී තිබුණි.	2023 2022 2021	පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණයේ සදහන් අනුමත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා අදාළ ආයතනවලින් ඉල්ලීම් සිදුකළ ද, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම දැනට නිකුත් වී ඇති චක්‍රලේඛය ප්‍රකාරව නොහැකි වී ඇති බව දන්වා තිබුණි.	දැනට නිකුත් කර ඇති චක්‍රලේඛය ප්‍රකාරව ඒ සඳහා කිසිවක් කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි.

38. ශීර්ෂය - 236 **රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	**මුළු වගකීම් රු.**	**ස්කන්ධය රු.**	**මතය**
2021	402,265,086	313,609	401,951,477	තත්ත්වාගණනය නොකළ
2022	399,248,636	678,220	398,570,416	තත්ත්වාගණනය නොකළ
2023	397,819,684	506,377	397,313,307	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	**විගණන නිරීක්ෂණය**	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මත තත්ත්වය**
01	මොරටුව විශ්ව විද්‍යාලය විසින් සකස් කරන ලද පිරිවැය රු.10,810,000ක් වූ සිංහල, දෙමළ සහ දෙමළ, සිංහල පරිවර්තන මෘදුකාංගයේ නිරවද්‍යතාවය පිළිබඳ සහතිකයක් රාජ්‍ය භාෂා කොමසාරිස් ජනරාල් විසින් 2022 පෙබරවාරි 14 දින ව්‍යාපෘති අධ්‍යක්‍ෂවරයාගෙන් ඉල්ලා තිබුණද, එය ලබාදී නොතිබුණ අතර වර්තමානය වන විට එම මෘදුකාංගය වෙනුවෙන් දැරූ පිරිවැය නිශ්කාර්ය වී ඇත.	2022 2023	මෘදුකාංගයේ අඩුපාඩු හඳුනාගෙන පරිවර්තන කටයුතු සඳහා සක්‍රිය දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	2023.01.04 දින මෘදුකාංගය LGN Cloud හි ස්ථාපනය කර ඇති අතර මේ වන විට පරිශීලකයන් 200 ට ආසන්න ප්‍රමාණයකට භාවිතය සඳහා ලබාදී ඇති බව දන්වා ඇත.	මෙම මෘදුකාංගය භාවිතයට ගන්නා බව තහවුරු කර නැත.
02	රාජ්‍ය සේවකයන් හා අර්ධ රාජ්‍ය සේවකයන් විසින් සම්පූර්ණ කළ යුතු වාචික, ලිඛිත හා කථන භාෂා ප්‍රවීණතා පාඨමාලා සඳහා 2016 සහ 2018 වර්ෂවල මිලදීගෙන තිබූ රු.5,347,048ක වටිනා පොත් තොගයක් හා 2018 වර්ෂයේ මුද්‍රණය කර තිබූ “ලියන සිංහල” පොත් 54 ක් අලෙවියට නුසුදුසු තත්ත්වයෙන් ද, අලෙවි නොවන හා භාවිතයට ගත නොහැකි පරිසර විද්‍යා පොත් 477ක් හා සත්ව විද්‍යා පොත් 71ක් ද ගබඩාවේ පැවතුනි.	2022 2023	අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රමාණවත් පොත් සංඛ්‍යාවක් පමණක් මුද්‍රණය කිරීමට කටයුතු කළ යුතුය.	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක හා 2021.12.28 දිනැති ලිපිය අනුව මෙම පොත් රජයේ ආයතන/පාසල් පුස්තකාලවලට නොමිලයේ නිකුත් කිරීමට අනුමැතිය හිමි වී ඇති බව හා මේ වනවිට ලැබෙන ඉල්ලීම් අනුව පොත් නිකුත් කිරීම් කටයුතු සිදු කළ බව.	අනවශ්‍ය පරිදි පොත් මුද්‍රණයේ නිශ්කාර්යය වියදමක් දරා ඇත.
03	2020 අගෝස්තු 17 වන දින	2023	අවශ්‍යතාවය	ඉදිරියේදී වෙනත්	ක්‍රියාමාර්ග ගෙන

රු.314,450ක් වැය කර මිලදී ගනු ලැබූ පොත් අලෙවි කළමනාකරණ මෘදුකාංගය අක්‍රියව පැවතුණි.	හඳුනාගෙන මිලදී ගැනීම් කිරීමට හා මිලදී ගැනීම් තීරණ සම්බන්ධයෙන් අදාල නිලධාරීන් වගකීමට යටත් කිරීමට කටයුතු කළ යුතුය.	ආයතනයක් හරහා පද්ධතිය නැවත සැකසීම හෝ නව පද්ධතියක් මිලදී ගැනීමට කටයුතු යොදන බව.	නැත.

39. ශීර්ෂය - 237 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	140,546,477	140,546,477	139,144,446	තත්ත්වාගණනය නොකළ
2022	142,966,110	142,966,110	142,966,110	තත්ත්වාගණනය නොකළ
2023	143,650,365	143,650,365	141,314,817	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර තිබුණු බව නිරීක්ෂණය නොවීය.	2022	තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම හා ඒවාට ළඟා විම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුනාගැනීම කළ යුතු වීම.	එක්සත් ජාතීන්ගේ 2030 වර්ෂය දක්වා වූ න්‍යාය පත්‍රයට අනුව තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හා ඒවාට ළඟා වීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්ණායක හඳුනා ගැනීම හා ඊට අදාල නිවැරදි දත්ත පද්ධතියක් ඇති කිරීමට කටයුතු කිරීම දැනටමත් තිරසර සංවර්ධන ජාතික සභාව මගින් අදාල ආයතන සමඟ ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව ද අවශ්‍ය සහය දැනටමත් ලබා දී ඇත.	තිරසර සංවර්ධන ඉලක්ක වෙත ළඟාවීම මැන බැලීම සඳහා අවශ්‍ය නිර්නායක හඳුනාගැනීම 2024 දෙසැම්බර් 31 දින තෙක් සිදුකර නොතිබුණි.
02.	ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යටතේ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ වැය විෂය අංක 237-1-1-20-2106-0/13 සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.34,788,249 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව	2023	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කළ යුතු බව හා ව්‍යාපෘති අරමුණු ඉටු කර ගැනීම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන, කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතු වීම.	ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රතිසාධන හදිසි ආධාර ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ CRM පද්ධතිය වැඩිදියුණු කිරීමට නියමිතව තිබුණි. කෙසේ නමුත් අස්වැසුම යටතේ සහනාධාර ගෙවීම වාණිජ බැංකු හරහා සිදු කරන ලද බැවින්,	අස්වැසුම සහනාධාර ගෙවීම සඳහා වූ CRM පද්ධතිය වැඩිදියුණු කිරීම හා Geoviya පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද, 2024 දෙසැම්බර් 31 දින දක්වා

	ඉතිරි වී තිබුණි.		සහනාධාර ගෙවීමේ ක්‍රමවේදය (System) CRM පද්ධතිය මගින් සිදුකිරීම එම අවස්ථාවේදී අවශ්‍ය නොවීය.	මෙම පද්ධති වැඩිදියුණු කිරීම් සිදු කර නොතිබුණි.
03.	විගණනය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යමණ්ඩල දත්ත අනුව 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 28 ක් වූ අතර, පුරප්පාඩු පිරවීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීමට සමාලෝචිත වර්ෂයේදී පියවර ගෙන නොතිබුණි. 2023	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පුරවා ගැනීම හෝ සේවක සංඛ්‍යාව යාවත්කාලීන කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	එකඟයි.	2024 දෙසැම්බර් 31 දින වන විට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 27 ක් පැවතුණි.

40. ශීර්ෂය - 238 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	39,748,298	39,748,298	39,723,335	තත්ත්වාගණනය නොකළ
2022	41,141,529	41,141,529	41,102,348	තත්ත්වාගණනය නොකළ
2023	40,343,623	40,343,623	40,239,220	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මත තත්ත්වය
01	2020 අගෝස්තු 20 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම තුල අන්තර්ගත කල යුතු ක්‍රියාකාරකම්වල ප්‍රතිදානය (Output) හා ප්‍රතිඵලය (Outcome) සඳහන් කර නොතිබුණි. එම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම්වල කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.	2023	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ වේ. ඉදිරියේදි නිවැරදි කර ගැනීමට නිලධාරින් දැනුවත් කරන ලදී.	2024 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ද අදාළ ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිදානය (Input) හා ප්‍රතිඵලය (Outcome) සඳහන් කර නොතිබුණි.
02	අපේක්ෂිත ආර්ථික හා සමාජයීය අභිමතාර්ථයන් මුදුන් පමුණුවා ගැනීම සඳහා අදාළ ආයතන, රේඛීය අමාත්‍යාංශ සහ පෞද්ගලික අංශය සමග මනා සම්බන්ධීකරණයෙන් යුතුව රජයේ පුළුල් සංවර්ධන රාමුව තුල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ රටේ බදු ප්‍රතිපත්තිය සැකසීම මෙන්ම ආදායම්, වියදම් සහ මූල්‍ය විශ්ලේෂණය හා දේශීය සහ විදේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා විශ්ලේෂණය තුළින් අපේක්ෂිත ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි සුදුසු පරිදි වෙනස්කම් සිදු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම ලෙස හඳුනාගෙන තිබුණි. 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත මඟින් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් පාලනය මූලිකව සිදු කරනු ලබන අතර, මෙම පනතේ පරමාර්ථ ඉටු කර	2023			

ගැනීම සම්බන්ධව 2019 සිට 2023 වර්ෂය දක්වා ආණ්ඩුවේ ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම පිළිබඳ පහත සඳහන් දර්ශක 2 ක ප්‍රගතිය පහත පරිදි විය.

වර්ෂ	**2019**	**2020**	**2021**	**2022**	**2023**
අයවැය පරතරය-දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට	9.6	11.1	11.7	10.	
රාජ්‍ය ණය-දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට	81.9	96.6	100.1	14.2	03.

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව 2023 අයවැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට වගබලා ගත යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය වන විට එය සියයට 8.3 ක් වී තිබුණි.	පනතේ දක්වා ඇති ආකාරයට අයවැය පරතරය පවත්වා ගැනීමට වගබලා ගත යුතු වීම.	සටහන් කරගතිමි. පනතේ 3(අ) වගන්තියට අනුව අයවැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 5 නොඉක්ම විය යුතුය යන ප්‍රකාශය නිවැරදිය. 2022 වසරේ දී වාර්තා කළ රු. බිලියන 2,013 ට සාපේක්ෂව 2023 වසරේ දී සියයට 52.8 කින් රු. බිලියන 3,074 දක්වා ඉතා ඉහළ වර්ධනයක් ලඟාකරගෙන, 2026 වසරේ සිට ඉදිරියට අයවැය හිඟය සියයට 5 කට අඩු අගයක පවත්වා ගෙන යාමට අපේක්ෂිතය. ඉදිරියේදී බලාත්මක කිරීමට නියමිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත	තොරතුරු ඉදිරිපත් කිරීමකි. 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් අහෝසි වී ඇති බැවින්, මෙම නව පනත මඟින් අයවැය හිඟය මත නොව ප්‍රාථමික ශේෂය මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය රීතීන් හඳුන්වාදී තිබුණි.

			මඟින් අයවැය හිඟය මත නොව ප්‍රාථමික ශේෂය මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය රීතීන් හඳුන්වා දීමට නියමිතය. එයට හේතුව වනුයේ, අයවැය හිඟයට ඇතුළත් වන පොළී ගෙවීම සඳහා වන වියදම රජයේ පාලනයෙන් බැහැර වන ක්‍රියාවලියක් වීමය.	
(ii) 2013 හා 2021 සංශෝධිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව ආණ්ඩුවේ මුළු බැරකම් ඒ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට අසූවක් නොඉක්මවන බවට සහතික විය යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී එය සියයට 103.9 ක් වී තිබුණි.	2023	එම -	සටහන් කරගතිමි. එය නිවැරදි වේ. 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත හා ඊට කරන ලද සංශෝධන 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත සහ 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත මඟින් ආණ්ඩුවේ මුළු බැරකම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 60 සීමාවට ලඟා වීම වසර 2030 වන විට විය යුතු යැයි නියම කර ඇත. ණය අඩු කිරීමේ	2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මඟින් අහෝසි වී ඇති අතර, මෙම නව පනත මඟින් සංඛ්‍යානමය නොවන නව රාජ්‍ය මූල්‍ය රීති හඳුන්වා දී ඇති අතර, මුළු බැරකම් සඳහා ද සංඛ්‍යානමය නොවන රාජ්‍ය මූල්‍ය රීතියක් හඳුන්වා දී තිබුණි.

අරමුණ පෙරදැරිව, ඉදිරියේ දී බලාත්මක කිරීමට නියමිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත මඟින් සංඛ්‍යානමය නොවන නව රාජ්‍ය මූල්‍ය රීති හඳුන්වා දීමට ද නියමිතය.

(iii) 2003 අංක 03 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත යටතේ නිකුත් කරනු ලබන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ, මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව අනුව රජයේ පුරෝකථන හෙළිදරව් කිරීමක් වාර්ෂිකව සිදු කරයි. මේ අනුව 2023 වර්ෂයේ නිකුත් කරනු ලැබූ මූල්‍ය කළමනාකරණ වාර්තාවන්හි හෙළිදරව් කරන ලද මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපායයන් සලකා බැලීමේදී දර්ශක දෙකක පුරෝකථනය කරන ලද දත්ත හා සත්‍ය දත්ත පිළිබඳ තොරතුරු පහත දැක්වේ. | 2023

මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව අනුව 2023 වර්ෂය සඳහා රජයේ ප්‍රමුඛතාවන්	සත්‍ය අගයයන් (වර්ෂයේ සාමාන්‍යය)
* 2023 වසර වන විට ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ 2024 වසර වන විට සියයට 3.5 ට වැඩි ආර්ථික වර්ධනයක් සහ ඉන් ඔබ්බට සියයට 5-6 ක පරාසයක පවත්වා ගැනීම.	2.3
* උද්ධමනය තනි ඉලක්කමක් වෙත එළඹීම.	17.4

මේ පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

(a) 2023 වර්ෂය වන විට ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ 2024 වසර වන විට සියයට 3.5 ට වැඩි ආර්ථික වර්ධනයක් සහ ඉන් ඔබ්බට සියයට 5-6 ක පරාසයක පවත්වා ගැනීම රජයේ ප්‍රමුඛතාවක් හැටියට හඳුනාගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ආර්ථික වර්ධනය -2.3 ක් (ඍණ 2.3) ක් විය.	2023 තාත්ත්වික පුරෝකථන සිදු කිරීම හා ඒවා ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	2020 වර්ෂයේ කොවිඩ්-19 වසංගතය තුලින් ශ්‍රී ලංකා ආර්ථිකයට ඇතිකල බලපෑමත් සමඟින් 2022 වසරේ දී ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු ඇති වූ ඉතා අසීරු ආර්ථික වටපිටාව තුළ ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කිරීම ඉතා අභියෝගාත්මක විය. ඒ අනුව, 2023 අයවැය මඟින් සියයට 3.0 ක ආර්ථික සංකෝචනයක් අපේක්ෂා කළද, 2023 වර්ෂයේ පළමු භාගයේදී ආර්ථිකය සියයට 7.3කින් සංකෝචනය වීම මෙන්ම විදේශිය හු දේශපාලන ව්‍යාකූලතාවයන් හටගැනීම, ආනයන සීමාවන් තවදුරටත් සැලකියයුතු මට්ටමක පැවතීම තුලින් යෙදවුම් සඳහා ඇතිකල බලපෑම ආදි අභියෝග තවදුරටත් පැවතීම	2024 වර්ෂයේ පළමු භාගයේදී සියයට 5.0 ක ධනාත්මක ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට හැකි වී තිබුණි.

		හේතුවෙන් 2023 වර්ෂයේදී ආර්ථික වර්ධනය සියයට 3.6 කින් සංකෝචනය වනු ඇති බවටත්, 2024 වර්ෂයේදී එම අගය සියයට 1.8 කින් වර්ධනය වනු ඇති බවටද අපේක්ෂා කරන ලදී. 2023 වසරේ සියයට -7.3 ක්ව පැවති ආර්ථික වර්ධනයට සාපේක්ෂව 2023 වර්ෂයේදී සියයට 2.3 ක අඩු ආර්ථික සංකෝචනයක් වාර්තා කරමින් ආර්ථිකය යළි යථා තත්ත්වයට පත්වීමේ සළකුණු පෙන්නුම් කර ඇත.	
(b) සමාලෝචිත වර්ෂයේදී උද්ධමනය 2023 තනි ඉලක්කමක් වෙත එළැඹීම ප්‍රමුඛතාවක් වුවද එය 17.4 ක් වූ අගයක් ගෙන තිබුණි.	-එම -	2023 වර්ෂයේ කො.පා.මි.ද මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2022 වර්ෂයේ වාර්තා වූ සියයට 46.4 සිට 2023 වර්ෂයේදී සියයට 17.4 ක් දක්වා පහළ යෑම නිවැරදි වේ. කෙසේ වුවද, කො.පා.මි.ද මත පදනම් වූ වාර්ෂික ලක්ෂමය මතුපිට උද්ධමනය 2023 වර්ෂය අවසාන වන විට සියයට	කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2024 වර්ෂයේ සැප්තැම්බර් මස වන විට සියයට 2.4 දක්වාත් කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂමය මතුපිට උද්ධමනය සියයට -0.5 ක් ලෙස වාර්තා වී තිබුණි.

		4.0 ක් ලෙස තනි ඉලක්කමක් වාර්තා වී ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.	
03 2023 වර්ෂය සඳහා සමස්තයක් ලෙස අයවැය යෝජනා 120 ක් ඉදිරිපත් කර තිබුණ අතර, එම අයවැය යෝජනාවන්ට ආදායම් යෝජනා 32 ක් ද, වියදම් යෝජනා 30 ක් ද, ප්‍රතිපත්තිමය යෝජනා 58 ක් ද ඇතුළත් වී තිබුණු අතර, එම අයවැය යෝජනා සඳහා මුළු ප්‍රතිපාදන මුදල රු. මිලියන 49,480 ක් විය. ඒ පිළිබඳව පහත සඳහන් විගණන නිරීක්ෂණයන් කෙරේ.			
(i) අයවැය යෝජනා අංක 47.2 යටතේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන (Social Safety Nets Programme) සඳහා ඉහත මුළු යෝජිත ප්‍රතිපාදන මුදල වූ රුපියල් මිලියන 49,480 න් රුපියල් මිලියන 43,000 ක් හෙවත් මුළු අයවැය යෝජනාවල ප්‍රතිපාදනවලින් සියයට 86.9 ක් වෙන් කර තිබුණි.	අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී ආර්ථික සංවර්ධන වැඩසටහන් පිළිබඳ ද විශේෂ අවධානයක් යොමු කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ වේ. අයවැය යෝජනා අංක 47.2 යටතේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන සඳහා මුළු වියදම් යෝජනා 30 සඳහා වෙන්කරන ලද රුපියල් මිලියන 49,480/- න් රුපියල් මිලියන 43,000/ ක් වෙන් කර ඇත.	2023 වර්ෂයට අදාළව අයවැය යෝජනා අංක 47.2 යටතේ සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන සඳහා මුළු වියදම් යෝජනා 30 සඳහා වෙන් කරන ලද රු.මිලියන 49,480/- න් රු.මිලියන 43,000/- ක් එනම් සියයට 86.9 ක් වෙන් කර තිබුණි.
(ii) මුළු අයවැය යෝජනා 120 අතරින් 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් යෝජනා 27 ක් සහ ප්‍රතිපත්ති යෝජනා 14 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, ආරම්භ කර ක්‍රියාත්මකව පවත්නා යෝජනා සංඛ්‍යාව 70 ක් විය. එහි ආදායම් යෝජනා 5 ක් වියදම් යෝජනා 30 ක් හා ප්‍රතිපත්තිමය යෝජනා 35 ක් බව නිරීක්ෂණය විය.	අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණ කටයුතු විධිමත්ව කිරීමට කටයුතු කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ වේ.	මුළු අයවැය යෝජනා 120 අතරින් 2023 දෙසැම්බර් 31 දිනට ආදායම් යෝජනා 27 ක් සහ ප්‍රතිපත්ති යෝජනා 14 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර, ආරම්භ කර ක්‍රියාත්මකව පවත්නා

			යෝජනා සංඛ්‍යාව 70 කි. එහි ආදායම් යෝජනා 5 ක් වියදම් යෝජනා 30 ක් හා ප්‍රතිපත්තිමය යෝජනා 35 ක් තිබුණි.
(iii) 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇතැම් අයවැය යෝජනා වසර කිහියපක් ඉදිරියට ක්‍රියාත්මක කළ යුතු යෝජනා වුවද, නිශ්චිත කාල රාමුවක් රහිතව යෝජනා සඳහා වන මුළු ප්‍රතිපාදනයම අදාළ වර්ෂයට පමණක් සීමා වන පරිදි ඉදිරිපත් කර තිබුණි.	අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී නිශ්චිත කාල රාමුවක් දැක්වීමට හා ඒ අනුව කටයුතු කිරීමට වගබලා ගත යුතු වීම.	දක්වා ඇති තොරතුර නිවැරදි වේ.	අයවැය යෝජනා ඉදිරිපත් කිරීමේදී නිශ්චිත කාලරාමුවක් දක්වා, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(iv) 2023 වර්ෂයේදී ඉදිරිපත් කළ කිසිඳු වියදම් යෝජනාවක් වර්ෂය තුළ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කර නිම කිරීමට නොහැකි වී තිබුණි. මුළු අයවැය යෝජනාවල ඇතුළත් වියදම් යෝජනාවලින් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන සඳහා වෙන් කළ ප්‍රතිපාදනය හැරුණු විට ඉතිරි වියදම් යෝජනා 29 සඳහා වෙන් කළ මුළු අයවැය ප්‍රතිපාදනය වූ රු.මි.6,380 න් රු.මි.3,351 ක් හෙවත් සියයට 52 ක මූල්‍ය කාර්යසාධනයක් පෙන්වා තිබුණි.	වියදම් යෝජනා, නිශ්චිත කාල රාමුවක් සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම හා යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව මනා අධීක්ෂණය ක් හා ප්‍රගතිය පිළිබඳ පසු විපරම් සිදු කිරීමට ක්‍රමවේදයක් සකස් කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ වේ.	2023 වර්ෂයට අදාළව සමස්ථ වියදම් යෝජනා 30 න් සමාජ ආරක්ෂණ ජාල වැඩසටහනට හැර ඉතිරි යෝජනා 29 සඳහා රු.මිලියන 6,380/- ක් වෙන් කර, ඉන් රු. 3,351/- ක් වියදම් දරා තිබුණි. එහි කාර්යසාධනය සියයට 52 ක් වී තිබුණි.

(v) වියදම් යෝජනා ක්‍රියාත්මක කිරීම

(a) අයවැය යෝජනා යටතේ වූ වියදම් යෝජනා 30 අතරින් එකතුව රු. මිලියන 860 ක අයවැය ප්‍රතිපාදන සහිත යෝජනා 09 ක්, 2023 වර්ෂය තුළ කිසිදු මූල්‍ය ප්‍රගතියක් ළඟා කරගෙන නොතිබුණි.	අයවැය යෝජනා ක්‍රියාවට නැංවීම පිළිබඳ මනා ලෙස අධීක්ෂණයක් හා ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් සිදු කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ වේ.	2023 වර්ෂයේ වියදම් යෝජනා ක්‍රියාත්මක කිරිම සඳහා අදාළ අමාත්‍යාංශ වෙත පවරා තිබුණි. කෙසේවුවද, වියදම් යෝජනා 30 අතරින් යෝජනා 09 ක් සඳහා කිසිදු මූල්‍ය ප්‍රගතියක් ළඟා කරගෙන නොතිබුණි.
(b) 2023 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ රු. මිලියන 360 ක ප්‍රතිපාදන එකතුවකින් යුක්ත වූ වියදම් යෝජනා 03 කට අදාළ මූල්‍ය ප්‍රගතිය ශූන්‍ය වී තිබුණි.	- එම -	නිරීක්ෂණය හා එකඟ නොවේ. 2023 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතු එකතුව රු. මිලියන 560 ක අයවැය ප්‍රතිපාදනයන්ගෙන් සමන්විත වූ වියදම් යෝජනා හතරක් අතරින් එක් යෝජනාවක් සඳහා රු. මිලියන 42 ක මූල්‍ය ප්‍රගතියක් අත්කරගෙන ඇති අතර විගණන විමසුමේ සඳහන් යෝජනා 03 ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් වන තත්ත්වය අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විමසිය යුතු බව නිරීක්ෂණය කරමි.	2023 වර්ෂයේ අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ යෝජනා 03 ක් ආරම්භ කර නොතිබුණි.
(c) අයවැය යෝජනා අංක 66.1 යටතේ යෝජනා කර තිබූ රුපියල් මිලියන 50 ක ඇස්තමේන්තුවක් සහිත විදේශ රැකියා	- එම -	නිරීක්ෂණය හා එකඟ වේ.	අයවැය යෝජනා අංක 66.1 ක්‍රියාත්මක

සඳහා තරුණයින් පුහුණු කිරීම (Training of Youth for Foreign Employment) ක්‍රියාවට නැංවීමට ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයට පැවරී තිබූ නමුත් මෙම යෝජනාවට අදාළ කිසිඳු කාර්යයක් ආරම්භ කර නොතිබුණි.			කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශයට පැවරී තිබූ නමුත් 2023 වර්ෂයේදී මෙහි කිසිඳු කාර්යයක් ආරම්භ කර නොතිබුණි.
(vi) ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම 2023 වසරේ අයවැය යෝජනා අතරින් ප්‍රතිපත්ති යෝජනා 09 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමේ පැවති අතර, ආරම්භ කර නොතිබුණි.	ප්‍රතිපත්ති යෝජනා, නිශ්චිත කාලරාමුවක් සහිතව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම හා ප්‍රගතිය පිළිබඳ විධිමත් පසුවිපරම් සිදු කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ නොවේ 2023 වසරේ අයවැය වාර්තාව තුළ ප්‍රතිපත්ති යෝජනා 58ක් තිබූ අතර ඉන් සමහර යෝජනා ක්‍රියාත්මක කිරීම මැදි හා දිගුකාලීන ස්වරූපයක් ගෙන තිබුණි. ඒ අනුව මෙහි සඳහන් ප්‍රතිපත්තිමය යෝජනා 09 තවදුරටත් සාකච්ඡා මට්ටමින් පවතින බව වාර්ථා වී ඇති අතර ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිතය.	2023 වසරේ අයවැය වාර්තාව තුළ ප්‍රතිපත්ති යෝජනා 58 ක් තිබූ අතර, ඉන් සමහර යෝජනා ක්‍රියාත්මක කිරීම මැදි හා දිගුකාලීන ස්වරූපයක් ගෙන තිබුණි. ඒ අනුව, මෙහි සඳහන් ප්‍රතිපත්තිමය යෝජනා 09 තවදුරටත් සාකච්ඡා මට්ටමේ පැවතුණි.
(vii) පසුගිය වර්ෂවල ඉදිරිපත් කළ අයවැය යෝජනා පිළිබඳව පසුවිපරම් සිදු කිරීම සඳහා 2022 වර්ෂයේ අයවැය යෝජනා තුළ අන්තර්ගත වූ ප්‍රතිපත්ති යෝජනා අංක 71.1 අනුව කාර්යසාධන බලකායක් පිහිටුවීමට යෝජනා වී තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දක්වා එම කාර්යාසාධන බලකාය පිහිටුවා නොතිබුණි. මේ අනුව වාර්ෂිකව අලුතින් අයවැය යෝජනා ඉදිරිපත් කිරීමක් සිදු වුවද, පසුගිය වර්ෂවල ඉදිරිපත් කර තිබුණු අයවැය යෝජනා පිළිබඳ ප්‍රගතිය මැන බැලීමක් සිදු කිරීමට ක්‍රියා පිළිවෙතක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී,	අයවැය යෝජනාවල ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කිරීම සඳහා ක්‍රමවේදයක් කඩිනමින් සකස් කළ යුතු වීම.	මෙකී කාර්ය සාධන බලකාය පිහිටුවීමේ දී එහි වපසරිය, පත් කරනු ලබන පුද්ගලයන්, හා නෛතික හා රෙගුලාසිමය බැඳීම් සහ අන්තර් ආයතනික දත්ත ගලන කාර්යක්ෂමතාවය සහතිකකරලීම ආදී පැති	අයවැය යෝජනාවල ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කටයුතු සඳහා යෝජනා අංක 71.1 අනුව 2024 නොවැම්බර් 20 දින තෙක් කාර්යසාධන බලකාය පිහිටුවා නොතිබුණි.

ක්‍රියාත්මක කර නොතිබුණි.		ගණනාවක් පිළිබඳව ගැඹුරින් විශ්ලේෂණයකට ලක්කිරීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබිණි. ඒ අනුව මෙකී කාර්යසාධන බලකාය පිහිටුවීමේ සාකච්ඡාවන් ආරම්භකර ඇති අතර එය ස්ථාපිත කිරීමේ මූලික කටයුතු ගැඹුරින් අධ්‍යයනය කර එකී කාර්ය සාධන බලකාය පිහිටුවීමේ කටයුතු ඉදිරියේදී සිදුකරනු ඇත.	
(viii) 2022 වර්ෂයේ ප්‍රතිපත්ති යෝජනා අංක 5:4:10 අනුව අයවැය යෝජනාවල අපේක්ෂිත ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමේ කාර්යය ක්‍රියාත්මක කර ඇගයීමක් සිදු කර නොතිබූ අතර, සමස්ත අයවැය යෝජනා 151 න් වර්ෂය අවසන් වන විට, සම්පූර්ණ තත්වයේ පැවති යෝජනා 12 ක් තරම් වූ අඩු සංඛ්‍යාවකට සීමා වී තිබුණි. එසේම, 2023 වර්ෂයේ සමස්ත අයවැය යෝජනා 120 න් යෝජනා 41 ක් පමණක් අවසන් තත්වයට පත්වී තිබුණි. වාර්ෂික අයවැය යෝජනා සැලකිය යුතු සංඛ්‍යාවක් හඳුන්වා දී තිබුණ ද, එම යෝජනා ක්‍රියාත්මක කිරීමට නිශ්චිත කාලරාමුවක් සකස් කිරීමේ වැඩපිළිවෙලක් නොමැති වීම, ක්‍රියාත්මක කරන ආයතන හා අධීක්ෂණ ආයතනවල දුර්වල කාර්යසාධනය හා සමස්ත යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ විධිමත් පසුවිපරමක් සිදු කිරීම හා අධීක්ෂණයක් සිදු කිරීමේ කාර්යය සඳහා වගකීම පවරන ලද ආයතනයක් හෝ පාර්ශවයක් නොමැති වීම ආදී දුර්වලතා හේතුවෙන් ඉදිරිපත් කරනු ලබන අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ සාර්ථක	අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ පසු විපරමක් සිදු කර අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කාලීනව ගත යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ නොවේ. වාර්ෂික අයවැය මඟින් යෝජනා ඉදිරිපත් වූ පසු ඒවා ක්‍රියාත්මක කළ යුතු රාජ්‍ය අමාත්‍යාංශ හා ආයතන හඳුනාගෙන ඒ ඒ ආයතන සඳහා වගකීම පවරනු ලබයි. එම සෑම ආයතනයකම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිවරයකු හෝ ගණන්දීමේ නිලධාරිවරයකු සිටින අතර ඒවා ක්‍රියාත්මක කර මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම ඔවුන්ගේ වගකීම වේ. එම යෝජනා ක්‍රියාත්මක කර	2023 වර්ෂය හා ඊට පෙර වර්ෂයේ ඉදිරිපත් කර තිබූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මන්දගාමී වී තිබුණි. එසේම, අයවැය යෝජනා ප්‍රගතිය පිළිබඳ පසුවිපරම් කිරීමේ කාර්යය සඳහා ආයතනයක් හෝ පාර්ශවයක් 2024 නොවැම්බර් 20 දින තෙක් ස්ථාපිත කර නොතිබුණි.

ප්‍රගතියක් ඇති කර ගැනීමට නොහැකි වී ඇත.	ප්‍රගතිය වාර්තා කරන ලෙස අවස්ථා ගණනාවකදීම අදාළ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත ලිඛිතව හා වාචිකව දැනුවත් කළද සමහර යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අප වෙත වාර්ථා කිරීම මන්දගාමී ස්වාභාවයක් ගෙන ඇත. මුදල් අමාත්‍යාංශය මඟින් මාසිකව හා කාර්තුමය වශයෙන් අදාළ යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඒ ඒ ආයතන මඟින් ලබා ගැනීමට කටයුතු කරනු ලබන අතර, එය වරින් වර ප්‍රගතිය අපේක්ෂා කරනු ලබන අංශ වෙත ලබාදීමට කටයුතු කරනු ලැබේ. කෙසේ වෙතත් අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකරනු ලබන ආයතන වල මෙම තත්ත්වය වර්ෂය පුරාවටම නිරන්තරයෙන් විගණනයට ලක් කරන්නේ නම් ඔබ විසින් පෙන්වා දෙනු ලබන

			දුර්වලතාවයන් මගහරවාගැනීමට හැකි බව නිරීක්ෂණය කරමි. අයවැය මඟින් ඉදිරිපත් කර ඇති යෝජනා, ක්‍රියාත්මක කිරීම සඳහා යොමුකර ඇති ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඒවා ක්‍රියාවට නැංවිය යුතු අතර එකී කාර්යයන් එම රේඛීය අමාත්‍යාංශ මඟින් අධීක්ෂණයට ද ලක් කරනු ලැබිය යුතුය. එයට අමතරව එක් එක් ව්‍යාපෘතීන්ට අදාළව මුදල් වෙන්කිරීමේදී ඒ ඒ අවස්ථාවන්ට අදාළව එම ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය ද විමසා බැලීමෙන් අනතුරුව මහා භාණ්ඩාගාරය මඟින් අදාළ මුදල් ප්‍රතිපාදන නිදහස් කිරීම සිදුකරනු ලැබීම සාමාන්‍ය ක්‍රියාපිළිවෙත වේ.	
04	රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වාදීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018. හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්ව, මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු වුවද, 2023 වර්ෂයේදී අවස්ථා 08 ක දී එකතුව රු.3,330,175 ක් වූ භාණ්ඩ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා	අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කර, භාණ්ඩ ප්‍රසම්පාදනයන් සිදු කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව අධ්‍යයනය කරමින් සිටී.	2024 වර්ෂයේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර නොතිබුණි.

	කිරීමෙන් තොරව මිල සැදහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.			
05	ආදායම් රැස් කිරීම සම්බන්ධ 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 4(ආ) ඡේදය සහ මු.රෙ. 128(2)(ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන සැලසිය යුතු බව දක්වා තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරුවලට අනුව ආදායම් රැස් කරන ප්‍රධාන ආයතන විසින් 2023 දෙසැම්බර් 31 වන විට රැස් කළ යුතු මුළු හිඟ ආදායම (බදු ආදායම සහ බදු නොවන) රු.714,989,620,126 ක් වි තිබුණි. පසුගිය වසරට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ හිඟ ආදායම් රු.128,986,232,809 ක අඩු වීමක් පෙන්නුම් කළ ද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු හිඟ අදායම රු.117,512,309,997 ක වැඩිවීමක් සිදුවී තිබුණි.	හිඟ ආදායම් රැස් කිරීම සම්බන්ධව චක්‍රලේඛ උපදෙස් හා මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනිමට කටයුතු කළ යුතු වීම.	2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2015 මඟින් ආදායම් ගණන් දීමේ නිළධාරින් විසින් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කලයුතු බවට දක්වා ඇත. එබැවින් මේ සම්බන්ධයෙන් අදාළ ආදායම් ශීර්ෂයන්ට වගකීම සඳහා ඍජුවම බැඳි සිටින්නාවූ ආදායම් ගණන් දීමේ නිළධාරින් මෙන්ම සියළුම අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිළධාරින් සහ අනෙකුත් සියළු ගණන් දීමේ නිළධාරින් මෙම හිඟ ආදායම් අඛණ්ඩව එකතු වීම පිලිබඳව ඍජු ලෙසම වගකීමට බැදී සිටි.	2023.12.31 දින වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස්කළ යුතුව තිබූ රු.බි.635.7 ක් වූ හිඟ බදු ආදායම 2024.06.30 දින වන විට රු.බි.582.9 දක්වා පහත බැස ඇති අතර, 2023.12.31 දිනට රේගු දෙපාර්තමේන්තුව විසින් රැස්කළ යුතුව තිබූ රු.බි.58.6 ක්ව පැවති හිඟ බදු ආදායම 2024.06.30 දින වන විට රු.බි.65.4 දක්වා වැඩි වී ඇත. එමෙන්ම, සුරාබදු දෙපාර්තමේන්තුව මඟින් අයකළ යුතුව ඇති හිඟ බදු ආදායම රු.බි.8.3 ක් වී තිබුණි.
06 .	2023 දෙසැම්බර් 31 දින වන විට අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 11 ක් පුරප්පාඩු වී පැවැති අතර, ඉන් තනතුරු 04ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය.	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවිම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය ට පියවර ගත යුතු වීම.	දෙපාර්තමේන්තුවේ තනතුරු පුරප්පාඩු සඳහන් කරමින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා නිලධාරීන් පත් කිරිමට අදාල කටයුතු සිදු කරන ලෙස රාජ්‍ය පරිපාලන,	2024 දෙසැම්බර් 31 අවසාන වන විට තනතුරු 11 ක් පුරප්පාඩුව පැවතුණි.

ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙත නිරන්තරයෙන් දැනුවත් කිරීම් සිදු කර ඇත.

41. ශීර්ෂය - 239 විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	200,933,723	200,933,723	200,933,723	තත්ත්වාගණනය නොකළ
2022	200,533,758	200,533,758	200,533,758	තත්ත්වාගණනය නොකළ
2023	191,487,734	191,487,734	191,487,734	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරන CS-DRMS ණය කළමනාකරණ පද්ධතිය, ණය සේවාකරණ පුරෝකථන ඇතුළු කාර්යයන් සඳහා හඳුන්වා දී ඇති පද්ධතියකි. ඒ අනුව ණය කළමනාකරණ කටයුතු සමඟ මුදල් ප්‍රවාහ කළමනාකරණය හා ණය ගණුදෙනු ගිණුම්ගත කිරීමේ පහසුකම් සහිත හා/හෝ CS-DRMS පද්ධතියෙන් ITMIS පද්ධතියට අවශ්‍ය දත්ත හුවමාරු කළ හැකි පහසුකම් සහිත වූ ණය කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී තිබුණි.	2023 2022 2021	යාවත්කාලීන කළ ගිණුම්කරණ හා මුදල් ප්‍රවාහ පහසුකම් සහිත පද්ධතියක් පවත්වා ගත යුතු වීම.	නව ණය කළමනාකරණ පද්ධතියක් මිලදී ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ප්‍රසම්පාදනය ඉදිරියේදී නව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සඳහා අදාළ වන අතර, එම ප්‍රසම්පාදන කටයුතු මුදල් අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරමින් පවති.	මේ දක්වා අපොහොසත් වී තිබුණි.
02	විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන CS-DRMS ණය කළමනාකරණ පරිගණක පද්ධතියේ අන්තර්ගත දත්ත නොසැසඳීම්	2023			
	(i). CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය		රාජ්‍ය ණය ගැනීම,ණය සේවාකරණය	රාජ්‍ය ණය ගැනීම වාර්තාගත කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශනය	2023 දෙසැම්බර් 31 දින වන විට

	කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණය එකතු මුළු වටිනාකම රු.මිලියන 15,823 ක් විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් 24(II) අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන 17,103.2 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම පෙර වර්ෂවලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් අඩුවෙන් දක්වා තිබුණි.		ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.	නව රාජ්‍ය ණය කලමනාකරණ කාර්යාලය මඟින් සිදුකිරීමට නියමිතය.	මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
(ii)	ණය අංක 2018003 අදාළව CSDRMS 854-1 වාර්තාව අනුව 2023 වර්ෂයට අදාළව කිසිදු ප්‍රතිලබ්ධිවීමක් නොමැති වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව EUR 727,053 ක් ප්‍රතිලබ්ධි වී ඇති බව දක්වා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ණය මුදලට අදාළව 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම්	2023	-එම-	ප්‍රමාද වී ප්‍රතිලබ්ධි සටහන් ලැබීම අවම කර ගැනීම සඳහා ණයහිමියන් දැනුවත් කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී. තවද ණය ශේෂ පරීක්ෂාව වාර්ෂිකව සිදු කරනු ලැබේ. ප්‍රදායකයන් වෙතින් ලද ප්‍රතිලබ්ධි සටහන්වල අගයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලද ආපසු ගෙවීම් සටහන් අනුව, ලැබී ඇති සියලු අගයයන් නොපමාව පද්ධතියට ඇතුළත් කර ඇත. තවද, දැනට නොගෙවා ඇති ණය සම්බන්ධව ක්‍රියාත්මකවන ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡාවලදී තවදුරටත් දත්ත සටහන් නිවැරදි දැයි අදාළ එක්එක් ද්විපාර්ශ්වික	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

	ගත කරන ලද ණය වටිනාකම EUR 335,930 ක් පමණක් විය. ඒ අනුව මෙම ණයමුදලට අදාළව 2023 වර්ෂය තුළ ප්‍රතිලබ්ධි වීම් අතර EUR 391,123 ක වෙනසක් නිරීක්ෂණය විය.			ණයහිමියන් සමඟ පරීක්ෂා කෙරේ. එහිදී යම් අනනුකූලතාවයක් අනාවරණය වුවහොත් වහාම යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.	
(iii)	ණය ගිවිසුම් 23 ක ට අදාළව CSDRMS 854-1 වාර්තාවේ 2022 දෙසැම්බර් 31 දිනට වූ ශේෂයන්, 2023 ජනවාරි 01 දිනට අදාළ ශේෂයන් සමඟ සැසඳීමේදි එකතුව රු.මිලියන 30,401 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(11) න් සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 න් සමාලෝචිත වර්ෂය තුළදී සත්‍ය වශයෙන්ම ණය ප්‍රතිලබ්ධිවීම්වල නිවැරදි වටිනාකම නිරූපණය නොවන බව ද නිරීක්ෂණය විය.	2023	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම හා ප්‍රතිලබ්ධි ප්‍රමාද වීම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	-එම-	-එම-
(iv)	ණය ගිවිසුම් 04 ක් සම්බන්ධයෙන් එකතුව රු.821,115,454 ක ඍන ණය ප්‍රතිලබ්ධි වීම් සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ CSDRMS 854 -1 වාර්තාවෙන් නිරීක්ෂණය විය.	2023 2022	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.	ගිණුම් තබන ආයතනය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂ හෝ අදාළ රේඛීය අමාත්‍යාංශයෙන් හෝ වියදම් ඒකකවලින් විමසීමෙන් ප්‍රතිලබ්ධි ආපසු පවරාගැනීම පිළිබඳ නිශ්චිත (හේතු) කරුණු තහවුරු කර ගත හැකි අතර, ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව ඉදිරියේදී සටහන් කිරීමට අපේක්ෂිතය.	-එම-
(v)	රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(I) න්	2023	රාජ්‍ය ණය ගැනීම, ණය	විගණනයෙන් පෙන්වා දී තිබූ වරද දත්ත පද්ධතියේ	-එම-

	ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 854-1 වාර්තාව සමඟ පරීක්ෂා කිරීමේදී 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට CS-DRMS 854-1 වාර්තාවෙහි සහ 2023 ජනවාරි 01 දිනට එම වාර්තාවේ USD 227,823 ක් හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිඳු වෙනසක් නිරීක්ෂණය නොවීය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD 1 ක් රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය.		සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.	නිවැරදි කර ඇති අතර, සටහන් කරන ලද දත්ත නැවත පරීක්ෂා කිරීමේ අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කර ඇත. මෙහිදී පැනනැඟුණු තාක්ෂණික දෝෂය ඉවත්කර ගැනීම සඳහා, තිරසාර තාක්ෂණික සහායක් ඇති ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ණය කළමනාකරණ පද්ධතියක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ අතර, ඉදිරියේ දී විදේශ ණය දත්ත පිළිබඳ කටයුතු රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරේ.	
(vi)	ප්‍රදායකයන් විසින් එවා තිබූ ණය ශේෂ තහවුරුකිරීම්, රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සහ පරිගණකගත ණය කළමනාකරණ පද්ධතියේ 854-1 වාර්තාව සමඟ සංසන්දනය කිරීමේදී ණය වර්ග 13කට අදාළව වූ ශේෂය රු.මිලියන 4,775 ක් වැඩියෙන්ද ණය වර්ග 14කට අදාළව රු.මිලියන	2023	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.	ප්‍රමාද වී ප්‍රතිලබ්ධි සටහන් ලැබීම අවම කර ගැනීම සඳහා ණයහිමියන් දැනුවත් කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී. තවද ණය ශේෂ පරීක්ෂාව වාර්ෂිකව සිදු කෙරේ. ප්‍රදායකයන් වෙතින් ලද ප්‍රතිලබ්ධි සටහන්වල අගයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලද ආපසු ගෙවීම් සටහන් අනුව, ලැබී ඇති සියලු අගයයන්	-එම-

	5,126 ක් අඩුවෙන්ද රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා වී ඇති බව නිරීක්ෂණය විය.			නොපමාව පද්ධතියට ඇතුළත් කර ඇත. තවද, දැනට නොගෙවා ඇති ණය සම්බන්ධව ක්‍රියාත්මකවන ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡාවලදී තවදුරටත් දත්ත සටහන් නිවැරදි දැයි අදාළ එක් එක් ද්වීපාර්ශ්වික ණයහිමියන් සමඟ පරීක්ෂා කෙරේ. එහිදී යම් අනනුකූලතාවයක් අනාවරණය වුවහොත් වහාම යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.	
	(vii) ප්‍රතිලබ්ධි වූ කාලපරිච්ඡේදය සලකා බැලීමේදී 2023 වර්ෂයට අදාළව ප්‍රතිලබ්ධි වූ ඇතැම් විදේශ ණය 2023 මැයි 07 දින මුද්‍රණය කළ පරිගණක ගත ණය කළමනාකරණ පද්ධතියේ 814-1 වාර්තාවේ ඇතුළත් වුවද 2024 පෙබරවාරි 17 දින මුද්‍රණය කළ වාර්තාවේ එම ප්‍රතිලබ්ධි වීම් ඇතුළත් වී නොමැති අතර, ඒ අනුව, රු.මිලියන 1,290 ක විදේශ ණය ශේෂයක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධි වූ ණය ලෙස ගිණුම්ගත කිරීම අත්හැරී තිබුණු බව නිරීක්ෂණය විය.	2023	-එම-	-එම-	-එම-
03	1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2023 වර්ෂය තුළ එසේ මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව	2023 2022 2021	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී පූර්ණ ප්‍රදාන පිළිබඳ ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි නීතිමය ප්‍රතිපාදන සකසා ඇත. ඒ අනුව අදාළ නියෝග අනුමත වූ පසු මෙම දෙපාර්තමේන්තුවෙන් ද චක්‍රලේඛ මඟින් පූර්ණ ප්‍රදාන සම්බන්ධයෙන්	මේ දක්වා මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

	ආයතන 11 ක් සඳහා එකතුව රු.මිලියන 22,210 ක විදේශ ප්‍රදාන සෘජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් ප්‍රතිපාදන සලසාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.			කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කරනු ඇත.	
04	2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමග එකතු වටිනාකම් ජපන් යෙන් 984,000, යුරෝ 134,810,000, ඇමෙරිකානු ඩොලර් 58,417,841 කොරියන් වොන් 400,000 චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිනි.	2023	ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුම්වලට එළඹෙන විදේශ ප්‍රදානයන් සම්පූර්ණ වශයෙන් ලබාගෙන, උපරිම වශයෙන් අරමුණට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම.	විදේශ ප්‍රදාන බලාපොරොත්තු වූ පරිදි උපලබ්ධි නොවීමට පොදුවේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදවීම, කොවිඩ් වසංගතය නිසා වැඩකටයුතු අඩාල වීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් නොවීම නිසා අදාළ ආයතනයන් මඟින් ණය හා ප්‍රදාන උපයෝජනයන් නිසිපරිදි ක්‍රියාත්මක නොකිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයන්හි පරිපාලනමය අඩුපාඩු හා ප්‍රදායක ආයතනයන්හී ප්‍රමාදවීම් යනාදිය බලපා ඇත. කෙසේ වුවද, ප්‍රදාන අරමුදල් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම තුළින් රටේ ආර්ථික වර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකිවන සේ මෙම දෙපාර්තමේන්තුව තුලින් ගතහැකි සියලු ක්‍රියාමාර්ග ඉදිරි කාලය තුළ ගැනීමට බලාපොරොත්තු වේ.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
05	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 18 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් ද, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි.	2023 2022 2021	අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් අනුමත කාර්ය මණ්ඩලය තුළ වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය හා අදාළ පත්වීම් බලධාරීන් දැනුවත් කර ඇත.	-එම-

සංශෝධනය කළ
යුතු වීම.

42. ශීර්ෂය - 240 ජාතික අයවැය දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	166,161,292	166,161,292	166,016,372	තත්ත්වාගණනය නොකළ
2022	179,894,713	179,894,713	179,894,695	තත්ත්වාගණනය නොකළ
2023	175,464,121	175,464,121	175,463,654	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	ා‍ර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරුපැදි ලබාදීමේ වැඩසටහනට අදාළව යතුරුපැදි සඳහා වූ මූලික ගෙවීම, බදු නොවන ආදායමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් 2003.04.00 දරන ආදායම් සංකේතාංකයට ගිණුම්ගත කර තිබූ අතර එසේ ලබා දුන් සියළුම යතුරුපැදි 2020 වර්ෂය අවසාන වන විට අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික අයිතියට පැවරී අවසාන විය යුතුව තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දින වන විටත් සම්පූර්ණ වශයෙන් අයකර ගත යුතු මුදල නිශ්චිතව තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණු අතර 2023 වර්ෂයේදී රු.490,386 ක ශුද්ධ ආදායමක් ලැබී තිබුණි.	2023	විධිමත් උපදෙස් හා මහපෙන්වීම් සිදුකරමින් හිඟ ආදායම් රැස්කර ගැනීමට කඩිනමින් කටයුතු කළයුතු වීම.	මෙම ගැටළුව කඩිනමින් නිරාකරණය සඳහා වෙන වෙනම ආයතන ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් පරීක්ෂා කිරීම තව දුරටත් කරගෙන යනු ලැබේ. එමෙන්ම මෙම යතුරුපැදි පවරා ගැනීමට කටයුතු කඩිනම් කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	මේ දක්වා නිමකර නොතිබුණි.

02	1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමිවූ ස්ථිර ජීවනෝපාය මාර්ගයක් නොමැති වූ වයස අවුරුදු 65 සම්පූර්ණ වූ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා දීමනාවක් ලබාදීමට අයවැය යෝජනා මඟින් 2013 වර්ෂයේ සිට අනුමත වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා මසකට රු.5,000 බැගින් ද, 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා මසකට රු.6,000 බැගින් ද, 2015 දෙසැම්බර් 31 දිනෙන් පසුව එක්වරක් පමණක් ගෙවනු ලබන රු.250,000 ක දීමනාවක් ද ලබා දීමට තීරණය කර තිබුණි. එසේ වුවද විගණනය විසින් මේ පිළිබඳව අඛණ්ඩව පෙන්වා දී තිබුණද දෙපාර්තමේන්තුව විසින් මේ සඳහා හිමිකම් ලබන්නන් නිශ්චිතව හඳුනා ගැනීමට හා අපේක්ෂිත ආකාරයට යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, 2023 වර්ෂයේදී ප්‍රතිලාභීන් 4 දෙනෙකු සඳහා රු.1,673,000 ක් ගෙවීම් කර තිබුණි.	2023	අයවැය යෝජනා වලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අදාළව විධිමත් සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම.	2013 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ මෙම අයවැය යෝජනාවට පදනම් කරගෙන ඇත්තේ එවකට මුදල් අමාත්‍යාංශය හා කම්කරු අමාත්‍යාංශය, වෘත්තීය සමිති සමඟ එවකට පැවති සාකච්ඡාවලදී අනාවරණය වූ තොරතුරු බව නිරීක්ෂණය වේ. එම තොරතුරු අනුව 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමි වී ස්ථිර ජීවනෝපායක් නොමැති වූවන් 10,000 ක පමණ පිරිසක් සිටින බවට වාර්තා වී ඇති බව ගොනුව අනුව නිරීක්ෂණය වී ඇත. මෙම වැඩසටහන යටතේ ගෙවීම් සිදු කිරීමේදී 1980 ජූලි වර්ජනයට සහභාගී වී රැකියා අහිමි වූවන්ගේ ඉල්ලීම්, ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන නිර්දේශ පදනම් කර ගනිමින් එවකට මෙම සේවකයින් සේවා කරන ලද විෂය භාර අමාත්‍යාංශ වන කම්කරු, ප්‍රවාහන, කර්මාන්ත, හා නිවාස යන අමාත්‍යාංශවල නිර්දේශ අනුව සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ.	2024 වර්ෂයේදී දීමනා ලබා දී තිබූ අතර තවදුරටත් ප්‍රතිලාභ ලබා දීම සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් හඳුනාගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.
03	2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නතතුරු 08 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 14 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක් ද ලෙස එකතුව පුරප්පාඩු	2023	පුරප්පාඩු පියවීම හෝ කාර්ය මණ්ඩල සංශෝධනය කළ යුතු වීම.	දැඩි වියදම් පාලනය හා බඳවාගැනීම්/ පුරප්පාඩු පිරවීම අත්හිටුවීම සම්බන්ධයෙන් නිකුත්කරන ලද විවිධ උපදෙස් මෙම තත්වයට	2024 නොවැම්බර් 30 දිනවන විටත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක් ද්වීතික මට්ටමේ තනතුරු 09 ක් හා

තනතුරු සංඛ්‍යාව 31 ක් පැවතුණ අතර, ජ්‍යෝෂ්ඨ හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු පිරවීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.		හේතු වී ඇත. ඒ අනුව තවදුරටත් ප්‍රාථමික මට්ටමේ පවතින පුරප්පාඩු වෙනුවෙන් සේවකයින් අනුයුක්ත කර ගැනීමට පුරප්පාඩු ලිපි නිකුත් කර තිබෙන අතර ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු වෙනුවෙන් ද නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට ලිපි නිකුත් කර තිබේ.	ප්‍රාථමික මට්ටමේ තනතුරු 04 ක් පුරප්පාඩු පැවතුණි.

43. ශීර්ෂය - 241 **රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	47,832,354	47,832,354	47,826,428	තත්ත්වාගණනය නොකළ
2022	47,631,890	47,631,890	47,628,390	තත්ත්වාගණනය නොකළ
2023	48,018,834	48,018,834	48,018,834	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	ාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන රාජ්‍ය සමාගම් 50ක් තිබුණද, ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය ව්‍යවසායන් යටතට ඇතුලත් කර තිබුණේ රාජ්‍ය සමාගම් 16 ක් පමණක් වු අතර අනෙක් රාජ්‍ය සමාගම් සම්බන්ධයෙන් වන අධීක්ෂණය පහල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	2023	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත්ව ඇති සියළුම රාජ්‍ය සමාගම් සම්බන්ධයෙන් නිසි අධීක්ෂණයක් සිදු කළ යුතු වීම.	ශ්‍රී ලංකා ආර්ථිකයට සුවිශේෂ දායකත්වයක් ලබාදීමට ක්‍රමෝපායිකව වැදගත් වන රාජ්‍ය සමාගම් අධීක්ෂණය කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙන අතරම අනෙකුත් රාජ්‍ය සමාගම්හි අවදානම් තත්ත්වය ඉහළ, මධ්‍යම හා පහළ යනාදී වශයෙන් ඇගයීමට ලක්කොට ඒ අනුව අධීක්ෂණ කටයුතු සිදු කරගෙන යනු ලැබේ. ඊට අමතරව, අදාළ අධීක්ෂණ කටයුතු කරගෙන යාම සඳහා විශේෂඥ දැනුමක් සහිත මානව සම්පත ප්‍රමාණවත් මට්ටමක නොපවතී.	මේ වන විටත් මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
02	2023 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.1,124,665,353,761 ක් සපයා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 13 ක 2022 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.1,047,966,900,772 ක් වු අතර, එම ආයතනවල මූල්‍ය	2023	රාජ්‍ය හිමිකාරිත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම්හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම් අඩුවීම් අනාවරණය කිරීමට කටයුතු ඉදිරියේදී	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය දක්නට ලැබුණි.

	ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය සෘන රු.630,632,144,273 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ මෙම ප්‍රාග්ධන දායකත්වයන් දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය. තවද, මේ සඳහා මූලික වශයෙන් බලපා ඇත්තේ අදාළ ආයතන අලාභ ලැබීම හේතුවෙන් රඳවා ගත් ලාභය සෘන අගයක් ගැනීම බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.		පරිදි අන්තර්ගත කළ යුතු වීම.	කරනු ලැබේ.	
03	2023 දෙසැම්බර් 31 දිනට රු.1,019,627,985,708 වන සහ 2022 දෙසැම්බර් 31 දිනට රු.892,034,785,542 ක් වූ රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.371,771,137,033 ක් පමණක් විය. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල ආයෝජනය කර ඇති ප්‍රාග්ධන දායකත්ව වටිනාකම අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	2023	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීමට හා ඒවායේ වටිනාකම්හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි අනාවරණය කළ යුතු වීම.	රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක්කර අවශ්‍ය සංශෝධනයන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	- එම-
04	2022 දෙසැම්බර් 31 දිනට පැවති රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්ව වටිනාකම රු.2,165,981,657,905 ක් වූ අතර, එයින් රු.2,121,653,720,125 ක් රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ආයෝජනය කර තිබුණි. සමස්තයක් ලෙස ගත් කළ රජය	2023	-එම-	රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක්කර අවශ්‍ය සංශෝධනයන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	- එම-

	සතු මෙම ව්‍යාපාර ආයතනවල ශුද්ධ වත්කම්වල මුළු වටිනාකම 2022 දෙසැම්බර් 31 දින වන විට රු.1,669,676,388,290 ක් වී තිබුණි. ඒ අනුව, ඉහත වර්ග තුනට අදාළ රජයේ ප්‍රාග්ධන දායකත්වය එම ආයතනවල ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව සියයට 21 කින් හෙවත් රු.451,977,331,835 කින් අපහායනය වී ඇති බව නිරික්ෂණය විය.				
05	2022 වර්ෂය තුළදී රජය විසින් ආයෝජනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩල 32 කට අදාළව රු.117,718,706,426 ක ශුද්ධ ලාභයක් උපයා තිබුණ ද, රාජ්‍ය සංස්ථා 36 කට සහ රජය සතු සමාගම් 30 කට අදාළව පිළිවෙලින් රු.804,795,113,607 ක් හා රු.133,722,486,417 ක් ලෙස එකතුව රු.938,517,600,024 ක ශුද්ධ අලාභ ඉපයීම හේතුවෙන් මෙම ආයතන 98 ට අදාළව සමස්තයක් වශයෙන් රු.820,798,893,548 ශුද්ධ අලාභයක් උපයා ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2022 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 22,181,000 වු අතර, ඒ අනුව රජය සතු ව්‍යාපාර ආයතන 98 ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා දරා ඇති ඒක පුද්ගල ශුද්ධ අලාභය රු.37,000 ක් පමණ වන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	2023	-එම-	මෑතකාලීනව මහා භාණ්ඩාගාරය විසින් ආර්ථිකයට සිදු කරන ලද ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණයන් තුළින් ආර්ථිකය යථාවත් වීමත් සමඟ මෙතෙක් අලාභ ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සැලකිය යුතු ප්‍රමාණයක් ලාභ උපයන තත්වයට පත්වෙමින් පවතී. ඒ අනුව ඉදිරියේදී රජය සතු ව්‍යාපාර ආයතන වෙනුවෙන් දරා ඇති ඒකපුද්ගල ශුද්ධ අලාභය අවම කර ගැනීමට හැකි වනු ඇත.	- එම-
06	2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යසායන් 17 කට අදාළව ජංගම අනුපාතය දුර්වල තත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ජංගම අනුපාතය 0.15 ක් වැනි ඉතාමත් පහළ අගයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා	2023	-එම-	රාජ්‍ය ව්‍යවසායන්හි ආයෝජන ඉහළ නැංවීම කෙරෙහි සීමාකාරී මූල්‍ය අවකාශය ඍණාත්මකව බලපා ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායන් විසින් මුහුණපාන	- එම-

	දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.			ද්‍රවශීලතා ගැටළු කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් අවස්ථානුකූලව ලබා දීමට කටයුතු කර ඇත.	
07	2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අයි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙහි ඇතැම් ආයතනවල රජයේ ප්‍රාග්ධනයට වඩා ගෙවීමට ඇති දිගුකාලීන ණය ඉහළ අගයක් ගෙන තිබුණි. තවද රජයේ ප්‍රාග්ධන දායකත්වය සෘන අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මඟින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව මෙම සියලු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.	2023	-එම-	රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය අවදානම අවම කර ගැනීම සඳහා 2023 වර්ෂයේ සිට ප්‍රතිසංස්කරණයන් සිදු කරමින් පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අයි තෝලන තත්ත්වයන් යහපත් තත්ත්වයකට ගෙන ඒමට හැකියාව ලැබී ඇත.	- එම-
08	රාජ්‍ය ව්‍යවසායන් 8 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 10,803 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 4,323 ක් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 6,480 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023 2022	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ඇගයීමට ලක් කර නිසි ක්‍රියා මාර්ග ගැනීමට හා ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.	එම වෙනස ඇතිවීමට බලපෑ හේතු කවරේද යන්න හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර අදාළ වෙනස්කම් නිසි පරිදි හඳුනා ගැනීමෙන් අනතුරුව විධිමත් අනුමැතියක් සහිතව ප්‍රධාන ලෙජර ගිණුම්වල වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ.	- එම-
09	රාජ්‍ය ව්‍යවසායන් 9 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 994,992	2023	-එම-	- එම-	- එම-

	ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 995,171 ක් වීම හේතුවෙන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 179 ක් වැඩියෙන් දක්වා තිබුණි.				
10	2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ ඍජු ශේෂ සනාථකිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 09 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 135 ක් අඩුවෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර තිබුණි.	2023 2022	-එම-	එම වෙනස්කම් වලට අදාළව නිවැරදි වටිනාකම නිසි පරිදි ගිණුම්ගත කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.	- එම-
11	Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd ආයතනයෙන් ලද ඍජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,573 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබුණ ද, රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් වී ඇත්තේ කොටසක මිල රු.100 ක් වූ කොටස් 200,000 ක ප්‍රාග්ධන දායකත්වයක් පවතින බවයි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයේ ප්‍රාග්ධන දායකත්වය රජයේ මූල්‍ය ප්‍රකාශනයේ රු.504,725,732 ක් අඩුවෙන් සටහන් වී තිබුණි.	2023	-එම-	අදාළ රේඛීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙහි හිමිකම් ප්‍රාග්ධන වැය විෂය යටතේ ලබා දී ඇති ප්‍රාග්ධන දායකත්වය ප්‍රධාන ලෙජර ගිණුම්වල වාර්තා නොවීම මත මෙම වෙනස හට ගෙන ඇති අතර මෙම වර්ෂය තුළදී අදාළ වාර්තා කිරීමේ කටයුතු සිදු කෙරෙනු ඇත.	- එම-
12	රාජ්‍ය සමාගම් 02ක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට කොටස් වටිනාකම රු.මිලියන 5,141 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 14,476 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2023 දෙසැම්බර්	2023 2022	-එම-	Bogala Graphite Lanka PLC හි අදාළ ගණනය කිරීම් නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. මිහින් ලංකා (පෞද්ගලික) සමාගමෙන් රාජ්‍ය බැංකු වලට ගෙවිය යුතු ණය අයකරගත	- එම-

	31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල කොටස් වටිනාකම රු.මිලියන 9,335 ක් වැඩියෙන් ප්‍රාග්ධන දායකත්වය දක්වා තිබුණි.			නොහැකි නිසාත්, එම ණය සඳහා රජය විසින් භාණ්ඩාගාර ඇපකර නිකුත් කර ඇති නිසාත්, එම ණය සඳහා වන වාර්ෂික පොළියට අදාල මුදල රාජ්‍ය බැංකු මඟින් රජයට ලබාදෙන අයබදු (Levy) වලින් කපා හැර ඉතිරිය පමණක් රජයට ප්‍රේෂණය කරයි. මෙම මුදල මිහින් ලංකා (පෞද්ගලික) සමාගම සඳහා වන බැවින් හා වසා දැමීමේ කටයුතු ආරම්භ කර ඇති මිහින් ලංකා (පෞද්ගලික) සමාගම සමඟ රජයට දැනට ඇති එකම බැඳියාව ප්‍රාග්ධනය වන බැවින් එම මුදල ප්‍රාග්ධනය ලෙස වාර්තා කර ඇත.	
13	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 241,651 ක් වූ අතර, ඉන් රු.මිලියන 34,090 ක් එනම් සියයට 14 ක එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත වී තිබුණි.	2023 2022	පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීම තුළින් ආයතනවල ප්‍රාග්ධන දායකත්වයන් වැඩිවීමක් සිදු නොවන බැවින් නිසි ක්‍රමවේදයක් ඒ සඳහා අනුගමනය කළ යුතු වීම.	මෙම ආයතන සියල්ලෙහිම සම්පූර්ණ අයිතිය මහා භාණ්ඩාගාරය සතු වේ. ඒ අනුව එම ආයතනවල පවතින කාරක ප්‍රාග්ධන ගැටළු හෝ අනෙකුත් පුනරාවර්තන ස්වරූපයේ වියදම් සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය මහා භාණ්ඩාගාරය විසින් ලබා දිය යුතු වේ.	- එම-
14	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ව්‍යවසායන් 05 ක් සඳහා රු.මිලියන 176 ක ප්‍රාග්ධන දායකත්වයක් සිදුකර තිබුණ ද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාවෙහි	2023	රජය මඟින් සිදුකරන ලද කොටස්වල ආයෝජනයට අදාළ සහතික කඩිනමින් ලබාගැනීමට කටයුතු කල යුතු	කොටස් සහතික කඩිනමින් ගෙන්වා ගැනීමට අදාළ විෂය නිලධාරීන් දැනුවත් කර ඇත.	- එම-

	වෙනසක් සිදු වී නොතිබුණි.		වීම.		
15	මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ඇවර කිරීම සම්බන්ධව අංක MOF/DG/LAD/CO/142/2017 හා 2017 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා අංක (අ), (ආ), හා (ඇ) සඳහා අංක අමප/17/2383/733/026-1 හා 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් සමාගම ඈවර කිරීම සඳහා විශේෂ යෝජනාවක් සම්මත කර වාණිජ මහාධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව අධිකරණය විසින් 2018 මාර්තු 18 දින ඈවරකරුවකු පත් කර තිබුණු තත්ත්වයකදී මහජන බැංකුවෙන්, එම ආයතනය ලබාගත් ණය වාරිකය හා පොළිය ගෙවීම සඳහා 2021 හා 2022 වර්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 272 ක් හා රු.මිලියන 441 ක් වශයෙන් එකතුව රු.මිලියන 713 ක් එම සමාගම වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණි.	2023	අරමුදල් ලබා දීමේදී රජයට විය හැකි අවාසිසහගත තත්ත්වයන් අවමවන පරිදිත්, පවතින තත්ත්වයන් විධිමත්ව ඇගයීමකින් යුතුවත් සිදුකළ යුතුවීම.	මෙය මිහින් ලංකා සමාගම වෙත මුදලින් ලබා දුන් ප්‍රාග්ධන දායකත්වයක් නොව, එම වර්ෂයන් වලදී රාජ්‍ය බැංකු වෙතින් භාන්ඩාගාර ඇපකර මත ලබා ගත් ණය සඳහා ගෙවිය යුතු වාරික හා පොළී ප්‍රමාණය අදාළ බැංකු විසින් භාණ්ඩාගාරයේ එකඟතාවය මත ගෙවිය යුතු වූ ලාභ (Levy) ප්‍රමාණයෙන් හිලව් කර ගැනීමයි. මෙවැනි ආයතන ඈවර කිරීමේ කටයුතු අවසන් කර වසා දමන අවස්ථාව දක්වා වූ භාණ්ඩාගාර බැඳීම් වෙනුවෙන් කළ යුතු වූ වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සුදුසු වැය විෂය සංකේතයක් යටතේ ලබා ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කර ගැනීමට සටහන් කර ගතිමි.	- එම-
16	සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් සටහන් 15 යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ආයෝජනය කරන ලද කොටස් ගණන සටහන් කර නොතිබුණු අතර වටිනාකම රු.1,271,480,516 ක් ලෙස සටහන් කර තිබුණි. තවද, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලද ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකා	2023	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.	අතපසුවීමකින් අදාළ කොටස් වටිනාකම සටහන් වී නොමැති අතර, ඉදිරියේදී එම වටිනාකම ද ඇතුළත් කිරීමට කටයුතු කරමි. අදාළ ප්‍රතිශතය ගණනය කිරීමේදී සිදු වූ ගණිත දෝෂයක් හේතුවෙන් මෙම වෙනස ඇති වූ අතර එය ඉදිරියේදී නිවැරදි කර ගැනීම සඳහා	- එම-

	ටෙලිකොම් ආයතනයේ කොටස් හිමිකාරීත්වය සියයට 50.23 ක් වුවද රජයේ මූල්‍ය ප්‍රකාශනයෙහි එය සියයට 49.5 ක් ලෙස දක්වා තිබුණි.			සටහන් කර ගතිමි.	
17	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 269,386 ක් වූ අතර, ඉන් රු.මිලියන 228,771 හෙවත් සියයට 85 ක් 2023 සැප්තැම්බර් 26 දිනැති අමප 23/1812/604/118-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ කරන ලද ස්කන්ධ ආයෝජනයන් හේතුවෙන් වැඩි වී තිබුණි.	2023	රජය සතු ව්‍යවසායන්හි හඳුනාගත් වගකීම් රජයට පවරා ගැනීම හේතුවෙන් රජය මූල්‍ය අර්බුදයකට බලපෑ හැකි බැවින් එම වගකීම් නිරවුල් කිරීමට නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු වීම.	එකඟ වේ. සටහන් කර ගතිමි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට අනුව මෙම ආයතන වල ශේෂපත්‍ර ප්‍රතිව්‍යුහගත කල යුතුවිය. ඊට සමගාමීව මෙම එක්දින ගනුදෙනුව සිදු කරන ලදී.	- එම-
18	"මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. මේ පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය වේ.	2023 2022 2021			
	(i) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, 2024 මැයි 25 දින වන විට පාර්ලිමේන්තු නිල වෙබ් අඩවිය අනුව දෙපාර්තමේන්තුව ක්‍රමෝපායිකව වැදගත් ලෙස සලකන ලද ආයතන 52 අතුරින් ආයතන 33 ක පමණක් 2022 වර්ෂයට අදාළව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර		අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීම පිළිබඳව මෙම වර්ෂය ආරම්භයේ දී අදාල ආයතන වල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්, ආයතන ප්‍රධානීන් හා අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීම සිදු කර ඇත. මේ පිළිබඳව කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා	- එම-

	තිබුණි.			ලෙස අදාල ආයතන වෙත විටින් විට දැනුවත් කිරීම් සිදු කර ඇත.	
	(ii) 2023 වර්ෂය වෙනුවෙන් 2024 මැයි 25 දින වන විට එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් කිසිඳු ආයතනයක වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2023 2022	අධීක්ෂණයට ලක්වන සියලුම ආයතන සම්බන්ධයෙන් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පසුවිපරම් කළ යුතු වීම.	- එම-	- එම-
	(iii) 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීමේ දී වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහල මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය.	2023 2022	ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	මේ සම්බන්ධයෙන් අදාළ දැනුවත් කිරීම් නිරන්තරයෙන් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. එහෙත් වාර්ෂික කාර්යසාධන ඇගයීම් රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් අදාල ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දැරිය යුතුය.	- එම-
19	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති තනතුරු පුරප්පාඩු 06 ක් අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ තනතුරු 04 ක්, තෘතීයික මට්ටමේ තනතුරු 01 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් පුරප්පාඩුව පැවතුණි.	2023 2022 2021	අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම හා අත්‍යාවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් අනුමත කාර්ය මණ්ඩලය තුළ වේ නම් අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කළ යුතු වීම.	මේ වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 අතරින් පුරප්පාඩු 02 ක් සම්පූර්ණ කර ඇත. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුර පුරප්පාඩුව පිරවීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. තවද, දෙපාර්තමේන්තු ගත සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නියමිත ක්‍රමවේදයට අනුව සුදුසු නිලධාරියෙකු බඳවා ගැනීමට දැනට	මේ වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 4 න් 2 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.

කටයුතු කෙරෙමින් පවතී.
එසේම තෘතීයික මට්ටමේ පුරප්පාඩුව පවතින තනතුර දෙපාර්තමේන්තුගත තනතුරක් වන අතර, ඒ සඳහා සේවය හැර යාමේ නියෝග නිකුත් කිරීම මත අදාළ තනතුර පුරප්පාඩු වී ඇත. ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත ස්ථානමාරු වීම සහ ඒ වෙනුවට අනුප්‍රාප්තිකයන් නොපැමිණීම මත අදාළ පුරප්පාඩුව ඇති වී ඇති අතර, ඉදිරියේදී ඒ සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කරවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

44. ශීර්ෂය - 242 **කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	55,641,798	55,641,798	55,641,798	තත්ත්වාගණනය නොකළ
2022	54,931,278	54,931,278	54,931,278	තත්ත්වාගණනය නොකළ
2023	53,795,859	53,795,859	53,795,859	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සමාලෝචනය කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම කාර්යභාරය අවසන් කර නොතිබුණි.	2021	සැලසුම් ප්‍රකාරව කාර්ය මණ්ඩලය සමාලෝචනය කළ යුතු වීම.	මහජනතාවගේ හා අනෙකුත් පාර්ශවයන්ගේ අදහස් ලබා ගැනිම සඳහා අමාතය මණ්ඩලය විසින් නම් කරනු ලබන විධිමත් කමිටුවක් පත් කර එම කමිටුවේ නිරීක්ෂණ හා නිර්දේශ පදනම් කරගෙන තැපැල් හා දුම්රිය සේවාවේ ප්‍රතිසංවිධාන කටයුතු සිදු කිරීම සුදුසු බවට ද 2017.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව පත් කළ නිලධාරී කමිටුව විසින් නිර්දේශ කර ඇත. ඒ අනුව, මෙම ආයතනයට අදාළව ආයතනික ව්‍යුහය, සේවක සංඛ්‍යා ව්‍යුහය පිළිබඳ පුළුල් සාකච්ඡාවක් සිදු කිරීමෙන් පසු කාර්ය මණ්ඩල සමාලෝචනය සිදු කිරීම යෝග්‍ය බව නිරීක්ෂණය කරන ලදි. එහෙත් පැවති	තැපැල් දෙපාර්තමේන්තුව සඳහා කාර්ය මණ්ඩල සමාලෝචනයක් 2024 දෙසැම්බර් 31 දින වන තෙක් සිදුකර නොතිබුණි.

				කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රටේ තිබූ තත්ත්වය හේතුකොට ගෙන අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා නිලධාරීන් ඒකරාශී කර ගැනීමට නොහැකි වීම නිසා සමාලෝචනය සිදු කිරීමට නොහැකි විය.	
02	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල අනුමත කිරීමට අදාළ නිර්ණායක සකස් කර නොතිබුණි.	2021	අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල කාර්ය මණ්ඩල නිවැරදි ලෙස අනුමත කිරීම සඳහා නිර්ණායක සකස් කළ යුතු වීම.	දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ සඳහා කාර්ය මණ්ඩලය අනුමත කිරීමට අදාළ නිර්ණායක පිළිබඳ මූලික සාකච්ඡාවක් ජාතික වැටුප් කොමිෂන් සභාව සමඟ මේ වන විටත් පවත්වා නැති අතර, ඒ අනුව සකසන ලද වාර්තාවක් ජාතික වැටුප් කොමිසමේ අවධානය පිණිස යොමු කර ඇත.	2024 දෙසැම්බර් 31 දින වන විටත් කාර්ය මණ්ඩල අනුමත කිරීමේ නිර්ණායක පිළියෙල කර නොතිබුණි.
03	භාණ්ඩාගාර ලේකම් සහ මුදල් හා ක්‍රමසම්පාදන ලේකම්ගේ අංක DMS/E/1/99 හා 1999 මැයි 05 දිනැති චක්‍රලේඛය අනුව පිහිටුවන ලද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රථම පියවර වශයෙන්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව තුළ පොදු දත්ත මූලාශ්‍රයන් පිහිටුවීමට හා විවිධ නියෝජිත ආයතන අතර අපිළිවෙලට විසිර පවත්නා දත්ත, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව යටතේ ඒකාබද්ධ කොට යාවත්කාලීන කොට කේන්ද්‍රගත කිරීමට යෝජනා වී තිබූ අතර,	2023	ප්‍රමාදයන්ගෙන් තොරව සැලසුම්වලට අනුකූලව කටයුතු කළ යුතු වීම.	දැනට දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අනුමත සහ තත්‍ය කාර්යය මණ්ඩලයට අදාළ පැතුරුම්පත් මගින් ලබා ගන්නා සියලු දත්ත වාර්තා පරිගණකගත දත්ත සමුදාය කළමනාකරණ පද්ධතිය ඔස්සේ ඉටු කර ගැනීම සම්බන්ධ මූලික කාර්යයන් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මේ වන විටත්	සමස්ත රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩල තොරතුරු කළමනාකරණය සඳහා 2024 දෙසැම්බර් 31 දින වන තෙක් පරිගණක දත්ත පද්ධතිය සකසා නොතිබුණි.

	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙසට රාජ්‍ය අංශයේ සහ පළාත් රාජ්‍ය සේවයේ සේවක පිරිස පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය හඳුනාගෙන තිබුණි. එසේවුවද, දෙපාර්තමේන්තුව පිහිටුවා සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 24 ක පමණ කාලයක් ගතවී තිබුණ ද, දත්ත පද්ධතියක් නිර්මාණය කර නොතිබුණි.			සිදු කරමින් පවතී.	
04	2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යෑම් වැනි කරුණුවලට අදාළව සිදුවන වෙනස්වීම් දක්වමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳව කාර්තුමය වශයෙන් යාවත්කාලීන කරන ලද තොරතුරු, දෙපාර්තමේන්තුව විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දී තිබුණ ද, 2019 පළමු කාර්තුවෙන් පසු අදාළ කාර්ය මණ්ඩල තොරතුරු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩල උපදෙස් අනුව කටයුතු කළ යුතු වීම.	අමාත්‍ය මණ්ඩලය වෙත කාර්තුමය වශයෙන් වාර්තා ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන බැවින් වාර්ෂිකව වාර්තා ඉදිරිපත් කිරීමට මෙම වසරේ සිට කටයුතු කරනු ලැබේ.	2019 පළමු කාර්තුවෙන් පසු අදාළ කාර්ය මණ්ඩල තොරතුරු 2024 දෙසැම්බර් 31 දින තෙක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
05	2017 අගෝස්තු 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, සියලුම රාජ්‍ය ආයතනවල නිලධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අත්හැර යාම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැනීම් සහ මිය යෑම් වැනි කරුණුවලට අදාළව සිදුවන වෙනස්වීම් දක්වමින් රාජ්‍ය අංශයේ කාර්ය මණ්ඩලය පිළිබඳ දත්ත	2023	වාර්තා සඳහා දත්ත, සම්පූර්ණව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම.	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සැකසීමේ දී ඇතුළත් නොවී ඇති කාර්ය මණ්ඩල තොරතුරු ප්‍රමාණය මුළු අනුමත කාර්ය මණ්ඩලයෙන් 0.6%	මුදල් අමාත්‍යාංශයේ 2023 වර්ෂයේ වාර්ෂික වාර්තාව සැකසීමේදී රාජ්‍ය අංශයේ සියලුම කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කර නොතිබුණි.

	පද්ධතිය පවත්වාගෙන යාමේ හා යාවත්කාලීන කිරීමේ වගකීම, දෙපාර්තමේන්තුව වෙත පවරා තිබුණද, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව සැකසීමේදී රජය සතු ව්‍යාපාර ආයතන 32 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ විශේෂ වියදම් ඒකකවලට අදාළ ආයතන 52 ක් වශයෙන් එකතුව ආයතන 84 ක පවතින කාර්ය මණ්ඩල විස්තර ඇතුළත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.			ක් වැනි සුළු ප්‍රතිශතයක් වන අතර එම තත්ත්වය ද නිවැරදි කිරීමට මේ වන විටත් කටයුතු කරමින් පවතී.	
06	2017 ජනවාරි 21 දිනැති අංක 01/2017 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය පරිදි රාජ්‍ය ආයතනවල කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය අවම කාර්ය මණ්ඩලය හඳුනාගෙන, ඒ පිළිබඳව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කිරීමට හා එම තොරතුරු පදනම්ව කාර්ය මණ්ඩල සමාලෝචන කමිටුවක් මගින් එක් එක් ආයතනයට අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය තීරණය කිරීමට නියමිතව තිබුණි. එසේවුවද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් චක්‍රලේඛය නිකුත් කර වසර 05 ක් ඉක්මවී තිබුණ ද, රාජ්‍ය ආයතන 1027 ක් අතරින් ආයතන 765 ක කාර්යමණ්ඩල සමාලෝචන වාර්තාවන් ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.	2023	දක්වා ඇති චක්‍රලේඛයට අනුව හා දෙපාර්තමේන්තුව ට පැවරී ඇති කාර්යය අනුව කාර්ය මණ්ඩල සමාලෝචන සිදු කිරීමට කටයුතු කළ යුතු වීම.	රාජ්‍ය අංශයේ ආයතනික කාර්යමණ්ඩල සමාලෝචනය මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයක් වන බැවින් කාර්යය මණ්ඩල සමාලෝචනය සිදු කළ යුතු ආයතන හඳුනා ගනිමින් කාර්යය මණ්ඩල සමාලෝචන අඛණ්ඩව සිදු කිරීමට කටයුතු කෙරේ.	සියලුම රාජ්‍ය ආයතනවලින් කාර්ය මණ්ඩල සමාලෝචන වාර්තා ලබා ගැනීමට 2024 දෙසැම්බර් 31 දින වන තෙක්ම දෙපාර්තමේන්තු වට නොහැකි වී තිබුණි.
07	දෙපාර්තමේන්තුවේ අනුමත	2023	දෙපාර්තමේන්තු	පසුගිය වසර කිහිපය	2024 වර්ෂය

තනතුරු 94 ක් වූ අතර, ඉන් තනතුරු 19 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මටට්ටමේ තනතුරු 12 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 05 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද විය.	වේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම.	තුළ රජයේ සේවයට බඳවා ගැනීම සීමා කිරීම හේතුවෙන් පවතින සේවක හිඟතාවය මත අනුප්‍රාප්තික නිලධාරීන් සොයාගැනීම දුෂ්කර වී ඇත. කෙසේ වෙතත් ඇතැම් තනතුරු සම්බන්ධ අවශ්‍යතාවය තවදුරටත් සලකා බලා සංශෝධනය කළ යුතු තනතුරු හඳුනා ගෙන එම තනතුරු 2024 වර්ෂයේ දී යටපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	අවසන් වන විට අනුමත කාර්ය මණ්ඩලය 91 ක් වී තිබුණ අතර, තනතුරු පුරප්පාඩු 14 ක් පැවතුණි.

45. ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,721,340,897	1,721,340,897	1,721,018,040	තත්ත්වාගණනය නොකළ
2022	1,722,238,459	1,722,238,459	(14,536,792,858	තත්ත්වාගණනය නොකළ
2023	1,772,472,487	1,772,472,487	(3,465,456,372)	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවන් විසින් අනුමත මූල්‍ය ආයතනවල තැම්පත්කොට ඇති තැන්පතු වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයතන 17 ක් වෙත දෙපාර්තමේන්තු විසින් ගෙවිය යුතු මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් නොකරන ලද හිඟ ණය පොළිය රු.108,708,315,853 ක් විය.	2023	සියළුම බැරකම් නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම.	එකඟ වේ. ගෙවිය යුතු මුළු පොලී සහනාධාර මුදල සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ප්‍රතිපාදන ඉල්ලුම් කළ ද රු.බිලියන 10ක මුදලක් පමණක් 2023 වර්ෂය සඳහා අයවැයෙන් වෙන් කර ඇත. ප්‍රතිපාදන නොමැති බැවින් බැරකම් ලෙස ඇතුළත් කර නැත.	**2024** වර්ෂය සඳහා වෙන්කරන ලද මුදල රු. බිලියන 20 ක් වූ අතර අදාල මුදලින් බැංකු 19 ක් වෙත ගෙවිය යුතුව තිබූ සියළු පොලී සහනාධාර ගෙවා අවසන් කර ඇති අතර බැංකු 8 ක් සඳහා පමණක් රු.බිලියන 88.7 ක පොලී සහනාධාර පියවීමට ඇත.
02	ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම (SMELoC) ව්‍යාපෘතිය සඳහා අනුමත මූල්‍ය ආයතන වෙත ලබා දී 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උප ණය මුදල රු.57,655,546,322 ක් වූ අතර මෙම යෝජනා ක්‍රමය යටතේ රු.2,214,490,586 ක් ප්‍රදාන ලෙස ලබා දී ඇති බව ද නිරීක්ෂණය විය.	2023	-එම-	එකඟ වේ.	2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු උපණය මුදල රු.59,380,686,408 කි. ප්‍රදාන රු.2,361,441,896කි.
03	දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 59 න් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් ද ද්විතීයික මට්ටමේ තනතුරු 02 ක් ද ප්‍රාථමික	2023	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව	ද්විතීක මට්ටමේ පුරප්පාඩු දෙකෙන් එක් පුරප්පාඩුවක් සම්පූර්ණ කර ඇති අතර, ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු	ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07 ක් ද ද්විතීක මට්ටමේ පුරප්පාඩු 02 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක්ද

	මට්ටමේ තනතුරු 03 ක් ද විය.		සංශෝධනය කිරීමට පියවර ගත යුතු විම.	තුනෙන් පුරප්පාඩු දෙකක් සම්පූර්ණ කර ඇත. පවතින එක් රියදුරු පුරප්පාඩුව සඳහා පුරප්පාඩුවක් පවතින බවට ලිපියක් නිකුත් කර එම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට කටයුතු කරමින් සිටී. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සම්බන්ධයෙන් අදාල අංශ නැවත වරක් දැනුවත් කර එම පුරප්පාඩු හැකි විගස පුරවා ගැනීමට සටහන් කර ගතිමි.	පවතින බව නිරීක්ෂණය විය.
04	සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ දක්වන ලද පහත ආයතනය හා ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ක්‍රියාත්මක තත්ත්වයට පත් වී නොතිබුණි. 1. National Credit Guarantee Institution II. ADB Rooftop Solar Power Generation Project (Phase II)	2022	ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතු වීම.	අදහස් දක්වා නොතිබුණි.	National Credit Guarantee Instititition රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මාරු කර ඇති අතර ADB Rooftop Solar Power Generation Project (Phase II) මේ දක්වා ආරම්භ කර නොමැත.

46. ශීර්ෂය - 244 වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය	මුළු වත්කම් රු.
2021	66,117,124	66,117,124	66,117,124	තත්ත්වාගණනය නොකළ	
2022	65,697,303	65,697,303	65,697,303	තත්ත්වාගණනය නොකළ	
2023	75,956,314	75,956,314	75,956,314	තත්ත්වාගණනය නොකළ	

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	සාර්ක් කලාපීය රටවල් 8 ක සහභාගීත්වයෙන් පිහිටුවාගෙන ඇති දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සැෆ්තා / SAFTA) සඳහා ශ්‍රී ලංකාව 2005 වර්ෂයේදී අත්සන් කර තිබුණි. මෙම වෙළඳ ගිවිසුමේ වෙළඳාම ලිහිල්කරණ වැඩසටහනේ දෙවන අදියර අවසාන බාණ්ඩය යටතේ සකස් වී ඇති රේගු සංකේතාංක 50 (සංකේතාංක 8කින් යුත්) සඳහා ක්‍රියාත්මක වන තීරු බදු කපා හැරීම සියයට 7.5 හා සියයට 6 ක ප්‍රමාණය 2018 දෙසැම්බර් මාසය වන විට සියයට 5 දක්වා අඩු කිරීමට යෝජනා වී තිබුණ ද, එය 2024 ජුලි 23 දින වන විටත් ඉටු වී නොතිබුණි.	2023	රටට වාසිදායක වන ගිවිසුම් සඳහා ප්‍රමාදයන්ගෙන් තොරව ක්‍රියාමාර්ග ගත යුතු වීම.	වරණීය තීරුබදු අනුපාතය 5% සීමාව දක්වා අඩු කිරීමට සඳහා අංක MF/TIP/09/CM/202014/188 සහ 2019.06.11 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබුණි. එම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් ඉදිරිපත් කර තිබූ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් මෙතෙක් තීරණය කර නොතිබුණි. මෙම ගිවිසුමට අදාළ සාකච්ඡා එහි සමාජික රටවල සහභාගිත්වයෙන් නොපැවතුණු බැවින් මෙම කටයුතු දැනට තාවකාලිකව නැවතී ඇති බව කාරුණිකව දන්වමි.	2024 ඔක්තෝබර් 22 දින වන විටත් මෙම ගිවිසුමට අදාළ සාකච්ඡා එහි සමාජිත රටවල සහභාගිත්වයෙන් පවත්වා නොමැත.
02	ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වරණීය වෙළඳ ගිවිසුමකට එළඹීම සම්බන්ධයෙන් වන	2023	දී ඇති අනුමැතීන් වලට අනුව ප්‍රමාදයන්ගෙන් තොරව	මෙම ගිවිසුමට අදාළව සාකච්ඡාවන් තවදුරටත් කෙරෙමින් පවතින අතර දෙරට අතර එකඟතාවයන් අනුව ඉදිරි කටයුතු තීරණය කෙරේ.	මෙම ගිවිසුම සාකච්ඡා මට්ටමේ පවතින අතර, 2024 ඔක්තෝබර් 22 දින වන විටත්

	සාකච්ඡා ආරම්භය කිරීම සඳහා 2021 ජුනි 14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය දී තිබුණි. එම කාර්යයට අදාළව ඉදිරිපත් කර තිබූ දත්ත අනුව 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳාමෙන් යහපත් වෙළඳ ශේෂයන් සහ ඉහළ ආනයන ආවරණ අනුපාතයක් දෙරට අතර වෙළඳාම මඟින් අය කර ගෙන තිබුණි. ඒ අනුව, බංගලාදේශය - ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම (BS-PTA) අත්සන් කිරීමට අදාළ වැඩ සැලැස්මක් (Work Plan) සඳහා එකඟතාවයකට පැමිණ, දෙරට අතර ගිවිසුම අත්සන් කිරීම 2022 ජනවාරි මසට යෙදී තිබුණ ද, එය 2024 ජුලි 23 දින වන විටත් අත්සන් කර නොතිබුණි.		ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වීම.		ගිවිසුම සඳහා අත්සන් තබා නොමැත.
03	චීන -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ එකඟතාවයකට එළඹීම සම්බන්ධ සාකච්ඡා 2014 වර්ෂයේ ආරම්භ වී 2017 වර්ෂය දක්වා පවත්වා තිබුණි. පසුව, නැවත 2022 වර්ෂයේ සාකච්ඡා ආරම්භ කිරීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබුණු අතර,	2023	රටෙහි අවශ්‍යතාවය අනුව ප්‍රමාදයන්ගෙන් තොරව ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතු වීම.	මෙම යෝජිත ගිවිසුම චීනය හා ශ්‍රී ලංකාව අතර ද්විපාර්ශවික ගිවිසුමක් වන අතර දැනට මෙහි 07 වන සාකච්ඡා වටය දෙරට අතර එකඟතාවය මත ඉදිරියේදී පැවැත්වීමට අන්තර්ජාතික වෙළඳ කාර්යාලය (ITO) මගින් අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.	චීන -ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සාකච්ඡා මට්ටමේ පවතින අතර, 2024 ඔක්තෝබර් 22 දින වන විටත් ගිවිසුමට අත්සන් තබා නොමැත.

	2023 දෙසැම්බර් 31 දින වන විටත් සාකච්ඡා මට්ටමෙන් පවතින බව කිරික්ෂණය විය.				
04	දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 64 ක් වූ අතර, ද්විතියික මට්ටමේ තනතුරු 03 ක තනතුරු පුරප්පාඩු පිරවීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමට 2024 ජුනි 30 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.	2023	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධන කිරීමට කටයුතු කළ යුතු වීම.	පුරප්පාඩු තනතුරු නුදුරේදී පිරවීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි.	2024 වර්ෂය අවසන් වන විට අනුමත කාර්ය මණ්ඩලය 63 ක් වී තිබුණ අතර, ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 04 ක් පැවතුණි.

47. ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	78,963,516	78,963,516	78,963,516	තත්ත්වාගණනය නොකළ
2022	76,134,775	76,134,775	76,134,775	තත්ත්වාගණනය නොකළ
2023	73,653,928	73,653,928	73,653,928	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13 ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අරමුදල් 3 සම්බන්ධයෙන් කටයුතු අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	2023	දෙපාර්තමේන්තු වේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම.	ජාතික උද්භිද උද්‍යාන අරමුදල, ස්වාධීන ආයතනයක් ලෙස නැවත ස්ථාපිත කිරීම සඳහා ඉල්ලීම් ලිපි වරින් වර ඉදිරිපත් වී ඇතත් එළඹි අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු බව දැන්වීම, වාහන වායු විමෝචන නිරීක්ෂණ, භාරකාර අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත්කිරීම, නැවත ස්වයං රැකියා වක්‍රීය අරමුදල වසා දැමීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත.	ජාතික උද්භිද උද්‍යාන භාර අරමුදල හා වාහන වායු විමෝචන භාර අරමුදල සම්බන්ධ කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි.
02	දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 80 ක් වූ අතර, ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටම තනතුරු 11 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද ඇතුළුව තනතුරු 19 ක් පුරප්පාඩුව පැවතුණි.	2023	පුරප්පාඩු පිරවීමට හෝ උචිත පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය.	මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ නිවැරදිය.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක් ද ද්විතීක මට්ටමේ පුරප්පාඩු 18 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 05 ක්ද වශයෙන් 2024 දෙසැම්බර් 05 දින වන විට පුරප්පාඩුව පැවතුණි.

48. ශීර්ෂය - 246 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	7,121,320,771	1,102,695,443	(754,787,833)	තත්ත්වාගණනය කළ
2022	11,685,087,396	903,019,202	(570,821,878)	තත්ත්වාගණනය කළ
2023	14,819,001,594	705,375,369	(402,468,526)	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	RAMIS පද්ධතියෙහි ක්‍රියාත්මක වන Appeal හා Objection යන මොඩියුල තුල පවතින View Appeal හා View Objection Record යන උප මොඩියුල සඳහා ප්‍රවේශ වීමට විගණන කාර්යය මණ්ඩලයට ප්‍රවේශ අවසර ලබා දී නොතිබීම හේතුවෙන් හා RAMIS පද්ධතියෙහි Report මොඩියුලය මඟින් ජනනය වන Appeal Registration, Time Bar Report, Settled Appeal Report, Objection Registration, Settled Objection Report හා Unsettled Objection Report යන වාර්තාවලට අදාළ යාවත්කාලීන කරන ලද තොරතුරු පද්ධතිය තුළින් ලබා ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	2023	ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා ට හෝ ඔහුගේ අධිකාරිය ලත් තැනැත්තෙකු ඉල්ලා සිටින ලේඛනයක් හෝ වාර්තාවක් නියමිත කාලය තුල ඉදිරිපත් නොකිරීම වරදක් වන බව දක්වා ඇත.	විගණකාධිපතිවරයාට සහාය දැක්වීම පැහැර හැරීමක් සිදුකර නොමැති අතර, අවශ්‍ය සහාය ලබා දීමට නිරන්තරයෙන් කටයුතු කරනු ලබන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
02	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිංගප්පූරුවේ ආයතනය සමඟ එළඹී ඇති ගිවිසුම්වල වෙනත් තෙවන පාර්ශ්වය සඳහා ගිවිසුම් ලබාදිය නොහැකි බවට කොන්දේසි ඇතුලත් කර ඇති හෙයින් එම ගිවිසුම් විගණකාධිපති වෙත ලබාදී නොමැති බැවින් RAMIS පද්ධතියට අදාල 2014 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා රු.14,429,237,244 ක මුදල් ගෙවීම්	2023	ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා ට හෝ ඔහුගේ අධිකාරිය ලත් තැනැත්තෙකු ඉල්ලා සිටින ලේඛනයක් හෝ වාර්තාවක් නියමිත කාලය තුල ඉදිරිපත් නොකිරීම	ගිවිසුමේ කොන්දේසි අනුව වෙනත් තුන්වන පාර්ශවයක් සමඟ RAMIS පද්ධතියට අදාළ ලියකියවිලි හෝ තොරතුරු හුවමාරු කරගැනීම සඳහා සිංගප්පූරු සමාගමේ ලිඛිත අවසරය ලැබී නොමැති බැවින්, එසේ ලබාදීම ගිවිසුම්	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	හා එහි ප්‍රගතියට අදාළ ගිවිසුම් ප්‍රකාරව සිදුවී ඇතිද යන්න විගණනයේදී තහවුරු කළ නොහැකි වී ඇත.		වරදක් වන බව දක්වා ඇත.	කොන්දේසි උල්ලංඝණය කිරීමක් විය හැකි බැවින්, ජාතික විගණන කාර්යාලය වෙත අදාළ තොරතුරු ලබා දීමට ඇති හැකියාව සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ මතය විමසීම සඳහා නැවත 2024 අගෝස්තු 27 දිනැතිව ලිපියක් යොමු කර ඇති බව.	
03	RAMIS පරිගණක පද්ධතියට අදාළව, 2023 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොළී වටිනාකම වන රු. 856,852,673,726 න් සියයට 84 ක් එනම්, රු. 718,383,567,358 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටු වූ බදු, දඩ හා පොළී ලෙසත්, රු. 138,469,106,368 ක් එනම් සියයට 16 ක් අය කර ගත හැකි හිඟ බදු හා දඩ ලෙසත් හඳුනා ගෙන තිබුණි.	2023	අදාල බදු පනත්වල දැක්වෙන සියළුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර සියළුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය.	හිඟ බදු අය කිරීම, අත්හිටුවීමට හඳුනාගත් වලංගු හේතු මත සිදු කරන අතර එම අත්හිටුවීමට හේතු වූ කරුණු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව හිඟ බදු අය කර ගැනීම සිදු කරනු ලබයි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
04	Legacy පරිගණක පද්ධතියට අනුව, 2023 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ බදු, දඩ හා පොළී වටිනාකම වන රු.209,936,351,219 න් රු. 159,645,625,333 ක් එනම්, සියයට 76 ක් අය කිරීම් තාවකාලිකව අත්හිටු වූ බදු, දඩ හා පොළී ලෙස හඳුනා ගෙන තිබුණි.	2023	අදාල බදු පනත්වල දැක්වෙන සියළුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර සියළුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය.	හිඟ බදු අය කිරීම, අත්හිටුවීමට හඳුනාගත් වලංගු හේතු මත සිදු කරන අතර එම අත්හිටුවීමට හේතු වූ කරුණු නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව හිඟ බදු අය කර ගැනීම සිදු කරනු ලබයි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
05	2014 අංක 14 පනතින් සංශෝධිත 2010 අංක 16 දරන පැහැර හරින ලද බදු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ 2009 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා ස්ථාපිත DTRU අංශයට 2015 දෙසැම්බර් 31 දින රු.48,812,991,690ක් හිඟ බදු හා දඩ ලෙස මාරු කර ඇති අතර 2023 දෙසැම්බර් 31 දින වන විට	2023	අදාල බදු පනත්වල දැක්වෙන සියළුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර සියළුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය.	2023 වර්ෂයේ DTRU අංශයේ හිඟ බදු අඩුවීම - මුදලින් හා වෙනත් ආකාරයන් පිළිබඳ සාරාංශයන් මගින් ඉදිරිපත් කරමින් විගණනයට කරුණු දක්වා තිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	රු.22,072,303,229ක් දක්වා එනම්, රු.26,740,688,461ක හිඟ බදු හා දඩ මුදල් පමණක් නිරවුල් කර තිබුණි. තවද හිඟ බදු අයකිරීම් තුල සත්‍ය වශයෙන්ම මුදලින් අය වූ ප්‍රමාණය සියයට 18 ක් වූ අතර නිවැරදි කිරීම් හා මුදල් පනත යටතේ කපා හැරීම් සියයට 82 ක් බව නිරීක්ෂණය විය.				
06	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය අනුව ආර්ථික සේවා ගාස්තු, ජාතික ආරක්ෂණ බදු සේවා, පිරිවැටුම් බදු, ණය ආපසු ගෙවීමේ බද්ද හා ස්වෙච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බදු වලට අදාළ ආදායම් රැස් කිරීම හා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව අය කරන ලද හිඟ ආදායම් සමාන විය යුතු වුවත්, ඒවා අතර රු. 2,454,770, 780 ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	අදාල බදු පනත්වල දැක්වෙන සියළුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර සියළුම හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතු අතර නිවැරදිව ගිණුම්ගත කල යුතු බව.	එක් එක් අංශ අතර, ලිපිගොනු මාරුවීම නිසා මේ පිළිබඳ සවිස්තරාත්මකව විස්තර ලබා ගැනීමට අපහසු වූ අතර මින් ඉදිරියට එවැනි දෝෂ ඇති නොවීමට අදාළ කටයුතු කරන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
07	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව කිසිඳු අයකර ගැනීමක් නොමැතිව 10.02.07.00 මුද්දර බදු ආදායම් ශීර්ෂය යටතේ රු.14,599,086 ක් හා 10.02.08.00 හර බදු ආදායම් ශීර්ෂය යටතේ රු. 2,215,581,368 ක ශේෂයක් ද 2019 වර්ෂයේ සිට පවතින බව නිරීක්ෂණය විය.	2023	අදාළ බදු පනත්වල දැක්වෙන සියළුම විධිවිධානයන්ට යටත්ව හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය.	මෙම හිඟ ආදායම් බදු සම්බන්ධයෙන් මේ වන විට නඩු විභාග වෙමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
08	2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව 2023 දෙසැම්බර් 31 දිනට ණය ආපසු ගෙවීමේ බද්ද රු 1,692,235,124 හා පොලී ආදායමේ හිඟ බදු ශේෂයන් වූ රු 6,016,947,091, ඉකුත් වර්ෂයට සාපේක්ෂව වැඩි වී ඇති අතර වර්ෂය තුළ කිසිඳු අයකර ගැනීමක්ද සිදු වී නොමැති අතර ඉන් පොලී	2023	අදාළ බදු පනත්වල දැක්වෙන සියළුම අය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර හිඟ බදු හා දඩ ශේෂ කඩිනමින් අයකිරීමට පියවර ගත යුතුය.	මේ අනුව හිඟ බදු වල වැඩි වීමක් පෙන්නුම් කර ඇත්තේ 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ රු. 530,235,731.82 ක වටිනාකමකින් යුතු තක්සේරු නිකුත් කර ඇති බැවින් බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	ආදායම් ශීර්ෂය යටතේද පෙර වර්ෂයේදී ද කිසිඳු අයකරගැනීමක් නොමැති මුත් විශාල ප්‍රමාණයක (37% ක් පමණ) හිඟ බදු කපා හැරීමක් 2022 වර්ෂයේ සිදු කර ඇති බවද නිරීක්ෂණය විය.				
09	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් කාර්ය සාධනය මැනිම සඳහා යොදාගන්නා ප්‍රධාන මිනුම් ඒකකයක් වන ආදායම් ඉලක්ක ළඟා කර ගැනීමේ කාර්ය සාධන මිනුම, මෙසේ වර්ෂ අවසාන විමට දින 13 ක් තිබියදි ආදායම් ඇස්තමේන්තුව සියයට 15.7 කින් අඩු කිරීම හා එසේ අඩුකරන ලද ප්‍රතිශෝධන ආදායම් ඇස්තමේන්තුව හා 2023 දෙසැම්බර් 31 දිනට ඇති තත්‍ය ආදායම සමඟ සසදා ආදායම් ඉලක්ක සපුරා ගැනිම සියයට 100 ඉක්මවා ළගා කර ගෙන ඇති බව දක්වා තිබිම මඟින් මෙම ඇස්තමේන්තු සකස් කිරීම සඳහා තොරතුරු ලබාදීමේ සිට ඇස්තමේන්තුගත ඉලක්ක ළඟා කර ගැනිම දක්වා පිහිටුවා ඇති ක්‍රමවේදයන් පිළිබඳව විගණනයේදි සැහිමකට පත්විය නොහැකි බව නිරීක්ෂණය කෙරේ.	2023	වාර්ෂික ආදායම් ඉලක්ක නිවැරදිව ස්ථාපනය කිරීම හා ඒවා ලඟාකර ගැනීමට කටයුතු කල යුතුය.	2023 වර්ෂයට අදාළව සංශෝධිත ඇස්තමේන්තුවක් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව මඟින් සකස් කර එම සංශෝධනය මුදල් අමාත්‍යාංශය මඟින් 2023 දෙසැම්බර් 14 දින ඉදිරිපත් කර ඇත. මුල් ඇස්තමේන්තු සකස් කිරීම හා සංශෝධිත ඇස්තමේන්තු සකස් කිරීම මුදල් අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද අතර ඒ අනුව ආදායම් රැස් කිරිමේ කාර්යය දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අතර සංශෝධිත ඇස්තමේන්නතුව සමඟ සැසඳීමේදී දෙපාර්තමේන්තුව 104% කින් ආදායම් ඉලක්ක ලඟා කරගෙන ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
10	මූලික ආදායම් ඇස්තුමේන්තුව තුල අපේක්ෂිත ඍජු බදු ආදායම සියයට 44ක් හා වක්‍ර බදු ආදායම සියයට 56 ක්ද, සංශෝධිත ඇස්තුමේන්තුව මඟින් එම අගයන් පිළිවෙලින් සියයට 49 ක් හා සියයට 51 ක් ද සත්‍ය ආදායම් රැස්කිරීම අනුව එම අගයයන් සියයට 50:50 වි තිබුණු අතර රාජ්‍ය බදු කරණය වඩා සාධාරණ හා යුක්ති සහගත විමට	2023	ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ ඉලක්ක ලගාකර ගැනීමට කටයුතු කළ යුතුය.	රටේ පවත්නා බදු ප්‍රතිපත්තිය පදනම් කර ගනිමින් වාර්ෂික ආදායම් ඇස්තමේන්තු සකසා දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන්නේ මුදල් අමාත්‍යාංශය විසින් බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	නම් ඍජු හා වක්‍ර බදු වල සංයුතිය වඩා යෝග්‍ය මිශ්‍රණයක් ලෙස 60:40 මට්ටමට ලගාකර ගැනීම කෙරෙහි ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදනයෙන් ඉලක්ක කෙරෙන අතර රජයේ ආදායම් බදු රැස්කරන්නා ලෙස දේශිය ආදායම් දෙපාර්තමේන්තුව එම බදු මිශ්‍රණ කරා ලගා වීමට තවදුරටත් ක්‍රියාකල යුතුව පැවතුණි.				
11	දෙපාර්තමේන්තුව විසින් 2016 ජනවාරි මස සිට 2020 ඔක්තෝබර් දක්වා වර්ෂ 04 ක පද්ධති නඩත්තු සේවා කටයුතු සඳහා සිංගප්පූරු ඩොලර් 5,880,313 (රු.725,882,619) පිරිවැයක් ද නැවත 2021 ජනවාරි 31 දක්වා මාස 03 කින් කොන්ත්‍රාත් ගිවිසුම දිර්ඝ කිරීම වෙනුවෙන් සිංගප්පූරු ඩොලර් 309,824 ක් (රු. 46,826,053) දරා තිබුණු අතර 2021 පෙබරවාරි 01 දින සිට 2024 ජනවාරි 31 දක්වා වසර 03 කට සිංගප්පූරු ඩොලර් 21,053,371 කට (රු.බි. 3.1 ක් පමණ) නඩත්තු සේවා කොන්ත්‍රාත්තුව සිංගප්පූරු සහයෝගිතා ආයතනයේ උප කොන්ත්‍රාත් කරුවකු වෙත ලබා දී තිබුණි. 2024 ජනවාරි වන විටත් පද්ධතිය භාර ගැනීමට කාර්යය මණ්ඩලය බදවා ගැනීමේ ප්‍රමාදය හේතුවෙන් තවත් අවුරුදු 03ක කාලයක් සඳහා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024 අප්‍රේල් 29 දින ලබාදී තිබූ අතර ඒ සඳහා රු. බිලියන 07ක වියදමක් දැරීමට සිදු වේ.	2023	RAMIS පද්ධතියේ නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුවට භාර ගැනිමට කඩිනමින් ක්‍රියා කළ යුතුය.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව 2024 පෙබරවාරි සිට 2027 ජනවාරි දක්වා වසර 3 කින් දීර්ඝ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024 අප්‍රේල් 29 දින ලබාදී ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
12	RAMIS පද්ධතිය ක්‍රියාත්මක වීමේ දී ඇති වන ගැටළු සඳහා RAMIS පද්ධතියෙහි යම් යම් වෙනස්කම් සිදු කරනු ලබන බවත්, මේ සඳහා සිංගප්පූරු ආයතනයට එම වෙනස්කම් සිදු කිරීමට ගත වන මිනිස් දිනක් සඳහා සිංගප්පූරු	2023	රජයට අවම පිරිවැයක් ඇතිවන පරිදි මනා අවබෝධයකින් කටයුතු කළයුතු අතර පද්ධතිය නඩත්තුව භාර	RAMIS පද්ධතිය සම්බන්ධ මොඩියුල බදු ප්‍රතිපත්තිවල සිදුකරන වෙනස්වීම් වලට අනුරූපව යාවත්කාලීන කිරීම් සිදු කළ යුතු වීම සාමාන්‍ය වන බවත්	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	ඩොලර් 1,333 ක් එනම් දල වශයෙන් රු.291,000 ක් වැය වන බවත්, එම මුදල නව ගිවිසුම යටතේ සිංගප්පූරු ඩොලර් 1,400 වන දල වශයෙන් රු.305,200 ලෙස වැඩිකර ඇති අතර ඒ අනුව එම ආයතනයට මොඩියුල සංවර්ධනය කිරීමට ගෙවන ඉහත දක්වා ඇති පිරිවැයට අමතරව, මෙසේ සිදු කළ වෙනස්කම් සඳහා 2022 වර්ෂයේ විටින් විට රු.71,723,662 ක් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවකදී නිරීක්ෂණය විය.		ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.	මෙම බදු ප්‍රතිපත්ති වෙනස් කිරීම් සම්බන්ධව පූර්ව අවශ්‍යතාවයන් ලබාගැනීම අසීරු බැවින් පද්ධතිය සංවර්ධනය කරන අවස්ථාවේ දී ඒ සඳහා පහසුකම් සැලසීම කළ නොහැකි බවය.	
13	RAMIS 2.0 යටතේ, තක්සේරු වාර්තා නිකුත් කිරීමේ මොඩියුලය සංවර්ධනය නොවීම හේතුවෙන් 2022 මැයි 31 දිනට කාල කඩඉමට යටත්වන 2018/2019 තක්සේරු වර්ෂයට අදාළව වූ අතිරේක ආදායම් බදු තක්සේරු වාර්තා RAMIS පද්ධතිය තුළට ඇතුළත් කිරීම සඳහා මාර්ගෝපදේශ 2024 අප්‍රේල් 10 දින නිකුත් කර ඇති අතර ඒ අනුව 2018/2019 වර්ෂය සඳහා RAMIS පද්ධතියට ඇතුළත් කළ යුතු තක්සේරු වාර්තා ප්‍රමාණය 2,979 ක් බව ලබාදී ඇති තොරතුරු මත නිරූපණය වේ. තවද , පද්ධතියේ එම වර්ෂයේ මොඩියුලය පමණක් නිමකර ඇති නිසාත් 2019/2020 වර්ෂයේ සිට 2021/2022 වර්ෂය දක්වා පිළිවෙළින් 4,489 ක්, 3,460 ක් හා 758 ක් වාර්තා පද්ධතිය තුළට ඇතුලත් කිරීම සඳහා එම එක් එක් තක්සේරු වර්ෂ සඳහා අදාළ තක්සේරු මොඩියුලය සංවර්ධනය නොවීම මත RAMIS පද්ධතියේ පරිබාහිර වූ තාවකාලික පද්ධතියක පවතින බව තවදුරටත් නිරීක්ෂණය විය. මේ හේතු කොට ගෙන පද්ධතිය හරහා නිලධාරීන් වෙත වැඩ අයිතම පැවරීමට නොහැකි වී ඇති බව ද නිරීක්ෂණය විය.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය.	විකල්ප පද්ධතිය මගින් දැනට නිකුත් කරන ලද තක්සේරු වාර්තා RAMIS පද්ධතිය සමඟ යාවත්කාලීන කිරීම් සිදුකරමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

14	ආයතන 28 ක් **RAMIS** පද්ධතියට සම්බන්ධ කිරීම අදියර 4 ක් යටතේ සිදු කිරීමටත් එහිදී, දැනටමත් ශ්‍රී ලංකා රේගුව, මහජන බැංකුව, ලංකා බැංකුව, මුදල් අමාත්‍යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ලංකා ක්ලියර් පුද්ගලික සමාගම, යන ආයතන 06 සම්බන්ධ කර ඇති නමුත්, ඉතිරි ආයතන විවිධ ගැටළු පැවතීම හේතුවෙන් මෙතෙක් සම්බන්ධ කළ නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.	2023	පවතින ගැටළු නිරාකරණය කර සම්බන්ධ වී නොමැති ආයතන කඩිනමින් RAMIS පද්ධතිය සම්බන්ධ කරගත යුතුය.	මේ වනවිට අවශ්‍ය යටිතල පහසුකම් සපුරා ඇති මහජන බැංකුව, ලංකා බැංකුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය, රේගු දෙපාර්තමේන්තුව, ලංකා ක්ලියර් පුද්ගලික සමාගම **RAMIS** පද්ධතිය හා මේ වනවිටත් සම්බන්ධ කර ඇති බවත්, අනෙකුත් ආයතන **RAMIS** පද්ධතිය සමඟ සම්බන්ධ කර ගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සපුරාගෙන නොමැති අතර ඒ සම්බන්ධයෙන් අදාළ ආයතන ද දැනුවත් කර ඇති බවත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර සාධක මේ සඳහා බලපා ඇති බවත්.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
15	RAMIS පද්ධතිය සම්බන්ධව වැඩිදුර සාකච්ඡා කිරීම සඳහා 2024 ජනවාරි 24 දින පාර්ලිමේන්තුවේ පැවති ක්‍රම හා විධි පිළිබඳ කාරක සභා වාරයේදී සිදු කරනු ලැබූ නිර්දේශයන්හි ඇතුළත් පරිදි වෙනම සේවයක් යටතේ තොරතුරු තාක්ෂණ නිලධාරීන් බඳවා ගෙන RAMIS පද්ධතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු බව සඳහන් වුවත් ඒ සම්බන්ධව සාධනීය පියවරක් ගෙන ඇති බවට තොරතුරු විගණනයට වාර්තා කර නොමැති අතර RAMIS පද්ධතිය භාර ගැනීමේදී අවම වශයෙන් පරිසනක තාක්ෂණ 50 ක නිලධාරීන් පිරිසක්	2023	**RAMIS** පද්ධතියේ නඩත්තු කටයුතු භාරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	RAMIS පද්ධතිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන නිලධාරීන් සංඛ්‍යාවත් ඔවුන්ගේ සුදුසුකම් හා අවශ්‍ය වන පළපුරුද්ද සහිත විස්තරාත්මක ලේඛණයක් මේ වන විට NCS ආයතනය වෙතින් ලබාගැනීමට කටයුතු කර ඇති බවත් ඒ සඳහා අවශ්‍යවන අනෙකුත් යටිතල පහසුකම් හා දෘඩාංග අවශ්‍යතා ඇතුළත් කරමින් RAMIS	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සිටිය යුතු බව අනුමාන කළ හැකි බවත් මෙම ප්‍රමාණය ගිවිසුම අනුව වෙනස් විය හැකි බවත්, තවදුරටත් තොරතුරු අසම්පූර්ණයෙන් ලැබී ඇති නිසා විගණනයට තහවුරු කළ නොහැකි වී ඇති බවද නිරීක්ෂණය කෙරේ.			පද්ධතිය භාරගැනීමේ සවිස්තරාත්මක සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමින් පවතින අතර, අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කරමින් ඊට අදාළ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව.	
16	RAMIS ව්‍යාපෘතියෙහි විෂය පථයට අදාළ කාර්යයන් ආවරණය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයෙන් 77 දෙනෙකු 2023 දෙසැම්බර් 31 දක්වා තාවකාලිකව අනුයුක්ත කර ඇති වුවත් 2024 පෙබරවාරි 16 දින MF1/02/17/IRD/33 දරන මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කළ ලිපිය අනුව 2024 දෙසැම්බර් 31 දක්වා අනුමත කාර්යය මණ්ඩලය 60 ක් දක්වා අඩු කර ඇති බව නිරීක්ෂණය විය.	2023	**RAMIS** පද්ධතියේ නඩත්තු කටයුතු භාරගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.	ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 77 ක් 2023 දෙසැම්බර් 31 දින වනවිට සේවය කරන ලද අතර, මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක MF/02/17/IRD/33 හා 2024 මාර්තු 04 දිනැති ලිපිය මගින් එම කාර්ය මණ්ඩලය 60 ක් දක්වා සීමා කරන ලෙස දන්වා ඇති බවත් එම කාර්ය මණ්ඩලය පවත්නා කටයුතු ඉටුකිරීමට ප්‍රමාණවත් නොවන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
17	**RAMIS** ව්‍යාපෘතිය යටතේ සිංගප්පූරු ආයතනය මගින් ක්‍රියාත්මක වූ ඇමතුම් මධ්‍යස්ථාන සේවාව **(call Center)** දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත පවරාගෙන වර්ෂයකට රු.**33,844,000**ක වැට් රහිත මුදලක් ගෙවීමට යටත්ව **2021** අප්‍රේල් **01** දින සිට **2023** මැයි **31** දින දක්වා වූ වර්ෂ **02**කට වැඩි කාලයක් සඳහා පුද්ගලික ආයතනයක් යටතේ පවත්වාගෙන යනු ලැබූ අතර නැවතත් **2023** ජූනි **01** සිට **2025** මාර්තු **31** දින දක්වා වසරකට රු.**38,350,000** ක වැට් රහිත මුදලකට අදාළ කොන්ත්‍රාත්තුව දිර්ඝ කිරීමට මුදල්	2023	රජයට අවම පිරිවැයක් වන පරිදි ව්‍යාපෘතිය මෙහෙයවීම කළමනාකරණයේ වගකීම වේ.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යනු ලබන ඇමතුම් මධ්‍යස්ථාන සේවාව සුවිශේෂී සේවාවක් බැවින් නිශ්චිත ගාස්තුවක් මත සුදුසුකම්ලත් ආයතනයක් මගින් එම කාර්යය ඉටුකර ගැනීම සිදුකරනු ලබන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී තිබිණ. මෙම ඇමතුම් මධ්‍යස්ථාන සේවාව පවත්වා ගෙන යාම සඳහා දෙපාර්තුමේන්තුව සතුව භෞතික හා මානව සම්පත් නොමැති වීම මත මෙම කොන්තාත්තුව දීර්ඝ කිරීමට සිදු වී ඇති අතර මෙම ඇමතුම් මධ්‍යස්ථාන සේවාව සඳහා 2024 පෙබරවාරි 28 දක්වා රු.96,450,500 ක් ගෙවා ඇති බවද මෙම සේවා දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට කටයුතු නොකිරීම නිසා මෙම අතිරේක වියදම් දැරීමට සිදු වන බවද නිරීක්ෂණය විය.				
18	දෙපාර්තමේන්තුව සතු ගිණුම්ගත වටිනාකම රු.24,890,000 ක් වූ වාහන 7 ක් 2020, 2021 හා 2022 වර්ෂයන් වල සිට නිෂ්ක්‍රියව පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන තුල 2023 දෙසැම්බර් 31 දිනට වාහන ලෙස දක්වා ඇති රු.320,307,150 ක් වූ වත්කම් වල වටිනාකම තුල ඉහත නිශ්ක්‍රියව පවතින වාහනවල වටිනාකමද විය.	2023	වාහන නිශ්ක්‍රීයව පැවතිමට හේතු සොයාබලා කඩිනම් ක්‍රියාමාර්ග ගතයුතු බව.	2023 වාහන සමීක්ෂණ වාර්තාව අනුව 42-7793 හා 52-8295 වාහන අපහරණය සඳහා කටයුතු සිදු කරමින්ද අනෙක් වාහන 06 අළුත්වැඩියාවන් සඳහා යොමු කර ඇති අතර මෙම වාහන 08 තවමත් දෙපාර්තමේන්තුව සතුව පවතින බැවින් ඒවායේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කරන ලද බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
19	අවස්ථා 05 කදී සිදුවූ වාහන හා උපකරණ අනතුරු සම්බන්ධයෙන්, රු. 8,851,886 ක මුදලක් මුදල් රෙගුලාසි 103 (1) (ඊ) හා (ඔ) ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීම හෝ කපා හැරීම සිදු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීම හෝ කපා හැරීම සිදු කල යුතු බව.	අලාභයන් ප්‍රතිපූර්ණයන් හා අවසන් පරීක්ෂණ මණ්ඩල තීරණ ලැබී නොමැති බැවින් අයකිරීම් සඳහා යොමු වී නොමැති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
20	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 126 වගන්තිය ප්‍රකාරව බදු ගෙවීමට ඇති සෑම තැනැත්තෙකු විසින්ම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලබන යම් ආකෘතියකට අනුව නියමිත	2023	2017 අංක 17 දරන දේශීය ආදායම් පනතෙහි 126 වගන්තිය ප්‍රකාරව බදු වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කල	බදුගෙවන්නන් 22 දෙනෙකු අතරින් බදුගෙවන්නන් 15 දෙනෙකු විසින් වාර්තා ඉදිරිපත් කර නොතිබූ වර්ෂයන් සඳහා බදු	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	තොරතුරු ඇතුලත් බදු වාර්තාවක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍යය මගින් නියමිත කාලය තුල ඉදිරිපත් කල යුතු බව දක්වා තිබුණද, නියැදියක් පරීක්ෂාවේදී බදුකරුවන් 22 දෙනෙකු වෙත බදු වාර්තා ආකෘතිපත්‍ර යවා තිබුණද, ඔවුන් විසින් 2020/21 හා 2021/22 යන වර්ෂයන් සඳහා නියමිත කාලය තුළ එසේ බදු වාර්තා ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.		යුතුය.	වාර්තා ඉදිරිපත් කර ඇති බව.	
21	දේශීය ආදායම් බදු පනතේ 152 වගන්තිය ප්‍රකාරව කොමසාරිස් ජනරාල්වරයා විසින්, බදු අය විය යුතු සහ ගෙවීමට නියමිත දිනයේදී බදු නොගෙවා ඇති විටදී ගෙවීම කරන ලෙස ඉල්ලා සිටිමින් බදු ගෙවන්නා වෙත දැන්වීමක් යැවිය හැකි බව දක්වා ඇතත් නියැදියක් පරීක්ෂාවේදී 2020/21 සහ 2021/22 වර්ෂයන් සඳහා ආයතන 34 කින් රු. 1,357,272,031 ක හිඟ බදු මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් නිසි පියවර ගෙන නොමැති බව RAMIS පද්ධතිය අනුව නිරීක්ෂණය විය.	2023	හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය	2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 152 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ඇති අතර, බදුකරුවන් වෙත අදාළ දැන්වීම් නිකුත් කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
22	දේශීය ආදායම් බදු පනතේ 157 වගන්තිය ප්‍රකාරව නියමිත දිනයට අදාළ බදු ප්‍රමාණය නොගෙවා ඇත්තේ නම්, ගෙවන්නා ගෙවීමට නියමිත දිනයේ සිට බදු ගෙවන දිනය දක්වා කාලපරිච්ඡේදය සඳහා එම ප්‍රමාණය මත පොළියක් ගෙවීමට යටත් විය යුතු බව දක්වා ඇතත් නියැදි පරීක්ෂණය සිදු කල ආයතන 06 ක් විසින් රු. 260,994,191 ක බදු ප්‍රමාණයක් නියමිත දිනට පසුව ගෙවා ඇතත්, ඒ සඳහා පනතේ 159 වගන්තිය ප්‍රකාරව මාසිකව ගණනය කරනු ලබන මාසයකට හෝ ඉන් කොටසක් සඳහා සියයට 1.5 බැගින් වූ රු. 14,183,365 ක පොලී මුදලක් අය කර ගෙන නොමැති බව	2023	2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ වගන්තිය ප්‍රකාරව පොලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 157 වගන්තිය ප්‍රකාරව කටයුතු කර ඇති අතර, පොලී මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් බදුකරුවන් වෙත දැන්වීම් නිකුත් කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

නිරීක්ෂණය විය.

23	බදු අභියාචනා රෙජිස්ටරයෙහි Received යටතේ ඇතුළත් බදු ගෙවන්නා විසින් සිදු කළ ඉල්ලීම, වලංගු අභියාචනයක් බවට හඳුනාගෙන නොමැති බදු අභියාචනා 2,192 කට අදාළ මතභේදකාරී බදු මුදල රු. 7,415,062,005 ක් 2017 වර්ෂයේ සිට බදු අභියාචනා රෙජිස්ටරයේ ඇතුළත්ව ඇති අතර, විගණිත වර්ෂය වන විට උපරිමය වර්ෂ 06 ක් ඉක්මවා ගොස් තිබිණ.	2023	පනත් ප්‍රකාරව කටයුතු කරමින් අභියාචනා කාලීනව විසඳීමට කටයුතු කළ යුතුය.	අභියාචනා බේරුම්කරන ක්‍රියාවලිය සම්බන්ද උක්ත තොරතුරු විමසුමට අදාළව අතපසුවීමකින් වැරදි තොරතුරු ඇතුළත් වාර්තාවක් ලබාදී ඇති බව දන්වන ලද අතර අංක EAQ/2024/28/06-02 යටතේ 2024 අගෝස්තු 28 දිනැති පිළිතුරු ලිපියට අනුව 2024 ජුලි 16 වන විට Received අයිතමය යටතේ සඳහන් අභියාචනයක් ලෙස ලද, එහෙත් වලංගු අභියාචනයක් බවට හඳුනාගෙන නොමැති ප්‍රමාණය, 2017 සිට 2021 කාලසීමාවට අදාළව 81 ක් වන අතර එහි මතභේදකාරී බදු මුදල රු. 607,357,128 ක් බවට විගණනයට වාර්තා කර තිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
24	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සමාලෝචනය (CGIR Hearing) ආරම්භ කළ එහෙත් විගණිත දිනය වූ 2023 මැයි මස 25 වන දින වනවිටත් අභියාචනා විසඳීමේ ක්‍රියාවලිය තුළ පවතින වසර 02 සිට 05 දක්වා පැරණි විසඳීම අවසන් කර නොතිබුණු 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලැබී තිබුණු වටිනාකම රු. 65,934,233,430 වූ බදු අභියාචනා 794 ක් අභියාචනා රෙජිස්ටරයට අනුව බේරුම්කරණ ක්‍රියාවලිය තුළ පවතින බව විගණනයට නිරීක්ෂණය විය.	2023	පනත් ප්‍රකාරව කටයුතු කරමින් අභියාචනා කාලීනව විසඳීමට කටයුතු කළ යුතුය.	දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා මඟින් සමාලෝචනය ආරම්භ කළ එහෙත් අභියාචනා විසඳීම අවසන් කර නොතිබුණු 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ලැබී තිබුණු බදු අභියාචනාවලින් නොවිසඳුනු අභියාචනා 374 ක් වන අතර එහි මතභේදකාරී බදු මුදල රු. 77,873,323,792 ක්	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

				බවට විගණනයට වාර්තා කර තිබුණි.	
25	දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණු පරිපාලන සමාලෝචනයන්, ඊට අදාළ අභියාචනා කාල සීමාව ඇතුළත විසඳීමට කඩිනම් පියවර ගත යුතු වුවත් තවදුරටත් බේරුම්කරණ ක්‍රියාවලියේ විවිධ අදියරයන් තුළ පවතින (Pending), නිශ්චිත තීරණයක් නොමැති බදු අභියාචනා 958 ක් හා ඊට අදාළ වටිනාකම රු. 4,990,297,715 ක් වූ මතභේදකාරී බදු මුදලක් 2017 වර්ෂයේ සිට පවතින බවත්, එහි වසර 02 සිට 06 දක්වා පැරණි අභියාචනා තවදුරටත් අභියාචනා බේරුම්කරණ ක්‍රියාවලිය තුළ පවතින බවත් විගණනයට නිරීක්ෂණය විය.	2023	පනත් ප්‍රකාරව කටයුතු කරමින් අභියාචනා කාලීනව විසඳීමට කටයුතු කළ යුතුය.	2024 ජුලි 16 වන විට බේරුම්කරණ ක්‍රියාවලියේ විවිධ අදියරයන් තුළ තවදුරටත් පවතින, 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලසීමාවට අයත් නොවිසඳුණු බදු අභියාචනා 124 ක් වන අතර එහි මතභේදකාරී බදු මුදල රු. 987,920,117 ක් බවට විගණනයට වාර්තා කර තිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
26	අභියාචනා බොහෝමයක් ප්‍රාථමික තක්සේරුවේ වැඩ අවසන් කිරීමේ දී මතු වූ ගැටළු වන, පෙර වර්ෂයේ අලාභ තහවුරු නොවීම මත, ඉදිරියට ගෙන ආ හිලවු නොවූ බදු බැර, පෙර කාර්තුවේ ආපසු ගෙවීම්, වෙනත් කාල වලට බදු බැර තිබීම යනාදී නොයෙක් හේතු විසඳීම සඳහා නිකුත් කල තක්සේරු මත අභියාචනා මෙන්ම නිලධාරීන් විසින් අභියාචනා, විමසුම් ලෙස හඳුනාගත යුතු වුවත් වැරදි සහගත ලෙස අභියාචනා ලෙස ලියාපදිංචි කිරීමත් හා අභියාචනා විසඳීමේදී පද්ධතියේ ඇති ගැටළු මත ප්‍රායෝගිකව විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදු වීම හා පද්ධතියේ දත්ත යාවත්කාලීන නොවීම යනාදී විවිධ හේතු නිසා අභියාචනා බේරුම්කරණ ක්‍රියාවලිය ප්‍රමාද වී ඇති බව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් විගණනයට ප්‍රකාශ කර තිබුණි.	2023	පනත් ප්‍රකාරව කටයුතු කරමින් අභියාචනා කාලීනව විසඳීමට කටයුතු කළ යුතුය.	අභියාචනා විසඳීම ප්‍රමාද වීමට බලපා ඇති නොයෙක් හේතු පවතින බව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් විගණනයට දක්වා තිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

27	එක් වරක් පමණක් අය කල හැකි බද්දක් ලෙස 2022 වාර්ෂික අයවැය මඟින් හඳුන්වා දෙනු ලැබූ අධිභාර බද්ද , 2022 අංක 14 දරන අධිභාර බදු පනතේ 2 (1) (අ) වගන්තිය ප්‍රකාරව, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහසක් ඉක්මවනු ලබන යම් පුද්ගලයකුගේ, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක, බදු අයකළ හැකි ආදායම මත සියයට 25ක අනුප්‍රමාණයකින් අය කරනු ලැබිය හැකි පරිදි බලාත්මක කරන ලදී. කෙසේ වෙතත් අධිභාර බදු වලට අදාළ තොරතුරු RAMIS පද්ධතියට ඇතුළත් කර නොමැති අතර, එම බද්ද ගොනු ලෙස (Manual) පවත්වාගෙන ගොස් තිබිණි.	2023	බද්දට යටත්වන බදු කරුවන් නිවැරදි ලෙස හඳුනා ගැනීමට හා බදු වගකීම් නිසි ලෙස නිරූපනය වන පරිදි පද්ධතිය යාවත්කාලීනව පවත්වා ගැනීම, හිඟ බදු අයකර ගැනීමට නිසි පියවර ගැනීම කළමනාකරණයේ වගකීම වේ.	RAMIS පද්ධතිය තුළ අන්තර්ගත නොවුව ද, අධිභාර බද්ද සම්බන්ධ තොරතුරු නිවැරදිව හඳුනාගෙන ඇති අතර, තොරතුරු නිවැරදි ගිණුම් ගත කර ඇත. හිඟ බදු අය කර ගැනීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව .	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
28	අධිභාර බදු පනතේ 2(4) වගන්තිය අනුව මෙම පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම බදු ගෙවන්නෙකුම කොමසාරිස් ජනරාල්වරයා වෙත 2022 අප්‍රේල් මස විසි වන දිනයේ දී සහ 2022 ජූලි මස විසි වන දිනයේ දී හෝ ඒ දිනවලට පෙරාතුව සමාන වාරික දෙකකින් බද්ද ගෙවිය ලැබිය යුතු බව දක්වා තිබිණි. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් තොරතුරු පරීක්ෂා කිරීමේදී බදුකරුවන් 08 දෙනකු විසින් නියමිත දිනයේදී බදු මුදල් නොගෙවා ප්‍රමාද වී ගෙවා තිබූ බදු මුදලේ වටිනාකම රු. 2,692,889,914 ක් විය.	2023	අධිභාර බදු පනතේ 2(4) වගන්තිය ප්‍රකාරව නියමිත දිනයේදී බදු මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.	RAMIS පද්ධතිය තුළ අන්තර්ගත නොවුව ද, අධිභාර බද්ද සම්බන්ධ තොරතුරු නිවැරදිව හඳුනාගෙන ඇති අතර, තොරතුරු නිවැරදි ගිණුම් ගත කර ඇත. හිඟ බදු අය කර ගැනීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව .	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
29	දේශීය ආදායම් බදු පනතේ 157 හා 159 වගන්ති ප්‍රකාරව නියමිත දිනයට පසු බදු මුදල් ගෙවීම හේතුවෙන්, අයකරගත යුතු දඩ සහ පොළී මුදල් ගෙවන ලෙස දන්වා බදුකරුවන් 04 දෙනෙකු වෙත 2023 වර්ෂයේදී විටින් විට නිවේදන	2023	ප්‍රමාද වී බදු ගෙවීම හේතුවෙන් අයකර ගතයුතු දඩ හා පොලී මුදල් කඩිනමින් අය කරගත යුතුය.	දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අදාළ දඩ හා පොලී මුදල් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	නිකුත් කර ඇති අතර,ඊට අදාළ මුළු පොළී මුදල රු. 71,134,984 ක් හා දඩ මුදල රු. 82,239,024 ක් විය. මීට අමතරව තවත් එක් බදුකරුවකු වෙත අදාළ පොළී හා දඩ මුදල් ගෙවන ලෙස නිවේදන නිකුත් කර ඇති බව විගණනයට දන්වා ඇතත් ඊට අදාළ ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොමැත.				
30	උපයන විට බද්ද (PAYE) හා රඳවා ගැනීමේ බද්ද (WHT) බදු වර්ග වලට අදාළ ව තක්සේරු වර්ෂ 2018/2019 සිට 2021/2022 දක්වා අතිරේක තක්සේරු වාර්තා නිකුත් කිරීම ආදායම් පරිපාලන කලමනාකරණ තොරතුරු පද්ධතියෙන් පරිබාහිරව සිදු වී තිබිණ. ඒ හේතුවෙන් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය තුල බදුකරුවන්ගේ බදු වගකීම නිවැරදිව වාර්තා වී නොතිබුණි.	2023	තක්සේරු වාර්තා නිකුත් කළ හැකි පරිදි RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය.	අතිරේක තක්සේරු පද්ධතිගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
31	බදු සම්බන්ධ සියළු තොරතුරු පද්ධතියේ ඇතුළත් නොවීම හේතුවෙන් හිඟ බදු වාර්ථාවේ ශේෂයන් පද්ධතියේ ශේෂයන් සමඟ නිවැරදි නොවීම හා පද්ධතියේ පවතින නොයෙකුත් අඩුපාඩු මත නිලධාරීන් හට වැඩ අයිතම අවසන් කිරීමට නොහැකි බවට විටින් විට විගණන වාර්තා කර ඇති අවස්ථා නිරීක්ෂණය වීම.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු ය.	RAMIS 2.0 හි කටයුතු කඩිනමින් නිම කිරීමට බලාපොරොත්තු වන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
32	RAMIS ක්‍රියාත්මක කිරීමේ අදියර II යටතේ පද්ධතිගත කිරීමට අපේක්ෂා කරන ලද ඔට්ටු හා සූදු බද්ද මෙතෙක් පද්ධතිගත කර නොතිබුණි. යථෝක්ත ඔට්ටු හා සූදු බද්ද මගින් 2023 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රු. මිලියන 5,500 ක් වන අතර 2023 වර්ෂයේ සත්‍ය ආදායම රු. 7,421,816,561 ක්ද හිඟ බදු	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය වේ.	ඔට්ටු හා සූදු බදු පද්ධති ගත කිරීමේ අවශ්‍යතාව සලකා බලමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	වටිනාකම රු. 5,563,543,778 ක්ද විය. ඔට්ටු හා සූදු බදු පනත යටතේ ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව කැසිනෝ සඳහා 04 ක් හා අනෙකුත් ඔට්ටු හා සූදු ව්‍යාපාර 401 ක් විය.				
33	2005 අංක 5 දරන මුදල් පනත මඟින් හඳුන්වා දී ක්‍රියාත්මක කරන ලද, කොටස් තැරැව්කරු, හෝ කොටස් වෙළෙන්දා හෝ භාරකාර බැංකුව යන තෙවන පාර්ශවයක් විසින් අවස්ථාවෝචිත පරිදි එකතු කර දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරනු ලබන කොටස් ගණුදෙනු බද්ද RAMIS පද්ධතියට ඇතුළත් කර නොතිබුණි. අදාළ බද්ද මඟින් 2023 වර්ෂයේදී රු. 2,477,736,910 ක ආදායමක් උපයා තිබුණු අතර 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත බදු ආදායම රු. මිලියන 1,980 ක් විය.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය වේ.	එකඟ වන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
34	2015 දී විගමණ බද්ද සහ 2017 දී ප්‍රේෂණ ගාස්තු හඳුන්වා දී ඇති අතර, එම බදු හඳුන්වා දී මේ වන විට වසර 03 කටත් අධික කාලයක් ගත වී ඇතත් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය මඟින් බදු පරිපාලන කටයුතු සිදු නොවන අතර, නව බදු හඳුන්වා දීමත් ඒවා පද්ධතිගත කිරීමත් අතර දැඩි කාල ප්‍රමාදයක් ඇති බව නිරීක්ෂණය විය.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය වේ.	එකඟ වන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
35	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආදායම් පරිපාලන කලමනාකරණ තොරතුරු පද්ධති (RAMIS) සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට පෙර හඳුනාගත් ඇතැම් බදු වර්ග මෙන්ම, පද්ධති සංවර්ධන කටයුතු ආරම්භ කිරීමෙන් පසු කාලීනව හඳුන්වා දුන් බදු වලට අදාළ පරිපාලන කටයුතු මෙම පද්ධතිය මඟින් කාර්යක්ෂමව සිදු	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය බව.	පසුගිය වර්ෂවල පැවති COVID වසංගත තත්ත්වය, ආර්ථික අවපාතය සහ RAMIS ව්‍යාපෘතියට අදාළ ව ගිවිසුම්ගත නොවීම මත ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	නොවන බව නිරීක්ෂණය වේ.			කිරීමෙ කටයුතු තරමක් දුරට අඩාල වූ අතර, මේ වන විට ඒ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනු ලබන බව.	
36	TIN අංක 11401xxxx හි සංස්ථාපිත ආදායම් බදු (Corporate Income Tax) ගෙවීම සම්බන්ධයෙන් කරනු ලැබූ විස්තරාත්මක විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.				
	තක්සේරු වර්ෂ 2019/20,2021/22 හා 2022/23 තක්සේරු වර්ෂයන් සඳහා ස්වයං තක්සේරු වාර්තා/බදු වාර්තා (Tax Return) යථෝක්ත සමාගම විසින් ඉදිරිපත් කර ඇතැත් RAMIS පද්ධතිය තුල අවම වශයෙන් එම බදු වාර්තාවල සඳහන් බදු වගකීමවත්, ගෙවිය යුතු බදු ශේෂ ලෙස සඳහන් නොකිරීම හේතුවෙන් පද්ධතිය තුළ සමාගම නමින් එක් එක් කාලපරිච්ඡේදයන්ට අදාළව සාවද්‍ය බදු ආපසු ගෙවීමක් (Refund) වාර්තා වී තිබීමෙන් රජයට අයවිය යුතු බදු ආදායම් සම්බන්ධයෙන් දෝෂ සහගත වාර්තා වීමක් පවතින බව නිරීක්ෂණය විය.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ හා දෝෂ නිවැරදි කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතුය.	එකඟ වන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
37	2015/16 තක්සේරු වර්ෂය තුළ වර්ෂ අවසන් ගෙවිය යුතු සංස්ථාපිත ආදායම් බද්ද හා දඩ මුදල රු. 21,624,871 වූ අතර එම බදු මුදල විගණිත දිනය වූ 2024 මැයි 03 දින දක්වා ගෙවීමට සමාගම කටයුතු කර නොමැති අතර RAMIS පද්ධතිය තුළ තවදුරටත් ඊට අදාළ වැඩ අයිතම, වර්ෂ 08 කට අධික කාලයක් තිස්සේ විවෘතව පවතින බව නිරීක්ෂණය විය.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීම සහ දෝෂ නිවැරදි කිරීම කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය වේ.	1516 - රඳවා ගැනීමේ බදු ඉඩ නොදීම සම්බන්ධව බදු ගෙවන්නා විරෝධතා ගොනු කොට තිබූ අතර මේ පිළිබඳව කටයුතු අවසාන කිරීමෙන් පසුව දැනට RAMIS පද්ධතියේ පවතින දෝශයක් හේතුවෙන් අදාළ බදු බැර ඉඩ දීමට නොහැකිව පවතින බව හා මේ පිළිබඳව RAMIS අංශය සමග සාකච්ඡා කොට බදු	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

				බැර ඉඩ දීමෙන් පසුව වැඩ අයිතම අවසන් කිරීමට කටයුතු කරනු ඇති බව.	
38	2015/16 තක්සේරු වර්ෂය තුළ වර්ෂ අවසන් ගෙවිය යුතු සංස්ථාපිත ආදායම් බද්ද හා දඩ මුදල රු. 21,624,871 වූ අතර එම බදු මුදල විගණිත දිනය වූ 2024 මැයි 03 දින දක්වා ගෙවීමට සමාගම කටයුතු කර නොමැති අතර RAMIS පද්ධතිය තුළ තවදුරටත් ඊට අදාළ වැඩ අයිතම, වර්ෂ 08 කට අධික කාලයක් තිස්සේ විවෘතව පවතින බව නිරීක්ෂණය විය.	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීම සහ දෝෂ නිවැරදි කිරීම කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය වේ.	1516 - රඳවා ගැනීමේ බදු ඉඩ නොදීම සම්බන්ධව බදු ගෙවන්නා විරෝධතා ගොනු කොට තිබූ අතර මේ පිළිබඳව කටයුතු අවසාන කිරීමෙන් පසුව දැනට RAMIS පද්ධතියේ පවතින දෝශයක් හේතුවෙන් අදාළ බදු බැර ඉඩ දීමට නොහැකිව පවතින බව හා මේ පිළිබඳව RAMIS අංශය සමග සාකච්ඡා කොට බදු බැර ඉඩ දීමෙන් පසුව වැඩ අයිතම අවසන් කිරීමට කටයුතු කරනු ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
39	බදුකරුවන් දෙදෙනෙකු පද්ධතිය තුල දැනටමත් එකතු කල අගය මත බදු ගෙවීම සඳහා අංක 7000 යටතේ ලියාපදිංචිව සිටින ක්‍රියාකාරී බදුගෙවන්නන් වුවත්, නියැදි විගණනයට අනුව 2022 හා 2023 වර්ෂයන්හි පිළිවෙලින් CIF එකතු වටිනාකමින් රු . 270,297,115 ක හා රු. 175,177,269 ක සීනි ආනයනය කිරීමට TIN අංක 2525 යටතේ තාවකාලික ලියාපදිංචිය අංක නිකුත් කර තිබිණ. එසේ ක්‍රියාකාරී VAT බදු ක්‍රමය යටතේ ලියාපදිංචි වී සිටින බදුකරුවන් හට තාවකාලික ලියාපදිංචිය TIN අංක නිකුත් කිරීම මඟින්, ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති අභ්‍යන්තර පාලන ක්‍රමය නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවන බවට හා RAMIS පද්ධතිය මඟින් එවැනි ක්‍රියාකාරකම්	2023	දැනටමත් එකතු කල අගය මත බදු ගෙවීම සඳහා අංක 7000 යටතේ ස්ථිර ලියාපදිංචිව සිටින ක්‍රියාකාරී බදුගෙවන්නන් සඳහා තාවකාලික ලියාපදිංචිය අංක නිකුත් කිරීමට නොහැකි පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපනය කිරීම හා RAMIS පද්ධතිය මඟින් එවැනි ක්‍රියාකාරකම් ස්වයංක්‍රීයව අනාවරණය වන පරිදි පද්ධතිය සංවර්ධනය කිරීමේ	ඉහත ආයතන ස්ථිර ලෙස එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වී සක්‍රිය බදුගෙවන්නන් බවට පත් වන විට තාවකාලික ලියාපදිංචිය අනිවාර්යයෙන්ම අවලංගු කරනු ලබන අතර එබැවින් ඉන් පසුව තාවකාලික බදු සහතිකය මගින් භාණ්ඩ ආනයනය කළ නොහැකි වේ. එසේ ආනයනය කර තිබේ නම් එය දේශිය ආදායම් දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර අවස්ථාවක් වන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	ස්වයංක්‍රීයව අනාවරණය වී නොමැති බව නිරීක්ෂණය විය.		කටයුතු කළ යුතුය.		
40	තාවකාලික VAT ක්‍රමය යටතේ ආනයන සිදු කර ඇති සීනි ආනයනකරුවන් අතරින් නියැදි විගණනයට අනුව ආනයනකරුවන් 14 දෙනෙකු ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ඇතත්, 2022/23 තක්සේරු වර්ෂය සඳහා අදාළව 2023 නොවැම්බර් 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු ආදායම් බදු වාර්තා විගණිත දිනය වූ 2024 ජනවාරි 30 දක්වා ඉදිරිපත් කර නොතිබුණු අතර, ඔවුන් සියලුදෙනා විසින් 2022 හා 2023 වර්ෂයන්හි පිළිවෙලින් 2525 යටතේ ගෙන්වා ඇති සීනි ආනයනවල මුළු CIF වටිනාකම රු. 3,580,948,952 ක් හා රු. 8,661,150,315 ක් විය.	2023	එකතු කල අගය මත බදු සඳහා තාවකාලික ලියාපදිංචි බදු අංක යටතේ ලියාපදිංචි කිරීමේදී අදාළ ගෙවිය යුතු බදු ගෙවා ඇති බවට අදාළ බදු වාර්තා ලබාදී ඇති බවට සහතිකකර ගැනීමෙන් අනතුරුව තාවකාලික ලියාපදිංචිය අංක නිකුත් කිරීම.	ආනයන කරුවන් 14 දෙනකු විසින් ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය විගණනයට දක්වා තිබුණි.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
41	2024 වර්ෂයේ වාර්ෂික සුරාබදු බලපත්‍ර අළුත් කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ආදායම් නිෂ්කාශන සහතිකය ලබා ගැනීම අනිවාර්ය කර තිබූ කොන්දේසිය සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ඉවත් කිරීම හේතුවෙන් 2024 වර්ෂය සඳහා බලපත්‍රලාභීන් 443 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලය වෙතින් නිෂ්කාශන සහතික අයදුම් කර තිබූ නමුත් ඉන් බලපත්‍රලාභීන් 241 දෙනෙකු නිෂ්කාශන සහතික ලබා ගැනීමට ඉදිරිපත් වී නොමැත. එසේ නිශ්කාෂණ සහතික ලබා ගැනීමට ඉදිරිපත් වී නැති බදුකරුවන් 40 කගේ නියැදියක් පරීක්ෂා කිරීමේදී බදුකරුවන් 21 දෙනෙකු වෙතින් අය කර ගත යුතු රු. 187,644,815 ක හිඟ බදු ශේෂයක් ඇති බව 2023 ජූනි 30 දිනට හිඟ බදු ලේඛනය අනුව නිරීක්ෂණය විය.	2023	මත්පැන් බලපත්‍ර ලබා ගැනීම සඳහා බදු නිෂ්කාශන සහතික නිකුත් කිරීමේදී අදාළ ගෙවිය යුතු බදු ගෙවා ඇති බවට/ අදාළ බදු වාර්තා ලබාදී ඇති බවට සතුටුදායක සහතිකකර ගැනීමෙන් අනතුරුව මත්පැන් බලපත්‍ර ලබා ගැනීම සඳහා බදු නිෂ්කාශන සහතික නිකුත් කළ යුතුය.	මෙම නිෂ්කාශන සහතිකය 2023 නොවැම්බර් 20 දිනැති උපදෙස් මාලාවේ අංක 1,2 සහ 4 ඡේද වල සඳහන් උපදෙස් අනුගමනය කරමින් නිකුත් කර ඇති බව හා එම උපදෙස් මාලාවේ පිටපතක් සහ අදාළ තොරතුරු 2024 අප්‍රේල් 25 දිනැතිව ඉදිරිපත් කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

42	1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනතේ 2 වන වගන්තිය හා 2015 අංක 14 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනතින් කරන ලද සංශෝධනවලට අනුව සජීවී විකාශන පහසුකම් සහිත ඔට්ටු මධ්‍යස්ථාන විසින් තක්සේරු වර්ෂ 2014/2015 (2015 මාර්තු 31) දක්වා ගෙවිය යුතු වාර්ෂික බද්ද රු.300,000ක් හා තක්සේරු වර්ෂ 2015/2016 (2015 අප්‍රේල් 01) සිට ගෙවිය යුතු වාර්ෂික බද්ද රු.600,000 ක් වන අතර 2023 අප්‍රේල් 01 දින සිට එය රු.1,000,000ක් දක්වා වැඩි කර ඇති අතර එම බද්ද තක්සේරු වර්ෂය තුල සමාන වාරික 4කින් හා අදාළ වාරිකය කාර්තුව ආරම්භ වීමට පෙර ගෙවිය යුතු අතර 2023 තක්සේරු වර්ෂය සඳහා ලියාපදිංචි බදුගෙවන්නන් විසින් රු. 103,450,000 ක් වටිනා වාර්ෂික බදු මුදල් පමණක් ගෙවා නොතිබුණු බව නිරීක්ෂණය විය.	2023	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු බදු මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	අදාළ හිඟ බදු මුදලින් එක් බදු ගෙවන්නෙකුගේ හිඟ බදු මුදල සහ 50 % දඩ මුදල වශයෙන් රු.525,000/- මුදලක් අය කරගෙන ඇති අතර, ඉතිරි බදු මුදල් අයකර ගැනීම සඳහා පනත් ප්‍රකාරව කටයුතු කරමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
43	1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනතෙහි 2 (1) වන වගන්තිය හා 2001 අංක 07 දරන ඔට්ටු හා සූදු බදු පනතේ සංශෝධනයන්ට අනුව සජීවී විකාශන පහසුකම් සහිත ඔට්ටු මධ්‍යස්ථාන විසින් වාර්ෂික බද්දට අදාළ වාරිකය කාර්තුව ආරම්භ වීමට පෙර ගෙවිය යුතු වුවද දැනටමත් ගෙවා අවසන් වාර්ෂික බදු නියමිත පරිදි අදාළ දිනයන් වලදී ගෙවා නොමැති අතර ප්‍රමාද වී ගෙවීම් පවතින බවත්එම ප්‍රමාද වී වාර්ෂික බදු ගෙවීම් සම්බන්ධව නියම කළ හැකි දණ්ඩන ප්‍රමාණය විගණිත දිනය වූ 2023 මාර්තු 31 දක්වා ආසන්න වශයෙන් රු. 103,100,000 ක් පමණ වන බව විගණනයේදී සිදු කළ ගණනය කිරීම් අනුව නිරීක්ෂණය විය.	2023	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු හිඟ බදු දඩ මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	පනත් ප්‍රකාරව කටයුතු කරමින් බදු කරුවන්ගෙන් ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

44	සජීවී විකාශන පහසුකම් සහිත ඔට්ටු මධ්‍යස්ථානවලට අදාළ ව 2014 වර්ෂයේ සිට නොගෙවූ වාර්ෂික බදු හා ප්‍රමාද වී සිදු කළ ගෙවීම් සම්බන්ධව නිකුත් වී ඇති තක්සේරු පිළිබඳ පරීක්ෂාවේ දී මේ වන තෙක් අය කර නොගෙන පවතින බදු හා දඩ මුදල් රු.206,200,000 ක් බව නිරීක්ෂණය විය.	2023	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු හිඟ බදු හා දඩ මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	පනත් ප්‍රකාරව කටයුතු කරමින් බදු කරුවන්ගෙන් ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
45	2014/2015 වර්ෂවල සිට 2022/2023 වර්ෂය දක්වා ව්‍යාපාර 03 හිම ඇතැම් කාලපරිච්ඡේද සඳහා මාසික දළ එකතුව මත ගෙවිය යුතු බද්ද නියමිත පරිදි අදාළ දිනයන්ට පෙර ගෙවා නොතිබුණු අතර ඒ අනුව එකිනෙක වර්ෂ සඳහා සජීවී විකාශන පහසුකම් සහිත ඔට්ටු මධ්‍යස්ථානවල ප්‍රමාද වී දළ එකතුව මත බදු ගෙවීම් සම්බන්ධව තවමත් අයවීමට පවතින දණ්ඩන ප්‍රමාණය ආසන්න වශයෙන් රු.1,679,339,966 ක් පමණ වන බව නිරීක්ෂණය විය.	2023	බදු කරුවන්ගෙන් අයවිය යුතු ඉතිරි හිඟ බදු හා දඩ මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	2014/2015, 2015/2016 තක්සේරු වර්ෂ වලට අදාළ හිඟ බදු සම්බන්ධයෙන් බදුකරු විසින් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
46	2014 වර්ෂයේ සිට සජීවී විකාශන පහසුකම් සහිත ඔට්ටු මධ්‍යස්ථානවල නොගෙවූ මාසික දළ එකතුව මත ගෙවිය යුතු බදු හා ප්‍රමාද වී සිදු කළ ගෙවීම් සම්බන්ධව මේ වන තෙක් නිකුත් වී ඇති තක්සේරු සම්බන්ධව අය කර නොගෙන පවතින මාසික දළ එකතුව මත බදු හා දඩ මුදල් රු.2,621,108,150 ක් පමණ වේ.	2023	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු ඉතිරි හිඟ බදු සහ දඩ මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.	මෙම හිඟ බදු මුදල් සඳහාද අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
47	ආදායම් පරිපාලන කළමණාකරන තොරතුරු පද්ධතිය තුල ඔට්ටු හා සූදු බද්දට අදාළ මොඩියුල සංවර්ධනය කර නොමැති බැවින් ඉහත බදුකරුවන්ගේ ආදායම් වාර්තා, බදු ගෙවීම්, තක්සේරු නිකුත් කිරීම්, ප්‍රගතිය හා සියලුම බදු පරිපාලන කටයුතු ලිපිගොනු	2023	RAMIS 2.0 මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනමින් නිම කළ යුතු අතර සියලු බදු වර්ග පද්ධතිගත කිරීම වඩා යෝග්‍ය වේ.	ඔට්ටු හා සූදු බදු බදු වර්ගය RAMIS පද්ධතියට ඇතුලත් කිරීම සඳහා දැනුවත් ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	මැනුවල් ක්‍රමයට පවත්වා ගෙන යාම හරහා සිදු කරන බැවින් තොරතුරුවල නිරවද්‍යතාවය ලිපිගොනු තුළින් ලබා දුන් තොරතුරු මත පදනම්ව විගණන කටයුතු තහවුරු කිරීමට සිදු වූ අතර බදු නිලධාරීන්ගේ පරිපාලනමය වැඩ අවම කිරීම සඳහා හා බදු අනුකූලතාවය එලදායී ලෙස සිදු කිරීම හා තොරතුරු නිවැරදිව හා යාවත්කාලීනව ලබා ගැනීමට නොහැකි වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.				
48	දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට අදාළව 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටටමේ පුරප්පාඩු 289 ක්ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 28 ක්ද ද්විතියික මට්ටමේ පුරප්පාඩු 84 ක්ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 105 ක්ද වශයෙන් පුරප්පාඩු 506 ක් පැවතුණි. ඊට සමගාමීව 2020 , 2021 හා 2022 වර්ෂ වලදී පුරප්පාඩු සංඛ්‍යාව පිළිවෙලින් 320ක්, 387ක් හා 437 ක් වී තිබුණි. මේ අනුව දෙපාර්තමේන්තුවේ සේවක පුරප්පාඩු සංඛ්‍යාව වර්ෂ ගණනාවක් පුරා ක්‍රමිකව වර්ධනය වීමක් පෙන්නුම්කර තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට එය සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 17.6 ක් විය.	2023	දෙපාර්තමේන්තු පුරප්පාඩු තනතුරු සඳහා අත්‍යවශ්‍ය කාර්යය මණ්ඩලය බඳවා ගැනීමට සහ අත්‍යවශ්‍ය පුරප්පාඩු තනතුරු සටහන් කිරීමට කටයුතු කල යුතුය.	එකඟ වන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
49	RAMIS පද්ධතියේ අදියර 2.0 ට අදාල මූලික හඳුනාගැනීමෙන් බැහැරව ඉටු කිරීමට නියමිත අතිරේක අවශ්‍යතා ඇතුළත් ලියවිල්ලෙහි පිටපතක් හා එකී අවශ්‍යතාවල ප්‍රගතිය විගණනයට වාර්තා නොවීම හේතුවෙන් එම අදියරෙහි මූලික හඳුනා ගැනීම්වලින් බැහැරව කරන ලද ගෙවීම්වල නිවැරදිතාවය විගණනයට පරීක්ෂා කළ නොහැකි විය.	2022	ජාතික විගණන පනතේ 42 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා ට හෝ ඔහුගේ අධිකාරිය ලත් තැනැත්තෙකු ඉල්ලා සිටින ලේඛනයක් හෝ වාර්තාවක් නියමිත කාලය තුල ඉදිරිපත් නොකිරීම වරදක් වන බව දක්වා ඇත.	පිළිතුරු ලබා දී නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

50	RAMIS ව්‍යාපෘතිය ස්ථාපනය සඳහා යොදවා ඇති කාර්යය මණ්ඩල වියදම RAMIS පද්ධතිය ස්ථාපිත කිරීම වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන ව්‍යාපෘති කාර්යාලයේ 2021 ගෙවීම් පිළිබඳ නියැදි පරීක්ෂාවට අනුව නිලධාරීන් 71 වෙත මාසිකව දළ වශයෙන් රු. 2,557,512 බැගින් මුදලක් ගෙවා තිබුණු අතර, 2020 වර්ෂයේ ඔක්තෝබර් සිට 2021 වර්ෂයේ ඔක්තෝබර් දක්වා කාල පරිච්ඡේදයට අදාළව RAMIS ව්‍යාපෘති කාර්යය මණ්ඩලය සඳහා රු.44,114,059 ක් ගෙවීම් කර තිබුණි. තවද, මෙම ව්‍යාපෘති කාර්යය මණ්ඩලය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු වල නිරත වන අතරතුරදී මෙම ව්‍යාපෘතියෙහි කටයුතු සඳහා තම සේවා දායකත්වය ලබා දීම සිදු කරනු ලැබීමෙන් 2014 සිට 2022 වර්ෂය දක්වා ආසන්න වශයෙන් වසර 10කට ආසන්න කාලසීමාවක් නිත්‍ය රාජකාරී කටයුතු වලට බාධාවක් විය හැකි බවත්, ව්‍යාපෘතිය අප්‍රමාදීව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් භාර නොගැනීම දෙපාර්තමේන්තු සමස්ථ කාර්යක්ෂමතාවයට අහිතකර බලපෑම් ඇතිවිය හැකි බවත් නිරීක්ෂණය විය.	2022	අතිරේඛ පාරිශ්‍රමිකයක් ගෙවීමේදී සාමාන්‍ය රාජකාරි කාලයෙන් පරිභාහිරව සේවයේ යෙදෙන බවට සහතික කර ගැනීම කලමනාකරණයේ වගකීම බව	පිළිතුරු ලබා දී නොමැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
51	1988 අංක 40 දරන ඔට්ටු හා සූදු බදු පනතේ 2 වන වගන්තිය හා 2015 අංක 14 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත අනුව කැසිනෝ ව්‍යාපාර පවත්වාගෙන යන්නන් විසින් රුපියල් මිලියන 200 වාර්ෂික බද්දක් ගෙවියයුතු වුවත් කැසිනෝ ව්‍යාපාර දෙකක් විසින් රු. 300,000,000 ක් වටිනා වාර්ෂික බදු මුදල් ගෙවා නොතිබුණි.	2022	අදාල බදුකරුවන්ගෙන් අයවියයුතු බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	එක් ව්‍යාපාරයක් අදාළ කාල පරිච්ඡේදය තුල ව්‍යාපාර කටයුතු සිදුකර නොමැති බවත් දෙවන ව්‍යාපාරයෙන් තවදුරටත් රු.මි.300ක් අයවිය යුතු මුදල අයකර ගැනිමට කටයුතු කරමින් සිටින බව	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

52	දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් ඔට්ටු හා සූදු බදු ව්‍යාපාර සම්බන්ධයෙන් දෙපාර්තුමේන්තු ආකෘති පත්‍ර ප්‍රකාරව අදාල කාර්තුවෙහි දළ ලැබීම් වාර්තා පමණක් ලබාගැනීම හා එම ලැබීම් වල නිවැරදිතාවය පරීක්ෂා කිරීමට හැකිවන පරිදි සුදුසු ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිතකර නොතිබීම හේතුවෙන් කැසිනෝ ව්‍යාපාර මත අය කළ යුතු දල එකතුව මත බද්ද නිවැරදිව අය වන බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.	2022	බදුකරු විසින් වාර්තා කරනු ලබන දල ලැබීම් හෝ පිරිවැටුම වෙනම ම හඳුනා ගැනීමට හැකිවන පරිදි සුදුසු ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිතකල යුතුය.	නව ආකෘතියක් යටතේ දළ එකතුව මත වාර්තා ලබාගැනීමට කටයුතු කර ඇති බව	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
53	2013 අංක 19 දරන ඔට්ටු හා සූදු බදු (සංශෝධන) පනත හා ඊට අදාල සංශෝධන අනුව දළ එකතුව පිළිබඳ වාර්තාව කාර්තුව අවසානයේ එළඹෙන මස 20 වන දිනට පෙර භාරදී එළඹෙන මස පළමුවන සතිය තුල ගෙවිය යුතුය. වාර්තා භාරදීමට අපොහොසත් වන්නේ නම් රු. 50,000 ක උපරිමයකට යටත් දඩයක් ද, නියමිත දිනට නොගෙවන අවස්ථාවලදී යථෝක්ත පනත හා 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත ප්‍රකාරව දණ්ඩන ද පැනවිය යුතුය. තක්සේරු වර්ෂ 2014/2015 වර්ෂවල සිට 2022/2023 දල එකතුව පිළිබඳ වාර්තා දේශීය ආදායම් දෙපාර්තුමේන්තුවට නියමිත දිනට භාර දී නොමැති අවස්ථාවලදී හා ගෙවිය යුතු බද්ද නියමිත දිනට නොගෙවීම මත අය කළ යුතු රු.342,281,284 ක් හිඟ දඩ හා ඊට අදාල පොලිය අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.	2022	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනිමට කටයුතු කල යුතුය.	2019 සිට 2021 වර්ෂය දක්වා වසංගත තත්වය හේතුවෙන් දළ වාර්තා නොලැබුණු බව හා ඒ සඳහා දණ්ඩන පැනවීමට කටයුතු නොකල බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
54	2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව 2015 ජනවාරි මස 01 වන දින හෝ ඉන් පසුව ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරය	2022	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු මුදල්	2023 පෙබරවාරි සිට ඇතුලත්වීමේ බද්ද අයකිරීමට කටයුතු කර ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	පවත්වා ගෙන යනු ලබන සෑම තැනැත්තකු විසින්ම එම සූදු ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන ස්ථානයට ඇතුල්වන සෑම තැනැත්තෙකුගෙන්ම ඇමරිකානු ඩොලර් 100 ක් හෝ පරිවර්තනය කල හැකි ඊට සමාන වෙනත් ව්‍යවහාර මුදලකින් හෝ ඊට සමාන ශ්‍රී ලංකා රුපියල් වලින් කැසිනෝ ඇතුලත්වීමේ බද්දක් අය කරනු ලැබිය යුතුය.මෙම බද්ද අයකිරීම 2016 - 2019 වර්ෂ දක්වා අහෝසිකර තිබුණ නමුත් නැවත 2019 වසරේ සිට කැසිනෝ ව්‍යාපාරික ස්ථානයට ඇතුලත්වන ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයකු හෝ පුරවැසියකුගෙන් ඇමරිකානු ඩොලර් 50 ක මුදලක් ලෙස අය කිරීමට යෝජනා කරන ලද නමුත් දෙපාර්තමේන්තුව විසින් මෙම බද්ධ අය කර ගැනීම සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.		කඩිනමින් අයකර ගැනිමට කටයුතු කළ යුතුය.		
55	2015 අංක 10 දරණ මුදල් පනතින් පනවා ඇති කැසිනෝ ව්‍යාපාර කර්මාන්ත අය බද්ද ව්‍යාපාරිකයන් විසින් වාරික වශයෙන් ගෙවීමට කටයුතු කර තිබුණද, කැසිනෝ ව්‍යාපාර දෙකක් වෙතින් තවදුරටත් යථෝක්ත බද්දට අදාලව රු. 2,380,000,000 ක් වටිනා හිඟ බදු අයවිය යුතුව තිබුණි.	2022	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදු කරුවන්ගෙන් අයවිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය.	හිඟ බදු අයකර ගැනීම සඳහා නීති කටයුතු සිදු කෙරෙමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
56	දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙහෙවර පියස කාර්යාලයේ 24 හා 25 මහල් සඳහා රු.2,851,725 (බදුරහිත)ක වටිනාකමකින් යුතු PABX පද්ධතියක් ස්ථාපනය කර තිබුණි. කෙසේ වෙතත්, මෙම කොන්ත්‍රාත් ගිවිසුමේ තාක්ෂණික පිරිවිතරයේ අයිතමයක් වන අන්තර් ශාඛා සම්බන්ධතාවය 2021 සැප්තැම්බර් 30 දින වන විටත් ලබා දීමට අපොහෙසත් වී තිබුණි.	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ප්‍රධාන කාර්යාලයේ එම පද්ධතිය සැපයූ කොන්ත්‍රාත්කරු වෙතින් ම මිලදී ගැනීම නිර්දේශ කරනුයේ තාක්ෂණික කරුණු සලකා බැලීමෙන් බවත් අන්තර් සම්බන්ධතා ගැටළුව ඇත්තේ පද්ධතියේ නොවන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

57	ගොඩනැඟිල්ල නවීකරණයේ දී දෙපාර්තමේන්තුව සපයා තිබුණු ට්‍රාන්ස්පෝමර් යන්ත්‍ර 02 ප්‍රධාන විදුලි පද්ධතියට සම්බන්ධ කර නොතිබිම නිසා එම යන්ත්‍ර 2010 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණි. රු.7,985,992ක පිරිවැයක් දරා දෙපාර්තමේන්තු ප්‍රධාන ගොඩනැඟිල්ලට සවි කල CCTV කැමරා පද්ධතිය ට අයත් කැමරා 70ක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින්, දෙපාර්තමේන්තුවට භාර දී නොතිබීම හේතුවෙන් වසර 01ක වගකීම් කාලයද ඉක්මවා වර්ෂ 12ක් ගත වී ඇතත් නිශ්ක්‍රීයව පැවතුණි. මේ හේතුවෙන් CCTV කැමරා පද්ධතියක් සවි කිරීමෙන් අපේක්ෂිත ආරක්ෂාව ලබා ගැනීමට අපොහොසත් වී තිබුණි.	2021	දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යයන් ඉටු කර ගැනීමට හැකි වන පරිදි වත්කම් පූර්ණ ලෙස උපයෝජනය කළ යුතුය.	නැවත මෙම පද්ධතිය ක්‍රියාකාරිත්වයට ගෙන ඒමට පද්ධතියේ දැනට භාවිතයට ගත හැකි උපාංගද උපයෝගී කර ගනිමින් ඉදිරියේදී CCTV කැමරා පද්ධතිය ක්‍රියාකාරිත්වයට ගෙන ඒමට කටයුතු කිරීමට නියමිත බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
58	2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව අතිරේඛ මත්පැන් බලපත්‍ර හා බෝතල් රා විකිණීමේ බලපත්‍ර මත මුද්දර බදු අය කළ යුතු වුවත් 2008 -2020 කාල පරිච්ඡේදය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකී පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු අතර නියැදි විගණන පරීක්ෂාවකට අනුව දිවයිනේ දිස්ත්‍රික්ක 07 කට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 66 ක් වෙතින් එකතු වටිනාකම රු. 67,917,000 ක් වූ හිඟ මුද්දර ගාස්තු තවදුරටත් අයකළ යුතුව තිබුණි.	2021	ව්‍යවස්ථාපිත නීති රීති අනුව පනවා ඇති බදු අය කර ගැනීම දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් අධිකරණමය ක්‍රියාමාර්ග 02ක් ගෙන ඇති අතර ඒවායේ තීරණ අනුව අයකිරීම් සිදු කරන බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
59	බදු ලිපිගොණු අංක 1240***** දරන සමාගම විසින් ඉදිරිපත් කර ඇති එකතුකල අගය මත බදු වාර්තා වලට අනුව ගෙවිය යුතු දිනට නොගෙවා ඇති එකතු කළ අගය මත බදු ප්‍රමාණය රු.2,843,923,139 ක් වූ අතර 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ	2021	පනත් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර බදුකරුගෙන් අයවිය යුතු බදු කඩිනමින් අයකර ගත යුතුය.	එකතු කළ අගය මත ගෙවීම පැහැර ඇති බදු අයකර ගැනීම සඳහා අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

	28(1)(ආ) වගන්තිය අනුව තක්සේරු වාර්තා නිකුත් කර හිඟ බදු අයකර ගැනීමට වර්ෂ 02 ට වඩා වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණි. තවද 2016 හතරවන කාර්තුවේ පළමු මාසයට අදාල ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ප්‍රමාණය නියමිත දිනට ගෙවීම් කර තිබිය දීත්, 2017 වර්ෂය සඳහා බදු නිෂ්කාශන සහතිකයක් ලබාදීමට කටයුතු කර තිබුණි.				
60	බදු ලිපිගොනු අංක 7704***** අදාලව 2016 ජනවාරි 01 සිට 2018 දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ එකතු කල අගය මත බදු සම්බන්ධ දෙවන බදු ඇස්තමේන්තුව රු.314,278,994ක් ලෙස තක්සේරු කර ඒ සම්බන්ධව 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 29 වන වගන්තියට අනුකූලව 2020 මැයි 18 දින බදු ගෙවන්නා දැනුවත් කර තිබූ නමුත් ඊට අදාළ තක්සේරු වාර්තාව 2021 දෙසැම්බර් 31 වන දින වන විටත් නිකුත් කර නොතිබුණි.	2021	අතිරේක බදු තක්සේරු නිකුත් කිරීම හා අභියාචනා විසඳීම පනත් මඟින් ලබා දී ඇති ප්‍රතිපාදන අනුව සිදු කල යුතුය.	බදු ගෙවන්නා බද්ද සඳහා එකඟ නොවීම මත යළි සම්මුඛ සාකච්ඡා සඳහා කැඳවීම හා ලැබී ඇති නිවැරදි තොරතුරු පදනම්ව නිවැරදිව බදු බැදියාව ගණනය කළ බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
61	TIN අංක 1141***** බදු ලිපිගොනුවට අදාළව තක්සේරු වර්ෂ 2014/15 සිට 2018/19 දක්වා නිකුත් නොකරන ලද තක්සේරු වාර්තා අනුව ආදායම් බදු, එකතු කළ අගය මත බදු හා ආර්ථික සේවා ගාස්තු වටිනාකම රු.25,179,056ක් වූ අතර ඒ සම්බන්ධව තක්සේරු වාර්තා නිකුත් කිරීම 2021 මාර්තු 23 දින වන විටත් සිදුකර නොතිබූ අතර එම කාලපරිච්ඡේදයටම අදාළ තක්සේරු නිකුත් කල නමුත් 2021 ජනවාරි 31 දිනට එකතු නොකල ආදායම් බදු, ජාතිය ගොඩනැඟීමේ බදු හා ආර්ථික සේවා ගාස්තු වටිනාකම් එකතුව රු.12,897,624ක් විය.	2021	නිසි කලට තක්සේරු වාර්තා නිකුත් කළ යුතු බව හා අයකර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය.	RAMIS පද්ධතිය තුළ වැඩ අයිතම නිර්මාණය වී නොතිබීම, සේවක සංඛ්‍යාව අවම වීම යන කරුණු මත ප්‍රමාද වූ බව හා විගණන විමසුම මත පදනම්ව අය ක්‍රියාමාර්ග ගන්නා බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

62	TIN අංක 1340***** බදු ලිපිගොනුවට අදාළව, ජාතිය ගොඩනැඟීමේ බද්දට සහ උපයන විට ගෙවීමේ බද්ද/ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දට අදාලව ගෙවිය යුතු බදු පිළිබඳ තොරතුරු RAMIS පද්ධතිය තුල යාවත්කාලීන කර නොමැති වීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට බදුකරු විසින් ගෙවූ බදු පිලිවෙලින් රු.91,247,399ක් සහ රු.57,085,410ක මුදල ආපසු ගෙවිය යුතු බදු (Refund) මුදලක් වශයෙන් පද්ධතියේ පැවති අතර ආදායම් බද්දට අදාළව රු.57,055,732ක හිඟ බදු හා දඩ ශේෂයක් ද නිරීක්ෂණය වීය.	2021	RAMIS පද්ධතිය නිසියාකාරව යාවත්කාලීන කිරීම හා බදු හා දඩ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	RAMIS පද්ධතිය යාවත්කාලීන නොවීම හේතුවෙන් අයවිය යුතු බදු මුදල් ශේෂයන් පෙන්වන අතර දඩ මුදල් කපා හැරීම සඳහා කටයුතු කරමින් පවතින බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.
63	2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ III පරිච්ඡේදයේ 07 වගන්තිය ප්‍රකාරව ආදායම් බදු නිදහස් ආයතන, 2017 අංක 24 දරන නව දේශීය ආදායම් පනතේ තුන් වන උපලේඛනයේ ඇති නිදහස් කළ මුදල් ප්‍රමාණයන්ට යටත්ව 2018 අප්‍රේල් 1 දින සිට බදු ගෙවීමට යටත් වන ආයතන මේ වන විටත් බදු ක්‍රමයට ලියාපදිංචි කරගෙන තිබේද යන්න දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතියේ තොරතුරු අනුව පරීක්ෂා කිරීමේ දී ආයතන 17ක් සඳහා ආදායම් බදු සඳහා ලියාපදිංචි වී තිබුණ ද විගණිත දිනය වන 2021 දෙසැම්බර් 31 වන තෙක් කිසිදු ආදායම් බදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. එම ආයතන බොහෝමයක් ලාභාංශ වලින් හා පොලී වලින් ලැබෙන ලාභ හෝ ආදායම මත හෝ අවුරුදු දහයකට වැඩි කාලයක් තිස්සේ කිසිදු ආදායම් බදු ගෙවීමක් සිදු කර නොමැති බවත්, තවත් ආයතන 19ක් සඳහා 2018 අප්‍රේල් 01 දින සිට ආදායම් බදු ගෙවීමට යටත් වුවද ආදායම් බදු සඳහා විගණිත දිනය	2021	දක්වා ඇති සියලු ආයතන සඳහා පනතේ විධිවිධානවලට යටත්ව ආදායම් බදු සඳහා ලිපිගොනු විවෘත කිරීම මෙන්ම බදු වාර්තා ගෙන්වා ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	ඉන් ආයතන 21ක ලිපිගොනු විවෘත කිරීමට කටයුතු කර ඇති බවත් ඉතිරි ආයතන 15 සඳහා විමසීම් කර තිබුණද තවම පිළිතුරු ලැබී නොමැති බව.	නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

වන 2021 දෙසැම්බර් 31 වන තෙක් ලියාපදිංචි වී නොමැති බවත් නිරීක්ෂණය විය.

49. ශීර්ෂය - 247 ශ්‍රී ලංකා රේගුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	14,472,485,013	25,943,363,967	(11,470,878,954)	තත්ත්වාගණනය කළ
2022	15,881,304,308	25,657,797,650	(9,776,493,342)	තත්ත්වාගණනය කළ
2023	16,072,269,511	32,648,073,740	(16,575,804,229)	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාදේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2021 වර්ෂයේදී ශ්‍රී ලංකා රේගුවේ නිලධාරීන් 2342 දෙනෙකු සඳහා වැටුප්, වේතන, අතිකාල, නිවාඩු දින වැටුප් හා දිරිදීමනා වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් රු.1,839,078,959 ක් ද, රේගු අතිකාල නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු හා තොරතුරු තාක්ෂණ සන්නිවේදන අරමුදල මගින් රු.1,086,992,639 ක්ද වශයෙන් එකතුව රු.2,926,071,598 ක් ගෙවා තිබුණු අතර එකී වියදම තහවුරු කිරීමේ සාක්ෂිය වන සේවයට වාර්තා කළ බව සනාථ කෙරෙන ඇඟිලි සළකුණු වාර්තා විගණනයට ඉදිරිපත් නොවුණි.	2021	(i) රජයේ පොදු විධාන හා රාජ්‍ය ගිණුම්කාරක සහා නියෝග පිළිපැදිම දැඩි ලෙස සැලකිල්ලට ගත යුතු බව. (ii) මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කළයුතු බව. (iii) සේවක කළමනාකරණය හා සම්බන්ධව පවතින සතුටුදායක නොවුණු අභ්‍යන්තර පාලනය විධිමත් කළයුතු බව.	දෙපාර්තමේන්තුවේ සේවක පැමිණීම 18 වන පොදු ආකෘතිය මඟින් සටහන් කරනු ලබන බවත් ඒ මත පදනම්ව අතිකාල ගණනය කරනු ලබන බවත් දන්වා තිබුණි. තවද, අතිකාල ගෙවීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා රේගුවේ සියලු නිලධාරීන් නියෝජනය වන සේ කමිටුවක් සකස් කර එම කමිටුවේ නිර්දේශ ලද පසු අතිකාල ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	රේගු නිලධාරීන්ගේ වෘත්තීය සංගම් විරෝධතාවයන් හේතුවෙන් 2024 ජූලි 22 දින වන විටත් ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොවුනු අතර එය භාවිතා කිරීම ප්‍රායෝගික නොවන බව මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ ලේකම්වරයා වෙත අවස්ථා කිහිපයකදීම දැනුම් දී ඇති බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විගණනය වෙත දැනුම් දී තිබුණි. රේගු නිලධාරීන්ට ඇඟිලි සටහන් තැබීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතින බව පැවසුව ද අතිකාල ලබා ගැනීම සඳහා “රේගු 221 ආකෘති පත්‍රයේ” නිලධාරියාගේ නම, තනතුර, දිනය, පැමිණි/පිටවූ වේලාව

					ආදී තොරතුරු රාශියක් දෛනිකව සටහන් කරන බව විගණනයට නිරීක්ෂණය විය.
02	හිඟ බදු ආදායම වාර්ෂිකව සමුච්චිත වෙමින් පවතින අතර 2021 ජනවාරි 01 දිනට රු.22,933,854,690 ක්ව පැවති හිඟ බදු වටිනාකම 2021 දෙසැම්බර් 31 දින වන විට රු.60,884,927,433 ක් දක්වා එනම්, සියයට 165 කින් පමණ වැඩිවී තිබුණි. 2016 ජනවාරි 01 දින සිට රාජ්‍ය ආයතන වෙත පසුව බදු අයකර ගැනීමේ පදනම මත ආනයන නිදහස් කිරීම නවතා තිබුණද, ඊට පටහැනිව ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව වෙත 2018 හා 2020 දී ආනයන නිදහස් කිරීම නිසා තෙල් පිරිපහදුව මත අයකරන නිෂ්පාදන බද්ද හා අනෙකුත් නිෂ්පාදන බද්ද හිඟව පවතින බව නිරීක්ෂණය විය. හිඟ බදු ආදායම 2020 වර්ෂයට සාපේක්ෂව සියයට 9 සිට සියයට 165 ක් දක්වා අහිතකර ලෙස වර්ධනයක් දක්නට ලදී.	2021	මුදල් රෙගුලාසි 128 හා රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ 01/2015 හි සඳහන් උපදෙස් පරිදි කටයුතු කළ යුතු බව.	විගණන නිරීක්ෂණ සමඟ එකඟ වී තිබුණි.	වාර්තා වී ඇති හිඟ ආදායම් වටිනාකම අයකර ගැනීම සඳහා අදාල අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත ලිපි යවා තිබුණි. පැරණි හිඟ බදු ආදායම්වලට අදාල තොරතුරු දෙපාර්තමේන්තුවෙන් සොයා ගැනීම අපහසු බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තා කර තිබුණි. කෙසේවුවද, 2023 දෙසැම්බර් 31 දිනට රු.58,478,974,134 ක් වූ සමස්ත හිඟ බදු ආදායමෙන් රු.57,709,049,189 ක් හෙවත් සියයට 99 ක් 2020 වර්ෂයට ද පෙර සිට පැවත එන හිඟ බදු ආදායම් විය.
03	1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලින්, ත්‍යාග වශයෙන් මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දිනැති අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝග සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව 1999 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා	2021	අමාත්‍යවරයාගේ අනුමැතිය දැක්වෙන ක්‍රමවේදය විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බව.	මෙම යෝජනා ක්‍රමය ගරු මුදල් අමාත්‍යවරයා විසින් අනිවාර්යයෙන්ම අනුමත කළ යුතුව තිබූ නමුත් එම අනුමැතිය මේ වන විට සොයාගත නොහැකි බව දන්වා තිබුණි.	මෙම වාර්තාවේ දිනය දක්වා ද අදාල දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	වර්ෂ 23 ක් තුළ ත්‍යාග මුදල් ලෙස රු.21,046,904,408 ක් ගෙවා තිබුණි.				
04	නැගෙනහිර පළාත් ජල සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් රජය විසින් ලබාදී ඇති ආධාරයක් මත ශ්‍රී ලංකා රජයේ මහා භාණ්ඩාගාරය විසින් එම ව්‍යාපෘතියට අවශ්‍ය DI පයිප්ප හා උපාංග ගෙන්වීමේ කාර්යය සඳහා ජාතික ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලය වෙත පවරා තිබුණි. ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඒ සඳහා අවශ්‍ය DI පයිප්ප හා උපාංග ලබා ගැනීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. ඒ සඳහා දරණ ලබන ඇ.ඩො. 6,659,685 ක මුදල JICA ආයතනයේ ලැබෙන ආධාරවලින් ද ප්‍රවාහන වියදම් හා බදු මුදල් ශ්‍රී ලංකා රජය විසින් ද දරනු ලබයි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.				
(i)	රේගු ආඥා පනතේ 72 වන වගන්තිය ප්‍රකාරව පළමු අවස්ථාවේදී බදු නොගෙවා භාණ්ඩ ගුදම් ගත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් පෞද්ගලික ආයතනයක් වෙත අවස්ථාව ලබාදී තිබූ අතර ඒ සඳහා රේගු සටහන්කර (Cusdec) 08 ක් නිකුත් කර තිබුණි. ඒ අනුව ඇ.ඩො. 5,139,621 ක භාණ්ඩ ගුදම් කර (To Bond) තිබුණි. රේගු ආඥා පනතේ 86 වන වගන්තිය අනුව භාණ්ඩ ගුදමෙන් නිදහස් කර ගැනීමේදී කලින් ප්‍රකාශ කරන ලද භාණ්ඩ තොගයේ ඉන්වොයිස් අගයම ප්‍රකාශ විය යුතු විය. එහෙත් දේශීයව සැකසූ ඉන්වොයිස් භාවිතා කර අදාල වටිනාකම මගින් ඇ.ඩො. 6,350,364 ක් ලෙස ව්‍යාජ තොරතුරු සහිත	2021	රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා වැඩිපුර ලබාගත් ප්‍රමාණයන් අයකර ගැනීමට හා ව්‍යාජ ලේඛන සැකසීමට විරුද්ධව නිසි පියවර ගත යුතු බව.	විමර්ශනය සිදු කරමින් පවතී. මූලික විමර්ශනයේ නිර්දේශ මත ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා තිබුණි.	2021 ජූලි 24 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් කමිටුවක් පත්කර තිබුණු අතර, වසර 2කට පමණ පසුව 2023 ජුනි 01 දින කමිටු නිර්දේශය ලබා දී තිබුණි. කමිටු නිර්දේශ පහත දැක්වෙන අතර සිද්ධියට සම්බන්ධ කිසිදු නිලධාරියෙකුට දඬුවම් නිර්දේශ කර නොතිබුණි. • දීර්ඝ කාලයක් පුරා පරිචයක් ලෙස ක්‍රියාත්මක කළ වැරදි ක්‍රමවේදයන් සඳහා එක් නිලධාරි

	ආනයන සටහන්කර ඉදිරිපත් කර තිබුණි. එමඟින් ඇ.ඩො. 1,210,743 ක වටිනාකමක් අදාල ආයතනයට වැඩිපුර ලබා ගැනීමට අවස්ථාව සැලසී තිබුණි.			කණ්ඩායමකට පමණක් විනයානුකූලව කටයුතු කිරීම සමානයන්ට අසමාන ආකාරයකින් සැලකීමක් බව. • සිද්ධියට සම්බන්ධ නිලධාරීන් විශ්‍රාම ගොස් ඇති බැවින් විනය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය නොවන බව. • භාණ්ඩ ගුදම්ගත කිරීම/ ගුදමෙන් ඉවත් කිරීමට අදාල උපදෙස් සහිත දෙපාර්තමේන්තු නියෝගයක් නිකුත් කිරීම. • රේගු නිලධාරීන්ට ගුදම්ගත කිරීම් පිළිබඳ විශේෂ පුහුණුවක් ලබාදීම. • ව්‍යාපෘතියෙන් රජයට යම් පාඩුවක් සිදුව ඇද්ද යන්න පිළිබඳ සොයා බැලීම සඳහා ජල සම්පාදන හා ජලප්‍රවාහ මණ්ඩලය හා එහි රේඛීය අමාත්‍යාංශයට දන්වා යැවීම.
(ii)	ව්‍යාජ ඉන්වොයිස් සැකසීම, 2021 ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර විදේශීය මෙන්ම දේශීය මුදල්ද ලබාගෙන තිබියදී මේ සම්බන්ධ විමර්ශන සිදු කරන ලද ශ්‍රී ලංකා රේගුව විසින් අදාල ආයතනය විසින් වරදක් කර නොමැති බව සලකා විමර්ශන අවසන් කර තිබුණු අතර එලෙස විමර්ශන	රේගු ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා විමර්ශන තීරණය නිවැරදි නොවන ලෙස ලබාදුන් පාර්ශවයන්ට එරෙහිව නිසි	පිළිතුරු ලබා දී නොතිබුණි.	-එම-

	තීරණය වැරදි ලෙස ලබා දුන් නිලධාරීන් සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගැනීම විගණනයේදී ප්‍රශ්ණගත කරුණක් විය.		ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතු බව.		
05	2016 වර්ෂයේ සිට ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීම (Build Own & Operate-BOO) යන ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ රැපිස් ස්කෑන් සිස්ටම් ප්‍රයිවට් ලිමිටඩ් නමැති සමාගමෙන් රේගුව සිය බහාළුම් පරිලෝකන කටයුතු සිදුකර ගෙන තිබුණු අතර 2021 වර්ෂයේදී එම සමාගමටම ඇ.ඩො. 21,590,008 ක් ගෙවා පද්ධතියේ පූර්ණ අයිතිය රේගුවට ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එවැනි විශාල මුදලක් ගෙවීමේදී විදේශ විනිමය අර්බුදය සැලකිල්ලට ගෙන නොතිබුණු අතර අදාල විදේශීය සමාගමින්ම එම පද්ධතිය මිලදී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබීම නිසා ප්‍රසම්පාදනයක් මගින් විවෘත වෙළඳපලේ තරඟකාරීත්වයට ඉඩ ලබා දෙමින් තාක්ෂණික ඇගයීමක් සිදු කර අවම පිරිවැයක් යටතේ ස්කෑන් යන්ත්‍ර මිලදී ගැනීමට තිබුණු අවස්ථාව අහිමි කර තිබුණි. තවද, රේගු නිශ්කාෂණ ක්‍රියාවලිය සඳහා පූර්ණ එක්ස්රේ පරිලෝකනයක් අපේක්ෂා කර තිබුණ ද එය ක්‍රියාත්මක නොවීම නිසා ප්‍රකාශිත භාණ්ඩ අයිතමයන් අතර සඟවා ඇති අයිතමයන් හඳුනා ගැනීම, ව්‍යාජ භාණ්ඩ ප්‍රකාශ කිරීම් සංඛ්‍යාව අඩු කිරීම, තහනම් හා නීතිවිරෝධී භාණ්ඩ ආනයනය අවම කිරීම යන අපේක්ෂිත සැලසුම්වලට ලඟාවීමට නොහැකි වී තිබුණි. තවද, 2019 නොවැම්බර් මස සිට 2021 සැප්තැම්බර් 30 දක්වා පමණක් නිශ්කාෂණය කරන ලද මුළු	2021	විදේශ විනිමය අර්බුදයක් පවතින අවස්ථාවක ගනුදෙනු සිදු කිරීමේදී ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු බව, ගනුදෙනු කිරීමේදී විනිවිදභාවයකින් යුක්තව කටයුතු කළ යුතු බව සහ වියදම් සිදු කිරීමේදී විචක්ෂණශීලිව, ප්‍රායෝගිකව හා ආර්ථික ලෙස වාසිදායක අයුරින් කටයුතු කළ යුතු බව.	ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමවේදය (BOO)යටතේ තෝරාගෙන ස්ථාපිත කර ඇති බහළුම් පරිලෝකන පද්ධතිය 2021 වසරේදී මිලදී ගැනීමට තීරණය කරන ලද්දේ මුදල් අමාත්‍යාංශයෙන් බව විගණනයට දැනුම් දී තිබුණි. තවද, රැපිස්කෑන් වෙත බහළුම් යොමු කරනුයේ අවදානම් කළමණාකරණ අංශය මගින් හඳුනා ගන්නා බහළුම් බවද එසේ යොමු කරන ලද සියළු බහළුම් ස්කෑන් කර ඇති බවද දැනුම් දී තිබුණි.	නිෂ්කාශණයට ඉදිරිපත් වන සියලුම බහාලුම් පරිලෝකනයට ළක් නොකරන බැවින් පරිලෝකන පද්ධතියට කෘතිම බුද්ධිය (Artificial Intelligence) සම්බන්ධ කරන ලෙස විගණනය විසින් වරින් වර පෙන්වා දුන්න ද මේ දක්වා එපරදි කටයුතු කර නොතිබුණි.

	බහාලුම්වලට සාපේක්ෂව පරිලෝකනය කර තිබුණු බහාලුම් සංඛ්‍යාව සියයට 08 ක පමණ අඩු ප්‍රමාණයක් වී තිබුණි.				
6 (i)	විමර්ශන කටයුතු අවසන්ව නැති ගාල් කර ඇති වාහන 336 ක් වෙනුවෙන් 2021 දෙසැම්බර් 07 දින වන විට රු.138,513,782 ක මුදලක් ශ්‍රී ලංකා රේගුව විසින් SALT ආයතනයට ගෙවිය යුතුව තිබූ අතර වාහන විමර්ශන කටයුතු අවසන් කිරීමේ ප්‍රගතිය මත ගෙවිය යුතුව තිබෙන මෙම මුදල ඉදිරියේදී තවදුරටත් වැඩිවිය හැකිව තිබුණි.	2021	අදාල විමර්ශණයන් විධිමත්ව කඩිනමින් අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව.	අංගනයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා මින් වාහන 39 ක රස පරීක්ෂක වාර්තා ලබා ගැනීම අපහසු වී තිබුණි. කෙසේවුවද, දැනට රස පරීක්ෂක වාර්තා ලබා ගෙන ඇති වාහනවලින් නීතිවිරෝධී ලෙස තෙරපන ලද වැසි හෝ නීතිවිරෝධී ලෙස එකලස් කරනු ලැබ ඇති බවට තහවුරු වූ වාහන 34 ක් කෝපා කමිටුවේ නිර්දේශ මත තාක්ෂණික අධ්‍යයන විෂයය සඳහා ද්විතීක හා තෘතීක අධ්‍යාපන ආයතනවලට ලබා දීමට අදාල කටයුතු සැලසුම් කර තිබුණි.	මේ වන විට ද පෞද්ගලික සමාගමකට මාසිකව රු.4,650,000ක කුලී මුදලක් ගෙවමින් තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දිනට අත් අඩංගුවට ගන්නා ලද වාහන 435ක් රඳවා තිබුණි. ඒවායින් වාහන 152 ක් වසර 5ට පෙර අත් අඩංගුවට ගත් ඒවා විය. මෙම වාහනවලට අදාලව මෙරටින් විනිමය වැයවීමක් සිදු වී තිබියදී දිගු කාලයක් ගාල් කර තැබීම හේතුවෙන් වාහන දිරාපත් වී ධාවනයට නුසුදුසු තත්ත්වයට පත්වීම සහ වෙන්දේසියකින් සාධාරණ මුදලක් ඉපයීමට නොහැකි තත්ත්වයක් ද පැන නැඟී තිබුණි.
(ii)	රේගුව සතුව ලිපිගොනු හෝ වාර්තා නොමැති වාහන 51 ක් වහලින් ආවරණය කර ඇති සහ ඉන් පිටත වාහන අංගනයේ ගාල් කර තිබුණි.	2021	මේ සම්බන්ධ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව.	ගොනු රහිත වාහන සම්බන්ධයෙන් සොයාගතහැකි තොරතුරු ආශ්‍රිතව නැවත ගොනු සාදා අවශ්‍ය කටයුතු කරන ලෙසත් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර මෙම වාහන අපහරණය සඳහා කටයුතු කිරීමටත් තීරණය කර තිබුණි.	2024 සැප්තැම්බර් 06 දින වන විට ලිපිගොනු හෝ වාර්තා නොමැති වාහන 136 ක් ඇති බවට හඳුනාගෙන තිබුණි.
07	රේගු ආඥා පනතේ 84 (අ) (3)	2022	රේගු ආඥා පනතේ	මෙම කරුණ පිළිබඳව ඉදිරි	2023 වර්ෂයේදී ද සමාගම් දෙකක්

	වගන්තිය අනුව බන්දිත ගුදම් (Manufacture in Bond – MIB) පහසුකම ලබාගත් යම්කිසි කර්මාන්තයකට අදාලව භාණ්ඩ දේශීය වෙළඳපොලට නිකුත් කිරීමේ දී ආනයන සේ සලකා තීරු බදු ගණන් බැලිය යුතු වුව ද, එවැනි සමාගම් 02 ක් අංක 1448/1 හා 2006 ජුනි 05 දිනැති කර්මාන්ත විෂයභාර අමාත්‍යවයා විසින් නිකුත් කරන ලද "දේශීයව සියයට 30 ට නොඅඩු අගයක් සහිත උපාංග යොදා ගනිමින් එකලස් කරන වාහන සඳහා ලබා දෙන සියයට 70 ක බදු සහනය" ලබා ගනිමින් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු. 7,191,949,084 ක නිෂ්පාදන බදු ගෙවීම පැහැර හැර තිබුණි.		විධිවිධානයන්ට අනුගත විය යුතු බව.	කටයුතු කිරීමට නීතිපති උපදෙස් ඉල්ලා ඇති බව දන්වා තිබුණි.	විසින් වාහන 326 ක් ගුදමේ එකලස් කර දේශීය වෙළඳපලට නිකුත් කර තිබුණු අතර එකලස් කරන ලද වාහන ගුදමින් මුදාහරින විට අය විය යුතු නිෂ්පාදන බද්ද රු.350,432,000 ක් වුවද රු.246,628,800 ක් පමණක් අයකර තිබීම නිසා රාජ්‍ය ආදායම රු.103,803,200 න් අඩු වී තිබුණි. මෙම වාර්තාවේ දිනය දක්වා නීතිපති උපදෙස් ලැබී නොතිබුණි.
08	පහත නිරීක්ෂණයට අදාලව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 102 සිට 110 ට අනුව කටයුතු කර නොතිබුණි. විදේශීය පුද්ගලික ආයතනයක් විසින් නැවකින් නැවකට භාණ්ඩ මාරු කිරීමේ ක්‍රමය යටතේ (Transshipment) සිංගප්පූරුවෙන් නැව්ගත කරනු ලැබූ දුම්වැටි තොගයක් ශ්‍රී ලංකා රේගුව විසින් අත්අඩංගුවට ගෙන විමර්ශනයක් සිදු කර තිබුණු අතර එහි තීන්දුව අනුව අදාල සිගරට් තොගය ප්‍රතිනැව්ගත කිරීමට අවසර ලබා දී තිබුණි. එසේ තිබියදී රේගුව විසින් මතභේදාත්මක ලෙස එම දුම්වැටි තොගය වෙන්දේසිකර විකුණා රු.5,901,750 ක මුදලක් උපයාගෙන තිබුණි. කෙසේවුවද, එම විකිණීමට එරෙහිව අදාල විදේශ ආයතනය	2022	මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධි විධානයන්ට අනුගත විය යුතු බව.	මූලික විමර්ශනය සඳහා 2023.10.07 දින ත්‍රී පුද්ගල කමිටුවක් පත් කර ඇත.	මූලික විමර්ශන කමිටු සභාපති විසින් මූලික විමර්ශනයේ වර්තමාන තත්ත්වය පිළිබඳව කරුණු දක්වමින් 2024.03.19 දින අතුරු වාර්තාවක් මඟින් ඉදිරිපත් කර ඇත. මේ සම්බන්ධයෙන් ඇති අධිකරණ කටයුතු පිළිබඳව ඇති නඩු වාර්තා ලද විගස විමර්ශන කටයුතු අවසන් කර, අවසන් වාර්තාව ලබා දෙන බව එහි දක්වා ඇත.

	නඩු පවරා තිබුණු අතර දිසා අධිකරණයෙන් රේගුව වැරදිකරු වී තිබුණි. එකී තීන්දුවට එරෙහිව රේගුව සිවිල් අභියාචනාධිකරණයේ හා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා තිබුණු නමුත් ඉන් ආනයනකරුට සිදුවූ අලාභය වෙනුවෙන් රු.37,529,749 ක්ද, නෛතික පොළිය ලෙස රු.63,464,121 ක්ද, නඩු ගාස්තුව ලෙස රු.190,000 ක්ද ගෙවීමට නියමව තිබුණි. නෛතික ගාස්තු රු.31,732,060 ක් දක්වා අඩු කිරීමට ආනයනකරු හෙවත් පැමිණිලිකාර පාර්ශවය එකගව තිබූ අතර ඒ අනුව රේගුවට මෙම වැරදි තීරණය මත ගෙවීමට සිදුවූ මුලු අලාභය රු.69,451,809ක් විය. මෙම විමර්ශනයට අදාළ ගොනුව අස්ථානගත වී ඇති බව විගණනයට 2022 සැප්තැම්බර් 22 දින රේගුව විසින් වාර්තා කර තිබුණු අතර එයට වගකිවයුතු නිලධාරින්ට සහ ඉහත වැරදි තීරණයට වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.				
09	නො.40, මෝගන් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 02 යන ස්ථානයේ රේගුවට අයත් භූමියක අනවසරයෙන් ඉදිකර තිබූ නිවාස 15 ක් සම්බන්ධව නීතිමය කටයුතු සිදුකර නොතිබුණි.	2022	අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිමය කටයුතු සිදුකළ යුතු බව.	අනවසර පදිංචි කරුවන් සම්බන්ධව තිරණය ගැනීම වසර ගණනක් තිස්සේ ලිපි මහින් විවිධ අවස්ථා වල බස්නාහිර පළාත් නියෝජ්‍ය පොලිස්පති වෙතත්, කොළඹ ප්‍රාදේශීය ලේකම් වෙතත් දැනුවත් කර තිබුණි.	මෙම වාර්තාවේ දිනය දක්වා ද අනවසර පදිංචි කරුවන් ඉන් ඉවත් කිරීමට නොහැකි වී තිබුණි.
10	2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා දෙපාර්තමේන්තුවේ අංශ (Directorate) 40 ට අදාලව රේගු විමර්ශන 9754 ක් පැවතුණු අතර, ඉන් ආදායම්	2022	විමර්ශන කඩිනමව අවසන් කිරීමට කටයුතු කළයුතු බව.	මෙතෙක් අවසන් කර නොමැති රේගු විමර්ශන කඩිනමින් අවසන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ	2023 දෙසැම්බර් 31 දින වන විට රේගුවේ විවිධ අංශ විසින් සිදුකරන රේගු විමර්ශන 8450 ක් පැවතුණි. ඉන්

	අධීක්ෂණ ඒකකයට (RTF) අදාළව විමර්ශන 3199 ක් ද, නිවාරණ අංශයට (Preventive) අදාළව විමර්ශන 1593 ක් ද, මධ්‍යම විමර්ශන අංශයට අදාළව විමර්ශන 738 ක් ද, අනෙකුත් අංශ 37ට අදාලව විමර්ශන 4224ක් ද විය. 2022 වර්ෂය අවසාන දිනට සමස්ත විමර්ශන සංඛ්‍යාවෙන් වසර 05 ට වඩා පැරණි 3582 ක්ද, වසර 1 ත් 5 ත් අතර 4720 ක්ද, වසරක් ඇතුළත වූ විමර්ශන 1452 ක් ද විය.			නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇති බව දන්වා තිබුණි.	විමර්ශන 3080 ක් වසර 05කට වඩා ද, විමර්ශන 4348 ක් වසර 02 සිට වසර 04ක් දක්වා ද, විමර්ශන 1022 ක් වසරක් තුළද වශයෙන් නොවිසඳී පැවතුණි. විමර්ශන ප්‍රමාදවීම මත අත් අඩංගුවට ගත් භාණ්ඩ නශ්‍ය වීම, භායනය වීම, පසු කාලීන අලෙවියෙන් නිසි වටිනාකමක් ලබා ගැනීමට නොහැකි වීම, ඔත්තුකරුවන් සහ නිලධාරීන් අධෛර්යයට පත් වීම ආදී අවාසිදායක තත්ත්වයන් පැන නැගී තිබුණි.
11	ටැන්සැනියාවේ Zanzibar වරායේ සිට ශ්‍රී ලංකා වරාය හරහා Hong Kong වෙත ප්‍රති අපනයනය කිරීම සඳහා අප්‍රිකානු සණ දැව (African Hard Wood) ලෙස සඳහන් කරමින් වඳවීමට ලක්ව ඇති හා ජාත්‍යන්තර වෙළඳාම සීමා කර ඇති මැලගසි රෝස (Rose Wood) මෙට්‍රික් ටොන් 420ක් බර දැව කඳන් 3669ක තොගයක් රේගුව විසින් රාජසන්තක කර විකිණීමට කිහිප අවස්ථාවකදී සැලසුම්කර තිබුණු නමුත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත්කල යුතු CITES බලපත්‍රය ලබා ගැනිමට නොහැකි වීම මත 2014 සිට 2023 අප්‍රේල් 30 දින වන විටත් ඉවත් නොකර රේගු අංගනයක ගබඩා කර තිබුණි. පදම් නොකළ කඳන් වීම මත මෙම දැව තොගයට මේ වන විටත් කෘමීන්ගෙන් හානි සිදු වී තිබුණු අතර 2014 සිට 2022 ජනවාරි	2022	අලෙවි කිරීමට යෝජිත රාජසන්තක කළ ද්‍රව්‍ය නොපමාව අලෙවි කර රාජ්‍ය ආදායමට බැර කිරිමට කටයුතු කළයුතු බව.	මෙම Rose Wood දැව තොගය 2015.08.22 දින සිට මේ දක්වා හැටපස් වතාවක් (65) පමණ ටෙන්ඩර සඳහා ඉදිරිපත් කර ඇතත් ඉන් අවස්ථා 04 කදී පමණක් වැඩිම ඉල්ලුම්කරුවන් වෙත එම දැව තොගය ප්‍රදානය වී ඇති බවත් ඔවුන්ට CITES බලපත්‍රය ලබා ගැනීමේ දී ඇති වී තිබෙන ගැටලු හේතුවෙන් දැව තොගය නිදහස් කිරීමේ ගැටලු ඇති බවත් දන්වා තිබුණි.	මේ සම්බන්ධයෙන් අභියාචනාධිකරණ යේ නඩුවක් පවතින අතර එහි තීන්දුව අනුව ඉදිරි කටයුතු රැඳී පැවතුණි.

	දක්වා දැව තොගය ගබඩාකර තබා ගැනිම වෙනුවෙන් ශ්‍රේ ලයින් කන්ටේනර් අංගනය මඟින් රේගුව වෙත රු.81,621,820 ක ඇස්තමේන්තු වියදමක් පිළිබඳව දැනුම්දී තිබුණි.				
12	සී ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක් වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරායට ළඟා වී තිබුණු අතර එහි බහාළුම් 98 ක තිබුණු නරක් වූ මාළු තොගය විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මගින් සොයාගත් දේශිය පෞද්ගලික ආයතනයකට කාබනික පොහොර නිෂ්පාදනය සඳහා 2022 මාර්තු 09 වන දින විකුණා තිබීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.				
(i)	මෙම මාළු තොගය අඩංගු නෞකාවෙහි ස්වභාවය Transshipment Status වුවද Import cargo status ලෙස වෙනස් කිරීමට ජ්‍යෙෂ්ඨ රේගු අධ්‍යක්ෂවරයා පත් කරන ලද කමිටුව විසින් තීරණය කර තිබුණ ද ඒ සඳහා HS Code වර්ගීකරණ කමිටුවක විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණු අතර මෙම මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති බව වාර්තා කළ ද, HS Code 511.91.10 යටතේ Whole Round Tuna In Bulk ලෙස රේගු සටහන්කරයේ ඇතුළත් කර ඒ අනුව රේගුව විසින් රු. 6,288,357 බදු අයකරගෙන තිබුණි.	2022	මාළු තොගය නරක් වූ ස්වභාවයක් ගෙන ඇති අවස්ථාවක් බැවින් වර්ගීකරණය පිළිබඳ අපැහැදිලිතාවක් ඇති අතර එවිට “වර්ගීකරණ කමිටුවක්” වෙත යොමු කිරීම අවශ්‍ය බව.	මෙම ද්‍රව්‍ය වර්ගීකරණ අංක 0511.91.10 යටතේ මත්ස්‍ය අපද්‍රව්‍ය (Fish Waste) ලෙස වර්ගීකරණය කොට ඇත. මෙම වර්ගීකරණය නිවැරදි බැවින් හා වර්ගීකරණය පිළිබඳ අපැහැදිලිතාවක් ඇතිවූ අවස්ථාවකදී පමණක් “වර්ගීකරණ කමිටුවක්” වෙත යොමු කිරීම සිදු කරන බැවින්, මෙහිදී වර්ගීකරණ තත්වයකට පත් කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී නොමැති බව	මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කිරීම සඳහා දිනයක් සහ වේලාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණි.

				දන්වා තිබුණි.	
(ii)	පොහොර නිෂ්පාදකයාගේ ධාරිතාවය පිළිබඳව නොසලකා හැර විශාල මාළු තොගයක් පොහොර නිපදවීමට ලබාදීමෙන් ප්‍රමාණවත් ධාරිතාවයෙන් යුතුව කටයුතු සිදු නොවීම (ප්‍රමාණවත් ශ්‍රමය හා උපකරණ නොමැති නිසා) හා ඇතැම් බහාළුම්වල ශීතකරණ සඳහා විදුලිය සැපයීම ඇණ හිටීමෙන් එම මාළු ගබඩා ආශ්‍රිතව සෞඛ්‍යට අහිතකර තත්ත්වයක් නිර්මාණය වී අධික දුගඳ හමන තත්ත්වයක් හා බහාලුම්වලින් ගලන අපවිත්‍ර ද්‍රාවණයන් හේතුවෙන් අවට පරිසරය අපවිත්‍ර වීමේ තත්ත්වයක් උද්ගත වී ඇති බවත් එම ගබඩා පරිශ්‍රයන්ට අදාළව 2022 අගෝස්තු 16 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් ප්‍රදේශවාසීන්ගෙන් චෝදනා එල්ල වී තිබුණු අතර, 2022 ජූලි 07 දින මහබාගේ පොලිස් ස්ථානාධිපතිවරයා විසින් ගබඩා කර ඇති බහාළුම් 60 ක් ඉවත් කර ගන්නා ලෙස ද දැනුම් දී තිබුණු බව ද නිරීක්ෂණය විය.	2022	මහජන සෞඛ්‍යට අහිතකර තත්ත්වයක් නිර්මාණය වේද යන්න පිළිබඳව ද සැලකිල්ලට ගතයුතු බව.	පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය බලපත්‍රය පොහොර ලේකම් කාර්යාලය මඟින් 2021.10.28 දින මෙම සමාගම වෙත නිකුත් කර ඇත.	-එම-
(iii)	මාළු තොග නිදහස් කිරීමේ දී රේගු සටහන්කර 17 ක් පිළිගෙන ඉහත සඳහන් ආයතනය වෙත නිදහස් කිරීමට පියවර ගෙන තිබුණු අතර මෙම රේගු සටහන්කර සැකසීමට දේශීයව සැකසූ Way Bill, Invoice, Packing List උපයෝගී කර ගැනීම විගණනයේ දී ප්‍රශ්නගත විය.	2022	රේගු සටහන්කර සැකසීමට දේශීයව සැකසූ Way Bill, Invoice, Packing List ආදිය උපයෝගී කර ගත නොහැකි බව.	අදාළ නැව් බඩු ලේඛනය රේගු දත්ත පද්ධතියට මූලික වශයෙන් Transhipment ලෙස ඇතුළත් කර ඇති අතර මධ්‍යම අපහරණ අංශය මඟින් කරන ලද ඉල්ලීමක් මත අදාළ නැව් බඩු ලේඛන වල Nature එක එනම්, තත්ත්වය Transhipment සිට Local දක්වා Edit කර ඇති බව දන්වා	මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කිරීම සඳහා දිනයක් සහ වේලාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණි.

				තිබුණි.	
(iv)	2023 වර්ෂය අවසාන දින වන විට අප-මාළු (Fish-Waste) අඩංගු බහාලුම් 98 න් බහාලුම් 40ක තිබුණු නරක් වූ මාළු කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගෙන අවස්ථා 3 ක දී තායිලන්තයට හා මැලේසියාවට ප්‍රතිඅපනයනය කර තිබුණි. කාබනික පොහොර නිෂ්පාදනය සඳහා බහාලුම් 43 ක් යොදාගත් බවට ආනයන හා අපනයන පාලකවරයා විසින් වාර්තා කර තිබුණු අතර ඉතිරි බහාලුම් 15 හි ඇති නරක් වූ මාළු තවදුරටත් පෞද්ගලික ගබඩාවක රඳවා තිබුණි. කෙසේවුවද, කාබනික පොහොර සැකසීමට යැයි පවසමින් රට තුළට ගත් මාළු බහාළුම් 40ක්ම එකී කාර්යයට යොදා නොගෙන ප්‍රතිනැව්ගත කිරීමට ඉන් වසරකට පමණ පසු කටයුතු කිරීමෙන් ශ්‍රී ලංකා රේගුවේ මුල් තීරණය වැරදි බව තවදුරටත් තහවුරු වී තිබුණි.	2023	තීරණ ගැනීමේදී වඩාත් විචක්ෂණශීලී විය යුතු බව.	මෙමගින් පෙන්වා දී ඇති පරිදි දැනට ඉතිරිවී ඇති බහාලුම් 15 ප්‍රතිඅපනයනය සඳහා නොව කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තෙක් රඳවා ඇත.	මේ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් කිරීම සඳහා දිනයක් සහ වේලාවක් ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර තිබුණි. ඒ අනුව ඉතිරි බහාළුම් 15 M/S Agri Star Compost Pvt Ltd නමැති සමාගමකට අපහරණය සඳහා බාර දී ඇති අතර සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලැබෙන තෙක් තවදුරටත් රඳවා තබා තිබුණි.
13	2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ ආදායම රු. මිලියන 800,949 ක් වූ අතර පසුව එය රු. මිලියන 628,054 ක් දක්වා සංශෝධනය කර තිබුණි. එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 22 ක අඩුකිරීමකි. වර්ෂය සඳහා රැස් කරන ලද සත්‍ය ආදායම රු. මිලියන 694,082 ක් වූ අතර එය මුල් ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 87 ක් විය.	2023	ඇස්තමේන්තු විචක්ෂණශීලීව සකස් කළ යුතු බව.	විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසුව මේ පිළිබඳව කටයුතු කිරීමට සටහන් කර ගත් බව දැනුම් දී තිබුණි.	2024 වර්ෂය සඳහා රු. බිලියන 1536 ක ඇස්තමේන්තුවක් මහා භාණ්ඩාරයෙන් ලබා දී තිබුණු අතර 2024 ඔක්තෝබර් 03 දින වන විට රු. බිලියන 1122ක ආදායමක් උපයා තිබුණි.
14	රේගු වැරදි වැළැක්වීමට බහාලුම් පරීක්ෂාවේ දී පරිලෝකන පද්ධතියක් හඳුන්වා දී තිබීම, අනෙකුත් සම්බන්ධිත ආයතන අතර පද්ධති සම්බන්ධ කිරීමට කටයුතු කිරීම සහ විමර්ශන මත පදනම්ව රේගු නිලධාරීන්ට ත්‍යාග ක්‍රමයක් හඳුන්වා දී තිබීම ආදී වූ තත්ත්වයන් තිබියදී 2023	2023	රේගු වැරදි හඳුනාගැනීම සහ වැළැක්වීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේද භාවිතා කළ යුතු බව.	ආනයන භාණ්ඩ නිශ්කාෂන ක්‍රියාවලිය අවදානම් පදනම් කරගත් ක්‍රියාවලියක් මඟින් විධිමත් කිරීම, දැනටමත් රේගු අවදානම් කළමනාකරණ අංශයේ	ස්වයංක්‍රීය අවදානම් කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමේ කටයුතු සිදු වී නොතිබුණි.

	වර්ෂය තුළ දී අවසන් කරන ලද විමර්ශන සඳහා පාදක වූ රේගු වැරදි 1902 ක් අතුරින් අතිරික්ත භාණ්ඩ ආනයන අවස්ථා 224 ක්ද, ප්‍රකාශ නොකළ භාණ්ඩ ආනයනයන් 498 ක්ද, වටිනාකම අඩුවෙන් ප්‍රකාශ කර ආනයනය කිරීම් 207 ක්ද, තහනම් කරන ලද හෝ සීමා කරන ලද භාණ්ඩ ආනයනයන් 188 ක්ද, රේගු ආඥා පනත උල්ලංඝනය කරන ලද වෙනත් අවස්ථා 211 ක්ද, ආදී රේගු වැරදි හඳුනාගත හැකි විය. කෙසේවුවද. නීතිය බලාත්මක කිරීම හා පහසුකම් සැලසීම සඳහා තීරණ ගැනීමට උපයෝගි කරගත හැකි, ඉදිරි අවශ්‍යතා වලට අනුකූලව වැඩිදියුණු කරගැනීමේ හැකියාවෙන් ද යුක්ත "ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක්" (Automated Risk Management System) රේගුව තුළ ස්ථාපිත කිරීමට කටයුතු කරගෙන යන බව රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිතුරු ලෙස මා වෙත වාර්තා කර තිබුණි.		මූලිකත්වයෙන් සිදුකර ඇත. එය කළමනාකාරිත්වය මහින්ද අත්‍යවශ්‍ය ක්‍රියාවලියක් ලෙස හඳුනාගෙන ඇති අතර, රේගු කටයුතුවලදි පාර්ශවකරුවන් වන ආනයනකරුවන්, අපනයනකරුවන්, වාප්පු නියෝජිතයන් ආදීන්ද, භාණ්ඩ, රටවල්, ගෙවීම් ක්‍රම ආදී නොයෙකුත් නිර්ණායක පදනම් කරගෙන, අදාල පාර්ශවවල පූර්ව හැසිරීම් හා පූර්ව දත්ත හා ඉදිරි නැඹුරුතා ද විශ්ලේශණය කිරීමේ හැකියාව ඇති, අදාල පරිදි නීතිය බලාත්මක කිරීම හා පහසුකම් සැලසීම සඳහා තීරණ ගැනීමට උපයෝගි කරගත හැකි, ඉදිරියේදි පැමිණිය හැකි අවශ්‍යතා වලටද අනුකූලව වැඩිදියුණු කරගැනීමේ හැකියාවෙන් යුක්ත "ස්වයංක්‍රිය අවදානම් කළමනාකරණ පද්ධතියක්" (Automated Risk Management System) ශ්‍රී ලංකා රේගුව තුළ ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරගෙන යමින් පවතී.	
15	ඉන්දියාවේ සිට සුදු සීනි ලෙස 2023 අනාවරණය කර ආනයනය කරන ලද සීනි තොගයක් රේගුවේ අවදානම්	රේගු ආඥා පනතේ විධිවිධානයන්ට අනුගත විය යුතු	ගරු මුදල් අමාත්‍යවරයා විසින් දණ්ඩන මුදල රුපියල් මිලියන 30	නිෂ්කාශණයට ඉදිරිපත් වන සියලුම බහාලුම් පරිලෝකනයට ලක්

	කළමනාකරණ ඒකකය (RMU) මඟින් දැඩි අවදානම් සහිත බවට වර්ගීකරණය කර ගැඹුරින් පරීක්ෂාවට යොමුකර තිබුණ ද, එම කාර්යය නිසි ලෙස සිදු නොවීම හා තෝරාගත් නියැදිය දෝෂයන් හඳුණා ගැනීමට තරම් ප්‍රමාණවත් නොවීම නිසා එම බහාලුම් තුළ දුඹුරු සීනි තොගයක්ද තිබිය දී රේගුවෙන් භාණ්ඩ නිෂ්කාශනය කර තිබුණි. රේගුවේ අනුකූලතා හා පහසුකම් සැලසීමේ අංශයට පසුව ලද තොරතුරකට අනුව සිදු කරන ලද පරීක්ෂාවේ දී ප්‍රකාශ නොකරන ලද දුඹුරු සීනි බහාලුම් 20 ක් ද එහි ඇති බවට අනාවරණය කරගෙන තිබුණි. මේ පිළිබඳව කරන ලද විමර්ශන අවසානයේ ආනයනකරුට එරෙහිව රු.500,000 ක දඩයක් සහ රු.189,293,778 ක අභිමි කිරීමක් පනවා තිබුණි. රේගු ආඥා පනතේ 165 වගන්තිය ප්‍රකාරව පනවන ලද දණ්ඩනය ලිහිල් කරන මෙන් ආනයනකරු විසින් සිදු කරන ලද අභියාචනය පළමු අවස්ථාවේදී අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කර තිබුණු අතර පසුව එම අභියාචනය සැලකිල්ලට ගෙන පනවන ලද දණ්ඩනය රු.30,000,000 කින් අඩු කිරීමට කටයුතු කර තිබුණි. දෙවන අවස්ථාවේ එපරදි සිදු කරන ලද ලිහිල් කිරීමට හේතු පැහැදිළි නොවුණි.		බව.	කින් ලිහිල් කිරීමට තීරණය කිරීම රේගු ආඥා පනතේ 165 වගන්තියට අනුකූල බව දන්වා තිබුණි.	නොකරන බැවින් පරිලෝකන පද්ධතියට කෘතිම බුද්ධිය (Artificial Intelligence) සම්බන්ධ කරන ලෙස විගණනය විසින් වරින් වර පෙන්වා දුන්න ද මේ දක්වා එපරදි කටයුතු කර නොතිබුණි.
16	2017 ජුනි 13 දින ජපානයෙන් කොළඹ වරායට ළඟාවූ අංක MSK 8912638 දරන බහාලුමේ පාවිච්චි කරන ලද යන්ත්‍ර සහ යතුරු පැදි අඩංගු වූ නමුත් ආනයනකරු විසින් භාණ්ඩ මුදාහැරීමට රේගු ලියකියවිලි ඉදිරිපත් නොකිරීම නිසා 2018 මාර්තු 29 දින වන විට රේගු විමර්ශනයක් ආරම්භ කර තිබුණි. කෙසේවුවද, වසර 5 ක පමණ කාලයක් තිස්සේ මුදා	2023	ආනයන සටහන්කරයන්හි ඇතුළත් දත්ත පිළිබඳව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට රේගු දත්ත සම්ප්‍රේෂණය වීමේ දී එකී	රේගු ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇති වාහනවල විස්තර අඩංගු කොටසේ තිබූ දත්තයන් සැක සහිත වූ බැවින්, රේගු ප්‍රකාශනය සැකසීම (process) රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) මඟින් තාවකාලිකව අත්හිටුවන බව දැනුම්	මෙම වාර්තාවේ දිනය දක්වා ද රේගු ආනයන සටහන්කරයන්හි ඇතුළත් දත්ත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට සම්ප්‍රේෂණය වීමේ දී එකී දත්තවල වලංගුභාවය මාර්ගගතව

	නොගත් මෙම බහාලුමට අදාළව 2022 අප්‍රේල් 07 දින ආනයන සටහන්කරයන් රේගුවට ඉදිරිපත්වී තිබුණු අතර රේගු විමර්ශන ක්‍රියාත්මකව පැවතිය දී බහාලුමේ අඩංගු භාණ්ඩ සඳහා 2022 ජුනි 27 දින වන විට රු.2,484,411 ක තීරු බදු අය කර රේගු ප්‍රකාශන අංශයේ කටයුතු අවසන් කර තිබුණි.මෙම අවස්ථාවේදී රේගු දත්ත මෝටර් රථ දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට සම්ප්‍රේෂණය වී තිබුණු අතර භෞතික විගණන පරීක්ෂාව සිදු කරන ලද 2023 සැප්තැම්බර් 15 දින වන විට ද ප්‍රශ්නගත බහාලුම කොළඹ වරායෙන් මුදා නොගෙන තිබිය දී වාහන 2ක් මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබුණි. ඒ අනුව විමර්ශනයක් සිදු කරමින් පවතින අතරතුර සහ ආනයන සටහන්කරයේ සැක සහිත වැසි අංක තිබිය දී ඒ පිළිබඳව නිසි සැලකිල්ලක් නොදක්වා රේගුව තීරු බදු අය කිරීමට කටයුතු කර තිබුණු අතර මෝටර් රථ දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට දත්ත සම්ප්‍රේෂණය වීමට ඉඩ හැරීම තුළ බහාලුම වරායේ රඳවා තිබිය දී එහි අඩංගු භාණ්ඩ සඳහා මෝටර් රථ දෙපාර්තමේන්තුවේ වාහන අනීතිකව ලියාපදිංචි වීමට ද රේගුව වක්‍රව අනුබල දී තිබුණි.		දත්තවල වලංගුභාවය පිළිබඳව සැලකිලිමත් විය යුතු බව.	දී ඇත්තේ 2022.04.29 දින දීය. 2022.05.30 දරණ අභ්‍යන්තර ලිපිය මගින් රේගු අධ්‍යක්ෂ (නිවාරණ) රේගු අධ්‍යක්ෂ (ප්‍රකාශන) වෙත දැනුම් දී ඇත්තේ MSKU8912638 දරණ බහාලුම පරීක්ෂා කිරීමට අවශ්‍ය බවත්, ඒ සඳහා ඉහත කී රේගු ප්‍රකාශනය ඉදිරි රේගු විමර්ශන කටයුතු සඳහා සාමාන්‍ය ක්‍රියා පටිපාටිය ඔස්සේ සැකසීම (process) කරන ලෙසත්, ප්‍රකාශිත අයිතමයන්වල වෙනස්කම් නිරීක්ෂණය වුවහොත් ඊට අදාල ක්‍රියාමාර්ග රේගු ආඥා පනතේ 47 වගන්තිය යටතේ ගන්නා බවත් පවසමිනි. ඒ අනුව එම රේගු ප්‍රකාශනයට අදාල බදු මුදල් ගෙවීම 2022.06.03 දින සිදු කර ඇති අතර, දැනට එම බහාලුම CICT අංගනයේ රඳවා ඇති අතර, පරීක්ෂණ කටයුතු සිදුකරමින් පවතී.	පරීක්ෂාවකින් පසුව සිදු කිරිමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද සකස් කර නොතිබුණි.
17	පුද්ගලික සමාගමක් විසින් ව්‍යාජ ඉන්වොයිසි ඉදිරිපත් කර ආනයනය කරන ලද සත්ව ආහාර තොගයකට අදාළව එම සමාගම පැහැර හැරීමට උත්සාහ දැරූ බදු වටිනාකම රු.15,198,755 ක් වූ අතර අඩුවෙන් දැක්වූ භාණ්ඩ	2023	රජයට ලැබිය යුතු නියමිත බදු ආදායම අයකරගත යුතු බව.	විමර්ශන නිලධාරියා විසින් ලිහිල් කරන ලද අභිමි කිරීම් සිදු කිරීම රේගු නීති ප්‍රතිපාදනවලට අනුව නෛතික රාමුව තුළ සිදු කර ඇති බව විගණනයට දන්වා	විමර්ශන අවසානයේ පනවන දණ්ඩන මුදලින් සියයට 30 ක් පමණක් රාජ්‍ය ආදායමට බැරවන බැවින් එකී ප්‍රතිශතය ඉහළ දැමීම සඳහා රේගු ආඥා පනත

වටිනාකම (Under Value) රු.63,519,586 ක් විය. කෙසේවුවද, විමර්ශන අවසානයේ දී වංචා කිරීමට උත්සාහ කළ තීරු බදු වටිනාකම සඳහා රු.500,000 ක ලිහිල් කරන ලද අහිමි කිරීමක් ද අඩුවෙන් දැක්වූ භාණ්ඩ වටිනාකම සඳහා රු.19,000,000 ක අහිමි කිරීමක්ද පමණක් පැනවීමට කටයුතු කර තිබුණු අතර එය සිදු කරන ලද වරදට සාපේක්ෂව විශාල ලිහිල් කිරීමක් විය. මෙකී ආනයනකරු විසින් 2021 සහ 2022 වර්ෂවල දී පමණක් ආනයනික අවස්ථා 300ට අධික සංඛ්‍යාවක් සිදු කර තිබුණු අතර එකම වාප්පු ලිපිකරු සේවයකින් දිගින් දිගටම වාප්පු සේවය ලබාගෙන තිබුණි. කෙසේවුවද, අදාළ වාප්පු සේවාව සම්බන්ධව දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී නොතිබුණු අතර “වාප්පු ලිපිකරුවන්ගේ ඇතැම් වංචනික ක්‍රියා නිසා රජයට බදු මුදල් අහිමි වන තත්ත්වය වළක්වා ගැනීම සඳහා පවතින නෛතික ප්‍රතිපාදන සංශෝධනය කළ යුතු බවට” රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මගින් ද දෙපාර්තමේන්තුවට නියෝග ලබා දී තිබුණි.		තිබුණි.	සංශෝධනය කිරීම සහ මෙලෙස දණ්ඩන ලිහිල් කිරීමේ දී රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් රේගුවට ඇති වගකීම පිළිබඳව වසර ගණනාවක සිට විගණනය විසින් පෙන්වා දුන්නද ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

50. ශීර්ෂය - 248 ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,844,731,545	307,990,378	1,536,741,167	තත්ත්වාගණනය කළ
2022	1,911,216,090	325,362,570	1,585,853,520	තත්ත්වාගණනය කළ
2023	2,321,953,949	377,267,735	1,944,686,214	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2023 වර්ෂයේ අප්‍රේල්, මැයි හා ජුනි මාස 03 ට අදාළව බැංකු ගිණුමට සෘජුව බැර වී තිබුණු හඳුනා නොගත් තැන්පතු 11 ක එකතුව වූ රු.6,124,850 ක් ලැබුණේ කාගෙන්ද යන්න නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව හා අදාළ ආදායම් ශීර්ෂයට නිශ්චිතව අදාළ ද යන්න හඳුනාගැනීමකින් තොරව ගිණුම් ගත කර තිබුණි.	2023	කාලීනව බැංකු ගිණුමට බැර වන හඳුනානොගත් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.	බැංකුවට මුදල් බැර කරනු ලැබූ පාර්ශව විසින් තම අනන්‍යතාවය හෙළි කරමින් ඉදිරිපත් වීමක් සිදු නොවන්නේ නම් හා එම තැම්පත්කරුවන් හඳුනා ගැනීමට වෙනත් ප්‍රායෝගික විකල්පයක් නොමැති නම් එම තැම්පතු හඳුනා නොගත් තැම්පතු සේ සලකා රජයේ ආදායම් ශීර්ෂයකට බැර කිරීම සිදුවේ.	2024 වර්ෂයේ ද ගණුදෙනුකරුවන් හඳුනාගත නොහැකි ලැබීම් පවතී.
02	ප්‍රධාන කාර්යාලයේ සරප් අංශය වෙත ලැබෙන ආදායම් නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ මාසික ගිණුම් සාරාංශ වල ආදායම් කේතයන් අනුව වර්ගීකරණය නොකර ආදායම් කේත 08 කට අදාළව එකතුව රු. 2,023,290,169 ක් ගිණුම්ගත කර තිබුණි.	2023	ලැබෙන ආදායම් නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ දෛනික හා මාසික වර්ගීකරණ සාරාංශ පිළියෙල කිරීම සිදු කල යුතුය.	බැංකු ගිණුම් වලට ලැබෙන සියලුම දෛනික ලැබීම් EXCEL මඟින් සටහන් කරගෙන එක් එක් ආදායම් ශීර්ෂයට මාසිකව ලද මුළු මුදල CIGAS වැඩසටහනට ඇතුලත් මාසික ගිණුම් සාරාංශවල පෙන්වා ඇත.	2024 ආදායම් ශීර්ෂ යටතේ ආදායම් කේත (ප්‍රභවයන්) අනුව වර්ගීකරණයන් සිදු නොකල ආදායම් පවතී.
03	2023 අයවැය යෝජනා අනුව රැස්කරණු ලබන දෛනික ආදායම් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලෙස උපදෙස් ලබාදී තිබුන ද 2023 වර්ෂය තුල දේශීය	2023	2023 අයවැය යෝජනා සහ භාණ්ඩාගාර උපදෙස් පරිදි රැස්කරනු ලබන දෛනික ආදායම් ඒකාබද්ධ	ප්‍රාදේශිය කාර්යාලවල දෛනික වියදම් සඳහා සුළු මුදල් අඛණ්ඩ අතුරු අග්‍රිමයක් ලබාදී ඇත. එම වියදම් පියවීම සඳහා පැවති ක්‍රමවේදය ක්ෂණිකව වෙනස්	2024 වර්ෂයේ අප්‍රේල් මස සිට භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කෙරේ.

	මත්පැන් සඳහා ඩිජිටල් සලකුණු හා මුද්‍රිත ස්ටිකර් සහ ආනයනික මත්පැන් සඳහා වූ රු.1,001,284,916 ක ස්ටිකර් ආදායම ඇතුළුව බැංකු ගිණුමට සමාලෝචිත වර්ෂයේ බැර වී තිබුණු රු.1,864,060,436 ක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර නොතිබුණි. තවද ITMIS පද්ධතිය යටතේ සියළුම මුදල් 2023 අගෝස්තු මාසයේ 01 දින සිට මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලෙස ලිඛිත උපදෙස් ලැබී තිබිය දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.		අරමුදලට ප්‍රේෂණය කල යුතුය.	කිරීමෙන් නිලධාරීන් නොසන්සුන්තාවයට පත්වන බැවින් එම ක්‍රමය වෙනස් කිරීම ක්‍රමවත්ව සිදු කල යුතුව තිබුණි.ඒ අනුව 2024 වර්ෂයේ අප්‍රේල් මස සිට නිසි පරිදි භාණ්ඩාගාරය වෙත දෛනික ආදායම් ප්‍රේෂණය කරන ලදී.	
04	2021 වර්ෂය තුළ අපනයනය කරන ලද මත්පැන්වලට අදාල ආපසු ගෙවන ලද එකතුව රු. 3,689,638,848 ක බදු අවකරණයක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.	2021	පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ගිණුම් ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කලයුතු අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු වේ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය.	මත්පැන් අපනයන මත සුරාබදු අවකරණය කිරීම සම්බන්ධ තොරතුරු 2022 වර්ෂයේ සිට ගිණුම් අංශය මඟින් ද ලේඛන ගත කර පවත්වාගෙන යාමට කටයුතු කෙරේ. බදු අවකරණය සම්බන්ධ ගිණුම් ක්‍රමවේදය පිළිබඳව අමාත්‍යාංශයේ උපදෙස් ඉල්ලා ඇති අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු කෙරේ.	2022 වර්ෂය සඳහා නිෂ්පාදන ආයතන 03කට අදාළව රු. 5,152,864,440ක් සහ 2023 වර්ෂයේ නිෂ්පාදන ආයතන 04 කට අදාළව රු. 7,301,770,528 ක සුරාබදු මුදලක් අවකරණය කර ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කටයුතු කර නොමැත.
05	2022 වර්ෂයට අදාළව නිෂ්පාදනාගාර විසින් දේශීයව නිපදවන මත්පැන් අපනයනය මත නිෂ්පාදන බදුවලින් අදාළ අවකරණයන් අඩු කිරීමෙන් පසු ශුද්ධ සුරාබදු ආදායම ගිණුම්ගත කර තිබුණු අතර සුරාබදු	2022	මත්පැන් අපනයනයට අදාළව බදු අවකරණය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු	බදු අවකරණ වටිනාකම සුරාබදු ආදායම් ශීර්ෂය යටතේම ආදායමින් හිලව් කිරීමක් කර පාද සටහන් මඟින් පෙන්නුම් කර ඇත.	එම

	අවකරණ වට්නාකම වියදමක් ලෙස නිරූපණය කර නොතිබුණි.		විසින් ලබා දී ඇති විධිවිධාන පරිදි කටයුතු කල යුතුය.		
06	අවකරණ සම්බන්ධ නිශ්චිත ගිණුම් ක්‍රමවේදය 2022 වර්ෂයේ අවසානය දක්වා හඳුනා ගෙන නොතිබුණි. මේ තත්ත්වය මත සුරාබදු දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් භාණ්ඩාගාර ගිණුම්වල ද මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය සම්බන්ධ තොරතුරු නිරූපණය වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.	2022	මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය සම්බන්ධ තොරතුරු ගිණුම් වල නිරූපණය විය යුතුය.	අමාත්‍යාංශය සමඟ සාකච්ඡා පවත්වා අවසන් තීරණයකට පැමිණි වහාම සුරාබදු අවකරණ සම්බන්ධ ගිණුම් තැබීම සිදු කෙරේ.	භාණ්ඩාගාර ගිණුම්වල ද මත්පැන් අපනයනය මත සුරාබදු අවකරණය සම්බන්ධ තොරතුරු වර්තමානයේ ද නිරූපණය නොවේ.
07	මත්පැන් නිෂ්පාදකයින් විසින් රජයට ගෙවිය යුතු සම්පූර්ණ බදු මුදල ආදායමක් ලෙස ගිණුම් ගත කර ඔවුන්ට ලබා දෙන බදු සහනය ආදායමින් ආපසු ගෙවීමක් ලෙස ගිණුම්ගත කළ යුතු බවත්, මුදල් රෙගුලාසි 118 අනුව ආදායමින් ආපසු ගෙවීමේ බලය සුරාබදු කොමසාරිස් ජනරාල්ට ලැබෙන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ගැනීම සුදුසු බවත්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබුණ ද 2022 වර්ෂයේ අවසානය දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2022	මුදල් රෙගුලාසි 118 හි විධි විධාන පරිදි කටයුතු කල යුතුය.	ආදායමින් ආපසු ගෙවීම සිදු කිරීම සඳහා අවශ්‍ය අක් මුදල් සපයා ගැනීමේ අපහසුතාවය හා මු.රෙ 118 අනුව කටයුතු කිරීම ප්‍රයෝගික ගැටළු පවතින හෙයින් ඒ සඳහා සුදුසු වැය ශීර්ෂයක් මඟින් ගෙවීම් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි 118 හි විධි විධාන පරිදි කටයුතු සිදු නොවේ.
08	අපනයනය කරනු ලබන මත්පැන්වලට අදාළ බදු මුදල් ආපසු ගෙවීම සඳහා සුරාබදු දෙපාර්තමේන්තුවට සුදුසු වැය විෂයක් ලබා දී ඊට අවශ්‍ය ප්‍රතිපාදන මුදල්	2022	එම	අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කළ අතර, ගෙවීමේදී පවතින දුෂ්කරතා හේතුවෙන් දැනට පවතින ක්‍රමවේදය අනුගමනය කිරීමට	එම

	වෙන් කර දෙන ලෙස හා එම වැය විෂය මඟින් සුරාබදු අවකරණය ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ඉල්ලීම් කර තිබුණු බව නිරීක්ෂණය විය. 2022 වර්ෂයේ අවසානය දක්වාත් ආපසු ගෙවීම් සඳහා වැය විෂයක් යටතේ ප්‍රතිපාදන ලැබී නොතිබුණි.			තීරණය විය.	
10	2023 වර්ෂයේ මත්පැන් අපනයන සඳහා සුරාබදු අවකරණ සම්බන්ධ ලිපිගොනු නියැදියක් පරික්ෂාවේ දී අවසර පත්‍ර 03 ක සඳහන් රට වෙනුවට වෙනත් රටවලට අපනයනය කර තිබූ අවස්ථා, අවසර පත්‍ර 02 ක සඳහන් නියමිත දිනට පසු දිනයක අපනයනය කිරීම හා නියමිත කාලය දක්වා නොතිබූ අවස්ථාවක්, අවසර පත්‍ර 20 ක කාර්යාල පිටපතේ වගකිවයුතු නිලධාරියෙකු විසින් සහතික කර නැති අවස්ථා සහ රේගු දත්ත පද්ධතියෙන් අපනයන ලියකියවිලි නිවැරදිතාවය තහවුරු කර නොතිබූ අවස්ථාවක් නිරීක්ෂණය විය.	2023	අපනයන අවකරණ සම්බන්ධයෙන් විධිමත් අභ්‍යාන්තර පාලන ක්‍රමයක් ඇතිකල යුතුය.	විදේශික ගැණුම්කරුගේ ඉල්ලීම පරිදි අදාල මත්පැන් තොගය වෙනත් රටවලට අපනයනය කරන ලදි.	අපනයන අවකරණ සම්බන්ධයෙන් අභ්‍යාන්තර පාලන ක්‍රමය විධිමත් කරමින් පවතී.
11	අපනයන කිරීමට යෝජිත මත්පැන් තොග කන්ටේනර් ගත කිරීම සනාථ කිරීම සඳහා වූ ලේඛන වල ඒකාබද්ධ පරීක්ෂාවක් සුරාබදු සහ රේගු නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුකර තිබුණු බව සඳහන් වුවද එම ලේඛන වල මත්පැන් තොග හරියාකාරව	2023	අපනයන වලට අදාළව සුරාබදු දෙපාර්තමේන්තුව සහ රේගු දෙපාර්තමේන්තුව ඒකාබද්ධ සුපරීක්ෂණය හා අධීක්ෂණය සිදුවන බවට ලේඛණමය සාක්ෂි වලින් තහවුරු වීමේ	වෙනත් ආයතනයක් මඟින් නිකුත් කරන ලද ලේඛනයක අත්සන් තැබීමට ශ්‍රී ලංකා රේගුව බැඳී නොමැති බව ප්‍රකාශ කර ඇත.	ඒකාබද්ධ සුපරීක්ෂණය හා අධීක්ෂණය සිදුවන බවට ලේඛණමය සාක්ෂි වලින් තහවුරු වන ක්‍රමයක් ක්‍රියාත්මක නොවේ.

	කන්ටේනර් ගත කර ඇති බවට සුරාබදු නිළධාරීන් විසින් පමණක් සහතික කර තිබුණු අතර රේගු නිළධාරීන් විසින් අත්සන් යොදා සහතික කිරීම සිදු නොකරන බව නිරීක්ෂණය විය.		ක්‍රමවේදයක් පැවතිය යුතුය.		
12	සුරාබද්දක් ගෙවීම මත හෝ බදු රහිත පදනමක් මත මත්පැන් අපනයනය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පිළිගත හැකි ඇපකරයක් හෝ බැංකු ඇපයක් තැබිය යුතු බව සඳහන් විය. එසේ වුවද 2023 වර්ෂයේ සැර මත්පැන් නිෂ්පාදන ආයතන 03 ක් විසින් අවස්ථා 06 කදී හා ධාන්‍ය මත්පැන් නිෂ්පාදන ආයතනයක් අවස්ථා 26 ක දී අපනයනය කල මත්පැන් ලීටර් 16,364,975 ක් සඳහා වූ රු.7,301,770,528 ක සුරාබදු අවකරණ සඳහා නිසි පරිදි ඇප ආවරණය වී නොතිබුණි.	2023	සුරාබදු නිවේදන විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඇප ආවරණ සම්බන්ධයෙන් චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.	නව චක්‍රලේඛයක් නිකුත් කර ඇතත් මත්පැන් අපනයනයට අදාළව ඇප තැබීම් සම්බන්ධ විගණනයට වාර්තා කර නොමැත.
13	2021 වර්ෂය තුළ බොතල් රා නිෂ්පාදනාගාර 44 ක් ක්‍රියාත්මකව පැවති අතර පොල් රා බෝතල් නිෂ්පාදනාගාර 11 කින් රු. 66,618,289 ක් හා තල් රා බෝතල් නිෂ්පාදනාගාර 22 කින් රු 20,536,816 ක් වශයෙන් එකතුව රු.87,155,105 ක මුළු ආදායමක් උපයා තිබුණි. තවද පොල් රා නිෂ්පාදනාගාර 5 ක් සහ තල් රා නිෂ්පාදනාගාර 6 ක් 2021 වර්ෂය තුළ අක්‍රීය තත්වයේ පැවතීම හේතුවෙන් එම නිෂ්පාදනාගාරවලින්	2021	අක්‍රීය තත්වයේ පැවති නිෂ්පාදනාගාර පිළිබඳව කරුණු සොයාබලා ක්‍රියාකාරී මට්ටමට පත් කිරීම මගින් නිෂ්පාදන බදු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේ යාවත්කාලීන කර තිබුණේ පොල් රා නිෂ්පාදනාගාර 05 ක් හා තල් රා නිෂ්පාදනාගාර 03 ක් පමණි. දීර්ඝ කාලයක් නිෂ්පාදන කටයුතු සිදු නොකර සිටින ආයතන පරීක්ෂා කර බලා සුදුසු ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට උපදෙස් ලබා දී ඇත.	දීර්ඝ කාලයක් නිෂ්පාදන කටයුතු සිදු නොකර සිටින ආයතන ක්‍රියාකාරී මට්ටමට පත් කිරීම සම්බන්ධ පසු විපරම් කටයුතු මෙතෙක් සිදු වී නොමැත.

	ලැබිය යුතු බෝතල් රා නිෂ්පාදන බදු ආදායම අහිමි වී තිබුණි.				
14	2023 අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව සමස්ත සුරාබදු හා දුම්කොළ බදු ආදායම් ඇස්තමේන්තුව රු.217,035,000,000 සිට 182,000,000,000 දක්වා රු.35,035,000,000 හෙවත් සියයට 16 ක ප්‍රතිශතයකින් අඩු කර සංශෝධනය වී තිබුණි.	2023	මනා අධීක්ෂණයක් හා සුපරීක්ෂණයක් ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත ආදායම් ඇස්තමේන්තු ඉලක්ක සපුරාගැනීමට කටයුතු කල යුතුය.	2023 වර්ෂයේ මත්පැන් සඳහා රු. බිලියන 181 ක් හා දුම්කොළ බදු සඳහා රු.බිලියන 1 ක් වූ සංශෝධනයද ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කොට ඇත.	2024 වර්ෂයේ ද ඇස්තමේන්තු ආදායම වූ රු. බිලියන 232 රු. බිලියන 210 ක් දක්වා සියයට 10 ක ප්‍රතිශතයකින් අඩු කර සංශෝධනය සඳහා අනුමැතිය ඉල්ලා ඇත.
15	2023 වර්ෂය තුල සමස්ත සංශෝධිත සුරා බදු හා දුම්කොළ බදු ආදායම් ඇස්තමේන්තුව වූ රු.182,000,000,000 සමග සැසඳීමේදී රු.171,273,655,832 ක බදු ආදායමක් රැස්කර තිබුණි. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 94 ක් වුවද 2023 වර්ෂයේ මුල් අයවැය ඇස්තමේන්තුව සමග සැසඳීමේදී 78 ක ප්‍රතිශතයක් විය.	2023	එම	නිරීක්ෂණය නිවැරදි නමුත් 2023 වර්ෂයේ සුරාබදු ආදායම රු. 171,273,655,832 වන අතර, සුරාබදු මත බදු අවකරණය 2023 වර්ෂයේදී රු.7,301,770,528 කි. ඒ අනුව සමස්ථ සුරාබදු ආදායම රු.178,575,426,360 ක් වේ. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 98.1% ක් වේ.	2024 වර්ෂයේ ඇස්තමේන්තුව සුරාබදු ආදායම රු. බිලියන 230 ක් හා දුම්කොළ බද්ද රු. බිලියන 2 ක් වූ අතර 2024 අගෝස්තු වන විට පිළිවෙලින් රු. බිලියන 133 ක් හා රු. මිලියන 749 ක ආදායමක් රැස් කර තිබුණි. විය.එය සියයට 57 හා සියයට 37 ක මට්ටමේ විය.
16	සුරාබදු දෙපාර්තමේන්තු තොරතුරු අනුව 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී මත්පැන් වර්ග 10 කින් මත්පැන් වර්ග 7ක මත්පැන් නිෂ්පාදනය සංශුද්ධ මධ්‍යසාර ලීටර් 8,396,933 කින් හෙවත් සියයට 19 ප්‍රතිශතයකින් අඩු වීමක් නිරීක්ෂණය විය. තවද මත්පැන් නිෂ්පාදනය අඩු වී තිබුණ ද සුරා බදු ආදායම ඉහල යාම සඳහා අවස්ථා 02 කදී සුරාබදු	2023	මත්පැන් නිෂ්පාදනය අඩුවීම තුලින් ව්‍යාජ මත්පැන් වෙළඳපොළට පැමිණීම වළක්වා ගැනීමට අදාළ වැටලීම් කල යුතුය.	මත්පැන් බදු හේතුවෙන් මිල ඉහලයාම හා උද්ධමනය හේතුවෙන් ක්‍රය ශක්තිය අඩුවීම නිසා මත්පැන් සඳහා ඉල්ලුම අඩුවීම හේතු කොට ගෙන නිෂ්පාදනය අඩුවීම ද නිරීක්ෂණය වේ.	2023 වර්ෂයට සාපේක්ෂව 2024 වර්ෂයේ අගෝස්තු මාසය දක්වා සියයට 3.5 කින් සමස්ථ මත්පැන් නිෂ්පාදනය අඩු වී ඇති බව වාර්තා වේ.

	නිවේදන 02 ක් මඟින් සුරාබදු අනුපාතය සියයට 20 පරාසයකින් වැඩිවීම බලපා තිබුණි.				
17	2023 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් කල හිඟ ආදායම් වාර්තාව අනුව මත්පැන් නිෂ්පාදන ආයතන 13 කින් රු. 7,159,178,778 ක්ද රා නිෂ්පාදන ආයතන 13 කින් රු. 6,218,940 ක්ද මත්පැන් ස්කාගාර 03 කින් රු.31,483,610 ක් ද සුරාබදු සහ මත්පැන් නිෂ්පාදන ආයතන 04 කින් අපතය සඳහා හිඟ බදු රු.68,392,684 ක් ද ඇතුළුව මුලු හිඟ සුරාබදු ආදායම සහ එයට අදාල හිග ප්‍රමාද ගාස්තු එකතුව රු.7,265,274,012 ක් විය. හිඟ ආදායම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (1) (උ) ,128 (2) (ඉ) විධිවිධාන සහ එම බලපත්‍ර වලට අදාළව 1912 අංක 8 දරණ සුරාබදු ආඥා පනත සහ ඊට අදාළව සංශෝධනයන් හා සුරාබදු නිවේදන වල විධිවිධාන ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.	2023	සුරාබදු ආඥාපනත ප්‍රකාරව හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	2024 වර්ෂයේ දී එක් ස්කාගාරයකින් රු. 8,676,985 ක් ද රා සම්බන්ධව පොල් රා නිෂ්පාදනාගාර 03 කින් රු. 4,514,250 ක් හා තල් රා නිෂ්පාදනාගාර 09 ක හිඟ මුදල් අය වී ඇත.තවද වර්තමාන හිඟ බදු වලට අදාළව රු. 706,302,955 ක් 2024 වර්ෂයේ අය වී ඇත.	තව දුරටත් හිග ආදායම් අයවීමට ඇත.
18	2023 වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක හිඟ ආදායම් වාර්තා සමග සැසඳීමේදි අයවිය යුතු මුළු හිඟ සුරා බදු ආදායම ක්‍රමයෙන් වැඩි වීමක් නිරීක්ෂණය විය.	2023	එම	සුරාබදු මුදල් නියමිත දිනට නොගෙවුවහොත් වාර්ෂිකව 36% ක් බැගින් ප්‍රමාද ගාස්තුවක් එකතු වේ. එසේ වාර්ෂිකව ප්‍රමාද ගාස්තු වැඩිවීම හේතුවෙන් 2019 වර්ෂයේ සිට හිඟ ආදායමේ වැඩිවීමක් පෙන්නුම් කෙරේ.	පැරණි හිඟ ආදායම් සහ 2024 වර්ෂයේ හිග ආදායම් සමඟ තවදුරටත් හිඟය වර්ධනය වෙමින් පවතී.
19	2023 වර්ෂයේ අවසාන දිනට වසර 05 කට වැඩි	2023	එම	මෙම හිඟ බදු මුදලින් රු. 2,537,023,747 ක් වසර	ආයතන 02 ක නඩු කටයුතු අවසන්ව

	කාලයක සිට ආයතන 04 කින් අයවිය යුතු හිඟ සුරාබදු ආදායම් රු. 409,254,141 ක් සහ ඒ සඳහා වූ ප්‍රමාද ගාස්තුව රු. 2,127,769,607 ක එකතුව රු. 2,537,023,748 ක් විය.			15 ඉකුත් වූ හිඟ බදු මුදල් වේ. ඉන් ආයතන 03ක් දැනට ක්‍රියාත්මක නොවේ. ඉන් එක් ආයතනයක අයවිය යුතු හිග බදු මුදල් සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී. අනෙක් ආයතන දෙකෙන් අයවිය යුතු හිඟ සුරාබදු හා අධිභාර ගාස්තු ගෙවීම සඳහා 2011.11.30 දින නීතිපති දෙපාර්තමේන්තුවේ මඟ පෙන්වීම යටතේ ගිවිසුමක් අත්සන් කර තිබුණි. නමුත් 2014.04.25 දින සිට මෙම සමාගම් ගිවිසුමට අනුව හිඟ සුරාබදු හා අධිභාර ගාස්තු ගෙවීම පැහැර හැර ඇත. එම හේතුවෙන් මෙම සමාගම් දෙකට බලපත්‍ර ලබාදීම අත්හිටුවා ඇත. තවද අනෙක් ආයතනයෙන් අයවිය යුතු හිඟ බදු හා අධිභාර සම්බන්ධයෙන් නඩුවක් අධිකරණයේ ගොනු කර ඇත.	නැත. ඉතිරි ආයතන 02 න් හිඟ බදු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.
20	තවත් එක් ආයතනයකින් අය විය යුතුව පැවති හිඟ සුරාබදු ආදායම් රු.1,292,877,138 සහ ඒ සඳහා ප්‍රමාද ගාස්තු වූ රු. 1,921,514,810ක එකතුව රු.3,214,391,948 ක් විය.	2023	නෛතික විධිවිධාන පරිදි කටයුතු කල යුතුය.	මෙම ආයතනය හිග බදු හා අධිභාර සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් ගොණුකර ඇත.	පැරණි හිඟ බදු සහ අධිභාර සඳහා නඩු කටයුතු අවසන් වී නොමැත.
21	ඉහත 4.3 සහ 4.4 සඳහන් ආයතන 02 ක් සහ තවත් ආයතන 06 ක් ඇතුළු මත්පැන් නිෂ්පාදන ආයතන 08 කින් සුරාබදු සහ ප්‍රමාද ගාස්තු එකතුව රු. 1,404,820,502 ක හිඟ ආදායමක් 2023 වර්ෂයේ	2023	එම	වර්තමාන හිඟ සුරාබදු ආදායම ආයතන 01ක් හිඟ බදු මුදල් හා අධිභාර අයකර ගැනීම සඳහා 2024.02.29 දින හා ආයතන 02ක් 2024.02.28 දින	2023 වර්ෂයේ හිඟ බදු සහ ඒ සඳහා නියම දිනයේ දී බද්ද නොගෙවූ විට එම බද්ද මත මසකට සියයට 3 බැගින් වූ අධිභාරයක්

	අවසාන දිනට විය.			එකඟතා ගිවිසුමකට එළඹී ඇත. මේ වන විට එම බදු මුදලින්, අධිභාර වලින් රු. 306,093,064 අයකර ගෙන ඇත. තවද ආයතන 05ක් විසින් හිගබදු සහ අධිභාර රු. 400,209,891 ක් 2024 වර්ෂයේ දී ගෙවා අවසන් කර ඇත.	ඇතුළුව තවදුරටත් ආයතන 04 කින් හිඟ අයවිය යුතුව ඇත.
22	2009 අංක 01 දරණ දුම්කොළ සාමාන්‍ය නියෝග අනුව ලියාපදිංචි සහතික ලබා නොගෙන දුම්කොළ ආනයනය කිරීමට කටයුතු කිරීම හේතුවෙන් ආයතන 02 කින් 2023 වර්ෂයේ අවසාන දිනට රු. 6,688,478 ක හිඟ දුම්කොළ බදු ආදායමක් විය.	2023	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම හා ගිවිසුම් කඩ කිරීම සම්බන්ධයෙන් නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	එක් ආයතනයකින් 2024 වර්ෂය තුල රු.800,000 ක් ගෙවා ඇති අතර අනෙක් ආයතනයේ අයිතිකරු විදේශගතව ඇති බැවින් මෙම බදු මුදල අයකර ගැනීම සඳහා නීති අංශය වෙත යොමුකර ඇත.	රු.3,659,127 ක් වූ හිඟ දුම්කොළ බදු අයවිය යුතු ආයතනයට අදාළ නිතිමය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
23	දුම්කොළ හා ඒ ආශ්‍රිත කර්මාන්ත නියාමනය, බදු අය කිරීම, අධීක්ෂණය හා පාලනය සඳහා වූ 2004 අංක 09 දරන දුම්කොළ බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1999 අංක 08 දරන දුම්කොළ බදු පනතේ 2 වගන්තිය හා 21 වගන්තිය යටතේ 2022 දෙසැම්බර් 31 දිනැති බීඩි සඳහා දුම්කොළ බද්ද පැනවීමට අදාළ දුම්කොළ බදු පනත යටතේ වූ නිවේදනය සහ 2023 ජනවාරි 18 දිනැති අංක 1/2023 චක්‍රලේඛය මඟින් නෛතික විධිවිධාන සලසා තිබුණි. බීඩි කර්මාන්තයේ නිරත ආයතන 316 කින් ආයතන 212 ලියාපදිංචිය අළුත් කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පසුවිපරමක් සිදුවී	2023	දුම්කොළ බදු පනත යටතේ වූ නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	බීඩි නිෂ්පාදනය සඳහා කිසිදු බදු මුදලක් අයවී නැතැයි සඳහන් නිෂ්පාදකයින් 387 න් සුරුට්ටු නිෂ්පාදකයින් 44 ක් හා දුම්කොළ ආනයන කරුවන් 27 ක් සඳහා බදු අදාළ නොවේ. ඉතිරි ආයතන සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවති.	බීඩි කර්මාන්තයේ ලියාපදිංචි වී ඇති බීඩි නිෂ්පාදකයින්ගෙන් හිඟ ආදායම් ගණනය කිරීම සහ වාර්තා කිරීම මේ දක්වාම සිදු නොවේ.

	නොතිබුණි. ලියාපදිංචි වී තිබූ ආයතන 104 න් 2023 වර්ෂය තුල කිසිදු බදු මුදලක් අයවී නොතිබුණි. බදු අයකර ගැනීමේ දී සුළු පරිමාණ, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ වශයෙන් නිෂ්පාදකයින් වර්ග කර නොතිබුණි.				
24	එක් එක් නිෂ්පාදනාගාර සහ ස්කාගාර වලට අදාළව අයවිය යුතු නිෂ්පාදන අපතයන් සම්බන්ධයෙන් මාසිකව හා ත්‍රෛමාසිකව මූල්‍ය තොරතුරු අඛණ්ඩව ප්‍රාදේශිය කාර්යාල වලින් ආදායම් අංශය සහ ගිණුම් අංශය වෙත වාර්තා නොවීම, දීර්ඝ කාලයක් තිස්සේ හිඟ ආදායම් අය නොවී පැවතීම, ලිපිගොනු වල තොරතුරු වලට අමතරව ඒ සම්බන්ධව එක් එක් ආයතන වලට අදාළව සම්පූර්ණ තොරතුරු ආදායම් ලේඛන සහ හිඟ ආදායම් ලේඛන පවත්වාගෙන නොයාම මු.රෙ. 128 (2) (ඇ) පරිදි හිඟ ආදායම් වාර්තා වල අයවිය යුතු සියළුම ආයතනවල අපතයන් සම්බන්ධ හිඟ ආදායම් තොරතුරු වාර්තා නොවීම ආදි අඩුපාඩු නිරීක්ෂණය විය.	2023	අපතයන් සම්බන්ධ හිග ආදායම් මාසිකව හා ත්‍රෛමාසිකව අඛණ්ඩව ප්‍රාදේශිය කාර්යාල වලින් වාර්තා විය යුතුය.	වාර්තා වී ඇති අපතයන්ට අදාල බදු මුදල් 2023.12.31 දිනට හිඟ බදු වාර්තාවේ ඇතුලත් කර ඇත. 2016.12.09 දිනැති අංක 991 සුරාබදු නිවේදනය අනුව අපතය මත බදු අය කිරීම, අදාල ඒකකයේ සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරි හා සහකාර සුරාබදු කොමසාරිස්ගේ වගකීම බව	සෑම නිෂ්පාදන ඒකකයකට අදාළව තොරතුරු වාර්තා වීමේ ක්‍රමවේදයක් තවමත් ක්‍රියාත්මක නොවේ. ඒ සම්බන්ධ පසු විපරමක් සිදුකර නොමැත.

25	2002 අප්‍රේල් 18 දිනැති අංක 844 දරන සුරාබදු නිවේදනය පරිදි ලබාදෙන සහනදානය ඉක්මවා යන්නා වූ අවස්ථාවේ බලපවත්වන බදු අනුපාතිකයන්ට අනුව රජයට බදු ගෙවිය යුතු බව සඳහන් වූ අතර 2023 වර්ෂයේ මත්පැන් නිෂ්පාදනාගාර 04 කින් රු. 68,392,384 ක් වූ අපතයන් සඳහා බදු අයකරගෙන නොතිබුණි.	2023	එම	එක් ආයතනයකින් අයවිය යුතු අපතය සඳහා වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් කමිටුවක් මඟින් පරීක්ෂණ සිදු කරන අතර තවත් ආයතන 04 කට ලිපි මඟින් දැනුම් දී ඇත.	2023 වර්ෂයට අදාලව එක් ආයතනයක රු. මිලියන 44 ක හිඟ බදු මුදල අයවී නොමැත. 2024 වර්ෂයට අදාළව ආයතන 02 කින් රු.මිලියන 23 ක හිඟ බදු අයවීමට ඇත.
26	වියදම් කළමනාකරණය - මූලධන වැය විෂයයන් 07 ක් සඳහා රු. 438,000,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් එකතුව රු.166,569,268 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එම වැය විෂයන්ගේ ඉතිරිය රු.271,430,732ක් විය.	2023	සුරාබදු දෙපාර්තමේන්තුව සඳහා වූ ආදායම් පරිපාලන පද්ධතිය ස්ථාපිත කිරීම වැනි අත්‍යාවශ්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.	RASED ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සුදුසු සේවාදායකයෙක් තෝරාගැනීමේදී ඇතිවූ ගැටලුකාරී තත්වය මත සැලසුම් කර තිබූ සමහර ප්‍රසම්පාදන කටයුතු අවලංගු කිරීමට සිදුවීමත්, ඇතැම් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීම මත, ප්‍රතිපාදන ඉතිරි විය.	2024 අගෝස්තු 31 දිනට ප්‍රාග්ධන විෂයයන් 08 රු.මිලියන 1068.7 ප්‍රතිපාදනයෙන් උපයෝජනය රු. මිලියන 31.1 ක් හෙවත් සියයට 3 ක පමණ විය.
27	වාර්ෂික වත්කම් හා බැරකම් ප්‍රකාශයන් සුරාබදු දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිළධාරීන්ගෙන් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. 2023 දෙසැම්බර් 31 දිනට නිළධාරීන් 120 දෙනෙකු චක්‍රලේඛය ප්‍රකාරව අදාළ වාර්තා ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.	2023	අදාළ නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	2023.12.31 දිනට නිළධාරීන් 120 දෙනෙකු චක්‍රලේඛ ප්‍රකාරව අදාල වාර්තා ඉදිරිපත් කර නොමැත.	නෛතික විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොමැත.
28	2023 වර්ෂය සඳහා අලුත් කරනු ලැබූ බලපත්‍ර සම්බන්ධයෙන් වූ නියැදි විගණන පරීක්ෂාවේදී රට බීම 4 බලපත්‍ර, ර.බී. 7 හා ර.බී. 22 ඒ සහ බී බලපත්‍ර අළුත් කිරීමේ දී පොලිස් වාර්තා ඉදිරිපත් නොවීම, සංචාරක මණ්ඩලයේ	2023	එම	2023 වර්ෂයේ වසර අවසානයේ ඇතිවූ තාක්ෂණික ගැටලුවක් මත බදු නිෂ්කාශණ සහතික හා ඇතිවූ තදබදය මත සංචාරක මණ්ඩල අනුමැතිය ප්‍රමාදවීම මත අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් ගේ	ආදායම් බදු නිෂ්කාශණ පසුව ලබා ගැනීමට යටත්ව සුරාබදු බලපත්‍ර අලුත් කිරීම සිදුකර ඇත.

	අනුමැතිය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන බදු ගෙවූ බවට සාක්ෂි ආදිය ලිපි ගොනුව තුළ නොතිබූ බැවින් බලපත්‍ර ගාස්තු වලට අදාළව එම අවශ්‍යතාවය ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.			2023.12.13 දිනැති අංක ED/04/Miscellaneous ලිපිය අනුව ආදායම් බදු නිෂ්කාශණ හා සංචාරක මණ්ඩල අනුමැතිය පසුව ලබා ගැනීමට යටත්ව සුරාබදු බලපත්‍ර අලුත් කිරීම සිදුකර ඇත.	
29	2023 වර්ෂයේ අවසාන දිනට මිය ගිය නිලධාරින් 10 දෙනෙකුගෙන් අය විය යුතු හිඟ ණය ශේෂය රු.1,214,537 ක් විය.	2023	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	මේ වන විට නිලධාරීන් 5 දෙනෙකුගෙන් රු 477,610 මරණ පාරිතෝෂිකයෙන් අය කිරීමට කටයුතු කර ඇත.	නිලධාරින් 6 දෙනෙකුගෙන් රු. 715,720 ක් අයවිය යුතුව ඇත.
30	2023 වර්ෂයේ අවසාන දිනට සේවය අතහැර ගිය නිලධාරින් 14 දෙනෙකුගෙන් අය විය යුතු එකතුව රු. 1,845,808 ක් විය.	2023	එම	මේ වන විට නිලධාරීන් 13 දෙනෙකුගෙන් රු 1,220,561 ක මුදලක් අය වීමට ඇත.	නිතිපති වෙත ලිපිගොනු 01 ක් යොමු කර ඇත.ලිපිගොනු 05 ක් යොමු කිරීමට කටයුතු කරමින් පවතින බව සහ 03 දෙනෙකුගේ ණය කපා හැරීම සඳහාත් කටයුතු කල බව වාර්තා කර ඇත.
31	2023 වර්ෂයේ අවසාන දිනට වැඩ තහනමට ලක්වූ නිලධාරින් 14 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.1,575,426 කි.	2023	එම	මේ වන විට අය වීමට ඇති මුලු මුදල රු. 1,468,342 කි.	නිතිපති වෙත ලිපිගොනු 03ක් යොමු කර ඇත. ලිපිගොනු 05 ක් යොමු කරමින් පවතින බවත් දෙදෙනෙකු නැවත සේවයේ පිහිටුවා ඇති බවද වාර්තා කර ඇත.
32	මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව බැංකු ගිණුම් වලට අදාල මාසික බැංකු සැසඳුම් ප්‍රකාශනය ඊළඟ මාසයේ 15 දිනට පෙර පිලියෙළ කර	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.	මෙම බැංකු ගිණුම තැම්පත්කරුවන්ගේ නමින් මුදල් ඍජුවම රැස්කිරීම සඳහා පවත්වාගෙන යනු ලබන රැස් කිරීමේ ගිණුමකි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැත.

	විගණකාධිපති දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සඳහා සූදානම්ව තිබිය යුතු බව සඳහන් වුවද සුරාබදු දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 17 දින ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සුරාබදු කොමසාරිස් ජනරාල් නමින් ආරම්භ කර තිබුණු බැංකු ජංගම ගිණුම සඳහා 2022 වර්ෂයේ සිට මේ දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොමැති බව ද නිරීක්ෂණය විය. බැංකු සැසඳුමක් පිලියෙල නොකිරීම තුල බැංකු සැසඳුමක් මගින් අනාවරණය වන බැංකු ගාස්තු, අගරු චෙක්පත් හා බැංකුව විසින් සිදු කරන වැරදි හඳුනා ගැනීම හා ඒවා නිවැරදිව ගිණුම් ගත වීම සිදුවී තිබේද යන්න පිළිබඳව තහවුරු ලබා ගැනීමට නොහැකි විය.			මෙම ගිණුමට දෛනිකව රැස්වන ආදායම් සුරාබදු දෙපාර්තමේන්තුවේ වෙනත් බැංකු ගිණුම් දෙකකට ප්‍රේෂණය කරනු ලැබේ.	
33	ප්‍රමිතියෙන් යුත් මත්පැන් වෙළඳ පොළට නිකුත් කිරීමේ සහ නීති විරෝධී මත්පැන් සම්බන්ධ නඩු කටයුතු කඩිනම් කිරීමේ හැකියාව ලැබෙන පරිදි මත්පැන් සඳහා රසායනාගාර පරීක්ෂණ හා මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් 2021 වසරේ ස්ථාපනය කිරීම සැලසුම් කර 2023 වර්ෂයේ අයවැය මඟින් රසායනාගාරය සඳහා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට රුපියල් මිලියන 100 ක් වෙන් කර තිබුණද 2023 වර්ෂයේ දරන ලද වියදම	2023	මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ස්ථාපනය කිරීමට කටයුතු කල යුතුය.	රසායනාගාර උපකරණ සහ ලී බඩු මිලදී ගැනීම 2024 මැයි මස වන විට ටෙන්ඩර් පිරිනැමීමට කටයුතු සිදුකර ඇත.	මත්පැන්වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා රසායනාගාරයක් ස්ථාපිත කර නොමැත.

	රු.1,480,133 ක් හෙවත් සියයට 1.4 ක ඉතා අඩු ප්‍රතිශතයක විමෙන් රසායනාගාරය ස්ථාපිත කිරීමට අදාළව 2023 වර්ෂයේ ප්‍රමාණවත් ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි.				
34	මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම යටතේ මත්පැන් වර්ග 11 ක් සඳහා නිර්ණායක 16 ක් යටතේ ප්‍රමිතීන් සකස් කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දක්වා ප්‍රමිතීන්ට අනුව නිෂ්පාදනය සඳහා විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ප්‍රමිතීන් සම්බන්ධ ගැසට් නිවේදන නිකුත් වී නොතිබුණි. තවද මහ රා සඳහා ප්‍රමිත ස්ථාපිත කිරීමට අදාළ කටයුතු මේ දක්වාම නිම වී නොතිබුණි.	2023	ප්‍රමිතීන්ට අනුව විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ගැසට් නිවේදනය නිකුත් කිරීම කල යුතුය.	ප්‍රමිතීන් සඳහා සකස් කරන ලද කෙටුම්පත අනුමැතිය සඳහා 2024.03.27 දින රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලදි.	රා සඳහා ප්‍රමිත ස්ථාපිත කර නොමැත. මත්පැන් ප්‍රමිතීන්ට අදාල විධිවිධාන බලාත්මක කළ හැකි අයුරින් ගැසට් නිවේදනය නිකුත් කර නොමැත.
35	කාර්යක්ෂම ආදායම් පරිපාලනය, සේවා දායකයන් සඳහා ඉහළපෙලේ සේවාවක් ලබාදීම, රාජ්‍ය ආයතන හා දත්ත හුවමාරු විධිමත් කිරීම හා මානව සම්පත් කළමනාකරණය සඳහා විධිමත් සැපයුම්දාමයක් ක්‍රියාත්මක කිරීම ආදී අරමුණු ඉටුකිරීම සඳහා වූ **RASED** නමින් නව ප්‍රතිසංස්කරණයෙන් යුතු පරිගණක තොරතුරු පද්ධතියක් ක්‍රියාවට නැංවීමේ කටයුතු 2020 දෙසැම්බර් මස ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මෘදුකාංග සංවර්ධනය සඳහා 2022 සහ 2023 වර්ෂ වල පිළිවෙලින් රු. මිලියන	2023	යෝජිත ආදායම් පරිපාලන පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි පද්ධතිය සංවර්ධනය කිරීම උදෙසා විවෘත ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ප්‍රසම්පාදන විශේෂඥයෙකු තෝරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.	2024 වර්ෂයේ රු. මිලියන 841.8 ක ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් උපදේශක සේවා සඳහා රු.මිලියන 91.8 ප්‍රසම්පාදනයේ භෞතික ප්‍රගතිය සියයට 10 කි. රු. මිලියන 300 ක සහ රු. මිලියන 450 ක පරිගණක මෘදුකාංගය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ප්‍රසම්පාදනයන් හි භෞතික හා මූල්‍ය ප්‍රගතියක් 2024 ජූනි 30 දිනට වාර්තා නොවුණි.

	100 ක් සහ රු. මිලියන 94 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද කිසිදු වියදමක් දරා නොතිබුණි. සුරාබදු දෙපාර්තමෙන්තුවේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය, නිෂ්පාදනාගාර අධීක්ෂණය බෙදාහැරීම් සහ සැපයුම්දාම නියාමනය අපරාධ දත්ත සහ නීති කළමණාකරනය, සුරා බදු සහ බදු පරිපාලනය ආදී වැදගත් ක්ෂේත්‍ර සඳහා යෝජිත මෙම පරිගණක දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම ප්‍රමාදවෙමින් පැවතිම මත ශ්‍රී ලංකා රේගුව , දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හා මුදල් අමාත්‍යාංශ තොරතුරු පද්ධතිය හා සම්බන්ධ වී ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වෙමින් තොරතුරු හුවමාරු කර ගැනීමේ කටයුතු තවදුරටත් ප්‍රමාද වෙමින් පවතින බව නිරීක්ෂණය විය.				
36	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ දත්ත හුවමාරුව 2021 ඔක්තෝම්බර් සිට ක්‍රියාත්මක වුවද අවබෝධතා ගිවිසුම පිටපතක් විගණනයට ඉදිරිපත් නොවූ අතර රේගු දෙපාර්තමේන්තුව අතර දත්ත හුවමාරුව අදාල දත්ත තොරතුරු හෙලිදරව් නොකිරීමේ ගිවිසුම 2021 ජුලි මස සිට ක්‍රියාත්මකව පැවතිණි. එහි පිටපතක් ද විගණනයට ඉදිරිපත් නොවුණි. එසේම දත්ත හුවමරු පහසුකම් යටතේ ඒකාබද්ධ පද්ධති මගින්	2021	-එම-	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සමඟ දත්ත හුවමාරු කර ගැනිමට අවතීර්ණ වී ඇත. ඒ සඳහා අවශ්‍ය ගිවිසුම් ගත වීමට ක්‍රියා කරමින් පවති.	සුරාබදු දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන පද්ධතිය (RASED) පද්ධතිය ස්ථාපිත වී නොමැති බැවින් අනෙකුත් පද්ධති හා ඒකාබද්ධ වීම ප්‍රමාද වී ඇත.

තොරතුරු හුවමාරුව සිදුවන බව ලේඛණ මඟින් තහවුරු නොවුණි.

37 **ස්ටිකර් කළමණාකරණ ව්‍යාපෘතිය**

බදු හෝ තීරු බදු නොගෙවන ලද මත්පැන් භාවිතය අවම කිරීම, සුරාබදු ආදායම තවදුරටත් සුරක්ෂිත කිරීම සහ ව්‍යාජ මත්පැන් වැලැක්වීම මූලික අරමුණ කරගෙන 2017 ඔක්තෝබර් 17 දිනැති අමාත්‍ය මණ්ඩලය අනුමැතිය අනුව ආරක්ෂිත ස්ටිකරයක් හා ස්ටිකර් කළමනාකරණ පද්ධතිය ක් ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාත්තුව ඉන්දියානු කොන්ත්රාත් සමාගමට ප්‍රදානය කර වසර 05ක් දක්වා 2018 සැප්තැම්බර් 21 දින සමාගම සමඟ ගිවිසුම්ගත වී තිබුණි.

ආනයනික මත්පැන් සඳහා 2019 ජුලි 20 දින සිට ක්‍රියාත්මක වී තිබු අතර දේශීය නිෂ්පාදිත මත්පැන් සඳහා 2019අගෝස්තු 20 දින සිට ස්ටිකර් ඇලවීම ආරම්භ කළ යුතුව තිබුණ ද ප්‍රමාද වී 2022 ජනවාරි 03 දින සිට ක්‍රියාත්මත වී තිබුණි. මත්පැන් නිෂ්පාදන ආයතන 08 ක් සඳහා ඩිජිටල් සලකුණ ද අනෙකුත් නිෂ්පාදන ආයතන මුද්‍රිත ස්ටිකර් ඇලවීම ක්‍රියාත්මක වු අතර, වෙළඳපොලේ පවතින මත්පැන් තොග සඳහා ආරක්ෂිත ස්ටිකර් ඇලවීම 2022 අප්‍රේල් මස

	01 වන දිනට පෙර ලෙස සංශෝධනය වී ක්‍රියාත්මක වී තිබුණි. ස්ටිකර් ආදායමට අදාළ ආදායම් වාර්තා හා මාසික ගිණුම් සාරාංශය අනුව 2021 දෙසැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා දේශීය සහ විදේශීය මත්පැන් සඳහා භාවිත කිරීමට මුද්‍රිත ස්ටිකර් සහ ඩිජිටල් සලකුණු 555,371,052 ක ප්‍රමාණයක් නිකුත් කර තිබූ අතර, රු. 1,155,016,308 ක ආදායමක් උපයා තිබුණි. සුරාබදු නිවේදන 07/2021 විධිවිධාන මාස 06 ක කාලයකට පෙර දැනුම් දිය යුතු වුව ද, නිෂ්පාදන ආයතන 03 ක ඩිජිටල් තාක්ෂණය ක්‍රියාත්මක වී ඉතා කෙටි කාලයකින් ආරක්ෂිත ස්ටිකර් ඇලවීමේ ක්‍රමවේදයට අනුගමනයට අනුමැතිය දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.				
38	ස්ටිකර් ව්‍යාපෘතිය යටතේ ආරක්ෂිත ස්ටිකරයක් හා ස්ටිකර් කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම, අයිතිය හා මෙහෙයුම් කිරීමේ පදනම මත ස්ටිකර් සහ සේවා සැපයුම සඳහා වූ කොන්ත්‍රාත්තුව විදේශීය පෞද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර තිබුණි. ගෙවීම් අනුමත කිරීමේ දි සහ සහතික කිරීමේ දී අදාළ ගිවිසුම් ප්‍රකාර එකඟ වූ සියලුම කාර්යයන් නිම වී තිබුණේ ද යන්න තහවුරු කර නොතිබුණි.	2022	ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු එකග වූ විෂය පථය යටතේ ඇති සියලුම කාර්යයන්ගෙන් එක් එක් කාර්යයට අදාළ කාර්යය කොටස නිමකල බවට ලිඛිතව තහවුරු කර ගැනිම කල යුතු වේ.	අදාළ දිනට ඇමරිකන් ඩොලර් 500,000 ක් පමණක් නිරවුල් කර තිබුණ ද මේ වන විට ඇ.ඩො. 2,118,374 ක් ගෙවා ඇත. ඇ.ඩො. 879,621 කට අදාල බිල්පත් නිරවුල් කිරීමට ඇත. ඩිජිටල් සලකුණු 500,500,000 ක් වෙනුවෙන් කොන්ත්‍රාත් සමාගමට ඇමරිකන් ඩොලර් 2,997,995 ක මුදලින් මේ වන විට ඇමරිකන් ඩොලර් 2,118,374 ක් ගෙවා ඇති අතර ඇමරිකන් ඩොලර් 879,621 කට අදාල	වර්තමානයේ ගෙවීම් කිරීමේදී ද ඩිජිටල් ක්‍රමවේදය යටතේ ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්කරු එකග වූ විෂය පථය යටතේ ඇති සියලුම කාර්යයන්ගෙන් එක් එක් කාර්යයට අදාළ කාර්යය කොටස නිමකල බවට ලිඛිතව තහවුරු කර ගැනිම සඳහා සාක්ෂි නොමැත.

				බිල්පත් නිරවුල් කිරීමට ඇත.	
39	භාවිත කරන ලද ස්ටිකර්වලට අදාළව නව නිර්මාණ සැලැස්මක් නිර්මාණය කිරීම සම්බන්ධව පසු විපරමක් වාර්තා නොවීම, කොන්ත්‍රාත් සමාගම සමඟ පවතින ගිවිසුම 2023 සැප්තැම්බර් මස අවසන් වන බැවින් ව්‍යාපෘතිය ඉදිරියට කර ගෙන යෑම සම්බන්ධව තාක්ෂණික හා කාර්මික දෝෂයන් නිවැරදි කිරීමට පියවර ගන්නා ලෙස දැනුවත් කිරීමක් කළ ද භාණ්ඩාගාර ලේකම්වරයා වෙත ලිපියකින් දැනුවත් කිරීමක් පමණක් සිදු කර තිබුණි.	2022	නව සැළැස්මක් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම.	ඉදිරියේ දී භාවිතා කිරීමට නියමිත ස්ටිකර් සඳහා නව නිර්මාණ සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා මේ වන විට අදාල කොන්ත්‍රාත් සමාගම සමඟ සාකච්ඡා කොට ඇති අතර තවද මෙම නව නිර්මාණ සැළැස්ම පිළිබඳ යෝජනා ස්ටිකර් කළමනාකරණ කමිටුව වෙතද මේ වන විට ඉදිරිපත් කර ඇත.	නව ස්ටිකරය තවම ක්‍රියාත්මක නොවේ
40	මත්පැන්, ව්‍යාජ මත්පැන් හෝ නිර්ව්‍යාජ මත්පැන් බෝතලයක් ලෙස සාමාන්‍ය ජනතාවට හඳුනා ගැනීම සඳහා සඳහා මෘදුකාංගයක් හඳුන්වා දී තිබුණ ද වාර්තාකරණ මොඩියුලයෙහි ගැටළු පැවති බව නිරීක්ෂණය විය. සංශෝධිත මෘදුකාංග පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා දීමේ ප්‍රමාදය මත පරිශීලකයන්ගේ දැනුම නොමැතිකම මත මෙහෙයුම්වලදී ගැටළු පැන නැගී තිබීම, ව්‍යාපෘති කළමනාකරුවෙකු මෘදුකාංග විශ්ලේෂකයෙක් අනියුක්ත නොකිරීම සහ වාර්තාකරණ මොඩියුලය සංවර්ධනය කිරීම සිදු කර නොමැති වීම නිසා අවශ්‍ය විටෙක දී මෙහෙයුම්	2022	එම මෘදුකාංගයෙහි හා වාර්තාකරන මොඩියුලයට අදාළ ගැටළු නිරාකරණය කිරීම හා අනිකුත් පහසුකම් ප්‍රවර්ධනයට කටයුතු කල යුතුය.	සුරාබදු දෙපාර්තමේන්තුව විසින් ව්‍යාජ මත්පැන් හෝ නිර්ව්‍යාජ මත්පැන් බෝතලයක් සාමාන්‍ය ජනතාවට හඳුනා ගැනීම සඳහා මෘදුකාංගයක් එකක් හඳුන්වාදී ඇත. ආරම්භයේ දී එහි හා එහි වාර්තාකරන මොඩියුලය ගැටළු පැවතුනද මේ වන විට එම සියළු ගැටළු නිරාකරණය කොට ඇත.	පැවති ගැටළු මේ වන විට නිරාකරණය කල බව ප්‍රකාශ කලද කොන්ත්‍රාත් ගිවිසුමේ එක් එක් කාර්යයන් ඉටුකල බවට ප්‍රගති වාර්තා නොමැත.

	සම්බන්ධයෙන් සම්පූර්ණ විස්තරයක් ලබා ගැනීමට නොහැකි වීම, කොන්ත්‍රාත් සමාගම සුරාබදු දෙපාර්තුමේන්තුවේ හෝ නිෂ්පාදකයන්ගේ භෞතික තොග සත්‍යාපනය සමඟ සංසන්දනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් මෘදුකාංගය මඟින් සලසා නොතිබුණි.				
41	මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තාවක් මොඩියුලය මඟින් ලබා ගැනීමට පහසුකම් සලසා නොතිබීම, අවශ්‍ය බිඳ වැටීම් සහිතව දිනකට මුද්‍රණය කරන ලද ඩිජිටල් සලකුණු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීම සඳහා වාර්තා කරන මොඩියුලය මඟින් නිරන්තරයෙන් කාර්මික ගැටළු පැන නැගීම, සවිස්තරාත්මක ඩෑෂ් පුවරුවක් සැපයීම වැනි අවශ්‍ය පහසුකම් සලසා නොතිබීම, සුරාබදු දෙපාර්තුමේන්තුව සඳහා තත්‍ය කාලීන,දෛනික හා කාලාන්තර මෙහෙයුම් නිරික්ෂණය කිරීම සහ මුද්‍රණය වීමේ දී ප්‍රතික්ෂේප වීම් හඳුනා ගැනීම සඳහා උපාංගයක් හඳුන්වා දී නොතිබුණි.	2022	එම	මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නෙ◌ාවීම පිළිබඳ වාර්තා ලබා ගැනීම සඳහා බිඳවැටීම් සම්බන්ධව දිනකට මුද්‍රණය කරන ලද ඩිජිටල් සලකුණු ප්‍රමාණය සත්‍යාපනය කර ගැනීම සඳහා සවිස්තරාත්මක ඩෑෂ් පුවරුවක් සැපයීම සඳහාද ආයතනය දැනුවත් කොට ඇත. මෙම ඩෑෂ් පුවරුව හා අදාල වාර්තා ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත් ආයතනය විසින් මේ වන විට අධ්‍යන හා පර්යේෂණ අංශයක් ස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. එමගින් අවශ්‍ය වාර්තා ලබා ගැනීම, දෛනික මෙහෙයුම් නිරීක්ෂණය සඳහා අවශ්‍ය ඩෑෂ් පුවරුව ස්ථාපනය කිරීම කෙරෙහි අවධානය යොමු වී ඇත. තවද මේ වන විට අවශ්‍ය උපාංග සෑම සුරාබදු නිලධාරියෙකුටම ලබා දී ඇති අතර එම මෘදුකාංගය නිසියාකාරව ක්‍රියාත්මක වේ.	මාසිකව අර්ධ වශයෙන් මුද්‍රණය සහ මුද්‍රණය නොවීම පිළිබඳ වාර්තාවක් මොඩියුලය මඟින් ලබා ගත නොහැක. මොඩියුලය සංවර්ධනය සඳහා ආයතනය දැනුවත් කොට ඇත
42	නියෝග අංක 7/2021 සුරාබදු නිවේදනයේ 5(2) රීතියට අනුව ගුවන් තොටුපළ සහ වරායන්	2022	අඛණ්ඩ සුපරීක්ෂණයක් හා අධීක්ෂණයක් ක්‍රියාත්මක කිරීම	ගුවන් තොටුපල හා වරාය ඇතුළු අනෙකුත් ස්ථානවල ක්‍රියාත්මක වන තීරුබදු රහිත සාප්පු	ගුවන් තොටුපල හා වරාය ඇතුළු අනෙකුත් ස්ථානවල

	ඇතුළු අනිකුත් ස්ථානවල ක්‍රියාත්මක වන තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම්වල දී ආරක්ෂිත සළකුණ ඇලවීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු වන බව විගණනයට තහවුරු නොවුණි. තව ද තානාපති සේවය, ශ්‍රී ලංකන් එයාර් ලයින් හා ශ්‍රී ලංකා කේටරින් යන ආයතන තීරු බදු රහිත ආයතන නොවූව ද ස්ටිකර් කමිටුවේ නිර්දේශය මත ස්ටිකර් යෙදීම පිළිබඳ පසු විපරමක් සිදු කරනොතිබුණි.	තුළින් තීරුබදු රහිත සාප්පු වෙත නිකුත් කරනු ලබන සුරා බද්දට යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම්වල දී ආරක්ෂිත සළකුණ ඇලවීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදු වන බවට කළමණාකාරීත්වය විසින් තහවුරු කර ගත යුතුය.	වෙත නිකුත් කරනු ලබන සුරා බද්ද යටත් වන ද්‍රව්‍ය මත බන්ධිත ගුදම් වලදී ආරක්ෂිත සලකුණ ඇලවීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා රේගුව වගකිව යුතු වේ. සුරාබදු නිලධාරීන් වෙත බන්ධිත ගුදම් පරීක්ෂාව සඳහා අවසර නොමැති අතර ස්ටිකර් ඇලවීමෙන් පසු තීරුබදු රහිත සාප්පු තුළ පවතින මත්පැන් බෝතල් පරීක්ෂා කිරීම සඳහා සුරාබදු නිලධාරීන්ට අවසර ඇති අතර මේ වන විට සුරාබදු නිලධාරීන් විසින් එම තීරුබදු රහිත සාප්පු පරීක්ෂා කිරීම් සිදු කරනු ලබයි. තවද සුරාබදු දෙපාර්තමේන්තුවේ සැපයුම් දාම නියාමන අංශය විසින් තානාධිපති සේවය. ශ්‍රී ලංකා එයාර් ලයින්, ශ්‍රී ලංකා කේටරින් ආයතන වලට අවශ්‍ය මත්පැන් සඳහා ස්ටිකර් අදාල රේගු නිලධාරියා වෙත නිකුත් කරනු ලබන අතර ඔහු විසින් එම ස්ටිකර් ලබා ගත් බවට සහතික කොට අත්සන් තැබූ ලිපි ලේඛන සැපයුම් දාම නියාමන අංශය විසින් ගොනු පවත්වා ගෙන යනු ලබයි.	ක්‍රියාත්මක වන තීරුබදු රහිත සාප්පුවල ස්ටිකරය ක්‍රියාත්මක වීම සම්බන්ධව වගකිව යුතු ආයතනවෙතින් තහවුරු කල බවට සාක්ෂි නොමැත.
43	සුරාබදු නිවේදන 7/2021 අනුව පාරිභෝගිකයා වෙත ළඟා වීමට පෙර, සෑම බෝතලයකම හෝ කෑන් එකක් මතම අනුමත ඩිජිටල් සලකුණු මුද්‍රණය වීම යන විධානය අඛණ්ඩව ක්‍රියාත්මක වී නොතිබුණු බව පහත නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.			

44	ඩිජිටල් සලකුණු ක්‍රමවේදය යටතේ ස්ටිකර් ව්‍යාපෘති ක්‍රියාත්මක ප්‍රධාන සමාගමක එක් නිෂ්පාදනාගාරයක සිදු කළ නියදි විගණන පරීක්ෂාවේ දී කොන්ත්‍රාත් සමාගමේ අධීක්ෂණය යටතේ සලකුණු යන්ත්‍රය ක්‍රියාත්මකව තිබූ අතර, සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් වාර්තා අනුව, යන්ත්‍රය ස්ථාපනය කරන ලද 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 කාලය තුළ එනම්, ආසන්න මාස 13 ක් තුළ අවස්ථා 813 ක දී මුද්‍රණ යන්ත්‍රය අක්‍රියව පැවතුනි. සුරාබදු නියෝග අංක 07/2021 නියෝගයට අනුකූල නොවන අයුරින් 2022 ජනවාරි 11 දින සිට 2023 ජනවාරි 31 දක්වා කාලය තුළ මත්පැන් බෝතල් 4,904,369 ස්ටිකර් මුද්‍රණය නොවී වෙළඳපොළට නිකුත් වී තිබුණි.	2022	යන්ත්‍රවල ප්‍රායෝගික ගැටළු මග හරවා ගැනීම සඳහා කටයුතු කල යුතුය.	එම නිෂ්පාදනාගාරයේ මෙම ව්‍යාපෘතිය ආරම්භයේදීම යන්ත්‍රවල ඇති වූ ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ඩිජිටල් සලකුණු මුද්‍රණය ප්‍රමාද වී තිබුණි. මේ වන විට එම යන්ත්‍රවල ප්‍රායෝගික ගැටළු මග හරවා ගනිමින් අඛණ්ඩව ඩිජිටල් සලකුණු මුද්‍රණය සිදු කිරීම සඳහා කටයුතු සම්පාදනය කොට ඇත. තවද යන්ත්‍රවල ප්‍රායෝගික ගැටළු මග හරවා ගැනීම සඳහා නවතම යන්ත්‍ර සූත්‍ර ඒ සඳහා ගෙන්වා ගැනීම සඳහා කොන්ත්‍රාත් සමාගම දැනුවත් කොට ඇත.	නව යන්ත්‍ර ස්ථාපිත කිරීම හා පැවති යන්ත්‍ර දෝෂ නිවැරදි කල බවට තාක්ෂණ නිළධාරියෙකු ලවා පරීක්ෂාවක් සිදුකර නොමැත.
45	සැර මත්පැන් නිපදවන ප්‍රධාන සමාගමක නිෂ්පාදනාගාරයක සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ සටහන් වාර්තා අනුව, යන්ත්‍රය ස්ථාපනය කරන ලද 2022 ජනවාරි 13 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ මුද්‍රණ යන්ත්‍රය අක්‍රියව පැවතීම මත මිලි.ලී. 180 මත්පැන් බෝතල් 3,601,735 ක් සහ 2023 ජනවාරි සිට පෙබරවාරි 14 දක්වා කාලය තුළ මිලි.ලී. 180 මත්පැන් බෝතල්	2023	සුරාබදු නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඩිජිටල් සළකුණු මුද්‍රණය වීම ස්වයංක්‍රීයව සිදුවන බැවින් ඩිජිටල් සළකුණු මුද්‍රණය නොවීම පිළිබඳ පරීක්ෂා කිරීමට වෙනම පුද්ගලයින් යොදා ගනිමින් එම මුද්‍රණය නොවූ බෝතල් වෙනම හඳුනා ගනිමින් නැවත එම බෝතල් මත ඩිජිටල් සළකුණු යෙදීමේ ක්‍රමවේදයක් මේ වන විට ක්‍රියාත්මක කොට ඇත.	එම

	66,335ක් ඩිජිටල් සලකුණු මුද්‍රණය නොවීම් වාර්තා වී තිබුණි.				
46	ධාන්‍ය මත්පැන් නිපදවන ප්‍රධාන සමාගමක 2023 ජනවාරි 12 සිට 2023 සැප්තැම්බර් 19 දක්වා දක්වා කාලය තුළ එනම්, අවස්ථා 54 ක දී මුද්‍රණ යන්ත්‍රය අක්‍රියව පැවතීම හේතුවෙන් ඩිජිටල් සලකුණු මුද්‍රණය නොවු බියර් බොතල් 1,335,591 ක ප්‍රමාණයක් හා බියර් කෑන් 3,362,568 ක ප්‍රමාණයක් හඳුනාගෙන තිබුණි. එම බෝතල් හා කෑන් හඳුනාගත් ප්‍රදේශ වෙත නිකුත් කිරීම සහ අපනයනය කිරීම සඳහා සුරා බදු දෙපාර්තමේන්තුව විසින් ලිඛිත අනුමැතිය ලබාදී තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.	2023	එම	එම ඩිජිටල් සළකුණු පියවී ඇසට පෙනෙන ආකාරයටම මුද්‍රණය කිරිම සඳහා කොන්ත්‍රාත් ආයතනය එකඟ වී ඇත. සුරාබදු නිලධාරීන් හට ඩිජිටල් සළකුණු පරීක්ෂා කිරීමට UV lights ලබා දී ඇත.	උපකරණ නිසිලෙස ක්‍රියාත්මක වන බවට සාක්ෂි ලිපිගොනුවල නොමැත.
47	විනිමය අනුපාතයේ ඉහල යාම, බැංකු කොමිස්, හා සේවා ගාස්තු ගෙවීම් හේතුවෙන් මුද්‍රිත ස්ටිකර් සහ ඩිජිටල් සළකුණු සඳහා පිරිවැය ඉහල යාමක් නිරීක්ෂණය විය. දේශිය මුද්‍රිත ස්ටිකර් හා ඩිජිටල් ස්ටිකර් සඳහා මත්පැන් නිෂ්පාදන සමාගම් වලින් ස්ටිකරයක් සඳහා අයකරනු ලබන රු. 2 ක් බැවින් ඉහත පිරිවැය වැඩිවීම මත මූල්‍ය අලාභය ආවරණය කර ගැනීම සඳහා අවධානය යොමු වී නොතිබුණි.	2023	ස්ටිකර් කළමණාකරණ ව්‍යාපෘතිය සමාලෝචනය කර රජයට වැය බරක් නොවන ලෙස ක්‍රියාත්මක කල යුතුය.	ඩොලරයේ අගය ශීඝ්‍ර ලෙස ඉහල යාම නිසා ආයතනයට ගෙවීමට සිදුවන මුදල රු.2/- ට වඩා වැඩිවීම හේතුවෙන් ස්ටිකරයේ මිල සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට දන්වා ඇත.	මිල සංශෝධනයක් සිදු වී නොතිබුණි.
48	අලෙවිය සඳහා බෙදා හරින බෝතල් වල ව්‍යාජ ස්ටිකර් අලවා තිබුණු බලපත්‍ර ලත් ස්ථාන 78 සම්බන්ධයෙන් සුරාබදු නිවේදන අංක	2023	සුරාබදු ආඥා පනත අනුව කටයුතු කල යුතුය.	තව දුරටත් විමර්ශන කටයුතු සිදු වෙමින් පවතී.	පරික්ෂණ නිමවී නොමැත.

	7/2021 හි 25 වගන්තිය සහ සුරාබදු ආඥා පනතේ 27 ,47 හා 56 වගන්ති වල විධිවිධාන පරිදි නිෂ්පාදනාගාර 03 ක් සහ බලපත්‍ර ලත් ස්ථාන 78 ක් වෙනුවෙන්, එම නිෂ්පාදනාගාර 03 විසින් වගකීම භාරගෙන 2023 සැප්තැම්බර් මාසයේදී සමථකරණය වී ඇත. උපරිම සමථ ගාස්තු ලෙස රු. 500,000 බැගින් රු. මිලියන 40.5 ක් සහ සුරා බදු මුදල් හා සියයට 3 ක ප්‍රමාද ගාස්තු වශයෙන් රු. මිලියන 17.938 ක් විමර්ෂණයට භාජනය කර තිබූ නිෂ්පාදන ආයතන 3 න් අය කර ගෙන ඇති බවත් 180 ml මත්පැන් බෝතල් 55,940 ක් රාජසන්තක කර ඉදිරි ක්‍රියා මාර්ග ගනිමින් පවතින බව වාර්තා කර තිබුණ ද අදාළ පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවුනි.				
49	මුදල් අමාත්‍යාංශ සහ සුරාබදු දෙපාර්තමේන්තු ඒකාබද්ධ කමිටුව විසින් 2023 ඔක්තෝබර් 16 දින ඉදිරිපත් කල කමිටු වාර්තාව අනුව ඩිජිටල් කේතය අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම. නිෂ්පාදන ක්‍රියාවලියේ වේගයට ඩිජිටල් කේත යොදන යන්ත්‍ර වල වේගය අනුගත නොවීම නිසා ඩිජිටල් කේත අඩංගු නොවන නිෂ්පාදන වෙළඳ පොලට නිකුත්වීම,සියළුම වාර්තා ලබාගැනීමේ මොඩියුල සංවර්ධනය වී නොමැති වීම, ඩිජිටල් මුද්‍රණය වන සහ මුද්‍රණයේ දී අඩුපාඩු සිදුවන ඩිජිටල්	2023	මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරන ලද කමිටු වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.	නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ සියළුම ස්ථානයන් මේ වන විට සුරාබදු නිලධාරීන් විසින් පරීක්ෂාවට ලක් කරනු ලබයි. වෙනත් පාර්ශවයක ඍජු පරීක්ෂාවකට ලක් කිරීම හා ක්ෂණික විගණනයන් පාරදෘශ්‍යභාවය හා විනිවිදභාවය ඇතිවන ආකාරයට ක්‍රමවේද හඳුන්වාදීම කෙරෙහි අවධානය යොමු කරමින් පවතී. සුරාබදු ආඥා පනතේ 33, 34, 35 සහ 48 වගන්තිවල ප්‍රතිපාදන මේ වන විටත් ක්‍රියාත්මක	මෙම නිර්දේශ ක්‍රියාත්මක කර නොමැත.

මුද්‍රණයන් හදුනාගැනීමේ ක්‍රමවේදයක් පද්ධතිය තුල නොතිබීම,පියවි ඇසට පෙනෙන ලෙස ඩිජිටල් කේතය මුද්‍රණය කල යුතුවීම,පද්ධතිය නිරන්තරයෙන් අධීක්ෂණය සඳහා සම්පූර්ණ පරිගණක පද්ධතිය තවදුරටත් සංවර්ධනය කලයුතු බව හදුනාගෙන තිබුණි.

එම කමිටුව විසින් සිදුකර තිබුණු නිර්දේශ වලින් පහත සඳහන් නිර්දේශ වල සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා නොවුණි.

- ඩිජිටල් කේතය සහ මුද්‍රිත ස්ටිකර් සඳහා මිල පරාසය නැවත විශ්ලේෂණය කිරීම සුදුසු බව
- සුරාබදු ආඥා පනතේ 56 වගන්තිය ඉවත් කිරීම හෝ සමථකරණ ගාස්තු ඉහල නැංවිය යුතු බව
- 7/2021 සුරාබදු නිවේදනයේ 15 වගන්තිය ප්‍රකාරව ආරක්ෂිත සලකුණු වල ආකෘතිය, ස්භාවය, විවෘත, ආවෘත හා වෝහාරික සළකුණු ආකෘති වෙනස්කල යුතු වීම හා ඒ පිළිබඳ මහජනයා සහ සුරාසැල් හිමියන් දැනුවත් කිරීමට ක්‍රමවේද සැලසීම.
- ආරක්ෂිත ස්ටිකරයක් සඳහා නිෂ්පාදකයාගෙන් අයකල යුතු රු.2 ක මිල වර්තමානයට ගැලපෙන ලෙස කරමින් සුරා වෙළඳසැල් සහ නිෂ්පාදනාගාර නිරන්තරයෙන් වැටලීම් සිදු කරන අතර තව දුරටත් ව්‍යාජ ස්ටිකර් පරීක්ෂාවන් සඳහාම සුරාබදු චක්‍රලේඛයක් නිකුත් කරමින් මෙම ව්‍යාජ ස්ටිකර් අඩංගු මත්පැන් බෝතල් පරීක්ෂාවන් තර කර ඇත.

සියළුම දේශීය නිෂ්පාදකයන් සඳහා ඩිජිටල් කේත ක්‍රමය යොදා ගැනීමේදී ප්‍රායෝගික ගැටළු මතුවේ. නමුත් සියළුම දේශීය මත්පැන් නිෂ්පාදකයන් සඳහා මුද්‍රිත ස්ටිකරය (Paper Base) යොදා ගැනීමේ හැකියාවක් පවතින්නේද යන්න පිළිබද අධ්‍යයනය කරමින් පවතී.

	සංශෝධනය කිරීම. • විධිමත් අධ්‍යනයකින් හා පිරිවැය විශ්ලේෂණයකින් ඩිජිටල් කේත ක්‍රමය සියළුම දේශිය මත්පැන් නිෂ්පාදනයන් සඳහා යොදා ගැනිම උචිත බව				
50	දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2022 දෙසැම්බර් 27 දින අනුමැතිය ලබාදී තිබුණු ඡායාපිටපත් යන්ත්‍ර මිලදී ගැනීමේ දී තෝරාගත් ලංසුකරු ඡායා පිටපත් යන්ත්‍ර 11 ක් සැපයීමේදී ට්‍රේ 2 ක් සහිත යන්ත්‍ර සැපයීමට එකග වී තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින ට්‍රේ එකක් සහිත යන්ත්‍ර සපයා තිබීම නිසා ලංසුකරු පිරිවිතර වලට අනුකූල නොවන ලෙස භාණ්ඩ සැපයීමේ දී පිරිවිතර වලට අනුව නිවැරදිව භාණ්ඩ භාරගැනිමකින් තොරව 2022 දෙසැම්බර් 31 දිනට චෙක්පත් ලියා තිබුණි. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) ජේදය ප්‍රකාරව සැපයුම් කොන්ත්‍රාත් ගිවිසුමකට එලැඹීම සහ ඡායා පිටපත් යන්ත්‍ර භාර ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 ජේදය ප්‍රකාරව කටයුතු සිදුවී නොතිබුණි.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කල යුතුය.	ඡායා පිටපත් යන්ත්‍රයට කොල ඇතුලත් කරන ට්‍රේ 02 ක් තිබිය යුතු වුවත්, සැපයුම්කාර සමාගම ට්‍රේ 01 ක් සහිතව යන්ත්‍ර සැපයීම නිසා දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා තිබූ ට්‍රේ 02 අදාල යන්ත්‍ර වෙත සපයන ලෙස සැපයුම්කාර සමාගමට දන්වා ඔවුන් එම සැපයීම සිදුකර නිවැරදි බවට තහවුරු කල පසුව සියලුම ගෙවීම් සිදුකර ඇත. ඉදිරියේදී සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන්වලදී පෙන්වාදී ඇති අඩුපාඩුව සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කර ඇත.	ඉදිරියේදී පෙන්වාදී ඇති අඩුපාඩුව සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට නිලධාරීන් දැනුවත් කිරීම සම්බන්ධව තොරතුරු නොමැත.
51	සුරාබදු දෙපාර්තමේන්තුවේ ආරක්ෂක සේවා සහ ආරක්ෂිත කැමරා පද්ධති ස්ථාපිත කර තිබියදිත්	2023	මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය	ජෙනරේටර් යන්ත්‍රය අස්ථානගත වීම, සොරකම් කිරීම සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයක් පැවැත්වේ.	අදාළ අස්ථාන ගතවීම සම්බන්ධයෙන් වාර්තා කර ඇති රු. මිලියන 4.13

	සුරාබදු දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ස්ථාන ගත කර තිබුණු විදුලි ජනක යන්ත්‍රයේ උපාංග 2023 සැප්තැම්බර් 04 දින අස්ථාන ගත වීම හේතුවෙන් රු. 4,130,300 ක පාඩුවක් මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කර තිබුණි. මේ සම්බන්ධව මුදල් රෙගුලාසි 104(03) ප්‍රකාරව ප්‍රාරම්භක පරීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. මෙම සිදුවීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග වල ප්‍රගතියද විගණනයට වාර්තා නොවුණි.			තවද, මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භ පරීක්ෂණයක් සිදුකර ඇති අතර, අවසාන පරීක්ෂණය සිදුකර ඉදිරියේදී විගණනයට වාර්තා කරන බව කාරුණිකව දන්වමි.	පාඩුව සම්බන්ධ වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගැනීම මෙතෙක් සිදු වී නොමැත. 2024 වර්ෂයේ අක්‍රිය විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා රු මිලියන 4.5 ක් නව ප්‍රසම්පාදනයකට කටයුතු කරමින් පවතී.
52	බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර 23 ක් අතුරින් රාජ්‍ය ආදායමට ඉතා අඩු දායකත්වයක් දක්වනු ලබන නිෂ්පාදනාගාර සමාගම් 6 ක් පිළිබඳව සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමනයේ ඇති කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා සිදු කළ කාර්යසාධන විගණනයේදී නිරීක්ෂණය වූ කරුණු ඇතුලත් වාර්තාවේ කරුණු 19 ක් මගින් කර තිබූ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ප්‍රමාණවත් මට්ටමක නොතිබුණි.	2021	නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව අවධානය යොමු කළ යුතු අතර ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය විගණකාධිපති වෙත වාර්තා කල යුතුය.	ගිණුම්කාරක සහා නිර්දේශ ක්‍රියාත්මක කිරිම යටතේ ක්‍රියාත්මක කල නිර්දේශ වාර්තා කර ඇත.	පෙන්වා දෙන ලද නිර්දේශ වල ඇතුලත් ඒකාබද්ධ පරිගණක පද්ධති ස්ථාපනය, ස්කාගාර ස්ප්‍රිතු නිෂ්පාදන ක්‍රියාවලිය පරිගණක ගත කිරීම,මත්පැන් බලපත්‍ර සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවිම, නිෂ්පාදනාගාර වල ලේබල්, බෝතල් මූඩි සහ සම්බන්ධතාවය පරීක්ෂාව සහ සුරාබදු ආදායම් පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී මධ්‍යසාර භාවිතයේ අහිතු ප්‍රතිවිපාක හේතුවෙන් දැරීමට සිදුවන ඍජු සහ

					වක්‍ර පිරිවැය පිළිබඳව සැලකිල්ලට ලක් කිරීම. ආදී නිර්දේශ සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.
53	දේශිය වෙළෙඳපොළේ ආනයනය කරනු ලබන ආනයනික විදේශ මත්පැන්වලට අදාළව සුරාබදු ර.බී. 03 බලපත්‍රලත් ස්ථාන වලින් 2021 පෙබරවාරි 19 දිනැති අංක 04/2021 දරන සුරාබදු චක්‍රලේඛනය අනුව අර්ධවාර්ෂික වශයෙන් මත්පැන් වර්ග වලින් නිදර්ශක ලබාගෙන රසපරීක්ෂක වෙත යවා වාර්තා ලබාගෙන ප්‍රමිතිය හා ගුණත්වය තහවුරුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ එවැනි වාර්තා සඳහා නිදර්ශක ලබා ගෙන තිබුණේ ස්ථාන **6**ක අවස්ථා 53 කදී පමණි.	2021	ආනයනික විදේශ මත්පැන්වලට අදාළව ප්‍රමිතීන් හා පිරිවිතරයන්ට අනුකූලතාවය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ට වෙත පැවරී ඇති වගකිම ඉටුවන අයුරින් කටයුතු කළ යුතුය.	අදහස් දක්වා නොමැත.	සාම්පල් රස පරික්ෂක වෙත ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය,ගුදම් හා මත්පැන් නිෂ්පාදනාගාර, ස්කාගාර, ආනයනික විදේශ මත්පැන්,අපනයන ය මත විදේශ මත්පැන් වල නිදර්ශන සහ බෝතල්ගත රා ,රා තැබෑරුම් ,වතු රා කැන්ටින්වල රා නිදර්ශන රස පරික්ෂක වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධව 4/2022 විස්තරාත්මක චක්‍රලේඛනය නිකුත් කර තිබුණ ද ඒ අනුව ක්‍රියාත්මක වන බවට තොරතුරු විගණනයට ඉදිැරිපත් නොවුණි.
54	**අපරාධ ග්‍රහන හා කාර්මික අපරාධ ග්‍රහන ඉලක්ක** 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්තුවකට 9,250 බැගින් අපරාධ ග්‍රහන ඉලක්ක 37,000 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු අතර ග්‍රහනයන් 39,436 ක්				

	සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අපරාධ ග්‍රහන පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.				
55	2023 වර්ෂය සඳහා අපරාධ ග්‍රහන ඉලක්ක 37,000 ක් සහ කාර්මික අපරාධ ග්‍රහන 4,000 ක් වශයෙන් මුළු ග්‍රහන 41,000 ක් සැලසුම් කර වර්ෂය තුල අපරාධ ග්‍රහන 39,436 ක් හා කාර්මික අපරාධ ග්‍රහන 5,499 ක් වශයෙන් මුළු ග්‍රහන 44,935 ක් 2023 වර්ෂය සඳහා සිදු කර තිබුණි. සුරාබදු දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය රාජකාරියක් වන නීති ක්‍රියාත්මක කිරීමේ කාර්යය දර්ශකයන් ලෙස යොදා ගන්නා කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50 000 ක සීමාවට ආසන්නව තබාගැනිමේ අවශ්‍යතාවය මුදල් අමාත්‍යාංශය විසින් අවධාරණය කර ඇත.	2023	කාර්මික අපරාධ සහ අපරාධ ග්‍රහන සංඛ්‍යාව හැකිතාක් 50,000 ක සීමාවට ආසන්නව තබා ගැනිමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමුකල යුතුය.	සමාලෝචිත කාලසීමාවට අදාලව විගණන නිරීක්ෂණ වල දක්වා ඇති දත්ත සමග එකඟ වන බව.	2024 වර්ෂයේ කාර්තුවකට 1,125 බැගින් කාර්මික අපරාධ ග්‍රහන 4,500 ක් කාර්තුවකට 9,750 බැගින් අපරාධ ග්‍රහන 39,000 ක් සැලසුම් කර 2024 ජූනි 30 දිනට පිළිවෙලින් කාර්මික අපරාධ 2,592 හා අපරාධ ග්‍රහන 18,930 සිදුකර ඇත .
56	අපරාධ ග්‍රහන ඉලක්ක සපුරාලීම පිළිබඳ ප්‍රගතිය පරික්ෂාවේදී 2023 වර්ෂයට දී තිබුණු ඉලක්කයන් ඉක්මවා ග්‍රහනයන් සිදුකර තිබුණ ද, සුරාබදු ස්ථාන 25 ක නියමිත ඉලක්කයන් සපුරා නොතිබූ බව නිරීක්ෂණය වූ අතර ඉන් සුරාබදු ස්ථාන 02 ක සියයට 75 කට අඩු ප්‍රතිශතයකින් ද සුරාබදු ස්ථාන 06 ක් සියයට 90 කට අඩු ප්‍රතිශතයකින් ද සුරාබදු ස්ථාන 17 ක් සියයට 90 ත් සියයට 100 ත් අතර ප්‍රතිශතයකින් ද ඉලක්කයන් සපුරා	2023	එම	සංශෝධිත ඉලක්කයන් කරා ලගා නොවූ සුරාබදු ස්ථාන සඳහා වගඋත්තර විමසීමේ හා අවවාද කිරීමේ ලිපි යොමු කර ඇත.	2024 වර්ෂයේ මුල් අර්ධ වර්ෂයට අදාළව ඉලක්ක සැපිරීම පහල මට්ටමක ඇති සුරාබදු ස්ථාන පවති.

	නොතිබුණු බව නිරීක්ෂණය විය.				
57	**තිරසර සංවර්ධනය** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 ප්‍රකාරව සුරාබදු දෙපාර්තමේන්තුව අරමුණු 15 කට අදාළව ලඟා කර ගත යුතු ඉලක්ක 37 කින් 2022 වර්ෂය සඳහා අරමුණු 05 ක් යටතේ ඉලක්කයන් 07 ක් හඳුනා ගෙන තිබුණු අතර එහි ඇතුළත් පාරිසරික හා සමාජීය ආරක්ෂණය සඳහා හඳුනා ගත් තිරසර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා රැස්වීම්වල දී ද අවධානය යොමු කර නියෝග ලබා දී තිබුණි. රසායනාගාරයක් ස්ථාපිත කිරීම හා අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදන වන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හා ඒවා ප්‍රතිචක්‍රීකරණය ආදී ක්ෂේත්‍රයන්ට අදාළ ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවිණි.	2022	එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය යටතේ වූ අරමුණු 15 කින් හඳුනාගෙන තිබූ අරමුණු 05 ක් යටතේ වූ ඉලක්කයන් 07 ඉටුවීම සම්බන්ධව වාර්ෂිකව ඇගයීමක් කල යුතුය.	2022 සිව් වන කාර්තුවට අදාලව ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව අනුව මත්පැන් සඳහා නිසි ප්‍රමිති හඳුන්වා දීම 65% ක්, රසායනාගාර ස්ථාපිත කිරීම 40% ක් සහ වාර්ෂික සුරා කර්මාන්තයෙන් අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදනය වන අපද්‍රව්‍ය පරිසරයට මුදාහැරීම හා ඒවා ප්‍රතිචක්‍රීකරණය නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම 85% කින්ද ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව	අපද්‍රව්‍ය උත්පාදනය වීම වැළැක්වීම සඳහා යෝජිත පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රමවේද ස්ථාපිත කිරීම හා උත්පාදන වන අපද්‍රව්‍ය පරිසරයට මුදා හැරීම හා ඒවා ප්‍රතිචක්‍රීකරණය ආදී කේෂත්‍රයන්ට අදාළ වාර්ෂිකව ඇගයීමක් සිදු කර නොතිබුණි.
58	සුරාබදු ප්‍රධාන කාර්යාලයේ 1913 කෙටි සංකේත දුරකථනය ඔස්සේ සුරාබදු මෙහෙයුම් මැදිරිය වෙත මහජනතාව වෙතින් පැමිණිළි 899 ක් ලැබී තිබුණු අතර, ඉන් 317 විශේෂ මෙහෙයුම් ඒකකය වෙත ද 554 ක් ද ප්‍රාදේශිය කාර්යාල වෙත 28 ක් මත්ද්‍රව්‍ය නාශක	2023	මෙහෙයුම් මැදිරිය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධව කඩිනමින් ක්‍රියාකිරීම හා ඒ සම්බන්ධව පසුවිපරම් කලයුතුය.	2024 මාර්තු 31 දිනට සාර්ථක ග්‍රහනයන් 365 ක් හෙවත් සියයට 41 ක් සිදුකර ඇත.	2024 වර්ෂය සඳහා පැමිණිලි 500 ක් ඇස්තමේන්තු කර ඇත. පැමිණිලි 460 ක් ලැබි සුරාබදු ස්ථාන වෙත යොමුකර ඇති බව වාර්තා කර ඇත.

	ඒකකයට ද යොමු කර තිබුණු අතර ඉන් 2023 දෙසැම්බර් 31 දිනට සිදුකල සාර්ථක ග්‍රහනයන් 356 ක් හෙවත් සියයට 39 ක් විය.				
59	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළ පුරප්පාඩු 38 ක් පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව තනතුරු පුරප්පාඩු සඳහා වැඩ බැලීම් හා රාජකාරි ආවරණය කිරීම් යටතේ නිළධාරීන් පත්කර තිබුනි.	2023	අත්‍යාවශ්‍ය පුරප්පාඩු තනතුරු පිරවීමටත් අනවශ්‍ය තනතුරු යටපත් කිරීමටත් කටයුතු කල යුතුය.	ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාලව අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුරක්, ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුරක්, සුරාබදු කොමසාරිස් තනතුරු 02 ක්, නියෝජ්‍ය සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක්, සහකාර සුරාබදු කොමසාරිස් තනතුරු 08 ක්, සුරාබදු අධිකාරී තනතුරු 18 ක් පුරප්පාඩුව පැවතිණි. නමුත් ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර 2022.12.31 දිනට පෙර දාතම්කර පත්වීම 2024.02.01 දින ලබා දී ඇත.	දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අදාළව සුරාබදු කොමසාරිස් ජනරාල් තනතුර සහ සුරාබදු කොමසාරිස් ආදායම් තනතුර කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිළධාරින් පත්කර ඇත.අනිකුත් තනතුරු ,රාජකාරි ආවරණය රාජකාරි ඉටු කිරිම යටතේ තව දුරටත් ඉටුකරමින් පවති.

51. ශීර්ෂය - 249 භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	102,316,641	102,316,641	(3,447,457,199)	තත්ත්වාගණනය නොකළ
2022	100,945,755	100,945,755	(4,343,885,837)	තත්ත්වාගණනය නොකළ
2023	112,215,735	112,215,735	(5,615,606,104)	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂය සඳහා ආදායම් සංකේතාංක 12 ක් යටතේ රු.90,070,000,000 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සියළුම ආදායම් සංකේතාංකවල මූලික ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. ආදායම් සංකේතාංක 03 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.23,100,000,000 කින් අඩු කර තිබුණි. ආදායම් සංකේතාංක 09 ක මුළු ආදායම් ඇස්තමේන්තු එකතුව රු.44,980,000,000 කින් වැඩි කර තිබුණි. 2003.05.00 භාණ්ඩාගාර බැඳුම්කර අධිහාරය මුල් ආදායම් ඇස්තමේන්තුවේ සඳහන් රු.31,000,000,000 ක ආදායම රු.13,000,000,000 කින් අඩු කර ආදායම් ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණි. සමස්තයක් වශයෙන් දෙපාර්තමේන්තුව විසින් මුල් ආදායම් ඇස්තමේන්තුව අනුව රැස්කිරීමට අපේක්ෂා කර තිබු ආදායම රු.21,880,000,000 කින් වැඩි කර ඇස්තමේන්තුව සංශෝධනය කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට	2023 2022 2021	මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.	මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන සියලුම විශේෂ වියදම් ඒකක ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මඟින් වාර්ෂික ඇස්තමේන්තු ගෙන්වාගෙන ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කර ඇත. <u>ආදායම් සංකේත අංක 2003.05.00 ට අදාළව</u> වර්ෂය තුලදී දේශීය ණය ප්‍රශස්තකරණ වැඩසටහන යටතේ භාණ්ඩාගාර බැඳුම්කර ද ඇතුළුව දේශීය ණය ප්‍රශස්තකරණය සිදුකරන ලදී. වර්ෂය තුල දී නව භාණ්ඩාගාර බැඳුම්කර සැලසුම් කල පරිදි වෙළඳපලට නිකුත් කිරීමට නොහැකි වීම මත හා නිකුත්	ආදායම් ඇස්තමේන්තු සංශෝධනය තවදුරටත් සිදුවන බව නිරීක්ෂණය විය.

	ආදායම් සංකේත 12 කින් රු.391,279,705,499 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අතරින් ආදායම් සංකේත 11 ක මුල් ආදායම් ඇස්තමේන්තු ඉක්මවා ආදායම් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් ඇස්තමේන්තු කිරීම හා ඒවා සංශෝධනය කිරීම තාත්වික පදනමක් මත සිදු වී නොතිබුණු බව නිරීක්ෂණය විය.			කල භාණ්ඩාගාර බැදුම්කරද වට්ටමකට නිකුත් කිරීමට සිදුවිය. ඒ හේතුවෙන් මුල් ඇස්තමේන්තුව වූ රු.31,000,000,000 ක ආදායම රු.18,000,000,000 දක්වා සංශෝධනය කිරීමට සිදු විය.	
02	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව, සත්‍ය ආදායම සමඟ සැසඳීමේදී ආදායම් සංකේතාංක 7 කට අදාළව සියයට 59 සිට සියයට 510 ක් දක්වා පරාසය තුළ වෙනස් වී තිබුණ බව නිරීක්ෂණය විය.	2023 2022	මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්ත්වික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.	මු.රෙ. 85 හි සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන සියලුම විශේෂ වියදම් ඒකක ආයතන ප්‍රධානීන් හා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මඟින් වාර්ෂික ඇස්තමේන්තු ගෙන්වාගෙන ආදායම් ඇස්තමේන්තු පිලියෙල කිරීමට කටයුතු කර ඇත. 2025 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු චක්‍රලේඛය 2024.05.22 දින නිකුත් කර ඇත.	2023 වර්ෂය අවසාන වන විටත් මෙවැනි විචලනයන් අනාවරණය වී තිබුණි.
03	2023 දෙසැම්බර් 31 දිනට ආදායම් සංකේතාංක 08 කට අදාළව හිඟ හිටි ආදායම රු.2,434,967,737 ක් වූ අතර ඒ තුළ වසරකට වඩා වැඩි හිඟ හිටි ආදායම රු.2,240,661,755 ක් පැවැතුණි.	2023 2022 2021	හිඟ හිටි ආදායම් අයකර ගැනීමට කාර්යක්ෂමව කටයුතු කළ යුතු වීම.	2024.08.20 දින රැස්වීමක් පවත්වා හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට හා හිඟ ආදායමකින් තොරව ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතු බව අදාළ ආයතන	මෙ දක්වා සම්පූර්ණ හිඟ මුදල් අය කරවාගෙන නොතිබුණි.

				දැනුවත් කර ඇත.	
04	2022 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති හිඟ ආදායමට සාපේක්ෂව 2023 දෙසැම්බර් 31 දින වන විට සමස්ත හිඟ හිටි ආදායම සියයට 100 අඩු වීමේ සිට සියයට 91 ක වැඩිවීමක් දක්වා වූ පරාසයක විචලනය වී තිබුණි.	2023 2022			
05	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් පාලන අමාත්‍යාංශයේ ආදායම් සංකේත අංක 20.03.02.99 යටතේ 2018 දෙසැම්බර් 31 දිනට පෙර පැවැති සමුච්චිත හිඟ ශේෂය වූ රු.259,079 ක් ද 2020 වර්ෂයට අදාළ රු.232,927 ක් ද වශයෙන් එකතුව රු.492,006 ක වටිනාකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ක්ෂය පදනම යටතේ ලබා දෙන කාර්යාල උපකරණ සඳහා අයවිය යුතු මුදලක් වූ අතර, එම මුදල අදාළ මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තුවට තේරී පත්වී නොමැති බැවින් හා මිය යෑම හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම හිඟ මුදල වසර 5ක පමණ කාලයක සිට ඉදිරියට එමින් පවතින අතර, මෙම මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	2022	හිඟ හිටි ආදායම් අයකර ගැනීමට කාර්යක්ෂමව කටයුතු කළ යුතු වීම	මෙම හිඟ ආදායම් සම්බන්ධයෙන් අයකර ගැනීම හෝ 2024.05.29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2024 අනුව අත්හැර දැමීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙස 2024.08.20 දින රැස්වීමක් පවත්වා අදාළ දැනුවත් කිරීම් කර ඇත.	මේ දක්වා හිඟ ආදායම් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.
06	ආදායම් සංකේත අංක 20.06.04.00 ප්‍රාග්ධන ආදායම් - ණය ආපසු අයකර ගැනීම් යටතේ ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව හා සී/ස බදුල්ල දිස්ත්‍රික් සණස සංගමයට අදාළව 2018 දෙසැම්බර් 31 දක්වා පිළිවෙලින්	2023	හිඟ හිටි ආදායම් අයකර ගැනීමට කාර්යක්ෂමව කටයුතු කළ යුතු වීම.	<u>**ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන සහ අපනයන සංස්ථාව**</u> 2024.08.26 දින හිඟ මුදල් අයකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ කරුණු විමසීම සඳහා	මේ දක්වා හිඟ ආදායම් සම්පූර්ණ වශයෙන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

රු.763,814,250 හා රු.111,114,479 ක් වශයෙන් එකතුව රු.874,928,729 ක හිඟ හිටි ආදායම් ශේෂයක් සහ ආදායම් සංකේත අංක 20.02.02.01 පොළිය-ණය දීම යටතේ උක්ත ආයතනයන්ට අදාළව පිළිවෙලින් රු.612,893,552 ක් හා රු.2,814,035 ක් සහ සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් සඳහා වූ රු.296,351,801 ක් වශයෙන් එකතුව රු.912,059,388 ක හිඟ පොළී ආදායමක්ද, 2018 වර්ෂයට පෙර සිට ඉදිරියට එමින් පැවති අතර, මෙම ආදායම අයකර ගැනීම පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතින බව නිරීක්ෂණය විය.

අමාත්‍යාංශ නිළධාරීන් සමඟ රැස්වීමක් පවත්වන ලද අතර දැනට උපලබ්ධි කිරීමට නියමිත වත්කම් උපලබ්ධි වීමෙන් පසු ණය මුදල් පියවීම පිළිබඳ හැකියාව වාර්තා කිරීමට එකඟ විය.

<u>සණස සංගමය බදුල්ල</u>

දෙපාර්තමේන්තුව විසින් 2023.12.05 දිනැති ලිපිය මගින් නඩු පැවරීමේ කටයුතු ආරම්භ කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත.

<u>සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය</u>

තවදුරටත් රු.541,395,760 හිඟ ණය මුදලක් ඇති අතර 2024 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දිනට පෙර රු.40,000,000 ක මුදලක් ලැබීමට නියමිතව තිබුණද එයින් රු.4,425,000 ක මුදලක් 2024.11.12 දින ලැබී ඇති අතර ඉතිරි මුදල සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවා (ගැරන්ටි) ලිමිටඩ් ආයතනයට ලාභාංශ ලැබීමෙන් අනතුරුව ගෙවීමට

				එකඟ විය.	
07	සමාලෝචිත වර්ෂය තුළ ගනුදෙනු කිසිවක් සිදු නොවී පවත්වාගෙන යන, 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.228,825,376 ක් වූ තැන්පත් ගිණුම් 12 ක් පැවතුණි. මෙම තැන්පත් ගිණුම් අතුරින් ගිණුම් 11 ක් විදේශ ප්‍රදාන ලැබීම්වලට අදාළ වන අතර, එක් තැන්පත් ගිණුමක් තෙවන පාර්ශවය වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවා ගන්නා තැන්පතු වලට අදාළ වේ.	2023/ 2022	ප්‍රදාන, ඒවා ලබා දී ඇති අරමුණට යෙදවීමට කටයුතු කිරීම හෝ එසේ කළ නොහැකි නම් මු.රෙ. 570 අනුව අවස්ථාවෝචිතව අදාළ ගිණුමට හෝ රාජ්‍ය ආදායමට බැරකල යුතුය.	2023 වර්ෂයේ ගනුදෙනු සිදු වී නැති විදේශ ප්‍රදාන ගිණුම් 11 ක් වූ රු.108,111,728 ක මුදලින් ගිණුම් 08 ක වූ රු.72,308,808ක මුදලක් රජයේ ආදායමට බැර කර ඇති අතර ඉතිරි ගිණුම් 03 හි වන රු.35,802,919 ක මුදල ගිණුම් ගත කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ දැනුවත් කර තිබුණි.	2023 වර්ෂය අවසාන වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
08	විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන පරිගණක පද්ධතියේ CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ මුළු විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් යටතේ සටහන් අංක 24(II) මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන17,103.2 ක් ලෙස දක්වා තිබුණි.මෙලෙස සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම මීට පෙර වර්ෂවලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023 2022 2021	රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.	තවදුරටත් ගිණුම්ගත කිරීමට ඇති ණය මුදල් සම්බන්ධයෙන් අදාල විගණන කාර්යාල වලටද පිටපත් සහිතව අදාල අමාත්‍යාංශ දැනුවත් කර ඇති අතර, මේ සම්බන්ධව 2024.10.21 දින රැස්වීමක්ද පවත්වා ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග සම්බන්ධව අදාල ආයතන දැනුවත් කර ඇත. මින් ඉදිරියට මෙවැනි තත්ත්වයක් ඇති නොවන ලෙස කටයුතු කිරීම පිණිස අදාල පාර්ශව දැනුවත් කර ඇත.	එම

09	2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමඟ එකතු වටිනාකම් ජපන් යෙන් 700,000, යුරෝ 132,710,000 ඇමෙරිකානු ඩොලර් 58,417,841එ කොරියන් වොන් 400,000 චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වු විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට අනාවරණය නොවුණි.	2023	ලැබුණු විදේශ ප්‍රදාන උපරිම ලෙස උපයෝජනය කළ යුතු වීම.	අත්සන් කරන ලද ගිවිසුම් වලට අදාළව මුදල් ලැබීමෙන් පසුව පමණක් එක් එක් ව්‍යාපෘති වලට අදාළ විස්තර මෙම දෙපාර්තමේන්තුව විසින් වාර්තා ගත කරනු ලැබේ.	එම
10	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රු.190,789,890,831 ක උපණය ශේෂයක් ලැබිය යුතුව පැවතුණි. අදාළ ආයතනය උපණය ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ක ට වඩා වැඩි රු.1,316,324,489 ක හිඟ උපණය ශේෂයක් පැවතුණි.	2023 2022	රාජ්‍ය උපණය ලබා දීම, පාලනය හා උපණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කළ යුතු වීම.	2024 අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක වීමත් සමඟ ණය අවධානම් තක්සේරුවක් මත පදනම්ව ගැණුම්කරු යම් මූල්‍ය අපහසුතාවකින් යුක්ත නොවන බවට නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව පමණක් උප ණය නිකුත් කරනු ලැබේ.	මේ වන විටත් සම්පූර්ණ හිඟ උපණය ශේෂය අයවී නොතිබුණි.
11	2023 දෙසැම්බර් 31 දිනට උප ණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම රු.9,439,025,443 ක් වු අතර, ආයතන 03 කට අදාළව ගිවිසුම් ප්‍රකාරව නොගෙවූ වසර 05 කට වඩා වැඩි නොගෙවූ පොළී වටිනාකම් එකතුව රු.912,059,388 ක් වී තිබුණි.	2023 2022	-එම-	-එම-	මේ වන විටත් උප ණය වෙනුවෙන් ලැබිය යුතු පොළි වටිනාකම් අය වී නොතිබුණි.

12	සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 10 ක දී නිකුත් කළ රු.මිලියන 115,977 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 10ක දී නිකුත් කළ රු.මිලියන 28,838 ක් වටිනා සහන ලිපි 2023 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, අදාළ වලංගු කාලය ඉක්මවීමට පෙර විධිමත් පරිදි අවසන් කිරීමට හෝ වලංගු කාලය දීර්ඝ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.	2023 2022	-එම-	-එම-	2023 වර්ෂය අවසාන වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
13	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක් ද, ද්විතීයික මට්ටමේ නිලධාරී තනතුරු 15 ක් ද හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීමට අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමටත්, අනවශ්‍ය තනතුරු වේ නම් ඒවා සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම.	2023.12.31 දිනට පැවති පුරප්පාඩු පිරවීම සඳහා පහත පරිදි ක්‍රියා මාර්ග ගෙන ඇත. ද්විතියික මට්ටමේ පුරප්පාඩු 15 හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 සඳහා නිලධාරීන් ලබා දෙන ලෙස මුදල් අමාත්‍යාංශය මඟින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් කර ඇත. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිළිබඳවද මුදල් අමාත්‍යාංශ ලේකම් මඟින් අදාල පත්වීම් බලධාරීන් වෙත දන්වා ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. තවද ජ්‍යෙෂ්ඨ මට්ටමේ මෙන්ම ද්වියිතික හා ප්‍රාථමික තනතුරු පුරප්පාඩු සඳහා	මේ වනවිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ තනතුරු 03 ක් ද ද්විතීයික මට්ටමේ නිලධාරි තනතුරු 15 ක් ද හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක් ද පුරප්පාඩුව පැවතුණි.

ඉල්ලීම් කරන ලද වෙනත් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ ඉල්ලීම් නිර්දේශ කර අදාල පත්වීම් බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත. එම ආයතන වලින් නිලධාරීන් නිදහස් කිරීම අනුව ඉතිරි පුරප්පාඩුද පිරවීමට අපේක්ෂිත වේ.

52. ශීර්ෂය - 250 රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	237,099,524	237,099,524	236,590,858	තත්ත්වාගණනය කළ
2022	187,491,761	187,491,761	187,003,763	තත්ත්වාගණනය නොකළ
2023	184,500,755	184,500,755	184,245,170	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තා වේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	පුනරාවර්තන වැය විෂයයන් 5 ක් සහ මූලධන වැය විෂයයන් 4 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.40,032,321 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර, එය එක් එක් වැය විෂයයන්ගේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 100 දක්වා වූ පරාසයක විය.	2023 2022	මු.රෙ. 50 විධිවිධාන අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු වීම.	2025 වර්ෂය සඳහා මූලික වියදම් ඇස්තමේන්තුව සැකසීමේදී මෙ සම්බන්ධයෙන් අවධානය යොමු කර මු.රෙ. 50 විධිවිධාන ප්‍රකාරව හැකිතාක් නිවැරදි ඇස්තමේන්තු පිළියෙළ කිරීමට කටයුතු කර ඇත.	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම තත්ත්වය පැවතුණි.
02	2023 දෙසැම්බර් 31 දිනට විවිධ අත්තිකාරම් ගිණුමේ හිඟ ශේෂය තුල වර්ෂ 05 ට වැඩි රු.124,317,823 ක අත්තිකාරම් ශේෂයක් පැවති අතර එම ශේෂයෙන් සියයට 88 ක් පොළොන්නරුව, අනුරාධපුර සහ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් අයවිය යුතුව පැවතුණි. එම හිඟ අත්තිකාරම් වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි.	2023	පසුවිපරම් කටයුතු විධිමත් කරමින් හිඟ ශේෂ නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් ඉදිරි පියවර ගත යුතු වීම.	හිඟ ශේෂ නිරවුල් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර පහත පරිදි වේ. • පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් නිරවුල් කළයුතු රු. මිලියන 19 ක මුදල හා පිරිවැයට වඩා අඩු මිලට සහල් විකිණීම හේතුවෙන් සිදුව ඇති බවට හඳුනාගෙන ඇති රු.මිලියන 2.9 ක මුදල කපා හැරීම සඳහා ඉදිරිපත් කර තිබූ අයදුම්පත් සම්බන්ධයෙන් සවිස්තරාත්මක	හිඟ ශේෂ මේ දක්වා නිරවුල් කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

තොරතුරු හා වරදක් හෝ වංචාවක් නිසා මෙම අලාභය සිදු නොවී ඇති බවට සනාථ කෙරෙන ලියවිලි සමඟින් අයදුම්පත් නැවත ඉදිරිපත් කරන ලෙස ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව දන්වා ඇත.

- අනුරාධපුරය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

අනුරාධපුර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් කපා හැරීමට ඉදිරිපත් කර තිබූ රු.මිලියන 2 ක මුදල කපා හැරීමට ඇති නීතිමය හැකියාව සම්බන්ධයෙන් නීති කටයුතු දෙපාර්තමේන්තුව වෙතින් විමසීම් සිදු කර තිබුණි.

නොච්චියාගම විවිධ සේවා සමුපකාර සමිතියෙහි වත්කම් උපලබ්ධි කළ පසු ප්‍රථමයෙන්ම හිඟ අත්තිකාරම් නිරවුල් කිරීමට එකඟ වී ඇත.

එප්පාවල විවිධ සේවා සමූපකාර සමිතිය විසින් එකඟ වූ පරිදි 2023 ඔක්තෝබර් මස සිට මසකට රු.30,000/- බැඟින් වාරික වශයෙන් හා වාර්ෂිකව රු.500,000/- ක් ගෙවීම ආරම්භ කර ඇත.

ගොවිජන සේවා

				මධ්‍යස්ථාන හා විවිධ සේවා සමුපකාර සමිති වෙතින් නිරවුල් විය යුතු රු.මිලියන 18 ක මුදල් සම්බන්ධයෙන් වන නඩු කටයුතු අවසන් වී නොමැති අතර නඩු කටයුතු අවසන් වූ පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. • අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අම්පාර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයට අදාල රු.මිලියන 16.7 ක මුදල සම්බන්ධයෙන් සිදුකරන විනය පරීක්ෂණයන්හි ප්‍රගතිය හා රු. මිලියන 21.4 ක මුදල සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය ක්‍රියා මාර්ගයන්හි ප්‍රගතිය සෑම නඩු වාරයක් අවසානයේදීම වාර්තා කිරීමට කටයුතු කරන ලෙස අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා අම්පාර ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත දැනුම් දී ඇත.	
03	භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ ඇස්තමේන්තුගත පිරිවැය	2023	දැනටමත් පසුගාමී වී ඇති බැවින්,පද්ධතිය කඩිනමින් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම.	ITMIS හඳුන්වාදීම 2010 වර්ෂයේ සිට මූල්‍ය කළමනාකරණ කාර්යක්ෂමතා ව්‍යාපෘතිය (FMEP) මගින් සිදුකර ඇත. එම පද්ධතියේ ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍ර ව්‍යාප්ති කටයුතු 2019 වසරේ සිට විවිධ	මේ වන විටත් ITMIS පද්ධතිය සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවන බව අනාවරණය විය.

රු.මිලියන 7,920 කට සමාන ඇ.ඩො. මිලියන 60 ක් වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ආසන්න වශයෙන් වසර 13 ක කාලයක් ගත වී තිබු අතර, විගණනයට ලද තොරතුරු මත රු.මිලියන 5,647 ක වියදමක් දරා තිබුණද, මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන තත්ත්වයකට පත් වී නොතිබුණි. කෙසේ වුවද 2023 දෙසැම්බර් 31 දින වන විට ITMIS පද්ධතිය සම්බන්ධයෙන් එළඹී ගිවිසුම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.43,887,382ක් හා ඇ.ඩො. 989,103 ක මුදලක්ද සේවා සපයන ආයතන වෙත තවදුරටත් ගෙවිය යුතුව පැවතුණු බව නිරීක්ෂණය විය.

කරුණු හේතුවෙන් වසර 4කටත් අධික කාලයක් නිසි පරිදි සිදුකල නොහැකි විය. මෙම වසරේ අප්‍රේල් මස අමාත්‍ය මණ්ඩලය විසින් පද්ධතියේ කටයුතු පිළිබඳ ඇගයීමක් සිදු කර එය පවත්වාගෙන යා යුතු ආකාරය පිළිබඳ නිර්දේශ ලබා දිම සඳහා ස්වාධීන විශේෂඥ කමිටුවක් පත්කළ අතර එම කමිටුවේ නිර්දේශ ලැබෙන තුරු පද්ධතියේ මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුම යාවත්කාලීන කිරීම සිදු නොකිරීමට තීරණය විය. ඒ අනුව පද්ධතියේ core modules ව්‍යාප්තිය අවසන් කිරීමට අවශ්‍ය මෘදුකාංග බලපත් ලබා ගැනීමටද නොහැකි විය.

ඉහත කමිටුව මඟින් පසුගිය අගෝස්තු මස ITMIS පද්ධතියේ මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුම පළමුව මෙම දෙසැම්බර් මස දක්වාත් පසුව 2026 දෙසැම්බර් මස දක්වාත් දීර්ස කලයුතු බවට නිර්දේශ කල අතර ලබන වසරේ ජූලි මස අවසන් වන විට පද්ධතියේ හඳුනාගත් දෝෂ නිරාකරණය කලයුතු බවටද නිර්දේශ කරන ලදී. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2024 නොවැම්බර් මුලදී ලැබුණු අතර ඒ අනුව පද්ධතියේ සේවා

				ගිවිසුම දීර්ඝ කිරීමට මේ වන විට කටයුතු කරගෙන යනු ලැබේ. 2024 වර්ෂය සඳහා පද්ධතියේ මෘදුකාංග සැපයුම්කරු සඳහා ගෙවීමට නියමිත හිඟ මුදල් ගෙවූ පසු පද්ධතියේ core modules ව්‍යාප්තිය අවසන් කිරීමට අවශ්‍ය මෘදුකාංග බලපත්‍ර ලබා ගැනීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වේ. ඒ අනුව දැනට රජයේ වියදම් ශීර්ෂ 164 ක් සඳහා ව්‍යාප්තිය අවසන් කර ඇති core modules, ඉතිරි වියදම් ශීර්ෂ 8 සඳහාද ව්‍යාප්තිය අවසන් කිරීමට නියමිතය. ඒ අනුව මෙම කටයුතු ලබන වසරේ මැයි මස පමණ වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.	
04	ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුන, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.5,704,871 ක වියදමක් ද දරා තිබුණි.	2023	ආර්ථිකභාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කර මුළු රාජ්‍ය අංශය සඳහා වැටුප් කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කර ගත යුතුය.	2016 වසරේ අප්‍රේල් මස පැවති අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති රැස්වීමේදී මුළු රාජ්‍ය අංශය සඳහාම වැටුප් කළමනාකරණය වෙනුවෙන් වෙනත් මෘදුකාංගයක් ලබා ගැනීමට ගත් තීරණය අනුව සකස් කළ e-payroll වැටුප් කළමනාකරණ පද්ධතිය මේ වන විට මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු තුළ පරීක්ෂණ ධාවනයක් ලෙස ක්‍රියාත්මක කරගෙන යනු ලබයි.	මේ වන විටත් e-payroll වැටුප් කළමනාකරණ පද්ධතිය මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබුණි.

05	2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, පළාත් සභාවල ආයතන වලට මාරු වී ගිය නිලධාරීන්, සංස්ථා, මණ්ඩල සහ පළාත් සභා සඳහා ස්ථිර වශයෙන් මුදා හැර ඇති නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනම් කරන ලද නිලධාරීන්, සේවය හැර ගිය/ අවසන් කළ නිලධාරීන්, ද්වීතීය පදනම මත සේවයේ යොදවා ඇති, විදේශගත /දේශීය නිවාඩු සහ වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අයවිය යුතු වසර 5 ත් 10 ත් අතර ශේෂය රු.112,939,218 ක් වූ අතර, වසර 10 කට වැඩි එසේ අයවිය යුතු ශේෂය රු.277,066,082 ක් වී තිබුණි.	2023	ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම.	මෙම ණය ශේෂයන්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා පවතින චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කර නිරවුල් කර ගැනීම ඒ ඒ ආයතන වල ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ හා ගණන් දීමේ නිලධාරීන්ගේ වගකීමකි. කාර්තුමය වශයෙන් එම ආයතන වල ප්‍රගතිය ගෙන්වා ගනිමින් ණය ශේෂයන් අයවීම් ප්‍රගතිය පරීක්ෂා කරමින්, අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබා දෙමින් නිරන්තරයෙන් පසු විපරම් කරනු ලබයි.	මේ වන විටත් දිගුකාලීන නිරවුල් නොවූ ශේෂයන් නිරීක්ෂණය විය.
06	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 44 ක් අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද, තෘතිය මට්ටමේ පුරප්පාඩු 02 ක් ද, ද්වීතියික මට්ටමේ තනතුරු 27 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණි. අදාළ තනතුරු පිරවීමට හෝ කාර්යමණ්ඩල විශ්ලේෂණයක් සිදු කර අනවශ්‍ය තනතුරු යටපත් කිරීමට හෝ සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි	2023	පුරප්පාඩු පිරවීමට හෝ කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මේ වන විට එම පුරප්පාඩු තනතුරුවලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් සහ ද්වීතියික මට්ටමේ තනතුරු 03ක් සඳහා පමණක් නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. අනෙක් තනතුරු සඳහාද නිලධාරීන් අනුයුක්ත කරන ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් මඟින් පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් දැනුවත් කර ඇත.	මේ වන විට එම පුරප්පාඩු තනතුරුවලින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් සහ ද්වීතියික මට්ටමේ තනතුරු 03ක් සඳහා පමණක් නිලධාරීන් අනුයුක්ත කර තිබුණි.

53. ශීර්ෂය - 251 තක්සේරු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	519,302,364	519,302,364	515,195,056	තත්ත්වාගණනය කළ
2022	516,505,507	516,505,507	514,350,161	තත්ත්වාගණනය කළ
2023	572,584,306	572,584,306	544,735,061	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	වැලිගම ප්‍රාදේශිය සභාවේ සභා අරමුදලින් මිලදී ගත් මාතර කඹුරුගමුව කසල ඉඩමට යාබදව පිහිටි පර්චස් 100.85ක් වූ අංක 169 දරන කැබැල්ලට අදාළ 2022 නොවැම්බර් 20 දිනැති තක්සේරු වාර්තාව නිකුත් කිරීමේ දී ඉතා ආසන්න දිනක දී එනම් 2021 ජූලි 26 දින අත්සන් කර ඇති අංක 1375 දරන පරිහරණ ලැයිස්තුව සහිත පිඹුර නොගෙන 2015 පෙබරවාරි 25 දිනැති අංක 35/2015 දරන පරිහරණ ලැයිස්තුවක් නොමැති පිඹුර සැලකිල්ලට ගෙන ඉඩමේ හිමිකම තහවුරු කර ගෙන තිබුණි. තක්සේරු මූලධර්මවලට අනුව තක්සේරු කරනු ලබන දේපලේහි හිමිකාරීත්වය තහවුරු කර ගත යුතු වුවද ඊට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් මෙම තක්සේරු වාර්තාව අදාළ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය අක්‍රමිකතාවයකට පාදක කර ගෙන ඇති බව අනාවරණය විය.	2023	තක්සේරු මූලධර්මවලට අනුව තක්සේරු කරනු ලබන දේපලෙහි හිමිකාරීත්වය තහවුරු කර ගත යුතු වේ.	ඉඩමක් මිල දී ගන්නා අවස්ථාවක නිරවුල් අයිතිය පිළිබඳ සොයා බැලීම තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් නොවන අතර එය මිල දී ගන්නා පාර්ශවය ඒ පිළිබඳ විශේෂඥ දැනුමකින් යුත් නීතිඥයන් ලවා සිදු කර ගත යුතු කර්තව්‍යකි ඒ බැවින් තක්සේරුව වාර්තා කිරීමේ දී අප විසින් නිරවුල් අයිතිය හා හිස් බුක්තිය ඇතැයි යන පදනම මත තක්සේරුව වාර්තා කර ඇත.	අදාළ ප්‍රාදේශිය සභාවේ මූල්‍ය අක්‍රමිකතාවයකට පාදක කරගෙන ඇති මෙම තක්සේරු වාර්තාව නිවැරදි කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණු අතර ඉදිරියේ දී එවැනි තත්ත්වයන් ඇති වීම වැළක්වීම සඳහා උචිත පාලන පද්ධතීන් හඳුන්වා දී නොතිබුණි

02	කොළඹ වරාය පරිශ්‍රය තුල ස්ථාපිත කිරීමට යෝජිත බහාලුම් අංගනයට අදාළ අක්කර 12 රූඩ් 2 පර්චස් 29 ක් වූ ඉඩම විදේශීය සමාගමකට බදු දීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අතිරේක කළමනාකරණ අධ්‍යක්ෂ (තාක්ෂණික) විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඉදිරිපත් කර තිබූ තක්සේරු වාර්තාව අනුව වාර්ෂික බදු කුලිය රු.1,460,000,000 ක් වී තිබුණි. එසේ වුවද, පසුව අදාල විදේශීය සමාගම විසින් වරාය අධිකාරියේ අදාල නිලධාරියා මඟින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන මුල් තක්සේරුව සඳහා පාදක කරගත් ලියවිලිම නැවත සැලකිල්ලට ගෙන මුල් තක්සේරුවෙන් රු.228,000,000 ක් හෙවත් 15.6% ක් අඩුවෙන්, රු.1,232,000,000 ක් වූ සංශොධිත තක්සේරු වාර්තාවක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය.	2023	දේපළ තක්සේරු කිරීමේ දී නිසි මූලධර්ම හා පදනම් අනුගමනය කර විනිවිදභාවයකින් යුතුව සිදු කිරීමටත් රජයට අවාසියක් නොවන ආකාරයටත් කටයුතු කළ යුතු වීම.	මුල් තක්සේරුවේ දී සැලකිල්ලට භාජනය නොවූ කරුණු 3ක් පදනම් කරගෙන ගාස්තු සංශෝධනය සිදු කොට ඇත.	දෝෂය නිවැරදි කිරීම සඳහා මේ දක්වා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

54. ශීර්ෂය - 252 ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,159,162,339	3,159,162,339	3,143,330,617	තත්ත්වාගණනය කළ
2022	3,195,344,960	3,195,344,960	3,185,389,184	තත්ත්වාගණනය නොකළ
2023	3,876,746,838	3,876,746,838	3,868,840,005	තත්ත්වාගණනය නොකළ

අනු අංක	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ 03 ප්‍රකාරව කටයුතු කර 2018 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණු වාහන 04 ක අපහරණ කටයුතු සිදු කළ යුතුව තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සිදු කර නොතිබුණි.	2021	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ 03 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අපහරණ කටයුතු සිදු කළ යුතු වීම.	වාහන 04 ධාවනයෙන් ඉවත් කර ඇත. අපහරණය කිරීම උදෙසා කමිටුවක් පත් කර ඇත. යතුරු පැදිය දෙපාර්තමේන්තුවේ තැපැල් රාජකාරී සඳහා අළුත්වැඩියා කිරීමටත් අනෙක් වාහන අපහරණය කිරීමටත් විධිමත් පරිදි කටයුතු කරමි.	කාර් රථ 02 ලියාපදිංචිය අවලංගු කර වෘත්තීය පුහුණු අධිකාරියට ලබා දී ඇත. වෑන් රථයේ ලියාපදිංචිය අවලංගු කර තිබුණ ද අපහරණ කටයුතු සිදුකර නොතිබුණි. කැබ් රථය දෙපාර්තමේන්තු රථ ගාලේ ගාල් කර ඇත. අනතුර සිදු වී වසර 10 කට වැඩි කාලයක් ගත වුවද වගකිවයුත්තන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොමැත.
02	2014 ජනවාරි 11 වන දින අනතුරට පත් කැබ් රථයක් වාර්තාවේ දිනය වන විටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර පවතින අතර පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන තිබූ මෙම වාහනයට බරපතල හානි සිදු වී ඇති බවත් යථා තත්ත්වයට පත්කල නොහැකි බවත්	2022	විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකියයුතු පාර්ශවයන් හඳුනාගෙන රජයට වූ අලාභය අයකරගැනීමට කටයුතු කළ යුතු වේ.	අදාල වාහනය මාර්ගයේ භාවිතා කිරීමට නොහැකි බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බැවින් අපහරණ කමිටුවක් පත් කර එහි වාර්තාව පදනම් කර ගනිමින් අදාල වාහනය පුහුණු	කමිටු වාර්තාව මෙතෙක් ලැබී නොමැත. මෙම අනතුර සිදු වී වාර්තාවේ දිනය වන විට වසර 10 කට අධික කාලයක් ගත වී තිබුණ ද වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

	දේශීය නියෝජිත ආයතනය විසින් දන්වා තිබිය දී ත් පූර්ණ රක්ෂණ වන්දිය ලබාගැනීමට කටයුතු කිරීමෙන් තොරව පෞද්ගලික ගරාජයකින් අළුත්වැඩියාව සිදු කර රක්ෂණ ආයතනයෙන් රු. 1,514,625 ක වන්දියක් ලබා ගෙන තිබුණි. මෙම අළුත්වැඩියාවෙන් පසුව ද වාහනය ධාවනය තත්ත්වයේ නොමැති බැවින් තව දුරටත් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ගාල්කර පවතින බව නිරීක්ෂණය විය.			කටයුතු සඳහා ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු අධිකාරිය වෙත ලබා දීමට යෝජනා වි ඇත. අදාල අපහරණ කමිටුව මේ වන විටත් පත් කර ඇත.	
03	මුද්‍රණ අංශයේ, 80 GSM මුද්‍රණ කඩදාසි තොගයේ රීම් 242ක ඌනතාවයක් පිළිබඳව මු.රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	අස්ථානගතව ඇති මුද්‍රණ කඩදාසි තොගය අනාවරණය කර ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර මෙම කාර්ය සඳහා කාලයක් ගතවීම හේතු කොට ගෙන මු.රෙ 104(3) යටතේ ප්‍රාරම්භක වාර්තාව ද ප්‍රමාද විය.	ප්‍රාරම්භක වාර්තාව මෙතෙක් අවසන් කර නොමැත. වාර්තාවේ දිනය වන විට මාස 10 කට අධික කාලයක් ගත වී තිබුණි.
04	ජන හා නිවාස සංගණනය 2021 - මෙම සංගණනය වෙනුවෙන් පිළියෙල කළ මූලික සැලැස්මක් විගණනයට ඉදිරිපත් නොවූ අතර 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, එම වර්ෂයේ දී අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. එසේ වුවද 2022 සහ 2023 වර්ෂ තුලදීද අවසන් කිරීමට	2023	සැලසුම් කළ ආකාරයට කාල ප්‍රමාදයකින් තොරව සංගණන කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතු වීම.	2024 ඔක්තොම්බර් මාසයට පෙර ගණන් ගැනීමේ අදියර අවසන් කිරීමට සියළු කටයුතු සූදානම් කර ඇත.	2024 දෙසැම්බර් 18 දින ගණන් ගැනීමේ කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර වාර්තාවේ දිනය වන විට සංගණනයෙන් සියයට 70 ක පමණ කටයුතු අවසන් කර ඇති බවට කරුණු දක්වා ඇත.

	නොහැකිවී ඇති මෙම සංගණනයේ කටයුතු 2024 වර්ෂයේ වාර්තාවේ දිනය වන විට ලැයිස්තුගත කිරීමේ අදියර පමණක් අවසන් කර තිබුණි. සංගණනයේ කටයුතු වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2024 අප්‍රේල් 30 දින දක්වා දරා ඇති වියදම එකතුව රු. 1,233,151,415 බව නිරීක්ෂණය විය. මීට අමතරව ජනාධිපති ලේකම් කාර්යාලයේ වැය විෂයයන් මඟින් 2022 හා 2023 වර්ෂ වල මෙම කාර්යය වෙනුවෙන් එකතුව රු. 4,813,352 ක් වූ වියදම් දරා තිබුණි.				
05	රු. මිලියන 1,116 කට අධික වියදමක් දරා ඉදි කර ඇති මහල් 12 කින් යුත් ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ල නියමිත ප්‍රමිතියට අනුකූලව ඉදිකර නොමැති බවටත්, නියමිත පරිදි නඩත්තු කර නොමැති බවටත් නිරීක්ෂණය වන අතර ගොඩනැගිල්ලේ ඉහළ සිට සහ පහල මහල් දක්වා ජලය කාන්දු වන බවත්, 6 වන මහලේ විවෘත ප්‍රදේශයේ වීදුරු ආවරණය තුලින් ගොඩනැගිල්ල තුලට ගලා එන ජලය විදුලි සෝපාන ලිං තුළට ඇතුළු වන බවත්, බිම යොදා ඇති අනාරක්ෂිත විදුලි රැහැන් වල පරිවාරක නල දිගේ කාර්යාල පරිශ්‍ර තුලට ජලය ගලා එන බවත්	2023	හැකි ඉක්මනින් උචිත අලුත්වැඩියාවන් සිදු කර ගැනීමට කටයුතු කළ යුතු වේ.	කාර්යාලීය ගොඩනැගිල්ලේ ඉහළ මතුපිට සහ පැති බිත්ති ජල මුද්‍රා කිරීම නිසි පරිදි සිදුවී නොමැති බැවින් වැසි ජලය කාන්දුවීමක් සිදුවේ. 06 වන මහලේ විවෘත ප්‍රදේශයේ සිට විදුලි සෝපානයේ ඉදිරිපස ප්‍රදේශය වෙත වැසි ජලය කාන්දු වේ. කාර්යාල පරිශ්‍රයන්ට වැසි ජලය කාන්දු වන ස්ථානවල ඇති ඇතැම් විදුලි පරිපථ විසන්ධි කර ඇත. ඇතැම් විදුලි පරිපථ ජලය හා නොගැටෙන සේ ස්ථානයන්	මෙතෙක් අලුත්වැඩියා කටයුතු සිදු කර නොමැත.

	නිරීක්ෂණය වන අතර ගොඩනැගිල්ල සඳහා කොන්ත්‍රාත් කරුගෙන් ලබාගත යුතු සහතික වීම් ලබාගැනීමට කළමනාකාරීත්වය විසින් කටයුතු නොකිරීම හේතුවෙන් කඩා වැටී ඇති ඉදිරිපස දොර අලුත්වැඩියාකිරීම සඳහා වෙනත් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ගෙවා ඇති රු. මිලියන 3.3 ක් වූ මුදල රජයට අමතර වැය බරක් වී ඇති බවත් අනාවරණය විය.			වෙනස්කොට සවි කර ඇත. විදුලි රැහැන් සම්බන්ධ As Built Drawings නොමැති බැවින් ඉදිරි පියවර ගැනීම අපහසුවී ඇත	
06	දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 07 ඇල්බට් චන්ද්‍රවංකයෙහි ඇති රුඩ් 03 පර්චස් 1.45ක් වූ මුද්‍රණ අංශය පිහිටි පරිශ්‍රය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.				
	(i) අදාළ පරිශ්‍රය විධිමත් පරිදි නඩත්තු කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබූ අතර පිවිසුම් ගේට්ටුව කැඩී දිරාපත් වී ගබඩාවල ජනෙල් පියන්, දොරවල් සහ වහල කැඩී අබලන් තත්ත්වයේ පවතින බවත් භූමිය පුරා තැනින් තැන අබලි ද්‍රව්‍ය ගොඩ ගසා ඉතා අපිරිසිදු තත්ත්වයේ පවතින බවත්, දිරාපත් වූ ගොඩනැගිලිවල කොටස් ගැලවී වැටෙන බවත් නිරීක්ෂණය විය.	2023	රජයේ දේපලවලට නිසි ආරක්ෂාවක් ලැබෙන ලෙස විධිමත් වැඩපිළිවෙලක් සකස් කිරීමටත් ඒවා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුතුව භාවිතා කිරීමටත් කළමනාකාරිත්වයේ ප්‍රමාණවත් අවධානයක් යොමුවිය යුතු වේ.	අවශ්‍ය අලුත්වැඩියාවන් සිදු කිරීමට යෝජනා වී ඇත. මුද්‍රණ අංශ ප්‍රධානීගේ එකඟතාවය ලද පසු ඉදිරි කටයුතු කඩිනමින් සිදු කෙරේ. පවතින අබලි ද්‍රව්‍ය ඉවත් කිරීමට කොළඹ මහ නගර සභාව වෙත දන්වා ඇත. මුද්‍රණ යන්ත්‍ර ස්ථාපිත කොට ඇති ගොඩනැගිල්ල තුලට ජලය පැමිණීම වැලැක්වීම	වාර්තාවේ දිනය වන විටත් මෙම දේපලෙහි ආරක්ෂාව, නඩත්තුව සහ විධිමත් භාවිතය සම්බන්ධයෙන් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය කෙරේ.

			සඳහා වැලි කොට්ට යොදා ආවරණය කර ඇත.	
(ii) මෙම පරිශ්‍රය තුළ පවත්වාගෙන ගිය කාර්යාල කටයුතු බත්තරමුල්ල ප්‍රධාන ගොඩනැගිල්ලට රැගෙන යාමේ දී පැවති වායු සමීකරණ යන්ත්‍ර 52 ක් විධිමත් පරිදි ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර ඉන් 12 ක් පමණක් භාවිතාවෙමින් පවතින බවට අනාවරණය විය.	2023	-එම-	මුද්‍රණ අංශ පරිශ්‍රය තුළ පවතින භාවිතයට නොගන්නා ලද වායු සමීකරණ යන්ත්‍ර වලින් ඇතැම් යන්ත්‍ර ක්‍රියාත්මක කළ හැකි මට්ටමේ පැවතිණි. දීර්ඝ කාලයක් මෙම යන්ත්‍ර භාවිතා කර නොමැති වීම හේතුවෙන් භාවිතයට ගැනීමට පෙර තත්ව වාර්තාවක් ලබාගැනීමට කටයුතු කරමි.	කමිටු වාර්තාව මෙතෙක් ලැබී නොමැත.
(iii) මුද්‍රණ අංශයේ සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර 03 ක බාහිර සිසිලන ඒකක (outdoor units) 03 ක් අස්ථාන ගත වී තිබුණ ද මු. රෙ. ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023	-එම-	නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගෙන ඇත.	මු.රෙ. 104 (4) වාර්තාව ලබාගෙන තිබුණ ද ඒ අනුව කටයුතු කර නොතිබුණි. දේපල වලට නිසි ආරක්ෂාවක් ලැබෙන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතීන් හඳුන්වා දී නොතිබුණි.
(iv) මුද්‍රණ අංශයේ එක් එක් යන්ත්‍රය මගින් සිදුකරනු ලබන කාර්යයන් වෙනුවෙන් නිකුත් කෙරෙන ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ එම යන්ත්‍රයේ නිමැවුම සටහන් ඇතුළත්ව විධිමත් ලේඛනයක් නඩත්තු නොකරන බැවින් යන්ත්‍ර සේවා කිරීමේ අවශ්‍යතාවය	2023	ප්‍රමාණවත් පාලන පද්ධතීන් හඳුන්වා දිය යුතු වේ.	මුද්‍රණ යන්ත්‍ර දෙකෙහි නිමවුම් පාඨාංක දැක්වෙන මීටර අළුත්වැඩියා කිරීමෙන් පසු නියමිත පරිදි අදාල ලේඛන පවත්වාගෙන යාමට ඉදිරියේදි කටයුතු කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.	ප්‍රමාණවත් පාලන පද්ධතීන් හඳුන්වා දී නොතිබුණි.

සහ ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය කල්තියා හඳුනා ගැනීමට නොහැකි වී තිබූ අතර අක්‍රමිකතා සිදුවීමට ඉඩකඩ පවතින බව නිරීක්ෂණය වේ.				
(v) මුද්‍රණ කටයුතු සඳහා යොදා ගන්නා කඩදාසි, තීන්ත වැනි අමු ද්‍රව්‍ය නිසි පරිදි ගබඩාකර නොතිබූ අතර ඒ සඳහා Bin card ඇතුළුව විධිමත් ලේඛන නඩත්තු කර නොතිබුණි.	2023	-එම-	ගබඩාකර ඇති එක් එක් ද්‍රව්‍යයන් සඳහා බින් පත්‍ර (Bin Card) නඩත්තුවක් මෙතෙක් සිදුකර නොමැති අතර අදාල බින්පත්‍ර ගබඩා භාරකරු විසින් නඩත්තු කල යුතුය. 2024 ජූනි 01 දින සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සැලසුම් කෙරෙමින් පවතී.	විධිමත් පාලන පද්ධතීන් හඳුන්වා දී ක්‍රියාත්මක කර නොතිබුණි.

55. ශීර්ෂය - 253 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,198,535,160	34,797,488	2,163,737,672	තත්ත්වාගණනය කළ
2022	2,201,380,569	39,593,863	2,161,786,706	තත්ත්වාගණනය නොකළ
2023	2,234,493,731	70,354,155	2,164,139,576	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 1(අ) ඡේදය අනුව සෑම මසකම ගිණුම් සාරාංශ මඟින් හර හා බැර කරන ලද දායක මුදල් පිළිබඳ වාර්තාවක් ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතු බව දක්වා තිබුණ ද, 2023 වර්ෂයේ දී රු.මිලියන 22,080.9 ක් 2022 වර්ෂයේ දී රු. මිලියන 23,009.3 ක් හා 2021 වර්ෂයේ රු. මිලියන 22,595.2 ක් ලෙස වෙනත් ආයතන විසින් බැර කරන ලද දායක මුදල් පිළිබඳ බැර නිවේදන ගෙන්වා ගැනීමට හා 2023 වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 3.5 ක හර කිරීම් ද 2022 වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 166.79 ක හර කිරීම් ද 2021 වර්ෂය තුල සිදුකරන ලද රු.මිලියන 19.6 ක හර කිරීම් ද තහවුරු කර ගැනීම සඳහා අදාල ආයතන වලින් හර නිවේදන ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	එක් එක් ශීර්ෂයන්ට අදාල ආයතන එකතුවීම්, අහෝසිවීම් ආදී හේතුන්ද මෙම විචල්‍යතාවයන් කෙරෙහි බලපානු ඇති අතර ආදායම් ගිණුමට හර කිරීම් සම්බන්ධව අදාල ආයතන වලින් හර නිවේදන ඉල්ලා යවා ඇත.	ආදායම් ගිණුමට හර කිරීම් සම්බන්ධව අදාල ආයතන වලින් හර නිවේදන ඉල්ලා යවා ඇත.
02.	සමාජ සංරක්ෂණ දායක මුදල් (වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල්) මධ්‍යම රජයට හා ආදායම් ගිණුම් යටතේ දායක වී තිබෙන නිලධාරීන් සම්බන්ධ දත්ත	2023 2022 2021	දායකයින් හා දායක ගෙවීම් පිළිබඳ දත්ත පද්ධතියක් පවත්වාගෙන දායක මුදල්	වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් අය කිරීම් පිළිබඳ විස්තර පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කිරීම	දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමට කටයුතු කර නොමැත.

	පද්ධතියක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාජ සංරක්ෂණ ක්‍රමයෙන් ප්‍රතිලාභ ලැබීමට නියමිත සාමාජික සංඛ්‍යාව පිළිබඳ තොරතුරු නොමැති වීම තුල, ඒ අනුව හිමිවන වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හා දායක මුදල් ගෙවීම් යනාදි ප්‍රතිලාභ හිමි ගැන්වීමේ දී දායක මුදල් නිශ්චිතව අඛණ්ඩව ලැබුණේ ද යන්න තහවුරු කරගැනීමට නොහැකි වී තිබුණි.		නිශ්චිතව ලැබුණේ දැයි තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.	සම්බන්ධයෙන් සියළුම ආයතන ප්‍රධානීන් දැනුවත් කර ඇත.	
03.	2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව රාජ්‍ය සේවකයකු ලබන රු. 7,800 ක ජීවන වියදම් දීමනාව ඉක්මවා විශ්‍රාමිකයෙකුට ජීවන වියදම් දීමනාව නොගෙවිය යුතු වුවත්, මියගිය හා ආබාධිත හමුදා නිලධාරීන්ගේ යැපෙන්නන් වෙත හමුදා සේවා වැටුප සමඟ දත්ත පද්ධතිය අනුව අවස්ථා 116 කදී ද, ඉබ්බාගමුව වරකාපොල හා දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 14 කදී ද ජීවන වියදම් දීමනාව රු. 31,953,239 වැඩිපුර ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය.	ජීවන වියදම් දීමනාව ගෙවීම නවතා ඇති අතර වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අයකර ගනිමින් පවතී.	ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර ඇත.
04.	2014 ජනවාරි 10 දිනැති අංක 1/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව ජීවන වියදම් දීමනාව සහිතව රජයේ වැටුපක් ලබන්නේ නම් එලෙස වැටුප් ලබන කාල සීමාව තුලදී විශ්‍රාම වැටුපට ජීවන වියදම් දීමනාව හිමි නොවුණද , එසේ ජීවන වියදම් දීමනාව ගෙවීම හේතුවෙන් කලුතර, දඹුල්ල,	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය.	වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.	ජීවන වියදම් දීමනාව ගෙවීම නවතා ඇති අතර වැඩිපුර ගෙවීම් නැවත අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.

	මැදදුම්බර, හංවැල්ල, බමුණාකොටුව, මාතර, මාවනැල්ල, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දත්ත පද්ධතිය අනුව අවස්ථා 269 කදී ජීවන වියදම් දීමනාව රු. 94,478,613 ක් වැඩිපුර ගෙවා තිබුණි.				
05.	2014 නොවැම්බර් 03 දිනැති අංක 13/2014 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව විශ්‍රාම වැටුප් කිහිපයක් ඒකාබද්ධව ලබාගන්නා අවස්ථාවල මාසිකව ගෙවනු ලැබූ අන්තර් දීමනාව ඒකාබද්ධ විශ්‍රාම වැටුපට පමණක් ගෙවිය යුතු වුවත් හංවැල්ල, මාතර, කෑගල්ල, අකුරණ, යටිනුවර, බිංගිරිය, මාවනැල්ල, දිවුලපිටිය, කලුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා දත්ත පද්ධතිය මඟින් හඳුනාගත් විශ්‍රාමිකයින් 47 දෙනෙකු සඳහා යැපීම් දීමනාවට ද අන්තර් දීමනාව ගෙවීම හේතුවෙන් රු. 13,743,400 වැඩිපුර ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය.	අන්තර් දීමනාව ගෙවීම නවතා ඇති අතර වැඩිපුර ගෙවීම් නැවත අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.	වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.
06.	2019ජුනි 11දිනැති අංක 1/2019දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව යම් පුද්ගලයෙකු වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ යැපීම් දීමනාව ලබාගන්නා අවස්ථාවක එම වැන්දඹු විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව සංශෝධනය කළ පසු යැපීම් දීමනාව සඳහා ගෙවනු ලබන අන්තර් දීමනා ගෙවීම නතර කළ යුතු වුවද කෑගල්ල හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එසේ නතර නොකර යැපීම් දීමනාව වෙනුවෙන් අන්තර් දීමනාව රු. 2,522,000 ක් ගෙවීමෙන් එම දීමනාව වැඩිපුර ගෙවා තිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය.	ගෙවන ලද අන්තර් දීමනාව නතර කර ඇති අතර වැඩිපුර ගෙවන ලද දීමනාව වාරික වශයෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.	වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත

07.	2019 ජූලි 26 දිනැති අංක 1/2019 සංශෝධන II දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව වයස අවුරුදු 55 දක්වා ත්‍රිවිධ හමුදා මඟින් වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයින්ට හා යැපෙන්නන්ට වැටුප් පරිවර්තනය අදාල නොවන බව දක්වා තිබියදී දත්ත පද්ධතියට අනුව හමුදා වැටුප ලබන යැපෙන්නන් 45 දෙනෙකුගේ හා වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාමිකයින් 04 දෙනෙකුගේ විශ්‍රාම වැටුපද සංශෝධනය කර ගෙවීම හේතුවෙන් විශ්‍රාම වැටුප් රු. 10,337,836 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර වැඩිපුර ගෙවීම් අය කළ යුතුය.	නිවැරදි වැටුපෙහි පිහිටුවා ඇති අතර වැඩිපුර ගෙවා ඇති මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී.	වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇත.
08.	2022 ජුනි 22 දිනැති අංක 14/2022, 14/2022(i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2022 සැප්තැම්බර් 20 දිනැති අංක 06/2022 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය අනුව විදේශ නිවාඩු ලබාගත් නිලධාරීන් විධිමත් පරිදි ලියාපදිංචි නොවීම නිසා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත එවනු ලැබුවද නිලධාරියා හඳුනාගත නොහැකි බැවින් දායක මුදල් මාසිකව (2022 නොවැම්බර් සිට 2023 පෙබරවාරි දක්වා) හඳුනානොගත් ලැබීම් ලෙස රු. 47,246,326 ක් පොදු තැන්පත් ගිණුමට මාරුකර තිබුණි.	2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය.	චක්‍රලේඛ ප්‍රකාරව තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි නිවැරදි ලෙස ලියාපදිංචි නොවූ සහ ස්ථාවර නියෝගයකින් නොවන ක්‍රමවේද ඔස්සේ සහ හඳුනා ගැනීමට යොමුවක් නොමැතිව මුදල් බැර කිරීම හේතුවෙන් නිර්මාණය වී ඇති මෙම මුදල් ශේෂය හඳුනා ගන්නා තෙක් පොදු තැන්පතු ගිණුමක බැර කර ගිණුම් ගත කරනු ලැබේ.	2023 දෙසැම්බර් 29 දිනැති 06/2023 විශ්‍රාම වැටුප් චක්‍රලේඛය මඟින් වැඩිදුර උපදෙස් ලබා දී තිබුණ ද හඳුනා නොගත් ශේෂය වැඩිවෙමින් පවතී.
09.	මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට තවදුරටත් අයකරගත යුතු වැඩිපුර ගෙවන ලද විශ්‍රාම වැටුප් වටිනාකම රුපියල් මිලියන 936.1 ක් විය. මෙම වටිනාකම, වර්ෂ 10 කට වඩා වැඩි කාලයක සිට පැවත එන රුපියල් මිලියන 1.5 කින්ද, වර්ෂ	2023	වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කරගැනීමට කටයුතු කළ යුතුය.	වැඩිපුර ගෙවීම් වාරික වශයෙන් අය කර ගැනීමට කටයුතු කර ඇත.	2023/12/31 දිනට තවදුරටත් අයකර ගත යුතු මුදල රු.මිලියන 885.7 කි.

	5 සිට වර්ෂ 10 දක්වා කාල පරාසයක සිට පැවත එන රුපියල් මිලියන 48.9 කින්ද හා වර්ෂ 5 ට අඩු කාලයකට අයත් රුපියල් මිලියන 885.7 කින්ද සමන්විත විය.			
10.	විදේශ විශ්‍රාම වැටුප් අංශය විසින් 2023 මියගිය විදේශ විශ්‍රාමිකයින් (2023 හා ඊට පෙර වර්ෂවල ලෙස හඳුනාගත් විශ්‍රාමිකයන්) සඳහා වැඩිපුර ගෙවා ඇති බැංකුවෙන් ආපසු ගෙන්වා ගතයුතු ශේෂයන්ගෙන් 2023 වර්ෂයේ දී බැංකුවට ඉදිරිපත් කරන ලද වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් අයකර ගැනීම් පිළිබඳ ලේඛනය අනුව 2023 දෙසැම්බර් 31දිනවන විට රු 29,539,809.ක මුදලක් තවදුරටත් අයකරගත යුතු බව නිරීක්ෂණය විය .මෙම ශේෂය තුළ 2023 වර්ෂයට පෙර වර්ෂවල දී මියගිය විශ්‍රාමිකයන් සඳහා වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු 15,506,715 . බවද නිරීක්ෂණය විය.	වැඩිපුර ගෙවීම් ඇතිනොවන පරිදි කටයුතු කල යුතු අතර වැඩිපුර ගෙවීම් කඩිනමින් අය කළ යුතුය.	තවදුරටත් අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට ලිපි හා දුරකතන ඇමතුම් මඟින් බැංකු වෙත දැනුම් දී ඇත.	ඉතිරි මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

56. ශීර්ෂය - 254 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,671,554,531	18,297,349	2,653,257,182	තත්ත්වාගණනය කළ
2022	2,714,707,293	5,789,575	2,708,917,718	තත්ත්වාගණනය කළ
2023	2,838,856,457	2,664,909	2,836,191,548	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රාජ්‍ය අංශ ප්‍රතිනිර්මාණය කිරීමේ වැඩසටහන යටතේ උපත්, විවාහ සහ මරණ සම්බන්ධ සිවිල් ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු හා යාවත්කාලීන තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස්කර පවත්වාගෙන යාමේ අරමුණෙන් 2010/2011 වර්ෂ වන විට ICTA ආයතනයේ මැදිහත්වීම මත නිර්මාණය කළ මෘදුකාංග පද්ධතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කිරීම 2021 වර්ෂයේ ආරම්භ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද මෙමගින් අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.	2022	මෙම වැඩසටහන ඵලදායි කර ගැනීම සඳහා අවශ්‍ය සැලසුම් විධිමත් කිරීමත්, පවතින සම්පත් කාර්යක්ෂමව භාවිතයට ගැනීම සඳහා කඩිනම් පියවර ගැනීමත් කළ යුතු ය.	පරිගණක වැඩසටහන් කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදී ඇත.	දිස්ත්‍රික්ක තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ඉතා දුර්වල මට්ටමක පවතින අතර, මිලදී ගෙන ඇති වත්කම් ඌණ උපයෝජිතව පැවතුණි.

	ඒ අනුව දිවයිනේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෙම වැඩසටහන පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපාදන මත ලැප්ටොප් පරිගණක හා උපාංග 331ක් බෙදාහැර තිබුණ ද, දිස්ත්‍රික්ක 14කට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 44ක 2021 වසරට අදාළව දත්ත පද්ධතියට ඇතුළත් කර තිබුණේ ලියාපදිංචි කළ උපත් 53,739කින් 01ක් පමණක් හා ලියාපදිංචි කළ මරණ 23,467කින් 04ක් පමණක් විය. එසේම විවාහ පිළිබඳ තොරතුරු කිසිදු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පවත්වාගෙන ගොස් නොතිබුණි.				
02	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 7ක සමාලෝචිත වර්ෂය ආරම්භයට පැවති රු.3,160,269ක හිඟ සමථ මුදල්වලින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළ අයකර නොතිබුණු අතර, අයකිරීම් පිළිබඳ තොරතුරු පවත්වාගෙන නොයන රු.12,191,593 හිඟ සහ දඩ ආදායම් ශේෂ සම්බන්ධයෙන් 2019 ජුලි 23 දිනැති අංක	2023	හිඟ ආදායම් කාර්යක්ෂමව අය කර ගැනීමටත්, හිඟ ආදායම් ඒකරාශී වීම වැලැක්වීමටත්, අයකරගත නොහැකි ආදායම් කපාහැරීමටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය.	මෙම මුදල කපාහැරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.	හිඟ ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමට හෝ කපාහැරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	11/2019 දරන රෙජිස්ට්‍රාර් ජනරාල් චක්‍රලේඛය පරිදි කටයුතුකර නොතිබුණි.				
03	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 44ක සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.20,806,353ක් සහ වර්ෂය තුළ පැනවීම් රු.7,111,533ක අයවිය යුතු සමථ මුදල්වලින් සමාලෝචිත වර්ෂය තුළ අයකර ගෙන තිබුණේ රු.7,451,243ක් හෙවත් සියයට 27ක් පමණි.	2023	හිඟ ආදායම් කාර්යක්ෂමව අයකර ගැනීමටත්, අයකරගත නොහැකි ආදායම් කපා හැරීමටත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගත යුතු ය.	වර්ෂය තුළ පැන වූ සමථ මුදල් බොහොමයක් අයකර ඇති බවත්, පෙර වර්ෂවල පනවා ඇති සමථ මුදල් අයකර ගැනීමට පියවර ගැනීමටත් උපදෙස් ලබාදී ඇත. අයකර ගත නොහැකි සමථ මුදල් කපා හැරීමට පියවර ගන්නා ලෙසත් උපදෙස් ලබාදී ඇත.	හිඟ ආදායම් අයකර ගැනීම සහ අයකරගත නොහැකි ආදායම් කපා හැරීම නිසිපරිදි සිදු වී නොමැත.
04	මූලික ආදායම් ඇස්තමේන්තු අනුව රුපියල් මිලියන 8කට ඇස්තමේන්තු කළ නොතාරිස්වරුන්ට මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු, රුපියල් මිලියන 11 දක්වා සියයට 38 කින් හෙවත් රු. මිලියන 3කින් වැඩිකර තිබුණ ද, වර්ෂය තුළ රැස්කළ ආදායම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 19කින් හෙවත් රු.2,060,808 කින් අඩුවී තිබුණි.	2023	නිසිඅධ්‍යයනයකින් යුතුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට සහ කාර්යක්ෂමව ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතු ය.	ඇස්තමේන්තු සංශෝධනය කිරීමට කටයුතු කිරීම.	ඇස්තමේන්තු සංශෝධනය කිරීමට හෝ ආදායම් රැස් කිරීම කාර්යක්ෂම කිරීමට පියවර ගෙන නොතිබුණි.
05	මු.රෙ.143(2)(ඊ) හා මු.රෙ.175(2)	2023	හිඟ ආදායම් කාර්යක්ෂමව අයකර	මු.රෙ.176(3) ප්‍රකාරව කටයුතු	හිඟ ආදායම් අයකර ගැනීම, හිඟ ආදායම්

	ප්‍රකාරව හිඟ ආදායම් එකතුකර ගැනීමටත්, අයකරගත නොහැකි ආදායම් අතහැර දැමීමටත් කටයුතු නොකිරීම හේතුවෙන් වසර ගණනාවක සිට පැවත එන හිඟ ආදායම් ඒකරාශී වී පවතින අතර, මුදල් එකතු කිරීමෙහිලා යම් නිලධාරියෙකුගේ නොසැලකිල්ල හෝ අකාර්යක්ෂමතාවය හේතුවී තිබේ නම් ඒ සම්බන්ධයෙන් මු.රෙ.176(3) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.		ගැනීමටත්, හිඟ ආදායම් ඒකරාශී වීම වැලැක්වීමටත්, අයකරගත නොහැකි ආදායම් කපාහැරීමටත් අවශ්‍ය විධිමත් පාලනයන් හඳුන්වාදිය යුතු ය.	කිරීමට උපදෙස් ලබාදී ඇත. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් පිළිගත් තොරතුරු ගෙන්වා කපා හැරීමට කටයුතු කිරීම.	ඒකරාශී වීම වැලැක්වීම සහ අයකරගත නොහැකි ආදායම් කපාහැරීම දුර්වල මට්ටමක පැවතුණි.
06	බිම් සවිය මිලදී ගැනීම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.මිලියන 25 ක ප්‍රතිපාදනවලින් වැඩසටහන වෙනුවෙන් රු.මිලියන 23.28ක් පමණක් වැයකර තිබුණු අතර, ආයෝජන හිතකර පරිසරයක් නිර්මාණය කිරීම වෙනුවෙන් ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ රු.මිලියන 12 ක ප්‍රතිපාදනවලින් වැඩසටහන වෙනුවෙන් උපයෝජනය කර තිබුණේ රු.මිලියන 7.21 ක්	2023	ප්‍රතිපාදිත මුදල් කාර්යක්ෂමව යොදාගෙන ක්‍රියාකාරී සැලැස්මට අනුව අදාළ කාර්යය නිම කිරීමට වගබලා ගත යුතු ය.	මුලදී රුපියල් මිලියන 13 වෙන් වුව ද, මුදල් අමාත්‍යාංශය විසින් නැවත රුපියල් මිලියන 5ක් ආපසු ලබාගෙන ඇත. ඊට අමතරව 1.4ක ප්‍රතිපාදන ද වර්ෂය අවසානයේ පවරාදී ඇත.	මෙම වැඩසටහනට අදාළ කාර්යභාරය මේ දක්වා අවසන් කර නොතිබුණි.

	පමණක් විය.				
07	දෙපාර්තමේන්තුවේ මූලා පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.	2022 2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	සමාලෝචන නිසිපරිදි සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.	අභ්‍යන්තර පාලන පද්ධතිය සඵලදායීව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
08	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාරව මාණ්ඩලික/විධායක මට්ටමේ රාජ්‍ය නිලධරයන් විදේශ සංචාරයන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙර අග්‍රාමාත්‍යවරයාගේ	2023	පවත්නා නීතිරීති රෙගුලාසිවලට පටහැනි නොවන පරිදි කටයුතු කිරීමට වගබලා ගත යුතු ය.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XV වැනි පරිච්ඡේදයේ 10 වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට වගබලා ගන්නා ලෙස උපදෙස්	2023 වර්ෂයේ විදේශගත වූ නිලධාරීන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමට පෙර ඒ සඳහා අග්‍රාමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2024 වර්ෂය තුළ මාණ්ඩලික/විධායක නිලධාරීන් විදේශ සංචාර සඳහා සහභාගී වී නොතිබුණි.

	පූර්ව අනුමැතිය ලබාගත යුතු වුව ද, දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික/විධායක මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකු එම පූර්ව අනුමැතිය ලබාගැනීමකින් තොරව දිවයිනෙන් බැහැර වී තිබුණි.			ලබාදී ඇත.	
09	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV වැනි පරිච්ඡේදයේ 4 වන වගන්තිය වර්ෂ 07 සිට වර්ෂ 28 ක කාලපරාසයක් තුළ නිලධාරීන් 20 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු රු.886,949 ක ණයශේෂ පොත්වලින් ඉවත් කිරීමේ කටයුතු නිමකර නොතිබුණි.	2021 2022 2023	සේවක ණය කළමනාකරණය විධිමත් කර ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ණය අයකිරීම කඩිනම් කළ යුතු ය.	තවදුරටත් අයකර ගත හැකි මුදල් අයකර ගැනීමටත්, අයකර ගත නොහැකි ණය ශේෂ කපාහැරීමට පියවර ගැනීමටත් කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත.	රු.876,948.89ක් වූ ණය ශේෂයක් තවදුරටත් හිඟව පවතී.
10	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති අංක 158 ප්‍රකාරව සෑම වර්ෂයක ම ජනවාරි 01 හා ජූලි 01 වන දිනට ජ්‍යෙෂ්ඨතා ලේඛනය යාවත්කාලීන කර ප්‍රසිද්ධ කිරීමට කටයුතු කළ යුතු වුවත්,	2023	පවත්නා නීතිරීති රෙගුලාසිවලට අනුව තොරතුරු යාවත්කාලීන කර වාර්තා ඉදිරිපත් කළ යුතු ය.	අදාළ ගැසට්පත්‍ර සහ කාර්ය පටිපාටික රීති පිළිබඳ නිසි අවධානය යොමු කරමින් ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත.	රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨතා ලේඛනය දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකර ඇතත්, අනෙකුත් නිලධාරී කාණ්ඩවලට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛන ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර නොතිබුණි.

	දෙපාර්තමේන්තුව විසින් ඒ අනුව කටයුතුකර නොතිබුණි.				
11	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය ප්‍රකාරව ඉකුත් වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණවලදී හඳුනාගත් පොදු 47 වාර්තාවේ සඳහන් අයිතම 07 කට අදාළ භාණ්ඩ 48 ක් සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	යොමුගත චක්‍රලේඛයට හා රෙගුලාසියට අනුකූලව කටයුතු කර වත්කම් කාර්යක්ෂමව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු ය.	අලුත්වැඩියා කිරීමට හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කඩිනම් පියවරගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත.	විශාල භාණ්ඩ ප්‍රමාණයක අලුත්වැඩියා කටයුතු සිදු නොකර නිශ්කාර්යව පවතී.
12	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 13.2 ඡේදය ප්‍රකාරව 2021 වර්ෂය වන විටත් අපහරණය කළයුතුව තිබුණු වාහන 05ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි.	2021 2022 2023	රජයේ සම්පත් උපරිම කාර්යක්ෂමතාවයකින් භාවිතයටගත හැකි වන පරිදි කළමනාකරණය කළ යුතු ය.	මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇත.	අපහරණ සඳහා මෙතෙක් පියවර ගෙන නොතිබුණි.
13	2022 ඔක්තෝබර් 21 දිනැති අංක 15/2022 දරන රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ චක්‍රලේඛයට පටහැනි වෙමින් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 13කින් සමාලෝචිත වර්ෂයට අදාළව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා 103ක්	2022 2023	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා නියෝග සම්පාදනය කළ යුතු ය.	ශාඛා කාර්යාල වෙත නිසි උපදෙස් ලබාදී වාර්තා නියමිත පරිදි ගෙන්වා ගැනීමට උපදෙස් දී ඇත.	මේ වන විට සමථ වාර්තා 26ක් තවදුරටත් ලැබීමට ඇති අතර, අඩුපාඩු සහිත වාර්තා නිවැරදි කර ඉදිරිපත් කර නොතිබුණි.

	ඉදිරිපත් කිරීම පැහැර හැර තිබුණි.				
14	සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණයෙන් නිම කිරීමේ අපේක්ෂාවෙන් වර්ෂයට අදාළ දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර තිබූ රු. මිලියන 108ක ඇස්තමේන්තුගත වගකීම් ක්ෂේත්‍ර 08කට අයත් ක්‍රියාකාරකම්වලින් වැඩසටහන් 14ක් වර්ෂය තුළ ක්‍රියාත්මකකර හෝ නිමකර නොතිබුණි.	2023 2022	දෙපාර්තමේන්තු අරමුණු කාර්යක්ෂමව ඉටු කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට අනුගතව කටයුතු කිරීමට වගබලා ගත යුතු ය.	නිරීක්ෂණය පිළිගෙන ඇත.	අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සතුටුදායක මට්ටමක නොමැත.
15	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(අ) ප්‍රකාරව මිලගණන් විවෘත කිරීමේ කමිටුව පත්කිරීම ප්‍රසම්පාදන මණ්ඩලය විසින් සිදුකළ යුතු වුවත්, රු.2,099,900ක් වටිනා කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් 2023 මාර්තු 29 දින කැඳවූ මිල ගණන්, ප්‍රසම්පාදන මණ්ඩලය විසින් පත්කළ කමිටුවක් විසින් සිදුකර නොතිබුණි. එසේම මෙම ප්‍රසම්පාදනයට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ලබාදීමට ප්‍රමාදවීම, කාර්යසාධන සුරක්ෂණය	2022 2023	යොමුගත මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කළ යුතු ය.	සියළුම කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිදි සිදු කිරීමට පියවර ගෙන ඇත.	ප්‍රවර්තන වර්ෂයේදී ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3(අ) ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටු සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා නොගත් අවස්ථා නිරීක්ෂණය විය.

	ලබාගැනීම හා ගිවිසුමකට එළඹීම ප්‍රමාදවීම හේතුවෙන් අදාළ භාණ්ඩ දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට මිල කැඳවීම් දිනයේ සිට මාස 05ක කාලයක් ගතවී තිබුණි.				
16	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 ප්‍රකාරව වැට් බදු සඳහා ලියාපදිංචි සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවනු ලබන වැට් බදු පිළිබඳ විස්තර විගණකාධිපතිවරයාට පිටපතක් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි.	2023	ගෙවනු ලබන වැට් බදු වාර්තා නිවැරදිව සකස්කර විස්තර වාර්තා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ද, විගණකාධිපතිවරයා වෙත ද නියමිත කාලය තුළ යොමු කළ යුතු ය.	ඉදිරියේදී විගණකාධිපති වෙත පිටපතක් යොමු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.	වැට් බදු පිළිබඳ මාසිකව වාර්තා පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.
17	ඊ - ඉඩම් (e - Land) ව්‍යාපෘතියට අදාළ පත්ඉරු පරිලෝකනය කටයුතු පෞද්ගලික ආයතන දෙකක් විසින් 2013 වර්ෂයේදී ආරම්භ කර 2018 වර්ෂය දක්වා ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 20ක, පත්ඉරු 11,595,197ක් පරිලෝකනය කර තිබුණු අතර, නියමු ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 07න් වැඩසටහන ක්‍රියාත්මක නොකළ	2023	විධිමත් ක්‍රමවේදයකට අනුව පරිලෝකනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර එම කටයුතු කාර්යක්ෂම කළ යුතු ය.	පත්ඉරු පරිලෝකනය කටයුතු නිසිපරිදි අවසන් කිරීමටත්, පරිලෝකනය කරන ලද පත්ඉරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ඇතුළත් ක්‍රමවේදයක් සකස් කිරීමටත් උපදෙස් ලබාදී ඇත.	මෙකී නියමු කාර්යාල 7න් 4කට පත්ඉරු පරිලෝකනය අවසන් කර ඇති අතර, නියමු කාර්යාල 3ක පත්ඉරු පරිලෝකනය අවසන් කර නොමැත. පත්ඉරුවලට අදාළ ඔප්පු දෙවන පිටපත් පරිලෝකනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ද සිදුකර නොතිබුණි.

	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 03ක සහ කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2023 නොවැම්බර් 29 දින වන විට පත්ඉරු 3,624,151ක් පරිලෝකනය කර නිම කිරීමට පෞද්ගලික ආයතනයක් වෙත නැවත භාරදී තිබුණ ද, නියමිත දිනය වන විට පරිලෝකනය කර නිමකර තිබූ පත්ඉරු ප්‍රමාණය 2,020,903ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට පත්ඉරු 9,328ක් පරිලෝකනය කර නොතිබුණි. කෙසේ වුව ද, 2013 වර්ෂයේ සිට මේ වන තෙක් පරිලෝකනය කරන ලද පත්ඉරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ඇතුළත් ක්‍රමවේදයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සකස් කර නොතිබුණු අතර, එම පත්ඉරුවලට අදාළ ඔප්පු දෙවන පිටපත් පරිලෝකනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ද සිදුකර නොතිබුණි.				
18	දෙපාර්තමේන්තුවට අයත් වාහනයක් 2022 ජනවාරි 20 දින අනතුරකට පත්වීම හේතුවෙන් සිදුවී ඇති	2022 2023	යොමුගත චක්‍රලේඛයට හා රෙගුලාසි වලට අනුකූලව කටයුතු	මු.රෙ.104(I)(අ) ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තු වේ පරිපාලන නිලධාරී	මු.රෙ.104(I) (අ) ප්‍රකාරව වාර්තාව ලබාදීමේ කටයුතු අවසන් කර නොමැති අතර, අනතුරට අදාළ KA-8957 දරන

	අලාභය රු.1,735,950ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණු අතර, අනතුර සිදුවී වසර 02කට අධික කාලයක් ගතවී තිබුණ ද, 2024 මැයි මස වන විටත් පරීක්ෂණ අවසන් නොකර හානි සම්බන්ධයෙන් මු.රෙ.104(1)(අ), මු.රෙ.104(3) හා මු.රෙ.104(4) ප්‍රකාරව සහ 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 2.5 ඡේදය ප්‍රකාරව කටයුතු ඉටුකිරීම පැහැර හැර තිබුණි.		කළ යුතු ය.	මූලිකත්වයෙන් කමිටුවක් පත්කර හැකි විගස වාර්තාවක් ලබාදීමට උපදෙස්දී ඇත.	මෝටර් රථය මේ දක්වා ගරාජයක රඳවා ඇත.
19	මු.රෙ.143(2) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04(ආ) ඡේදය ප්‍රකාරව සියලුම රාජ්‍ය ආයතන විසින් හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණික පියවරගත යුතු බව දක්වා තිබුණි. පසුගිය වර්ෂ කිහිපයේදී හිඟ සමථ ශේෂය ක්‍රමිකව වැඩිවී තිබුණ ද, හිඟ සමථ මුදල් අය කරගැනීම සඳහා හෝ 2022 අංක 31 දරන නොතාරිස් සංශෝධන පනතේ විධිවිධාන ප්‍රකාරව	2022 2023	මුදල් රෙගුලාසිවලට සහ චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීම සඳහා යෝග්‍ය පද්ධතියක් ස්ථාපිත කළ යුතු ය.	අයකර ගැනීමට නොහැකි සමථ මුදල් සම්බන්ධයෙන් අදාළ නොතාරිස්වරයාට විරුද්ධව නඩු පැවරීමට 15/2022 චක්‍රලේඛයක් හඳුන්වාදී ඇත. නොතාරිස් බලපත්‍රය අලුත් කිරීමට ප්‍රථම හිඟ සමථ වාර්තාවක් සෑම මහාධිකරණයකට ම යවන ලෙස දන්වා ඉඩම් රෙජිස්ට්‍රාර්වරු වෙත උපදෙස් ලබා දී ඇත. නොතාරිස් ආඥා පනතේ රීති කඩ කරන අවස්ථාවන්හිදී නඩු දැමීමට ප්‍රථම ධූරයේ කාර්යයන්	නොගෙවන ලද සමථ මුදල් පවතින අතර එය නොගෙවන ලද නොතාරිස්වරුන් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

	සමාලෝචිත වර්ෂයේදී ද කටයුතුකර නොතිබුණි.			තාවකාලිකව අත්හිටුවීමට ඉඩ සලසා ඇත.	
20	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති 96, 97, 101, 103, 105 හා 106 ප්‍රකාරව අවුරුදු තුනක පරිවාස කාලයකට හෝ වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන පරිදි රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II ශ්‍රේණියට 2005 සිට 2016 වසර දක්වා කාලය තුළ බඳවාගෙන තිබුණු නිලධරයින් 30 කගේ සහ 2018 වසරේදී බඳවාගෙන තිබුණු නිලධරයින් 45 කගේ පත්වීම් ස්ථිර කිරීමට හෝ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට හෝ කටයුතුකර නොතිබුණි.	2023	කාර්ය පටිපාටික රීති ප්‍රකාරව ස්ථිර කිරීම සඳහා සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගේ සේවය ස්ථිර කිරීමටත්, එසේ නොවන නිලධාරීන්ගේ පරිවාස කාලය දීර්ඝ කිරීමට හෝ පත්වීම අවසන් කිරීමට හෝ කටයුතු කර දෙපාර්තමේන්තු කටයුතු විධිමත් කළ යුතු ය.	පත්වීම් ස්ථිර කිරීම්, පරිවාස කාලය දීර්ඝ කිරීම් හෝ පත්වීම අවසන් කිරීම් කටයුතු නිසිපරිදි සිදු කිරීමට උපදෙස් ලබාදී ඇත.	නිලධාරින් තනතුරේ ස්ථිර කිරීම්, පරිවාස කාලය දීර්ඝ කිරීම් හෝ පත්වීම අවසන් කිරීමේ කටයුතු විධිමත් කිරීමේ කටයුතු සතුටුදායක මට්ටමක නොතිබුණි.
21	කාර්ය පටිපාටික රීති 135හි විධිවිධානවලට පටහැනිව හා ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ 16:10 වගන්තිය සාවද්‍ය ලෙස නිර්වචනය කරමින් වැටුප් රහිත	2023	නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය තීරණය කිරීමේදී කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි ජ්‍යෙෂ්ඨත්වය නිවැරදිව සැකසිය යුතු ය.	කාර්ය පටිපාටික රීති 135හි විධිවිධානවලට සහ ආයතන සංග්‍රහයේ පරිච්ඡේදයන් නිසි ලෙස අනුගමනය කිරීමට උපදෙස් ලබාදී ඇත.	ජ්‍යෙෂ්ඨත්වය නිවැරදි කර ජ්‍යෙෂ්ඨතා ලේඛනය යාවත්කාලීනකර නොතිබුණි.

	නිවාඩු ලබාගෙන තිබූ මෙන්ම නියමිත කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම ඉක්මවීමට අසමත් වූ ඇතැම් නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය එවැනි නිවාඩු ලබානොගත් නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වයටත් ඉහළින් තැබීමට කටයුතුකර තිබුණි.				
22	කාර්ය පටිපාටික රීති 122 හා 123 විධිවිධාන ප්‍රකාරව සේවා ව්‍යවස්ථාවෙහි හෝ බඳවාගැනීමේ පටිපාටියෙහි හෝ නියමකර ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම පැවැත්විය යුතු වුවත්, රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වර්ෂයකට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකක් පැවැත්විය යුතු වුව ද, 2013 ජනවාරි සිට 2023 වර්ෂය අවසානය දක්වා වූ වර්ෂ 11ක් තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 05ක් පමණක් පවත්වා තිබුණි.	2023	නියමිත කාලසීමාවන් තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කළ යුතු ය.	සේවා ව්‍යවස්ථාවන්හි හෝ බඳවාගැනීමේ පටිපාටියන්හි හෝ නියමකර ඇති පරිදි කාර්යක්ෂමතා කඩඉම් නිසි පරිදි පැවැත්වීමටත්, නොපැවැත්වූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ කඩිනමින් පැවැත්වීමටත් උපදෙස් ලබාදී ඇත.	2013 වර්ෂයේ සිට මේ දක්වා වාර 5ක් පමණක් මෙම පරීක්ෂණය පවත්වා ඇති නමුත්, ඉන් අනතුරුව අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා නොතිබුණි.
23	කාර්ය පටිපාටික රීති 251 ප්‍රකාරව බලය අභිනියෝජිත බලධරයා විසින් රජයේ ප්‍රතිපත්තිවලට සහ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවලට අනුකූලව වාර්ෂික	2023	කාර්ය පටිපාටික රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.	අනුමත ස්ථාන මාරු පටිපාටියක් සහ නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදී ඇත.	2025.01.01 දිනෙන් පසු එළඹෙන වර්ෂය සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇති බව දන්වමි.

	ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පටිපාටි සකස් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගත යුතු වුවත්, එවැනි අනුමත ස්ථාන මාරු පටිපාටියක් විගණනයේදී නිරීක්ෂණය නොවූ අතර, දෙපාර්තමේන්තුගත ඇතැම් නිලධරයන්ගේ වාර්ෂික ස්ථාන මාරු නිසි ක්‍රමවේදයක් මත සිදුකර නොමැති අවස්ථා ද නිරීක්ෂණය විය.				
24	දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට පැවති ගබඩා තොග සම්බන්ධයෙන් විශේෂ සමීක්ෂණයක් සිදුකිරීමට පත්කළ සිව් පුද්ගල කමිටුව 2023 සැප්තැම්බර් 26 දිනැති වාර්තාව අනුව වටිනාකම රු.507,764 ක් වූ අයිතම 14 ක භාණ්ඩ 3,453 ක ඌනතා සහ අයිතම 31 ක භාණ්ඩ 428 ක අතිරික්තතා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පැවැත්වීමට නිර්දේශකර තිබුණ ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි. කෙසේ වුව ද, නිසි විමර්ශනයකින් තොරවම ඒ වන විට සේවයේ නියුතුව සිටි	2023	මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු අතර, ප්‍රමාදයන්ට හා නිසි වගවීමකින් තොරව කටයුතුකර ඇති නිලධාරින්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතු ය.	නිසි විමර්ශනයක් සිදු කිරීමට උපදෙස් ලබාදී ඇත.	විමර්ශනය කටයුතු මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

	ගබඩා භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සම්බන්ධව කටයුතු කළ නිලධාරිනිය වෙත තනතුර හැරයාමේ නිවේදනයක් 2023 ජනවාරි 12 දින නිකුත්කර තිබුණි.				
25	ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් සිදුකර තිබුණු විනය විරෝධී කටයුතු සම්බන්ධයෙන්, මූලික විමර්ශන පැවැත් වීමට 2021 නොවැම්බර් 09 දින රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් අනුමැතිය ලබාදී තිබුණ ද, මාස 28ක පමණ කාලයක් ගත කර ඇතත්, අදාළ මූලික විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි.	2023	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට කටයුතු කළ යුතු ය.	මූලික විමර්ශන කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදී ඇත.	මූලික විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණි.
26	කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවයේ නියුතු ඇතැම් නිලධාරීන් විසින් සිදු කරන අල්ලස් ලබාගැනීම් සහ මහජනතාවට හිංසාපීඩා සිදුකිරීම සම්බන්ධව ජනාධිපතිතුමා වෙත යොමුකර තිබූ නිර්නාමික ලිපියක් 2020 ජූලි 10 දින රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලැබී තිබුණු අතර, මේ සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදුකළ මධ්‍යම	2023	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු අතර විමර්ශන වාර්තා සම්බන්ධයෙන් අප්‍රමාදව කටයුතු කළ යුතු ය.	නිසික්‍රමවේදයක් ඔස්සේ විමර්ශන කටයුතු සිදු කිරීමට පියවර ගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත.	නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.

	කළාප සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ වාර්තාව 2020 සැප්තැම්බර් 14 දින ඉදිරිපත්කර තිබුණ ද, එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මකකර නොතිබුණි.				
27	පානදුර ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2013 වර්ෂයේ දී සිදුවී තිබුණු රු.532,600ක මුදල් වංචාවක් සම්බන්ධ චෝදනාපත්‍රයක් සඳහා පිළිතුරු ලබාගැනීම සඳහා මාස 15ක කාලයක් ගතකර තිබුණු අතර, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට විමර්ශන වාර්තාවේ දින සිට මාස 22 ක කාලයක් ගතකර තිබුණි. මේ හේතුවෙන් මු.රෙ.104(2) ප්‍රකාර වාර්තාව මහා භාණ්ඩාගාරය වෙත යැවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තව ද, මූලික විමර්ශන වාර්තාවේ නිර්දේශවලට අනුව, මෙම මූල්‍ය අක්‍රමිකතාවය අනාවරණයකර ගැනීමට අපොහොසත් වූ නිලධාරිනිය වෙත චෝදනා පත්‍රයක්	2023	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු අතර, අනවශ්‍ය ප්‍රමාදයන් සිදු නොකිරීමට වග බලාගත යුතු ය.	නිලධාරිනියට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණය ආරම්භ කිරීමට උපදෙස් ලබාදී ඇත.	විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

	නිකුත්කර තිබුණේ විමර්ශන වාර්තාවේ දින සිට මාස 39ක් ද ඉක්මවීමෙන් පසු වූ අතර, ලද පිළිතුරු මත ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට ද කටයුතු කර නොතිබුණි.				
28	ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 2020 මැයි 27 දින සිදුකළ මුදල් වංචාවක් සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් 2020 ජුනි 30 දින පත්කළ කමිටුව විසින් මාස 16ක් ප්‍රමාදකර තිබුණු වාර්තාව, ලේකම්වරයා විසින් 2021 දෙසැම්බර් 06 දින දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබුණු අතර, එදින සිට මාස 19ක් ගතවන තුරුත් නිදහසට කරුණු විමසා නොතිබුණි. මේ පිළිබඳව ආරක්ෂක ලේකම්වරයා විසින් ද 2021 අගෝස්තු 30 දින රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත දැනුම්දී තිබුණ ද, ඒ සඳහා කමිටුවක් පත් කිරීමට මාස 05ක් ද, එහි විමර්ශන වාර්තාව ලබාගැනීමට මාස 14ක් ද ගතකර තිබුණි.	2023	විනය විරෝධි කටයුතු සම්බන්ධයෙන් පවත්නා නීතිරීතිවලට අනුව කටයුතු කළ යුතු අතර, අනවශ්‍ය ප්‍රමාදයන් සිදු නොකිරීමට වග බලා ගත යුතු ය.	අමාත්‍යාංශය මගින් මූලික විමර්ශන වාර්තාවක් ගෙන්වා ගෙන ඉදිරි පියවර ගැනීමට උපදෙස් ලබාදී ඇත.	විනය ක්‍රියාමාර්ග ගැනීම අවසන් කර නොතිබුණි.

29	ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩය අනුව, රජයට ලැබිය යුතු මුදල් සාවද්‍ය ලෙස වංචා කිරීම හා රාජ්‍ය සම්පත් අයථා ලෙස පරිහරණය කිරීම රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය යටතට අයත් වුව ද, මෙම මූලික විමර්ශනය අනුව එය දෙවන උපලේඛනය යටතට අයත් වන වැරදි වශයෙන් අර්ථ දක්වා අදාළ නිලධාරින්ට ලඝු විනය ක්‍රියාපටිපාටිය යටතේ විනයානුකූලව කටයුතු කිරීමට නිර්දේශකර තිබුණි. ඒ අනුව මෙම සිදුවීමට සෘජුවම සම්බන්ධ අතිරේක ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා ප්‍රධාන කාර්යාලය වෙත ස්ථාන මාරු කිරීමට නිර්දේශකර තිබුණ ද, එය ක්‍රියාත්මක නොකර 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු යටතේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්ථාන මාරුවක් ලබාදීමටත්, මෙම සිදුවීමට ආධාර අනුබල දුන් බවට චෝදනා ලද ඉඩම් රෙජිස්ට්‍රාර්වරයාට විනයානුකූලව	2023	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව විනය ක්‍රියාමාර්ග ගැනීම විධිමත් කළ යුතු ය.	ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් මූලික විමර්ශන වාර්තාවක් ගෙන්වා ගෙන ඉදිරි පියවර ගැනීමට උපදෙස් ලබාදී ඇත.	මූලික විමර්ශනය වාර්තාව නිර්දේශ එදින වන විට එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණ ද, ඒ අනුව කටයුතු නොකර, 2021 අගෝස්තු මස සිට සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරක පූර්ණකාලීනව රාජකාරි ඉටුකිරීම සඳහා පත්කිරීමටත් කටයුතුකර තිබුණි.				
30	රෙජිස්ට්‍රාර් සේවය III පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවාගන්නා ලද ඇතැම් නිලධාරින්ට අදාළ වාර්ෂික සමාලෝචන වාර්තා නියමිත කාලයට පෙර සම්පූර්ණකර ඔවුන්ගේ පත්වීම් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබූ අතර, ඇතැම් නිලධාරින්ගේ යාවත්කාලීන වූ පෞද්ගලික ලිපිගොනු පෙර සේවා ස්ථානයෙන් ගෙන්වා ගැනීමට ද අසමත්වී තිබුණි. තව ද මෙම තනතුර සඳහා බඳවාගත් ඇතැම් නිලධාරින් ඔවුන්ගේ ලිඛිත පරීක්ෂණවලින් සමත්වී ඇති බවට ප්‍රතිඵල ලේඛනවලින් සනාථ කරගත නොහැකි විය.	2023	නිලධාරින් සම්බන්ධ ලිපිගොනු නිසිපරිදි හා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු ය.	නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු නිසිපරිදි නඩත්තු කිරීමට උපදෙස්දී ඇත.	නිලධාරීන්ගේ යාවත්කාලීන වූ පෞද්ගලික ලිපිගොනු පෙර සේවා ස්ථානයෙන් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.
31	රෙජිස්ට්‍රාර් සේවය III ශ්‍රේණියේ තනතුරුවලට බඳවාගැනීම සඳහා	2023	බඳවාගැනීම් විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතු අතර, අවශ්‍ය	නියමිත ලකුණු මට්ටම් අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමට	අදාළ අපේක්ෂකයින් 117 දෙනා සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කළ බව සනාථ කිරීම සඳහා

	2007 නොවැම්බර් 25 දින පවත්වා තිබුණු විභාගයෙන් ලකුණු 232 - 192 ත් අතර, ලකුණු ප්‍රමාණයක් ලබාගත් අපේක්ෂකයින් 83 දෙනෙකු තනතුර සඳහා පත්කරගෙන තිබූ නමුත්, ලකුණු 259 - 193 ත් අතර ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන තිබූ අපේක්ෂකයින් 117 දෙනෙකු සම්මුඛ පරීක්ෂණය සඳහාවත් කැඳවීම්කර ඇති බවට විගණනය වෙත සනාථ නොවී ය.		තොරතුරු පවත්වාගත යුතු ය.	උපදෙස් ලබාදී ඇත.	අවශ්‍ය තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවී ය.
32	රෙජිස්ට්‍රාර් සේවය III ශ්‍රේණියේ තනතුරුවලට බඳවාගැනීම සඳහා විභාගයට අදාළ අනුමත බඳවාගැනීමේ පටිපාටියක් නොවුණු අතර, තනතුරු සඳහා තෝරාගන්නා ලද අපේක්ෂකයින් 83 දෙනා අතරින් විෂයයන් 4ටම ලකුණු 40ට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයින් ගණන 22කු පමණක් වූ අතර 61 දෙනෙකුම විෂයයන් දෙකකට හෝ එකකට ලකුණු 39ට වඩා අඩු ලකුණු ලබාගෙන තිබූ අපේක්ෂකයන් විය.	2023	බඳවාගැනීම් විනිවිදභාවයෙන් යුතුව සිදුකළ යුතු ය.	අනුමත බඳවාගැනීමේ පටිපාටියක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදී ඇත.	රෙජිස්ට්‍රාර් සේවය III ශ්‍රේණියේ තනතුරුවලට අදාළ අනුමත බඳවාගැනීමේ පටිපාටියක් නොවී ය.

33	දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා නිසි අනුමැතියන් මත ලබාදෙනු ලබන අඩ වැටුප් සහිත සහ වැටුප් රහිත නිවාඩු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ අංශ අතර, නිසි සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු නොකිරීම හේතුවෙන් ඇතැම් නිලධාරින්ට ගෙවා ඇති මාසික වැටුප නිවැරදිව ගණනය කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය.	2023	දෙපාර්තමේන්තුවේ අංශ අතර, නිසි සම්බන්ධීකරණයකින් යුතුව කටයුතු කළ යුතු ය.	අංශ අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් මෙම දෝෂ මගහරවා ගැනීමට උපදෙස් ලබාදී ඇත.	මෙම තත්වය මගහරවා ගැනීමට අංශ අතර සම්බන්ධීකරණය සිදුකර ඇති බව දන්වමි.
34	මාළිගාවත්ත මධ්‍යම ලේඛනාගාරයේ විදුලි බිල්පත් නියමිත පරිදි නොගෙවීම හේතුවෙන් විදුලිබල මණ්ඩලයට ගෙවීමට සිදුවූ අධිභාරය සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව පරීක්ෂණයක් සිදුකර එය අයකර ගත යුතු නිලධාරින් වෙත් නම් ඒ සම්බන්ධයෙන් සොයා බැලීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් 2023 ඔක්තෝබර් 10 දින නියෝග ලබාදී තිබුණ ද, ඒ සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දින වන විටත් මු.රෙ.101 ප්‍රකාරව කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව විමර්ශන කටයුතු අප්‍රමාදව සිදුකළ යුතු ය.	මාළිගාවත්ත මධ්‍යම ලේඛනාගාරයේ විදුලි බිල්පත් ප්‍රමාද වී ගෙවීම හේතුවෙන් අධිභාර මුදලක් ගෙවීම සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා විමර්ශන අංශයට දැනුම්දීමට උපදෙස් ලබාදී ඇත.	මූලික විමර්ශන කටයුතු කාර්යක්ෂමව සිදු නොවන බව නිරීක්ෂණය විය.
35	2022 දෙසැම්බර් 20	2023	රේඛීය අමාත්‍යාංශ	නියමිත කාලය	අංක

	දිනැති අංක HA/05/20/05 දරන අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපිය ප්‍රකාරව නියමිත කාලය තුළ, ගෙවීම් නොකර හිඟ බිල්පත් ඇතිවීමට හේතු සොයා බලා අවශ්‍ය පියවර ගැනීමටත්, 2023 වර්ෂයේ සිට මෙවැනි මූල්‍ය අලාභ සිදුවීම වැළැක්වීමට අදාළ පියවරගත යුතු බවටත් උපදෙස් ලබාදී තිබුණ ද, ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයට අදාළව ද හිඟ බිල්පත් ඇතිවීම නිසා කාර්යාල 08කට අදාළව දඩ පොළී ගෙවීමට සිදු වී තිබීමෙන් තවදුරටත් රජයට අලාභ සිදුවී ඇති බව නිරීක්ෂණය විය.		ලේකම්වරයාගේ උපදෙස් අනුව කටයුතු කිරීම අතපසු නොකළ යුතු අතර, සිදුවී ඇති එවැනි වැරදි ඉදිරියට සිදු නොවීමට වග බලාගත යුතු ය.	තුළ, ගෙවීම් නොකර හිඟ බිල්පත් ඇතිවීමට හේතු සොයා බැලීමට කමිටුවක් පත් කරන ලෙසත්, මින් ඉදිරියට නියමිත පරිදි ගෙවීම් කරන ලෙසත් උපදෙස් ලබාදී ඇත.	RG/AB/POU/06/01/18 හා 2024.07.15 දිනැති ලිපිය මගින් විදුලි බිල්පත්වල හිඟ ශේෂ සම්බන්ධව කරුණු සොයා බැලීම සඳහා කමිටුවක් පත්කර ඇති බව දන්වමි.
36	බදු පදනම මත මිලදී ගෙන තිබුණු කාර්යාල පරිශ්‍ර 06 කට අදාළ බදු ගිවිසුම් කාලය අවසන් වී මාස 03 - 12 ත් අතර, කාලයක් ගතවී තිබුණ ද, නව බදු ගිවිසුම්වලට එළඹීමකින් තොරව රු.943,500 ක මාසික බදු මුදල් ගෙවමින් තවදුරටත් කාර්යාල පවත්වාගෙන ගොස් තිබුණි.	2023	කුලී ගොඩනැගිලිවල බදු කාලය අවසන්වීම නිශ්චිතව හඳුනාගත හැකි බැවින් නව ගිවිසුම්වලට එළඹීමට අවශ්‍ය සියලු කටයුතු පෙර සූදානමකින් සිදුකළ යුතු ය.	නියමිත කාලයට බදු ගිවිසුම් අත්සන් කිරීමට උපදෙස් ලබාදී ඇත.	රජයේ තක්සේරුව, තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදීමට ප්‍රමාදවීමෙන් ප්‍රාදේශීය කාර්යාලයන්හි බදු ගිවිසුම් අත්සන් කිරීමට ප්‍රමාද වී ඇත. මින් ඉදිරියට සිදු නොවීමට වගබලා ගන්නා බව දන්වා සිටිමි.
37	නොතාරිස්	2022	ආඥා පනතේ	රීති නිසිපරිදි	ඉඩම් රෙජිස්ට්‍රාර්

	ආඥාපනතේ 31 වන වගන්තියේ සඳහන් රීති නිසි පරිදි අනුගමනය නොකිරීම හා පවතින අඩුපාඩු නිවැරදි කිරීමට ප්‍රමාදවීමත්, ඒවා පිළිබඳව නිලධාරින්ගේ පසුවිපරම් කිරීම නිසිපරිදි සිදු නොවීමත් වැනි කරුණු හේතුවෙන් ලේඛන ලියාපදිංචිය ප්‍රමාද වූ අවස්ථා නිරීක්ෂණය වූ අතර, ලේඛනවල පවතින අඩුපාඩු ප්‍රමාදයකින් තොරව නිවැරදි කිරීමට කටයුතු නොකරන නොතාරිස්වරුන් සම්බන්ධයෙන් විධිමත් පියවරයන් ගැනීමට ද කටයුතුකර නොතිබුණි.	2023	රීතිවලට අනුකූලව කටයුතු කළ යුතු ය.	අනුගමනය කිරීමට හා පවතින අඩුපාඩු කඩිනමින් නිවැරදි කිරීමට සහ අඩුපාඩු සහිත ඔප්පු ප්‍රතික්ෂේප කිරීමට උපදෙස් ලබාදී ඇත.	කාර්යාලවල නොතාරිස්වරුන් ගෙන්වා නිවැරදි කිරීම හා අඩුපාඩු සහිත ඔප්පු ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කිරීමට උපදෙස් ලබාදී ඇති බව දන්වමි.
38	2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 2,818ක් වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 3,916 ක් විය. එහි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොගෙන බඳවාගත් සංවර්ධන නිලධාරීන් 1,283ක අතිරික්තයක් සහ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක් ද ඇතුළත්ව තනතුරු කාණ්ඩ 18ක අනුමත නිලධාරීන් 185ක	2022 2023	අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවාගැනීම් සිදුකිරීමට වගබලා ගත යුතු ය.	අනුමත කාර්ය මණ්ඩලය සඳහා පමණක් බඳවාගැනීම් සිදු කිරීමට උපදෙස් ලබාදී ඇත.	සේවක මණ්ඩල සංශෝධනය සඳහා කටයුතු කර නොතිබුණි.

	ඌණතාවයක් නිරීක්ෂණය විය.				
39	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයේ පොත් බැඳුම්කරු තනතුරු 77න් තනතුරු 03ක් පමණක් පුරප්පාඩුව පැවතිය ද, ගාල්ල දිස්ත්‍රික්කයට අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරින් 06ක් අනුයුක්ත කිරීම හේතුවෙන් අනෙකුත් දිස්ත්‍රික්ක තුළ තනතුරු පුරප්පාඩු නිර්මාණය වී තිබුණි.	2023	කාර්ය මණ්ඩලය නිසිපරිදි කළමනාකරණය කර කාර්යක්ෂමව සේවයේ යෙදවිය යුතු ය.	අනුමත කාර්ය මණ්ඩලය සඳහා පමණක් අනුයුක්ත කිරීම් සිදු කිරීමට උපදෙස් ලබාදී ඇත.	නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.
40	දෙපාර්තමේන්තුවේ වැඩි කාර්යභාරයක් පවතින අංශයන් හා කාර්යාල 05ක් සඳහා ස්ථිර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් අනුක්ත නොකර එම තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා ඉඩම් රෙජිස්ට්‍රාර්වරු 10 දෙනෙකු අනුයුක්ත කර තිබූ අතර, එයින් ද ඇතැම් නිලධාරින්ගේ රාජකාරි ආවරණය කිරීමේ කාලය අවසන්ව තිබූ අතර, අනෙකුත් නිලධාරින්ගේ අනුමත කාලය 2024 ජූනි 30 දින වන විට අවසන් වීමට නියමිතව තිබුණි.	2023	වැඩි කාර්යභාරයක් පවතින අංශයන් හා කාර්යාල සඳහා පළපුරුදු සහ ස්ථිර නිලධාරින් අනුයුක්ත කළ යුතු ය.	පුරප්පාඩුව පවතින නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 07 සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදන සඳහා අනුමැතිය ලබාගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස උපදෙස් ලබාදී ඇත.	මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරු 07 සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවාගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ නිවේදන කෙටුම්පත් අනුමැතිය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමුකර ඇති බව දන්වා සිටිමි.
41	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	2023	ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ	පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර්	මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින ඉඩම්

විසින් 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 හා 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත්කර ඇති කාර්ය පටිපාටික රීති 118 හා 130 ප්‍රකාරව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබානොගෙන ඉඩම් රෙජිස්ට්‍රාර් තනතුරේ රාජකාරි ආවරණය කිරීමේ පදනම මත නිලධාරීන් 36 දෙනෙක් අනුයුක්තකර තිබුණි.	විධිවිධාන මධ්‍යම රජයේ නිලධාරින්ට අදාළ නොවන බැවින් කාර්ය පටිපාටික රීති අනුව කටයුතු කළ යුතු ය.	(රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තිය) තනතුරු සඳහා අතිරේක ඉඩම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණිය) නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලබාගැනීමට කටයුතු කරන ලෙසත්, අතිරේක ඉඩම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණිය) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමෙන් පසු ඉඩම් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තිය) සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කරන ලෙසත් උපදෙස් ලබාදී ඇත.	රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තිය) තනතුරුවල රාජකාරි ආවරණය කිරීම සඳහා අතිරේක ඉඩම්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ II/I ශ්‍රේණිය) නිලධාරීන් පත්කර ඇත. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තිය අනුව හා VII පරිච්ඡේදයේ 12.2.5 වගන්තිය අනුව රාජකාරි ආවරණය කිරීමට යොදා ඇති නිලධාරීන් සඳහා රාජකාරි ඉටුකිරීමේ වැටුපක් හෝ වැඩබැලීමේ දීමනාවක් ගෙවනු නොලබයි. පුරප්පාඩුව පවතින ඉඩම් රෙජිස්ට්‍රාර් නිලධාරීන් බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභා අනුමැතිය ලැබී ඇත. අතිරේක ඉඩම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ III පන්තියේ I ශ්‍රේණිය) වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පැවැත්වීමෙන් පසු ඉඩම් රෙජිස්ට්‍රාර් (රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තිය) සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

57. ශීර්ෂය - 280 ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	96,766,350	96,766,350	96,090,156	තත්ත්වාගණනය කළ
2022	79,528,641	79,528,641	79,528,641	තත්ත්වාගණනය නොකළ
2023	73,232,825	73,232,825	73,232,825	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 8 ක් පැරණි රු.139,921 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් වී නොතිබුණි.	2023	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	නිලධාරියා විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමින් පවතින අතර, ඔහුට ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිකයෙන් ඔහුගෙන් රජයට අයවිය යුතු අයවීම් අයකර ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	2024 දෙසැම්බර් 31 දින වන විටත් ණය ශේෂය අයකරගෙන නොතිබුණි.
02	අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය සහතික කරනු වස් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් අධීක්ෂණය, උපදේශනය සහ පහසුකම් සැලසීම මෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන ආයතන වෙත උපදේශනය ලබා දෙමින් සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම තුළින් එකඟ වූ කාලරාමුව සහ පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන	2023			

	අරමුණු වූ අතර, ඊට අදාළ කාර්යයන් ඒ අනුව හඳුනාගෙන තිබුණි. එම කාර්යයන් ඉටු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.				
(i)	විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයේ දේශීය හා විදේශීය මූල්‍යයනය මත විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සංඛ්‍යාව 209 ක් පැවති අතර, මෙම විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘති අතරින් 91 ක් දේශීය අරමුදල් හා ණය මගින්ද, ව්‍යාපෘති 118 ක් විදේශීය ණය හා ප්‍රදාන මගින්ද මූල්‍යයනය කර තිබුණි. ඉහත ව්‍යාපෘති අතරින් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 107 ක් අතරින් ව්‍යාපෘති 23 ක් පමණක් අවසන් ව්‍යාපෘති ප්‍රතිඵලය ජනනය කිරීමට සමත්ව තිබුණු අතර, කාර්යසාධන ගැටළු හේතුවෙන් මහා පරිමාණ ව්‍යාපෘති 06 ක් වර්ෂ අවසානය වන විට අත්හිටුවා තිබුණි. 2023 වර්ෂයේ ක්‍රියාත්මක වූ විශාල හා මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනය දළ වශයෙන් රු.බිලියන 716 ක් වූ අතර 2023 වර්ෂය අවසාන වන විට උපයෝජනය කිරීමට සමත්වූ ප්‍රමාණය රු.බිලියන 361 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් 50% ක්	2023	සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කර එකඟ වූ කාල රාමුව හා පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල අත්කර ගැනීමට අවශ්‍ය ලෙස මෙහෙයවීම සිදුකළ යුතුය.	මෙම දෙපාර්තමේන්තුව මගින් විශාල සහ මහා පරිමාණ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය මාසිකව සමාලෝචනය කරන අතර, කාර්තුමය වශයෙන් එම ප්‍රගතිය හා ගැටළු සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරනු ලබයි. අමාත්‍ය මණ්ඩලය මගින් ඒ සඳහා දෙනු ලබන තීරණය රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දැනුම් දෙනු ලබන අතර, දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනු ලබන රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන ගැටළු ජාතික මෙහෙයුම් මැදිරිය වෙත යොමු කිරීමද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, අදාළ පහසුකම් ප්‍රයෝජනයට ගෙන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය අපේක්ෂිත	2023 වර්ෂය අවසන් වන විට දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටු වී නොතිබුණි.

	පමණක් අනාවරණය විය. ඒ අනුව අපේක්‍ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ අරමුණ අපේක්‍ෂිත පරිදි ඉටුවී නොතිබුණු බව නිරීක්‍ෂණය විය.			ඉලක්ක අනුව අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීමක් වේ.	
03	ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්‍ෂණ දෙපාර්තමේන්තුව ප්‍රගති අධීක්‍ෂණ කටයුතු සඳහා දත්ත රැස්කිරීමේ ප්‍රධාන මාධ්‍යයක් ලෙසට භාවිතා කිරීම සඳහා ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය (NDIS) නව තාක්‍ෂණය යොදා ගනිමින් වෙබ් පදනම් කරගත් ව්‍යාපෘති අධීක්‍ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 වර්ෂයේදී විවෘත මිල ගණන් යටතේ ලංසු කැඳවා කොන්ත්‍රාත් වටිනාකම ලෙස බදු සහිතව රු. 135,720,000 ක ලංසුව ඉදිරිපත් කල පෞද්ගලික සමාගමක් වෙත 2021 නොවැම්බර් 25 දින පද්ධතිය සැකසීමේ කොන්ත්‍රාත්තුව පිරිනමා, 2022 පෙබරවාරි 03 දින අත්තිකාරම් ලෙස රු.12,169,950 ක් ලබාදී තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2022 අගෝස්තු 31 දින මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවා, කොන්ත්‍රාත්කරුට ලබාදී තිබූ අත්තිකාරම් මුදල වූ රු.12,169,950 කට අදාළ අත්තිකාරම් සුරක්‍ෂණය 2022 ඔක්තෝබර් 20 දින නැවත දෙපාර්තමේන්තුව වෙත අයකර ගෙන	2023	ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය කඩිනමින් සකසා ගැනීමට කටයුතු කළ යුතු වීම.	ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.12,169,950.70 ක් අත්තිකාරමක් ලෙස රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියට අනුව ලබාදී තිබුණි. අත්තිකාරම් ලබාදී මාස 09 ක් ගතවන විට කොන්ත්‍රාත්කරුට මෙම කාර්යය නියමිත පරිදි නියමිත වේලාවට සිදුකල නොහැකි බව අවබෝධ කර ගැනීම තුළින් එම කොන්ත්‍රාත්තුව අත්හිටුවීමට කටයුතු කළ අතර, ඒ තුළින් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි නිර්මාණය නොවන හා නියමිත කාලය තුළ නිමකර ගත නොහැකි පරිගණක මෘදුකාංගයක් සකස් වීම තුළ රජයට දැරීමට සිදුවිය හැකි අනාර්ථික පිරිවැය වැළැක්වී ඇත.	2024 දෙසැම්බර් 31 දින වන තෙක් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතිය සකසා නොතිබුණි.

තිබුණි.

(i) මෙහිදී මාස 09 කට අධික කාලයක් ඉහත අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත රඳවා තැබීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ අතර, මේ දක්වා උචිත පද්ධතියක් සකසා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකිවී තිබුණි.

	(ii) NDIS නවීකරණය කිරීමේ කොන්ත්‍රාත්තුව අතරමගදී අවසන් කිරීම නිසා 2023 වර්ෂයේදී ව්‍යාපෘති සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු අදාළ පාර්ශවයන් සම්බන්ධ කර විසඳාදීම සඳහා විශේෂ ප්‍රයත්නයක් දැරීමට සිදුවී ඇති බව විගණනයට නිරීක්ෂණය වූ අතර, ඉහත කොන්ත්‍රාත්තුව අත්හිටුවා 2023 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 මාස 04 ක් ගතවී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තොරතුරු පද්ධතිය නවීකරණය කර ගැනීමේ කිසිදු ඉදිරි පියවරක් ගෙන නොතිබුණි.		ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය කඩිනමින් සකසා ගැනීමට කටයුතු කළයුතු වීම.	මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවීමෙන් පසු මෙවැනි සංකීර්ණ මෘදුකාංගයක් සකස් කිරීම පහසු නොවන බව හා කල්ගත වන කාර්යයක් වන බව ප්‍රත්‍යක්ෂ වූ බැවින්, දැනට දෙපාර්තමේන්තුව සතු අක්‍රිය තත්වයේ පවතින ඒකාබද්ධ ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය, 2024 වර්ෂයේදී ආරම්භ කිරීමට යෝජිත ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන සෞඛ්‍ය පද්ධති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම (NDIS) මෘදුකාංගය අළුත්වැඩියාව සඳහා සහය දීමට එකඟතාවය පළකර ඇති බවද වැඩිදුරටත් සඳහන් කරමි. කෙසේවෙතත් (NDIS) පද්ධතිය සකස් කර ගන්නා තුරු දෙපාර්තමේන්තුවේ කාර්යයන් මහත් පරිශ්‍රමයක් දරා ඉටු කරගෙන යන බවද දන්වනු කැමැත්තෙමි.	- එම -
04.	වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු	2023	තිරසර සංවර්ධන අරමුණු සපුරා	පිළිගනිමි.	- එම -

	පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක් සම්බන්ධව කිසිදු ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.		ගැනීමට කටයුතු කළයුතු වීම.		
05	දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 101 ක් වූ අතර ඉන් තනතුරු 32 ක් හෙවත් 32% ක පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 12 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 03 ක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 12 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 05 ක්ද වශයෙන් පුරප්පාඩු පැවතුණි. ඒ අනුව පුරප්පාඩු තනතුරු පුරවා ගැනීමට හෝ අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	2023	දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමටත්, එසේ නොවන තනතුරු තිබේ නම් ඒවා අනුමත කාර්ය මණ්ඩලයේ සංශෝධනය කිරීමටත් කටයුතු කළයුතු වීම.	පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.	2024 වර්ෂය අවසන් වන විට අනුමත තනතුරු සංඛ්‍යා 101 ක් වූ අතර, එහි පුරප්පාඩු සංඛ්‍යාව 31 ක් වී තිබුණි.

58. ශීර්ෂය - 281 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,031,646,188	728,018,066	2,303,628,122	තත්ත්වාගණනය කළ
2022	3,036,892,905	602,865,512	2,434,027,393	තත්ත්වාගණනය කළ
2023	12,243,136,368	770,793,382	11,472,342,986	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	2023 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ගොවීන්ට පොහොර ලබාදීම සඳහා රු.11,147,000,000,ක් වටිනා වවුචර්පත් 1,626,000 ක් එකක් සඳහා රු.3 ක මුද්‍රණ පිරිවැයක් දරා මුද්‍රණය කර තිබුණි. පොහොර අවශ්‍ය ගොවීන් නිශ්චිතව හඳුනාගත නොහැකි වීම නිසා රු.1,162,077,900 ක් වටිනා වවුචර් 211,583ක් අවලංගු වී තිබුණි.	2023	ගොවීන්ට පොහොර නිකුත් කිරීම හා වවුචර්පත් බෙදාදීම පිලිබද පෙර සැලසුමක්ද පොහොර අවශ්‍ය ගොවීන් නිශ්විතව හඳුනා ගැනීමද කල යුතුය.	Geogoviya.lk දත්ත පද්ධතිය හරහා පොහොර අවශ්‍යතාව නිශ්චිතව හඳුනා ගෙන පොහොර බෙදාහැරීම් කටයුතු සැලසුම් කිරීමට කටයුතු කරනු ලැබේ.	වර්තමානයේදි සියලුම ගොවීන්ගේ ගිණුම් වලට මුදල් බැර කිරීම සිදු කෙරේ.
02.	ලෝක ආහාර ව්‍යාපෘතියෙන් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ CR– 0098 දරන ජීප් රථය 2015 වර්ෂයේ ලියාපදිංචිය සිදුකර භාවිතයට නොගෙන එම වර්ෂයේ සිටම මාලඹේ රථවාහන අංගනයේ ගාල් කර තිබුණි.	2022 2023	භාවිතයට ගත නොහැකි නම් සුදුසු කටයුත්තක් කළ යුතුය.	නැවත මෙවැනි විධිමත් පරිදි ලියාපදිංචි නොකරන ලද වාහන දෙපාර්තමේන්තුව වෙත බාර නොගැනීමට කටයුතු කරනු ලැබේ.	මෙම රථය ලියාපදිංචි කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග අසාර්ථක වූ බැවින් අංක 7/6/4/1/CR-0098 හා 2023.10.23 දිනැතිව එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩපිළිවෙළෙහි ශ්‍රී ලංකා නියෝජිත ආයතනය වෙත නැවත භාර දීමට කටයුතු කිරීමට නියමිතය.

03.	ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය සහ ගොවිජන සේවා කාරක සභා සඳහා සකස් කෙරෙන කළමනාකරණ තොරතුරු පද්ධති මෘදුකාංගය ස්ථාපනය කල පසු දිවයින පුරා පිහිටි ගොවිජන බැංකු නියමු ව්‍යාපෘති වල හා ගොවිජන සේවා කාරක සභා වල පද්ධතිය ක්‍රියාත්මක කෙරෙන ආකාරය පිළිබඳව අධීක්ෂණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීමට යෝජිත මෙහෙයුම් මැදිරිය වෙනුවෙන් අඟල් 65 සැම්සුන් (Samsung) වර්ගයේ ස්මාට් රූපවාහිනී යන්ත්‍ර 05 ක් රු.2,497,800 ක් ගොවිජන බැංකු අරමුදලින් මිලදී ගෙන තිබුණි.මෙම රූපවාහිනි යන්ත්‍ර වල වගකීම් කාලය වසර 01 ක් වන අතර වගකීම් කාලයෙන් මාස 08 ක් යනතුරු රූපවාහිනි යන්ත්‍ර භාවිතයට ගෙන මෙහෙයුම් මැදිරියේ කටයුතු ආරම්භ කර නොතිබුණි.	2023	කළමනාකරණ තොරතුරු පද්ධති ස්ථාපනය කර මෙහෙයුම් මැදිරියේ කටයුතු කඩිනමින් ආරම්භ කළ යුතුය.	මෙහෙයුම් මැදිරියේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.	ප්‍රධාන කාර්යාලයේ ඉදි කල මෙහෙයුම් මැදිරියේ කටයුතු ආරම්භය කර අදාල රූපවාහිනී යන්ත්‍ර භාවිතයට නියමිතව ඇත.
04.	නාරාහේන්පිට අමතර කොටස් ගබඩාවේ ගබඩා භාරකරු විසින් හිතාමතා භාණ්ඩ ලැබීම් තොග පොත්වලට ඇතුළත් නොකර, නිකුත් නියෝග මගින් ටයර් නිකුත් කළ බව දැක්වීම හා ටයර් ශේෂයන් වැරදි ලෙස තුලනය කිරීම හේතුවෙන් 2021, 2022 හා 2023 ජුනි 12 දින දක්වා මිලදී ගෙන තිබුණු රු.2,135,679 ක් වටිනා ටයර් 58 ක්	2023	අලාභය අයකර ගැනීමට හා විධිමත් විනය පරීක්ෂණය කඩිනමින් සිදු කළ යුතුය.	ගබඩාභාරකරු ලෙස කටයුතු කළ නිලධාරියා වහාම ක්‍රියාත්මක වන පරිදි වැඩ තහනමට ලක් කර මේ සම්බන්ධව පොලිසියේ පැමිණිල්ලක් සිදු කර ඇත. අභ්‍යන්තර පාලන ක්‍රමය විධිමත් කර ඇති අතර වාර්ෂික තොග සත්‍යාපනයක් සිදු කරනු ලැබේ.	ගබඩා භාර නිලධාරියාගේ 2023.07.02 දිනැතිව වැඩ තහනම් කර ඒ සම්බන්ධයෙන් 2023.07.07 දින මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා ද 2023.08.03 දින මු.රෙ. 104 පරීක්ෂණයක් සිදු කිරීම සඳහා ද නිලධාරීන් පත් කර ඇත.

	වංචනික ලෙස ඉවත් කර තිබුණි. එම අලාභය අයකර ගැනීමට හා ඒ සඳහා විධිමත් විනය පරීක්ෂණයන් පැවැත්වීමට 2024 අප්‍රේල් 31 දක්වා කටයුතු කර නොතිබුණි.				මූලික විමර්ශනයේ නිර්දේශ අනුව නිලධාරියාට විරුද්ධව චෝදනා පත්‍රයක් කෙටුම්පත් කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024.03.12 දිනැතිව යොමු කරන ලදි. ඒ අනුව ඒකාබද්ධ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2024.08.16 දිනැතිව නිලධාරියා වෙත අදාළ චෝදනා පත්‍රය නිකුත් කරන ලදි. එසේම මු.රෙ. 104 පරීක්ෂණ වාර්තාව ද 2024.05.30 දිනැතිව ලබා දී ඇති අතර සිදුව ඇති අලාභය ලෙස රු.3,371,570 ක් බව වාර්තාව අනුව අනාවරණය වේ. එම මුදල ගබඩා භාරකරු වන කළමණාකරන සේවා නිලධාරී වයි.ඒ.ඩී.අයි. ඥාණරත්න මයාගෙන් අය කර ගැනීමට නිර්දේශ කර ඇත. ඒ අනුව අදාළ මුදල් අය කර ගැනීම සඳහා අධිකාරී බලය ලබා ගැනීමට මහා භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත.
05.	2022 වර්ෂයේ පරිසර අමාත්‍යාංශය රු.51,565,000 ක ප්‍රතිපාදන යටතේ රු.45,000,000 ක් වැය කර තුම්බිකුලම වැව 2023 අගෝස්තු මස	2023	රක්ෂිත වනාන්තර සඳහා පූර්ව අනුමැතිය මත ඉදිකිරීම් කළ යුතු අතර අළුත්වැඩියාවන් නිම කර වගාවන්	ලිඛිත අනුමැතියක් නොමැතිව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර අමාත්‍යාංශ	වගා කිරීම සඳහා ගොවීන් ලියාපදිංචි කර ඇති අතර මේ දක්වා වගා කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතියක් ලැබී නොමැති බැවින්

	ප්‍රතිසංස්කරණය කර නව කුඹුරු අක්කර 400 කට වැඩි ප්‍රමාණයක් වී වගා කිරීමට සැලසුම් කර ඇතත් එම පිහිටි කලාපය පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී රක්ෂිත වනාන්තරයක් බවට ප්‍රකාශ කර තිබුණි.ඒ සඳහා වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව සහ වන ජීවී දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියක් නොමැතිව, වැව් බැම්ම සංවර්ධනය සඳහා රු.24,373,998 ක වියදමක් දරා තිබුණද 2023 ඔක්තොම්බර් 31 දින වන විට වැව් බැම්මේ වම්පස වානේ සිට මීටර් 50-500 වැව් බැම්ම ඇතුලත හා ඉදිරිපස කොටසේ මීටර් 1000 ක් පමණ කොටසක් දක්වා විශාල ලෙස ඉරිතලා බාදනය වී වැව් බැම්මේ මධ්‍යම කොටසද වැව අභ්‍යන්තරයට මීටර් 50 කොටසක් වැව් බැම්ම දෙසට ගිලා බැස තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දින දක්වා වැඩ අවසන් කර මාස 6 ක් ගත වන තුරු කිසිදු වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.		ආරම්භ කිරීමට කටයුතු සැලැස්විය යුතුය.	ලේකම් විසින් ද මේ සම්බන්ධව උපදෙස් ලබා දී ඇත. තවද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ප්‍රතිසංස්කරණ භූමියට ගොස් සීමා මායිම් වෙන්කරදීමට කටයුතු කර ඇත. ව්‍යාපෘතිය ආරම්භයේදී වගා කිරීමට අවශ්‍ය ඉඩම් හඳුනාගෙන තිබූ අතර, එම ඉඩම්වල පෙර වගා කළ සළකුණු සහ වර්තමානයේ භාවිතා කළ හැකි ඇළ මාර්ග පද්ධතියක් පැවතුණි. නමුත් වැවේ වැඩ අවසන් වූ පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉඩම් ලබාදීමේ ගැටළුව නිරාකරණයට කටයුතු සිදු කරමින් පැවතිණි.	වගා ව්‍යාපෘති කිසිවක් ආරම්භ කර නොමැත.
06.	2023 දෙසැම්බර් 31 දිනට මු.රෙ. 104 පරීක්ෂණ, 77 ක් මූලික විමර්ශන 431ක් සහ විධිමත් විනය පරීක්ෂණ 103 ක් නොවිසඳී පැවති අතර මෙම විනය පරීක්ෂණ ලිපිගොනුවලින් 293 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණි.ඒ	2023	විනය පරීක්ෂණ කඩිනමින් අවසන් කර රජයට අයවිය යුතු මුදල් අයකර ගත යුතුය.	විනය පරීක්ෂණ කඩිනම් කිරීම සඳහා විනය කටයුතු සඳහා වෙනම ශාඛාවක් ස්ථාපිත කර විනය ලිපි ගොනු කඩිනමින් අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.	2023 දෙසැම්බර් 31 ට පැවති මු.රෙ. 104 පරීක්ෂණ ගොනු 77 අතුරින් ගොනු 10 ට අදාළව මේ වන විට වැඩ අවසන්ව ඇති අතර එදිනට ක්‍රියාකාරී තත්ත්වයේ පැවති මූලික

	අතර මාස 03 ක් ඇතුළත විසඳිය යුතු මු.රෙ. 104(4) පරීක්ෂණ ලිපිගොනු 37 ක් පැවති අතර මුළු විනය පරීක්ෂණ වලින් රු. 66,194,999 ක් රජයට අයවිය යුතුව පැවතුණි.				විමර්ශන ගොනු 431 අතුරින් ගොනු 48 ට අදාළ කටයුතු අවසන් කර ඇත. එසේම එදිනට පැවති විධිමත් විනය පරීක්ෂණ ගොනු 103 අතුරින් ගොනු 06 ට අදාළ කටයුතු ද මේ වන විට අවසන් කර ඇත. මේ වන විට රු.11,265,382 ක මුදලක් අය වී ඇති අතර මෙම වසරට අදාළව අනාවරණය වූ නව අයවීම් ද සමඟින් රු. 78,653,839 ක මුදලක් තවදුරටත් අය විය යුතුව පවතී.
07.	2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 51(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන සභා පිහිටුවා නොතිබුණි.	2021	ගොවිජන සංවර්ධන සභා පිහිටුවිය යුතුය.	සංශෝධිත නියෝග නීති කෙටුම්පත් වෙත යොමු කර ඇත. අනුමැතීන් ලද විගස ගැසට් පත්‍රයේ පළ කිරීමට නියමිතය.	සංශෝධිත නියෝග නීති කෙටුම්පත් වෙත යොමු කර ඇත.

59. ශීර්ෂය - 282 වාරිමාර්ග දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	99,907,051,692	540,371,713	99,366,679,979	තත්ත්වාගණනය කළ
2022	102,373,355,107	485,499,885	101,887,855,222	තත්ත්වාගණනය කළ
2023	110,877,221,579	663,116,012	110,214,105,567	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණන ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්ථාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක වීමේ තත්ත්වය
01	2021,2022හා 2023 වර්ෂයන්හි දරන ලද රු. 16,207,758,072 ක් හා ඒ යටතේ සංවර්ධනය කරන ලද රු.7,596,399,292 ක දේපල පිරියත හා උපකරණ නිශ්චිත ලෙස හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2021 2022 2023	සියලුම මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.	මේ දක්වා නිවැරදි කිරීම් සිදුකර නැත. මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී මූල්‍ය නොවන වත්කම් පිළිබඳව තොරතුරු යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.
02	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 11/1986 චක්‍රලේඛයේ 5 ඡේදයේ දැක්වෙන පරිදි වාරිමාර්ග 6 ආකෘතිය අනුව ක්ෂේත්‍ර බඩු සටහන් පොත් පවත්වා නොතිබුණි.	2023	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්ෂේත්‍ර තොගපොත් පවත්වාගෙන යා යුතුය.	කලාප හා ප්‍රාදේශීය කාර්යාලවල අදාල නිලධාරීන්ව චක්‍රලේඛ උපදෙස් නිකුත්කර තිබුණි.	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්ෂේත්‍ර තොගපොත් පවත්වා නොතිබුණි.
03	මු.රෙ 1647(ඉ) අනුව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි. වාහන 2,004 ක් සඳහා ලියාපදිංචි කිරීමේ සහතිකපත්,අදාළ ආදායම් බලපත්‍ර,එම වාහන දැනට භාවිතාකරනු ලබන ස්ථානය හා භාරකාරිත්වය පැවරී ඇති ආයතන පිළිබඳ විස්තර යාවත්කාලීනව කර පවත්වාගෙන යාමට ප්‍රවාහනය භාර නිලධාරියා කටයුතු කර නොතිබුණි.	2023	දෙපාර්තමේන්තුව සතු සියළු වාහන සම්බන්ධයෙන් වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය.	ලේඛනයක් පවත්වා ගෙනයාමට උපදෙස් ලබාදී තිබුණි.	දෙපාර්තමේන්තුව සතු සියළු වාහන සම්බන්ධයෙන් තොරතුරු ලේඛන ගත කර නොතිබුණි.

04	දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වරයා විසින් පුද්ගලික සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුව අදාළ සමාගම විසින් 2021 ජනවාරි මස සිට 2022 දෙසැම්බර් මස දක්වා නිෂ්පාදනය කළ විදුලි ඒකක (kwh) 11,519.679 ලංකා විදුලි බල මණ්ඩලය වෙත විකිණීම මගින් උපයාගෙන තිබු රු.200,934,154ක ආදායමෙන් ගිවිසුම අනුව සියයට 15 ක් හෙවත් රු.30,140,123 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව තිබුණි. එයින් රු.6,085,051 ක් එනම් සියයට 20 ක් පමණක් අයකර තිබු නමුත් ඉතිරි රු. 24,055,072 නිසි පරිදි අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. තවද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ලැබිය යුතු ආදායම හඳුනාගැනීමට අදාල ලේඛනද පවත්වා නොතිබුණි.	2023	ආදායම් රැස්කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඒවා රැස්කර ගැනීමට කටයුතු කළයුතුය.	අයකර ගැනමට තිබු රු. 24,055,072 මුදලින් කිසිදු වටිනාකමක් මේ දක්වා අයකරගෙන නොතිබුණි.	ආදායම් රැස්කර ගැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු නොතිබුණි.

05	දැදුරුඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පුද්ගලික සමාගමක් සමග 2017 ඔක්තෝබර් 13 දින අවබෝධතා ගිවිසුමට එලබීමේදී අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය ලබා ගෙන නොතිබුණි. එහිදී අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගෙන නොතිබූ අතර වාරිමාර්ග දෙපාර්තමේන්තුව හෝ වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ගිවිසුම තහවුරු කර හෝ නොතිබුණි. එසේම 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුල ජල විදුලි බලාගාරයෙන් ලැබී තිබූ රු.3,085,051 ක ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබූ අතර එම මුදලින් 2021 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා කාලය සඳහා වාරියපොල ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ රු.3,085,051 ක දුරකථන බිල්පත්, ජල බිල්පත් හා විදුලි බිල්පත් ගෙවීම සඳහා පුද්ගලික සමාගම වෙත ඉදිරිපත් කර තිබුණි. 2023 ජුනි 13 දින පුද්ගලික සමාගමෙන් ලැබී තිබූ රු.2,000,000 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන ඉන් රු. 1,968,532 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්යාල දුරකථන, ජල බිල්පත් හා විදුලි බිල්පත් පියවීමට වැයකර තිබුණි.	2023	අවබෝධතා ගිවිසුමට එලඹීමේදී අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය නිෂ්කාශනය, අදාළ ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති නිර්දේශ ලබා ගත යුතුය.ඒකාබද්ධ අරමුදලට බැර කළයුතු ආදායම් වියදම් සඳහා යොදා නොගත යුතුය.	ගිවිසුමේ නෛතිකභාවය හා කොන්දේසිවල අනුකූලතාවය පිළිබඳ නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලබා ගෙන නොතිබූ අතර 2024 වර්ෂය තුල ජලවිදුලිය උත්පාදනයෙන් මුදල් ලැබී නොතිබූ බැවින් වියදම් කර තිබූ බවට තහවුරු නොවුණි.	අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය නිෂ්කාශනය ලබා ගෙන සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර ලැබූ ආදායම් ඒකාබද්ධ අරමුදලට බැර නොතිබුණි.
06	දෙපාර්තමේන්තුව විසින් ගංගා ඇලදොල ආශ්‍රිතව කුඩා ජලවිදුලි බලාගාර ඉදිකිරීම, වැලි ඉවත් කිරීම ඇතුළු වෙනත් ආර්ථික	2022 2023	විවිධ කාර්යන් තුළින් රැස්කරන ආදායම් සඳහා භාණ්ඩාගාර	2024 වර්ෂය තුල “කුලී ආදායම්” වෙනුවෙන් ආදායම් ශීර්ෂයක් හඳුන්වාදී	ආදායම් එකතු කිරීමට විධිමත් පාලන පද්ධතියක් ස්ථාපිත කර

	කටයුතු සඳහා බලපත්‍ර ලබා දීම හා විවිධ රාජ්‍ය ආයතන වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම වෙනුවෙන් රු.10,000 බැගින් වූ ගාස්තු ලෙස අයකල රු.8,925,901 ක ශේෂයක් අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පත් කර එම තැන්පත් විධිමත් අධිකාරි බලයකින් තොරව වියදම් දරා තිබූ අතර මු.රෙ 569 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය තුළ අදාළ කාර්යයන් තුළින් එක්රැස් කළ ආදායම් හා දරන ලද වියදම් පිළිබඳ නිශ්චිතව හඳුනාගත හැකි පරිදි ගිණුම් තැබීමද කර නොතිබුණි.		අනුමැතිය ලබා ගෙන එම ආදායම් එකතු කිරීමට විධිමත් පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතුය.	තිබුණි.	නොතිබූ අතර එම අදායම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.
07	දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකළ චීන සමාගමක් විසින් මාතර නිල්වලා වේලි ව්‍යාපෘතියේ BR-5 බැම්ම 2003 වර්ෂයේ හානි වී තිබීම නිසා මාතර කිරලකැලේ ප්‍රදේශයට ඇතිවී තිබූ ගංවතුර අවදානම පාලනය කිරිම සඳහා ගාල්ල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට ව්‍යාපෘති කාර්යන් වෙනුවෙන් ලබාදී තිබූ රු. 21,364,992 ක මුදලින් රු.1,120,415 ක් පමණක් වැයකර 2023 දෙසැම්බර් 31 දිනට රු.20,244,577 ක ශේෂයක් අංක 6000-0-0-13-0-36-0-0 දරන තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.	2023	ව්‍යාපෘති මගින් පවරන විවිධ කාර්යයන් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය.	2023 දෙසැම්බර් 31 දිනට පැවති රු. 20,244,577 ක ශේෂය අදාල කාර්ය සඳහා වැය නොකර මේ දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	ප්‍රතිපාදන ඉතිරිවීම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.
08	දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිකිරීමේදි හම්බන්තොට කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාරි නිර්මිතයන්ට සිදුවූ හානි යථා තත්ත්වයට පත්කිරීම සඳහා ලැබී තිබූ රු.22,768,500 ක් තැන්පතු ගිණුමේ රඳවාගෙන ඇතත් එම වාරි නිර්මිතයන් යථා තත්ත්වයට පත්කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ	2023	ව්‍යාපෘති කාර්යයන් සඳහා ලැබෙන ප්‍රතිපාදන අදාළ කාර්යන් සඳහා නොපමාව යොදවාගත යුතුය.	දෙසැම්බර් 31 දිනට තැන්පතු වලින් සියයට 41 ක් ගෙවා රු. 13,265,091 ක ශේෂයක් අදාල කාර්ය සඳහා වැය නොකර මේ දක්වා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.	ප්‍රතිපාදන ඉතිරිවීම් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි.

	දෙසැම්බර් 31 දිනට තැන්පතු වලින් සියයට 41 ක් ගෙවා රු.13,265,091 ක ශේෂයක් තැන්පත් ගිණුමේ තවදුරටත් පැවතුණි.				
09	1983 අංක 23 දරන වාරිමාර්ග (සංශෝධන) පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	2022	වාරිමාර්ග සංශෝධන පනතේ 11 වැනි වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම්වරයා දැනුවත්කර ඇත. වාරිමාර්ග දඩ අරමුදලක් පවත්වාගෙන යාමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	නිර්දේශය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.
10	ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්ති ප්‍රකාරව මිය ගිය සේවකයන් 16 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,933,126 ක්, විශ්‍රාම ගිය සේවකයන් 61 දෙනෙකුගෙන් අයවිය යුතු රු.10,209,662 ක් සහ වැඩ තහනමට ලක් වූ, සේවය හැර ගිය හා සේවය අත්හිටවූ සේවකයන් 35 දෙනෙකුගෙන් අය විය යුතු රු.2,087,808 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම ශේෂයන් තුළ වර්ෂ තුනකට වඩා පැරණි රු. 3,280,334 ක ණය ශේෂ 32 ක් හා අවුරුදු පහකට වැඩි රු.2,047,790 ක ණය ශේෂ 33 ක් විය.	2021 2022 2023	ණය ආපසු නොගෙවූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	මිය ගිය,විශ්‍රාම ගිය ,වැඩ තහනමට ලක් වූ, සේවය හැර ගිය හා සේවය අත්හිටවූ සේවකයන්ගෙන් අය විය යුතු ශේෂ මේ වනවිට අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.	ණය ආපසු නොගෙවූ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
11	ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 5.2.1 හා 5.3.1 වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අයත් කලාප 14 ක පිහිටි නිල නිවාසවල පදිංචි නිලධාරීන්ගෙන් හා සේවකයින්ගෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව නිල නිවාස කුලී අයකර ගෙන නොතිබුණි.	2022 2023	නිල නිවාස වල පදිංචි නිලධාරීන්ගෙන් නිල නිවාස කුලී අයකර ගත යුතුය.	ආයතන සංග්‍රහයට අනුව කටයුතු කරන ලෙස කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන් දැනුවත් කර එම අයකර නොගත් නිවාස කුළී අයකර ගැනීම පිළිබද පරික්ෂා කිරීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශ අනුව මේ වනවිට	නිල නිවාස කුලී අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන තිබුණි.

				නිවාස කුළී අයකර ගනිමින් පැවතුණි.	
12	මු.රෙ.753(1) සහ (2) ප්‍රකාරව විවිධ ව්‍යාපෘතින් යටතේ වැව්/ ජලාශ ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සඳහා ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.	2023	ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල නියමයන්ට අනුව කටයුතු කළ යුතුය.	ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල නියමයන්ට අනුව කටයුතු කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි.	ක්ෂේත්‍රයට සෘජුවම ලැබෙන ද්‍රව්‍ය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවල නියමයන්ට අනුව ලේඛනගත කර නොතිබුණි.
13	මු.රෙ 756 ප්‍රකාරව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල මෙහෙයුම් හා නඩත්තු වැඩ සහ ඉදිකිරීම් කර්මාන්ත සඳහා නිකුත්කර, ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් පරීක්ෂා කර නොතිබුණි.	2022 2023	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු උපදෙස් හා ආකෘති පත්‍ර අනුගමනය කර සිදුකල යුතුය.	ඉංජිනේරු සහකාරවරුන් භාරයේ ඇති ද්‍රව්‍ය වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මගින් පරීක්ෂා කර නොතිබුණි.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය මු. රෙ. හා දෙපාර්තමේන්තු උපදෙස් හා ආකෘති පත්‍ර වලට අනුකූලව සිදුකර නොතිබුණි.
14	බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද රු. මි. 2,093 ක ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත රු.මි 254 කින් වැඩි කර රු.මි. 2,347 ක වටිනාකමකට ප්‍රදානය කර තිබුණි. උක්ත සාවද්‍ය කොන්ත්‍රාත් පිරිවැය වූ රු.මිලියන 2,347 ක් මත පදනම්ව රු. 50,812,416 ක සංචලන අත්තිකාරම් මුදලක් (Mobilization advance) 2019 අගෝස්තු 23 දින වැඩිපුර කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඒ අනුව එකී රු. මිලියන 50 වසර 4 ක් සාවද්‍ය පරිහරණයට ඉඩ සලසා තිබුණි.	2022	ප්‍රසම්පාදන ක්‍රියාවලින් වගකීම් විරහිතව ක්‍රියා කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමටත් එම නොසැලකිලිමත් භාවය තුළ රජයට සිදු කර ඇති පාඩුව සම්බන්ධයෙන් 2018 අංක 18 දරන ජාතික විගණන පනතේ 38(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන වෙත පැමිණිලි කළ යුතුය.	මේ වන විට, එම මුදලින් රු. 40,408,800මුදලක් අඩු කර ගෙන ඇති අතර ඉතිරි මුදල වන රු.10,402,615 ක ප්‍රමාණය ඉදිරියේදී ගෙවීමට නියමිත ගෙවීම් කටයුතු වලදී අඩු කර ගැනීමට කටයුතු කරනු ලැබේ	වගකීම් විරහිතව ක්‍රියා කර ඇති තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.
15	බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පෙන්වාදී ඇති උපදෙස් ප්‍රකාරව අමාත්‍ය	2023	භාණ්ඩාගාරයට කිසිදු අමතර බරක් පැටවීමකින් තොරව අරමුදල්	අදාල කරුණු සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ වල ලේකම්වරු දැනුවත්	අදාල ගෙවීමට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර

	මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර ඇති තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ අනුව කටයුතු නොකර, මු.රෙ 40,72, 94(1) හි දැක්වෙන විධිවිධාන නොසලකා මිල විචලනයන් ගෙවීමට හැකිවන පරිදි මූලික කොන්ත්‍රාත් ගිවිසුමේ iv වන කොටසේ 13.8 වගන්තිය අනුව මිල විචලනයන් ගෙවීම් නොකරන බවට වූ කොන්දේසිය, සංශෝධනය කර 2024 අප්‍රේල් 16 දිනැති සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම 2 අත්සන් කර තිබුණි. ඒ අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුවෙන් සියයට 47 ක් හෙවත් රු.1,085,860,158 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබූ අතර මේ සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ එකඟතාවය නොලැබීම මත රු.1,085,860,158 ක් ගෙවීමේ වගකීම වාරිමාර්ග අමාත්‍යාංශය වෙත පැවරී තිබුණි.		සපයා ගත යුතුය.	කර ඇත.	ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ගෙන නොතිබුණි.
16	බස්නාගොඩ ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මූලික කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි (fidic –first edition 1999 EPC/Turnkey Project) අනුව ව්‍යාපෘතිය අවසන්කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් නිදහස් කළ යුතු බවට වූ කොන්දේසිය සංශෝධනය කර 2024 ජනවාරි 31 දක්වා අයකර ඇති රැඳවුම් මුදල් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට පෙර ගෙවීමට හැකිවන පරිදි 2024 අප්‍රේල් 16 දින සංශෝධිත කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ කටයුතු සියයට 25 ක් ඉතිරිව තිබියදී රු.104,667,237 ක රැඳවුම් මුදල් කොන්ත්‍රාත්කරුට ලබාගැනීමට	2023	අවසන් කිරීමේ වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසු කොන්ත්‍රාත් රැඳවුම් මුදල් නිදහස් කළ යුතුය.	රැඳවුම් මුදල් මෙතෙක් ගෙවා නැත.	ව්‍යාපෘතිය අවසන් වාර්ථා ඉදිරිපත් කල පසු රැඳවුම් මුදල් නිදහස් කිරීමේ හැකියාව ඇතිවන ආකාරයට ගිවිසුමෙ සංශෝධනය කර නොතිබුණි.

හැකියාව ලැබී තිබුණි.

17	සියඹලාන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2012-2014 කාළ සීමාව එනම් වසර 3 ක් තුල නිම කිරීමට අපේක්ෂා කර තිබූ අතර වසර 9 ක් ප්‍රමාදවී තිබුණද මේ දක්වා නිමකර නොතිබුණි. 2014-2023 කාළ සීමාව තුල ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 580 ක ප්‍රතිපාදන සලසා ඉන් රු.මිලියන 375 ක් හෙවත් සියයට 64 ක් පමණක් වැයකර තිබුණි. මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත නොකර කුරුණෑගල වාරිමාර්ග අධ්‍යක්ෂ විසින් වරින් වර ඇස්තමේන්තු අනුමත කර සැලසුමකින් තොරව කිලෝමීටර් 14 ක් දිගට ඉදිකිරීමට යෝජනාකර තිබූ ඇල මාර්ගයේ තැනින් තැන කිලෝමීටර් 2 ක් පමණ කැණිම් කිරීම සඳහා උක්ත පිරිවැය දරා තිබූ නමුත් එක් කොටසක හෝ ඇලමාර්ග නිසිපරිදි සකස්කර නොතිබුණි. ඒ අනුව වැයකල රු.මිලියන 375 ක වියදමෙන් කිසිදු ප්‍රතිලාභයක් මේ දක්වා ජාතික ආර්ථිකයට එක්කර නොතිබුණි.එසේම ව්‍යාපෘතිය සඳහා පාරිසරික අධ්‍යයන වාර්තාවක් සකස්කර අනුමැතිය ලබාගෙන නොතිබූ අතර මු.රෙ 35 (4) සහ 36 අනුව ප්‍රාථමික අනුමැතිය හා අවසාන අනුමැතිය ලබාගැනීමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි. තවද වාරි ජලය සැපයීමට අවශ්‍ය ඉඩම් විගණිත දින තෙක් හඳුනාගෙනද නොතිබුණි.	2022 2023	මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුමත කර නිසි අධීක්ෂණයත්, පාරිසරික අධ්‍යයන වාර්තාවන් හා මු.රෙ. 35(4) හා 36 ප්‍රකාරව ප්‍රාථමික හා අවසාන අනුමැතියකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් වගකීම් විරහිතව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් ජ්‍යේෂ්ඨ නිධාරින්ගෙන් සමන්විත කමිටුවක් මඟින් විමර්ශනයක් සිදු කර ඔවුන්ගේ නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. මේ වන විට එම වාර්තාවේ නිර්දේශ හා ව්‍යාපෘතිය යටතේ කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් කිරීමට කමිටුවක් පත් කර ඇත. වාරි ජලය සැපයීමට අවශ්‍ය ඉඩම් මෙතෙක් හඳුනාගෙන නොතිබුණි.	මුළු පිරිවැය ඇස්තමේන්තුව අනුමත නොකර සැලසුමකින් තොරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නිමකර නොතිබුණි.වගකීම් විරහිතව කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
18	සියඹලාන්ගමුව ඔයේ සිට මහගල්ගමුව වැව පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතියේ දෙවන කිලෝමීටරය හා තුන්වන කිලෝමීටරය අතර ගල් ඉවත්	2022	දෙපාර්තමේන්තුව විසින් ස්වකීය සේවකයින් හා ද්‍රව්‍ය භාවිත කර ඉටු කරනු ලබන	මෙම ව්‍යාපෘතිය යටතේ ඉටු කර ඇති කාර්යයන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක්	ව්‍යාජ මැනුම් හා බිල්පත් ඉදිරිපත් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල

	කිරීම සඳහා රු. මිලියන 6.7 ක ඇස්තමේන්තුවක් 2020 දෙසැම්බර් මස අනුමත කර තිබූ අතර ඒ යටතේ ඍජු ශ්‍රම ක්‍රමය යටතේ ඇළමාර්ගයේ පිහිටි කළුගල් කියුබ් 3,276.25 ක් ඉවත් කළ බවට වැඩ සහතික කර තිබූ නමුත් ගල් ඉවත්කර නොමැති ස්ථානයන්හිද ගල් ඉවත්කළ බවට සාවද්‍ය ලෙස මිනුම් ඉදිරිපත් කර ශ්‍රමය, යන්ත්‍ර හා ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර තිබුණි. එසේ තිබියදී ඉටුකරන ලද වැඩ කොටස් පිළිබඳ නිශ්චිත සහතික කිරීමකින් තොරව 2+400 සිට 2+875 දක්වා වූ කොටසේ ගල් ඉවත් කිරීම සඳහා නැවත රු.20,236,000 ක ඇස්තමේන්තුවක් අනුමත කර තිබුණි.		කොන්ත්‍රාත් (Force Account) සඳහා යන්ත්‍ර භාවිතය, ශ්‍රමය භාවිතය, අමු ද්‍රව්‍ය භාවිතය මිණුම් හා වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නව පටිපාටීන් හඳුන්වා දිය යුතුය. ව්‍යාජ මැනුම් හා බිල්පත් ඉදිරිපත් කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	පැවැත්වීම සඳහා කමිටුවක් වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇත.	ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.
19	මුතුකණ්ඩිය ඒකාබද්ධ ගොවි සංවිධානය කොන්ත්‍රාත් පිරිනැමීමේ ලිපියේ කොන්දේසි ප්‍රකාරව රු.1,000,000 ක නැවත ගෙවනු ලබන තැන්පතුවක් ලබාදී නොතිබූ අතර උප කොන්ත්‍රාත්කරු වූ ස්වර්ණදේවි එන්ටර්ප්‍රයිසස් ආයතනය විසින් 2021 මාර්තු 4 දින සිට වසරක කාලයක් වෙනුවෙන් උක්ත වටිනාකමට ඉදිරිපත් කර තිබුණු බැඳුම්කර ලිපිය දෙපාර්තමේන්තුව භාරගෙන තිබුණි. අදාළ ලිපියේ කොන්දේසි අනුව අධීක්ෂණ ගාස්තු ලෙස මාසිකව රු. 50,000 ක් බැගින් මාස 15 ක කාලය වෙනුවෙන් අයවිය යුතුව පැවති රු.750,000 ක් අය කරගෙන නොතිබුණි.	2022	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දුන් නියෝග වලට පටහැනිව වෙනත් පාර්ශවයන් වෙත ජලාශයේ වැලි කැණීම් සඳහා ඉඩ ප්‍රස්තා නිර්මාණය කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කිරීමට පත්වීම් බලධාරියා වෙත යොමු කළ යුතුය.	වැලි, රොන්මඩ හා දියලු පස් ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධ කොන්දේසි සංශෝධනය කිරීමට හඳුනාගෙන අතර ඉදිරියේදී එම කොන්දේසි සංශෝධනය කිරීමටත්, මේ සම්බන්ධව විමර්ශනයක් සිදුකර ඇති අතර ගිවිසුමේ කොන්දේසි කඩ වීමක් සිදුකර ඇත්නම්, ඉදිරියේදී විනයානුකූලව කටයුතු සිදු කරනු ලැබේ.	ඇප තැන්පතු හෝ අධීක්ෂණ ගාස්තු අයකර නොතිබුණි. ජලාශයේ වැලි කැණීම් සඳහා ඉඩ ප්‍රස්තා නිර්මාණය කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියා කර නොතිබුණි.
20	රණමයුර ගොවි සංවිධානය වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමීමේ ලිපිය අනුව අයවිය යුතු රු.1,000,000 ක නැවත ගෙවනු ලබන තැන්පතුව ලබාදී නොතිබුණද වැවේ රොන්මඩ	2022	සෑම ක්ෂේත්‍ර පරීක්ෂණයක දීම තහවුරු කිරීම සඳහා පරීක්ෂණ ලැයිස්තු හඳුන්වා දී කොන්දේසි කඩ	මේ සම්බන්ධයෙන් පවත්වන ලද පරීක්ෂණ කමිටු වාර්තාව ලැබී තිබූ අතර එහි නිර්දේශ පරිදි කටයුතු කරන	කොන්දේසි කඩ කළ ගොවි සංවිධානය අසාදු ලේඛන ගත කර දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු

	ඉවත් කිරීමට අවසර ලබාදී තිබුණි. පැවරුම් ලිපිය අනුව භාරන ලද රොන්මඩ සහ අපද්‍රව්‍ය සතියක කාලසීමාවක් තුළ වැවෙන් පිටතට ගෙනයා යුතු වුවද භාරන ලද දියලුපස් කියුබ් 1,500 ක් පමණ තවදුරටත් වැව තුළ ගොඩ ගසා තිබුණි. ජලාශයේ රොන්මඩ ඉවත්කර ජලාශයේ ජල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණද වැලි හා රොන්මඩ ඉවත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අවසර ලබාදුන් ස්ථානවල කැණීම් සිදුකර ජලාශයේ ජල ධාරිතාවය ඉහළ නැංවීමට කටයුතු කර නොතිබුණු අතර ජලාශයේ ආර කොටසේ වැලි හා පස් කැණීම් සිදු කර තිබුණි.		කළ ගොවි සංවිධානය අසාදු ලේඛන ගත කර දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	බව දක්වා තිබුණි.	ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
21	යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන වැව් බැම්ම ඉදිකිරීම, සැඳලි බැම් 04 ක් ඉදිකිරීම, වම් ඉවුරු ඇළ කි.මී. 18 ක් දිගින් යුතුව ඉදිකිරීම හා දකුණු ඉවුරු ඇළ කි.මී.12 ක් දිගින් යුතුව ඉදිකිරීමට යෝජිතව පැවතුණි. ඒ යටතේ වූ දකුණු ඉවුරු ඇළ හැර අනෙකුත් කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත, ඇ.ඩො. මිලියන 176 ක සෘජු කොන්ත්‍රාත්තුවක් ලෙස China CAMC Engineering Co. Ltd (CAMCE) සමාගම සමඟ 2011 නොවැම්බර් 03 දින ගිවිසුමකට එළඹ තිබුණි. එම කොන්ත්‍රාත් ගිවිසුමේ විෂය පථය ප්‍රධාන බැම්ම හා සැඳලි බැම් 04 ඉදිකිරීමට පමණක් සීමා වන පරිදි හා කොන්ත්‍රාත් වටිනාකම ඇ.ඩො. මිලියන 150 ක් වන පරිදි 2013 අගෝස්තු 16 දින සංශෝධනය කර තිබුණි. නැවත වරක් වම් ඉවුර ඇළ ඉදිකිරීම සඳහා ඇ.ඩො.මිලියන 39.5 ක ගිවිසුමක් 2017 දෙසැම්බර් 12	2022	මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන්හි කොන්ත්‍රාත් පරිපාලනයට සම්බන්ධ කරුණු, ප්‍රතිපත්තිමය කරුණු ලෙස අර්ථ දක්වා ක්‍රියා නොකළ යුතුය. අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී නිරීක්ෂණයන්හි සඳහන් කරුණු ඇතුළුව සාර්ව ආර්ථික බලපෑම පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තා කළ යුතුය.	වැළැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කොන්ත්‍රාත් පරිපාලනයට සම්බන්ධ ප්‍රතිපත්තිමය කරුණු හා සාර්ව ආර්ථික බලපෑම පිළිබඳ විස්තරාත්මක තොරතුරු අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේ දී සැලකිලිමත් වී නොතිබුණි.

	දින අදාළ කොන්ත්‍රාත්කරු සමඟම අත්සන් කර තිබුණි. ඒ අනුව මුල් අවස්ථාවේ ඇ.ඩො. මිලියන 176කට එකඟ වූ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ඇ.ඩො. මිලියන 189.5ක් ගෙවීමට සිදු වී තිබුණි.				
22	මූලික ගිවිසුම අනුව චීන ණය සපයන ආයතනයකින් කොන්ත්‍රාත් මුදලින් සියයට 85 ක් සැපයීමට එකඟ වී තිබුණද ණය මුදල ලබාගැනීමට සිදුකළ සාකච්ඡා අසාර්ථක වීම හේතුවෙන් ව්‍යාපෘතිය දේශීය අරමුදල් මත ක්‍රියාත්මක කර තිබුණි. ගිවිසුම අනුව වසරක් තුළ ණය නොලැබීම මත ඉන් ඉවත් වීමට හැකිව පැවති නමුත් වසර 3ක් තුළ ව්‍යාපෘතිය නිම කර එම ප්‍රතිලාභ අත් කර ගැනීමේ අපේක්ෂාවෙන් ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේදී පහත සඳහන් අවාසිදායක තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කර නොතිබුණි. වසර 8කට වැඩි කාලයක් ගතවී ඇතැත් ව්‍යාපෘතියේ කටයුතු මේ දක්වා සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි. • චීන රජයේ ණය අපේක්ෂාවෙන් තරඟකාරී මිල ගණන් කැඳවීමකින් තොරව ඍජු ක්‍රමය යටතේ චීන කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම තුළ තරඟකාරී මිල කැඳවීම් තුළින් ලබා ගත හැකිව තිබූ වාසි මඟහැරීම. • විදේශ ණය අපේක්ෂාවෙන් EPC කොන්ත්‍රාත් ගිවිසුමක් ලෙස ඇමරිකානු ඩොලර් මඟින් ගෙවීම් කිරීමේ කොන්දේසි ඇතුළත් කර තිබුණද අපේක්ෂිත පරිදි	2022	ව්‍යාපෘති සම්බන්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී සාර්ව ආර්ථික බලපෑම් පිළිබඳ විස්තරාත්මක තොරතුරු වාර්තා කළ යුතුය.	වැළැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ගිවිසුම් කොන්දේසි වෙනස් නොකර දේශීය අරමුදල් මත ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතියේ අවාසිදායක තත්ත්වයන් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අවධානයට යොමු කර නොතිබුණි.

	විදේශ අරමුදල් ලැබී නොතිබූ නමුත් ගිවිසුම් කොන්දේසි වෙනස් නොකිරීම හේතුවෙන් රටෙහි විදේශ සංචිත වලට ඇති වන අහිතකර බලපෑම.				
23	2021 ජූලි 5 දිනැති අංක අමප/21/1123/317/035 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ව්‍යාපෘතියේ කටයුතු 2022 දෙසැම්බර් 31 දිනට නිම කළ යුතුව පැවති නමුත් ව්‍යාපෘතිය නිම කිරීමට අදාළ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ වාර්තාව, ව්‍යාපෘතිය අවසන් කිරීමේ ගිණුම, ව්‍යාපෘතියේ වත්කම් පවරා දීම නිසි පරිදි සිදු වී ඇති බව තහවුරු කිරීමට අදාළ ලේඛන හා EPC කොන්ත්‍රාත් ගිවිසුම් 2 ට අදාළව අනාගතයේදී පැන නැඟිය හැකි ආරවුල් බේරුම්කරණය හා වෙනත් නෛතික කාර්යයකදී සේවායෝජක අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය වන ලේඛන සකස් කර නොතිබියදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය භාරගෙන තිබුණි.	2022	මහා පරිමාණ ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු භාර ගැනීමේ දී අනුගමනය කළ යුතු නිශ්චිත පටිපාටීන් දක්වා උපදෙස් නිකුත් කළ යුතුය.	මහා පරිමාණ ව්‍යාපෘති අවසන් කිරීමෙන් පසු භාර ගැනීමේදී අනුගමනය කළ යුතු කාර්යය පරිපාටීන් මේ වන විට හඳුන්වා දී ඇත.	ව්‍යාපෘතියේ තවදුරටත් ඉටු කළ යුතු කාර්යයන් පිළිබඳ වාර්තාව, අවසන් කිරීමේ ගිණුම, වත්කම් පවරා දීම තහවුරු කිරීමට අදාළ ලේඛන පවත්වා නොතිබුණි.
24	යාන්ඔය වම් ඉවුරු ඇළ ඉදිකිරීම සම්බන්ධව චීන කොන්ත්‍රාත්කරු සමඟ එළඹ තිබූ EPC කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව ඉටු කළ යුතුව තිබූ ඇමරිකානු ඩොලර් 3,478,910 ක් වූ කාර්යයන් ඉටු කර නොතිබුණු නමුත් ඒ සඳහා සම්පූර්ණයෙන්ම වැඩ සහතික කර ගෙවා තිබුණි.	2022	EPC කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කොන්ත්‍රාත්කරු විසින් නිම කළ යුතු සියලු වැඩ නිම කර නොතිබිය දී, සියලු වැඩ අවසන් කර ඇති බවට සහ නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවන ඉදිකිරීම් සඳහා කාර්යසාධන සහතික නිකුත් කර ගෙවීම් සහතික කළ නිලධාරීන් සම්බන්ධයෙන්	වැලැක්වීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	නිම කළ යුතු සියලු වැඩ නිම කර නොතිබිය දී, සියලු වැඩ අවසන් කර සහ නියමිත පිරිවිතරයන්ට අනුකූල බවට ඉදිකිරීම් සඳහා කාර්යසාධන සහතික නිකුත් කර ගෙවීම් සහතික කළ නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර

			විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.		නොතිබුණි.
25	වැඩබිම සඳහා ප්‍රවේශ වීමේ හා ඉවත්වීමේ කටයුතු වෙනුවෙන් ජලාශය ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව යටතේ ඇ.ඩො. 4,672,247 ක් හා වම් ඉවුරු ඇළ ඉදිකිරීම කොන්ත්‍රාත්තුව යටතේ ඇ.ඩො. 486,358 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත්කරු මේ දක්වා වැඩබිමෙන් ඉවත්වී නොමැති අතර එහි ඇති තාවකාලික කාර්යාල ගොඩනැගිලි, ගල් අඹරන යත්ත්‍ර සහ අනෙකුත් යන්ත්‍රෝපකරණ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ආරක්ෂක සේවා සපයා ගනිමින් භූමිය තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි.	2022	කාර්යසාධන සහතිකය නිකුත් කළ දිනෙන් පසු වැඩ බිමෙන් විධිමත් පරිදි ඉවත් වීමකින් තොරව පරිහරණය කරනු ලැබූ රජයේ ඉඩම් හා දේපල වල වටිනාකම තක්සේරු කොට බදු කුලිය අය කර ගත යුතුය.	වැඩ් බිමෙන් ඉවත් කළ යුතු දේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුට දන්වා ඇත. මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු විසින් කල් දිගුවක් ඉල්ලා ඇත. මේ සඳහා සිහිකැඳවීමක් කර ඇත.	කාර්යසාධන සහතිකය නිකුත් කළ දිනෙන් පසු වැඩ බිමේ පරිහරණය කරනු ලැබූ රජයේ ඉඩම් හා දේපල වල වටිනාකම තක්සේරු කොට බදු කුලිය කොන්ත්‍රාත්කරු ගෙන් අයකර නොතිබුණි.
26	හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අයත් ගොඩ සහ මඩ ඉඩම් හෙක්ටයාර 4,148 ක් ජලාශයේ ජලයෙන් යටවී තිබුණි. නව ඉඩම් හෙක්ටයාර 1,515 කට වාරි ජල පහසුකම් සපයා වගාවන්ට එක් කිරීමේ මූලික අරමුණින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණද මේ දක්වා නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 421 ක් පමණක් වගාකිරීම සඳහා වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම්කර තිබූ නව කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1,094 ක් හෙවත් සියයට 72 ක් මේ දක්වා හඳුනාගෙන වගාකිරීම සඳහා ගොවීන් වෙත ලබාදී නොතිබුණි.ව්‍යාපෘතිය නිසා කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් උපරිමය අක්කර 1.5 බැගින් ලබාදීමට සැලසුම් කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ඉඩම්	2023	සැලසුම්කල පරිදි ඉඩම් හඳුනාගෙන වගා කිරීම සඳහා ගොවීන් වෙත භාරදී ජලය සැපයිය යුතුය.කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් ලබාදීමට සැලසුම් කර තිබූ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වෙන් නිදහස්කර ගොවීන් වෙත ලබාදීමටත් අතිරේක වන්දි පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය.	නව කුඹුරු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1,094 ක් හෙවත් සියයට 72 ක් මේ දක්වා හඳුනාගෙන වගාකිරීම සඳහා ගොවීන් වෙත ලබාදී නොතිබුණි. අතිරේක වන්දි පිරිවැය අවම කිරීම සඳහාත්, ව්‍යාපෘතියේ ඉඩම් සම්බන්ධ ගැටළු අවසන් කිරීම සඳහාත් ගරු වාරිමාර්ග විෂහාර අමාත්‍යවරුන් විසින් විකල්ප ඉඩම් ලබා දිය යුතු පවුල් සමග පැවති සාකච්ඡා වලදී එළඹ ඇති තීරණයන් අනුව ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කර ඇති බව දක්වා තිබුණි.	සැලසුම්කල පරිදි ගොවීන් වෙත ඉඩම් භාරදී නොතිබූ අතර කුඹුරු ඉඩම් අහිමිවූවන් වෙනුවෙන් ලබාදීමට සැලසුම් කර තිබූ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වෙන් නිදහස්කර නොතිබුණි.

	හඳුනාගෙන වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් නිදහස්කරගෙන නොතිබුණි. මේ හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වුවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමට නොහැකි වී තිබුණි. ඒ වෙනුවට පවුල් 506 ක් සඳහා රු.1,800,000 බැගින් රු. 910,800,000 ක් අතිරේක වන්දි 2024 මැයි 31 වන විට ගෙවා තිබුණි.				
27	යාන්ඔය ජලාශය ඉදිකිරීම සඳහා වාරි ඉඩම් කට්ටි 2,044 ක් හා වම් ඉවුරු ඇල ඉදිකිරීම සඳහා වාරි ඉඩම් කට්ටි 313 ක් වශයෙන් වාරි ඉඩම් කට්ටි 2,355 ක් ප්‍රගමන රේඛන අනුව අත්පත්කරගෙන තිබුණි. ව්‍යාපෘතිය යටතේ ඕමාරකඩ හෙක්ටයාර් 506, ඉස්සන්වැව හෙක්ටයාර් 444 ක් මෝරාගම හා ඉඳුල්හිටියාව හෙක්ටයාර් 337 ක් සහ කොහොඹගස් වැව හෙක්ටයාර් 227 ක් ලෙස නව කුඹුරු ඉඩම් හෙක්ටයාර් 1,514 සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ නමුත් ඉන් කොටසක් පමණක් සංවර්ධනය කර ජලාශයට යටවූ කුඹුරු හිමියන් සඳහා බෙදා දී තිබූ නමුත් එසේ බෙදා දුන් කුඹුරු ඉඩම් පිළිබඳ විස්තරාත්මක උපලේඛන පවත්වා නොතිබුණි. ඒ හේතුවෙන් කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමේ ප්‍රමාණය නිවැරදිව තහවුරු කර ගැනීමට නොහැකිවිය.	2023	කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමේ ප්‍රමාණය නිවැරදිව තහවුරු කර ගත හැකිවන පරිදි සංසන්දනාත්මක ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.	විකල්ප ඉඩම් ලබා දිය යුතු පවුල් ගණන් ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් හඳුනාගෙන ඉදිරිපත් කර ඇත. ඒ අනුව කටයුතු කරගෙන යන බව දක්වා තිබුණි.	කුඹුරු ඉඩම් අහිමි වූවන් සඳහා විකල්ප කුඹුරු ඉඩම් ලබාදීමේ ප්‍රමාණය නිවැරදිව තහවුරු කර ගත හැකිවන පරිදි සංසන්දනාත්මක ලේඛන පවත්වා නොතිබුණි.
28	ජලාශය ඉදිකිරීම සඳහා හොරොව්පොතාන හා ගොමරන්කඩවල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන් වලට අයත් ගොඩ සහ මඩ ඉඩම් හෙක්ටයාර 4,148 ක් යටතේ වූ ඉඩම් කට්ටි 4,352 ක් අත්පත් කරගෙන තිබූ අතර ඉන් වන්දි	2023	අත්පත් කරගෙන ඇති ඉඩම් සඳහා වන්දි ගෙවා අවසන් කළ යුතුය.	අදාල වන්දි ගෙවීම සඳහා මුදල් ප්‍රාදේශිය ලේකම් වෙත ලබා දී තිබුණි. වම් ඉවුර ඇල සඳහා අත්පත් කර ගත යුතු මුළු ඉඩම් කට්ටි 763 න් ඉඩම් කට්ටි 528 ක් අත්පත්	ඉඩම් කට්ටි 78 ක් සහා ඉඩම් කට්ටි 71 ක් සඳහා වන්දි ගෙවීම අවසන් කර නොතිබුණි.

	ගෙවියයුතු ඉඩම් කට්ටි ගණන 3,621 ක් විය. 2024 මැයි 31 දිනට ඉඩම් කට්ටි 3,515 ක් සඳහා වන්දි ගෙවා අවසන් කර තිබුණද ඉඩම් කට්ටි 108 ක් අත්පත්කරගෙන වසර 8-9 අතර කාලයක් ගතවී තිබුණි.එසේම ජලාශයේ වම් ඉවුරු ඇල ඉදිකිරීම සඳහා හොරොව්පොතාන, කැබිතිගොල්ලෑව,පදවිය හා ශ්‍රීපුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයන් වලට අයත් ඉඩම් හෙක්ටයාර 75.5 ක් යටතේ වූ ඉඩම් කට්ටි 769 ක් අත්පත් කරගෙන තිබු අතර ඉන් වන්දි ගෙවිය යුතු ඉඩම් කට්ටි ගණන 528 ක් විය. ඉඩම් කට්ටි 348 ක් සඳහා වන්දිගෙවා අවසන් කර තිබූ අතර ඉඩම් කට්ටි 180 ක් අතපත්කරගෙන වසර 4-5 අතර කාලයක් ගතවී තිබුණි. අදාල ඉඩම් සඳහා කිසිදු වන්දියක් 2024 මැයි 31 වන විට ගෙවා නොතිබුණි.			කරගත යුතු අතර ඉන් ඉඩම් කට්ටි 457 ක් සඳහා 2024.10.01 දින වන විට ගෙවීම් කටයුතු කර ඇති බව දන්වා ඇත.	
29	වන්දි ගෙවීමේ ප්‍රමාදවීම හේතුවෙන් අත්පත්කරගත් ඉඩම් සඳහා 38(අ) අතුරු විධිවිධාන ගැසට්කළ දින සිට තක්සේරු වාර්තා ලබාදීමේ ප්‍රමාදය මත පූර්ණ වන්දියට අදාල ව්‍යාවස්ථාපිත වන්දිය සඳහා සියයට 7 ක පොලි මුදලක් වසර 5 කට වැඩි කාලයක් සඳහා ගෙවීමට සිදුවී තිබුණි. ඒ අනුව 2024 මැයි 31 දිනට රු.1,275,580,533 ක් පොලී වශයෙන් ගෙවා තිබුණි. මෙසේ ගෙවූ පොලී ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.	2023	ගෙවූ පොලී ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා සකස්කර ඉදිරිපත් කළ යුතුය.	පොලී මුදල් ගෙවීම් තහවුරු කර ඉදිරිපත් කරන ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කර තිබුණි.	ගෙවූ පොලී ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා සකස්කර මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි.
30	වන්දිගෙවීම් සම්බන්ධයෙන් 2024 පෙබරවාරි 21 ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් 2022 වර්ෂය වන විට හොරොව්පොතාන,	2023	රු.1,800,000 ක් දක්වා වන්දි මුදල් වැඩිකිරීමට හේතුවූ කරුණු හා ඉතිරි පුද්ගලයන් 328	වම් ඉවුරු ඇල යටතේ වාරි ඉඩම් අහිමි වූ අයවලුන් වෙත විකල්ප ඉඩමක් වෙනුවට අතිරේක	වන්දි මුදල් වැඩිකිරීමට හේතුවූ කරුණු හා ඉතිරි පුද්ගලයන් වෙනුවෙන් ගනු

	කැබිතිගොල්ලෑව, පදවිය ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වලින් බැහැරව ස්ථිර පදිංචි පවුල් ඒකක 614 ක් සඳහා අක්කර 1.5 ක වාරි ඉඩම් වෙනුවට රු.1,800,000 ක් ලෙස සංශෝධනය කර ගෙවීමට අනුමැතිය ඉල්ලා තිබූ අතර මේ සඳහා 2024 මාර්තු මස 18 දිනැති අමප/24/0395/623/009 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2024 මැයි 31 වන විට පවුල් 506 ක් සඳහා රු.1,800,000 බැගින් රු. 910,800,000 ක අතිරේක වන්දි ගෙවා තිබුණි. එහිදී රු.1,800,000 ක් දක්වා වන්දි මුදල් වැඩිකිරීමට හේතුවූ කරුණු හා ඉතිරි පුද්ගලයන් 328 දෙනා වෙනුවෙන් ගනුලැබූ විකල්ප ක්‍රියාමාර්ග සඳහන්කර නොතිබුණි.		දෙනා වෙනුවෙන් ගනු ලැබූ විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතුය.	වන්දියක් ගෙවීම සම්බන්ධයෙන් නැවත සළකා බැලීමටත් ඒ සම්බන්ධව වාර්තාවක් පිළියෙල කිරීමටත් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර තිබුණි.	ලැබූ විකල්ප ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
31	නියමිත දිනට ඉඩම් ලබා නොදීම හේතුවෙන් ජලාශයේ වෙල්ල ඉදිකිරීමේදී කුඹුරු ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2014/2015 මහ කන්නයේ සිට 2018/2019 මහ කන්නය දක්වා අක්කරයකට රු. 35,000 බැගින් වගා අහිමි කන්න 9 ක් සඳහා රු. 345,452,574 ක කන්න වන්දි ගෙවා තිබුණි. වම් ඉවුරු ඇල ඉදිකිරීමේදී ඉඩම් අහිමි වූවන් වෙනුවෙන් 2018 යල කන්නයේ සිට 2020 මහ කන්නය දක්වා අහිමි කන්න 4 ක් සඳහා අක්කරයකට රු. 50,700 ක් හා අහස් දියෙන් වගා කරන ගොවීන්ට අක්කරයකට රු.35,000 ක් බැගින් කන්න වන්දී රු. 123,494,081 ක් ගෙවා තිබුණි. ඒ අනුව ඉඩම් අහිමි වූවන්ට නියමිත පරිදි කුඹුරු ඉඩම් ලබා නොදීම නිසා රු.468,846,655 ක කන්න වන්දී ගෙවීමට සිදුවී තිබුණි.	2023	කන්නය සඳහා වූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා ඉදිරිපත් කළ යුතුය.	අදාල වාර්තාව ප්‍රාදේශීය ලේකම් වරුන්ගෙන් ලබා ගන්නා තොරතුරු අනුව සකස් කරමින් පවතින බව දන්වා තිබුණි.	කන්නය සඳහා වූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

	මෙසේ ගෙවූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.				
32	වාරි ඉඩම් ලබා නොදීම හේතුවෙන් ජීවනෝපාය මාර්ග අහිමි වූ පුද්ගලයෙකුට මාසිකව රු. 2,000 බැගින් උපරිමය රු.8,000 දක්වා ජීවනාධාර දීමනාවක් ලෙස 2024 මැයි 31 දක්වා රු. 481,918,000 ක් ගෙවා තිබුණි. මේ සඳහා එක් එක් පුද්ගලයන් වෙනුවෙන් ගෙවන ලද ප්‍රමාණය වෙන් වෙන්ව හඳුනාගත හැකි පරිදි පොත්පත් පවත්වා නොතිබීම හේතුවෙන් ඒ සඳහා දැරූ පිරිවැය ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට විගණනයට තහවුරු නොවුණි.	2023	ජීවනාධාර දීමනාව ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකි පරිදි වාර්තා පවත්වා ගත යුතුය.	අදාල වාර්තාව ප්‍රාදේශීය ලේකම් වරුන්ගෙන් ලබා ගන්නා තොරතුරු අනුව සකස් කරමින් පවතින බව දන්වා තිබුණි.	ජීවනාධාර දීමනාව සඳහා වූ වන්දි ඉඩම් අහිමිවූවන් සඳහාම ගෙවූ බවට සංසන්දනාත්මකව තහවුරු කළ හැකිවන පරිදි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
33	ශ්‍රී ලංකාවේ මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවිපල ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරිම අධ්‍යයනය සඳහා වූ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ ගිවිසුම 2021 මාර්තු 31 දින අත්සන් කර තිබුණද ඊට පෙර 2018 වසරේ ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කර තිබුණි. 2019-2021 කාලය තුළ දෙපාර්තමේන්තු නිලධාරීන් 22 ක් විදෙස් පුහුණුවීම්වලට සහාභාගී කරවා තිබුණි. එහිදි නිලධාරීන් ව්‍යාපෘතියේ කටයුතුවලට දායකත්වය ලබාදිය යුතු බවට ගිවිසුම් මඟින් එකඟතාවයක් ලබාගෙන නොතිබූ අතර පුහුණුව ලබාදුන් නිලධාරීන් 22 ක් අතරින් නිලධාරීන් 09 ක්, විශ්‍රාම යාම, වෙනත් ආයතන සඳහා ස්ථාන මාරුවීම සහ වෙනත් රාජකාරී කටයුතු සඳහා අනුයුක්ත කර තිබීම හේතුවෙන් ඔවුන්ගෙන් නියමු ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලැබී නොතිබුණි. ඒ අතුරින් 2019 වර්ෂයේ ජූලි මාසයේදී සහ	2022	විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ නිර්ණායක සකස්කර තෝරාගැනීමත්, ස්ථානමාරු ක්‍රමයෙන් බැහැරව ව්‍යාපෘතියේ රාජකාරී කරන බවට කොන්දේසි ඇතුළත් කර එම පාඨමාලා තුළින් ලබා ගන්නා දැනුම හා පුහුණුව අදාළ ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා යොදා ගත හැකි වන පරිදි හා සේවය ලබා දිය හැකි පරිදි නිලධාරීන් වැඩි සංඛ්‍යාවකට පුහුණු අවස්ථා සැලසෙන පරිදි සිදු කළ යුතුය.	පුහුණු පාඨමාල සඳහා නිළධාරින් තොරාගැනීම සම්බන්ධයෙන් ක්‍රමවේද හඳුන්වාදී නොතිබුණි.	විදේශ පුහුණු පාඨමාලා සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ දී, ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට අවශ්‍ය නිර්ණායක තීරණය කර, ඒ අනුව නිලධාරීන් තෝරා ගැනීම සිදු කර නොතිබුණි.

	අගෝස්තු මාසයේදී විශ්‍රාම යාමට නියමිතව තිබූ නිලධාරීන් දෙදෙනෙකු 2019 පෙබරවාරි මාසයේදී ජපානයේ පුහුණු පාඨමාලාව සඳහා සහභාගී කරවා තිබුණු අතර පුහුණුවෙන් මාස කිහිපයකට පසු උක්ත නිලධාරීන් විශ්‍රාම ගොස් තිබුණි.				
34	ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 60 කට වැඩි නොවන පිරිවැයක් දැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද බිම් සැකසීම හා ඇළ වේලිවලින් කොටසක් පමණක් සකස් කිරීමට රු.මිලියන 119.3 ක් ඇස්තමේන්තු අනුමත කර තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉක්මවා රු.මිලියන 59 ක පිරිවැයක් දැරීමට ඇස්තමේන්තු අනුඥාත කර තිබුණි.	2022	අමාත්‍ය මණ්ඩල තීරණයේ ඇස්තමේන්තු ඉක්මවන්නේ නම් නැවත අමාත්‍ය මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගත යුතුය. අනුමැතිය ඉක්මවා ඇස්තමේන්තු අනුඥාත කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම සඳහා පත්වීම් බලධාරියා වෙත යොමු කළ යුතුය.	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉක්මවා අනුඥා. කරතිබූ රු.මිලියන 59 ක සඳහා මේ දක්වා අනුමැතිය ලබාගෙන නොතිබුණි.	අනුමැතිය ඉක්මවා ඇස්තමේන්තු අනුඥාත කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව මේ දක්වා කටයුතු කර නොතිබුණි.
35	දෙපාර්තමේන්තුවේ නාච්චාදුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් මෙම නියමු ව්‍යාපෘතියේ බිම් සකස් කිරීම හා ඉදිකිරිම් කටයුතු භාරගෙන ක්‍රියාත්මක කර තිබුණි. 2018 වර්ෂයේ සිට අවස්ථා කිහිපයකදි ව්‍යාපෘතියේ කටයුතු සඳහා සකස්කළ ඇස්තමේන්තු සංශෝධනය කර තිබුණු අතර එහි පළමු ඇස්තමේන්තුව යටතේ රු.මිලියන 22 ක් වැය කර තිබියදී එකී කාර්යයන් සඳහා 2022 වර්ෂයේ තවත් රු.මිලියන 22.6 ක ඇස්තමේන්තු අනුඥාත කොට පළමු ඇස්තමේන්තුව යටතේ ඉටුකළ කාර්යයන් සඳහාම නැවත රු.මි.17.3 ක් ගෙවා තිබුණි.	2022	ව්‍යාපෘති කාර්යයන් සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට කටයුතු කළ යුතුය.ප්‍රාදේශීය ලේකම් විසින් මායිම් පෙන්වා දීමට ප්‍රථම ඉඩම් කට්ටි කිරීම නියරවල් දැමීම හා ඇළ පද්ධතිය සකස් කිරීමට තීරණය කළ හා උපදෙස් ලබා දුන් නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට පත් වීම් බලධාරියා	ව්‍යාපෘති කාර්යයන් සඳහා නිශ්චිත කාල වකවානු දක්වමින් වගකීම් පැවරෙන ආකාරයට ක්‍රියාකාරී සැලසුම් සකස්කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් විසින් මායිම් පෙන්වා දීමට ප්‍රථම ඉඩම් කට්ටි කිරීම නියරවල් දැමීම හා ඇළ පද්ධතිය සකස් කිරීම කළ නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

			වෙත යොමු කළ යුතුය.		
36	පහළ ඌව මධ්‍ය හා සුළු පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ඇති වටගල ආර වැව, මල්ලිපොත වැව, දෙබර ආර වැව මගින් ජලය ඝන මීටර් කියුබ් රු.මිලියන 2.45 සැපයීමෙන් පවතින ඉඩම් හෙක්ටයාර 971 හා නව ඉඩම් හෙක්ටයාර 728 ක් දෙකන්නයේ වගා කිරීම සඳහා ජලය සැපයීම සඳහා රු.මිලියන 1,250 ක ඇස්තමේන්තුවක් යටතේ 2007 වර්ෂයේ සිට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 776.23 ක් හා භෞතික ප්‍රගතිය සියයට 91 ක් වී තිබූ අතර හෙක්ටයාර් 723 ක් සඳහා පමණක් වාරි ජලය ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘති ආරම්භ කර වසර 17 ක් ගතවී තිබුණද සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ ඉඩම් හෙක්ටයාර් 976 ක් හෙවත් සියයට 57 ක් සඳහා වාරි ජලය සැපයීමට කටයුතු කර නොතිබුණි. නව ඉඩම් හඳුනාගැනීමත් වාරි ජලය සැපයීමට පහල නිම්න සංවර්ධන කටයුතු සිදු නොකිරීමත් නිසා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂාකර තිබූ ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක්කර නොතිබුණි.	2023	පහල නිම්න සංවර්ධන කටයුතු මගින් අපේක්ෂා කල ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් කළ යුතුය.	ව්‍යාපෘති ආරම්භ කර වසර 17 ක් ගතවී තිබුණද සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ ඉඩම් හෙක්ටයාර් 976 ක් හෙවත් සියයට 57 ක් සඳහා වාරි ජලය සැපයිමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	වාරි ජලය සැපයිමට මෙන්ම ආර්ථික ප්‍රතිලාභ ජාතික ආර්ථිකයට එක් කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.
37	මොරාණ ජලාශ ව්‍යාපෘතිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති ඉඩම් හෙක්ටයාර 570 කට ජලය ඝන මීටර් කියුබ් මිලියන 16 ක් සැපයීම සඳහා රු.මි.2,900 ක ඇස්තමේන්තුවක් යටතේ 2012 වර්ෂයේ සිට මෙම	2023	අපේක්ෂා කර තිබූ නව ඉඩම් සඳහා වාරි ජලය සැපයිමට හා ව්‍යාපෘතියට ආදාල පාරිසරික බලපෑම් ඇගයීම නිසි පරිදි	මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන්	අපේක්ෂා කර තිබූ නව ඉඩම් සඳහා වාරි ජලය සැපයිමට මෙන්ම වන්දි ගෙවීමේ කාර්යය ඉටුකර නොතිබුණි.

	ජලාශය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 2,725.87 ක් හා භෞතික ප්‍රගතිය සියයට 99 ක් වී තිබුනද වාරි ජලය නව ඉඩම් හෙක්ටයාර් 449 ක් සඳහා පමණක් ලබාදී තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර 14 ක් ගතවී තිබූ නමුත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කර තිබූ නව ඉඩම් හෙක්ටයාර් 121 ක් හෙවත් සියයට 21 ක් සඳහා වාරි ජලය සැපයිමට කටයුතු කර නොතිබුණි. තවද ජලාශය හා ප්‍රධාන ඇල සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම හා විකල්ප ඉඩම් ලබා දීමද ප්‍රමාද වී තිබුණි.		සිදු කර ජලාශය හා ප්‍රධාන ඇල සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම හා විකල්ප ඉඩම් ලබා දීමද සිදුකළ යුතුය.	අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022.10.07 වන දිනැති ලිපියට අනුව දෙන ලද උපදෙස් අනුව කටයුතු කර ඇත.	
38	කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද රු.521,548,736 ක පිරිවැයෙන් ජාතික ආර්ථිකයට මේ දක්වා කිසිදු දායකත්වයක් දක්වා නොතිබුණි.මෙමගින් අපේක්ෂිත ප්‍රතිලාභ වන නව සහ වාරි පහසුකම් නොමැති ඉඩම් හෙක්ටයාර 5,429 ක් සඳහා වාරි ජලය සැපයීම,පානීය ජල අවශ්‍යතාවය සඳහා වාර්ෂිකව ජලය ඝන මීටර් මිලියන 12ක් ලබා දීම,විකල්ප මාර්ග කිමීටර් 15ක් පමණ සංවර්ධනය කිරීම,වාර්ෂිකව ගිගා වොට් පැය 16ක ජල විදුලිය උත්පාදනය,මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම,නැවත පදිංචි කරනු ලබන ප්‍රදේශයේ නගර සංවර්ධනය සිදු කිරීම සහ අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා අලිවැට ඉදිකිරීම වුවත් ඉන් කිසිවක් 2023 දෙසැම්බර් 31 දින වන විටද අත්කරගෙන නොතිබුණි.	2023	දරන ලද පිරිවැය තුලින් අපෙක්ෂිත ප්‍රතිලාභ හඳුනාගෙන ඒවා ජාතික ආර්ථිකයට එක් කිරීමට කටයුතු කළ යුතුය.	මහා පරිමාන සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු තීරණ සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය ලේකම්ගේ අංක PMO/DEV-11/01/01/MTG/SEP-02 හා 2022.10.07 වන දිනැති ලිපියට අනුව දෙන ලද උපදෙස් අනුව කටයුතු කර ඇති බව දක්වා තිබුණි.	දරන ලද පිරිවැය තුලින් අපෙකෂිත ප්‍රතිලාභ හඳුනාගෙන ඒවා ජාතික ආර්ථිකයට එක් කිරීමට කටයුතු කර නොතිබුණි.
39	කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම	2023	ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන්	ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන්	ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර

	හේතුවෙන් දේපළ අහිමිව පීඩාවට පත්වන ජනතාවට වන්දි ගෙවීම සහ නැවත පදිංචි කිරීම මැයෙන් ඉදිරිපත් කර තිබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව ගෙන ඇති අංක අමප 17/0583/729/011 දරන 2017 මාර්තු 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ජනාධිපතිවරයා විසින් මෙවැනි අවස්ථාවල ක්‍රියාත්මක කළ හැකි පොදු වූ වන්දි ක්‍රමයක් ඇති කිරීම සුදුසු බව නිර්දේශ කර තිබුණි. මුදල් ඇමතිවරයා විවිධ ව්‍යාපෘතින් යටතේ බලපෑමට ලක්වන එකම ප්‍රදේශයේ වෙසෙන පුද්ගලයින්ට විවිධ ක්‍රමවේද යටතේ සලකා ඇති බව නිරීක්ෂණය කර තිබුණි. මෙම ගැටළු මගහැරීම පිණිස ඉඩම්/වගාවන් අහිමි පුද්ගලයින්ට වන්දි ගෙවීමේ නව රෙගුලාසි සැකසීම කඩිනමින් අවසන් කරන ලෙස ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබුණි. ඒ අනුව වාරිමාර්ග අමාත්‍යාංශය ඉඩම් අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණයෙන් ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කොට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කල යුතුව පැවති නමුත් ඒ සඳහා කටයුතු කර නොතිබුණි.		පොදු වූ වන්දි ක්‍රමයක් හඳුන්වාදී ඒ අනුව කටයුතු කළ යුතුය.	පොදු වූ වන්දි ක්‍රමයක් මේ දක්වා හඳුන්වාදී නොතිබුණි.	ගැනීම හා වන්දි ගෙවීම සඳහා පොදු ක්‍රමවේදයක් සකස් කොට අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
40	ඉඩම් අත්පත් කර ගැනීම හා වන්දි ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබියදී අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ 2019, 2020, 2021 හා 2022 වර්ෂවලදී ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් ඉඩම් අත්පත් කරගැනීම සඳහා වන්දි ගෙවීමට මැදගම,බඩල්කුඹුර, මොණරාගල ප්‍රාදේශීය	2023	වන්දි ගෙවියයුතු පුද්ගලයන් හඳුනාගැනීමකින් පසුව මුදල් නිදහස්කළ කල යුතුය.	මේ සම්බන්ධයෙන් අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්හට දැනුම් දී තැන්පත් කර දී තිබූ මුදල් නැවත ලබා ගැනීමට කටයුතු කර තිබුණි	ඉඩම් අහිමිවූවන් හා වන්දි ගෙවියයුතු පුද්ගලයන් හඳුනාගැනීමකින් තොරව නිදහස්කල මුදල් එම කාර්යාලයන්හි පොදු තැන්පත් ගිණුම්වල

	ලේකම්වරුන් වෙත රු. 43,998,988 ක් ගෙවා තිබුණි. එහිදී වන්දි ගෙවීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් නොමැතිව ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත ගෙවා ඇති මුදල් වසර 4 ක කාලයක් තිස්සේ එම කාර්යාලයන්හි පොදු තැන්පත් ගිණුම්වල නිශ්කාර්යව පැවතුණි.				නිශ්කාර්යව පැවතීම වෙනුවෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
41	වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යවරයා විසින් 2017 නොවැම්බර් 24 දින ඉදිරිපත් කර තිබූ අංක අමප17/2716/729/029 දරන "කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය හා හැඩ ඔය ජලාශ ව්‍යාපෘතිය ස්විස් චැලේන්ජ් ක්‍රමය (Swiss Challenge Method) යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා චීන සමාගමක් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹීමට අනුමැතිය ලබා ගැනීම" යන මැයෙන් වූ අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළව මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණ මගින් එම ක්‍රමය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ගිවිසුම් ගත වීමට නම් ස්විස් චැලේන්ජ් ක්‍රියාපටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූලව, ප්‍රති යෝජනා කැඳවා තෝරා ගැනීමේ ක්‍රියා පටිපාටිය අවසන් කළ යුතුය. 2017 දෙසැම්බර් 12 දිනැති අමප17/2716/729/029 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය සඳහා අදාල මුදල් ඇමතිවරයාගේ නිරීක්ෂණවල සඳහන් පරිදි ස්විස් චැලේන්ජ් ක්‍රමයට අදාළ පටිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2018 මාර්තු 30 වන දින වාරිමාර්ග ජල සම්පත් කලමනාකරණ අමාත්‍යාංශය සහ චීන සමාගම සමඟ, කුඹුක්කන් ඔය හා හැඩඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා ශක්‍යතා	2023	අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබූ ප්‍රතිපත්තිමය තීරණයට පටහැනිව අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වීම සම්බන්ධයෙන් හා පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලිය මූලික අධ්‍යයනයට ඇතුලත් නොකර එ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට විනයානුකූලව ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවබෝදතා ගිවිසුම් වලට එළඹ තිබුණද එකී ගිවිසුම්හි පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලිය ආවරණය කිරීමට මෙතෙක් කටයුතු නොකර අවිධිමත් ලෙස කරණ ලද ගෙවීම් මේ දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණයට පටහැනිව අවබෝධතා ගිවිසුමකට ඇතුළත් වීම හා පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලිය මූලික අධ්‍යයනයට ඇතුලත් නොකර එ සඳහා ගෙවීම් සඳහා වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග මේ දක්වා ආරම්භ කර නොතිබුණි.

	අධ්‍යනයක් සිදු කිරීමට එකඟත්වය ලබා දෙමින් අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. ඒ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබූ ප්‍රතිපත්තිමය තීරණයට පටහැනිව ගිවිසුම් ගත වී රු. 8,929,126 කට අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබුණි. තවද, එකී ගිවිසුමේ පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලිය විධිමත් ප්‍රසම්පාදන පටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව ශක්‍යතා අධ්‍යයනයේම කොටසක් වූ පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව සකස් කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමග ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ යටතේ 2023 දෙසැම්බර් 31 දින වන විට රු.5,150,880 ක් ගෙවා තිබුණි. අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පරිසර ඇමතිවරයාගේ නිරීක්ෂණවල සඳහන් පරිදි පරිසර බලපෑම් අධ්‍යයන ක්‍රියාවලියක්ද මූලික අධ්‍යයනයට ඇතුලත් විය යුතුව තිබූ නමුත් එම තීරණයට පටහැනිව උක්ත ගිවිසුම ක්‍රියාත්මක කර අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි.				
42	කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියට අදාළ සාමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම රු.4,008,750 කට සකස් කිරීම සඳහා 2018 ජුලි 20 දින පුද්ගලික සමාගමක් සමග වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් ගිවිසුමකට එළඹ තිබුණි. අදාල වාර්තාව හා සැලැස්ම මාස 3 ක් ඇතුළත එනම් 2018 ඔක්තෝබර් 14 දිනට අවසන් කල යුතු වූ වුවත් 2020 අගෝස්තු 30 දක්වා අවස්ථා 4 කදී අවුරුදු 1 මාස 10 ක් දින දීර්ඝ කර තිබුණි. අදාල ගිවිසුම අනුව පළමු කෙටුම්පත් වාර්තාව	2023	පළමු කෙටුම්පත් වාර්තාව වෙනුවෙන් ගෙවීම් කළ හා කාලය දීර්ඝ කිරීම් ලබාදුන් නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකර ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ වන විට ගිවිසුමට අදාල සියළු කටයුතු නිම කර ඇත.	පළමු කෙටුම්පත් වාර්තාව වෙනුවෙන් ගෙවීම් කළ හා කාලය දීර්ඝ කිරීම් ලබාදුන් නිලධාරීන් සම්බන්ධයෙන් විමර්ෂණයක් මෙතෙක් ආරම්භ කර නොතිබුණි.

	තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් අනුමත කල පසු ගිවිසුම් ගත වටිනාකමින් සියයට 70 ක මුදලක් ගෙවීමට හැකි වේ. 2019 අප්‍රේල් 02 දින ඉදිරිපත් කර තිබු කෙටුම්පත් වාර්තාව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු අනුමැතියක් ලද බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවිය. එසේ තිබියදී ගිවිසුමට පටහැනිව මුළු ගිවිසුම් වටිනාකමින් සියයට 85 ක් 2018 වර්ෂයේ සිට 2022 දක්වා එනම් රු.3,778,247 ක මුදලක් එනම් ගෙවීම් කර තිබුණි.				
43	ව්‍යාපෘතියට අදාළ ශක්‍යතා අධ්‍යන වාර්තාව, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, සමාජීය ඇගයීම් වාර්තාව හා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම සැකසීමේ කටයුතු 2017 ජනවාරි මසට පසු ආරම්භ කර තිබුණද 2017 ජනවාරි 28 දින ව්‍යාපෘතියේ සමාරම්භක උත්සවය පවත්වා ඒ වෙනුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රු. 22,771,296 ක් වැය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීමකින්ද තොරව සමාරම්භක උත්සවයක් පවත්වා ඒ වෙනුවෙන් විධිමත් අනුමැතියකින් තොරව වියදම් දරා තිබුණි.	2023	ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීමකින් තොරව සමාරම්භක උත්සව වියදම් දැරීම සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකර ක්‍රියාමාර්ග ගත යුතුය.	මෙවැනි සිදුවීම් ඉදිරියේදී ඇති නොවීමට උපදෙස් නිකුත්කර නොතිබුණි.	ව්‍යාපෘතියේ මූලික කටයුතු සිදු කිරීමකින් තොරව සමාරම්භක උත්සව වියදම් දැරීම සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදුකර නොතිබුණි.
44	ව්‍යාපෘති මූලික ඇගයීම් වාර්තා වන ශක්‍යතා අධ්‍යයන වාර්තාව, පාරිසරික බලපෑම් ඇගයීම් වාර්තාව, සමාජ බලපෑම් ඇගයීමේ හා නැවත පදිංචි කිරීමේ සැලැස්ම යන මූලික වාර්තා අනුමත කර ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ වූ තෙනගල්ලන්ද සහ ඉත්තෑකටුව වැව් 2හි යටි නිම්න සංවර්ධන කටයුතු ඉටු කිරීමට	2023	ව්‍යාපෘතියේ මූලික වාර්තා අනුමත කිරීමට පෙර සංවර්ධන කටයුතු ආරම්භ කිරීම හා දෝෂ සහගත ලෙස ඇස්තමේන්තු සකස් කර අනුඥාත කළ නිළධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත	ඉදිරියේදී මෙවැනි කාර්යයන් සඳහා ප්‍රතිපාදන ලබා දීමේදී සැළකිලිමත් වන බව දක්වා තිබුණි.	ව්‍යාපෘති මූලික වාර්තා අනුමැතියට පෙර සංවර්ධන කටයුතු ආරම්භ කිරීම හා දෝෂ සහගත ලෙස ඇස්තමේන්තු සකස් කර අනුඥාත කළ නිළධාරීන්ට එරෙහිව

	රු.95,262,039 ක් වියදම් කර තිබුණි. එලෙස සංවර්ධනය කරන ලද තෙනගල්ලන්ද වැවෙහි යටි නිම්න සංවර්ධන කටයුතු වල ගැටළු ලෙස සොරොව්වේ සිට මීටර් 100 ක් දුරට කොන්ක්‍රීට් බේසම සැලසුම් කල පරිදි නිම නොකිරීම,සොරොව්වේ ආවරණය ඉදි නොකිරීම,සොරොව්වේ දොර අරින ශ්‍රේඩරය සඳහා G.I බටයක් දැමීම, වැව් බැම්මේ පිඩලි ඇල්ලීම ක්‍රමානුකූලව සිදු නොකිරීම, වැව ඇතුළත එක් පැත්තක පමණක් රොන් මඩ ඉවත් කර වැවෙහි අනෙක් පස රොන් මඩ ඉවත් කර නොතිබීම සහ වැව ප්‍රතිසංස්කරණයෙන් පසු ගොවි සංවිධානය වෙත භාර දී නොතිබීම යන කරුණු නිරීක්ෂණය විය.		යුතුය.		විමර්ෂණයක් සිදුකර නොතිබුණි.
45	මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් 2023 මැයි 31 දින ඉදිරිපත් කර තිබූ අංක අමප 23/1028/604/010-I දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය 2023 මැයි 31 න් පසුව අවසන් කළ යුතු විය. ව්‍යාපෘති කාර්යයන් තවදුරටත් කර ගෙන යාම සඳහා වූ වගකීම මොණරාගල ප්‍රාදේශීය වාරිමාර්ග කාර්යාලය වෙත භාර දීමටත්, ඉඩම් සම්බන්ධයෙන් ප්‍රදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධ වී ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් වාරිමාර්ග ලේකම් වෙත නියම කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත පවරා තිබුණද එම පවරා දීමට අදාළ ලිපි ලේඛණ විධිමත් ලෙස සකස් කර නොතිබුණි.	2023	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත පවරා දීමට අදාළ ලිපි ලේඛණ විධිමත් ලෙස සකස් කළ යුතුය.	ව්‍යාපෘති භාර දීම සම්බන්ධයෙන් මේ වන විට දී ඇති උපදෙස් අනුව කටයුතු කරනු ඇති බව දක්වා තිබුණි.	ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත පවරා දී නොතිබුණි.

46	කුඩාවිලච්චිය ජලාශය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2021-2023 කාලය තුල මිලියන 6,000 ක ඇස්තමේන්තුවක් යටතේ කුඩාවිලච්චිය ජලාශය සංවර්ධනය කිරීමට සැලසුම්කර තිබූ අතර 2023 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 162.14 ක් වැයකර තිබුණි. මහාපරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරනය හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුවේ නිර්දේශ මත මෙම ව්‍යාපෘතිය 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියයෙන් අපේක්ෂිත ප්‍රතිලාභයන් ලෙස හඳුනාගෙන තිබූ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 25,000 කට පිරිසිදු පානීය ජලය සැපයීම, මහවිලච්චිය මහා වාරි යෝජනා ක්‍රමයේ බෝග තීව්‍රතාවය 1.57 සිට 2.0 දක්වා වැඩි කිරීම, අලි මිනිස් ගැටුම් අවම කිරීම, පුරාවිද්‍යා ස්ථාන තවදුරටත් විනාශ වීමෙන් ආරක්ෂා කිරීම, අනුරාධපුරයේ යෝජිත ඖෂධ කලාපය සඳහා ජලය සැපයීම, විල්පත්තු ජාතික වනෝද්‍යානයේ වන සතුන්ට අවශ්‍ය ජල පහසුකම් සැපයීම සහ මෝදරගම් ආරු ගංගාවේ පාරිසරික තුලනය සඳහා ජල ගලනය සහතික කිරීමට නොහැකිවී තිබුණි.	2022 2023	සියලු ව්‍යාපෘති පිළිබඳ සමාලෝචනයක් කර ප්‍රමුඛතා හඳුනා ගෙන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුව වෙත ඉදිරිපත් කර යුතුය.	කුඩා විලච්චිය ජලාශයේ ඉදිකිරීම කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු මඟින් දෙන ලද උපදෙස් පරිදි නවතා දමා ඇති බව දක්වා තිබුණි.	සියලු ව්‍යාපෘති පිළිබඳ සමාලෝචනය කර ප්‍රමුඛතා හඳුනා ගෙන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.
47	2021 වර්ෂයේදී ආරම්භ කරන ලද කුඩාවිලච්චිය ජලාශය පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ කුඩා ජලාශයේ වාන් දොරටු 5 ක් අලුතින් ඉදි කිරීමට නියමිතව තිබූ අතර ඒ සඳහා රාජාංගණය ජලාශයෙන් ඉවත් කරන ලද හොඳ තත්ත්වයේ පැවැති වාන් දොරටු 5ක් අලුත්වැඩියා කර යොදා ගැනීමට තීරණය කර තිබුණි. එම යකඩ	2022	අනාර්ථික වියදම් වළක්වා ගැනීමට පියවර ගත යුතු අතර සැලසුම් කළ පරිදි පුනරුත්ථාපන කටයුතු නිම කිරීමට කටයුතු කළ යුතුය.	කුඩා විලච්චිය ජලාශයේ ඉදිකිරීම කටයුතු මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු මඟින් දෙන ලද උපදෙස් පරිදි නවතා තිබුණි.	ජලාශයේ ඉදිකිරීම් අවසන් නොකිරීම හේතුවෙන් අලුත්වැඩියා කරන ලද ගේට්ටු ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා ගෙන නොතිබුණි.

	ගේට්ටු 5 අලුත්වැඩියාව සඳහා රු.94,073,866 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට යථෝක්ත ඇස්තමේන්තු මුදලින් රු.මිලියන 10 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර ඉන් රු.9,997,582 ක් වැය කර එක් ගේට්ටුවක් අලුත්වැඩියා කිරීම හා ඇස්තමේන්තු ප්‍රකාරව Sand Blasting Yard එක ඉදිකිරීම සිදුකර තිබුණි. ජලාශයේ ඉදිකිරීම් අවසන් නොකිරීම හා අලුත්වැඩියා කරන ලද ගේට්ටු ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා නොගැනීම හේතුවෙන් ඒ සඳහා දරන ලද පිරිවැය අනාර්ථික වියදමක් වී තිබුණි.				
48	වඩමාරච්චි කළපුවෙහි ජල සම්පත් සංවර්ධනය කිරීම මඟින් යාපනය අර්ධද්වීපයේ ජනතාවට පානීය ජලය සැපයීම සඳහා 2019 වර්ෂයේදී දේශීය අරමුදල් රු.මිලියන 2,000 ක ඇස්තමේන්තු පිරිවැයක් යටතේ ව්‍යාපෘතියක් ආරම්භ කර එම වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව ඇතත් වසර 3 කට පසුව 2021 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 28 ක් වැයකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.	2022 2023	කාර්යසාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර ඒ සඳහා හේතු දැක්විය යුතුය.	ඉදිරි වාර්තා වලදී මෙවැනි කරුණුද ඇතුලත් කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.	අතහැර දමා තිබු ව්‍යාපෘතිය පිළිබඳ කාර්යසාධන වාර්තාවේ තොරතුරු ඇතුළත් කර ඒ සඳහා හේතු දක්වා නොතිබුණි.
49	දලුග්ගල වැවේ භූ විද්‍යා පරීක්ෂණ සඳහා 2022 වර්ෂය තුළ රු.3,190,000 ක ඇස්තමේන්තුවක් අනුඥාත කොට වැයකර තිබුණද, එම වැව ඉදිකිරීමට අදාළ මූලික කටයුතු කිසිවක් ආරම්භ කිරීමකින් තොරව අතරමඟ නවතා තිබීම හේතුවෙන් දරා තිබූ වියදම අනාර්ථික වී තිබුණි.	2022 2023	කාර්යසාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	කාර්යසාධන වාර්තා තුළ මෙම ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කර හේතු දක්වා නොතිබුණි.
50	ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ වගාබිම්	2022 2023	මිලදී ගත් හියුම් පයිප්ප සැලසුම්	ගොවි සංවිධාන වෙත එම බට 2,187 ක් දී	මිලදී ගත් හියුම් පයිප්ප නිසි පරිදි

	සඳහා ජල සැපයුම් ඉදිකිරීමට සැලසුම්කර ඒ සඳහා අවශ්‍ය හියුම් පයිප්ප 2411 ක් මිලදී ගෙන තිබූ අතර ඉන් 1,245 ක් ගොවි සංවිධාන වෙත නිකුත් කර තිබුණද එමගින් අපේක්ෂිත ජල සැපයුම් ඉදිකර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හියුම් පයිප්ප 1,166 ක් පදවිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ නිෂ්කාර්යව තබා තිබුණි.		කළ පරිදි උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	ඇති අතර ඒවා ක්ෂේත්‍රයේ ජල සැපයුම් කටයුතු සඳහා යොදා ගෙන තිබුණි	උපයෝජනය කර නොතිබුණි.
51	දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක, ඇස්තමේන්තුගත වටිනාකම රු. මිලියන 128,942 ක් වූ සංවර්ධන ව්‍යාපෘතීන් 9 ක සැලසුම් කළ කාලය ඉක්මවා තිබුණද නිමකර නොතිබුණි. 2012 වර්ෂයේ සිට ආරම්භ කර තිබූ එම ව්‍යාපෘතීන්හි කාලය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවන් කිහිපයකදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇතත් ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති අරමුණු යටතේ හඳුනාගෙන තිබූ වාසි සැලසුම්ගත පරිදි ලබාගැනීමට නොහැකි වී තිබුණි. ඒ පිළිබඳ විශ්ලේෂණයක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරද නොතිබුණි.	2022 2023	මේ පිළිබඳ ප්‍රමාණවත් විශ්ලේෂණයක් සිදුකර අමාත්‍යමණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.	මේ සම්බන්ධයෙන් මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් නැවත ක්‍රමෝපායකරණ හා කඩිනම් කිරීමේ (RAMP) කමිටු හිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කර තිබුණි.	සංවර්ධන ව්‍යාපෘතීන් සැලසුම් කළ කාලය ඉක්මවීම පිළිබඳ ප්‍රමාණවත් විශ්ලේෂණයක් කර අමාත්‍යමණ්ඩලය වෙත වාර්තා කර නොතිබුණි.
52	උමා ඔය යටි ගං සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිකුත්කළ කාර්යසාධන වාර්තාව අනුව මෙහි සමුච්චිත මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 15,130.40 ක් වී තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභයන් වූ නව ඉඩම් හෙක්ටයාර 4,500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1,500 කට වාරි ජල පහසුකම් සපයා දීමට සැලසුම් කලද මේ දක්වා නව කුඹුරු ඉඩම්	2023	අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති කඩිනමින් නිමකිරීමටත් වාරි පහසුම්කම් සපයනු ලබන නව කුඹුරු ඉඩම් හා පැවති කුඹුරු ඉඩම් වෙන්වෙන්ව හඳුනාගත හැකි පරිදි ලේඛන සකස්කළ යුතුය.	ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ලබාදෙන සැලසුම් වලට අනුව ඇළ මාර්ග සකස් කිරීම හැර ඉඩම් බෙදාදීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවන බව දක්වා තිබුණි. ව්‍යාපෘතිය යටතේ වගා කරන ප්‍රදේශ මේවන විට හඳුනා ගෙන ඒවා සිතියම්ගත කිරීම	අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘති කඩිනමින් නිමකිරීමටත් වාරි පහසුම්කම් සපයනු ලබන නව කුඹුරු ඉඩම් හා පැවති කුඹුරු ඉඩම් වෙන්වෙන්ව හඳුනාගත හැකි පරිදි ලේඛන සකස්කර අවසන්

	හෙක්ටයාර් 750 ක් පමණක් වගාකිරීමට වාරි පහසුකම් සපයා තිබුණි. ඒ අනුව සැලසුම්කර තිබූ හෙක්ටයාර් 5,250 ක් හෙවත් සියයට 87.5 සඳහා ජලය නිකුත්කර නොතිබුණි. එසේම මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම, සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය, නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම හා කුඩා වැව් 54 ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110 කට ජලය සැපයීමේ අරමුණු ව්‍යාපෘතිය ආරම්භ කර වසර 11 ක් ගතවී තිබූ නමුත් මේ දක්වා ලගාකරගෙන නොතිබුණි.			කරගෙන යනු ලබන බව දක්වා තිබුණි.	කර නොතිබුණි.
53	උමා ඔය පහළ නිම්න සංවර්ධන කටයුතු රුපියල් මිලියන 9,352.5ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ නමුත් අදාළ ඇස්තමේන්තුව රුපියල් මිලියන 17,914ක් ලෙස සංශෝධනය කිරීමට 2021 අගෝස්තු 30 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. එම අනුමැතිය ලබා දීමේ දී මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ කෙරෙහි නිසි අවධානය යොමු කර ඒ අනුව කඩිනම් පියවර ගන්නා ලෙස ද නියම කර තිබුණි. එනම් “වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන බොහෝ මහා පරිමාණ ව්‍යාපෘතීන් ආරම්භ කර කෙටි කාලයක් තුළ ඒවායේ විෂය පථයේ කිසිම වෙනස් කමකින් තොරව ව්‍යාපෘති පිරිවැය සිය ගුණයකින් වැඩිවීමේ ප්‍රවණතාවය දැකිය හැක. තව ද මෙම ව්‍යාපෘතිවල බාහිර සාධක විශේෂයෙන්ම උද්ධමනය හා විදේශ විනිමය අනුපාතයෙන්	2022	මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු අතර ඒ සඳහා, ව්‍යාපෘතිය කෙරෙහි බලපාන සියලු බාහිර සාධක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර දැනට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ඇස්තමේන්තු නැවත සමාලෝචනය කළ යුතුය.	දැනට සිදුව ඇති මිල උච්චාවචනයනසාමාන්‍ය තත්වය යටතේ බලාපොරොත්තු විය නොහැක්කකි. ඇස්තමේන්තු සැකසීමේදී සඳහන් කර ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි.	ව්‍යාපෘතිය කෙරෙහි බලපාන සියලු බාහිර සාධක කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර දැනට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති ඇස්තමේන්තු නැවත සමාලෝචනය කර නොතිබුණි.

	ඇති වන වැඩි වීමට වඩා ඇස්තමේන්තු අනුපාත වැඩිවීම ඉතා ඉහළ මට්ටමක පැවතීම මෙම වාරිමාර්ග ක්ෂේත්‍රයේ ව්‍යාපෘතිවල දැකිය හැකි පූර්වාදර්ශයකි. එම නිසා ඇස්තමේන්තු අනුපාත නැවත සමාලෝචනය සුදුසුය” යන නිර්දේශය මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.				
54	උමා ඔය ද්‍රෝණියේ ජලය වාර්ෂිකව ඝන මීටර් මිලියන 145ක් කිරිදිඔය ද්‍රෝණිය වෙත හැරවීමෙන් පසු දකුණු පළාතේ කෘෂිකාර්මික කටයුතු සඳහා නිදහස් කිරීමට, තැන්පත් කර ගැනීම අරමුණු කොට ගෙන ඝන මීටර් මිලියන 22.5 කින් යුත් නව කුඩා ඔය ජලාශය ඉදි කිරීමට සැලසුම් කර තිබූ නමුත්, උමා ඔය සිට කුඩා ඔය වෙත ජලය රැගෙන එන කිලෝමීටර 30 ක් දිගින් යුත් සැලසුම්ගත ඇළ මාර්ගයට ඉහළින් සිටින සේ ජලාශයේ සැලැස්ම, නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කර තිබුණි.	2022	උමා ඔය සිට නිකුත් කරනු ලබන ජලය රඳවාගැනීමට නොහැකි වන පරිදි කුඩා ඔය ජලාශයේ සැලැසුම් නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර ඊට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	නිසි අනුමැතියකින් තොරව සැලසුම් සංශෝධනය නොකල යුතු බවට උපදෙස් නිකුත්කර නොතිබුණි.	උමා ඔය සිට නිකුත් කරනු ලබන ජලය රඳවාගැනීමට නොහැකි වන පරිදි කුඩා ඔය ජලාශයේ සැලැසුම් නිසි අනුමැතියකින් තොරව සංශෝධනය කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.
55	කුඩා ඔය ජලාශයේ ඉදි කිරීමට අවශ්‍ය වැලි මීටර් කියුබ් 109,524 ජලාශයට යටවන ප්‍රදේශයෙන් සපයා ගැනීම අරමුණු කොට ගෙන මූලික ඇස්තමේන්තු සකස් කර තිබූ නමුත් ඉහත සඳහන් පරිදි ජලාශයේ සැලැස්ම වෙනස් කිරීමෙන් පසු හඳුනාගෙන තිබූ වැලි නිධිය ජලාශයෙන් පිටත සීමාව බවට පත්ව තිබිණි. එහිදී කුඩා ඔය ජලාශය ඉදි කිරීමට අවශ්‍ය වැලි කියුබ් 1ක් සඳහා රුපියල් 6,452ක් ඇස්තමේන්තු කර තිබුණ ද රුපියල් 10,100 වැනි මුදලකට බාහිර සැපයුම්කරුවෙකු මඟින් වැලි මිල දී ගැනීමට කටයුතු කර තිබූ	2022	ව්‍යාපෘති සැලසුම වෙනස් කිරීම නිසා ඛනිජ සම්පත් අවභාවිතයට ඉඩ සැලසූ නිලධාරීන් හා වැඩිමිලට වැලි මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.	ඇස්තමේන්තු අනුව කටයුතු කල යුතු බවට උපදෙස් නිකුත් කර නොතිබුණි.	ව්‍යාපෘති සැලසුම වෙනස් කිරීමේ දී වන බලපෑම ඇගයීම් නොකිරීම නිසා ඛනිජ සම්පත් අවභාවිතයට හා වැඩිමිලට වැලි මිලදී ගැනීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

	අතර අදාළ සැපයුම්කරු විසින් ජලාශ බැම්මට මීටර් 200 ක් පමණ පහළින් පිහිටි ගාස්තු ගෙවීමකින් තොරව වැලි සපයා ගැනීමට සැලසුම්කර තිබූ ස්ථානයෙන් වැලි කියුබ් 21,286 ක් සපයා තිබූ අතර ඒ සඳහා රුපියල් මිලියන 190 ක් ගෙවා තිබුණි.				
56	ව්‍යාපෘති කාර්ය සඳහා දරන ලද වියදම් පිළිබඳව වෙන් වෙන්ව වාර්තා තබාගෙන නොතිබූ අතර වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ද පිළියෙල කර නොතිබුණි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2023 ජනවාරි මස ප්‍රගති වාර්තාවට අනුව 2021 වර්ෂය දක්වා වාරිමාර්ග අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 9,870.92 ක් හා 2022 වර්ෂයේ වාරිමාර්ග දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ රුපියල් මිලියන 2,006.67ක් වශයෙන් රුපියල් මිලියන 11,878 ක් වැය කර තිබූ නමුත් එක් එක් කාර්ය යටතේ එක් එක් කාර්ය සඳහා දරන ලද පිරිවැයෙහි එකතුව රුපියල් මිලියන 6,567.22 ක් විය. ඒ අනුව ව්‍යාපෘතිය සඳහා වැය කරන ලද පිරිවැයෙන් රුපියල් මිලියන 5,310 ක් වැය කළ කාර්යය නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි විය.	2022	ව්‍යාපෘති කටයුතු සඳහා වාර්ෂික අයවැය ලේඛනයක්, ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. ඒ මත පදනම්ව ප්‍රතිපාදන වෙන් කොට ගිණුම් සංකේත හඳුන්වා දී ගිණුම් තබා ගත යුතුය. ඊට අමතරව වාර්ෂිකව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.	ගිණුම් තැබීමට උපදෙස් ලබා දී ඇත.	ව්‍යාපෘති කටයුතු සඳහා වාර්ෂික අයවැය ලේඛනයක්, ප්‍රසම්පාදන සැලැස්මක් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ප්‍රතිපාදන වෙන් කොට ගිණුම් සංකේත හඳුන්වා දී ගිණුම් තබා නොතිබීම හේතුවෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.
57	ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර අනුඥාත කරනු ලැබූ එක් එක් ඇස්තමේන්තු යටතේ නිමකරන ලද වැඩකොටස් පිළිබඳ සහතික කිරීම් හා වැඩ අවසන් වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. ඉංජිනේරු සහකාරවරුන්ගේ දෛනික	2022	අනුඥාත කරනු ලැබූ එක් එක් ඇස්තමේන්තුව යටතේ නිමකරන ලද වැඩ කොටස් පිළිබඳ මිනුම් වාර්තා හා බිල්පත් සකස් කොට නිශ්චිත සහතික කිරීමක් සහිතව වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට	ඍජු ශ්‍රමය යටතේ නිම කරන ලද වැඩ කොටස් පිළිබඳ වැඩ අවසන් කිරීමේ සහතිකයක් නිකුත් කර නොතිබුණි.	අනුඥාත කරනු ලැබූ එක් එක් ඇස්තමේන්තුව යටතේ නිමකරන ලද වැඩ කොටස් පිළිබඳ මිනුම් වාර්තා හා බිල්පත් සකස් කොට සහතික කර වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර

	මිනුම් පොත් පදනම් කොට ගෙන ද්‍රව්‍ය, ශ්‍රමය හා යන්ත්‍ර සඳහා ගෙවීම් කර තිබුණි.		කටයුතු කළ යුතුය.		නොතිබුණි.
58	ජල විදුලි උත්පාදනයෙන් පසු නිකුත් කරන ජලය කිරිඳි ඔය ද්‍රෝණියේ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට අදාළ සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබුණු වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඒ සඳහා 2009 වර්ෂය සිට නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු යටතේ අලිකොටආර ජලාශයේ සිට කිලොමීටර් 18 ක් දුරින් පිහිටි මීගස් ආර වැව හරහා ගෙනයනු ලබන ජලය කිලෝමීටර් 24+365 දුරින් පිහිටි කුඩාඔය ජලාශයට ගෙනයාමෙන් පසු ප්‍රියන්තගේ වැව දක්වා ගෙනයාමට සැලසුම්කර තිබුණි. එසේ වුවද මීගස් ආර වැව දක්වා ජලය ගෙනයාමට හැකි පරිදි පහල නිම්න සංවර්ධන කටයුතු නිම කර නොතිබීම හේතුවෙන් අලිකොටආර ජලාශයෙන් නිකුත් කරන ජලය මීගස්ආර වැව දක්වා ගෙන යාමට නොහැකිවී තිබුණි.	2023	මූලික සැලසුමට අනුව ව්‍යාපෘති කටයුතු නිමකර අපේක්ෂිත ප්‍රතිලාභ ලැබෙන පරිදි වාරි පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය.	බුදුරුවගල නිර්මිතය නිම වූ පසු මීගස්ආර වැව දක්වා ජලය ගෙන යෑමට හැකි බව දක්ව තිබුණි. මේ වන විට ප්‍රධාන ඇලෙහි ඉදිකිරීම් කඩිනමින් සිදු වන අතර එම කාර්යයන් ඉදිරි මාස කිහිපය තුල නිම කිරීමට සැලසුම් කර ඇති බව දක්වා තිබුණි.	මූලික සැලසුමට අනුව ව්‍යාපෘතිය නිමකර අපේක්ෂිත වාරි පහසුකම් සැපයීමට කටයුතු කර නොතිබුණි.
59	ප්‍රියන්තගේ වැවේ සිට කිලෝමීටර් 5.5 ක් දුරින් පිහිටි කෙඩුම්කඩේ වැව දක්වා ඇති මලල ආර සංවර්ධනය කිරීමත් ඉන්පසු බඳගිරිය හා පහල මත්තල දක්වා ඇති වැව් 40 කට ජලය රැගෙන යාමටත් සැලසුම්කර තිබුණි. එහෙත් ප්‍රියන්තගේ වැවෙන් පසුව ජලය ගෙන යාමට හැකිවන පරිදී ඇල මාර්ග සංවර්ධනයට මේ දක්වා කටයුතු කර නොතිබුණි. දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා නිම කර නොතිබීම හේතුවෙන් උමා ඔය ද්‍රෝණියේ ජලය කිරිඳි ඔය ද්‍රෝණියට හැරවීමේ ප්‍රධාන	2023	මූලික සැලසුමට අනුව ඇලමාර්ග සංවර්ධනය කර අපේක්ෂිත පරිදි බඳගිරිය හා පහල මත්තල දක්වා ඇති වැව් 40 කට ජලය සැපයිය යුතුය.	දකුණු ඉවුරු ඇළ යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන් මේ දක්වා නිම කර නොතිබීම හේතුවෙන් උමා ඔය ද්‍රෝණියේ ජලය කිරිඳි ඔය ද්‍රෝණියට හැරවීමේ ප්‍රධාන අරමුණ වූ දකුණු පළාතේ පිහිටි ඉඩම් සඳහා ජලය සැපයීමට නොහැකි වී තිබුණි.	මූලික සැලසුමට අනුව ඇලමාර්ග සංවර්ධනය කර අපේක්ෂිත පරිදි ජලය සැපයිම කර නොතිබුණි.

	අරමුණ වූ දකුණු පළාතේ පිහිටි ඉඩම් සඳහා ජලය සැපයීමට නොහැකි වී තිබුණි.				
60	උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘති කාර්යාලය ඒ යටතේ පාලනය වන කුඩාඔය, සිංහලයාගම, හඳපානාගල හා වැල්ලවාය නේවාසික ව්‍යාපාර ඉංජිනේරු කාර්යාල 4 ක් සහ ව්‍යාපෘතියට අනුයුක්ත ස්ථිර කාර්ය මණ්ඩලයක් සහිතව ව්‍යාපෘතියේ කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි. නමුත් ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම යන කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීමට වැදගත් තොරතුරු ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද පරිඝණක ගත තොරතුරු පද්ධතියක් පවතවාගෙන ගොස් නොතිබුණි. ඒ හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති නිර්ණායකයන්ට අනුකූලව නිසි පුද්ගලයින් වෙත සිදුකර ඇතිබව විගණනයේදී තහවුරු කළ නොහැකි විය.	2023	ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම යන කටයුතු පාලනය හා මෙහෙයවීම යන කළමනාකරණ තීරණ ගැනීමට වැදගත් තොරතුරු ලේඛනයක් හෝ යාවත්කාලීන කරන ලද පරිඝණක ගත තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය.	ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති නිර්ණායකයන්ට අනුකූලව නිසි පුද්ගලයින් වෙත සිදුකර ඇතිබව තහවුරු කර නොතිබුණි.	ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම හා නව කුඹුරු ඉඩම් බෙදාදීම යන කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීමට වැදගත් තොරතුරු ලේඛනයක් පවත්වා නොතිබුණි.
61	ව්‍යාපෘතිය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් අනුමත කර නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුත් ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරි සීමාවට සරිලන පරිදි රු. මිලියන 50 බැගින් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කොටස්කර අනුමත කර	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට පටහැනිව කටයුතු කළ නිළධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය.	මෙවැනි අඩුපාඩු සිදුනොවීමට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුව කටයුතු කර නොතිබුණි.

	සැලසුමකින් තොරව ක්‍රියාත්මක කර තිබුණි.				
62	උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2010 වර්ෂයේ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ රු.මිලියන 9,352.5 ක ඇස්තමේන්තුව යටතේ නිම කිරීමට අපේක්ෂිත කාර්යයන්ට අදාල උප කාර්යයන් වෙන් වෙන්ව හඳුනාගෙන නොතිබූ අතර එක් එක් උප කාර්යයන් යටතේ වූ ප්‍රතිපාදන වැය කිරීමට ඇස්තමේන්තු අනුඥාත කිරීමේදී විධිමත් ලේඛන නඩත්තු කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය යටතේ අදාල කාල සීමාව තුල ඉටුකරන ලද කාර්යයන් හා ඒ සඳහා දරන ලද වියදම් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි විය. 2023 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 14,945.28 ක් වැයකර තිබූ නමුත් ප්‍රමුඛතා හඳුනාගෙන නිසි සැලැස්මකට අනුකූලව ඉදිකිරීම ආරම්භ නොකිරීම හේතුවෙන් නිමකළ ඇළ මාර්ග සේදී යාම, ඉවුරු බාදනය, ඇළ මාර්ගවල හා කොන්ක්‍රීට් නිර්මිත තුළ පස් පිරීම ආදිය යථාවත් කිරීම සඳහා අමතර ප්‍රතිපාදන දැරීමට සිදුව තිබුණි.	2023	ව්‍යාපෘති කාර්යයන් හා වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ලේඛන සකස්කළ යුතු අතර ව්‍යාපෘතියේ ප්‍රමුඛතාවය හඳුනාගෙන ඉදිකිරීම් කළ යුතු අතර. නිමකළ ඇළ මාර්ග සේදී යාම, ඉවුරු බාදනය, ඇළ මාර්ගවල හා කොන්ක්‍රීට් නිර්මිත තුළ පස් පිරීම වැලැක්වීමට කටයුතු කළ යුතුය.	ව්‍යාපෘතිය යටතේ අදාල කාල සීමාව තුල ඉටුකරන ලද කාර්යයන් හා ඒ සඳහා දරන ලද වියදම් වෙන් වෙන්ව හඳුනාගත ගැනීමට අවශ්‍ය වාර්තා සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.	ව්‍යාපෘති කාර්යයන් හා දරන ලද වියදම් වෙන් වෙන්ව හඳුනාගත හැකිවන පරිදි ලේඛන නොතිබූ අතර ප්‍රමුඛතාවය හඳුනාගෙන ඉදිකිරීම් කිරීම, නිමකළ ඇළ මාර්ග සේදී යාම, ඉවුරු බාදනය, ඇළ මාර්ගවල හා කොන්ක්‍රීට් නිර්මිත තුළ පස් පිරීම වැලැක්වීමට කටයුතු කර නොතිබුණි.
63	2022 වර්ෂයේ සිට උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘති කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පවරා ඇතත් ,ව්‍යාපෘති කාර්යාලය විසින් භාවිතා කරන ලද උපකරණ භාර ගැනිම සම්බන්ධ සකස් කර ඇති වාර්තාවල පිටපත්, භාර ගන්නා දින වන විට නිමකර ඇති කාර්යයන් පිළිබඳ කාර්යසාධන හෝ ප්‍රගති වාර්තාවල පිටපත්, ව්‍යාපෘතිය භාරගත් දින වන විට දරා ඇති වියදම් පිළිබඳ විස්තර	2023	ව්‍යාපෘතිය දෙපාර්තමේන්තුව වෙත පැවරීමේ ලේඛන විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය.	මේ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව දක්වා තිබුණි.	ව්‍යාපෘතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත පැවරීමේ ලේඛන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

	ඇතුළත් කර ඉදිරිපත් කර ඇති ගිණුම් වාර්තාවල පිටපත් සහ ව්‍යාපෘතිය 2024 දෙසැම්බර් 31 දිනට නිමකිරීම සඳහා යොදාගනු ලබන වැඩ නිමකිරීමේ සැලැස්ම ආදිය ඉදිරිපත්කර නොතිබුණි.				
64	2007 වර්ෂයේ දී ඉදි කර තිබූ වේලිඔය අමුණු තුළ 2017 ආරම්භය වන විට වැලි ඝනමීටර් 500,000 තැන්පත්ව පවතින බව වේලිඔය ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ඇස්තමේන්තු කර තිබූ අතර වේල්ලේ වැලි සොරොව්ව 2017 වර්ෂයෙන් පසුව විවෘත කොට නොතිබීම හේතුවෙන් ඉන් අනතුරුවද වසර තුනක කාල සීමාව තුළ විශාල වැලි ප්‍රමාණයක් අදාළ ස්ථානයේ තැන්පත් වී තිබුණි. උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වේලිඔය ජලාශයේ සිට කි.මීටර 20 ක් පමණ දුරින් පිහිටි කුඩා ඔය ජලාශය ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණු අතර ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු ගත වැලි ප්‍රමාණය කියුබික් මීටර් 109,524 ක් විය. වාරිමාර්ග දෙපාර්තමේන්තුව කුඩා ඔය ජලාශයේ ඉදිකිරීම් කටයුතු ස්වකීය සේවකයින් සහ උපකරණ යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ක්‍රියාත්මක කර තිබුණු බැවින් වේලිඔය ජලාශයේ තැන්පත්ව තිබූ වැලි එම ව්‍යාපෘතියේ යන්ත්‍ර සූත්‍ර භාවිතා කර අවම පිරිවැයක් යටතේ උකහා ගැනීමට හා ඒවා කුඩාඔය ජලාශයේ ඉදිකිරීම් සඳහා යොදා ගැනීමට අවස්ථාව පැවතිණි. එසේ වුවද කුඩාඔය වැව් බැම්මේ මෙම වැලි අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඩ්‍රෙජින් ලංකා පුද්ගලික සමාගම වෙත වේලිඔය අමුණේ වැලි ඉවත් කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව	2022	ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනයන් තුල ඛණිජ සපයා ගත හැකි ස්ථාන නිවැරදිව හඳුනා ගත යුතුය. ස්වකීය සේවකයින් සහ උපකරණ යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය (force Account) යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීමේ දී පවතින සම්පත් උපරිම උපයෝජනය පිළිබඳ සැලකිල්ලට ගත යුතුය.	උමා ඔය ඉදිරිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් වැලි මිල දී ගෙන තිබූ බව දක්වා තිබුණි.	ව්‍යාපෘති ශක්‍යතා අධ්‍යනයන් සිදු කිරීමේ දී සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඛණිජ සපයා ගැනීම සිදු කරනු ලබන ස්ථාන නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. ස්වකීය සේවකයින් සහ උපකරණ යොදා වැඩ කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය (force Account) යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දීමේ දී පවතින සම්පත් උපරිම උපයෝජනය පිළිබඳ සැලකිල්ලට ගෙන නොතිබුණි. ඊට පටහැනිව කටයුතු කර ඇති නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නොතිබුණි.

	අනුමැතිය ලබාදී තිබුණි. 2017 සිට 2020 දක්වා එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.මිලියන 192 ක් වැයකර වැලි කියුබික් මීටර් 6,239 ක් පුද්ගලික සමාගමක් වෙතින් මිලදී ගෙන තිබුණි.				
65	වේලිඔය ජලාශයේ තැන්පත්ව තිබූ වැලි අදාළ සමාගම 2018 වර්ෂයේ සිට ඉවත්කළ වැලි ප්‍රමාණය පිළිබඳ කිසිදු වාර්තාවක් ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.	2022	ජලාශයන්හි වැලි ඉවත් කිරීමේ කටයුතු අධීක්ෂණය හා පටිපාටීන් නිශ්චය කොට ඊට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම සඳහා නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ජලාශයන්හි වැලි ඉවත් කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීමේ පටිපාටීන් නිශ්චය කොට ඊට අදාළ අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් කිරීම සඳහා නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොතිබුණි.
66	දෙපාර්තමේන්තුව සතු භූමි තුළින් ඛණිජ ඉවත් කිරීමේදී ගාස්තු අයකිරීමට විධිමත් ක්‍රමයක් හඳුන්වාදී නොතිබූ අතර වැලි කියුබ් එකක් සඳහා රුපියල් 150 බැගින් අය කරන ලෙස මොණරාගල වාරිමාර්ග අධ්‍යක්ෂක වෙත දැනුම් දී තිබූ නමුත් ඉවත් කළ වැලි සඳහා කිසිදු මුදලක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	ගාස්තු අය කිරීමට කැලෑ ආඥාපනතේ 20 වන වගන්තිය යටතේ 2009 මැයි 06 දිනැති අංක 1600/18 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ගාස්තු අනුව ඉඩම් පරිහරණ ගාස්තු අය කර ගැනීමට නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය.	ඛණිජ ඉවත් කිරීමේදී ගාස්තු අයකිරීමට නිවැරදි ක්‍රමවේද අනුව සිදුකරනු බව දක්වා තිබුණි.	ඉඩම් පරිහරණ ගාස්තු අය කර ගැනීමට නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොතිබුණි.
67	මොනරාගල දිස්ත්‍රික්කයේ කඩිනම් වාරි සංවර්ධන ව්‍යාපෘතිය (වෙල්ලස්ස නවෝදය) යටතේ වූ මොරගොල්ල, ඌරාඋල හා පයිලේගම වැව් ප්‍රතිසංස්කරණය කළයුතු ආකාරය පිළිබඳ ප්‍රමුඛතාවයන් තීරණය කිරීමෙන් තොරව ද්‍රව්‍ය මිල දී ගෙන තිබීම	2022	මෙම වැව් ප්‍රතිසංස්කරණයට දරන ලද පිරිවැයෙහි ආර්ථික ප්‍රතිලාභ ළඟා කරගත හැකි වන පරිදි ප්‍රමුඛතා පදනමක් මත ඉදිකිරීම් සඳහා	මේ වන විට මීට අදාල ඇස්තමේන්තු සංශෝධනය සඳහා අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව දක්වා තිබුණි. මේ වන විට මිල දී ගෙන තිබූ ද්‍රව්‍ය ඉදි කිරීම්	ප්‍රමුඛතා හඳුනාගෙන වැව් ප්‍රතිසංස්කරණය නිම කර ජනතාව වෙත ප්‍රතිලාභ ළඟාකරගත හැකි තත්ත්වයට පත් කර නොතිබුණි.

	හා ඉදිකිරීම් සිදුකිරීම නිසා එම වැව් මගින් වගා කටයුතු සඳහා ජලය සැපයීමට නොහැකිවී තිබුණි. තවද 2023 අයවැය තුළින් මුදල් වෙන්කිරීම සීමා වීම නිසා මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් මේ දක්වා දරන ලද රු.140,963,871 ක වියදමද නිෂ්කාර්ය වී තිබුණි.		යොදා ගෙන ප්‍රමුඛතා හඳුනාගෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ යුතුය.	හඳුනාගෙන ඒ වෙනුවෙන් යොදා ගැනීමට උපදෙස් දී තිබුණි.	
68	මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය සඳහා අනුමත කර තිබූ රු.මිලියන 49.9 ක ඇස්තමේන්තුව තුළ ඇතුළත් රු.මිලියන 37.9 ක් වූ සිවිල් වැඩ පිරිවැයෙන් රු.මිලියන 30.3 ක් හෙවත් සියයට 80 ක් වැය කර තිබුණු නමුත් ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය සියයට 37 ක් විය. එසේ ප්‍රමාණවත් භෞතික ප්‍රගතියක් වාර්තා වී නොතිබියදීත් 2019,2020,2021 හා 2022 වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන වැයකිරීමේ අරමුණින් පෙර වර්ෂවල මිලදී ගත් අමුද්‍රව්‍ය භාවිතා කිරීමෙන් තොරව තොග වශයෙන් නැවතත් ද්‍රව්‍ය මිලදී ගෙන තිබුණි. වැව ප්‍රතිසංස්කරණයට අදාළව අනුමත කළ ඇස්තමේන්තුව තුළ වැවේ පිටවාන ඉදිකිරීමට රු.මිලියන 28.6 හෙවත් මුළු ඇස්තමේන්තුවෙන් සියයට 75 වෙන්කර තිබූ අතර ඒ සඳහා 2022 වර්ෂය තුළ රු. 9,872,170 ක් වැය කර වානේ කම්බි 5,150 Kg ක් මිලදීගෙන ඉන් 1,884 Kg ක් පමණක් භාවිතා කර තිබුණි. මේ අනුව මිලදී ගත් කම්බි ප්‍රමාණයෙන් සියයට 63 ක් ඉතිරි වී තිබුණි.	2022	වර්ෂ අවසානයේ ඉතිරි ප්‍රතිපාදන වැයකිරීමේ අරමුණින් නොව තාක්ෂණික පිරිවිතරයන්ට අනුව සැලසුම් හා ඇස්තමේන්තු පිළියෙල කර අමුද්‍රව්‍ය මිලදී ගත යුතුය. සෘජුශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී අවිධිමත්භාවයන් වැළකෙන පරිදි ඒ හා සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කර අඛණ්ඩව පසු විපරම් කළ යුතුය.	මිල දී ගෙන තිබූ ද්‍රව්‍ය ප්‍රමුඛ ඉදි කිරීම් හඳුනාගෙන ඒ වෙනුවෙන් යොදා ගැනීමට උපදෙස් දී ඇත. ඇස්තමේන්තු අයිතමයන් ඉක්මවා ගෙවීම් කටයුතු සිදු නොකළ යුතු අතර එසේ කිරීමට අපහසු අවස්ථාවන්හිදී මූලික ඇස්තමේන්තු සංශෝධනය කර ඒ සඳහා නිසි අනුමැතිය ලබා ගැනීම කළ යුතු බවට උපදෙස් දී තිබුණි.	සෘජුශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී අවිධිමත්භාවයන් වැළකෙන පරිදි ඒ හා සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොතිබුණි.
69	මොරගොල්ල වැව ප්‍රතිසංස්කරණය කිරීමෙන් පසු වගාකරන භූමි ප්‍රමාණය අක්කර 50 සිට අක්කර 200 දක්වා වැඩි කිරීමට සැලසුම් කර තිබුණු	2022	අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීමේදී ඉටු නොකළ කාර්යයන්	ඇස්තමේන්තු සංශෝධනය කර වගාවට ජලය ගෙන යාමට අවශ්‍ය ඇළ මාර්ග සකස් කිරීම	වගාකරන භූමි ප්‍රමාණය වැඩි කිරීමට අවශ්‍ය කුඹුරු හඳුනාගෙන

	නමුත් ඒ සඳහා අවශ්‍ය කුඹුරු හඳුනාගෙන නොතිබුණු අතර වගාවට ජලය ගෙනයාමට අවශ්‍ය ඇළ මාර්ග සකස්කිරීම අනුමත ඇස්තමේන්තුවට ඇතුළත්කර නොතිබුණි.		ක්‍රියාකාරි සැලසුම් හා ප්‍රමුඛතා ලේඛන තුළ ඇතුළත් කර අඛණ්ඩ පදනමින් පසු විපරම් කළ යුතුය.	සඳහා වන වියදම් නව ඇස්තමේන්තුවට ඇතුළත් කර ඇති බව දක්වා තිබුණි.	සැලසුම් හා ප්‍රමුඛතා ලේඛන තුළ ඇතුළත් කර අඛණ්ඩ පදනමින් පසු විපරම් කර නොතිබුණි.
70	ඖරාඋල වැවේ බැම්ම ඉදිකිරීමෙන් පසු වැව් බැම්මේ ආරක්ෂාවට රළපනාවක් දැමීමට අවශ්‍ය 6X9 කළුගල් කියුබ් 240.26 ක් රු.3,499,500 මුදලක් වැය කර 2021 වසරේ මිලදී ගෙන වැව ඉදිකිරීම් භූමියේ ගොඩගසා තිබුණු අතර එම වර්ෂයේම මිලදී ගෙන තිබූ රු.2,324,850 ක් වටිනා 12 mm කම්බි 1761 ක් වසරකට වැඩි කාලයක් ඉදිකිරීම් භූමියේ ගොඩ ගසා තිබුණද වැව් බැම්ම ඉදිකර නොතිබුණි.	2022	සෘජු ශ්‍රම පදනම මත කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී අවිධිමත්භාවයන් වැළකෙන පරිදි, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම හා උපයෝජනය පිළිබඳ නිර්ණායකයන් ඇතුළත් කර, චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. දරන ලද පිරිවැයට උපරිම ආර්ථිකමය ප්‍රතිලාභ එක් වන පරිදි ඉදිකිරීම් කටයුතු කඩිනමින් ඉටු කළ යුතුය.	මේ වන විට මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිපාදන නොලැබේ. මිළදී ගෙන ඇති කම්බි බිබිල වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ ගබඩා කර ඇත. කෙසේ වෙතත් දැනට පිළියෙල කර ඇති ඇස්තමේන්තුවල පවතින මිල ගණන් යටතේ මෙම කාර්යයන් ඉටු කළ නොහැකි නිසා ඇස්තමේන්තු සංශෝධනය කරන ලෙසට උපදෙස් දී ඇත.	අවිධිමත්භාවයන් වැළකෙන පරිදි, අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා එක් එක් ව්‍යාපෘතිය සඳහා ද්‍රව්‍ය මිල දී ගැනීම හා උපයෝජනය පිළිබඳ නිර්ණායකයන් ඇතුළත් කර, චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොතිබුණි.
71	දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීමේ බහු අදියර ව්‍යාපෘතිය (CResMPA) සඳහා එළඹ තිබූ 2021 සැප්තැම්බර් 17 දිනැති ගිවිසුම 2023 මැයි 23 වන දින නැවත සංශෝධනය කර දිළිඳු ප්‍රජාවට ඔවුන්ගේ ඇළ මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උපකාර කිරීමේ අරමුණින් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සිදු කිරීමට තීරණය කර තිබුණි. ව්‍යාපෘති සංරචක 1 සහ 2 සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන වලින් රු.මිලියන 4,500 (ඇ.ඩොලර් මිලියන 15) ක් වෙන්කර "දේශගුණික	2023	ගොවි සංවිධාන වෙත පිරිනමන ලද කොන්ත්‍රාත්තු දෙපාර්තමේන්තු නිළධාරීන් විසින් ඉටු නොකල යුතුය.	දිළිඳු ප්‍රජාවට ඔවුන්ගේ ඇළ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උපකාරි වීම" යන අරමුණ ඉටු වී නොතිබුණි.	ගොවි සංවිධාන වෙත පිරිනමන ලද කොන්ත්‍රාතු දෙපාර්තමේන්තු නිළධාරින් විසින් ඉටු නොකල යුතු බවට චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොතිබුණි.

ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ වාරිමාර්ග හා වැසි ජලය යටිතල පහසුකම් නඩත්තු කිරීම" ලෙස 5 වන සංරචකය හඳුනාගෙන තිබුණි. මෙම නව සංරචකය මගින් දිස්ත්‍රික්ක 25 හි වාරිමාර්ග පද්ධති වල බෝක්කු, ගංවතුර පාලන ව්‍යුහ, ගේට්ටු සහ ජල මෙවලම්, හදිසි අලුත්වැඩියාවන් සිදුකිරීමට සඳහා ඉහළම ප්‍රමුඛතාවය ලබා දෙමින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ක්‍රියාත්මක කර තිබුණි.

ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ඇස්තමේන්තු වටිනාකම රු. 87,421,384 ක් වූ කොන්ත්‍රාත් පැකේජ 69 ක් ගොවි සංවිධාන වෙත පිරිනමා තිබුණි. ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 30.755 වූ කොන්ත්‍රාත් පැකේජ් 17 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිම කර තිබුණි. කෙසේ වුවද මේ සම්බන්ධයෙන් මඩකලපුව හා අම්පාර ප්‍රදේශවල සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණ අනුව එම ඉදිකිරීම් බොහොමයක් ගොවි සංවිධාන මගින් සිදුකර නොතිබූ අතර දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින්ම සිදුකළ බව තෙවන පාර්ශව විගණනයට තහවුරු කරන ලදි. එමගින් මෙම සංරචකය ක්‍රියාත්මක කිරීමේ මූලික අරමුණ වූ " දිළිඳු ප්‍රජාවට ඔවුන්ගේ ඇළ මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීමට සහාය වෙමින් ඔවුන්ගේ ජීවනෝපාය වැඩිදියුණු කිරීමට උපකාරි වීම" යන අරමුණ ඉටු වී නොතිබුණි. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති කළමනාකරණයේ අධීක්ෂණය ද අවම මට්ටමක පැවතුණි.

72	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.7 ප්‍රකාරව ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය සුදුසු වන්නේ තම ආයතනයේ ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර පවතී නම් පමණක් වුවද ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් හා යන්ත්‍ර සූත්‍ර පවතින බව තහවුරු කිරීමකින් තොරව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල විසින් ඒවායේ ක්‍රියාත්මක කර්මාන්ත ස්වකීය සේවකයින් හා උපකරණ භාවිතා කර ඉටුකරන ප්‍රසම්පාදන ක්‍රමය (Force Account) යටතේ ක්‍රියාත්මක කර තිබුණි.	2022 2023	ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදීමට ප්‍රථම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට ඇති අනුකූලතාවය තහවුරු කර ගත යුතුය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදීමට ප්‍රථම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට ඇති අනුකූලතාවය තහවුරු කර නොතිබුණි.
73	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2 අනුව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර යාවත්කාලීන කළ යුතු අතර ඒ තුළ ප්‍රසම්පාදන ක්‍රමය නිශ්චය කර තිබිය යුතු වේ. මාර්ගෝපදේශ 4.2.3(ඇ) අනුව ප්‍රසම්පාදන කාල සටහන අදාළ ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු වුවත් විගණනයට ඉදිරිපත්කළ තොරතුරු අනුව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 11 ක් මඟින් 2023 වර්ෂය තුළ සිදු කරන ලද රු.මිලියන 978 ක් වූ ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්ත 137 ක ප්‍රසම්පාදන ක්‍රමවේදය ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා විසින් නිශ්චය කර තිබුණි.	2022 2023	ස්වකීය සේවකයන් සහ උපකරණ භාවිතා කර ඉටු කරන ප්‍රසම්පාදන ක්‍රමය යටතේ කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කළ යුතුය.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට උපදෙස් ලබා දී තිබූ නමුත් ඒ අනුව කටයුතු කරණ බවට තහවුරු කර නොතිබුණි.
74	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින්, වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් නමින්, හෝ දෙපාර්තමේන්තු ලිපිනය යටතේ වාහන 2004 ක් ලියාපදිංචි වී තිබුණ ද	2022 2023	වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති නමුත් දෙපාර්තමේන්තුව භාරයේ නොපවතින වාහන පිළිබඳ සොයා බලා	වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති නමුත් දෙපාර්තමේන්තුව භාරයේ නොපවතින වාහන පිළිබඳ සොයා බලා අවශ්‍ය	වාරිමාර්ග දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී ඇති භාරයේ නොපවතින වාහන පිළිබඳ සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග

	දෙපාර්තමේන්තුවේ වාහන ලේඛනය අනුව වාහන සංඛ්‍යාව 1,564 ක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව වාහන 460 ක් දෙපාර්තමේන්තුව භාරයේ නොපැවතුණි.		අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.	ගෙන නොතිබුණි.
75	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල අනුගමනය කරන ගෙවීම් පටිපාටිය රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූල නොවන බැවින් මෙම පටිපාටිය නිවැරදි කරන ලෙස 2016 සැප්තැම්බර් 22 ලබාදුන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝග කර තිබුණද ගිණුම් කාරක සභා නියෝගයට නොසලකා 2017 අප්‍රේල් 07 දිනැති අංක 2013/31 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර තිබූ ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය මගින් ගණකාධිකාරිවරයෙකු විසින් ඉටු කල යුතු කාර්යන් වන ගෙවීම් සහතික කිරීම, මුදලින් කරන සියලු ගෙවීම් කිරීම, දෙවැනි අත්සන්කරු වශයෙන් චෙක්පත් අත්සන් කිරීම, සුලු මුදල් පොත හා ගෙවීම් මුදල් පිළිබඳ උපයෝගි ලේඛන නඩත්තු කිරීම යන කාර්යයන් ඉංජිනේරු සහකාර සේවයේ විශේෂ ශ්‍රේණියේ කොට්ඨාශ සහකාරගේ රාජකාරි ලෙස දක්වා තිබුණි.	2023	ගණකාධිකාරිවර යෙකු විසින් ඉටු කල යුතු කාර්යන් ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් ඉවත්කර, ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කල යුතුය.	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල වල මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ගෙවීම් සහතික කිරීමේ බලය සම්බන්ධව වාරිමාර්ග අමාත්‍යාංශය මගින් කමිටුවක් පත්කර සුදුසු ක්‍රමවේදයක් සැකසීම සඳහා සාකච්ඡා කරමින් පවතින බව දක්වා ඇත.	ගණකාධිකාරිවර යෙකු විසින් ඉටු කල යුතු කාර්යන් ඉංජිනේරු සහකාර සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙන් ඉවත්කර, ව්‍යවස්ථා සංග්‍රහය සංශෝධනය කර නොතිබුණි.
76	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලවල ඉදිකිරීම් හා නඩත්තු කර්මාන්තයන්ට සපයනු ලබන ද්‍රව්‍ය, භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් කරු වෙතින් ඉන්වොයිස්පත් ඉදිරිපත් කර නොතිබියදී වවුචර් 402 ක් සඳහා රු. 108,518,811 ක් ගෙවීම් අනුමත කර, සහතික කර ගෙවීම් කර තිබුණි.	2023	සපයනු ලබන වැඩ, භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් කරු වෙතින් ලබාගත් ඉන්වොයිස්පත් වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතුය.	ගෙවීම් පටිපාටිය විධිමත්ව සිදුකිරීමට උපදෙස් ලබා දී ඇති බව දක්වා තිබුණි.	සපයනු ලබන වැඩ, භාණ්ඩය හෝ සේවාවට අදාලව සැපයුම් කරු වෙතින් ලබාගත් ඉන්වොයිස්පත් වවුචර් සමඟ ඉදිරිපත් කරන බවට තහවුරු කර

					නොතිබුණි.
77	1946 අංක 32 දරන වාරිමාර්ග අඥා පනතේ 285 වැනි පරිච්ඡේදයේ 64 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඒ යටතේ පාලනය වන ප්‍රධාන හා මධ්‍ය පරිමාණ ජල යෝජනා ක්‍රම, ප්‍රධාන ගංගා ද්‍රෝණි, ජලපෝෂක හා රක්ෂිතයන්හි ආරක්ෂාව, අනවසර ඉදිකිරීම් හා වගා කටයුතු පාලනය, ජලය අපවිත්‍ර කිරීමෙන් වලක්වා ගැනීම, අනවසර ජල භාවිතා කිරීම පාලනය කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රමයන්හි නඩත්තුව සම්බන්ධ විධිමත් නියාමනයක් සිදුකිරීමට අවශ්‍ය නිර්ණායක නිකුත් කර නොතිබුණි.	2022 2023	අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනතේ සඳහන් නියමයන්ට අනුව නෛතික ක්‍රියා මාර්ග ගත යුතුය.	වාරිමාර්ග ආඥා පනතේ සිදුකළ සංශෝධනයන් හා ශ්‍රී ලංකාවේ සකස් කරන ලද වෙනත් අණ පනත් හා නීතිරීති මඟින්, වාරිමාර්ග ආඥා පනතේ රෙගුලාසි සකස් කළ යුතු බව සඳහන් ක්ෂේත්‍රයන් සියල්ලම පාහේ ආවරණය වන පරිදි නීති සම්පාදනය වී ඇති බැවින්, එකී නෛතික ප්‍රතිපාදන අනුව කටයුතු කරනු ලබයි. වාරිමාර්ග රක්ෂිත සීමා සඳහා රෙගුලාසි පැනවීම වාරිමාර්ග අඥාපනත යටතට නොවැටෙන හෙයින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ ප්‍රකාශයට පත්කිරීම සඳහා රෙගුලාසි කෙටුම් පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇත.	සියළුම අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් වාරිමාර්ග ආඥාපනතේ සඳහන් නියමයන්ට අනුව නෛතික ක්‍රියා මාර්ග ගෙන තිබූ බවට තහවුරු කර නොතිබුණි.
78	ආඥා පනතේ 65 වැනි වගන්තිය අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 26 කට අයත් වැව් ජලාශ අමුණු ආශ්‍රිත අනවසර ඉදිකිරීම් හෝ වගාකිරීම් 397 ක් හඳුනාගෙන තිබූ නමුත් ඒම අනවසර කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තාකර නොතිබුණි.	2023	වැව් ජලාශ ආශ්‍රිත අනවසර කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තාකළ යුතුය.	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් දෙපාර්තමේන්තු චක්‍ර ලේඛ අංක 08/2014 මගින් අභ්‍යන්තර උපදෙස් මාලාවන් නිකුත් කර තිබුණි.	වැව් ජලාශ ආශ්‍රිත සියළු අනවසර කටයුතු සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් වෙත වාර්තාකර තිබූ බවට තහවුරු කර නොතිබුණි.
79	ශ්‍රී ලංකාවේ කුඩා ජල විදුලි බලාගාර (Mini Hydro Power) 213 ක් මඟින් 2022 වර්ෂයේ කිලෝ වොට් පැය (kwh)	2022	කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීමේදි	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පරිසර අංශය මඟින් නිර්දේශ ඉදිරිපත්	කුඩා ජල විදුලි බලාගාර ඉදිකිරීම සඳහා අනුමැතිය ලබාදීමේදි

	1,375,965,915 ක් නිෂ්පාදනය කර තිබූ නමුත් මේ සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පරිසර අංශය මඟින් නිර්දේශ ඉදිරිපත් කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.		ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත් කළ යුතුය. කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.	කිරීමේදී නිශ්චිත ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.	ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳ නිශ්චිත චක්‍රලේඛ උපදෙස් නිකුත්කර නොතිබුණි. කුඩා ජල විදුලි බලාගාර සම්බන්ධයෙන් දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
80	මහඔය ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත ඉංජිනේරු සහකාරවයෙකුගේ 2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබූ මාසික ද්‍රව්‍ය වාර්තාවේ සඳහන් ද්‍රව්‍ය සම්බන්ධයෙන් කොට්ඨාශ සහකාර හා ගබඩාභාරකරු විසින් සිදු කළ ප්‍රකාශ අනුව එම ද්‍රව්‍ය භෞතිකව නොමැති බව තහවුරු විය. වාර්ෂික ගබඩා භාණ්ඩ සමීක්ෂණය මගින් දෙපාර්තමේන්තුවට අයත් වැඩබිම් වල ඉංජිනේරු සහකාරවරුන් භාරයේ වර්ෂය අවසාන දිනට ඉතිරිව පවතින ද්‍රව්‍ය ශේෂයන් තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් 2023 නොවැම්බර් 24 දින නිකුත් කර තිබූ අංක FIN/ST/VR/2023 දරන ලිපිය අනුව වැඩබිම්වල 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිව පවතින ද්‍රව්‍ය සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් ඉදිරිපත්කල යුතු වාර්තා තුල මෙම ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු ඇතුලත් කර නොතිබුණි.	2023	මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර ඊට වගකිවයුතු ඉංජිනේරු සහකාර වරයාට සහ භාණ්ඩ සමීක්ෂණය කල නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළයුතුය.	2023 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙහි අඩුපාඩු සකස් කර නිවැරදි වාර්තාව ලබාදෙන ලෙස වාරිමාර්ග අධ්‍යක්ෂ (අම්පාර) වෙත දන්වා තිබුණි.	වගකිවයුතු ඉංජිනේරු සහකාර වරයාට සහ භාණ්ඩ සමීක්ෂණය කල නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
81	දෙටගමුව වැවෙහි ඉදිකිරීම් සඳහා 2021 මාර්තු 23 දින මිලදී ගත් වෙළඳපොළ වටිනාකම	2022	ගබඩා ද්‍රව්‍ය මිලදී ගැනීම, නිකුත් කිරීම, භාවිතය සහ	මේ වනවිට විධිමත්ව මෙම ද්‍රව්‍ය ලේඛන ගත කර ඇති බව	තොග ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන

	රු. 30,002,500 ක් වූ මි.මීටර 12 වානේ කම්බි 1100 ක් විධිමත් ලේඛනගත කිරීමකින් තොරව කතරගම, මයිලගමේ ඒකක කාර්යාලයේ ගොඩගසා තිබුණි.		පොත්පත් පවත්වාගෙන යාම සම්බන්ධ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය. තොග ලේඛන විධිමත් පරිදි පවත්වාගෙන නොයාම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.	දක්වා තිබුණි.	නොයාම සම්බන්ධ වග කිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII වන පරිච්ඡේදයේ 29 වගන්තිය යටතේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.
82	විගණිත දිනය වූ 2022 මාර්තු 08 දිනට හිරියාල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයට අනුයුක්ත කොට්ඨාශ සහකාරවරයාගේ ද්‍රව්‍ය සාරාංශය අනුව පැවති, ඉදිකිරීම් ද්‍රව්‍ය තොග ශේෂයන් හා ඇඳගල ඉදිකිරීම් භූමියේ හා ක්ෂේත්‍ර ගබඩාවේ පැවති තොග ශේෂයන් සැසඳීමේදී රු. 6,092,193ක ඌණතාවයක් විය.	2022	තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන,මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අමතරව ආයතන සංග්‍රහයේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. ඉංජිනේරු හකාරවරුන් වෙත ද්‍රව්‍ය නිකුත් කිරීම ද්‍රව්‍ය භාවිතය හා ලේඛන පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් සමීප අධීක්ෂණයකට ලක් වන පරිදි පාලන පද්ධතිය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටු වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි කටයුතු කරනු ලැබේ.	තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන,මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අමතරව ආයතන සංග්‍රහයේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

83	දෙපාර්තමේන්තු තොග පොත අනුව 2021 දෙසැම්බර් 31 වන විට රු.5,146,400 ක් වටිනා සිමෙන්ති මිටි 7,662 ක් ඇඳගල අමුණ III අදියර සඳහා හිරියාල කොට්ඨාශ ඉංජිනේරු සහකාරවරයා වෙත නිකුත් කර තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දින වන විට ඉන් සිමෙන්ති මිටි 2784 ක් ඉංජිනේරු සහකාරවරයා භාරයේ තිබුණු බව වාර්තා කර තිබුණි. එසේ වුව ද විගණනය විසින් අවස්ථා දෙකකදී සිදුකරන ලද භෞතික විගණන පරීක්ෂාවන්හිදී රු.2,269,718 ක් පිරිවැය වූ සිමෙන්ති මිටි 2,796ක ඌණතාවයක් පැවතුණි.	2022	තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන, මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර කමිටු වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි කටයුතු කරනු ලැබේ.	තොග ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන,මුදල් රෙගුලාසි 101(3) ප්‍රකාරව කටයුතු කළ යුතු අතර ඊට අමතරව ආයතන සංග්‍රහයේ විනයානුකූල ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.
84	රු.41,643,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් මත 2021 අගෝස්තු 08 දින ආරම්භ කර තිබූ හුදලියාව වැව ප්‍රතිසංස්කරණය සඳහා 2022 දෙසැම්බර් 28 වන විට රු.15,455,953 ක් වැය කර තිබුණු අතර තවදුරටත් ගෙවිය යුතු රු.6,576,474 ක බැරකම් පැවතුණි. වැවෙහි රොන්මඩ ඉවත්කිරීමේ කටයුතුවලින් කොටසක් 2021 වර්ෂයේ ඔක්තෝබර් සිට 2022 පෙබරවාරි දක්වා සිදුකර තිබුණු අතර ඒ සඳහා පෞද්ගලික ආයතනයක් වෙතින් පස් සීරුම්, තල්ලු කිරීම් හා පැටවීම සඳහා භාවිතා කරන කුල්ලක් පමණක් සහිත යන්ත්‍රයක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. ඉහත කාර්යය සිදුකළ හැකි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් අංක RS–1373 දරන JCB යන්ත්‍රය හුදලියාව වැඩ බිමට ගෙනගොස් තිබුණද, එම යන්ත්‍රය භාවිතා කර නොතිබුණි. දෙපාර්තමේන්තුවට අයත් පස් සීරුම්/ කැපීම සඳහා භාවිතා කළ හැකි වර්ක්ස් මෝටර්	2022	දෙපාර්තමේන්තුවට අයත් යන්ත්‍ර සූත්‍ර පවතින අවස්ථාවන්හිදී කුලී පදනම මත පිටස්තර යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීම සිදු නොකළ යුතු බවට පටිපාටීන් නිශ්චය කර චක්‍රලේඛ උපදෙස් යන්ත්‍ර නිශ්කාර්යව පවතින විට බාහිරින් කුලී පදනම මත යන්ත්‍ර ලබාගෙන සේවයේ යෙදවූ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා විනයානුකූලව කටයුතු කළ යුතුය.	මෙවැනිදෑ වැලැක්වීම ට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	දෙපාර්තමේන්තුව ට අයත් යන්ත්‍ර සූත්‍ර පවතින අවස්ථාවන්හිදී කුලී පදනම මත පිටස්තර යන්ත්‍ර සූත්‍ර සපයා ගැනීම සිදු නොකළ යුතු බවට හා එහිදී අනුගමනය කළ යුතු පටිපාටීන් නිශ්චය කර චක්‍රලේඛ උපදෙස් නිකුත් කර නොතිබුණි.

	ග්‍රේඩර් යන්ත්‍රයද, අනුරාධපුර වාරිමාර්ග කාර්යාලයෙන් රැගෙන විත් තිබුණු ඩෝසර් යන්ත්‍ර 02 ක් සහ නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයට අයත් ලෝඩර් යන්ත්‍රයක්ද ක්ෂේත්‍රය ආසන්නයේ නවතා තිබුණු නමුත් එම යන්ත්‍රයද වැවෙහි කටයුතු සඳහා භාවිතා කර නොතිබුණි. මේ අයුරින් දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීමට හැකිව තිබියදී රියදුරන්ට හා එම සහායකයන්ට නිෂ්කාර්යව වැටුප් ගෙවමින්, කුලී පදනමින් පස් කැපුම් කටයුතු සඳහා පුද්ගලික පාර්ශවයන්ගෙන් වාහන ලබාගෙන තිබුණි.				
85	වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති 16 ක් සඳහා රු. මිලියන 80,148 ක් සහ වෙනත් ව්‍යාපෘති **3** ක් සඳහා රු. මිලියන 75,330 ක් ඇස්තමේන්තු කර තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා 2023 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු. මිලියන 64,369 ක් හා රු.මිලියන 1,817 ක් වැයකර තිබුණි.මේ අතරින් ව්‍යාපෘති 17 ක් සඳහා ගණකාධිකාරීවරුන්/ මූල්‍ය නිලධාරින් පත්කර තිබූ නමුත් එකි ව්‍යා පෘති සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළුම මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දී ඇත.	දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන සියළුම මහා පරිමාණ හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.
86	දෙපාර්තමේන්තු සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරවාගෙන නොතිබුණි.	2022	දෙපාර්තමේන්තු වේ සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීමට කටයුතු	සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉදිරියේදී අනුමත කරගැනීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දක්වා තිබුණි.	දෙපාර්තමේන්තු වේ සංවිධාන සටහන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කර ගැනීමට මේ

			කළ යුතුය.		දක්වා කටයුතු කර නොතිබුණි.
87	දෙපාර්තමේන්තුවේ සේවයේ නිරතව සිට වැඩ තහනමට ලක්වීම, සේවය හැර යාම,මිය යාම හෝ විශ්‍රාම යාම මත දෙපාර්තමේන්තුවේ සේවය අවසන් කල නිලධාරින් 19 ගේ පෞද්ගලික ලිපිගොනු අස්ථානගත වීම මත එම නිලධාරින්ට හා එම නිලධාරින්ගේ කාලත්‍රයන්ට විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික, වැන්දඹු හා අනත්දරු, විශ්‍රාම වැටුප් ලබාගැනීමට හා රා.ප. චක්‍රලේඛ 14/2019 අනුව වැටුප් විෂමතා මත විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනයන් සිදු කර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	අස්ථානගත ලිපිගොනු භාර වගකිවයුතු නිළධාරින් සොයාබලා එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය.	සෑම මසකම විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ ප්‍රගතිය අදාළ විෂය භාර නිලධාරීන් විසින් ලබාදිය යුතු බවට දන්වා ඇත.	අස්ථානගත ලිපිගොනු භාර වගකිවයුතු නිළධාරින් සොයාබලා ඔවුනට එරෙහිව විනයාණුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
88	සමාලෝචිත වර්ෂය තුල වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටි නිලධාරින් 72 ක් විශ්‍රාම ගොස් තිබු අතර විශ්‍රාම වැටුප් පිළියෙල කිරිම සඳහා අවශ්‍ය ලියවිලි නිවැරදි තොරතුරු ඉදිරිපත් නොකිරීම හා නිල නිවාස නැවත රජයට භාර නොදීම යනදී කරුණු හේතුකොටගෙන නිලධාරින් 23 දෙනෙකුට විශ්‍රාම වැටුප් ලබාගැනීමට නොහැකි වී තිබුණි.	2023	විශ්‍රාම නිළධාරීන්ගේ තොරතුරු ඉදිරිපත් නොකිරීම හා නිල නිවාස නැවත රජයට භාර නොදීම සම්බන්ධයෙන් විධිමත් පරික්ෂණයක් කර ක්‍රියාමාර්ග ගත යුතුය.	නිල නිවාස ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව දක්වා තිබුණි.	නිල නිවාස භාරදී නොමැති අයට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව දක්වා තිබුණි.
89	දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිට විශ්‍රාම ගොස් තිබූ නිලධාරින් 4 දෙනෙකු විසින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඔවුන් පදිංචිව සිටි දෙපාර්තමේන්තුවට අයත් නිල නිවාස ආපසු භාරදී නොතිබුණි.	2023	නිල නිවාස ආපසු භාරදී නොමැති නිළධාරින් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.	නිල නිවාස ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව දක්වා තිබුණි.	නිල නිවාස භාරදී නොමැති අයට එරෙහිව නිතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇති බව දක්වා තිබුණි.

60. ශීර්ෂය- 283 වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,746,312,942	816,236,346	1,930,076,596	තත්ත්වාගණනය කළ
2022	4,424,947,972	832,218,235	3,592,729,737	තත්ත්වාගණනය කළ
2023	4,924,761,921	709,484,382	4,215,277,539	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනය නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	නුවරඑළිය කුඩා පරිමාණ ජල විදුලි බලාගාරයක් පවත්වාගෙන යෑම සඳහා පුද්ගලික සමාගමකට ලබා දී තිබුණු භූමි ප්‍රමාණයට වඩා පර්චස් 72 ක් වැඩියෙන් 2016 වර්ෂයේ සිට පරිහරණය කර තිබුණු අතර එම සමාගම විසින් 2019 වසරේ සිට වාර්ෂික බලපත්‍ර ගාස්තු ගෙවීම නවතා තිබුණි. ඒ අනුව, 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා පර්චස් 72 ක් සඳහාත්, 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා පර්චස් 174 සඳහාත් අයවිය යුතු රු.5,435,860 ක් අය කර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීමටත්, අදාළ ගාස්තු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.	මෙතෙක් හිඟ ගාස්තු ගෙවා නොමැති බැවින් නීතිමය පියවර ගන්නා ලෙස දිසා වන නිලධාරී වෙත දැනුම් දී ඇත.	හිඟ ගාස්තු අය වී නොමැති අතර අදාළ ගාස්තු අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නැත.
02	බදුල්ල, අම්පාර හා මොණරාගල දිසාවන් හි ගල් කොරි හිමියන් විසින් ගෙවීම පැහැර හැර තිබුණු පිළිවෙලින් රු.5,188,707 ක්, රු.34,147,382 ක් හා රු.7,604,227 ක් ලෙස එකතුව රු.46,940,316 ක් වන හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023 2022	හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	බදුල්ල දිසාවේ කළුගල් ව්‍යාපාරකරුවන් වෙතින් අය කළ යුතු හිඟ ගාස්තුව ලෙස සඳහන් කර ඇති රු: 5,188,706.89 මුදලෙන් මේ වන විට රු: 1,829,712.28 ක මුදලක් ගෙවා ඇති බව දන්වා සිටිමි. ඒ අනුව බදුල්ල දිසාවෙන් 2023.12.31 දින වන විට යුතු හිඟ මුදල රු: 3,358,994.61 වේ. මෙම හිඟ මුදල් ගෙවීමට ඇති	හිඟ මුදලින් රු.1,829,712 ක් අය වී ඇති අතර 2024.09.30 දින තව දුරටත් අයවිය යුතු හිඟ මුදල රු.45,110,604 කි. අදාළ ගාස්තු අයකර ගැනීමට නීතිමය පියවර ගෙන නැත.

				ව්‍යාපාරකරුවන්ගෙන් හිඟ ගාස්තු අය කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කරමින් පවතී.	
03	වලස්මුල්ල අඩවි වන කාර්යාලය විසින් 2021 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු පැල තවාන්වල දෛනික ගෙවීමේ පදනම මත චෙක්රෝල් කම්කරුවන් 1059 ක් ලියාපදිංචි කර සේවයේ යොදවාගෙන තිබුණු අතර, එයින් 2021 ජනවාරි සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය සඳහා රු.1,825,165 ක වැටුප් ගෙවන ලද කම්කරුවන් 200 දෙනෙකුගේ නම් හා ජාතික හැඳුනුම්පත් අංක මැතිවරණ කාර්යාල ඡන්දහිමි නාමලේඛනය සමඟ පරීක්ෂාවේ දී නිවැරදි නොවන බවට නිරීක්ෂණය වූයෙන් සත්‍ය වශයෙන් එම කම්කරුවන් තවාන්වල වැඩට යොදවාගත් බවට සනාථ කළ නොහැකි විය.	2023	චෙක්රෝල් සේවකයන් පත්කිරීම, සේවයේ යෙදවීම හා වැටුප් ගෙවීම සඳහා විධිමත් අභ්‍යන්තර පාලනයක් ස්ථාපිත කිරීමටත්, යොදවා තිබූ එම කම්කරුවන් සත්‍ය වශයෙන් වැඩට යොදවා ගත් බවට විගණනය වෙත සනාථ කිරීමටත් කටයුතු කළ යුතුය.	චෙක්රෝල් වැඩ සඳහා විවිධ පුද්ගලයින් පැමිණෙන අතර, ඒ සියළුම දෙනාගේ විස්තර ඔවුන් සඳහන් කරන ආකාරයට කම්කරු ලේඛනයේ සටහන්කරගනු ලබයි. එම නම් සියල්ල එම ප්‍රදේශයට අයත් මැතිවරණ ලේඛණයේ සඳහන් වේ දැයි නිශ්චිතව කිව නොහැක. ඒ අනුව කම්කරු නම් ලැයිස්තුව මැතිවරණ කාර්යාලය සමඟ පරීක්ෂා කර නිසි තහවුරු කිරීමක් සිදුකර ගත නොහැක. විගණන විමසුම මගින් දක්වා ඇති විවිධ දෝෂ සහිත කම්කරු නාමයන් ගේ ජාතික හැඳුනුම්පත් වල පිටපත් පිළිවලින් ජාතික හැඳුනුම්පත අනුව පුද්ගලයන් හඳුනාගැනීමට නොහැකි වූ කම්කරුවන් ,ජාතික හැඳුනුම්පත් අංක අනුව නමෙහි වෙනස්කම් ඇති කම්කරුවන් ලෙසද දක්වා ඇත. තවද නාමයන් හා අංකයන් පරිගණක ගත කිරීමේදී සිදුවූ මුද්‍රණ දෝෂයන් ,කම්කරු ලේඛන වල සටහන් කිරීම් වල දෝෂයන්ද මෙම සමහර වෙනස්කම් වලට බලපා ඇත. එසේ හෙයින් විගණන විමසුමෙහි දක්වා ඇති ආකාරයේ වංචාවක් සිදුකර මුදල් ලබා	යොදවා තිබූ එම කම්කරුවන් සත්‍ය වශයෙන් වැඩට යොදවා ගත් බවට විගණනය වෙත සනාථ කිරීමට කටයුතු කර නොතිබුණි.

				ගැනීමක් සිදුවී නොමැති බව දන්වා සිටිමි.	
04	වන සංරක්ෂණ දෙපාර්තමේන්තු පාලනය යටතේ පවතින විශාල වනාන්තර ප්‍රමාණයක් රක්ෂිත වනාන්තර ලෙස ගැසට් කර ප්‍රසිද්ධයට පත් කිරීමට ප්‍රමාද කිරීම හේතුවෙන් රක්ෂිත වනාන්තර ආශ්‍රිතව අනවසර ඉඩම් අල්ලා ගැනීම් බහුලව සිදුවී ඇති අතර ඒවා රක්ෂිත භාවයෙන් නිදහස් කිරීමට සිදු වී තිබීමෙන් පවතින ස්වභාවික වනගහන ප්‍රතිශතය ක්‍රමයෙන් පහළ බැසීම තුළින් තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අහිතකර බලපෑම් ඇති විය හැකි බව නිරීක්ෂණය කෙරේ.	2023 2022	රක්ෂිත වනාන්තර ගැසට් කිරීම කඩිනම් කර වන ගහනය ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තු පරිපාලනය යටතේ පවතින රක්ෂිත, සංරක්ෂිත සහ වෙනත් කැළෑ ඉඩම් මුළු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 6,561,000 කි. ඉන් හෙක්ටයාර 1,499,130 ක භූමි ප්‍රමාණයක් ගැසට් කිරීමට කටයුතු කර ඇත. වනාන්තර ගැසට් කිරිම ප්‍රමාදවීමට හේතුවී ඇත්තේ නිළධාරි මණ්ඩලයේ හෝ ඒ පිළිබඳ තාක්ෂණ දැනුමේ අඩුපාඩුවක් නිසා නොව ඒ සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවිනි.අවශ්‍ය ප්‍රතිපාදන කලට වේලාවට ලද විගස මෙම කටයුතු කඩිනම් කල හැකි බව දන්වමි.	රක්ෂිත වනාන්තර ගැසට් කිරීම මන්දගාමී ව සිදු කරමින් පවතී.
05	ක්‍රියාකාරි සැළැස්මට ඇතුළත් කර තිබුණු රෝපනය කරන ලද පැළ බෙදා හැරීමේ කාර්යය සඳහා සැළසුම්ගත වැඩපිළිවෙලක් නොතිබීම හේතුවෙන් විවිධ වැඩසටහන් යටතේ පසුගිය වසර කිහිපයක් තුළ ප්‍රධාන පැල තවාන්වල නිෂ්පාදනය කරන ලද විවිධ වර්ගයේ පැළ 861,921 ක් පමණ ද, දියතලාව හමුදා කදවුර හා සම්බන්ධ හෙක්ටයාර 42 ක නරියා කන්ද පයිනස් වන වගා භූමිය තුළ නැවත සිටුවීම සඳහා 2021 වර්ෂයේ රෝපණය කර තිබුණු පැළ 160,000 කින් බොහෝමයක් ද හානියට ලක් වී තිබුණු අතර වලස්මුල්ල අඩවි වන	2023 2021	අවශ්‍යතාවය අනුව පැළ රෝපනය කිරීමටත්, නිෂ්පාදිත පැළ කාර්යක්ෂමව සිටුවීමටත් සැලසුම් සහගත වැඩපිළිවෙලක් ඔස්සේ කටයුතු කළ යුතුය.	2020 වර්ෂයේදී වනවගා කිරීමට සැලසුම් කලද COVID වසංගත තත්ත්වය හා රටේ පැවති අනෙකුත් අර්බුධ හේතුවෙන් එකී නිෂ්පාදනය කරන ලද සියළුම පැළ වගා කිරීමට ප්‍රතිපාදන නොමැති විය.කෙසේ වුවද ලද ප්‍රතිපාදන අනුව එම පැළ වගා කරන ලද අතර මේ වන විට එම පැළ විවිධ වන ව්‍යාප්ති වැඩසටහන් සඳහා භාවිතා කර ඇත. දැනට ගල්ගමුව පැළ තවානේ පැළ 20138 ක ප්‍රමාණයක් ඉතිරි වී ඇත.	නිෂ්පාදිත පැළ බෙදාහැරීම සඳහා මේ වන විටත් විධිමත් සැලැස්මක් සකස් කර නොතිබුණි.

	කාර්යාලයට අයත් පැළ තවාන් 04 ක සිටුවන ලද පැල 325,500 කින් සියයට 65 ක් වන පැල 210,759 ක් හානියට ලක්වීමෙන් වැයකර තිබුණු රු.10,145,508 ක් ද නිෂ්කාර්යය වියදම් වන බවට නිරීක්ෂණය විය. තවාන්වල පැල බෙදාහැරීමේ ප්‍රගතිය පිළිබඳ විස්තර ද විගණනයට ඉදිරිපත් නොවීය.				
06	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශය විසින් සෑම මාස 06 කට වතාවක් එක් එක් කැණීම් ස්ථාන ආශ්‍රිතව සිදු කරන ලද කැණීම් ප්‍රමාණය, සමෝච්ඡ රේඛා සිතියම් අනුව ගණනය කර අදාළ රජයේ ඉඩම් කළමනාකාරිත්වය හිමි ආයතනය, පුපුරණ ද්‍රව්‍ය පාලන අධිකාරිය හා කැණීම්කරු වෙත දැනුම් දිය යුතු වුවද, එම වාර්තා නියමිත කාලවකවානු තුළ ලබා ගැනීමට කටයුතු නොකිරීමෙන් ගල්කොරි හිමිකරුවන් විසින් සීමාව ඉක්මවා සිදු කරන කැණීම් වෙනුවෙන් හිඟ ගාස්තු කාලීනව හා නිසියාකාරව අය කර ගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	2023	පවතින නීති රීති අනුව කටයුතු කිරීම සඳහා සුදුසු ක්‍රමවේද අනුගමනය කළ යුතුය.	අදාල වාර්තා සෑම මාස 06 කට වරක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් ඉඩම් කළමනාකාරීත්වය හිමි ආයතනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද එම කාර්යංශය විසින් වාර්තා නියමිත කාලය තුළ ලබා දීම සෑම විටම සිදු නොවේ. එසේ වුවද අදාල වාර්තා ලද පසු අනුමත ප්‍රමාණය ඉක්මවා ඉවත් කර ඇති කළුගල් සඳහා හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක නොවීම මත අනුමත සිමා ඉක්මවා කැණීම් සිදු කරයි. ඒ අනුව හිඟ ආදායම් කාලීනව හා නිසියාකාරව ගණනය කර අයකරනු නොලබයි.
07	පූර්ණ හෙළිම් සඳහා මොනරාගල දිසා වන කාර්යාලය විසින් 2021 වර්ෂය තුළ රාජ්‍ය දැව සංස්ථාව වෙත භාරදෙන ලද වන වගා 05 ක් නියමිත කාලය තුළ හෙළීම් කිරීමට කටයුතු කර නොතිබීම නිසා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුව නැවත වන වගා කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. එම නිසා තවාන්වල රෝපණය කරන	2023	ආයතන දෙක අතර මනා සම්බන්ධීකරණය ක් පවත්වා ගනිමින් හෙළීම් කටයුතු කාර්යක්ෂමව ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේ දී මොණරාගල දිසා වන කාර්යාලය මගින් වනවගා 5ක හෙළීම් කිරීම සඳහා හෙක්.72 රාජ්‍ය දැව සංස්ථාවට භාරදෙන ලදී.ඉන් 2022 වර්ෂය තුල හෙක්. 35 ක්ද, 2023 වර්ෂය තුල හෙක්. 20 ක් ලෙස හෙක්. 55 හෙළිම් කර අවසන් කර ඇත. ඉතිරි හෙක්.17 ක වන	හෙලිම් කටයුතු වල ප්‍රමාදයන් තවදුරටත් පවතී.

	ලද පැළ හානියට පත්වීමෙන් හා නඩත්තු කටයුතු සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදු වීමෙන් වන පාඩුව වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.			වගා මේ වසර තුලදීම හෙලීම් කර අවසන් කර නැවත වන වගා කල හැකි පරිදි මෙම දෙපාර්තමේන්තුවට භාරදීමට නියමිතය.	
08	මුහුදු මට්ටමේ සිට අඩි 5,000 කට වැඩි උසකින් යුත් ජලධාරිතා ප්‍රදේශයක් වන හල්ග්‍රන්ඔය අඩවියේ කුරුදුඔය රක්ෂිතයෙන් 1971 වර්ෂයේ දී පුද්ගලයන් 72 කුට ඇපල් වගා කිරීම සඳහා අක්කර 240 ක් ලබා දී තිබුණු නමුත් ඇපල් වගාව ස්ථාපිත නොකිරීම හා 1977 වසරේ සිට නියමිත බදු මුදල් නොගෙවීම හේතුවෙන් එම බලපත්‍ර 1978 වර්ෂයේ දී අවලංගු කර තිබුණි. එහෙත් බලපත්‍රලාභීන් එම ඉඩම් අතනොහැර ගොවිතැන් කටයුතු කරමින් 1990 වර්ෂය වන විට ඉඩම් අක්කර 1,000 ක පමණ ප්‍රමාණයක් අනවසරයෙන් අල්ලාගෙන තිබුණි. වර්තමානය වන විට බොහෝ පිරිසක් ස්ථිර ජනාවාස හා තාවකාලික ජනාවාස ඉදිකරගෙන පදිංචි වී සිටින බව ද නිරීක්ෂණය විය.	2023	රක්ෂිත වනාන්තර ආරක්ෂා කිරීම සඳහා ශක්තිමත් පද්ධතියක් නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතුය.	මෙම ප්‍රදේශය ජලපෝෂක ප්‍රදේශයක් වන අතර මෙම ඉඩම් ගොවීන් වෙත පවරා දෙන අවස්ථාවේ පැවති වනාන්තර තත්ත්වය පිළිබඳ වාර්තා නොමැති අතර වර්ථමානයේ පවතින ස්වාභාවික වනාන්තර හෝ වන වගා වලට හානි සිදු වී නොමැති බව දන්වමි.	සැලසුම්කර ඇති පරිදි රක්ෂිත වනාන්තර ගැසට් කර නොතිබුණු අතර මෙම ඉඩම් තවදුරටත් ස්ථිර හා තාවකාලික ජනවාස ලෙස පවතී.
09	දීර්ඝ කාලයක සිට කැබලිත්ත රක්ෂිතයේ ඉඩම්වල අනවසර වගා කිරීම් හේතුවෙන් අක්කර 25,000 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තු පරිපාලනයෙන් බැහැර කිරීමට සිදු වී තිබුණි. මායිම් කණු සිටවා දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ප්‍රමාණය වෙන් කර නොගැනීම, නිලධාරීන්ගේ හිඟකම, නිලධාරීන් සඳහා පවතින යටිතලපහසුකම් අවම වීම වැනි කරුණු හේතුවෙන්	2023	රක්ෂිත මැනීම හා ගැසට් මඟින් අයිතිය තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කර වන විනාශය මඟහරවා ගත යුතුය.	රක්ෂිතය මැනීමට හා මායිම් කණු දැමීමට විශාල මුදලක් වැය වන අතර, නිළධාරින් වේලාවට ලබා දෙන්නේ නම් රක්ෂිතය මැන ගැසට් කිරිමේ ක්‍රියාවලිය කඩිනම් කර වන විනාශය මඟහරවා ගැනීමට කටයුතු කල හැකි බව දන්වමි.	රක්ෂිත මැනීම හා ගැසට් කිරීම මන්දගාමීව සිදුවේ.

	කැබලිත්ත රක්ෂිතය සුරැකීම දෙපාර්තමේන්තුවට අසීරු කාර්යයක් වී තිබුණු අතර හේන් ගොවිතැන සඳහා ඉඩම් ඉල්ලීමද ඉහළ ගොස් ඇති බවට නිරීක්ෂණය විය.				
10	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පරිසරයට සිදුවන බලපෑම පුනස්ථාපනය කිරීම සඳහා 2007 වර්ෂයේ ලැබී වැය නොකළ රු.1,106,846 ක් වසර 16 ක් තිස්සේ ද, පරිසර සමීක්ෂණ අධ්‍යයන වැඩසටහන් 15 ක පරිපාලන වියදම් වෙනුවෙන් ලබා දී තිබුණු රු.1,152,314 ක් වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ ද, රු.380,273,079 ක් වසර 02 කට වැඩි කාලයක් තිස්සේ ද මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව රජයේ ආදායමට බැරකිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුම් 04 ක රඳවා තිබුණි.	2022	තව දුරටත් තැන්පත් ලෙස පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොමැති තැන්පත් හඳුනාගෙන රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තු පොදු තැන්පත් ගිණුමේ වසර 02ක කාලය ඉක්මවා ඇති තැන්පතු වශයෙන් පවතින්නේ ව්‍යාපෘති හා ඉඩම් වෙනුවෙන් තැන්පත්කර ඇති මුදල් ය. 2023.12.31 දින වන විට ඒවායේ එකතුව රු. 271,307,862 කි. මේ සම්බන්ධයෙන් මු.රෙ.571(2) ප්‍රකාරව කටයුතු කෙරේ.	2024 සැප්තැම්බර් 30 දිනට ද වසර 02 ක කාලයක් ඉක්මවූ රු.168,595,478 ආරක්ෂණ තැන්පතු ශේෂයන් පවතී.
11	දෙපාර්තමේන්තුව සතු මෝටර් සයිකල් 400 කට අධික ප්‍රමාණයක් තිබෙන නමුත් ඒවා තක්සේරු කිරීමට කටයුතු නොකර වටිනාකම රු.37,500 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	2022	වාහනවල තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය.	2024 වර්ෂයේදී දෙපාර්තමේන්තුව සතු සියලුම දේපල, පිරියත හා උපකරණවල වටිනාකම නිවැරදිව තක්සේරු කර ගිණුම් ගත කිරීමට උපදෙස් ලබා දී ඇති අතර ඒ අනුව කටයුතු කරමින් පවතී. ඉන් පසු මෙම දෝෂය නිවැරදි වනු ඇත.	වාහන තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.
12	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වූ කැළෑවලින් ලැබෙන ආදායම සහ පෞද්ගලික දැව ප්‍රවාහනයෙන් ලැබෙන ආදායම, නිවැරදිව ඇස්තමේන්තු කිරීම, හිඟ ආදායම් ගණනය කිරීම සහ අයකර ගැනීම සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබීමෙන් අදාළ	2022	පවතින නීති රීති අනුව හිඟ ආදායම් කාලීනව අයකර ගැනිමටත්, ආදායම් නිවැරදිව ඇස්තමේන්තු කිරීමට සහ ආදායම් කළමනාකරණය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත	2024.01.01 දින වනවිට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ස්කන්ධ භාග මුදල් හා ඊට අදාළ සියලුම හිඟ ගාස්තු අයකර ගැනීම අවසන් කර ඇත. දෙපාර්තමේන්තුවට අයවිය යුතු අනෙකුත් හිඟ ආදායම් ද කඩිනමින් අයකරගෙන අවසන්	ආදායම් පරිපාලනය හා ගිණුම්ගත කිරීම සම්බන්ධව සඵලදායී අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර නොතිබුණි.

	පාර්ශවයන් රාජ්‍ය ආදායමට මුදල් බැර කිරීම පැහැර හරින බවට නිරීක්ෂණය වූ අතර 2021 දෙසැම්බර් 31 දිනට රු.1,491,611,273 ක් වූ හිඟ ආදායම, 2022 දෙසැම්බර් 31 දිනට රු.1,885,180,372 ක් දක්වා ඉහළ ගොස් තිබුණි.		කිරීමටත් කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය.	කිරීමට අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතින අතර , අයකර ගැනීමට නොහැකි හිඟ ආදායම් සම්බන්ධයෙන් නීතිපති උපදෙස් විමසීමට නියමිතය.	
13	පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතියේ (ESCAMP) ප්‍රතිපාදන යටතේ කන්නෙලිය රක්ෂිතයේ ක්‍රියාත්මක කරන ලද ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ගිවිසුම් කාලය ද ඉක්මවා අතරමඟ නතර කර තිබුණු අතර ඒ සඳහා ගෙවන ලද රු.4,750,000 ක වැඩ මූලික අත්තිකාරම් මුදලින් රු.3,723,637 ක් ඉටුකළ වැඩ සඳහා කොටස් මුදල් ගෙවීමේ දී අයකර ගැනීමටත්, ඊට අදාළ ඇපකරයේ කාලය ද දීර්ඝ කර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.	2022	කොන්ත්‍රාත්කරුට ගෙවන ලද වැඩමූලික අත්තිකාරම් මුදල් ඉදිරිපත් කළ බිල්පත්වලින් අයකර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමටත්, අයවිය යුතු මුදල් සුදුසු පරිදි අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව පරීක්ෂා කිරීමට කමිටුවක් පත් කර ඇත. කෙසේ වුවද මෙම කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුවේ එකඟතා පැහැරහැර කටයුතු කර ඇති බව නිරීක්ෂණය වී ඇත. ඒ අනුව කොන්ත්‍රාත්කරුගෙන් මෙම අලාභය අයකර ගැනීමේ හැකියාව පරීක්ෂා කර එම මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති වෙත කරුණු ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධ නීතිපති උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය.	අයවිය යුතු මුදල් මේ දක්වා අය වී නොතිබුණි.
14	කුරුණෑගල දිසා වන කාර්යාලයේ පාලනය යටතේ පවත්වාගෙන යන දැව ව්‍යාපාර 370 ක් 2023 වර්ෂය සඳහා බලපත්‍ර අලුත් කර නොතිබුණු අතර එමඟින් 2023 වර්ෂයේ පෙබරවාරි මස අවසාන වන විට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අහිමිවී ඇති මුළු ආදායම රු.3,058,907 ක් බවට නිරීක්ෂණය විය.	2022	දැව ව්‍යාපාර පවත්වාගෙන යාම පිළිබඳ නිරතුරුව පසුවිපරම් කර නියමිත දිනට වාර්ෂික ලියාපදිංචිය අලුත් කර අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2014.12.03 දිනැතිව නිකුත් කරන ලද අංක 1891/26 දරන ගැසට් පත්‍රය මඟින් දැව ව්‍යාපාර කාලය දීර්ඝ කිරීම සඳහා මාස 06 ක සහන කාලයක් ව්‍යාපාර අයිතිකරුවන් වෙත ලබා දී ඇති බැවින් එම කාලසීමාව අවසානයේ, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.	දැව ව්‍යාපාර ලියාපදිංචිය සම්බන්ධව පසු විපරම් කර නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.
15	2017 සිට 2022 කාල වකවානුව තුළ මුලතිව් දිසා වන කාර්යාලය සහ ඕළුමඩු අඩවි වන කාර්යාලය යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර අනවසරයෙන් එළි	2022	වන අපරාධ පාලනයට සහ අවම කර ගැනීමට කටයුතු කළ යුතු අතර අදාළ අධිකරණ සමඟ	ප්‍රමාදයකින් තොරව නඩු පැවරීමට කටයුතු කරනු ලැබුව ද නඩු විසඳීමේ ප්‍රමාදය අපගේ පාලනයෙන් බැහැරව සිදුවන්නකි. කෙසේ	වන අපරාධ අවම වීමක් සිදු වී නොතිබුණු අතර නඩු විසදා ගැනීම සම්බන්ධයෙන් ප්‍රධාන

	කිරීම්, ගස් හෙලීම්, දැව ප්‍රවාහනය වැනි වන අපරාධ 1,420 ක් සිදු කර ඇති බවටත්, කුරුණෑගල දිසා වන කාර්යාලයට අයත් අඩවි 05 යටතේ පාලනය වන රක්ෂිත වනාන්තර හෙක්ටයාර් 253.053 කට හානි සිදු කර තිබුණු බවත්, ඊට අදාළ නඩු කටයුතු ඉතා මන්දගාමීව සිදුවන බවත්, වන අපරාධ දැව විශාල ලෙස ගොඩගැසී දිරාපත් වෙමින් පවතින බවත් නිරීක්ෂණය විය.		සෘජුවම සම්බන්ධ වී අදාළ නඩු විසඳීම කාර්යක්ෂම කර ගැනීමට පියවර ගත යුතුය.	වෙතත් හැකි ඉක්මනින් අදාල කටයුතු ඉටු කරවා ගැනීම සඳහා දි.ව.නිලධාරින් දැනුවත් කර ඇත.	කාර්යාලයේ මැදිහත් වීම සතුටු දායක නොවීය.
16	කුඩා පරිමාණ විදුලි බලාගාරයක් පවත්වාගෙන යාම සඳහා බලශක්ති පුද්ගලික සමාගමකට 2015 පෙබරවාරි මස සිට පර්චස් 200 ක් බදු දී තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව පර්චසයක් සඳහා වසරකට රු.5,000 ක් බැගින් පළමු වසර සඳහා පමණක් රු.1,000,000 ක බදු මුදල් ලබාගෙන ඉන් අනතුරුව කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. මෙම සමාගම විසින් ගිවිසුම්ගත පර්චස් 200 ට අමතරව තවත් පර්චස් 523.78 ක් අනවසරයෙන් පරිහරණය කර තිබුණු අතර ඒ අනුව 2023 පෙබරවාරි 18 දින වන විට පර්චස් 723.78 ක් සඳහා වසර 08 ක් වෙනුවෙන් එම සමාගමෙන් අයවිය යුතු මුදල රු.40,349,839 ක් විය.	2022	වන සංරක්ෂණ ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව භාහිර පාර්ශවයන් විසින් වනයෙන් ලබාගන්නා මුල්‍යමය හෝ අනාායාකාර ප්‍රතිලාභවල වටිනාකමට සමානුපාතික වන අයුරින් ගාස්තු අයකළ යුතු බැවින් ඒ අනුව කටයුතු කළ යුතුය.	වැඩිපුර භාවිතා කර ඇති භූමි ප්‍රමාණය වෙනුවෙන් අයවිය යුතු ගාස්තුව වන රු.17,364,944 ක මුදලින් රු.3,255,927 ක මුදලක් 2024.03.26 දින ගෙවීම් කර ඇත. ඉතිරි මුදල වාරික 04 කින් ගෙවා නිමකල යුතු බව අදාල ආයතන වෙත දැනුම් දී ඇත	2024 අප්‍රේල් මස සිට සමාන මාසික වාරික 04 කින් ඉතිරි මුදල් ගෙවන ලෙස දක්වා තිබුණද එම වාරික කිසිවක් ගෙවා නොතිබු බැවින් 2024 සැප්තැම්බර් 30 දිනට තවදුරටත් අයවිය යුතු මුදල රු.14,109,017 .කි. මෙම මුදල් අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
17	2021 වර්ෂය අවසානයට වවුනියාව දිසා වන කාර්යාලයට අදාලව පෞද්ගලික ව්‍යාපාරිකයන්ගෙන් රු.166,426,259 ක හිඟ ගාස්තුවක් අයකර ගත යුතුව තිබුණි. එහෙත් එම මුදල්වලින් සියයට 75 ක ප්‍රමාණයක් අවකරණය කර	2021	මෙම තීරණය හේතුවෙන් රජයට සිදු වී ඇති අලාභය තවදුරටත් සිදු වීම වලක්වා ගැනීමට අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කළ යුතුය.	කළුගල් කර්මාන්තකරුවන් ප්‍රායෝගිකව මුහුණපාන ගැටලු අධ්‍යනය කර එම තත්ත්වයට ප්‍රායෝගික විසඳුම් ඉදිරිපත් කිරීම සඳහා පත්කල කමිටුව විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රකාශයට පත්කල	හිඟ ගාස්තු වලින් රු.719,042 ක් තවදුරටත් අයවීමට ඇත.

	සියයට 25 ක ප්‍රමාණයක් එනම් රු.41,606,565 ක් පමණක් අය කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. එබැවින් වවුනියා දිසාවන කාර්යාලට පමණක් රු.124,819,694 ක අලාභයක් සිදු වී තිබුණි.			1600/18 හා 2009.05.06 දිනැති ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශිත ගාස්තු ක්‍රමවේදය සංශෝධනය කිරීමට යෝජනා වී ඇත. ඒ අනුව කළුගල් කැනීමේ ගාස්තුව 50% කින් අඩුකර ඇත. තවද හිඟ ගාස්තු ගණනය කිරීමේදී හිඟ ගාස්තුව 25% ක් අය කිරීමටද, අදාල හිඟ ගාස්තු වසර 03 ක් තුල මාසික වාරික 36 කින් ගෙවා නිම කිරීමටද යෝජනා කරන ලදී.	
18	වවුනියා දිසා වන කාර්යාලයේ පරිපාලනය යටතේ පවතින රජයේ ඉඩම්වල සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමට බදු දීම වෙනුවෙන් පෞද්ගලික ආයතන 02 කින් 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු.28,501,491 ක ආදායමක් හිඟව පැවතුණ ද අවසන් ගිණුම්වල දක්වා නොතිබුණි.	2021	සම්ප්‍රේෂණ කුළුණු පවත්වාගෙන යෑම පිළිබඳව පසුවිපරම් කර අදාළ ආදායම් ගිණුම් සමඟ වාර්තා කිරීමට කටයුතු කළ යුතුය.	යුද හමුදා කඳවුර තුළ පිහිටා ඇති මොබිටෙල් සමාගමට අයත් ඩයලොග් සමාගම සමඟ පොදුවේ පරිහරණය කරනු ලබන කුළුණට අදාළ ගාස්තු 2022 ජුනි දක්වා ආරක්ෂක අමාත්‍යාංශයේ **අපි වෙනුවෙන් අපි** ගිණුමට බැර වන බව 2024.06.20 දින මොබිටෙල් සමාගම විසින් දෙපාර්තමේන්තුවට දන්වා ඇත.එය තහවුරු කර ගැනීමට ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් විමසා ඇත. මෙම ආයතන දෙකම රජයේ ආයතන වන බැවින් නීතිමය පියවර ගැනීමට පෙර සාකච්ජා මාර්ගයෙන් ගැටලුව විසදා ගැනීමට කටයුතු කරමින් පවතින අතර , මේ සම්බන්ධයෙන් නීතිපති වෙතින් ද විමසා ඇත.	පවත්නා නීති ප්‍රකාරව අයවිය යුතු ආදායම් අදාළ ගිණුමට රැස් කර නොතිබුණි.

61. ශීර්ෂය - 284 වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	32,566,974,159	6,609,372,304	25,957,601,855	තත්ත්වාගණනය කළ
2022	32,615,018,738	6,867,124,490	25,747,894,248	තත්ත්වාගණනය කළ
2023	32,693,630,538	9,151,120,002	23,542,510,536	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනය නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මියගිය, විශ්‍රාම ගිය, සේවය හැර ගිය හා වැඩ තහනම් කළ නිලධාරීන් 38 දෙනෙකුගෙන් අය විය යුතු 2023 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක් ඉක්ම වූ රු.1,580,671 ක ණය ශේෂ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	2021 2022 2023	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර හිඟ හිටි ණය ශේෂ කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුය.	ණය අයකර ගැනීමේ යාන්ත්‍රණයට අදාළ ක්‍රියාමාර්ග විධිමත් කර ඇති අතර, අදාළ අංශ අතර සන්නිවේදනය විධිමත් කර ඇත.	නිලධාරීන් 28 දෙනෙකුගෙන් අයවිය යුතු රු.700,592 ක ශේෂය කපා හැරිම සඳහා අනුමැතිය ලැබී ඇති අතර 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.578,449ක ශේෂය කපා හැරීම සඳහා යොමුකර ඇත. නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.127,221ක ශේෂය පියවා ඇති අතර රු.85,300ක ශේෂයක් සහිත නිලධාරියෙකු නැවත සේවයේ පිහිටුවා ඇත.
02	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 (අතිරේක 35) ප්‍රකාරව වටිනාකම රු.මිලියන 500 ට වැඩි භාණ්ඩ හා සේවා මිලදී ගැනීම අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුව විසින් සිදු කළ යුතු වුවද 2021 වර්ෂයේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.631,067,014ක් වූ අලිවැට	2021	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය	ඉදිරියේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ විදුලි වැට ඉදි කිරීමේ ඉලක්කගත අගයන් අඩු ප්‍රමාණයක පවතින බැවින් විදුලි වැට නඩත්තු සහ ඉදිකිරීම් වෙනුවෙන් වෙන් කිරීමට නියමිත	ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කරන බව දන්වා ඇතත් 2023 සහ 2024 වර්ෂවල අලි වෙඩි මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය අමාත්‍යාංශ

	උපකරණ අයිතම 30 ක් මිලදී ගැනීම සඳහා කොන්ත්‍රාත් 07 කට වෙන්කර අවස්ථා 07 ක දී ලංසු කැඳවීම් 07 ක් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් සිදුකර තිබුණි. මේ හේතුව නිසා මිල ගණන් කැඳවීමට පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමට හා තාක්ෂණික ඇගයීම් කමිටුවට අවස්ථා 07 කදී ගෙවීම සිදු කිරීම හේතුවෙන් රු.557,320 ක අතිරේක වියදමක් දරා තිබුණි.			ප්‍රතිපාදනයන් සීමිත වන අතර, ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරනු ඇත.	ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කළ යුතු වුවද මුළු වටිනාකම කොන්ත්‍රාත් කිහිපයකට වෙන් කර දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කර තිබුණි.
03	2023 වර්ෂය තුළදී විදුලි වැට ඉදිකිරීම සඳහා රු.58,640,147 ක් හා එහි නඩත්තුව සඳහා රු.14,433,552 ක් ද ඇතුළුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ පමණක් විදුලි වැට සඳහා වැය කර තිබුණු මුදල රු.2,355,882,248 ක් වූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට විදුලි වැටෙහි සම්පූර්ණ දිග ප්‍රමාණය කිලෝමීටර් 5,389.97 ක් විය. එසේ වුවද, පසුගිය වර්ෂ 05 ක් තුළ සිදු වූ අලි මරණ, මිනිස් මරණ හා දේපළ හානි සැලකීමේදී විදුලි වැට ඉදිකළ ද අලි මිනිස් ගැටුම අවම වීමක් නිරීක්ෂණය නොවීය.	2021 2022 2023	අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සුදුසු උපක්‍රමයන් හඳුන්වා දීමට කටයුතු කළ යුතුය.	විදුලි වැට කළමනාකරණ පටිපාටි දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් ලෙස නිකුත් කිරීම මගින් විදුලි වැට නඩත්තුව විධිමත් කිරීම, වනඅලි මිනිස් ගැටුම ගැන ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ නව ප්‍රවේශයන් හඳුන්වා දීම, වනඅලි හානි සඳහා වන්දි ගෙවීමේ යාන්ත්‍රණය වඩාත් වේගවත් කිරීම, වනඅලි සංරක්ෂණ කටයුතු සම්බන්ධ පසු විපරම් යාන්ත්‍රණය විධිමත් කිරීමට කටයුතු සිදු කරමින් පවතී.	වනඅලි මිනිස් ගැටුම මැඩලීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විදුලිවැට කළමනාකරණ ක්‍රමවේදයේ සුවිශේෂී වෙනස්කම් සිදුකර තිබුණි. තවද මහජනතාව දැනුවත් කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2021,2022,2023 වර්ෂයන්ට වඩා කැපී පෙනෙන අගයකින් වන අලි මිනිස් ගැටුමේ තීව්‍රතාවය අඩු කර ගැනීමට මේ දක්වා හැකි වී ඇත.
04	2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ භාවිතයෙන් ඉවත් කර ඇති දකුණු කළාප කාර්යාලයට අයත් යතුරු පැදි 05 ක් සහ අලි ලොරි රථයක් 2020 ඔක්තෝම්බර් 02 දිනැති අංක 05/2020 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02(අ) ඡේදය ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	ධාවන තත්ත්වයේ නොපවතින හා අළුත්වැඩියා කිරීම ඵලදායී නොවන වාහන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අපහරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත	අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක : වජී/1/7/පොදු/06-වෙළුම II හා 2023.06.23 දිනැතිව අපහරණය කිරීමට සුදුසු වාහන හඳුනා ගැනීම සඳහා පත් කරන ලද විශේෂ සමීක්ෂණ මණ්ඩලය විසින් දකුණු කලාපයද ඇතුලුව කලාප 11 ක	2024 සැප්තැම්බර් 30 දින වනවිටත් අපහරණ කටයුතු සිදුකර නොතිබුණි.

			යුතුය.	අපහරණය කළ යුතු වාහන හඳුනා ගැනීම් කටයුතු අවසන් කර ඇති අතර වාහන තක්සේරු කටයුතු සිදු කරමින් පවතී.	
05	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් වීමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මගින් පවත්වන ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්, කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ මෙහෙයුම් මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108 කට අදාළ ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැසුම්දායි	2022	විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක කරන මෙවැනි කාර්යයන් අරපිරිමැසුම්දායී ව සහ ඵලදායී ආකාරයට සිදු කළ යුතුය.	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින්ම මින් ඉදිරියට පුහුණු පාඨමාලා පැවැත්වීමට කටයුතු කර ඇත.	මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් මගින්ද කොළඹ විශ්ව විද්‍යාලය දැනුවත් කර වැය වාර්තා ගෙන්වා ගැනීමට ඉල්ලීම්කර තිබුණද මේ දක්වා යහපත් ප්‍රතිචාරයක් ලැබී නොතිබුණි.

	ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය.				
06	දකුණු කලාප කාර්යාලය විසින් 2022 වර්ෂය තුළදී මාර්ග දෙපස යටි කැළය ඉවත් කිරීම සඳහා වූ එකතුව රු.5,337,814 ක ප්‍රසම්පාදන කාර්යන් 04 ක් 2021 සැප්තැම්බර් 29 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සුදුසුකම් පරීක්ෂා නොකර ප්‍රජා පාදක සංවිධාන 03 කට පවරා තිබුණු අතර ඊට අදාළ ගිවිසුම්වලට ද දෙපාර්තමේන්තුව විසින් අත්සන් තබා නොතිබුණි.	2022	ප්‍රසම්පාදන මාර්ගෝපදේශය න් ප්‍රකාරව සුදුසු කොන්ත්‍රාත්කරු වන් තෝරා ගෙන ලිඛිත ගිවිසුම් මත කාර්යයන් පැවරීමට කටයුතු කළ යුතුය.	ප්‍රසම්පාදන කාර්යයන් සම්බන්ධව පුහුණු වැඩ සටහන් පවත්වා කලාප කාර්යාලයන්හි ප්‍රසම්පාදන රාජකාරි වල නිරත නිලධාරීන් දැනුවත් කර ඇති අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	ගිවිසුම් ප්‍රකාරව එම කාර්යයන් අවසන් කර ඇති අතර. ඉදිරියේදී එවැනි ප්‍රමාද දෝෂයන් සිදු නොවීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.
07	2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ (සංශෝධන) පනතේ 4 වගන්තිය ප්‍රකාරව සෑම ස්වභාවික රක්ෂිතයක් හා අභය භූමියක් වෙනුවෙන්ම මෙහෙයුම් සැලැස්මක් පිළියෙල කර සෑම වසර පහකට වරක්ම ඒවා ඇගයීමකට ලක් කර අවශ්‍ය වෙනස්කම් සිදු කළ යුතු වුවද මිරිස්ස, කල්පිටිය, හික්කඩුව යන සමුද්‍රීය රක්ෂිත සහ මාදුගඟ අභයභූමිය වෙනුවෙන් එවැනි සැලසුම් පිළියෙල කර නොතිබුණි.	2023	පනත ප්‍රකාරව සෑම ස්වභාවික රක්ෂිතයක් හා අභය භූමියක් වෙනුවෙන් මෙහෙයුම් සැලසුම් පිළියෙල කළ යුතුය.	සම්ප්‍රදායික සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය ඉතා දීර්ඝ වන බැවින් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නව ආකෘතියක් යටතේ එම ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.	මිරිස්ස, කල්පිටිය, හික්කඩුව යන සමුද්‍රීය රක්ෂිතයන් හා මාදුගඟ අභයභූමිය සඳහා කළමනාකරණ සැලසුම් සකස් කරමින් පවතී.
08	2009 අංක 22 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ (සංශෝධන) පනතේ 14 වගන්තිය ප්‍රකාරව යම් ජාතික රක්ෂිත භූමියක මායිමේ සිට සැතපුම් 01 ක දුරක් ඇතුළත පෞද්ගලික හෝ රජයේ හෝ යම් තැනැත්තෙකු හෝ සංවිධානයක් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව කවර ආකාරයක හෝ සංවර්ධන ක්‍රියාකාරකමක් සිදු නොකළ යුතු වුවද, එවැනි ලිඛිත	2023	පනත ප්‍රකාරව සමුද්‍ර උද්‍යානයට අයත් වෙරළ කලාපය මනා සුපරීක්ෂණක් සහිතව ආරක්ෂා කර ගැනීමටත් ඒ තුළ ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය.	හික්කඩුව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා යෝජනාවක් උද්‍යාන භාරකරු විසින් ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ හික්කඩුව නගර සභාවට එම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා උපදෙස් ලබා දී ඇත.	වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉවත් කළ යුතු අනවසර ඉදිකිරීම් පිළිබඳව වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල් වෙත විස්තර ලබා දී ඇති අතර, වෙරළ සංරක්ෂණ ජනරාල්ගේ අනුමැතිය ලද වහාම වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් ඉවත් කරනු ලබන

	අවසරයකින් තොරව හික්කඩුව සමුද්‍රීය උද්‍යානයේ ප්‍රවේශ මාර්ගය අවහිර වන පරිදි හා සමුද්‍ර උද්‍යානයට අයත් වෙරළ කලාපය තුළ අනවසර වෙළඳ ස්ථාන සහ සංචාරක විවේකී ස්ථාන ස්ථාපිත කර තිබුණි.				බව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුතුමිය විසින් හික්කඩුව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවේදී කරුණු දක්වා ඇත.
09	2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ රු.7,094,700 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ කාර්යයන් 33 ක් ක්‍රියාත්මක කර නොතිබුණි	2023	අවශ්‍යතාවයන් හඳුනාගෙන නිසි සැලසුම්ගත වැඩ පිළිවෙලක් ඔස්සේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත් බැහැරවීම් වලදී සැලසුම් සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතුය.	පසු විපරම් යාන්ත්‍රණය සඳහා නිකුත් කරන ලද චක්‍රලේඛය නිසි පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත..	පසුවිපරම් යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කර ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට පියවර ගනිමින් සිටි.
10	පරිසර පද්ධති සංරක්ෂණ සහ කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ මිලදී ගෙන රිටිගල වනජීවී කාර්යාලය තුළ තාවකාලිකව ඉදිකරණ ලද මඩුවක අනාරක්ෂිතව ගබඩා කර තිබූ විදුලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන වටිනාකම රු.2,818,200 ක් වූ කම්බි රෝල් 154 ක් හා වටිනාකම තක්සේරු නොකළ nut & bolt 122 ක් සොරුන් විසින් පැහැරගෙන ගොස් තිබූ බවට නිරීක්ෂණය වූ අතර එම අලාභය සඳහා වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කර මෙම අලාභය සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	විශාල භාණ්ඩ තොග සඳහා මින් ඉදිරියට ආරක්ෂක සේවා මඟින් ආරක්ෂාව සැලසීමට කටයුතු කරනු ඇත.	මෙම සිද්ධියට අදාළව කහටගස්දිගිලිය මහේස්ත්‍රාත් අධිකරණය මගින් මේ වන විට නඩු අංක B 1654/22 යටතේ නඩුව විභාග වෙමින් පවතින අතර, අනුරාධපුර සහකාර අධ්‍යක්ෂකගේ සභාපතිත්වයෙන් යුක්ත පරීක්ෂණ මණ්ඩලයක් විසින් මේ වන විට මු.රෙ. 104(4) පරීක්ෂණය සිදුකර ඇත.
11	මාදු ගඟ අභය භූමියක් ලෙසට ප්‍රසිද්ධ කිරීමට අදාළ 2006 ජූලි 17 දිනැති අංක 1454/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි එය ගාල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටා තිබෙන බවට වූ වරද නිවැරදි කර නිවැරදි මායිම සලකුණු	2023	මාදු ගඟ අභය භූමියේ මායිම් නිවැරදිව සිතියම් ගත කිරීමටත්, එය ජාතික උද්‍යානයක් ලෙස උසස් කර ගාස්තු අය කර	මායිම් සංශෝධනය කර මායිම් කණු සිටුවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කිරීම සහ ඉදිරි ගාස්තු සංශෝධයේදී ගාස්තු අය කිරීමට කටයුතු කරනු ඇත.	මාදුගඟ අභයභූමියේ ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමේදී සිදුව ඇති තාක්ෂණික දෝෂ මඟහරවා ගෙන නව මායිම් සහිතව ගැසට් නිවේදනය

	කිරීමට හා අභය භූමිය නිවැරදිව සිතියම් ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණු අතර මාදු ගඟ නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්ගෙන් ප්‍රවේශපත්‍ර ගාස්තුවක් අය කිරීමටද කටයුතු කර නොතිබුණි.		ගැනීමටත් අවශ්‍ය කටයුතු කළ යුතුය.		සංශෝධනය කිරීම 2024 වර්ෂය තුළදී සිදු කිරීමට අපේක්ෂිතබව දන්වා ඇති අතර ඊට අවශ්‍ය මූලික ක්ෂේත්‍ර පරීක්ෂණ 2023 වර්ෂයේදී ආරම්භ කර ඇත. මාදුගඟ ජාතික උද්‍යානයක් ලෙස උසස් කර නොමැති බැවින් ගාස්තුවක් නියම කිරීමට නොහැකි වුවද මීළඟ ගාස්තු සංශෝධනයේදී සංචාරක සේවා සඳහා ගාස්තු අයකිරීම ඊට ඇතුළත් කිරීමට කටයුතු කරනබව දන්වා ඇත.
12	2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා තබ්බෝව අභයභූමියේ හෙක්ටයාර 315 ක කලපු අන්දර ඉවත් කර වාසස්ථාන සුපෝෂණය සඳහා රු.57,401,665 ක් ද, ඉවත් කළ ප්‍රදේශය නඩත්තුව සඳහා රු.5,865,900 ක් ද වැය කර තිබුණු නමුත්, 2023 වර්ෂය අවසන් වන විටත් විශාල භූමි ප්‍රදේශයක කලපු අන්දර වැවී තිබුණි. මේ හේතුවෙන් අලි ඇතුන්ට රක්ෂිතයෙහි රැඳී සිටීමට අපහසු වී ඔවුන් කිලෝමීටර් 50 ක් පමණ ඈත ගම්මානවලට ගමන් කරන බව නිරීක්ෂණය විය.	2023	ආක්‍රමණශීලී ශාක ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දෙමින් එහි නඩත්තු කටයුතු සිදුකළ යුතුය.	විධිමත් විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කිරීමටත්, එම නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමටත් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරනු ඇත..	කලපු අන්දර ඉවත් කිරීම හා ඉවත් කරන ලද ප්‍රදේශ නඩත්තු කටයුතු කර ගෙන යාම සඳහා අදාළ ප්‍රදේශය ආවරණය වන ආකාරයට එහි ඵලදායීතාවය සනාථ කර ගැනීම සඳහා විධිමත් විද්‍යාත්මක අධ්‍යයනයන් සිදු කර එහි නිර්දේශ අනුව ඉදිරි කලපු අන්දර ඉවත් කිරීම සඳහා 2024 වසරේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රතිපාදන වෙන්කර ඇති අතර, එම කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

62. ශීර්ෂය - 285 **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	27,056,545,554	566,030,939	26,490,514,615	තත්ත්වාගණනය නොකළ
2022	28,104,304,558	569,899,599	27,534,404,959	තත්ත්වාගණනය කළ
2023	29,866,254,232	645,998,210	29,220,256,022	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහ ඉදිකිරීම් ඒකක 1235 ක්, ප්‍රවාහන උපකරණ 28 ක් සහ ඉඩම් කොටස් 371 ක් වශයෙන් වූ මූල්‍ය නොවන වත්කම් 1634 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2021 2022 2023	රජයේ සියළු වත්කම් නියමිත පරිදි තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.	2024 වර්ෂය තුලදී ඉඩම් කොටස් 04 ක හා ගොඩනැගිලි කොටස් 6ක වටිනාකම් තක්සේරු කර ලබාදී ඇති අතර ඒවා ගිණුම්ගත කිරීම සිදුකර ඇත	අදාළ අංශ දැනුවත් කිරීම සිදු කර ඇති අතර නිර්දේශය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නොත්බුණි.
02	කෘෂිකාර්මික ගොවිපල් නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමට අදාළව 2023 වර්ෂයේ හරස් සටහන් මගින් සිදුකර තිබූ රු.11,989,882 ක අවකරණයන් වියදමක් වශයෙන් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ගොවිපල් නඩත්තු හා බීජ අලෙවි අත්තිකාරම් ගිණුමේ රු.950,000,000 ක් වූ හර ශේෂයන්ගේ උපරිම සීමාව රු.11,859,129 කින් ඉක්මවා ගොස් තිබුණි.	2023	මු.රෙ.503(2) ප්‍රකාරව සීමා ඉක්මවීම් ගෙවීමට කටයුතු කළ යුතුය.	විගණනයෙන් පෙන්වා දුන් පසු සීමා සංශෝධනයට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කළ නමුත් නොවැළැක්විය හේතුවක් නිසාවෙන් සීමා සංශෝධනය සඳහා වූ නියමිත කාල සීමාවට පෙර එනම්, 2024.05.31ට පෙර එම යෝජනා ඉදිරිපත් කිරීමට නොහැකි වූ බැවින් සීමා සංශෝධනය සඳහා එකඟ විය නොහැකි බව දන්වා ඇත.	මුනිර්දේශය ප්‍රකාරව 2024 සැප්තැම්බර් 30 දිනවන විටත් කටයුතු කර නොතිබුණි.
03	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ ඒකක	2021 2022 2023	දෙපාර්තමේන්තුව සතු සියළු ඉඩම් නිරවුල් කර පවරා ගැනීමට කටයුතු	පවරාගෙන නොමැති හෙක්ටයාර 1899.06 ක් වූ භූමි ප්‍රමාණය මෙම	දෙපාර්තමේන්තුව සතු මුළු භූමි ප්‍රමාණය (දළ වශයෙන්

	10 කට අයත් හෙක්ටයාර 1954 ක ඉඩම්වල අයිතිය පවරා ගෙන නොතිබුණි.		කළ යුතුය	දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට අදාල ඉල්ලීම් සියල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කොට ඇත.	හෙක්ටයාර) 3690.60 වන අතර, එයින් මේ වන විට හෙක්ටයාර් 1791.53 ක ඉඩම් ප්‍රමාණයක් පවරා ගැනීම් කටයුතු අවසන් කර ඇත.
04	පසුගිය වසර 08 ක කාලය තුල රු. 337,170,792 ක් වැය කර ලොකු ළූණු බීජ නිෂ්පාදන ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක කර තිබුණද, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව 2014 වර්ෂයේ මෙ.ටො. 98900 ක් වූ දේශීය ලොකු ළූණු නිෂ්පාදනය 2022 වර්ෂය වන විට මෙ.ටො. 15840 ක් දක්වා මෙ.ටො. 83,060 කින් හෙවත් සියයට 84 ක ප්‍රමාණයකින් පහළ ගොස් තිබුණි.	2023	අවධානයකින් යුක්තව ව්‍යාපෘති සඳහා අරමුදල් යෙදවිය යුතු අතර එම ව්‍යාපෘති සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.	දේශීය ලොකු ළූණු නිෂ්පාදනය 2024 තුල ඉහළ නැංවීම සඳහා ගම්දොරින් - ගොවි බිමට ළූණු ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ගොවීන් දිරි ගැන්වීමේ කටයුතු ක්‍රියාත්මක කරමින් සිටියි.	ව්‍යාපෘති යෝජනාවක් සකස් කිරීමට පෙර ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමට ඉටුකළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳවත්, අධික පිරිවැයක් වැය වන මෙවැනි ව්‍යාපෘති විධිමත් ඇගයීමක් මත නිවැරදි අධ්‍යයනයකින් පසු ක්‍රියාත්මක කළ යුතු බවටත් අදාළ ඒකක ප්‍රධානීන් වෙත විගණන හා නියාමන උපදෙස් ලබාදීම පමණක් සිදුකර තිබුණි.
05	ශ්‍රී ලංකාවේ ලොකු ළූණු බීජ නිෂ්පාදනය හා වගා තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ වසර 05 ක කාලය තුල KOPIAව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් 05ක් සඳහා රු. මිලියන 203.9 ක් වියදම් කර ඇතත්, නියැදි පරීක්ෂණයට අනුව හම්බන්තොට දිස්ත්‍රික්කයේ මෙම ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අසාර්ථක වී තිබුණි.	2023	ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය.	හම්බන්තොටගොවීන් විසින් ලොකු ළූණු බීජ නිෂ්පාදනයෙන් ඉවත් වී දෙමුහුන් මිරිස්,නයි මිරිස්, තක්කාලි, මාළු මිරිස් ආදී ආරක්ෂිත ගෘහ තුළ වගා කරන අතර එළඹෙන කන්නයේ සිට ආරක්ෂිත ගෘහ තුළ රතු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහනක් සඳහා සැලසුම් කර ඇති බව.	අදාළ ඒකක ප්‍රධානීන් වෙත විගණන හා නියාමන උපදෙස් ලබාදීම පමණක් සිදුකර තිබුණි.
06	2023 වර්ෂයේ අවසාන දිනට මුදල් රෙගුලාසි 104	2021	මුදල් රෙගුලාසි ප්‍රකාරව	බීජ හානි හා පැළ මිය යාම් හානි සම්බන්ධ	2023.12.31 වන විට මු.රෙ පරීක්ෂණ

	ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් නොකළ 1976 වර්ෂයේ සිට පවතින ඇස්තමේන්තුගත වටිනාකම රු. 106,934,291ක් වූ පාඩු හා හානි සිද්ධි 437 ක් පැවතුණි.	2022 2023	පරීක්ෂණ කටයුතු කඩිනමින් අධ්‍යයනය කළ යුතුය.	ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා නිර්ණායක ඇතුළත් කමිටු පත්කර ඇත.	ගොනු 340 ක් පැවැති අතර 2024.01.01 සිට 2024.09.30 දින දක්වා අළුතින් ගොනු 78 ක් ආරම්භ කර ඇති අතර ගොනු 72 ක පමණක් වැඩ අවසන් කර තිබුණි.
07	මුදල් රෙගුලාසි 109 (1) ප්‍රකාරව පරීක්ෂණ කටයුතු අවසන් වූරු.13,188,887 ක අලාභ හානි සම්බන්ධව මු.රෙ. 108 ප්‍රකාරව කටයුතු නොකර ගන්නෝරුව එළවළු බීජ මධ්‍යස්ථානයේ කි.ග්‍රෑ. 8752 ක එළවළු බීජ තොගයක් තව දුරටත් ගබඩා තුල රඳවා ගෙන තිබුණි.	2023	මුදල් රෙගුලාසි 108 ප්‍රකාරව පොත්වලින් අස්කිරීමේ නියෝගය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.	ඉදිරි ක්‍රියාමාර්ග සඳහා කමිටුවක් පත්කර ඇත.	නිර්දේශ ලබා ගැනීම සඳහා අනු කමිටු 03 ක් පත්කර තිබුණ ද 2024 සැප්තැම්බර් 30 දක්වාත් ඉදිරි කටයුතු නිමවී නොතිබුණි.

63. ශීර්ෂය- 286 **ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,886,430,855	68,794,932	1,817,635,923	තත්ත්වාගණනය කළ
2022	2,021,430,722	53,160,403	1,968,270,319	තත්ත්වාගණනය කළ
2023	2,069,782,430	50,937,386	2,018,845,044	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තා ප්‍රකාරව ශ්‍රී ලංකාවේ මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණ වන රජයේ ඉඩම් සම්බන්ධ සෘජු වගකීමක් දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බව හඳුනා ගෙන තිබුණද 1931 වර්ෂයේ දෙපාර්තමේන්තුව පිහිට වූ දින සිට සිදු කරන ලද ඉඩම් බැහැර කිරීම් ඇතුළත් කරමින් සකස් කරනලද ඉඩම් ලේඛනයක් පවත්වා නොතිබුණි.	2021 2022	ඉඩම් ලේඛනයක් හෝ රජයේ ඉඩම් පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කළ යුතුය.	රජයේ ඉඩම් පිළිබඳ සංගණනයක් සිදුකර ඉඩම් තොරතුරු පද්ධතියක් සකස් කිරීම සඳහා 2020 වර්ෂයේ අග භාගයේදී කටයුතු ආරම්භ කර ඇත. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව යටතේ රජයේ ඉඩම් කළමනාකරණය සඳහා දත්ත බැංකුවක් ස්ථාපිත කිරීම සඳහා අපේක්ෂා කරන ලද අතර ඊට 2024 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු මගින් රු. මිලියන 250 ක ප්‍රතිපාදන වෙන්කර දෙන ලෙස ඉල්ලා සිටින ලද නමුත් 2024 වර්ෂයේ අයවැය ප්‍රතිපාදන ලෙස එම ප්‍රතිපාදන ප්‍රමාණය නොලැබුණි. එබැවින් මෙම දෙපාර්තමේන්තුව භාරයේ තිබෙන රජයේ ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීමට නොහැකි වී ඇත.	2024.10.25 දින වන විටත් ඉඩම් ලේඛනයක් පවත්වා නොතිබුණි.
02	රජයේ නිල නිවාස තම ආයතනය සතු වත්කම් බවත්, එම වත්කම් නිෂ්කාර්යව හෝ අවභාවිතයට නොයොදා	2022	නිල නිවාස වලින් උපරිම ප්‍රයෝජන ගත යුතු ය.	මෙම දෙපාර්තමේන්තුව සතු නිල නිවාස අතුරින් නිල නිවාස සියයට 90 ක පමණ අවුරුදු 25-30 කට වඩා පැරණි වේ.	2024.10.25 දින වන විටත් රජයේ නිල නිවාස කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීමට පියවර ගෙන

	චක්‍රලේඛ හා ආයතන සංග්‍රහයේ නීති රීති වලට අනුකූලව කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිතා කිරීම ආයතනය සතු වගකීමක් වුවද, එසේ සිදු කර නොතිබුණි.			වාර්ෂිකව වෙන්වන අයවැය ප්‍රතිපාදන මගින් සිදු කිරීමට හැකියාවක් නොමැත. අත්‍යාවශ්‍යයෙන්ම අලුත්වැඩියාවන් කළයුතු නිවාසවල ඒ ඒ අලුත්වැඩියාවන් සිදුකර, උපරිම ඵලදායී ලෙස භාවිතයට ගෙන ඇත. නිල නිවාස සම්බන්ධයෙන් ඵලදායී ලෙස රජයේ වෙනත් ආයතන වෙත යොදාගැනීම උදෙසා විධිමත් පරිදි පැවරීම සම්බන්ධව ප්‍රතිපත්තිමය වශයෙන් තීරණ ගැනීමට පියවර ගෙන ඇත.	නොතිබුණි.
03	භාණ්ඩාගාර ලේකම්ගේ අංක 05/2022 හා 2022 අප්‍රේල් 04 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව රජයේ දේපළ අස්ථානගත වීම සහ අවභාවිතය වැළැක්වීමට මෙන්ම රජයේ දේපළ උපරිම ඵලදායීතාවයෙන් ප්‍රයෝජනයට ගැනීම තහවුරු කරගැනීම සඳහා, රජය සතු සියලුම මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ලේඛනගත කර පවත්වා අදාල චක්‍රලේඛ විධිවිධාන අනුව යාවත්කාලීන කර නියමිත දිනට කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කළ යුතු වූවත් දෙපාර්තමේන්තුව සතු නිල නිවාස හා සංචාරක බංගලා එකතුව 407 ක් පවතින අතර එයින් නිල නිවාස 399 ක් පැවතියද 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන	2022 2023	නිල නිවාස තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමටත්, නිල නිවාසවලින් උපරිම ඵලදායිතාවක් ලැබෙන අයුරින් කටයුතු කළ යුතුය..	මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත නොකළ මෙම දෙපාර්තමේන්තුව සතු නිල නිවාස, ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවෙහි අන්තර් පළාත් හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලවල ඉඩම් කොමසාරිස් හෝ සහකාර ඉඩම් කොමසාරිස්ගේ සභාපතිත්වයෙන් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරයෙකු, ඉඩම් නිලධාරියෙකුගෙන් යුත් කමිටුවක් පත්කර දළ තක්සේරුව ලබාගන්නා ලෙස සියලුම අන්තර් පළාත් හා සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාල වෙත දැනුවත් කරන ලදි. මෙම දෙපාර්තමේන්තුව	2024.10.25 දින වන විටත් පාර්තමේන්තුව සතු නිල නිවාස හා සංචාරක බංගලා මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනා ගෙන නොතිබුණි

	වත්කම් ලෙස සිගාස් පරිගණක පද්ධතිය තුළ වාර්තාගත කර ඇත්තේ නිල නිවාස 247 ක් වූ අතර ඉතිරි නිල නිවාස 152 ක තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ හඳුනා ගෙන නොතිබුණි.			සතු මූල්‍ය වත්කමක් ලෙස සිගාස් පද්ධතිය තුළ වාර්තාගත කර නොමැති නිල නිවාස අතුරින් නිල නිවාස 28 ක දළ තක්සේරුව මේ වන විට ලබාගෙන ඇති අතර සිගාස් පද්ධතියට වාර්තාගත කිරීමට ලබාදී ඇත. ඒ අනුව ත්‍රිකුණාමලය හා අම්පාර ඉඩම් කොමසාරිස් අන්තර් පළාත් කාර්යාල වෙතින් සම්පූර්ණ කර මේ වන විට යොමුකර ඇති දළ තක්සේරු වාර්තා සිගාස් පද්ධතියට 2024.07.29 දින ඇතුළත් කරන ලදි. ඉතිරි අනෙකුත් නිල නිවාස, ඉඩම් හා ගොඩනැගිලිවල දළ තක්සේරුවද මේ වසර අවසන් වන විට සිදුකර පද්ධතියට ඇතුළත් කිරීමට හැකිවන පරිදි ලබාදීමට හැකියාව ඇත. භාවිතයට ගැනීමට කිසිසේත්ම හැකියාවක් නොමැති නිල නිවාස ඵලදායී ලෙස බැහැර කිරීම සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පියවර ගෙන ඇත.	
04	නිරවුල් බිමක අයිතිය තහවුරු කෙරෙන විධිමත් කළමනාකාරීත්වයක් පවත්වා ගෙන යෑම දෙපාර්තමේන්තුවේ ‘මෙහෙවර’ ලෙස දක්වා ඇතත්, ඉඩම් පිළිබඳ තොරතුරු හා දත්ත ලබාගැනීමේදී දෙපාර්තමේන්තුව තුළ බදුදීම්, ඉඩම් බැහැර කිරීම්,දීමනාපත්‍ර ලබාදීම, බදු නිදහස් කිරීම, බදු	2023	ඉඩම් සම්බන්ධව යාවත්කාලීන කළ ඉඩම් ලේඛනයක් හෝ තොරතුරු පද්ධතියක් පවත්වා ගත යුතුය.	රජයේ ඉඩම් තොරතුරු කළමනාකරණය සහ පරිපාලන කටයුතු මේ වන විට e-Slims පද්ධතිය හරහා සිදු වෙමින් පවතින අතර රජයේ ඉඩම්වලට අදාළ සියලුම බැහැර කිරීම්වලට අදාළ තොරතුරු එනම් පද්ධතියට ඇතුළත් කර ඇති ඉඩම් කැබලි ගණන, මුද්‍රණය කර ඇති	බදුදීම්, ඉඩම් බැහැර කිරීම්,දීමනාපත්‍ර ලබාදීම, බදු නිදහස් කිරීම, බදු සහන ආදී තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් පවත්වා නොතිබුණි.

	සහන ආදී තොරතුරු ලබා ගැනීමට විධිමත් ක්‍රමවේදයක් විගණිත දිනය වන 2024 අප්‍රේල් 02 දින වන විටද පවත්වා නොතිබුණි.			බලපත්‍ර ප්‍රමාණය, දීමනාපත්‍ර ප්‍රමාණය, අනුමත කර ඇති බදු නිර්දේශ ප්‍රමාණය, නිකුත් කර ඇති බදුකර ප්‍රමාණය, පවත්වා ඇති ඉඩම් කච්චේරි ප්‍රමාණය සහ ඉඩම් පරිපාලනයට අදාළ පසු කටයුතුවලට අදාළ තොරතුරු e-Slims පද්ධතිය හරහා ලබාගැනීමේ හැකියාව ඇත.	
05	අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රජයේ ඉඩම් කළමණාකරණයට අදාළව රජයේ ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය (E-Slim) ඔස්සේ ස්වයංක්‍රීයව සිදු කරමින් රටේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය වෙනුවෙන් මෙම තොරතුරු පද්ධතිය පවත්වාගෙන යාම අරමුණු කර ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය හා ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක කරන ලද රජයේ ඉඩම් කළමණාකරණ පද්ධතිය (E-Slim) 2016 වර්ෂයේදී ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ආරම්භ කර තිබුණි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව අනුව ඒ සඳහා වැය වන මුදල රු.මිලියන 119.6 ක් ලෙස හා එම වැඩ සටහන	2021 2023	සැලසුම්ගතව E-Slim පද්ධතිය සඳහා වැය කරන පිරිවැයට සාපේක්ෂව පද්ධතියේ කටයුතු වැඩිදියුණු කරගත යුතුය.	e-Slims පද්ධතිය ආරම්භයේදී ICTA ආයතනය විසින් ලබාදී ඇති ව්‍යාපෘති යෝජනාවේ වසර 05 කට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සේවය කාර්යක්ෂම කිරීමේ අරමුණින් මැනුවල් ක්‍රමයෙන් බැහැරව ඩිජිටල්කරණයට ලක් කිරීමකි. එසේම 2017 වර්ෂයේදී නඩත්තු හා සේවා ගිවිසුම ක්‍රියාත්මක වී නොමැති අතර නැවතත් 2018 වර්ෂයේදී උපදේශන සේවා යටතේ විවෘත මිල ගණන් කැඳවීමක් සිදුකර එහිදීද සුදුසුකම් ලත් ආයතනය බවට පත්ව ඇති අරායා බිස්නස් සොලියුෂන්ස් පෞද්ගලික සමාගම සමඟ ගිවිසුම්ගත වීමට කටයුතු කර ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ 2023 අයවැය කතාව තුළ වූ උරුමය වැඩසටහනෙහි පළමු අදියර සති 03 ක පමණ කාලයක් තුළ සාර්ථකව නිමා කරමින් නිදහස් දීමනා පත්‍ර	රජයේ ඉඩම් කළමණාකරණයට අදාළව රජයේ ඉඩම් තොරතුරු හා කළමණාකරණ පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයට පත්කර දෙපාර්තමේන්තුවට භාරදී නොතිබුණි.

	වසර 05 ක් තුළ අවසන් කිරීමට ඇස්තමේන්තුගත කර පද්ධතියේ නඩත්තු, සේවා කටයුතු සහ වැඩිදියුණු කිරීම් සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2019 ජුලි 12 දින සිට 2022 ජුලි 11 දින දක්වා වර්ෂ 03 ක් සඳහා වාර්ෂිකව රු.4,950,000 ක් බැගින් ගෙවීම් කිරීමට ගිවිසුම් ගත වී තිබුණි. 2013 වර්ෂයේ සිට 2023 දක්වා වැයකර ඇති මුළු වියදම රු. 193,086,520 ක් වුවද විගණිත දිනය වූ 2024 මාර්තු 25 දින වන විටද එම කටයුතු ක්‍රියාත්මක තත්ත්වයට පත්කර දෙපාර්තමේන්තුවට භාරදී නොතිබුණි.			10,000 ආසන්න ප්‍රමාණයක් e-Slims පද්ධතිය ඔස්සේ ලබාදීමට කටයුතු කිරීම ඊට අදාළ එක් අවස්ථාවක් වශයෙන් දැක්විය හැකි වේ. එසේම ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පළාත් සහ අන්තර් පළාත් මට්ටමින් රජය සතු ඉඩම් හඳුනා ගනිමින් පද්ධති ගත කළ විට ඉතාමත් ඉහළ මට්ටමක වටිනාකමක් ඇති දත්තයන්ගෙන් සමන්විත දත්ත පද්ධතියක් නිර්මාණය කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. අඛණ්ඩව සිදුවන ක්‍රියාවලියක් වන බැවින් එය වසර 05 ක් තුළ නිමාවට පත් කළ හැකි කාර්යයක් නොවේ.	
06	වාණිජ පදනමින් දීර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් සඳහා බදු සහන ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ අතුරින් 2021 පෙබරවාරි මස 01 දිනැති අංක 2020 / 06 (1) දරන චක්‍රලේඛය සහ ඊට අදාල අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දීර්ඝ කාලීන බදු පදනම මත රජයේ ඉඩම් ලබාගෙන ඇති බදුකරුවන් සඳහා බදු සහන ලබා දීම යටතේ බදු සහනය හිමි බදුකරුවන් සඳහා වන බදු මුදල ගණනය කිරීමේදී දෙවන බදු කාලය ආරම්භ වන දිනයේ සිට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දුන් 2020	2023	නොපමාව අහිමි වී ඇති බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	එක් බදු කාලයක් අවසානයේ ඊළඟ බදු කාලය සඳහා නව තක්සේරුවක් ගෙන බදු ගණනය කිරීමේදී ඉහළ වාර්ෂික බදු මුදලක් ලැබීම හේතුවෙන් එයට සහන සැලසීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2017.03.22 හා 2018.02.28 දිනට පසු පළමු බදු කාලය අවසන් වූ බදුකරුවන් සඳහා දෙවන බදු කාලයට අදාළව නව තක්සේරුවක් නොගෙන මුල් බදු කාලය අවසානයේ අය කළ බදු මුදලට සියයට 20 ක බදු ප්‍රතිශෝධනයක් අය කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. වාණිජ කටයුතු සඳහා	බදු කරුවන් 74 දෙනෙකුට අදාලව බදු සහන ලබා දීම සඳහා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට මෙතෙක් අමාත්‍ය මණ්ඩල තීරණය ලබා ගෙන නොතිබුණි.

නොවැම්බර් 16 දින දක්වා දෙවන බදු කාලයට අදාලව ගනු ලැබූ තක්සේරුව මත බදු මුදල් නිවැරදිව ගණනය කර අය කල යුතු වුවත් ඊට පටහැනිව අනුරාධපුර නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් අමතන ලද 2022 නොවැම්බර් 10 දිනැති අංක 4 / 10 /පොදු / බදු සහන (L 2) දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ බදු ගොනු 08 ක් සම්බන්ධයෙන් වූ බදු අය කළ යුතු ආකාරය දන්වා එවා තිබීම නිසා රජයට රු.70,518,510 ක බදු මුදලක් අහිමි වී තිබුණි. එසේම එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ වාණිජ පදනමින් දීර්ඝ කාලීන බදු දී ඇති ඉඩම් ගොනු අතරින් ඉහත චක්‍රලේඛය සඳහන් දෙවන බදු කාලය ආරම්භ වන දීර්ඝ කාලීන වාණිජ බදු ගොනු 82 ක් පවතින බව නිරීක්ෂණය වූ අතර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2022 නොවැම්බර් 10 දිනැති අංක 4/10/ පොදු / බදු සහන (L2) ලිපිය මඟින් බදු ගොනු 08 කට පමණක් චක්‍රලේඛය අභිබවා බදු සහන ලබා දීමට කටයුතු කර තිබීම නිසා එකී බදු ගොනු 82 න් බදු ගොනු 74 ක බදුකරුවන් බදු ගෙවීම් අධෛර්යමත් වීමේ අවධානමක් ඇති විය

2017.03.22 දිනට පෙර හා කෘෂිකාර්මික කටයුතු සඳහා 2018.02.28 දිනට පෙර දෙවන බදු කාලය ඇරඹෙන බදුකරුවන් සඳහා පවතින ක්‍රමවේදය අනුව දෙවන බදු කාලය සඳහා නව තක්සේරුවක් අනුව බදු ගණනය කරනු ලැබේ. දෙවන හෝ ඊට පසු යෙදෙන බදු කාලයකට අදාළව නව තක්සේරුවක් මත බදු මුදල් ගණනය කිරීමේදී එම බදු කාලය ආරම්භයේ වාර්ෂික බදු මුදල් ලෙස විශාල මුදලක් ගෙවීමට සිදුවීම හේතුවෙන් විවිධ පාර්ශ්වයන් වෙතින් ලද ඉල්ලීම් සලකා, දෙවන බදු කාලය සඳහාද ඉහත 2.1 හි සඳහන් ක්‍රමවේදය පරිදි එකී සහන ලබාදීම සඳහා අමා/20/0374/225/005 හා 2020.10.13 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරනු ලැබුවද එයට අනුමැතිය ලැබී ඇත්තේ 2020.11.16 දින සිට එකී සහනය ක්‍රියාත්මක කිරීමට කිරීමට යටත් වන පරිදි වේ.

එහිදී දෙවන බදු කාලයේ ආරම්භයේ සිට නව තක්සේරුවට අනුව ගෙවීමට සිදුවීම හේතුවෙන් නැවත වතාවක් බදුකරුවන් අගතියට පත්වන බව පවසමින් බදුකරුවන් පිරිසක් විරෝධතා ඉදිරිපත් කර ඇත.

අමාත්‍ය මණ්ඩල

හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.

සංදේශයේ අරමුණ පරිදි එහි 03 වන ඡේදයේ සඳහන් ආකාරයට කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉහත කී විරෝධතා දැක්වූ පුද්ගලයන් 08 වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් අපේක්ෂිත බදු සහන ලබාදී ඇත.

අමාත්‍ය මණ්ඩල තීරණය හා ඉහත 2.5 හි සඳහන් ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ තීරණයේ පරස්පරතාවයක් පැවතීම හේතුවෙන් ඉහත කී බදුකරුවන් 08 දෙනාට හැර වෙනත් පාර්ශවයකට උක්ත 2.5 පරිදි සහන ලබාදීමට කටයුතු කර නොමැත. එබැවින් අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කිරීමේ අරමුණ ඉටුවී නොමැති බව පෙන්වා දෙමින් සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් පරිදි ඉහත කී බදු සහන ක්‍රියාත්මක කළ යුතු දිනය සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සටහනක කෙටුම්පතක් සකස් කර සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

ඉහත කී ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් අපේක්ෂිත සහනය සියලු පාර්ශ්වයන්ට මේ දක්වා ලබාදී නොමැති අතර කෙටුම්පත් කළ අමාත්‍ය මණ්ඩල සටහන සඳහා

අපේක්ෂිත අනුමැතිය ලැබුණහොත් අදාළ සියලු පාර්ශවයන් සඳහා එම සහනය ලබාදීමට හැකියාව ඇත. එසේ නොමැති වුවහොත් මේ දක්වා බදු සහන ලබාදී ඇති බදුකරුවන් 08 දෙනා වෙතින් එකී සහනය අවලංගු කොට අදාළ හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

64. ශීර්ෂය- 287 **ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	327,842,019	2,513,191	325,328,828	තත්ත්වාගණනය කළ
2022	322,010,117	5,981,191	316,028,926	තත්ත්වාගණනය නොකළ
2023	364,833,765	2,552,316	362,281,449	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	1897 මුඩුබිම් ආඥා පනත හා 1931 ඉඩම් නිරවුල් ආඥා පනත ක්‍රියාත්මක කිරීමට අදාළව පවත්වාගෙන යනු ලබන වසර සියයකට වඩා පැරණි ඉඩම් ලෙජර හා අනෙකුත් ලේඛන සංරක්ෂණය සඳහා 287-2-1-0-2509 වැය විෂය යටතේ රු.8,000,000 ක මුදලක් වෙන්කර තිබුණද අදාළ ලේඛන පරිලෝකනය කිරීමේ කාර්යය සඳහා එයින් කිසිදු ප්‍රතිපාදනයක් උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි.	2021	වාර්ෂික ඉලක්ක සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රතිපාදන වෙන් කළ වර්ෂය තුළදීම භාවිතා කළ යුතුය.	ලේඛන සංරක්ෂණය කිරීමේ හා පරිලෝකනය කිරීමේ කාර්යය විධිමත් පරිදි 2022 වර්ෂයේ සිට ආරම්භ කිරීම.	ලේඛන පරිලෝකනය කිරීමේ අදියර 02 ක් මේ වන විට අවසන් කර 03 වන අදියර ක්‍රියාත්මක වෙමින් පවතී. අවසන් කල හැකි දිනයන් හඳුනාගෙන නොමැත.
02	අංක KH – 5711 ජීප් රථයේ එන්ජිමේ සම්පූර්ණ අලුත්වැඩියාවක් 2021 මාර්තු 01 දින සිදුකර පළමු සේවාව සඳහා 2021 අගෝස්තු 09 දින නැවත එම ආයතනයට රථය භාරදී ඇතත් විගණිත දිනය වන 2023 මාර්තු 15 දින වන විට වසර 01 මාස 07 ක් ගතවී ඇතත් වාහනය නැවත දෙපාර්තමේන්තුවට ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.	2022	අලුත්වැඩියාව නිසි පරිදි ඉටුකර තිබේද යන්න තහවුරුවක් ලබාගත යුතුය.	KH – 5711 දරන ජීප් රථයේ අලුත්වැඩියාව සඳහා අමාත්‍යාංශ යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ මත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීම.	අලුත්වැඩියාව සිදු කර නොමැත.
03	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ මුදල් ආදායම් මුද්දර හෝ බඩු	2022	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව වගකිව යුතු	ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් දැනුවත් කිරීම.	මේ වන විට නිලධාරීන් 42 ක් ඇප තැන්පත් කර නොමැත.

	බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධව පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන් පිළිබඳව තොරතුරු දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යා යුතුය. එසේ තැබිය යුතු නිලධාරීන් 75 ක් දෙපාර්තමේන්තුව තුළ සිටියද ඇප තබා ඇති නිලධාරීන් ගණන 05 ක් විය.		නිලධාරීන්ගෙන් ඇප ලබාගත යුතුය.		
04	බිම්සවිය වැඩ සටහන 2002 දී හෝමාගම හා තඹුත්තේගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ආරම්භ කර වසර 21 කට ආසන්න කාලයක් ඉකුත්ව ගොස් තිබුණද, 2023 වර්ෂය වන විටත් අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි.	2023	අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	පසු විමර්ශන කටයුතු සිදුවෙමින් පවතී. මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්වරු සමග ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කරමින් පවතින අතරේ එම ගැටලු වර්තමානය වන විට ක්‍රමිකව විසඳෙමින් පවතී.	අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර කරගෙන නොතිබුණි.
05	බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 87 ට අදාළව මුළු ග්‍රාම නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව 4,728 ක් පැවතියද, ඉන් 1,449 ක පමණක් එනම් සියයට 31 ක පමණක් මැනුම් අවසන් කර තිබුණි. එසේම කොට්ඨාශ 26 කට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාශ 974 ක කිසිදු මැනුම් කටයුත්තක් 2023 ඔක්තෝබර් 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.	2023	අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	එමෙන්ම මේ වන විට හිමිකම් ලියාපදිංචි කිරීම කඩිනම් කිරීම සඳහා විශේෂ ක්‍රියාවලියක් හඳුනාගෙන ඇති අතර වසර 14 ඇතුළත මැනුම් කටයුතු අවසන් කිරීමටද ඉන් අනතුරු එළඹෙන ඉදිරි අවුරුදු 03 තුළ සියලු විමර්ශන කටයුතු අවසන් කර හිමිකම් ලියාපදිංචි කිරීමට හැකිවන පරිදි යෝජනාවලියක් සකස් කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය අනුමැතිය සහ දිරිදීමනා ගෙවීම සිදුකර අදාළ කාර්යයන් කඩිනමින් ඉටුකිරීම සඳහා වැඩපිළිවෙලක් යෝජනා කර ඇත.	මැනුම් කිරීමේ හා ගැටලු විසඳීමේ දුෂ්කරතා හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ලගා වී නොතිබුණි.

06	බිම්සවිය වැඩසටහන අම්පාර, මුලතිව්, කිලිනොච්චිය, මන්නාරම හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක වල ආරම්භ කර නොතිබුණු අතර කිසිදු දිස්ත්‍රික්කයක සම්පූර්ණයෙන් මෙම වැඩසටහන ආරම්භ කර නොමැති වීම හේතුවෙන් මෙම මඟින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමේ බාධාවක් පවතින බව නිරීක්ෂණය විය.	2023	අපේක්ෂිත ප්‍රගතිය ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම දිස්ත්‍රිකයන්හි මැනුම් කටයුතු සිදුකර එම කැඩැස්තර සිතියම් ලැබෙන ආකාරය අනුව නිලධාරීන් යොදවා විමර්ශන හා අනෙකුත් කටයුතු සිදු කිරීමට යෝජිතව ඇත.	1931 අංක 20 දරන ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත යටතේ නිරවුල් නොකරන ලද විශාල භූමි ප්‍රමාණයක් හා පනතට අනුව වසන ලද ගම් බොහෝමයක් පැවතීම. 2024 වර්ෂය සඳහා මුළු දිවයිනම ආවරණය කිරීම අරමුණු කර ගනිමින් දිස්ත්‍රික්ක මට්ටමින් අම්පාර, මුලතිව්, කිලිනොච්චිය, මන්නාරම හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික්ක කාර්යාල ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කර ඇත.
07	1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 12 වගන්තිය යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා ගැසට් කළ මුළු කැබලි සංඛ්‍යාව වූ 1,671,417 න් සියයට 58 ක් හෙවත් කැබලි 972,592 ක් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් අනුමත කර තිබුණද, සියයට 42 ක් මෙතෙක් අනුමත කිරීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය.	2023	අනුමත නොවූ කැබලි අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය.	2024-2023 දක්වා දස අවුරුදු උපාය මාර්ගික සැලැස්මක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතී. මාසික වාර්තා මඟින්ද පනතේ 12 වන වගන්තිය යටතේ ගැසට් කිරීම පිළිබඳ තොරතුරු පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.	2024 අගෝස්තු 31 දින වන විට ගැසට් කර ඇති මුළු බිම් කැබලි සංඛ්‍යාව 1,740,581 කින් කැබලි 1,017,955 ක් සඳහා ඉඩම් හිමිකම් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් අනුමැතිය ලබාදී ඇත. එසේම හිමිකම තහවුරු කළ නොහැකි සියයට 17 ක හිමිකරුවන් අයදුම් නොකරන, නීතිමය ගැටලු හා මායිම් ගැටලු ආදි ගැටලු පැවතිණි.
08	විවිධ ගැටළු හේතුවෙන් හිමිකම් සහතිකය නිකුත් කිරීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිව ප්‍රාදේශීය කාර්යාල 85 ක 2023 දෙසැම්බර් 31 දිනට පසෙක තැබූ මුළු ගොනු	2023	පසෙක තැබූ ගොනු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සහ අධීක්ෂණ	මේ වන විට දෙපාර්තමේන්තු මට්ටමින් තීරණ ලබා දිය හැකි ගැටලු සඳහා කඩිනම් විසඳුම් ලබාදීමට පහත පරිදි	2023 වර්ෂයේදී බිම් කොටස් 20,000 කින් අඩු වී තිබුණි. 2024 වර්ෂයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් කැඩැස්තර

	සංඛ්‍යාව 490,327 ක් වූ අතර මෙම ප්‍රමාණය මෙතෙක් මැනුම් කර ගැසට් කර ඇති මුළු බිම් ප්‍රමාණය වූ 1,671,417 න් සියයට 29ක් පමණ විය. දෙපාර්තමේන්තුව විසින් පසෙක තබා ඇති ගොනු සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සහා ඒවා අධීක්ෂණය නිසියාකාරව සිදුනොවන බව නිරීක්ෂණය විය.		කටයුතු නිසියාකාරව සිදු කළ යුතුය.	කටයුතු සකස් කර ඇත. වාර්ෂික ඉලක්කමත පදනම්ව පසෙක තැබූ ගොනුවලින් සියයට 20 ක ප්‍රමාණයක් සඳහා තීරණ ලබාදීමට අවශ්‍ය කටයුතුද මේ වන විට ක්‍රියාත්මක වන අතර ප්‍රගතිය මැනීමේදී නැවත විසඳු ලබාදීමේ ප්‍රගතියද විශේෂයෙන් මාසිකව නිරීක්ෂණය කිරීමද සිදු කරනු ලබයි.	සිතියම් 2,178 ක් ලබාදී තිබුණි. මුල් මාස 07 තුළ පමණක් මුළු හිමිකම් තීරණ ප්‍රමාණයෙන් ගොනු 12,912 ක් එකතු වීම හා එම පසෙක කොටස්වලින් නැවත තීරණ ලබාදීම 4,723 ක් ඉටු කරන ලදී.
09	බිම් සවිය කටයුතු සඳහා දෙපාර්තමේන්තුව දිවයින පුරා ප්‍රාදේශීය කාර්යාල 52 ක් පවත්වා ගෙන යනු ලබන අතර ඒවා පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතන වල පවත්වා තිබුණි. 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම කාර්යාල වල ගොඩනැගිලි කුලී හා ආරක්ෂක වියදම් වශයෙන් රු.246,884,260 ක මුදලක් ගෙවා ඇතත්, 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දරා ඇති ගොඩනැගිලි කුලී හා ආරක්ෂක සේවා වියදම් ලෙස රු.48,390,246 ක් වී තිබුණි.	2023	2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ප්‍රාදේශීය කාර්යාල හැකි පමණින් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ගොඩනැගිලිවල ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සොයා බැලීම.	මේ වන ප්‍රාදේශීය කාර්යාල ගණන 54 පෞද්ගලික ගොඩනැගිලි 28 කද අර්ධ රාජ්‍ය අංශයට අයත් 05 කද රජයේ කාර්යාල 21 කද පවත්වා ගනු ලබයි. 2023 වර්ෂයේ ජනවාරි මසදී ප්‍රාදේශීය කාර්යාල 42 ක් සඳහා ආරක්ෂක වියදම් ගෙවන ලද අතර එම කාර්යාල ගණන මේ වන විට 33 දක්වා අඩු කර ඇත.
10	1998 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත හිමිකම් සහතික ලියාපදිංචිය සඳහා යවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව 779,691 ක් වන අතර එම කාර්යය අවසන් කර ලැබී ඇති හිමිකම් සහතික සංඛ්‍යාව 422,070 ක් වුවත් හිමිකම් සහතික 357,621 ක ප්‍රමාණයක් කාර්යය අවසන් කර ලැබී	2023	නොලැබුණු සහතිකපත් සම්බන්ධයෙ න් වාර්තා පවත්වා ගනිමින් කාලීනව පසු විපරම් කිරීමට කටයුතු කළ යුතුය.	හිමිකම් සහතික ශීර්ෂය යටතේ මාසික ප්‍රගති වාර්තාව මගින් තොරතුරු ලබා ගැනීමට මේ වන විට දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමේදී මෙම කරුණු සම්බන්ධයෙන් ද	2024 අගෝස්තු 31 දිනට හිමිකම් සහතික ලියාපදිංචිය සඳහා යවා ඇති ඉඩම් කැබලි සංඛ්‍යාව 810,363 ක් වේ.

	නොතිබුණි. එම නොලැබුණු සහතිකපත් සම්බන්ධයෙන් වාර්තා පැවැත්වීමක් හෝ පසු විපරම් කිරීමක් දෙපාර්තමේන්තුව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.			විශේෂ අවධානයක් යොමු කරමින්, පසු විපරමක යෙදීමටද දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු කරනු ලබයි.	
11	1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 7(1) වගන්තියේ සඳහන් පරිදි නිශ්චිතව සඳහන් යම් ප්‍රදේශයක් තුළ වූ එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් සඳහා හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස්වරයා විසින් සමගි මණ්ඩලයක් පත් කළ යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක දිස්ත්‍රික්ක, 87 හි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 4728 න් 532 කට පමණක් සමඟි මණ්ඩල පත් කර තිබුණු අතර, ඉතිරි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 4,196 ක සමඟි මණ්ඩල පත් කිරීමට කටයුතු කර නොමැති වීම සමස්ත ප්‍රගතිය අඩු වීමට හේතු වී ඇති බව නිරීක්ෂණය විය.	2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	එක් එක් කොටසේ ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සමගි මණ්ඩල නම් කර එවන ලෙසට 2023.06.08 දිනැති ලිපිය මගින් අපගේ ප්‍රාදේශීය කාර්යාලවල කොමසාරිස්වරුන් දැනුවත් කර ඇත. සමගි මණ්ඩල පත්කරනු ලබන්නේ මැනුම් කටයුතු ආරම්භ කර ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාශ සඳහා පමණි.	2024.09.25 දින වන විට 2024 වර්ෂය සඳහා ග්‍රාම නිලධාරී වසම් 64 ක සමගි මණ්ඩල පත්කර තිබේ.
12	2023 වර්ෂයේදී ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ වන තීරණ අතරින් ගැසට් මගින් ප්‍රසිද්ධ කිරීමට සැලසුම් කළ ඉඩම් කැබලි ප්‍රමාණය 200,000 ක් වුවද සත්‍ය තත්වය වශයෙන් ගැසට් මගින් ප්‍රසිද්ධ කළ ඉඩම් ප්‍රමාණය 56,789 ක් විය. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 28.3 ක ප්‍රමාණයකි.	2023	සැලසුම් නිසි පරිදි සකස් කළ යුතුය.	මිනින්දෝරු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධව මෙම ඉලක්ක සපුරා ගැනීමට අදාළව සාකච්ඡා කරමින් අදාළ ප්‍රදේශ සඳහා මිනින්දෝරුව නියුක්ත කර ගැනීමට කටයුතු සිදුකරමින් පවතී. මෙම ප්‍රමාණාත්මක වෙනස්කම් පිළිබඳ මේ වන විට මාසික ප්‍රගති වාර්තා මගින් හා ප්‍රගති සමාලෝචන කමිටු හරහා නිරන්තර පසු විපරම් සිදු කරමින් ප්‍රගතිය නංවා ගැනීමේ කටයුතු සිදු කරනු	මිනින්දෝරු දෙපාර්ත මේන්තුව මගින් ඉඩම් කැබලි 70,350 කට කැඩස්තර සිතියම් සැලසුම් සකස් කරන බවට එකග වුවද වර්ෂය තුළ ලබා දී ඇත්තේ 59,181 ක් විය.

				ලබයි.	
13	ඉඩම් හිමිකම් ලියාපදිංචිය සඳහා හිමිකම් සහතික නිකුත් කිරීමට ඉඩම් කැබලි 200,000 ක් අපේක්ෂා කර තිබුණද ඉඩම් හිමිකම් ලියාපදිංචිය සඳහා යවා තිබුණේ 47,271 කි.එය ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 23.6 ක ප්‍රමාණයකි.	2023	සැලසුම් නිසි පරිදි සකස් කළ යුතුය.	පසුගිය වර්ෂ වලට අදාළව ඉතිරි හිමිකම් සහතික පිළිබඳ එක් එක් කාර්යාලයට අදාළ තොරතුරු, අත ඉතිරි හිමිකම් සහතික ශීර්ෂය යටතේ මාසික ප්‍රගති වාර්තාව මගින් ලබා ගැනීමට මේ වන විටත් දෙපාර්තමේන්තුව කටයුතු කරමින් පවතී. ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමේදී මෙම කරුණු සම්බන්ධයෙන්ද විශේෂ අවධානය යොමු කරමින් පසු විපරමක යෙදීමටද දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් කටයුතු සිදුකරනු ලබයි.	2023 වර්ෂය සඳහා මූලික සැලසුම් වලදී කැබලි ලක්ෂ 02 ක් කැඩස්තර සිතියම් ලබාගැනීමට සැලසුම් කළද මිනින්දොරු දෙපාර්තමේන්තු සැලැස්ම මත එම සංඛ්‍යාව 76,000 කට අඩු කර ඇතත් 2023 වර්ෂය අවසානයේදී එම ප්‍රමාණය ලබා දී නොතිබුණි.
14	1931 අංක 20 දරන පනතට අනුව ඉඩම් නිරවුල් කිරීමේ ආඥාව ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමැතියට යැවීමේ කාර්යභාරය සියයට 40 ක මට්ටමක පැවතුණි.	2023	අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වීමට කටයුතු කළ යුතුය.	1931 අංක 20 දරණ ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත ප්‍රකාරව සකස් කරනු ලබන නිරවුල් කිරීමේ ආඥාවක් ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට යැවීමට ප්‍රථම සම්පූර්ණ කළ යුතු වැඩ පියවරයන් කිහිපයක් වේ. ඒ අතරින් නිරවුල් කිරීමේ දැන්වීම් පළ කිරීම, උරුම විභාග පැවැත්වීම, ක්ෂේත්‍ර ඉඩම් පරීක්ෂාව සහ මැනුම් ඉල්ලීම් යොමු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශය විසින් සෘජුවම මැදිහත්වී සිදු කරනු ලබයි. මැනුම් ඉල්ලීම් යොමු කළ පසු අදාළ ඉඩම් කොටස් මැන පිඹුරු හා ඉඩම්	මිනින්දෝරු දෙපාර්තමේන්තුවෙන් පිඹුරු, ඉඩම් විස්තර ලැයිස්තු සහ "S" රේඛා චිත්‍ර ලැබීම ප්‍රමාද වීම මත නිරවුල් කිරීමේ ආඥාවන් ගරු අමාත්‍යවරයා වෙත යොමු කිරීමේ ප්‍රගතිය එලෙසම පවතී.

විස්තර ලැයිස්තු සකස් කර මිනින්දෝරු දෙපාර්ත මේන්තුවට ඉදිරිපත් කර ඉන් අනතුරුව නිරවුල් කිරීමේ අවසන් තීරණ ගැනීමත්, විධානය සකස් කිරීමත්, ඉඩම් කොටස් ලියාපදිංචිය සඳහා ඉඩම් රෙජිස්ටර් කාර්යාලය වෙත යොමු කිරීමත් සිදුවේ. අනතුරුව ආඥාව ගරු අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කරනු ලබයි. මේ වන විට ඉඩම් අංශය විසින් සිදු කළ යුතු කාර්යයන් එක් එක් සිතියම් ගත ප්‍රදේශවලට අදාළව ඉටු කර ඇති අතර අනෙකුත් සිතියම් ගත ප්‍රදේශයන් සඳහා පිඹුරු සහ ඉඩම් විස්තර ලැයිස්තු, "S" රේඛා චිත්‍රත් නොලැබීම මත ඉහත තත්වය උද්ගත වී ඇත. එබැවින් එම තත්ත්වය කඩිනම් කර ගැනීම සඳහා නැවතත් සිහිකැඳවීම් යොමු කිරීම, අදාළ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරියවරුන් දැනුවත් කිරීම නිරන්තරයෙන් සිදුකිරීමට කටයුතු කර ඇත.

65. ශීර්ෂය - 288 **මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	**මුළු වගකීම්** රු.	**ස්කන්ධය** රු.	**මතය**
2021	9,093,363,844	80,954,172	9,012,409,672	තත්ත්වාගණනය කළ
2022	10,926,172,318	12,321,918	10,913,850,400	තත්ත්වාගණනය නොකළ
2023	11,414,670,900	26,348,034	11,388,322,866	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	**විගණන නිරීක්ෂණය**	**වාර්තාවේ වර්ෂය**	**විගණකාධිපති නිර්දේශය**	**විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග**	**වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය**
01	ගුවන් මැනුම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුව 2015 දෙසුම්බර් 31 දින රු. 8,868,900 ක් ගෙවා දේශීය නියෝජිත ආයතනයකින් මිනිසුන් රහිත ගුවන් යානයක් (Unmanned Aerial Vehicle) මිළදී ගෙන තිබුණු අතර 2017 අගෝස්තු 03 දින හබරණ ප්‍රදේශයේදී එය යාන්ත්‍රික දෝෂයකට ලක්ව තිබුණි. එය අලුත්වැඩියා කිරීමෙන් පසු නැවත වරක් 2019 අප්‍රේල් 18 දින එහි විදුලි කෝෂය අක්‍රිය වීමත්, 2019 ජූලි 17 දින වන විට හයිපර් එස්. ආර්. (Hipper SR) ටොප් කොන් (Top con) වර්ගයේ ජී. එස්. පී.(GSP) උපකරණය ක්‍රියාවිරහිත වීමත් 2021 මාර්තු 04 දින වනවිට යානය සඳහා ලබා දී තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර තිරයේ දෝෂයක් පවතින බවද වාර්තා කර තිබුණි. ඉන්පසු 2022 අප්‍රේල් 26 දින යානයේ අවර පෙත්ත සවි කර තිබුණු රබර් පටිය කැඩී යාම හෝ ගැලවී යාම නිසා හානි සිදු වී තිබුණි. මෙම යානය මිලදී ගෙන වර්ෂ 07 ක් ඉක්මවා	2022	ආර්ථික වශයෙන් ප්‍රයෝජනවත් දෙ පාර්තමේන්තුවේ නිලධාරීන්ට නඩත්තු කළහැකි උපකරණ මිලදී ගැනීමත්, මෙවැනි සේවාවන් කුලී පදනමින් ලබා ගැනීමේ හැකියාව පිළිබඳවත් අවධානය යොමු කළ යුතුය.	2019 අප්‍රේල් මස වන විට සියලු වියළි කෝෂ ඉදිමී තිබීම නිසා යානය ගුවන් ගත කිරීමට නොහැකිව තිබිණි.2019 ජූලි මස 17 දිනය වන විට Hipper SR Top con වර්ගයේ GPS උපකරණ කොටස (RTK තාක්ෂණය මඟින් GPS ඛණ්ඩාංක නිවැරදි කිරීමට අවශ්‍ය වන) ක්‍රියාවිරහිතව පැවති අතර එම උපකරණ කොටස ගුවන්ගත කිරීමට පෙර වියළි කෝෂ ආරෝපණය සිදු කල යුතුය. නමුත් එහි අන්තර්ගතව ඇති (Inbuilt) වියළි කෝෂය (මෙය මෙම උපකරණයට අනුකූලව සකසන ලද්දක් වන අතර සාමාන්‍ය වෙළඳ පොළෙහි ක්ෂණිකව මිලදී ගත හැකි උපාංගයක් නොවේ.) නමුත් යානයෙන් ඡායා රූප ලබා ගැනීමට ඇති හැකියාවට බාධාවක් නොවිය. කෙසේ වෙතත් ඒ සම්බන්ධයෙන් භූමිටෙක් ආයතනයෙන්	මෙම යානය ගර්හිතකිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. කමිටු වාර්තාව 2024.10.31 දිනට පෙර ලැබීමට නියමිතය.

	තිබීම හා වසර දෙක හමාරක පමණ කාලයක් මෙය ගුවන් ගතකර නොමැතිවීම නිසා යානය ගර්හිත කිරීමට සුදුසු බවට 2023 මැයි 08 දිනැති ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු (විශේෂ මැනුම් හා තත්ත්ව පාලන) විසින් දන්වා තිබුණි. මෙම යානය 2016 වර්ෂයේ සිට 2022 දක්වා අවස්ථා 05 කදීම ක්‍රියා විරහිතව තිබුණු බැවින් එයින් ඵලදායී සේවාවක් අත්කරගෙන නොතිබුණු අතර ඒ අනුව මෙය ආර්ථික නොවන ගනුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.			විමසා ඇති අතර ඒ පිළිබඳ නිශ්චිත පිළිතුරක් මෙතෙක් ලැබී නොමැත. මෙම යානය සමඟ ලබා දී තිබූ ලැප්ටොප් පරිගණකයේ තිරය මත වරින්වර දිස්වන ඉරි යැමේ දෝෂය තවමත් පවතින නමුත් එම දෝෂය මෙම යානය ගුවන්ගත කිරීමට බාධාවක් නොවේ. 2020 නොවැම්බර් මස 17 වන දින භූමිටෙක් ආයතනය විසින් වර්ෂ 2021/2022/2023 සඳහා සේවා ගිවිසුම් ගතවීමට මිල ගණන් ලබාදී තිබූ අතර එම මිල ගණන් ඉතා අධික වන බැවින් ඒ සඳහා සේවා ගිවිසුම් ගත කිරීමක් සිදු නොවිය. එසේම රක්ෂණ ප්‍රතිපූරණය කිරීමට උත්සහ කළද එය සාර්ථක නොවීය.	
02	2023 වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු එකතුව රු. 300,000,000 ක් වූ වැය විෂයන් 2 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.	2023	ප්‍රතිපාදන ඉල්ලීමේදී වර්ෂය තුළ ඉටුකළ හැකි වැඩසටහන් වලට සීමා කරගත යුතුය.	සමෝධානික ඉඩම් තොරතුරු පද්ධතිය සකස් කිරීම සඳහා දේශීය අරමුදල්වලින් රු.20,000,000 ක්ද විදේශ අරමුදල්වලින් රු.280,000,000 ක්ද ලෙස එකතුව රු.300,000,000 ප්‍රතිපාදන වෙන් කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලබා දුන්නද විදේශ ණය අරමුදල අනුමත නොවීම නිසා අදාළ ව්‍යාපෘති ප්‍රතිපාදන වියදම් ඉතිරිව පවතින අතර එම කටයුතු සිදු නොකරන ලදී.	අදාළ ව්‍යාපෘතිය මෙම වාර්තාවේ දින වන විටද ආරම්භ කර නොතිබුණි.

03	දෙපාර්තමේන්තුවේ මිනින්දෝරුවරුන් විවිධ මැනුම් වර්ග සිදු කරන අතර ඉන් මායිම් ගල් දමා ව්‍යවස්ථාපිත හේතූන් මත සිදු කරන මැනුම් සඳහා මාසික ඉලක්කය ඉඩම් කට්ටි 20ක් වන අතර ඉඩම් කැබලි නම් 30 ක් ලෙස වර්ෂ 16 කට පෙර පිහිටුවාගත් සම්මතය (Norms), මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කර නොතිබුණි.	2023	සම්මතයන් **(Norms),** මැනුම් ශිල්පක්‍රම හා උපකරණවල තාක්ෂණික දියුණුවත් සමග වර්තමානයට ගැලපෙන ආකාරයට සමාලෝචනය කළ යුතුය.	දෙපාර්තමේන්තුව මාසික වැඩ ප්‍රමාණයන් සමාලෝචනය කර සංශෝධනයෙන් පසු වාර්තාව ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත භාර දී ඇත. ලේකම්වරයාගේ අනුමැතිය ලද පසු අදාල මාසික වැඩ ප්‍රමාණයන් සංශෝධනය කිරීමට ක්‍රියා කරනු ඇත. නවීන උපකරණ මිලදී ගැනීම ලංකාවේ ප්‍රමුඛ තාක්ෂණික දෙපාර්තමේන්තුවක් ලෙස ලෝකයේ අනෙකුත් රටවල් සමග සාමගාමීව කටයුතු කිරීමේදී අත්‍යාවශ්‍ය කරුණක් වන අතර තාක්ෂණික ක්‍රමවේදයන් වැඩි දියුණු කිරීම සහ ඉඩම් මිල ඉහළ යන බැවින් නිරවද්‍යව මැනීම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර ඒ අනුව නවීන උපකරණ මිලදී ගැනීම සිදු කරනු ඇත. මාසික ඉලක්කයන් ඉහළ නැංවීමේදී මීට අමතරව වර්තමානයේ පවතින ඉඩම් ගැටලු විසඳාගෙන ප්‍රගතිය ලබා ගැනීමට සිදුවී ඇති බැවින් එවැනි කරුණු බාධාවක් වන බව වැඩිදුරටත් දන්වමි.	මාසික වැඩ ප්‍රමාණයන් සමාලෝචනය කර සංශෝධනයෙන් පසු වාර්තාව ඉඩම් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත භාර දී ඇත. අනුමැතිය ලද පසු අදාල සංශෝධනය කිරීමට ක්‍රියා කරනු ඇත.
04	පෙර වර්ෂවල සිට 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මැනුම් වර්ග 08 ක් යටතේ ලැබී ඇති මුළු මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව 129,270 කින් නිම කළ සංඛ්‍යාව 95,933 ක් වූ අතර එදිනට නිම නොකළ සංඛ්‍යාව 33,337 ක් හෙවත් සියයට 26 ක් විය. එම මැනුම්	2023	මැනුම් ඉල්ලීම් ඉටුකිරීමේ කාර්යක්ෂමතාවය වැඩිකළ යුතුය.	නිම නොකළ මැනුම් ඉල්ලීම් 33,337 යන සංඛ්‍යාව වරින් වර උච්ඡාවචනය වන අතර එය අප වෙත මැනුම් ඉල්ලීම් ලැබෙන සීඝ්‍රතාවය මත සහ භූමියේ මතුවන ඉඩම් ආරවුල්වල ස්වභාවයන් මතද වර්තමානයේ	මැනුම් ඉල්ලීම් ලැබෙන සීඝ්‍රතාවය, භූමියේ මතුවන ඉඩම් ආරවුල්වල ස්වභාවයන්, ක්ෂේත්‍රයේ කටයුතු කරන මිනින්දෝරුවරුන් සීමිත වීම යන

	ඉල්ලීම් අතර වර්ෂ 4ට වැඩි මැනුම් ඉල්ලීම් 8,688 ක්ද, වර්ෂ 3 ට වැඩි මැනුම් ඉල්ලීම් 3,834 ක් ද, වර්ෂ 2 ට වැඩි මැනුම් ඉල්ලීම් 4,712 ක් ද, වර්ෂ 1ට වැඩි මැනුම් ඉල්ලීම් 6,276 ක් ද විය.			දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රයේ කටයුතු කරන රජයේ මිනින්දෝරුවරුන්ගේ සීමිත සංඛ්‍යාව නිසාද ක්‍රියා නොකළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව ඉහළ යාම සිදුවේ. පසුගිය වසර 2 තුළ රජයේ මිනින්දෝරුවරුන් බඳවාගැනීමක් සිදුකර නොමැත.	කරුණු මත ක්‍රියා නොකළ මැනුම් ඉල්ලීම් සංඛ්‍යාව ඉහළ ගියද උපරිම කාර්යක්ෂමතාව යෙන් කටයුතු කරයි. රටේ පවත්නා වඩා සංවේදී හා ප්‍රමුඛතාවය දිය යුතු කාර්යභාරය ප්‍රථමයෙන් නිම කිරීමට කටයුතු කරයි.
05	කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අදාළව මැනුම් ඉල්ලීම් තොරතුරු කළමනාකරණ පද්ධතිය (SRIMS) හා මැනුම් ගාස්තු ලේඛණය පරීක්ෂාවේදී ආයතන 16 කින් මැනුම් කටයුතු සඳහා ගාස්තු ලෙස රු. 1,187,085 ක් අය වී 2020 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් 31 දිනට දින 195 සිට දින 1338 දක්වා වූ කාල පරාසයක් ගත වී ඇතත් අදාළ මැනුම් කටයුතු සම්පූර්ණ කර නොතිබුණි.	2023	ලැබෙන මැනුම් ඉල්ලීම් ප්‍රමුඛතාවය අනුව කඩිනමින් ඉටු කළ යුතුය.	මෙම පැනය තුළ දක්වා ඇති රු.1,187,085ක මුදලට අදාල ඉල්ලීම් 16හි අංක සඳහන්ව නොතිබූ බැවින් මේවා වෙන් වෙන් වශයෙන් කුමන ඉල්ලීම්ද යන්න හඳුනාගත නොහැක. තවද ගාස්තු අය කිරීමෙන් පසු මැනුම් ඉල්ලීම් ක්ෂේත්‍රයට නිකුත් කරනුයේ ප්‍රමුඛතාවය ලබා දී ක්‍රියා කරන ලෙස උපදෙස් දෙමිනි. ඉහළ ප්‍රමුඛතාවයකින් යුතු උසාවි මැනුම් ඉටු කිරීමට ප්‍රමාද වනු ඇත. අප වෙත මැනුම් ඉල්ලීමක් ලද පසු ගාස්තු අය කිරීම අදාල ඉල්ලීමේ සඳහන් කර ඇති තොරතුරු මත පමණක් පදනම්ව ගාස්තු ගණනය කරනු ඇත. ඉන් අනතුරුව මෙහි ක්ෂේත්‍ර වැඩ ආරම්භ කිරීමෙන් පසු ක්ෂේත්‍රයේ ඇතිවන මායිම් ගැටලු වැනි විවිධාකාර ආරවුල් සහගත තත්ව අනුව එම ඉල්ලීම ඉටු කිරීමට	දිරි දීමනා ක්‍රමය යටතේ ඉදිරියේදී නිම කිරීමට කටයුතු කෙරෙනු ඇත.

				කල්ගත වීමට හැකියාවක් පවතින අතර ඇතැම් අවස්ථාවලදී ඉටු නොකිරීමට සිදුවන අවස්ථාද පවතී. රටේ පවත්නා වඩා සංවේදී හා ප්‍රමුඛතාවය දිය යුතු කාර්යභාරය ප්‍රථමයෙන් නිම කළයුතු බැවින් අඩු ප්‍රමුඛතාවයක් සහිත ඉල්ලීම් ක්‍රියාත්මක කිරීමට යම් කාලයක් ගත වනු ඇත.	
06	කොළඹ දිස්ත්‍රික් කාර්යාලයට අදාළව මැනුම් ඉල්ලීම් තොරතුරු කළමනාකරණ පද්ධතියේ සඳහන් කර තිබුණු මැනුම් ඉල්ලීම් 05 ක් අදාළ මිනින්දෝරුවරයෙකු වෙත පැවරීම සඳහා දින 66 සිට දින 490 දක්වා වූ කාල පමාවක් සිදුව තිබුණි.	2023	මැනුම් ඉල්ලීම් ඉටු කිරීමේ කාලය හා ප්‍රගතිය පරික්ෂා කළ යුතුය.	මැනුම් ඉල්ලීමක් දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ලැබුණු වහාම ඊට සර්වේයර් ජනරාල්ගේ අංකයක් යොදා SRIMS දත්ත පද්ධතියේ ඇතුලත් කර අදාල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයට දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල මගින් නිකුත් කරනු ලැබේ. එසේ වුවද ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලයේ සිටින රජයේ මිනින්දෝරුවරුන් අත ඒ වන විටත් විශාල වැඩ ප්‍රමාණයක් තිබීම හා හදිසි වැඩ ප්‍රමාණයක් තිබීම යන කරුණු මත සමහර මැනුම් ඉල්ලීම් එක් වරම ඉටු කළ නොහැකි වනු ඇත. එබැවින් මෙම මැනුම් ඉල්ලීම් ක්‍රියාත්මක වන අතර උසාවි මැනුම් ඉල්ලීම් වැනි ඉහළ ප්‍රමුඛතාවයක් අවශ්‍ය මැනුම් ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දිය යුතු බැවින් සමහර මැනුම් ඉල්ලීම් නිම කිරීම ප්‍රමාද වීම සිදු වේ. එබැවින්	රජයේ මිනින්දෝරුවරුන් වෙත මැනුම් ඉල්ලීම් නිකුත් කිරීමට ගත වන කාල පරාසය අදාල මැනුම් ඉල්ලීමේ ප්‍රමුඛතාවය මත තීරණය වනු ඇත. ලැබෙන මැනුම් ඉල්ලීම් ප්‍රමාණය විශාල බැවින් මෙය නොවැළැක්විය හැකි කරුණකි.

				ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය වෙත දිස්ත්‍රික් මිනින්දොරු කාර්යාලයෙන් මැනුම් ඉල්ලීම් ලැබුණද රජයේ මිනින්දෝරුවරුන් වෙත නිකුත් කිරීමට කාල පරාසයක් ගත වනු ඇත. එය අදාල මැනුම් ඉල්ලීමේ ප්‍රමුඛතාවය මත තීරණය වනු ඇත.	
07	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනය විසින් මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් සඳහා පවත්වනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම (NVQ මට්ටම 2) සඳහා වූ පාඨමාලාව 2023 වර්ෂයේදී පවත්වා නොතිබුණි.	2023	සැලසුම් කල පරිදි වාර්ෂිකව සිසුන් බඳවා ගෙන පාඨමාලා පැවත්විය යුතුය.	විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සමග එකඟ විය නොහැක. ක්ෂේත්‍ර මැනුම් සහායකයින් සඳහා 2022 වසරේදී බඳවා ගත් සුදුසුකම් සහිත පුද්ගලයන් වෙනුවෙන්, 2023 වර්ෂයේදී ජාතික වෘත්තීය සුදුදුකම් ලබා දීමේ පාඨමාලාව (NVQ 2/3) පවත්වන ලදී.	NVQ පාඨමාලා සඳහා බඳවා ගැනීම් කටයුතු සිදු කරන ආකාරය අනුව එම පාඨමාලා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ.
08	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර එහි 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් එවැනි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2023	ඉදිරි වර්ෂ 03 ක් සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.	2025 වර්ෂයේ දී නිවැරදිව සකස් කිරීමට අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.	2025 වර්ෂයේ අයවැය අනුමත වීමෙන් පසු මෙය සකස් කරන බැවින් ඉදිරියේ දී සකස් කිරීමට කටයුතු කරනු ලබයි.
09	මූල්‍ය නොවන වත්කම්වලට අදාළව 2022 මූල්‍ය ප්‍රකාශනවල SA – 82 ආකෘතියෙහි දෙසැම්බර් 31 දිනට අවසන් ශේෂය ලෙස දක්වා තිබූ වටිනාකමට වඩා වැඩියෙන් රු.13,847,422 ක් 2023 මූල්‍ය ප්‍රකාශනවල	2023	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ භාණ්ඩාගාර වාර්තා සමග සමාන විය යුතුය.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

	SA – 82 ආකෘතියෙහි ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස දක්වා තිබුණි.				
10	SA – 82 ආකෘතියෙහි 2023 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය නොවන වත්කම්වල එකතුව රු.11,088,124,680 ක් වූවත් එදිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයෙහි අගය රු.11,074,119,758 ක් වූයෙන් වෙනස රු. 14,004,922 ක් විය. මෙම වෙනස හඳුනාගෙන භාණ්ඩාගාර පොත් හා නිවැරදි කර නොතිබුණි.	2023	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ භාණ්ඩාගාර වාර්තා සමග සමාන විය යුතුය.	මහා භාණ්ඩාගාරය සමඟ එක් වී මේවන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.	මහා භාණ්ඩාගාරය සමඟ එක් වී මේවන විට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
11	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ සඳහා එකතුව ලෙස රු.9,725,619 ක් වැයකර ඇතත් SA – 82 ආකෘතියෙහි එම මිලදී ගැනීම් රු. 8,641,788 ක් ලෙස දැක්වීම නිසා රු. 1,083,831 ක වෙනසක් පැවතිණි.	2023	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ, යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණවල ශේෂ භාණ්ඩාගාර වාර්තා සමග සමාන විය යුතුය.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
12	මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව අනුව දෙපාර්තමේන්තුවට ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීමේදී පවතින පුරප්පාඩු මත නියමිත සුදුසුකම් සහිත උපාධිධාරීන් සියයට 90 ක් විවෘත තරඟකාරි විභාගයකින් ද , තාක්ෂණ නිලධාරීන්ගේ කුසලතාවය මත පදනම්ව ඉතිරි සියයට 10 ද බඳවා ගැනීම සිදුකරයි. උපාධිධාරීන් ලෙස බඳවා ගන්නා සියයට 90 න් 9 : 1 අනුපාතයට මැනුම් විද්‍යා උපාධිදාරීන් හා අනෙකුත් උපාධිදාරීන් බඳවා ගනු ලබයි. එසේ බඳවා ගන්නා අනෙකුත් උපාධිධාරීන් හා	2023	සම්පත් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි පාඨමාලා සැලසුම් කල යුතුය.	පවතින මිනින්දෝරු සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව උපාධි පාඨමාලාව සඳහා බඳවා ගැනීම් සිදු කරන අතර, දෙපාර්තමේතුව තුල පවතින මිනින්දෝරු සේවයේ පුරප්පාඩු අනුව මෙන්ම රජය මගින් විටින් විට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ මත අනුමැතිය ලබා දෙන අවස්ථාවල මෙම උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.	දැනට ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීම සඳහා විභාග පවත්වා ඇත. ඒ අතුරින් සුදුසුකම් ලබන අය සඳහා උපාධි පාඨමාලා පැවැත්වීමට කටයුතු සිදු කරනු ඇත.

	මැනුම් විද්‍යා උපාධිය හදෑරීමට තරඟකාරී විභාගයකින් තෝරා ගන්නා තාක්ෂණ නිලධාරීන්ගෙන් කිසියම් ප්‍රමාණයක් උපාධි පාඨමාලාව හැදෑරීමට බඳවා ගන්නා බැවින් 2022 සිට 2026 දක්වා වර්ෂ 4 ක පාඨමාලාව සඳහා සිසුන් 22 ක් වැනි ඉතා අඩු සිසුන් ප්‍රමාණයක් විය. ආධුනික මිනින්දෝරුවරුන් බඳවා ගැනීම් නොමැති අවස්ථාවක උපාධි පාඨමාලාව සඳහාද සිසුන් නොමැති තත්වයක් ද නිරීක්ෂණය විය.				
13	2022 - 2026 උපාධි කණ්ඩායමේ සංයුතිය වෙනත් උපාධිධාරීන් 08 ක් හා තාක්ෂණ නිලධාරීන් 14 ක ගෙන් යුක්ත වූ අතර මෙම පාඨමාලාවට තෝරා ගැනීමේ දී අනෙකුත් උපාධිධාරීන් ප්‍රමාණය තීරණය කිරීමේ නිශ්චිත ක්‍රමවේදයක් තිබූ අතර තාක්ෂණ නිලධාරීන් තරඟ විභාගයකින් තෝරා ගන්නා බව 2021 ජූලි 02 දිනැති අංක 16/2021 දරන මිනින්දෝරු දෙපාර්තමේන්තු කාර්යය මණ්ඩල චක්‍රලේඛයෙහි සඳහන් වුවද එසේ බඳවා ගනු ලබන ප්‍රමාණය තීරණය කිරීම සඳහා වන නිශ්චිත ක්‍රමවේදයක් හෝ ලිඛිත සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවීය.	2023	තාක්ෂණ නිලධාරීන්ගේ ප්‍රමාණය තීරණය සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වාදිය යුතුය.	තාක්ෂණ සේවයේ නිලධාරීන් මැනුම් විද්‍යා උපාධිය හැදෑරීම සඳහා තරඟ විභාගයකින් තෝරා ගැනීමට අදාලව සේවා ව්‍යවස්ථාවකින් නිශ්චිත ලෙසටම මාර්ගෝපදේශයක් ලබාදී නොමැත. මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ උපදේශන හා සම්බන්ධීකරන මන්ඩලය (Institute of Surveying and Mapping Advisory and Coordinating Board) මගින් මෙය සඳහා මාර්ගෝපදේශයක් ලබාදී ඇත. එසේම තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගන්නා ලබන ප්‍රමාණය තීරනය කිරීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වා දී නොමැති බවද පිළිගන්නා අතර කෙසේ වෙතත් පවතින මිනින්දෝරු සේවා ව්‍යවස්ථාව සහ පවතින පුරප්පාඩු ප්‍රමාණය	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ උපදේශන හා සම්බන්ධීකරණ මණ්ඩල කමිටුව වෙත ඉදිරි පත් කර ඇත.

				අනුව, රජය මගින් කලින් කලට ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ යටතේ බඳවා ගැනීම් සිදු කරනු ලබන බැවින් ඒ හා සමගාමීව මැනුම් විද්‍යා උපාධිය හැදෑරීම සඳහා දෙපාර්තමේන්තුවේ සේවය කරන තාක්ෂණ සේවයේ නිලධාරීන්ටද අවස්ථාව සලසන බැවින්, තාක්ෂණ සේවයේ නිලධාරීන් කොපමන ප්‍රමානයක් එක් අවස්ථාවකදී තෝරාගැනීම පිළිබඳව නිශ්චිතවම සඳහන් කල නොහැක.	
14	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ දේශන පැවත්වීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 17 ක් ස්ථිර කථිකාචාර්යවරුන් ලෙස පත්කර ඔවුන්ට කථිකාචාර්ය දීමනාවක් තම නිත්‍ය තනතුරේ වැටුපට අමතරව ගෙවා තිබුණි. මින් නිලධාරීන් 15 දෙනකුට පමණක් කථිකාචාර්ය දීමනාව ගෙවා ඇතත් ඉන් ජ්‍යොෂ්ඨ නියෝජ්‍ය සහකාර ජනරාල්(පුහුණු) හා නියෝජ්‍ය සහකාර ජනරාල් (අධ්‍යයන) යන දෙදෙනා පාඨමාලා අධික්ෂණය සිදු කර ඇතත් කිසිඳු දේශනයක් නොපවත්වා තිබූ අතර කථිකාචාර්යවරු තිදෙනකු පන්ති භාර ලෙස සඳහන් කරමින් කිසිඳු දේශනයක් නොපවත්වා දීමනාව ලබා ගෙන තිබුණි. 2023 වර්ෂය මෙම සිසුන්ගේ දෙවන අධ්‍යයන වර්ෂය වන අතර ඒ සඳහා පැවත්විය යුතු	2023	කථිකාචාර්ය දීමනාව ලබා ගන්නා සියලුම ස්ථිර කථිකාචාර්යවරුන් සඳහා දේශන පැය වෙන්කළ යුතුය.	විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සමග එකඟ විය නොහැක. මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය මගින් උපාධි පාඨමාලාවට අමතරව ඩිප්ලෝමා පාඨමාලා, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලා, NVQ පාඨමාලා, වෙනත් ආයතන වල සිටින නිලධාරීන් සඳහා අවශ්‍යතාව අනුව සිදුකරනු ලබන පාඨමාලා, ආරක්ෂක හමුදාවන් සඳහා පුහුණු පාඨමාලා සහ පාසල් සිසුන් සඳහා එක් දින වැඩමුළු සිදු කරනු ලබයි. මෙම කටයුතු සඳහා සේවයේ යොදවා ගන්නා සියළුම අධ්‍යයන නිලධාරීන් වෙනුවෙන් කථිකාචාර්ය දීමනාව ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ආයතන අධ්‍යක්ෂ	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ උපදේශන හා සම්බන්ධීකරණ මණ්ඩල කමිටුව වෙත ඉදිරි පත් කර ඇත.

අනුමත දේශන පැය ගණන 1950 ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව දේශන පැය 700 ක් පමණක් පවත්වා තිබුණි.	ජනරාල්ගේ අංක ආ/8/5/719/272/11 හා 2007.02.13 දිනැති ලිපිය මගින් අවසර ලබා දී ඇත. (BDC) මැනුම් උපාධි පාඨමාලාව යනු න්‍යායිකව (සෛද්ධාන්තිකව) සහ ප්‍රායෝගිකව දැණුම සිසුන්ට ලබාදිය යුතු පාඨමාලාවකි. එම මැනුම් උපාධි පාඨමාලාව සහ අනෙකුත් මිනින්දෝරු වෘත්තියට අදාල පාඨමාලා පවත්වාගෙන යාමේදී දේශන පැවැත්වීමට දේශකවරුන්ගේද, අධීක්ෂණ කටයුතු සඳහා උපදේශකවරුන්ගේද (අධීක්ෂණ නිලධාරීන්ද) සහයෝගය ලබාගතයුතුව ඇත. සියළුම අධ්‍යයන කාර්යය මන්ඩලය ඔවුන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ අනුයුක්ත තනතුර අනුව කාන්ඩ ගත කර ඇත. කථිකාචාර්යවරුන් කාලසටහනකට අනුව දේශන පවත්වන අතර අනුයුක්ත උපදේශකවරු කාල සටහනකට අනුව දේශන නොපැවැත්වුවද පුහුණුවීම් කාලය තුළ උපදේශනාත්මක දේශන පංති කාමර තුළදී සිදු කරනු ලබයි. එමෙන්ම ක්ෂේත්‍රයේදී ප්‍රායෝගික දැණුම සපයනු ලබයි. දේශන පැය ප්‍රමාණය, උපාධිය පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්

				අනුමත දේශන පැය ප්‍රමාණය වන බැවින් එය එලෙස පවත්වාගෙන යාමට කටයුතු කර ඇති අතර, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ උපදේශන හා සම්බන්ධීකරණ කමිටුව (The Institute of Surveying and Mapping Advisory and Coordinating Board) මඟින් උපාධි ප්‍රතිඵල ලබාදීමේදී එය අධීක්ෂණය කරනු ලබයි.	
15	2022 සිට 2026 දක්වා වූ සිව් අවුරුදු උපාධි පාඨමාලා සිසුන් 22ක් වෙනුවෙන් අධ්‍යන කටයුතු කරගෙන යන අතර කෙටි කාලීන පාඨමාලා 17 ක් හා එක්දින වැඩමුළු 51 ක් පමණක් 2023 වර්ෂයේ පවත්වා තිබුණි. මෙම ආයතනය විවිධ ගොඩනැගිලි අංග 121 කින් සමන්විත අක්කර 61 ක භූමිභාගයක් තුළ ඉතා විශාල භෞතික සම්පත් සහිතව පිහිටා ඇතත් ඒවායේ උපයෝජනය ඉතා අඩු මට්ටමක පැවතිණි.	2023	සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගත යුතුය.	2022 සිට රටේ උද්ගත වූ ගැටළුකාරී තත්ත්වය මත අපගේ සේවාව සඳහා සේවයට බඳවා ගන්නා නිලධරයන් බඳවා ගැනීම සීමා කිරීම හේතුවෙන් අධ්‍යන කටයුතු වල යම් පසුබෑමක් 2021 වර්ෂයේ සිට දක්නට ලැබුණත් වර්තමානය වනවිට රජය ගන්නා ලද තීන්දු තීරණ අනුව අප සතුව ඇති භෞතික සම්පත් සහ මානව සම්පත් උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය වටපිටාවක් සැකසෙමින් පවතින අතර, ඉදිරියේදී අප ආයතනයේ උපයෝජනය ඉතා ඉහල මට්ටමකට පත් කිරීම සඳහා කටයුතු සම්පාදනය කරමින් පවතී.	රජයේ මිනින්දෝරුවරු 108 ක් බඳවා ගැනීමට තරඟ විභාග පවත්වා උපාධි පාඨමාලා පැවැත්වීමට සූදානම් කර ඇත. ඉදිරියේ දී රජය විසින් නැවතත් රජයේ මිනින්දෝරුවරුන් බඳවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.
16	මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ උපාධි සිසුවෙකුගේ ශිෂ්‍ය ඒකක පිරිවැය වෙනුවෙන් මසකට වැයවන අධ්‍යයන හා	2023	මැනුම් විද්‍යා උපාධිධාරීන් බිහි කරන පසුබිමක තවදුරටත් මෙම උපාධි පාඨමාලාව	මැනුම් දෙපාර්තමේන්තුවේ සේවය සඳහා බඳවා ගන්නා සියළු ආධුනික මිනින්දෝරුවරුන්	ඉදිරියේ දී විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා උපදෙස් අනුව බඳවා ගැනීම

පරිපාලන වියදම රු.25,426 ක් ද, සිසුන්ගේ 2024 පෙබරවාරි මස සාමාන්‍ය දල වැටුප පදනම් කරගෙන එක් සිසුවෙකුගේ මාසික සාමාන්‍ය වැටුප රු. 55,927 ක් වූයෙන් එක් සිසුවෙකු සඳහා මාසික පිරිවැය රු. 81,353 ක් බව නිරීක්ෂණය විය. ඒ අනුව සිව්වසරක උපාධිය (මාස 48) සඳහා එක් සිසුවෙකු වෙනුවෙන් රු. 3,904,944 ක් විය. ආධුනික මිනින්දෝරුවරු බඳවා ගැනීමේදී පුරප්පාඩුවලට වඩා වැඩි පිරිසක් බාහිර අයදුම්කරුවන් සිටින බැවින් මැනුම් විද්‍යා උපාධිධාරීන්ගෙන් හා අනෙකුත් උපාධිධාරීන්ගෙන් පවතින පුරප්පාඩු මත සියයට 90 ක් විවෘත තරඟකාරී විභාගයකින් තෝරා ගනු ලබයි. මෙම ආයතනය 1990 දී විශ්වවිද්‍යාල පනත යටතේ පිළිගන්නා අවස්ථාවේ දී මැනුම් විද්‍යා පිළිබඳ වෙනත් විශ්වවිද්‍යාලයකින් උපාධි ප්‍රදානය නොකලද වර්තමානයේදී සබරගමුව විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මැනුම් විද්‍යා උපාධිධාරීන් බිහි කරන පසුබිමක තවදුරටත් මෙවැනි විශාල පිරිවැයක් දරමින් මෙම උපාධි පාඨමාලාව පැවත්වීම පිළිබඳව නැවත වරක් සලකා බැලිය යුතු කරුණක් බව විගණනයේ අදහසයි.

පැවත්වීම පිළිබඳ නැවත සලකා බැලිය යුතුව ඇත.

සඳහා වසර හතරක (4) මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් ලබාගත යුතුය.
එය ලබාගත යුතු වන්නේ උපාධිධාරියා විසින් ලබා ගත් උපාධිය මැනුම් විද්‍යාවට අදාල නොවන උපාධියක් වූ අවස්ථාවකදී පමණි. මැනුම් විද්‍යා උපාධිධාරීන් බඳවා ගැනීමේදී මැනුම් විද්‍යා උපාධිය හදාරන 9 දෙනෙකුට අනෙකුත් උපාධි හදාරන එක් අයෙකු වශයෙනි (9:1 අනුපාතයට). ඒ අනුව මැනුම් විද්‍යා උපාධිය සහිතව බඳවාගනු ලබන සබරගමුව හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල නිලධාරීන් සඳහා මෙම උපාධිය අත්‍යාවශ්‍ය නොවන අතර ඒ නිලධාරීන් සඳහා මාස 06ක දිශානුගත කිරීමේ පාඨමාලාවක් පවත්වනු ලබයි. මැනුම් පනතට අනුව මැනුම් විද්‍යා උපාධිය රහිත උපාධිධරයෙකුට අප දෙපාර්තමේන්තුවට බැඳීමට ලබා දී ඇති "මැනුම් විද්‍යා උපාධිය තිබිය යුතුයි" යන සුදුසුකම නිසා එම නිලධාරීන් පමණක් අවුරුදු 04 ක මැනුම් විද්‍යා උපාධිය අප ආයතනය තුළ හැදෑරිය යුතු වේ. මෙම නිලධාරීන් විවිධ විෂයන් ඔස්සේ තාක්ෂණික දැනුමින් සන්නද්ධ උපාධිධාරීන් බැවින් පුහුණු විද්‍යා උපාධිය

සලකා බැලීම මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ උපදේශන හා සම්බන්ධීකරණ මණ්ඩල කමිටුව වෙත ඉදිරි පත් කර ඇත.

සහිතව සේවයේ යෙදවීම තුලින් ආයතනයක් තුල මුහුණදීමට සිදුවන බහුවිධ ගැටලු සඳහා සාර්තකව මුහුණදීමේ හැකියාව සහිතව ඉදිරියට යෑමට පහසු වේ.

66. ශීර්ෂය - 289 අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,237,770,609	2,205,522	1,235,565,087	තත්ත්වාගණනය කළ
2022	1,237,216,470	86,628,076	1,150,588,394	තත්ත්වාගණනය කළ
2023	1,577,452,471	9,855,785	1,567,596,686	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
01.	1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්ත ප්‍රවර්ධන පනතේ 15(1) වගන්තිය ප්‍රකාරව, අපනයන ප්‍රවර්ධන ආධාර ගෙවිය යුත්තේ නිවේදිත කෘෂිකාර්මික බෝග වගා කරන සහ සකස් කරන තැනැත්තන්ට සහනාධාර සහ මූල්‍යමය හෝ අන්‍යාකාර වූ වෙනත් ආධාර ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබීමෙන් පසුව වුවද, එවැනි නියෝග සෑදිමකින් තොරව රු.602,900,000 ක අපනයන ප්‍රවර්ධන ආධාර ගෙවා තිබුණි.	2021	පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය.	පනතේ විධිවිධාන අනුව ඉදිරියේදී කටයුතු කරන බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
02.	2016 මාර්තු 17 දිනැති අංක 01/2016(1) දරන ජාතික අයවැය චක්‍රලේඛය අනුව මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමේදී අධ්‍යක්ෂ හා ඊට සමාන මට්ටමේ නිලධාරීන් සඳහා ලබා ගන්නා වාහනයක උපරිම මාසික බදු කුලිය (එකතු කළ අගය මත බදු රහිත)	2021	චක්‍රලේඛ උපදෙස් ක්‍රියාත්මක කල යුතුය.	සංචිතය සඳහා ලබාගත් වාහන පසුව අධ්‍යක්ෂවරුන් වෙත අනුයුක්ත කිරීම නිසා මෙම තත්ත්වය ඇති වූ බව.	නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණ අතර 2024 සැප්තැම්බර් 30 දින වන විට වැඩිපුර ගෙවා ඇති මුදල රු.12,986,000 ක් වී තිබුණි.

	රු.135,000 ක් වුවද දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු අධ්‍යක්ෂවරුන් 08 දෙනෙකු සඳහා ලබාගෙන අනුයුක්ත කර තිබුණු වාහන සඳහා මසකට රු.163,500 බැගින් ගෙවා තිබුණි.				
03.	නාරම්මල අන්තර් බෝග හා බුලත් පර්යේෂණ මධ්‍යස්ථානයේ ශෂ්‍ය විද්‍යා හා පාංශු පෝෂණ අංශයෙහි ශාක හා පස් නියැදි විශ්ලේෂණය කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.840,650 ක් වැයකර මිලදී ගෙන ස්ථාපිත කර තිබුණු ජෙල්ඩාල් නිස්සාරන යන්ත්‍රය (Kjeldahl Distillation unit) Digestion unit නම් උපයෝජන යන්ත්‍රය නොමැති වීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.	2021	අදාල යන්ත්‍රය භාවිතයට ගැනීමට පියවර ගත යුතුය.	උපයෝජන යන්ත්‍ර කොටස මිලට ගෙන ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින දක්වා යන්ත්‍රය භාවිතයෙන් තොරව පවතී.
04.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවතින රජයේ නිවාස 07 ක් භාවිතයට ගෙන නොතිබුණු අතර එම නිවාස වලින් නිවාස 06 ක් අබලන් තත්ත්වයේ පැවතීම හේතුවෙන් වර්ෂ ගණනාවක සිට නිෂ්කාර්යයව පැවතුණි.	2021	වත්කම් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුය.	අලුත්වැඩියා කිරීම සඳහා සැලසුම් කර තිබෙන බව.	2024 සැප්තැම්බර් 30 දින දක්වා භාවිතයෙන් තොරව පවතී.
05.	තක්සේරු වටිනාකම රු.3,000,000 ක වාහන 3 ක් වසර 5 කට අධික කාලයක සිට භාවිතයට යොදා ගෙන නොතිබුණි.	2023	අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට පියවර ගත යුතුය.	මෙම වාහන වෙන්දේසි කිරීමට කටයුතු කරන බව.	රු.2,000,000 ක වාහන 02 ක් 2024 සැප්තැම්බර් 30 දින වන විටත් භාවිතයෙන් තොරව පවතී.

06.	මහනුවර දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම මහවැලි ගඟට මායිම්ව පිහිටා ඇති අතර ගං ඉවුර දැඩිව ඛාදනය වීම හේතුවෙන් ගඟ දෙසට ඉදිකර ඇති බැම්ම, රැස්වීම් ශාලාව, තාප්පය සහ ඉන්ටර්ලොක් ගල් අතුරා ඇති මිදුලද පුපුරා ඉරිතලා නාය යාමේ ඉහළ අවධානමක් පැවතියද ජීවිත හා දේපල ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022	දේපල හා ජීවිත හානි වලක්වා ගත යුතුය.	මහවැලි ගඟේ දකුණු ඉවුරේ මීටර 115 ක් දිග යෝජිත ගේබියන් බැම්මක් ඉදිකිරීම සඳහා අදාල ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කර නිර්මාණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර ඒ සඳහා රු. මි. 138.5 ක දළ ඇස්තමේන්තුවක් සකස් කර අවසන් කර ඇති බව	අවදානම තවදුරටත් පවතින අතර නිර්දේශිත පරිදි කටයුතු කර නොතිබුණි.
07.	අපනයන කෘෂිභෝග නිෂ්පාදන ගොවිපළ, ගොවීන්, සැකසුම්කරුවන් සහ වෙළෙන්දන් ලියාපදිංචි කිරීම සහ ශ්‍රී ලංකාවේ ගම්මිරිස් සහ කුරුඳු සඳහා භූගෝලීය දර්ශක (GI) ලබා ගැනීමට අදාල ක්‍රියාකාරකම් සිදු කිරීමේ අරමුණින් 2020 අගෝස්තු 27 දින වන විට රු.10,647,000 ක් වැයකර ටැබ්ලට් පරිගනක 300 ක් මිලදීගෙන ආයතනගත හා ක්ෂේත්‍රගත නිලධාරීන් 300 දෙනෙකුට ලබා දී රු. 1,505,000 ක් වැයකර පරිගණක මෘදුකාංගයක්ද සංවර්ධනය කර හඳුන්වා දී තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ටැබ්ලට් පරිගණක ලබාගත් 58 දෙනෙකු අදාල මෘදුකාංගය භාගත කරගෙන නොතිබුණි. එසේම අදාල පරිසනක භාවිතා කර පසුගිය	2022	ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය.	2023 අප්‍රේල් මාසය වන විට කුරුඳු ගොවීන් 8000 ට වැඩි ප්‍රමාණයක ගේ තොරතුරු මෙම ඩිජිටල් පද්ධතියට එක්කර ගැනීමට හැකිවී ඇති අතර 2023 වර්ෂය අවසාන වන විට කුරුඳු ගොවීන් 50,000 කගේ තොරතුරු මෙම පද්ධතියට ඇතුලත් කිරීමට ඉලක්කගත කර ඇති බව.	2024 සැප්තැම්බර් 30 දින දක්වා ගොවීන් 31,500 ක් පමණක් ලියාපදිංචි කර ඇත.

	වර්ෂ 02 ක කාලය තුල සමස්ථ කුරුඳු ගොවීන් 250,000 කගෙන් 238 දෙනෙක් (සියයට 0.09) තරම් ඉතා අඩු ප්‍රමාණයක් ලියාපදිංචි කරගෙන තිබුණි. එම ප්‍රමාණය ලියාපදිංචි කිරීමද ටැබ් පරිඝනක 29 කින් පමණක් සිදු කර ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. එසේම අදාල මෘදුකාංගය භාවිතා කර එම කාලය තුල අපනයන කෘෂි භෝග නිෂ්පාදන ගොවිපල සැකසුම්කරුවන් හා වෙළඳුන් ලියාපදිංචි කිරීම කෙරෙහිද අවධානය යොමුකර නොතිබුණි. එමෙන්ම මෙසේ රු. 1,505,000 ක් වැයකර මෘදුකාංගයක් හඳුන්වා දී ඒ සඳහා වාර්ෂිකව රු. 135,000 ක් බැගින් නඩත්තු වියදම් ගෙවිය යුතුව තිබුනද, ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මෘදුකාංගය භාවිතා කර නොමැති බව කරන ලද විගණනයේදී නිරීක්ෂණය විය.ඒ අනුව රු. 12,152,000 ක් වැය කර ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණු ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.				
08.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව 2023 වර්ෂයේ භෝග වර්ග 12 ක් ප්‍රවර්ධනය කිරීමට රු.400,000,000 ක ප්‍රතිපාදනයක් වෙන් කර සමාලෝචිත වර්ෂය තුළ රු.387,697,746 ක් වැය කර තිබුණි. ඊට අදාලව	2023	පසු විපරම් ප්‍රමාදයන් සිදුවීම අවම කිරීම සඳහා අධීක්ෂණ නිලධාරීන් සොයාබලා කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් බව	බෙදා හරිනු ලබන පැළ මගින් උපරිම නිෂ්පාදනයක් ලබා ගන්නා තෙක් පසු විපරම් ක්‍රියාවලිය විධිමත් කළ යුතුය.	2024 සැප්තැම්බර් 30 දිනටත් එම තත්ත්වයේම පැවතුණි.

	වර්ෂය තුලදී බෝග වර්ග 12 කට අදාළ පැළ ගොවීන් වෙත බෙදා හැර තිබුණි. මේ අතුරින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පැළ 622,226 ක් ගොවීන් වෙත බෙදා දී තිබුණු අතර ඒ අතරින් මහනුවර දිස්ත්‍රික්කයේ තෝරාගත් ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ 03 ක නියැදි පරීක්ෂාවට භාජනය වූ ගොවීන් 10 දෙනෙකු වෙත ලබා දී තිබූ ගම්මිරිස් පැල 9,580 ක් අතරින් පැළ 4,240 ක් විනාශ වී තිබුණි. එමෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශයට අදාළව ගම්මිරිස් හා කෝපි පිළිවෙලින් 2,890 ක් හා 600 ක් ලබා දී තිබුණ ද ඉන් ගම්මිරිස් හා කෝපි පැළ පිළිවෙලින් 1,225 ක් හා 598 ක් විනාශ වී තිබුණි. එමෙන්ම පැළ නඩත්තුවකින් තොරව පැවතීම, ප්‍රමාණවත් කාලයක් පසු විපරමක් නොකිරීම නිරීක්ෂණය වන අතර ඒ හේතුවෙන් පරීක්ෂණයට භාජනය වූ බෝග ප්‍රවර්ධනය සියයට 54 ක් පමණ වූ අඩු ශක්‍යතාවයකින් පැවතුණි.				
09.	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පර්යේෂණ සඳහා සමාලෝචිත වර්ෂයේ රු.10,000,000 ක ප්‍රතිපාදනය වෙන් කර ඉන් රු. 6,410,734 ක් වර්ෂය තුළ වැය කර තිබුණි. එයින් මාතලේ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා රු. 5,703,092 ක ප්‍රතිපාදනයක් වෙන් කර	2023	සීනි රහිත කුරුදු බිස්කට් නිෂ්පාදනය සම්බන්ධයෙන් විශේෂ පුහුණු වැඩසටහන් මගින් නිෂ්පාදකයින් දැනුවත් කිරීමට පියවර ගැනීම හා කුරුදු සංවර්ධන දෙපාර්තමේන්තුවේ ද මේ සඳහා සහයෝගය ලබා ගැනීමටද බිස්කට් නිෂ්පාදනය කරන	පර්යේෂණ ප්‍රතිඵල ජාතික ආර්ථිකයට දායක කර ගැනීම හා ප්‍රායෝගික නිෂ්පාදන ක්‍රියාවලිය තුළ ක්‍රියාත්මක කල යුතුය.	2024 සැප්තැම්බර් 30 දිනටත් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කර නොතිබුණි.

	සමාලෝචිත වර්ෂයේදී රු.3,607,811 ක් වැය කර තිබුණි. මාතලේ පර්යේෂණායතනයේ කුරුඳු සම්බන්ධ සිදු කල පර්යේෂණයකට අනුව සීනි වෙනුවට කුරුඳු යොදා ගෙන බිස්කට් නිෂ්පාදනය කල හැකි බව නිගමනය කර තිබුණද ඒ සම්බන්ධව නිෂ්පාදකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. එමෙන්ම රු.730,000 ක් වැය කර ගම්මිරිස් සම්බන්ධ පර්යේෂණ 04 ක් ක්‍රියාත්මක කර වියළි කළු ගම්මිරිස් සඳහා පයිපෙරින් නිස්සාරණය කිරීම සඳහා ක්‍රමවේදයන් සංවර්ධනය කිරීම හා ශ්‍රී ලංකාවේ වගා කරන ගම්මිරිස් ප්‍රදේශ අනුව එහි ගුණාත්මක බව වෙනස් වන ආකාරය විශ්ලේෂණය කිරීම සිදු කර තිබුණද ඒ සම්බන්ධව මහජනතාව මෙන්ම ගම්මිරිස් ගොවීන් වෙත සන්නිවේදනය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.		සමාගම් වෙත මෙම තාක්ෂණය හඳුන්වා දීමට අපේක්ෂා කරණු ලබන බව ගම්මිරිස් සම්බන්ධව ඉදිරියේදි පවත්වනු ලබන පුහුණු වැඩසටහන් සඳහා මෙම පර්යේෂණ ප්‍රතිපල යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන බව අනෙකුත් නිෂ්පාදන සමබන්ධයෙන් කුඩා පරිමාණයෙන් නිෂ්පාදන සිදුකරන නිෂ්පාදකයින් සිටින අතර ඉදිරියේදීද ව්‍යවසායකයන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරනු ලබන බව		
10.	2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව ලබාගත් තොරතුරු වලට අනුව දෙපාර්තමේන්තුව මඟින් සෘජුවම ක්‍රියාත්මක වන පැළ තවාන් 12 ක නිෂ්පාදනය කළ හැකි උපරිම ධාරිතා මට්ටම පැළ 3,005,000 වූ අතර නිෂ්පාදන ඉලක්කය 2,104,508 ක් වී තිබුණි. ඒ අතරින් පැළ නිෂ්පාදනය 1,829,144 ක් විය. එම කාලය තුල සහතික කල	2023	අදාළ කාලය තුළ පර්යේෂණ කටයුතු පවත්වා ගැනීමට ප්‍රමුඛතාව ලබා දෙන අතරතුර පැළ නිෂ්පාදනය ද හැකි උපරිමයෙන් සිදු කළ බව	පැළත තවාන් උපරිම ධාරිතාවයෙන් යුතුව ක්‍රියාත්මක කල යුතුය.	උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කර නැත.

	පැළ 1,560,005 ක් වුවද ක්ෂේත්‍රයට නිකුත් කළ පැළ ප්‍රමාණය 1,514,813 ක් විය. දෙපාර්තමේන්තුව යටතේ පවතින කුණ්ඩසාලේ සහ නිල්ලඹ පැළ තවාන්වල උපරිම අපනයන බෝග පැළ නිෂ්පාදන ධාරිතාවය වාර්ෂිකව පැළ 250,000 ක් වුවද වාර්ෂික නිෂ්පාදනය පැළ 65,026 ක් එනම් සියයට 26 ක් තරම් අඩු මට්ටමක පැවතුණු අතර පැළ ඉලක්කයට සාපේක්ෂව ක්ෂේත්‍රයට පැළ නිකුත් කිරීම් සියයට 44 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. එසේම අනෙකුත් රජයේ පැළ තවාන් 10 උපරිම ධාරිතාවයට සාපේක්ෂව පැළ නිෂ්පාදනය සියයට 61 මට්ටමක පැවතුණි.				
11.	දෙපාර්තමේන්තුව සතුව වාහන 98 ක් තිබියදී 2022 මැයි මස සිට වසරක කාලයක් සඳහා මසකට කිලෝමීටර් 3,000 ක් ධාවනය කිරීමේ පදනම මත මාසිකව රු.178,000 ක කුලියකට වාහනයක් ලබා ගෙන තිබුණි. ඒ අනුව වර්ෂය තුල කිලෝමීටර් 36,000 ක් ධාවනය කළ යුතු වුවත් එම කාලය තුළ කිලෝමීටර් 18,020 ක් ධාවනය කිරීමෙන් කිලෝමීටර් 17,980 ක් ඌණ උපයෝජනය කර ඒ වෙනුවෙන් රු.1,066,813 ක පිරිවැයක් නිශ්කාර්යයව ගෙවා තිබුණි.	2023	අවශ්‍යතාවය සලකා බලා වාහන කුලී පදනම මත ලබාගත යුතු අතර රජයට අවම පිරිවැයක් වන ලෙස කටයුතු කල යුතුය.	කොවිඩ් වසංගතය හේතුවෙන් රාජකාරි ගමන් සීමා කිරීම, රජයේ ප්‍රතිපත්ති මත රාජ්‍ය වියදම් සීමා කිරීම , හේතුවෙන් ක්ෂේත්‍ර රාජකාරිවල යෙදීම අඩු වීම, QR කේතය යටතේ ඉන්ධන ලබා දීම හා ZOOM තාක්ෂණය ඔස්සේ රැස්වීම් පැවැත්වීම යනාදී හේතු මත වාහන භාවිතය සීමා වූ බව	2024 සැප්තැම්බර් 30 දින දක්වාත් මෙම තත්ත්වය නිවැරදි වී නොතිබුණි.
12.	දෙපාර්තමේන්තුව වාහන වලට අවශ්‍ය ටයර්	2023	අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී	2022 වර්ෂයේ වාහන නිසි පරිදි	2024 සැප්තැම්බර් 30

නිශ්චිතව හඳුනාගැනීමකින් තොරව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් මස එකතුව රු.2,416,265 ක ටයර් 50 ක් මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් දින වන විට ඉන් රු.1,812,231 ක ටයර් 35 ක් ගබඩාවේ ඉතිරිව තිබුණි.	ගැනිම් සිදු කල යුතුය.	ධාවනය නොවීමත් නිසා එම වර්ෂයේ ටයර් නිකුත් නොවීමත්, 2023 වර්ෂය සඳහා තොග ශේෂ පවත්වාගෙන යාමේ අරමුණින් ටයර් මිලදී ගැනීම් සිදු කළ බව	දින දක්වාත් මෙම තත්ත්වය නිවැරදි වී නොතිබුණි.

67. ශීර්ෂය - 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,144,736,827	94,469,162	1,050,267,665	තත්ත්වාගණනය කළ
2022	1,540,160,077	103,152,800	1,437,007,277	තත්ත්වාගණනය කළ
2023	2,224,108,002	231,263,450	1,992,844,552	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දියවර දිරිය ණය යෝජනා ක්‍රමයේ රජය වෙනුවෙන් පොලී සහනාධාරය ගෙවීම සහ නියාමනය කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත බලය පවරා තිබුණ ද, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම ලබාගෙන තිබූ එක් එක් ධීවරයා ණය ලබාගත් දිනය, ණය වාරික ගෙවා අවසන් වන දිනය, මාසිකව ගෙවිය යුතු පොලී සහනාධාර ආදී ගෙවීම් විස්තර වෙන වෙනම හඳුනාගැනීමට හැකිවන පරිදි ලේඛන හෝ දත්ත ගොනුවක් පවත්වා ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි. මේ නිසා 2023 වර්ෂයේ ගෙවා තිබූ රු.11,996,398 ක මුදල ද ඇතුළුව වසර 12 ක වැඩි කාලයක් තුළ ලංකා බැංකුවට ගෙවා තිබෙන රු.මිලියන 300 කට වැඩි පොලී සහනාධාරයේ නිරවද්‍යතාවය තහවුරු කරගැනීමට නොහැකි වූ අතර මේ දක්වා ගෙවා තිබෙන පොලී සහනාධාර	2023 2022	ණය යෝජනා ක්‍රමය පිළිබඳ නිවැරදි තොරතුරු පවත්වා ගත යුතු අතර ඉල්ලුවිට දී එම තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය.	දියවර දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ සිටින සියලුම ණයලාභීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොමැති අතර එමගින් ඇති වූ ගැටළු සහගත තත්වය නිරාකරණය කිරීම සඳහා දෙපාර්තමේන්තුව මේ වන විට පියවර ගෙන ඇත. මේ අනුව හඳුනාගත් ණය හිමියන්ගේ හිඟ වාරික සහ ණය මුදල් අයකර ගැනීම කඩිනමින් සිදුකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පොලි සහනාධාර මුදල් ලංකා බැංකුව වෙත ගෙවීම තාවකාලිකව අත්හිටුවීම, දෙපාර්තමේන්තුව මඟින් ණය හිමියන් දැනුවත් කරමින් අවවාදාත්මක ලිපි යැවීම, සියලු දිස්ත්‍රික් කාර්යාල දැනුවත්	දියවර දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ සිටින සියලුම ණයලාභීන්ගේ තොරතුරු ඇතුලත් දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගොස් නොමැත.

	මුදල නිවැරදිව ගණනය කිරීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තු විසින් ණය හිමියන්ගෙන් ණය වාරික අයවීම, නොපියවා තිබෙන ශේෂ සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් ලේඛන හෝ දත්ත පද්ධතියක් පවත්වාගෙන නොයාම නිසා පොලී සහනාධාරය ගෙවීමට ඉතිරිව තිබෙන ණය මුදල, ගෙවීමට තිබෙන පොලීය, සහ ගෙවා අවසන් කළ ණයකරුවන් කවුරුන් ද යන්න හඳුනාගැනීමට අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ බැවින් මෙම ගණුදෙනුවේ නිරවද්‍යතාවය තහවුරු නොවීය. කෙසේ වෙතත් බැංකු ලේඛන අනුව 2023 දෙසැම්බර් 31 දිනවන විට ලබා දී තිබූ ණය ශේෂය රු.776,515,188 ක් විය.			කරමින් ක්ෂේත්‍ර නිලධාරීන් හරහා ණය හිමියන් දැනුවත් කිරීම, ලංකා බැංකුවෙන් අදාල ණය ලාභීන් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනීම හා ණය හිමියන් සමග එළඹ ඇති සම්මුතීන් පිළිබඳ කරුණු ලබා ගැනීමට පියවර ගෙන ඇත.	
02	2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් බලපත්‍ර ගාස්තු අයකිරීමේ නියෝග ප්‍රකාරව ප්‍රධාන ක්‍රියාකාරකම් 05 යටතේ බලපත්‍ර ලබාදිය හැකි අවස්ථා 53 ක් සඳහා රාජ්‍ය ආදායම් එකතුකිරීම සඳහා ගාස්තු පැනවීමට අදාල නියෝග අමාත්‍යාවරයා විසින් නිකුත් කර තිබුණි. කෙසේ වෙතත් බලපත්‍ර නිකුත් කිරීමේ දී පූර්ව අංකනය කිරීමක් සහිත විශේෂිත කඩදාසියක	2023 2022	බලපත්‍ර නිකුත් කිරීම සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය.	2021 නොවැම්බර් 24 දිනැති අංක 2255/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් බලය ලබා දී ඇති ආකාරයට අවස්ථා 53 ක් යටතේ ආදායම් රැස් කිරීම සිදු කරනු ලබයි.එම රැස්වන ආදායමට අදාල බලපත්‍ර නිකුත් කිරීම කළමනාකරණ අංශය , තත්ව පාලන අංශය , සංවර්ධන අංශය හා මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලබන අතර අප	පූර්ව අංකනය කිරීමක් සහිත විශේෂිත කඩදාසියක බලපත්‍රයන් නිකුත්වීම සිදුනොවේ.

	බලපත්‍ර නිකුත් නොකිරීම නිසා රජයට ආදායමක් නොමැතිව බලපත්‍රයක් නිකුත්වීමට අවස්ථාවක් තිබෙන අතර 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එකතුකර තිබූ රු.179,170,315 ක වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායම නිකුත් කර තිබූ සියලුම බලපත්‍රවලට අදාල ආදායම බව සැසඳීමට නොහැකිවීම නිසා ඉහත සඳහන් වාර්ෂික බලපත්‍ර ගාස්තු ආදායමේ නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත්විය නොහැකි විය.			දෙපාර්තමේන්තු බැංකු ගිණුමට රැස් වන මුදල, එක් එක් අංශයෙන් නිකුත් කරන බලපත්‍ර ප්‍රමාණය සමඟ මාසික සැසඳීම සිදු කරනු ලබයි. 2024 වර්ෂයේ සිට දෙපාර්තමේන්තු ආදායම් රැස් කිරීම online ක්‍රමයට සිදුවන බැවින් ආදායම බැංකුවට ලැබුණු බව තහවුරු කරගෙන බලපත්‍ර නිකුත් කරයි.එම නිසා නිකුත් කර ඇති බලපත්‍ර වලට අදාලව රැස්කරන ආදායම පහසුවෙන් සැසඳීමේ හැකියාව පවතී.	
03	ගැඹුරු මුහුදෙහි ධීවර කටයුතු සිදුකරන ධීවර යාත්‍රා නිරීක්ෂණය හා නියාමනය කිරීම සඳහා උපකරණ කට්ටල 4200 ක් ඕස්ට්‍රේලියානු රජය විසින් ප්‍රදානයක් වශයෙන් ලබා දී තිබූ අතර එම උපකරණ කට්ටලයක් එක් යාත්‍රාවක සවිකිරීමේ වියදම ඇමරිකානු ඩොලර් 45 ක් විය. එම මුදල උපකරණ කට්ටලයක් සවිකිරීමේ කොන්ත්‍රාත්තුව ලබා දී තිබූ දේශීය සමාගම වෙත ගෙවිය යුතුව ඇත. කෙසේ වුවද ටෙන්ඩර් නියමයන් අනුව යාත්‍රා නිරීක්ෂණ පද්ධති 200 ක් අදාළ සැපයුම්කරු විසින් බහුදින ධීවර යාත්‍රා 200 ක නොමිලේ සවිකළ යුතුය. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දිනෙන් පසු ලියාපදිංචි/නිෂ්පාදනය කරනු ලබන, බෝට්ටු	2023	VMS උපකරණ සවිකිරීම් සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.	විගණනය විසින් පෙන්වා දී ඇති 2020.12.31 න් පසුව ලියාපදිංචි කරන ලද යාත්‍රා 27 දෙපාර්තමේන්ත කළමනාකරණය විසින් ද හඳුනා ගන්නා ලද අතර මේ වන විට ඒ සම්බන්ධයෙන් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කරමින් පවතී.	මේ පිළිබඳව පවත්වන අභ්‍යන්තර පරීක්ෂණය 2024 සැප්තැම්බර් 30 දින වනවිටත් අවසන් කර නොතිබුණි.

	සඳහා VMS උපකරණ අදාළ බෝට්ටු හිමිකරුවන් විසින් සවිකර ගත යුතු බවට රජය තීරණය කර තිබුණ ද ඉහත සඳහන් දිනට පසු ලියාපදිංචි කර තිබූ බෝට්ටු 27ක් සඳහා ද අදාළ යන්ත්‍ර නොමිලේ සවිකර තිබුණේ කෙසේ ද යන්න පිළිබඳව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.				
04	කලපු සංවර්ධන වැඩසටහන යටතේ කලපු සීමා ලකුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ හලාවත කලපුවේ සීමා මායිම් සලකුණු කිරීම සඳහා අවශ්‍ය සීමා මායිම් කණු සංඛ්‍යාව 1,784 ක් වුවද ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී කණු සංඛ්‍යාව 4060 ක් ලෙස සටහන්වීම නිසා වැඩිපුර සාදා නිමකර තිබුණු රු.3,826,639 ක්වූ කණු 2276 ක් 2023 දෙසැම්බර් 31 දිනවන විටත් හලාවත කලපුවේ ස්ථාන 13 ක ගොඩගසා තිබුණි. මුදල් රෙගුලාසි 128(1)(එ) ප්‍රකාර මහජන මුදල් වියදම් කිරීමේ දී අරපිරිමැස්ම සහ කාර්යක්ෂමතාවය, විධිමත් බව සහ අවංකභාවය පිළිබඳව ගණන්දීමේ නිලධාරීන් වගකිව යුතුව තිබෙන බව සඳහන්ව තිබුණ ද, ඒ පිළිබඳව සැලකිලිමත් වී නොතිබුණි.	2023	වැඩිපුර මිලදී ගත් කණුවල වියදම සහ අමතරව දැරීමට සිදුවන ප්‍රවාහන වියදම් වගකිව යුතු පාර්ශව වෙතින් අයකරගත යුතුය.	ඇස්තමේන්තු සකස් කිරීමේ දී සිදු වී තිබූ ප්‍රමාද දෝෂයන් නිසා වැඩිපුර මිලදීගෙන තිබූ කණු 2276 ක් පුත්තලම කලපුව වෙත නැවත ප්‍රවාහනය කර පුත්තලම කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා යොදා ගැනීමට නියමිතව ඇත.	2024 සැප්තැම්බර් 30 දින වනවිටත් වැඩිපුර මිලදීගෙන තිබූ කණු 2276 පුත්තලම කලපුව වෙත ප්‍රවාහනය කර නොමැත.

05	ආරුගම්බේ කලපුවේ සීමා ලකුණු කිරීම සඳහා මායිම් කණු 1048 ක් නිෂ්පාදනය කර තිබුණ ද මායිම් කණු 420 ක් කලපුව වටා ස්ථාපිත කර තිබූ අතර ඉන් මායිම් කණු 90 ක් හඳුනානොගත් අයවලුන් විසින් ගලවා ඉවත්කර ඇති බව දන්වා තිබුණි. මායිම් කණු 90 ක් ඉදිකිරීමට හා ස්ථාපිත කිරීමට දළ වශයෙන් රු.222,300 ක මුදලක් රජයට වැය වී තිබූ අතර එම හානි හා පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තව ද, එම ගලවා ඉවත්කර තිබූ මායිම් කණු සඳහා නැවත කණු ස්ථාපිත කිරීම සහ ඉතිරිව තිබූ මායිම් කණු 628 ක ප්‍රමාණයක් කලපු සීමා සලකුණු කිරීම සඳහා ස්ථාපිත කිරීම 2023 දෙසැම්බර් 31 දිනවන විටත් සිදුකර නොතිබුණි.	2023	රජයට සිදු වී තිබෙන පාඩුව අයකරගත යුතු අතර ඉතිරි කණු කලපු සීමා ලකුණු කිරීමට යොදා ගත යුතුය.	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් ආරුගම්බේ කලපුවේ මායිම් කණු 420 ක් සිටුවා ඇති අතර, මෙම මායිම් කණු අතරින් කණු 90 ක් නාඳුනන පුද්ගලයන් විසින් ගලවා ඉවත් කර ඇත. මේ සම්බන්ධයෙන් පොතුවිල් පොලිස් ස්ථානයේ 2020.09.18 දින පැමිණිල්ලක් සිදු කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වනවිටත් ආරුගම්බේ කලපුවේ සීමා ලකුණු කිරීම් කණු සිටුවීමේ ව්‍යාපෘතිය අවසන් කර නොමැත.
06	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 කට අදාළව පුරප්පාඩු 19 ක් ද, තෘතියික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 10 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 08 කට අදාළව පුරප්පාඩු 223 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 කට අදාළව පුරප්පාඩු 05 ක් ද පැවතුණි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටම ඇතුළුව තනතුරු විශාල සංඛ්‍යාවක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීමේ දී	2023	දෙපාර්තමේන්තුවේ අරමුණු ඉටුකිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගත යුතුයි.	පත්වීම් සිදු කිරීමට සහ බඳවාගැනීම් සඳහා විභාග පැවැත්වීමට කටයුතු කරමින් පවතී. වෙනත් නිලධාරීන් විසින් අදාල තනතුරු වල රාජකාරි ඉටුකරමින් පවතී.	බඳවාගැනීම් සඳහා විභාග පවත්වා නැත.

බාධාවක් වී තිබුණි.

07	දෙපාර්තමේන්තුවට අයත් දිස්ත්‍රික් ධීවර කාර්යාල 31 ක පිහිටා තිබෙන ඉඩම් පවරාගැනීමට කටයුතු කර නොතිබුණු අතර එයින් කාර්යාල 14 ක ඉඩම්වල මායිම් නිවැරදිව හඳුනාගෙන වැට මායිම් සකස් කිරීමට ක්‍රියාකළ යුතු වුවත් එම දිස්ත්‍රික් කාර්යාල පිහිටි ඉඩම්වල වැට මායිම් සකස් කිරීම සිදුකර නොතිබුණි.	2022	දෙපාර්තමේන්තුව සතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ඉඩම් නිවැරදිව හඳුනාගෙන වැට මායිම් සකස් කිරීම කළ යුතුය.	මෙහි සඳහන් ඉඩම් මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමෙන් අනතුරුව වැට මායිම් සකස් කළ හැකි අතර එම කාර්යාල පිහිටි ඉඩම් සඳහා ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන්නේ නීත්‍යානුකූල අයිතියක් සහිත පැවරුම් සහතිකයක් පමණක් බැවින් එම ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.	එම ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොමැත.

68. ශීර්ෂය - 291 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	586,242,510	41,572,280	544,670,230	තත්ත්වාගණනය කළ
2022	650,130,714	12,302,111	637,828,603	තත්ත්වාගණනය කළ
2023	721,740,698	10,960,744	710,779,954	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාව දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	2015 සිට 2023 දක්වා කඩා ඉවත් කිරීම් නියෝග මත ඉවත් කර තිබූ අනවසර ඉදිකිරීම් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබුණු රු.3,853,006 කින් සියයට 85 ක් වන රු 3,280,780 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තුව ට අයවිය යුතුව තිබෙන මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අවශ්‍ය නීති මය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමින් පවති	ගෙවීම් පැහැර හැර ඇති අය සඳහා නීති මගින් කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාරග ගනිමින් පවතී.
02	ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත 2007 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් 03 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දුන් බලපත්‍ර 04 කට හා 2020 සැප්තැම්බර් 07 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට නිකුත් කරන ලද බලපත්‍රය මත අනුමත කළ වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැඩිපුර සිදුකළ කැණීම් සඳහා අයවිය යුතු පිළිවෙලින් රු.72,895,000 ක හා රු.1,688,515 ක ගාස්තුව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. නමුත් ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය විසින් රු.64,056,000 ක් පමණක් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ලෙස ගණනය කර එම මුදල වර්ෂ 5 ක් තුළ ගෙවීම් කරන බව දන්වා තිබීම විගණනයට ගැටළු සහගත විය.	2022 2023	රජයට අය විය යුතු නිවැරදි ගාස්තුව කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගත යුතුය .	රජයට අයවියයුතු මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	අයවිය යුතු මුදලින් රු. 6,474,500.00 ක මුදලක් ලංකා මිනරල් සැන්ඩ් සමාගම විසින් ගෙවා ඇත. ඉතිරි මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් 2023 මාර්තු 02 දින අදාළ ආයතන සමග කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේ දී පිහිටුවාගත් කමිටු තීරණය අනුව රජයට අය විය යුතු ගෙවීම් සිදු කිරීමට ලංකා මිනරල් සැන්ඩ්

					සමාගම විසින් එකඟතාව පල කර ඇත.
03	1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 7 (ඉ) හා 12 වගන්ති සහ 2018 වසරේ උපදේශක සභාව විසින් අනුමත කරන ලද වෙරළ කළමනාකරණ සංශෝධිත සැලැස්මේ 6.4.6 ඡේදය ප්‍රකාරව මහජනතාවට අවශ්‍ය කරන පොදු සංවර්ධන කටයුත්තක් සඳහා පමණක් වෙරළ රක්ෂිතයන් (පසසිටුවන්) නිදහස් කිරීම වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ උපදේශක සභාවේ නිර්දේශ මත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනුමක කළ හැකි වුවද. 2021 දෙසැම්බර් සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය තුළ පෞද්ගලික අයදුම්පත් 81 කට ඉදිකිරීම් බලපත්‍ර ලබා දී තිබීමෙන් වෙරළ කලාපයට සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි.	2023	පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය.	විකල්පයක් නොමැති අවස්ථා වලදී සාධාරණකරුණු සැලකිල්ලට ගනිමින් හා එමගින් වෙරළ කලාපයට සිදුවන අහිතකර බලපෑම අවම කරමින් උපදේශක සභාව වෙරළ කලාපය සංවර්ධන කාර්යයන් සඳහා නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි.	වෙරළ කලාපයේ සංවර්ධන කාර්යයන් සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථා වලදී සාධාරණකරුණු සැලකිල්ලට ගනිමින් හා එමගින් වෙරළ කලාපයට සිදුවන අහිතකර බලපෑම අවම කරමින් උපදේශක සභාව වෙරළ කලාපය සංවර්ධන කාර්යයන් සඳහා නිර්දේශ ලබාදීම සිදුකරනු ලබන බව දන්වා ඇත.
04	2012 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් 2,763 කින් 2445 ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් ඔස්සේ අනවසර ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.	බලපත්‍ර ලබා දිය හැකි අනවසර ඉදිකිරීම් සඳහා බලපත්‍ර ලබා ගැනීම සඳහා යොමු කර ඇති අතර අනෙකුත් අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.	2024.09.30 දිනට මෙම අනවසර ඉදිකිරීම් ඉවත් කර ගැනීමට කටයුතු කර නැත.
05	2017 වර්ෂයේ දී ඇති වූ ගංවතුර තත්ත්වය පාලනය සඳහා පිළියමක් ලෙස කළුගඟ ගංමෝය කට පුලුල් කිරීම නිසා කළුතර අවට වෙරළ ඛාදනය දැඩි ගැටලුවක් බවට පත්ව ඇති අතර එම වෙරළ ඛාදනය	2023	වැයකරන ලද රු.මි. 189 ක මුදල ඵලදායි වන ලෙස ස්ථිර පිළියමක් යෙදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග	ඉදිරියේදී ශක්‍යතා අධ්‍යයන සිදුකර ව්‍යාපෘති ආරම්භ කිරීමට තීරණය කර ඇත.	අදාළ ගැටළුව නිරාකරණය කර ගැනීමට ස්ථිර විසඳුමක් ගෙන නොමැත.

	නැවැත්වීමට පිළියමක් ලෙස 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු.මි. 189 ක් වැයකර ව්‍යාපෘති කාර්යන් 19 ක් සිදුකර තිබුණ ද ගැටලුව සඳහා ස්ථිර පිළියමක් ලැබී නොතිබුණි.		සම්බන්ධිත ආයතන සමග සම්බන්ධීකරණ යෙන් ක්‍රියාත්මක කළ යුතුය		
06	2021 නොවැම්බර් 16 වන දින වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණු රු.5,800,000 ක් වටිනා අංක PD-1046 දරන TOYOTA HILUX ඩබල් කැබ් රථයේ අයිතිය පැවරීමට හෝ එම වාහනය දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට හෝ 2023 වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි.	2022 2023	2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වාහනයේ අයිතිය පැවරීමට හෝ දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	PD – 1046 රථයේ අයිතිය පවරා දීමට අවශ්‍ය ආකෘති පත්‍ර පුරවා ලබා දී ඇත.	වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් PD – 1046 රථයේ අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොමැත.
07	වෙරළ කලාපයන් තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍ර ලබාදීම පිණිස රු.5,000,000 කට පද්ධතියක් සකස්කර ගැනීම සඳහා 2016 ජූනි 09 දින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණ ද, පසුව එම ආයතනය විසින් එම කාර්යය රු.14,528,000 කට පෞද්ගලික පාර්ශවයකට පැවරීම නිසා රු.9,528,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි.	2023	ප්‍රසම්පාදනයේදී ඇස්තමේන්තුව නිවැරදිව තක්සේරු කළ යුතු අතර ගිවිසුම් ගත වටිනාකමට සේවාව සැපයීමට අපොහොසත් වේ නම් අදාල කොන්ත්‍රාත්තුව අවලංගු කර නැවත ප්‍රසම්පදන ක්‍රියාවලිය පිළිපැද සුදුසු සැපයුම්කරුවකු තෝරා ගත යුතුය.	ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කිරීමට තීරණය කර ඇත.	වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
08	වෙරළ ආශ්‍රිත නිවාස 38 ක් සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්ත්වය සමනය කර නොගැනීම, අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට හා දුම්රිය හරස් මාර්ගයට කොඩිකරුවන් යෙදවීමට දුම්රිය දෙපාර්තමේන්තුවට රු.3,567,321 ක් ගෙවා තිබියදී දුම්රිය හරස් මාර්ගයට නිසි	2023	පවතින ගැටළු ආරම්භයේදීම නිරාකරණය කරගෙන ව්‍යාපෘතිය නියමිත කාලය තුල අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු	රජයට අවාසි නොවන පරිදි ව්‍යාපෘති සිදුකිරීමට මින් ඉදිරියට කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.	වැඩබිම්වල ඉදිකිරීම් කටයුතු අවසන් වී තිබුණද ඇස්තමේන්තුගත පිරිවැය රු.65,919,292 ක් දක්වා වැඩි වීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

පරිදි කොඩිකරුවන් නොයෙදවීම හා ද්‍රව්‍ය සැපයුම් ප්‍රමාදවීම යන හේතූන් මත 2021 නොවැම්බර් 11 දින අවසන් කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතිය එදිනට අවසන් කිරීමට නොහැකිවීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇස්තමේන්තුගත පිරිවැය රු.65,919,292 ක් දක්වා වැඩි වී තිබුණි.	කළයුතුයි.

69. ශීර්ෂය - 292 සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,727,243,283	24,487,856	2,702,755,427	තත්ත්වාගණනය කළ
2022	3,226,316,069	16,573,964	3,209,742,105	තත්ත්වාගණනය කළ
2023	3,272,829,822	18,326,651	3,254,503,171	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
01.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XVපරිච්ඡේදයේ 4ඡේදය ප්‍රකාරව අධ්‍යයන, අභ්‍යාස හෝ රාජකාරී කටයුතු සඳහා විදේශගතවූ නිලධාරීන් 07 දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොතිබීම හේතුවෙන් අනිවාර්ය සේවාකාලයක් සේවය කිරීම සඳහා එළඹී ගිවිසුම කඩ කිරීම නිසාඑම නිලධාරීන්ගෙන් අය විය යුතු රු. 5,727,891 ක දඩ මුදල් අය කරගෙන නොතිබුණි.	2021	ගිවිසුම් ප්‍රකාරව අදාළ මුදල් අය කරගත යුතුය.	නිලධාරීන් තිදෙනෙකුට විරුද්ධව නඩු පවරා ඇති අතර අනෙකුත් නිලධාරීන් 4 දෙනා වෙතින් දණ්ඩන මුදල් අයකර ගැනමට අවශ්‍ය නීති උපදෙස් ලබාගෙන ඇති බව.	නිලධාරීන් තිදෙනෙකු දණ්ඩන මුදල් වාරික වශයෙන් ගෙවීම් කරමින් පවතින අතර අනෙකුත් නිලධාරීන් සිව්දෙනාගෙන් දණ්ඩන මුදල් 2024 සැප්තැම්බර් 30 තෙක් අයකර නොමැත.
02.	ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනයේ මුදල් භාරකාරිනිය (සරප්) විසින් 2018 සිට 2023 ජූලි මස දක්වා කාලය තුළ දෛනිකව රැස්කරගනු ලබන ආදායමින් රු.14,749,160 ක මුදලක් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන මුදල් භාරකරු වෙත භාර නොදී පෞද්ගලික පරිහරණයට ලබාගෙන අක්‍රමිකතාවයක් සිදු කර තිබුණි.මෙම මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව මු.රෙ.104(4) පූර්ණ පරීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය අවසන් දින වන විටත් නිකුත් කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුය.	මූල්‍ය අක්‍රමිතකාවයට වගකීමට බැඳෙන පාර්ශව නිර්ණය කිරීම සම්බන්ධව මූලික විමර්ෂණයක් සිදු කෙරෙන අතර ඒ සම්බන්ධ වාර්තාව කඩිනමින් ලබා දෙන ලෙස දන්වා ඇති බව	මූලිකවිමර්ෂණ වාර්තාව හා මු.රෙ.104 (4) වාර්තාව 2024 සැප්තැම්බර් 30 දින දක්වාත් ලැබී නොමැත.

03.	මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ කුකුලන් 5,181 ක උපරිම ධාරිතාවයකින් පවත්වාගෙන යාමට හැකි කුකුල් නිවාස හා සම්පත් පැවතියද සමාලෝචිත වර්ෂය තුලදී කුකුලන් 1,680 ක් එනම් සියයට 32 කට අඩු ප්‍රමාණයක් නඩත්තු කිරීම තුලින් මධ්‍යස්ථානය සියයට 68 ක් ඌණ උපයෝජිතව පැවතුණි.	2023	කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය උපරිම ධාරිතාවයකින් පවත්වාගෙන යායුතුය.	ගොවිපලෙහි කුකුළන් 5000 ට වැඩි ප්‍රමාණයක් ඇති කිරීමට තරම් කුකුල් නිවාසවල ඉඩකඩ පවතින නමුත් බීජරක්වනාගාරයේ ධාරිතාවය ඇත්තේ බිත්තර 8400 කට පමණක් බැවින් බීජ රක්වනාගාරයට අවශ්‍ය setter යන්ත්‍රය මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව	2024 සැප්තැම්බර් 30 දිනට නඩත්තු කරන කුකුළන් ප්‍රමාණය 2,482 ක් විය.
04.	වසරකට 50 බැගින් වසර 05 ක් තුල එළුවන් 250 ක් ක්ෂේත්‍රගත කිරීමේ අරමුණින් 2019 වර්ෂයේදී ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය තුල බෝයර් වර්ගයේ එළු අභිජනන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂය අවසන් වන විට රු.91,970,290 ක වියදමක් දරා තිබුණු අතර එම කාලය තුළ රු.2,362,442 ක ආදායමක් පමණක් ලබා ගෙන තිබුණි. එසේම මෙම කාලය තුල එළුවන් 23 ක් පමණක් ක්ෂේත්‍රයට නිකුත් කර තිබුණු බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.	2023	රෝග පාලනයත් සමඟ ව්‍යාපෘතියේ සැලසුම් කල අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	නිරෝධායන කාල සීමාව තුළ B/T හා CAE ප්‍රතිදේහ හමුවීම නිසා ආනයනික එළු කණ්ඩායම විටින් විට පරීක්ෂා කළ අතර රෝග කාරක සහිත සතුන් හමු වූ අතර ඒ අනුව ක්ෂේත්‍රයට මේ වන විට සතුන් නිකුත් කිරීම නතර කර ඇති බව	රෝගකාරක සහිත සතුන් හමුවීම හේතුවෙන් අභිජනන කටයුතු හා ක්ෂේත්‍රයට සතුන් නිකුත් කිරීම 2022 මැයි 22 දින සිට නතර කර ඇත.
05.	රු.11,611,665 ක වියදමක් දරමින් 2021 ජනවාරි 04 දින වැඩ නිම කරන ලද අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ ආපනශාලාවේ ඉහල මහල වසර තුනකටත් අධික කාලයක සිට අපේක්ෂිත අරමුණට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	2021 2022 2023	අපේක්ෂිත අරමුණට අදාළව ගොඩනැගිල්ල භාවිතයට ගත යුතුය.	2024 වර්ෂයේ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම් යටතේ ඇති ප්‍රතිපාදන මඟින් මෙම අවශ්‍යතා වලින් කොටසක් හෝ ලබා ගැනීමට උත්සාහ දරන බව	2024 සැප්තැම්බර් 30 දක්වාත් ඌණ උපයෝජිතව පැවතුණි.
06.	පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරයේ වැඩි දියුණු කිරීම් හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් 2018 අගෝස්තු 24 දින තෝරාගත්	2021 2022	රසායනාගාරයේ අලුත්වැඩියාවන් සිදුකර පර්යේෂණ කටයුතු හා	සත්ත්ව විෂාණු රසායනාගාරය වැඩි දියුණු කිරීම හා අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය නියමිත	රසායනාගාරයේ අලුත්වැඩියා කටයුතු 2024 සැප්තැම්බර් 30 දින වන විටත්

	කොන්ත්‍රාත්කරුවෙකුට 2018 දෙසැම්බර් 29 දිනට පෙර වැඩ අවසන් කිරීම සඳහා රු.3,273,873 ක වටිනාකමකට ගිවිසුම්ගතව කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. ගිවිසුම අනුව නියමිත අලුත්වැඩියා කිරීම් අවසන් නොකර කොන්ත්‍රාත්කරු විසින් ඉදි කිරීම් අත්හැරදමා තිබියදී 2020 අගෝස්තු 11 දින කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර තිබුණි. කෙසේ වුවද රසායනාගාරයේ අලුත්වැඩියාවන් නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් නියමිත අයුරින් ජීවාණුහරණ ක්‍රියාවලියක් සිදුකර ගැනීමට නොහැකි වීමත්, රසායනාගාරයේ පර්යේෂණ කටයුතු, එන්නත් සාර නිෂ්පාදන කටයුතු අපහසුතා සහිතව සිදු කරන බවත් නිරීක්ෂණය වූ අතර සමාලෝචිත වර්ෂයේදී ද නැවත අලුත්වැඩියා කිරීම් ආරම්භ කර නොතිබුණි.		නිෂ්පාදන කටයුතු බාධාවකින් තොරව ඉටුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	කාලසීමාව තුළදී නිම කිරීමට නොහැකිවීම හේතුවෙන් ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර ඇත.	නැවත ආරම්භ කර නොතිබුණි.
07.	2018 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ කුර හා මුඛ රෝග එන්නත් දේශීය නිෂ්පාදනය වඩි 359,760 ක් ලෙස දේශීය අවශ්‍යතාවයෙන් සියයට 25 ක් තරම් අවම මට්ටක පැවති අතර , ආනයනය සියයට 51 සිට සියයට 91 ක් තරම් ඉහල මට්ටමකින් වඩි 2,299,900 ක් ආනයනය කර තිබුණු අතර ඒ සඳහා රු.89,344,215 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව දේශීය නිෂ්පාදනය වැඩි කිරීමකින් තොරව ආනයනය වැඩි කිරීමේ ප්‍රවණතාවයන් නිරීක්ෂණය විය.	2022	දේශිය නිෂ්පාදනය වැඩි කර ආනයනය පාලනය කිරීමට කටයුතු කළ යුතුය.	එන්නත් නිපදවීමට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය හිඟතාවය හේතුවෙන් ආනයන ප්‍රමාණය වැඩි වූ බව	2021 හා 2022 වර්ෂයන්හි එන්නත් ආනයනය නතර කර තිබුණද දෙපාර්තමේන්තු වේ එන්නත් නිෂ්පාදනය වැඩි කිරීමට පියවර නොගැනීම හේතුවෙන් 2021,2022 හා 2023 වර්ෂයන්වල නිෂ්පාදනය පිළිවෙලින් 249,320 , 342,180ක් හා 162,840 ක් වැනි පහත මට්ටමක තිබුණි.
08.	අභිජනන කටයුතු සඳහා 2019 අප්‍රේල් මාසයේදී ඕස්ට්‍රේලියාවෙන් එළුවන් 100 ක්	2023	ශ්‍රී ලංකාවේ දේශගුණයට ගැලපෙන සතුන්	ආනයනිකසතුන්නවප රිසර තත්ත්වයන්ට පරිවර්තනය කළ යුතු	නිවැරදි වී නොමැත.

	ආනයනය කර තිබුණු අතර, එම එළුවන් අතරින් පිරිමි සතුන් 05 ක් සහ ගැහැණු සතුන් 16 ක් 2021 දෙසැම්බර් 31 දිනට මිය ගොස් තිබුණු අතර මිය ගිය එළුවන්ගේ වටිනාකම රු.8,036,275 ක් විය. මෙම වටිනාකම මූලික ආයෝජනයෙන් සියයට 21 ක් වන අතර, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට පෙර මිය යාම තුළින් මෙම සතුන් සඳහා එතෙක් දරන ලද ආනයනික හා නඩත්තු වියදම් ඵලදායී නොවන බවද නිරීක්ෂණය විය. එමෙන්ම එළුවන් ආනයනය කිරීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලය 2017 වර්ෂයේදී අනුමත කර තිබුණ ද, ආනයනය කර තිබුණේ 2019 වර්ෂයේදී බැවින් විනිමය අනුපාතයේ වෙනස්වීම මත රු.2,311,760 ක් අමතරව ගෙවීමට සිදුවී තිබුණි.		ආනයනය කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතුය.	අතර, එසේ පරිවර්තනය නොවන සතුන් මියයාම අපේක්ෂිතතත්ත්වයක් බව හා සත්ත්ව සෞඛ්‍ය සහතිකය (Health Protocol) පිළිබඳව ඕස්ට්‍රේලියාවේ නිරෝධායන ආයතනය සහ ශ්‍රී ලංකාවේ නිරෝධායන අංශ අතර අවසන් එකඟතාවයට පැමිණීමට නොහැකිවීම නිසා ආනයන ප්‍රමාද විය.	
09.	මධ්‍යම කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ 2015 වර්ෂයේ එවකට පැවති තාරා කොටුව රු.1,562,000 ක් වැය කර ගව ගාලක් බවට පරිවර්තනය කර තිබුණු නමුත් එය සමාලෝචිත දෙසැම්බර්31 වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි.	2021 2022	සම්පත් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුය.	පුං ගව පැටවුන්ගේ භාවිතය සඳහා යොදවා ගැනීමට අවශ්‍ය සේවකයින් නොමැති බැවින් එය ක්‍රියාත්මක ඉකළ නොහැකි වූ බව.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් භාවිතයෙන් තොරව පවතී.
10.	ඉඹුලන්දණ්ඩ එළු අභිජනන මධ්‍යස්ථානය පිහිටි අක්කර 37 ක ඉඩමෙන් අක්කර 10 ක් ද,කරඳගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි අක්කර 25 ක ඉඩමෙන් අක්කර 06 ක් ද උපයෝජනය කර නොතිබුණි.	2021	ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉඩම් උපයෝජනය කල යුතුය.	මෙම අක්කර 10 තුළ තෘණ වගාකර තිබුණ ද, වියළි කාලගුණය පැවති බැවින් වියළී ගොස් තිබෙන බව සහ කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානයේ අක්කර 6 ක් භාවිතයට ගැනීමට සැලසුම් කර තිබෙන බව.	මධ්‍යස්ථාන දෙකෙහි අක්කර 16 ක ඉඩම් භාවිතයෙන් තොරව2024 සැප්තැම්බර් 30 දින දක්වාපැවතුණි.

70. ශීර්ෂය - 293 රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	871,194,711	5,495,891	865,698,820	තත්ත්වාගණනය නොකළ
2022	876,945,548	6,597,870	870,347,678	තත්ත්වාගණනය නොකළ
2023	888,309,198	1,682,001	886,627,197	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලාභහානි සිදු වී වර්ෂ 04 ත් වර්ෂ 09 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 07 ක් සම්බන්ධයෙන් එකතුව රු.2,086,351 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	පාඩු හා හානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කාර්යක්ෂමව හා ඵලදායීව කටයුතු කළ යුතුය.	මෙම අලාභ හානි සිදු වී තිබූ සිද්ධීන් 07න් මු.රෙ. 103 සහ 104 පරීක්ෂණ සිදු නොකර තිබූ සිද්ධි 02ක් සම්බන්ධව පරීක්ෂණ සිදු කරමින් පවතින අතර සිද්ධි 03ක් සම්බන්ධව නීති උපදෙස් සඳහා යොමු කර ඇත. එක් සිද්ධියක් සම්බන්ධව වැරදිකරුගෙන් අය කර ගැනීමට හා අනෙක් සිද්ධිය සම්බන්ධව අධිකරණයේ නඩු කටයුතු විභාග වෙමින් පවතින බැවින් එම නඩු කටයුතු නිම වන තෙක් තබා ඇත.	අලාභහානි සිදු වී වර්ෂ 04 ත් වර්ෂ 09 ත් අතර කාලයක් ගත වී තිබුණු සිද්ධීන් 07 ක් සම්බන්ධයෙන් එකතුව රු.2,086,351 ක් වූ පාඩු හා හානිවීම් අයකර ගැනීමට හෝ කපා හැරීමට දෙපාර්තමේන් තුව විසින් කටයුතු කර නොතිබුණි.
02	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු රු.66,700,000 ක් වටිනා පර්චස් 75ක ඉඩමක් දෙපාර්තමේන්තුව විසින් 2009 වර්ෂයේ රු.59,304,347 ක් ගෙවා මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම මෙම ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත	2023 2022 2021	වසර 14කට පෙර ගෙවීම් කරන ලද මෙම ඉඩම් අප්‍රමාදව පවරාගෙන අවශ්‍ය ඉදිකිරීම් සිදු කර එම වත්කම් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගත යුතුය.	ඉඩමේ මිනුම් කටයුතු 2024 පෙබරවාරි මස සිදු කර ඇති අතර, මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මේ දක්වා ඉඩමේ පිඹුර සකස් කර ලබා දී නැත. ඉදිකිරීම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත.	ඉඩම රබර් සංවර්ධන දෙපාර්තමේන් තුව වෙත පවරාගෙන නොතිබුණු අතර වසර 14 කට වැඩි කාලයක් ගත වුවද මෙම ඉඩම කිසිදු ඵලදායි කාර්යයක

	පවරාගෙන නොතිබුණු අතර වසර 14 කට වැඩි කාලයක් ගත වූවද මෙම ඉඩම කිසිඳු ඵලදායි කාර්යයක යොදවා නොතිබුණි.				යොදවා නොතිබුණි.
03	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන නිල නිවාස 69ක නිත්‍යානුකූල අයිතිය වෙනත් රාජ්‍ය ආයතන සතුව පවතින අතර ඒවායේ අයිතිය විධිමත්ව පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	2022	නිල නිවාසවල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය.	නිල නිවාස පිහිටි ඉඩම්වල අයිතිය පවතින ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන්, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ හා රබර් පර්යේෂණායතනයන්, අදාළ ඉඩම් පවරා ගැනිමේ කටයුතු එම ආයතන සමඟ සම්බන්ධිකරණය සිදු කරමින් පවතින අතර, පසුගිය වසරේ ඉඩම් 04ක පැවරීම් කටයුතු සිදු කර ඇත.	නිල නිවාස පිහිටි ඉඩම් වල අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් කර නැත.
04	දිස්ත්‍රික්ක 15 ක වගාකරුවන් 32,563 ක් සඳහා රබර් නැවත වගාව සහ නව වගාව වෙනුවෙන් ලබාදුන් වගා සහනාධාර මුදලින් වගාව අතහැර දැමීම නිසා වගාකරුවන් 3,544 කගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.126,306,217 ක් අයවිය යුතුව තිබුණු නමුත් එම මුදල් අය කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	රබර් වගා සහනාධාර ලබාගෙන වගාව අතහැර දැමීමට හේතුවූ කරුණු පරීක්ෂා කර නැවත සහනාධාර ලබා දීමේදී එම අඩුපාඩු අවම කර ගැනීමට හා අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම සහනාධාර මුදල් අය කර ගැනීම සහ කපා හැරීම සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර, එම කමිටු වාර්තාව අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. අයකිරීම ඉතා අපහසු සහනාධාර මුදල්, මුදල් රෙගුලාසි 113 සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2024 අනුව කටයුතු කිරීමට රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇත.	අයවිය යුතු මුදල් මේ දක්වා අය කරගෙන නොමැත.
05	රබර් ඉඩම් සම්බන්ධව 2010/2011 වර්ෂයට පසුව සංගනණයක් සිදුකර	2023	රබර් වගාකර ඇති ඉඩම් ප්‍රමාණය පිළිබඳව නිවැරදි	2023/2024 වර්ෂයන් පදනම් කර ගනිමින් ඉඩම් සංගණනයක්	රබර් වගාකර ඇති ඉඩම් ප්‍රමාණය

	නොතිබුණු අතර රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2022 කාර්යසාධන වාර්තාව අනුව රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 138526 ක් ලෙස දක්වා ඇතත් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව රබර් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 98,583.56 ලෙස දක්වා තිබුණි.		තොරතුරු රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගත යුතුය	ක්‍රියාත්මක කරනු ලබන අතර එය 2024.12.31 අවසන් කිරීමට සැලසුම් කර ඇත.	පිළිබඳ නිවැරදි දත්ත දෙපාර්තමේන් තුව සතුව නොමැත.
06	වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශවලින් ලැබී වසර 08 සිට 12 දක්වා කාලයක් ගත වී තිබුණු මෙම දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන මෝටර් වාහන 03ක් හා යතුරුපැදි 16 ක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි	2023	දෙපාර්තමේන්තුව වෙත ලැබී භාවිතා කරනු ලබන මෙම වාහන හා යතුරුපැදිවල අයිතිය පවරා ගැනීමේ කටයුතු නොපමාව කළ යුතුය.	එවකට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබා දී ඇති මෝටර් වාහන 03 සහ යතුරුපැදි 16 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ නමට ලියාපදිංචි කර ඇති බැවින්, එම වාහන දෙපාර්තමේන්තුව වෙත පවරා දෙන ලෙස අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත.	මෝටර් වාහන සහ යතුරුපැදි මේ වන විටත් රබර් සංවර්ධන දෙපාර්තමේන් තුවට පවරාගෙන නොතිබුණි.
07	ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 05 ක් සහ ගණකාධිකාරී සේවයේ තනතුරු 01 ක් සඳහා 2021 වර්ෂයේ සිට නිලධාරීන් අනුයුක්ත කරවා ගෙන නොතිබුණි.	2023,2022,2021	කාර්යමණ්ඩල පුරප්පාඩුවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන පරිපාලන අංශ සමඟ සාකච්ඡා කර බඳවා ගැනීමේ කඩිනම් කළ යුතුය.	එම පුරප්පාඩු සම්බන්ධව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.	ජ්‍යෙෂ්ඨ මට්ට මේ පුරප්පාඩු යටතේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුරු 8ක් සහ අධ්‍යක්ෂ තනතුරු 04 ක පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදුකර නැත.
08	දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ක්‍රියාවලියට සෘජුවම දායක වන ජ්‍යෙෂ්ඨ රබර් සංවර්ධන නිලධාරීන් 9 ක්ද රබර් සංවර්ධන නිලධාරීන් 61 ද පුරප්පාඩුව පවතින අතර 2021	2023,2022,2021	කාර්යමණ්ඩල පුරප්පාඩුවල අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන පරිපාලන අංශ	විශ්‍රාම යාම, සේවයෙන් ඉල්ලා අස්වීම වැනි හේතු නිසා ඇතිවී තිබෙන මෙම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට රජයෙන් අනුමැතිය	සේවා අවශ්‍යතාවය මත අනුමත කාර්ය මණ්ඩල සංශෝධනයට හෝ ජ්‍යෙෂ්ඨ

වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කාලය තුල රබර් සංවර්ධන නිලධාරීන්ගේ පුරප්පාඩු වැඩිවීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය විය.		සමඟ සාකච්ඡා කර බඳවා ගැනීමේ කඩිනම් කළ යුතුය.	ලබා නොදීම මත රබර් සංවර්ධන නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව වැඩි වී ඇත.	රබර් සංවර්ධන නිලධාරීන් 8 ක් සහ රබර් සංවර්ධන නිලධාරීන් 66ක් සඳහා නිලධාරින් බඳවා ගැනීමට කටයුතු කර නොමැත.

71. ශීර්ෂය- 294 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තුමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	6,112,286,578	2,245,677,121	3,866,609,457	තත්ත්වාගණනය කළ
2022	6,235,700,352	2,038,023,992	4,197,676,360	තත්ත්වාගණනය කළ
2023	6,314,269,998	1,951,187,252	4,363,082,746	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනය නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 ඡේදය හා 7.2 ඡේදය ප්‍රකාරව යම් තනතුරකට වෙන් කරන ලද නිවාසයක් හැර අනෙකුත් සියළුම නිවාස වල බදු කාලය වර්ෂ 05 ක් වීම හා නියමිත බදු කාලසීමාව ඉක්මවා නිවාසයක පදිංචිව සිටින කාලපරිච්ජේදය වෙනුවෙන් දණ්ඩන කුලියක් අය කර ගත යුතුය යන කරුණු උල්ලංඝනය කරමින් වර්ෂ 05 ක බදු පදනම මත ලබා දුන් නිල නිවාස 12 ක බදු කාල සීමාව ඉක්මවා වර්ෂ 06 සිට 33 දක්වා කාලයක් ගත වී තිබුණද දණ්ඩන කුලියද නොගෙවමින් නිලධාරීන් දෙපාර්තමේන්තුවේ නිල නිවාසවල රැඳී සිටින බව නිරීක්ෂණය විය.	2021	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය	බදු කාලය වසර 05 කට වැඩියෙන් නිවාස වල රැඳිසිටි නිලධාරීන්ගෙන් දණ්ඩණ කුලිය පමණක් අයකිරීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල් උපදෙස් ලබා දී තිබුණ ද එම නිර්දේශය නැවත සමාලෝචනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි දෙපාර්තමේන්තුව තුළ කමිටුවක් පත්කර ඇත. එම කමිටුවේ නිර්දේශ මසක් ඇතුළත ලබාගැනීමට කටයුතු කරමින් සිටියි.	දෙපාර්තමේන්තුව සඳහා සුවිශේෂී වන පරිදි නව නීතියක් සකස් කිරීමට යෝජනා වී තිබුණ ද 2024 සැප්තැම්බර් 30 දින වන විටත් එවැනි නීතියක් අනුමත වී නොතිබුණි.
02	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ එකතුව රු.176,281,496 ක ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා එළැඹ තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය පරිදි එම ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර	2021 2022 2023	අතරමඟ නවතා ඇති මෙම ඉදිකිරීම් වෙනත් ක්‍රමයක් මඟින් සම්පූර්ණ කර ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ මුදල් පියවන ලෙස ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වෙත 2024.07.17 දින දන්වා ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම ඉදිකිරීම් සම්පූර්ණ කරගෙන නොතිබුණු අතර අයවිය යුතු මුදල් ද මේ වන විට ලැබී නොතිබුණි.

	(Terminate) තිබුණ ද, ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.69,558,270 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ වැඩ මූලික අත්තිකාරම් මුදලෙන් රඳවා ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.14,360,310 ක මුදලක් තව දුරටත් අය කර ගත යුතුව තිබුණි.				
03	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද ප්‍රකාරව මියගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.478,872 ක්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.724,136 ක් හා වැඩ තහනම් කර ඇති නිලධාරීන් 19 දෙනෙකුගෙන් රු.1,365,809 ක් වශයෙන් එකතුව රු. 2,568,817 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එයින් රු.1,077,431 ක් වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින ශේෂ විය.	2022 2023	හිඟ හිටි ණය ශේෂ හඳුනාගෙන ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 ඡේදය ප්‍රකාරව කටයුතු කර කඩිනමින් අය කර ගැනීමට පියවර ගත යුතුයි.	වර්ෂ 05 කට වැඩි ණය ශේෂ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගෙන ඇති අතර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදුකරමින් පවතී. වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම ණය ශේෂ අයකර ගෙන හෝ කපා හැර නොතිබුණි.
04	දෙපාර්තමේන්තුව සතු එකම සෆාරි උද්‍යානය වූ රිදියගම සෆාරි උද්‍යානය ආරම්භ කර වසර 08 ක් පමණ ගත වී තිබුණ ද, එම උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළව නිශ්චිත මාර්ගෝපදේශයක් පිළියෙල කර නොතිබුණි.	2023	උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශය ක් කඩිනමින් සකස් කර ගත යුතුය.	සෆාරි උද්‍යානය ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා වන මූලික කටයුතු සිදුකරන ලද අතර, එහි ඉදිරි කටයුතු සම්බන්ධයෙන් සාකච්ඡා වාර 02 ක් අවසන් කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් එවැනි මාර්ගෝපදේශයක් පිළියෙල කර නොතිබුණි.

05	රු.215,891,993 ක් වැය කර 2018 සහ 2019 වර්ෂවලදී සම්පූර්ණයෙන් නිමකර තිබූ රිදියගම සෆාරි උද්‍යානයේ ඉදිකිරීම් 10 කින් 06 ක් 2023 වර්ෂය අවසන් වන විටත් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	2023	මෙම වත්කම් ඵලදායීව උපයෝජනය කළ යුතුය.	මෙම කලාප තුළ ඇති ඉදිකිරීම්වල වැඩ අවසන් කර නොමැති කොටස් 2025 වර්ෂය තුළදී සම්පූර්ණ කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතින අතර ඉන් පසුව මෙම කලාප උපයෝජනය කිරීමට හැකිවනු ඇත.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම ඉදකිරීම් භාවිතයට ගෙන නොතිබුණි.
06	අක්කර 500 ක පමණ වපසරියකින් යුතු රිදියගම සෆාරි උද්‍යානයේ අක්කර 150 ක භූමි ප්‍රමාණයක් ආරම්භයේ සිටම උද්‍යානය සඳහා භාවිතයට ගෙන නොතිබුණි.	2023	උද්‍යානයේ භූමි ප්‍රදේශය ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතුය.	මේ වන විට භාවිතයට නොගන්නා ප්‍රදේශ තුළ සැලසුමට අනුව කලාප එකින් එක ඉදි කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.	2024 සැප්තැම්බර් 30 දින වන විටත් මෙම කාර්යයන් ඉටු කර නොතිබුණි.
07	රිදියගම සෆාරි උද්‍යානයේ 2023 වර්ෂයේ ජූනි 02 දින සිදු කළ බෙංගාලි ව්‍යාඝ්‍රයාගේ මරණ පරීක්ෂණ වාර්තාව අනුව එම ව්‍යාඝ්‍රයා විෂ ශරීර ගත වීමෙන් මරණයට පත්වී තිබුණු අතර සෆාරි උද්‍යානයේ රැකවරණයේ සිටින සතෙකු ස්වභාවික නොවන මරණයකට ගොදුරු වීම සම්බන්ධයෙන් විමර්ෂණ කටයුතු මේ දක්වා අවසන් කර නොතිබුණි.	2023	කඩිනමින් විමර්ශන කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය.	බෙංගාල ව්‍යාඝ්‍රයාගේ මරණය සම්බන්ධව 2023 වසරේ විමර්ශන කමිටුවක් පත්කළ අතර එම සත්වයාගේ පටක සාම්පල පිළිබඳව රස පරීක්ෂක වාර්තා මෙතෙක් නොලැබීම මත පරීක්ෂණයේ අවසන් වාර්තාව ප්‍රමාද වී ඇත.	මේ වන විටත් විමර්ශන කටයුතු අවසන් කර නොමැත.
08	රිදියගම සෆාරි උද්‍යානය තුළ සංචාරකයින් ප්‍රවාහනයට භාවිතා කරනු ලබන බස් රථයක් සඳහා ඉන්ධන ලීටර් 01 කින් කිලෝමීටර් 4.2 ක් ධාවනය කළ හැකි බව තහවුරු වුවද, ඉන්ධන තුලනය කිරීමේදී 2023 පෙබරවාරි දක්වා ලීටරයකට කිලෝමීටර් 1.16 ක් ලෙසද 2023 මාර්තු සිට කි.මී. 2.1 ක් ලෙසද තුලනය කර තිබීමෙන්	2023	ඉන්ධන තුලනය කිරීම නිවැරදිව සිදු කරමින් වාහන සඳහා ඉන්ධන භාවිතය කාර්යක්ෂමව සිදු කළ යුතු අතර වාහන පාලනයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට	බස් රථ දෙකක් අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති අතර අළුත්වැඩියාවෙන් පසු කඩිනමින් ඉන්ධන තුලනය කිරීමට කටයුතු සැලසුම් කර ඇත. ආරක්ෂක අංශයේ පවත්වාගෙන යන	බස් රථ වල එන්ජින් සර්විස් කිරීමෙන් පසු ඉන්ධන පරීක්ෂාවක් සිදු කර විගණනය වෙත ඉදිරිපත් කල යුතු වුවත්, 2024 සැප්තැම්බර් 30 දින වන විටත් එලෙස සිදු කර නොමැත.

ජනවාරි සිට ඔක්තෝම්බර් දක්වා බස් රථ 03 ක් සඳහා ඉන්ධන පිරිවැය රු.7,063,875 ක් වී තිබූ අතර එහි නිවැරදි පිරිවැය ආසන්න වශයෙන් රු.3,289,613 ක් වීමෙන් රු.3,774,262 ක් වැඩිපුර වියදමක් දරා තිබුණි. තවද, එම බස් රථ 03 හි 2023 ජූලි සිට ඔක්තෝම්බර් දක්වා ධාවන සටහන්වල දක්වා තිබූ දුර සහ ආරක්ෂක අංශයේ වාර්තා අනුව දුර අතර කිලෝමීටර් 2,190 ක වෙනසක් විය	කටයුතු කළ යුතුය.	වාර්තා නිවැරදිව පවත්වාගෙන යාමට උපදෙස් ලබා දී ඇත.

72. **ශීර්ෂය**- 295 **වානිජ දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	73,123,984	614,277	72,509,707	තත්ත්වාගණනය නොකළ
2022	77,656,946	307,139	77,349,807	තත්ත්වාගණනය නොකළ
2023	76,435,732	1,049,227	75,386,505	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	ශ්‍රී ලංකාව, තහනම් කළ සහ ක්‍රියාමාර්ගයක් ගත නොහැකි සහනාධාර මඟින් හා ප්‍රපාතනයෙන් දේශීය කර්මාන්ත ආරක්ෂා කිරීමේ අරමුණින් 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත හඳුන්වා දී තිබුණි. පනත හඳුන්වා දී වර්ෂ 05ක් ගතවී ඇතත් මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නියමයන් ගැසට් නොකිරීම හේතුවෙන් පනත ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.	2022 /2023	පනත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියමයන් කඩිනමින් ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.	නියමයන් ගැසට් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට කමිටුවක් පත් කර ඇති බව.	අවශ්‍ය නියමයන් ගැසට් කර නොමැත.

73. ශීර්ෂය- 296 ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	58,244,028	3,000,000	55,244,028	තත්ත්වාගණනය කළ
2022	66,167,636	3,216,619	62,951,017	තත්ත්වාගණනය නොකළ
2023	71,761,461	1,307,073	70,454,388	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනතේ 11 E වගන්තියට අනුව ප්‍රමිතියට පටහැනිව ආනයන සිදු කරන ආනයනකරුවන් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් එපරිදි කටයුතු කර නොතිබුණි.	2021	අදාල ආනයනකරුවන්ගේ විස්තර ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතු බව	ආනයනකරුවන් අසාධු ලේඛනගත කිරීමට (Black List) අදාළ ගැසට් නිවේදනය නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංශෝධන කීපයක් සිදු කරන ලෙස යෝජනා කර ඇත. එම සංශෝධන ඇතුලත් කර අදාල ගැසට් පත්‍රය ඉදිරියේදී ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරමින් පවතී.	අසාධු ලේඛනගත කළ යුතු ආනයනකරුවන් ගැසට් පත්‍ර මගින් ප්‍රකාශයට පත් කර නොතිබුණි.
02	දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණ, දැක්ම හා මෙහෙවර අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට අහිතකර ලෙස බලපාන ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වුවද, වර්තමානයේදී එක් එක් විෂයයන්ට අදාල ආයතන විසින් සිදු කරන ඉල්ලීම් මත පදනම්ව බලපත්‍ර නිකුත් කිරීමේ කටයුතු පමණක් සිදුකර තිබුණි. එබැවින් මෙම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණ ඉටු වන ආකාරයට කටයුතු කිරීම සඳහා පිළිගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් හෝ ක්‍රියා පටිපාටියක් නොමැති බව	2021	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිහිටුවීමේ අරමුණු, දැක්ම, හා මෙහෙවර අනුව අහිතකර ආනයන හා අපනයනයන් පාලනය කිරීමට කටයුතු කළ යුතු බව.	දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශනය මගින් ශ්‍රී ලංකාවේ ජාතික, ආර්ථික පරිසරය, මහජන සෞඛ්‍ය සහ මහජන ආරක්ෂාව අන්තර්ගත සමස්ථ පද්ධතිය ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම ප්‍රධාන අරමුණ වේ. මේ නිසා මෙම දෙපාර්තමේන්තුවෙන් ආනයන හෝ අපනයන පාලන බලපත්‍රයක් නිකුත් කිරීමට පෙර ඉන් ලැබෙන බලපත්‍ර ගාස්තු හෝ අතිරේක ගාස්තු	අහිතකර ආනයන හා අපනයනයන් පාලනය කිරීමට අවශ්‍ය පද්ධතියක් සකස් කර නොතිබීම නිසා බලපත්‍ර රහිතව මෙන්ම තහනම් ද්‍රව්‍යයන් ද ආනයන කටයුතු සිදු වෙමින් පැවතුණි.

	විගණනයට නිරීක්ෂණය විය.			පමණක් නොව එම බලපත්‍රය නිකුත් කිරීමේ දී ඉහත කී සමස්ත පද්ධතියටම ප්‍රතිලාභ සහ සමාජීය පිරිවැය ගැන සළකා නිකුත් කරන අතර ආනයනය හෝ අපනයනය කරනු ලබන භාණ්ඩ සම්බන්ධව ක්‍රියා කරනු ලබන ව්‍යවස්ථානුකූලව ආයතන ස්ථාපිත කර ඇත්නම් එම ආයතන වල නිර්දේශය මත පදනම්ව ආනයන හා අපනයන පාලන බලපත්‍ර ලබා දෙනු ලබයි.	
03	දෙපාර්තමේන්තුව විසින් මෘදුකාංග සංවර්ධනය සඳහා අනුමත කරන ලද ආයතන සමඟ මෘදුකාංග පද්ධති සම්බන්ධ කිරීම, ජාලගත වීම හා ජාලගත අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීම වැනි කටයුතු සිදු කිරීම සඳහා ICTA ආයතනය සමඟ 2017 පෙබරවාරි 09 දින අවබෝධතා ගිවිසුම අත්සන් කර තිබූ අතර ඒ අනුව අරමුදල් සැපයීම ICTA ආයතනය විසින් සිදු කළ යුතුව පැවතුණි. නමුත් මේ සඳහා විසර්ජන පනතින් ද 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.9,080,000 ක් ලබාගෙන තිබුණු අතර ඉන් රු. 8,119,035 ක් විවිධ කාර්යයන් සඳහා වියදම් කර තිබුණි.	2021	සැලසුම් කළ පරිදි නියමිත දිනට කාර්යය ඉටු කරවා ගැනීමට ක්‍රියාකාරීව මැදිහත් වී ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කළ යුතු බව	මෙම දෙපාර්තමේන්තුව ICTA ආයතනය සමඟ 2017.02.09 දිනැතිව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මඟින් දෙපාර්තමේන්තුව සඳහා ජාලගත බලපත්‍ර නිකුත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම සඳහා එකඟ වී තිබිණි. ඒ අනුව මෙම වැඩසටහන සකස් කිරීම සඳහා වන අවශ්‍ය ප්‍රතිපාදන සෘජුවම **ICTA** ආයතනය වෙත ලබා දී තිබුණි. ඒ අනුව **ICTA** ආයතනය විසින් තෝරා ගන්නා ලද ආයතනයක් මඟින් පරිගණක වැඩසටහනක් සකස් කර එහි පළමු අදියර දියත් කිරීම සඳහා පියවර ගෙන තිබුණි. නමුත් මෙම අදියර දෙපාර්තමේන්තුවට සෑහිමකට පත්වන මට්ටමේ නොපැවතිම මත ඒවා නිවැරදි කරන ලෙස ලිඛිතව හා පවත්වන රැස්වීම් මඟින්	ICTA ආයතනය සමඟ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද වැඩසටහන අතරමඟ නවතා දමා තිබුණි.

				ICTA ආයතනය වෙත දැනුම් දුන්නද ඒ සඳහා අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනිමට නොහැකි විය. එබැවින් මෙම දෙපාර්තමේන්තුවේ පැවති අභ්‍යන්තර පරිගණක පද්ධතිය සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරිම් සිදු කිරීමෙන් පාරිභෝගික ජනතාව වෙත මාර්ගතව ලියාපදිංචි වීමටත්, අයදුම්පත් ඉදිරිපත් කිරිමටත් ,ගෙවීම් කටයුතු සිදු කිරිමට හා හරපත්‍ර ලබා ගැනිමටත් හැකිවන පරිදි ක්‍රියාකාරි සේවා ලබා දීමට පියවර ගන්නා ලදී.	
04	සීනි කිලෝග්‍රෑම් එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බදු රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් බලාපොරොත්තු වූ සහනය පාරිභෝගික ජනතාවට ලැබීම පිළිබඳව අධ්‍යයනය කිරිම සඳහා වූ විශේෂ විගණනයේ දී පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරුණි. **(i)** ආනයනික සීනි සඳහා බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දෙමින් 2020 ඔක්තෝබර් 29 දිනැති අංක 2199/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය නිකුත් කිරීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු කර තිබුණ ද මේ සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදයන් පිළිබඳ උපදෙස් මුදල් අමාත්‍යාංශය විසින් ලබා දී ඇති බව නිරීක්ෂණය නොවිය. ඒ අනුව සීනි ආනයනය පාලනය කිරීමට අවශ්‍ය නිර්ණායක හඳුන්වා දීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සීනි ආනයනය සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත්	2021	ගැසට් මගින් ආනයන මත පනවා තිබූ පාලනයන් රජයේ අපේක්ෂාවන් පරිදි ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව	මේ හරහා එකල මූලික අරමුණව පැවති විදේශ විනිමය ගලා යාම පාලනය කිරීමේ රජයේ අපේක්ෂාව දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී.	ආනයනයන් සීමා කිරීම හෝ පාලනය කිරීමේ අරමුණින් බලපත්‍රයක් හඳුන්වා දුන්න ද ඒ වන විට පවතින තොගය පිළිබඳව දත්ත ආදිය දෙපාර්තමේන් තුව සතුව නොපවතින අතර අතිරේක ගාස්තු අයකර බලපත්‍ර රහිතව සිදුකළ ආනයනයේදී නිෂ්කාශණයට අවසර දීම මත රජය අපේක්ෂා කරන පාලනයක් මේ වන විට ද සිදු වී

කළ සියලුම ඉල්ලුම්කරුවන්ට ඔවුන් ආනයනය කිරීමට ඉල්ලුම් කළ සියලු තොගයන් ආනයනය කිරීමට ආනයන හා අපනයන පාලක විසින් අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව මෙලෙස ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් සිය වෘත්තීමය වගකීම මැනවින් ඉටුකර නොමැතිවීම හේතුවෙන් ආනයන බලපත්‍ර හඳුන්වා දීම මඟින් ආනයනය පාලනය කිරීමේ හෝ විනිමය ගලායාම පාලනය කිරීමේ රජයේ අපේක්ෂාවන් බලාපොරොත්තු වූ පරිදි ඉටු වී නොතිබුණි.				නොතිබුණි.
(ii) සීනි ආනයනය සඳහා වන බලපත්‍ර ක්‍රමය 2020 ඔක්තෝබර් 30 දින සිට ක්‍රියාත්මක වුවද බලපත්‍ර නිකුත් කිරීම 2020 නොවැම්බර් 18 වන දින දක්වා ප්‍රමාද වී ක්‍රියාත්මක කර තිබුණි. ඒ අනුව බලපත්‍ර ක්‍රමය හඳුන්වාදීමෙන් පසුව බලපත්‍ර නිකුත් කිරීම ප්‍රමාද කළ කාල පරිච්ඡේදය තුළ සීනි මෙ.ටො. 101,527 ක් බලපත්‍ර නොමැතිව ආනයනය කිරීමට ආනයනකරුවන් 18 ක් කටයුතු කර තිබුණි.	2021	ගැසට් මගින් ආනයන මත පනවා තිබූ පාලනයන් රජයේ අපේක්ෂාවන් පරිදි ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව	හදිසි ප්‍රතිපත්තිමය තීරණයක් මත ගැසට් පත්‍රයක් නිකුත් කලද ආනයනකරුවන් කිහිපදෙනකු ඒ වන විටත් ණයවර ලිපි විවෘත කර ,භාණ්ඩ ඇනවුම් කර හෝ සැපයුම්කරුවන් වෙතින් අදාල භාණ්ඩ වරායන් වෙත ප්‍රවාහනය කරමින් ආනයන ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. එසේවුවද, යම් කිසි භාණ්ඩයක් ආනයනය බලපත්‍ර පාලනයට යටත් කළ විට එම භාණ්ඩ නැව්ගත කිරීමට පෙර බලපත්‍ර ලබා ගැනීම අපේක්ෂා කෙරේ. නමුත්, බලපත්‍ර ලබා නොගෙන ආනයනය කළද මෙම සීනි තොග නිෂ්කාශනය කිරීමට වලංගු ආනයන පාලන බලපත්‍රයක් ශ්‍රී ලංකා රේගුවට ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව මෙලෙස බලපත්‍ර නොගෙන ආනයනය කරන සීනි	-එම-

			සඳහා බලපත්‍ර ගාස්තුවක් සහ අමතර ගාස්තුවක් ද අයකර රේගුවෙන් නිෂ්කාශනය කර ඇත.	
(iii) 2016 පෙබරවාරි 11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව බලපත්‍ර නොමැතිව ආනයනය කරන ලද භාණ්ඩ සඳහා මි.ර.ගැ වටිනාකමින් සියයට 05 ක අතිරේක ගාස්තුවක් අය කළ යුතු වුවද ආනයන බලපත්‍ර නොමැතිව ආනයනය කර තිබූ සීනි තොගවල මි.ර.ගැ වටිනාකමින් සියයට 2 ක් පමණක් අය කිරීමට ආනයන හා අපනයන (පාලන) ජනරාල් විසින් තීරණය කර තිබුණි. එලෙස දඩ මුදල අඩුකර අය කිරීම සඳහා ආනයන අපනයන දෙපාර්තමේන්තුවට බලතල ඇතිබව නිරීක්ෂණය නොවූ අතර බලපත්‍ර රහිතව ආනයනය කර තිබූ සීනි මෙ.ටො. 294,085 ක් සඳහා එලෙස ගාස්තු අඩු කිරීම හේතුවෙන් රජයට අයවිය යුතු රු.433,523,216 ක මුදලක් අහිමි වී තිබුණි.	2021	ගැසට් මගින් ආනයන මත පනවා තිබූ පාලනයන් රජයේ අපේක්ෂාවන් පරිදි ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව	2016.02.11 දිනැති අංක 1953/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ **III** උපලේඛනය අනුව අතිරේක ගාස්තුව අවස්ථානුකූලව**,** භාණ්ඩ නැව්ගත කළ නමුත් භාණ්ඩ වරායට ලගා වීමට පෙර ආනයන පාලන බලපත්‍ර ලබා ගන්නා විට මි.ර.ගැ. වටිනාකමින් 4%ක් ලෙස සහ භාණ්ඩ වරායට ලගා වූ පසුව ආනයන පාලන බලපත්‍ර ලබා ගන්නා විට මි.ර.ගැ. වටිනාකමින් 5%ක් ලෙස අතිරේක ගාස්තුවක් අය කළ යුතු බව දන්වා තිබුණි.	රජයට අහිමි වූ අඩුකරන ලද දඩ මුදල අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.
(iv) සීනි සඳහා ආනයන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් නිරීක්ෂණය වන්නේ බදු අඩු කිරීමෙන් පසු විශාල වශයෙන් සීනි ආනයනය කිරීම පාලනය කිරීම වේ. එහෙත් බලපත්‍ර නිකුත් කිරීමට පෙර මාසික සාමාන්‍යය ආනයනය කළ මෙ.ටො. ප්‍රමාණය 41,779 ක් වූ අතර බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමෙන් පසු එය මාසිකව මෙ.ටො 61,714 ක් පමණ වන අතර එය සියයට	2021	ගැසට් මගින් ආනයන මත පනවා තිබූ පාලනයන් රජයේ අපේක්ෂාවන් පරිදි ඉටු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව	ශ්‍රී ලංකා රේගුවෙන් ලද 2020 වර්ෂයට අදාල ආනයනික සීනි පිළිබඳ දත්ත අනුව මාසික සීනි ආනයනය 58,385 **MT** පමණ වේ. නමුත් බලපත්‍ර ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව එය 61,055 **MT** පමණ වේ. එය ආසන්න වශයෙන් 4.6% පමණ වර්ධනයකි.	බලපත්‍ර හඳුන්වා දීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම පිණිස සම්බන්ධිත ආයතන සමඟ දෙපාර්තමේන්තුව මේ දක්වා මාර්ග ගත පරිගණක පද්ධතියක් හරහා සම්බන්ධ වී නොතිබුණි.

	47 කින් පමණ ආනයන වැඩිවීමකි. ඒ අනුව බලපත්‍ර ක්‍රමයක් හඳුන්වා දීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටු වී ඇති බවක් නිරීක්ෂණය නොවීය.				
05	එලදායී තොරතුරු තාක්ෂණික පද්ධතීන් උපයෝගී කර ගනිමින් රජයේ ආදායම එකතු කිරීම, වැඩිදියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් විසින් සහ පාර්ශවකරුවන් අතර ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහා වූ 2016 නොවැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අතුරු වාර්තාවේ නියෝග පරිදි "ආයතන විසි අටක සම්බන්ධීකරණය ඇතිව, බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල ආයතන වෙතින් අන්තර්ජාලය ඔස්සේ නිර්දේශ ලිපි ලබා ගැනීමට සැලසුම් සකස් කළ යුතු බව දන්වා" තිබුණද එම නිර්දේශය විගණන දිනය වූ 2023 මාර්තු 23 වන විටත් ක්‍රියාත්මක වී නොතිබුණි.	2022	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝගයන්ට අනුකූල විය යුතු බව	2016 නොවැම්බර් 23 දින පැවති රජයේ ගිණුම් පිලිබද කාරක සභාවේදී ප්‍රකාශ කරන ලද්දේ ඒ වන විට සැලසුම් කර තිබූ වැඩසටහනට අනුව තත්වයන්ය. මෙම වැඩසටහන් සකස් කිරීම 2017 වර්ෂයේදී ICTA ආයතනය විසින් ඔවුන්ගේ පිරිවැය යටතේ ඉටු කර දීමේ වගකීම භාර ගෙන තිබුනි. එසේ වුවද මෙම ආයතනය විසින් පරිගනක පද්ධතිය වැඩි දියුණු කිරීමේ කටයුතු නිවැරදිව අවසන් නොකිරීම හේතුවෙන් එම කටයුතු අතහැර දැමීමට සිදුවිය. එබැවින් දෙපර්තමේන්තුව විසින් මාර්ගගත පරිගනක පද්ධතියක් වැඩි දියුණු කිරීමේ කටයුතු නැවත ආරම්භ කරන ලද අතර, ඒ අනුව ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය යටතේ ක්‍රියාත්මක EXBS වැඩසටහන වෙතින් ප්‍රදානයක් වශයෙන් මාර්ගගත පරිගණක පද්ධතියක් ලබා දීමට එකගතාවය පල කල අතර එම වැඩසටහන සකස් කිරීමේ කටයුතු 2023 අප්‍රේල් මස සිට ආරම්භ කරන ලදි. මෙම පරිගනක පද්ධතිය	මාර්ග ගත පරිගණක පද්ධතියක් හරහා සම්බන්ධ වී නොතිබුණි.

				සකස් කිරීමෙ කටයුතු 2024 පෙබරවාරි මස වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර එම වැඩසටහන යටතේ නිර්දේශ ලබා දුන් ආයතන මාර්ගගතව සම්බන්ද කිරීම සඳහා කටයුතු සුදානම් කර ඇත.	
06	අපනයන පාලනයට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් නිවේදන ප්‍රකාශයට පත් කිරීම ද දෙපාර්තමේන්තුවේ වගකීම් සහ කාර්ය භාරයන් වශයෙන් දැක්වුවද, ආනයන පාලනයට අදාළ කාර්යයන්හි පමණක් නිරතවී තිබුණු අතර 2017 වසරෙන් පසුව අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කළ බවට විගණනයට නිරික්ෂණය නොවුණි.	2023	දෙපාර්තමේන්තුව පිහිටුවීමේ වගකීම් සහ කාර්ය භාරයන් නිසි පරිදි ළඟා කර ගැනීමට උනන්දු විය යුතු බව	මෙම දෙපාර්තමේන්තුව භාණ්ඩ ආනයන හා අපනයන පාලනය මගින් මෙරට ආර්ථිකයට අහිතකර ලෙස බලපාන තත්ත්ව පාලනය මෙන්ම රටේ ආරක්ෂාව, මහජන සෞඛ්‍ය හා පරිසර සංරක්ෂණයට අහිතකර තත්ත්වයන් පාලනය කිරීම ද සිදු කරනු ලබයි. එහි දී වැඩි බලපෑමක් සිදු වන්නේ මෙරටට ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් වන බැවින් ආනයන පාලනය සඳහා වැඩි අවධානයක් යොමු කරනු ලබන අතර මෙරටින් අපනයනය කරන භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අංක 2044/41 හා 2017.11.09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අපනයන පාලනයට යටත් කර ඇත.	2017 වසරෙන් පසුව අපනයනයන්ට අදාළ කිසිදු රෙගුලාසියක් නිකුත් කර නොතිබුණි.

07	නිර්දේශිත කාලය ඉක්ම වූ වාහන සහ කොටස්කර ගෙන්වනු ලබන වාහන ආනයනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කරන ලෙස 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණ ද, එවැනි ප්‍රතිපත්තියක් සකස්කර නොතිබුණු අතර ඖෂධ නිෂ්පාදනයට ගෙන්වන ස්ප්‍රිතු පිළිබඳ පසු විපරම් කරන ලෙස දැනුම් දී තිබුණ ද, එය ද ඉටුකර නොතිබුණි.	2023	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූල විය යුතු බව	වාහන ආනයනය සඳහා වන ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම ජනාධිපති ලේකම් කාර්යාලය විසින් පත් කළ කමිටුවක් මගින් සිදු කර ගෙන යනු ලබන අතර එම වාර්තාව නිකුත් කිරීමෙන් පසුව ඊට අනුකූලව කටයුතු කිරීම සඳහා සටහන් කර ගෙන ඇති බව දන්වා තිබුණි.	වාහන ආනයනය සඳහා ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණු අතර ඖෂධ නිෂ්පාදනයට ගෙන්වන ස්ප්‍රිතු පිළිබඳ පසු විපරම් සිදු කිරීමක් ද වී නොතිබුණි.
08	සි ෂෙල්ස් සිට තායිලන්තය දක්වා ගමන් කළ මත්ස්‍යයින් ගබඩා කළ බහාළුම් රැගත් නෞකාවක් කොළඹ වරායට ආසන්න මුහුදු ප්‍රදේශයේ දී කාර්මික දෝෂයකට ලක් වී විදුලි සැපයුම නතර වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වරාය අධිකාරිය වෙත ළඟා වී තිබුණු අතර විදේශීය නෞකාවේ දේශීය නියෝජිතයා මගින් සොයාගත් දේශිය පෞද්ගලික ආයතනයකට දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ආනයන බලපත්‍රයක් මත කාබනික පොහොර නිෂ්පාදනය සඳහා මෙම මාළු බහාළුම් 2022 මාර්තු 09 වන දින විකුණා තිබීම සම්බන්ධව සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ දී කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගත් අප-මාළු (Fish-Waste) අඩංගු බහාලුම් 15 පිළිබඳව සොයා බලා අපහරණය සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස 2024 ජනවාරි 23 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබුණ ද එම නියෝගය දෙපාර්තමේන්තුව විසින් ඉටුකර නොතිබුණි.	2023	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නියෝගයන්ට අනුකූල විය යුතු බව.	කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා නොගත් අප-මාළු අඩංගු බහාලුම් 15 සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය ලද පසු ඉතා ඉක්මනින් අපහරණය කිරීම ආරම්භ කරන බව දන්වා තිබුණි.	අප-මාළු (Fish-Waste) අඩංගු බහාලුම් 15 අපහරණය කර නොතිබුණි.

74. ශීර්ෂය- 297 සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	22,760,428	22,760,428	-	තත්ත්වාගණනය කළ
2022	21,584,525	21,584,525	-	තත්ත්වාගණනය කළ
2023	21,928,650	21,928,650	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01.	2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම්වලින් අයවිය යුතු හිඟ ආදායම රු.1,529,339,000 ක් වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	හිඟ ආදායම් නිවැරදිව වාර්තා කිරීමට හා කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.	වාර්ෂික වාර්තා ගොනු කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට හා ලේකම්වරුන්ට ලිපි මගින් හා මාර්ගගත ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සමාගම්වලට විද්‍යුත් තැපැල මගින් පණිවිඩ යොමු කළ බව.	මේ දක්වා අයකරගෙන නැත.
02.	1891 අංක 16 දරන සමිති ආඥා පනතේ (123 වන අධිකාරිය) 8(1) (ඇ) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා ගොනුකළ යුතු ලියාපදිංචි සමිති 11,940 කින් රු.13,731,000 ක ආදායමක් රැස්කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	පනත ප්‍රකාරව ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය.	වාර්ෂික වාර්තා ගොනු නොකරන සමිතිවල නාමය කපා හැරීමට කටයුතු කරන බව දන්වා ලිපි යැවීම.	මේ දක්වා අයකරගෙන නැත.
03.	සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ඍජු අධීක්ෂණයට යටත්ව, සමාගම් පනත උල්ලංඝනය කරන සමාගම් පිළිබඳව නීතිමය කටයුතු කිරීම සහ අධිකරණ නඩු සඳහා නියෝජිතයෙකු ලෙස පෙනී සිටීම යනාදී කාර්යයන් ඉටු කරන ද්විතීයික මට්ටමේ තනතුරක් වන සමාගම් පරීක්ෂක තනතුර සඳහා අනුමත තනතුරු 10 න්, තනතුරු 05 ක්ම පුරප්පාඩුව පැවතිණි.	2023 2022	සමාගම් පනත බලාත්මක කිරීමට අත්‍යවශ්‍ය තනතුරුවල පුරප්පාඩු ඇති නොවීමට වගබලාගත යුතුය.	කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය සඳහා වූ නිලධාරී කමිටුව වෙත යොමු කිරීම සඳහා වූ ලිපිය අමාත්‍යාංශය වෙත 2024 අගෝස්තු මස යවා තිබීම.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

04.	දෙපාර්තමේන්තු කටයුතු e – 2023 ROC පරිගණක පද්ධතිය හරහා මාර්ගගතව සිදු කරන පසුබිමක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී අනුමත තනතුරු 03න් තනතුරු දෙකක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරෙහි අනුමත තනතුරු 06 න් තනතුරු 3ක් තනතුර අනුමත කළ දින සිටම පුරප්පාඩු වී පැවතුණි.	තොරතුරු තාක්ෂණ අංශයේ පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතුය.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු එකඟතාව 2024 මැයි මස ලිපියෙන් දී නොතිබූ අතර 2024 ජුලි මස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීම.	පුරප්පාඩු පුරවා නැත.

75. ශීර්ෂය- 298 මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	1,466,181,937	1,466,181,937	-	තත්ත්වාගණනය කළ
2022	1,466,428,500	1,466,428,500	-	තත්ත්වාගණනය කළ
2023	1,470,136,819	1,470,136,819	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කටයුතු ඉටු කිරීම පිණිස සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කල යුතු වුවද 2021 සැප්තැම්බර් 06 දිනෙන් පසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.	2023 2022	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කිරීම කල යුතුය.	අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට රාජ්‍ය පරිපාලන ලේකම් වෙත දන්වා ඇති බව.	මේ දක්වා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොමැත.
02	2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්යමණ්ඩලය 19 ක් වූ අතර ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ තනතුරු 08 ක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරු 01 ක් සහ ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ තනතුරු 01 ක් ඇතුළුව තනතුරු 10 ක් එනම්, සියයට 53 ක් 2011 වසරේ සිට පුරප්පාඩුව පැවතුණි. අනුමත තෘතියීක මට්ටමේ තනතුරු 30 ක් අතුරින් කළමනාකරණ සේවා නිලධාරි සේවය (අධි ශ්‍රේණිය) තනතුරු 01 ක්ද දෙපාර්තමේන්තුගත තනතුරු 04 ක්ද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (අධි ශ්‍රේණිය) තනතුරු 23 ක්ද ඇතුළුව 28 ක් එනම්, සියයට 93 ක් පුරප්පාඩුව පැවතුණි.	2023 2022 2021	තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය.	රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇති බව සහ තෘතීයික මට්ටමේ තනතුරු 25 ක් සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ අවසන් කෙටුම්පත 2024.03.22 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමුකර ඇති අතර ඉතිරි තනතුරුවලින් 04 ක් සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත උපදෙස් ලබා දී නොමැති බව.	තනතුරු පුරප්පාඩු මේ දක්වා පුරවා නොමැත.

76. ශීර්ෂය- 299 ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	13,251,113	13,251,113	-	තත්ත්වාගණනය නොකළ
2022	13,323,415	13,323,415	-	තත්ත්වාගණනය නොකළ
2023	13,228,376	13,228,376	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයෙන් (ICTA) සර්වර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා 2016 දෙසැම්බර් 30 දින අවබෝධතා ගිවිසුමකට එළඹ, එදිනම රු.මිලියන 32.5 ක් ගෙවීම් කර තිබුණි. එහෙත් එම ගිවිසුම සේවා දායක විසින් කඩකිරීම නිසා ගෙවන ලද මුදල ආපසු ගෙවීම කඩිනම් කරන මෙන් අදාළ රේඛීය අමාත්‍යාංශය සහ තාක්ෂණ අමාත්‍යාංශය මඟින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත 2024 පෙබරවාරි 16 දින ඉල්ලීම් කර තිබුණද වාර්තාවේ දින වනවිටත් මුදල් ලැබී නොතිබුණි. එම නිසා 2023 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සර්වර් පහසුකම් සම්පාදනය කිරීම ඇතුළත් කර ඇතත් එය ඉටුකරගැනීමට නොහැකි වී තිබුණි.	2023 2022 2021	මුදල් අය කරගැනීමට කටයුතු කළ යුතුය.	2024.02.16 දිනැතිව අධ්‍යක්ෂ ජනරාල් විසින් හා 2024.04.19 දිනැතිව රේඛිය අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිපි යොමු කර ඇති බව.	මේ දක්වා අය කර ගෙන නැත.
02	අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වසර 4 ක කාලයක සිට ස්ථිර විගණකවරයෙක් පත් කර නොතිබුණි.	2023 2022 2021	විගණන පනතේ 40 වගන්තියට අනුකූල විය යුතුය.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉල්ලීම් කර තිබීම.	මේ දක්වා අභ්‍යන්තර විගණනවරයෙක් පත්කර නැත.
03	අනුමත පේටන්ට් නිලධාරී	2023	ආයතනයේ	ගැසට් පත්‍රයේ පළ	නිර්දේශ

	තනතුරු 10 දෙපාර්තමේන්තුගත තනතුරු වූ නමුත් ඒ සඳහා සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන් බුද්ධිමය දේපළ විෂය සම්බන්ධව දේශීය හා විදේශීය පුහුණු අවස්ථා 3 සිට 26 ක් දක්වා ප්‍රමාණයකට සහභාගී කරවා තිබුණ ද, වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ ස්ථාන මාරුවීම් සිදුවන බැවින් පේටන්ට් ක්ෂේත්‍රයට අදාළව ලබාගත් පුහුණුව පේටන්ට් අංශයේ ඉදිරි කාර්යසාධනයට යොදාගත නොහැකිවීමේ අවධානමක් පැවතුණි.	2022	කාර්යසාධනය රැකෙන ලෙස පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය.	කිරීම සඳහා වූ විභාග දැන්වීම, අමාත්‍යාංශය වෙත යොමු කර තිබීම.	ක්‍රියාත්මක කර නැත.
04	වෙළඳ ලකුණ ලියාපදිංචි කිරීම, අලුත් කිරීම, වෙනස් කිරීම, පැවරීම සහ අවසර ගිවිසුම් ඇතුලු කටයුතු පැවරී තිබූ බුද්ධිමය දේපළ නිළධාරී තනතුරු 13 න් තනතුරු 08 ක් විගණන දිනය වන විට පුරප්පාඩු වී තිබුණි.	2023 2022	ආයතනයේ කාර්යසාධනය රැකෙන ලෙස පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුය.	මෙම පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් විභාගය පැවැත්වීමට අදාළ ගැසට් නිවේදනයේ කෙටුම්පත සකස් කර අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකළ බව.	තවදුරටත් පුරප්පාඩු පවතී.

77. ශීර්ෂය - 300 ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	4,936,914,430	4,936,914,430	-	තත්ත්වාගණනය කළ
2022	5,018,678,671	5,018,678,671	-	තත්ත්වාගණනය කළ
2023	5,029,112,416	5,029,112,416	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	වෙයන්ගොඩ විද්‍යාත්මක ගබඩාව සම්බන්ධයෙන් 2012/2013 වර්ෂයන් හි සහල් මෝල් හිමියන් සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව එක් සහල් මෝල් හිමියෙකුගෙන් ලැබිය යුතු රු.6,102,932 ක් වූ මුදල අයකර ගෙන නොතිබුණි.	2021	හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාකල යුතුයි.	අවිස්සාවේල්ල දිසා අධිකරණයේ නඩු අංක 29904/**M**/22 යටතේ නඩු පවරා ඇත. අදාල නඩුව 2024.11.27 දින කැඳවීමට නියමිතය.	මේ දක්වා අයකරගෙන නැත.
02	නිවාස 366 ක නිවාස සංකිර්ණයක් වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් තනවා 1981 නොවැම්බර් 21 දින ආහාර හා සමූපකාර අමාත්‍යාංශය වෙත නිල වශයෙන් භාර දී තිබූ ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ ඉඩම විගණිත දින වන විටත් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි.	2022	කඩිනමින් ඉඩම පවරා ගැනීමට කටයුතු කල යුතුයි.	ඉඩම පවරා ගැනීමට කටයුතු සිදුකරමින් පවතී.	මේ වන විටත් ඉඩම පවරාගෙන නැත.
03	2023 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පතු ගිණුම් 3 කට අදාලව රු.121,171,943 ක ශේෂයක් පැවතුණි. එම ශේෂය තුල වසර 01 ත් 05 ත් අතර රු.51,765,801 ක ශේෂයක් ද, වසර 05 ට වැඩි රු.54,522,200 ක ශේෂයක් ද වූ අතර ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබිණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	කොන්ත්‍රාත් සඳහා රැඳවුම් මුදල් අදාල ආයතන විසින් ඉල්ලුම් කර නොතිබීම, නෛතික ක්‍රියාමාර්ග පැවතීම සහ දැනට භාවිතා කරන නිවාස හා ගබඩා පැවතීම යන කරුණු මේ සඳහා බලපා ඇත. ඉදිරියේදී මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු සිදු කරනු ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
04	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ලෙස දකුණු ආසියාතික කලාපීය රටවල සහයෝගීතා	2023	ප්‍රධාන කාර්යයන් ඉටුකර ගැනීමට	මෙට්‍රික් ටොන් 8000 ක සහල් සංචිතයක් පවත්වා ගැනීමට	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

	සංවිධානයේ කොළඹ ප්‍රඥප්තිය හා 16 වන සමුළු රැස්වීම අනුව මෙට්‍රික් ටොන් 8000 ක විශේෂිත සහල් සංචිතයක් පවත්වාගෙන යාම වෙනුවෙන් රුපියල් මිලියන 100 ක ප්‍රතිපාදනයක් ඇස්තමේන්තු කර තිබුණ ද එම මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණු අතර කිසිදු සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නොතිබිණි. ඒ අනුව ආරක්ෂිතව, අඛණ්ඩව, පෝෂ්‍යදායී ධාන්‍යමය ආහාර සැම නිවසකටම යන දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.	රු. මිලියන 1,996 ක් ඉල්ලුම් කලද වෙන් කර ලබා දෙන ලද්දේ රු. මිලියන 100 ක් පමණි. එය ප්‍රමාණවත් නොවන නිසා එලෙස ප්‍රතිපාදන ඉතිරිවී පැවතුණි.	
05	ආරක්ෂිත තොග ලෙස දිගු කාලයක් සහල් තොග පවත්වාගෙන යාමේදී එම තොග මිනිස් පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවය වලක්වා ගැනීම සහ සහල් තොග උපරිම ප්‍රමිතියෙන් පවත්වාගෙන යාම සඳහා රසායනික ද්‍රව්‍ය භාවිතය අවමකිරීම සහ ඒ සඳහා වැයවන පිරිවැය අවම කිරීම අරමුණු කරගෙන මෙට්‍රික් ටොන් 34,300 ක ගබඩා ධාරිතාවයක් සහිත විද්‍යාත්මක ගබඩා 06 ක් රු.මිලියන 296 ක් වැය කරමින් දෙපාර්තමේන්තුව විසින් නවීකරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ. (අ) මෙම ගබඩා ඉදිකල අරමුණ සඳහා උපයෝජනය කර නොතිබුණු අතර වර්ග අඩි 28,000 ක් වූ වේයන්ගොඩ 01 ගබඩාව වෛද්‍ය සැපයුම් අංශය විසින් වෛද්‍ය උපකරණ ගබඩා කිරීම සඳහා ද වර්ග අඩි 28,000 ක් වූ වේයන්ගොඩ අංක 09 ගබඩාව පෞද්ගලික ආයතනයක් විසින් පොල් කිරි අපනයන නිෂ්පාදන සඳහා ද වර්ෂ 04 කට ආසන්න කාලයක් තිස්සේ භාවිත කරමින් පැවතුණි.	2023	අරමුණ සඳහා ගබඩා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	වේයන්ගොඩ අංක 01 ගබඩාව වෛද්‍ය සැපයුම් අංශයේ ඖෂධ හා වෛද්‍ය උපකරණ ගබඩා කිරීම සඳහා රු. 420,000.00 ක මාසික බදු මුදලක් යටතේ ලබා දී ඇත. වේයන්ගොඩ අංක 09 ගබඩාව සන්මික් ආයතනයට රු. 400,000ක (බදු රහිත) මාසික බදු මුදලක් යටතේ ලබා දී තිබූ අතර ගබඩාව නැවත දෙපාර්තමේන්තුව භාරයට ගෙන ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
	(ආ) ගබඩා විද්‍යාත්මක ලෙස භාවිතා නොකිරීම හේතුවෙන් ලෝක ආහාර වැඩසටහන	2023	ගබඩා විද්‍යාත්මක ලෙස භාවිතා	විද්‍යාත්මක ගබඩා ලෙස ඉදිකර තිබුණද මෙම ගබඩා දැනට	නිර්දේශ ක්‍රියාත්මක කර

	යටතේ සහල් ගබඩා කර පවතින ගබඩා 04 හි (රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව වෙත ලබාදුන් ගබඩාවද ඇතුලත්ව) ගබඩා කල කාලසීමාවට අදාලව ධූමායන වාර 06 ක් සිදු කර තිබූ අතර ඒ වෙනුවෙන් Ceylon pest control Co.(Pvt) Ltd ආයතනය වෙත රු.3,171,842 ක් ගෙවා තිබුණි. ඒ අනුව රසායන ද්‍රව්‍ය භාවිතය අවම කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි.		කිරීමට කටයුතු කල යුතුය.	භාවිත කරන්නේ ලෝක ආහාර වැඩසටහන යටතේ වන ආහාර ගබඩා කිරීමට වන බැවින් නිරන්තරයෙන් මෙහි ගබඩා කර ඇති ඔවුන්ට අයත් ආහාර ද්‍රව්‍ය වල කෘමීන් හා පලිබෝධකයින් ඉවත් කිරීමට ධූමායනය කිරීමට සිදු වී ඇත.	නැත.
	(ඇ) ගබඩා 03 ක ලෝක ආහාර වැඩ සටහන යටතේ ලබාදෙන ලද ආහාර ද්‍රව්‍ය වර්ෂයකට ආසන්න කාලයක් තිස්සේ ගබඩා කර පැවතුණු අතර මෙම ගබඩා තුනෙහි ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 17600 ක් වුවද උපයෝජනය මෙට්‍රික් ටොන් 8110 ක් පමණක් විය. ඒ අනුව එම විද්‍යාත්මක ගබඩාවන්ගෙන් මෙට්‍රික් ටොන් 9490 ක් ඌන උපයෝජිතව පැවතුණි. එහි විද්‍යාත්මක ගබඩා පවත්වාගෙන යාම වෙනුවෙන් සවිකල වායු සමීකරණ පද්ධතිද නිශ්කාර්යව පැවතුණි.	2023	ගබඩා උපයෝජනය ඵලදායී ලෙස කළ යුතුය.	ගබඩාවන්හි ධාරිතාවය මෙ.ටො. 17,600 ක් වුවද ලෝක ආහාර සංවිධානය විසින් මෙරටට ආධාර ලෙස ලබා දෙන ආහාර තොග ආරක්ෂා වන පරිදි ගබඩා කරනු ලබයි. ඒ අනුව ඌණ උපයෝජනයක් පැවතිය හැක. ලෝක ආහාර සංවිධානයේ උපදෙස් අනුව කටයුතු කරනු ලැබේ.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
06	දෙපාර්තමේන්වේ පරිහරණය සඳහා පැවති ගබඩා 17 න් ගබඩා 06 ක් පමණක් භාවිතා කර තිබුණු අතර ඉතිරි ගබඩා 11 නිශ්කාර්යව පැවතුණි.	2023	ගබඩා කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග දන්වා නැත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
07	ගබඩා ධාරිතාවය මෙට්‍රික් ටොන් 16920 ක් වූ භාවිතයට නුසුදුසු ගබඩා 04 ක් වසර 02 සිට 11 දක්වා නිෂ්කාර්යට තබා තිබුණි. තවද අළුත්වැඩියා කළ යුතු ගබඩා 08 ක් අලුත්වැඩියා නොකිරීම හා නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් භාවිතයට නුසුදුසු තත්ත්වයට පත්වීමේ හැකියාවක් පැවතුණි.	2023	ගබඩා මනාව නඩත්තු කළ යුතුය.	2025 වර්ෂය සඳහා ගබඩා 10 ක් අලුත්වැඩියාව සඳහා රු. මිලියන 100 ක් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලුම් කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
08	තිස් අවුරුදු බදු පදනම මත අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් ගබඩා 4	2023	බදු පදනමින් ලබා දී ඇති	කැබිනට් තීරණ මත බදු	නිර්දේශ ක්‍රියාත්මක කර

	ක් කාර්යාල සංකීර්ණය හා බිම් කොටසක් පෞද්ගලික ආයතනයක් වෙත බදු දී තිබුණු අතර බිම් කොටසෙහි එම ආයතනය විසින් අනුමැතියක් රහිතව ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. තවද ගබඩා සහ පරිශ්‍ර 05 ක් වසර 05ක කාලයක් සඳහා වසරින් වසර අලුත් කිරීමේ පදනම මත ඉහත ආයතනයටම පවරා තිබුණු අතර ඉන් ගබඩා 04 ක් අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව ඒකාබද්ධ කර තිබුණි.		ගබඩා සම්බන්ධයෙන් මනා පාලනයක් හා අධීක්ෂණයක් සිදු කළ යුතුය.	පදනමින් ලබා දී ඇති ගබඩා හා බිම් කොටස් වල යම් කිසි අලුත්වැඩියා කිරීමක් හෝ ඉදිකිරීමක් සිදුවන්නේ නම් ආහාර කොමසාරිස්ගේ ලිඛිත අනුමැතිය අනිවාර්යයෙන්ම ලබා ගත යුතු බව 2024.02.07 දිනැති ලිපියෙන් අදාල ආයතනයට දන්වා ඇත.	නැත.
09	2016 වර්ෂයේදී අංක 06 දරන ගබඩාව රසායනාගාරයකට පරිවර්තනය කිරීම සඳහා රු.3,495,536 ක් වැය කර තිබුණ ද එම රසායනාගාරය විගණිත දින විටත් නිෂ්කාර්යව පැවතිණි.	2023	රසායනාගාරය භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.	2024 වර්ෂයේදී ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ කටයුතු සඳහා මෙම රසායනාගාරය භාවිතා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
10	පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුලත් රු. 200,637,572 ක් වූ අධිහාර සමුපකාර ණය ශේෂයන් සනාථ කිරීමට අදාල සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවූ අතර අයකරගෙන නොතිබුණි.	2023	ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	අධිහාර සමුපකාර ණය පිළිබඳව පරීක්ෂා කර බලා අදාල ආයතන වෙතින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
11	2023 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික අංශය වෙත කුලියට ලබා දී ඇති ගබඩා හා පරිශ්‍ර 28 ක් සම්බන්ධව පෞද්ගලික අංශයේ ආයතන 11 කින් රු.7,928,378 ක් ද, රාජ්‍ය ආයතන වෙත කුලී පදනම මත ලබා දී තිබෙන ගබඩා 21 ක් සම්බන්ධව රාජ්‍ය ආයතන 06 කින් රු.32,267.674 ක් ද, සන්තකය ලබා ගැනීම හා හිඟ ගබඩා කුලී අය කර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති ගබඩා සම්බන්ධයෙන් ආයතන 05 කින් රු.20,913,506 ක් ද, කුලියට ලබා දී නැවත පවරාගෙන තිබුණු ගබඩා 30 ක් සම්බන්ධයෙන් රු.50,710,877 ක් ද වශයෙන් රු.111,820,436 ක හිඟ ගබඩා කුලී පැවතුණි.	2023	හිඟ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතුය.	2024.08.31 දින වන විට බදුකුලී පදනම මත රාජ්‍ය අංශයට ගබඩා 21 ක් හා පෞද්ගලික අංශයට ගබඩා 31 ක් වශයෙන් ගබඩා 52ක් බදු කුලී පදනම මත ලබා දී ඇත. එම ආයතන සමඟ ගිවිසුම්ගතවී බදු කුලී අයකරගෙන යනු ලැබේ.	මේ දක්වා අයකරගෙන ඇති ප්‍රමාණය ඉදිරිපත් කර නැති අතර අය නොවූ ශේෂ තවදුරටත් පවතී.
12	2023 දෙසැම්බර් 31 දිනට ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ	2023	හිඟ නිවාස කුලී කඩිනමින්	ධාන්‍යාගම නිවාස සංකීර්ණයේ කුලී	මේ දක්වා අයකරගෙන

	දැනට පදිංචි නිවාස, නීතිමය කටයුතු සිදු කරන නිවාස සහ නැවත පවරා ගන්නා ලද නිවාසවලින් රු.11,527,480 ක නිවාස කුලි අය විය යුතුව පැවතුණි.		අයකර ගැනීමට කටයුතු කල යුතුය.	නිවාස සඳහා ගිවිසුම් අත්සන් කර ඇති අතර එම ගිවිසුම් ප්‍රකාරව කුලී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.	ඇති ප්‍රමාණය ඉදිරිපත් කර නැති අතර අය නොවූ ශේෂ තවදුරටත් පවතී.
13	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි	2023	පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අමප/24/0497/0627/0 10 අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කරන බැවින් මෙම තනතුර ඇති කිරීම පිළිබඳ කටයුතු නවතා ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

78. ශීර්ෂය - 301 සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	64,273,333	64,273,333	-	තත්ත්වාගණනය කළ
2022	63,604,345	63,604,345	-	තත්ත්වාගණනය කළ
2023	63,494,398	63,494,398	-	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉටුකර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.	2022	තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට ක්‍රියාකල යුතුයි.	ඉදිරි වර්ෂවල සිට සකස් කිරීමට කටයුතු කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
02	වන්දි ගෙවීම් වලට අදාල පොදු තැන්පත් ගිණුමේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති තැන්පතු ශේෂ105 ක වටිනාකම රු.2,056,432 ක් විය. මෙම ශේෂ වසර 08කට වඩා පැරණි වූ අතර මුදල් රෙගුලාසි 571 අනුව වසර 2 ට වඩා පැරණි ශේෂ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙම වන්දි ගෙවීම් වලට අදාලව පොදු තැම්පත් ගිණුමේ පවතින ශේෂය නිරවුල් කිරීමට නොවිසඳුන ශේෂ සම්බන්ධව තොරතුරු නීති අංශය මගින් සොයා අදාල නිරවුල් කිරීම් සිදු කරමින් පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.
03	2013 වර්ෂයේදී ආරම්භ කරන ලද මූල්‍ය සේවා සමිති සම්බන්ධ තොරතුරු රැස් කිරීම හා යාවත්කාලීන කිරීමට දත්ත බැංකුවක් ආරම්භ කිරීමේ කාර්යය සඳහා රු.5,920,186 ක මුදලක් වැය කර තිබුණු අතර අදාල දත්ත පද්ධතියක් දෙපාර්තමේන්තුව සතුව නොමැති බව 2021 අගෝස්තු 05 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අවධානය	2023	දත්ත බැංකුව ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය.	සී/ස ශ්‍රී ලංකා ජාතික සමූපකාර මණ්ඩලයේ මැදිහත් වීමෙන් ක්‍රියාත්මක කරන ග්‍රාමීය බැංකු පරිගණක ගත කිරීමේ වැඩ සටහන සම්බන්ධයෙන් පළාත් දෙපාර්තමේන්තු දැනුවත් කිරීමට තීරණය කර ඇත.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

	යොමු වී තිබුණද, 2023 දෙසැම්බර් වන විට වසර 10 ක් ගත වූ පසුවද දත්ත බැංකුව ආරම්භ කර නොතිබුණි.			නියමු ව්‍යාපෘතියක් ලෙස දඹදෙණිය විවිධසේවා සමූපකාර සමිතියේ සියළුම ග්‍රාමීය බැංකු ශාඛා සඳහා ක්‍රියාත්මක කරමින් පවතී.	
04	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.	2023	පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.	අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගැනීම සඳහා කටයුතුකරමින් පවතී.	නිර්දේශ ක්‍රියාත්මක කර නැත.

79. ශීර්ෂය - 302 සමුපකාර සේවක කොමිෂන් සභාව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	26,705,370	26,705,370	-	තත්ත්වාගණනය කළ
2022	27,372,285	27,372,285	-	තත්ත්වාගණනය කළ
2023	26,729,946	26,729,946	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) සහ 40(2) වගන්ති ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	පනත අනුව ක්‍රියාකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුයි.	අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති බැවින් නව තනතුරක් ඇතිකර ගැනීම සඳහා ඇති ඉඩකඩ සොයා බලනු ලැබේ. අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී සහ කළමනාකරණ හා විගණන රැස්වීම් වලදී මෙම තත්වය ඉදිරිපත් කර ඇත.	මේ දක්වා නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
02	2021 හා 2022 වර්ෂවල ලැබී විසඳා නොතිබුණු අභියාචනා 13 ක් සම්බන්ධව 2023 වර්ෂයේදී විසඳුම් ලබා දී තිබුණු අතර 2023 වර්ෂය තුල ලද පැමිණිලි 20 කින් 16 කට පමණක් විසඳුම් ලබා දී තිබුණු අතර විසඳුම් ලබා දිය යුතු අභියාචනා 04 ක් තවදුරටත් පැවතුණි.	2023	ප්‍රධාන කාර්යයන් කඩිනමින් ඉටු කිරීමට කටයුතු කළ යුතුය.	අභියාචනා විසඳීම් කඩිනමින් ඉටුකිරීම සඳහා අදාල තොරතුරු නිවැරදිව හා නොපමාව ඉදිරිපත් කරන ලෙස අදාල සමිති වලට දැනුම් දී ඇත.	මේ දක්වා එම පැමිණිලි 04 විසඳා නැත.
03	කොමිෂන් සභාව සතුව වාහන 03 ක් පවතින අතර අනුමත රියදුරු සංඛ්‍යාව 03 ක් ලෙස පැවතුණි. එසේ වුවද තත්‍ය කාර්ය මණ්ඩලය තුල එක් රියදුරෙකු පමණක් සිටීම හේතුවෙන් සංචිත ධාවනයේ යෙදෙන වාහන 2 ම ඌන උපයෝජිතව	2023	වත්කම් නිසි පරිදි කළමනාකරණය කළ යුතුය.	අනුමත රියදුරු සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු (විශ්‍රාම ගැනීම හේතුවෙන්) සම්පූර්ණ කිරීම සම්බන්ධව ඉල්ලීම් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, බහු කාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා අධ්‍යක්ෂ ජනරාල් සහ ලේකම් - වෙළෙඳ, වාණිජ	මෙතෙක් රියදුරන් ලබාදීම සිදුවී නොමැත.

පැවතුණි.		හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.	

80. ශීර්ෂය - 303 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	288,204,911	288,204,911	-	තත්ත්වාගණනය නොකළ
2022	288,016,135	288,016,135	-	තත්ත්වාගණනය කළ
2023	288,211,629	288,211,629	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ගය	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	තලල්ල හා හිඟුරක්ගොඩ බලවේග පේෂකර්මාන්ත ඉඩම හා ගොඩනැගිලි බදු පදනමට ලබාදීමට අදාළව පිළිවෙලින් 1995 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා සහ 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අයවිය යුතු රු.9,431,000 ක් අයකරගෙන නොතිබුණි.	2023	හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරි කටයුතු කර ඇත.	මේ දක්වා අයකරගෙන නැත.
02	බිබිල බලවේග පේෂකර්මාන්ත ඉඩම හා ගොඩනැඟිලි බදු පදනම මත ලබාදීමට අදාළව අයවිය යුතු රු.1,681,250 ක් අයකරගෙන නොතිබුණි.	2023 2022	හිඟ බදු මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ මුදල අයකර ගැනීමට අදාළව බස්නාහිර පළාත් මහාධිකරණයේ නඩු පැවරූ බව.	මේ දක්වා අයකරගෙන නැත.
03	පේෂකර්මාන්ත පුහුණු ආයතන 11 ක් සහ සංචාරක නිවාස 02 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීම සිදු කර නොතිබුණි.	2023	වත්කම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.	ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	මේ දක්වා පවරාගෙන නැත.
04	අයිතිය නිශ්චිතව හඳුනාගෙන නොමැති, මුරකුටියක් හා ගොඩනැගිලි 02 කින් සමන්විත පර්චස් 30 ක ඉඩමක් වූ රාජගිරියේ ස්වාභාවික වර්ණ ගැන්වීමේ මධ්‍යස්ථානය වසර 3 කට වැඩි කාලයක සිට උපයෝජනය නොවී පැවතුණි.	2023	වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතුය.	පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.	තවදුරටත් උපයෝජනය නොවී පවතී.
05	2020 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.19,991,000 ක් වටිනා අත්‍යන්ත්‍ර කට්ටල 185ක් සහ	2023 2022	වත්කම් ඵලදායි ලෙස උපයෝජනය	සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්ට නිකුත් කිරීමට පියවර ගනිමින්	තවදුරටත් නිශ්කාර්යව පවතී.

වයින්ඩින් යන්ත්‍ර 146 ක් වසර 3 ක් තිස්සේ කටුබැද්ද ගබඩා පරිශ්‍රයේ නිශ්කාර්යව පැවතුණි.	කළ යුතුය.	ඇති බව.

81. ශීර්ෂය - 304 කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,903,800,545	3,903,800,545	-	තත්ත්වාගණනය කළ
2022	3,912,026,332	3,912,026,332	-	තත්ත්වාගණනය කළ
2023	3,953,895,940	3,953,895,940	-	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශ	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	අනුරාධපුරය,මඩකලපුව, කටුගස්තොට, මහඉලුප්පල්ලම, මන්නාරම, රත්නපුර, කුරුණෑගල, වව්නියාව, මුලතිව් යන කාලගුණ විද්‍යා ප්‍රාදේශීය කාර්යාල පිහිටි භූමි ප්‍රදේශ 09 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	අදාල භූමි ප්‍රදේශ දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	ඉඩම් අත්කර ගැනීමට අදාළ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.	ඉඩම් අත්පත් කර ගැනීමට අදාල කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.
02	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ සවිකර ඇති ස්වයංක්‍රීය කාලගුණ පද්ධති 35 න් 21 ක GPRS තාක්ෂණය යටතේ නියමිත පරිදි දත්ත ආයතනයට නොලැබෙන අතර හදිසි කාලගුණ වෙනස්වීම් තත්ත්වයන්හිදී ස්වයංක්‍රීය දත්ත ලබාගැනීමේ හැකියාව ඉතා වැදගත් වන අතර මේ හේතුවෙන් පද්ධති ස්ථාපිත කිරීම තුලින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.	2022, 2023	ක්‍රියාවිරහිත තත්ත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන පිළිබඳව සොයා බලා විධිමත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.	ජයිකා (JAICA) හා ලෝකබැංකු ණය යෝජනාක්‍රමය මගින් ක්‍රියාත්මක නවීකරණ ව්‍යාපෘතිය හරහා සංනිවේදන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සහිත ඩේටා ලොගර් පිළිවෙලින් 05 ක් හා 20ක් ලබාගැනීමට කටයුතු සිදුකර ඇත.	දැනට ක්‍රියාකාරිත්වයේ පවතින ස්වයංක්‍රීය කාලගුණ පද්ධති 14 ක් මගින් ස්වයංක්‍රියව දත්ත ලබාගන්නා අතර අනෙකුත් පද්ධති 21 හි දත්ත දේශගුණ හා පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි එම ස්ථානයන්හි නඩත්තු කටයුතු කර දත්ත භාගත කිරීම සිදුකර ඇත.
03	දිවයින පුරා සාම්ප්‍රදායික වැසි මාපක 453 ක් සවිකර පවතින අතර ඒවායේ වර්තමාන ක්‍රියාකාරීත්වය හා දත්ත ලැබීම් අනුව වැසි මාපක 44 කින් විධිමත් පරිදි නඩත්තු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් දත්ත අඛණ්ඩව නොලැබෙන බව	2022, 2023	අඛණ්ඩව දත්ත නොලැබෙන වැසි මාපක සඳහා විධිමත් නඩත්තු ක්‍රමවේදයක් ස්ථාපිත කර	එම වැසි මාපකවලට යම් කිසි හානියක් වී ඇත්නම් පමණක් එම වැසි මාපක අලුත්වැඩියා කිරීමක් හෝ ඒ සඳහා අලුත් වැසි මාපකයක් ලබාදීම සිදුකරනු	දත්ත නොලැබෙන වැසි මාපක ඇති ස්ථානයන් පරීක්ෂා කිරීමට ප්‍රාදේශීය කාලගුණ විද්‍යා කාර්යාල හරහා යාන්ත්‍රණයක් සකස් කරමින් පවතින බව.

	නිරීක්ෂණය විය.		අඛණ්ඩව දත්ත ලැබෙන පරිදි පවත්වා ගත යුතුය.	ලබයි.	
04	ජපන් ආධාර යටතේ (JICA) 2008 වර්ෂයේදී ලැබී තිබූ රුපියල් මිලියන 570 ක් වටිනා ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධති 38 න් පද්ධති 02 ක් නියමිත ස්ථානවල සවිකිරීමට කටයුතු කර නොතිබූ බැවින් අධික වටිනාකමක් සහිත උපකරණ ඌණ උපයෝජිතව පැවතීමට ඉඩහැරීම හේතුවෙන් අවශ්‍ය පහසුකම් ලබාගැනීමට තිබූ අවස්ථා අහිමි වී තිබුණි.	2023	අධික වටිනාකමක් සහිත උපකරණ නිසි පරිදි උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය.	කටුනායක ගුවන් තොටුපළ පද්ධතිය මේ වන විට සවිකර ඇත.	මෙම පද්ධතීන් සවිකිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකරමින් පවතී.
05	ඩොප්ලර් රේඩාර් පද්ධති පුත්තලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන භූමියේ ස්ථාපනය කිරීම සඳහා 2019 සිට 2022 වර්ෂය දක්වා රුපියල් මිලියන 563.58 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, 2023 වර්ෂය අවසානය වන විට වියදම රුපියල් මිලියන 0.462ක් පමණක් වී තිබුණි. ගිවිසුම්ගත වී වසර 05 ක් ගත වී ඇතත් රේඩාර් පද්ධති ඉදිකිරීමේ කටයුතු 2020 වර්ෂය අවසානයේදී අවසන් අදියර වෙත ළඟාවිය යුතු වුවද, වර්තමානයේ මිල ගණන් ඉහළයාම නිසා ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවක් පැවතියද, වර්ෂ 15 කට ආසන්න කාලයක් එම පද්ධතිය නොමැතිව කාලගුණ විද්‍යා අනාවැකි හා පුරෝකථන ලබා දී තිබීමෙන් එහි නිරවද්‍යතාවයට වඩාත් ලංවීම හා විශ්වසනීයත්වයෙන් යුතුව පුරෝකථන හා අනාවැකි නිකුත් කිරීමට කටයුතු සැලසේද යන්න	2021 2022 2023	කාලගුණ විද්‍යා අනාවැකිකරණයේදී ඩොප්ලර් රේඩාර් පද්ධතියක දැඩි අවශ්‍යතාවක් පවතින අතර මෙම ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට කටයුතු කල යුතුය.	ව්‍යාපෘති පිරිවැය වැඩි වූ බැවින් මුලින් සැලසුම් කළ පරිදි ඩොප්ලර් රේඩාර් දෙකක් සමඟ ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුණි. තවදුරටත් ව්‍යාපෘතිය ප්‍රමාද වීම වැළැක්වීම සඳහා JICA උපදේශකවරුන්, JICA, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව (ERD) , ආරක්ෂක අමාත්‍යාංශය (MOD) , ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව (PMMD) සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව (NPD) සමඟ සාකච්ඡා කිරීමෙන් පසුව ව්‍යාපෘතිය සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීමට එකඟ විය.	ව්‍යාපෘතිය සංශෝධන සහිතව සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමේ ප්‍රදාන ගිවිසුමේ සංශෝධනය 2023.11.22 දින අත්සන් කරන ලද අතර , ප්‍රදාන මුදල JPY 2,663,000,000 ලෙස සංශෝධනය කර ඇත.

නිශ්චය කිරීමට නොහැකි විය.

82. ශීර්ෂය - 306 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	490,912,954,153	603,160,365	490,309,793,788	තත්ත්වාගණනය කළ
2022	493,950,789,329	592,740,663	493,358,048,666	තත්ත්වාගණනය කළ
2023	498,536,308,866	941,808,119	497,594,500,747	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	2023 වර්ෂය ආරම්භයේ දී දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් පාලන ගිණුමේ ආරම්භක ශේෂය රු.1,176,837,238 ක් වූ අතර එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු.1,181,015,043 ක් විය. මේ අනුව දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.4,177,805 ක වෙනසක් පැවතුණි. 2004 වර්ෂයේ සිට මේ වන විට වසර 19 ක් ඉක්ම ගොස් ඇතත් මෙම ශේෂය නිරවුල් කර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021 2022	වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධයෙන් තවදුරටත් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	වෙනසට හේතු පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
02.	උප දෙපාර්තමේන්තු 15 ක වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.17,828,124 ක ණය ශේෂ ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඉන් සියයට 61 ක් වූ රු.10,918,457 ක ණය ශේෂය වසර 05 ට වඩා වැඩි කාලයක් ඉක්මවා ඇති අතර එම ණය ශේෂයන්ගෙන් සියයට 35 ක් ප්‍රධාන ඉංජිනේරු (ධාවන) උප දෙපාර්තමේන්තුවට අයත් ඒවා විය.	2022 2023	හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අලුතින් හිඟ ශේෂ ඇතිවීම වළක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේ දී හිඟ ණය මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මෙම ශේෂය තවදුරටත් අයකර ගැනීමට පවතී.

03.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 04 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබීම හේතුවෙන් විශ්‍රාම ගිය හා මියගිය නිලධාරීන්ගේ වර්ෂයකට අඩු, වර්ෂ 01 ත් 10 ත් අතර, වර්ෂ 10 ත් 20 ත් අතර හා වර්ෂ 20 ට වැඩි වශයෙන් වූ රු.52,296,852 ක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2022 2023	රෙගුලාසි ප්‍රකාරව හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අලුතින් හිඟ ශේෂ ඇති වීම වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ ණය ශේෂ වලින් කොටසක් අයකර තිබූ අතර රු.52,296,852 ක් වූ ඉතිරි හිඟ මුදල ද ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මෙම ණය ශේෂ අයකර ගැනීමට මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.
04.	ආනයනික භාණ්ඩ සඳහා ගෙවීමේ දී ලියකියවිලි ඉදිරිපත් කිරීමේ විවිධ අකාර්යක්ෂමතාවයන් මත සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් බැංකු පොළී වශයෙන් රු.15,150,834 ක්ද, නැව් සංස්ථාවට ප්‍රමාද ගාස්තු වශයෙන් රු. 1,200,098 ක්ද, ශ්‍රී ලංකා වරාය අධිකාරියට රු.2,544,785 ක් හා පෞද්ගලික ආයතනයක් වෙත රු. 1,995,755 ක්ද, ලෙස විවිධ අකාර්යක්ෂමතාවන් මත ගෙවන ලද රු. 20,891,472 ක් තොග පිරිවැයට අතිරේකව දැරීමට සිදුවී තිබුණු අතර, එම අතිරේක අකාර්යක්ෂමතා පිරිවැයද එකතුකොට තොගයේ පිරිවැයට දක්වා තිබුණි.	2021	ප්‍රමාද ගාස්තු හා පොළී ගෙවීම් අවම කිරීම හා තොග වටිනාකමට එකතු කළ හැකි වියදම් පමණක් ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.	ආනයනික භාණ්ඩ මත වියදම් එකතු වීමෙන් තොග ලැබීම් අගය ඉහළ යන අතර එසේ වීමට හේතු වී ඇත්තේ රජය ඒ සඳහා අක්මුදල් ලබා දීම ප්‍රමාද වීම බව දක්වා තිබුණි.	ප්‍රමාද ගාස්තු හා පොළී ගෙවීම තවදුරටත් සිදුවෙමින් පවතී.
05.	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගබඩා අත්තිකාරම් ගිණුමේ ඉදිරිපත් කර තිබූ රු.268,627,824 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව කාල විශ්ලේෂණ වාර්තා හා ඒවා සැදුම්ලත් ආකාරය දැක්වෙන උපලේඛන ඉදිරිපත් නොවීම හේතුවෙන් එම ශේෂයන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	2021	ගිණුම් ශේෂ තහවුරු කිරීමට අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.	ගබඩා අත්තිකාරම් ගිණුම යටතේ ගිණුම් විෂයන් 5 කට අදාළ කාලවිශ්ලේෂණයක් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	2023 වර්ෂයේ ගිණුම් තුළද ශේෂ තහවුරු කිරීම් සහ කාල විශ්ලේෂණ වාර්තා ඉදිරිපත් නොකෙරිණි.

06.	2023 නොවැම්බර් 30 දිනැති අංක 05/2023 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට සියලුම බැදීම් හා බැරකම් අංක අනුව හෙලිදරව් කළ යුතු වුවත්, දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු 02 කට අදාළව රු.1,131,855,611 ක් වටිනා බැදීම් හා බැරකම් ගිණුම් තුළ හෙලිදරව් කර නොතිබුණි.	2021 2022 2023	රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බැදීම් හා බැරකම් ගිණුම් තුළ හෙලිදරව් කළ යුතුය.	ඉදිරියේ හෙළිදරව් කිරීමට පියවර ගන්නා ලෙස උප දෙපාර්තමේන්තු වෙත උපදෙස් ලබා දී තිබුණි.	2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළද හෙලිදරව් කර නොතිබුණි.
07.	දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතන 31 කින් රු. 120,476,948 ක් හිඟ හිට තිබූ අතර ඒ තුළ වූ ආයතන 16 කින් ලැබිය යුතු රු. 20,307,403 ක් වර්ෂ 21 කට වඩා පැරණි හිඟ ශේෂ විය.	2021	හිඟ ආදායම් අය කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	අක්‍රියව පවතින හා වසා දමා ඇති ආයතන නිසා එම ආයතන වෙත යවා ඇති ලිපි ආපසු හරවා එවා ඇති බවත් පරික්ෂා කර මෙම අගය ඉදිරියේදි කපා හැරීමට අවශ්‍ය කටයුතු කරන බව දන්වා තිබුණි.	හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
08.	දුම්රිය දෙපාර්තමේන්තුව විසින් නිසි සැලසුමක් හා නිසි කළමනාකරණයක් නොමැතිව ගබඩා ටෙන්ඩර් කිරීම තුළින් කොළඹ බඩු ගබඩා සංකීර්ණයේ කඩ කාමර 03 ක් තුළින් රු.12,587,000 ක ආදායමක් අහිමි වී තිබූ අතර දුම්රිය දෙපාර්තමේන්තුව සතු භෝජනාගාරයක් සහ බඩු ගබඩා 02 ක් කුලියට ලබා දීම තුළින් ලැබිය යුතු රු.24,203,032 ක ආදායම අයකර ගෙන නොතිබුණි.	2023	ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය.	ගබඩා ගොඩනැගිලි 02ක පරිහරණය කිරීම වෙනුවෙන් නැෂනල් පේපර් ආයතනයෙන් අයවිය යුතු රු.23,809,904 ක හිඟ කුලිය අයකර ගැනීම සඳහා නීතිපති උපදෙස් පරිදි අංක 18/විවිධ/(019) හා 2018.05.31 දිනැති රාජ්‍ය ආයතන අතර නෛතික ක්‍රියාමාර්ග යන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව රාජ්‍ය ආයතන අතර හිඟ මුදල් නිරවුල් කර ගැනීම සඳහා මේ වන විට ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් මගින් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන බව ද දන්වා තිබුණි.	ලැබිය යුතු ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

09. වත්තේගම පිහිටි රූඩ් 01 පර්චස් 24.5 ක රක්ෂිත ඉඩම 1963 දෙසැම්බර් 29 වන දින සිට පැවරීමේ නියෝග මත ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාවට බදු දී තිබුණද මෙම පැවරීමේ නියෝගය පදනම් කරගෙන 1964 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 59 ක් සඳහා රජයේ තක්සේරුව අනුව අයවිය යුතු රු.12,192,825 ක බදු වටිනාකම අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2023	බදු ගිවිසුම අනුව බදු වටිනාකම ගණනය කර අය කර ගත යුතුය.	ගොනුව නැවත පරීක්ෂා කර හිඟ මුදල් අය කර ගැනීමට හෝ නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙසට වගකිව යුතු නිලධාරීන්ට උපදෙස් ලබාදී තිබුණි.	බදු ගිවිසුම අනුව බදු වටිනාකම ගණනය කර අය කර ගෙන නොතිබුණි.
10. පැලියගොඩ නගරයේ බදු ගිවිසුම් අංක LB 31134 දරන දුම්රිය රක්ෂිත ඉඩම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු බදු ආදායම රු.18,308,192 ක වටිනාකම, මාතලේ නගරයේ බදු ගිවිසුම් අංක LC 1899 දරන දුම්රිය රක්ෂිත ඉඩම සඳහා 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු බදු ආදායම රු.3,803,533 ක වටිනාකම හා මීරිගම නගරයේ බදු ගිවිසුම් අංක LB 30037 දරන දුම්රිය රක්ෂිත ඉඩම සඳහා 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු බදු ආදායම රු.1,442,100 ක වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අයකර ගෙන නොතිබුණු අතර වසර 09 කට වැඩි කාලයක සිට කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි.	2023	අයවිය යුතු බදු ආදායම් ගිවිසුම් ප්‍රකාරව කඩිනමින් අයකර ගත යුතුය.	පරීක්ෂා කර ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	අයවිය යුතු බදු ආදායම් ගිවිසුම් ප්‍රකාරව අයකර ගෙන නොතිබුණි.
11. දුම්රිය ආඥා පනතේ 200 අධිකාරියේ 31(අ), 31(ආ), 31(ඇ), 31(ඈ) වගන්ති ප්‍රකාරව දුම්රිය සාමාන්‍යාධිකාරීගේ ලිඛිත අවසරයකින් තොරව දුම්රිය රක්ෂිතයන් තුළ කිසිදු කටයුත්තක් සිදු කළ නොහැකි	2022	දුම්රිය ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.	බදු ලබා දීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ බදු අයදුම්පත් කැඳවීම මේ වන විට ක්‍රියාත්මක අතර බදු ලිපිගොනු පරිගණකගත දත්ත පද්ධතියක් මඟින් ක්‍රියාත්මක කිරීමට ද	දුම්රිය ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	වුවද වැලිගම දුම්රිය ස්ථානය අතර දුම්රිය රක්ෂිතයේ අනවසරයෙන් ගොඩනැගිලි ඉදිකර ගෙන තිබුණු බවත්, තවත් පිරිසක් විසින් එම රක්ෂිත ඉඩම් අත්පත් කරගෙන වෙළඳාම් කටයුතු සිදු කර ගෙන යනු ලබන බව නිරීක්ෂණය වූ අතර ඒ බව දුම්රිය සාමාන්‍යාධිකාරීට දන්වා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට කටයුතු ඉටු කර නොතිබුණි. මෙම අනවසර ඉදි කිරීම් තුළ ස්ථිර කඩකාමර 13 ක් පිහිටා තිබූ බැවින්, ඒ සඳහා ජල, විදුලිය පවා ලබා ගෙන අදාළ පලාත් පාලන ආයතනය මඟින් ව්‍යාපාරික බලපත්‍ර ද ලබා ගෙන තිබුණි.			අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තු තොරතුරු තාක්ෂණ අංශය වෙත භාරදී තිබුණි.	
12.	රාජ්‍ය පරිපාලන ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ඡේදයේ I වගන්තිය මඟින් ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 උප වගන්තිය සංශෝධනය ප්‍රකාරව දුම්රිය පීලි පැනීම්, විහද්ධවීම්, ගැටීම් හා හානි වලට වගකිවයුතු පාර්ශවයන්ට අදාළව 2018 - 2022 වර්ෂ වල සිදුවූ සිදුවීම් 365 න් සිදුවීම් 357 ක් සඳහාම අදාල මූලික විමර්ශන වාර්තා අවසන් කර නොතිබුණි.	2023	ආයතන සංග්‍රහය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මූලික විමර්ශන පැවැත්විය යුතුය.	ඉදිරියේ දී තොරතුරු වාර්තා කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	ආයතන සංග්‍රහය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව මූලික විමර්ශන පවත්වා අවසන් කර නොතිබුණි.
13.	2022 අගෝස්තු 12 දිනැති අංක 01/2022 සහ 2019 සැප්තැම්බර් 30 දිනැති අංක 30/2019 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මඟින්	2023	ආයතන සංග්‍රහය සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	මූලික විනය පරීක්ෂණ සඳහා අවශ්‍ය වන පරීක්ෂණ නිලධාරීන්, මූලික විමර්ශන සිදු කරන නිලධාරීන්, දිස්ත්‍රික්	මූලික විමර්ශන කටයුතු නියමිත කාලසීමාව තුළ අවසන් කර නොතිබුණි.

	සංශෝධිත ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 උප වගන්තිය හා 13.12 වගන්තිය ප්‍රකාරව නිලධාරීන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ 2003 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ මූලික විමර්ශන 50 ක් පවත්වා අවසන් කිරීමට මාස 03 සිට අවුරුදු 14 යි මාස 03 අතර කාල පරාසයක් ගෙන තිබුණි. ආයතනය විසින් දැනට පවත්වාගෙන යන අවසන් නොවූ මූලික විමර්ශන 134 ක් පැවැති අතර ඉන් මූලික විමර්ශන 120 ක්ම මාස 03 ඉක්මවා ගොස් තිබුණි. තවද නිලධාරීන් සම්බන්ධයෙන් මූලික විමර්ශනයන් 30 ක් අවසන් කර චෝදනා පත්‍ර කෙටුම්පත් කිරීමට මාස 02 සිට අවුරුදු 06 අතර කාල පරාසයක් ගෙන තිබුණි.		අනුව මූලික විමර්ශන කටයුතු නියමිත කාලසීමාව තුළ නිම කළ යුතුය.	ප්‍රවාහන පරීක්ෂකවරුන් යන නිලධාරීන්ගේ පවතින හිඟය සහ ඉංජිනේරු වාර්තා, අධිකරණ වෛද්‍ය වාර්තා, මහේස්ත්‍රාත් වාර්තා යනාදිය ලබා ගැනීම ප්‍රමාද වීම සහ පැවැති කොවිඩ් 19 වසංගතය නිසා මූලික විමර්ශන සිදු කිරීම ප්‍රමාද වී තිබූ බව දන්වා තිබුණි.	
14.	කාල සටහනකට අනුව දුම්රිය ධාවනය ආරම්භ වූයේ 1865 වර්ෂයේ දී වුවද මේ දක්වා කාල සටහන් අනුව දුම්රිය ධාවනය නොවන බවට දුම්රිය භාවිතා කරන්නන්ගෙන් පැමිණිලි ලැබී තිබුණි. 2023 වර්ෂයේදී සැලසුම් කළ මුළු දුම්රිය ධාවන වාර සංඛ්‍යාව 122,426 ක් වූ අතර ඒ තුළින් නිශ්චිත වේලාවට ධාවනය වී තිබූ මුළු දුම්රිය වාර ගණන 36,771 ක් විය. අවලංගු වී තිබූ මුළු දුම්රිය වාර ගණන 10,531 ක් වී තිබුණි. ඒ අනුව සියයට 70 දුම්රිය නියමිත පරිදි ධාවනය වී නොතිබුණි. මින් සැලසුම් කළ මඟී දුම්රිය ධාවන වාර සංඛ්‍යාව 113,759 කින් නිශ්චිත වේලාවට ධාවනය වී තිබුණේ මඟී දුම්රිය 36,053 ක සංඛ්‍යාවක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 32 ක්	2021 2022 2023	දෙපාර්තමේන්තුවේ දැක්ම හා මෙහෙවරට අනුව කටයුතු කර තිරසර සංවර්ධන ඉලක්ක ළඟා වන පරිදි දුම්රිය කාර්යසාධනය පාරිභෝගිකයින්ට සමීප වන ආකාරයෙන් වර්ධනය කළ යුතුය.	දුම්රිය මාර්ග දෝෂ, ගැල් හා මැදිරි වල දෝෂ, දුම්රිය සංඥා පද්ධතියේ දෝෂ, පැවතීම නිසා සහ දුම්රිය ධාවනයට සෘජුවම බලපාන දුම්රිය රියදුරු, රියදුරු සහායක, නියාමක යන දුම්රිය කාර්යමණ්ඩල විශ්‍රාම යාමට සාපේක්ෂව බඳවා ගැනීමක් සිදු නොකිරීම හේතුවෙන් හිඟතාවයක් ඇතිවීම නිසා දුම්රිය ප්‍රමාද වීම් සහ දුම්රිය අවලංගු වීම සිදුවේ. දුම්රිය සේවකයන්ගේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ග, ස්වාභාවික ආපදා නිසාද දුම්රිය ප්‍රමාද වීම සිදුවන බව දන්වා තිබුණි.	නියමිත කාලසටහනට අනුව දුම්රිය ධාවනය සිදු නොවන අතර දුම්රිය ප්‍රමාද හා අවලංගු වීම සිදුවේ.

	විය. දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ සමස්ත මගී ප්‍රවාහනයෙන් සියයට 6 ක් හා භාණ්ඩ ප්‍රවාහනයෙන් සියයට 6.5 ක් දායකත්වයක් ලබා දෙන දුම්රිය සේවය එකී දායකත්වය ඉහළ නංවා ගැනීමට අපොහොසත් වී තිබූ අතර 1934 වර්ෂයේ දී දුම්රිය මාර්ගස්ථ ජාලය කිලෝමීටර් 1521 ක් වුවද බෙලි අත්ත දක්වා වූ කිලෝ මීටර් 32 ක් ද අලුතින් එක් කල පසුව ද වර්තමානය වන විට එය කිලෝ මීටර් 1465 ක් දක්වා කිලෝ මීටර් 56 කින් අඩු වී තිබුණි.				
15.	මහනුවර - ගැටඹේ අතර ද්විත්ව දුම්රිය මාර්ගයක් ඉදි කිරීම සඳහා රු. 47,618,821 ක වටිනාකමකට පුද්ගලික ආයතනයක් සමග ගිවිසුම් ගතවී තිබුණු අතර එහි ඉදිකිරීම් කටයුතු 2018 ජූලි 30 දිනට පෙර (අවසන් කාලය දීර්ඝ කිරීම) නිමකළ යුතුව පැවතිය ද මෙතෙක් ව්‍යාපෘතියේ වැඩ නිමකර ගැනීමට නොහැකි වී තිබුණි. තවද, 1/720 සිට 1/830 දක්වා හා 1/900 සිට 1/980 දක්වා මුළු දිග මීටර් 190 ක පමණ කොටසක ඉදි කිරීම් කටයුතු වලින් කොන්ත්‍රාත්කරු ඉවත් වී තිබුණු අතර, එම කොටස දෙපාර්තමේන්තුව මැදිහත් වීමෙන් පිළිසකර කිරීමට එකඟවී තිබුණද, මේ දක්වා නිමකර නොතිබුණි. මෙම ඉදිකිරීම් වලට අදාළව බොරලු ගල්කැට සහිත මාර්ගය Sleepers, Rails හා අනෙකුත් ද්‍රව්‍ය සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබීම, පිරිවිතරයන්ට අනුව 10" ලෙසට තිබිය යුතු ABC 7.25" සිට 9.5" දක්වා පරාසයක පැවතීම, පිරිවිතරයන්ට අනුව 8" ලෙසට යෙදිය යුතු Ballast 6" සිට 7.5" දක්වා පරාසයක පැවතීම,	2021	ඉදිකිරීම් සඳහා ගිවිසුම් අනුව නියමිත කාලයේදී වැඩ අවසන් විය යුතුය.	මේ වන විට ගැටඹේ - මහනුවර අතර ද්විත්ව මාර්ග කටයුතු කොන්ත්‍රාත් ක්‍රමයට ගිවිසුම අනුව අවසන් කර ඇත. මෙම කොටසේ දුම්රිය මාර්ගය යෙදීමේ කටයුතු මේ වන විට ආරම්භ කර තිබුණි.	ව්‍යාපෘතිය මෙතෙක් සම්පූර්ණයෙන් නිම කර නොතිබූ අතර නිරීක්ෂණයේ සඳහන් අඩුපාඩු නිවැරදි කර නොතිබුණි.

	අනවසර පදිංචිකරුවන් 116 ක් ඉවත් කිරීමට අධිකරණ නියෝගයන් තිබියදී නිවාස 95 ක් ඉවත් කර නොතිබීම. විකල්ප ඉඩම් ලබා දුන් පදිංචිකරුවන් 17 දෙනෙකු තවදුරටත් දුම්රිය රක්ෂිතය තුළ පදිංචි වී සිටීම වැනි අඩුපාඩු විගණන භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.				
16.	අංක L-4731 (LC-32933) යටතේ නීත්‍යානුකූලව වෙනත් පුද්ගලයෙකුට බදු ලබා දී තිබුණු ගම්පොළ, දුම්රිය ස්ථානය අසල අක්කර 02 යි, රූඩ් 02 යි, පර්චස් 35.3 ක් වූ දුම්රිය රක්ෂිත ඉඩම හා තවත් කොටසක් එකතු කළ මෙම ඉඩම සඳහා අංක 16/1370/724/054 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ III යෝජනාව ප්‍රකාරව ත්‍රෛපාර්ශවීය අවබෝධතා ගිවිසුමකට එළඹීමට පෙර, නීතිපතිතුමාගේ නිශ්කාශනය ලබාගත යුතු අතරම ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත තීරණය කරණු ලබන බද්දකට යටත්ව මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදිය යුතු බවට ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා නිර්දේශ කර තිබුණත්, එසේ කටයුතු නොකර ගම්පොළ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට බදු දී තිබුණි. ගම්පොළ නගර මධ්‍යයේ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2016 සැප්තැම්බර් 10 දින මුල්ගල තබා තිබුණු අතර, අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව,	2021	අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අදාළ අනුමැතිය ලබා ගත යුතුය. ප්‍රධාන තක්සේරු කරුගේ තක්සේරුව මත බදු අයකළ යුතුය. ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අදාළ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත බදු අයකර නොතිබුණි. ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	2019 පෙබරවාරි 20 දින තෙක් මෙම ගිවිසුම වලංගු වන බව දක්වා තිබූ නමුත් ඒ අනුව මේ දක්වාම ඉදි කිරීම් අරඹා නොතිබුණු අතර අරමුණු ඉටු නොවීම මත මෙම දෙපාර්තමේන්තුව සතු ඉඩමේ සන්තකය ආපසු පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.				
17.	ඔස්ට්‍රියානු ආධාර යටතේ යුරෝ. 16,600,000ක් වූ කැළණිය පැරණි දුම්රිය පාලම ඉදි කිරීමේ හා සියලු කාර්යය නිමවා (Turnkey) ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියට අනුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය මඟින් 2002 වර්ෂයේදී සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව පරිදි මෙම පාලම 2022 වර්ෂය වන තෙක් භාවිතා කළ හැකි ලෙස වාර්තා කර තිබුණි. පාලම ඉදිරි වසරකින් හෝ දෙකකින් අනිවාර්යයෙන් ඉවත් කළ යුතු වුවත් ඒ සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව හෝ ප්‍රවාහන අමාත්‍යාංශය හෝ සිදු කළ යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පෙර සූදානමක් හෝ නොමැති අතර ශක්‍යතා අධ්‍යයනයක් ද සිදු කර නොතිබුණි.	2023	ඉතාමත් කඩිනමින් ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර පාලම නැවත ප්‍රතිස්ථාපනය කළ යුතුය.	ඔස්ට්‍රියානු ණය ආධාර යටතේ මෙම පාලම නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා Turnkey ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ අතර, ඒ සඳහා ඔස්ට්‍රියානු බැංකුවක් හරහා අවශ්‍ය සහනදායි ණය ලබා දීම සඳහා එකඟ වී තිබුණි. ලංසු ඉදිරිපත් කර තිබූ ආයතනය සමඟ සාකච්ඡා කර යුරෝ මිලියන 16.8 ක් දක්වා ඇස්තමේන්තු වියදම අඩු කර ගිවිසුම් සඳහා එළැඹීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව ද දන්වා තිබුණි.	ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර පාලම නැවත ප්‍රතිස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.
18.	2022 වර්ෂයේ අතුරු අයවැය ප්‍රතිපාදන මඟින් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත "දුම්රියේ එළවළු ප්‍රවාහනය" කිරීම සඳහා රු.මි. 200 ක මුදලක් 2022 සැප්තැම්බර් 09 දින භාණ්ඩාගාර ලේකම් විසින් ලබාදී තිබූ අතර එම මුදලින් රු.198,790,847 ක් වැය කර දුම්රිය මැදිරි 05 ක් අලුත්වැඩියා කර තිබුණි.	2023	නිසි අරමුණකින් තොරව රාජ්‍ය මුදල් නිෂ්කාර්ය කටයුතු සඳහා යෙදවීමට උපදෙස් හා අනුමැතිය ලබා දුන් නිලධාරීන්ට එරෙහිව	මෙම ව්‍යාපෘතිය සඳහා වෙන් කළ මුදල මේ වන විටත් දුම්රිය දෙපාර්තමේන්තු සංවර්ධනයට දිගු කාලීනවම බලපාන කාර්යයන් සඳහා යොදවා ඇති බව හා එම වැය කිරීම් එළවළු ප්‍රවාහනය සිදු නොවුණ ද දුම්රිය ප්‍රවාහනයට කළ පිරිවැයක් බැවින්	නිසි අරමුණකින් තොරව රාජ්‍ය මුදල් නිෂ්කාර්ය කටයුතු සඳහා යෙදවීමට උපදෙස් හා අනුමැතිය ලබා දුන් නිලධාරීන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

	එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් එම සම්පූර්ණ වියදම නිෂ්කාර්ය වියදමක් වී තිබූ අතර උප දෙපාර්තමේන්තු 04 ක් සඳහා එළවළු ප්‍රවාහනය සම්බන්ධයෙන් වූ කටයුතු සඳහා ලබා දුන් ප්‍රතිපාදන වලින් උප දෙපාර්තමේන්තු 03 ක රු.96,956,246 ක් වූ ප්‍රතිපාදන අරමුණින් බැහැරව වැය කර තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 49 ක් විය.		ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	නිශ්කාර්ය වියදමක් ලෙස සැලකිය නොහැකි බව දන්වා තිබුණි.	
19.	රත්මලාන ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාලය විසින් සකසන ලද 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඔක්තෝබර් මාසය වන විට wagon 83 ක් අලුත්වැඩියා කළ යුතු වුවත් අලුත්වැඩියා කර තිබූ wagon ගණන 35 කි. මෙහි කාර්යසාධනය සියයට 42 ක් තරම් අඩු මට්ටමක පැවතුණි. පළමු මාස 10 ක කාලය තුළ මෙම wagon අලුත්වැඩියා කරනු ලබන නිලධාරීන් 269 (ආසන්න වශයෙන්) දෙදෙනෙකුට වැටුප් හා වේතනවලට අමතරව රු.3,480,188 ක දිරි දීමනා හා පැය 645,600 ක අතිකාල දීමනා ද ගෙවා තිබුණි.	2023	අධීක්ෂණ කටයුතු විධිමත් කර කාර්යසාධනය ඉහල නැංවිය යුතුය.	ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන්ට අමතරව පුහුණු ශ්‍රමයේ හිඟකම හා මහජනතාව වෙත නිසි වේලාවට අවශ්‍ය දුම්රිය මැදිරි හා එන්ජින් අලුත්වැඩියා කර සැපයීම අඛණ්ඩව සිදු කිරීමට අවශ්‍ය නිසා විශේෂ ව්‍යාපෘති ඉටු කිරීම සම්බන්ධව දීමනා හා අතිකාල ගෙවීමට සලසා තිබුණි.	අධීක්ෂණ කටයුතු විධිමත් කර කාර්යසාධනය ඉහල නැංවීම කටයුතු කර නොතිබුණි.
20.	කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ වසර 20 ක කාලය තුළ දී ඉටු කර ගැනීමට අපේක්ෂිත ඉලක්ක ඇතුළත් ශක්‍යතා අධ්‍යන වාර්තාව හා විස්තරාත්මක සැලසුම් 2021 වර්ෂයේ මාර්තු මස නිමකර අදාළ රේඛීය අමාත්‍යංශය හරහා ශ්‍රී ලංකා දුම්රිය	2021	ශක්‍යතා අධ්‍යනය ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	ශක්‍යතා අධ්‍යනය ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

	දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණි. මෙම ශක්‍යතා අධ්‍යනය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ රු. 1,446,952,381 ක මුදලක් වැය කර තිබූ අතර එම ණය සඳහා වූ ණය වාරිකය වූ ඇමරිකානු ඩොලර් 275,000 බැගින් අර්ධ වාර්ෂිකව 2022 මාර්තු 15 සහ 2022 සැප්තැම්බර් 15 ගෙවීමට නියමිතව තිබුණි. එබැවින් උක්ත ශක්‍යතා අධ්‍යනය ක්‍රියාත්මක නොකොට නිශ්කාර්යව පැවතීම තුළින් ආර්ථිකයට කිසිදු ප්‍රයෝජනයක් නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.				
21.	ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයන් (ගිවිසුම් අංක TA 9382 - SRI OF 29-10-2017) යටතේ ලද ඇමරිකන් ඩොලර් මිලියන 1.5 ක් වැය කර දුම්රිය දෙපාර්තමේන්තුව සඳහා සකස් කළ ප්‍රධාන මෙහෙයුම් සැලැස්ම (Master Plan) ක්‍රියාත්මක කර නොතිබුණි.	2021	මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගෙන නොතිබුණි.
22.	එම 6 ක්ලාස් ලොකෝස් සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ දී භාණ්ඩ හිඟයක් හෝ හානි වීමක් සම්බන්ධයෙන් භාණ්ඩ වරායට ලැබී දින 45 ක් ඇතුලත සැපයුම්කරුට දැන්විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුට භාණ්ඩ අඩුවෙන් එවා ඇති බව දැනුම් දී ඇත්තේ වසර 03 කට පසුව බැවින් රු.12,247,936 ක් වූ හිඟ භාණ්ඩ සැපයීම හෝ	2021	සැපයුම්කරුගේ සැපයුම් කොන්දේසිය අනුව අදාළ කාලය තුළ දී භාණ්ඩ අඩුවෙන් සැපයීම දැනුම් නොදීම නිසා සිදු වූ අලාභය වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගත	භාණ්ඩ නිෂ්කාශනය සඳහා අදාල ලේඛන වාප්පු අංශයට ලබා දීමේදී ප්‍රමාදයක් සිදු වී ඇති නිසාම වරායෙන් භාණ්ඩ සොයා ගැනීමේදී හා නිෂ්කාශනය කිරීමේදී ද ප්‍රමාදයක් සිදු වී තිබුණි.	සැපයුම්කරුගේ සැපයුම් කොන්දේසිය අනුව අදාළ කාලය තුළ දී භාණ්ඩ අඩුවෙන් සැපයීම දැනුම් නොදීම නිසා සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

	වටිනාකම ආපසු ගෙවීම සැපයුම්කරු ප්‍රතික්ෂේප කර තිබුණ අතර මේ වෙනුවෙන් දරා ඇති රු. 14,537,444 කට ආසන්න මුදල නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.		යුතුය.		
23.	ඇණවුම් අංක RJFM/3432/17 මගින් ඇණවුම් කළ අමතර කොටස් අඩුවෙන් සපයා වසර 02 කට වැඩි කාලයක් ද ඇණවුම් අංක RWS/3367/15 මගින් ඇණවුම් කළ භාණ්ඩ සැපයීමට අපොහොසත්වී වසර 03 කට වැඩි කාලයක්ද ගතවී තිබුණි. භාණ්ඩ අඩුවෙන් සැපයීම හා භාණ්ඩ නොසැපයීම සම්බන්ධයෙන් ගිවිසුමේ කොන්දේසි ඇතුළත් නොවීම, රැඳවුම් මුදල් තබා නොගැනීම සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂණ ලබා නොගැනීම හේතුවෙන් සැපයුම්කරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට ආයතනයට නොහැකි වී තිබුණි. ඉහත සියලු කරුණු අනුව ඉන්ඩෙන්ට් මගින් මිල දී ගැනීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතාවයන් හා නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදය හේතුවෙන් මෙම භාණ්ඩ වෙනුවෙන් දරා ඇති රු.10,345,906 ක වටිනාකම පාඩුවක් බවට පත්ව තිබුණි.	2022	ප්‍රසම්පාදනයන් වලදී වැදගත් සියළු කොන්දේසි ගිවිසුම් ගත කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. මිලදී ගැනීමේ ක්‍රියාවලියේ පවතින දුර්වලතා නිලධාරීන්ගේ නොසැලකිල්ල හා ප්‍රමාදයන් නිසා සිදු වී ඇත්නම් සිදු වූ අලාභය සඳහා වගකිමට බැඳෙන නිලධාරීන්ට එදිරිව පියවර ගත යුතුය.	වර්තමානයේ ණයවර ලිපි විවෘත කිරීමේ කොන්දේසි ප්‍රකාරව 100% සම්පූර්ණ මුදලම සැපයුම්කරු වෙත ගෙවීම් සිදු කළ යුතුය. නමුත් සපයා නොමැති භාණ්ඩ පිළිබඳව හඳුනාගත් අවස්ථාවේදීම අදාල සැපයුම්කරුවන් වෙත දන්වා ඒවා නැවත ගෙන්වා ගැනීමට හෝ මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. නමුත් මෙම තත්වය අවම කර ගැනීම සඳහා දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි හා ඊට ඇතුළත් කර ඇති කොන්දේසි, ගෙවීම් කොන්දේසි, සුරක්ෂණයක් ලබා ගැනීම ආදී කරුණු ඇතුළත් වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමට කටයුතු කරමින් පවතී.	දැනට භාවිතා කරන ලංසු ලේඛන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ට අනුකූල වන පරිදි නව ලංසු ලේඛනයක් සකස් කරමින් පවතී. සිදු වූ අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
24.	එස් 8 ක්ලාස් ලොකෝස් සඳහා අමතර කොටස් මිලදී ගැනීමේ දී 2019 අප්‍රේල් 10 දින දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු. 16,781,002 ක් වටිනා අමතර කොටස් තොගය 2021 දෙසැම්බර් 31 දින දක්වා ම භාවිතයට	2021	තොග සක්‍රියව පාවිච්චි කළ යුතුය.	2021.12.24 වන දින වන විට ඉන්ඩෙන්ටුවේ සඳහන් පිළිවෙලට පළමු අයිතමයන් හතරම භාවිතයට ගෙන අවසන් වී ඇති අතර අංක 05,06,08 යන අයිතමයන්ගෙන් ද	තොග අයිතමයන්ගෙන් කොටසක් භාවිතා කර ඇති බව හා එක් අයිතමයක් භාවිතයට සුදුසු නොවන බව දන්වා ඇත.

	නොගෙන ගබඩාවේ නිශ්ක්‍රීයව පැවතුණි.			කොටසක් භාවිතයට ගෙන ඇත. අංක 11 දරන අයිතමය භාවිතය සඳහා සුදුසු නොවන බව හඳුනාගෙන ඇති බැවින් ඒ පිළිබඳව සුදුසු පරිදි කටයුතු කිරීම සඳහා දුම්රිය ගබඩා අධිකාරී වෙත වාර්තා කර තිබුණි.	
25.	චීනයෙන් ගෙන්වා ඇති මගී මැදිරි 100 න් මේ වන විට ධාවනයට යොදවා තිබූ මගී මැදිරි සංඛ්‍යාව 17 ක් වන අතර අනෙකුත් මැදිරි මාලිගාවත්ත, රත්මලාන අංගන වල ගාල් කර තිබූ අතර තවත් මැදිරි කිහිපයක් පුත්තලම දුම්රිය ස්ථානයේ ගාල් කර තිබුණි.	2022	මිලදී ගත් මගී මැදිරි සියල්ල ධාවනයට යෙදවිය යුතුය.	දැනට චීන මැදිරි 100 පිළිබඳ තත්වය පහත පරිදි වේ. • ධාවනයේ පවතින ගණන - 19 (දුම්රිය කට්ටල 02යි) • ධාවනයට සූදානම්කර ඇති ගණන - 06 • අළුත්වැඩියාවට යැවීම සඳහා මාලිගාවත්ත අංගනයේ නවතා ඇති ගණන - 40 • මාලිගාවත්ත අංගනයේ අළුත්වැඩියා කරමින් පවතින ගණන - 02 • අලුත්වැඩියාවට රත්මලාන කර්මාන්ත ශාලාවට යවා ඇති ගණන - 32 • අනතුරට ලක්වීම නිසා ධාවනයෙන් ඉවත්කර ඇති ගණන - 01 පුත්තලම දුම්රිය ස්ථානයේ ගාල් කර තිබූ දුම්රිය මැදිරි අලුත්වැඩියාවට රත්මලාන කර්මාන්ත ශාලාවට යවා ඇත. මාලිගාවත්ත අංගනයට අයත් දුම්රිය ඉඩමේ කොටස බාහිර පාර්ශවයෙන් නිදහස් කර ගෙන දුම්රිය මැදිරි නවතාලිය හැකි පරිදි අංගනය පුළුල් කිරීම ප්‍රමාද වීම නිසා පුත්තලම,	ධාවන තත්වයේ පවතින මගී මැදිරි ගණන 25 ක් වන අතර ඉතිරි 75 ධාවන තත්වයේ නොමැත.

				අනුරාධපුරය, ගල්ඔය වැනි බැහැර ස්ථාන වල අලුත්වැඩියා කිරීමට නියමිත මැදිරි නවතා තැබීමට සිදුවී තිබුණි.	
26.	වැව්රුකන්නල ඉදිකර තිබූ විශාල ප්‍රමාණයේ කාමර 07 කින් සමන්විත සංචාරක නිවාසය 2019 සිටම නිශ්කාර්යව පැවති අතර මුරකරුවකු යොදා එයට ආරක්ෂාව සැපයුවද ගොඩනැගිල්ල හා කාමර සියල්ල භාවිතයට නුසුදුසු තත්ත්වයක පැවතුණි.	2022	ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කර එහි ආර්ථික වාසි ලබා ගත යුතුය.	වැව්රුකන්නල ඉදි කර ඇති මෙම සංචාරක නිවාසය නිවාඩු නිකේතනයක් ලෙස විධිමත්ව ජනතා පරිහරණයට යෙදවීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන ලෙස දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නි.සා.(වා) වෙත උපදෙස් ලබාදී ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.	ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත් කර නොතිබූ අතර තවදුරටත් නිශ්කාර්යව පවතී.
27.	කැකණදුර හා බෙලිඅත්ත බහුකාර්ය ගොඩනැගිලි වල ඇති සුපිරි වෙළඳසැල් සඳහා භාවිත කළ හැකි පිළිවෙළින් වර්ග අඩි 2637 ක් හා 1730 ක් වශයෙන් වූ ගොඩනැගිලි 2019 සිටම නිශ්කාර්යව පවතින අතර එම ගොඩනැගිලි බාහිර පාර්ශවයන් විසින් විවිධ සමාජ විරෝධී ක්‍රියාවලට භාවිත කරන බව නිරීක්ෂණය විය. තවද එම ගොඩනැගිලි සියල්ල භාවිතයට නුසුදුසු තත්ත්වයක පැවතුණි.	2022	ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත්කර එහි ආර්ථික වාසි ලබා ගත යුතුය.	මේ වන විට බෙලිඅත්ත දුම්රිය ස්ථානය යාබදව පිහිටා ඇති වාණිජ ගොඩනැගිල්ලෙහි බිම් මහල මාසික කුලී ගෙවීමේ පදනම මත ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ බෙලිඅත්ත ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය බවට ඉල්ලීම් සිදු කර ඇත. ඒ අනුව, මෙම ගොඩනැගිල්ලේ බිම් මහල සඳහා වසර දෙකකට බලපැවැත්වෙන පරිදි රජයේ තක්සේරුව ලෙස මාසික වෙළඳපොල කුලිය රු.115,000 ක් බව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ බෙලිඅත්ත ප්‍රාදේශීය කාර්යාලය වෙත දන්වා යවා ඇත. කැකණදුර දුම්රිය ස්ථානය යාබදව පිහිටා ඇති වාණිජ	ප්‍රයෝජනයට ගත හැකි තත්වයට පත් කර නොතිබූ අතර තවදුරටත් නිශ්කාර්යව පවතී.

				ගොඩනැගිල්ල සඳහා මෙතෙක් කිසිදු බදුකරුවෙකු ඉදිරිපත් වී නොමැත.	
28.	යාපනය දුම්රිය ස්ථානය අසල ඇති අධීක්ෂණ කළමණාකරු මාර්ග හා කර්මාන්ත කාර්යාලය අසලින් ආරම්භ වී රෝහල පාර, වෙරළ පාර, නුවර පාර හරහා ගොස් යාපනය ජැටිය දක්වා දුම්රිය මාර්ගයක් පැවත තිබී ඇති අතර එම දුම්රිය මාර්ගය හා ඊට අදාළ දුම්රිය රක්ෂිත ඉඩම් සියල්ල ප්‍රදේශ වාසීන් විසින් අත්පත් කරගෙන වසර 20 කට වැඩි කාලයක සිට භුක්ති විඳිමින් පවතී. මේ සම්බන්ධව වගකිව යුතු දුම්රිය බලධාරීන් කිසිදු පියවරක් නොගැනීම තුළින් මෙම දේපළ අවභාවිතයට ලක්වී තිබුණි.	2022	දුම්රිය රක්ෂිතයන් විධිමත් පරිදි බදු ලබාදී ආදායම් අයකර ගත යුතුය.	යාපනය දුම්රිය ස්ථානය අසල ඇති අධීක්ෂණ කළමනාකරු මාර්ග හා කර්මාන්ත කාර්යාලය අසලින් ආරම්භ වී යාපනය ජැටිය දක්වා භාවිත කර තිබූ රේගු මාර්ගයට අයත් දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශය සතු බදු ගොනු පිළිබඳව හා මේ වන විට ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් පිළිබඳව දු.ආ.සේ. වෙතින් පූර්ණ වාර්තාවක් කැඳවා ඇති අතර, අදාළ වාර්තාව ලැබීමෙන් පසු මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	දුම්රිය රක්ෂිත ඉඩම් විධිමත් පරිදි බදු ලබාදීමට හෝ අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.
29.	අනුරාධපුර අධීක්ෂණ කළමනාකරු (ගොඩනැගිලි) සඳහා අයත් ක්ෂේත්‍ර නිවාස (දෙමහල්) 05 ට අදාළව පවතින කාමර 69 කින් කාමර 23 ක් මාස 02 සිට අවුරුදු 15 මාස 07 දක්වා වූ කාල පරාසයක් තුළ ද, බංගලා නිවාස 56 කින් 06 ක් මාස 05 සිට අවුරුදු 05 මාස 09 දක්වා වූ කාල පරාසයක් තුළද, යුගල නිවාස 189 කින් 31 ක් මාස 02 සිට අවුරුදු 12 මාස 07 දක්වා වූ අතර කාල පරාසයක් තුළද භාවිතයෙන් තොරව ඌන උපයෝජිතව පැවතුණි.	2023	මෙම නිවාස අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී වන්නේද යන්න පිළිබඳව සක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඒ අනුව කටයුතු කළ යුතුය.	පදිංචියෙන් තොරව නිල නිවාස වසර ගණනාවක් හිස්ව පැවතීම නිසා ගරාවැටීමට ලක්වීම සිදුව ඇත. නමුත් ප්‍රවාහන අධිකාරි (අනුරාධපුරය) විසින් මෙම නිල නිවාස යම් අයෙකු වෙත වෙන් කළ පසු එම පදිංචිකරුගේ අවශ්‍යතාවය පරිදි අළුත්වැඩියා කටයුතු සිදු කලද මෙම නිවාස හිස් තත්වයේ පැවතීම හේතුවෙන් තවදුරටත් අබලන් තත්වයට පත්වී තිබුණි.	මෙම නිවාස අළුත්වැඩියා කිරීම ආර්ථිකමය වශයෙන් ඵලදායී වන්නේද යන්න පිළිබඳව සක්‍යතා අධ්‍යයනයක් සිදු කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.
30.	රුමේනියන් කෝච්චි පෙට්ටි 13 ක් 2021 මැයි 11 වන දින සිට විගණිත දින වූ 2023 ජූලි	2023	භාවිතයට ගත හැකි කෝච්චි පෙට්ටි මඟී	පිළිතුරු ලබා දී නොමැත.	භාවිතයට ගත හැකි කෝච්චි පෙට්ටි මඟී ප්‍රවාහනයට යොදා

	26 දින වන විටත් එනම් අවුරුදු 02 මාස 02 ක කාලයක් යාපනය දුම්රිය ස්ථානයේ කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව නවතා තබා තිබුණි.		ප්‍රවාහනයට යොදා ගත යුතු අතර භාවිතයට ගත නොහැකි කෝච්චි පෙට්ටි විනාශ වී යාමට නොදී ප්‍රයෝජනවත් කාර්යයකට යොදා ගත යුතුය.		ගත යුතු අතර භාවිතයට ගත නොහැකි කෝච්චි පෙට්ටි විනාශ වී යාමට නොදී ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොතිබුණි.
31.	දුම්රිය ස්ථාන 04 ක ඇති වැගන් හා දුම්රිය මැදිරි 69 ක් වර්ෂ ගණනාවක සිට දුම්රිය ස්ථානවල නවතා දමා ඇති අතර ඒවා දිරාපත් වී විනාශයට පත් වෙමින් තිබුණි. අළුත්වැඩියා කළ හැකි මැදිරි හඳුනාගෙන ඒවා ආරක්ෂා කර ගැනීමටත්, ඒවා අළුත්වැඩියා කර සේවයේ යෙදවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	අළුත්වැඩියා කළ හැකි මැදිරි හඳුනා ගෙන ඒවා ආරක්ෂා කිරීමටත්, ඒවා අළුත්වැඩියා කිරීමටත් කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	අළුත්වැඩියා කළ හැකි මැදිරි හඳුනා ගෙන ඒවා ආරක්ෂා කිරීමටත්, ඒවා අළුත්වැඩියා කිරීමටත් කටයුතු කර නොතිබුණි.
32.	අංක 68 - 5023 දරන ට්‍රක් රථය 2007 මාර්තු 03 දින අම්බලන්ගොඩදී ගිනිගෙන විනාශ වී තිබූ අතර එහි අලාභය රු. 2,200,000 ක් ලෙස ප්‍රාරම්භක වාර්තාවේ දක්වා තිබුණි. එහෙත් මෙම සිදුවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිවයුත්තන් සිටී නම් එහි අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2014 වර්ෂයේ අප්‍රේල් මස 09 වන දිනට පසුව එම ගොනුව යාවත්කාලීන කර නොතිබූ බවද නිරීක්ෂණය විය.	2023	රෙගුලාසි ප්‍රකාරව පරික්ෂණ පවත්වා වගකිවයුත්තන් සිටීනම් අලාභ අයකර ගත යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	රෙගුලාසි ප්‍රකාරව පරික්ෂණ පවත්වා වගකිවයුත්තන්ගෙන් අලාභ අයකර නොතිබුණි.
33.	දුම්රිය දෙපාර්තමේන්තුව සතුව M class එන්ජින් 103 ක් ද S class එන්ජින් 133 ක් ද 2023 වර්ෂය අවසානයට පැවති අතර විගණනයට භාජනය වූ M class එන්ජිමක වටිනාකම රු. මිලියන 15 සිට	2023	එන්ජින් අලුත්වැඩියාවන් සඳහා සැලසුමක් සකස් කර එයට අනුව අළුත්වැඩියාව	පිළිතුරු ලබා දී නොමැත.	එන්ජින් අලුත්වැඩියාවන් සඳහා සැලසුමක් සකස් කර එයට අනුව අළුත්වැඩියාවන් සිදු

	765 ක් දක්වා අතර වටිනාකමකට ද S class එන්ජිමක වටිනාකම රු. මිලියන 8 සිට 218 දක්වා අතර වටිනාකමකට ද මිලදී ගෙන තිබුණි. අලුත්වැඩියාවට යොමු කර තිබූ M class එන්ජින් 47 හා S class එන්ජින් 31 අලුත්වැඩියා නොකර වසර 01 ත් 07 ත් දක්වා වූ කාලයක් තිස්සේ ධාවනාගාර වල (running shed වල) හෝ රත්මලාන වැඩපලෙහි රඳවා ගෙන තිබූ අතරම එක් එන්ජිමක වටිනාකම රු. මිලියන 765 බැගින් 2019 වර්ෂයේදී අවසාන වරට මිලදී ගෙන තිබූ M-11 එන්ජින් 10 න් එන්ජන් 05 ක් ධාවනයෙන් ඉවත් කර අලුත්වැඩියාව සඳහා යොමු කර තිබුණි. මුල් කාලයේදී මිලදී ගත් M class එන්ජින් වල ක්‍රියාකාරීත්වය ඉහල තත්ත්වයක් පෙන්නුවද මෑතකදී මිලදී ගත් එන්ජින් වල ක්‍රියාකාරීත්වය දුර්වල වීමට තාක්ෂණික සහ වෙනත් අඩුපාඩු හේතුවී තිබුණි.		න් නිම කළ යුතුය. එන්ජින් මිලදී ගැනීමේදී තාක්ෂණික වශයෙන් ශ්‍රී ලංකාවේ මාර්ග හා අනිකුත් අවශ්‍යතාවයන්ට වඩාත් ගැලපෙන එන්ජින් මිලදී ගැනීම කළ යුතුය.		කර නොතිබුණි. එන්ජින් 10 න් එන්ජන් 05 ක් අළුත්වැඩියාවන් සඳහා නවතා ඇත.
34.	දිස්ත්‍රික් ඉංජිනේරු (ඉහල), ප්‍රවාහන අධිකාරී කාර්යාලය (කොළඹ), ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු හා දිස්ත්‍රික් ඉංජිනේරු (උතුර) කාර්යාලය යන උප දෙපාර්තමේන්තු 04හි වටිනාකම තක්සේරු නොකළ අලාභ හානි සිද්ධීන් 223 ක් තක්සේරු කර නොතිබූ අතර එම සිද්ධීන් අතරින් සිද්ධි 172 ක් වසර 30කට වඩා පැරණි සිද්ධීන් විය.	2021	පැරණි අලාභ හානි වටිනාකම තක්සේරු කර අය කිරීමට කටයුතු කළ යුතුය.	වසර 05 කට වඩා කල්ගත වීඇති නමුත් අවසන් කිරීමට මේ වන තෙක් කටයුතු කර නොමැති අලාභහානි සම්බන්ධයෙන් නොපමාව කටයුතු කරන ලෙසත් මෙම අලාභයන් අවසන් කිරීමට කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කරන ලෙසත් උප දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දන්වා තිබුණි.	පැරණි අලාභ හානි වටිනාකම තක්සේරු කර අය කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කර ඒ අනුව ක්‍රියා කිරීමට උපදෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දන්වා ඇත.
35.	වසර 30 කට වඩා වැඩි කාලයක් ඉක්ම ගොස් ඇතත් ප්‍රධාන දුම්රිය	2021	මුදල් රෙගුලාසි ප්‍රකාරව	වසර 05 කට වඩා කල්ගත වී ඇති නමුත් අවසන් කිරීමට මේ වන	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව දන්වා

	ගණකාධිකාරී කාර්යාලය, වාණිජ අධිකාරී කාර්යාලය, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය, ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු, ප්‍රවාහන අධිකාරී (කොළඹ) හා පීලි පැනීම් යන අංශ වලට අදාළ හානි හා පාඩු සිද්ධීන් 35 කට අදාළ රු. 91,231,001 ක අලාභ හානි නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.		කටයුතු කළ යුතුය.	තෙක් කටයුතු කර නොමැති අලාභහානි සම්බන්ධයෙන් නොපමාව කටයුතු කරන ලෙසට උප දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත දන්වා තිබුණි.	ඇතත් නිරවුල් වී නොමැත.
36.	භාණ්ඩ නිසි ප්‍රමිතියෙන් හා නිවැරදි ප්‍රමාණයන්ගෙන් ලද බවට ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව ගබඩා සැපයුම් සඳහා ගෙවීම් කළ යුතු වුවද, එසේ කිසිදු සහතිකවීමකින් තොරව සැපයුම්කරු හට මුදල් ගෙවීම හේතුවෙන් සපයා නොමැති භාණ්ඩ සඳහා රු. 95,763,117 ක් ගෙවා තිබුණි.	2021, 2022	ගෙවීම් සහතික කරනු ලබන නිලධාරියා විසින් සහතිකවීමෙන් අනතුරුව විධිමත් අධිකාරී බලයක් යටතේ ගෙවීම් සිදු කල යුතුය. අලාභයට වගකිවයුතු නිලධාරින්ගෙන් අලාභය අයකර ගත යුතුය.	නව ලංසු ලේඛනයක් සකස් කිරීමටත්, දෙපාර්ශවයටම අගතියක් නොවන පරිදි විධිමත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීමටත් ලේඛන සැකසීම සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීමට තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර ඇත. දැනට නොසැපයූ භාණ්ඩ සඳහා කර ඇති ගෙවීම් නිරවුල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා ප්‍රසම්පාදන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විෂය ලිපිකරුවන් දෙදෙනෙක් පත් කර මාස 06 ක් ඇතුළත මෙම කටයුතු අවසන් කිරීමට උපදෙස් ලබා දී තිබුණි.	විධිමත් අධිකාරී බලයක් යටතේ මෙම කටයුතු අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇතත් මෙම වටිනාකම නිරවුල් වී නොමැත. වගකිවයුතු නිලධාරින්ගෙන් මෙතෙක් අලාභය අයකර ගැනීමට කටයුතු කර නොමැත.
37.	සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු. 616,141,592 ක් වූ අතර එයින් සියයට 19 ක් වූ රු. 116,958,556 ක් වර්ෂ 02 ත් 23 ත් අතර පැරණි ශේෂයන් විය. මුදල් ගෙවා වර්ෂ 02 කට වැඩි කාලයක් ගත වී ඇති මෙම ශේෂයන් භාණ්ඩ ලැබීම් පත්‍ර මඟින් නිරවුල් නොවීමට හේතු විගණනයට ඉදිරිපත් නොවූ අතර මිලියන 116 කට වැඩි මෙම ගෙවීම් සපයා	2021	මෙම ණයවර ලිපි නිරවුල් කිරීමට පියවර ගත යුතුය.	1998-2009 වර්ෂවල පවතින නිරවුල් නොවූ ණයවර ලිපි වටිනාකම රු. 35,715,002 ක් වන අතර ඉතා පැරණි ශේෂයන් හේතුවෙන් මෙම තොරතුරු හඳුනා ගැනීමෙන් පසු ඉදිරියේදී නිවැරදිව ඉදිරිපත් කරන බව හා 2010-2020 දක්වා නිරවුල් නොවූ වටිනාකම 2022 පෙබරවාරි මසට රු.144,516,621.09 ක් වන අතර ඉදිරියේදී	මෙම ණයවර ලිපි නිරවුල් කිරීම ඉදිරියේදී සිදු කරන බව දන්වා ඇතත් රු.119,019,690 ක ශේෂයක් තවදුරටත් නිරවුල් කිරීමට පවතී.

	නොමැති භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවා ඇති මුදල්ද යන්න විගණනයේදී මතභේදකාරී විය.			භාණ්ඩ ලැබීම් පත්‍ර කඩිනමින් ලබාගෙන ඉතිරි මුදල් ද තොගයට ඇතුළත් කිරීමේ කටයුතු කරන බව දන්වා තිබුණි.	
38.	භාණ්ඩ ආනයනය කිරීමේදී නිශ්කාෂණ කටයුතු කාර්යක්ෂමව හා කඩිනමින් ඉටුකර නොගැනීම මත වාර්ෂිකව විශාල මුදලක් ප්‍රමාද ගාස්තු හා පොළී වශයෙන් ගෙවීමට සිදුව ඇති අතර සමාලෝචිත වර්ෂය තුල එසේ ගෙවා ඇති මුදල රු.5,044,787 ක් විය. ප්‍රමාද ගාස්තු හා පොළී ගෙවීම ආයතනයේ සාමාන්‍ය කටයුත්තක් බවට පත්ව තිබූ අතර ගබඩා අත්තිකාරම් ගිණුමට අදාළව 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ගෙවන ලද ප්‍රමාද ගාස්තු හා පොළී වටිනාකම රු.73,921,280 ක් වී තිබුණි.	2021, 2022	ප්‍රමාද ගාස්තු හා පොළී ගෙවීම් වලට හේතු සොයා බලා භාණ්ඩ ආනයනය කිරීමේ යාන්ත්‍රනය කාර්යක්ෂම කළ යුතුය.	ආනයනික භාණ්ඩ සඳහා ගෙවීමේදී ලියකියවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය මත බැංකුව විසින් අය කරන ලද පොළී වටිනාකම හා සමාලෝචිත වර්ෂය තුළදී ආනයනික භාණ්ඩ සඳහා දැරූ ප්‍රමාද ගාස්තු සහ භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් ප්‍රමාණය අනුව භාණ්ඩ නිෂ්කාශනය සිදුකරන බැවින් ලැබෙන අක්මුදල් ප්‍රමාද වී ලැබීම හේතුවෙන් නැව් සංස්ථාවට ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වීම නොවැළැක්විය හැකි තත්ත්වයක් බව දන්වා තිබුණි.	ප්‍රමාද ගාස්තු හා පොළී ගෙවීම් වලට හේතු සොයා බලා භාණ්ඩ ආනයනය කිරීමේ යාන්ත්‍රනය කාර්යක්ෂම කර නොතිබුණි. 2023 වර්ෂය තුලදී ද රු.2,005,535 ක් ප්‍රමාද ගාස්තු හා පොළී වශයෙන් ගෙවා තිබුණි.
39.	ධාවනාගාර 04 කට අදාළව පවත්නා ඩීසල් තොග ලේඛන අනුව ශේෂය හා මාසික ලැබීම්, නිකුත් කිරීම් අනුව පැවතිය යුතු ශේෂය අතර ලීටර් 450 ත් ලීටර් 12568 ත් අතර පරාසයක වෙනස්කම් නිරීක්ෂණය වූ අතර මෙම වෙනස්කම් සඳහා හේතු දැක්වීමට වගකිවයුතු පාර්ශවයන් අපොහොසත් විය.	2021	වෙනස් වීම් වලට අදාළ නිශ්චිත හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.	පිළිතුරු ලබා දී නොමැත.	වෙනස් වීම් වලට අදාළ නිශ්චිත හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.
40.	“පිබිදෙමු පොළොන්නරුව” සංවර්ධන වැඩසටහන යටතේ මූල්‍ය මධ්‍යස්ථානය ඉදි කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම් නාගරික සංවර්ධන අධිකාරියට ලබාදීම සඳහා අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව වර්ග අඩි 442 ක		ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම මත ගිවිසුම අවලංගු කර සන්තකය පවරා ගැනීමට කටයුතු කළ	පිළිතුරු ලබා දී නොමැත.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම මත ගිවිසුම අවලංගු කර සන්තකය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

රැස්වීම් ශාලාවක් ඉදි කිරීම සහ ස්ථිර මාර්ග පරීක්ෂක කාර්යාලය, විවේකාගාර, උපකරණ ගබඩාව, තෙල් ගබඩාව හා දිස්ත්‍රික් ඉංජිනේරු විවේකාගාරය සඳහා සුදුසු වන පරිදි අළුත්වැඩියාවන් සිදු කොට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව භාවිතා කරනු ලබන ගොඩනැගිලි හා එම ඉඩම් කොටස ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් නිදහස් කර නාගරික සංවර්ධන අධිකාරිය විසින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතු වුවද, විගණිත අවස්ථාව වූ 2023 ඔක්තෝබර් 16 වන විට ගිවිසුම් ගත කාලය අවසන් වී වසර 03 මාස 06 කට ආසන්න කාලයක් ගතවී ඇතත් එකී ගිවිසුම් ප්‍රකාරව ඉදි කිරීම් හෝ අලුත්වැඩියාවන් සිදුකර නොතිබුණි. එහිදී ගිවිසුම ප්‍රකාරව අගතියට පත් පාර්ශවයට අවබෝධතා ගිවිසුම අවලංගු කර දුම්රිය දෙපාර්තමේන්තු ඉඩමේ සන්තකය ආපසු පවරා ගත හැකි වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි.	යුතුය.

83. ශීර්ෂය - 307 **මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,767,934,116	192,039,166	2,575,894,949	තත්ත්වාගණනය කළ
2022	2,634,471,132	62,738,560	2,571,732,572	තත්ත්වාගණනය කළ
2023	2.643,204,492	4,509,834	2,638,694,657	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශය ක්‍රියාත්මක තත්ත්වය
01	අංක 01/2015 හා 2015 ජුලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 04 (ආ) ඡේදය ප්‍රකාරව 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සුබෝපභෝගී අංශයේ හිඟ බදු ආදායම රු.82,669,000 සිට රු.214,323,900 දක්වා රු.131,654,900කින් වැඩිවීමක් නිරීක්ෂණය වන අතර එම හිඟ ආදායම අයකර ගැනීමට හෝ අයවීමට ඇති හිඟ ආදායම තව තවත් එකතුවීම වැළැක්වීමට හෝ අදාල ක්ෂණික පියවර ගෙන නොතිබීම.	2021	නීති රීති රෙගුලාසි අනුව කටයුතු කිරීමට පියවර ගැනීම.	බදු ගෙවීම පැහැර හැර ඇති හඳුනා නොගත් සියලු වාහන හිමියන් සඳහා සිහි කැඳවීම් ලිපි යවා ඇත. රක්ෂණ ආයතන දැනුවත් කර ඇති අතර එමගින් විශාල හිඟ බදු ආදායමක් අයකර ගැනීමට හැකි වී ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
02	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වන වාහන පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලබාදීම අරමුණු කරගත් තොරතුරු හුවමාරු ක්‍රමවේදයට අදාළ පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය 2018 වර්ෂයෙන් පසු අක්‍රිය වී තිබුණු අතර ඒ වෙනුවෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් Informatics International (Ltd) ආයතනය වෙත 2018 දෙසැම්බර් 19 දින දක්වා ගෙවන ලද රු.2,420,000ක මුදල අනාර්ථික වියදමක් බව	2021	වැය කරන ලද මුදලට සරිලන උපයෝජනයක් ලැබෙන පරිදි රාජ්‍ය මුදල් භාවිතා කළ යුතු වීම.	නිරීක්ෂණය හා එකඟ වී ඇත. වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

නිරීක්ෂණය විය.

03	පද්ධතිය තුළ පැවති පැරණි වාහනවල දත්ත වෙනස් කරමින් සුඛෝපභෝගී ජීප් රථ 11ක් ඇතුළු වාහන 14 ක් සඳහා ගෙවිය යුතු නිෂ්පාදන බදු, සුඛෝපභෝගී බදු සහ අනිකුත් රජයේ අය කිරීම් යනාදී ලෙස රු.499,569,300ක ආදායමක් රජයට අහිමි වී තිබුණි.	2021	නිසි විමර්ශනයක් සිදුකර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.	මෙම වාහන 14 අතරින් වාහන 6ක් සඳහා සුඛෝපභෝගී බදු ගෙවා ඇති බවත් ඉතිරි වාහන සඳහා බදු අය කර ගැනීමට කටයුතු කරන බවත් දන්වා ඇත. රේගු දෙපාර්තමේන්තුව විසින් අදාළ නිෂ්කාශන බදු ගෙවීමෙන් පසු Data Link කිරීමට කටයුතු කරන අතර එම Data Link වී ඇති රථ පමණක් ලියාපදිංචිය සිදුකරයි	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
04	වාහන ලියාපදිංචි අංක අනුපිළිවෙලට නිකුත් කිරීම වෙනුවට ඇතැම් අංක හිස්ව තබමින් වාහන ලියාපදිංචි කර තිබුණු අතර පසුව එම වෙන් කළ හිස් අංක යටතේ පරිගණක පද්ධතියට සාවද්‍ය ලෙස දත්ත ඇතුළත් කර නව වාහන 05ක් ලියාපදිංචි කර තිබුණි. එමඟින් දළ වශයෙන් සුඛෝපභෝගී බදු, නිෂ්පාදන බදු සහ අනෙකුත් රජයේ අය කිරීම් ලෙස රු.4,643,800ක් රජයට අහිමිව ඇති බව නිරීක්ෂණය විය.	2021	නිසි විමර්ශනයක් සිදුකර නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.	වාහන 4ක් සඳහා මහජන බැංකුවේ රිසිට්පත් මගින් මුදල් අය කරගෙන ඇත. එක් වාහනයක් බදු අයවිය යුතු වාහනයක් ලෙස හඳුනාගෙන ඇති අතර වර්තමාන අයිතිකරු වෙත අදාල බදු මුදල ගෙවීමට පැමිණෙන ලෙස ලිපියක් මගින් දන්වා ඇත. රේගු දෙපාර්තමේන්තුව විසින් අදාළ නිෂ්කාශන බදු ගෙවීමෙන් පසු Data Link කිරීමට කටයුතු කරන අතර එම Data Link වී ඇති රථ පමණක් ලියාපදිංචිය සිදුකරයි	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
05	ද්විත්ව කාර්ය වාහන සඳහා වන ලියාපදිංචි අංකය යටතේ විශේෂ කාර්යයන් සඳහා ආනයනය කළ වාහන ලියාපදිංචි කිරීම හේතුවෙන් 2018 හා 2019 වැනි වර්ෂ වලදී වාහන 9ක් සඳහා පමණක් රු.27,472,988ක රේගු බදු මුදලක් රජයට අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය.	2021	නිසි විමර්ශනයක් සිදුකර අහිමිවී ගිය ආදායම් රජයට අයකර ගැනීමට කටයුතු කිරීම	ශ්‍රී ලංකා රේගුව මඟින් බදු මුදල් අයකර අප දෙපාර්තමේන්තු පරිගණක ජාලයට එම ගෙවීම් පිළිබඳ විස්තර සම්බන්ධවීමෙන් පසුව පමණක් වාහන ලියාපදිංචිය සිදු කරයි. මෙම වාහන 9 අතරින්	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	මෙලෙස සාවද්‍ය ලියාපදිංචි කිරීම් වැළැක්වීමට අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණි.			PZA කාණ්ඩයට අයත් වන්නේ එක් වාහනයක් පමණක් වන බැවින් එම වාහනයේ ගොනුව ගෙන්වා අක්‍රමිකතාවයක් සිදු වී ඇත්දැයි කරුණු වාර්තා කිරීමට උපදෙස් ලබා දී ඇත. ඉදිරියේදී මෙවන් අක්‍රමිකතාවයන් සිදුවීම වළක්වා ගැනීමට අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	
06	ජර්මන් රජයේ පරිත්‍යාගයක් ලෙස වෛරහැර වාහන පරීක්‍ෂා කිරීමේ මධ්‍යස්ථානයට 2004 වර්ෂයේ දී ලද පරීක්ෂණ උපකරණ 6ක් 2022 මැයි 20 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.	2021	දෙපාර්තමේන්තුව සතු සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනයට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.	මෙම උපකරණවලින් යාන්ත්‍රිකව සිදුකළ හැකි ක්‍රියාවන් කිහිපයක් පමණක් සිදුකිරීමට හැකි ආකාරයට උපකරණ 2ක් පමණක් සකස් කර භාවිතා කරනු ලබයි. ප්‍රමිතියකින් යුතු තාක්ෂණික වාර්තාවක් සැපයීමට අවශ්‍ය උපකරණ මිලදී ගැනීමට ප්‍රතිපාදන නොලැබුණු බැවින් මෙම උපකරණවල වර්තමාන තත්ත්වය හා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජ්‍යෙෂ්ඨ මෝටර් වාහන පරීක්ෂකවරයකුගේ සභාපතීත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
07	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් මහජනයා වෙත ලබා දෙන සේවාවන් සඳහා එක් එක් ආදායම් සංකේත යටතේ දෛනිකව ලැබිය යුතු ආදායම නිවැරදිව එකතු වන බව තහවුරු කර ගැනීම සඳහා ලබා දෙන සේවාවන් අනුව ආදායම හා ලද ආදායම සැසඳීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබීම හේතුවෙන් සපයන සේවාවන් හා සබැඳිව අයවිය	2022, 2023	දෙපාර්තමේන්තුව සැපයූ සේවාවන් අනුව ලැබිය යුතු ආදායම හා ලද ආදායම දෛනිකව සැසඳීමට කටයුතු කළ යුතුය.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ පවතින bank link ආදායම් අධීක්ෂණ පරිගණක පද්ධතිය මඟින් දෙපාර්තමේන්තුවේ දෛනික ආදායම් රැස් කිරීම බැංකු ගිණුම් සමඟ දෛනිකව සසඳා තහවුරු කිරීමෙන් පසුව දෛනික ආදායම් ගිණුම් ගත කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	යුතු ආදායම නිසි ලෙස ගිණුම් ගත වී ඇති බව තහවුරු කර ගැනීමකින් තොරව රු.9,636,851,446ක බැංකුවට ලද ආදායම ගිණුම් ගත කර තිබුණි.			2003.02.14, 1003.07.09, 1003.07.04 හා 2003.02.15 ආදායම් සංකේත යටතේ රැස්කළ සමස්ථ ආදායම රු. 9,636,851,446 නිවැරදි බව සඳහන් කර ඇත.	
08	2007 ජුලි 9 දිනැති 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ 5 වගන්තිය හා 6 (1) අ, ආ, ඇ, ඡේද ප්‍රකාරව පරිගණකයට යම් කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීම සඳහා තමාට අධිකාරී බලයක් නොමැති බව දන්වමින්, හිතාමතා යම් පරිගණකයකට හෝ පරිගණක පද්ධතියකට අනවසර වෙනස්කමක් හෝ අලාභයක් සිදු කිරීමත්, එය ජාතික ආරක්ෂාවට, ජාතික ආර්ථිකයට හෝ මහජන ආරක්ෂාවට හානියක් සිදුකරන ඕනෑම තැනැත්තෙක් වරදකරුවකු වන බව දක්වා තිබුණත් දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය වෙනස් කරමින් නිරන්තරයෙන් වංචනික ක්‍රියා සිදු වන බවට අනාවරණය වුවත්, එම වංචා වළක්වා ගැනීමටත් අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	2022	පරිගණක ආශ්‍රිත වංචා වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කළ යුතුය.	දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය 2004 වර්ෂයේදී පමණ ස්ථාපනය කරන ලද මෘදුකාංග හා දෘඩාංග මත පදනම්ව ක්‍රියාත්මක කරනු ලබයි. E-Motoring ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා වීම හේතුවෙන් දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු නොවුණි. පරිගණක පද්ධතියේ ආරක්ෂාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය අනුබද්ධ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SL CERT)මඟින් පරිගණක ආරක්ෂණය පිළිබඳ විගණනයක් සිදු කිරීමට කටයුතු කර ඇති අතර, එහි ප්‍රතිඵල මත පද්ධති ආරක්ෂාව සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග සිදු කිරීමට කටයුතු කරනු ඇත. තවද පරිගණක දත්ත පද්ධතිය ආශ්‍රිත කටයුතු (අනාරක්ෂිත ප්‍රවේශ හා දත්ත වෙනස් කිරීම් ආදී කටයුතු) අධීක්ෂණය සඳහා Privilege Access Management පද්ධතියක් ස්ථාපනය	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				කිරීමට කටයුතු කරන ලදි. එමඟින් අනවසර ප්‍රවේශ සහ වරප්‍රසාදිත ගිණුම් නියාමනය මෙමඟින් සිදු කරනු ලබයි.	
09	ලියාපදිංචි අංක KE - XXXX යටතේ පූර්වයෙන් ලියාපදිංචිව පැවති CEYGRA වර්ගයට අයත් මෝටර් රථයක දත්ත සාවද්‍ය ලෙස වෙනස් කොට MITSUBISHI PAJERO වර්ගයේ මෝටර් රථයක දත්ත ඇතුලත් කර 2019 වර්ෂයේදී මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් වංචනිකව නිකුත් කිරීම හේතුවෙන් දඩ මුදල් ද ඇතුලුව රු.757,500ක සුඛෝපභෝගී බදු ආදායමක් හා රු.35,200,000 නිෂ්පාදන බදු ආදායමක් අහිමි වී තිබුණි.	2022	විගණන නිරීක්ෂණ හා සබැඳිව විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	මෙවැනි පාඩු හා හානි වාර්තා වී නොමැති අතර, හානි හා පාඩු ලෙස සනාථ වූ පසු වාර්තා කිරීමට කටයුතු කරනු ලබයි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
10	මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතිය අනුව KE–XXXX දරණ අංකය යටතේ CRYGRA වර්ගයට අයත් මෝටර් රථයක් ලියාපදිංචි වී ඇති නමුත් 2018 වර්ෂයේදී එකී දත්ත වෙනස් කර MINICOOPER වර්ගයේ මෝටර් රථයක දත්ත ඇතුලත් කර මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් නිකුත් කර තිබීම හේතුවෙන් රු.5,513,000ක නිෂ්පාදන බදු ආදායමක් හා රු.44,050ක නව ලියාපදිංචි ගාස්තුවක් අහිමි වී තිබුණි.	2022	විගණන නිරීක්ෂණ හා සබැඳිව විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	මෙවැනි පාඩු හා හානි වාර්තා වී නොමැති අතර, හානි හා පාඩු ලෙස සනාථ වූ පසු වාර්තා කිරීමට කටයුතු කරනු ලබයි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
11	මෝටර් රථ ලියාපදිංචි තොරතුරු පද්ධතිය අනුව ලියාපදිංචි අංක KE – XXXX දරණ අංක යටතේ CEYGRA වර්ගයේ බර 580Kg පෙට්‍රල්මෝටර් රථයක් ලියාපදිංචි වී ඇතත් 2018 වර්ෂයේදී එකී දත්තයන් වෙනස්	2022	විගණන නිරීක්ෂණ හා සබැඳිව විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට ක්‍රියා	මෙවැනි පාඩු හා හානි වාර්තා වී නොමැති අතර, හානි හා පාඩු ලෙස සනාථ වූ පසු වාර්තා කිරීමට කටයුතු කරනු ලබයි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	කොට TOYOTA වර්ගයේ බර 2580Kg ඩීසල් මෝටර් රථයක දත්ත ඇතුලත් කර ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීම හේතුවෙන් රු.49,920,000ක නිෂ්පාදන බදු ආදායමක් අහිමි වී තිබුණි.		කළ යුතුය.		
12	මෝටර් රථ ලියාපදිංචි කිරීමේ දත්ත පද්ධතියෙහි පූර්ව ලියාපදිංචි වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර අනීතිකව ආනයනය කරන ලද යතුරුපැදිවල වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර ලියාපදිංචි සහතික නිකුත්කර ඇති යතුරුපැදි 91ක එන්ජින් ධාරිතාවය සැලකිල්ලට ගත් කල වලංගු රේගු සටහන්කරයක් සහිතව ආනයනය නොකිරීම හේතුවෙන් රු.55,207,475ක රේගු බදු ආදායමක් රජයට අහිමි වී ඇති බව නිරීක්ෂණය විය.	2022	විගණන නිරීක්ෂණ හා සබැඳිව විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	මෙවැනි පාඩු හා හානි වාර්තා වී නොමැති අතර, හානි හා පාඩු ලෙස සනාථ වූ පසු වාර්තා කිරීමට කටයුතු කරනු ලබයි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
13	ලංකාවට අනීතිකව ආනයනය කරන ලද එහෙත් ලියාපදිංචි නොකළ යතුරුපැදි ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනලද අංක අමප/16/1307/709/061 හා 2016 ජූලි 05 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව හා 2016 සැප්තැම්බර් 07 වන දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ අධිභාර මුදල් අයකර ගැනීමකින් තොරව වංචනිකව පැරණි අංක යටතේ ලියාපදිංචි සහතික නිකුත් කිරීම හේතුවෙන් වාහන 91කට අදාළව රු.21,285,000ක අධිභාර ගාස්තුවක් හා රු.191,000ක නව ලියාපදිංචි ගාස්තුවක් අයකර ගැනීමේ අවස්ථාව අහිමි වීමෙන් රු.21,476,000ක රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.	2022	විගණන නිරීක්ෂණ හා සබැඳිව විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම් අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය.	මෙවැනි පාඩු හා හානි වාර්තා වී නොමැති අතර, හානි හා පාඩු ලෙස සනාථ වූ පසු වාර්තා කිරීමට කටයුතු කරනු ලබයි.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
14	මෝටර් රථ පනත ප්‍රකාරව මෝටර් රථයක් සජ්ජිත කිරීමේදී වැසිය හැර අනෙකුත් උපාංග	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක්	මේ සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර	නිර්දේශය ක්‍රියාත්මක කර

	වෙනස් කල හැකි වුවත් පෙට්‍රල් වාහනයක් ඩීසල් වාහනයක් බවට පරිවර්තනය කිරීමේදී චැසි අංකයද වෙනස් කර තිබූ අවස්ථා 27ක් නිරීක්ෂණය වී ඇති අතර ඒ අනුව මෝටර් රථයක් සජ්ජිත කරන මුවාවෙන් අනීතිකව ආනයනය කරන ලද වාහන 27ක් ලියාපදිංචි කර ඇති බව නිරීක්ෂණය විය.		සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	ඇත.	නොමැත.
15	පෙට්‍රල් මෝටර් රථයක් ඩීසල් මෝටර් රථයක් බවට පරිවර්තනය කිරීමේදී පැරණි මෝටර් රථ ලියාපදිංචි අංකය පද්ධතියෙන් ඉවත් කල යුතු වුවත් අවස්ථා 130කදී පරිවර්තිත වාහනවල ලියාපදිංචි අංක පද්ධතියෙන් ඉවත්කර නොතිබුණි.	2022	පරිවර්තිත වාහනවල ලියාපදිංචි අංක පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය	මේ සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
16	ලියාපදිංචි අංක BDA-XXXX දරණ යතුරුපැදියේ හිමිකරුගේ අනුදැනුමකින් තොරව සොරකම් කරන ලද ලිපි ලේඛන භාවිතයෙන් වෙනත් පුද්ගලයන් දෙදෙනෙකු වෙත පැවරුම් කර ඇති අතර එකී පැවරුම් සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
17	දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර නිකුත් කර ඇති ලියාපදිංචි යතුරුපැදි 99කට අදාළ චැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වෙනත් වංචනිකව ආනයනය කරන ලද යතුරුපැදිවල එන්ජින් අංක හා චැසි අංක වංචනිකව ඇතුළත් කර උක්ත පැරණි ලියාපදිංචි අංකය සඳහා නව මෝටර් වාහන ලියාපදිංචි සහතිකයක් නිකුත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියෙ හි පැරණි දත්ත මකා දමා දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	පසුගිය කාලසීමාව තුළ QR කේත මගින් ඉන්ධන ලබාදීමේ වැඩසටහනට සමගාමීව විශාල පිරිසක් ඔවුන්ගේ වාහන තොරතුරු, ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වන අතර, දිස්ත්‍රික් කාර්යාල මගින් ලියාපදිංචිය සිදු කළ යතුරුපැදි ද විගණනය මගින් පෙන්වා දෙන බව නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධව පූර්ණ	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	නිලධාරීන් කටයුතු කර තිබුණි.			අධ්‍යනයක් සිදු කර ඉදිරියේ දී කරුණු වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ.	
18	වෙනත් වාහන පංතියකට අදාළව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ඇති වාහන 31ක වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වංචනිකව ආනයනය කරන ලද යතුරුපැදිවල එන්ජින් අංක හා වැසි අංක ඇතුළත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය තුළ ඇතුළත්ව තිබූ පැරණි දත්ත පද්ධතියෙන් මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය සහ ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පරිගණක පද්ධතිය එකිනෙකට වෙනස් පද්ධතීන් 2ක් වන අතර, ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පරිගණක පද්ධතිය 2009 වර්ෂයේදී ආරම්භ කර ඇත. ආදායම් බලපත්‍ර නිකුත් කරන නිලධාරීන් විසින් එම පද්ධතිය වෙත වාහනයේ අදාළ දත්ත ඇතුළත් කර ආදායම් බලපත්‍ර නිකුත් කිරීමට පහසුකම් එම පද්ධතිය තුළ ඇති බව නිරීක්ෂණය වේ. එබැවින් දෙපාර්තමේන්තු දත්ත පද්ධතියේ දත්ත සහ ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියේ දත්ත අතර, වෙනස්කම් පිළිබඳ පූර්ණ අධ්‍යනයක් සිදු කර කරුණු වාර්තා කළ යුතු බැවින් ඉදිරියේ දී මේ සම්බන්ධව පූර්ණ වාර්තාවක් ලබා දීමට කටයුතු කරනු ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
19	පූර්වයෙන් ආදායම් බලපත්‍ර නිකුත් කර ඇති වෙනත් වාහන පන්තියකට අදාලව ලියාපදිංචි වී ඇති වාහන 29කට අදාළ වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වෙනත් නීත්‍යානුකූල නොවන ලෙස ආනයනය කරන ලද වාහනවල වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර පැරණි ලියාපදිංචි අංකය සඳහා මෝටර් රථ ලියාපදිංචි කිරීමේ	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	සහතිකයක් නිකුත් කිරීමට හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙ හි උක්ත පැරණි ලියාපදිංචියට අදාළ දත්ත මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරින් කටයුතු කර තිබුණි.				
20	පූර්ව ලියාපදිංචි මෝටර් කාර් 11ක වැසි අංක හා එන්ජින් අංක වෙනස් කර වෙනත් අනීතිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද කාර් රථයක වැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර වංචනිකව මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කිරීමට හා පැරණි මෝටර් රථයට අදාළ දත්ත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියෙන් මකා දැමීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
21	දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර ලබාගෙන නොමැති හිඟ ආදායම් බලපත්‍ර ගාස්තු සහිත ලියාපදිංචි යතුරුපැදි 04ක එන්ජින් අංකය හා වැසි අංකය වෙනස් කර වෙනත් අනීතිකව ආනයනය කරන ලද යතුරුපැදි 04ක එන්ජින් අංක හා වැසි අංක ඇතුළත් කර වංචනිකව 2022 වර්ෂයේ දී මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කර තිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
22	විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන් හා රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් ආනයනය කර රාජ්‍ය අනුග්‍රහය යටතේ තීරු බදු රහිතව නිෂ්කාශනය කොට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද පසුව එකී වාහන නැවත ප්‍රතිඅපනයනය කරන අවස්ථාවන්හි දී ලියාපදිංචි අවලංගු කරන ලද වාහන 06ක් සඳහා සාවද්‍ය ලෙස වෙනත්	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	මේ සම්බන්ධව පූර්ණ අධ්‍යනයක් සිදු කර ඉදිරියේ දී කරුණු වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	සුඛෝපභෝගී වාහනවල චැසි අංක හා එන්ජින් අංක ඇතුළත් කර වෙනත් පුද්ගලයෙකුගේ නමට ලියාපදිංචි සහතික නිකුත් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරින් කටයුතු කර තිබුණි.				
23	විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන් හා රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් නීත්‍යානුකූල නොවන ආකාරයට මෙරටට ආනයනය කරන ලද හෝ මෙරට එකලස් කරන ලද වාහන, වංචනිකව මෝටර් රථ දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචි කිරීමට කටයුතු කිරීම හේතුවෙන් දළ වශයෙන් සුඛෝපභෝගී බදු හා අනෙකුත් අයකිරීම් හැර ශ්‍රී ලංකා රේගුව විසින් අයකර ගත යුතුව තිබූ රු.122,282,900ක බදු ආදායමක් වංචනිකව අවභාවිතා කර ඇති බව නිරීක්ෂණය විය.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මේ සම්බන්ධව පූර්ණ අධ්‍යනයක් සිදු කර ඉදිරියේ දී කරුණු වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
24	පූර්ව ලියාපදිංචියක් සිදු වී නොමැති ලියාපදිංචි අංක 06ක් සඳහා වංචනිකව ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනවල එන්ජින් අංක හා චැසි අංක වංචනිකව ඇතුළත් කර ආදායම් බලපත්‍ර නිකුත් කරන ERL දත්ත පද්ධතිය අනුව පෙර වර්ෂයන් හි දී ආදායම් බලපත්‍ර නිකුත් වී නොතිබූ හා පරිගණකගත දත්ත පද්ධතිය අනුව ආසන්නතම ලියාපදිංචි අංක ලියාපදිංචි වී ඇති දිනයන් හා සැලකිල්ලට ගෙන වලංගු මෝටර් රථ ලියාපදිංචි සහතිකයක් නිකුත් කිරීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් කටයුතු කර තිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	භාවිතයට නොගත් හිස් අංක සඳහා නව වාහන ලියාපදිංචි සිදු කිරීමට පරිගණක පද්ධතිය තුළ කිසිදු හැකියාවක් නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

25	මෝටර් රථයක් ලියාපදිංචි වී නොතිබූ පැරණි හිස් අංකයක් වන 253-XXXX දරන අංකය යටතේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු හම්බන්තොට උපකාර්යාලය මඟින් 2021 ඔක්තෝබර් 24 දින ඉදිරිපත් කර තිබූ පළමු සන්තකය පැවරීමේ අයදුම්පත්‍රය හා පරම අයිතිය ලියාපදිංචි කිරීමේ අයදුම්පත් 02ක් භාවිතයෙන් අනීතික ලෙස ආනයනය කරන ලද හෝ එකලස් කරන ලද වාහනයක් සඳහා 2021 දෙසැම්බර් 03 දින වංචනිකව නීත්‍යානුකූල මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කර තිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	විගණනය මඟින් පෙන්වා දෙනු ලබන 253-XXXX දරණ මෝටර් රථයේ දත්ත වංචනික ලෙස ඇතුළත් කිරීමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් විමර්ශණ අංශය මඟින් සිදු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
26	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු දත්ත පද්ධතියට වංචනික ලෙස තොරතුරු ඇතුළත් කර ඇති දිනය 2021 දෙසැම්බර් 03 වන දින වුවත්, වංචනික ලියාපදිංචියට අදාළ ලියාපදිංචි අංකයට පෙර ලියාපදිංචි අංකය හා පසු ලියාපදිංචි අංකය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව ලියාපදිංචි කළ දිනය හා එකී වාහන නිෂ්පාදනය කළ වර්ෂයට ගැලපෙන සේ උක්ත වංචනික ලියාපදිංචි අංකය වන 253-XXXX දරන අංකය මුල් ලියාපදිංචි දින 2000 අගෝස්තු 17 දින ය හා මෝටර් රථයේ නිෂ්පාදන වර්ෂය 1997 වර්ෂය ලෙස පරිගණක පද්ධතියට ව්‍යාජ තොරතුරු ඇතුළත් කර තිබුණි.	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	විගණනය මඟින් පෙන්වා දෙනු ලබන 253-XXXX දරණ මෝටර් රථයේ දත්ත වංචනික ලෙස ඇතුළත් කිරීමක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් විමර්ශණ අංශය මඟින් සිදු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
27	වලංගු රේගු සටහන්කරයක් නොමැතිව ආනයනය කරන ලද හෝ නීති විරෝධිව එකලස් කරන ලද ද්විත්ව කාර්ය වාහනයක් සඳහා වංචනික ලෙස මෝටර් රථ ලියාපදිංචි	2022	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය	මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් විමර්ශණ අංශය මඟින් සිදු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	සහතිකයක් නිකුත් කිරීම හේතුවෙන් එකි වාහනය වෙනුවෙන් අයකළ යුතුව තිබූ ආසන්න වශයෙන් රු.6,000,000ක නිෂ්පාදන බදු ආදායමක්, රු.181,500ක සුඛෝපභෝගී බදු ආදායමක් හා රු.23,800ක මෝටර් රථ ලියාපදිංචි ගාස්තු ආදායමක් ඇතුළුව එකතුව රු.6,205,300ක බදු ආදායමක් අයකරගැනීමේ අවස්ථාව අහිමි කර තිබුණි.		ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.		
28	වාහන අනීතිකව ලියාපදිංචි වීම හා මෝටර් වාහන ලියාපදිංචි කිරීම සඳහා ව්‍යාජ හා කූඨ ලේඛන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත වසර ගණනාවක සිට විගණන වාර්තා යොමු කර ඇති අතර 2022 වර්ෂයේදී ද අවස්ථා 4කදී ව්‍යාජ ලියාපදිංචි කිරීම් හා කූඨ ලේඛන ඉදිරිපත් කිරීම් සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ ඉදිරිපත් කර තිබුණි. එහෙත් එකීවාහන පැවරුම්ලාභී ව්‍යාජ හා කූඨ ලේඛන යොමු කල පාර්ශවයන්ට එරෙහිව කිසිඳු නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2022	විගණනයෙන් පෙන්වා දී ඇති අක්‍රමිකතා සිදුවී ඇති වාහන ලියාපදිංචි අවලංගු කර ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කළ එකී වාහනවල ලියාපදිංචි හිමිකරුවන්ට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.	මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් විමර්ශණ අංශය මඟින් සිදු කරමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
29	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන ලියාපදිංචිය හා ඊට අනුශාංගික කරුණු සඳහා රාජකාරී ඉටුකිරීමට අවශ්‍ය පරිගණක දත්ත ඇතුළත් කිරීමට අවසර ඇති පරිශීලකයින්ට පරිගණක මුරපද ලබා දී තිබූ අතර දෙපාර්තමේන්තුවෙන් වෙනත් කාර්යාලවලට ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ට නිකුත් කර තිබූ මුරපද මෙන්ම, දෙපාර්තමේන්තුවේ සේවය කරන නමුත් රාජකාරී පැවරීම්	2022	සක්‍රියව පවතින පරිශීලක මුරපද හඳුනාගත හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කළ යුතුය.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතිය සඳහා අවශ්‍ය පරිශීලක නාමයන් සහ මුරපද විධිමත් ක්‍රමවේදයක් යටතේ ලබාදීම සිදු කරයි. සේවා සපයනු ලබන අංශය සහ ඉටුකරනු ලබන රාජකාරීන්ට අනුකූලව අදාළ නිලධාරීන්ට පරිශීලක නාමය ලබාදෙන අතර,අදාළ	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	අනුව භාවිත නොවන මුරපද තවමත් සක්‍රීයව හා ක්‍රියාකාරී තත්ත්වයේ පැවතීම හේතුවෙන් එකී මුරපද භාවිතයෙන් වංචා හා දූෂණ අක්‍රමිකතාවයක් සිදුකිරීමට අවස්ථාව හිමි වී ඇති බව නිරීක්ෂණය විය.			නිලධාරියා අදාළ අංශයෙන් ඉවත්වීම වාර්තා කළ වහාම නිලධාරියාට හිමි පරිශීලක නාමය අවලංගු කරනු ලැබේ. පරිශීලක නාම ලබාදීම අංශ ප්‍රධානීන්ගේ ලිඛිත ඉල්ලීම මත පදනම්ව පමණක් සිදු කරනු ලබයි.	
30	ආදායම් බලපත්‍ර වසර 03කට වැඩි කාලයක් ලබාගෙන නොමැති මෝටර් වාහන නැවත ආදායම් බලපත්‍ර ඉල්ලුම් කිරීමේ දී නියෝජ්‍ය කොමසාරිස් විමර්ෂණගේ නිර්දේශ ලබාගත යුතු බවට කොන්දේසි පනවා ඇතත්, එකී අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමෙන් පසුව ආදායම් බලපත්‍ර නිකුත් කරන බව සහතික කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි.	2022	නියෝජ්‍ය කොමසාරිස් විමර්ශන නිර්දේශ ලබා ගැනීමෙන් පසුව කල්පසු වූ ආදායම් බලපත්‍ර නැවත නිකුත් කරන බව තහවුරු කර ගැනීමට වැඩපිළිවෙලක් හඳුන්වාදිය යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
31	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මගින් අවලංගු කරන ලද හෝ නිෂ්ක්‍රීය කරන ලද වාහන ලියාපදිංචි අංක නැවත භාවිතයට ගත නොහැකි පරිදි පරිගණකගත තොරතුරු පද්ධතිය මගින් අවහිර කිරීමට කටයුතු කර නොතිබුණි.	2022	අවලංගු කරන ලද වාහන අංක නැවත භාවිතයට ගත නොහැකි පරිදි පරිගණක පද්ධතිය අවහිර කිරීමට කටයුතු කළ යුතුය.	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු පරිගණක පද්ධතියේ අවලංගු කරන ලද හෝ නිෂ්ක්‍රීය කරන ලද වාහන අංක නැවත භාවිතා කිරීමට හැකියාවක් නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
32	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් වන කොමසාරිස්වරුන් වෙත ලබා දී ඇති මුරපදයක් භාවිතයෙන් පූර්ව ලියාපදිංචි වාහනයක වැසි අංක ඇතුළු දත්ත පද්ධතිය තුළ ඇති ඕනෑම තොරතුරක් වෙනස් කිරීමට හා මකා දැමීමට අවස්ථාව ලබා දී ඇති අතර	2022	අතීත දත්ත කිසිවක් මැකී නොයන ලෙස (පැරණි මෝටර් රථ ලියාපදිංචිය වෙනස් කිරීම් සම්බන්ධ) සියලු තොරතුරු නැවත ලබා ගත හැකි වන පරිදි	විධායක නිලධාරීන් වන කොමසාරිස්වරුන්ට ලබාදී ඇති පරිශීලක නාමයක් භාවිතයෙන් පූර්ව ලියාපදිංචි වාහනයක වෙනස් කරනු ලබන ඕනෑම තොරතුරක් ලගු සටහනක් වශයෙන් ලබා ගැනීමට	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	එලෙස වෙනස් කරනු ලබන අතීත දත්ත කිසිවක් නැවත ලබාගත නොහැකි ලෙස පද්ධතිය තුළ පූර්ණ වශයෙන් මැකී යාමට අවස්ථාව සලසා දී තිබුණි.		පරිගණක පද්ධතිය වැඩි දියුණු කළ යුතුය.	හැකියාවක් ඇති අතර, එහිදී මුල් දත්තය සහ නව දත්තය යන දෙකම නිරීක්ෂණය කිරීමේ හැකියාවක් ඇත.	
33	මෝටර් රථ පනතේ 203 අධිකාරිය අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිත රිය පුහුණුකරුවන් නොමැතිව පුහුණුවන්නෙකුට මෝටර් වාහනයක් තනිව පැදවීම නීතියෙන් තහනම් වේ. එවැනි පසුබිමක් තුල රියදුරු බලපත්‍ර ලබා ගැනීමේ ලිඛිත විභාගය සමත් අයදුම් කරුවන් වෙත රිය පුහුණුව සඳහා L පුවරුවක් ලබා දුන්නද එකී L පුවරු භාවිතයෙන් අදාල අයදුම්කරුවන් වෙත මෝටර් රථය ධාවනය පුහුණු වීමට අවකාශය හිමි නොවේ. එහෙත් සියළුම ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් වෙත L පුවරුවක් ලබා දීම හා ලබා දීමට කටයුතු කිරීම හා ඒ සඳහා L පුවරු මිලදී ගැනීම සඳහා රු.162,495,000ක රජයේ මුදල් භාවිතා කිරීමට කටයුතු කර තිබුණි.	2023	අත්‍යාවශ්‍ය වියදම් සඳහා පමණක් රාජ්‍ය මුදල් වැයකල යුතුය.	රියදුරු බලපත්‍ර ලබා ගැනිමට අපේක්ෂා කරන අයදුම්කරුවකු ලිඛිත විභාගය සමත් වූ පසු ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ආසන්න වශයෙන් මාස 03ක පමණ කාලයක් ලබා දෙනු ලැබේ. මේ කාලය ලබා දෙනු ලබන්නේ අයදුම්කරුට සුදුසුකම් ලත් පුහුණුකරුවකු වෙතින් ප්‍රායෝගික පුහුණුව ලබා ගෙන තනිව වාහනයක් මාර්ගයේ ධාවනය කිරිම සඳහා හැකියාව ලබා ගැනිම සඳහා වේ. මෙවැනි අවස්ථාවලදි ඔවුන් රියදුරු පාසලකට සම්බන්ධ වී අදාල පුහුණුව ලබා ගන්නා අතරම තමන්ගේම වාහනයක ද සුදුසුකම්ලත් පුහුණුකරුවකු සමග පුහුණුවන අවස්ථා ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය සම්මත ප්‍රමිතියකින් යුතු එල් පුවරු මුදල් අයකර මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබේ. එල් පුවරු සඳහා රු. 162,495,000 ක් වැය කලද ගාස්තුවක් අයකර නිකුත් කරන බැවින් අදාල වියදම ආවරණය වන බව දන්වා ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
34	වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයීමට අදාල				

කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත මිල නැවත සංශෝධනය සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
(i) වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයීමට අදාල කොන්ත්‍රාත් ගිවිසුමට අන්තර්ගත ලංසු කැඳවීමේ ලියවිලි අතර වූ ලංසුකරුවන්ට ලබා දී ඇති උපදෙස් මාලාවේ පළමු වගන්තියට අනුව අන්තර්ජාතික මිල කැඳවීමේ ක්‍රමයට මිල ගණන් කැඳවන බවත් ලංසු මිල ගණන් ශ්‍රී ලංකා රුපියල්වලින් දැක්විය යුතු බවත් සඳහන් කර ඇත. ඒ අනුව අන්තර්ජාතික මිල කැඳවීම් මඟින් සැපයුම්කරු තෝරාගෙන ඇති බැවින් හා සාර්ථක ලංසුකරු ජර්මානු සමාගමක්වීම මෙන්ම අදාල ජර්මානු සමාගම වෙනුවෙන් දේශීය නියෝජිත ආයතන ගිවිසුම්ගත වී තිබීම යන කරුණු සැලකීමේදී අන්තර්ජාතික තරගකාරී මිල ගණන් කැඳවීම ක්‍රමයට ලංසු කැඳවා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර ඇති, ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ගිවිසුමක් සඳහා ඩොලරයට ගෙවන ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණය වෙනස්වීම මත ගිවිසුම්ගත මිල ගණන් සංශෝධනයක් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහ තුල ප්‍රතිපාදනයන් ඇතුලත් වී නොමැත. ඒ අනුව මෙම මිල සංශෝධනය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනි බව නිරීක්ෂණය විය.	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය. .	වාහන හඳුනාගැනීමේ අංක තහඩු සැපයුම්කාර ආයතනය වන ඇක්සස් ඉන්ටර්නැෂනල් (ප්‍රා) ලිමිටඩ් විසින්, ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත මිල ගණන් වැඩිකර දෙන ලෙස 2022.06.21 දින ඉදිරිපත් කරන ලද ඉල්ලීම සම්බන්ධව, අංක MT/50/2022 දරණ 2022.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ලැබුණු අංක අමප/22/1104/608/010 හා 2022.08.22 දිනැති අනුමැතිය මගින් තාක්ෂණ ඇගයීම් කමිටුවක් සහ අමාත්‍ය මණ්ඩලය මගින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුවක් (CANC) පත් කර ඇත. එම අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් පත් කරන ලද තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් මිල වැඩිවීම සම්බන්ධව ලබා දී ඇති නිර්දේශ අනුව, අමාත්‍ය මණ්ඩලය මගින් පත් කළ මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුවේ (CANC) නිර්දේශයන් ඉදිරිපත් කර ඇත. එම නිර්දේශ ඉදිරිපත් කරන ලද අංක MT/123/2022 දරණ 2022.12.30 දිනැති අමාත්‍ය මණ්ඩල	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				සංදේශය ඉදිරිපත් කර ඒ සඳහා අංක අමප/23/0023/608/002 හා 2023.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දී ඇත. එම තීරණය ප්‍රකාරව කටයුතු කර ඇත.	
(ii)	මෙම මිල සංශෝධනය ඉදිරිපත් කිරීමට පෙර වාහන අංක තහඩුවලින් පලාත් අක්ෂර ඉවත්කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් වාහන නියාමනය බස් රථ ප්‍රවාහන සේවා, දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් (සංවර්ධන)ගේ ප්‍රධානත්වයෙන් 2023 මාර්තු 14 දින රාජ්‍ය අමාත්‍යාංශයේදී පැවති සාකච්ඡාව සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් තිදෙනෙකු හා සැපයුම්කරුගේ දේශීය නියෝජිත ආයතනය වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධ වී ඇති අතර එහිදී ගිවිසුම්ගත අංක තහඩු ප්‍රමාණය ලබා දීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සඳහා එම අවස්ථාව වන විටත් ඇණවුම් කර ඇති බවත් පලාත් අක්ෂර ඉවත් කිරීම මඟින් ගිවිසුම්ගත අංක තහඩු ප්‍රමාණය ලබා දීමට නොහැකි වුවහොත් ඔවුන්ට අලාභයක් සිදු වන බවත් සැපයුම්කාර ආයතනයේ නියෝජිතයන් කමිටුව හමුවේ ප්‍රකාශ කල බව කමිටු වාර්තාවේ සඳහන්ව ඇත. ඒ අනුව ගිවිසුම් ප්‍රකාරව ගිවිසුමෙ බැඳීම් ඉටු කිරීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ප්‍රමාණයන් මෙම මිල සංශෝධනය ඉල්ලුම් කිරීමට	2023	ප්‍රසම්පාදනයට අදාල වන සියළුම තොරතුරු තීරණ ගැනීමට අදාල කරගත යුතුය.	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	පෙර සැපයුම්කරු විසින් ආනයනය කර ඇති බව තහවුරු වන නමුත් ඒ පිළිබඳ සැලකිල්ලට ගැනීමකින් තොරව මිල සංශෝධනයක් සඳහා අවශ්‍ය කටයුතු සිදු කර තිබුණි.				
(iii)	අමප/22/1104/608/010 දරණ 2023 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් විසින් සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් ව්‍යාපෘති කමිටුවක් පත් කර ඇති අතර 2022 නොවැම්බර් 22 දින උක්ත කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කල මිල ගණන් සාකච්ඡා කිරීමේ කමිටුව (CANC) වෙත ඉදිරිපත් කර තිබුණි. සැපයුම මිල ගණන් තීරණය වන අනෙකුත් කිසිදු කරුණක් පිළිබඳ ඇගයීමකින් තොරව විනිමය අනුපාතයේ වෙනස්වීම පමණක් සැලකිල්ලට ගෙන කමිටු වාර්තාව පිළියෙල කර තිබූ අතර විනිමය අනුපාතයේ වෙනස්වීම මඟින් සැපයුම් අයිතමයේ මිල ගණන් සඳහා වන බලපෑම ගණනය කිරීමකින් හෝ තොරව සැපයුම්කරු සමඟ සාකච්ඡා කර එකඟ වන මිල සංශෝධනයක් ලබා දීමට සුදුසු බව තීරණය කර තිබීම හේතුවෙන් ව්‍යාපෘති කමිටුව සිය වගකීම නිසි ලෙස ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.	2023	වගකීම් දරන නිලධාරීන් සිය රාජකාරි මැනවින් ඉටුකල යුතුය.	ව්‍යාපෘති කමිටුව පිහිටුවීම සහ එහි ක්‍රියාකාරීත්වය මෙම දෙපාර්තමේන්තුවේ විෂය පථයෙන් බැහැර කරුණකි. ඒ අනුව මෙම ඡේදය සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් ප්‍රවාහන අමාත්‍යාංශයේ අදාළ අංශය වෙත යොමු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
(iv)	අමප/22/1104/608/010 දරණ 2023 අගෝස්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍ය	2023	වගකීම් දරන නිලධාරීන් සිය රාජකාරි මැනවින්	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

මණ්ඩලය විසින් පත් කල මිල සංශෝධන කමිටුව වෙත උක්ත ව්‍යාපෘති කමිටු වාර්තාව ඉදිරිපත් වී තිබුණි. එකී වාර්තාවෙහි මිල වැඩි කිරීම සාධාරණීකරණය කිරීම සඳහා තාත්වික තර්කානුකුල කරුණු ඇතුලත් වී නොතිබිය දී මිල වැඩිවීමක් සඳහා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර ඇති වාර්තාව හැර වෙනත් කිසිදු අධ්‍යනයක්, ඇගයීමක් පිළිබඳ සඳහනකින් තොරව සැපයුම්කරු සමඟ එකඟවූ අගයක් ලෙස, පදනම් විරහිතව සියයට 62.5 ක මිල වැඩිවීමක යෝජනාවක් ඇතුලත්ව 2022 නොවැම්බර් 29 දිනැති කමිටු වාර්තාව ඉදිරිපත් කර තිබීම හේතුවෙන් මිල සංශෝධන කමිටුව සිය වගකීම නිසි ලෙස ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.		ඉටුකල යුතුය.		
(v) අංක MT/123/2022 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව එකී අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කර තිබූ නිරීක්ෂණයන්ට අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.5 වගන්තිය අනුව මිල ගණන් වැඩි කිරීමට හැකියාවක් ඇත්දැයි නීතිපති විමසා උපදෙස් ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණය කර තිබුණි. ඒ අනුව මිල සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ගිවිසුම් කොන්දේසි අංක 30 අනුකූලව ගිවිසුමේ නෛතික ප්‍රතිපාදන පවතින්නේද යන්න 2023 පෙබරවාරි 09 දින අංක DMT/11/DE/02 දරණ ලිපිය	2023	අමාත්‍ය මණ්ඩලය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් කල යුතුය.	අංක MT/50/2022 දරණ 2022.08.02 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 2.5 හි සඳහන් පරිදි මිල ගණන් වැඩි කිරීමට හැකියාවක් ඇතිද යන්න පිළිබඳව අංක DMT/H/DE/04/02 හා 2023.02.09 දිනැති ලිපිය මගින් ගරු නීතිපතිතුමාගේ මතය විමසන ලදුව, අංක CL/34/2023 හා 2023.04.19 දිනැති ලිපිය මගින් ගරු නීතිපතිතුමාගේ මතය ලබා දී ඇත. ගතයුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමාගේ මතය	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නීතිපති විමසා තිබූ අතර “මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයේ අඩංගු කරුණු”, ගිවිසුමේ 30 වගන්තියට ඇතුලත් විෂය පථයට අයත් නොවන බව නීතිපති විසින් පෙන්වා දී තිබුණි. එහෙත් නීතිපති මතය අදාල කර ගැනීමකින් තොරව මිල සංශෝධනයක් සඳහා අවශ්‍ය වන කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් වගන්ති සංශෝධනය කර සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගැනිම පිණිස සංශෝධිත කොන්දේසි ඇතුලත් කෙටුම්පත අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර තිබුණි.			අංක DMT/H/DE/04/02/05 හා 2023.07.17 දිනැති ලිපිය මඟින් ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශ ලේකම් වෙතින් උපදෙස් ඉල්ලා ඇත. එම උපදෙස් ඉල්ලීම අනුව 2023.08.03 දින මහා මාර්ග අමාත්‍යාංශයේ දී රැස්වීමක් පවත්වන ලදී. එම රැස්වීමේ දී ලැබුණු උපදෙස් අනුව ගිවිසුමේ කෙටුම්පත පිළිබඳව නිර්දේශ ලබා දී ඇත.	
35	අමප/16/1307/709/061 හා 2016 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීත්‍යානුකූල රේගු ක්‍රියාවලියකින් තොරව ආනයන කරන ලද යතුරුපැදි ඉන්ධන ධාරිතාවය පදනම් කර ගනිමින් අධිභාරයක් අයකිරීමකට යටත්ව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සම්බන්ධ පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
	(i) අමප/16/1307/709/061 හා 2016 සැප්තැම්බර් 07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව නීත්‍යානුකූල රේගු ක්‍රියාවලියකින් තොරව ආනයන කරන ලද යතුරුපැදි ඉන්ධන ධාරිතාවය පදනම් කර ගනිමින් අධිභාරයක් අයකිරීමකට යටත්ව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේදී එන්ජින් ධාරිතාව 201CC සිට 450CC දක්වා කාණ්ඩයේ යතුරුපැදි 296ක්	2023	විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය.	විගණන නිරීක්ෂණ බැහැර නොකරන නමුත් විශේෂ කාර්යයක දී ගෙවීම් සිදු කිරීම සඳහා “විවිධ ගෙවීම්” (Miscellaneous) ක්‍රමවේදය භාවිතා කිරීමට පරිගණක පද්ධතිය තුල හැකියාවක් ඇති බැවින් සහ මෙම කාර්යය සඳහා වූ අයකිරීම් ද එම ක්‍රමවේදය අනුව සිදු කිරීමේ හැකියාව ඇති	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	සඳහා අයකල යුතු නියමිත ගාස්තු අය නොකිරීම හේතුවෙන් රජයට ලැබිය යුතු රු.මිලියන 78ක ආදායමක් අහිමි කර තිබුණි.			අතර , එහිදී යොමු අංකයන් පැහැදිලිව සඳහන් කර නොමැති අවස්ථාවක එය හඳුනා ගැනීමට පරිගණක පද්ධතිය තුල හැකියාවක් නොමැති අතර, එමගින් සඳහන් කර ඇති යතුරුපැදි සඳහා අයකල මුදල නිශ්චිතව හඳුනාගත නොහැක. කෙසේ වෙතත් "විවිධ ගෙවීම්" (Miscellaneous) ක්‍රමවේදය යටතේ මෙම කාණ්ඩවල යතුරු පැදි සඳහා අයකිරීම් කිහිපයක් හඳුනා ගෙන පරිගණක පද්ධතිය මඟින් ලබා ගැනීමට හැකි වූ අතර, ඒ අනුව එම අයකිරීම් උක්ත අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අනුමත ගාස්තු වන බව නිරීක්ෂණය විය.	
	(ii) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මහජනතාව වෙත උක්ත සහනය පිලිබඳ මාධ්‍ය ප්‍රකාශය නිකුත් කල 2016 අගෝස්තු 30 දින සිට මාස 04ක සහන කාලයක් ඇතුලත ලියාපදිංචි කිරීම අවසන්කල යුතු වුවත් එකී අවසන් කල යුතු දිනය වන 2016 දෙසැම්බර් 30 සිට ඉදිරි මාස 05ක කාලයක් කැබිනට් අනුමැතියකින් තොරව හා ලියාපදිංචි කිරීමට අවශ්‍ය නීතිමය ලිපිලේඛන නොමැතිව යතුරුපැදි 3088ක් ලියාපදිංචි කර තිබුණි.	2023	විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව යුත්තන්ගෙන් අයකරගත යුතුය.	මෙම ලියාපදිංචි කිරීම් 2016 වර්ෂයේ සිදුකර ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් දැනට ගත හැකි ක්‍රියාමාර්ග කඩිනමින් සොයා බලන ලෙස අදාල නිලධාරින් දැනුවත් කරන අතර ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු මග හරවා ගැනීමට නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
36	පසුගිය වසර පහක කාලය තුළ වේරහැර ආපනශාලාව බද්දට ගත් බදු ගැණුම්කරුවන් වෙතින් රු. මිලියන 4.1ක හිඟ ආදායමක්	2023	විධිමත් පරීක්ෂණයක් සිදුකර අහිමි වූ ආදායම වගකිව	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වේරහැර හා නාරාහේන්පිට	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	හා ප්‍රධාන කාර්යාලයේ හා වේරහැර පරිශ්‍රයේ ස්ථාපිත අනෙකුත් ආයතන වෙතින් රු. මිලියන 2.5ක හිඟ ආදායමක් ලබාගත යුතුව ඇතත් එකී ආදායම් අයකර ගැනීමට හෝ හිඟ ආදායම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.		යුත්තන්ගෙන් අයකරගත යුතුය.	පරිශ්‍රයන්හි පිහිටුවා ඇති බාහිර ආයතනයන් වෙතින් බදු / කුලී මුදල් විධිමත් පරිදි අයකර ගැනීම හා රජයේ ආදායමට ගිණුම්ගත කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත.	
37	මෝටර් වාහන පනතේ (203 අධිකාරිය) XII වන කොටසෙහි අඩංගු පරිපූරක විධි විධාන අංක 231 අනුව මෙම පනත හෝ යම් නියෝගයක් යටතේ දෙන ලද සහතිකයක් අවසර පත්‍රයක් අස්ථානගත වූ විට හෝ විනාශ වූ විට, නිකුත් කල බලධාරියා සෑහීමකට පත්වන තොරතුරු ඔප්පු කලහොත් එකී අවසර පත්‍රයේ හෝ සහතික පත්‍රයේ අනුපිටපතක් ලබා දිය යුතුය. එහෙත් ඊට අනුකූල නොවන සේ මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයන්හි දෙවන පිටපත නිකුත් කර වසර 5 සිට වසර 25ක් දක්වා වූ කාලයකට පසුව, 2023 වර්ෂයේ අවස්ථා 19ක දී දිවුරුම් ප්‍රකාශයක් මඟින් සිදු කරන ලද ඉල්ලීම්වලට ප්‍රතිචාරීව පෙර වර්ෂයන්හි නිකුත් කරන ලද මෝටර් රථ ලියාපදිංචි කිරීමේ සහතිකයන්හි දෙවන පිටපත වෙනුවට මෝටර් රථ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත නිකුත්කර තිබුණි.	2023	පවතින නෛතික විධිවිධාන අනුව කටයුතු කල යුතුය.	මෝටර් වාහන පනතේ ප්‍රතිපාදන අනුව මෝටර් වාහනයක මුල් ලියාපදිංචි සහතිකය විනාශ වූ හෝ අස්ථානගතවීමකට අනතුරුව නිකුත් කලයුතු වන්නේ අනුපිටපතක් වුවත් පසුගිය වසර ගණනාව තුල මුල් පිටපත වෙනුවට අනුපිටපත් නිකුත් කිරීම මඟින් විවිධ අපහසුතාවයන්ට සහ මෝටර් රථය විකුණා ගැනීමේ දී විවිධ දුෂ්කරතාවයන්ට මෙන්ම අලාභ තත්ත්වයන්ට මෝටර් වාහන වල ලියාපදිංචි අයිතිකරුවන්ට මුහුණ දීමට සිදුවන බවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට මෙන්ම ඔහුට පෙර පත්වූ කොමසාරිස් ජනරාල්වරු වෙත ද විවිධ මහජන දුක්ගැනවිලි ලැබී තිබේ. එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙතද මේ සම්බන්ධව ඉල්ලීම් කර ඇති අතර එම ඉල්ලීම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කල අවස්ථා ද තිබේ. ඒ අනුව දෙවන පිටපත අනුපිටපතක් (Duplicate) ලෙස නිකුත් නොකරන ලෙස ඉල්ලා සමාජය තුල	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				කතිකාවක් නිර්මාණය වී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව Duplicate යන්න ඉවත් කිරීමට ඇති හැකියාව සොයා බැලීමට දෙපාර්තමේන්තුවේ කමිටුවක් පත්කර කරුණු ද අධ්‍යනය කර තිබේ. ඒ අනුව ඉදිරියේදී සියලු පුරවැසියන් වෙත අදාල මුල්පිටපත අස්තානගතවීම හෝ විනාශවීම මත නව පිටපතක් ඉල්ලීමේදී අනුපිටපතක් යන්න සහතිකයේ සඳහන් කිරීමකින් තොරව නිකුත් කිරීමට අදාල නෛතික ප්‍රතිපාදන සැලසීමට කටයුතු ආරම්භ කර ඇත.	
38	වාහන ලියාපදිංචි සහතිකයේ දෙවන පිටපත වෙනුවෙන් මුල් පිටපත් නිකුත් කර ඇති වාහන 06කට අදාලව විගණන විසින් සිදුකල පරීක්ෂාවේ දී එම ලියාපදංචි සහතික පිටපත් ලබා ගැනීම උදෙසා ඉදිරිපත් කර තිබූ දිව්රුම් ප්‍රකාශ 03ක් එකම අත් අකුරු හා එකම ආකෘතියක් වීමත්, අනෙක් දිව්රුම් ප්‍රකාශ 03 එක සමාන ආකෘතියකින් ඉදිරිපත් කරතිබීමත් හා දෙවන පිටපතක් මුල් පිටපතක් බවට පරිවර්තනය කිරීමට ප්‍රතිපාදන ඇතුලත් නොවීමත්, එවැනි හඳුන්වාදීමක් සිදු කරන්නේ නම් ඕනෑම පුද්ගලයකුට දෙවන පිටපත ඉදිරිපත් කර මුල් පිටපත ලබා ගැනීමට අවස්ථාව ලබා දිය යුතු වීමත්, සීමිත පිරිසකට මෙම අවස්ථාව ලබා දීමෙන් අනෙකුත් දෙවන පිටපත් ලබා ගෙන ඇති පුද්ගලයන්ගේ මානව හිමිකම්	2023	පවතින නෛතික විධිවිධාන අනුව කටයුතු කල යුතුය.	නිරීක්ෂණය හා එකඟ වී ඇත. වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	අභියෝගයට ලක් වීමත්, වෙනත් රාජ්‍ය ආයතන නිකුත් කරනු ලබන මෙහා සමාන සහතික හෝ බලපත්‍ර දෙවන පිටපත වෙනුවට මුල් පිටපත් නිකුත් නොකිරීමත් යන කරුණු හේතුවෙන් මෙලෙස දෙවන පිටපත් වෙනුවට මුල් පිටපත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය රටේ මූලික නීතීන්ට අනුව නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය විය.				
39	ලියාපදිංචි අංක 32- XXXX දරණ වාහනය දීර්ඝ කාලයක් තිස්සේ ආදායම් බලපත්‍ර ලබා නොගැනීම හේතුවෙන් නැවත පසුගිය වසර 20ක් සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට 2023 ජූලි 07 හෝ ඊට ආසන්න දිනයක දී කුරුණෑගල පලාත් මෝටර් රථ දෙපාර්තමේන්තුව වෙත මෝටර් රථ කොමසාරිස් විමර්ෂණගේ නිල මුද්‍රාව සහිත කූඨ ලේඛණයක් සකස් කර ඉදිරිපත් කර ඇතත් එකී කූඨ ලේඛණ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර අදාල වන පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳව විමර්ශනයක් සිදු කිරිම සඳහා කොමසාරිස් (විමර්ශන) වෙත උපදෙස් දිමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
40	ලියාපදිංචි අංක CAW-XXXX දරණ මෝටර් රථය එහි ලියාපදිංචි හිමිකරු විසින් 2022 අප්‍රේල් 21 දින කොහුවල, නුගේගොඩ ප්‍රදේශයේ පදිංචි අයෙකු වෙත විකුණා තිබූ අතර සියළුම නීත්‍යානුකූල ලියවිලි ඔහු වෙත භාර දී තිබුණි. වාහනය මිලදී ගත් තැනැත්තා මෙම වාහනය නැවත විකිණීම සඳහා කොහුවල ප්‍රදේශයේ ඔහුට අයත් වාහන අලෙවි කරන ස්ථානයක රඳවා තිබියදී මාලඹේ පාර, පන්නිපිටිය ප්‍රදේශයේ පදිංචි කාන්තාවක් විසින් මෙම වාහනය සඳහා අනීතිකව දෙවන පිටපත් ලබාගෙන පසුව වාහනය ලියාපදිංචි සහතිකයේ දෙවන	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර අදාල වන පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මේ පිළිබඳව විමර්ශනයක් සිදු කිරිම සඳහා කොමසාරිස් (විමර්ශන) වෙත උපදෙස් දිමට කටයුතු කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	පිටපත මුල් පිටපතක් බවට පරිවර්තනය කර ගනිමින් කූඨ ලෙස සකසන ලද ලියවිලි සමඟ කල්බදු සමාගමකින් මූල්‍ය පහසුකමක් ලබා ගෙන තිබූ නමුත් කූඨ ලේඛණ සකස් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකර අවශ්‍ය නීත්‍යානුකූල කටයුතු සිදුකර නොතිබුණි.				
41	ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට තීරු බදු රහිතව ආනයනය කර ලියාපදිංචි අංක KA- XXXX දරණ ලියාපදිංචිය සහිත ජීප් රථයක් 2011 වර්ෂයේ දී ඩුබායි රාජ්‍ය වෙත ප්‍රතිඅපනයනය කිරීම හේතුවෙන් ලියාපදිංචිය අවලංගු කර තිබුණි. එහෙත් එකී අවලංගු කරන ලද අංකය භාවිතයෙන් ජා ඇල ප්‍රදේශයේ පුද්ගලයෙකු වෙත වෙනත් වාහනයක චැසි අංකය හා එන්ජින් අංකය ඇතුලත් කොට මෝටර් වාහනය ලියාපදිංචි කර වලංගු ලියාපදිංචි සහතිකයක් නිකුත් කර තිබූ නමුත් ඒ පිලිබඳව විධිමත් පරීක්ෂණයක් සිදුකර වංචනිකව කටයුතු කල පුද්ගලයන්ට එරෙහිව නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර අදාල වන පරිදි නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
42	මෝටර් වාහන පනතේ 203 අධිකාරිය අනුව මෝටර් රථයක්, යතුරුපැදියක් හෝ පනත යටතේ ලියාපදිංචි කරනු ලබන යම් වාහනයක වෙනස් කල නොහැකි ප්‍රධාන අංගයක් ලෙස වාහනයේ චැසිය හඳුනාගන්නා අතර වාහනයේ ලියාපදිංචිය චැසි අංකය හා බද්ධව පවතී. මේ අනුව ලියාපදිංචි මෝටර් රථයක චැසිය වෙනස් කර පූර්ව ලියාපදිංචිය පවත්වාගෙන යා නොහැකි වුවත් විධිමත් වලංගු	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	නිරීක්ෂණය හා එකඟ වී ඇත. වැළැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	තාර්කික හේතුවකින් තොරව 2022 හා 2023 වර්ෂයන් හීදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක 237කට අදාළ වැසි අංක වෙනස් කර පූර්ව ලියාපදිංචිය පවත්වාගෙන යාමට අවස්ථාව ලබා දී තිබුණි. වැසි අංක වෙනස් කරන ලද උක්ත වාහනයන් පූර්ව වැසි අංකය යටතේ වසර ගණනාවක් ආදායම් බලපත්‍ර ලබා ගෙන තිබීම, එකී වාහනවල නීත්‍යානුකූල හිමිකම අවස්ථා 5කට වඩා වැඩි අවස්ථා ගණනක හුවමාරු වී තිබීම, ඇතැම් වාහන සඳහා මෝටර් රථ පරීක්ෂකවරුන් වෙතින් ලබාගත් බර සහතිකයේ අඩංගු දත්ත වෙනුවට වෙනත් දත්ත ඇතුලත් කර තිබීම යන කරුණු සැලකිල්ලට ගැනීමේදී උක්ත දත්ත සංශෝධනයන්ගේ නීත්‍යානුකූලභාවය දැඩි ලෙස අභියෝගයට ලක්වන නමුත් ඒ පිලිබඳව පරීක්ෂණයක් සිදුකර නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.				
43	රජයේ ගිණුම් පිලිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
	(i) ශ්‍රී ලංකා රේගුවේ නිශ්කාෂණය නොවූ වාහන 07ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා ඊට අදාල ලිපිගොනු අස්ථානගත කර වංචාවක් සිදු කිරීම සම්බන්ධයෙන් 2018 පෙබරවාරි 23 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා තීරණය අනුව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය විසින් අදාල නිලධාරීන්ට චෝදනා පත්‍ර සකස් කර ඉදිරිපත් කල යුතු වුවත් චූදිත	2023	රජයේ ගිණුම් පිලිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුය.	මෙම මෝටර් වාහන වලට අදාලව රේගු ගාස්තු ගෙවා ඇති ද යන්න ශ්‍රී ලංකා රේගුවෙන් විමසීමක් කරන ලදි. අදාල බදු ගාස්තු අයවී නොමැති බවට ශ්‍රී ලංකා රේගුවේ CUS/MV/RMV/02/2003 හා 2023.10.24 දිනැති ලිපිය මඟින් මෙම දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. මෙම මෝටර් වාහන පිළිබඳ වැඩිදුර පරීක්ෂණ සඳහා	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

		නිලධාරීන්ට එරෙහිව ගත් විනයානුකූල කටයුතු, ලිපිගොනු හෝ කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.			විස්තර රේගුව වෙත යොමු කර ඇත. තවද, මෙම කරුණු විමර්ශනයට හා එයට සම්බන්ධ වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන වාර්තා කිරීම සඳහා මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර ඇත. එහි අතුරු වාර්තාව මේ වන විට ලැබී ඇති අතර, එහි සඳහන් කරුණු ද අවසන් වාර්තාව ඉදිරිපත් කල පසු එමඟින් හඳුනාගෙන ඇති වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව විධිමත් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.	
	(ii)	ලියාපදිංචි අංක තහඩු නැවත ලබාගෙන එකී වාහන මහා මාර්ගයේ ධාවනය වීම වැලැක්වීමට, එකී වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට, පැවරිය නොහැකි ලෙස විරෝධතා ගොනු කිරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ගිණුම්කාරක සභාවේ විමසුමට ලක් වූ උක්ත වාහන 07ක් සම්බන්ධයෙන් පැවරුම් තහනමක් ලබාදී තිබියදී හා ආයතනික මට්ටමින් පරීක්ෂණයක් සිදුකර තිබෙන අතරතුර ඉන් එක් වාහනයක් 2021 අප්‍රේල් 04 දින වෙනත් අයෙකු වෙත පැවරීමට කටයුතු කර තිබූ අතර ගිණුම්කාරක සභා නියෝගය පරිදි කටයුතු කර නොතිබුණි.	2023	රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කළ යුතුය.	දැනට මෙම වාහන පැවරීමට නොහැකිවන පරිදි විරෝධතා ගොනුකර ඇත. එමෙන්ම ඉහත (i) ඡේදයේ සඳහන් කමිටුවේ වාර්තාවේ නිර්දේශ සඳහන් කර ගෙන අදාල වාහනවල ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
44		නීත්‍යානුකූල රේගු බදු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකා	2023	කඩිනමින් අභ්‍යන්තර	මේ සම්බන්ධයෙන් විමර්ෂණය කිරීම සඳහා	නිර්දේශය ක්‍රියාත්මක කර

	රේගු දෙපාර්තමේන්තුව මඟින් නිෂ්කාශනය නොකරන ලද හා වංචනිකව ආනයනය කරන ලද සුඛෝපභෝගී මෝටර් රථ 02ක් හා යතුරු පැදි 04ක් රේගු දෙපාර්තමේන්තුව තුල මෙතෙක් නිෂ්කාශනය නොවූ බහාලුමකට හා අදාල අංක CBHQ I 498224 දරණ සම්පූර්ණයෙන් නිෂ්කාශනය නොවූ රේගු සටහන්කරය භාවිතයෙන් කූඨ ලේඛණ ඉදිරිපත් කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම හා ලියාපදිංචි කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් රේගු දෙපාර්තමේන්තුව සමඟ ඒකාබද්ධ පරීක්ෂණයක් සිදුකර උක්ත අනීතික ලියාපදිංචි කිරීම අවලංගු කර නියමිත රේගු බදු අයකර ගැනීමට හා නීත්‍යානුකූල පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.		පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වය ඇතිව කමිටුවක් මගින් විමර්ශණය සිදු කරන අතර එහි අතුරු වාර්තාවක් මේ වන විට කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කර ඇත. එහි අවසන් වාර්තාවේ නිරීක්ෂණ හා නිර්දේශ ලද පසු මේ සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග ඉදිරියේදී රජයේ විගණන අධිකාරී වෙත වාර්ථා කිරීමට කටයුතු කරන බව දන්වා ඇත.	නොමැත.
45	ඊ මෝටරින් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
	(i) ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා ගිවිසුම්ගත සේවා ගාස්තු සංශෝධනය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද සංදේශය හා ඊට අදාලව අමාත්‍ය මණ්ඩලය පත්කල නිලධාරි කමිටු වාර්තාව සඳහා ලබා දී ඇති අංක අමප 23/0952/608/011-1 හා 2023 ජුනි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇතුලත් 3(1) හා 3(2) යෝජනා සම්බන්ධයෙන් සිදුකල යුතු කාර්යයන් අවසන් කිරීමකින් තොරව ගිවිසුම්ගත සැපයුම්කරු සමඟ ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක	2023	ගිවිසුම්ගත සැපයුම්කරු සමඟ ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙතින් නිසි අනුමැතියක් ලබාගත යුතුය.	මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා අනෙකුත් කටයුතු සාකච්ඡා මට්ටමේ පවතින අතර අදාල ගොඩනැගිල්ල කුලියට ගැනිම පිළිබඳව මෙතෙක් අවසන් තීරණයක් ගෙන නැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

කරන්නේද, ඊට නීතිමය බාධා පවතින්නේද, එසේ කටයුතු කරන්නේ නම් එක් ගනුදෙනුවක් සඳහා ගෙවන ගාස්තුව කොපමණද යන්න පිළිබඳව නිශ්චිත එකඟතාවයකින් තොරව ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගංගාරාම විහාරස්ථානයේ වර්ග අඩියක් රු.98ක් බැගින් වර්ග අඩි 10,000ක් කුලියට ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන් සිදු කර තිබුණි. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් විගණනය වෙත දන්වා ඇත.				
(ii) ඊ මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා 2018 වර්ෂයේදී මෙට්‍රොපොලිටන් ආයතනය සමඟ ගිවිසුම් ගත වී ඇති අතර ගිවිසුම අනුව එක් ලිපිගොනුවක් සඳහා රු.187.97ක් වන නමුත් වර්තමානය වන විට එක් ලිපිගොනුවකට ගෙවනු ලබන 187.97ට අමතරව තවත් රු. 646ක් බැගින් (මාසයකට ලියාපදිංචි 60000ක් ලෙස සලකා වසර 5ක් වෙනුවෙන්) රු.2,325,600,000ක් (646 x 60000 x 12 x 5) ගෙවා ගිවිසුම්ගත ආයතනය සමඟ කටයුතු කිරීමට අවශ්‍ය කටයුතු සිදු වන නමුත් එකී තීරණය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූල නොවන බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් මේ සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොමැති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට හා අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව කටයුතු කල යුතුය.	ඊ මොටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා එක් ගොනුවකට රු. 187.97 ට අමතරව, ගොඩනැගිල්ලේ අනෙකුත් යටිතල පහසුකම් නිර්මාණය කිරීම සඳහා යන වියදම මෙතෙක් ඇස්තමේන්තු කර නොමැත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	ජනරාල් විසින් විගණනය වෙත දන්වා ඇත.				
46	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු මාතර ශාඛාවේ රියදුරු බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා සාමාන්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
	(i) රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා සමත් විය යුතු ලිඛිත පරීක්ෂණයන් සඳහා ලැයිස්තුගත නොවූ අයදුම්කරුවන් 18දෙනෙකු හා ලිඛිත පරීක්ෂණ දිනයේදී සහභාගී නොවීම හේතුවෙන් පරීක්ෂණ සටහන් ලේඛනයෙහි පැමිණ නොසිටි ලෙස සටහන් වූ අයදුම්කරුවකු ලිඛිත පරීක්ෂණය සමත් බවට ව්‍යාජ ප්‍රතිඵල ඇතුලත් කර හා ලිඛිත පරීක්ෂණයේදී කිසිදු ලකුණක් ලබා නොගත් අයදුම්කරු විභාගය සමත් බවට ව්‍යාජ ප්‍රතිඵලයක් ඇතුලත් කර හා ලේඛන යාවත්කාලීන කර ප්‍රායෝගික පරීක්ෂණයන්ට යොමු වීමට හා ප්‍රායෝගික පරීක්ෂණ අවසානයේ වලංගු රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මාතර කාර්යාලයේ ප්‍රධාන මෝටර් රථ පරීක්ෂක හරහා මේ පිළිබඳ විමර්ශණයක් සිදු කරන ලද අතර, සැක සහිත සහ විගණනයෙන් පෙන්වා දෙන කරුණුවලට අදාල වූ සියලු ගොනු ඔවුන් විසින් පරීක්ෂා කර ඇත. ඒ අනුව අදාල අක්‍රමිකතාවලට සම්බන්ධ කාර්යාලීය නිලධාරිණියකගේ සේවය අත්හිටුවා ඇත. මේ පිළිබඳ විමර්ශණ තවදුරටත් සිදු කෙරෙමින් පවතී.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
	(ii) රියදුරු බලපත්‍ර ලබා දීම සඳහා සමත් විය යුතු ප්‍රායෝගික පරීක්ෂණයන්ට ලැයිස්තුගත නොවූ අයදුම්කරුවන් 10දෙනෙකු හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පෙනී නොසිටීම හේතුවෙන් ප්‍රතිඵල ලේඛනයෙහි පෙනී නොසිටි ලෙස සටහන් වී ඇති එක් අයදුම්කරුවකු, ප්‍රායෝගික පරීක්ෂණ ලේඛනයෙහි අදාල පරීක්ෂණ අසමත් බවට තොරතුරු ඇතුලත් වී	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	ඇති එක් අයදුම්කරුවකු, හා ප්‍රායෝගික ලේඛණයන්හි කිසිදු සටහනක් ඇතුලත් නොවූ අයදුම්කරුවන් පස්දෙනෙක් වෙනුවෙන් ප්‍රායෝගික පරීක්ෂණ සමත් බවට ව්‍යාජ දත්ත ඇතුලත් කර වලංගු රියදුරු බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර තිබුණි.				
	(iii) රියදුරු බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍ය වන ලිඛිත පරීක්ෂණයක් සඳහා පෙනී නොසිට එහෙත් ලිඛිත පරීක්ෂණ පැවැත්වූ දිනයකදී එදින භාවිතා නොවූ විභාග අංකයන් හා ව්‍යාජ ප්‍රතිඵලයක් ඇතුලත් කර එක් අයදුම්කරුවකුට වලංගු රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමට අවස්ථාව ලබා දී තිබූ අතර ලිඛිත පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය යන පරීක්ෂණ ද්විත්වයට පෙනී නොසිටියදී එකී පරීක්ෂණයන් සමත් බවට ව්‍යාජ තොරතුරු ඇතුලත් කර රියදුරු බලපත්‍ර ලබා දීමට අවස්ථාව ලබා දී තිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
47	යුධ හමුදාව විසින් අපහරණය කරන ලද වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
	(i) මෝටර් රථ පනතේ 203 අධිකාරිය ප්‍රකාරව වාහන නව ලියාපදිංචි කිරීමක් සඳහා MT–02 පෝරමය සමඟ වාහනය රේගුවෙන් නිදහස් කිරීමේදී නිකුත් කරන ලද ලියවිලි, රේගු ගාස්තු ගෙවූ රිසිට්පතේ මුල් පිටපත හා අලුතින් නිපදවන ලද මෝටර් රථයක් නම් අදාල ඉන්වොයිසිය වැනි	2023	මෝටර් වාහන පනතේ 238 වන වගන්තියේ ප්‍රතිපාදන අනුව කටයුතු කිරීම සඳහා වුවද ආනයනික ලියවිලි හා අදාල වන ලේඛන ඉදිරිපත් කල යුතු බැවින් ඊට	ත්‍රිවිධ හමුදාවට අයත් මෝටර් වාහන මහා මාර්ගයේ ධාවනය සඳහා ත්‍රිවිධ හමුදාවන්ට අනන්‍ය වූ කාණ්ඩ අංකයක් සමඟ අංකයක් භාවිතා කිරීමට මෝටර් වාහන පනතේ 238 වන වගන්තිය අනුව ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව පොදුවේ මෙරට	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	වාහනයට අදාල මූලික ලියවිලි ඉදිරිපත් කල යුතු වේ. විශේෂිත ආයතනවලට හෝ විශේෂිත පුද්ගලයින් වෙත උක්ත ලියවිලිවලින් තොරව වාහන නව ලියාපදිංචි කිරීමක් සඳහා මෝටර් වාහන පනතේ 203 අධිකාරිය තුල ප්‍රතිපාදන ඇතුළත් වී නොමැත. එහෙත් පූර්ව ලියාපදිංචියකින් තොරව ත්‍රිවිධ හමුදාව භාවිතා කර ටෙන්ඩර් ක්‍රියාවලියකින් පසුව සිවිල් පුද්ගලයින් වෙත අලෙවි කර ඇති වාහන 63ක් මෝටර් රථ පනතේ 203 අධිකාරියට අනුකූල නොවන සේ උක්ත මූලික ලියවිලිවලින් තොරව අංක කාණ්ඩ 325 යටතේ ලියාපදිංචි කර අදාල සිවිල් පුද්ගලයින් වෙත පවරා දී තිබුණි.		අනුකූලව ක්‍රියාකල යුතුය.	තුල භාවිතා කරන වාහන ලියාපදංචිය සඳහා විධිවිධාන මෝටර් රථ පනතේ 203 අධිකාරිය ප්‍රකාරව සලසා තිබුණ ද විශේෂිත ආයතන වලට (ත්‍රිවිධ හමුදා) සහ විශේෂිත පුද්ගලයන් (ජනාධිපති, අගමැති) සඳහා ඉහත විධිවිධානයනගෙන් පරිභාහිරව මෝටර් රථ පනතේ 238 අධිකාරිය ප්‍රකාරව ප්‍රතිපාදන යොදා ගෙන මෝටර් රථ ලියාපදිංචි කර භාවිතා කිරීමේ හැකියාව ඇත. ඒ අනුව ත්‍රිවිධ හමුදාව මගින් අලෙවිකරණ වාහන සිවිල් පුද්ගලයන් අතට පත් වූ විට එම වාහන මෝටර් වාහන පනතේ 203 අධිකාරිය ප්‍රකාරව වාහන නව ලියාපදිංචි කිරීමක් ලෙස MTA - 02 සමග නොව, වාහනයේ අයිතිය වෙනස් වීමක්/පැවරීමක් ලෙස වාහන පැවරීමකදී භාවිතා කරන MTA 06 සහ MTA 08 සමග අනෙකුත් සහයක ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු සිදු කරනු ලැබේ. ඒ අනුව වාහන පැවරීමකදී වාහන රේගුවෙන් නිදහස් කිරීමේදී නිකුත් කරන ලියකියවිලි, රේගු ගාස්තු ගෙවූ රිසිට්පත්, සහ අදාල ඉන්වොයිස්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව දන්වා ඇත.	
(ii)	ත්‍රිවිධ හමුදාව විසින් කලින් කලට ටෙන්ඩර් කරන ලද වාහන පිළිබඳ විස්තර වගකිව යුතු ප්‍රධාන	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන	ලියාපදිංචි අංකවලට අදාලව මෙම දෙපාර්තමේන්තුවේ පරිගණක විස්තර අනුව	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	නිලධාරියකුගේ අත්සනින් යුතුව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරනු ලබන අතර සිවිල් පුද්ගලයකු ත්‍රිවිධ හමුදාවෙන් මිල දී ගත් වාහනයක් ලෙස ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන සෑම අවස්ථාවකදීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් අයදුම්පතෙහි සඳහන් වාහනයෙහි විස්තර උක්ත ටෙන්ඩර් කරන ලද වාහන පිළිබඳ විස්තර සමඟ පරීක්ෂා කර එකී වාහනය ත්‍රිවිධ හමුදාවෙන් ටෙන්ඩර් කරන ලද වාහනයක්ද යන්න සහතික කරනු ඇත. එහෙත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලිපිගොනුවලට අනුව ත්‍රිවිධ හමුදාව විසින් එවා තිබූ ටෙන්ඩර් විස්තර සමඟ නොගැළපෙන හා ටෙන්ඩර් විස්තර මඟින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දැනුවත් නොකළ ත්‍රිවිධ හමුදා වාහන 40ක් 325 කාණ්ඩය යටතේ ලියාපදිංචි කර තිබුණි. උක්ත වාහන ලියාපදිංචි තොරතුරු ඇතුළත් මුල් ලිපිගොනු විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.		සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	මෙම සියළුම මෝටර් වාහන යුධ, ගුවන් හා නාවික හමුදාව පළමු ලියාපදිංචි අයිතිකරු ලෙස සඳහන් වේ. ඒ අනුව මෙම මෝටර් වාහන යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් වෙන්දේසි කරන ලද මෝටර් වාහන බවට මූලික වශයෙන් හඳුනාගත හැකිය. 2011 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකා යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් වෙන්දේසි කරන ලද මෝටර් ලියාපදිංචියට පෙර අභ්‍යන්තර විගණන අංශය මඟින් අදාල හමුදා බණ්ඩයෙන් විමසා අවශ්‍ය තොරතුරු ලබාගැනීම සිදු කරනු ලබයි.ඒ අනුව මෙම මෝටර් වාහන ලියාපදිංචියට පෙර යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් ටෙන්ඩර් මඟින් විකිණූ බවට තහවුරුවක් ලබාගෙන ඇති බව දන්වා ඇත.	
(iii)	ත්‍රිවිධ හමුදාවේ වගකිව යුතු නිලධාරියකුගේ අත්සනින් යුතුව ඉදිරිපත් වී ඇති ටෙන්ඩර් ලියවිලිවල සඳහන් වාහන 8ක් අදාල ටෙන්ඩර් කරන ලද දිනයන්ට පෙර දිනයන්හි දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී සිවිල් පුද්ගලයින් වෙත සන්තකය	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	ශ්‍රී ලංකා යුධ, ගුවන් හා නාවික හමුදා මඟින් මෝටර් වාහන වෙන්දේසි කර නිකුත් කරනු ලබන ලියකියවිලිවල එම මෝටර් වාහනය යුධ හමුදාවට පාවිච්චිය සඳහා ගත් දිනය ඇතුළු තොරතුරු ඇතුලත්	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

හුවමාරු වී තිබුණි. මේ අනුව ත්‍රිවිධ හමුදා වෙන්දේසිවලින් ලබාගත් වාහන ලෙස වෙනත් වාහනද ලියාපදිංචි වීමේ අවධානමක් නිර්මාණය වී තිබුණි.

ලේඛණයක් නිකුත් කරනු ලැබේ.

එම ලේඛණය පදනම් කර ගනිමින් ලියාපදිංචිය සඳහා තොරතුරු ලබා ගැනීම සිදු වේ. එහිදී යුධ හමුදාව පාවිච්චිය සඳහා යොදාගත් දිනය හෝ යුධ හමුදාව මගින් ටෙන්ඩර් මගින් විකුණන ලද දිනය හෝ මෙම වාහනය පරීක්ෂා කර බර සහතිකය (CMT 75) නිකුත් කළ දිනය පළමු ලියාපදිංචි දිනය ලෙස සළකනු ලැබේ.

තවද 325 අංක බාණ්ඩය ලබාදීම සඳහා දත්ත ඇතුලත් කරන විට, ලියාපදිංචි දිනය ලෙස දත්ත ඇතුලත් කරනු ලබන දිනය පරිගණකය මගින් ස්වයංක්‍රීයව (AUTO) ලබා ගනී. මෙම දිනය දත්ත confirm කළපසුව ලියාපදිංචි සහතිකය මුද්‍රණයට පෙර වෙනස් කළ යුතුය. එම ක්‍රියාව සිදු කිරීමට අමතක වුවහොත් විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි දිනවල පරස්පරයන් දැකිය හැකිය.

මේ අනුව විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි වරදක් සිදුකර ඇති බවට හේතුව අදාල දිනයන් නිවැරදිව දත්ත ඇතුලත් කිරීම සඳහා යොදා නොගැනීම බව පෙනී යයි. මෙම වරද නිවැරදි කිරීම සඳහා සියළුම උත්සාහයන් හැම විටම ගන්නා බවද

			සඳහන් කර ඇත. මේ අනුව 325 අංක බාණ්ඩය ලබාදීමේදී මුල් ලියාපදිංචි දිනය තෝරා ගැනීම ගැටළුකාරී තත්ත්වයකට පත් වී ඇත. මේ නිසා මුල් ලියාපදිංචි දිනය සහ පැවරුම් දිනය අතර වෙනසක් දැකිය හැකිය. විගණනය මඟින් පෙන්වා දී ඇති මෙම වරද නිවැරදි කිරීම සඳහා උපදෙස් ඇතුළත් අංක 3/2024 හා 2024.03.12 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර ඇත.	
(iv) ත්‍රිවිධ හමුදාව විසින් පූර්ව ලියාපදිංචියකින් තොරව භාවිතා කරන ලද වාහන ටෙන්ඩර් ක්‍රියාවලියකින් පසුව සිවිල් පුද්ගලයින් වෙත අලෙවි කර ඇතත් එම වාහන ටෙන්ඩර් කර ඇති දිනයන්ට පෙර දිනයන්හිදී එකී වාහනවල මුල් ලියාපදිංචිය සිදු වී ඇති බව නිරූපණය වන පරිදි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියට ව්‍යාජ දත්ත ඇතුලත් කරමින් ත්‍රිවිධ හමුදාව විසින් ටෙන්ඩර් කරන ලද වාහන 29ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	-එම-	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
(v) ත්‍රිවිධ හමුදා විසින් ටෙන්ඩර් කරන ලද වාහන වැසි අංක පරීක්ෂා කිරීමේදී ත්‍රිවිධ හමුදාවෙන් පුද්ගලයන් වෙත හුවමාරු වී ඇති වැසි අංක 04ක් සඳහා එම වැසි අංකයෙන්ම තවත් වාහන කිහිපයක් ලියාපදිංචි වී	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු	පැරණි ඉලක්කම් අක්ෂර කාණ්ඩ යටතේ ට්‍රැක්ටර් ටේලර්, අත්ට්‍රැක්ටර් හා අනෙකුත් ඉඩම් වාහන ලියාපදිංචියේ දී සම්පූර්ණ වැසි අංකය භාවිතා කර නොමැති බව නිරීක්ෂණය වේ.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	තිබුණි. ඒ අනුව එකම අංකයෙන් වාහනයක් ලියාපදිංචි වී තිබීම, නිර්ව්‍යාජ වැසි අංකය හා ව්‍යාජ වැසි අංකය හඳුනා ගැනීම, ත්‍රිවිධ හමුදාවෙන් ටෙන්ඩර් කල වාහන තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් සිදුකල යුතු නමුත් එවැනි පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.		කළ යුතුය	එබැවින්, වැසි අංකයේ කාණ්ඩ කොටස ඉවත් කර අංක කොටස පමණක් උපයෝගී කරගෙන පොදුවේ ලියාපදිංචිය සිදු කර ඇත. මෙම අංක කොටස ඉලක්කම් හතරකින් හෝ පහකින් යුක්ත වේ. එක් කාණ්ඩයක් යටතේ මෝටර් වාහන 9500 ක් (එකතුව 13 හැර) පමණ ලියාපදිංචි වන හෙයින් මෙම ඉලක්කම් හතර ප්‍රමාණවත් නොවේ. එම නිසා එකම වැසි අංකයෙන් ඉඩම් වාහන කීපයක් ලියාපදිංචි වී තිබිය හැකිය. පරිගණක අනුසාරයෙන් තොරව මෝටර් වාහන ලියාපදිංචි කරන කාල වලදී මෙලෙස එකම වැසි අංකයක් යටතේ මෝටර් වාහන කීපයක් ලියාපදිංචි වී තිබීමේ හැකියාව පවතී. ඒ අනුව, මෙලෙස එකම වැසි අංකයකින් අත්ට්‍රැක්ටර් හෝ ට්‍රැක්ටර් ටේලර් කීපයක් ලියාපදිංචි වී තිබීම සාමාන්‍ය වේ. නමුත්, වර්තමානයේ ඉංග්‍රීසි අකුරු ලියාපදිංචියේ දී මෙවැනි වැරදීමක් සිදුවිය නොහැකිය.	
48	රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන ත්‍රිවිධ හමුදාව හෝ මූල්‍ය ආයතන විසින් යම් ලියාපදිංචි වාහනයක් සුන්බුන් ලෙස ඉවත් කිරීමට කටයුතු කිරීමේදී ඉවත්වන වාහනයේ ලියාපදිංචි සහතිකය වංචනික ක්‍රියාවන්ට යොමු වීම වැලැක්වීම සඳහා සියලුම සුන්බුන් වාහන මෝටර් රථ ප්‍රවාහන	2023	ලියාපදිංචි වාහනයක් සුන්බුන් ලෙස ඉවත් කිරීමට කටයුතු කිරීමේදී ඉවත්වන වාහනයේ ලියාපදිංචිය අවලංගු කිරීමට කටයුතු කල	ත්‍රිවිධ හමුදාව මගින් සුන්බුන් ලෙස විකුණන ලද වාහන සඳහා මෝටර් වාහනයක් ලෙස විකිණූ බවට තහවුරුවක් මෙම දෙපාර්තමේන්තුවට යොමු කිරීමක් සිදු නොකරනු ලබයි. විගණනය මගින් ඉදිරිපත් කරනු ලබන	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය අවලංගු කරවා ගැනීමට ක්‍රියාකල යුතු බවට අවශ්‍ය වන නීතිමය හා ප්‍රායෝගික ව්‍යුහයන් සකස් කර නොතිබුණි.		යුතුය.	කරුණු අනුව මෙලෙස සුන්බුන් ලෙස විකුණා ඇති වාහන වල වැසි අංකයට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබිය හැකි බව පිළිගෙන ඇත. කෙසේ වෙතත් විගණන නිරීක්ෂණය හා එකඟ වෙමින් මේ සඳහා අවශ්‍ය නීතිමය හා ප්‍රායෝගික ව්‍යුහයන් සකස් කිරිමට පියවර ගෙන ඇත.	
49	එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබාදීමේ චක්‍රලේඛ අනුව ලබාදුන් බලපත්‍ර මත ආනයනය කරන ලද වාහන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.				
	(i) කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය නිකුත් කරන ලද අංක 02/2022 දරණ මුල් චක්‍රලේඛයේ 5.3 ඡේදය හා 02/2022(i) හා 2022.09.09 දිනැති චක්‍රලේඛය අනුව විදේශ රටක දී භාවිතා නොකළ හෝ ධාවන මනුව ශුන්‍ය හා නිෂ්පාදිත දින සිට වසර එකක කාලයක් ඇතුළත යන කොන්දේසි සම්පූර්ණ වන වාහන පමණක් ආනයනය කළ යුතුය. වාහන ආනයනයේ දී මෙන්ම වාහන ලියාපදිංචි කිරීමේ දී ඉහත කොන්දේසි සම්පූර්ණ කර ඇති බවට නිෂ්පාදකයාගේ සහතික, විදේශ රටක ලියාපදිංචි සහතික, පූර්ව ආනයනික භාණ්ඩ පරීක්ෂාවට අදාළ ලේඛන වැනි විෂයගත ලේඛන මගින් සනාථ කළ යුතු වුවත් එවැනි ලේඛන මගින් පූර්වෝක්ත චක්‍රලේඛ	2023	රේගු සටහන්කරයට අමතරව අනෙකුත් ආනයනික ලියවිලි සමඟ සසදා භාවිතා නොකල වාහනයක්ද යන්න තහවුරු කර ගත යුතුය.	මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව මඟින් නිකුත් කර ඇති CUSTOM 53, ASSESMENT NOTICE සහ ශ්‍රී ලංකා රේගුව මඟින් මෙම දෙපාර්තමේන්තුවට සම්ප්‍රේෂණය කරනු ලබන මෝටර් වාහනයට අයත් තොරතුරු ප්‍රධාන වේ. අදාල මෝටර් වාහනය ආනයනය සඳහා බලපත්‍රයක් නිකුත් කර ඇත්නම් එම බලපත්‍රයේ සඳහන් කොන්දේසි ද ප්‍රමුඛ වේ. විගණන විමසුම මඟින් සඳහන් කර ඇති පරිදි වාහන ආනයනයේදී හෝ වාහන ලියාපදිංචියේදී කොන්දේසි සම්පූර්ණ	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති බව තහවුරු කර නොතිබිය දී බලපත්‍ර මගින් ආනයනය කර තිබූ අවස්ථා 5ක දී තීරු බදු සහනයන් මත උක්ත වාහන නිදහස් කිරීමට මෙන් ම නිසි පරිදි ලේඛනගත තහවුරු කිරීමකින් තොරව රේගු සටහන්කරය තුළ "භාවිතා නොකළ" වාහනයක් බව සඳහන් කිරීමට රේගුව කටයුතු කර තිබූ අතර රේගු සටහන්කරයට අමතරව අනෙකුත් ආනයනික ලියවිලි කිසිවක් නොමැතිව උක්ත වාහන මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.			කර ඇති බවට නිෂ්පාදකයාගේ සහතිකය, බැටරිය බැහැර කිරීමේ වගකීම බලයලත් නියෝජිතයා භාර ගැනීම් ආදී වගකීම් සම්බන්ධයෙන් මෝටර් වාහන ආනයනයේදී ශ්‍රී ලංකා රේගුව මගින් පරීක්ෂා කළයුතු කාර්යක් බව සඳහන් කර ඇත. එම ලේඛණ මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කටයුතු සඳහා ඉදිරිපත් කිරීමක් සිදු නොවන බවද වැඩිදුරටත් දන්වා ඇත.	
(ii) වාහන ආනයනයේ දී සම්පූර්ණ කළ යුතු නිර්ණායකයන් ලෙස 02/2022 චක්‍රලේඛයේ 5.1 තුළ බැටරි ඇසුරුම හා විදුලි මෝටරය සඳහා අවම වශයෙන් වසර තුනක් සඳහාවත් නිෂ්පාදකයින්ගේ හෝ අපනයනකරුවන්ගේ වගකීමක් තිබිය යුතු ලෙස දක්වා ඇති අතර චක්‍රලේඛයේ 5.4 ඡේදය තුල එක් බල ආරෝපණයකින් අවම වශයෙන් ධාවන කිලෝමීටර් දෙසීයකට වඩා ධාවනය කළ හැකි විය යුතු ලෙස දක්වා ඇත. කෙසේ නමුත් උක්ත නිර්ණායකයන් සම්පූර්ණ වන බවට නිෂ්පාදකයාගේ හෝ අපනයනකරුගේ පිළිගත හැකි තහවුරුවක් සහිත ලේඛන ලබා ගැනීමකින් තොරව උක්ත වාහන ආනයනය කර තිබූ අතර චක්‍රලේඛ අවශ්‍යතාවයන් තහවුරු වන බවට ලේඛණ ලබා ගැනීමකින් තොරව බලපත්‍ර	2023	අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම මෝටර් වාහන ආනයනය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛය අනුව මෝටර් වාහන ලියාපදිංචියට පෙර ආනයනය සඳහා බලපාන කොන්දේසි වලට අදාල ලේඛණ පරීක්ෂාව අදාල රේගුබදු අයකිරීමට පෙර රේගුව සතු කාර්යභාරයක් බවත්, රේගුව මඟින් නිකුත් කරනු ලබන CUSTOM 53 පදනම් කර ගනිමින් සහ අවශ්‍ය කරන අනෙකුත් ලියකියවිලි භාරගෙන ලියාපදිංචිය සිදුකරන බව සඳහන් කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	යටතේ ආනයනය කළ වාහන 108ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබුණි.				
(iii)	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2022(iii) හි 2.2 ඡේදය 02/2022(iv) චක්‍රලේඛ අනුව 2022.05.17 දිනයට පෙර නිකුත් කරන ලද සියලුම බලපත්‍ර යටතේ ආනයනය කරන ලද වාහන 2023 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතුවේ. එහෙත් චක්‍රලේඛයේ සඳහන් ලියාපදිංචි කළ හැකි අවසන් දිනෙන් පසුව චක්‍රලේඛ නිකුත් කළ බලධාරි ආයතනයන්හි අවසරයකින් හෝ අනුමැතියකින් තොරව, බලපත්‍ර යටතේ ආනයනය කළ වාහන දෙකක් ලියාපදිංචි කිරීමට කටයුතු කර තිබුණි.	2023	අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර චක්‍රලේඛ විධිවිධාන අභිබවා කටයුතු කල නිලධාරින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.	ලියාපදිංචි අංක CBM-XXXX දරණ මෝටර් රථය ශ්‍රී ලංකා රේගුව මඟින් 2023.09.11 දින නිදහස් කර ඇති බව රේගු ලියවිලි අනුව තහවුරු වේ. ඒ අනුව ලියාපදිංචිය සිදුවී ඇත. එමෙන්ම CBM-XXXX අංක දරණ මෝටර් රථය 2023.05.24 දින ශ්‍රී ලංකා රේගුව මඟින් නිදහස් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව එම චක්‍රලේඛයට අනුව අදාල කාලය තුල මෙම රථ 02 ලියාපදිංචි වී නොමැති බව පිළිගන්නා අතර එය චක්‍රලේඛනය නිවැරදි ලෙස පරිශීලනය නොවීම නිසා සිදුවී ඇති බව සඳහන් කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
(iv)	තීරු බදු ආනයන බලපත්‍ර ක්‍රමය යටතේ විදේශගත ශ්‍රමිකයින් විසින් ආනයනය කරනු ලබන වාහන, අදාළ විදේශගත ශ්‍රමිකයාගේ නමින් ලියාපදිංචි කළ යුතු අතර චක්‍රලේඛ අංක 02/2022(iii) 2.4 ඡේදය අනුව වසර දෙකක් යනතෙක් සන්තකය මාරු කළ නොහැකි වේ. එහෙත් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව බලපත්‍ර මත ආනයනය කළ වාහන 6ක් එකී වාහන මුල් ලියාපදිංචි කළ දිනයේදීම හා එක් වාහනයක් මුල් ලියාපදිංචි දින 5ක් ගතවීමේ පසුව වංචනිකව වෙනත්	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	අදාල නිලධාරීන් මේ සම්බන්ධයෙන් කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ නිසි ලෙස පරිශීලනය කර නොමැති වීම හේතුවෙන් මෙම පැවරීම සිදුකර ඇත. එවැනි වරදක් ඉදිරියේදී සිදු නොවීම සඳහා කඩිනමින් අදාල අංශභාර නිලධාරියා දැනුවත් කර අවශ්‍ය පියවර ගෙන ඇති බවද සඳහන් කර ඇත. තවද මෙම මෝටර් වාහන ආනයනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	පාර්ශවයන්ට පැවරීමට කටයුතු කර තිබුණි.			රේගුව මඟින් පරීක්ෂණයක් සිදු කරන බවද දන්වන අතර මුල් ගොනු ශ්‍රී ලංකා රේගුව විසින් විමසා මෙම දෙපාර්තමේන්තුවෙන් රැගෙන ගොස් ඇති බවද දැනුම් දී ඇත..	
(v)	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 02/2022(i) හා 02/2022(iii)හි ප්‍රතිපාදන ප්‍රකාරව 2022 සැප්තැම්බර් 09 දින සිට 2023 මාර්තු 21 දින දක්වා බලපත්‍ර යටතේ ආනයනය කරනු ලබන වාහනයේ CIF වටිනාකමින් සියයට 10ක වටිනාකම ඇමෙරිකානු ඩොලර් වලින් ගෙවීමෙන් පසුව පාර්ශවයකට පැවරීමට හැකි ලෙස ප්‍රතිපාදන ඇතුළත්ව තිබූ නමුත් උක්ත පැවරීමට තිබූ විධිවිධාන 2023 මාර්තු 21 දිනෙන් අවසන් වී තිබුණි. එහෙත් චක්‍රලේඛ ප්‍රතිපාදනයන්ට අනුකූල නොවන සේ චක්‍රලේඛ ආවරණය බලාත්මක නොවන දිනයක් වන 2023 මාර්තු 22 දින, බලපත්‍ර ක්‍රමය යටතේ ආනයනය කරන ලද එක් වාහනයක CIF වටිනාකමින් සියයට 10කට සමාන රුපියල් අගයක් ගෙවීමෙන් පසුව වෙනත් පාර්ශවයකට සන්තකය මාරු කර දීමට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරින් කටයුතු කර තිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	ලියාපදිංචි අංක CBM-XXXXට අදාල මෝටර් රථය 2023.02.28 දින ශ්‍රී ලංකා රේගුව මඟින් නිදහස් කර ඇති අතර, ලියාපදිංචිය 2023.03.17 දින සිදු කර ඇත. කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛණය අනුව මෙම රථය 2023.09.30 දිනට පෙර ලියාපදිංචි වියයුතු බව සඳහන් වුවත් CIF වටිනාකමින් 10% ක් අයකර පැවරීම සිදු කිරීමට ඇති හැකියාව 2023.03.21 දිනෙන් අවසන් බවට 2023.03.21 නිකුත් කර ඇති 02/2022(III) චක්‍රලේඛණයේ සඳහන් වුවද මෙම චක්‍රලේඛණයේ විධිවිධාන 2023.03.22 වැනි දින වන විට මෙම දෙපාර්තමේන්තුවට වාර්තා නොවීම හේතුවෙන් මෙම පැවරුම සිදුවී ඇති බව සඳහන් කර ඇත. මෙම පැවරීමට අදාලව CIF වටිනාකමින් 10% ක් ලෙස රු. 898,978/- ක මුදලක් ගෙවා ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

	(vi) ඉහත යෝජනා ක්‍රමය යටතේ වාහන ආනයනය කිරීමට අදාළ රජයේ බදු ඇතුළු සියලු වියදම් පියවීම සඳහා විධිමත් ලෙස බැංකු පද්ධතිය හරහා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය භාවිතා කළ යුතු අතර ආනයනය කරන ලද වාහන සඳහා කල්බදු පහසුකම් ලබා ගැනීමට චක්‍රලේඛ මගින් ප්‍රතිපාදන සලසා දී නොතිබුණි. කෙසේ වෙතත් බලපත්‍ර අතර ආනයනය කරන ලද එක් වාහනයක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර 2023.10.27 දින වාහනයේ පරම අයිතිය මූල්‍ය සමාගමක් වෙත පවරා දී කල්බදු පහසුකමක් ලබා ගෙන තිබුණි.	2023	කඩිනමින් අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුකර ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය	මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 02/2022, 02/2022(I), 02/2022(III) හා 02/2022(IV) චක්‍රලේඛණ අනුව මූල්‍ය පහසුකම් ලබාගැනීමට නොහැකි බවට කිසිදු සඳහනක් නොමැත. නමුත් විගණනය මඟින් පෙන්වා දී ඇති පරිදි වර්තමානයේ ලියාපදිංචි වන මෝටර් වාහන සඳහා මූල්‍ය පහසුකම් ලියාපදිංචි කිරීමක් සිදු නොකරන බවද දන්වා ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.
50	රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා කරන කාඩ්පත් ඉදිරි මාස තුනකට පමණක් ප්‍රමාණවත් වන බැවින් කඩිනමින් මිලදී ගන්නා ලෙස කොමසාරිස් (රියදුරු බලපත්‍ර) විසින් 2024 ජනවාරි මාසයේ දී ගිණුම් අංශය වෙත දැනුම් දී ඇතත් 2024 මැයි මාසය දක්වා රියදුරු බලපත්‍ර මිලදී ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ කටයුතු ඇනහිටීම හෝ පෞද්ගලික අංශය මගින් ඉහළ මුදලක් ගෙවා මුද්‍රණය කරවා ගැනීමේ අවධානමක් ජනනය වී තිබුණි.	2023	රියදුරු බලපත්‍ර මුද්‍රණය සඳහා භාවිතා කරන කාඩ්පත් කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කල යුතුය.	පසුගිය වසර 3ක් හෝ ඊට වැඩි කාලයක මෙම දෙපාර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර මිලදී ගැනීම් ප්‍රසම්පාදනයක් සිදු කර නොමැත. එබැවින් මෙය විශේෂිත ප්‍රසම්පාදනයක් ලෙස සිදු කිරීම පහත කාල රාමුව තුල ඉටු කර ඇත. 2024.01.18 දින වෙරහැර කොමසාරිස් (රියදුරු බලපත්‍ර) විසින් ඉල්ලීම් කල පසු 2024.01.29 නව රියදුරු බලපත්‍ර සඳහා පිරිවිතර සකස් කිරීමට තොරතුරු තාක්ෂණ අංශය වෙත දැනුම් දී ඇත. ඒ අනුව 2024.02.09 පිරිවිතර සකස් කර දී ඇත. 2024.02.14 තාක්ෂණ ඇගයීම් කමිටු පත්කර ලංසු ලේඛන අනුමත කර අමාත්‍යාංශය වෙත	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

				යොමු කර ඇත. 2024.03.05 අමාත්‍යාංශ අනුමැතිය ලැබුණු පසු 2024.03.06 පුවත්පත් දැන්වීම් පල කර ඇත. මුල් ලංසු ලේඛන අනුව 2024.03.27 ලංසු ලේඛන විවෘත කිරීමට අනුමත වුවත් 2024.03.18 දින ලංසුකරුවන් සමඟ පැවති (per bid meeting) මඟින් ලංසු විවෘත කිරීම 2024.04.10ට දීර්ඝ කරන ලදි. පසුව අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් අනුව 2024.04.19 දක්වා ලංසු විවෘත කිරීම දෙවන වරටත් දීර්ඝ කරන ලදී. මේ වන විට විවෘත කල මිලගණන් ඇගයීම් කටයුතු සිදු කරනු ලබයි.	
51	රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා වේරහැර කාර්යාලයේ මුද්‍රණ යන්ත්‍ර තුනක් හා හම්බන්තොට අනුරාධපුර කාර්යාලවල එක් මුද්‍රණ යන්ත්‍රය බැගින් මුද්‍රණ යන්ත්‍ර පහක් භාවිතා කර නමුත් වර්තමානය වන විට ඉන් මුද්‍රණ යන්ත්‍ර දෙකක් භාවිතයට ගත නොහැකි සේ අක්‍රිය වී ඇත. නැවත එකී මුද්‍රණ යන්ත්‍ර දෙක ප්‍රතිෂ්ඨාපනය කිරීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ ක්‍රියාවලිය ඉදිරියේදී දැඩි ලෙස අකර්මන්‍ය වීමට හෝ ඉහළ මුදලක් ගෙවා පෞද්ගලික අංශයෙන් මුද්‍රණය කරවා ගැනීමට සිදුවීමේ අවධානමක් ඇති වී තිබුණි.	2023	රියදුරු බලපත්‍ර මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණ යන්ත්‍ර කිහිපයක් කඩිනමින් මිලදී ගැනීමට කටයුතු කල යුතුය.	රියදුරු බලපත්‍ර මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියාව සඳහා යන්ත්‍ර නියෝජිත ආයතනය වන මෙට්‍රොපොලිටන් ආයතනයෙන් ඉදිරිපත් කල මිල ගණන් අනුව යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.	නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

84. ශීර්ෂය - 308 තැපැල් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	7,330,701,344	955,740,354	6,374,960,990	තත්ත්වාගණනය කළ
2022	8,110,044,253	1,563,838,262	6,546,205,991	තත්ත්වාගණනය කළ
2023	10,169,717,515	855,008,009	9,314,709,506	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01.	කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වර්ෂ 10 කට පෙර රු.1,295,400 ක වටිනාකමැති මුල්‍ය වංචාවක් අනාවරණය වී තිබුණු අතර 2023 දෙසැම්බර් 31 දින වන විටත් එයින් රු.1,145,850 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳ විගණන වාර්තාවලින් පෙන්වා දුන්නද දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු අවසන් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	කළුතර දිසා ගිණුම් කාර්යාලයේ මුල්‍ය වංචාවෙන් තවදුරටත් අය කරගෙන නොමැති රු.1,145,850 ක ශේෂය සම්බන්ධයෙන් විමර්ශන කටයුතු කඩිනම් කරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.
02.	සමාලෝචිත වර්ෂය අවසානයට මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය සහ වෙනත් නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 57,810,684 ක් වූ අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂය රු. 20,799,130 ක් විය.	2021 2022 2023	හිඟ ණය ශේෂ අයකර ගත යුතුය.	මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය සහ වෙනත් නිලධාරීන්ගේ හිඟ ණය ශේෂ අයකර ගැනීමට, ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ අදාළ චක්‍රලේඛ අනුව කටයුතු කරන ලෙස දිසා ගණකාධිකාරීන් වෙත උපදෙස් ලබාදී ඇත.	වාරික වශයෙන් අය වෙමින් පවතින අතර තවදුරටත් අයකර ගත නොහැකි ණය ශේෂයන් කපා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.
03.	දෙපාර්තමේන්තුව විසින් 2023 දෙසැම්බර් 31 දින වන විට විධිමත්ව පවරා නොගත් තැපැල් කාර්යාල 449 ක් විය.	2022 2023	පවරාගැනීමට කටයුතු කළ යුතුය.	ක්‍රියාමාර්ග ගෙන නොමැත.	පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.
04.	තැපැල්පති නමින් ලියාපදිංචි කර ඇති වාහන සම්බන්ධයෙන් තැපැල් දෙපාර්තමේන්තුවෙන්	2022 2023	තැපැල්පති නමින් ලියාපදිංචිව ඇති සියලුම වාහන	ක්‍රියාමාර්ග ගෙන නොමැත	ක්‍රියාමාර්ග ගෙන නොමැත.

හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු සැසඳීමේදී වාහන 42 ක් සම්බන්ධ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොතිබුණු අතර බස් රථය භාවිතයෙන් ඉවත් කර තිබුණද ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි.	හඳුනාගත යුතුය. භාවිතයෙන් ඉවත් කර තිබුණු බස් රථය වෙනුවෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

85. ශීර්ෂය - 309 **ගොඩනැගිලි දෙපාර්තමේන්තුව**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	892,303,616	892,303,616	(446,636,072)	තත්ත්වාගණනය කළ
2022	906,688,099	906,688,099	(462,931,050)	තත්ත්වාගණනය කළ
2023	913,165,533	913,165,533	272,043,713	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මු.රෙ. 571(3) ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතු වුවත් 2023 දෙසැම්බර් 31 දින වන විට එසේ නිරවුල් නොකරන ලද ඉදිකිරීම් අවසන් කර දෝෂ නිවැරිදි කිරීමේ කාලයද අවසන් හා අතරමඟ නවතා දමා තිබූ ව්‍යාපෘති වල 16/33 තැන්පතු ගිණුම හා 13/52 තැන්පතු ගිණුම යන ගිණුම් 02 ක ශේෂයන් අවුරුදු 05 ට වැඩි රු. 53,108,686 ක්, අවුරුදු 3-5 අතර රු. 83,219,886 ක් හා අවුරුදු 2 - 3 අතර රු. 81,678,965 ක් විය.	2022 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු බව.	දෝෂ නිවැරදි කිරීම් කාලය අවසන් සියලුම ව්‍යාපෘතිවල රඳවුම් මුදල් ආදායමට බැර කිරීමට කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉකුත් තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට මෙතෙක් කටයුතු කර නැත.
02	මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඒවායෙහි ඉදිකිරීම් කටයුතු කරගනු පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී පවරා දෙනු ලැබූ රු. 1,335,896,343 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් උපයෝජනය කර තිබුණේ රු.644,102,933 ක් පමණි. එනම් ප්‍රතිපාදිත මුදලෙන් සියයට 48 ක් පමණි. ඉතිරි රු.691,793,409 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය නොකොට නැවත හරවා යවා	2023	අයවැය ප්‍රතිපාදන සම්පූර්ණයෙන් උපයෝජනය කිරීමට වගකිව යුතු පාර්ශව කටයුතු කල යුතු බව.	මෙම පවරා දෙනු ලැබූ ප්‍රතිපාදන වලින් සැලකිය යුතු ප්‍රතිශතයක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි හේතූන් මත උපයෝජනය කළ නොහැකි වී ඇත.	2024 වර්ෂයේද මුල් මාස 9 තුලදී සියයට සියයක්ම උපයෝජනය නොකල ව්‍යාපෘති 53 ට අදාල ප්‍රතිපාදනය රු. මිලියන 1,099 ක් වී තිබුණි.

	තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 52 ක් වේ. මේ තුල මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකළ ව්‍යාපෘති 08 කට අදාළ මුළු ප්‍රතිපාදනය වූ රු.310,934,000 ක් ද ඇතුළත් වේ.				
03	භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.	අළුතින් මිල දී ගත් හා අපහරණය කල වත්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර තිබුණද රථ වාහන පිළිබඳ විස්තර හා වත්කම්වල අගය තක්සේරු කිරීම්, පසුව හඳුනාගත් ගිණුම් ගත නොවූ වත්කම් ආදී තොරතුරු යවා නොමැත.
04	සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින්, එම සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශයක් එම සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කරන අවස්ථාවේදී රෙජිස්ටාර්වරයා වෙත භාර දිය යුතුය. මෙලෙස සහතිකය ලබාගැනීමට දේපල 61 කට අදාල තොරතුරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලබා දී තිබුණේ සහතික 49 ක් පමණි. 2022 දෙසැම්බර් 31 දිනට	2022 2023	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුවේ.	අනවසර ඉදිකිරීම් වලින් පසුකාලීනව ගොඩනැගිල්ලේ ව්‍යුහයට හානි සිදුවිය හැකි වීම, නිවාස විවෘත කර ගැනීමට නොහැකි විම වැනි දෙපාර්තමේන්තුවට පාලනය කළ නොහැකි හේතු මත හැර අනෙකුත් දේපළ සඳහා සහතික නිකුත් කිරීම	විගණනය වෙත ලබා දී තිබූ තොරතුරු අනුව මේ වන විට සියළු ආයතන සඳහා ඉල්ලීම් කර තිබූ නිවාස දේපළ 2,352 ක් අතුරින් නිවාස දේපළ 1,335 ක් වෙනුවෙන් සහතික පත් නිකුත් කර නොතිබුණි.

	ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරික්ෂා කරන ලද සහාධිපත්‍ය දේපළ ඒකක 710 ක් පැවතුණු අතර 2023 වර්ෂය තුලදී නිකුත් කර තිබූ සහතික ගණන 599 ක් පමණක් විය.				
05	ගොඩනැගිලි ශාස්තු උපලේඛණය (BSR) සැකසීම හා යාවත්කාලීන කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණු අතර 2023 වර්ෂයේ ගොඩනැගිලි ශාස්තු උපලේඛණය පිළියෙල කර තිබුණද ඒකකයකට, වර්ග අඩියකට, දිග අඩියකට ආදී වශයෙන් ඉදිකිරීම් කටයුතු සඳහා සම්මත, ශ්‍රමය, අමුද්‍රව්‍ය ආදී වශයෙන් වූ සම්මතයන් (Norms) 1988 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. එම නිසා ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේදී වර්තමානයේ දියුණු තාක්ෂණික මෙවලම්, යන්ත්‍ර සූත්‍ර යොදාගැනීමෙන් ශ්‍රමයෙහි ඇති වන වෙනස්කම් හා සාම්ප්‍රදායික සිමෙන්ති, ගඩොල්, වැලි වෙනුවට යොදාගන්නා විකල්ප අමුද්‍රව්‍ය හේතුවෙන් ඇතිවන වෙනස්කම් සමඟ ද මෙම සම්මතයන් වෙනස් නොවීම හේතුවෙන් ඒවා වර්තමානයේ යොදාගැනීම තාත්වික නොවේ.	2023	නවීන තාක්ෂණයත් සමග ඉදිකිරීම් සම්මතයන් යාවත්කාලීන විය යුතු බව.	නව ඉදිකිරීම් ක්‍රම යොදා ගෙන කරන ඉදිකිරීම් 10 ක් සඳහා සම්මතයන් සකස් කර 2024 අවසන් කාර්තුවේදී ගොඩනැගිලි ශාස්තු උපලේඛනයට එක්කිරීමට කටයුතු කරමින් පවතී.	සම්මතයන් (Norms) යාවත්කාලීන කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.
06.	**ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**				
(අ)	2017 දෙසැම්බර් 27 දින කොන්ත්‍රාත්කරු වෙත ප්‍රදානය කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු. 156,267,463 ක් වූ කුරුඳුවත්ත පොලිස් ස්ථානයේ තනිකඩ බට නිවාස ඉදිකිරීම වසර 06 කට අධික	2022 2023	ව්‍යාපෘති පිරිවැය අවම වන පරිදි ඉදිකිරීම් කඩිනමින් අවසන් කල යුතුය.	පළමු කොන්ත්‍රාත්කරු හා ගිවිසුම අවසන් කර සිවිල් හා විදුලි වැඩ සඳහා ප්‍රමාණපත් සකස් කර විවෘත ප්‍රසම්පාදනය යටතේ සුදුසු නව කොන්ත්‍රාත්කරුවකු	ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව මේ දක්වා නව කොන්ත්‍රාත්කරුවෙකු මඟින් හෝ ඉටු කරවා ගෙන නොතිබුණි.

	කාලයක් ගතවී තිබුණද ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.			ලවා සිදු කිරීමට නියමිතය.	
(ආ)	රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 06 ක කාලසීමාවක් තුල පිරිනමන ලද රුපියල් මිලියන 659 ක් ඉක්මවූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 23 ක වැඩ අවසන් කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි.	2021 2022 2023	මෙම ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම පිළිබඳව සම්බන්ධිත පාර්ශවයන් සමඟ එකඟතාවයකට එළඹිය යුතු බව.	කොන්ත්‍රාත් 13 ක ගිවිසුම්අවලංගු කර ඇති අතර එක් ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘති කිහිපයක් නැවත ටෙන්ඩර් කර නිම කරවා ගෙන තිබුණි. ඉතිරි ව්‍යාපෘති සේවාදායක ආයතනවල අවශ්‍යතාවය හා ප්‍රතිපාදන මත නිමකිරීමට කටයුතු කරමින් පවතී.	වැඩ අවසන් නොකළ ව්‍යාපෘති නිම කර දීමට මේ දක්වා කටයුතු කර නැත.
07	මහල් නිවාස 05 ක් ඇතුළත්ව දෙපාර්තමේන්තුව සතු ඉඩම් 45 ක් පවතින අතර ඉන් ඉඩම් 29 ක් සඳහා හිමිකම් ඔප්පු සකස් කර නොතිබුණි.	2021 2022 2023	නිරන්තරයෙන් විමසීම්කර සොයාබලා හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කල යුතුය.	අදාළ ආයතන වෙත ඉල්ලීම් කර ඉතිරි ඉඩම් සඳහා ඔප්පු ලබා ගැනීමට පියවරෙන් පියවර කටයුතු කරමින් පවතී .	ඉඩම් 28 ක් සඳහා ඔප්පු මෙතෙක් ලබාගෙන නොමැත.
08	දෙපාර්තමේන්තුව සතු ඉඩම් 45 අතුරින් ඉඩම් 25 ක් සඳහා තක්සේරු වටිනාකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගත නොහැකි වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන ඉඩම් වටිනාකම නිවැරදි නොවන අඩු අගයන් පෙන්නුම් කරයි.	2021 2022 2023	මිනින්දෝරු සැලැස්ම සකස්කර වත්කම් වෙන් වශයෙන් තක්සේරුකර වටිනාකම දැක්විය යුතුය.	සිහි කැඳවීම් කර ඉදිරි කටයුතු සිදු කිරීම.	පැවරුම් සහතික ලබා ගනිමින් ඉඩම් තක්සේරු කිරීමට මෙතෙක් කටයුතු කර නොමැත.
09	2020 මාර්තු මාසයේ සිට සංචාරකයන් වෙත තංගල්ල සංචාරක බංගලාව ලබාදීමට නොහැකි වී තිබූ අතර නිසි ක්‍රමවේදය යටතේ මුදල් ගෙවා වෙන්කරවා ගැනීමකින් තොරව බාහිර පුද්ගලයන් පිරිසක් රැඳී සිටින ලදි. එම හේතුවෙන් විදුලිය හා ජලය ගාස්තු අසාමාන්‍ය ලෙස වර්ධනය වූවද බංගලාවේ නඩත්තු වෙනුවෙන් වියදම්	2023	සංචාරක බංගලාව බාහිර පුද්ගලයන් වෙත ලබාදී ආදායම් ඉපයීමට කටයුතු කල යුතුය.	තංගල්ල සංචාරක බංගලාව අවභාවිතා කිරීම සම්බන්ධව 2023.12.04 දිනැතිව ජනාධිපති කාර්යාලයේ ලේකම් වෙත ලිපියක් යොමු කර ඇති බව වැඩිදුරටත් සඳහන් කරමි. ඒ අනුව, එම තත්ත්වය පාලනය කිරීමට නොහැකි තත්ත්වයක් නිසා	මේ දක්වා සංචාරක බංගලාව විවෘත කර නොමැති අතර විදුලිය හා ජල ගාස්තු රු.794,572 ක් ප්‍රතිපූරණය කර ගෙන නොතිබුණි.

	දැරීමට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. මෙතෙක් දැරූ විදුලිය සහ ජලය වියදම වූ රු. 699,387 ක මුදල හා 2023 නොවැම්බර් 16 දිනට ගෙවිය යුතු හිඟ විදුලිය හා ජල වියදම රු.95,185 ක මුදල ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.			සංචාරක බංගලාව තාවකාලිකව වසා දැමීමට පියවර ගන්නා ලදී.	
10	තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුලදී පවතින රාජ්‍ය රෝහල් 46 කට සූර්ය පැනල සවිකිරීම සඳහා සැලසුම්පත් හා පිරිවිතර සකස් කර දීම ලෙස එක් අරමුණක් හඳුනාගෙන තිබුණි. මෙම අරමුණෙහි ඉලක්කය ලෙස සූර්ය බලය උපයෝගී කරගෙන පුනර්ජනනීය බලශක්තිය නිපදවීම මඟින් තාපජනක විදුලි ඉල්ලුම අඩුකර ගැනීම දක්වා තිබුණි. දර්ශකයක් ලෙස පවත්නා රෝහල්වල සූර්ය පැනල සවිකිරීම යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල ලිපි යොමුකල බව දන්වතත්, ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මෙම ව්‍යාපෘතියෙහි අදාළ ඉදිකිරීම්වල ප්‍රගතියක් මේවන තෙක් නොවීය. මේ හේතුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අදාල තිරසාර සංවර්ධන අරමුණු සකස් කර ගැනීමට 2023 වසරේදීත් නොහැකි වී තිබුණි. එබැවින් කාර්යසාධන වාර්තාවෙහි දක්වා තිබූ ප්‍රගතිය විගණනයේදී පිළිගත නොහැක.	2023	හඳුනාගෙන ඇති අරමුණු තිරසර සංවර්ධනයට දායක නොවන බැවින් ලඟාකරගත හැකි වෙනත් අරමුණු හඳුනාගත යුතුවේ.	සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් රෝහල්වල සූර්ය පැනල සවිකිරීම ව්‍යාපෘතිය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව මඟින් සැලසුම්පත් හා පිරිවිතර සකස් කර දුන්නද ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතිය නොකරන බව 2023/10/16 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තාක්ෂණික (ඉංජිනේරු සේවා) මඟින් දන්වා එවා ඇත. එසේ හෙයින් මෙහි ඉදිකිරීම් ප්‍රගතියක් නොමැත.	මේ දක්වා තිරසර සංවර්ධන අරමුණු සකස් කර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි වී නොතිබුණි.

86. ශීර්ෂය - 310 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	852,843,079	852,843,079	777,260,288	තත්ත්වාගණනය කළ
2022	852,280,808	852,280,808	828,462,528	තත්ත්වාගණනය කළ
2023	799,618,041	799,618,041	776,580,755	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපතිගේ නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2023 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමෙන් කළ වැඩ අත්තිකාරම් ගිණුමට නිකුත් කල ද්‍රව්‍යවල පිරිවැය රු.111,541,429 ක් වූ අතර මෙම නිකුත් කිරීම්වල ගණනය කරන ලද වටිනාකම රු.127,685,080 ක් වී තිබුණි. මේ අනුව ගබඩා කිරීම් හා මෙහෙයුම් කටයුතු සඳහා වන වියදම් ආවරණය සඳහා රු.16,143,651 ක අගයක් එකතුකර තිබුණි. ඒ අනුව එම අගය නිකුත් කිරීම්වල පිරිවැයෙන් සියයට 14.5 ක ප්‍රමාණයක් බවද නිරීක්ෂණය විය.	2023	පෙරවදනෙහි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය.	ඉදිරියේදී සියලුම නිකුත් කිරීම්වලට අදාළ රික්විෂිෂන්පත් FMS පද්ධතිය හරහා වටිනාකම් ගණනය වීම තුලින් මෙම දෝෂය ඇති වීම අවම කිරීමට හැකිවනු ඇත.	ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව තොග නිකුත් කිරීමේදී පිරිවැයට සියයට 10 ක් එකතු කළ ද ගබඩා අත්තිකාරම් ගිණුමේ ලාභයක් ඇති නොවන අයුරින් මෙහෙයවීමට මේ දක්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
02	2023 වර්ෂයේ ගබඩා අත්තිකාරම් ගිණුමෙහි අතිරික්තය වූ රු.5,437,456 ක් කළ වැඩ අත්තිකාරම් ගිණුමට අනුචිත ලෙස ගලපා තිබුණි. මේ හේතුවෙන් නිෂ්පාදන පිරිවැය රු.5,437,456 කින්	2023	ගබඩා අත්තිකාරම් ගිණුමෙහි අතිරික්තයන් කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි නොගැලපිය යුතු බව.	මෙම ගිණුම් දෙකෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සකස් කර ඉදිරියේදී කටයුතු කරනු ලබයි.	අත්තිකාරම් ගිණුම්වලට අදාල ලාභය / අලාභය ගැලපීම සඳහා භාණ්ඩාගාර උපදෙස් ගෙන ඉදිරියේදී අවසන් ගිණුම් නිවැරදිව පිළියෙල කිරීමට

	අඩුවෙන් දක්වා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. එබැවින් 2023 වර්ෂයේදී කලවැඩ අත්තිකාරම් ගිණුමෙහි දක්වා ඇති රු.5,377,653 ක් වූ අලාභය, එම ගැලපුම සිදුකර නොතිබුණි නම් රු.10,815,109 ක අලාභයක් දක්වා වැඩි වීමට හේතුවේ. මීට අමතරව ගබඩා අත්තිකාරම් ගිණුමට අදාල සේවක අතිකාල, බටා හා ප්‍රවාහන වියදම් එකතුව රු.10,706,195 ක්ද නිෂ්පාදන පිරිවැය ගණනයේදී අඩුකර තිබුණි. මේ තත්ත්වයද සලකා බැලීමේදී අලාභය එම අගයෙන් ද වැඩි වනු ඇති බවද නිරීක්ෂණය වේ. ඒ අනුව කළ වැඩ අත්තිකාරම් ගිණුමේ මුළු අලාභය රු.21,521,304ක් වන බව නිරීක්ෂණය විය.				අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
03	වත්කම් හඳුනා ගැනීමේ කේතාංක ඇතුලත් කර නොතිබීම හේතුවෙන් සිගාස් මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් වාර්තාවෙහි භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන්හි පවත්නා වත්කම් පමණක්ම ඇතුළත්ද, වත්කම් අපහරනයන්හිදී කුමන වත්කම් ඉවත් කර තිබේද, කුමන වත්කම් දෙපාර්තමේන්තුව තුල පවතින්නේද යන්න හඳුනා ගැනීමට විගණනයට නොහැකි විය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්	2023	ගිණුම්ගතකර තිබෙන භාණ්ඩ සත්‍ය වශයෙන්ම භෞතිකව පවතින නිවැරදි භාණ්ඩ ප්‍රමාණය බව තහවුරු කර ගත යුතු බව.	කමිටුවක් මගින් කේතාංක ඇතුලත් කිරීම සිදුකොට ස්ථාවර වත්කම් වාර්තාව යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම.	ස්ථාවර වත්කම් වාර්තාව මේ වන තෙක්ම යාවත්කාලීන කර නොමැත.

	කරන රු.1,009,227,853 ක් වටිනා වත්කම් සත්‍ය වශයෙන්ම දෙපාර්තමේන්තුව තුල භෞතිකව පවත්නා වත්කම් පමණක් බව තහවුරු නොවීය.				
04	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව 2008 හා 2009 වර්ෂවල පැවති ණයගැති ශේෂවල එකතුව රු.36,941,553 ක් වුවද ලියා හැරිම සඳහා අමාත්‍යංශ ලේකම්ගේ අනුමැතිය සහිත කමිටු වාර්තාව ප්‍රකාරව එම ණයගැතියන්ගේ එකතුව රු.4,045,992 ක් විය. එසේ තිබියදී මූල්‍ය ප්‍රකාශයන්හි 2008 හා 2009 වර්ෂයන්ට අදාළ ඉහත සඳහන් රු.36,941,553 ක් වූ මුළු ශේෂයම කපාහැර තිබුණි.	2022 2023	නිසි අනුමැතියකින් තොරව ණයගැතියන් කපාහැරීම නොකල යුතු බව.	ඉදිරියේදී රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත පමණක් ඉවත් කිරීමට කටයුතු කිරීම	අදාල අනුමැතීන් ලබා ගෙන නොමැත.
05	2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය පිළියෙල කර යාවත්කාලිනව පවත්වා නොතිබුණි.	2023	සිගාස් වැඩසටහන තුළ ස්ථාවර වත්කම් මොඩියුලය මගින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතු බව.	සිගාස් වැඩසටහන තුල ස්ථාවර වත්කම් මොඩියුලය යාවත්කාලීන කිරීමට අදාළ උපදෙස් විමසා ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමට හා යාවත්කාලීන කිරීමට සටහන් කර ගැනීම.	මාර්ගෝපදේශය ප්‍රකාරව ස්ථාවර වත්කම් මොඩියුලය මගින් වත්කම් ලේඛනය යාවත්කාලීනව පිළියෙල කර නොතිබුණි.
06	රු. 53,161,909 ක් වටිනාකමැති කල වැඩ අත්තිකාරම් ගිණුමට අදාලව 2021 වර්ෂයේදී ලියා හරින ලද ණය ගැතියන් සඳහා අදාල අනුමැතීන් නොමැති වීම හේතුවෙන් ණය ගැතියන් ලියා හැරීම විගණනයට	2022 2023	2021 වර්ෂයේ ලියා හරින ලද ණය ගැතියන් සඳහා විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් කල යුතු බව.	ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කර ඇති අතර ඉදිරියේදී ලැබෙන උපදෙස් අනුව කටයුතු කිරීම.	ලියා හරින ලද ණයගැතියන් වෙනුවෙන් නිසි අනුමැතිය ලබා ගෙන නොමැත.

පිළිගත නොහැකි විය.

07	සමාලෝචිත වර්ෂයේදී කල වැඩ අත්තිකාරම් ගිණුමෙහි රු. 1,682,924ක ක්ෂය සංචිත අරමුදලට අදාල විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කල නොහැකි විය.	2021 2022 2023	මූල්‍ය ප්‍රකාශන වල ශේෂයන් සඳහා අදාල විස්තරාත්මක උපලේඛන පවත්වා ගත යුතු බව.	මේ සම්බන්ධ තොරතුරු පවතින ලිපිගොනු වලින් සොයාගත නොහැකි වීම.	විස්තරාත්මක උපලේඛණ මේ වන තෙක්ම ලබා දී නොමැත.
08	කළ වැඩ අත්තිකාරම් ගිණුමෙහි 2022 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු. 536,724,700 ක් වූ අතර වර්ෂ 01 ත් 10ත් අතර නිරවුල් නොවූ ණයගැති ශේෂය රු.310,357,322 ක් වූ බැවින් ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීම ඉතාමත් දුර්වල තත්ත්වයක පවතින බව නිරීක්ෂණය විය.	2021 2022	හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට විධිමත් හා ප්‍රමාණවත් පියවර ගත යුතු බව.	මෙම ණයගැති ශේෂය හඳුනාගෙන කටයුතු කිරීම සඳහා දැනට පවත්වාගෙන යනු ලබන ණයගැති ශේෂ සැසඳීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.	ණයගැති ශේෂයන් නිරවුල් කර ගැනීමට මෙතෙක් කටයුතු කර නොමැත.
09	අංක 01/2017 දරන 2017 ජූනි 28 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 5 වන ඡේදය ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ආයතනය සතු රු. 72,379,000 ක් වූ වාහන හා රු.278,543,676 ක් වූ යන්ත්‍රෝපකරණ පිළිබඳව භාණ්ඩාගාර කොම්ප්ට්‍රෝලර් ජනරාල්වරයා වෙත වාර්තා කර නොතිබුණි.	2021 2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව අදාල වත්කම් විස්තර කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු බව.	අදාල තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවති.	චක්‍රෙල්ඛ ප්‍රකාරව අදාල සියලුම තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.
10	2023 දෙසැම්බර් 31 දිනට FMS පද්ධතිය මඟින් ජනනය වෙන තොග ශේෂයන් සම්බන්ධ	2023	පද්ධතිය ස්ථාපිත කිරීමේ හා වැඩිදියුණු කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමට	FMS පද්ධතිය වැඩි දියුණු කර දෙන ලෙස ඉල්ලුම් කිරීම.	FMS පද්ධතියෙන් මෙතෙක් තොග වාර්තා ලබාගත

	තොරතුරු විගණනය විසින් ඉල්ලා සිටියද යාවත්කාලීන කරන ලද එවැනි වාර්තාවක් පද්ධතිය හරහා ජනනය කර ලබා නොදුන් අතර ගිණුම් අංශය විසින් පිලියෙළ කරන ලද තොග වාර්තා විගණනයට ඉදිරිපත් කෙරුණි. එම වාර්තාවේ අයිතමවල කිසිඳු දිනයක් හෝ කාල පරාසයක් නොතිබුනු අතර තොග වාර්තාවෙහි රු.1,723,305 ක් වටිනා අයිතම් 04 ක සෘණ අගයන් සටහන් වී තිබුණ ද එම ශේෂයන් තොග පොත් අනුව සොයාගත නොහැකි විය.		ප්‍රමාදයකින් තොරව කටයුතු කලයුතු බව.		නොහැකි වී ඇත.
11	මායිම් තාප්ප හෝ ස්ථිර වැටක් යොදා දෙපාර්තමේන්තුව සතු ඉඩම් ආරක්ෂා කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් රජයේ කර්මාන්තශාලා සේවක නිවාස පිහිටි ඉඩමේ ඌන උපයෝජිතව පවතින ඉතිරි අක්කර 01 යි රූඩ් 03 යි පර්චස් 11ක භූමි භාගය අනවසර පදිංචිකරුවන් විසින් අත්පත් කරගෙන තිබුණි.	2022	අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන දෙපාර්තමේන්තුවට අයත් වත්කම් ආරක්ෂාකර ගැනීමට කටයුතු කිරීම කළමණාකරණයේ වගකීම වන බව.	අනවසර පදිංචිකරුවන්ගේ නාම ලේඛනයක් කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් වෙතින් ලබාගෙන අවශ්‍ය නීතිමය කටයුතු සිදු කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා යවා ඇත.	අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමට මේ වන තෙක් කටයුතු කර නොමැත.
12	තැපැල් දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශය සඳහා තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද	2021 2022 2023	ඉදිකිරීම් ව්‍යාපෘති සිදු කිරීම දෙපාර්තමේන්තුවේ විෂය පථයට නොගැනෙන බැවින් නඩත්තු/ අළුත්වැඩියා කටයුතු හැර වෙනත් අවදානම් සහිත ව්‍යාපෘති භාර	විකල්ප ක්‍රියාමාර්ග වෙත යොමු වීම සම්බන්ධයෙන් වන යෝජනා සහිත වාර්තාවක් තැපැල් දෙපාර්තමේන්තුව වෙත යොමුකිරීමට කටයුතු කිරීම.	2024 ඔක්තෝබර් දක්වා ඉදිකිරීම් නිමකර නොමැත.

	රු.104,412,899 ක් වූ ඇස්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුව එකඟවී 2018 දෙසැම්බර් 31 දින රු.3,795,000 ක් ගෙවා තිබුණි. එසේ වුවද අදාළ ඉදිකිරීමට යෝජිත ඉඩමෙහි පස සුදුසු නොවන බව 2019 ජනවාරි 13 දින පැවති සාකච්ඡාවේදී තහවුරු වී තිබුණු බැවින් අළුතින් සකස් කරන සැලසුමකට අනුව වෙනත් ස්ථානයක ඉදිකිරීමකට යැයි දක්වා තවත් රු.10,710,572 ක් 2019 මාර්තු 14 දින හා රු.7,694,000ක් 2020 මාර්තු 06 දිනද ලෙස එකතුව රු.22,199,572ක් මෙම දෙපාර්තමේන්තුවට තැපැල් දෙපාර්තමේන්තුවෙන් අයකරගෙන තිබුණි. එසේ වුවද 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සියයට 10 ක් පමණක් විය. වසර 05 ක් ගත වුවද ව්‍යාපෘතිය නිමකර දීමට හෝ ලද මුදල් ආපසු ගෙවීමට හෝ කටයුතු කර නොතිබුණි.		නොගත යුතුය.		
13	දෙපාර්තමේන්තුවට අයත් කොලොන්නාව පිහිටි නිල නිවාස 24 ක් එම නිවාසයන්හි නානකාමර වල ජලය කාන්දුවීම අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් වර්ෂ 04 ක සිට පාවිච්චි නොකර ඌන උපයෝජිතව පැවතුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තුව සතු වත්කම් භාවිතා කල හැකි පරිදි අළුත්වැඩියා කොට නිසිපරිදි නඩත්තු කිරීමට වග බලා ගත යුතු බව.	නිවාස 11 ක් අළුත්වැඩියා කර පදිංචිය සඳහා ලබා දී ඇති අතර ඉතිරි නිවාස සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය වගකීම නොදරණ බව දන්වා ඇති බැවින් ඉදිරි පියවර ගැනීමට නීති සහකාර වෙත දැනුම් දීම.	ඉතිරි නිවාස 13 අළුත්වැඩියාකර පදිංචිය සඳහා ලබා දී නොමැත.
14	දෙපාර්තමේන්තු පරිශ්‍රයේ එළිමහනේ කිසිඳු ප්‍රයෝජනයක් නොගෙන	2023	වත්කම් නිසිපරිදි කළමනාකරණය කිරීමට හෝ	සියලු වත්කම් ලේඛන ගත කිරීම හා භාණ්ඩ සමීක්ෂණය කිරීමටත්	භාණ්ඩ සමීක්ෂණයක් මගින් හඳුනාගෙන

	අව්වට වැස්සට නිරාවරණව දිරාපත් වෙමින් වසර ගණනාවක සිට පැවතෙන වටිනා වාහන, යන්ත්‍ර සූත්‍ර යනාදිය විශාල ප්‍රමාණයක් නිරීක්ෂණය වූ අතර ඒ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. මෙම වත්කම් මු.රෙ.445 ප්‍රකාරව ඉන්වෙන්ට්‍රිගත වී ස්ථාවර වත්කම් ලේඛණයන්හි ඇතුලත් වී ඇත්ද, ඒවායෙහි වටිනාකම් කවරේද, හඳුනාගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවූ අතර භාණ්ඩ සමීක්ෂණයන්හි මේ පිළිබඳ වාර්තා වී නොතිබුණු අතර මේ හේතුවෙන් මු.රෙ.756 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයන් සිදුකරන බව විගණනයට පිළිගත නොහැකි විය.		අපහරණය කිරීමට කටයුතු කල යුතු බව.	එම නිර්දේශ අනුව අදාල පරිදි කටයුතු කිරීම.	උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නැත.
15	රජයේ කර්මාන්තශාලීය සංහිඳ සෙවණ මහල් නිවාසයන්හි පවත්නා අක්‍රමිකතා සම්බන්ධයෙන් අතෘප්තියට පත් සංහිඳ සෙවණ මහල් නිවාසයන්හි පදිංචි දෙපාර්තමේන්තු සේවකයන් විසින් පොලිස්පතිතුමාටද පිටපතක් සහිතව මාධ්‍යයක් වෙත යොමු කර තිබූ ලිපියකට අනුව, විශ්‍රාම ගිය නිලධාරීන් රාජ්‍ය නිවාස භාවිත කිරීම, විදේශගත වීමෙන් පසුවද පදිංචිව සිටීම, රජයේ නිවාස වෙනත්	2023	රජයේ නිවාස භාවිතයේදී පිළිපැදිය යුතු උපදෙස් පිළිනොපදින නිලධාරීන්ට විරුද්ධව නොපමාව ක්‍රියාමාර්ග ගත යුතු බව.	නිවාස පරීක්ෂණ මණ්ඩලයක් විසින් නිවාස 27 ක් පරීක්ෂා කල අතර 2019 වර්ෂයේ සිට වසා දමා තිබූ නිවාස පිළිබඳ විශේෂ විමර්ෂන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයට භාර දීම.	අදාල උපදෙස් පිළිනොපදින නිලධාරීන්ට එරෙහිව මෙතෙක් කටයුතු කර නැත.

බාහිර පාර්ශවයන්ට කුලියට දීම, අයිස් මත්ද්‍රව්‍ය භාවිතය, සේවකයන් වැඩ තහනම්ව තිබියදී රජයේ නිවාස පරිහරනය කිරීම, සුනඛයන් ඇති කිරීම, නිවාස බලධාරීන් විසින් පරික්ෂා නොකිරීම යන කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබුණි. එසේ වුවද 2023 නොවැම්බර් 10 දින අවසන්වරට රැස්ව තිබුණු නිවාස කමිටුව විසින් නිවාස 26 ක් පමණක් පරීක්ෂාකර තිබූ අතර ඉතිරි නිවාසද පරීක්ෂාකර බලා අවශ්‍ය ක්‍රියාමාර්ගය ගැනීමට කටයුතු කිරීමට 2024 අප්‍රේල් 01 විගණිත දිනය වන තෙක්ම අපොහොසත් වී තිබුණි.

87. ශීර්ෂය - 311 ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	365,669,267	2,670,512	362,998,755	තත්ත්වාගණනය කළ
2022	237,453,261	39,201	237,414,060	තත්ත්වාගණනය කළ
2023	277,411,610	82,243	277,329,367	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	මූලධන වැය විෂය අංක 311-1-1-1-2506(ii) යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2021, 2022, 2023 යන වර්ෂවලදී වෙන්කර තිබූ මුදලින් එකතුව රු. 399,352,846 සංවර්ධන කටයුතු සඳහා වැය නොකර වර්ෂය අවසානයේ ඉතිරි වී තිබුණි. නිසි සැලැස්මකට අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර නොගැනීම මෙම තත්වයට සෘජුවම හේතු වී තිබුණි.	2021 2022 2023	ඉදිරි තත්වයන් පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යනයක් සිදු කර නිසි සැලැස්මකට අනුව ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කලයුතු බව.	රටේ පැවති ව්‍යාකූල තත්වය නිසා භෞතික සැලසුම් සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම නිසා ඉතිරි වීම් සිදු විය.	2024 දී ද මේ සඳහා වෙන්කළ ප්‍රතිපාදන වැය නොකර ඉතිරිව තිබුණි.
02	ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුවේ දැක්ම වනුයේ සුඛිත සුබල සුහුරු දැයක්, සුසැලි සුරැකි සොඳුරු බිමක් වූ අතර මෙහෙවර වූයේ ජාතික භෞතික සැළසුම් ප්‍රතිපත්තීන් , සැළසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ ගොඩබිම සහ එහි මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික, සාමාජීය පොදු හා පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ හා ප්‍රවර්ධනය කිරීමේ	2021 2022 2023	දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර සහ අරමුණු කෙරෙහි අවධානය යොමුකර ඒවා ලගාකර ගැනීමට හැකිවන පරිදි සුදුසු සැලැස්මක් දෙපාර්තමේන්තුවට සකස් කර ගත යුතුය.	මෙම කාර්යමණ්ඩලය බුද්ධ ශාසන අමාත්‍යාංශයට අනුයුක්ත කරන මෙන් ඉල්ලීමක් එම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල ද එය ප්‍රතික්ෂේප කරන ලදී. මේ පිළිබඳව නාගරික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් හා බුද්ධ ශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් රැස්වීමක් පැවැත්වීමට සංවිධානය කර ඇත.	බුද්ධ ශාසන අමාත්‍යාංශයට අනුයුක්ත කර නොමැත.

	අරමුණ ඇතිව කලාපීය හා ප්‍රාදේශීය සැලසුම මගින් එම ජාතික ප්‍රතිපත්තිය හා සැළසුම් ක්‍රියාවට නැංවීම තහවුරු කිරීම හා පාලනය කිරීම වේ. එසේ වුවද මෙහෙවරෙන් බැහැරව පූජාභූමි පිරිසිදු කිරීම හා වෙනත් කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ සේවකයින් අඛණ්ඩව යොදවා තිබුණි. මේ සඳහා නගර හා ග්‍රාම නිර්මාණ පනතේ ප්‍රතිපාදන නොමැති අතර, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් සිදු කල යුතු කටයුතු මෙම දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන බව නිරීක්ෂණය විය.				
03	අනුරාධපුර පූජා නගර භූමියේ ජනාවාස ව්‍යාප්තිය සීමා කිරීම හා අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා ලොල්ලුගස්වැව නගර නිර්මාණ ව්‍යාපෘතිය 2017 ආරම්භ කර 2023 දක්වා රු.මිලියන 1,033 ප්‍රතිපාදන ලබා දී තිබුණ ද, ඉන් මිලියන 13.4 ක් එනම් සියයට 1 ක් පමණක් වැය කර තිබූ අතර ව්‍යාපෘති කාර්යාලය පමණක් ඉදි කර තිබුණි. මේ අනුව වසර 07 ක් ගත වුව ද අපේක්ෂිත අරමුණට ළඟා වීමට නොහැකි වී තිබූ අතර නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කිරීම සඳහා රාජ්‍ය ආයතන 04 කින් උපදේශකවරු බඳවා ගැනීමට තීරණය කර තිබූ නමුත් එම කටයුතු	2021 2022 2023	දෙපාර්තමේන්තුවේ විෂය පථයට අදාළ නොවන කාර්යයක් වන බැවින් අදාල පාර්ශවයන් දැනුවත් කර ව්‍යාපෘතිය සිදු කල හැකි ආයතනයක් වෙත පැවරීමට කටයුතු කල යුතු බව.	ලෝලුගස් වැව ඉඩම දෙපාර්තමේන්තුවට 2021 ජුනි පවරාගෙන ඇත. ඉඩම් අමාත්‍යාංශය විසින් නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් ඉල්ලා ඇත. එය සකස් කිරීමට උපදේශකයින් නිදහස් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් තීරණයක් ගෙන නොමැත. එම ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග තීරණ කෙරේ.	2024 වර්ෂයේදීද සිදුකර නොමැත.

	අතරමග නවතා තිබුණි.				
04	දෙපාර්තමේන්තුව විසින් ජාතික භෞතික සැලැස්ම පිලියෙළ කිරීම සහ ඊට අවශ්‍ය සංශෝධනයන් කාලීනව කිරීමටත් කලාපීය සහ නගර භෞතික සැලසුම් සකස් කිරීමක් කළයුතුය. මේ සඳහා රටේ විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරනු ලබන විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් සහ ප්‍රමාණවත් සැලසුම් ශිල්පීන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටිය යුතුය. නමුත් දෙපාර්තමේන්තුවේ එම තනතුරු සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන් ප්රමාණවත් පරිදි නොමැති වීමත් ජාතික භෞතික සැලසුම ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීම සඳහා අනිකුත් රාජ්‍ය ආයතන වල විශේෂඥ දායකත්වය ලබාගත හැකි වන පරිදි 1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත 2000 අංක 49 දරණ නගර නිර්මාණ සංශෝධන මගින් අවශ්‍ය සංශෝධනයක් සිදු කලත් දෙපාර්තමේන්තුව ස්ථාපිත කර වසර 11 කට වැඩි කාලයක් ගත වුවත් ජාතික භෞතික සැලසුම් පිලියෙල කිරීම සහ අනිකුත් කලාපීය සහ නගර සැලසුම් කාලීනව පිළියෙළ කර ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වී තිබුණි.	2021 2022 2023	විශේෂඥ දැනුමැති කාර්යමණ්ඩලයක් සහ විද්වතුන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් භෞතික සැලසුම් සකස් කිරීම සහ සංශෝධනයක් කාලීනව සිදුකළ යුතුය.	ජාතික භෞතික සැලස්ම 2019 වර්ෂයේ පිළියෙල කර සංශෝධනයක් කර අවසන් අදියරෙහි පවතී.	සැලසුම් ශිල්පීන් පුරප්පාඩු පැවතීම නිසා 2024 දී ද කාලීනව සැලසුම් පිළියෙල කිරීමට නොහැකි වී ඇත.
05	පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා පූජා භූමි ලෙස සැලකෙන	2021 2023	සැලසුම් කළ පරිදි කටයුතු සිදුකළ යුතු බව.	මෙම කාර්ය මෙම දෙපාර්තමේන්තුව සිදුකළද එය පුරාවිද්‍යා,	2024 සැප්තැම්බර් 30 වන විටත් 109

	ප්‍රදේශයේ ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකර අවශ්‍යයැයි සැලකෙන නිර්නායක සපුරා තිබේ නම් ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කෙරේ. 2023 දෙසැම්බර් 31 අවසන් වූ වර්ෂය තුල මහා විහාර 38 ක් පූජා භූමි ලෙස ප්‍රකාශයට පත්කිරීමට සහ සංවර්ධනය කිරීමට සහ සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කර තිබූ නමුත් 2023 වර්ෂය තුලදී එම විහාර ගැසට් පත්‍රයක් මගින් පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට කටයුතු කර නොතිබුණි.			මිනින්දෝරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇතුළු ආයතන ගණනාවක් එක්ව කටයුතු කළ යුතුය. ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුද ඇත.	ක් පූජා භූමි ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කරමින් පවතී.
06	2023 වර්ෂය තුලදී මධ්‍යම, ඌව, නැගෙනහිර යන පලාත් 3 සඳහා ප්‍රාදේශීය භෞතික සැලසුම් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද, 2023 වර්ෂය අවසාන වන විටත් කිසිදු සැලැස්මක වැඩ නිම කර නොතිබුණු අතර මධ්‍යම පලාතේ සංවේදී පරිසරයක් සඳහා උපදේශන මාලාවක් සකස් කිරීමට සැලසුම් කර තිබුණ ද එයද සිදුකර නොතිබුණි. කළමනාකරණයේ දුර්වල අධීක්ෂණය මෙයට හේතු වී තිබුණි. මේ හේතුවෙන් සැලසුමකින් තොරව නොගැලපෙන ඉදිකිරීම් සහ පොදු පහසුකම් විධිමත්ව නොමැතිවීම පාරිසරික ගැටළු ඇති වීමට හේතු වී තිබුණි.	2021 2022 2023	සැලසුම් කළ පරිදි භෞතික සැලසුම් සකසා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව.	කාර්යමණ්ඩලයේ හිඟකම නිසා මෙම සැලසුම් සකස් කිරීම සැලසුම් කළ පරිදි සිදුකළ නොහැකි විය.	2024 වර්ෂය තුලදීද අවසන් කර නොමැත.

07	2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 291 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 165 ක් වූයෙන් පුරප්පාඩු 126 ක් විය. මෙය නියමිත කාලවකවානුව තුළ දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතුව තිබූ භෞතික සැලසුම් සකස් කිරිමට නොහැකි වීමට සෘජුව බලපා තිබුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තු කාර්යභාරය ඉටුකිරීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය පවත්වා ගත යුතු බව.	භෞතික සැලැස්ම සකස් කිරීමට අදාලව සහකාර අධ්‍යක්ෂවරුන් බඳවා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.	2024 වර්ෂයේදී ද බඳවාගෙන නොතිබුණි.
08	2022 දෙසැම්බර් 13 දිනැති රාජ්‍ය අංශ ගිණුම් මාර්ගෝපදේශ 2022/05 හි 8.2 ප්‍රකාරව මුල්‍ය නොවන වත්කම් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වුවත් දෙපාර්තමේන්තුවට භුක්තිය ඇති ඉඩම් 06 ක් හා ගොඩනැගිලි 04 ක අයිතිය පවරාගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2023	කඩිනමින් මිනින්දෝරු වාර්තා ලබාගෙන තක්සේරු සිදුකර ගිණුම්ගත කළයුතුය.	ඉඩම් සඳහා ප්‍රාදේශීය ලේකම්වරු වෙතින් මිනින්දොරු සැලසුම් හා හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කරමින් පවතී. අයිතිය ලැබීමෙන් පසු තක්සේරු කරනු ලැබේ.	සිදුකර නොතිබුණි.
09	දෙපාර්තමේන්තුව සතු බත්තරමුල්ල දියවන්නා උද්‍යාන මාවතේ පිහිටි 2015 වර්ෂයේදී රු. 5,160,000 කට මිලදී ගත් අංක 104 දරන නිල නිවස, 2017 වර්ෂයේ සිට සේවකයින්ට ලබාදී නොතිබූ අතර දෙපාර්තාමේන්තුවේ වෙනත් අවශ්‍යතාවයකට යෙදවීමට කටයුතු නොකෙට නිශ්කාර්යව වත්කමක් ලෙස පවත්වා ගෙන ගොස් තිබුණි.	2021	දෙපාර්තමේන්තුවේ වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළයුතුය.	එම කාලය තුල නිල නිවාස සඳහා ඉල්ලීම් ඉදිරිපත් නොවූ අතර ඉදිරියේදී නිසි පරිදි වෙන්කර දීමට හැකි වනු ඇත.	ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

88. ශීර්ෂය - 320 සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	3,036,737,319	439,079,386	2,597,657,934	තත්ත්වාගණනය කළ
2022	3,018,104,412	229,980,938	2,788,123,473	තත්ත්වාගණනය කළ
2023	2,384,204,629	84,984,184	2,299,220,445	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තතත්වය
01	දෙපාර්තමේන්තුව විසින් මන්නාරම කොණ්ඩච්චි ප්‍රදේශයේ අක්කර 1,200 ක පමණ කජු ගස් 27,000 කට ආසන්න කජු වගා ව්‍යාපෘතියක් දීර්ඝ කාලයක සිට පවත්වාගෙන යනු ලබන අතර, පසුගිය වර්ෂ 5 ක ආදායම හා වියදම සැසඳීමේදී රු.මිලියන 10.6 ක ආදායම ඉක්මවූ වියදමක් පැවතුණි. තවද, මේ සඳහා යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින් 180 දෙනෙකුගේ වැටුප් වියදම සැලකිල්ලට ගතහොත් ව්‍යාපෘතියේ අලාභය තවදුරටත් ඉහළයන බව නිරීක්ෂණය විය. වන අලි තර්ජනය නිසා ආරක්ෂාවට පමණක් භටයින් 120 දෙනෙකු යොදවා තිබුණු අතර, කජු ගස් 14,700 ක් පමණක් අංක කර ලේඛන ගතකර තිබුණි. තවද, කජු ඵලදාව නෙලීම හා ලේඛනගත කිරීම විධිමත් අධීක්ෂණයකින් තොරව සිදු කරන අතර, කජු අස්වැන්න ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් ගබඩා පහසුකම් සපයා	2021	වගාව, අස්වනු නෙලීම හා ගබඩා කිරීම නිසි ලෙස කළමනාකරණය කරමින් වියදම් අවම කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනිමට කටයුතු කළයුතු වීම.	ඉදිරියේදී භූමිය වටා අලිවැටක් ඉදිකිරීමටත්, අංක නොකළ කජු ගස් අංක කිරීමටත්, අස්වනු නෙලීම නිසි ලෙස අධීක්ෂණය කිරීමටත්, ප්‍රමාණවත් ගබඩා පහසුකම් ලබාදීමටත් කටයුතු කරන බව.	කොණ්ඩච්චි කජු ව්‍යාපෘතියේ කජු ගස් සියල්ල අංකනය කර අවසන් කර තිබූ අතර, ඒ අනුව කජු ගස් 27,152 ක ප්‍රමාණයක් ඇති බවට තහවුරු කරගෙන තිබුණි. කජු ව්‍යාපෘති භූමිය ශ්‍රී ලංකා කජු සංස්ථාවට අයත් භූමියක් වන බැවින් දෙපාර්තමේන්තු ප්‍රතිපාදන මගින් ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට හැකියාවක් නොමැති හෙයින් කජු අස්වැන්න ගබඩා කිරීම සඳහා ස්ථිර ගබඩා ගොඩනැගිලි ඉදිකල නොහැකි බව දන්වන ලදී. අස්වනු එකතු කිරීමේ දී, වියලීමේදී සහ ගබඩාකිරීමේදී තෙත බර සහ වියලි බර ලෙස වෙන වෙනම සටහන් තබා ගනිමින් ලේඛණ නඩත්තු කිරීම සිදුකරනු ලබන අතර කජු ව්‍යාපෘතිය නැවත කජු සංස්ථාවට බාර දීම සඳහාද මේවන විට සාකච්ජා කරමින් පවතී.

	නොතිබුණි.				
02	අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍ය දැක්ම සංකල්පයට අනුව කෘෂි වගාව නගාසිටුවීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ කැබිතිගොල්ලෑව බලකායට අදාළව අක්කර 20 ක භූමි ප්‍රමාණයක හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට රු. මිලියන 17.67 ක් ද ඇතුලුව, එකතුව රු. මිලියන 18.37 ක මුදලක් වැයකර තිබුණු අතර, නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම වියදම් දැරීම නිසා ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කිරීමට හෝ නොහැකිව අසාර්ථක වී තිබුණි.	2021	ව්‍යාපෘති ආරම්භ කිරීම නිසි ශක්‍යතා අධ්‍යයනයකින් පසුව සිදුකළ යුතු වීම.	විගණන නිරීක්ෂණ හා එකඟවන බව හා මෙවන විට අක්කර 20 පිළිබඳව සැලසුම් සකස් නොකර නියමු ව්‍යාපෘතියක් ලෙස මෙම ලබාගෙන ඇති අයිතම උපරිම අයුරින් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි මිරිස් වගා ව්‍යාපෘතිය අක්කර 04 ක භූමි භාගයක ක්‍රියාත්මක කිරීමට කටයුතු ආරම්භ කර ඇති බව. තවද, මෙවැනි ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමේදී නිසිපරිදි සැලසුම් කර ශක්‍යතා අධ්‍යයනයකින් පසුව ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව.	මුල් අවස්ථාවේදී රු:19,737,736 ක ආදායමක් ලබා ඇති අතර ඉන්පසු එම මුල් වගාව අවසන් කර නැවත 2024 වර්ෂයේදී වගාව ආරම්භකර මේ වන විට පවත්වාගෙන යනු ලබන අතර, එමගින් මේ වන විට රු.3,736,695 ක ආදායමක් උපයාගෙන තිබුණි. එම ව්‍යාපෘතිය ඉදිරියේදී තව දුරටත් ආදායම් ලබා ගනිමින් අඛන්ඩව පවත්වාගෙන යනු ලබන බව සහ තවද, මෙවැනි ව්‍යාපෘති ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමේදී නිසිපරිදි සැලසුම් කර ශක්‍යතා අධ්‍යයනයකින් පසුව ආරම්භ කිරීමට කටයුතු කරනු ලබන බව දන්වන ලදී. ශක්‍යතා අධ්‍යයනයකින් තොරව තවදුරටත් ව්‍යාපෘති ආරම්භකර තිබුණි.
03	ලිපිගොනු 11 යටතේ රු.මිලියන 17.67 ක් වැයකර හරිතාගාර (Green House) මිරිස් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ හා උපකරණ ප්‍රසම්පාදනයේදී ලංසු විවෘත කිරීම්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයන් ලබාදීම්, ප්‍රසම්පාදන කමිටු තීරණ ලබාදීම් හා භාණ්ඩ ඇණවුම් කිරීම් වැනි ප්‍රසම්පාදන කටයුතුවලට පෙර ගබඩාවට භාණ්ඩ ලැබී තිබුණු අතර, විගණනය නොමඟ යැවීම	2021	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් ප්‍රකාරව කටයුතු කරමින් රජයට වඩා වාසි සහගත ලෙස ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට කටයුතු කළයුතු වීම.	අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි අදාළ ව්‍යාපෘතිය ඉතා කඩිනමින් ආරම්භ කිරීමට උපදෙස් ලබා දී තිබූ බැවින් නිලධාරීන් විසින් ඒ සඳහා කටයුතු කර තිබේ. මෙම පිළිවෙත නිවැරදි නොවන බව පිළිගන්නා අතර, වර්තමානයේ හෝ අනාගතයේ එසේ සිදු නොවීමට ක්‍රියාකරන බව හා කොරෝනා ව්‍යාප්තිය නිසා බොහෝ ව්‍යාපාර	වර්තමානයේදී සියළුම ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සිදු කරන දන්වන ලදී.

සඳහා මිලදී ගැනීමෙන් පසු ඒවා නිත්‍යානුකූල බවට තහවුරු කිරීමට ලිපි ලේඛන සකස්කර තිබුණි. ඉතා ඉක්මණින් අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදුකර ගැනීමට කටයුතු කිරීම නිසා ප්‍රසම්පාදන ලිපිගොනු හතරක් යටතේ රු. මිලියන 3.23 ක මුදලක් වැඩිපුර වැයකර මිලදී ගත් භාණ්ඩ හා උපකරණ නිශ්කාර්යව වර්ෂයකට අධික කාලයක් ගබඩාකර තිබුණු අතර, මේ නිසා වර්ෂයක පමණක් වගකීම් කාලයක් ඇති යන්ත්‍ර සහ විදුලි උපකරණවල නිදහස් වගකීම් කාලය සම්පූර්ණයෙන් නිශ්කාර්යව උපයෝජනය වී තිබුණි. මිල සැඳහුම් ක්‍රමය යටතේ මිලදී ගැනීමේදී, ලබා ගතයුතු අවම මිල ගණන් ප්‍රමාණය ලබාගෙන නොතිබුණි. මෙම භාණ්ඩ සහ උපකරණ තොගය යටතේ රු.මිලියන 2.78 ක් වැයකර Rotavator 02 ක් මිලදී ගැනීමේදී ලංසු විවෘත කිරීම එක් සාමාජිකයෙකු විසින් සිදුකර තිබුණු අතර, තාක්ෂණික පිරිවිතරයන්ට අනුකූල අඩු මිල ලංසුකරු ප්‍රතික්ෂේප කර රු.මිලියන 1.98 ක වැඩි මිලකට ප්‍රසම්පාදනය කරගෙන තිබුණි. රු.මිලයන 5 ක් වැයකර Insect Proof Net මිලදී ගැනීමේදී අඩු මිල ගණන් ඉදිරිපත්කළ හා පිරිවිතර අවශ්‍යතා සැපිරූ තායිවාන නිෂ්පාදනයක් හා ඊශ්‍රායලයේ ස්ථාන විවෘතව නොතිබූ බැවින් ක්ෂේත්‍ර පරීක්ෂාවන් මඟින් වෙළඳපල මිල විමර්ෂණය කර අවම මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුගෙන් භාණ්ඩ ප්‍රසම්පාදනය කරගෙන ඉන් අනතුරුව ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රසම්පාදන අංශය වෙත ලිපි ඉදිරිපත් කර ඇති බව.

	නිෂ්පාදනයක් හේතු නොදන්වා බැහැරකර වැඩි මිල ගණන් යටතේ ප්‍රසම්පාදනයකර තිබුණි. රු. මිලයන 3.75 ක වියදමින් ගොඩනැගිලි ද්‍රව්‍ය හා ස්ප්‍රේ මැෂින් මිලදී ගැනීමේදී කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.				
04	ශ්‍රම පිරිවැය හැර රු.මිලියන 11.13 ක වියදමකින් කතරගම බලකා මූලස්ථානයේ සෙසු නිල නිවාඩු නිකේතන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර පලාත් පාලන ආයතනයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර, අනුමැතිය ලබාගැනීමෙන් පසුව අනුමැතියකියන් තොරව අවස්ථා කිහිපයකදිම ගොඩනැගිලි සැලැස්ම සංශෝධනය කර තිබුණි. සැලසුම් කළ පරිදි රු. මිලියන 2 ක ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රාදේශීයව සපයාගනු වෙනුවට රජයේ මුදල් වැයකර සපයා ගැනීමට සිදුවී තිබුණු අතර, ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි මහජන තරඟයට ඉදිරිපත්කර නොතිබුණි. තවද, ඉදිකිරීමට අදාළ අත්‍යාවශ්‍ය ලේඛන නිසි ලෙස යාවත්කාලීනව ගොනුකර නොතිබුණි ඉංජිනේරුවරයෙකුගේ උපදේශයන් සහ අධික්ෂණයකින් තොරව පැරණි අත්තිවාරමේ කොටසක් ප්‍රයෝජනයට	2021	පලාත් පාලන ආයතනයේ පූර්ව අනුමැතියක් මත ඉදිකිරීම් කටයුතු ආරම්භ කළයුතු අතර, පසුව සිදුකරන වෙනස්කම් සම්බන්ධයෙන්ද අනුමැතිය ලබාගත යුතුවීම හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශය නට අනුව කටයුතු කළයුතු වීමත්, ඉදිකිරීම් කටයුතු තාක්ෂණික හෝ ඉංජිනේරු නිර්දේශයන් හා මහපෙන්වීම් මත මෙහෙයවියයුතු වීමත්, තාක්ෂණික නිර්දේශයන් මත ගොඩනැගිලි ද්‍රව්‍ය තෝරාගැනීම හා තනා නිමකිරීම කළයුතුවීමත් පිළිබඳව අවධානය යොමුකළ යුතුවීම.	පසුව ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගෙන ඇති අතර, මුල් සැලැස්මට සුළු වෙනස්කම් කිහිපයක් සිදුකර ඇති බව හා ප්‍රාදේශීයව සපයා ගතහැකි ද්‍රව්‍ය සපයා ගැනීමට ප්‍රාදේශීය බලධාරීන්ගේ අනුමැතිය නොලැබීමෙන් මිලදී ගැනීමට සිදුවූ අතර, අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් පරිදි කටයුතු කිරීමටත්, ලිපි ගොනු හා ලේඛන නිසි ලෙස පවත්වා ගැනීමටත්, ඉදිරියේදී ගොඩනැගිලි ඉදිකිරීම්වලදී අනුගමනය කළයුතු ක්‍රියාදාමයන් පිළිබඳව උපදෙස් ලබාදී ඇති බව හා බළකාවල ශ්‍රම දායකත්වය මත මෙම දොර ජනෙල් නිමවා තිබූ අතර, ඔවුන් බොහෝමයක් වෘත්තීයමය පුහුණුවක් සඳහා යොමු නොකළ හටයින් හෙයින් මේ තත්වය උදා වී ඇතත්, විගණන නිරීක්ෂණය කර ඇති	මෙම ගොඩනැගිල්ල ආගමික අරමුදල සහ වෙනත් රාජ්‍ය නොවන සුභසාධක අරමුදල් මගින් ඉදිකර ඇති අතර මේ සඳහා ප්‍රාදේශීය සභා අනුමැතිය පසුව ලබාගෙන තිබුණි. ගොඩනැගිල්ලේ අඩුපාඩු සම්පූර්ණ කර තිබුණි. කෙසේ වෙතත් විගණන නිර්දේශ අනුව වර්තමානය වන විට සිදුකරනු ලබන ඉදිකිරීම් ඉංජිනේරුවරයෙකුගේ/ ක්ෂේත්‍රයේ ප්‍රවීනයෙකුගේ අධීක්ෂණ හා උපදේශකත්වය මත සිදු කරනු ලබයි. විගණනය නිරීක්ෂණය කර තිබූ නිවාඩු නිකේතනය සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පරීක්ෂණයක් ද සිදු කර ඇති දන්වන ලදී.

ගැනීම හා ගොඩනැගිල්ලේ බර දරා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා නොගැනීම නිසා ඉදිකිරීම සිදුකරන අතරතුර අඩි 4 ක් උසට බැඳ තිබුණු ගඩොල් බිත්ති කිහිපයක්ම පුපුරා ගෙඩනැගිල්ලෙන් පිටතට ඇලවීමෙන් පසුව එම බිත්ති ඉවත්කර කොන්ක්‍රීට් ටයිබීම් ඉදිකර ඒ මත වෙරගැන්වූ කුලුණුද සමඟ බිත්ති නැවත ඉදිකිරීමට සිදුව තිබුණු අතර, මෙමඟින් විනාශ වූ අමුද්‍රව්‍ය හා ශ්‍රම හානිය ගණනයකර නොතිබුණි. තවද, ගොඩනැගිල්ලේ වැඩකටයුතු අවසන් කිරීමට දීර්ඝ කාලයක් ගත වීමටත් , සියයට සීයකින් පමණ ඉදිකිරීම් පිරිවැය ඉහළ යාමටත් මෙම තත්ත්වය හේතු වී තිබුණි. දොර,ජනෙල් සඳහා වියළි සහ පදම් කළ දැව භාවිතා නොකිරීමත්, නුපුහුණු ශ්‍රමිකයින් යොදවා තනා නිමකිරීමත් නිසා බොහෝ දොර ජනෙල් සුමටව වැසීමට නොහැකි වන ලෙස ඇදවී තිබුණු අතර, දොර ජනෙල් වැසීමෙන් පසුව විශාල හිඩැස් දක්නට ලැබුණි. ඉදිකිරීම් කටයුතු සඳහා භාවිතා කළ ලී පංතිය පිළිබඳව තාක්ෂණ වාර්තාවකින් තහවුරුවක්ද ලබාදී නොතිබුණු අතර, නාන කාමරවල සහ ස්ථාන කිහිපයක බිම් ගඩොල් ඇතිරීම සුමටව සිදු නොකිරීම නිසා ජලය

දොර ජනෙල්වල හා ජලය කාන්දුවන ස්ථාන අඩුපාඩු සකස් කිරීමට උපදෙස් ලබා දී ඇති බව.

	කාන්දුවෙමින් පැවතුණි.				
05	සිවිල් ආරක්ෂක හටයින් 3,300 ක් විදුලි වැට (අලිවැට) නඩත්තු කිරීම සඳහා ද, හටයින් 845 ක් වනඅලි පලවාහැරීම සඳහා ද, හටයින් 389 ක් වනජීවී කාර්යාල කටයුතු සඳහාද ලෙස හටයින් 4,534 ක් අනුයුක්ත කර තිබුණි. ශ්‍රී ලංකාවේ මේ වන විට ඉදිකර ඇති මුළු අලිවැට ප්‍රමාණය කි.මී.4,756 ක් වන අතර, මෙයින් කි.මී. 4,725 ක් හෙවත් සියයට 99 ක් ම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට නඩත්තු කටයුතු සඳහා භාරදී ඇත. මේ සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු දෙක සම්බන්ධීකරණයවන ආකාරය හෝ අන්‍යෝන්‍ය සේවාවන් සපයන ආකාරය පිළිබඳවත් මුදල් වෙන්කරන ආකාරය පිළිබඳවත් පොදු එකඟතාවයක් ඇති කරගෙන නොතිබුණි. වනඅලින් පලවාහැරීම සඳහා වාර්ෂිකව රු. මිලියන 427 කට අධික වැටුප් හා දීමනා පිරිවැයක් දරා සිවිල් ආරක්ෂක හටයින් 845 දෙනෙකු යොදාවා ගෙන තිබුණු අතර, මෙම හටයින්ට ඒ සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබාදී නොතිබුණි. තවද, වනඅලින් පලවාහැරීම සඳහා යොදවාගැණුනු හට පිරිස්වල කටයුතු අධීක්ෂණය කිරීමට සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් හෝ වනජීවී	2021	යොදවා ඇති සමස්ත හට පිරිස් හා අලිමිනිස් ගැටුම පාලනය කර ගැනීම සඳහා සමස්ත රජයේ වියදම් සැලකිල්ලට ගත්විට අලි මිනිස් ගැටුමෙන් සිදුවන දේපල හා ජීවිත හානි පාලනයකර ගැනීම සඳහා කටයුතු කළයුතු වීම.	විදුලිවැට නඩත්තු කටයුතු ආශ්‍රිත අප දෙපාර්තමේන්තුව හා වනජීවී දෙපාර්තමේන්තුව අතර, සම්බන්ධීකරණය වන ආකාරය සම්බන්ධව මේ වනවිට ගිවිසුමක් සකස්කර ඇතත්, එම ගිවිසුම්ගතවීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුව වෙත සිහිකැඳවීම් දෙකක් මඟින් දැනුම් දී ඇති නමුත් මේවන තෙක් ඒ සඳහා දිනයක් ලබාදී නොමැති අතර, හටයින් සඳහා විධිමත් පුහුණුවක් ලබාදෙන ලෙසද අප විසින් ඉල්ලීම්කර ඇති බව හා වනඅලින් පළවාහැරීම සඳහා වනජීවී නිලධාරීන්ට සහයදීම පමණක් අප හටපිරිස් ඉටුකරනු ලබන අතර, වර්තමානයේ අලිමිනිස් මරණ අඩුවී ඇති බව වනජීවී දත්ත අනුව පෙනී යන බව.	වනජීවී දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය මත එම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වී හට පිරිස් ලබා දීම සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් සිදුකරන අතර එම කටයුතු සම්පූර්ණයෙන් අධීක්ෂණය කරනු ලබන්නේ වනජීවී දෙපාර්තමේන්තුව බව කාරුණිකව දන්වන ලදී. අලිවැට සඳහා 2021 වර්ෂයේ දී සිවිල් ආරක්ෂක හටයන් 4,534 දෙනෙකු අනුයුක්ත කර සිටි නමුත් වර්තමානයේ එම පිරිස 3,881 දක්වා අඩු වී තිබුණි. 2021 වර්ෂය වන විට කි.මී. 4,756 ලෙස තිබූ අලිවැට ප්‍රමාණය බහුකාර්ය සාමාජිකයන් යෙදවීම හේතුවෙන් වර්තමානය වන විට කි.මී. 2,111.05 ලෙස අඩුවී තිබුණි.

	දෙපාර්තමේන්තු නිලධාරීන් විධිමත්ව පත්කර නොතිබුණු අතර, වනඅලින් පලවා හැරීම සඳහා යථෝක්ත සෙබළුන්හට නිසිපරිදි අවශ්‍ය උපකරණ, ආයුධ සහ අලි වෙඩි ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි. 2010 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ශ්‍රී ලංකාවේ අලි වැටවල් ඉදිකිරීම සඳහා දරා ඇති මුළු ප්‍රාග්ධන වියදම රු. බිලියන1.64 ක් වන අතර, 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා අලිවැටවල් නඩත්තු කිරීම සඳහා නිලධාරීන්ගේ වැටුප් ඇතුළුව දරා ඇති මුළු වියදම රු. බිලියන 1.16 ක් වී තිබුණි. අදාළ කාලපරාසය තුළ අලිමිනිස් ගැටුම හේතුවෙන් මිනිසුන් 989 දෙනෙකුද, අලි ඇතුන් 3,646 දෙනෙකුද මියගොස් ඇති අතර, පෙර වර්ෂවලට සාපේක්ෂව ආසන්න වර්ෂවල සිදුවූ ජීවිතහානි වැඩි වී තිබුණත්, යොදවා ඇති සිවිල් ආරක්ෂක භටයින්ට මෙම තත්ත්වය පාලනය කරගැනීමට නොහැකි වී තිබුණි.				
06	දෙපාර්තමේන්තුව කාර්යාල පවත්වා ගැනීම, නිල නිවාස හා වාසස්ථාන පහසුකම් හා ගබඩා පහසුකම් සපයා ගැනීම වැනි ගොඩනැගිලි අවශ්‍යතා පිළිබඳව දිගුකාලීන සැලස්මක් අනුව කටයුතු නොකිරීම නිසා දිවයිනේ විවිධ ප්‍රදේශවල විවිධ ආයතන	2021	ගොඩනැගිලි අවශ්‍යතාවය හඳුනාගෙන දිගු කාලීන සැලැස්මක් මඟින් ගොඩනැගිලි අවශ්‍යතා සම්පූර්ණ කළයුතු විම.	මෙම ගොඩනැගිලිවල අවශ්‍යතාවයන් සමාලෝචනය කර ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව.	වර්තමානය වන විට දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිතව පැවතුණි. එහි තීරණයක් ලද පසු දිගුකාලීන ගොඩනැගිලි අවශ්‍යතා පිළිබඳව සැලැස්මක් අනුව ක්‍රියාකරන බව දන්වන ලදී.

	හා පුද්ගලයින්ට අයිති වර්ග අඩි 130,769 ක් හා වර්ග මීටර් 2,000 කට අදාළ ගොඩනැගිලි 128 ක් තාවකාලිකව පරිහරණය කිරීමට සිදුවී තිබුණි. ඇතැම් ගොඩනැගිලි පරිශ්‍ර දෙපාර්තමේන්තු වියදමින් නවීකරණ කටයුතුද සිදුකර තිබුණි.				
07	සේවා වනිතා සංගමය විසින් දෙපාර්තමේන්තුවේ සාමාජිකයින්ගේ දරුවන්ට අභ්‍යාස පොත් නිෂ්පාදනය කර බෙදාහැරීම සඳහා කන්තලේ බලකායේ භටයින් 239 දෙනෙකු යොදවාගෙන තිබුණු අතර, මේ වෙනුවෙන් අදාළ භටයින් සඳහා රු.මිලියන 45.1 ක වැටුප් පිරිවැයක් දරා තිබුණු ද, එම මුදල දෙපාර්තමේන්තුවට ප්‍රතිපූර්ණය කරවාගෙන නොතිබුණි.	2021	අදාල වැටුප් පිරිවැය දෙපාර්තමේන්තුව ට ප්‍රතිපූර්ණය කර ගැනිමට කටයුතු කළයුතු විම.	ඉදිරි වර්ෂයන් සඳහා අභ්‍යාස පොත් නිෂ්පාදනය කිරීම වෙනුවට විවෘත වෙළඳපලින් මිලදී ගැනීම කෙරෙහි අවධානය යොමුකර ඒ සඳහා කමිටුවක් පත්කර ඇති බව.	ත්‍රිකුණාමලය බලකායේ 2013 සිට 2019 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා එම කාල සීමාව තුල යොදවා සිටි භටයින් ඔවුන්ට පැවරී තිබූ රාජකාරීන්ට අමතරව මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා සිටි බවත් හිමි රාජකාරීයෙන් නිදහස් කර පූර්ණකාලීනව ව්‍යාපෘතියෙහි යොදවා නොමැති බව දන්වන ලදී. විගණන නිර්දේශයන්ට අනුව 2021 සිට ඉදිරියට එම ව්‍යාපෘතිය නවත්වා විවෘත වෙළඳ පොල වෙතින් අභ්‍යාස පොත් සේවා වනිතා ඒකකය මගින් මිලදී ගෙන සිවිල් ආරක්ෂක සාමාජික සාමාජිකාවන්ගේ දරුවන් සඳහා ලබාදිමට කටයුතු කර තිබුණි. මෙය දෙපාර්තමේන්තු සුභසාධන කටයුත්තක් බැවින් ව්‍යාපෘතියේ යොදවා සිටි අයවළුන්ගෙන් රුපියල් මිලියන 45.1 ක වැටුප් පිරිවැය පියවිම ක්‍රමවේදයක්0 නොමැති බව අමාත්‍යාංශ විගණන හා කළමනාකරන

					කමිටුව වෙත ද දන්වා තිබුණි.
08	2022 වර්ෂයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් දෙපාර්තමේන්තුවට ලද කාබනික පොහොර නිෂ්පාදනයට අදාළ යන්ත්‍ර 11 ක්, ලීටර් 5000 ජල ටැංකි 06 ක්, විවිධ කටයුතු සඳහා භාවිතා කරන තවත් යන්ත්‍ර 07 ක්, ඩිජිටල් තරාදියක් හා ග්‍රීස් පොම්පයක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුලත්කර නොතිබුණි.	2022	නිවැරදිව තක්සේරුකර ගිණුම්ගත කළ යුතු වීම.	පවරාගෙන අවසන් කර ඇති ඉඩම් කැබලි 31 හා එහි ඇති ගොඩනැගිලිවල වටිනාකම ගිණුම්ගත කිරීම සඳහා අවශ්‍ය තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත මේ වනවිට යොමුකර ඇති බව දන්වා ඇත.	කාබනික පොහොර නිෂ්පාදනය යන්ත්‍ර සහ අනෙකුත් යන්ත්‍ර සූත්‍ර වල වටිනාකම තක්සේරුකර 2024 මූල්‍ය ප්‍රකාශවල ශේෂපත්‍ර සටහනක් ලෙස ඉදිරිපත්කිරිමට කටයුතු කරන බව දන්වන ලදී.
09	මුදල් රෙගුලාසි 104(3) හා (4) ප්‍රකාරව මිහින්තලය බලකා මූලස්ථානයට අයත් කැබ් රථයකට 2021 දෙසැම්බර් 14 දින යාන්ත්‍රික වශයෙන් අලාභ හානියක් සිදු වී තිබුණි. එම අලාභහානිය අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 1.06 ක මුදලක් වැයවන බවට තක්සේරුකර ඇති අතර, එම හානිය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් දින 07 ක් ඇතුලත නිකුත් කිරීමට කටයුතුකර නොතිබුණු අතර, 2023 මාර්තු 31 දිනවන විටත් පරිපූර්ණ වාර්තාද ඉදිරිපත්කර නොතිබුණි.	2022	අදාළ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වීම.	ඉදිරියේදී මුදල් රෙගුලාසිවල නියමිත කාලරාමුව තුල වාර්තා ලබා ගැනීම සඳහා අභ්‍යන්තර ක්‍රියා මාර්ග ගෙන ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව මණ්ඩලයක් පත්කර ඇති අතර මණ්ඩල නිර්දේශ ප්‍රකාරව ක්‍රියාකර ඉදිරියේදී වාර්තා කිරීමට කටයුතු කරනු ලබයි.
10	කෘෂි සත්ත්ව හා වෙනත්, සංගීත හා නර්තන, ආරක්ෂක සේවා, ඉදිකිරීම් හා නඩත්තු සේවා යන ආදායම්වලින් දෙපාර්තමේන්තුව සෑම වර්ෂයකම ආදායම් රැස්කරන අතර,	2023	ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට පෙර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින්	ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට පෙර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයක් මඟින් සංශෝධනයක් සිදු කළ

	සමාලෝචිත වර්ෂයේදී ද එම ආදායම් ප්‍රභවයන්ගෙන් එකතුව රු. මිලියන 1,547.8 ක ආදායමක් රැස්කර තිබුණි. වාර්ෂිකව උපයනු ලබන මෙම ආදායම් ගිණුම් ගත කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විමසා වෙනම ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.			සංශෝධනයක් සිදුකළ යුතු බව දන්වා ඇත. නමුත් වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිත බැවින් හා ඒ සම්බන්ධව සැලසුම් සකස් කරන බැවින්, ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කිරීම ප්‍රායෝගික නොවන බව දන්වමි.	යුතු බව දන්වා තිබුණද, වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජිත බැවින් හා ඒ සම්බන්ධව සැලසුම් සකස් කරන බැවින්, ආදායම් ශීර්ෂයක් ලබා ගැනීමට කටයුතු කිරීම ප්‍රායෝගික නොවන බව දන්වන ලදී.
11	2022 ජුනි 12 දින රු.720,000 ක මුදලකට රතු කැකුළු සහල් කි.ග්‍රෑ. 4,500 ක් හා රු.480,000 ක මුදලකට සුදු කැකුළු සහල් කි.ග්‍රෑ. 3,000 ක් දියතලාව යුධ හමුදා පුහුණු පාසලට අළෙවි කිරීමෙන් උහන බලකාය වෙත ලැබිය යුතු රු. 1,200,000 ක මුදලක් ද, 2022 දෙසැම්බර්, 2023 ජනවාරි, පෙබරවාරි සහ මාර්තු යන මාසවලදී මහඔය බලකා සාමාජිකයන් වෙත සුදු බෝල සහල් කි.ග්‍රෑ. 12,014 ක් අළෙවි කිරීම වෙනුවෙන් සේවා වනිතා ඒකකය මගින් මහඔය බලකාය වෙත ලැබිය යුතු රු.1,063,047 ක මුදලක් සහ වැලිසර බලකාය, 2021, 2022, 2023 යන වර්ෂයන්වලදී වී, ධාන්‍ය හා අනෙකුත් බලකා නිෂ්පාදනයන් වෙනුවෙන් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු රු.62,758,801 ක මුදලක් ද ලැබිය යුතුව තිබූ අතර, එම ලැබිය යුතු මුළු මුදල වූ	2023	සියළුම ව්‍යාපෘති ආදායම් යාවත්කාලීනව නිවැරදිව ගිණුම්වල හඳුනාගැනීමට කටයුතු කළ යුතු වීම.	ඉදිරියේදී හිඟ ආදායම් නිසි ලෙස හඳුනාගෙන වාර්තා කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී ඇත. ඒ අනුව ලැබිය යුතු ආදායම් හා හිඟහිටි ආදායම් සම්බන්ධව ලේඛන යාවත්කාලීන කරමින් තොරතුරු පද්ධතියක් තබා ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇති බව දන්වමි.	බලකා වෙත නිරවුල් කල යුතු මුදල මීට වඩා අඩු බවත්, විගණනය නිරීක්ෂණය රතු සහ සුදු කැකුළු සහල් කිලෝ 01 සඳහා වී කිලෝ 1.72 හා සම්බා සහ නාඩු ස්ටීම් කිලෝ 01 සඳහා වී කිලෝ 1.67 වැය වීම අනුව අදාල කාලසීමාවේදී වී සඳහා කර ඇති ඇතැම් ශේෂ මේ වන විට පියවී ඇති බවත්, වැලිසර වෙතින් බලකා වෙත තවදුරටත් නිරවුල් කල යුතු මුදල රු.මිලියන 27 පමණ බවත් දන්වන ලදී. දෙපාර්තමේන්තු මණ්ඩලයක් මගින් දියතලාව යුධ හමුදා කඳවුර වෙත අලෙවිකරන ලද සහල් මුදල් ආපසු ලබාගැනීම සඳහා පරීක්ෂණයක් සිදුකර ඇති අතර එම මුදල් යුධ හමුදාව මගින් සිදු කරන පරීක්ෂණයෙන් අනතුරුව නිරවුල් කරගැනීමටත්, බලකා වෙතින් ලබාගත් සහල්

	රු.65,021,848 ක් ව්‍යාපෘති අංශය විසින් හඳුනාගෙන වාර්තා කර නොතිබීම හේතුවෙන් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුලත් කර නොතිබූ අතර, ඒ අනුව හිඟ ආදායම් ප්‍රමාණ එම ප්‍රමාණවලින් අඩුවෙන් දක්වා තිබුණි.				සඳහා අයවිය යුතු මුදල් සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය මගින් පරීක්ෂණයක් සිදුකරන අතර එම වාර්තාව සම්බන්ධව ආරක්ෂක ලේකම්ගේ උපදෙස් ලැබුණු පසු වගකිව යුතු අයගෙන් අයකිරීම් සිදුකිරීම කටයුතු කරන බවත් දන්වන ලදී.
12	2019, 2020 හා 2021 වර්ෂවල හිඟ හිටි ආදායමෙන් පිළිවෙලින් රු.122,000 ක්, රු. 274,000 ක් හා රු. 147,000 ක් ලෙස හිඟව තිබූ රු.543,000 ක් වූ ආදායම් විවිධ හේතුන්මත ආයතන මගින් අයකර ගත නොහැකි බව දක්වමින් හිඟ ආදායම් ශේෂ වලින් අඩු කර දක්වා තිබූ නමුත් එලෙස ආදායම් කපා හැරීම හෝ අත්හැර දැමීම මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව සිදු කර තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොවුණි.	2023	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ආදායම් කපා හරින්නේ නම් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	හිඟ ආදායම් ලෙස දක්වා ඇති අයකරගත නොහැකි ශේෂ මුදල් රෙගුලාසි 113 ප්‍රකාරව ආදායම් කපාහැරීම හෝ අත්හැර දැමීමට ක්‍රියාකිරීම සඳහා අවශ්‍ය උපදෙස් මේ වන විට ලබාදී ඇති බව කාරුණිකව දන්වමි.	පැමිණීමේ ලේඛන හා ගිවිසුම් නිසි අධ්‍යනයකින් තොරව ඉන්වොයිස්පත් නිකුත් කිරීම හිඟහිටි ආදායම ලෙස පෙන්වාදී ඇති අගයන් වලට හේතු වී තිබුණි. එය කාර්යාල ප්‍රමාද දෝෂයක් බැවින් මෙවා 2023 හිඟ ආදායම් තුල පෙන්වා නොතිබූ බවත්, එබැවින් මු.රෙ 113 අනුව මෙම වර්ෂයේදී ක්‍රියාකිරීමට හැකියාවක් නොමැති අතර මෙම අගයන් 2024 හිඟ ආදායම් ලෙස දක්වා එම වර්ෂයේදී මු.රෙ 113 අනුව කපාහැරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂාකිරීමට උපදෙස් ලබාදී ඇති බවත් දන්වන ලදී.
13	සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයිතිය පවරාගෙන තිබූ හෙක්ටයාර් 11 ක වපසරියකින් යුත් බිම් කැබලි 21 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කර නොතිබුණි.	2023	තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම් ගත කළ යුතුවීම.	පෙන්වාදී ඇති වත්කම් ඉඩම් වටිනාකම් නොවන අතර, අදාළ පරිශ්‍රයේ පවතින ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් බව පෙන්වා දෙමි. එම වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කිරීම සඳහා ඉදිරිපත් කරන විට	2024 වර්ෂයේදී ගිණුම් ගත කරන බව දන්වන ලදී.

				2023 වර්ෂය සඳහා වන ගිණුම් කටයුතු අවසන් කර තිබූ අතර 2024 වර්ෂයේ අවසන් ගිණුම් තුල නිරූපණය කිරීම සඳහා සටහන් කර ගතිමි.	
14	ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ උපලේඛන තුළ ඇතුළත්ව තිබූ තක්සේරු වටිනාකම රු.134,124,000 ක් වටිනා වාහන 58 ක් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් ACA 6 ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබූ අතර, ඒ අනුව එම ප්‍රමාණයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.	2023	සියළු වාහන වටිනාකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම.	මෙම විගණන නිරීක්ෂණය මගින් ඉදිරිපත් කර ඇති වාහන 58 ක් අතුරින්, වාහන 43 සම්බන්ධව ගිණුම්ගත කිරීම 2024 දෙවන කාර්තුව අවසන් වීමට පෙර සිදුකිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. අනෙකුත් වාහන සම්බන්ධවද පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනිමට උපදෙස් ලබාදි ඇත.	වාහන 43 ක් සම්බන්ධව ගිණුම් ගත කිරීමට මේ වනවිට කටයුතු කර ඇති අතර, අනෙකුත් වාහන සම්බන්ධව ද පරීක්‍ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී තිබුණි.
15	විගණනයට ඉදිරිපත් කල තොරතුරු අනුව දෙපාර්තමේන්තුව සතුව පාපැදි 341 ක් පැවති බව දක්වා තිබූ නමුත් එම පාපැදි වටිනාකම් ගිණුම් තුළ ඇතුළත් වී නොතිබුණි.	2023	පාපැදි වටිනාකම් නිවැරදිව ගිණුම් වල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුවීම.	මණ්ඩලයක් මගින් දෙපාර්තමේන්තුවේ පාපැදි තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.	ගිණුම් ගත කර නොතිබුණි.
16	2022 වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු. 2,314,614,772 ක් වූ අතර 2023 වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ වටිනාකම රු.1,761,457,769 ක් විය. ඒ අනුව රු. 553,157,003 කින් එම වටිනාකම අඩු වී තිබුණු අතර, එම වෙනසට හේතුව විගණනයට අනාවරණය නොවුණි.	2023	සියළුම දේපළ, පිරියත හා උපකරණ වලට අදාළ නිවැරදි වටිනාකම් ගිණුම් තුළ ඇතුළත් කළ යුතු වීම.	පරිගණක පද්ධතිය තුල සදොස් ලෙස ඇතුලත් කර යන්ත්‍ර හා උපකරණ වත්කම් පරිගණක පද්ධතියෙන් ඉවත්කර, භෞතික ශේෂ නැවත සත්‍යාපනය කරන ලදී. නමුත් එසේ නැවත සත්‍යාපනය කරන ලද භෞතික ශේෂ සියල්ලම පරිගණක පද්ධතියට කාලපරිච්ඡේදය තුල	මේ වන විට පරිගණක පද්ධතියට ඇතුලත් කර ඇති ශේෂ ප්‍රතිශතය සියයට 62 ක් බව හා නිවැරදි කරන ලද ඉතිරි ශේෂ කඩිනමින් පරිගණක පද්දතියට ඇතුළත් කරන බව දන්වන ලදී.

				ඇතුලත් කිරීමට නොහැකි විය. මෙම නිරීක්ෂණයට හේතු වී ඇත්තේ එම පරස්පරතාව බව කාරුණිකව දන්වමි. නිවැරදි කරන ලද ඉතිරි ශේෂ කඩිනමින් පරිගණක පද්ධතියට ඇතුලත් කරන බව කාරුණිකව වැඩිදුරටත් දන්වමි.	
17	**ණය සහ අත්තිකාරම් ලේඛනය** 2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව ණය හා අත්තිකාරම් ලේඛනය පිළියෙල කර නොතිබුණු අතර පරිගණක පැතුරුම්පතක් ආධාරයෙන් ණය ශේෂ හා අයකිරීම් සටහන්කර තිබුණි.	2023	2017 ජූලි 05 දිනැති අංක 256/2017 දරන රජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ යුතුය.	දෙපාර්තමේන්තුවේ CC10 ණය ලේඛණ හා අත්තිකාරම් ලේඛන හස්ත ක්‍රමයට (Manual) පවත්වාගෙන නොයන අතර, පරිගණක පැතුරුම්පත් ආධාරයෙන් ණය ශේෂ හා අය කිරීම් සටහන් කරගෙන යනු ලබයි. එයට හේතු වී ඇත්තේ 32,000 ආසන්න හට පිරිසක් සේවයේ යෙදීම බව දන්වා සිටිමි. ඉදිරියේදී CC10 ණය ලේඛණ, පී ලෙජර් ඇතුලත් පරිගණක මෘදුකාංගයක් ලබාගැනීමට සැලසුම් කර ඇත.	සී.සී.10 ආකෘතිය හා ඒ ආකෘතිය පදනම් කරගෙන ණය හා අත්තිකාරම් ලේඛන පිළියෙල කළ කර නොතිබුණි.
18	මූල්‍ය ප්‍රකාශනයන්හි හිඟ ආදායම් පිළිබඳ වාර්තාව අනුව ආරක්ෂක සේවා හා ව්‍යාපෘති මඟින් සේවා ලබාදීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන්වන විට රු.133,700,136 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට පැවතුණි. ඉන්	2023	හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වීම.	නඩු ගොනු කිරීම, ආයතන සමඟ සාකච්ඡා කිරීම වැනි ක්‍රියාමාර්ග නිරවුල් වීමට පවතින හිඟ ශේෂයන් සම්බන්ධව වර්තමානය වන විට පියවර ගෙන ඇත.	CML - MTD Construction Ltd වෙතින් අයවිය යුතු 8,844,478.13 මුදල සම්බන්ධව මූල්‍ය අපරාධ විමර්ශණ අංශයේ පැමිණිල්ලක් ගොණුකර තිබුණි. අයකර ගත හැකි ආදායම් සියල්ල මේ

	ආරක්ෂක සේවා වෙනුවෙන් රු. 11,143,453 ක් ලැබීමට පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම ආදායම් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්ව වර්ෂ 01 ත් 06 ත් අතර, කාලයක් ගත වී තිබුණි.				වන විට අයකර ගෙන තිබුණි. ඉතිරි ආදායම් අයකර ගැනීම සම්බන්ධව මණ්ඩල පත්කර ඇති බව දන්වන ලදී.
19	මුදල් රෙගුලාසි 103 සිට මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පොලොන්නරුව බලකායේ 2023 වර්ෂයේ NLDB කෘෂි ව්‍යාපෘතියේ වී සහ බඩ ඉරිඟු වගාව විනාශ වීම, පොලොන්නරුව බලකාය යටතේ ඇති මාර්න්කේනි කජු ව්‍යාපෘතියේ කජු වගාව සඳහා යොදා ගනු ලබන මොස්පිලාන් කෘමි නාශක ග්‍රෑම් 100 පැකට් 2,603 ක් 2023 ජූලි වන විට කල් ඉකුත් වී තිබීම, පොලොන්නරුව බලකායේ නාඩු වී තොග කි.ග්‍රෑම් 20,019 ක ඌණතාවයක් පෙන්නුම් කිරීම සහ අම්පාර බලකාය යටතේ ඇති ලාහුගල කරංකෝව 2022/2023 මහ කන්නයේ වී වගාව විනාශ වීම යන හානි හඳුනාගෙන ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඒවා ලේඛනවල සටහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	මෙම විගණන නිරීක්ෂණය සම්බන්ධ මුදල් රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකිරීමට ව්‍යාපෘති හා සිවිල් පාලන අංශවලට උපදෙස් ලබාදී ඇත. මේ වන විට නිරීක්ශිත සිදුවීම් සම්බන්ධව පරීක්ෂණ පැවැත්වෙන බවද දන්වමි.	දෙපාර්තමේන්තුව වෙතින් පත්කරන ලද අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර තිබූ අතර, එම වාර්ථාව ලැබුණු විගස ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියාකරනු ලබන බව දන්වන ලදී.
20	2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව විසින් මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් පිළිවෙලින් 56 දෙනෙකුට හා 37	2023	වැටුප් ගෙවීම් සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු වීම හා	මියගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අවසන් මස වැටුප මෙසේ බැංකු ගතවී ඇති අතර, එම මුදල් ඔවුන්ගේ විශ්‍රාම/	සේවය අතහැරගිය 85 දෙනෙකුගෙන් 2024 සැප්තැම්බර් 30 දිනට අයකරගෙන ඇති මුදල 633,451 කි. අයකර ගැනීමට ඉතිරි මුදල

	දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ වැටුප් රු.1,107,463 ක් හා එම කාලය තුළදී සේවය හැර ගිය නිලධාරීන් 85 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ රු.1,914,647 ක් වූ වැටුප් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.		වැඩිපුර ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මරණ පාරිතෝෂික මුදලින් අයකර ඉදිරියේදී මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබීමට නියමිතව ඇත. ඒ අනුව එම මුදල ක්‍රමයෙන් අයවන බව කාරුණිකව දන්වමි.	1,281,196 කි. විශ්‍රාම/මියගිය 93 දෙනෙකුගෙන් 2024 සැප්තැම්බර් 30 දිනට අයකරගෙන ඇති මුදල 356,256.75 කි. අයකර ගැනීමට ඉතිරි මුදල 751,206 කි. අයකර ගැනීමට ඇති ඉතිරි මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව දන්වන ලදී.
21	මුලස්ථානයට අයත් ජීප් රථයකට 2022 සැප්තැම්බර් 17 දින හුන්නස්ගිරිය ප්‍රදේශයේදී එන්ජින් පද්ධතියට සිදු වූ හානියෙන් රු.323,000 ක අලාභයක් සිදුව තිබූ අතර, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම අලාභය අදාළ පාර්ශවයන්ගෙන් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	අලාභය අදාළ පාර්ශවයන්ගෙන් පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම.	නැවත මූලික විමර්ශනයක් කිරීමට උපදෙස් ලබා දී ඇති බැවින්, සිදු කර ඇති විමර්ශන වාර්තාව විමර්ශන අංශය වෙත යොමු කර ඇත.	අලාභය සම්බන්ධව මේ වන තෙක් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
22	වැලිසර උප බලකාය මඟින් පවත්වාගෙන යනු ලබන විශේෂ සහල් ව්‍යාපෘතියෙන් 2021, 2022 හා 2023 යන වර්ෂයන්ට අදාළව බලකා 07 කින් ලබාගත් වී, ධාන්‍ය වර්ග හා අනෙකුත් බලකා නිෂ්පාදනයන්ට අදාළව රු.62,758,801 ක මුදලක් ශ්‍රී ලංකා රජයට පියවිය යුතු වුවත්, 2024 පෙබරවාරි 13 දින වන විටත් එම මුදල් පියවා නොතිබූ අතර එම වටිනාකම් පියවීමට ප්‍රමාණවත් මුදල් හෝ සහල් තොගද, වැලිසර සහල් ව්‍යාපෘතිය සතුව නොතිබුණි.	2023	කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	අමාත්‍යාංශ මට්ටමින් මණ්ඩලයක් පත් කර විමර්ශනයක් සිදු කරමින් පවතී.	බලකා වෙත නිරවුල් කල යුතු මුදල මීට වඩා අඩු බවත්, විගණනය නිරීක්ෂණය රතු සහ සුදු කැකුළු සහල් කිලෝ 01 සඳහා වී කිලෝ 1.72 හා සම්බා සහ නාඩු ස්ටීම් කිලෝ 01 සඳහා වී කිලෝ 1.67 වැය වීම අනුව අදාල කාලසීමාවේදී වී සඳහා බලකා වෙත නිරවුල් කල යුතු මුදල මීට වඩා අඩු බවත්, විගණනය නිරීක්ෂණය කර ඇති ඇතැම් ශේෂ මේ වන විට පියවී ඇති බවත් සඳහන් කර තිබුණි. වැලිසර සහල් ව්‍යාපෘතියෙන් තවදුරටත් අයකර ගත මුදල රු.මිලියන 27 පමණ බව සහ තවද

					මෙම මුදල් නිරවුල් නොවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පත්කල පරීක්ෂණයක් මේ වන විට පැවැත්වෙන අතර, පරීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ගයන් දැනුම් දීමට කටයුතු කරන බව ද දන්වන ලදී.
23	**මාර්න්කේනි කජු ව්‍යාපෘතිය**				
(අ)	පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කජු ව්‍යාපෘතිය අක්කර 187 කින් සමන්විත වන අතර ඉන් අක්කර 155 ක භූමි ප්‍රදේශයක් තුල කජු ගස් සිටුවා ඇති බව සඳහන් වුවද, එම භූමි ප්‍රදේශය නිවැරදි ලෙස මැන සිතියම් ගත කර නොතිබූ බැවින් වගා කර ඇති භූමි ප්‍රමාණයෙහි ආදායම් වියදම් ගණනය කිරීමේ නිරවද්‍යතාව තහවුරු නොවිය.	2023	භූමි ප්‍රමාණය නිශ්චිතව හඳුනා ගත යුතු වීම හා ආදායම් වියදම් යාවත්කාලීනව හා නිවැරදිව හඳුනා ගත යුතු වීම.	කජු සංස්ථාව සතු මෙම කජු ව්‍යාපෘතියේ ඇති ඉඩම් කොටස අක්කර 187ක් බව සඳහන්ව ඇතත් එය මිණුම් කර නොමැත. එම නිසා ඉඩම් කොටස මිනුම් කටයුතු කර ස්ථිර වැටක් ඉදිකිරීම සඳහා කජු සංස්ථාව වෙත දැන්වීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	පොලොන්නරු බලකා මූලස්ථානය යටතේ ඇති මාර්න්කේනි කජු ව්‍යාපෘති භූමිය නිසි පරිදි මිනුම් කටයුතු සිදුකර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමින් පැවතුණි.
(ආ)	පොලොන්නරුව බලකායට අයත් මාර්න්කේනි කජු ව්‍යාපෘතියේ කජු ගස් 8,787 ක් ඇති බව සඳහන් වුවද, වර්තමානය වන විට එහි පවතින්නේ කජු ගස් 3,682 ක් වීම හේතුවෙන් කජු ගස් 5,105 ක ඌණතාවයක් වූ අතර එම ඌණතාවය සම්බන්ධයෙන් මු.රෙ.103, 104, 110 ප්‍රකාරව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	කජු ගස්/ පැල නිවැරදිව ගණනය කිරීමක් ව්‍යාපෘතිය ආරම්භයේ සිදුකර නොමැති වීම හේතුවෙන් මූලික අවස්ථාවේ දී මෙම ව්‍යාපෘතිය තුල කජු ගස් 8,787 ක ප්‍රමාණයක් ඇති බවට සඳහන් වී ඇත. නමුත් මෙහි සත්‍ය වශයෙන් පවතින්නේ කජු පැල 3,682 ක් බව දන්වමි. ඒ අනුව එම කජු ගස් ප්‍රමාණයට අදාල ජීව	මේ සම්බන්ධව භෞතික සත්‍යාපනයක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස පොලොන්නරු බලකා අණදෙන නිලධාරි වෙත උපදෙස් ලබා දී තිබූ අතර එය ලද පසු මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් පවතීනම් ඒ අනුව කටයුතු කරන බව දන්වන ලදී.

				දත්ත රෙජිස්ටරයක් පවත්වාගෙන යාමට මේ වන විට උපදෙස් ලබා දී ඇත.	
(ඇ)	කපු වගාව සඳහා භාවිතා කරන මොස්පිලාන් ඇසිටමිප්‍රිඩ් නම් කෘමිනාශක ග්‍රෑම් 100 පැකට් 2,930 ක් 2022 හා 2023 වර්ෂවලදී මිල දී ගෙන තාවකාලික ගබඩාවේ අනාරක්ෂිතව ගබඩා කර තිබූ අතර එම පැකට් සියල්ල 2023 ජූලි වන විට කල් ඉකුත් වීම හේතුවෙන් රජයට සිදු වී තිබූ අලාභය රු.3,123,600 කට ආසන්න විය.	2023	අවශ්‍යතාවය සඳහා පමණක් මිලදී ගැනීමට කටයුතු කිරීම සහ මිලදී ගන්නා කෘමි නාශක නිසි කලට වගාවන්ට යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම.	මෙම මිල දී ගැනීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකරන බව දන්වා සිටිමි. මෙම කපු වගාවේ හෝ කොණ්ඩච්චි කපු වගාවේ අවශ්‍යතා සඳහා යොදා ගැනීමට උපදෙස් ලබා දී ඇත. කෙසේ නමුත් මේ පිළිබඳව පරීක්ෂණයක් ක්‍රියාත්මකවන බව කාරුණිකව දන්වමි. මෙවැනි නිරීක්ෂණ නැවත ඇති නොවීමට සඳහා විශේෂයෙන් කපු වගාවට යොදන රසායන ද්‍රව්‍ය සම්බන්ධ අවශ්‍යතාවය, මිලදී ගැනීම්, යෙදවීම්, තොග පාලනය යනාදිය සම්බන්ධ පවතින ක්‍රමවේද සම්පූර්ණයෙන් වෙන් වෙන්ව සමාලෝචනය කර අවශ්‍ය අභ්‍යන්තර පාලනයන් යෙදීමට මේ වන විට පියවර ගෙන ඇත.	දෙපාර්තමේන්තුව වෙතින් පත්කරන ලද අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර තිබූ අතර, එම වාර්ථාව ලැබුණු විගස ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියාකරනු ලබන බව දන්වන ලදී.
(ඈ)	පොලොන්නරුව බලකායේ තොග පොතෙන් මාර්න්කේනි උපබලකායට මොස්පිලාන් ඇසිටමිප්‍රිඩ් කෘමිනාශක ද්‍රව්‍ය පැකට් 1,980 ක් නිකුත් කර තිබූ නමුත් එය මාර්න්කේනි උපබලකායේ තොග	2023	උප බලකා තොග පොත් අතර වෙනසකම් ඇති නොවන ලෙසට නිසි කළමනාකරණය ක් ඇති කළ යුතු වීම.	මේ පිළිබඳ පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස වර්තමාන අණදෙන නිලධාරී වෙත දැනුම් දී ඇති අතර, එම වාර්තාව ලැබුණු පසු ඉදිරිකටයුතු සිදුකරන බව කාරුණිකව	දෙපාර්තමේන්තුව වෙතින් පත්කරන ලද අභ්‍යන්තර පරීක්ෂණ මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදුකර තිබූ අතර, එම වාර්ථාව ලැබුණු විගස ආරක්ෂක අමාත්‍යාංශය

	පොත්වල සඳහන් වී තිබුණේ පැකට් 1,916 ක් වීම හේතුවෙන් පැකට් 64 ක ප්‍රමාණයක ඌනතාවක් පැවති අතර, එහි වටිනාකම රු.76,800 ක් විය.			දන්වා සිටිමි.	වෙත ඉදිරිපත් කිරීමට ක්‍රියාකරනු ලබන බව දන්වන ලදී.
24	**NLDB කෘෂි ව්‍යාපෘතිය**				
(අ)	පොලොන්නරු බලකායට අයත් ජාතික පශු සම්පත් මණ්ඩලය සතු අක්කර 90 ක් වූ ගල්ලැල්ල ප්‍රදේශයේ පිහිටි භූමියෙහි සිදු කරන ලද කෘෂි ව්‍යාපෘතිය සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිඛිත අනුමැතියකින් තොරව ආරම්භකර තිබුණි.	2023	ව්‍යාපෘතීන් සඳහා ලිඛිත අනුමැතියක් ලබා ගත යුතු වීම.	මෙම නිරීක්ෂණ ද ඇතුලුව පොලොන්නරුව බලකායේ කටයුතු සම්බන්ධව විමර්ෂණයක් සිදුකර, ඉන් අනතුරුව අභ්‍යන්තර මූලික පරීක්ෂණ මණ්ඩලයක්ද පත්කර පරීක්ෂාවක් සිදුකර ඇත. රේඛීය අමාත්‍යාංශය වෙත වාර්තා කර ඉදිරි පියවර ගැනීම සිදුකරන බව දන්වා සිටිමි.	පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. මේ වන තෙක් වාර්තා ලබා දී නොතිබුණි.
(ආ)	මෙම ඉඩම පොලොන්නරුව බලකාය විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය වෙත නැවත භාර දී තිබූ අතර ඒ වන විට එහි වී සහ බඩ ඉරිඟු වගාව සඳහා රු.1,395,060 ක වියදමක් දරා රු.324,100 ක පමණ ආදායමක් ලබා තිබූ අතර ඒ හේතුවෙන් රු.1,070,960 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි.	2023	අලාභ ඇති නොවන පරිදි වගා ව්‍යාපෘතීන් සිදු කළ යුතු වීම.	මෙම නිරීක්ෂණ ද ඇතුලුව පොලොන්නරුව බලකායේ කටයුතු සම්බන්ධව විමර්ෂණයක් සිදුකර, ඉන් අනතුරුව අභ්‍යන්තර මූලික පරීක්ෂණ මණ්ඩලයක්ද පත්කර පරීක්ෂාවක් සිදුකර ඇත. රේඛීය අමාත්‍යාංශය වෙත වාර්තා කර ඉදිරි පියවර ගැනීම සිදුකරන බව දන්වා සිටිමි.	පරීක්ෂණ මණ්ඩලයක් පත් කර තිබුණි. මේ වන තෙක් වාර්තා ලබා දී නොතිබුණි.
25	**ලාහුගල කරංකෝව වී වගා ව්‍යාපෘතිය**				
(අ)	අක්කර 70 ක වී වගා	2023	ප්‍රායෝගිකව ලබා	මෙම ප්‍රදේශයට	පරීක්ෂණ කටයුතු

	ව්‍යාපෘතියෙන් වී කිලෝග්‍රෑම් 105,000 ක අස්වැන්නක් හා ඉන් රු.12,600,000 ක ආදායමක් ලබාගත හැකි බවට තොරතුරු ඉදිරිපත් කර සැලසුම අනුමත කරවාගෙන තිබුණද, සත්‍ය ලෙස ලද අස්වැන්න කිලෝග්‍රෑම් 24,500 ක් හා ඉන් ලද ආදායම රු. 1,849,750 ක් වූ අතර ළඟා විය නොහැකි ඉලක්ක ව්‍යාපෘති වාර්තාවලට ඇතුලත් කර ඇති බව නිරීක්ෂණය විය.		කරගත හැකි අස්වැන්න පදනම් කරගත් ව්‍යාපෘති වාර්තා සැකසිය යුතු වීම.	පැවති අධික නියන් සහිත කාලගුණ තත්ත්වය හේතුවෙන් වගාභූමිය ආසන්නයෙන් ගලා බසිනා හැඩ ඔයද වියළි තත්වයට පත්වී ඇත. ඒ අනුව ව්‍යාපෘතියට අවශ්‍ය ජලය ලබාගත නොහැකි වී ඇත. ව්‍යාපෘති යෝජනාවේ සැකසීමේදී දෙපාර්තමේන්තු මූලස්ථානය මඟින් ලබා දී ඇති චක්‍රලේඛණ හා උපදෙස් වලට අනුකූලව අක්කරයකින් ලබා ගත හැකි අස්වනු ප්‍රමාණය කි.ග්‍රෑම් 1500 ක් ලෙස ගණනය කර ඇති අතර ප්‍රදේශයේ පැවති වී මිල ගණන් වලට සාපේක්ෂව මිල රු.120 ක් ලෙස ගෙන ආදායම ගණනය කර ඇත. කෙසේ වෙතත් මෙම වගා ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවභාවිතාවක් හෝ අක්‍රමිකතාවයක් ඇතිද යන්න සොයා බැලීම සඳහා මා විසින් මණ්ඩලයක් ද පත්කර ඇති බවත්, එහි වාර්තාව අනුව ඉදිරිකටයුතු සිදුකරන බවත්, වැඩිදුරටත් දන්වා සිටිමි.	සිදුකර තිබූ අතර, එහි වාර්ථාව මේ වන විට ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර තිබුණි.
(ආ)	වී වගා ව්‍යපෘති සැලසුම අනුව භටයින් 64 දෙනෙකු යෙදවීමට සැලසුම්කර තිබුණද සත්‍ය ලෙස ව්‍යාපෘති කටයුතු	2023	අලාභ ඇති නොවන අයුරින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට	ව්‍යාපෘති යෝජනාවේ ව්‍යාපෘතිය සඳහා භටයින් 64 දෙනෙකු යෝජනා කර තිබුනද, අවශ්‍යතාවය	පරීක්ෂණ කටයුතු සිදුකර තිබූ අතර, එහි වාර්ථාව මේ වන විට ආරක්ෂක අමාත්‍යාංශය

	සඳහා හටයින් 74 දෙනෙකු යොදවා තිබූ හෙයින් විධිමත් අනුමැතියකින් තොරව වැඩිපුර හටයින් දස දෙනෙකු යොදවා තිබුණි. තවද, ව්‍යාපෘතිය සඳහා රු.21,528,146 ක වියදමක් සමාලෝචිත වර්ෂයේ දී දරා ඇති අතර මෙම ව්‍යාපෘතියෙන් ලද ආදායම රු.1,849,750 ක මුදලක් බැවින් රජයට සිදු වූ පාඩුව රු.19,678,396 ක් විය.		කළමනාකරණය කටයුතු කළ යුතු වීම.	මත අක්කර 01 ක් සඳහා එක් හටයකු වන ලෙස හටයින් 70 ක් හා අධීක්‍ෂණ නිලධාරීන් 04 ක් වශයෙන් 74 දෙනෙකු යොදවා ඇත. විශේෂ රාජකාරි පිටව ගොස් නැවත කාර්යාලයේ අතිරික්ත සිටි හට පිරිස අතිරේක වශයෙන් මේ සඳහා යොදවා ඇත.	වෙත යොමු කර තිබුණි.
26	ගිණුම් අංශය විසින් රු. 69,310,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 6 ක පිහිටා ඇති අක්කර 176 රූඩ් 3 පර්චස් 39.5 ක් ගිණුම් තුල පැවති නමුත් දෙපාර්තමේන්තුව සතුව එවන් ඉඩම් කැබලි 6 ක් නොමැති බව පාලන අංශය ලබා දුන් තොරතුරු අනුව නිරීක්ෂණය විය.	2023	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් ඉඩම් හා ගොඩනැගිලි සත්‍යාපනය නොවන බැවින් ඔබගේ නිරීක්ෂණ කෙරෙහි විශේෂ අවධානයක් යොමුකර ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයිමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.	නිරවුල් කිරීම සඳහාත් කමිටුවක් පත්කර තිබූ අතර කමිටු වාර්තාව ලැබුණු පසු ප්‍රගතිය දන්වන බව සඳහන් කරන ලදී.
27	ගිණුම් අංශය විසින් රු. 198,846,000 කට ගිණුම් ගත කර තිබූ ප්‍රදේශ 4 ක	2023	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර	සොයාබලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකිරීමට, මෙම	නිරවුල් කිරීම සඳහාත් කමිටුවක් පත්කර තිබූ අතර කමිටු වාර්තාව

	පිහිටා තිබූ ඉඩම් කැබලි 4 ක් අක්කර 121 රූඩ් 2 පර්චස් 33.12 ක් ලෙස දක්වා තිබූ නමුත් පාලන අංශය විසින් ලබා දී තොරතුරු අනුව එම ඉඩම් කැබලි වල මුළු භූමි ප්‍රමාණය අක්කර 33 රූඩ් 2 පර්චස් 35.48 ක් වූ අතර ඒ අනුව අක්කර 88 කින් පමණ භූමි ප්‍රමාණයේ වෙනසක් නිරීක්ෂණය විය.		පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයිමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරිම් සිදුකිරිමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.	ලැබුණු පසු ප්‍රගතිය දන්වන බව සඳහන් කරන ලදී.
28	හෙක්ටයාර් 2.17 ක සේරුපිට බලකා ඉඩම හා සමෘද්ධි මාවත, පරණ මැදවච්චිය, ඇලපාත නමින් අක්කර 4 ක ඉඩමක් ගිණුම් අංශය විසින් රු.13,400,000 හා රු.1,500,000 කට ගිණුම් ගත කර තබූ නමුත් මෙම ඉඩම් සඳහා තක්සේරු වටිනාකමක් පාලන අංශය ලබාදී නොතිබුණි.	2023	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	සොයාබලා අවශ්‍ය නිවැරදි කිරිම් සිදුකිරිමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයිමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරිම් සිදුකිරිමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.	නිරවුල් කිරීම සඳහාත් කමිටුවක් පත්කර තිබූ අතර කමිටු වාර්තාව ලැබුණු පසු ප්‍රගතිය දන්වන බව සඳහන් කරන ලදී.
29	ගිණුම් අංශය විසින් පලුගස්වංගුව, සිරිපුර නමින් රූඩ් 1 පර්චස් 28.4 ක ඉඩමක් රු.513,000 කට ගිණුම්ගත කර තිබූ නමුත් පාලන අංශයේ ලබාදුන් තොරතුරු අනුව ශ්‍රී පුර උප බලකායේ භූමි	2023	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	සොයාබලා අවශ්‍ය නිවැරදි කිරිම් සිදුකිරිමට, මෙම වත්කම් පොදු 287 ආකෘතියට අනුව හරි වැරදි බැලීම කල යුතු අතර ඒ සඳහා මණ්ඩලයක් පත්කර	නිරවුල් කිරීම සඳහාත් කමිටුවක් පත්කර තිබූ අතර කමිටු වාර්තාව ලැබුණු පසු ප්‍රගතිය දන්වන බව සඳහන් කරන ලදී.

	ප්‍රමාණය දක්වා නොතිබුණි.			අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. ඉහත මණ්ඩලය මගින් ක්‍රියාකර වාර්තාවක් කඩිනමින් සැපයිමටත්, ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරිම් සිදුකිරිමටත් කටයුතු කරන බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.	
30	දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට දිවයිනේ විවිධ ප්‍රදේශවල පරිහරණය කරමින් පැවතුණු බිම් කැබලි 554 කින් 2023 දෙසැම්බර් 31 දින වන විටත් බිම් කැබලි 30 කට අදාළ හෙක්ටයාර් 21.086 ක ඉඩම් ප්‍රමාණයක් පමණක් පවරා ගැනීමට කටයුතු කර තිබූ අතර, ඉතිරි බිම් කැබලි 524 ක ප්‍රමාණය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පවරා ගැනීම් කටයුතු අවසන්කර නොතිබුණි.	2023	නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	මේවන විට නිරීක්ෂිත ඉඩම් පවරා ගැනීමට දෙපාර්තමේන්තුව ක්‍රියාකරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.	නිරවුල් කිරීම සඳහාත් කමිටුවක් පත්කර ඇති අතර කමිටු වාර්තාව ලැබුණු පසු ප්‍රගතිය දන්වනු ඇත.
31	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ACA 6 ප්‍රකාශයේ රු. 740,456,671 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුළ වාහන 579 ක් ඇතුළත් වූ නමුත් ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ වාහන ලැයිස්තුව තුළ වාහන 502 ක් පමණක් ඇතුළත් වී තිබුණි.	2023	ගිණුම් අංශය හා පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදි ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
32	මූල්‍ය ප්‍රකාශන තුළ	2023	ගිණුම් අංශය හා	විගණන නිරීක්ෂණය	වාහන පවරාගැනීම

	ඇතුළත් කර තිබූ රු. 100,345,435 ක් වටිනා වාහන 135 ක් ප්‍රවාහන අංශයෙන් ලබා දී තිබූ උපලේඛන තුල ඇතුළත් කර නොතිබූ අතර, එම වාහන සම්බන්ධයෙන් තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.		පාලන අංශයේ තොරතුරු අතර පරස්පරතා ඇති නොවන සේ කටයුතු කළ යුතු වීම.	මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
33	ප්‍රවාහන අංශය සහ ගිණුම් අංශය යන අංශයන් දෙකෙහිම පැවති වාහන 444 ක් අතුරින් රු.140,135,000 ක් වටිනා වාහන 82 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි.	2023	වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
34	ACA 6 තුල ගිණුම්ගත වී නොමැති ප්‍රවාහන අංශය තුල තොරතුරු ඇතුලත් වාහන 58 කින් වාහන 38 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ වාහන 108 ක් පිළිබඳ තොරතුරු ප්‍රවාහන අංශය සතුව නොවීය.	2023	වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම හා දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තුව සතුව පැවතිය යුතු වීම.	විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි.	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
35	ප්‍රවාහන අංශය තුල විස්තර ඇතුලත් නොවූ ACA 6 තුල ඇතුලත් වූ	2023	වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු	විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින්

	වාහන 135 කින් වාහන 78 ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොතිබුණි. තවද, දෙපාර්තමේන්තුවට අයත් වාහන පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වාහන උපලේඛනයේ ඇතුලත් වාහන 71 ක් ACA 6 තුල ද ඇතුලත් වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි දේපළ, පිරියත හා උපකරණ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.		වීම හා ගිණුම් තුළ දෙපාර්තමේන්තුව සතු වාහන සියල්ල ඇතුළත් කළ යුතු වීම.	ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි.	නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
36	මේ අනුව ප්‍රවාහන අංශය හා ගිණුම් අංශය නඩත්තු කරන ලේඛන දෙක තුලම ඇතුලත් නොවූ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වාහන 128 ක් පැවතුණු අතර, මින් වාහන 108 ක් (ප්‍රවාහන අංශයේ විස්තර නොමැති) දෙපාර්තමේන්තුව තුල පවතින බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අයිතිය පවරා නොගත් තක්සේරු වටිනාකම රු.43,410,000 ක් වූ වාහන 40 ක් පවතින බව දක්වා තිබූ නමුත් ඉන් එක් වාහනයක් වූ GA-4428 දරන වාහනය මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, සිවිල් ආරක්ෂක	2023	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වාහන සියල්ල දෙපාර්තමේන්තුව සතු විය යුතු වීම.	විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇත. ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරික්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි.	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.

	දෙපාර්තමේන්තුව නමින් ලියා පදිංචි වී තිබුණි.				
37	දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අයිතිය පවරා නොගත් තක්සේරු වටිනාකම රු.43,410,000 ක් වූ වාහන 40 ක් පවතින බව දක්වා තිබූ නමුත් ඉන් GA-4428 දරන වාහනය මොටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නමින් ලියා පදිංචි වී තිබුණි.	2023	නිවැරදිව වාහන තොරතුරු දෙපාර්තමේන්තුව තුළ පවත්වා ගත යුතු වීම.	විගණන නිරීක්ෂණය මඟින් ඉදිරිපත් කර ඇති ACA 6 ඇතුලත් වාහන සහ ප්‍රවාහන අංශය වාර්තා කර ඇති වාහන අතර වෙනසට හේතු සහ ලියාපදිංචි විස්තර පරීක්ෂා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබාදී ඇති බව දන්වා සිටිමි.	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
38	විවිධ අමාත්‍යාංශවලට හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 36 ක් දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ කාලයක සිට පරිහරණය කරමින් තිබෙන නමුත්, එම වාහන වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023	නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම.	මේ වන විට පවරා ගැනීමට ක්‍රියාකරමින් පවතින වාහන සංඛ්‍යාව 22 කි. වාහන 14 විස්තර නොමැති බව දන්වමි. දැනට අපහරණ තත්ත්වයේ වාහන වලින් තවදුරටත් පවරා ගත යුතු වාහන සංඛ්‍යාව 27 කි. එයින් අයිතිය පවතින රජයේ ආයතන වෙත අපහරණය සඳහා බාරදීමට ක්‍රියාකරමින් පවතින වාහන 05 ඇති අතර මණ්ඩලයක් මඟින් මෙම කටයුත්ත සම්බන්ධව ක්‍රියාකරමින් පවතින බව කාරුණිකව දන්වමි.	වාහන පවරාගැනීම ඇතුළු විගණන නිරීක්ෂණ කඩිනමින් නිරවුල් කිරීම සඳහා මෙන්ම, ප්‍රවාහන හා ගිණුම් අංශවල නිවැරදි තොරතුරු සහිත පවත්වාගෙනයාම සඳහාත් අවශ්‍ය පියවර ගැනීමට මණ්ඩලයක් පත්කර ඇති අතර මාස දෙකක් ඇතුලත මෙම නිරීක්ෂණ නිරවුල් කිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
39	මහඔය බලකාය යටතේ බක්කි ඇල්ල අනුකලාපයේ 2010 හා 2012 වර්ෂයන් හි පවත්වාගෙන ගොස් තිබුණු ගඩොල්	2023	ඉතිරි මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	තවදුරටත් රු.3,242,165 ක මුදලක් අයකර ගැනීමට ඇත. තවද, මෙම අය කිරීම සම්බන්ධයෙන්	රජයට සිදුවූ අලාභය වගකිව යුතු අයගෙන් අයකිරීමට දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු

	ව්‍යාපෘතීන්හි ඇති වී තිබූ ගඩොල් 762,322 ක ඌණතාවයක් නිසා රු.5,447,590 ක පාඩුවක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.2,255,672 ක් පමණක් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබූ නමුත් රු.3,191,918 ක් වූ ඉතිරි මුදල අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.			විධිමත් අනුමැතියක් ලැබෙන තෙක් අයකර ගැනීම තාවකාලිකව අත්හිටුවන මෙන් MOD/CSD/CSD/03/08/1 හා 2024.01.31 දිනැති ආරක්ෂක අමාත්‍යාංශ ලිපිය මගින් දැනුම් දී ඇති අතර මේ සම්බන්ධව විගණන හා කළමනාකරන කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලදී. අමාත්‍යාංශ අනුමැතිය ලද පසු ඉතිරි මුදල් අයකිරීමට නියමිත බව දන්වා සිටිමි.	රැස්වීමේදී ගත් තීරණයක් අනුව සිදු වු අතර, ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදුන් උපදෙස් අනුව අයකිරීම තාවකාලිකව නවතා තිබුණි. නැවත මේ සම්බන්ධව විගණන හා කළමනාකරණ කමිටුවේ සාකච්ඡා කර පැහැදිලි කල අතර ඒ අනුව අනුමැතිය ලද වහාම නැවත අයකිරීම් සිදුකරන බව දන්වන ලදී.
40	කතරගම බලකා මූලස්ථානයේ පළල අඩි 16 ක් හා දිග අඩි 903 ක් වන ප්‍රධාන අභ්‍යන්තර මාර්ග පද්ධතිය 2016 වර්ෂයේදී කොන්ක්‍රීට් අතුරා නවීකරණය කිරීම සඳහා ප්‍රදේශයේ පුද්ගලික ආයතනයකින් මිලදී ගත් සිමෙන්ති, ගල්, වැලි ඇතුළු ඉදිකිරීම් ද්‍රව්‍ය කතරගම බලකා මූලස්ථානයට ලැබී නොතිබූ අතර, එම මාර්ගයේ අළුත්වැඩියාව ද සිදු නොකර තිබීමෙන් රු.579,124 ක අලාභයක් දෙපාර්තමේන්තුවට සිදු වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විටත් ඉන් රු.144,781 ක් පමණක් අයවී තිබුණි.	2023	ඉතිරි මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	වගකිව යුතු යුධ හමුදා නිලධාරීන් වෙතින් ඉතිරි අයකර ගැනීම් සඳහා අවැසි කටයුතු සිදුකර දෙන ලෙසට ඉල්ලීමක් කර සීඑස්ඩී/1/1/2/8 ( ) හා 2023.12.14 දිනැති ලිපිය මගින් යුධ හමුදාපති වෙත යොමුකර ඇති අතර එම මුදල් අයවීමෙන් පසු ඔබ වෙත වාර්තා කරන බව කාරුණිකව දන්වා සිටිමි.	වගකිව යුතු යුධ හමුදා නිලධාරීන් වෙතින් අලාභය අයකරගැනීම සඳහා යුධහමුදාපති වෙත ලිඛිතව ඉල්ලීමක් සිදුකර තිබුණි.
41	සමාලෝචිත වර්ෂය අවසන්වන විට තවදුරටත් අයිතිය පවරාගෙන තක්සේරු කර ගිණුම්වලට ගෙන	2023	ඉදිකිරීම් සිදු කිරීමට පෙර ඉඩමේ අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු	මේ සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදුන් බව	රජයේ සතු ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීම සඳහා මේ වන විට ක්‍රියාකරමින්

	නොතිබුණු බිම් කැබලි 524 ක ඉදිකර තිබූ ගොඩනැගිලිවල වටිනාකම රු.746,203,209 ක් විය. තවද මෙසේ පවරා නොගත් ඉඩමක් වූ විල්පත්තුව බලකායෙහිද සමාලෝචිත වර්ෂයේ නැවතත් ගොඩනැගිලි ඉදිකිරීමක් සිදුකර තිබූ අතර, ඒ සඳහා වැයකර තිබූ මුදල රු.16,156,769 ක් විය.		කළ යුතු වීම.	කාරුණිකව දන්වා සිටිමි.	පවතින අතර එම ක්‍රියාදාමයට කාලසීමාවක් ගතවිය හැකි බව හා විල්පත්තුව බලකා ගොඩනැගිල්ල ඉදිකර ඇති භූමිය ප්‍රාදේශීය ලේකම් සමඟ සම්බන්ධිකරණයෙන් පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වන ලදී.
42	උහන හා මහඔය බලකා විසින් 2021, 2022 හා 2023 වර්ෂවලදී දියතලාව යුධ හමුදා පුහුණු පාසලට හා සේවා වනිතා ඒකකයට අළෙවි කරන ලද බලකා නිෂ්පාදනයන් සඳහා අයවිය යුතු රු. 2,263,047 ක මුදල අදාල ආයතනයන්යන්ගෙන් අයකර ගෙන ශ්‍රී ලංකා රජයට පියවීමට අදාල බලකා කටයුතු කර නොතිබුණි.	2023	කඩිනමින් මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	අයකර ගැනීම් සිදුකිරිමට අමාත්‍යාංශ මට්ටමින් මණ්ඩලයක් පත්කර විමර්ශනයක් සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.	දෙපාර්තමේන්තු මණ්ඩලයක් මගින් දියතලාව යුධ හමුදා කඳවුර වෙත අලෙවිකරන ලද සහල් මුදල් ආපසු ලබාගැනීම සඳහා පරීක්ෂණයක් සිදුකර තිබූ අතර එම මුදල් යුධ හමුදාව මගින් සිදුකරන පරීක්ෂණයෙන් අනතුරුව නිරවුල් කරගැනීමටත් බලකා වෙතින් ලබාගත් සහල් සඳහා අයවිය යුතු මුදල් සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය මගින් පරීක්ෂණයක් සිදුකරන අතර එම වාර්තාව සම්බන්ධව ආරක්ෂක ලේකම්ගේ උපදෙස් ලැබුණු පසු වගකිව යුතු අයගෙන් අයකිරීම් සිදුකිරීමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
43	අවශ්‍යතාවය නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව මිලදී ගන්නා ලද ජල නල උපකරණ වර්ග 76 කට අදාළව අයිතම 2,291 ක් වසර 15 කට අධික කාලයක සිට ද, 2021 වර්ෂයේදී	2023	ඵලදායී ජීව කාලය ඉක්ම යාමට ප්‍රථම භාවිතයට ගැනීමටත් මිලදී ගැනීමට ප්‍රථම අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා	මෙම පුහුණු පාසල ඇතුළුව බලකා හා පුහුණු පාසල් සියල්ලේම අතිරික්තතා සම්බන්ධව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන	නිරීක්ෂණය කර ඇති අයිතමයන්ගෙන් අවශ්‍යතාවය ඇති බලකා පුහුණු පාසැල්වලට බෙදාහැරීම සිදුකර ඇත. ඉතිරි අයිතමයන් ද ඵලදායි කටයුතු වලට

	රු.304,400 ක් වටිනා පොලිසැක් උර 2,000 ක් වසරකට අධික කාලයක සිටද, සේරුපිට ගබඩාව තුල නිශ්කාර්යව පැවතුණි.		ගැනීමටත් කටයුතු කළ යුතු වීම.	ලද නිර්දේශ ප්‍රකාරව ක්‍රියාකර, අතිරික්ත අයිතමයන් අවශ්‍යතා ඇති ස්ථානවලට ලබා දීම සහ, තවදුරටත් නිෂ්කාර්යය අයිතම විධිමත් පටිපාටියකට අනුව ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇති බව කාරුණිකව දන්වමි.	කඩිනමින් යොදාගැනීමට ප්‍රසම්පාදන අංශයට උපදෙස් ලබාදී තිබුණි. එය මේ වර්ෂය තුල සිදුකිරීමට අපේක්ෂිත ජලනල අළුත්වැඩියා සඳහා යොදාගැනීමට සැලසුම් කර ඇති බව දන්වන ලදී.
44	සේරුපිට බලකායට අයත් කාර්යයන් සඳහා යොදා ගන්නා ලොරි රථයක් අලුත්වැඩියාව සඳහා 2022 නොවැම්බර් 30 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව අවම මිල ඉදිරිපත් කර තිබූ පුද්ගලික ආයතනයකින් රු.1,250,000 ක මුදලකට සිදුකිරීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව රු.500,000 ක් ඉක්මවන සේවා ප්‍රසම්පාදනයේදී කොන්ත්‍රාත්කරු හා ප්‍රසම්පාදන අස්ථිත්වය අතර, එළැඹි විධිමත් ලිඛිත ගිවිසුමක් තිබිය යුතු වුවත් එලෙස කටයුතු කර නොතිබුණි. තවද, අලුත්වැඩියාව සඳහා අධ්‍යක්ෂ (ප්‍රවාහන) ගේ අනුමැතියකින් තොරව 2022 නොවැම්බර් 17 දින ලොරි රථය තෝරා ගත් ගරාජය තුළ නවතා තිබූ අතර, 2024 මාර්තු 20 දින වන විටත් අලුත්වැඩියා කිරීමකින් තොරව	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම හා වාහන අළුත්වැඩියාව නිසි පරිදි කළමනාකරණය කළ යුතු වීම.	උක්ත ලොරි රථයේ අළුත්වැඩියාව සඳහා කොන්ත්‍රාත් ප්‍රදානයක් සිදුකර නොමැති අතර වැයවන මුදලට සාපේක්ෂව ඵලදායී ආයුකාලයක් අපේක්ෂා කල නොහැකි බැවින්, සුදුසු ඉදිරිපියවරක් ගැනීම සඳහා මණ්ඩලයක් පත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මේ වන විට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි. අනුමැතිය අපේක්ෂාවෙන් හෝ අළුත්වැඩියා සඳහා ලබා දී දීර්ඝ කාලයක් වාහන ගරාජවල පැවතීම වළක්වා ගැනීම සඳහා මේ වන විට අළුත්වැඩියා ප්‍රගති සමාලෝචන රැස්වීම් මාසිකව පැවැත්වීම සඳහා අවශ්‍ය උපදෙස් ප්‍රවාහන අංශයට ලබා දී ඇත.	විධිමත් ක්‍රමවේදයකිනි තොරව ගරාජය වෙත යොමු කර තිබූ මෙම වාහනය ආපසු සේරුපිට පුහුනු පාසැල වෙත ගෙන ඒමට උපදෙස් ලබාදී ඇති අතර වාහන අළුත්වැඩියා කළමනාකරණයට වැඩපිළිවෙලක් ස්ථාපනය කර ඇති අතර ඒ අනුව මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව දන්වන ලදී.

	පැවතුණි. වාහන අලුත්වැඩියාවන් නිසි ලෙස කළමනාකරණය නොකිරීම නිසා මෙම තත්ත්වය උදා වී ඇති බව නිරීක්ෂණය විය.				
45	දෙපාර්තමේන්තුව සතු බලකා, පුහුණු පාසල් හා කාර්යාල මඟින් භාවිතයෙන් ඉවත් කරන ලද රථ වාහන 113 ක් අපහරණය කිරීම සඳහා සේරුපිට බලකා මූලස්ථානයේ ගාල්කර තිබූ අතර, මෙම බලකායට මෙම රථ ලැබී ඇත්තේ 2018 – 2023 කාල පරිච්ඡේදය තුල විය. මෙම රථ දීර්ඝ කාලයක් අපහරණය කිරීමකින් තොරව පැවතීම නිසා විශාල ලෙස හානි වීම් සිදුව තිබූ අතර විගණිත දිනය වූ 2024 මාර්තු 20 දිනවන විටත් මෙම රථ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	වාහන අපහරණය දෙපාර්තමේන්තුව ට අවාසිදායක තත්ත්වයන් ඇති වීමට ප්‍රථම කඩිනමින් සිදු කිරීමට කළමනාකරණය වග බලා ගත යුතු විම.	මෙම කරුණ සම්බන්ධව අවස්ථා කීපයක දී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සාකච්ඡා කර ඇති අතර 2016 පෙර රාජසන්තක කල වාහන සම්බන්ධ ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධව උපදෙස් අපේක්ෂිතව ප්‍රමාදයක් සිදු වී ඇති බව සඳහන් කරමි. වර්තමානය වන විට පුවත්පත් දැන්වීම් පලකර ඇති අතර ටෙන්ඩර් කැඳවා අලෙවි කිරීමට කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වමි.	වාහන 26 ක් මේ වන විට විකුණා අවසන් කර තිබුණි. ඉතිරි වාහන විකිනීම සඳහා කටයුතු කරමින් පැවතුණි.
46	වැලිසර බලකායේ ගබඩාව තුල වසර 05 ත් 20 ත් දක්වා පැරණි නිකුත් නොවී පවතින නිල ඇඳුම් අයිතම 31 ක් ද, වර්ෂ 02 ත් 08 ත් දක්වා පැරණි නිකුත් නොවී පවතින ටයර් සහ ටියුබ් ඒකක 268 ක් ද, වර්ෂ 04 ත් 11 ත් අතර නිකුත් නොවී පවතින ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි උපකරණ 93 ක් ද, වර්ෂ 05ත් 13ත් අතර නිකුත් නොවී පවතින ලිපි ද්‍රව්‍ය, ටෝනර් සහ පරිගණක උපාංග අයිතම 17 ක ඒකක 26,417 ක් ද නිෂ්කාර්යව පැවතුණි.	2023	අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිලදී ගැනීම් සිදු කළ යුතු වීම හා පවත්නා උපකරණ ඵලදායී ආර්ථික කටයුත්තකට යෙදවීමට කටයුතු කළ යුතු වීම.	අතිරික්තතා සම්බන්ධව අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ප්‍රකාරව ක්‍රියාකර, අතිරික්ත අයිතමයන් අවශ්‍යතා ඇති ස්ථානවලට ලබා දීම සහ, තවදුරටත් නිෂ්කාර්යය අයිතම විධිමත් පටිපාටියකට අනුව ටෙන්ඩර් කිරීමට කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. මේ වන විට අතිරික්ත	නාවික හමුදාව වෙත ටයර් 145ක ප්‍රමාණයක් සහ ටියුබ් 51ක ප්‍රමාණයක් පැවති තොගයෙන් ලබා දීමට කටයුතු කරන ලදී. නිල ඇඳුම් අයිතම 31 ක් අවශ්‍යතාවය නැවත සියළු බලකා සහ පුහුණු පාසල් වලින් අවශ්‍යතාවය හඳුනාගෙන නැවත නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. ලිපි ද්‍රව්‍ය, ටෝනර් හා විගණනයට නිරීක්ෂණය වූ ගොඩනැගිලි හා විදුලි උපකරණ නිකුත් නොවී සහ සෙමින් නිකුත් වන

	මින් විගණනයට ඉදිරිපත් කරන ලද නිල ඇඳුම් තොග අයිතම 20 ක වටිනාකම රු.5,946,501 ක් ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි උපකරණ වර්ග 21 ක වටිනාකම රු. 762,809 ක් හා ටයර් හා ටියුබ් ඒකක 195 ක වටිනාකම රු.2,310,917 ක් ද විය.			ටයර් සම්බන්ධව මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජිතයෙක් ලබා ගෙන දෙපාර්තමේන්තු අවශ්‍යතාවය පවතින ටයර් හා ටියුබ් තොග පමණක් තොගයේ තබා ගැනීමටත් ඉතිරි තොග ආරක්ෂක අමාත්‍යංශය හා සම්බන්ධීකරණය වී ත්‍රිවිධ හමුදාව හා පොලිස් දෙපාර්තමෙන්තුවට රාජ්‍ය ආයතන අතර හුවමාරු කිරීමේ පදනම මත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවද දන්වමි.	තොගයන්හි පා පැදි විෂයන් හැර අනිකුත් විෂයන්ගේ අවශ්‍යතාවය නියෝජ්‍ය අධ්‍යක්ෂ තාක්ෂණ හා මාණ්ඩලික නිලධාරී ඉදිකිරීම් මගින් විමසීමට ලක් කරන ලද අතර එම තොගයෙන් කොටසක් මේ වන විට අවශ්‍යතාවය ඇති ස්ථානවලට බෙදා හැර තිබුණි. ඉතිරිය ඉදිරි අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට උපදෙස් ලබා දී තිබුණි. පාපැදි ලෙජර් ගත කර අවසන් වූ පසු පා පැදි අළුත්වැඩියා කටයුතු සඳහා අවශ්‍ය පාපැදි උපාංග ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරන බව දන්වන ලදී.
47	ප්‍රසම්පාදන හා තාක්ෂණික ඇගයීම් කමිටු විසින් බීජ අවශ්‍යතාවය නිසි පරිදි ඇගයීමක් සිදු නොකර බීජ මිලදී ගැනීම ද, නිසිකලට වේලාවට වගා නොකිරීම හා පසු විපරම් කිරීමක් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 1,067,202 ක් වටිනා බීජ ප්‍රභේද 8 කට අයත් බීජ කි.ග්‍රෑ 2,112 ක් භාවිතයට නුසුදුසු තත්ත්වයෙන් පැවතුණි.	2023	අවශ්‍යතාවයට පමණක් මිලදී ගැනීම් කිරීමට කටයුතු කළ යුතු වීම.	ගබඩාවේ පවතින සෙමෙන් නිකුත් වන මෙම තොගයන්ගේ ඉදිරි අවශ්‍යතාවයන් නැවත ඇණවුම් කිරීම සිදු නොකරන ලෙසත් මෙම තොගයන් මගින් හැකි උපරිම ප්‍රයෝජන ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී භාවිතා කරන ලෙසටත් නිසි උපදෙස් අධ්‍යක්ෂ ප්‍රසම්පාදන මගින් ලබාදීමට කටයුතු කර ඇති බව දන්වමි.	මේ සම්බන්ධව මණ්ඩලයක් පත්කර තිබුණි.
48	පොළොන්නරු බලකායේ තොග ලේඛණයන්ට අනුව නාඩු වී කිලෝ ග්‍රෑම් 98,539 ක් පැවති නමුත් පත්කරන ලද මණ්ඩලය විසින් වී තොග කිරුම් කිරීමේ දී ගබඩාවේ ඇති	2023	නෙළන ලද අස්වැන්න ආරක්ෂාකාරීව ගබඩා කළ යුතු වීම හා ඌණතාවයන් අයකර ගැනීමට	මිනුම් කිරීමේදී යම් දෝශයක් හෝ ගණනය කිරීමේදී අත්වැරැද්දක් සිදුව ඇති බව නිරීක්ෂණය කරමි. කෙසේ වෙතත් නාඩු වී	පොළොන්නරුව බලකාය සම්බන්ධව පත්කරන ලද මණ්ඩලයක් මගින් මූලික පරීක්ෂණයක් සිදුකරන අතර එහි අවසන් වාර්තාව

	සත්‍ය තොගය කිලෝ ග්‍රෑම් 84,035 ක් බව අනාවරණය වී තිබූ අතර ඒ අනුව වී කිලෝ ග්‍රෑම් 14,504 ක ඌණතාවක් නිරීක්ෂණය විය. එහි වටිනාකම රු.1,675,067 ක් විය. තවද, පොළොන්නරු බලකායේ තොග ලේඛණයන්ට අනුව සම්බා වී කිලෝ ග්‍රෑම් 11,054 ක් පැවති නමුත් පත්කරන ලද මණ්ඩලය විසින් වී තොග කිරුම් කිරීමේ දී ගබඩාවේ ඇති සත්‍ය තොගය කිලෝ ග්‍රෑම් 11,585 ක් බව සඳහන් කර තිබූ හෙයින් සම්බා වී තොග කිලෝ ග්‍රෑම් 531 ක අතිරික්තයක් පෙන්නුම් කල අතර, එහි වටිනාකම රු. 55,746 ක් විය. මෙම ඌණතා හා අතිරික්තතා සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.		ක්‍රියාමාර්ග ගැනීම.	කිලෝ 14,504 ප්‍රමාණය අඩුවීම සම්බන්ධ මේ වන විට මණ්ඩලයක් මඟින් පරීක්ෂා කරන බව කාරුණිකව දන්වමි.	ලැබුණු පසු අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් ලබාගෙන ක්‍රියාකිරිමට අපේක්ෂා කරන බව දන්වන ලදී.
49	හිඟ හිටි ණය ශේෂ අතර මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.155,492 ක් වූ වර්ෂ 2 ට වඩා පැරණි ණය ශේෂයක් ද, විශ්‍රාම ගිය නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,475,631 ක් වූ වර්ෂ 2 ට වඩා පැරණි ණය ශේෂයන් ද, සේවය අතහැර ගොස් තිබූ නිලධාරීන් 53 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 5 කට වඩා පැරණි රු.4,141,473 ක් වූ ණය ශේෂද, වර්ෂ 2 – 5 ත් දක්වා පැරණි නිලධාරීන් 78 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 7,635,965 ක් වූ	2023	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන්ගේ අයවිය යුතු ණය ශේෂ විශ්‍රාම පාරිතෝෂිතයෙන් අඩු කර මෙම දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කිරීමෙන් අනතුරුව පියවා ගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. තවද, රු. 155,492 ණය ශේෂය නිලධාරිණියකගේ නොඉල්ලුමට ඇතුලත් කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. අත්තිකාරම් බී ගිණුම සම්බන්ධව	මිය ගිය නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයකර ගත යුතු මුදල රු.188,257 කි. විශ්‍රාම ගිය නිලධාරින් 62 දෙනෙකුගෙන් රු. 4,775,428.00 විශ්‍රාම පාරිතෝෂිතයෙන් ඉදිරියේදී අයකිරීමට නියමිත බවත්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 460 දෙනෙකුගෙන් අයවිය යුතු ඉතිරි මුදල 27,783,158 ක් බවත් මේ තුල නැවත සේවය පිහිටවූ 28 දෙනෙකු සිටින අතර රු. 1,186,355 මුදල මෙවන විට ඔවුන්ගෙන් වාරික වශයෙන් අය

	ණය ශේෂ පැවතුණි. ඒ අනුව මෙම ණය ශේෂ අයකර ගැනීමේ ප්‍රමාණවත් ප්‍රගතියක්ද නිරීක්ෂණය නොවීය.			පවතින හිඟ ශේෂ අයවීම පරීක්‍ෂා කර එම ගිණුම විධිමත් කිරීම හා නිවැරදිව පවත්වා ගෙන යාම සඳහා අධ්‍යක්‍ෂ ජනරාල් විසින් සිආදෙ/1/1/3/18() අංක දරන 2022.08.17 දිනැති ලිපිය මගින් මණ්ඩලයක් පත් කර ඇති අතර, එම මණ්ඩලය විසින් මේවන විට කේවල ශේෂ ලැයිස්තුවේ පැවති දෝෂයන් බොහෝදුරට නිරවුල් කර අවසන්ව ඇති හෙයින් එම කේවල ශේෂ අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.	කරමින් පවතින බවත් දන්වන ලදී. අය වීමට පැවති ඉතිරි මුදල් අයකර ගෙන තිබුණි.
50	නිලධාරීන් 102 ක ගෙන් සමාලෝචිත වර්ෂය අරම්භයේ අයවීමට පැවති එකතුව රු.14,904,310 ක් වූ ණය ශේෂ වර්ෂය තුලදී අයකර ගැනීමට අපොහොසත් වී තිබීමෙන් එම ආරම්භක ණය ශේෂ එලෙසම වර්ෂය අවසානයේදී ද අත්තිකාරම් ශේෂ තුල ඇතුලත්ව තිබුණි.	2023	ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	නිලධාරීන් අවසන් වරට අනුයුක්තව රාජකාරි කළ සේවා ස්ථානභාර අණදෙන නිලධාරීන් මගින් අදාල ණයකරුවන් දැනුවත් කර ඇත, එක් එක් ණයකරුවන්ට අදාල ඇපකරුවන්ගේ වැටුපෙන් වාරික වශයෙන් අයකර ගැනීමට දැනටමත් කටයුතු කර ඇත. නිලධාරියාට ගෙවිය යුතු අර්ථසාධක අරමුදල, යහසාධක හා සුවසවිය අරමුදල් අංශ වෙතින් මෙම භටයන්ට ගෙවිය යුතු මුදලක් ඇත්නම් එමගින් අයකර ගැනීමට ලිපි යොමු කර ඇත.	ණයකරුවන් ඇප ලෙස යහසාධක අරමුදල නම් කර ඇති අවස්ථා අනුව එම අරමුදලින් රු. 2,859,707 ක මුදලක් පියවා ගෙන තිබුණි. ඉතිරිය අය කිරීමට එන්තරවාසි යවා ඇති බව දන්වන ලදී.

89. ශීර්ෂය - 322 ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	7,823,463,698	236,014,435	7,587,449,263	තත්ත්වාගණනය කළ
2022	7,908,711,106	239,635,306	7,669,075,800	තත්ත්වාගණනය කළ
2023	8,110,908,637	277,072,115	7,833,836,522	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	දැදුරු ඔයේ සිට ගනේවත්ත ඖෂධ උද්‍යානය දක්වා ජල සැපයුමක් ලබා ගැනීම වෙනුවෙන් අවබෝධතා ගිවිසුමක් රහිතව වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 03 කදී රු. 18,581,000 ක් ගෙවා තිබුණු අතර අදාල කටයුතු වෙනුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත රු. 1,323,623 ක් 2021 දෙසැම්බර් 16 දින ගෙවා තිබුණි. එසේ වුවද මෙම ව්‍යාපෘතියේ කටයුතු 2023 වර්ෂයේ දෙසැම්බර් වන විටත් අවසන් කර නොතිබුණි.	2022	සංවර්ධන ව්‍යාපෘති අපේක්ෂිත කාල රාමුව තුල නිම කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.	මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම්කටයුතු අදියර 03ක් යටතේ ක්‍රියාත්මකවන අතර මේවනවිට එහි පළමු අදියරේ හා දෙවන අදියරේ 95%ක කාර්යයන් හා තෙවන අදියරේ 88% කකාර්යයන් අවසන් කර ඇත. තෙකලා විදුලිය ලබාගැනීම සඳහා අයඳුම්කර ඇතත් ශ්‍රිලංකා විදුලිබල මණ්ඩලයෙන් විදුලි සම්බන්ධතාවය ලබාදීම ප්‍රමාදයමත මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වපවතී.	2024 සැප්තැම්බර් 30 වන විටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණි.
02.	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 224 වගන්තිය ප්‍රකාරව උද්‍යාන 05 කට අයත් හෙක්ටයාර් 362.1054 ක වපසරිකින් යුතු ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විටත් අවසන් කර නොතිබුණි.	2023	දෙපාර්තමේන්තුව සතු සියළු ඉඩම් නිරවුල් කර පවරා ගැනීමට කටයුතු කළ යුතුය.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ පැවැති උද්භිද උද්‍යාන,2006 වර්ෂයේ දී ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වශයෙන් වෙනම දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කර ඒ යටතට පත් කර ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	උද්‍යාන සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණයන් විධිමත්ව ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව ට පවරා දෙන ලෙස සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මඟින් 2024.09.12 දිනැතිව ඉඩම්

				විසින් භුක්ති විඳින අංක 1092 හා 1092 Aදරණ ගොඩනැගිලි දෙක ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා නොදී ඉතිරි වත්කම් පවරා දීමට ඉල්ලීමක් කර ඇත. එහිදී ඒ සඳහා ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව එකඟතාවය පල නොකිරීම මත කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් සියළු වත්කම් පැවරීම අත්හිටුවා ඇත. අනෙකුත් ඉඩම් උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු ඉටු කරමින් පවතී.	කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලීමක් යොමු කර තිබුණි.
03.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 හා 6.3 වගන්ති ප්‍රකාරව 2023වර්ෂයේ අවසන් දිනට විශ්‍රාම ගොස් ඇති, මියගිය හා සේවය අතහැර ගොස් ඇති නිලධාරින් 35 දෙනෙකුගේ රු. 4,343,939 ක ණය ශේෂයන් අය කර නොතිබුණි.	2023	හිඟ ණය ශේෂ කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	විශ්‍රාම ගිය නිලධාරීන් සම්බන්ධයෙන් යොමු කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් එම ණය ශේෂයන් ඔවුන්ගේ පාරිතෝෂික මුදලින් අඩු කර ගැනීමට කටයුතු කරමින් පවතින අතර මියගිය, සේවය අතහැර යාම,වැඩ තහනම් කිරීම යනාදි හේතූන් මත අයවිය යුතු අයකරගත නොහැකි ණය ශේෂයන් මේ වන විට ඇපකරුවන්ගෙන් හා අදාල පරිදි අයකර ගැනිමට කටයුතු	2024 සැප්තැම්බර් 30 දිනට තවදුරටත් අය විය යුතු හිඟ ණය ශේෂය රු. 3,661,364 ක් විය.

				කරමින් පවතී.	
04.	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ගබඩාවක් තුල වර්ෂ 01 සිට වර්ෂ 05 ක් අතර කාලයක සිටඑකතුව රු.6,536,374 ක යන්ත්‍ර හා උපකරණ 51 ක් නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතිණි. ඒ තුල මිලදී ගත් දින සිට භාවිතයට ගෙන නොමැති රු.3,572,815 ක යන්ත්‍ර හා උපකරණ 03 ක් පැවතුණි.	2023	නිෂ්කාර්යය වත්කම් කඩිනමින් භාවිතයට ගැනීම හෝ සුදුස්සක් කර බැහැර කිරීමට කටයුතු කළ යුතුය.	මෙහි සඳහන් භාවිතා කළ හැකි උපකරණ රජයේ වෙනත් ආයතනයක් වෙත මාරු කර යැවීමට සාකච්ඡා කරමින් පවතින අතර දෙපාර්තමේන්තුව තුල භාවිතා කළ හැකි අනෙකුත් උපකරණ සංවර්ධන කටයුතු සඳහා ඉදිරියේදී යොදා ගැනීමට අපේක්ෂා කර ඇත.	2024 සැප්තැම්බර් 30 දින දක්වාත් භාවිතා නොකරයි.
05.	පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය ෆෙරෝ සිමෙන්ති ටැංකියක් ඉදිකිරීම සඳහා රු.5,609,030 ක මුදලකට 2021 අගෝස්තු 19 දින ගිවිසුම්ගතව2021 නොවැම්බර් 15 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණද, 2023 වර්ෂයේ අවසාන දින වන තෙක් එහි වැඩ අවසන් කර නැතත්, අවස්ථා 05 කදී ගෙවා තිබූ රු.5,855,645 ක මුදල තුල ඉටුකර නොතිබූ වැඩ විෂයයන් සඳහා රු.2,145,422 ක් ගෙවා තිබුණි.	2023	ඉටු කළ කාර්යයන් සඳහා පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය.	ඉටු නොකළ වැඩ හා අනෙකුත් අඩුපාඩු සම්බන්ධයෙන් අදාළ කොන්ත්‍රාත්කරුට විරුද්ධව අවශ්‍ය කරන නීතිමය පියවර ගැනීම සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය හරහා නීතිපති දෙපාර්තමේන්තුවට දන්වා යවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.	නීතිමය කටයුතු වලට අමතරව මෙම දෙපාර්තමේන්තුව විසින් සහ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය මගින් පත් කළ කමිටුවක් මගින් සිදුකරණ පරීක්ෂණ 2024 සැප්තැම්බර් 30 දක්වා නිමවී නොතිබුණි.

90. ශීර්ෂය -323 නීති කටයුතු දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	9,805,261	9,805,261	9,805,261	තත්ත්වාගණනය නොකළ
2022	9,651,842	9,651,842	9,651,842	තත්ත්වාගණනය නොකළ
2023	9,828,294	9,828,294	9,828,294	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	මුදල් රෙගුලාසි 103(1), 104, 109(1) 109(2) 2021 වර්ෂයේදී අස්ථානගතවූ රු.216,155 ක් වටිනා ලැප්ටොප් පරිගණකයේ පරීක්ෂණ කටයුතු අවසන් කර සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට 2024 සැප්තැම්බර් 02 වන විටත් කටයුතු කර නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි පරිදි කටයුතු සිදු කළ යුතු වීම.	මු.රෙ 104(1) (අ) අනුව පරීක්ෂණය සහ වගකිව යුත්තන් නිශ්චය කිරීමට පත්කරන ලද කමිටුවේ නිර්දේශ අනුව පොලිස් විමර්ශනයට අනුකූලව ඉදිරි කටයුතු සිදු කළ යුතු ය. පොලිස් විමර්ශනය මගින් නිශ්චිත කරුණු අනාවරණය කර ගැනීමෙන් අනතුරුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතයි.	වසර 3ක් ඉක්මවා ඇතත් මුදල් රෙගුලාසි පරිදි කටයුතු අවසන්කර නොතිබුණි.
02	2021 සහ 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් තුළ අන්තර්ගත කර තිබූ 2023 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කර කටයුතු සිදු කරමින් පවතින පනත් කෙටුම්පත් 24 ක් අතුරින් පහත දැක්වෙන පනත් 09 ක් 2024 අගෝස්තු 01 දින වන විටත් පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට නොහැකි වී තිබුණි. • 1951 අංක 38 දරන ලෝහෝර් ආයීා ණය අරමුදල් පනත • කොළඹ කොටස් හුවමාරුව අසාමුහිකරණ කිරීමේ පනත	2023	සැලසුම් කළ පරිදි වාර්ෂික ක්‍රියාකාරකම් ඉටු කළ යුතු වීම	පනතක් සම්මත කිරීම ප්‍රතිපත්තිමය තීරණ මත සිදු කරනු ලබන ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර පනත් කෙටුම්පත් සම්මත කිරීමට පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමට ප්‍රථම අදාළ විෂයයන් සම්බන්ධ ආයතන සමඟ නිරන්තරයෙන් සාකච්ඡා පවත්වන අතර එකී ආයතයන් හි වන තීරණයන් අනුව ඒවා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේදි ප්‍රමාදයන් සිදු වීම අප දෙපාර්තමේන්තුවෙහි	අදාළ පනත් 09 සඳහා පාර්ලිමේන්තු අනුමැතිය මේ දක්වා ලැබී නොතිබුණි.

	• 2009 අංක 23 දරන ශ්‍රී ලංකා සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරී ආයතන පනත • 2006 අංක 05 දරන මුදල් විශුද්ධිකරණ වැලැක්වීමේ පනතට සංශෝධන • 2006 අංක 06 දරන මුදල් ගණුදෙනු වාර්තා කිරීමේ පනතට සංශෝධන • 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සම්මුති පනතට සංශෝධන • 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට සංශෝධන • 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) සංශෝධන පනත්කෙටුම්පත 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත පනත සංශෝධන			වගකීමක් නොවන බව පෙන්වා දෙමි. 2021 සහ 2022 වර්ෂවල රටෙහි පැවති ආර්ථිකමය ගැටළු හේතුවෙන් ආර්ථික තත්වය ඉන් ඉහළට ඔසවා තැබීමට අවශ්‍ය වන දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාල වන පනත් කෙටුම්පත් සම්මත කිරීම පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ කාර්යයක් වූ අතර එය රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව සිදු වී ඇත.	
03	නීති කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට අවසන් කර නොමැති නඩු සංඛ්‍යාව 381 ක් වූ අතර, 2022 වර්ෂය තුළදී ලැබී ඇති නඩු සංඛ්‍යාව 77 කි. ඉන් නඩු 06 ක් 2022 වර්ෂය තුළ විසඳී ඇති අතර, 2024 ඔක්තෝම්බර් 09 දින වන විට අවසන් නොමැති නඩු සංඛ්‍යාව 362 ක් විය.	2023	දෙපාර්තමේන්තුවට ලැබෙන නඩුවල වැඩ කටයුතු නිම කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කළ යුතු වීම.	විගණනයේ නිරීක්ෂණ සමඟ එකඟ වන බව දක්වා තිබුණි.	නඩු 90 ක වැඩ කටයුතු පමණක් අවසන් වී ඇති අතර තවදුරටත් නඩු 362 ක් විසඳී නොතිබුණි.

91. ශීර්ෂය - 324 කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	39,752,990	39,752,990	39,752,990	තත්ත්වාගණනය නොකළ
2022	38,790,771	38,790,771	38,790,771	තත්ත්වාගණනය නොකළ
2023	38,595,789	38,595,789	38,595,789	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ 315 දෙපාර්තමේන්තුවේ රියදුරන් විසින් ඇප තැබීම සිදු කර නොතිබුණි.	2022	මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම.	රියදුරු මහතුන්ගේ ඇප තැබීමේ කටයුතු සඳහා ඇප මුදල තීරණය කිරීමෙන් අනතුරුව එම ඇප තැබීමේ කටයුතු ඉක්මනින් සිදු කිරීමට කටයුතු කරමින් පවතී.	ඇප මුදල තීරණය කර ඒ අනුව ඇප තැබීමට කටයුතු කරමින් පවතී.
02	2023 වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 50 ක් වූ අතර, ඉන් තනතුරු 09 ක් පුරප්පාඩුව පැවතුණි. පුරප්පාඩුවලින් 04 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය.	2022	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩල ප්‍රමාණයෙන් තනතුරු 9 ක් දැනටමත් පුරප්පාඩු වී ඇත. විශේෂයෙන් ආයතනයේ කාර්යසාධනය සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින්ගේ හිඟය තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. මෙම හිඟය සම්පූර්ණ කර ගැනීම සඳහා නිරන්තරයෙන් අමාත්‍යාංශය හා අදාල සේවා මණ්ඩල දැනුවත් කර ඇත.	පුරප්පාඩු පිරවීමට අදාල අමාත්‍යාංශය හා සේවා මණ්ඩල දැනුවත් කර තිබුණි.

92. ශීර්ෂය - 325 ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,181,043,514	9,825	2, 181,033,689	තත්ත්වාගණනය කළ
2022	2,338,652,678	3,477,679	2,335,174,999	තත්ත්වාගණනය කළ
2023	2,547,673,953	1,131,202	2,546,542,751	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනතේ 12 ඡේදය ප්‍රකාරව, උපදේශක සභාව විසින් දෙපාර්තමේන්තුවේ වාර්ෂික කටයුතු පිළිබඳ සමාලෝචනයක් සිදුකර අමාත්‍යවරයා වෙත ඒ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද මේ දක්වා එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	2021	අදාළ වාර්තා නියමිත කාලය තුළ ඉදිරිපත් කළ යුතු බව.	2023.09.30 වන දිනැති MOD/CSD/CG/01/21 දරණ ලේකම් ආරක්ෂක අමාත්‍යංශයගේ ලිපිය මගින් උපදේශක සභාවක් ස්ථාපිත කර ඇත.	උපදේශක සභාව සඳහා රීති කෙටුම්පත් සැකසීමට අදාල කටයුතු සිදුකරගෙනයමින් පවතී.
02	අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට අයත් ඉඩම් පර්චස් 1159.92 ක් (හෙක්ටයාර් 1.91825) නිසි පරිදි පවරාගැනීමකින් තොරව පරිහරණය කර තිබුණි.	2021	නිසි පරිදි පවරාගැනීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු බව.	වැල්ලවත්ත හරිත උද්‍යාන ඉඩම, මිරිස්ස ඉඩම, කිරින්ද ඉඩම, මාඔය මෝය (වෙන්නප්පුව) හා පාසිකුඩා ඉඩම යන ඉඩම් පවරාගෙන ඇති අතර අනෙකුත් ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.	රොක්සිවත්ත, ගල්කිස්ස ඉඩම, ඔලුවිල් ධීවර වරාය, ඔලුවිල් ධීවර වරාය ඉඩම, දික්ඕවිට ධීවර වරාය ඉඩම, දික්ඕවිට යාඩ්, පානදුර (ලන්සියාවත්ත) ඉඩම හා තොඩුවාව (මහවැව) ඉඩම යන ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

03	අනුමත කාර්ය මණ්ඩලය තුළ ජ්‍යෝෂ්ඨ මට්ටමේ තනතුරක් වූ ගණකාධිකාරී තනතුර වැඩ බැලීමේ පත් වීමක් ලෙස දිගින් දිගටම පත් කර තිබුණි.	2021	වැඩ බැලීමේ පත් වීමක් ලෙස දිගින් දිගටම පත් කර ඇති ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුර ස්ථිර තනතුරක් බවට පත් කල යුතු බව.	ගණකාධිකාරි තනතුර විධිමත් ලෙස පත්කර ගැනීම සඳහා 2022.09.29 වන දිනති අංක DGCG/ADM/3 දරන ලිපිය මගින් ආරක්ෂක අමාතයාංශය දැනුවත්කර ඇත.	ගණකාධිකාරි තනතුර සඳහා ස්ථිර වශයෙන් පත්වීමක් මෙතෙක් ලබා දී නැත.
04	දෙපාර්තමේන්තුවේ සමාලෝචිත වර්ෂයේ ඉන්ධන සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.2,400,000 ක් වූ අතර තත්‍යය මුළු වියදම රු.582,759,746 ක් විය.ඒ අනුව ඇස්තමේන්තුවට වඩා ඉන්ධන වියදම රු. 580,359,746 ක් එනම් සියයට 24,180 කින් වැඩි වී තිබූ අතර ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීම මත අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය කර ගැනීමකින් තොරව නාවික හමුදාවෙන් ලබා ගන්නා බැවින් දෙපාර්තමේන්තුවේ අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.	2022	වියදම් නිසි පරිදි පූරෝකථනය කර වැය විෂයට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතුය.	2024 අගෝස්තු මස 10 වන දිනැති අංක DGCG/LOG/10 දරණ අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රීලංවෙආදෙ ගේ ලිපිය මගින් ආරක්‍ෂක අමාත්‍යාංශය වෙතින් නිසි උපදෙස් අයැද ඇත.	ප්‍රතිපූර්ණය කිරිමේ පදනම මත නාවික හමුදාව වෙතින් ලබා ගත්තද ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙතින් මෙම දෙපාර්තමේන්තුවේ ඉන්ධන සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන දිගින් දිගටම ප්‍රමාණවත් නොවීම මත එම ඉන්ධන වටිනාකම නාවික හමුදාව වෙත නැවත ප්‍රතිපූර්ණය කිරිමට නොහැකි වී ඇත. ඒ සඳහා ස්ථිර විසඳුමක් ලබාගැනීමට අවශ්‍ය වූ බැවින්, අවශ්‍ය නිසි උපදෙස් ලබාගැනීම සඳහා 2024 අගොස්තු මස 10 වන දිනැති අංක DGCG/LOG/10 දරණ අධ්‍යක්‍ෂ ජනරාල් ශ්‍රීලංවෙආදෙ ගේ ලිපිය මගින් ආරක්‍ෂක අමාත්‍යාංශය වෙතින් නිසි උපදෙස් අයැද ඇත.
05	වටිනාකම රු. 283,829,893ක්	2022	යාත්‍රා	CG 405, CG 203, CG	අක්‍රිය තත්වයේ

	වූ නෞකා හා යාත්‍රා 07ක් මාස 03ක සිට අවුරුදු 3ක් දක්වාවූ කාලයක සිට අක්‍රියව පැවතුණද, ප්‍රතිපාදන නොපැවතිම මත ඒවා අළුත්වැඩියා කර සේවයේ යෙදවීමට කටයුතු කර නොතිබුණි.		අළුත්වැඩියා කිරිමට ප්‍රමුඛතාවය ලබාදිය යුතු අතර එම යාත්‍රා සේවයේ යෙදවීමට කටයුතු කල යුතුවේ.	204 යාත්‍රා සඳහා නාවික හමුදා මූලස්ථානය මගින් අමතර කොටස් ඉල්ලුම් කර ඇති අතර CG 403 යාත්‍රාව මුදල් ප්‍රතිපාදන නොමැති බැවින් තාවකාලිකව අළුත්වැඩියා කටයුතු නවතා ඇත.තවද CG 408 යාත්‍රාව අළුත්වැඩියාව සඳහා වියදම අධික බැවින් සුදුසුසක් කිරිමට නියමිතව ඇත.	පැවති යාත්‍රා 07 න් යාත්‍රා 02 ක් ක්‍රියාකාරි තත්වයට පත් කර ඇත.
06	සමාලෝචිත වර්ෂයේ ඉන්ධන සඳහා වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු. 2,400,000 ක් වූ අතර තථ්‍ය මුළු වියදම රු. 532,118,353 ක් විය. ඒ අනුව ඇස්තමේන්තුවට වඩා ඉන්ධන වියදම රු. 529,718,353 ක් එනම් සියයට 22,071 කින් වැඩි වී තිබුණු අතර ඇස්තමේන්තු ප්‍රමාණවත් නොවීම මත අතිරේක ඉන්ධන ප්‍රතිපූර්ණය කර ගැනීමකින් තොරව නාවික හමුදාවෙන් ඉන්ධන ලබා ගෙන තිබුණි. එම වියදම දෙපාර්තමේන්තුවේ වියදම් ප්‍රකාශයේ හෝ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා නොතිබුණි.	2023	වියදම් නිසි පරිදි පුරෝකථනය කර වැය විෂයයට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනිමට කටයුතු කළ යුතුවීම.	මෙම දෙපාර්තමේන්තුවේ ඉන්ධන සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන දිගින් දිගටම ප්‍රමාණවත් නොවීම මත එම ඉන්ධන වටිනාකම නාවික හමුදාව වෙත නැවත ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත.	2025 වර්ෂය සඳහා ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව නාවික හමුදාව වෙතින ඉන්ධන ලබා ගැනීම සඳහා අනුමැතිය ඉල්ලා ඇති බව දන්වා ඇත.
07	දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු සිදු කරන නිලධාරීන් හා නාවිකයන් හට ශ්‍රී ලංකා නාවික හමුදාවේ වැය ශීර්ෂය යටතේ වැටුප් ගෙවා තිබුණි. එම වියදම දෙපාර්තමේන්තුවේ වියදම් ප්‍රකාශයේ හෝ අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ වියදමක් ලෙස දක්වා නොතිබුණි.	2023	වියදම් නිසි පරිදි පුරෝකථනය කර වැය විෂයයට අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළයුතු වීම.	නාවික හමුදාව විසින් ද්විතීක පදනම මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇති නිලධාරීන්ට ආරම්භයේ සිටම වැටුප් හා වේතන නාවික හමුදාව විසින්ම ගෙවා ඇති බව දන්වා ඇත.	වැටුප් හා වේතන ගෙවීම සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් උපදෙස් ඉල්ලා ඇත.
08	යෝජිත නව ගොඩනැඟිලි දෙකක් ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා රු. 82,700,000 ක ශුද්ධ	2023	ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතා	ආරක්ෂක අමාත්‍යාංශය විසින් මේ සම්බන්ධයෙන් උපදෙස්	2025 වසර සඳහා " වරුණ" ආයතනයේ හා " රෝහණ"

	ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අදාල ඉදිකිරීම් කටයුතු අත්හැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයෙහි ඉතිරිවීම් රු. 68,989,858 ක් වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 ක් වී තිබුණි.		වයකින් යුතුව උපයෝජනය කළ යුතු වීම.	ලබා දී නැති බව දන්වා ඇත.	ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් නව ඇස්තමේන්තු ඉදිරිපත් කර නැති බව දන්වා ඇත.
09	ශ්‍රී ලංකා මුහුදු තීරයේ පවතින බහුදින ධීවර යාත්‍රා සහ එක්දින ධීවර යාත්‍රා දෙපාර්තමේන්තුව මඟින් අදාල ධීවර වරායන්හි ලේඛණගත කර තිබුණද, එම යාත්‍රාවන්ට අදාල තොරතුරු ඇතුළත් කරමින් මධ්‍යගත දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023	මධ්‍යගත දත්ත පද්ධතියක් සකස්කරගත යුතු බව.	ප්‍රාදේශිය අධ්‍යාක්‍ෂකවරුන් විසින් ධිවර යාත්‍රාවන්හී තොරතුරු ඇතුලත් කිරීම සඳහා ධීවර කාර්යාල පිහිටුවා ඇති බව දන්වා ඇත.	මධ්‍යගත පද්ධතියක් සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් හැකිතාක් දුරට සෑම දත්තයක්ම ගබඩා කර තබා ගැනීමේ ප්‍රයත්නයක යෙදී ඇති බව වාර්තා කර ඇත.
10	වැල්ලවත්තෙහි පිහිටි වෙරළ ආරක්ෂක වරුණ ආයතනය සඳහා නේවාසික හා පරිපාලන පහසුකම් සහිත නව සිව් මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ පළමු අදියර වෙනුවෙන් 2022 සහ 2023 වර්ෂ වෙනුවෙන් රු. 40,000,000 ක ප්‍රතිපාදන වෙන්වී තිබුණි. එම ප්‍රතිපාදන වලින් 2022 වර්ෂයේ රු. 4,728,914 ක් සහ 2023 වර්ෂයේ රු. 13,052,119 ක් ලෙස එකතුව රු. 17,781,033 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය මිළදී ගෙන වැල්ලවත්ත ප්‍රාදේශීය මූලස්ථානයේ ගබඩාකර තිබුණද ඉඩමේ අයිතිය සම්බන්ධ ගැටලුව මත ඉදිකිරීම් නවතා දමා තිබුණි. මිළදී ගන්නා ලද අමුද්‍රව්‍ය කෘමී සතුන්ගෙන් හා මුහුද ආසන්නයේ පැවතීම හේතුවෙන් විනාශ වී යාමේ අවධානමක් පැවතුණි.	2023	ඉදිකිරීම් ද්‍රව්‍යවල ආරක්ෂාව හා උපයෝජනය පිළිබඳ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම.	එම අමුද්‍රව්‍ය ආරක්‍ෂිතව හා නිසියාකාරව ශ්‍රීලංවෙආ වරුණ ආයතනයේ ගබඩා කර ඇති අතර, පවතින දැව වර්ග (ජ්ලයිවුඩ් හා II වන පංතියේ දැව) වර්ග කෘමි සතුන්ගෙන් හා මුහුද ආසන්නයේ පැවතීම හේතුවෙන් ඇතිවන පරිසර තත්ව මත විනාශ වීමේ අවධානමක් පවතී. මෙම ව්‍යාපෘතියට අදාලව 2022 වර්ෂයේ ගෙන්වන ලද දැව දැනටමත් විනාශවීමේ අවධානමකට ලක්ව ඇත.	මෙම ව්‍යාපෘතියට අදාල අමුද්‍රව්‍ය වෙනත් ව්‍යාපෘතියකට යොමු කිරීමට හෝ වෙනත් සුදුස්සක් කිරීමට යෝජනා කර ඇත.
11	2023 වර්ෂය තුළදී වෙරළ ආරක්ෂක විෂයයට අදාල	2023	පුහුණු පාඨමාලා සඳහා	නොවැලක්විය හැකි හේතූන් මත සාමාන්‍ය	දින 30 ඉක්මවූ විදේශීය පාඨමාලා

	දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සම්පූර්ණ කරන ලද නිලධාරීන් හා නාවිකයින් 13 දෙනෙකු අදාළ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මාසයකට අඩු කාලයක සිට මාස 09 ක කාලයක් තුළදී නැවත නාවික හමුදාව වෙත අනුයුක්ත කර තිබීමෙන් එම නිළධාරීන් හා නාවිකයින්ගෙන් දෙපාර්තමේන්තුවට ලබාගත හැකිව තිබූ සේවාව අවම වී තිබුණි. එමෙන්ම විදේශීය පුහුණු පාඨමාලාවලදී එම පුහුණු පාඨමාලාවේ බැඳුම්කරයේ සඳහන් අවම කාලසීමාවන් සම්පූර්ණ කිරීමට ප්‍රථම දෙපාර්තමේන්තු සේවාවෙන් ඉවත්ව යාමට සිදු වී තිබූ අවස්ථාද විගණනයට නිරීක්ෂණය විය.		අදාල ගිවිසුම් ප්‍රකාර කටයුතු කළයුතු වීම.	අනුයුක්ත කරන වසර 02 ක කාලය සම්පූර්ණ නොකර අඩු කාලසීමාවකදී නැවත කැඳවීම් සිදුවන බව දන්වා ඇත.	සම්පූර්ණ කළ නිලධාරීන් පමණක්, පාඨමාලාව අවසන් කළ දින සිට ඉදිරි වසර 02ක කාලයක් සඳහා ගිවිසුම් අත්සන් කරනු ලබන බව දන්වා ඇත.
12	වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තු පනත පරිච්චින්න කර නව පනතක් සම්පාදනය කිරීම සඳහා 2016 වර්ෂයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නව පනත සම්පාදනය කිරීමට අපොසහාසත් වී තිබුණි.	2023	නව පනත සම්පාදනය කඩිනමින් අවසන් කළයුතු වීම.	පනත පරිච්චින්න කර නව පනතක් සකස්කර ඇති බව දන්වා ඇත.	ඉදිරි කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.
13	නිල ඇඳුම් නිකුත් කිරීමේදී දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක පරිගණක පද්ධතියේ ගැටළුකාරී තත්වය මත තොගය යාවත්කාලීන වීමේ දෝෂයක් පැවතියද එම පරිසණක පද්ධතිය ක්‍රමවත් කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි.	2023	පරිගණක පද්ධතිය යාවත්කාලීන කර පවත්වාගත යුතුවීම.	පරිසණක පද්ධතිය නිසි අයුරින් ක්‍රමවත්ව යාවත්කාලීන කිරීම සඳහා තාක්ෂණික දෙපාර්තමේන්තුව දැනුවත් කළ බව දන්වා ඇත.	නාවික හමුදා මූලස්ථානය හා සම්බන්ධ වී කඩිනමින් මෙම පද්ධතියට අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකරමින් පවතින බව දන්වා ඇත.
14	දෙපාර්තමේන්තුවේ බටහිර ප්‍රාදේශිය මූලස්ථානය පිහිටි පර්චස් 132.64 ක් වූ වැල්ලවත්ත භූමිය මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ	2023	සුදුසු භූමියක් ලබා ගැනීම සිදු කළ යුතු වීම.	පවතින ගැටළුකාරී තත්වය පැහැදිලිකර ගැනීමට ජනාධිපති කාර්යමණ්ඩල ප්‍රධානී සමඟ සාකච්ඡාවක්	ඉදිරි කටයුතු සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

	වැඩි දියුණු කිරීමේ ආයෝජන ව්‍යාපෘතිය සඳහා කොළඹ මහ නගර සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පැවතියද, මෙම ප්‍රාදේශීය මූලස්ථානය පිහිටුවීම සඳහා සුදුසු භූමියක් සොයා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි.			ඉල්ලා ඇති බව දන්වා ඇත.	
15	ශ්‍රී ලංකා වටා ඇති මුහුදු තීරය දෙපාර්තමේන්තුවේ රාජකාරී අවශ්‍යතාවය මත කලාප හතරකට බෙදා ඇති අතර එම කලාප හතර සඳහා 573 ක කාර්යය මණ්ඩලයක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුයුක්ත කර තිබුණු අතර තවදුරටත් 106 ක කාර්යය මණ්ඩලයක් අවශ්‍ය බවට හඳුනාගෙන තිබුණි. එසේ වුවද, එම එක් එක් කලාපය සඳහා අනුයුක්ත කළ යුතු අනුමත කාර්යය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබීම නිසා කාර්යමණ්ඩලයේ ඌණතාවයක් හෝ අතිරික්තයක් පවතීද යන්න නිශ්චිතව ප්‍රකාශ කළ නොහැකි විය.	2023	එක් එක් කලාපය සඳහා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට හා අනුයුක්ත කර ගැනීමට ක්‍රියා කළ යුතු වීම.	කලාප අනුව පවතින රාජකාර ඉටුකිරීමේදී පුරප්පාඩු හඳුනාගෙන ඇති බව දැනුම් දී ඇත.	එක් එක් කලාපයේ පවතින පුරප්පාඩු සංඛ්‍යා හඳුනාගෙන ඇති බව දන්වා ඇත.

93. ශීර්ෂය - 326 ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	80,323,207	236,595	80,086,612	තත්ත්වාගණනය නොකළ
2022	81,351,650	195,224	81,156,426	තත්ත්වාගණනය කළ
2023	102,760,150	58,750	49,586,640	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2018 ජනවාරි 24 දිනැති අංක 02/2024 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (i) ඡේදය ප්‍රකාරව ආයතනයේ සේවය නියුතු සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතු වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි.	2021 2022 2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරින් සහ ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා ගිවිසුම් යොමුකර ඇති අතර, මේ වන විට නැවත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018(1) අනුව කටයුතු කරමින් පවතින බව දන්වා තිබුණි.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2008(1) අනුව මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2024 සිට 2029 දක්වා කාලසීමාවට සකස් කර ඇත.
02	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.i ඡේදය ප්‍රකාරව කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වසරකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු විය යුතු වුව ද, එසේ පුහුණු සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර නොතිබුණි.	2022 2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මානව සම්පත් සැලැස්ම අනුව වාර්ෂික පුහුණු සැලැස්මක් සකස්කර නොමැති වුවත්, සකස් කර ඇති වාර්ෂික පුහුණු සැලැස්මට සියලුම නිලධාරීන් ආවරණය වන පරිදි සකස්කර තිබුණ ද, ප්‍රතිපාදන ගැටලු මත පුහුණුවීම් ලබාදිය නොහැකි වූ බව දන්වා තිබුණි.	2024 වර්ෂය සඳහා මේ වන විට ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී, ප්‍රජා විශෝධන නිලධාරී, සංවර්ධන නිලධාරී සහ වැඩ පරීක්ෂක නිලධාරීන් සඳහා වාර්ෂික පුහුණු සැලැස්ම අනුව පැය 12ට නොඅඩු පුහුණු අවස්ථා ලබාදී ඇති අතර, ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුතු කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, ලිපිකරු සහ කා.කා.ස. නිලධාරීන් සඳහා 2024 නොවැම්බර් 26 සහ 27 යන දිනයන්හි දෙදින පුහුණු වැඩමුළුවක්

					සංවිධානය කර ඇත.
03	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තියට අනුව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.	2021 2022 2023	විගණන පනතට අනුකූලව කටයුතු කළ යුතුය.	අභ්‍යන්තර විගණකවරයෙකු දෙපාර්තමේන්තුවේ නොමැති බැවින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි.	අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර එවන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇති අතර, මේ වන තෙක් පත්කර නොමැත.
04	රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 880 අනුව රජයේ නිලධාරින්ට ඇප තැබීම පිළිබඳව, රාජ්‍ය මුදල් ආදියේ භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරින් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන්කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315 හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරින් අදාළ ඇප මුදල් තැන්පත්කර නොතිබුණි.	2021 2022 2023	චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කළ යුතුය.	මීට අදාළ ආකෘති සහ ලේඛන අධිකරණ අමාත්‍යාංශයේ ඇප සම්බන්ධ අංශයෙන් මේ වන විට ලබාගෙන ඇති අතර, ඇප තැබීමට අවශ්‍ය නිලධාරින් හඳුනාගෙන එම නිලධාරින්ගේ විස්තර සහ ආකෘති සම්පූර්ණකර අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යැවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව දන්වා තිබුණි.	මේ වන විට අදාළ ආකෘතිපත්‍ර අධිකරණ අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇති අතර, එක් නිලධාරියෙකුට අදාළ ආකෘතිපත්‍ර පුරවා එම ආකෘතිපත්‍රවල හරි වැරදි පරීක්ෂා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ ඇප අංශය සමඟ සම්බන්ධ වෙමින් ඉදිරි කටයුතු සිදු කරමින් පවතී.
05	නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම අධීක්ෂණය කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ඇතුළු දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාල ආවරණය වන පරිදි	2022 2023	ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු ය.	ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලවල සවිකර ඇති ඇඟිළි සලකුණු යන්ත්‍ර ප්‍රධාන කාර්යාලය හා මධ්‍යගත කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර, ඇඟිළි සලකුණු යන්ත්‍ර 96 න්	ප්‍රාදේශීය කාර්යාල 91 ක් මේ වන විට ප්‍රධාන කාර්යාලය හා මධ්‍යගත වී ඇති අතර, දෝෂ සහිත ඇඟිළි සලකුණු යන්ත්‍ර 04 ක් අලුත්වැඩියා කිරීම සඳහා අනුමැතිය

	2018 වර්ෂයේ රු.2,889,145 ක් වැයකර ඇඟිලි සලකුණු යන්ත්‍ර 97 ක් ස්ථාපිතකර තිබුණු අතර, ප්‍රාදේශීය කාර්යාල බොහෝමයක අඩු පහසුකම් සහිතව කුඩා කාමරවල පවත්වාගෙන යන කාර්යාලවල තාවකාලික විදුලි පරිපථ සකස්කර මෙම යන්ත්‍ර සවිකර තිබුණි. ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සියලු ප්‍රාදේශීය කාර්යාලවල තොරතුරු ලබාගැනීමේ දත්ත පද්ධතිය සමාලෝචිත වර්ෂය තුළදී ද, වැඩි දියුණුකර නොතිබීම තුළ ඇඟිලි සළකුණු යන්ත්‍ර ස්ථාපනය කිරීමෙන් අපේක්ෂිත අරමුණු ළඟාකර ගෙන නොතිබුණි.			යන්ත්‍ර 84 ක් පමණ මේ වනවිට මධ්‍යගතකර ඇති අතර, එහි පිටපත් ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන කාර්යාලවලට ප්‍රධාන කාර්යාලය මඟින් යොමු කරනු ලබන බව දන්වා තිබුණි.	ලබාදී ඇත. ඇඟිළි සලකුණු යන්ත්‍ර සවිකර නොමැති කාර්යාල සඳහා පවතින ප්‍රතිපාදන යටතේ අලුතින් ඇඟිළි සලකුණු යන්ත්‍ර 05 ක් මිලදී ගැනීම සඳහා කටයුතු කර ඇත.
06	පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය ඉදිකිරීම ප්‍රමාදවීම නිසා ප්‍රජා විශෝධන ක්‍රියාවලියේ නියැලී සිටින නිලධාරින්ට, ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශනයට ලක්කිරීම හා අනෙකුත් කාර්යාල කටයුතු විවිධ දුෂ්කරතා යටතේ අධිකරණ පරිශ්‍රයේ පිහිටි අඩි 11 x 11 වර්ග ප්‍රමාණයකින් යුත් කුඩා කාමරයක පවත්වාගෙන ගොස් තිබුණු අතර, 2022 ජුනි 21 දින ඇති වූ ගින්නකින් කාර්යාලයේ පැවති රු. 163,302 ක් වටිනාකමැති පරිගණක යන්ත්‍රය, ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිලි සළකුණු යන්ත්‍රය හා අනෙකුත්	2022 2023	විමර්ශන කටයුතු ආරම්භ කර වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතු ය.	කාර්යාලය ගිනිගැනීමට අදාළව මූලික පරීක්ෂණ වාර්තාවක් සහ මෙහි සඳහන් කාර්යාල උපකරණ වර්ග 06 පොත්වලින් කපා හැරීම සඳහා නැවත පූර්ණ විමර්ශනයක් සිදුකර එම වාර්තාව ද සමඟ විනාශ වූ භාණ්ඩ පොත්වලින් කපා හැරීම සඳහා අනුමැතිය ඉල්ලා අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමුකළ ද, පුත්තලම කාර්යාලය ගිනි ගැනීමට අදාළව නඩුවක් පවතින බැවින් එම නඩුවේ තීරණය ලැබෙන තෙක් තීරණයක් ලබාදිය නොහැකි බවට අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා තිබුණි.	පුත්තලම කාර්යාලය ගිනි ගැනීමට අදාළව නඩුවක් පවතින බැවින්, එම නඩුවේ තීරණය ලැබෙන තෙක් තීරණයක් ලබාදිය නොහැකි බවට අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇත.

	කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භ කර නොතිබුණි.				
07	දෙපාර්තමේන්තුව විසින්, විනාශ වූ පුත්තලම ප්‍රජා විශෝධන කාර්යාලය වෙනුවට වෙනත් තාවකාලික ස්ථානයක් සොයා ගැනීමට හෝ අඩක් ඉදිකරන ලද ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කරගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතුකර නොතිබුණි.	2023	ස්ථානයක් සොයා ගැනීම හෝ ඉදිකිරීම් කටයුතු අවසන්කර ගැනීම කඩිනම් කළ යුතු ය.	දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු රැස්වීමේ යෝජනා සහ තීරණය අනුව පුත්තලම ප්‍රජා විශෝධන කාර්යාලය ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් ලබාදෙන ලෙස අධිකරණ අමාත්‍යාංශය දැනුවත්කර ඇති බව දන්වා තිබුණි.	පුත්තලම ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා සුදුසු ස්ථානයක් වෙන්කර දෙන ලෙස අධිකරණ අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. ඒ අනුව පුත්තලම අධිකරණ භූමියේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා අඩක් නිම කළ ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස්කර එවන ලෙස පුත්තලම මහාධිකරණ තාක්ෂණ නිලධාරී වෙත අධිකරණ අමාත්‍යාංශය විසින් 2024 ජුනි 11 දිනැතිව ලිපියක් යොමුකර ඇත.
08	2020.08.28 දිනැති අංක 2/2020 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුව ද, 2023	2023	යොමුගත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	ඉදිරි වර්ෂයේ පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි අතර, ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර 2022 දෙසැම්බර් 20 දින අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත අනුමැතිය සඳහා යොමුකර ඇති	පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි අතර, ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර 2025 සිට අදාළ චක්‍රලේඛය අනුව කටයුතු සිදුකරමි.

	වර්ෂය සඳහා වන ප්‍රසම්පාදන සැලැස්ම තුළ ප්‍රාග්ධන වැඩසටහන් පමණක් ඇතුළත්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විසින් 2022 දෙසැම්බර් 30 දින අනුමතකර තිබුණි.			අතර, මෙම වර්ෂයේ සිට අදාළ පරිදි කටයුතු කරන බව දන්වා තිබුණි.	
09	සියලුම වාර්තාකරන ආයතන විසින් තැන්පතු සඳහා සැසඳීම් ප්‍රකාශය පිළියෙලකර 2024 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත පිටපතක් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුව ද, එසේ සිදුකර නොතිබුණි.	2023	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	මින් ඉදිරියට මෙවැනි අවස්ථා නොවීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	මින් ඉදිරියට මෙවැනි අවස්ථා නොවීමට කටයුතු කරමි.
10	පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රජා විශෝධන දෙපාර්තමේන්තුවේ 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.1,009,934 ක මුදල් වියදම් කර තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන්වී නොතිබුණි.	2022 2023	ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන්කර ගැනීමට කටයුතු කළ යුතු ය.	2010 වර්ෂයේ මෙම ගොඩනැගිල්ලට අදාළව ප්‍රසම්පාදන කටයුතු, කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සහ ගෙවීම් කටයුතු සියල්ල අධිකරණ අමාත්‍යාංශය විසින් සිදුකර ඇති අතර, අතරමග නවතා ඇති කොටස නැවත කඩිනමින් සකස්කර ලබාදෙන ලෙස ලිඛිතව අමාත්‍යාංශය දැනුවත් කළ ද, මෙවන තෙක් පිළිතුරු ලැබී නොමැති නිසා නැවත වරක් මේ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලිඛිතව දැන්වීමට කටයුතු කරන බව දන්වා තිබුණි.	පුත්තලම අධිකරණ භූමියේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා අඩක් නිමකළ ගොඩනැගිල්ල ඉදිකිරීම අවසන් කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස්කර එවන ලෙස පුත්තලම මහාධිකරණ තාක්ෂණ නිලධාරී වෙත අධිකරණ අමාත්‍යාංශය විසින් 2024 ජුනි 11 දිනැතිව ලිපියක් යොමුකර ඇත.

94. ශීර්ෂය - 327 ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	587,797,626	4,000	587,793,626	තත්ත්වාගණනය නොකළ
2022	581,616,194	136,665	581,479,529	තත්ත්වාගණනය නොකළ
2023	581,325,702	6,000	581,319,702	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01.	ශ්‍රී ලංකාවේ භූමි සම්පත් ප්‍රශස්ත හා තිරසාර ලෙස කළමනාකරණය කිරීම සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සංශෝධනයට 2018 අගෝස්තු මාසයේදී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යයක් වන ශ්‍රී ලංකාව සඳහා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සකස්කිරීම සහ කාලීන අවශ්‍යතාවයන් අනුව එය සංශෝධනය කිරීමට සකස් කළ අවසන් කෙටුම්පත ඉඩම් හා සංවාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු අවසන් කර නොතිබුණි.	2023	ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු කඩිනමින් අවසන් කරගත යුතුය.	විගණකාධිපති නිර්දේශය ලෙස දක්වා ඇති පරිදි ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත.(මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය)	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය සැකසීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර ඉඩම් අමාත්‍යාංශය විසින් අවසන් කරන ලද ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.
02.	දෙපාර්තමේන්තුව සඳහා අනුමත සේවක සංඛ්‍යාව 697 ක් වන නමුත්, තථ්‍ය සංඛ්‍යාව 620 ක් වූ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු	2023	කාර්ය සාධන දර්ශක පදනම්ව අනුමත සේවක සංඛ්‍යාවන්	මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පිළිබඳ සමාලෝචනය කර අවශ්‍ය නිර්දේශ	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් එම කාර්ය මණ්ඩල

21 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 1 ක්, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 36 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 19 ක් සමඟ මුළු පුරප්පාඩු 77 ක් පැවතිණි.		පිළිබඳව නැවත සමාලෝචනය ක් සිදු කළ යුතු වේ.	2024.02.13 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර 2024.04.29 දින ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේදී පවත්වන ලදී.	සංශෝධනය මෙතෙක් අනුමත කර නොමැත.

95. ශීර්ෂය - 328 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	178,315,366	191,900	178,123,466	තත්ත්වාගණනය කළ
2022	194,591,476	532,406	194,059,070	තත්ත්වාගණනය නොකළ
2023	207,178,640	352,690	206,825,950	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රැකියා පියස වැඩසටහන යටතේ වූ කොරියානු ජනරජයේ රැකිරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය විසින් කොරියානු - ශ්‍රී ලංකා ප්‍රතිපත්ති උපදේශනාත්මක වැඩසටහනට අදාල ව්‍යාපෘතිය සේවා නියුක්ති ප්‍රතිපත්ති සහ ශ්‍රම වෙළඳපොල සක්‍රීයකරණ වැඩසටහන් මහජන රැකියා සේවා සංවිධානය කිරීම, ව්‍යුහය හා වැඩසටහන් පිළිබඳ ඵලදායී ක්‍රමවේද හුවමාරු කිරීම යන ක්ෂේත්‍ර යටතේ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වී තිබුණි. ඒ අනුව 2020 ජුනි 23 දින ශ්‍රී ලංකාවේ මහජන රැකියා සේවය නඟාසිටුවීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනයට අදාල ව්‍යාපෘති සංකල්ප පත්‍රිකාව ඇඟයීම සඳහා 2020 නොවැම්බර් 18 වන දින ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ එකඟතාවය ලබාගෙන තිබුණි. කොරෝනා වසංගතය හේතුවෙන් මෙම ව්‍යාපෘතියට අදාළව කිසිදු ක්‍රියාකාරකමක් 2021 වසරේ සිදු වී නොතිබුණු බැවින් මෙම ව්‍යාපෘතියට අදාලව ප්‍රගතියක් අත්කරගෙන නොතිබුණි.	2021 2022	අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට සහ කාර්යය සාධනය උපරිමයට ලබා ගත හැකි පරිදි ව්‍යාපෘති සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම.	මෙම ව්‍යාපෘතියට අදාළ කිසිදු ක්‍රියාකාරකමක් 2021 වසරේ සිදුනොවුණි. 2022/02/23 වන දින මාර්ගගත ක්‍රමය ඔස්සේ මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල් ප්‍රධානත්වයෙන් කොරියානු රජය සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී කොරියානු රජය විසින් ඉදිරි සැලසුම් ඉදිරිපත් කිරීමට එකඟ වු අතර එම සැලසුම් පිළිබඳව සාකච්ඡා කර ඇත. 2022/03/23 දින මෙම ව්‍යාපෘතියෙහි වර්තමාන තත්වය හා ඉදිරි සැලසුම් පිළිබඳව වැඩිදුරටත් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කල අතර මෙම ව්‍යාපෘතියෙහි යෝග්‍යතාවය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලය හරහා වාර්තාවක් ලබා ගැනීමට යෝජනා කරන ලද අතර කොරියානු රජය විසින් තොරතුරු තව දුරටත් ලබා දීමට එකඟ විය.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතී.

02	ශ්‍රම වෙළඳපොල තොරතුරු සඳහා කලමණාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීමට අදාලව 2021 දෙසැම්බර් 31 දිනට මෘදුකාංග ආයතනයක් තෝරා ගැනීමට ප්‍රසම්පාදන කටයුතු පමණක් ආරම්භ කර තිබුණු අතර එම ව්‍යාපෘතියේ ප්‍රගතියක් අත්කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය.	2021 2022 2023	අපේක්ෂිත අරමුණු ඉටු කර ගත හැකි ආකාරයට සහ කාර්යය සාධනය උපරිමයට ලබා ගත හැකි පරිදි ව්‍යාපෘති සැළසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම.	ප්‍රසම්පාදන කටයුතු හරහා Belvantage (Pvt) Ltd ආයතනය මෙම කළමණාකරණ තොරතුරු පද්ධතිය ගොඩනැගීම සඳහා තෝරාගන්නා ලද අතර එහි පළමු අදියර ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් රුපියල් 1,980,000.00 මුදලක් Belvantage (Pvt) Ltd ආයතනය වෙත ලබා දෙන ලදි.	තොරතුරු කළමනාකරණ පද්ධතිය අවසන් වී නොමැත.
03	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු බවට අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2022 2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම	අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතිය සමාලෝචනය කර ඉදිරියේදී වාර්තා කිරීමට කටයුතු කරන බව.	මෙතෙක් වාර්තාව ලබාදී නැත.
04	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍ර අංක 1640/31 අනුව කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීම 2010 ජනවාරි 01 දින සිදුකලද, එහි මූලික අරමුණ වූ “මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම” යන මූලික	2022 2023	ආයතන ස්ථාපිත කිරීමේ මූලික අරමුණ ඉටුකර ගැනීමට ක්‍රියාකල යුතු වීම.	වාර්ෂිකව වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ප්‍රතිපත්ති සම්පාදනය කර වසර 5 ක් ඉක්මවා ඇති අතර නැවත සංශෝධනයට අවශ්‍ය ප්‍රතිචාර ලැබී නොමැත.	ප්‍රතිපත්ති මෙතෙක් ක්‍රියාත්මක කර නැත.

	අරමුණ ඉටුකර ගැනීමට 2022 වර්ෂය වන විටත් නොහැකි වී තිබුණි.				
05	ශ්‍රම වෙළඳපොල තොරතුරු රැස්කිරීම පදනම් කර ජනාධිපති කාර්යාලය මගින් දෙපාර්තමේන්තුවට යොමුකරන ලද තරුණ මානව සම්පත් දත්ත බැංකුවක් ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ (ස්මාර්ට් ශ්‍රී ලංකා ව්‍යාපෘතිය) ප්‍රගතිය සම්බන්ධයෙන් මොරටුව විශ්ව විද්‍යාලය මගින් කරන ලද පරීක්ෂණ වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ අනුව පද්ධතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු කරගත නොහැකි බැවින් මෘදුකාංගය ස්ථාපිත කිරීමේ අරමුණු ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ව්‍යාපෘති සඳහා සමාලෝචිත වර්ෂය වන විට දෙපාර්තමේන්තුව විසින් 2021 හා 2022 වර්ෂවලදී රු.84,082,617 ක වියදමක් දරා තිබූ අතර පරිගණක උපාංග, ගෘහ උපකරණ හා ලීබඩු මිලදී ගැනීම සඳහා ඉහත ව්‍යාපෘති යටතේ රු.83,582,617 ක් වැයකර තිබුණි.	2022	අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා ගැනීමට කටයුතු කල යුතුය.	රට තුල පැවති විවිධ අර්බුද හේතුවෙන් පොදුවේ මහජනතාව මෙන්ම රාජ්‍ය ආයතනවලටද බලපෑම් ඇති කරන ලදී. ලබාගත් ලී බඩු හා උපකරණ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් භාවිතා කරනු ලබයි.	මෙම ව්‍යාපෘතිය අතහැර දමා ඇත.
06	රැකියා අපේක්ෂකයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා රැකියාගත කිරීම පිළිබඳ 2018–2022 දක්වා කාලවකවානුවෙහි රු.11,372,667 ක මූල්‍ය පිරිවැයක් දරා තිබූ නමුත් රැකියා අපේක්ෂකයන් රැකියාගත කිරීම සියයට 10–16 අතර පරාසයක විය. එම රැකියාගත කිරීම්වල නිරතවීම පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැති බව නිරීක්ෂණය විය.	2022	රැකියා අපේක්ෂකයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා රැකියාගත කිරීමට කටයුතු කළ යුතුය.	මාර්ගගත රැකියා සේවා සංවර්ධනය කිරීමේ පද්ධතිය මගින් පසුවිපරම් ක්‍රියාවලිය ඉටුකිරීමේ පහසුකම සැලසෙනු ඇත.	පසුවිපරම් ක්‍රියාවලිය විධිමත් පරිදි සිදු නොකරයි.
07	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1)(ඊ) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන	2022 2023	අභ්‍යන්තර විගණනය ශක්තිමත්	පුරප්පාඩු සඳහා ඉල්ලීම් කර ඇතත් ප්‍රමුඛතාවය ලැබී නොමැත.	අභ්‍යන්තර විගණනය විධිමත් පරිදි සිදු නොවේ.

	ගණන්දීමේ නිලධාරියෙකු සහ ගණන්දීමේ නිලධාරියෙකුගේ වගකීම් යටතේ අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට සහතික විය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිලධාරී තනතුර වසර කිහිපයක් තිස්සේ පුරප්පාඩුව පැවතීමෙන් එම කර්තව්‍ය නිසි පරිදි සිදු වී ඇතිද යන්න පිළිබඳව ගැටළු සහගත විය.		කිරීමට ක්‍රියාකල යුතුය.		
08	මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට අදාලව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 05/2023 දරණ උපදෙස් මාලාවේ 8.2 වගන්තිය ප්‍රකාරව මූල්‍ය නොවන වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කල අගයට ගිණුම්ගත කලයුතු වුවද, 2023 වර්ෂයේ දෙපාර්තමේන්තුව නමට ලියාපදිංචි කරන ලද මිනි වෑන් රථයේ අගය හඳුනාගෙන නොතිබූ අතර ලියාපදිංචිය සඳහා වැයවූ රු.1,500,000 පමණක් සිගාස් වැඩසටහන තුල වාර්තා කර තිබුණි.	2023	වත්කම් පිරිවැය නිවැරදිව ගිණුම්ගත කල යුතුය.	මිනි වෑන් රථයේ මිලදී ගැනීමේ වටිනාකම අප දෙපාර්තමේන්තුව සතුව නොමැති අතර ඉදිරියේදී එහි වටිනාකම තක්සේරු කර Cigas වැඩසටහනට වත්කම් ලෙස ඇතුලත් කිරීමට කටයුතු කරමින් පවතින බව.	තක්සේරු කිරීම සිදුකර නොමැත.
09	මු.රෙ.880 ප්‍රකාරව රජයේ මුදල්, ආදායම් හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුවර සහතික කරන,	2023	මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය.	මෙතෙක් මෙම දෙපාර්මේන්තුවේ නිලධාරින් ඇප තැබීමක් සිදු කර නොමැති බැවින්, ඒ පිළිබඳ තීරණය කිරීම රාජ්‍ය මුදල් චක්‍රලේඛ 07/2019 අනුව අමාත්‍යාංශ ලේකම්වරයෙකුට කළ හැකි බැවින් ඒ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම් වෙතින් විමසන ලෙස වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් ලිඛිත උපදෙස්	ඇප තැබීමේ ක්‍රියාවලිය අවසන් කර නොමැත.

	චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත අනුව ඇප තැබිය යුතු වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ එවැනි ඇප තැබීමක් නිරීක්ෂණය නොවීය.			ලබා දෙන ලදී.	
10	දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල නිරූපණය නොවූ “ගරුසරු” නමින් වැඩසටහනක් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ අතර, මෙම වැඩසටහන සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීමට රු.342,456 ක් වැය දරා තිබුණි.	2023	අනුමත සැලසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය.	ව්‍යාපෘතියේ සමාරම්භක වැඩසටහන 2023.11.01 දින ගරු කම්කරු හා විදේශ රැකියා ආමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් විය. අවිධිමත් අංශයේ රැකියාවල නියුතු වූවන් ඉලක්ක කරගනිමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්‍රියාත්මක වන මෙම වැඩසටහනට අදාල පූර්ව ප්‍රචාරක කටයුතු සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ පූර්ව අවසරය මත මෙම වියදම් දරා ඇති බව.	ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයක් සිදුකර නොමැත.
11	ශ්‍රම වෙළඳපොලට වඩාත් ගැලපෙන යෝග්‍ය කුසලතාවලින් යුතු මානව සම්පතක් බිහිකිරීමේ වැය විෂය යටතේ ප්‍රවර්ධන වීඩියෝ වැඩසටහන් 13 ක් නිර්මාණයට හා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් සඳහා ප්‍රවර්ධන වීඩියෝපට 6 ක් නිර්මාණය සඳහා රු.859,935 ක් වැය කර තිබුණද එකී කාර්යයන් අවසන්ව නොතිබුණි.	2023	කාර්යභාරය න් ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය.	වැය ශීර්ෂ 328-2-2-4-2509 යටතේ ප්‍රවර්ධන වීඩියෝපට 06ක් (එනම් සිංහල මාධ්‍ය 03ක් සහ එය දෙමළ මාධ්‍ය පරිවර්ථන 03ක් ලෙස) සකස් කිරීමට කටයුතු කෙරිණි. මෙහිදී සිංහල වීඩියෝපට 03 දෙපාර්තමේන්තුව වෙත ලැබුණු අතර, එම සිංහල වීඩියෝපටවල යම් යම් සංස්කරණ සිදුකළයුතු බව නිරීක්ෂණය විය. එම සංශෝධන මේ වන විට සිදුකරමින් පවතින බැවින් එය අවසන් වූ පසුව දෙමළ භාෂා මාධ්‍ය වීඩියෝපට සංස්කරණය කිරීමට නියමිත බව.	කාර්යය අවසන් කර නොමැත.

12	දෙපාර්තමේන්තුවට අයත් ජීප් රථයක් 2023 මැයි 11 දින අධිවේගී මාර්ගයේදී රේඩියේටරයේ උඩ බාර් කොටස පුපුරා යාම නිසා තලවතුගොඩ ප්‍රදේශයේ ගරාජයකට අලුත්වැඩියාව සඳහා යොමුකර තිබුණි. අදාල ගරාජය 2023 මැයි 25 දින අලුත්වැඩියාව සඳහා රු.1,551,000 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබූ අතර අදාල මිල ගණන් හා අලුත්වැඩියාවන් එම ආයතනයෙන් කර ගැනීමට සුදුසු බවට යාන්ත්‍රික ඉංජිනේරු වරයාගේ නිර්දේශය ලබාදීමට මාස තුනක කාල පමාවකින් සිදුවී තිබුණි. රේඩියේටර් උඩ බාර් කොටස පුපුරා යාම නිසා සිදු වූ හානියක් වාර්තා වී තිබූ අතර, එම හානිය මගින් වාර්තා වී නොතිබූ කාර්යන් සඳහා එකී සියලු අමතර කොටස් යොදා ඇලුත්වැඩියාව සිදු කිරිම කර තිබුණි.	2023	රථවාහන අලුත්වැඩියා වන් නිසි පරීක්ෂාවකින් හා අධීක්ෂණයකි න් සිදුකල යුතුය.	නිරීක්ෂණය පරිදි මෙහි ඇති වූ දෝෂ තතත්වය සම්බන්ධයෙන් රියදුරුගේ දැනුම්දීම මත (දුරකථනය ඔස්සේ) කැරියර් සහිත මිළ ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලෙස ප්‍රවාහන වැඩ මුලික විසින් ලබා දුන් නිර්දේශය මත අලුත්වැඩියා ආයතනය වෙත අදාළ වාහනය යොමු කර ඇත. රථය අළුත්වැඩියාව සම්බන්ධයෙන් එවකට සිටි ප්‍රවාහන වැඩ මුලික හා යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශ ඇතුළත් ලිපි අමුණා ඇත. මෙම සිදුවීමෙන් පසු 2023 මැයි මස මෙම දෙපාර්මේන්තුව වෙත ස්ථානමාරුවී පැමිණි නව අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාළ මිල ඇස්තමේන්තුව ඉහළ වටිනාකමකින් යුක්තවීම හේතුවෙන් මෙම රථයේ අළුත්වැඩියාව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය මත සිදු කිරීමට තිරණය කර ඇත. නව යාන්ත්‍රික ඉංජිනේරුගේ නිර්දේශය 2023.08.22 දිනැතිව ලබා ගැනීමෙන් පසු එම මිල ඇස්තමෙන්තුව ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කර අදාළ අළුත්වැඩියාව සිදු කර ඇති බව.	නිරීක්ෂණය සම්බන්ධව පසුවිපරම් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
13	දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවා අංශය විසින් පවත්වන රැකියා පොළ, වෘත්තීය පොළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ඒ සම්බන්ධ වීඩියෝ පට සැකසීම, වෙබ් අඩවියේ පළකිරීම, ෆේස්බුක් පිටුවේ පලකිරීම සඳහා රු.548,435 ක්	2023	වත්කම් අවශ්‍යතාවය මත ප්‍රසම්පාදනය කලයුතු අතර උපරිම කාර්යක්ෂම තාවයකින් උපයෝජනය	මහජන රැකියා සේවා අංශයේ ඉල්ලීම පරිදි මෙම කැමරාව මිළදී ගැනීමට කටයුතු කළ අතර ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරන වැය විෂයෙන් කැමරාවද, එහි උපාංග යන්ත්‍ර හා උපකරණ (improvement) වැය	වත්කම් උපරිම කාර්යක්ෂමතාවය කින් භාවිතා නොවේ.

	වැයකර කැමරාවක් හා උපාංග මිලදී ගෙන තිබුණි. 2022 වර්ෂයේදී මෙකී අවශ්‍යතා සඳහා රු.5,228,193 ක් වැයකර කැමරා 30 මිලදී ගෙන තිබූ නමුත් වීඩියෝ නිර්මාණ සැකසීම සඳහා 2023 වර්ෂයේදීද බාහිර ආයතන සඳහා රු.859,935 ක් ගෙවා තිබුණි.		කල යුතුය.	විෂයෙහි ප්‍රතිපාදන භාවිතා කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කොට මිලදී ගන්නා ලදී. 2022 හි මිලදී ගත් කැමරා ඉහත දැක්වූ පහසුකම් වලින් යුක්ත නොවන අතර, (වීඩියෝ සඳහා විශේෂිත වූ) ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍රයේ වැඩ කරන නිළධාරීන් වෙනුවෙන් ලබා ගන්නා ලද කැමරා වන අතර එම කැමරා දිස්ත්‍රික් සඳහා ලබාදී ඇති බැවින් ඉහත දක්වන ලද විශේෂ අවශ්‍යතාවය මත නව කැමරාවක් ලබාගන්නා ලද බව.	
14	දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා නාගරික සංවර්ධන හා ආයෝජන පුද්ගලික සමාගමට මාසිකව රු.3,548,342 ක කල්බදු වාරිකයක් බැගින් වාර්ෂිකව රු.42,580,104 ක පිරිවැයක් ගෙවීමට සිදුව ඇති අතර, අමාත්‍යාංශය සමඟ කටයුතු කිරීම හා පරිපාලන පහසුව සඳහා මෙහෙවර පියෙස හෝ කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ භාවිතා නොකරන පරිශ්‍රයක ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.	2023	වඩාත් කාර්යක්ෂම ලෙස දෙපාර්තමේන්තුව පවත්වා ගැනීමේ වැයබර දැරිය යුතුය.	මෙම දෙපාර්තමේන්තුව සෙත්සිරිපාය දෙවන මහළ පරිශ්‍රයේ පවත්වාගෙන යාම හේතුවෙන් දරනු ලබන වැය බර අවම කර ගැනීම සඳහා මහලේකම් කාර්යාල පරිශ්‍රයට හෝ මෙහෙවර පියස ගොඩනැගිල්ල අළුත්වැඩියා කර රැගෙන යාම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් යෝජනා කර ඇති නමුත් ඒ සම්බන්ධයෙන් විධිමත් දැනුවත් කිරීමක් සිදුව නොමැති බැවින් ද, එතෙක් මෙම දෙපාර්තමේන්තුව පවත්වාගෙන යාම සඳහා පරිශ්‍රයක් අවශ්‍ය බැවින් ඒ සම්බන්ධ විධිමත් තීරණයක් ගන්නා තෙක් දෙපාර්තමේන්තුව දුරටත් මෙම පරිශ්‍රයේ පවත්වා ගෙන යාම සිදුවන බව.	මෙතෙක් විධිමත් තීරණයක් ගෙන නොමැත.

96. ශීර්ෂය - 329 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	53,244,775	53,244,775	52,916,993	තත්ත්වාගණනය නොකළ
2022	54,773,622	54,773,622	54,054,905	තත්ත්වාගණනය නොකළ
2023	60,375,188	60,375,188	59,970,468	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ සම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් ද තෘතියික මටට්ටමේ තනතුරු 04 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 09 ක් ද ලෙස අනුමත තනතුරු සංඛ්‍යාව 16 කින් වැඩිකර ගෙන තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 73 ක් වූ අතර, ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් ද, තෘතියික මටට්ටමේ තනතුරු 06 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 11 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් ද ඇතුළත්ව තනතුරු 21 ක් පුරප්පාඩුව පැවතුණි.	2023	විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතු වීම.	මෙ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ නිවැරදිය.	ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද තෘතියික මට්ටමේ පුරප්පාඩු 03 ක් ද, ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 14 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 01 ක්ද වශයෙන් 2024 නොවැම්බර් 30 දින වන විට පුරප්පාඩුව පැවතුණි.

97. ශීර්ෂය - 331 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

	මුළු වත්කම්	මුළු වගකීම්	ස්කන්ධය	මතය
	රු.	රු.	රු.	
2021	3,191,743,853,000	25,608,073,000	3,166,135,780,000	තත්ත්වාගණනය කළ
2022	3,491,767,852,000	31,906,612,000	3,459,861,240,000	තත්ත්වාගණනය කළ
2023	3,895,119,583,000	37,713,758,000	3,857,405,825,000	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	2013 අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසයන්හි සහනාධාර ගෙවීම සඳහා එවකට සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් සමෘද්ධි අධිකාරියෙන් ලබාගත් රු.මිලියන 2,374 ක මුදල වසර 10 ක කාලයක් ගත වී ඇතත් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.	2023 2022 2021	ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි.	මෙම මුදල පියවා ගැනීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම.	2023.08.09 දින කැබිනට් සංදේශයක් මඟින් ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර 2024 අයවැයෙන් ප්‍රතිපාදන සලසා ඇතත් මේ දක්වා භාණ්ඩාගාර අක් මුදල් නිදහස් කර නොමැත.
02	2013 අංක 1 දරන දිවිනැගුම ආඥාපනතේ 36 වගන්තිය යටතේ දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවනු ලැබිය යුතු වන අතර දෙපාර්තමේන්තුවට ලැබෙන සියළු ප්‍රදාන, ත්‍යාග පනත යටතේ පිහිටුවන ලද බැංකු හා බැංකු සමිති විසින් ත්‍යාග වෙනත් දායක මුදල්, බැංකු වල ලාභයෙන් අමාත්‍යවරයා නිශ්චය කරනු ලබන මුදල් ප්‍රතිශතයක් වශයෙන් සියළු ලැබීම් ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වේ. ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව දිවිනැගුම සංවර්ධන අරමුදලට බැරකල යුතු වුවත් දිවිනැගුම සංවර්ධන අරමුදල මේ දක්වා පිහිටුවා නොතිබුණි.	2022 2023	පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අරමුදල පිහිටුවිය යුතුය.	දිවිනැගුම සංවර්ධන අරමුදල පිහිටුවීම සම්බන්ධව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා සිටීම.	භාණ්ඩාගාර අනුමැතිය මෙතෙක් ලැබී නැත.

03	**සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙතින් ලබාගත් මුදල් ප්‍රතිපූර්ණය නොකිරීම** සමෘද්ධිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් ගිණුම්වල පවතින මුදල් හා අරමුදල් ගිණුම් වලින් 2020 වර්ෂයේදී ජීවන තත්ත්වය යථා පරිදි පවත්වාගෙන යාමේ අරමුණින් අඩු ආදායම් ලාභී පවුල් වෙත රු. 5,000 ක දීමනාවක් ලබාදීම සඳහා බැංකු පද්ධතිය තුලින් රු. මිලියන 32,418 ක මුදලක් ලබාගෙන 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 03 කට වැඩි කාලයක් ගත් වී තිබූ නමුත් සමෘද්ධි ප්‍රජාමූල බැංකු වෙත එම මුදල් ප්‍රතිපූර්ණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	2023 2022 2021	බැංකු පද්ධතියෙන් ලබාගත් මුදල් බැංකු වෙත නැවත ගෙවීමට කටයුතු කල යුතුයි.	මෙම මුදල පියවා ගැනීම සඳහා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම	2023.08.09 දින කැබිනට් සංදේශයක් මඟින් ප්‍රතිපාදන ඉල්ලා ඇති අතර 2024 අයවැයෙන් ප්‍රතිපාදන සලසා ඇතත් මේ දක්වා භාණ්ඩාගාර අක් මුදල් නිදහස් කර නොමැත.
04	2019 වර්ෂයේ සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව දෙපාර්තමේන්තු විමර්ශන අංශයට මූල්‍ය වටිනාකම රු.මිලියන 234.9 ක් වූ මූල්‍ය වංචා 165 ක් වාර්තා වී තිබුණ අතර ඉන් තවදුරටත් රු.මිලියන 218.4 ක් වූ මූල්‍ය වංචා 98 ක විනය කටයුතු සිදුකරමින් පවතින අතර 2014 ජනවාරි 03 දින සිට 2018 අගෝස්තු 31 දක්වා බැංකු හා බැංකු සමිතිවල සිදු වූ මූල්‍ය අක්‍රමිකතා වලින් රු.මිලියන. 263.8 ක අක්‍රමිකතා 15 ක කටයුතු අවසන් කර නොතිබුණි. නිලධාරීන් විසින් දිගින් දිගටම මෙසේ මූල්‍ය වංචා සිදු කිරීමට බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කිරීම හා විනය නියෝගය තුළින් දඬුවම් ලිහිල් වීමද වංචා වැඩිවීමට හේතුවී තිබුණි	2022 2021 2023	මූල්‍ය වංචා සිදුනොවන ලෙස බැංකු පද්ධතිය තුල පවතින අඩුපාඩු සකස් කල යුතු අතර විනය නියෝග දැඩි කිරීමට හා සිදුකර ඇති වංචා සම්බන්ධව කටයුතු කඩිනම් කළ යුතුයි.	බැංකු පද්ධතිය පරිගණකගත කර නවීකරණය කිරීම හා විනය නියෝග ලබාදීම සම්බන්ධව ක්‍රියා කිරීම.	වංචා හා වැරදි අඩුවීමේ හා විනය නියෝග ලබාදීම පිළිබඳ සැලකිය යුතු ප්‍රගතියක් ලබාගෙන නොමැත.

05	**ප්‍රජාමූල බැංකු වලට පොලී ආදායම උපයා ගැනීම අහිමිවීම** 2023 දෙසැම්බර් 31 දිනට සමෘද්ධිලාභීන්ගේ සහනාධාර මුදලින් අනිවාර්ය ඉතුරුම් ලෙස රඳවාගත් රු.මිලියන 43.472 ක මුදල් දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට ආයෝජන පොළිය රු.මිලියන 2.819 ක් වේ. බැංකු මූලා අංශය විසින් 2023 වර්ෂය තුලදි සියයට 11 සිට සියයට 26 දක්වා පොලි අනුපාත යටතේ මෙම මුදල් ආයෝජන කර ඇතත් බැංකු වෙත ලබා දි ඇත්තේ සියයට 5 ක් වැනි අඩු පොලි අනුපාතයකි. මින් සමෘද්ධිලාභීන් වෙත ගෙවිය යුතු පොලිය කළමනාකරණ තීරණ ප්‍රකාරව සියයට 4 කි. අනිවාර්ය ඉතිරිකිරිම් මුදල් සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය නොකර දෙපාර්තමේන්තු බැංකු මූලා අංශය තුළ රඳවාගෙන ආයෝජනය කිරිම තුළින් ප්‍රජාමූල බැංකුව විසින්ම ආයෝජනය කර පොලී ආදායම උපයා ගැනීම අහිමිවීම හා එම මුදල් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් යෙදවීමට නොහැකිවීමේ අවාසි සහගත තත්වයක් ද උදා වී තිබුණි.	2023 2022	අනිවාර්ය ඉතුරුම් මුදල් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන කටයුතු වෙනුවෙන් ඵලදායි ලෙස යෙදවීමට කටයුතු කළ යුතුයි.	භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අනිවාර්ය ඉතුරුම් ගිණුමට අයත් රු බිලියන 36 ක ප්‍රතිපාදන ලද පසු ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් යොදාගැනීම.	2024 අයවැයෙන් ප්‍රතිපාදන සලසා ඇතත් මේ දක්වා භාණ්ඩාගාර අක් මුදල් නිදහස් කර නොමැත.
06	**සමෘද්ධි ප්‍රජාමූල බැංකු පද්ධතිය තුළින් ණය ලබාදීම** ණය වර්ග 34 ක් යටතේ ප්‍රතිලාභින් 12,309,875 ක් සඳහා ණය ලබා දීම සිදුකර තිබුණ අතර 2023 වර්ෂය තුළ ප්‍රතිලාභින් 350,604 කට ණය	2023 2022	බැංකු පද්ධතිය සතු මුදල් ආයෝජනය කිරීමට වඩා ප්‍රතිලාභීන්ට ණය ලබාදීම වර්ධනය කිරීමට කටයුතු	ණය ප්‍රතිශතය වැඩි කර ගැනීම සඳහා ණය වර්ග කීපයක් අළුතින් හඳුන්වා දීම හා නියමිත පරිදි වාරික අයකිරීම සඳහා නිලධාරීන්ට	සමස්ථ ආයෝජනයන්ට සාපේක්ෂව ණය නිකුත් කිරීම වර්ධනය වී නොමැති අතර ණය අයකිරීමද දුර්වල මට්ටමක පවතී.

	ලබාදී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට පිටහිටි ණය ශේෂය රු. මිලියන 73,856 කි. 2023 දෙසැම්බර් 31 දිනට පිටහිටි ණය ශේෂයෙන් සියයට 8 ක් බොල්ණය ලෙස වෙන්කර තිබුණි.එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 1 කින් වර්ධනය විමකි. සමස්ථ බැංකු පද්ධතිය සතු මුළු ආයෝජන රු. මිලියන 242,116 ක් වුවත් ප්‍රතිලාභීන් සඳහා ලබාදී තිබූ ණය ප්‍රමාණය රු මිලියන 73,856 ක් වේ. එය සමස්ථ ආයෝජනයෙන් සියයට 30 ක් පමණි.		කලයුතු අතර, ණය අයකර ගැනීම කාර්යක්ෂමව සිදු කල යුතුයි.	උපදෙස් ලබාදීම.	
07	බැංකු කාර්ය මණ්ඩලයේ නිලධාරින් 9894 ක් සඳහා දෙපාර්තමේන්තු වැය විෂයයෙන් වැටුප් ගෙවීම සිදු කරමින් පවතින අතර 2023 වර්ෂය සඳහා ගෙවා තිබූ මුදල රු. මිලියන 853 ක් විය. ප්‍රජාමූල බැංකු හා සමිති විසින් මෙම වැටුප් වියදම සඳහා වාර්ෂිකව ලාභයෙන් වෙන්කිරිමක් කර තිබුණි. ඒ අනුව බැංකු ආරම්භයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු. බිලියන 43.4 ක මුදලක් රජයට ගෙවිය යුතු වැටුප් වශයෙන් වෙන් කිරිම කර ඇතත් මේ දක්වා එම මුදල් ආපසු රජයට ගෙවිම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	2021 2022 2023	දෙපාර්තමේන්තු වැය විෂයෙන් බැංකු කාර්ය මණ්ඩලයට ගෙවන ලද වැටුප් ආපසු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතුයි.	බැංකු කාර්ය මණ්ඩලයට ගෙවන ලද රු.බි.43.4 ක වැටුප් සම්බන්ධයෙන් බැංකු කළමනාකරණ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව.	මේ දක්වා රජයේ ආදායමට බැර කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොමැත.

98. ශීර්ෂය - 332 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	92,460,664	238,423,338	(145,962,674)	තත්ත්වාගණනය කළ
2022	145,620,702	228,995,074	(83,374,372)	තත්ත්වාගණනය කළ
2023	152,030,839	274,669,374	(122,638,535)	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්වය
01	ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ ව්‍යාපෘති 09 කට අදාලව ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් රු.2,577,811 ක මුදලක් 2020 සහ 2021 වර්ෂය තුළ දී ප්‍රජා මූල සංවිධානයන්ට ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.	2021	වැඩිපුර ගෙවා ඇති මුදල් නැවත අය කිරීම හෝ නොකළ වැඩ ඉටු කරවා ගැනීම කල යුතු අතර නොසැලකිලිමත් ව කටයුතු කර ඇති නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය පියවර ගත යුතුය.	මූලික විමර්ෂණයක් පවත්වා අදාල නිලධාරීන්ට අවවාදාත්මක හා උපදෙස් සහිත ලිපි නිකුත් කර ඇත.	විගණන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
02	අංක 30/2016 දරන හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 ක කාල සීමාවකට පසුව හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහනවලට අදාලව එසේ ඉන්ධන දහනය පරීක්ෂා	2021	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළයුතු වීම.	ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කිරීමට උපදෙස් ලබා දී ඇත.	ඉන්ධන දහන පරීක්ෂාවන් සිදු කර නැත.

	කර නොතිබූ බව එම වාහනවලට අදාල ලොග් පොත් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.				
03	ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබූ ඇල්පිටිය ගුලන්කන්ද පානීය ජල ව්‍යාපෘතිය සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තු අවශ්‍යතාවයට වඩා සියයට 27 ක් ඉක්මවූ රු.788,006 ක වටිනාකමකින් යුතු විවිධ පරිමාණයන් සහිත පී.වී.සී. නල සහ උපාංග ප්‍රජා මූල සංවිධානයට ලබා දී තිබුණද ඒවා නැවත දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2021	දෙපාර්තමේන්තු ව විසින් මිලදීගත් ජලනල හා උපාංග බෙදාහැරීමට විධිමත් වැඩපිළිවෙලක් තිබිය යුතු අතර ඊට අදාල අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කල යුතුය.	අතිරික්තව පවතින උපාංග සුදුසු වෙනත් සංවිධාන වෙත ලබාදීමට අනුමැතිය ලබා දී ඇත.	විගණන නිර්දේශ ක්‍රියාත්මකව නොතිබුණි.
04	දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක 23 කට අයත් ප්‍රජා මූල සංවිධානයන්හි ජල ව්‍යාපෘති 311 ක් 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරාසයක අක්‍රීයව පැවතුණි.	2021	අක්‍රීය තත්ත්වයේ පවතින ප්‍රජා මූල සංවිධාන නැවත සක්‍රීය තත්ත්වයට පත් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.	අක්‍රීය තත්ත්වයේ පවතින ප්‍රජා මූල සංවිධාන නැවත සක්‍රීය තත්ත්වයට පත් කිරීම වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත පදනම්ව වැඩසටහන් ක්‍රියාත්මක වේ.	විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම මන්දගාමීව සිදු වී තිබුණි.
05	ජල ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද ජල ගබඩා ටැංකි බාහිර පාර්ශවයන්ට ප්‍රවේශ විය නොහැකි පරිදි ආරක්ෂිත ආවරණයන් යොදා ආරක්ෂාව තහවුරු කිරීම සිදු කළ යුතු වුවත් බද්දේගම කීඹියකන්ද පානීය ජල ව්‍යාපෘතිය, ඉමදුව මයුර පානීය ජල ව්‍යාපෘතිය හා ඇල්පිටිය අම්බන පැහැසර පානීය ජල ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ජල ගබඩා	2021	ජනතාවට බෙදාහරිනු ලබන පානීය ජලයේ සුරක්ෂිතතාවය තහවුරු කළ යුතු වීම.	ප්‍රතිපාදන නොලැබීම නිසා නිම කිරීමට නොහැකි විය.	2024 සැප්තැම්බර් වන විටත් ගබඩා ටැංකි සඳහා ආරක්ෂිත ආවරණයන් යොදා නොතිබුණි.

	ටැංකි සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට එබඳු ආරක්ෂිත ආවරණයන් යොදා නොතිබුණි.				
06	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 751(1), 752 හා 763 ඡේද ප්‍රකාරව ප්‍රජා ජලසම්පාදන ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු සඳහා මිලදීගෙන ප්‍රජා මූල සංවිධාන වෙත බෙදාහැර තිබූ ජල පොම්ප හා උපාංග සහ පරිත්‍යාග ලෙස ලැබී තිබූ ජල මීටර් 2,543 ක් පිළිබඳ තොරතුරු බඩු ලේඛණ පොත්වලට ඇතුලත් කර නොතිබුණි.	2022	දෙපාර්තමේන්තුව විසින් මිලදීගෙන බෙදාහරිනු ලබන උපකරණ හා උපාංග පිළිබඳ විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු අතර දැනට ගබඩා තුල ඇති භාණ්ඩ සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර සියලුම උපකරණවල භෞතික පැවැත්ම පිළිබඳ තහවුරුවක් ලබාගෙන ඌණතා අතිරික්තතා පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතුයි.	ඉදිරියේදි සියළු ලැබිම් තොග පොත්වල සටහන් කරන ලෙස උපදෙස් දි ඇත.	2023 වර්ෂයෙන් පසු දිස්ත්‍රික් කාර්යාලවල තොග පොත්වල සටහන් කරනු ලබන අතර ඊට පෙර මිල දි ගැනීම් සටහන් කර නොතිබුණි.
07	2012 ජනවාරි 05 හා 2021 සැප්තැම්බර් 29 දිනැති පිළිවෙලින් අංක 01/2012 හා 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් කොන්ත්‍රාත්තු පැවරිය යුතු වේ. විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාව	2021 2022 2023	විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ව්‍යාපෘති අසාර්ථක වීමට සෘජු ලෙස බලපා ඇති බැවින් ඊට වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත	රු.මිලියන 5ට අඩු ව්‍යාපෘති ප්‍රතිලාභ ලබන ප්‍රජා මූල සංවිධානයට ලබා දෙන බැවින් මිල ගණන් ලබා ගනිමින් කමිටුවක ඇගයීමට ලක් කිරීම් කර නැත.	2022 වර්ෂයෙන් පසු නව ජල ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි. විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට අදාල නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	සඳහා පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතිය පැවරීමේදී එවැනි ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශ මත සිදුකර නොතිබුණු අතර දෙපාර්තමේන්තුව විසින් තෝරාගත් කොන්ත්‍රාත්කරුවන් මඟින් එම කටයුත්ත ආරම්භ කර තිබුණද, අපේක්ෂිත අරමුණට ලඟාවිය නොහැකිව ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. එමෙන්ම ඇස්තමේන්තු වටිනාකම එකතුව රු.මිලියන 48 ක් වූ මාතලේ දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 05 ක ඉදිකිරීම් කටයුතු දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරීගේ නිර්දේශ මත ප්‍රජා මූල සංවිධාන වෙත ප්‍රදානය කර තිබුණි. මෙම ජල ව්‍යාපෘති 05 මඟින් පවුල් 970 කට ජලය ලබාදීමට අපේක්ෂාකර තිබුණද සත්‍ය ලෙස ජල සැපයුම ලබා දී තිබුණේ පවුල් 377 කට පමණක් වන අතර එම ජලයද පිරිසිදු පානීය ජලය බවට තහවුරු වන වාර්තා නොතිබුණි.		යුතුයි.		
08	මොණරාගල දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති 04 කට අදාළව ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවල ඇතුළත් කාර්යයන් 84 ක කිසිදු ඉදිකිරීමක් සිදු නොකර තිබියදී එකතුව රු.2,195,071 ක් සහ අඩක් නිමකළ හෝ ප්‍රමාණපත්‍රවල සඳහන් ප්‍රමිතීන්ට පටහැනිව සිදුකළ ඉදිකිරීම් කාර්යයන් 17 ක්	2022	මෙම කොන්ත්‍රාත් කටයුතු පිළිබඳ නිසි අධීක්ෂණයකින් තොරව ගෙවීම් සහතික කිරීම, ගෙවීම් කිරීම හේතුවෙන් රජයට පාඩු සිදු වී ඇති බව නිරීක්ෂණය වන බැවින් ඊට අදාල වගකිවයුත්තන්	අදාළ කාර්යසාධන ඇපකර සහ අත්තිකාරම් ඇපකර දීර්ඝ කර වැඩ කටයුතු කරමින් පවතී.	ව්‍යාපෘති කටයුතු අවසන් කර නොතිබුණි. කොන්ත්‍රාත් කටයුතු පිළිබද නිසි අධීක්ෂණයකින් තොරව ගෙවීම් කිරීමට අදාල වගකිවයුත්තන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	වෙනුවෙන් එකතුව රු.777,347 ක් දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ සහතිකය මත ගෙවා තිබුණි. තවත් එක් ව්‍යාපෘතියක් සඳහා රු.3,929,236 ක් අත්තිකාරම් ලෙස ගෙවා ඊට අදාළව කිසිදු කටයුත්තක් සිදුකර නොතිබුණු අතර 2023 මාර්තු වන විට එම ඉහත ව්‍යාපෘති සියල්ලම අතරමග අත්හැර දමා තිබුණි. ඒ අනුව ඒ සඳහා වැය කර තිබූ එකතුව රු.17,730,116 ක මුදල නිශ්කාර්ය වැයක් බවට පත්වෙමින් තිබුණි.		සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.		
09	මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රදේශ 5 ක කැණීම් ළිං 4 ක් හා ජල ටැංකියක් ඉදිකිරීම සඳහා ලබා දී තිබුණු කොන්ත්‍රාත්වල කාර්යයන් කිහිපයක් ඉටු කිරීම පිළිබද සාක්ෂි හෝ තහවුරු නොමැතිව රු.295,000 ක් සහ ඉටු නොකළ වැඩ සඳහා සහ කළ වැඩ ප්‍රමාණය ඉක්මවා වැඩිපුර ගෙවීම් කිරීම වෙනුවෙන් රු.4,148,606 ක් රජයේ මුදල් නිෂ්කාර්ය ලෙස වැය කර තිබුණි. මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර අදාල ස්ථානවල ජල තත්ත්වය පරික්ෂාව ඇතුළත්ව ශක්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබූ අතර ඉදිකර අවසන් කර තිබූ ළිං 03 ක ජලයෙහි තත්ත්වය අපේක්ෂිත මට්ටමට වඩා අඩු මෙන්ම පරිහරණයට නුසුදුසු බව ජල නියැදි පරික්ෂාවලදී තහවුරු වී තිබුණි. ඒ අනුව මෙම ජල	2022	නිළධාරීන්ගේ නොසැලකිලිමත් කමින් මෙම කොන්ත්‍රාත් කාර්යයේදී රජයට පාඩු සිදුවී ඇති බව විගණන පරීක්ෂාවලදි අනාවරණය වී ඇති බැවින් ඊට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය. එමෙන්ම මෙම ඉදිකිරීම් කඩිනම් කර එම ප්‍රදේශවල ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ඉටුකරදිමට කටයුතු කල යුතුය.	රු.295,000 ක මුදල රඳවුම් මුදලින් හා අවසන් බිල්පත් මගින් අඩුකිරීමට කටයුතු කිරීම හා ඉටු නොකල වැඩ වහාම සම්පූර්ණ කරන ලෙස කොන්ත්‍රාත්කරු දැනුවත් කිරීම.	ව්‍යාපෘති කටයුතු අවසන් කර නොමැති අතර වැඩිපුර ගෙවීම් කර රජයට පාඩු සිදු කල නිළධාරින් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සම්පාදනවලට අදාල නිළධාරීන් ඉතාමත් නොසැලකිල්ලෙන් රජයට පාඩු සිදුවන පරිදි කටයුතු කර ඇතිබව අනාවරණය වී තිබුණි.				
10	ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වර්ෂ 9½ ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එබැවින් දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාල කැබිනට් පත්‍රිකාවේ සඳහන් කාර්යයන් සිදුකිරීමට දෙපාර්තමේන්තුවට නෛතික පසුබිමක් නොතිබුණි.	2021 2022 2023	පනත සම්මත කර ගැනීම කඩිනම් කර දෙපාර්තමේන්තු වේ කාර්යයන් විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය නෛතික පසුබිම සකසාගත යුතු වේ.	මෙම පනත් කෙටුම්පත නිරීක්ෂණ කටයුතු සඳහා රාජ්‍ය ඇමතිවරයා වෙත යොමු කර ඇත.	මේ දක්වා පනත සම්මත කර නොමැත.
11	වාර්ෂික අයවැය ප්‍රතිපාදන යටතේ ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීමේ අරමුණින් Nano Filters 80 ක් ඉදිකර ස්ථාපිත කිරීමට 2021 වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර ඉන් විගණන දිනය වූ 2022 දෙසැම්බර් 31 වන විට 25 ක් පමනක් ඉදිකර අවසන් කර තිබුණු අතර එදින වන විට එකතුව රු.120,718,050 ක් වැය කර තිබුණි. මීට අදාලව මොනරාගල දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ Nano Filters 05 ක් පිළිබඳ	2022	මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුල පැවති අවිධිමත්භාවය හා නිළධාරීන්ගේ නොසැලකිලිමත් කම හේතුවෙන් රජයට පාඩු සිදුවීම මෙන්ම එම කටයුත්ත නිසි ප්‍රමිතියකින් සිදුනොකිරීමෙන් ප්‍රතිලාභ අපේක්ෂිත ජනතාවගේ අවශ්‍යතාව ඉටුනොවීම පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු	සැලසුම් වෙනස්කර ඉදි කිරීම් කර ඇත.	Nano filters 30 ක කටයුතු මේ දක්වා නිමකර නොතිබුණි. රජයට පාඩු සිදුවීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

	සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 ප්‍රකාරව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමෙන් තොරව ඉදිකිරීම් අතරමග නවතා දමා තිබුණද ඊට අදාලව ප්‍රමාද ගාස්තු අය කිරීමට සහ කාර්යසාධන ඇපකර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබීම, ඉදිකිරීම්වලට අදාල අනුමත ප්‍රමානපත්‍රවල සඳහන් ප්‍රමිතීන්ට පටහැනිව ඉදිකිරීම් සිදුකර තිබියදී තාක්ෂණික නිලධාරීන් ලබා දුන් ව්‍යාජ සහතික මත එකතුව රු.7,385,602 ක මුදලක් ගෙවා තිබීම වැනි අඩුපාඩු සිදුවී තිබුණි.		නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කලයුතු අතර ඉදිකිරීම් අතරමග නවතා ඇති කොන්ත්‍රාත් කටයුතු කඩිනමින් නිමකිරීමට කටයුතු කල යුතුය.		
12	එකතුව රු.183,600 ක් වැයකරමින් මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ග්‍රාම නිලධාරී වසම් 4 ක නල ළිං 4 ක් ඉදිකිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් භූ විද්‍යාත්මක පරීක්ෂණ සිදුකර 2021 වර්ෂයේ වැඩ ආරම්භ කර තිබූ අතර විගණන දිනය වූ 2023 මාර්තු වන විට එකතුව රු.1,260,058 ක් වැයකර ඉන් ළිං 2 ක් පමණක් ඉදිකර තිබුණි. ඉදිකල නල ළිං මගින් ජලය බෙදාහැරීමේ කටයුත්ත සඳහා වැය කර තිබූ එකතුව රු.1,443,658 ක සම්පූර්ණ මුදල නිෂ්කාර්ය වැයක් බවට පත්වෙමින්	2022	මෙම අවිධිමත් කොන්ත්‍රාත් කාර්යය හේතුවෙන් සිදු වී ඇති පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර නල ළිං 04 හි ඉදිකිරීම් කඩිනමින් නිමකර ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිටින ජනතාවට එම සේවාව ලබා දිය යුතුය.	ජල ව්‍යාපෘතියක් වසරක් වැනි කෙටි කාලයකදී නිමකල නොහැකි වේ. මෙම වර්ෂයේදී නව ඇස්තමේන්තු ලබා දී ඉදිරි කටයුතු කිරීමට සැලසුම් කර ඇත.	ව්‍යාපෘතිය අවසන් කර නොමැති අතර සිදු වී ඇති පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැත.

	තිබුණි.				
13	මැණික්කඩවර හා පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාව සඳහා පිරිසිදු පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘතියේ කාර්යයන් 14 ක් ඉටු කිරීම වෙනුවෙන් එකතුව රු.28,530,317 ක් පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු වෙත ගෙවා තිබූ අතර ඊට අයත් Pump house හා Sand filter ඉදිකිරීම 2023 පෙබරවාරි වන විටත් සිදුකර නොතිබුණි. මෙම ව්‍යාපෘතියේ පළමු අදියර ආරම්භ කර විගණිත දින වන විට වසර 03 කට වඩා වැඩි කාලයක් ගත වුවද, ව්‍යාපෘතිය අවසන් කර නොතිබූ බැවින් වැය කර තිබූ රු.28,530,317 ක මුදල නිෂ්කාර්ය වැයක් බවට පත් වී තිබුණි.	2022	විගණන නිරීක්ෂණවල සඳහන් පරිදි මෙම කොන්ත්‍රාත් කාර්යයේදී නොසැලකිලිමත් කමින් රජයට පාඩු සිදුවන පරිදි කටයුතු කිරීම සහ ජනතාවට අවශ්‍ය සේවාව කඩිනමින් නොසැපයීම පිළිබඳ වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය.	ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය.	2024 මාර්තු වන විට රු.මිලියන 33 ක වියදමක් දරා ඇතත් මේ දක්වා ව්‍යාපෘතිය නිම කර නොමැත. රජයට පාඩු සිදු වන පරිදි කටයුතු කල නිළධාරීන්ට එරෙහිව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
14	අනුරාධපුර දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.53,537,675 ක්වූ ජල ව්‍යාපෘති 4 කට අදාල කොන්ත්‍රාත් 2021 වර්ෂයේ පුද්ගලික ආයතනයකට ප්‍රදානය කර තිබුණු අතර එම ඉදිකිරීම් වර්ෂයක පමණ කාලයකදී අවසන් කල යුතුව තිබුණි. මෙම ව්‍යාපෘතිවලින් එක් ව්‍යාපෘතියක පමණක් පොම්පාගාරය ඉදිකිරීම අවසන් කර තිබුණද ඉතිරි වැඩ කොටස් වසරකට අධික කාලයක සිට නිම නොකර අත්හැර දමා ඇති බව විගණනයේදි	2022	කොන්ත්‍රාත් පිරිනැමීමේදී කොන්ත්‍රාත්කරු ගේ මූල්‍යමය හා භෞතික හැකියාව මෙන්ම පූර්ව වැඩ පිළිබඳ නිසි ඇගයීමක් කල යුතුව තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් සිදුවන අතරතුර ඒ පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණයක් තිබිය යුතුය.	අදාළ කාර්ය සාධන ඇපකර සහ අත්තිකාරම් ඇපකර දීර්ඝ කර වැඩකටයුතු ආරම්භ කර ඇත.	මේ දක්වා ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.

	අනාවරණය වී තිබුණි.				
15	සමාලෝචිත වර්ෂය තුල එකතුව රු.4,290,300 ක් වැය කර වසරක වගකීම් කාලයක් සහිතව ජලමනු 945 ක් මිලදීගෙන තිබුණු අතර විගණන දිනය වූ 2023 මාර්තු වන විට එම ජලමනු වසරකට වඩා වැඩි කාලයක් භාවිතයකින් තොරව නිෂ්කාර්යව තිබුණි. ඒ අනුව වගකීමක් සහිත මිලකට එම ජලමනු මිලදී ගැනීම ඵල රහිත වී තිබුණි.	2022	අවශ්‍යතාවය නිසිපරිදි හදුනාගෙන ප්‍රසම්පාදනය කල යුතු අතර රජයේ මුදල් ඵලදායීව යොදාගැනිම නිලධාරීන්ගේ වගකීම බව අවබෝධකර නොගෙන කටයුතු කරන නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය.	සිවිල් ඉදිකිරීම් සදහා නව ඇස්තමේන්තු සකස් කර ඇති අතර එම ඉදිකිරීම් නිම වු විට මෙම ජල මනු භාවිතා කරනු ලැබේ.	රජයේ මුදල් ඵලදායීව යොදා නොගත් නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත.
16	මඩකලපුව ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 5 කට අදාලව සහ මොණරාගල ප්‍රදේශයේ ජල සම්පාදන ව්‍යාපෘති 04 කට අදාලව ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම් ඉක්මවා සියයට 24 සිට සියයට 29 ක වැඩි වටිනාකමකට කොන්ත්‍රාත් පිරිනමා තිබු අතර එසේ ඉක්මවීම් නිසා කොන්ත්‍රාත්තුවල මුළු පිරිවැය වැඩිවීම්වල එකතුව රු.14,463,172 ක් වී තිබුණි. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 ඡේදයේ ඇති උපදෙස් ප්‍රකාරව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කිරීමෙන් අපේක්ෂා කරන අරමුණු ඉටු නොවන අතර ඒ සදහා වැය කරන පිරිවැයද නිෂ්කාර්ය බවට පත්වී තිබුණි.	2022	කොන්ත්‍රාත් ඇගයීමේදී සහ ප්‍රදානයේදී සිදුවන මෙවැනි අක්‍රමිකතා වැලැක්වීමට හා රජයට පාඩු නොවන පරිදි කටයුතු කිරීමට කළමනාකරණ අවධානය යොමුවිය යුතුය.	ක්‍රියාමාර්ග සදහන් කර නොමැත.	2024 සැප්තැම්බර් වන විටත් මෙම ව්‍යාපෘති අවසන් කර නොතිබුණි.

17	මොණරාගල රනුගල්ල ප්‍රදේශයේ පවුල් 500 කට ජලය සැපයීමේ දෙවන අදියර යටතේ රු.1,665,984 ක ඇස්තමේන්තු පිරිවැයකට ජල ටැංකියක් ඉදිකිරීමට සැලසුම්කර තිබූ අතර රු.2,314,123 කට කොන්ත්‍රාත් ප්‍රදානය සිදුකර රු.462,824 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. ටැංකිය ඉදිකිරීම තාක්ෂණික ගැටලු මත අත්හිටුවීමට 2021 නොවැම්බර් 17 දින තීරණය කර තිබුණි. මෙම ව්‍යාපෘතියෙහි මුල් අදියරයෙහි ඉදිකිරීම් සඳහා ඒ වන විට එකතුව රු.6,147,244 ක්ද වැයකර තිබුණද මේ දක්වා අපේක්ෂිත අරමුණ ඉටු නොවී පැවතුනි.	2022	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදි නිසි අධ්‍යනයකින් හා සැලසුමකින් යුතුව කටයුතු කලයුතු අතර ඒ සඳහා අදාල නිලධාරීන්ගේ නිසි අධීක්ෂණය තිබිය යුතුය. එසේ කටයුතු නොකිරීමෙන් රජයට සිදුවන පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.	ව්‍යාපෘතියේ තෙවන අදියර සඳහා ඇස්තමේන්තු සකස් කරමින් පවතී.	නිසි සැලසුමකින් තොරව කටයුතු කල නිලධාරීන් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැත.
18	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වන වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි අංක 128 (අ,ආ) සහ 133 ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ රාජකාරි හා වගකීම් ඉටුකිරීමේදී ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා විගණන අංශයක් පිහිටුවිය යුතු අතර ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්විය යුතුයි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුවේ	2022 2023	ජාතික විගණන පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.	අභ්‍යන්තර විගණන තනතුර සඳහා ගණකාධිකාරී II/II ශ්‍රේණියේ තනතුර ගණකාධිකාරී I ශ්‍රේණියේ තනතුරක් ලෙස සංශෝධනය කිරීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත.	ජාතික විගණන පනත ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය පිහිටුවා නොමැත.

	අනුමත කාර්යය මණ්ඩලය තුල අභ්‍යන්තර විගණන තනතුර අනුමත කර තිබුණද, එම තනතුරට අදාල බඳවා ගැනීම් සිදුකර දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සහ ඵලදායිතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කෙ◌ාට එය ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.				
19	මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කර තිබූ රු.මිලියන 73 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල රු.මිලියන 10.70 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 ක්ද ඇතුලත්ව තිබුණි.	2022 2023	භාවිතා කරනු ලබන වෙනත් ආයතනවලට අයත් වත්කම් විධිමත් පරිදි පවරාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතුය.	මෙම වාහන ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය හා ලුනාව පාරිසරික ප්‍රවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සතු වන අතර පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.	2024 සැප්තැම්බර් වන විටත් පවරාගෙන නොමැත.
20	එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික හදිසි ළමා අරමුදල (UNICEF) මගින් රටෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ලැබී තිබූ විදේශ ප්‍රදාන යටතේ 2022 වර්ෂයේදී සියයට 62 ක් එනම් රු.මිලියන 2.3 ක්ද 2023 වර්ෂයේදී සියයට 66 ක් එනම් රු.මිලියන 6.6 ක්ද ඉතිරිව පැවතුනි. මෙම අරමුදල මගින් ලැබෙන ප්‍රතිපාදනවලින් සැලකිය යුතු ප්‍රතිපාදනයක් අදාල කාර්යයන් සඳහා උපයෝජනය නොකර වාර්ෂිකව ඉතිරි වී තිබුණි.	2022 2023	විදේශ ප්‍රදාන ලෙස ලැබෙන මෙම මුදල් අදාළ අරමුණු වෙනුවෙන් වැය කිරීමට කළමණාකරන යේ නිසි අවදානය යොමු විය යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	2024 වර්ෂය සඳහා වූ රු.මිලියන 3 ක ප්‍රතිපාදනය මේ වන විට උපයෝජනය කර ඇත.

21	නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂය තුලදී ලබා දී තිබූ එකතුව රු.මිලියන 389 ක් වූ ප්‍රතිපාදනවලින් රු.මිලියන 217 ක් එනම් සියයට 56 ක් දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.	2023	ග්‍රාමීය ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදෙන ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කිරීමට කළමණාකරණ ය වගකීමෙන් යුතුව කටයුතු කල යුතුය.	වැලැක්වීමේ ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.	2024 වර්ෂය සඳහා නිවාස අමාත්‍යාංශයෙන් හා ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනයෙන් සැප්තැම්බර් 30 වන විට උපයෝජනය කර තිබුණේ සියයට 20 ක් පමණි.
22	ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් ආයතනවලින් දෙපාර්තෙමේන්තුව වෙත ලැබී තැන්පත් ගිණුමේ රදවාගත් මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 කට වඩා වැඩි ශේෂය රු.මිලියන 30 ක් වූ අතර වැඩ අවසන් වූ ව්‍යාපෘති හදුනාගෙන එම ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2021 2023	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ.	වැඩ අවසන් කල ව්‍යාපෘතිවල ඉතිරි මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත.	2024 අගෝස්තු 30 දිනට වැඩ අවසන් නොකල ව්‍යාපෘතිවල රදවා ගත් මුදලින් වර්ෂ 2 කට වැඩි ශේෂය රු.මිලියන 10.38 ක් වේ.
23	රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ, පැල්මඩුල්ල, අයගම හා මාදම්පේ යන ප්‍රදේශවල ඉදිකර තිබූ ජල ව්‍යාපෘති 05 ක ඉටු නොකල වැඩ වෙනුවෙන් රු.මිලියන 1.4 ක් වැඩිපුර ගෙවීම්කර රජයේ මුදල් අවභාවිතා කර තිබුණි.	2023	ඉටුනොකල වැඩ සඳහා ගෙවීම් සහතික කිරීමට වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතුය.	වැඩිපුර ගෙවීම් වර්තමානයේ සිදුවීම වැලැක්වීමට අදාල තාක්ෂණික අංශ වෙත උපදෙස් ලබා දී ඇත.	අදාල වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
24	දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාළ 2014 මාර්තු 13 දිනැති අංක 17/2014 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සහ ශ්‍රී	2023	ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීම දෙපාර්තමේන්තු වෙහි මූලික කාර්යභාරය	වර්ෂයකට දෙවරක් ජලයේ ගුණත්වය පරීක්ෂා කල යුතු බවට ප්‍රජා මූල සංවිධාන වෙත දන්වා ඇත. ජංගම ජල	2024 සැප්තැම්බර් වන විටත් සැළසුම් කල පරිදි ක්‍රියාත්මක නොවේ.

	ලංකා ප්‍රමිති ආයතනයේ අංක 614:2013 දරන “පානීය ජලය සඳහා පිරිවිතර” ප්‍රකාරව ජල තත්ත්ව පරීක්ෂණයන් සිදුකළ යුතු වුවද භෞතික විගණන පරීක්ෂාවන්ට අනුව 2019 වර්ෂයේ ආරම්භ කර ඉදිකිරීම් අවසන් කරන ලද ජලය ලබාදෙන ව්‍යාපෘති 92 න් ව්‍යාපෘති 12 ක ජල තත්ත්ව පරික්ෂාවන් සිදු කර නොතිබුණු අතර 2023 සැප්තැම්බර් වන විට ව්‍යාපෘති 05 ක අවසන් වරට ජල පරීක්ෂණය සිදු කර තිබුණේ වර්ෂ 04 කට පෙරය. එමෙන්ම ව්‍යාපෘති 08 ක වර්ෂයකට පෙරද, ව්‍යාපෘති 06 ක වර්ෂ 02 කට පෙරද, ව්‍යාපෘති 08 ක වර්ෂ 03 කට පෙරද ජල තත්ත්ව පරීක්ෂාවන් සිදුකර තිබූ අතර ව්‍යාපෘති 28 ක පමණක් ජල තත්ත්ව පරීක්ෂාව 2023 වර්ෂයේදී සිදු කර තිබුණි.		බැවින් ඒ සඳහා හඳුන්වා දී ඇති ක්‍රමවේද මනා අධීක්ෂණයකින් යුතුව පවත්වාගෙන යා යුතු වේ.	පරීක්ෂණාගාරය භාවිතා කිරීමට ක්‍රමවේදයන් සකසමින් පවතී.	
24	පුත්තලම හා කෑගල්ල දිස්ත්‍රික්කවල එකතුව රු.මිලියන 26.6 ක් වැයකර ඉදිකළ ව්‍යාපෘති 03 කින් එක් ව්‍යාපෘතියක නළ ළිදේ වැලි පිරීම හේතුවෙන් සහ ව්‍යාපෘති 02 ක ආරම්භයේදී හඳුනාගත් ජල මූලාශ්‍රය නියං සමයේදී සිඳී යාමට භාජනය වන බැවින් විකල්ප ක්‍රම උපයෝගී කරගෙන ජලය බෙදා හැරීමට කටයුතු කර තිබුණු අතර එම විකල්ප මූලාශ්‍ර තෝරාගැනීමේදී ජලය පිරිසිදු පානීය ජලය බවට තහවුරු කිරීමක් සිදු	2023	මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හේතුවෙන් රජයට පාඩු සිදුවීම මෙන්ම එම කටයුත්ත නිසි ප්‍රමිතියකින් සිදුනොකිරීමෙන් ප්‍රතිලාභ අපේක්ෂිත ජනතාවගේ අවශ්‍යතාව ඉටුනොවීම පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු නිලධාරීන්ට	අවශ්‍ය තාක්ෂණික දැනුම ඉංජිනේරුවරුන් වෙත ලබාදීමට කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වගකිවයුතු නිලධාරීන්ට අදාලව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

	වී නොතිබුණි. විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ ජල තත්ත්ව වාර්තා අනුව භාවිතයට නුසුදුසු බවට තහවුරු වී තිබූ වෙනත් ජල ව්‍යාපෘති 11 ක් මගින් ප්‍රතිලාභි පවුල් 1,518 ක් සඳහා පානීය ජලය සපයමින් තිබුණි.		අදාලව විනය ක්‍රියාමාර්ග ගතයුතුය.		
25	පවුල් 220 ක් සඳහා පිරිසිදු පානිය ජලය ලබා දිම සඳහා ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 7 කට ආරම්භ කර තිබූ මාතලේ දිස්ත්‍රික්කයේ ඕපල්ගල මෙත්සිත් ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2019 වර්ෂයේදී ප්‍රජා ජල මූල සංවිධාන 04 ක් වෙත ලබාදී ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.මිලියන 7 ක් වැය කලද පවුල් ඒකක 05 ක් සඳහා පමණක් ජලය සැපයීම සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් 6 දින ජනතා අයිතියට පත්කර තිබුණු අතර ආරම්භයේ සිටම පිරිසිදු පානීය ජලය ලබා දුන් බව තහවුරු නොවුණි. මෙමගින් ලබාගත් ජල සාම්පල ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පරික්ෂණාගාර මගින් පරික්ෂා කිරිමේදී භාවිතයට නුසුදුසු බව වාර්තාකර තිබුණි. විගණන භෞතික පරික්ෂාවට අනුව මෙම ව්‍යාපෘතියේ ඉටු නොකල ඉදිකිරීම් හා සවිකිරීම් වෙනුවෙන් රු.මිලියන 1.2 ක් කල වැඩ පිළිබඳ පරික්ෂාවකින් තොරව	2023	විගණන නිරීක්ෂණවල ඇතුලත් කරුණු පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු කර අදාල පාඩු සඳහා වගකිව යුතු නිළධාරින්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගත යුතුය.	විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලියාපදිංචි විනය පරීක්ෂණ නිලධාරි සංචිතයේ නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කර ඇත.	2024 සැප්තැම්බර් වන විටත් පරීක්ෂණ කටයුතු පවත්වා නොතිබුණි.

	ගෙවීම් කර රජයට පාඩු සිදු කර තිබුණි.				
26	2021 වර්ෂය තුලදි කුරුණෑගල දිස්ත්‍රික්කයේ මුළු ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 78 ක් වූ ප්‍රජා ජල ව්‍යාපෘති 09 ක් ඉදි කිරිම සඳහා පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්වලට එලබි තිබුණි. මෙම කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හැකියාව, යන්ත්‍ර උපකරණ ප්‍රමාණවත් බව හා පෙර පලපුරුද්ද පිලිබඳ නොසලකා කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. ඒ අනුව 2024 පෙබරවාරි මස වන විට ලබා දි තිබූ කොන්ත්‍රාත් 9 න් ඇස්තමේන්තු වටිනාකම එකතුව රු.මිලියන 51 ක් වූ කොන්ත්‍රාත් 6 ක ඉදිකිරිම් අත්හැර දමා අන්‍යෝන්‍ය එකඟතාවය මත කොන්ත්‍රාත් අවසන් කිරිමට කටයුතු කර තිබූ අතර එම කොන්ත්‍රාත් වෙනුවෙන් වැයකර තිබූ එකතුව රු.මිලියන 38 ක මුදල අනාර්ථික ගණුදෙනුවක් වී තිබුණි.	2023	ප්‍රසම්පාදන කටයුත්තේදි සිදු වී ඇති අවිධිමත්භාවය පිලිබඳව විධිමත් පරික්ෂණයක් පැවැත්විය යුතු අතර ඒ තුළින් රජයට යම් පාඩුවක් තිබේ නම් ඊට වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගත යුතුය.	නිම නොකල වැඩ කොටස් සඳහා ඇස්තමේන්තු සකස් කර ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කරමින් පවතී.	රජයට සිදු වූ පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.
27	කුරුණෑගල දිස්ත්‍රික්කයේ සඳ දිය ප්‍රජාමූල සංවිධානයේ සහ රඹෑව පානිය ජල ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 15 ක් වැයකර ඉදිකරන ලද ජල ටැංකි 3 ක ඉදිකිරිම් අවසන් කර 2024 මාර්තු වන විට මාස 03 සිට මාස 15 ක කාලයක් ගත වී තිබුණද, ව්‍යාපෘතිය නිමකර අදාල ජල සබඳතාව ලබාදීමට කටයුතු නොකිරීම මත	2023	පවතින ප්‍රතිපාදන අනුව ව්‍යාපෘති ආරම්භ කල යුතු අතර ආරම්භ කර ඇති ව්‍යාපෘති කඩිනමින් නිමකර ජනතාව වෙත ජලය ලබාදීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.	මුදල් ප්‍රතිපාදන ලැබෙන ප්‍රමාණය අනුව අදියර වශයෙන් නිම කිරීමට නියමිතය.	2024 සැප්තැම්බර් වන විටත් ව්‍යාපෘති නිමකර නොමැත.

	මෙම ටැංකි භාවිතයට නොගෙන නිශ්කාර්ය තත්ත්වයට පත් වී තිබුණි.				
28	කුරුණෑගල දිස්ත්‍රික්කය තුල 2019, 2020 හා 2021 යන වර්ෂවලදි ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති 19 ක ඉදිකිරීම් කටයුතු අවසන් කර ප්‍රතිලාභි ජනතාවට පානිය ජලය සැපයිමට නොහැකි වි තිබු අතර 2023 දෙසැම්බර් 31 වන විට එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 14 ක් සඳහා රු.මිලියන 106 ක් වැයකර තිබුණි. එමෙන්ම පුත්තලම, ත්‍රිකුණාමලය, මාතලේ, මඩකලපුව සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල 2021 වර්ෂය තුලදී ඉදිකිරීම් ආරම්භ කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති 11 ක ඉදිකිරීම් කටයුතු අතර මඟ නවතා දමා තිබූ අතර ඒ වන විට එම ව්‍යාපෘති වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් දරන ලද රු.මිලියන 18.6 ක මුදලද නිශ්කාර්ය වී තිබුණි.	2023	පවතින ප්‍රතිපාදන අනුව ව්‍යාපෘති ආරම්භ කල යුතු අතර ආරම්භ කර ඇති ව්‍යාපෘති කඩිනමින් නිමකර ජනතාව වෙත ජලය ලබාදීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.	මාස දෙකක් තුල අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇත.	2024 සැප්තැම්බර් වන විටත් ව්‍යාපෘති නිමකර නොමැත.
29	අනුරාධපුර දිස්ත්‍රික්කය තුල 2021 හා 2022 වර්ෂය තුල ප්‍රජා ජල ව්‍යාපෘති 08 ක් සඳහා නැනෝ පිරිපහදු යන්ත්‍ර රු.මිලියන 19 ක් වැය කරමින් ස්ථාපිත කිරිමට සැලසුම් කර තිබුණි. එම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 03 කට අදාල පිරිපහදු මධ්‍යස්ථාන ගොඩනැගිලි වසර 02 කට වැඩි කාලයක සිට ඉදිකිරීම් වැඩ අවසන් කිරීමෙන් තොරව අතරමග නවතා දමා තිබුණි. ඒ අනුව ඒ	2023	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත යුතු වන අතර කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා කාර්ය ශක්‍යතාවය පිළිබඳ අවධානය යොමු නොකර කොන්ත්‍රාත්	කඩිනමින් නිම කිරීමට අදාල සමාගමට සැනුම් දී ඇත.	2024 සැප්තැම්බර් වන විටත් ව්‍යාපෘති නිමකර නොමැත. කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය හා කාර්යය ශක්‍යතාවය පිළිබඳ අවධානය යොමු නොකර කොන්ත්‍රාත් ප්‍රදානය කල නිළධාරීන්ට විරුද්ධව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගෙන නොමැත.

	සඳහා දෙපාර්තමේන්තුව වැය කරන ලද එකතුව රු.මිලියන 6.6 ක සම්පූර්ණ පිරිවැයම නිශ්කාර්ය වී තිබුණි.		ප්‍රදානය කල නිළධාරීන්ට විරුද්ධව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතු වේ.		
30	ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 56 ක්වූ මාතර, වැලිගම පෝරඹ කනංකේ (දකුණ) ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘතිය 2019 නොවැම්බර් 08 දින ආරම්භකර ඉදිකිරීම් කටයුතු කොටස් 08 කට වෙන්කර ප්‍රජා මූල සංවිධානය වෙත පවරා තිබුණි. ව්‍යාපෘතියේ වැඩ විෂයයන් 02 ක් නියමිත දිනට පෙර අවසන් නොකිරීමෙන් වෙළෙඳපොළ මිලගණන් ඉහලයාම නිසා මුල් ඇස්තමේන්තුවට වඩා රු.මිලියන 7 ක් වැඩි නව ඇස්තමේන්තු සකස් කිරිමට සිදුව තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට මෙම ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 27 ක් වැය කර තිබුණු අතර වර්ෂ 4 ක් ඉක්ම ගොස් තිබුණද ව්‍යාපෘතිය නිම නොවී පැවති අතර ඒ වෙනුවෙන් වැයකර තිබූ මුදල නිශ්කාර්ය වැයක් බවට පත්වෙමින් පැවතුණි.	2023	ව්‍යාපෘති ඉදිකිරීම් කාර්යයන් කඩිනම් කල යුතු අතර ප්‍රමාද වීම මත දැරිමට සිදුවන අමතර පිරිවැය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ.	විමර්ශණ කටයුතු අවසන් කර ඇත.	ප්‍රමාද වීම මත දැරිමට සිදුවන අමතර පිරිවැය සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග සඳහන් කර නොමැත.
31	ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 36 න් තනතුරු 18 ක් ඇතුලුව සියළුම කාණ්ඩවල පුරප්පාඩු සංඛ්‍යාව සියයට 14 ක පමණ ප්‍රතිශතයක් විය. කෙසේ වුවද සේවකයින් 72 ක අතිරික්තයක්ද, අනුමත තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් 09	2023	දෙපාර්තමේන්තු වේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන කාර්යමණ්ඩලය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.	පුරප්පාඩු වූ තනතුරු පිරවීම සඳහා ලිපි ඉදිරිපත් කර ඇත. අතිරික්ත තනතුරු සඳහා නව තනතුරු ඇති කරන ලෙස කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර ඇත.	අදාල අනුමැතීන් නොලැබී ඇති බැවින් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු හා අතිරික්තතා එලෙසම පවතී.

ක් ද නිරීක්ෂණය විය.

99. ශීර්ෂය - 333 කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	17,255,802	17,255,802	17,255,802	තත්ත්වාගණනය නොකළ
2022	17,593,702	17,593,702	17,593,702	තත්ත්වාගණනය නොකළ
2023	18,637,632	18,637,632	18,637,632	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	රජයේ සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම තුළින් රජයේ වත්කම් කළමනාකරණය, වත්කම් පිළිබඳ පිරිවැය කළමනාකරණය හා අධීක්ෂණය කිරීම අරමුණු කොටගෙන 2017 වර්ෂයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවක් අනුව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා තිබුණි. ඉඩම්, ගොඩනැගිලි, මෝටර් රථ, නැව්, ගුවන් යානා, යන්ත්‍රෝපකරණ ආදිය ද ඇතුළත් දේශීයව හා විදේශීයව රජය සතු සියලු වත්කම් මධ්‍යගතව ලේඛනගත කිරීම කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය ඉටු කළ යුතු ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය පිහිටුවා 2023 දෙසැම්බර් 31 දින වන විට වසර 06 ක් ඉක්මගොස් තිබුණ ද, ඉහත දක්වන ලද සියලු වත්කම් ඇතුළත් කොට මධ්‍යගතව ලේඛනගත කිරීමක් සිදු කිරීමට කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට නොහැකි වී තිබුණි.	2023			

කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් වත්කම් පිළිබඳව මධ්‍යගත ලේඛනගත කිරීම සම්බන්ධයෙන් 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්වය පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.				
(i) රාජ්‍ය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ මධ්‍යගත දත්ත පද්ධතියට අදාළව තොරතුරු ඇතුළත් කළ යුතු රාජ්‍ය ආයතන 1,773 ක් (රජයේ ආයතන හා රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා සහ පළාත් පාලන ආයතන) 2021 දෙසැම්බර් 31 දිනට හඳුනාගෙන තිබුණ ද, කාර්යාලය විසින් එම ආයතනවලට අදාළව ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන කර නොතිබුණි.		කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය පිහිටුවීමේ අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතු වීම.	මෙම මධ්‍යගත දත්ත පද්ධතිය මාර්ගගත තොරතුරු කළමනාකරණ පද්ධතියක් මඟින් ස්ථාපිත කිරීමට 2017 වර්ෂයේ සිට උත්සාහ කළ අතර, වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 06/2023 මඟින් 2023.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මාර්ගගත මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) ස්ථාපිත කර 2023.09.01 දින සිට එහි පළමු මොඩියුලය ලෙස වාහන පිළිබඳ තොරතුරු කැඳවා ඇත.	ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය 2024 දෙසැම්බර් 31 දින වන තෙක් යාවත්කාලීන කර නොතිබුණි.
(ii) 2023 සැප්තැම්බර් 01 දින සිට මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය (NFAMS) ස්ථාපිත කෙරුණ ද, වාහන මොඩියුලය යටතේ එදින සිට පමණක් ආවරණය වන ලෙස වාහන පිළිබඳ තොරතුරු කැඳවා තිබුණි. එසේ වුවද රජයට අයත් නැව්, ගුවන් යානා, දුම්රිය, මඟී ප්‍රවාහන බස්රථ යනාදී වත්කම් පිළිබඳ තොරතුරු, දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට මේ වන විටත්	2023	කඩිනමින් තොරතුරු ගෙන්වාගෙන මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම.	-එම-	වාහන මොඩියුලය යටතේ රජයට අයත් නැව්, ගුවන් යානා, දුම්රිය, මඟී ප්‍රවාහන බස් රථ ඇතුළු සියලු වාහන පිළිබඳ තොරතුරු 2024 දෙසැම්බර් 31 දින වන තෙක් දත්ත පද්ධතියට ඇතුළත් කර යාවත්කාලීන කර නොතිබුණ.

නොහැකි වී තිබුණි.				
(iii) කොම්ප්ට්‍රොලර් ජනරාල්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 මඟින් පිරියත, යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සඳහා තොරතුරු ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට කිසිදු ආයතනයකින් තොරතුරු ලබා ගැනීමට නොහැකි වී තිබුණි.	2023	- එම -	- එම -	යන්ත්‍රෝපකරණ, ඉදිකිරීම්, කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ සඳහා වන තොරතුරු රාජ්‍ය ආයතන වෙතින් ලබාගෙන අදාළ දත්ත පද්ධතිය 2024 දෙසැම්බර් 31 දින වන විටත් යාවත්කාලීන කර නොතිබුණි.
(iv) රාජ්‍ය ආයතන විසින් වාහන හැර අනෙකුත් වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳව තොරතුරු කාර්යාලය වෙත වාර්තා කිරීම සඳහා වන ක්‍රමවේදයක් 2024 සැප්තැම්බර් 04 දින දක්වා ස්ථාපිත කර නොතිබුණි.	2023	වත්කම් මිලදී ගැනීම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු ඇතුළත් කර මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වීම. -	NFAMS තථ්‍යකාලීන දත්ත වාර්තා කරනු ලබන මාර්ගගත තොරතුරු පද්ධතියක් වන අතර පළමු මොඩියුලය ලෙස වාහන මොඩියුලය ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් මොඩියුලයන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.	වාහන හැර අනෙකුත් වත්කම් මිලදී ගැනීම් හා අපහරණය වාර්තා කිරීම සඳහා 2024 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රමවේදයක් නොතිබුණි.
(v) 2023 අගෝස්තු 09 දින රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ලබා දුන් නියෝග ප්‍රකාරව කාර්යාලය විසින් NFAMS ට දත්ත ඇතුළත් කිරීම සඳහා එක් එක් වත්කම් සඳහා මාර්ගගත (Online) දත්ත පද්ධතිය ක්‍රියාත්මක කර සම්පූර්ණ කිරීමට 2023 දෙසැම්බර් 31 දින සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය තුළ කාල රාමුවක් ඉදිරිපත්	2023	තොරතුරු ලබා නොදුන් රාජ්‍ය ආයතන වෙතින් කඩිනමින් තොරතුරු ලබාගෙන පද්ධතිය යාවත්කාලීන කළ යුතු වීම.	NFAMS පද්ධතියෙහි වාහන මොඩියුලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - රාජ්‍ය ආයතනවල (රජයේ ආයතන, රාජ්‍ය ව්‍යාපාර, පළාත් සභා හා පළාත් පාලන ආයතන) තොරතුරු ඇතුලත් කිරීමේ ඒකක (data entry points) වලින් 95% ක් මේ වන විට තොරතුරු වාර්තා කර ඇත.	2024 දෙසැම්බර් 31 දින වන විට වාහන පිළිබඳ තොරතුරු පමණක් වාර්තා කර ඇත.

	කර තිබුණි. ඒ අනුව, වාහන මොඩියුලය 2023 සැප්තැම්බර් 01 දින සිට ක්‍රියාත්මක කර 2023 දෙසැම්බර් 31 දින වන විට දත්ත පද්ධතිය සම්පූර්ණ කරනු ලබන බව දක්වා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට රාජ්‍ය ආයතන 110 ක වාහන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි වී තිබුණි.				
	(vi)කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තක්සේරු වටිනාකම් ඇතුළත් කර මධ්‍යගත ලේඛනය සකසා නොමැති වීම හේතුවෙන් රජයේ ගිණුමේ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් ශේෂයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	රජයේ ගිණුම තුළ දැක්වෙන මූල්‍ය නොවන වත්කම් වල වටිනාකම නිවැරදිව නිරූපණය කළ හැකිවන ලෙස පද්ධතිය සැකසීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.	මූල්‍ය නොවන වත්කම් කළමනාකරණ පද්ධතියෙහි (NFAMS) පළමු මොඩියුලය ලෙස වාහන මොඩියුලය ක්‍රියාත්මක කර ඇති අතර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් මොඩියුලයන් ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ.	රජයේ සියලුම මූල්‍ය නොවන වත්කම් පිළිබඳ තක්සේරු වටිනාකම් ඇතුළත් කර මධ්‍යගත ලේඛනය සකසා නොතිබුණි.
02	2023 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ පුරප්පාඩු 09 ක් පැවති අතර, එම පුරප්පාඩු අතරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 06 ක් පැවතුණි. එය අනුමත තනතුරු සංඛ්‍යාවෙන් සියයට 50 ක් විය.	2023	දෙපාර්තමේන්තු වේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම.	මෙම කාර්යාලයේ කටයුතු පවත්වා ගැනීමට මෙම පුරප්පාඩු පිරවීම අවශ්‍ය වේ. මෙම පුරප්පාඩු පුරවන ලෙස දන්වා ඇත.	2024 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ පුරප්පාඩු 13 ක් පැවතුණි.

100. ශීර්ෂය - 334 බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	111,725,148.6	-	111,725,148.6	තත්ත්වාගණනය නොකළ
2022	133,113,115.07	-	133,113,115.07	තත්ත්වාගණනය නොකළ
2023	137,767,817.22	-	137,767,817.22	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතනය විසින් ගත් වැළැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	නිලධාරීන් මියයාම සහ සේවය අත්හැර යාම යන හේතූන් මත දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී නොමැති සේවකයින්ගෙන්, 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂයකට වඩා වැඩි එකතුව රු.346,480 ක හිඟ ණය ශේෂයක් පැවතුණි.	2023	හිඟ ණයශේෂ කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු ය.	අයවිය යුතු ණයශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග යෙදීම.	අයවිය යුතු ණය ශේෂය රු. 250,000ක මුදලක් ණය සුරැකුම් රක්‍ෂණාවරණ මගින් ද, රු. 126,480 ක මුදල ඇපකරුගෙන් ද අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරමින් සිටින අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට ආයතනය වසා ඇත.
02	2020 ඔක්තෝම්බර් මස බඳවාගත් පුහුණුලාභීන් 34,605 අතරින් 2022 වර්ෂය වන විට මාස 06 පුහුණුවෙන් පසු තෙවන අදියරේ පුහුණුව සම්පූර්ණකර ගෙවීම් කොන්දේසි සපුරා තිබුනේ 22,306 ක් පමණක් වූ අතර, පුහුණුව සාර්ථකව නිමකල පුහුණුලාභීන්ට NVQ 3 සහතිකය පිරිනැමීම 2022 මැයි මාසය වන විටත් ඉටු වී නොතිබුණි. 22023 දෙසැම්බර් 31 දිනට ස්ථිර පත්වීම් නොලත් හා NVQ සහතික නොලත් බහුකාර්ය සහයකයින් 41 දෙනෙකු විය.	2021 2023	පුහුණුලාභීන් පුහුණු කිරීම, NVQ සහතිකය නොලැබී ඇති අයගෙන් එසේ නොලැබීමට හේතු සොයා ඒ සඳහා පිළියම් යෙදීමත් ස්ථිර කිරීමට අදාළ කටයුතු කඩිනමින් අවසන් කිරීමත් කළ යුතු ය.	ස්ථිර පත්වීම් නොලත් පුහුණුව සම්පූර්ණ කළ පුහුණුලාභීන්ට NVQ සහතිකය පිරිනැමීමටත්, ස්ථිර පත්වීම් ලබාදීමටත් පියවර ගනිමින් පැවතුණි.	ස්ථිර පත්වීම් නොලත් පුහුණුලාභීන් තවදුරටත් සිටියදී ආයතනය වසා ඇති නමුත්, බහුකාර්ය සංවර්ධන කාර්ය සහායක පුහුණුලාභීන්ගේ පරිපාලන කටයුතු ඒකබද්ධ සේවා අධ්‍යක්‍ෂ ජනරාල් යටතට පවරා ඇත.
03	2021 වර්ෂයේ රැකියාලාභීන්ට පුහුණුවෙන් පසු NVQ 3	2021	පුහුණුලාභීන් හැරයාම තුළින්	පුහුණුලාභීන් හැරයාම අවම	පුහුණුව සම්පූර්ණ නොකරන ලද

සහතිකය ලබාදී සුදුසු රජයේ රැකියා සඳහා අනුයුක්ත කිරීමට අපේක්ෂා කළ ද, පුහුණුකාලය තුලදී ඉවත් වූ පුහුණුලාභීන් සංඛ්‍යාව 2470 ක් විය. මෙම පුහුණුලාභීන් සඳහා මාසිකව ගෙවන ලද රු. 22,500 බැගින් වූ වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි. මෙම ඉවත් වූ පුහුණුලාභීන් 2,470 සඳහා මාසයක දීමනාව පමණක් මිලියන 55.58 ක් විය. 2022 වර්ෂයේ රැකියා ලක්ෂයේ වැඩසටහනේ අදියර 1 යටතේ 2020දී බඳවාගන්නා ලද පත්වීම්ලාභීන් 34,605 ක් NAITA ආයතනයේ පුහුණු වැඩසටහනට සහභාගි වී තිබුණු අතර පුහුණුව අවසානයේ ඉන් 1,592 ක් ඉවත්වී තිබුණි. රැකියා ලක්ෂයේ වැඩසටහනේ අදියර 2 යටතේ අලිවැට නඩත්තු සහායකයින් 3,544 ක් NAITA ආයතනයේ පුහුණු වැඩසටහනට සහභාගි වී තිබුණු අතර පුහුණුව අවසානයේ ඉන් 94 දෙනෙක් ඉවත්වී තිබුණි. 2022 වර්ෂයේ රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ 2022 දෙසැම්බර් 31 දිනට බඳවාගත් පුහුණුලාභීන් 38,375 ක් වූ අතර, ඉන් ඉවත් වූ මුළු පුහුණුලාභීන් සඳහා එක් අයෙකුට මාසිකව ගෙවන ලද රු. 22,500 බැගින් වූ වියදම් නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. මෙම ඉවත් වූ පුහුණුලාභීන් 7317 ක් සඳහා එක් මාසයක් දීමනාව රු.මි. 164.63 ක් විය. 2023 වර්ෂය වන විට බඳවාගන්නා ලද පුහුණු ලාභීන්ගෙන් 8,841 දෙනෙකු විවිධ හේතූන් මත ඉවත් වීම් සිදු වී ඇති අතර, එම ප්‍රමාණය මුළු බඳවාගත් පුහුණුලාභීන්ගෙන් සියයට 23	2022 2023	දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත අරමුණු ඉටු නොවන බැවින්, හැරයාම අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. පුහුණුලාභීන් ඉවත් වීමට බලපෑ හේතු සොයා පිළියම් යෙදිය යුතු ය.	කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	මෙන්ම සම්පූර්ණ කරන ලද බහුකාර්ය සහායකයින්ද ආයතනය හැර ගොස් ඇති ප්‍රමාණයක් සිටින අතර, ආයතනය වසා ඇති බැවින්, නිවැරදි දත්ත විගණනයට ඉදිරිපත් නොවුනි.

	ක් විය.				
04	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව ඇප තැබිය යුතු රජයේ නිලධාරීන් ඇප තබා නොතිබුණි.	2022	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව කටයුතු කල යුතු වීම.	ක්‍රියා මාර්ග දක්වා නොතිබුණි.	ක්‍රියාමාර්ග දක්වා නොතිබුණ අතර, වර්තමානය වන විට ආයතනය වසා ඇත.
05	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි.	2023	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් ලේඛනය පරීක්ෂා කළ හැකි වන පරිදි පවත්වා ගත යුතු ය.	බැරකම් ලේඛනය පරිගණක විසුරුම්පතක පවත්වා ගෙන ගොස් තිබුණි.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණ අතර, ආයතනය වසා ඇත.
06	දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2023	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු ය.	දෙපාර්තමේන්තු වේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන කලින් කල සමාලෝචනය සිදු කර පද්ධතිය ඵලදායී ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය වෙනස්කම් කරනු ලැබුවද, එම සමාලෝචනයන් ලිඛිතව පවත්වා ගැනීමට කටයුතු යොදා නොමැත.	ලිඛිතව පවත්වා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, ආයතනය වසා ඇත.
07	2023 වර්ෂය වන විට බඳවාගන්නා ලද පුහුණුලාභීන්ගෙන් පළමු අදියර යටතේ 31,463 ක් හා දෙවන අදියර යටතේ 3,264 ක් ලෙස අවසන් පුහුණුවලත් මුළු සංඛ්‍යාව 34,727 දෙනෙකු වූ අතර, ඒ සඳහා එකතුව රු.114,008,194 ක මුදලක් ගෙවා තිබුණ ද, 2023 දෙසැම්බර් 31 දින වන විට පත්වීම් ලබාදී ඇති බහුකාර්ය	2023	සම්මුඛ පරීක්ෂණ අදියරේ සිටින සහ පත්වීම්/නාමයෝජනා ලබාදිය යුතු සහයකයින් සඳහා අදාළ කාර්ය නිමකර ස්ථිර පත්වීම් ලබාදීමට කටයුතු කළ යුතු අතර, මෙතෙක් ස්ථිර පත්වීම් නොලද බහුකාර්ය	ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කළ ද සියළුම බහුකාර්ය සහයකයින් හට පත්වීම් ලබා දීමට කටයුතු යොදා නොතිබුණි.	ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු යොදා තිබුණ ද සියළුම බහුකාර්ය සහායකයින් වෙත ස්ථිර පත්වීම් ලබා දීමට අපොහොසත් වී ඇති අතර, 2023 දෙසැම්බර් 31 දින වන විට ආයතනය වසා ඇති බැවින්, බහුකාර්ය සංවර්ධන

	සහයකයින් සංඛ්‍යාව 23,024 පමණක් විය. රැකියා ලක්ෂයක් ලබාදීමේ වැඩසටහන යටතේ 2020 වර්ෂයේ සිට මේ දක්වා වසර 04 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, පත්වීම් නොලද සම්මුඛ පරීක්ෂණ අදියරේ සිටින සහයකයින් සංඛ්‍යාව 3,178 දෙනෙකු හා තවදුරටත් පත්වීම්/ නාමයෝජනා ලබාදිය යුතු සහයකයින් සංඛ්‍යාව 3,207 දෙනෙකු විය. 2023 දෙසැම්බර් 31 දිනට තාවකාලිකව ආයතනය වෙත අනුයුක්ත කර, මෙතෙක් ස්ථිර සේවයට බඳවාගෙන නොමැති බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින් සංඛ්‍යාව 6,385 දෙනෙකු විය.		සහායකයින් හට කඩිනමින් ස්ථිර පත්වීම් ලබා දීමට කටයුතු කළ යුතු ය.		කාර්ය සාධක බලකා පුහුණුලාභීන්ගේ පරිපාලන කටයුතු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් යටතට පවරා ඇත.
08	2021 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා සියළු මට්ටම්වල පුරප්පාඩු ප්‍රතිශතය සියයට 25 සිට සියයට 100 දක්වා පැවතීම, දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාමට බාධාවක් වී තිබුණි. පරිපාලන නිලධාරී තනතුරු දෙක සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 20 න් තනතුරු 15 ක් හා කළමණාකරන සේවා නිලධාරී තනතුරු 30 න් 23 ක් පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තු දෛනික රාජකාරීවලට බාධාවක් බව නිරීක්ෂණය විය. 2022 වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සිට ප්‍රාථමික මට්ටම දක්වා සියලු මට්ටම්වල පුරප්පාඩු ප්‍රතිශතය සියයට 28 සිට සියයට 100 දක්වා පැවතුණි.	2021 2022	කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර, 2023.12.31 දින ආයතනය වසා තිබුණි.

101. ශීර්ෂය - 335 ජාතික අධ්‍යාපන කොමිසම

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	47,494,100	33,250	47,460,850	තත්ත්වාගණනය කළ
2022	46,186,098	50,050	46,136,048	තත්ත්වාගණනය කළ
2023	47,241,739	52,950	47,188,789	තත්ත්වාගණනය නොකළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාගේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	තිරසාර සංවර්ධන අරමුණු 04ට අදාළ මධ්‍ය වාර්ෂික ප්‍රගති සමාලෝචනය සිදු කිරීම සම්බන්ධයෙන් වූ පර්යේෂණ වාර්තාව සඳහා 2023 දෙසැම්බර් 31 දින වන විට රු .3,883,457 ක වියදමක් දරා ඊට අදාළ කෙටුම්පත් වාර්තාව අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම පමණක් සිදුකර තිබුණු අතර අවසන් වාර්තාව පිළියෙල කර අදාල පාර්ශවයන්ට යොමුකර නොතිබුණි.	2023	ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් කඩිනමින් අවසන් කිරීමට ක්‍රියා කල යුතු වීම.	තිරසාර සංවර්ධන අරමුණු 04ට අදාළ මධ්‍ය වාර්ෂික ප්‍රගති සමාලෝචනය සිදු කිරීම සම්බන්ධයෙන් වූ කෙටුම්පත් පර්යේෂණ වාර්තාව පමණක් පිළියෙල කර ඇත.	මේ දක්වා අවසන් වාර්තාව පිළියෙල කර අදාල පාර්ශවයන්ට යොමුකර නොමැත.
02	කොමිෂන් සභා කාර්යාල පරිශ්‍රය වර්ග අඩි 10,000 කින් යුක්ත මාසික කුලිය රු.650,000 ක්වූ නුගේගොඩ පිහිටි ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් තිබුණි. එහෙත් 2021 ජූලි 01 දින සිට මාසික කුලිය 1,424,400ක් වන වර්ග අඩි 4,748 කින් යුක්ත වූ බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයෙහි කොමිෂන් සභා කාර්යාලය ස්ථාපිත කිරීම හේතුවෙන් වාර්ෂිකව රු. 7,184,596 ක අමතර වැයක් දැරීමට සිදු වී තිබුණි.	2021 2022	සේවා ගිවිසුම් වලට එළඹීමේදී වෙළඳපලේ පවතින තරගකාරී මිල රේටයන් සැලකිල්ලට ගෙන වඩාත්ම ඵලදායී සහ වාසි සහගත සේවා ගිවිසුම් වලට එළඹීමට කළමණාකරණය තීරණ ගත යුතුය.	මෙම ආයතනය අඩු කුලී වියදමක් සහිත වෙනත් සුදුසු ස්ථානයක ස්ථාපනය කරගන්නා තෙක් බණ්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය තුල ලබාගෙන ඇති වර්ග අඩි 1,000කට ආසන්න ප්‍රමාණයක් ආපසු භාර දීමට කටයුතු කරන ලද අතර ඒ අනුව 2023 බදු කුලී ගිවිසුම සංශෝධනය කෙරෙමින් පවතී.	මේ වන තෙක් නිර්දේශ පරිදි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

102. ශීර්ෂය -336 වෙළඳ නාවික ලේකම් කාර්යාලය

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	-	-	-	-
2022	139,626,119	134,585,889	5,040,230	තත්ත්වාගණනය කළ
2023	102,640,388	98,545,880	4,094,508	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණ	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	විගණිත ආයතන විසින් ගත් වැලැක්වීමේ ක්‍රියාමාර්ග	වාර්තාවේ දිනට නිර්දේශයේ ක්‍රියාත්මක තත්ත්වය
01	වෙළඳ නාවික ලේකම් කාර්යාල පැරණි ගොඩනැගිල්ල කඩා වැටීම හේතුවෙන් නව ගොඩනැගිල්ලක් වෙත කාර්යාලය ගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව වර්ෂයේ සමස්ත ප්‍රතිපාදනය තුළ වියදම් කලමනාකරණය කර ගත යුතු බවට තීරණය කර තිබුණි. එසේම මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන ඇත්නම් පමණක් බැඳීම් හා බැරකම් ඇතිකර ගත යුතු බව දක්වා තිබුණද, උක්ත රෙගුලාසි නොසලකා අවස්ථා 11කදී රු. 9,938,532ක ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් හා බැරකම් සඳහා එළඹ තිබුණි.	2023	මු.රෙ 94 (1) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ අනුමැතිය ලබාදී ඇත්තේ හැකිතාක් දුරට සමස්ථ ප්‍රතිපාදනය තුළ කළමනාකරණය කළයුතු බවත් අවශ්‍ය වුවහොත් අතිරේක ප්‍රතිපාදන ලබාදීමට හැකි බවත්ය.	අතිරේක ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබුණි.
02	(i) 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් 2022 හා 2023 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර	2022 2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගැනීමට ලේකම්	ප්‍රසම්පාදන සැලැස්ම සකස්කර ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය නිලධාරීන් වෙත වගකීම් පවරා ඇත.	2024 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

	නොතිබුණි.		කාර්යාලය කටයුතු කළ යුතු වීම.		
	(ii) 2018 ජනවාරි 24 දිනැති අංක 2018/02 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	අදාළ නිලධාරීන් වෙත වගකීම් පවරා ඇත	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව 2023,2024 වර්ෂ සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි.
	(iii) 2018 ජනවාරි 24 දිනැති අංක 05/2018/(1) දරන චක්‍රලේඛයෙන් සංශෝධිත 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව හඳුන්වාදී ඇති පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.	2023	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	අදාළ නිලධාරීන් වෙත ක්‍රියාත්මක කිරීමට වගකීම් පවරා ඇත.	පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සැකසීමේ කටයුතු සිදුකර නොතිබුණි
03	දැක්ම මෙහෙවර හා අරමුණු ඉටුකර ගැනීම සඳහා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 03 ඡේදය පරිදි මාර්ගෝපදේශ අංක 12 ප්‍රකාරව වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line), ආදායම් ශීර්ෂයන් සඳහා අනුමත ආදායම් එකතු කිරීමේ ක්‍රියාකාරී සැලැසුම් හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමැවුම්/ප්‍රතිඵල (Output/Outcome) හා ඇතුළත් විය යුතු වුවද ඒ අනුව විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි	2023	රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	අදාළ නිලධාරීන් වෙත ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා වගකීම් පවරා ඇත. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන අතර ඒ සඳහා අප කාර්යාලයට අදාළ තොරතුරු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.	විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

04	ක්‍රියාකාරී සැලැස්ම තුළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය, දැනට සේවයේ යෙදෙන කාර්ය මණ්ඩලය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත විය යුතු වුවත් එම කරුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි	2023	රාජ්‍ය මුදල් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඇතුලත් විය යුතු සියළු කරුණු ඇතුලත්ව විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	මේ සඳහා අදාළ සියළු ලේඛන හා වාර්තා සකස් කර ඇති අතර එම වාර්තා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට උපදෙස් ලබාදී ඇත.	විධිමත් පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.
05	වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ 2023 වර්ෂයේ කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව ප්‍රධාන කාර්යයන් 12 ක්, කෙටිකාලීන සැලසුම් 4 ක් හා දිගුකාලීන සැලසුම් 03ක් ඉදිරි සැලසුම් ලෙස දක්වා තිබුණද එම ප්‍රධාන කාර්යයන් හා සැලසුම්, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොමැති වීම හේතුවෙන් ලේකම් කාර්යාලයේ කාර්යසාධනය පරික්ෂා කිරිමට නොහැකි විය.	2023	කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ ඇතුලත් ප්‍රධාන කාර්යයන් මෙන්ම දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් ඇතුලත් කර ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ඇතුළත් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	මේ වන විට අදාළ සැලසුම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරීමට උපදෙස් දී ඇත.	දිගුකාලීන හා කෙටිකාලීන සැලසුම් ඇතුලත් කර ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.
06	යාපනය කයිට්ස්හි වෙළඳ නාවික ලේකම් උප කාර්යාලය, සංචාරක බංගලාව හා දියත්මග ව්‍යාපෘතියෙහි ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ රු.79,279,747ක් වැය කර තිබූ අතර එම ඉදිකිරීම් සිදු කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණු අතර 2022 හා 2023 වසර සඳහා රු.3,466,187ක් නඩත්තු වියදම්ද දරා තිබූ අතර වර්තමානයේදී ඒවා නිශ්ක්‍රීය වත්කමක් බවට පත්ව තිබුණි. සංචාරක බංගලාව 2020	2023	විධිමත් ක්‍රියාපටිපාටියක් අනුව වත්කම් කුලී පදනම මත ගැනීමට ලේකම් කාර්යාලය විසින් කටයුතු කළ යුතු වීම.	විගණකාධිපතිගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට නිලධාරීන්ට උපදෙස් දී ඇත. දිගු කාලීන කුළී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දීමට කටයුතු කරමින් පවතී	ඵලදායී කටයුත්තකට යෙදවීමට කටයුතු කර නොතිබුණි.

	වර්ෂයේ සිට ඉල්ලුම්කරුවන් වෙත වෙන්කර දීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බැවින් එය නිශ්කාර්ය වත්කමක් බවට පත්ව තිබූ අතර රජයට ලැබිය යුතු ආදායමක් අහිමි වී තිබුණි.				
07	යාපනය දියත්මග ව්‍යාපෘතියේ (Slipway) ප්‍රධාන යන්ත්‍රයට 2020 වර්ෂයේදී ස්වාභාවිකව ඇති වූ බුරවි නම් සුළි කුණාටුව හේතුවෙන් රු.2,088,808ක හානියක් සිදුව තිබූ අතර එම අලාභ හානිය අවම කර ගැනීම සඳහා වගකීම් කාලයක් හා හානි පාඩු රක්ෂණාවරණයක් ලබා ගැනීමට කළමණාකාරීත්වය කටයුතු නොකිරීම නිසා සමස්ත අලාභයම රජයට දැරීමට සිදුව තිබුණි. එසේම මේ පිළිබඳ මු.රෙ.104 ප්‍රකාරව වගකිව යුතු නිලධාරීන් හඳුනා ගෙන ඒ අනුව කටයුතු කිරීමටද ප්‍රමාණවත් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීමටද ක්‍රියාකර නොතිබුණි.	2023	මු.රෙ. 104 ප්‍රකාරව ඊට වගකිව යුත්තන් හඳුනාගෙන ප්‍රාරම්භක හා පූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම.	මින් ඉදිරියට ආයතනය සතු වත්කම් ආරක්ෂා කිරීමට ක්‍රියා මාර්ග ගෙන ඇත. මු.රෙ. 102(2) ඇ ඡේදය අනුව වැව් කණ්ඩි, බෝක්කු, පාලම් මංමාවත් දුම්රිය මාර්ග සහ ගොඩනැගිලි යනාදියට ගංවතුරෙන් සිදුවන අලාබ හා නි නැතිවීම් හා හානි යටතට ගණන් නොගන්නා බවට සඳහන් වේ. ඒ අනුව යාපනය දියත්මගට සිදුවූ හානිය එබඳු හානියක් බැවින් හානි හා පාඩු ලේඛනයට ඇතුලත් කර නොමැත.	ස්වාභාවික හානි වලක්වාගැනීම ට පූර්ව සැලසුම් පිළියෙල කිරීම කලමනාකර ණය සතු වුවත් එලෙසින් කටයුතු කර නොතිබුණි.
08	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර මු.රෙ. 133 (ආ) හා කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/01-2019 ප්‍රකාරව එම වගකීම අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මඟින්ද නිසි පරිදි ආවරණය වී නොතිබුණි.	2022 2023	මු.රෙ.133 ප්‍රකාරව හා චක්‍රලේඛ ප්‍රකාරව නිසි අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.	විගණකාධිපති නිර්දේශ අනුව කටයුතු සිදු කිරීම.	වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ විධිමත් අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණ අතර අමාත්‍යාංශයේ 2024 අභ්‍යන්තර විගණන සැලසුමට ද වෙළඳ නාවික ලේකම් කාර්යාලයේ ඇතුලත් වී

නොතිබුණි.

<table>
<tr>
<td>09</td>
<td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.
<table>
<tr><th>සේවක වර්ගය</th><th>අනුමත</th><th>තථ්‍ය සංඛ්‍යාව</th><th>පුරප්පාඩු</th></tr>
<tr><td>ජ්‍යෙෂ්ඨ</td><td>25</td><td>10</td><td>15</td></tr>
<tr><td>තෘතීයික</td><td>04</td><td>01</td><td>03</td></tr>
<tr><td>ද්විතීයික</td><td>66</td><td>48</td><td>18</td></tr>
<tr><td>ප්‍රාථමික</td><td>30</td><td>14</td><td>16</td></tr>
<tr><td></td><td>125</td><td>73</td><td>52</td></tr>
</table>
ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ සේවක සංඛ්‍යාව සියයට 60ක්, හා ප්‍රාථමික මට්ටමේ සේවක සංඛ්‍යාව සියයට 53ක් පුරප්පාඩුව පැවතුණි.</td>
<td>2022
2023</td>
<td>මානව සම්පත් ප්‍රශස්ත හා කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට ලේකම් කාර්යාලය කටයුතු කළ යුතු වීම.</td>
<td>නාවික ක්ෂේත්‍රයේ වෘත්තීයමය විධායක තනතුරු සඳහා බඳවා ගැනීමට අදාළ අනුමැතිය ලබාගෙන ජාතික පුවත්පත්වල දෙවතාවක්ම දැන්වීම් පලකළ ද කිසිවෙකුත් ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි. එම නිසා නැවත වතාවක් අයදුම්පත් කැඳවීමට කටයුතු සිදු කරමින් පවතී. තෘතියික, ද්විතීයික හා ප්‍රාථමික මට්ටම් වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා මේ වන විටත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිඛිතව සහ වාචිකව දැනුම් දී ඇත. ඒ අනුව මේ වන විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ක්‍රමානුකූලව නිලධාරීන් අනුයුක්ත කරමින් ඇත.</td>
<td>මානව සම්පත ප්‍රශස්ත මට්ටින් පවත්වා ගෙන යෑමට කටයුතු කර නොතිබුණි.

බඳවා ගැනීමේ පරිපාටි සකස් කිරීමේ කටයුතු කර නොතිබුණි.</td>
</tr>
</table>

103. **රජයේ මූල්‍ය ප්‍රකාශන**

	මුළු වත්කම් රු.	මුළු වගකීම් රු.	ස්කන්ධය රු.	මතය
2021	2,838,018,184,276	17,817,028,444,958	(14,979,010,260,682)	තත්ත්වාගණනය කළ
2022	4,873,546,457,604	27,350,908,982,178	(22,477,362,524,574)	තත්ත්වාගණනය කළ
2023	5,840,717,133,216	28,639,816,557,056	(22,799,099,423,840)	තත්ත්වාගණනය කළ

අනු අංකය	විගණන නිරීක්ෂණය	වාර්තාවේ වර්ෂය	විගණකාධිපති නිර්දේශය	ආයතනය විසින් ගනු ලැබූ වැළැක්වීමේ ක්‍රියාමාර්ග	ඒ ම්බන්ධයෙන් වූ වර්තමාන තත්ත්වය
01	ගිණුම්කරණ මූලධර්ම මත පදනම්ව පිළියෙල කර ඇති ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා ඇති පොදු අරමුදලේ ආරම්භක ශේෂයට ඇතුළත් කළ යුතු වන්නේ සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හෝ ඌනතාවය හා අතීතානුයෝගීව සිදු කරනු ලබන අනෙකුත් ගැලපීම් (Retrospective Adjustments) වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ විචලනයන් අන්තර්ගත කර, එයින් ඒකාබද්ධ අරමුදල සමඟ හිලව් විය යුතු ශේෂයන් ඉවත් කර ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් කළ යුතු විදේශීය ණය ශේෂ, විදේශීය ව්‍යවහාර මුදලින් ඇති දේශීය ණය ශේෂ හා උපණය ශේෂ දේශීය ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීමේදී ඇති වූ එකතු ශුද්ධ විදේශ විනිමය ලාභය වූ රු.මිලියන 1,572,718 ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණද ඒ සඳහා වූ පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති හෝ සටහන් මඟින් නිසිපරිදි අනාවරණය කර නොතිබුණි. එසේ වුවද එම ගැලපීම සිදු කළේ නම් සමාලෝචිත වර්ෂයේ	2023	ගිණුම්කරණ මූලධර්ම මත පදනම්ව ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.	පොදු අරමුදලේ ශේෂය සමන්විත වී ඇත්තේ ඒකාබද්ධ අරමුදලේ ශේෂය හා ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ශේෂය යන ශේෂ දෙකෙහි එකතුවෙන් බැවින් සමාලෝචිත වර්ෂයේ ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ශේෂයන්ගේ සිදු වූ වෙනස්කම් ද පොදු අරමුදලට ගලපා ඇත.	2023 දෙසැම්බර් 31 දිනට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

	ආදායම් ඌනතාවය රු.මිලියන 1,572,718 කින් අඩුවීමට හැකියාව තිබුණි. මේ අයුරින් ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කිරීම නිසා සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම්වලට සිදු කරන ලද ගැලපීම්, ණය ශේෂ සම්බන්ධව සිදු කරන ලද ගැලපීම් හා වැරදි නිවැරදි කිරීම් වක්‍ර ලෙස ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයට ගැලපී තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට නොහැකි බව නිරීක්ෂණය විය.				
02	රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් (Note to Readers) යටතේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය හිඟය, මූල්‍යනය කර ඇති ආකාරය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් නිරූපණය කරන බව දක්වා තිබුණද, මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතාවය මත පිළියෙල කර ඇති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් මූල්‍ය හිඟය මූල්‍යනය කර ඇති ආකාරය දක්වා නොතිබුණි.	2023	පරිශීලකයන්ට නිසි තොරතුරු අනාවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.	2024 වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ නිවැරදි කිරීම සිදුකරනු ඇත.	2023 දෙසැම්බර් 31 දිනට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
03	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙන් ජනිත වන රු.2,172,190,285,821 ක හිඟයත්, අයවැය ක්‍රියාකාරීත්වය සහ ඌනතාවය මූල්‍යනය කිරීමේ ප්‍රකාශයේ මුළු ආදායමෙන් වර්තන වියදම් අඩු කිරීමෙන් පසු ජනිත වන රු.1,650,857,019,989 ක හිඟයත් එකිනෙකට වෙනස් වුවද, ආදායම් ඌනතාවය ලෙස එම ඌනතාවයන් දෙකම එකම නමකින් නම් කර ඉදිරිපත් කර තිබුණි.	2023	පරිශීලකයන් ව්‍යාකූල නොවන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය.	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා අයවැය ක්‍රියාකාරීත්වය සහ ඌනතාවය මූල්‍යයනය කිරීමේ ප්‍රකාශනය අරමුණු 02 ක් සඳහා පිළියෙල කරනු ලබන ප්‍රකාශන 02 ක් වන අතර ආදායම් ඌනතාවය යන්න අදාළ ප්‍රකාශනයේ අරමුණ අනුව නිර්වචනය කළ යුතුය.	-එම-

04	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් වත්කම් හා වගකීම්, ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඉදිරි වර්ෂය තුළදී රජය විසින් ගෙවා නිම කළ යුතු බාහිර වගකීම් ප්‍රමාණය පිළිබඳව පැහැදිලි අවබෝධයක් ලබාගත නොහැකි විය.	2023/ 2022/ 2021	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට නිසි තොරතුරු අනාවරණය වන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.	රජයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට සකස් නොකරන අතර ඒ අනුව වත්කම් හා වගකීම් ජංගම හා ජංගම නොවන ලෙස වර්ගීකරණය නොකෙරේ.	-එම-
05	සමාලෝචිත වර්ෂයේදී සිදුකරන ලද මූල්‍ය නොවන වත්කම් උපලබ්ධි කිරීමට අදාළව වත්කම් වල පිරිවැය පොත් වලින් ඉවත් කිරීමකින් තොරව උපලබ්ධියෙන් ලද රු.515,895,718 ක වටිනාකම ගිණුම්කරණ මූලධර්මයන්ට පටහැනිව ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2023	ගිණුම්කරණ පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයන් හඳුන්වා දී ඇති බැවින්, ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්ගත කළ යුතු වීම.	මූල්‍ය නොවන වත්කම් විකිණීම හා අදාළ අලෙවි වටිනාකම ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් දැනට භාවිත වන ගිණුම්කරණ ප්‍රතිපත්තිය ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පැහැදිලිව හෙළිදරව් කර ඇත.	-එම-
06	රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉඩම්, නොනිමි වැඩ හැර එකතුව රු.මිලියන 882,576 ක් වටිනා මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් එම වත්කම්වල ක්ෂය කළ හැකි අගය එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූලව වෙන් කරමින් විචක්ෂණ ගිණුම්කරණ සංකල්පයට අනුව ක්ෂය ප්‍රතිපාදනය සිදු කර නොතිබුණි. තවද මෙම වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම මුදල් වර්ෂයක් අවසානයේදීම සමාලෝචනය කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. ඒ අනුව මෙම වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළ නිරූපණය නොවන අතර සමුච්චිත ක්ෂය හා සමුච්චිත	2023 2022 2021	-එම-	රජයේ මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමට සකස් නොකරන අතර ඒ අනුව වත්කම්වලට අදාළ ක්ෂයකිරීම් ගිණුම්ගත කිරීමක් සිදු නොවේ.	-එම-

	හානිකරණ අලාභ වෙතොත් එය අඩු කිරීමෙන් පසු ලැබෙන ධාරණ අගය (Carrying amount) පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට නිශ්චිත අවබෝධයක් ලබාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.				
07	2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වල මුළු වටිනාකම රු.2,093,287,997,716 වුවද, සමාලෝචිත වර්ෂයට අදාළව 2023 ජනවාරි 01 දිනට මෙම ශේෂය රු.2,017,866,940,344 ක් වී තිබුණි. ඒ අනුව, මූල්‍ය නොවන වත්කම්වල පෙර වර්ෂයේ අවසාන ශේෂයන් හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂයන් අතර රු.75,421,057,372 ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	මූල්‍ය ප්‍රකාශන සංරචක නිසි පරිදි හඳුනා ගැනීමට හා තහවුරු කරගැනීමකින් පසුව පමණක් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම.	මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ගිණුම්ගත කිරීමේ වගකීම එක් එක් වාර්තාකරණ ආයතනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සතු වගකීමක් වන අතර අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	-එම-
08	රජයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් මිලදී ගැනීම හෝ ඉදිකිරීම් සහ වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම යටතේ රු.385,393,946,314 වටිනාකමක් දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශන අනුව අදාළ වත්කම් ඉහළ ගොස් තිබුණේ රු.377,486,249,808 කින් පමණි. ඒ අනුව, රු.7,907,696,506 ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	-එම-	නිසි පිළිතුරක් ලැබී නැත.	-එම-
09	සමාලෝචිත වර්ෂයේ ලීසිං වාහන සඳහා ප්‍රාග්ධන වාරික ගෙවීම් වටිනාකම වන රු.609,482,108 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ සිදු වූ මුදල් ගලා යෑමක් ලෙස දැක්විය යුතු වුවද, එය ආයෝජන ක්‍රියාකාරකම් යටතේ සිදු වූ මුදල් ගලා යෑමක් ලෙස	2023	ගිණුම්කරණ මූලධර්මවලට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතු වීම.	නිසි පිළිතුරක් ලබා දී නොමැත.	-එම-

	දක්වා තිබුණි.				
10	රජයේ මූල්‍ය ප්‍රකාශනවල අන්තර්ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ජනනය වු මුදල් ප්‍රවාහය තුළ ප්‍රදාන ලෙස රු.25,501,817,303 ක් ඇතුළත් වුවද එම වටිනාකම තුළ මුදල් ගලා ඒමක් නොමැති රු.11,208,048,717 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ ප්‍රදාන ලෙස ලැබීම් අන්තර්ගත කර තිබුණි.	2023 2022	-එම-	-එම-	-එම-
11	විදේශ ව්‍යවහාර මුදලින් පවතින මූල්‍යමය වත්කම් (Monitory Assets) දේශීය ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කිරීමේදී ඇතිවන විදේශ විනිමය හුවමාරු ලාභය හෝ අලාභය ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් කළ යුතු වුවත්, එලෙස පැනනැඟී ඇති රු.57,388,881,470 ක සමුච්චිත වටිනාකම ඒ ඒ වර්ෂවලදී මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගැලපීම් නොකර, විදේශීය ණය චක්‍රීය අරමුදලට ගිණුම්ගත කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි අරමුදල් ගිණුමක් ලෙස දිගින් දිගටම ඉදිරිපත් කිරීම ගිණුම්කරණ මූලධර්මවලට අනුකූල නොවූ අතර, එය ව්‍යවස්ථාපිත හෝ ව්‍යවස්ථාපිත නොවන ලෙස පිහිටවූ අරමුදලක් නොවන බව නිරික්ෂණය විය.	2023	ගිණුම්කරණ පදනම මත පිළියෙල කරනු ලබන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට මෙම ගැලපීම් කළ යුතු වීම.	සුදුසු පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට හා අදාළ ගිණුමේ නම අදාළ පරිදි වෙනස් කිරීමට සටහන් කර ගන්නා ලදී. .	-එම-
12	2022 වර්ෂය තුළදී ගිණුම්ගත නොකරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභයෙන් රජයට පවරා තිබූ රු.1,028,542,891 ක වටිනාකම සමාලෝචිත වර්ෂය තුළදී කාලච්ඡේද සංකල්පයට අනුකූල නොවන ලෙස ගිණුම්ගත කර තිබුණි.	2023	මූලික ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම.	විගණකාධිපතිගේ නිර්දේශය අනුව අදාළ නිලධාරීන් දැනුවත් කර ඇත.	-එම-

13	විදේශීය ණය ගිවිසුම් 39 කට අදාළව එම ණය ගිවිසුම් වල උපයෝජනය නොකල ණය ශේෂ මත පදනම්ව ගණනය කරන ලද රු.1,167,945,184 ක් කැපකරු ගාස්තු (commitment fee) ලෙස සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම් කර තිබුණද එම වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ දැක්විය යුතු වුවද, එය වෙනත් භාණ්ඩ හා සේවා යටතේ දක්වා තිබුණි.	2023	වියදම් වර්ගීකරණය නිවැරදි ලෙස සිදු කළ යුතු වීම.	ණය ගිවිසුම්වලට අදාළව ගෙවන ලද කැපකරු ගාස්තු සඳහා වෙනම වැය විෂයය අංකයක් වෙන්කර නොමැති අතර එසේ ගෙවන ලද වටිනාකම විවිධ සේවා සඳහා වන වියදම් යටතේ ගිණුම්ගත කර ඇත.	-එම-
14	2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, මධ්‍යම රජයේ, රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) ශේෂය රු.මිලියන 30,720 ක් වුවද, විගණනය වෙත ඉදිරිපත් කරන ලද කාල විශ්ලෙෂණය අනුව එම ශේෂය රු.මිලියන 30,516 ක් විය. ඒ අනුව රු.මිලියන 204 ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම.	සියලුම ආයතනවල වාර්ෂික කාල විශ්ලේෂණ වාර්තා පරික්ෂා කර, නිරන්තරයෙන් පසු විපරම් කර අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් එම ශේෂයන් නිවැරදිව පවත්වාගෙන යාමට කටයුතු කරන මෙන් දැනුවත් කර ඇත.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
15	රජයේ මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ප්‍රාග්ධන දායකත්වයන් ලෙස රු.270,520,862,758 ක් දක්වා තිබුණ ද, මූල්‍ය ප්‍රකාශනයේ සටහන් අංක 15 අනුව එය රු.269,386,448,439 ක් වූයෙන් රු.1,134,414,319 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	2023	රජයේ ප්‍රාග්ධන දායකත්වයන් අදාළ ආයතනයන්හි ශේෂ සමඟ නිවැරදි අගයන් ගිණුම්ගත කළ යුතු වීම.	නිසි පිළිතුරක් ලැබී නැත.	-එම-
16	දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ යටතේ සමාලෝචිත වර්ෂය තුළදී ඇ.ඩො.788,237,384 වටිනා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරද, රජයේ දේශීය නීතිය යටතේ නිකුත් කරන ලද විදේශ විනිමය බැංකු වලට අදාලව මහජන බැංකුවෙන් ලබා ගෙන	2023	ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශය එහි අර්ථය නිරූපණය වන පරිදි පිළියෙල කළ යුතු වීම.	නිසි පිළිතුරක් ලැබී නැත.	-එම-

	තිබූ ඇ.ඩො.85,943,611 ණය මුදලද, රු.3,204,461,897,219 ව පැවති භාණ්ඩාගාර බැඳුම්කරද නව භාණ්ඩාගාර බැඳුම්කර බවට පරිවර්තනය කර තිබූ අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිලදී ගෙන තිබූ රු.2,368,416,351,609 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජයට ලබා දී තිබූ රු.344,728,000,400 ක අත්තිකාරම් මුදල, රු.2,492,347,352,009 වටිනා නව භාණ්ඩාගාර බැඳුම්කර ලෙසට සහ රු.220,797,000,000 වටිනා නව භාණ්ඩාගාර බිල්පත් ලෙසටත් පරිවර්තනය කර තිබුණි. මෙම පරිවර්තනය කිරීම් වලදී කිසිදු මුදල් ගලා ඒමක් හෝ ගලා යාමක් සිදු නොවුනද එම පරිවර්තනයන් මුදල් ගලා ඒම් සහ ගලා යාම් ලෙස සලකා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර තිබූ බව නිරීක්ෂණය විය.				
17	විදේශීය රාජ්‍ය ණය වාර්තා කිරීමට භාවිතා කරන පරිගණක පද්ධතියේ CSDRMS 854-1 වාර්තාව හා රජයේ මූල්‍ය ප්‍රකාශන සන්සන්දනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් විය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල පැහැදිලි කිරීමේ සටහන් (Explanatory Notes) 24(II) අනුව 2023 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත නොකළ විදේශීය ණයවල මුළු වටිනාකම රු.මිලියන 17,103.2 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ මෙන්ම පෙර වර්ෂවලදී ද ප්‍රතිලබ්ධි වී ඇති නමුත් ගිණුම්ගත නොකළ ණය වටිනාකම් පැවතීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31	2023/ 2022/ 2021	රාජ්‍ය ණය ගැනීම හා ණය සේවා ගිණුම්ගත කිරීම විධිමත් කල යුතු වීම.	රාජ්‍ය ණය ගැනීම වාර්තාගත කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශනය නව රාජ්‍ය ණය කලමනාකරණ කාර්යාලය මඟින් සිදුකිරීමට නියමිතය.	2023 දෙසැම්බර් 31 දින වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

	දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විදේශ ණය වටිනාකම රු.මිලියන 15,823 ක් අඩුවෙන් දක්වා තිබුණි.				
18	රජයේ මූල්‍ය ප්‍රකාශනවල වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ වියදම් හඳුනාගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, සියළුම වියදම්, ගෙවීම් සිදු කර ඇති කාලසීමාව තුළ ගිණුම්ගත කර ඇති බව දක්වා තිබුණ ද, මෙලෙස, ඉහත දක්වා ඇති, ගිණුම්ගත නොකළ විදේශ ණය මුදල් භාවිතා කර දරා ඇති වියදම් සමාලෝචිත වර්ෂයේදී ගිණුම්ගත කර නොමැති බව නිරීක්ෂණය විය.	2023 2022	සියළු ණය ගිණුම්ගත කර අදාළ වියදම් නිවැරදිව සටහන් කළ යුතු වීම.	පසුගිය වර්ෂයන්ට සාපේක්ෂව, අදාළ ගිණුම්ගත කිරීම්වල ප්‍රගතියක් ඇති අතර නිරන්තරව අවශ්‍ය සුපරික්ෂණය සිදුකරනු ලැබේ.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
19	2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් පිටත පවත්වාගෙන පැමිණි ණය වර්ග 19 අදාළව රු.මිලියන 10,645.2 ප්‍රතිලබ්ධිවීම් සමාලෝචිත වර්ෂය තුළදී ගිණුම්ගත කර තිබුණු අතර, ඒ පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි. ඒ අනුව කාලච්ඡේද සංකල්පයට පටහැනිව අදාළ වර්ෂය තුළ ප්‍රතිලබ්ධි වුවත්, එම වර්ෂය තුළ සමහර විදේශ ණය ගිණුම්ගත නොකිරීම දිගින් දිගටම සිදු කරන බව තවදුරටත් නිරීක්ෂණය විය.	2023 2022 2021	ණය ගිණුම්ගත කිරීම කාලච්ඡේද සංකල්පයට අනුකූලව සිදු කළ යුතු වීම.	වියදම දරනු ලබන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන වර්ෂය තුළදීම එම උපලබ්ධීන් තහවුරු නොකිරීම නිසා මෙම තත්ත්වය ඇතිව තිබේ. කෙසේ වුව ද, මේ පිළිබඳව අදාළ ආයතන දිගින් දිගටම දැනුවත් කර ඇත.	-එම-
20	ණය අංක 2016035 අදාළව දෝෂ සහිත විනිමය අනුපාතිකයක් භාවිතා කිරීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට එම ණය වටිනාකම රු.මිලියන 962 කින් අඩුවෙන් දක්වා තිබුණි.	2023	විදේශීය ව්‍යවහාර මුදල් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී නිසි අවධානය යොමු කළ යුතු වීම.	2023/12/31 දිනට පැවති XDR විනිමය අනුපාතය වෙනුවට USD විනිමය අනුපාතය යොදා ගැනීම හේතුවෙන් මෙම වෙනස සිදුව ඇත. මින් ඉදිරියට එසේ නොවන ලෙස අදාළ නිලධාරීන් ලිඛිතව දැනුවත් කරන	-එම-

				ලදී.	
21	CSDRMS 854-1 වාර්තාවට අනුව ණය අංක 2018003 අදාළව 2023 වර්ෂයට කිසිදු ප්‍රතිලබ්ධිවීමක් නොමැති වුවද, රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(II) සහ අයවැය ක්‍රියාකාරීත්වය හා හිඟය මූල්‍යනය කිරීම යටතේ සටහන් අංක 11 අනුව EUR 727,053 ක් ප්‍රතිලබ්ධි වී ඇති බව දක්වා තිබුණි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව මෙම ණය මුදලට අදාළව 2022 වර්ෂය තුළ හෝ ඊට පෙර වර්ෂවල ප්‍රතිලබ්ධි වී 2023 වර්ෂය තුළ ගිණුම් ගත කරන ලද ණය වටිනාකම EUR 335,930 ක් පමණක් විය. ඒ අනුව මෙම ණයමුදලට අදාළව 2023 වර්ෂය තුළ ප්‍රතිලබ්ධි වීම් අතර EUR 391,123 ක වෙනසක් නිරීක්ෂණය විය.	2023	ණය ලබා ගැනීම් නිවැරදි කාලච්ඡේදය තුළ නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වීම.	ප්‍රමාද වී ප්‍රතිලබ්ධි සටහන් ලැබීම අවම කර ගැනීම සඳහා ණයහිමියන් දැනුවත් කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී. තවද ණය ශේෂ පරීක්ෂාව වාර්ෂිකව සිදු කරනු ලැබේ. ප්‍රදායකයන් වෙතින් ලද ප්‍රතිලබ්ධි සටහන්වල අගයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලද ආපසු ගෙවීම් සටහන් අනුව, ලැබී ඇති සියලු අගයයන් නොපමාව පද්ධතියට ඇතුළත් කර ඇත. තවද, දැනට නොගෙවා ඇති ණය සම්බන්ධව ක්‍රියාත්මකවන ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡාවලදී තවදුරටත් දත්ත සටහන් නිවැරදි දැයි අදාළ එක්එක් ද්විපාර්ශ්වික ණයහිමියන් සමඟ පරීක්ෂා කෙරේ. එහිදී යම් අනනුකූලතාවයක් අනාවරණය වුවහොත් වහාම යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
22	CSDRMS 854-1 වාර්තාවේ ණය ගිවිසුම් 23 ක ට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට සහ 2023 ජනවාරි 01 දිනට ශේෂයන් අතර එකතුව රු.මිලියන 30,401 ක වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(11) න් සහ අයවැය	2023	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම හා ප්‍රතිලබ්ධි ප්‍රමාද වීම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම.	-එම-	-එම-

	ක්‍රියාකාරීත්වය හා හිභය මූල්‍යානය කිරීම යටතේ සටහන් අංක 11 න් සමාලෝචිත වර්ෂය තුළදී සත්‍ය වශයෙන්ම ණය ප්‍රතිලබ්ධිවීම්වල නිවැරදි වටිනාකම නිරූපණය නොවන බව ද නිරීක්ෂණය විය.				
23	රජයේ මූල්‍ය ප්‍රකාශනවලට පරිබාහිරව පවත්වාගෙන තිබූ ණය වර්ග 08 කට අදාළ රු.මිලියන 518,293 ණය ශේෂ 2022 වර්ෂයේදී ගිණුම්ගත කිරීමේදී එම ණයවලට අනුරූපී ලෙස රජය විසින් කරන ලද ආයෝජන හෝ ප්‍රාග්ධන ප්‍රදානයන් රජයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. තවද, අංක MF/PE/001/CM/2023/05 හා 2023 ජනවාරි 20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉහත ණයවල ඇතුළත් මත්තල ගුවන් තොටුපළ ව්‍යාපෘතිය සඳහා ලබා ගත් ණය, රජයේ මූල්‍ය ප්‍රකාශනවලට පවරා ගැනීමට අදාළව එම ණය ආපසු ගෙවීමේ කාලසටහනට අනුකූලව ණය සේවාකිරීමේ මුදලට සමාන මුදලක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමට ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගමට යොමු කරන ලෙසත්, මේ සඳහා ගුවන් තොටුපළ සහ ගුවන් සේවා සමාගම, මහා භාණ්ඩාගාරය සමඟ නව අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කළ යුතු වුවද, එවැනි ගිවිසුමක් විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර, එම ණය මුදල වන රු.මිලියන 29,852 ක් උපණයක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	2023 2022	ණය ලබාගෙන අත්පත් කර ගනු ලබන වත්කම් නිවැරදි ලෙස ගිණුම්ගත කළ යුතු වීම.	පිළිතුරක් ලබා දී නොමැත.	-එම-
24	රජයේ මූල්‍ය ප්‍රකාශනවල සහ CSDRMS 854 -1 වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේදී ණය ගිවිසුම් 04 ක්	2023 2022 2021	සෘන ණය වටිනාකම් පැනනැගීමට හේතු මූල්‍ය	ගිණුම් තබන ආයතනය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂ හෝ අදාළ රේඛීය	2023 දෙසැම්බර් 31 දින වන විට මෙම

	සම්බන්ධයෙන් එකතුව රු.821,115,454 ක සෘන ණය ප්‍රතිලබ්ධි වීම් නිරීක්ෂණය විය.		ප්‍රකාශනවල හෙළිදරව් කර එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම.	අමාත්‍යාංශයෙන් හෝ වියදම් ඒකකවලින් විමසීමෙන් ප්‍රතිලබ්ධි ආපසු පවරාගැනීම පිළිබඳ නිශ්චිත (හේතු) කරුණු තහවුරු කර ගත හැකි අතර, ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව ඉදිරියේදී සටහන් කිරීමට අපේක්ෂිතය.	තත්ත්වය නිරීක්ෂණය විය.
25	රජයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 24(1) න් ඉදිරිපත් කර ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ව්‍යාපෘති ණය ශේෂවලට (Foreign Currency Banking Unit Loan (Project) Balances) අදාළ CS-DRMS 854-1 වාර්තාව සමඟ සැසඳීමේදී 2017045 දරන ණය ගිවිසුමට අදාළව 2022 දෙසැම්බර් 31 දිනට සහ 2023 ජනවාරි 01 දිනට USD 227,823 ක හෙවත් රු.82,724,927 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, ණය ආපසු ගෙවීම් අතර ද USD 227,823 ක වෙනසක් නිරීක්ෂණය වුවද, එහි දේශීය මුදල් වටිනාකමෙහි කිසිදු වෙනසක් නිරීක්ෂණය නොවිය. තවද, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආපසු ගෙවන ලද USD 332,704 ක මුදල දේශීය මුදල් බවට පරිවර්තනය කිරීමේදී USD 1 ක් රු.524.6050 ක් ලෙස අසාමාන්‍ය විදේශ විනිමය අනුපාතයක් යොදාගෙන ඇති බව නිරීක්ෂණය විය.	2023	රාජ්‍ය ණය ගැනීම, ණය සේවාකරණය ගිණුම්ගත කිරීම විධිමත් පරිදි සිදු කළ යුතු වීම.	විගණනයෙන් පෙන්වා දී තිබූ වරද දත්ත පද්ධතියේ නිවැරදිකර ඇති අතර, සටහන් කරන ලද දත්ත නැවත පරීක්ෂා කිරීමේ අභ්‍යන්තර ක්‍රමවේදයක් සකස් කර ඇත. මෙහිදී පැනනැඟුණු තාක්ෂණික දෝෂය ඉවත්කර ගැනීම සඳහා, තිරසාර තාක්ෂණික සහායක් ඇති ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ණය කළමනාකරණ පද්ධතියක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ අතර, ඉදිරියේදී විදේශ ණය දත්ත පිළිබඳ කටයුතු රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත පැවරේ.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
26	අයවැය ක්‍රියාකාරීත්වය සහ හිඟය මූල්‍යනය කිරීමේ ප්‍රකාශය තුළ සටහන් අංක 14 මඟින් දේශීය ණය ආපසු ගෙවීම්වලට අදාළ විස්තරාත්මක තොරතුරු හෙළිදරව් කර තිබුණ ද, 2023 වර්ෂය තුළදී විදේශ ණය ආපසු	2023 2022	තොරතුරු ඉදිරිපත් කිරීමේදී සංගතභාවය පවත්වා ගත යුතු වීම.	නිසි පිළිතුරක් ලබා දී නොතිබුණි.	-එම-

	ගෙවීම් වටිනාකම වූ රු.මිලියන 337,296 ට අදාළව එවැනි සටහනක් ඉදිරිපත් කර නොතිබුණි.				
27	ප්‍රදායකයන් විසින් එවා තිබූ ණය ශේෂ තහවුරුකිරීම්, රජයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සහ පරිගණකගත ණය කළමනාකරණ පද්ධතියේ 854-1 වාර්තාව සමඟ සංසන්දනය කිරීමේදී ණය වර්ග 13කට අදාළව වූ ශේෂය රු.මිලියන 4,775 ක් වැඩියෙන්ද ණය වර්ග 14කට අදාළව රු.මිලියන 5,126 ක් අඩුවෙන්ද රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ වාර්තා වී ඇති බව නිරීක්ෂණය විය.	2023 2022 2021	ණය ප්‍රදායක ආයතන සමඟ ණය ශේෂ නිරන්තරයෙන් සැසඳුම් කළ යුතු අතර, අවශ්‍ය නිවැරදි කිරීම් නිසි විමසා බැලීමකින් අනතුරුව සිදු කළ යුතු වීම සහ අවශ්‍ය පරිදි හෙළිදරව් කිරීම.	ප්‍රමාද වී ප්‍රතිලබ්ධි සටහන් ලැබීම අවම කර ගැනීම සඳහා ණයහිමියන් දැනුවත් කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී. තවද ණය ශේෂ පරීක්ෂාව වාර්ෂිකව සිදු කෙරේ. ප්‍රදායකයන් වෙතින් ලද ප්‍රතිලබ්ධි සටහන්වල අගයන් හා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලද ආපසු ගෙවීම් සටහන් අනුව, ලැබී ඇති සියලු අගයයන් නොපමාව පද්ධතියට ඇතුළත් කර ඇත. තවද, දැනට නොගෙවා ඇති ණය සම්බන්ධව ක්‍රියාත්මකවන ණය ප්‍රතිව්‍යුහගතකරණ සාකච්ඡාවලදී තවදුරටත් දත්ත සටහන් නිවැරදි දැයි අදාළ එක්එක් ද්විපාර්ශ්වික ණයහිමියන් සමඟ පරීක්ෂා කෙරේ. එහිදී යම් අනනුකූලතාවයක් අනාවරණය වුවහොත් වහාම යාවත්කාලීන කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
28	ණය ප්‍රදායක ආයතන වලින් ලද ණය ශේෂ තහවුරුකිරීමේ ලිපි සම්බන්ධයෙන් වන නියැදි පරීක්ෂාවේ දී ගෙවිය යුතු ගාස්තු (Fee Overdue Amount) ලෙස ඇ.ඩො. 50,793ක මුදලක් සහ ද්‍රවශීලතා ගාස්තු ලෙස (Liquidity Fee) යූරෝ	2023	ණය ප්‍රදායක ආයතන සමඟ ණය ශේෂ නිරන්තරයෙන් සැසඳුම් කළ යුතු අතර, අවශ්‍ය නිවැරදි කිරීම් නිසි විමසා බැලීමකින්	ඇතැම් විදේශ ණය ගෙවීම අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවීමට රජය ගත් ප්‍රතිපත්තිමය තීරණය අනුව, බලපෑමට ලක්වූ ණයවල නොගෙවන	-එම-

	92,032ක් දක්වා තිබුණි. එසේ වුවද, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර හෝ හෙළිදරව් කර නොතිබුණි.		අනතුරුව සිදු කළ යුතු වීම සහ අවශ්‍ය පරිදි හෙළිදරව් කිරීම.	ලද වාරික, පොලිය හා දඩ මුදල් පිළිබඳ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළ සම්මුති සාකච්ඡාවලදී තීරණයකට එළඹෙනු ඇත.	
29	ප්‍රතිලබ්ධි වූ කාලපරිච්ඡේදය සලකා බැලීමේදී 2023 වර්ෂයට අදාළව ප්‍රතිලබ්ධි වූ ඇතැම් විදේශ ණය 2023 මැයි 07 දින මුද්‍රණය කළ පරිගණක ගත ණය කළමනාකරණ පද්ධතියේ 814-1 වාර්තාවේ ඇතුළත් වුවද 2024 පෙබරවාරි 17 දින මුද්‍රණය කළ වාර්තාවේ එම ප්‍රතිලබ්ධි වීම් ඇතුළත් වී නොමැති අතර, ඒ අනුව රු.මිලියන 1,290ක විදේශ ණය ශේෂයක් රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිලබ්ධී වූ ණය ලෙස ගිණුම්ගත කිරීම අත්හැරී තිබුණි.	2023 2022 2021	ණය ගිණුම්ගත කිරීම නිවැරදි කාල පරිච්ඡේදයට සිදු කළ යුතු වීම.	-එම-	-එම-
30	2023 දෙසැම්බර් 31 දින වන විට රජය විසින් ප්‍රාග්ධන දායකත්වය ලෙස රු.1,124,665,353,761 ක් සපයා තිබූ රාජ්‍ය ව්‍යවසායන් 13 ක 2022 දෙසැම්බර් 31 දිනට එම වටිනාකම රු.1,047,966,900,772 ක් වූ අතර, එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ඒවායේ ශුද්ධ වත්කම් (මුළු වත්කම් - මුළු බාහිර වගකීම්) වල අගය සෘන රු.630,632,144,273 ක් වී තිබුණි. ඒ අනුව, රජයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය වත්කම් යටතේ මෙම ප්‍රාග්ධන දායකත්වයන් දක්වා ඇති නමුත්, එහි වටිනාකම පූර්ණ වශයෙන් අපහායනය (impairment) වී, අදාළ ආයතන මුළුමනින්ම බාහිර වගකීම් යටතේ පවත්වාගෙන යන තත්ත්වයකට පත්ව ඇති බව නිරීක්ෂණය විය. තවද, මේ සඳහා මූලික වශයෙන්	2023	රජයේ හිමිකාරීත්වය දරන ආයතනයන් හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම් හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි අන්තර්ගත කළ යුතු වීම.	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර ඒවායේ වටිනාකම් අඩුවීම් අනාවරණය කිරීමට කටයුතු ඉදිරියේදී කරනු ලැබේ.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය දක්නට ලැබුණි.

	බලපා ඇත්තේ අදාළ ආයතන අලාභ ලැබීම හේතුවෙන් රඳවා ගත් ලාභය ඍණ අගයක් ගැනීම බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.				
31	2023 දෙසැම්බර් 31 දිනට රු.1,019,627,985,708 සහ 2022 දෙසැම්බර් 31 දිනට රු.892,034,785,542 ක් වූ රජයේ ප්‍රාග්ධන වටිනාකමක් සහිත රාජ්‍ය ව්‍යවසායන් 05 ක 2022 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම්වල වටිනාකම රු.371,771,137,033 ක් වී තිබුණි. ඒ අනුව මෙම රාජ්‍ය ව්‍යවසායන් වල ආයෝජනය කර ඇති ප්‍රාග්ධන දායකත්ව වටිනාකම අපහායනයට (impairment) ලක් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	2023	-එම-	රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර අවශ්‍ය සංශෝධනයන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	-එම-
32	2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ව්‍යවසායන් සඳහා ප්‍රාග්ධන දායකත්ව වටිනාකම රු.2,165,981,657,905 ක් වූ අතර, එයින් රු.2,121,653,720,125 ක් රජයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම්වල ආයෝජනය කර තිබුණි. එසේ වුවද, එදිනට මෙම ව්‍යාපාර ආයතනවල ශුද්ධ වත්කම්වල මුළු වටිනාකම රු.1,669,676,388,290 ක් වී තිබුණි. ඒ අනුව, ඉහත ආයතන වර්ග තුනට අදාළ රජයේ ප්‍රාග්ධන දායකත්වය එම ආයතනවල ශුද්ධ වත්කම්වලට සාපේක්ෂව රු.451,977,331,835 ක් හෙවත් සියයට 21 කින් අපහායනය වී ඇති බව නිරීක්ෂණය විය.	2023	-එම-	රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර අවශ්‍ය සංශෝධනයන් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	-එම-
33	2022 වර්ෂය තුළදී රජය විසින් ආයෝජනය කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩල 32 කට අදාළව රු.117,718,706,426 ක	2023	-එම-	මෑතකාලීනව මහා භාණ්ඩාගාරය විසින් ආර්ථිකයට සිදු කරන ලද ව්‍යුහාත්මක	-එම-

	ශුද්ධ ලාභයක් උපයා තිබුණ ද, රාජ්‍ය සංස්ථා 36 කට සහ රජය සතු සමාගම් 30 කට අදාළව පිළිවෙලින් රු.804,795,113,607 ක් හා රු.133,722,486,417 ක් ලෙස ශුද්ධ අලාභ ඉපයීම හේතුවෙන් මෙම ආයතන 98 ට අදාළව සමස්තයක් වශයෙන් රු.820,798,893,548 ශුද්ධ අලාභයක් ලබා ඇති බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවට අනුව 2022 වර්ෂයේ මධ්‍ය වාර්ෂික ජනගහනය 22,181,000 වූ අතර, ඒ අනුව රජය සතු ව්‍යාපාර ආයතන 98 ක් වෙනුවෙන් 2022 වර්ෂය සඳහා දරා ඇති ඒක පුද්ගල ශුද්ධ අලාභය රු.37,000 ක් පමණ වන බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.			ප්‍රතිසංස්කරණයන් තුළින් ආර්ථිකය යථාවත් වීමත් සමඟ මෙතෙක් අලාභ ලැබූ රාජ්‍ය ව්‍යවසායන් සැලකිය යුතු ප්‍රමාණයක් ලාභ උපයන තත්වයට පත්වෙමින් පවතී. ඒ අනුව ඉදිරියේදී රජය සතු ව්‍යාපාර ආයතන වෙනුවෙන් දරා ඇති ඒක පුද්ගල ශුද්ධ අලාභය අවම කර ගැනීමට හැකි වනු ඇත.	
34	රාජ්‍ය ව්‍යවසායන් 8 ක් විසින් ඉදිරිපත් කරන ලද ඍජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 10,803 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.මිලියන 4,323 ක් වීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 6,480 ක් අඩුවෙන් දක්වා තිබුණි.	2023 2022 2021	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ඇගයීමට ලක් කර නිසි ක්‍රියා මාර්ග ගැනීමට හා ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.	එම වෙනස ඇතිවීමට බලපෑ හේතු කවරේද යන්න හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතින අතර අදාළ වෙනස්කම් නිසි පරිදි හඳුනා ගැනීමෙන් අනතුරුව විධිමත් අනුමැතියක් සහිතව ප්‍රධාන ලෙජර ගිණුම්වල වාර්තා කිරීමට අපේක්ෂා කෙරේ.	-එම-
35	ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් (Sri Lanka Institute of Biotechnology (Pvt) Ltd) ආයතනයෙන් ලද ඍජු ශේෂ සනාථ කිරීම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට කොටසක මිල රු.10 ක් වූ කොටස් 52,472,573 ක් මහා භාණ්ඩාගාරය සතු බව සඳහන් කර තිබුණ ද, රජයේ මූල්‍ය	2023	-එම-	අදාළ රේඛීය අමාත්‍යාංශයේ වැය ශීර්ෂයෙහි හිමිකම් ප්‍රාග්ධන වැය විෂය යටතේ ලබා දී ඇති ප්‍රාග්ධන දායකත්වය ප්‍රධාන ලෙජර ගිණුම්වල වාර්තා නොවීම මත මෙම වෙනස හට ගෙන ඇති අතර මෙම වර්ෂය	-එම-

	ප්‍රකාශන තුළ සටහන් වී ඇත්තේ කොටසක මිල රු.100 ක් වූ කොටස් 200,000 ක ප්‍රාග්ධන දායකත්වයක් පවතින බවයි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට එම ආයතනයට අදාළව කොටස් අයිතියෙහි හා ප්‍රාග්ධන දායකත්වයෙහි රු.504,725,732 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.			තුළදී අදාළ වාර්තා කිරීමේ කටයුතු සිදු කෙරෙනු ඇත.		
36	රාජ්‍ය සමාගම් 02ක හිමිකාරීත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව ගණනය කිරීමේදී 2023 දෙසැම්බර් 31 දිනට කොටස් වටිනාකම රු.මිලියන 5,141 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු.මිලියන 14,476 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන දායකත්වයෙහි රු.මිලියන 9,335 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	2023 2022	-එම-	Bogala Graphite Lanka PLC හි අදාළ ගණනය කිරීම් නිවැරදි කර ගැනීමට සටහන් කර ගතිමි. මිහින් ලංකා (පෞද්ගලික) සමාගමෙන් රාජ්‍ය බැංකු වලට ගෙවිය යුතු ණය අයකරගත නොහැකි නිසාත්, එම ණය සඳහා රජය විසින් භාණ්ඩාගාර ඇපකර නිකුත් කර ඇති නිසාත්, එම ණය සඳහා වන වාර්ෂික පොළියට අදාල මුදල රාජ්‍ය බැංකු මගින් රජයට ලබාදෙන අයබදු (Levy) වලින් කපා හැර ඉතිරිය පමණක් රජයට ප්‍රේෂණය කරයි. මෙම මුදල මිහින් ලංකා (පෞද්ගලික) සමාගම සඳහා වන බැවින් හා වසා දැමීමේ කටයුතු ආරම්භ කර ඇති මිහින් ලංකා (පෞද්ගලික) සමාගම සමඟ රජයට දැනට ඇති එකම බැඳියාව ප්‍රාග්ධනය වන බැවින් එම මුදල ප්‍රාග්ධනය ලෙස වාර්තා කර ඇත.	-එම-	
37	1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ගිණුම්	2023 2022	චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු	ඉදිරියේදී ප්‍රදාන	පූර්ණ පිළිබඳ	2023 වර්ෂය අවසන් වන

	චක්‍රලේඛය ප්‍රකාරව, විදේශාධාර සම්බන්ධ සියළු ගණුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් කළ යුතු බව සඳහන් වුවද, නියැදි පරීක්ෂාවක් මත ලබාගත් තොරතුරු අනුව, 2023 දී මහා භාණ්ඩාගාරයේ දැනුවත් වීමකින් තොරව ආයතන 11 ක් සඳහා එකතුව රු.මිලියන 22,210 ක විදේශ ප්‍රදාන ඍජුව ලැබී තිබුණු අතර එම වටිනාකම් ප්‍රතිපාදන සලසාගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.		කිරීම, අමාත්‍යාංශය යටතේ වන විවිධ දෙපාර්තමේන්තු අතර මනා සබඳතාවයක් හා සම්බන්ධිකරණය කින් කටයුතු කිරීමට හා ඊට පටහැනිව කටයුතු කරන පාර්ශව වලට අදාළ නිසි පියවර ගත යුතු වීම.	ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳව 2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතෙහි නීතිමය ප්‍රතිපාදන සකසා ඇත. ඒ අනුව අදාළ නියෝග අනුමත වූ පසු මෙම දෙපාර්තමේන්තුවෙන් ද චක්‍රලේඛ මඟින් පූර්ණ ප්‍රදාන සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කරනු ඇත.	විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
38	මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය මඟින් 2022 අප්‍රේල් මස 12 දින නිකුත් කරන ලද අන්තර්කාලීනව විදේශ ණය ගෙවීම අත්හිටුවීමේ ප්‍රතිපත්තිමය තීරණය අනුව 2022 අප්‍රේල් මස 13 දින සිට සමාලෝචිත වර්ෂය අවසන් දිනට ණය ගිවිසුම් 401 අදාළව ගෙවිය යුතු ණය වාරිකය ලෙස රු.මිලියන 1,439,066 ක් ද, පොළිය ලෙස රු.මිලියන 673,964 ක් ද ගෙවීම් අත්හිටුවා තිබුණ ද, ඒ පිළිබඳව රජයේ මූල්‍ය ප්‍රකාශනවල විධිමත් පරිදි හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.	2023 2022	මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට වැදගත් වන තොරතුරු උචිත ලෙස හෙළිදරව් කළ යුතු වීම.	ඉදිරි වර්ෂයේදී හෙළිදරව් කිරීමට නියමිතය.	2023 දෙසැම්බර් 31 දිනට මෙම තත්ත්වය පැවතුණි.
39	2021 දෙසැම්බර් 31 දිනට පැවති ඒකාබද්ධ අරමුදලේ ඍන වටිනාකම වූ රු.990,490,932,444 සහ ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ඍන වටිනාකම වූ රු.14,040,298,131,574 එකතු කර රු.15,030,789,064,018 පොදු අරමුදල (General Fund)	2023	- එම -	රජයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ සිදුවන අඩුපාඩු අවම කර ගැනීම සඳහා රජයේ ගිණුම් කාරක සභාවේ නිර්දේශ මත පත් කරන ලද කමිටුවේ දී	2023 දෙසැම්බර් 31 දිනට මෙම තත්ත්වය පැවතුණි.

	ස්කන්ධය/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ සටහන් කර තිබුණ ද, එම ගිණුම්ගත කිරීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල විධිමත් පරිදි අනාවරණය කර නොතිබුණි.			ගන්නා ලද තීරණ අනුව ඒකාබද්ධ අරමුදලේ වටිනාකමේ හා ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ වටිනාකමේ එකතුව පොදු අරමුදල (General Fund) ලෙස සඳහන් කිරීමට තීරණය විය. ස්කන්ධ/ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හා ඊට අදාළව වර්ෂය තුළ සිදු වූ වෙනස්කම් මෙන්ම සමාලෝචිත වර්ෂයට පෙර වර්ෂය සඳහා ද ආරම්භක ශේෂය හා වසර තුළ සිදු වූ වෙනස්කම් ඇතුළත් කළ යුතු බැවින් 2021 දෙසැම්බර් 31 දිනට පැවති ඒකාබද්ධ අරමුදලේ ශේෂය හා ශුද්ධ වත්කම් ගැලපුම් ගිණුමේ ශේෂයේ මුළු වටිනාකම එකතු කර දක්වා ඇත.	
40	මූල්‍ය ප්‍රකාශනවල රජයේ හිමිකම් දායකත්වය දැක්වීමේදී කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්හි කරන ලද ආයෝජන සහ ලැයිස්තුගත නොවන සමාගම්හි කරන ලද ආයෝජන ලෙස වර්ගීකරණය කර නොතිබුණි. තවද කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත සමාගම්වල හිමිකාරීත්වයේ වටිනාකම එහි නාමික අගය පදනම් කරගෙන ගිණුම්ගත කර තිබූ අතර, ඒවායේ 2023 දෙසැම්බර් 31 දිනට වන වෙළඳපොළ	2023 2022	- එම -	ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දෙසැම්බර් 31 දිනට වෙළඳපොළ වටිනාකම හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ.	-එම-

	වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.				
41	2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් හා 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනතින් සංශෝධිත 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත ප්‍රකාරව, යම් වර්ෂයක් අවසානයට පැවතිය හැකි උපරිම බැරකම් වටිනාකම එම වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 80 නොඉක්මවිය යුතු වුවත්, 2023 දෙසැම්බර් 31 දින වන විට එම සීමාව සියයට 104.06 ක් වී තිබුණි. විස්තර පහත පරිදි වේ.	2023/ 2022/ 2021	පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම.	2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් 2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත අහෝසි වී ඇත. මීට ඉහත දී පැවති රාජ්‍ය මූල්‍ය රීති වෙනුවට, මෙම නව පනත මගින් රාජ්‍ය මූල්‍ය රීති හඳුන්වා දී ඇත. ඒ අනුව, මෙම නව පනත තුළ රාජ්‍ය ණය පිළිබඳ රාජ්‍ය මූල්‍ය රීතියක් ඇතුළත් නොවන නමුත්, රාජ්‍ය ණය තිරසාර මට්ටමකට අඩු කර පවත්වාගෙන යන බවට සහතික වීම මූල්‍ය කළමනාකරණයට අදාළ අරමුණක් ලෙස එම පනතේ දක්වා ඇත. ඒ අනුව, ආදායම් මූලික රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මගින් රජයේ ණය ගැනීම් අවශ්‍යතා අඩු කර රාජ්‍ය ණය අඩු කර ගැනීම සඳහා මේ වන විට පියවර ගෙන තිබේ.	-එම-

බැරකම්	2023 දෙසැම්බර් 31 දිනට බැරකම් වටිනාකම* රු.බිලියන
බැංකු අයිරාව	80
මහ බැංකු අත්තිකාරම්	-
රාජ්‍ය ණය	29,150
මූල්‍ය ප්රකාශන තුළ ගිණුම්ගත නොකළ බැරකම් : ගිණුම්ගත නොකළ විදේශ ණය	15
මුළු බැරකම්	29,245
ඇස්තමේන්තුගත දළ දේශීය	28,103

	නිෂ්පාදිතය **මුළු බැරකම ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් ප්‍රතිශතයක් ලෙස (%)** **104.06** * මහා භාණ්ඩාගාරයේ ඇපකර මත රාජ්‍ය ව්‍යාපාර විසින් ලබාගෙන ඇති ණය සඳහා බැංකු වෙත ලබා දී ඇති ඇපකර හා සහන ලිපි වටිනාකම වූ රු.බිලියන 2,034 ක් සහ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකකවලට අදාළව විගණනයට ඉදිරිපත් කළ බැරකම් හා බැඳීම් ප්‍රකාශය අනුව රු.බිලියන 117 ක් වූ බැරකම් ඉහත බැරකම්වලට ඇතුළත් කර නොමැත.				
42	"2006 වර්ෂය අවසානයේ අයවැය පරතරය, එම වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට සහ එම මට්ටම ඉන්පසු දිගටම පවත්වාගෙන යනු ලබන බවට වගබලා ගැනීමෙන් ආණ්ඩුවේ ණය දූරදර්ශී මට්ටම් දක්වා අඩු කිරීම" ආණ්ඩුව විසින් අනුගමනය කළ යුතු වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදක වූ පරමාර්ථයක් ලෙස 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනතේ 3 (අ) වගන්තියේ දැක්වේ. එසේවුවද, සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි ඇස්තමේන්තු කිරීමටත්,	2023 2022 2021	පනතේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම.	2003 අංක 03 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් අහෝසි වී ඇති අතර, මෙම නව පනත මගින් අයවැය හිඟය මත නොව ප්‍රාථමික ශේෂය මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය රීතීන් හඳුන්වා දී ඇත. ඒ අනුව, 2023 වසරේ දී සියයට 0.6 ක ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ද ලබාගැනීමට හැකි වූ අතර, 2024 වසරේ දී සියයට 0.8 ක ප්‍රාථමික අතිරික්තයක් ද 2025 වසරේ සිට සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක්	-එම-

සමාලෝචිත වර්ෂය අවසානයට වූ තත්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන පරිදි පවත්වාගෙන යාමට මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය අපොහොසත් වී ඇති බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතය	අයවැය පරතරය		ඇස්තමේන්තුගත අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස	තත්‍ය අයවැය පරතරය, ඇස්තමේන්තුගත දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස
	ඇස්තමේන්තුගත	තත්‍ය		
රු.බි	රු.බි	රු.බි	%	%
28,103	3,783	2,584	13.46	9.19

ද ලබාගැනීමට අපේක්ෂිතය.

43	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 373 ප්‍රකාරව, 2023 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල අග්‍රිම ගිණුම් 99 ක රු.මිලියන 3,782 ක හර	2023 2022 2021	මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම.	පවතින අග්‍රිම ශේෂය පියවීමේ වගකීම අදාළ ආයතනය සතු වන අතර මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වනුයේ	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

	ශේෂ නොපියවී පැවතුණි. ඉන් රු.මිලියන 50 ක ශේෂයක් වර්ෂ ගණනාවක සිට පැවත එන අතර, එම ශේෂයන් නිරවුල් කර ගැනීමට 2023 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.			එම කටයුතු අධීක්ෂණය කිරීම පමණි. ඒ අනුව මෙම ශේෂය පියවීම සඳහා අවශ්‍ය උපදෙස් අදාළ ආයතන වෙත ලිඛිතව දන්වා ඇති අතර එම ආයතන සමඟ සාකච්ඡා වාර ගණනක් පවත්වා අවශ්‍ය උපදෙස් ලබා ඇත.	
44	සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදායකයන් 07 දෙනෙකුගෙන් ව්‍යාපෘති 10 කට අදාළව ලැබී තිබූ එකතුව රු.73,426,055 ක් වූ විදේශ ප්‍රදාන අදාළ අරමුණට නොයොදවා ආපසු ප්‍රදායකයන් වෙත යවා තිබුණි.	2023 2022	ශ්‍රී ලංකා රජය වෙත ලැබෙන විදේශ ප්‍රදාන උපරිම වශයෙන් අදාළ අරමුණට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම.	එවැනි තත්ත්වයන් වළක්වා ගැනීමට ඉදිරියේදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ද ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට කටයුතු කිරීමට අපේක්ෂා කරනු ලැබේ.	-එම-
45	රජයේ අනුමත භාණ්ඩාගාර අත්තිකාරම් ගිණුම් 7 ක 2023 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,293,506,349 ක ශේෂයක් නිරවුල් නොවී වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.	2023 2022	දිගුකාලීනව නිරවුල් නොවී පවතින අත්තිකාරම් ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම.	පසුවිපරම් සිදුකරමින් පවතී.	-එම-
46	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් 14 ක එකතුව රු.9,027,522 ක් වූ ශේෂයක් හා තවත් අත්තිකාරම් ගිණුම් 2 ක් යටතේ එකතුව රු.408,233 ක් වූ ඍණ ශේෂයක් නිරවුල් නොවී වර්ෂ ගණනාවක් තිස්සේ දිගින් දිගටම පවත්වාගෙන ගොස් තිබුණි.	2023 2022	- එම-	මෙම ශේෂයන් සම්බන්ධව දෙපාර්තමේන්තුව සතුව පවතින පැරණි තොරතුරු විශ්ලේෂණය කර අක්‍රියව පැවතීමට හේතු නිවැරදිව හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී.	-එම-
47	2008 මැයි 22 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1550/7 දරන	2023 2022 2021	රාජ්‍ය ආදායම් රැස් කිරීම සම්බන්ධව විධිමත් සැලසුම්	2023 නොවැම්බර් මස සිට 2024 මාර්තු මස දක්වා විදේශීය	2008 අගෝස්තු 01 දින සිට 2023

	අතිවිශේෂ ගැසට් පත්‍රයේ 7 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශ පත්‍රයක් සම්බන්ධයෙන්ම එවැනි ටිකට්පත් විකිණීමේ ආකාරය සහ/හෝ නිකුත් කිරීම නොසලකා ඇ.ඩො. 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කරනු ලැබිය යුතු බවත්, එම ගැසට් පත්‍රයේ 8 ඡේදය ප්‍රකාරව එලෙස එකතු කරගනු ලබන අධිභාර මුදල් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ හැකි පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බවත් දක්වා ඇත. ඒ අනුව 2008 අගෝස්තු 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අධිභාරය ලෙස රු.මිලියන 22,113 ක් එකතු කර ගෙන තිබුණ ද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද මෙම අධිභාරය තවදුරටත් අය කර ගැනීමට හැකියාව ඇති බවත්, එම අධිභාර මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ නීතිමය බැඳීමක් පවතින බවත් 2017 අප්‍රේල් 07 දිනැති ලිපිය මඟින් නීතිපති දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වන විටත් මෙම අධිභාර මුදල සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.		සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම.	විකුණුම් අධිභාර ආදායම වන රු.1,766,269,517 ක මුදලින් රු.393,000,000 ක මුදලක් රඳවා ගැනීමෙන් අනතුරුව රු.1,373,269,517 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට 2024.05.10 දින බැර කිරීමට කටයුතු කර ඇත. මෙම ආදායම සති දෙක බැගින් වූ කාර්තු දෙකකට ගුවන් සේවා ආයතනය වෙතින් අය කරනු ලබන අතර, දෙවන කාර්තුවේ මුදල් ලැබෙනුයේ ඊළඟට එළඹෙන මස 15 දිනයේ දී බවත්, ඒ අනුව ඉදිරි මාස වලට අදාළ ප්‍රේෂණයන් යම් මාසයක් අවසන්ව ඊළඟට එළඹෙන මාසයේ 20වන දිනට පෙර එවීමට කටයුතු කරන බව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සභාපති විසින් දැනුම් දී ඇත.	නොවැම්බර් දක්වා කාලසීමාවට අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
48	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනට රු.190,789,890,831 ක උපණය ශේෂයක් ලැබිය යුතුව පැවති අතර අදාළ උපණය ගිවිසුම්	2023 2022	රාජ්‍ය උපණය ලබා දීම, පාලනය හා උපණය සේවාගිණුම්ගත කිරීම විධිමත් කළ	2024 අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක වීමත් සමඟ ණය අවධානම්	2024.09.30 දින වන විට එම ණය මුදලින් රු.3,866,667

	ප්‍රකාරව ගෙවීම් සිදු නොකිරීම හේතුවෙන් ආයතන 03 කට අදාළව වසර 05 ක ට වඩා වැඩි රු.1,316,324,489 ක හිඟ උපණය ශේෂයක් පැවතුණි.		යුතු වීම.	තක්සේරුවක් මත පදනම්ව ගැණුම්කරු යම් මූල්‍ය අපහසුතාවකින් යුක්ත නොවන බවට නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව පමණක් උප ණය නිකුත් කරනු ලැබේ.	ක් පමණක් මෙම වර්ෂය තුළදී අය කර ගෙන තිබුණි.
49	2023 දෙසැම්බර් 31 දිනට උප ණය වෙනුවෙන් ලැබිය යුතු පොළී වටිනාකම රු.9,439,025,443 ක් වූ අතර, ආයතන 03 කට අදාළව ගිවිසුම් ප්‍රකාරව වසර 05 කට වඩා වැඩි නොගෙවූ පොළී වටිනාකම් එකතුව රු.912,059,388 ක් වී තිබුණි.	2023 2022	-එම -	-එම-	මේ වන විටත් උප ණය වෙනුවෙන් ලැබිය යුතු පොළි වටිනාකම් අය වී නොතිබුණි.
50	2023 ජනවාරි 01 දින වන විට ආයතන 2 ක ට අදාළ වූ උපණය ගිවිසුම් 4 ක් යටතේ පැවති උප ණය ශේෂ එකතුව වූ රු.114,487,221 කින් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු හිඟ මුදලක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.	2023	-එම -	-එම-	2023 වර්ෂය අවසාන වන විට මෙම හිඟ උපණය ශේෂයන් අයකර ගෙන නොතිබුණි.
51	2023 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු මඟින් කිසිදු ප්‍රතිපාදනයක් සලසා ගැනීමකින් තොරව, 2022 මාර්තු 31 දින සිට 2022 ජුලි 22 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික දේපළ වලට සිදු වූ හානි සම්බන්ධයෙන් 2022 අංක 43 දරන විසර්ජන පනතේ 6(1) වගන්තියේ සඳහන් පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් වැය විෂයෙන්, ශීර්ෂය 130 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට පරිපූරක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන	2023	තක්සේරු ගත වන්දිය පූර්ව හඳුනාගෙන වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම.	ඉදිරියේ දී යම් වසරක අයවැය ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේදී මෙවැනි හානි සඳහා පූර්ව වන්දි තක්සේරුකරණය කිරීමේ හැකියාවක් පැවතේ නම් හා එම හානිපූර්ණය කිරීම ඉදිරි වර්ෂය දක්වා කල් තැබීමට හැකියාවක් පැවතේ නම් ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදනය ඉදිරි වර්ෂයේ අයවැය ඇස්තමේන්තු තුළ ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	2023 වර්ෂය අවසාන වන විට මෙම තත්ත්වය පැවතුණි.

	ලබා දී එකී අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 41 දෙනෙක් වෙනුවෙන් එකතුව රු.1,050,339,626 ක් හානිපූරණය වශයෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය.				
52	රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණ ඒකකයක් පිහිටුවා 2022 දෙසැම්බර් 01 දින සිට ක්‍රියාත්මක වී තිබුණි. ඒ අනුව රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමට අදාළව පහත නිරීක්ෂණයන් කරන ලදී. රජය සතු ව්‍යාපාර ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තියේ 02 වන මූලධර්මයෙහි සඳහන් පරිදි පාලක සමාගමක් පිහිටුවීමට හා 2023 මැයි මස 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන් අංක MF/036/CM/2023/107 හා 2023 මැයි 08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයේ 4.2 හා 4.3 ඡේද අනුව අමාත්‍ය මණ්ඩල සංදේශයේ ඇමුණුම 02 හා 03 හි ලැයිස්තුගත කර ඇති ආයතන 72 ක් ප්‍රතිව්‍යුහගතකරණය සඳහා පාලක සමාගම (HOCO) වෙත, එහි අනුබද්ධිත සමාගම් ලෙස පැවරීමටත් තීරණය කර තිබුණද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි පාලක සමාගමක් (HOCO) ස්ථාපිත කර නොතිබුණි.	2023	අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු විම.	රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ පනත තවමත් කෙටුම්පත් අවදියේ ඇති බැවින් පාලක සමාගම මෙතෙක් ස්ථාපිත කර නොමැත.	මේ වන විටත් මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
53	තවද, එම පාලක සමාගම (HOCO) වෙත පවරාගෙන, ප්‍රතිව්‍යුහගත කිරීමට යෝජනා වී තිබූ ඉහත සංදේශයේ ඇමුණුම 02 ලැයිස්තුවේ සඳහන්, ආයතන	2023	-එම-	එවකට රජයේ ප්‍රමුඛත්වය යටතේ තෝරාගත්, රාජ්‍ය ව්‍යවසාය 07 හි, රජය සතු කොටස් බැහැර	-එම-

	08 ක් අතරින් ආයතන 07 ක් මේ වන විටත් පාලක සමාගම වෙත පවරා ගැනීමකින් තොරව, රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ රජය සතු කොටස් බැහැර කිරීම් (Divesting) ක්‍රියාවලිය සඳහා ගනුදෙනු උපදේශකවරුන් බඳවාගෙන ලංසු කැඳවීමේ ක්‍රියාවලියේ අදියර කිහිපයක් ක්‍රියාත්මක කර ඇති බවත්, මේ යටතේ ඇති එක් ආයතනයක් නීතිපතිවරයාගේ උපදෙස් මත තාවකාලිකව අත්හිටුවා ඇති බවත් නිරීක්ෂණය විය.			කිරීමේ ක්‍රියාවලිය මෙතෙක් අවසන් වී නොමැත. හිල්ටන් හෝටලයට අදාළව සාකච්ඡා මට්ටම දක්වා ද සී/ස ලංකා හොස්පිටල් කෝපරේෂන් ආයතනයට අදාළව යෝජනා කැඳවීම අවසන් කිරීමේ අදියර දක්වා ද කටයුතු නිමකර ඇත.	
53	භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතියක් (ITMIS) හඳුන්වා දීම 2010 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ වෙනුවෙන් සමස්ත ආයෝජනයේ ඇස්තමේන්තුගත පිරිවැය ඇ.ඩො. මිලියන 60 ක් හෙවත් රු.මිලියන 7,920 ක් වී තිබුණි. 2023 දෙසැම්බර් 31 දින වන විට ආසන්න වශයෙන් වසර 13 ක කාලයක් ගත වී තිබු අතර, විගණනයට ලද තොරතුරු මත රු.මිලියන 5,647 ක වියදමක් දරා තිබුණද, මෙම පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද මූලික ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13 සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර ක්‍රියාත්මක කරන තත්ත්වයකට පත් වී නොතිබුණි. කෙසේ වුවද 2023 දෙසැම්බර් 31 දින වන විට ITMIS පද්ධතිය සම්බන්ධයෙන් එළඹී ගිවිසුම් අනුව 2023 දෙසැම්බර් 31 දිනට රු.43,887,382ක් හා ඇ.ඩො. 989,103 ක මුදලක් ද සේවා සපයන ආයතන වෙත තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.	2023	දැනටමත් පසුගාමී වී ඇති බැවින්, පද්ධතිය කඩිනමින් සම්පූර්ණ වශයෙන් සංවර්ධනය කර, ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම.	පද්ධතියේ ප්‍රධාන ක්‍රියාවලියන් 8ක් ITMIS ව්‍යාප්තියට අදාළ රජයේ වියදම් ශීර්ෂ 172 න් 164 ක් සඳහා ක්‍රියාත්මක කර ඇත. කොවිඩ් වසංගත තත්ත්වය, සමාජ සහ මූල්‍ය අර්බුදය හේතුවෙන් රටේ පැවති අස්ථාවරත්වය, විදුලි සහ ප්‍රවාහන සේවා අඩපණ වීම, පද්ධතිය සම්බන්ධයෙන් අභ්‍යන්තරව සහ බාහිර විශේෂඥයන්/කමිටු විසින් සිදුකල අධ්‍යයනයන් යනාදිය ප්‍රමාදයට හේතු විය. මුල් ගිවිසුම අනුව මිලදීගත් පරිශීලක බලපත්‍ර (user licenses) 5000 ම මේ වනවිට භාවිත කර ඇති හෙයින් ඉහත ඉතිරි ආයතන පද්ධතිය වෙත එක්කර ගැනීම ප්‍රමාද වී ඇත. මේ සඳහා අවශ්‍ය ඉතිරි බලපත්‍ර කිසිදු අතිරේක වියදමකින් තොරව	මේ වන විටත් ITMIS පද්ධතිය සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොවන බව අනාවරණය විය.

				ලබාගැනීමට අමාත්‍යාංශය සේවා සැපයුම්කරු සමඟ සාකච්ඡා කර ඇති අතර පද්ධතියේ මෙහෙයුම් සහ නඩත්තු ගිවිසුම යාවත්කාලීන කිරීමෙන් පසු ලබන වසර මුල එම බලපත්‍ර ලැබෙනු ඇතැයි අපේක්ෂිතය.	
54	ITMIS පද්ධතිය ආරම්භයේ සිට ඒ තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතව පැවතුන, වැටුප් කළමනාකරණ ක්‍රියාකාරකම් ක්ෂේත්‍රය ස්ථාපනය කර ක්‍රියාත්මක කිරීමකින් තොරව 2016 වර්ෂයේදී e-Payroll නැමති වෙනත් වැටුප් කළමනාකරණ පද්ධතියක් මුදල් අමාත්‍යාංශයට පමණක් හඳුන්වා දී තිබූ අතර, ඒ වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.5,704,871 ක වියදමක්ද දරා තිබුණි.	2023	ආර්ථිකභාවය සහ කාර්යක්ෂමතාවය පිළිබඳ විශේෂ අවධානය යොමු කර මුළු රාජ්‍ය අංශය සඳහා වැටුප් කළමණාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම කඩිනම් කර ගත යුතුය.	2016 වසරේ අප්‍රේල් මස පැවති අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති රැස්වීමේදී මුළු රාජ්‍ය අංශය සඳහාම වැටුප් කළමනාකරණය වෙනුවෙන් වෙනත් මෘදුකාංගයක් ලබාගැනීමට ගත් තීරණය අනුව e-payroll වැටුප් කළමනාකරණ පද්ධතිය මේ වන විට මුදල් අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු තුළ පරීක්ෂණ ධාවනයක් ලෙස ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.	මේ වන විටත් e-Payroll වැටුප් කළමනාකරණ පද්ධතිය මුදල් අමාත්‍යාංශය ට හා භාණ්ඩාගාර දෙපාර්තමේන්තු වලට පමණක් හඳුන්වා දී තිබේ.
55	2023 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් (8493) කාල විශ්ලේෂණය අනුව, පළාත් සභාවල ආයතන වලට මාරු වී ගිය නිලධාරීන්, සංස්ථා, මණ්ඩල සහ පළාත් සභා සඳහා ස්ථිර වශයෙන් මුදා හැර ඇති නිලධාරීන්, මිය ගිය නිලධාරීන්, විශ්‍රාම ගිය නිලධාරීන්, වැඩ තහනම් කරන ලද නිලධාරීන්, සේවය හැර ගිය/ අවසන් කළ නිලධාරීන්, ද්විතීය පදනම මත ස්ථාන මාරු,	2023	ශේෂයන් නිරවුල් කිරීම සඳහා කඩිනමින් පියවර ගෙන පවත්නා පද්ධතිය වැඩි දියුණු කළ යුතු වීම.	මෙම ණය ශේෂයන්, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා පවතින චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කර නිරවුල් කර ගැනීම ඒ ඒ ආයතනවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමකි. කාර්තුමය වශයෙන් එම	සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් දිගුකාලීන නිරවුල් නොවූ ශේෂයන් නිරීක්ෂණය විය

	විදේශගත /දේශීය නිවාඩු සහ වෙනත් යන වර්ග යටතේ වන නිලධාරීන්ගෙන් අයවිය යුතු වසර 5 ත් 10 ත් අතර ශේෂ එකතුව රු.112,939,218 ක් වූ අතර වසර 10 කට වැඩි ශේෂ එකතුව රු.277,066,082 ක් වී තිබුණි.			ආයතනවල ප්‍රගතිය ගෙන්වා ගනිමින් ණය ශේෂයන් අයවීම් ප්‍රගතිය පරික්ෂා කරමින්, අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදෙමින් නිරන්තරයෙන් පසුවිපරම් කරනු ලබයි.	
56	2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යසායන් 17 කට අදාළව ජංගම අනුපාතය දුර්වල තත්වයක පැවතුණි. විශේෂයෙන්ම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ජංගම අනුපාතය 0.15 ක් වැනි ඉතාමත් පහළ අගයක පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, මෙම රාජ්‍ය ව්‍යවසායන් ද්‍රවශීලතා දුෂ්කරතාවයන්ට මුහුණ දීමේ ඉහළ අවධානමක් ඇති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	2023	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතනයන්හි මූල්‍ය තත්ත්වය කාලීනව ඇගයීමට ලක් කර අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීමට හා ඒවායේ වටිනාකම්හි අඩුවීම් රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ නිසි පරිදි අනාවරණය කළ යුතු වීම.	රාජ්‍ය ව්‍යවසායන්හි ආයෝජන ඉහළ නැංවීම කෙරෙහි සීමාකාරී මූල්‍ය අවකාශය සෘණාත්මකව බලපා ඇත. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යවසායන් විසින් මුහුණපාන ද්‍රවශීලතා ගැටළු කළමනාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් අවස්ථානුකූලව ලබාදීමට කටයුතු කර ඇත.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය දක්නට ලැබුණි.
57	2022 වර්ෂය අවසානය වන විට රාජ්‍ය ව්‍යවසායන් 16 ක් සම්බන්ධයෙන් අධි ප්‍රාග්ධන තෝලන තත්ත්වයක් නිරීක්ෂණය විය. මෙහි ඇතැම් ආයතනවල රජයේ ප්‍රාග්ධනයට වඩා ගෙවීමට ඇති දිගුකාලීන ණය ඉහළ අගයක් ගෙන තිබුණි. තවද රජයේ ප්‍රාග්ධන දායකත්වය ඍන අගයක් ගෙන ඇති රාජ්‍ය ව්‍යවසායන්ද නිරීක්ෂණය වූ අතර එම ආයතන මුළුමනින්ම දිගුකාලීන ණය මඟින් මූල්‍යනය කර තිබුණි. ඒ අනුව මෙම සියලු ආයතන ඉහළ මූල්‍ය අවධානමකට (Financial Risk) මෙන්ම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානමකට මුහුණ	2023	-එම-	.රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය අවදානම අවම කර ගැනීම සඳහා 2023 වර්ෂයේ සිට ප්‍රතිසංස්කරණයන් සිදු කරමින් පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස අධි තෝලන තත්ත්වයන් යහපත් තත්ත්වයකට ගෙන ඒමට හැකියාව ලැබී ඇත.	-එම-

	දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.				
58	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 241,651 ක් වූ අතර, ඉන් රු.මිලියන 34,090 ක් එනම් සියයට 14 ක එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා ම හා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත වී තිබුණි.	2023	පුනරාවර්තන ස්වරූපයේ වියදම් දැරීම තුළින් ආයතනවල ප්‍රාග්ධන දායකත්වයන් වැඩිවීමක් සිදු නොවන බැවින් ඒ සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වීම.	මෙම ආයතන සියල්ලෙහිම සම්පූර්ණ අයිතිය මහා භාණ්ඩාගාරය සතු වේ. ඒ අනුව එම ආයතනවල පවතින කාරක ප්‍රාග්ධන ගැටළු හෝ අනෙකුත් පුනරාවර්තන ස්වරූපයේ වියදම් සඳහා අවශ්‍ය මූල්‍ය දායකත්වය මහා භාණ්ඩාගාරය විසින් ලබා දිය යුතු වේ.	-එම-
59	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය ව්‍යවසායන් 05 ක් සඳහා රු.මිලියන 176 ක ප්‍රාග්ධන දායකත්වයක් සිදුකර තිබුණ ද, ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාරයට හිමි කොටස් සංඛ්‍යාවෙහි වෙනසක් සිදු වී නොතිබුණි.	2023	රජය මඟින් සිදු කරන ලද කොටස්වල ආයෝජනයට අදාළ කොටස් සහතික කඩිනමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම.	කොටස් සහතික කඩිනමින් ගෙන්වා ගැනීමට අදාළ විෂය නිලධාරීන් දැනුවත් කර ඇත.	2023 වර්ෂය අවසන් වන විට මෙම තත්ත්වය දක්නට ලැබුණි.
60	මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ඈවර කිරීම සම්බන්ධව අංක MOF/ DG/LAD/CO/142/2017 හා 2017 ඔක්තෝබර් 30 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙහි යෝජනා අංක (අ), (ආ), හා (ඇ) සඳහා අංක අමප/17/2383/733/026-1 හා 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර ලේකම් විසින් සමාගම ඈවර කිරීම සඳහා විශේෂ යෝජනාවක් සම්මත කර වාණිජ මහාධිරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව 2018 මාර්තු 18 දින ඈවරකරුවකු අධිකරණය විසින් පත් කර තිබුණු	2023	අරමුදල් ලබා දීමේදී රජයට විය හැකි අවාසිසහගත තත්ත්වයන් අවම වන පරිදිත්, පවතින තත්ත්වයන් විධිමත්ව ඇගයීමකින් යුතුවත් සිදු කළ යුතු වීම.	මෙවැනි ආයතන ඈවර කිරීමේ කටයුතු අවසන් කර වසා දමන අවස්ථාව දක්වා වූ භාණ්ඩාගාර බැඳීම් වෙනුවෙන් කළ යුතු වූ වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සුදුසු වැය විෂය සංකේතයක් යටතේ ලබා ගැනීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කර ගැනීමට සටහන් කර ගතිමි.	-එම-

	තත්ත්වයකදී මහජන බැංකුවෙන් එම ආයතනය ලබා ගත් ණයවලට අදාළව 2021 හා 2022 වර්ෂය වෙනුවෙන් වාරික හා පොළිය ගෙවීම සඳහා පිළිවෙලින් රු.මිලියන 272 ක් හා රු.මිලියන 441 ක් වශයෙන් එකතුව රු.මිලියන 713 ක් එම සමාගම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වෙතින් ලබා දී තිබුණි.				
61	සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් සටහන් 15 යටතේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ ආයෝජනය කරන ලද කොටස් ගණන සටහන් කර නොතිබුණු අතර වටිනාකම රු.1,271,480,516 ක් ලෙස සටහන් කර තිබුණි. තවද, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් ලද ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව, 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජය සතු ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කොටස් හිමිකාරීත්වය සියයට 50.23 ක් වුවද රජයේ මූල්‍ය ප්‍රකාශනයෙහි එය සියයට 49.5 ක් ලෙස දක්වා තිබුණි.	2023	රාජ්‍ය හිමිකාරීත්වය දරන ආයතන සමඟ කාලීනව ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම් වල නිරවද්‍යතාවය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වීම.	අතපසුවීමකින් අදාළ කොටස් වටිනාකම සටහන් වී නොමැති අතර, ඉදිරියේදී එම වටිනාකම ද ඇතුළත් කිරීමට කටයුතු කරමි. අදාළ ප්‍රතිශතය ගණනය කිරීමේදී සිදු වූ ගණිත දෝෂයක් හේතුවෙන් මෙම වෙනස ඇති වූ අතර එය ඉදිරියේදී නිවැරදි කර ගැනීම සඳහා සටහන් කර ගතිමි.	-එම-
62	රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 269,386 ක් වූ අතර, ඉන් රු.මිලියන 228,771 හෙවත් සියයට 85 ක් 2023 සැප්තැම්බර් 26 දිනැති අමප 23/1812/604/118-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය සහ සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙහි ශේෂ පත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ කරන ලද ස්කන්ධ	2023	රජය සතු ව්‍යවසායන්හි හඳුනාගත් වගකීම් රජයට පවරා ගැනීම හේතුවෙන් රජය මූල්‍ය අර්බුදයකට බලපෑ හැකි බැවින් එම වගකීම් නිරවුල් කිරීමට නිසි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු වීම.	එකඟ වේ. සටහන් කර ගතිමි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහනට අනුව මෙම ආයතන වල ශේෂපත්‍ර ප්‍රතිව්‍යුහගත කල යුතුවිය.ඊට සමගාමීව මෙම එක්දින ගනුදෙනුව සිදු කරන ලදී.	-එම-

	ආයෝජනයන් හේතුවෙන් වැඩි වී තිබුණි.				
63	2019 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විදේශ ප්‍රදානයන් ලබා ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් එක් එක් විදේශ ප්‍රදානිත ආයතන 13 ක් සමග එකතු වටිනාකම් ජපන් යෙන් 984,000, යුරෝ 134,810,000, ඇමෙරිකානු ඩොලර් 58,417,841 කොරියන් වොන් 400,000, චීන යුවාන් 2,000,000,000 හා රු.4,545,750 ක් වූ විවිධ ව්‍යවහාර මුදලින් ගිවිසුම් වලට එළඹියද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම විදේශ ප්‍රදාන ලද බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිනි.	2023	ශ්‍රී ලංකා රජය විසින් ගිවිසුම්වලට එළඹෙන විදේශ ප්‍රදානයන් සම්පූර්ණ වශයෙන් ලබාගෙන, උපරිම වශයෙන් අරමුණට යොදවා ගැනීමට කටයුතු කළ යුතු වීම.	විදේශ ප්‍රදාන බලාපෙරොත්තු වූ පරිදි උපලබ්ධි නොවීමට පොදුවේ ප්‍රසම්පාදන කටයුතුවල ප්‍රමාදවීම්, කොවිඩ් වසංගතය නිසා වැඩ කටයුතු අඩාල වීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු අවසන් නොවීම නිසා අදාළ ආයතනයන් මගින් ණය හා ප්‍රදාන උපයෝජනයන් නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනයන්හි පරිපාලනමය අඩුපාඩු හා ප්‍රදායක ආයතනයන්හි ප්‍රමාදවීම් ආදී කරුණු බලපා ඇති බව නිරීක්ෂණය කෙරේ. කෙසේ වුවද, ප්‍රදාන අරමුදල් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම තුළින් රටේ ආර්ථික වර්ධනයට වැඩි දායකත්වයක් ලබාගත හැකිවන සේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව තුළින් ගතහැකි සියලු ක්‍රියාමාර්ග ඉදිරි කාලය තුළ ගැනීමට බලාපොරොත්තු වේ.	2023 වර්ෂය අවසාන වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.
64	ණය ගෙවීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් 2022 අප්‍රේල් 12 දින සිට එම ණය ගිවිසුම්වලට අදාළව උපයෝජනය නොකළ ශේෂය මත කැපකරු ගාස්තු	2023	ණය ගෙවීම් අත්හිටුවීමට අදාළව පැනනැගිය හැකි අතිරේක වියදම් කල්තියා හඳුනා	ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශයට පත්කරන ඇතැම් ණය ගෙවීම අත්හිටුවීමේ දී අනුගමනය කරන අතුරු ප්‍රතිපත්තියට	මේ වන විටත් මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

	(Commitment Fee) ගෙවීම සිදු කර නොමැති බව විගණනය වෙත දන්වා තිබුණ ද, ඉදිරියේදී මෙම ණය මුදල්වලට අදාළව උපයෝජනය නොකළ ශේෂ මත සාමාන්‍ය කැපකරු ගාස්තු වටිනාකම හෝ ගෙවීම් ප්‍රමාද කිරීම හේතුවෙන් එම වටිනාකමට වඩා ඉහළ වටිනාකමක් හෝ ගෙවීමට සිදුවීමේ අවධානමක් පවතින බව විගණනයේදී වැඩිදුරටත් නිරීක්ෂණය විය.		ගෙන නිසි උපක්‍රමික විසඳුම් ලබා දිය යුතු වීම.	අනුකූලව බලපෑමට ලක් වූ විදේශ ණය සේවාකරණය 2022.04.12 දින සිට අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවා ඇත. ඒ අනුව, නොගෙවූ කැපවීම් ගාස්තු හා දඩ පොලී ණය ශේෂ පිළිබඳ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළ සම්මුති සාකච්ඡාවල දී සාකච්ඡාවට බඳුන් කරනු ලැබේ.	
65	මුදල් රෙගුලාසි 85(2)(ආ) ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීම පමණක් සඳහන් වන හෙයින්, පාර්ලිමේන්තුව විසින් අනුමත කළ ආදායම් ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවේ අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමට අවස්ථාව ලබා දීම නිසා ආදායම් තාත්ත්වික ලෙස ඇස්තමේන්තු කිරීමේ වගවීම දුර්වල වී ඇති බව නිරීක්ෂණය විය.	2023 2022 2021	ආදායම් නිවැරදි ලෙස තක්සේරු කර ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඒවා සංශෝධනය කිරීමේදී අයවැය හිඟය මූල්‍යනය කළ යුතු ආකාරය පිළිබඳව අවධානය යොමු කළ යුතු වීම හා පාර්ලිමේන්තුව විසින් අනුමත කල ආදායම් ඇස්තමේන්තු පාර්ලිමේන්තු විධිමත් අනුමැතියකින් තොරව සංශෝධනය කිරීමේ හැකියාව සීමා කළයුතු වීම.	ලබා දී ඇති පිළිතුර අදාළ නැත.	2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින්ද මේ පිළිබඳ පැහැදිලිව දක්වා නොතිබුණි.
66	සමාලෝචිත වර්ෂයේ රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව, බාහිර ආයතන වෙත අවස්ථා 10 ක දී නිකුත් කළ රු.මිලියන 115,977.35 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර සහ අවස්ථා 10ක දී නිකුත් කළ රු.මිලියන 28,838.4 ක් වටිනා	2023 2022	භාණ්ඩාගාර ඇපකර හා සහන ලිපි නිකුත් කිරීමේ ක්‍රියාවලිය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු වීම.	2024 අංක 33 දරණ රාජ්‍ය ණය කළමනාකරණ පනත ක්‍රියාත්මක වීමත් සමඟ ණය අවධානම් තක්සේරුවක් මත පදනම්ව ගැණුම්කරු යම් මූල්‍ය	2023 වර්ෂය අවසාන වන විට මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

සහන ලිපි 2023 දෙසැම්බර් 31 දින වන විට කල් ඉකුත් වී ඇති බවට නිරීක්ෂණය වූ අතර, ඒවායේ වලංගු කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.	අපහසුතාවයකින් යුක්ත නොවන බවට නිර්දේශ ලබාගැනීමෙන් අනතුරුව පමණක් භාණ්ඩාගාර ඇපකර නිකුත් කරනු ලැබේ.